ෆ්‍යෝදර්
දොස්තොයෙව්ස්කි

කරමසෝ සහෝදරයෝ

සිරිල් සී. පෙරේරා



ෆ්යෝදර්
දොස්තොයෙව්ස්කි

කරමසෝ සහෝදරයෝ

දෙවන වෙළුම

ප්‍යෝදර් දොස්තොයෙව්ස්කි

කරමසෝ සහෝදරයෝ

දෙවන වෙළුම

අනුවාදක

කළුබෝවිල සිරිල් සී. පෙරේරා

සීමාසහිත

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

ප්‍රථම මුද්‍රණය - 1969
දෙවන මුද්‍රණය - 1999
තෙවන මුද්‍රණය - 2013
සිව්වන මුද්‍රණය - 2023

කරමසෝ සහෝදරයෝ

© සිරිල් සී. පෙරේරා

Fyodor Dostoevsky

THE BROTHERS KARAMAZO

A Complete Sinhala Translation
with an introduction
by Cyril C. Perera

ISBN - 955-20-3546-2

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය

R- 4535/4740/350

තුන්වන කොටස

තුන් වන කොටස

හත් වන ග්‍රන්ථය

අලෝෂා

පළමු පරිච්ඡේදය

දූෂණයේ දුර්ගන්ධය

චිරාගත චාරිත්‍ර ධර්ම අනුව සොසිමා තවුසා ගේ මෘත දේහය භූමිදානය පිණිස පිළියෙළ කරන ලදි. පූජකයන් ගේ හා තවුසන් ගේ ද මෘතශරීර නොසේදීම ප්‍රකට කරුණකි. පූජකයකු මිය ගිය විට එතුමා ගේ නිලයට පත්වන පූජකතැන විසින්, තෙත රෙදිකඩක් ගෙන, මිය ගිය පූජකයා ගේ නළල මත ද ළය මත ද, අත් පා හා දණහිස් මත ද, කුරුසයේ ලකුණ ඇඳ, උණු දියෙන් පිස දැමිය යුතු ය. එසේ කලොක් ප්‍රමාණවත් වන්නේ යයි පල්ලියේ චාරිත්‍ර ධර්මවල සඳහන් කර තිබේ. මේ කාරිය ඉටු කළ පියසි පියතුමා ඉක්බිති ව තවුසා ගේ මෘතදේහය ආරාමයට අයත් වස්ත්‍රයෙන් ඔතා, චාරිත්‍ර අනුව තවුසා ගේ කබාය අන්දවා, කොණ් අටක සවි කරන ලද කුරුස අවකින් යුත් හිස්වැස්මකින් හිස වසා, ඉතා සිනිඳු කළු දූල් රෙදි කඩකින් මුහුණ වැසුවේ ය. තවුසා ගේ අතේ ක්‍රිස්තුන් වහන්සේ ගේ සුරුවමක් ද තබන ලදි. කල් ඇති ව පිළියෙළ කරන ලද මිනී-පෙට්ටියක එතුමා ගේ මෘත දේහය තැන්පත් කරන ලද්දේ එළිවන පාන්දර ය. තවුසා ජීවත් ව සිටිය දී පූජකයන් හා අමුත්තන් ද

හමු වී කතා බහ කළ අසපුවේ, ඉඩ කඩ ඇති කාමරයේ මුළු දවස ම පෙට්ටිය තැබීමට තීරණය කරන ලදි. මිය ගිය තාවුසා දැඩි විනයකින් පාලනය වූ නිකායකට අයත් වූ හෙයින් පූජකයකු විසින් මිනිය ළඟ හිඳ ගීතිකා වෙනුවට බයිබලය කිය යුතු විය. මළවුන් සඳහා පවත්වන ලද පූජාවෙන් අනතුරු ව මේ කටයුත්ත කැරුණේ ඉයෝසි පියතුමා විසිනි. පසු ව එතුමා දිවා රෑ දෙක්හි, මිය ගිය තම මිත්‍ර තාවුසා ගේ මෘතදේහය ළඟ හිඳ බයිබලය කියැවීමට කැමැත්ත පළකෙළේ ය.

එහෙත් දැනට එතුමා ආරාමාධිපති පියතුමා සමඟ ඉතා වැදගත් කටයුත්තක යෙදී සිටියේ ආරාමයේ වැඩවෙසෙන පූජකයන් තුළ ද, ආරාමයට අයත් ලැගුම් ගෙවල නතර වී සිටින අමුත්තන් තුළ ද, නගරයේ සිට රැස් වූ මිනිසුන් තුළ ද, මීට පෙර නො ඇසූ, ඉතා අද්භූත, හා අශෝභන කලබලයක්, නොඉවැසිල්ලක් හා බලාපොරොත්තුවක් ඇති වූ හෙයිනි. ටිකින් ටික මේ තත්ත්වය උග්‍ර අතට හැරිණි. මිනිසුන් අතරේ පැවැති මේ නොඉවැසිල්ලත් බලාපොරොත්තුවත් සන්සුන් කිරීමට ආරාමාධිපතිතුමා හා පියසි පියතුමා ද බොහෝ වෑයම් කළ හ.

පොළොවට එළිය වැටුණු පසු සමහරු රෝගීන් ගෙනෙන්නට වූහ. වැඩි වශයෙන් ගෙනෙනු ලැබුවෝ පොඩි ළමයි ය. නගරවාසීන් මෙසේ රෝගීන් ගෙන පැමිණියේ වෙසෙසින් ම බොහෝ කාලයක සිට මේ මොහොත පැමිණෙනතෙක් බලාපොරොත්තු ව සිටියාක් මෙනි. මිය ගිය තාවුසා ගේ මෘත දේහයට රෝග සුවකිරීමේ පුදුම බලයක් තිබෙන බවත්, තමන්ගේ ඇදහීමේ හැටියට ඒ බලය පැහැදිලි ව ම පෙනෙන බවත් ඔවුහු විශ්වාස කළහ. තාවුසා ජීවත්ව සිටිය දී ශ්‍රේෂ්ඨ සාන්තුවරයකු ලෙස පිළිගෙන සිටි බව මින් පැහැදිලි වෙයි. එතුමා හමුවීමට දුර කතර ගෙවා පැමිණි අය අතරේ දුප්පතුන් පමණක් නො ව පොහොසත්තු ද වූ හ.

බැතිමතුන් විසින් එළිපිට ම දක්වන ලද නොඉවැසිල්ලත් බලාපොරොත්තුවත් ඉතා අශෝභන දෙයක් ලෙස පියසි පියතුමාට පෙනී ගියේ ය. එතුමා මෙ වැනි දෙයක් බලාපොරොත්තු නොවූවා නො වේ. එහෙත් මේ හැඟීම් බැතිමතුන් තුළ ඇති වූයේ එතුමා බලාපොරොත්තු වූ පිළිවෙළට නො වේ. නොඉවැසිල්ලෙන් සිටින පූජකයකු දුටුවිට පියතුමා ඔහුට තරවටු කෙළේ ය. "සොසිමා තාවුසා ගේ මෘතදේහයෙන් මේ තරම් ඉක්මනට හාස්කම් බලාපොරොත්තු වීම සාමාන්‍ය මිනිසා තුළ පවතින චපල කම හඟවන්නෙකි. එහෙත් අප වැනි අය එ වැනි දෙයක් බලාපොරොත්තු වීම ඉතා අශෝභනයි" එතුමා කී ය.

එහෙත් පියසි පියතුමා ගේ කතාවට වැඩි සැලකිල්ලක් නො-දක්වන ලදි. ඒ බව දනගත් පියතුමා මදක් නොසන්සුන් විය. (එහෙත් සත්‍ය නොසඟවා කීමට නම්) අවට සිටි අය තුළ පැවැති බලාපොරොත්තුව හා නොඉවැසිල්ල, ඔවුන් ගේ අනුවණ කම, හිස්කම හා අහංකාරකම පිළිබිඹු කරන්නක් විය. එතුමා ඒ ගැන කිපුණේ ය. එහෙත් තමා තුළ ද එ වැනි ම බලාපොරොත්තුවක් හා නොඉවැසිල්ලක් ද පවතින බව පියසි පියතුමා දන සිටියේ ය. කෙසේ වෙතත් තම සිතේ බිය සැක ඇති කරවන පුද්ගලයන් හමුවීම පියතුමා අප්‍රසන්න දෙයක් ලෙස සැලකුවේ ය. තවුසා ගේ මිනිය තැන්පත් කර තිබුණු කුටියේ රැකිටින් හා ඔප්ඩොස්කියේ සිට පැමිණ, තවමත් ආරාමයේ ලැගුම් ගෙන සිටින පූජකයා දකින විට පියසි පියතුමා ගේ සිතේ බලවත් පිළිකුලක් ඇති විය. (එ වැනි පිළිකුලක් ඇතිවීම ගැන පියතුමා තමාට ම දොස් පවරා ගත්තේ ය.) කිසියම් හේතුවක් නිසා පියතුමා තුළ හදිසියෙන් ම මේ දෙදෙනා ගැන සැක පහළ විය. එහෙත් එ තැන රැස් ව සිටි අනෙක් අය ගැන ද එතුමා තුළ සැක පහළ වන්නට ඉඩ තිබුණේ ය.

නොසන්සුන් වූ පිරිස අතරේ සිටි ඉතා ම කලබලකාරි පුද්ගලයා ඔප්ඩොස්කියේ සිට පැමිණි පූජකයා ය. ඔහු හැම තැන ම දක්නා ලදි. ඔහු හැම දෙනා ගෙන් ම ප්‍රශ්න ඇසුවේ ය. හැම දෙනා ගේ ම කතාබහට සවන් දුන්නේ ය. අද්භූත දෙයක් ගැන රහසින් කතාකරන්නාක් මෙන් හැම දෙනා සමඟ රහසින් කතා කෙළේ ය. ඔහු මහත් නොඉවැසිල්ලෙන් හා නොසන්-සුන්කමින් සිටින බව පෙනේ.

රැකිටින්, හොලාකෝ මැතිනිය ගේ නියමය පිට උදෑසනම තාපසාරාමයට පැමිණි බව පසු ව දනගන්නට ලැබිණි. කරුණාවෙන් පිරි හදවතක් හා දුබල සිතක් ද ඇති ඒ ඉගිරියට තපෝවනයට ඇතුළු වීමට නුපුළුවන් විය. උදේ අවදි වූ හැටියේ ම තවුසා ගේ මරණය ගැන ආරංචි වූ පසු ඇය තුළ බලවත් කුතුහලයක් ඇති විය. නොඉවැසිල්ලට පත් ඕ වහා රැකිටින් කැඳවා, තපෝ වනයට ගොස් ඉතා පරිස්සමින් සිට, එහි සිදු-වන හැම දෙයක් ගැන ම විස්තරයක් පැය භාගයෙන් භාගයට තමාට ලියා එවන ලෙස දන්වා පිටත්කොට යැව්වා ය. ඇ පිළිගෙන සිටියේ රැකිටින් ආගමට ලැදි බැතිමත් තරුණයකු හැටියට ය. තමාට වාසියක් සැලැසෙන බව දනගත් හැටියේ ම මිනිසුන්ට උවමනා ලෙස කටයුතු කරමින් ඔවුන් ගේ සිත් දිනා ගැනීමට රැකිටින් සමතෙකි.

එය දීප්තිමත් දිනයකි. ආශ්‍රමයට පැමිණි ජනයා මිනීවළ-වල් අතරේ රැස් වී හුන්හ. දේවස්ථානය වටේ මිනීවළවල් බොහෝ වූ අතර තපෝවනයේ මිනීවළවල් තිබුණේ ඉතා සවල්පයකි. අසපුව වටේ යමින් සිටි පියසි පියතුමාට අලෝෂා ගැන සඳහන් විය. පෙර දින රෑ දුටුවාට පසු යළි අලෝෂා නොදුටු බව එතුමාට කල්පනා විය. අලෝෂා ගැන මතක් වූ වහා ම එතුමා තපෝවනයේ කෙළවර, බොහෝ කාලයක සිට සිල්වත්කම ගැන ප්‍රසිද්ධ ව සිට මිය ගිය පියතුමකු ගේ සොහොන්කොතක් මත හිඳින අලෝෂා දුටුවේ ය. අසපුව දෙසට පිටිපස හරව තාප්පය දෙසට මුහුණ ලා හුන් අලෝෂා සොහොන්කොත පිටිපස සැඟැවී සිටින්නා සේ පෙනේ. දෑතින් මුහුණ වසාගත් ඔහු සෙමෙන්, එහෙත් දැඩි සෝකයෙන් ඉකිගසමින් අඬන බවත්, ඒ සමග ඔහු ගේ සර්වාංගය ම ගැහෙන බවත්, ඔහු ළඟට ගිය පියතුමා දුටුවේ ය. පියතුමා කතා කළේ මද වේලා-වක් අලෝෂා දෙස බලාසිටීමෙන් පසු ව ය.

"පුතා, ඔය ඇඬුවා ඇති"යි පියතුමා අන්තිමේ දී ආදරයෙන් කී ය. "ඇයි අඬන්නේ? අඬනවා වෙනුවට ප්‍රීතිවන්න, සොසිමා පියතුමා ගේ ජීවිතයේ ඉතා ම උසස් දිනය අද බව දන්නේ නැද්ද? මේ මොහොතේ දී එතුමා සිටින තැන ගැන පමණක් කල්පනා කරන්න."

දරුවකු මෙන් ඇඬීම නිසා ඉදිමුණු මුහුණ වසා ගෙන සිටි දෑත ඉවත් කළ අලෝෂා හිස උස්සා පියතුමා දෙස බැලුවේ ය. එහෙත් මුවෙන් නො බැණ ඉවත බලාගත් තරුණයා යළි දෑතින් මුහුණ වසාගත්තේ ය.

"කැමැති නම් අඬන්න. ඔය කඳුළු දී තියෙන්නේ ක්‍රිස්තුන් වහන්සේ යි. සමහර විට ඇඬීමෙන් යහපතක් වන්නට පුළුවනි"යි පියතුමා කීවේ මදක් කල්පනා කිරීමෙන් පසු ව ය.

"ඇඬීමෙන් ආත්මයට සැනැසීමක් ලැබෙන අතර සිතේ ප්‍රීතිය ඇතිවීමට ද උපකාර වෙනවා,"යි අනතුරුව පියතුමා තමාට ම කියාගත්තේ එ තැනින් ඉවත් ව යන අතරේ අලෝෂා ගැන ආදරයෙන් කල්පනා කරමිනි. එතුමා වහා එ තැනින් ඉවත් ව ගියේ අලෝෂා අඬන හැටි දකීමෙන් තමාට ද ඇඬෙන්-නට පුළුවන් ය යන බියෙනි.

ක්‍රමයෙන් කාලය ගත විය. මිය ගිය තවුසා වෙනුවෙන් ආගමික පූජා හා මෘතශාන්තිකර්මය ද පවත්වන ලදි. පියසි පියතුමා ආයෙත් මිනිය අසල, ඉවෝසි පියතුමා හුන් තැන හිඳ බයිබලය කියවන්නට විය. එහෙත් සවස තුන වීමට කලින්, මා විසින් පසුගිය ග්‍රන්ථයේ අවසානයේ දී සඳහන් කරන ලද දෙයට තුඩුදුන් දෙයක් සිදු විය. අප කිසිසේත් බලාපොරොත්තු නොවූ, එමෙන් ම අප මෙතෙක් වේලා දැකගැනීමට පුළුපුලා සිටි හාස්කමට ඉදුරා වෙනස් දෙයක් ම සිදු විය. මේ නොවැද-ගත් සිද්ධිය අද දින දක්වා අපේ නගරයේත් අවට ගම් නියම්ගම්වලත් සවිස්තර ව සඳහන් ව තිබෙන බව මම ආයේත් මෙහි ලා සඳහන් කරමි. ඇත්ත වශයෙන් මෙය කිසි ම වැද-ගැම්මකට නැති ස්වාභාවික දෙයකි. එහෙත් බොහෝ දෙනකුට මහත් සිරිහැරයක් වූ, එමෙන් ම මහත් පෙරළියක් ඇති කළ මේ සිද්ධිය ගැන ආයේත් සඳහන් කිරීම සිතේ පිළිකුල් උපදවන්නක් බව මම පෞද්ගලික ව දනිමි. මගේ කතාවේ ප්‍රධාන තැනක් ගත්, එහි අනාගත වීරයා වන අලෝෂා ගේ හදවතේ හා ආත්මයේ උග්‍ර බලපෑවැත්මක් ඇති නො කළේ නම් මම මේ සිද්ධිය මගේ කතාවට කොහෙත්ම ඇතුළත් නො කරමි. මේ සිද්ධිය අලෝෂා ගේ ආධ්‍යාත්මික දියුණුවෙහි වැදගත් එහෙත් අවදානම් අවස්ථාවක් විය. මෙ සිද්ධිය ඔහු ගේ බුද්ධිය දෙදරා, මිය යනතෙක් ශක්තිමත් කොට, ජීවිතයට නියම පරමාර්ථයක් ලබා දුන්නේ ය.

නැවැත අපි කතාවට බසිමු. එ දින එළිවීමට කලින් සොසිමා තවුසා ගේ මෘතදේහය පෙට්ටියක තැන්පත් කොට කුටියේ තැබූ පසු කුටියේ කවුළු ඇර තැබිය යුතු ද නැද්ද යන ප්‍රශ්නය එහි රැස්ව සිටි අය අතරේ මතු විය. යම්කිසිවකු විසින් අහම්බෙන් මතු කරන ලද මේ ප්‍රශ්නයට පිළිතුරු නොදීම පමණක් නො ව කිසි ම සැලකිල්ලක් ද නොදක්වන ලදි. සාන්තුවරයකු වැනි මේ උත්තමයා ගේ මෘතදේහය කුණු වී දුගඳ හැමීම සැබැවින් ම න්‍යාය විරෝධි දෙයක් බව එහි රැස් ව සිටි අය කල්පනා කරන්නට ඇත. ඔවුන් බලාපොරොත්තු වූයේ මීට ඉදුරා වෙනස් දෙයකි. එ හෙයින් භක්තිය නැතිවීම අනුකම්පාව ඇති කරවන දෙයක් යයි ඔවුහු කල්පනා කළහ.

බලව, මද්දහනට පසු ව කිසියම් දෙයක් සිදුවන ලකුණු පහළ විය. පළමු ව මේ ලකුණු දක්නා ලද්දේ කුටියට පැමිණි අය විසිනි. එහෙත් ඒ බව නවෙකකුට සඳහන් කිරීමට පවා බිය වූ ඔවුහු නිහඬ ව සිටියෝ ය. එහෙත් සවස තුන වන විට

ඒ ලකුණු කොතරම් පැහැදිලි ව දක්නා ලද්දේ ද කියතොත් ඒ ගැන සැක කිරීමට පවා ඉඩක් නො තිබිණි. පළමු ව එය අසපුවේ රැස් ව සිටි පූජකයන් හා අමුත්තන් ද අතරේ පැතිරී ගියේ ය. අනතුරු ව ආශ්‍රමයේ සිටි පූජකයන් තුළ පුදුමය ඇති කරවමින් එය ආශ්‍රමයට ද සැළ විය. වැඩි වේලා යන්නට කලින් එවැනි දෙයක් විශ්වාස කරන අය ද, නොකරන අය ද, පුදුමයට පත්කරවමින් නගරය පුරා පැතිරී ගියේ ය. මේ පුවත අසා ආගමිභක්තියෙන් තොර වූ අය ප්‍රීති වූහ. මිය ගිය තවුසා වරක් අනුශාසනාවක දී සඳහන් කළ "ධර්මිෂ්ඨයා විනාශයට හා නින්දාවට පත් වන සැටි දකිමට මිනිසා තුළ මහත් ආශාවක් ඇත්තේ ය" යන කියමන සනාථ කිරීමට මෙන් ආගමිභක්තිය නැති අයට වඩා ඇති අය ප්‍රීති වූහ.

මේ සිද්ධිය නම් මිනිපෙට්ටියේ සිට දුගඳක් පිටවීම ය. පළමු ව මඳ වශයෙන් ඇති වූ මේ දුගඳ ක්‍රමයෙන් වැඩි වෙමින් සවස තුන වන විට කාටත් දැනෙන්නට විය. අපේ ආශ්‍රමයේ මුළු ඉතිහාසයට ම මෙවැනි අපකීර්තියක් ඇති නො වී ය. මේ දුර්ගන්ධය ගැන ඇත්ත දැනගත් වහා ම ආශ්‍රමයේ පූජකයන් තුළ ද, ඉතා අශෝභන නොසන්සුන් කමක් ඇති විය. මෙවැනි අපකීර්තියක් වෙන කිසිවකින් ඇති විය නො හැකි ය. හවුරුදු බොහෝ ගණනකට පසු ව ද එ දවස සිහි කළ සමහර නුවණැති පූජකයෝ පවා එද ඇති වූ ඒ අපකීර්තිය එතරම් උග්‍ර තත්ත්වයකට පත්වීම ගැන පුදුම වූවා පමණක් නො ව, භීතියට ද පත්වූවෝ ය. දේව භය ඇත්තා වූ සිල්වත් බැතිමතුන් විසින් සාන්තුවරයන් ලෙස පිළිගෙන වැඳුම් පිදුම් කළ පූජකයන් පවා මියගොස් ඇත. හැම මළමිනියකින් ම වැහෙන්නා වූ දුර්ගන්ධය එම පූජකයන් ගේ මළමිනිවලින් ද ස්වාභාවික ලෙස පැතිර ගියේ ය. එහෙත් ඉන් කිසි ම අපකීර්තියක් ඇති නො වී ය. නොසන්සුන් කමක් ඇති නො වී ය. ඉතා භක්තියෙන් සිහි කරනු ලබන සාන්තුවරයන් අතීතයේ ආශ්‍රමවල වැඩ විසූ බව සැබෑ ය. පැරණි චාරිත්‍ර ධර්ම අනුව ඔවුන් ගේ මෘතශරීර නො දිරා පවතියි. මෙය සිතේ භක්තිය ඇති කරවන අද්භූත කරුණක් ලෙස පූජකයෝ පිළිගතිති. එය දේව අනුහසින් ඇති වූ හාස්කමක් හැටියට ද, අනාගතයේ දී මේ සාන්තුවරයන් ගේ සොහොන් තුළින් ශ්‍රේෂ්ඨ කීර්තියක් ඇති වී පැතිරයන බවට දෙවියන් විසින් දෙන ලද පොරොන්දුවක් ලෙස ද; ආරක්ෂා කරනු ලැබේ.

මීට හවුරුදු හැත්තෑවකට පෙර, හවුරුදු එකසිය පහක් අංයු වළඳ මියගිය ජෝබ් නමැති මහලු පූජකයා මෙසේ ආදරයෙන් සිහි කරනු ලබන්නෙකි. එතුමා නිතර උපවාසයෙහි යෙදෙමින් තුෂ්ණීම්භූත ව සිටි සුප්‍රසිද්ධ තවුසෙකි. තපෝවනයට පැමිණි හැම ආගන්තුකයකුට ම තවුසා ගේ සොහොන් කොත අමුතු ගෞරවයකින් හා, ඒ ගැන ඇති කරගත් උසස් බලාපොරොත්තු හඟවන අද්භූත හැඟිමෙන් යුතු ව ද පෙන්වන ලදී. (එ දින උදේ පියසි පියතුමා අලෝෂා සිඳිනු දුටුවේ මේ සොහොන් කොත උඩ ය.) ආශ්‍රමයේ ආදරයෙන් සිහි කරනු ලබන අනෙක් පූජකයා නම් වාසනෝපි පියතුමා ය. එතුමා ජීවත්ව සිටි කාලයේ දී අශ්‍රමයට පැමිණි වන්දනාකාරයන් එතුමාට ගරු බුහුමන් දක්වූයේ එතුමා උමතු සාන්තුවරයකු ලෙස පිළිගෙන ය මෙ පූජකයන් දෙදෙනා ම පණ පිටින් සිපින්නාක් මෙන් මිනීපෙට්ටිවල තැන්පත් කර තිබුණු බවත්, භූමදානය කරන විට දුගඳක් නොදැනුණ බවත්, ඔවුන්ගේ මුහුණු ශුද්ධ වූ ආලෝකයකින් දීප්තිමත් වූ බවත්, කියනු ලැබේ ඔවුන් ගේ මළමිනීවලින් සුවඳක් පිට වූ බව සමහරු තරයේ ම කියා සිටිති.

මෙ වැනි උතුම් දේවල් මතක තිබියදීත්, අවට ඇති වූ වැදගැම්මකට නැති විහිළුවට, හාස්‍යජනක න්‍යාය විරෝධී කතාවට හා දෝෂයට සොසිමා තවුසා ගේ මෘතදේහය බඳුන් වූ හේතුව කිව නො හැකි ය. මගේ අදහසේ හැටියට මේ තත්ත්වය පැන නැගුණේ එකිනෙකට පටහැනි වූ කාරුණු කිපයක් ම එකවිට ක්‍රියාත්මක වීම නිසා ය. ඉන් එක් කරුණක් නම් මේ තාපස නිකාය කෙරෙහි මුල්බැසගත් අනපීදයක වූ චාරිත්‍ර ධර්මයක් ලෙස සලකනු ලබන විරුද්ධත්වයයි. ඒ වෛරය බොහෝ පූජකයන් ගේ සිතේ පතුලේ සැඟවී පැවැතිණි. තවුසා ජීවත්ව සිටිය දී එතුමා සාන්තුවරයකු ලෙස පිළිගන්නා ලදි. මෙ පිළිගැනීම කො තරම් මුල් බැස ගෙන තිබුණේ ද කියතොත් ඒ ගැන ප්‍රශ්න කිරීම පවා නුසුදුසු ක්‍රියාවක් ලෙස සලකන ලදී. එතුමාට දක්වන ලද ඊරිසියාව අනෙක් හැම දෙයකට ම වඩා බලවත් විය. හාස්කම්වලට වඩා උතුම් වූ ප්‍රේමයෙන්, බොහෝ දෙනකු පහදවා ගැනීමට තවුසා සමත් විය. එ හෙයින් එතුමා පිරිවරාගත් විශාල අනුගාමික පිරිසක් ද විය. මේ නිසා බොහෝ දෙනකු තුළ තවුසා ගැන ඊරිසියාවක් ඇති විය. ඒ සමග ආශ්‍රමයේ පමණක් නො ව ඉන් පිටත ද රහසින් හා එළිපිට එතුමාට සතුරුකම් කරන පිරිසක් සිටියේ ය. එතුමා කිසි ම කලක කිසි ම කෙනකුට හිරිහැර නො කළේ ය. එහෙත් "එතුමා සාන්තුවරයකු ලෙස පිළිගන්නේ මන් ද?" යන ප්‍රශ්නය නිතර ඇසීම නිසා

අන්තිමේ දී බොහෝ දෙනකු තුළ තෘප්තියට නොහත් වෛරයක් ඇති වීය. එතුමා මිය ගොස් දවසක් ගත වන්නට කලින්, ඉතා ඉක්මනින් ඇති වූ දුගඳ ගැන බොහෝ දෙනකු අතිශය ප්‍රීතියට පත් වූයේ මේ කාරණ නිසා යයි මම විශ්වාස කරමි. මේ සිද්ධිය නිසා කෝපයට පත්, අවඥාවට බඳුන් වූ කීප දෙනෙක් තවුසාට මහත් භක්තියෙන් සැලකූ අය අතර වූහ. එය සිදු වූයේ පහත සඳහන් ක්‍රමයට ය.

මිනිය කුණුවන බවට ලකුණු පහළ වූ වහා ම පූජකයෝ කුටියට රැස්වීමෙන් මෙතෙක් කල් ඔවුන් තුළ සැඟැවී පැවැති දුෂ්ට අදහස් එළි කළහ. කුටියට ගිය ඔවුන් එහි ටික වේලාවක් නතර වී සිට අනතුරුව වහා පිටවී ආවේ අනෙක් පූජකයන්ට ආරංචිය දන්වීම පිණිස ය. එළියේ සිටි පූජකයන් ගෙන් සමහරු ශෝකයෙන් හිස් වනන අතර අනෙක් අය ඔවුන් ගේ ද්වේෂයෙන් පිරි නෙත් තුළ බැබැළෙන ප්‍රීතිය සඟවා ගැනීමටවත් වෑයම් නො කළහ. දැන් ඔවුන්ට දොස් කීමට කිසිවෙක් නැත. පූජකයන් වැඩි දෙනකු මිය ගිය තවුසාට බැතිමත් ව සිටි හෙයින් එතුමාට කළ අපහාසයට විරුද්ධ ව කිසිවකු කතා නොකිරීම පුදුමයට හේතුවක් විය. එහෙත් මේ වේලාවේ දී දෙවියන් වහන්සේ වැඩිදෙනා ගේ පක්ෂයට ඉතා සුළු වේලාවකට ඉඩ දුන්නාක් මෙන් පෙනේ.

දුර බැහැර සිට පැමිණි අය, වෙසෙසින් ම උගත් අය, ඇති තතු දැනගැනීමේ කුහුල් සිතින් වහා කුටියට ගියහ. තපෝවනයට පිවිසෙන ගේට්ටුව ළඟ ගැමියන් බොහෝ දෙනකු රැස්වී සිටියත් කුටිය තුළට ගියේ ඉතා ස්වල්ප දෙනෙක් පමණි. සවස තුනෙන් පසු විශාල පිරිසක් පැමිණෙන්නට වූයේ මේ සංවේගදායක ආරංචිය නිසා බවට කිසි ම සැකයක් නැත. එ දින පැමිණීමට නොසිටි අය ද, පැමිණීමට කිසි ම අදහසක් නැති ව සිටි අය ද, පැමිණියහ. ඔවුන් අතරේ උසස් අය ද වූහ. ඒ පිරිස අතරේ බාහිර සන්සුන්කම තවමත් දකින්නට තිබිණි. කිසියම් අමුත්තක් දකින්නට තිබෙන බව දැනගත් පයිසි පියතුමා ඒ බව නොහඟවා කිසිවක් නො දන්නාක් මෙන් ඉතා සන්සුන් පැහැදිලි හඬින් බයිබලය කියෙව්වේ ය. එහෙත් සෙනඟ අතරේ මුල දී සෙමෙන් පැවැති කතාව ක්‍රමයෙන් වැඩි වන බව පියතුමාට පවා ඇසිණි. "මේකෙන් පේනවා දෙවියන් ගේ විනිශ්චය මිනිසා ගේ විනිශ්චයට වඩා වෙනස් බව" යයි කියන කතාව හදිසියෙන් ම පියතුමාට ඇසිණි. මෙසේ පළමු වරට හඬ නගා සිය අදහස පළ කළේ බැතිමතකු ලෙස පිළිගත් නගරයේ වයසක මහළු නිලධරයෙකි. ඔහු කළේ මෙතෙක් වේලා

පූජකයන් විසින් රහසින් කියන ලද දෙය හඩ නගා කීම පමණි. ඔවුහු බොහෝ වේලාවක සිට මේ දුෂ්ට නිගමනයට එළැඹ සිටියහ. මින් ඉතා ම නපුරු වූයේ මෙසේ ඇතිකරගත් නිගමනයෙන් හටගත් ජයග්‍රාහක තෘප්තිය හැම මොහොතක් පාසා ම පෙනෙන්නට වීම ය. වැඩි වේලා යන්නට පෙර ඔවුහු එම ස්ථානයේ පැවැති නිශ්චලතාවට පවා බාධා කළහ. එසේ බාධා කිරීම තමන් සතු අයිතියක් යයි ඔවුන් සිතන්නට ඇත.

“මෙ වැනි දෙයක් සිදුවුණේ මොන හේතුවක් නිසා දැ” යි පළමු ව සඹහර පූජකයන් විමසුවේ පසුතැවිල්ලෙන් හිස වනමිනි. තවුසා උස මහත මිනිහෙක් නො වෙයි. එතුමාට තිබුණේ වියළුණු සිහින් ශරීරයක්. එහෙම නම් මෙ තරම් ඉක්මනට එතුමා ගේ මිනිය කුණු වුණේ කොහොම ද?”

“මෙය දෙව්ලොවින් පෙන්වන ලකුණක් වෙන්න ඕනෑ” යි අනෙක් අය වහා පිළිතුරු දුන්හ. ඔවුන් ගේ ඒ මතය කිසි ම විරුද්ධත්වයක් නොදක්වා වහා පිළිගන්නා ලදි. පව්කාරයකු ගේ මිනියක් සාමාන්‍යයෙන් කුණු වන්නේ පැය විසිහතරකට පසු ව බව පෙන්වා දෙන ලදි. එහෙත් මෙසේ කලින් කුණුවීම 'අස්වාභාවික දෙයකි.' එ හෙයින් මෙය දේව උදහසින් වන දෙයක් බව පැහැදිලි ය. එය කිසියම් දෙයක පෙර නිමිත්තකි. මෙ වැනි නිගමනයකට බැසීම නොවැළැක්විය හැකි ය,

පුස්තකාලයාධිපති ඉවෝසි පියතුමා දිවංගත තවුසා ප්‍රිය කළ තැනැත්තෙකි. “ධර්මිෂ්ඨයන් ගේ මෘතදේහ නොදිරන්නේ ය යන විශ්වාසය හැම තැන ම තිබෙන දෙයක් නොවේ” යයි කියමින් එතුමා දුදනාන් ගේ බසට පිළිතුරු දීමට වෑයම් කෙළේ ය. ධර්මිෂ්ඨයන් ගේ මෘතදේහ නො දිරා පැවැතීම සත්‍ය ලබ්ධික සභාවේ චිරන්තන දෘෂ්ටියක් නො ව අදහසක් පමණක් බවත්, නිදසුනක් වශයෙන් සත්‍ය ලබ්ධිය පවතින ඇතෝසය වැනි පළාත්වල ද මළමිනියකින් පිටවන දුගඳ ගැන එ තරම් කලබල නොවන බවත්, ආත්මය ගලවාගත් අය විසින් ලබන ලද ශ්‍රේෂ්ඨත්වය මනින්නේ මෘතදේහය නො දිරා පැවැත්මෙන් නො ව බොහෝ කලක් වළලා තබා, මස පොළොවට පස් වූ පසු කටුවල ඇති වන වර්ණයෙන් බවත් කී ය. “ශරීරයේ ඉතිරිවන ඇට ඉටි මෙන් කහ පාට නම් එය දෙවියන් වහන්සේ විසින් මිය ගිය සාන්තුවරයා ශ්‍රේෂ්ඨත්වයට පත් කළ බව හඟවන ලකුණක්. යම් විදියකින් ඇට කළුපාට නම් ඉන් හැඟෙන්නේ දෙවියන්

වයාත්ගේ මිය ගිය සාන්තුවරයා ශ්‍රේෂ්ඨත්වයට පත් කිරීම ප්‍රතික්ෂේප කළ බවයි. පුරාණයේ සිට සත්‍ය ලබ්ධිය නිර්මල ව පැවැත එන ආශ්චර්ය වැනි උසස් තැනක පවතින විශ්වාසයත් එයමයි'' පියතුමා අවසාන වශයෙන් කී ය.

එහෙත් මේ නිහතමානී පියතුමා ගේ කතාවෙන් වැඩක් නො වී ය. එය සමහරුන් ගේ සිනාවට හේතු විය. "මෙය අහන්නට පවා නුසුදුසු පණ්ඩිත මානී කතාවකි. නවීන සිද්ධාන්තයකි''යි පූජකයෝ නිගමනය කළහ. "අපි අපේ පරණ පුරුදු බණ විශ්වාස කරමු. මේ කාලේ ඔය විදියේ නොයෙක් නවීන අදහස් තියෙනවා. අප ඒ අදහස් විශ්වාස කළ යුතුද'' යි අසමින් අනෙක් අය තර්ක කළහ.

"ඔවුන්ට එගේ අපටත් සිල්වත් පූජකවරු සිටියා. තුර්කි ජාතිකයන් අතර සිටින ඔවුන්ට හැම දෙයක් ම අමතක වෙලා. ඔවුන් ගේ ධර්මය අපිරිසුද්ද වෙලා දැන් බොහොම කල්. වෙනෙකක් තබා ඔවුන්ට ගහන්න සණ්ඨාවක්වත් නැහැ''යි සමහරු අවඥා කරමින් කීහ.

ශුවෝසි පියතුමා දුක් වෙමින් යන්නට ගියේ තමා ඉදිරිපත් කළ අදහස ගැන තමා තුළ ද විශ්වාසයක් නැත්තාක් මෙනි. ඉතා අශෝභන දෙයක් සිදුවන බවත්, විනයගරුක නොවීමේ ලකුණු පහළ වන බවත් එතුමා කල්තියා දුටුවේ ය. ශුවෝසි පියතුමා මෙන් නුවණැති හැම පූජකයෙක් ම ඒකින් ඒක නිහඬ වූහ. දිවංගත තවුසාට ලැදිව සිටි, එසේ ම තාපස නිකාය භක්තියෙන් පිළිගත් හැම දෙනා ම දුර්මුඛ වූහ. වෙනෙකක් තබා හමුවූ හැම විට ම ඔවුන් එකිනෙකා ගේ මුහුණු දෙස බැලුවේ බියෙන් හා සැකයෙන් ද යුතු ව ය. අනෙක් අතින් තාපස නිකායට සතුරු කම් කළ අය මහත් ගර්වයෙන් යුතුව හිස් කෙළින් තබා ගෙන සිටිය හ. "වාසනෝපි පියතුමා මළාට පස්සේ සුවඳ හැමුවා මිස මේ වගේ කුණු ගඳ ගැහුවේ නැහැ. එතුමා එ වැනි ශ්‍රේෂ්ඨත්වයක් ලැබුවේ තාපසයකු වූ නිසා නො වෙයි, අංගමට ලැදි වූ නිසයි'' ඔවුහු දුෂ්ට චේතනාවෙන් පසු ගිය දෙයක් සිහි කොට කී හ.

අනතුරු ව ඔවුහු දිවංගත තවුසා විවේචනය කරමින් දොස් කියන්නට වූහ. "තවුසා දේශනා කළ ධර්මය බොරුවකි. ජීවිතය උතුම් සැපතක් මිස දුකක් නො වේය කියා ඉගැන්නුවා''යි කිසි ම යුක්ති ධර්මයක් නොදත් අය කීහ. "නවීන අදහස් පිළිගත් තවුසා අපායේ ගිනි දල් තිබෙන බව විශ්වාස කළේ නැහැ''යි ඊටත්

වඩා යුක්ති ධර්මයක් නොදත් අය කීහ. "එතුමා නියම විදියට උපවාසයේ යෙදුණේ නැහැ. පැණි රස කෑම කෑවා. චෙරි ජෑම් කාලා තේ වතුර බිව්වා. එතුමාට චෙරි ජෑම් එවන්නේ ගෑනු. දැඩි සිලයක් රකින තවුසකුට තේ වතුර බීම සුදුසු ද?"යි තවුසාට ඊරිසියා කළ අය ප්‍රශ්න කළහ. "මිනිහ බොහොම ආඩම්බර යි. එයා හිතාගෙන හිටියා එයා සාන්තුවරයෙක් ය කියා. එයා ඉදිරිපිට කවුරුත් දණින් වැටී වඳින්න ඕනෑ. ඒක තමා විසින් ලැබිය යුතු ගෞරවයක් කියා හිතාගෙන හිටියා'යි අසික ද්වේෂයෙන් පෙළෙන අය පලිගැනීමේ චේතනාවෙන් කීහ. "එතුමා සක්‍රමේන්තුවට අපහාස කළා"යි තාපස නිකායයේ විරුද්ධවාදීහු රහසින් කීහ. මෙ පිරිස අතරේ දැඩි භක්තියෙන් යුත්, නියම ලෙස තවුස්දම් රකින මහලු පූජකයෝ ද වූහ. මෙතෙක් කල් තුෂ්ණිම්භූත ව සිටි ඔවුහු මේ අවස්ථාවේ දී හදිසියෙන් ම කතා කරමින් සොසිමා තවුසාට දෙස් කියන්නට පටන් ගත්හ. මෙසේ ගුණ දෙස් කීම විපත්තිදායක වූයේ තවමත් ස්ථිර විශ්වාසයක් නැතිව සිටින තරුණ පූජකයන් කෙරෙහි එය තදින් බලපැවැත්වූ නිසා ය. ඔප්ඩෝස්කියේ සිට පැමිණි පූජකයා සුසුම් හෙළමින් හිස වනමින් මේ හැම කතාවකට ම සවන් දුන්නේ ය "ඇත්ත ඇත්ත ඊයේ පෙරාපොන් තවුසා කියාපු කතාව ඇත්ත"යි ඔහු කී ය. එතැන පැවැති නොසන්සුන්කම වැඩි කිරීමට මෙන් ඒ මොහොතේ දී පෙරාපොන් තවුසා පැමිණියේ ය.

මී මැස්සන් ඇති කරන ස්ථානය අසල පිහිටි එතුමා ගේ ලීයෙන් තැනූ අසපුවෙන් එතුමා පිටත නොයන බව මම ඉහත සඳහන් කෙළෙමි. එමතුද නො ව, එතුමා කලාතුරකින් හෝ දේවස්ථානයට පවා යන්නේ නැත. එතුමා ගේ මේ නොසැලැකිල්ල, උමතු ව නිසා ඇති වූවෙක් යයි අදහස් කළ ආශ්‍රමයේ වැඩ වෙසෙන අනෙක් පූජකයෝ, එතුමා විනය ගරුක නොවීම ගැන ද වැඩි සැලැකිල්ලක් නොදැක්වූ හ. එහෙත් ඇත්ත ඇති සැටියෙන් පවසන්නේ නම් පෙරාපොන් තවුසා ගේ හැසිරීම ගැන අනෙක් පූජකයන්ට කිසිවක් කළ නො හැකි විය. රෑ දවල් දෙකේ යාච්ඤා කරන්නා වූ (වෙනෙකක් තබා දණගසා ගෙන හිඳගන්නා වූ) උතුම් තවුසකු ලවා විනය නීති රැක්කවීම නින්දිත ක්‍රියාවක් වනු ඇත. යම් ලෙසකින් එතුමා විනය ගරුක කිරීමට වෑයම් කළොත් "එතුමා අපට වඩා සිල්වත් ය. අප රකින විනයට වඩා දැඩි විනයක් රකින්නේ ය. එතුමා දේවස්ථානයට නොයන්නේ එහි යා යුතු නියම වේලාව නොදන්නා නිසා විය යුතු ය.

හැරත් එතුමා වෙන ම විනයක් රකින්නෙකි''යි ආශ්‍රමයේ අනෙක් පූජකවරුන් පවසනු ඇත. මෙසේ මේ උමතු තවුසාට සාමයෙන් සිටීමට ඉඩ දෙන ලද්දේ මෙවැනි පාපිෂ්ඨ කතා නතර කිරීමට ඉඩ ලබා ගැනීමට මෙනි.

මේ තවුසා, වෙසෙසින් ම සොසිමා තවුසා කෙරෙහි අප්‍රසාදයෙන් සිටිය බව කවුරුත් දනිති. දෙවියන්ගේ විනිශ්චය මිනිසා ගේ විනිශ්චයට සමාන නොවන බවත්, අස්වාභාවික වූ යම් කිසිවක් සිදු වී තිබෙන බවත්, කුටියේ සිටි පෙරාපොන් පියතුමාට දැනගන්නට ලැබිණි. පළමු ව මේ ආරංචිය ගෙන තවුසා ගේ කුටියට දිවගියේ ඔප්ඩෝස්කියේ සිට පැමිණි පූජකයා යැයි විශ්වාස කළ හැකි ය. පෙර දින සවස පෙරාපොන් තවුසා ගේ කුටියට ගිය මේ පූජකයා ඉන් පිට වූයේ මහත් භීති-යකින් යුතුව ය.

මෘතදේහය අසල නො සැලී හිඳ බයිබලය කියවමින් සිටි පයිසි පියතුමා කුටියෙන් පිට සිදුවෙන දෙය නොඇසූ බවත්, නොදුටු බවත්, මම ඉහත සඳහන් කොළෙමි. එහි රැස්ව සිටි අය පිළිබඳ වගතුග මැනැවින් දැනසිටි එතුමාට ඔවුන් අතරේ පවතින නොසන්සුන් කම ගැන නිවැරදි හැඟීමක් යම් සිතේ ඇති කරගත හැකි විය. එහෙත් ඉන් සසල නොවූ පියතුමා අනතුරැ ව සිදුවන්නේ කුමක් දැයි දැනගැනීමේ අදහසින් බියෙන් තොර ව බලා සිටියේ ය.

හදිසියෙන් ම එහි පැවැති නිසංසලයට බාධා කරමින් නැගුණු අපූරු ඝෝෂාවක් පියතුමා ගේ සවන් වැකිණි. හිටිහැටියේ ම කුටියේ දොර ඇරුණේ ය. දොර ළඟ පොරාපොන් තවුසා පෙනී සිටියේ ය. එතුමා පිටුපසින් නගරයේ සිට පැමිණි මිනිසුන් සමඟ පූජකයෝ කීප දෙනෙක් ද වූහ. කෙසේ වෙතත් කුටියට ඇතුළු නොවූ ඔවුහු පඩි පාමුල සිට තවුසා කුමක් කරන්නේ ද, කුමක් කියන්නේ දැයි දැනගැනීමේ ආශාවෙන් බලා හුන්හ. පෙරාපොන් තවුසා එහි පැමිණියේ නිකම් නොවන බව දැන සිටි ඔවුහු භීතියෙන් තැති ගත්හ. දොර ළඟ නතර වූ උමතු තවුසා දෑත එසෙවුවේ ය. එතුමා ගේ දකුණු අත යටින් ඔප්ඩොස්කියේ සිට පැමිණි පූජකයා කුතුහලයෙන් එබී බැලුවේ ය. මහත් කුහුල් සිතින් සිටි හෙතෙම, තවුසා පිටුපසින් පඩිපෙළ නැග දොර ළඟට ගියේ ය. එහෙත් තවුසා හඬ නගා කුටියේ දොර ඇරිය වහා ම එතුමා පිටු පසින් පැමිණි අනෙක් පිරිස හදිසියෙන් ම හටගත් භීතියෙන් පසුබා සිටියහ. දෑත ඔසොවා ගත් තවුසා මෙසේ කියමින් බෙරිහන් දුන්නේ ය.

"මම තොප එලවා දමමි"යි කියමින් බෙරිසන් දුන් තවුසා හැම පැත්තට ම හැරෙමින් කුටියේ බිත්ති හතරේ හා මුලු හතරේ කුරුසයේ ලකුණ ඇන්දේ ය. තවුසා පිටු පසින් පැමිණි පිරිස එම ක්‍රියාවේ අර්ථය වහා වටහා ගත්හ. එතුමා ගිය හැම තැනක දීම මෙසේ ක්‍රියා කරන බවත්, මෙසේ යක්ෂ භූතයන් පන්නා දමා මිස හිඳ නොගන්නා බවත්, කතා නොකරන බවත් ඔවුහු දැන සිටියහ.

"සාතන් මෙ තැනින් පිට වෙනු! සාතන් මෙ තැනින් පිට වෙනු!" එතුමා ඇන්ද හැම කුරුස ලකුණක් පාසා ම කී ය. "මම තොප එලවා දමමි"යි කියා අනතුරුව බෙරිසන් දුන්නේ ය.

එතුමා ඇඳ සිටියේ ඉඟ වටා ලණුවකින් ගැට ගසන ලද දිළ රෙදි කබායකි. පැසුණු ලෝමයෙන් වැසුණු ළය පෙදෙස හණ නූලෙන් කළ කමිසය යටින් පෙනේ. එතුමා පාවහන් පැළඳ නොසිටියේ ය. එතුමා දූත වනන්නට පටන්ගත් වහා ම ශරීරයට විද දීම පිණිස කබාය යටින් එල්ලා ගෙන සිටි යකඩ කැලිවලින් හඬක් නික්මිණි.

බයිබලය කියවීම නතර කළ පියසී පියතුමා හුන් තැනින් නැගිට, දොර ලගට ගොස්, උමතු තවුසා ඉදිරි පිට සිට ගත්තේ ය.

"ගරු පියතුමාණෙනි, ඔබ තුමා ආවේ මොක ද? පැරණි තවුසන්ට විරුද්ධ වන්නේ මොක ද? බැතිමතුන් අතර පවතින සාමයට බාධා කරන්නේ මොක ද?"යි පියතුමා තවුසා දෙස රවා බලා ප්‍රශ්න කෙළේ ය.

"මා ආවේ මොනවට ද කියා මගෙන් ඇසුවා නේද? එසේ නම් ඔබ තුමාගේ ආගම මොකක් ද කියා මට කියන්න"යි කියමින් තවුසා උමතුවෙන් කෑගැවේ ය. "මා ආවේ ඔබ තුමාගේ ආගන්තුකයන් වන අපිරිසුදු යක්ෂයන් එළවා දැමීමටයි. මා නැති අතර මේ ස්ථානයට යක්ෂයන් කී දෙනෙක් පැමිණ ඇද්දැයි බැලීමට පැමිණියා. මට ඕනෑ උන් පේරම කොස්සකින් අතුගා දමන්න යි."

"ඔබ තුමා යක්ෂයා එළවා දැමීමට සැරසෙන අතර යක්ෂයාට සේවය කරන බව පේනවා"යි පියසී පියතුමා නිර්භය ව කී ය.

"මම සිල්වන්තයෙක්මි. මම ශුද්ධවන්තයෙක්මි'යි කියන්න පුළුවන් කොයි සමතාට ද? ඔබ තුමාට කියන්න පුළුවන් ද?"

"මම අපිරිසුදු මිනිහෙක්, මම සිල්වන්තයෙක් නො වෙයි. එහෙත් මම සැප පුටුවක හිඳ ගෙන ප්‍රතිමාවකට වඳිනවා වගේ මිනිසුන් ලවා වැඳුම් ගත්තේ නැහැ"යි තවුසා ගිගුම් දුන්නේ ය. "මේ කාලේ මිනිස්සු සත්‍ය ධර්මය විනාශ කරනවා. මේ මළ මිනිහා, තුඹලා ගේ සාන්තුවරයා, යක්ෂයන් ගැන විශ්වාස කළේ නැහැ"යි තවුසා මිනීපෙට්ටියේ තැන්පත් කර තිබෙන සොසිමා තවුසා ගේ මිනිය දෙසට අත දිගු කොට සෙනග අමතා කීවේ ය. "යක්ෂයා එලවන්න එතුමා බෙහෙත් දුන්නා. ඉතින් ගෙයි මුලු-වල මකුණන් දැල් බඳිනවා වගේ මේ ස්ථානය යක්ෂයන්ගෙන් පිරෙන්න පටන් ගත්තා. දැන් එතුමා ගේ මිනියෙන් කුණු ගඳ ගහනවා. දෙවියන් වහන්සේ ගෙන් විපාක ලැබෙන හැටි එයින් අපට පේනවා."

තවුසා සඳහන් කළ පුවත මෙය සි. ආශ්‍රමයේ පූජකයෙක් සිහිනෙන් හඬ වන්නට විය. පසු ව අවදි ව සිටින විට යක්ෂ භූතයන් දැක තැති ගත්තේ ය. මෙසේ මහත්සේ තැති ගත් පූජකයා අන්තිමේ දී ඒ බව සොසිමා තවුසාට කීවේ ය. නිතර දෙවියන්ට යාච්ඤා කිරීමටත්, උග්‍ර ලෙස උපවාසයේ යෙදෙන්නටත් පූජකයාට තවුසා නියම කෙළේ ය. එහෙත් ඉන් පලක් නොලත් විට යාච්ඤා කිරීමෙහි හා උපවාසයෙහි ද යෙදෙන අතරේ විශේෂ බෙහෙතක් ගැනීමට තවුසා නියම කෙළේ ය. මේ බව අසා එකල බොහෝ දෙනා සංවේගයට පත්වූ හ. අනුන්ගේ දෙස් දැකීම පුරුද්දක් කරගත් අය මේ 'පුදුම' අනුශාසනාව ගැන වහ පෙරාපොන් තවුසාට පැමිණිලි කළහ. අනෙක් හැම දෙනාට ම වඩා සංවේගයට පත් වූයේ පෙරාපොන් තවුසා ය.

"පියතුමාණෙනි, කරුණාකර මෙ තැනින් පිට වී යන්නා දෙවියන් වහන්සේට මිස මිනියකුට විනිශ්චය කිරීමට පුළුවන් කමක් නැහැ"යි පියසි පියතුමා උස් හඬින් කී ය. "සමහර විට අපට පෙනෙන්න එ තිබෙන මේ ලකුණෙහි අර්ථය කුමක් ද කියා ඔබතුමාටවත්, මට වත්, මෙ තැන සිටින වෙන කිසිවකුටවත්, කියන්නට පුළුවන් කමක් නැහැ. පියතුමාණෙනි, මෙහි සිටින. බැතිමතුන්ට කරදර නො කර වහා පිට වී යන්න."

"සොසිමා තවුසා විනයානුකූල ව උපවාසයේ යෙදුණේ නැහැ. ඒ නිසයි මේ ලකුණු පහළ වී තියෙන්නේ. ඒක ඉතා පැහැදිලියි. ඒක සැඟවීමට වෑයම් කිරීම පාපයක්"යයි උමතු තවුසා පැවැසී ය.

කල්පනාශක්තිය ඉක්මවා ගිය උද්යෝගයෙන් පෙළෙන උමතු තවුසා නිහඬ කළ නො හැකි ය. "ගැනු සංක්කුවල දමාගෙන ආ පැණිරස කෑම කාලා මේ තවුසා දූෂණය වුණා. තෝ බිව්වා· රසවත් ආහාර පානයෙන් බඩ කට පුරවා ගන්නා අතර උඩගු කමින් හිස පුම්බා ගත්තා.........ඒ නිසා තමයි මොහු නින්දාවට පත්වුණේ."

"පියතුමාණෙනි, ඔබ තුමා ගේ කතාව බොහො ම ලාමකයි" පියසි පියතුමා උස් හඬින් කී ය. ඔබ තුමා ගේ උපවාසය හා වාන් ජීවිතය මම උසස් කොට සලකනවා. ඒ නමුත් ඔබ තුමා කතා කරන්නේ ලාමක, චපල, නොමේක්මුණු තරුණයකු හැටියටයි. පියතුමාණෙනි, වහා මෙ තැනින් ඉවත් වන ලෙස මම ඔබට අණ කරමි"යි කියමින් පියසි පියතුමා මහ හඬින් කෑගැවේ ය."

"හොඳයි, මම යන්නම්"යි මදක් නැති ගත් එහෙත් තවමත් කිපී සිටි තවුසා කීවේ ය. "උගතුන් වූ තමුන්නාන්සේලා මගේ අසරණකම පහත් කොට සලකනවා. මා මේ ආශ්‍රමයට ආවේ බොහො ම සුළු උගත්කමක් ඇතිව යි. ඒ සුළු උගත්කමත් දැන් මට අමතක වෙලා. තමුන්නාන්සේලා ගේ කපටිකමින් අසරණ වූ මා ආරක්ෂා කරගන්නා ලද්දේ දෙවියන් වහන්සේ විසිනි."

පියසි පියතුමා, උමතු තවුසා දෙය එඩිතර බැල්මෙන් බලා සිටියේ ය. මදක් නතර වූ තවුසා කලකිරුණු ස්වභාවයෙන් අත කම්මුල මත තබා, පෙට්ටියෙහි තැන්පත් කර තිබුණු දිවංගත තවුසා ගේ මෘතදේහය දෙස බලා මෙසේ කීවේ ය.

"හෙට මොහු ගේ මිනිය වලලන විට 'අසරණ අපට සරණ වන උතුමාණෙනි, අපේ ආරක්ෂකයාණෙනි' යන ගීය ගයනවා ඇත. එය ඉතා අලංකාර ගීයකි. ඒ නමුත් මා මළ පසු 'කුමන ලෞකික සැප ද?' යන කුඩා ගීය ගයනවා ඇත. නුඹලා අහංකාර කමින් ඉදිමිලා. මෙ තැන තුච්ඡ තැනක්." මෙසේ පිස්සකු මෙන් හිපිහැපියේ ම කෑගා කී තවුසා දූත වනා වහා ආපසු හැරී පඩි පෙල බැස ගියේ ය. පඩි පෙල මුල තවුසා බලාපොරොත්තු ව සිටි පිරිස කටයුතු නොකටයුතු දූ විසඳ ගත නො හැකි ව බලා සිටියේ ය. සමහරුන් තවුසා පිටුපසින් යන අතරේ අනෙක් අය නතර වූයේ තවමත් කුටියේ දොර වසා තිබෙන හෙයිනි. තවුසා පිටුපසින් පියගැට පෙල දක්වා ගිය

පියසී පියතුමා, ඔහු දෙස බලා සිටියේ ය. එහෙත් නොසන්සුන් වූ මහලු උම්මත්තකයා සම්පූර්ණයෙන් ම තිහඩ කළ නො හැකි විය. අඩි විස්සක් පමණ ගමන් කළ හෙතෙම බැස යන හිරු මඬල දෙස බලා දෑත ඔසවා යම් කිසිවකුගෙන් පහරක් කෑවාක් මෙන් කෑගා ගෙන බිම ඇද වැටුණේ ය.

“මගේ දෙවියන්වහන්සේ ජයගත් සේක! ක්‍රිස්තුන් වහන්සේ බැස යන හිරු ජයගත් සේක!”යි උමතුවෙන් කෑගෑ තවුසා හිරු මඬල දෙසට දෑත දිගු කොට මුණින් අතට බිම ඇද වැටුණේය අනතුරු ව හෙතෙම පොළොව මත දෑත විදහා දරුවකු මෙන් ඇඬුවේය. අවට රැස් ව සිටි පිරිස ඔහු ළඟට දිව ගියහ සමහරු විලාප නගමින් අඬන්නට වූහ. එහි සිටි හැම දෙනා ම වංගේ කිසියම් උන්මාදයකින් පෙළෙන්නා සේ පෙනේ.

“මෙතුමා තමයි නියම සාන්තුවරයා! මෙතුමා තමයි නියම සිල්වතා!” යි සමහරු බිය සැක දුර හැර කීහ. “නායක තවුසා විය යුත්තේ මේ උත්තමයා”යයි තවත් සමහරු ද්වේෂයෙන් කීහ.

“මේ උත්තමයා නායක තවුසෙක් වෙන්නේ නැහැ, මෙතුමා කවදාවත් නිල තල පිළිගන්නේ නැහැ.———සාප ලත් නීති රීතිවලට යටත් වන්නේ නැහැ”යි කියන කට හඬ ඒ අතරේ ඇසිණි. උමතු තවුසා වටකරගත් මේ පිරිස කොපමණ වේලාවක් මෙසේ කෑගසත් දැයි කිව අපහසු ය. එහෙත් ඒ මොහොතේ ඔවුන් පූජාවට කැඳවමින් ඝණ්ඨාව නාද දෙන්නට විය. ඔවුහු එක් වර ම කුරුසයේ ලකුණ ඇන්දෝ ය. වැටී සිටි තැනින් නැගී සිටි තවුසා ද කුරුසයේ ලකුණ ඇඳ වට පිට නො බලා යම් කිසිවක් කියා කෑගාමින් කෙළින් ම අසපුව බලා ගියේ ය ටික දෙනකු ඔහුගේ පිටුපසින් යන අතරේ අනෙක් අය පූජාව සඳහා වහා පිටත් වූහ. ඉවෝසි පියතුමාට බයිබලය කියැවීම භාරදුන් පියසී පියතුමා ද පූජාවට ගියේ ය. අවිචාර සිත් ඇත්තන් ගේ කෑගෑමෙන් එතුමා සසල නොවී ය. එහෙත් කිසියම් හේතුවක් නිසා තම හදවත හදිසියෙන් ම ශෝකයෙන් කකියන බව එතුමාට දැනිණි. “අධෛර්ය වීමට තරම් මා තුළ ශෝකයක් ඇති වූයේ මන්ද”යි එතුමා හදිසියෙන් ම නතර වී කල්පනා කෙළේ ය. තමා තුළ ශෝකය ඇති වුණේ ඉතා සුළු එහෙත් විශේෂ කාරණයක් නිසා බව එතුමාට හදිසියෙන් ම අවබෝධ විය ඒ ගැන එතුමා පුදුම විය. කුටියට පිවිසෙන දොර ළඟ රැස් කකා

සිටි සෙනඟ අතරේ අලෝෂා සිටි බවත්, අලෝෂා දුටු වහා ම තමා ගේ හදවත වේදනාවෙන් කකියන්නට පටන්ගත් බවත්, එතුමාට සදහන් විය. "මේ දරුවා මට මෙ තරම් වැදගත් විය හැකි ද?"යි එතුමා කල්පනා කෙළේ ය.

ඒ මොහොතේ දී අලෝෂා පියසි පියතුමා පසු කොට ගියේ ය. එහෙත් ඔහු ගියේ දේවස්ථානය දෙසට නො වේ. මෙසේ ගමන්-ගත් ඔවුහු එකිනෙකා දෙස බැලූහ. එහෙත් අලෝෂා වහා බිම බලාගත්තේ ය. ඒ මොහොතේ ඔහු තුළ කො තරම් ලොකු විපරි-යාසයක් ඇති වී තිබේ දැයි පියතුමා කල්පනා කෙළේ ය.

"අලෝෂාත් වරදට පෙළඹුණා ද? භක්තියෙන් හීන වූ ඔවුන් සමග එකතු වුණා ද?"යි පියසි පියතුමා අලෝෂා ගෙන් විමැසුවේ ය.

මග නතර වී අනුමාන බැල්මෙන් පියතුමා දෙස බැලූ අලෝෂා ආයේත් බිම බලා ගත්තේ ය. පැත්තට හැරී සිටි ඔහු තමා දෙස සැලකිල්ලෙන් බලා සිටින පියතුමා දෙස නොබැලුවේ ය.

"කොහෙ ද කලබලයෙන් යන්නේ? පූජාවට කැඳවමින් සංඝාව ගැහැව්වා නේ ද?"යි පියසි පියතුමා නැවැත විමසුවේ ය. එහෙත් අලෝෂා කරබා ගත්තේ ය.

"අපට නො කියා, අපේ ආසිරිවාදය නො පතා, ආශ්‍රමය අත් හැර යනවා ද?"

වැඩි කැමැත්තක් නො දක්වා යන්තම් සිනාහුණු අලෝෂා, සිය හදවතේ රජකම් කළ මාර්ගෝපදේශකයාණන් වූ මියගිය ආදරණීය තවුසාණන් විසින් මිය යාමට කලින් තමා භාරදුන් පියසි පියතුමා දෙස ආගන්තුක බැල්මෙන් බලා, කිසිවක් නො කියා, කිසි ම ගරු සැලකිල්ලක් නො දක්වා, තපෝවනයේ ඇත පිහිටි ගේට්ටුව දෙසට වහවහා ගමන් කෙළේ ය.

"අලෝෂා නැවැත ආපසු ආශ්‍රමයට පැමිණේ වි!"යයි පියසි පියතුමා නික්ම යන තරුණයා දෙස පුදුමයෙන් හා ශෝකයෙන් ද බලා සෙමෙන් තමාට ම කියා ගත්තේ ය.

දෙවන පරිච්ඡේදය

සුදනා දුදනකු කිරීම

මේ 'පියකරු තරුණයා' ආපසු පැමිණෙතැයි පියසි පියතුමා බැසගත් නිගමනය නිවැරැදි ය. සමහර විට එතුමා අලෝෂා ගේ ආධ්‍යාත්මික තත්ත්වයේ නියම ස්වරූපය දැන සිටින්නට ඇත. මා ප්‍රේම කරන මගේ තරුණ වීරයාගේ ජීවිතයේ ඒ අද්භූත නො පැහැදිලි මොහොත ගැන පැහැදිලි විස්තරයක් කිරීම දුෂ්කර කරුණක් බව මම අවංක ව පවසමි. පියසි පියතුමා විසින් අසන ලද "තුඹත් භක්තියෙන් තොර වූ ඔවුන් සමග එකතු වුණා ද?" යන කතගාටුදායක ප්‍රශ්නයට අලෝෂා වෙනුවෙන් මට නිසැක ව ම පිළිතුරු දිය හැකි ය. අලෝෂා භක්තියෙන් තොර වූ ඒ සුළු පිරිසට අයිති නැත. ඔහුගේ පිළිවෙත ඊට ඉදුරා වෙනස් ය. ඔහු නොසන්සුන් වූයේ තමා තුළ පැවැති අචල භක්තිය නිසා ය. එහෙත් ඔහුගේ නොසන්සුන් කමත් ශෝකයත් එසේම පැවැතුණේ ය. එය කො තරම් දැඩි ශෝකයක් වූයේ ද කියතොත් බොහෝ කලකට පසු ව ද ඒ දවස තම ජීවිතයේ ශෝකාන්විත මාරක දවසක් ලෙස අලෝෂාට පෙනී ගියේ ය. "මේ ශෝකය හා නොසන්සුන්කම ඇති වූයේ තම මාර්ගෝපදේශකයාණන්ගේ මෘතදේහය හාස්කම් දක්වනවා වෙනුවට අකාලයේ කුණු වීම නිසා ද ?" යන ප්‍රශ්නය අසනු ලැබුව හොත් මම කෙළින් ම පිළිතුරු දෙමින් එය එසේ යැයි කියමි. මගේ තරුණ වීරයා ගේ නිර්මල හදවත ගැන සිතා සීමට ඉක්මන් නොවන ලෙස මම මගේ පාඨකයන් ගෙන් ඇයැද සිටිමි. ඔහු ගේ තරුණ කම නිසා හෝ, ඔහු ලැබූ සුළු අධ්‍යාපනය නිසා හෝ, වෙනයම් කරුණක් නිසා හෝ, ඔහු ගේ අහිංසක භක්තිය වෙනුවෙන් සමාව යැදීමටත්, එය යුක්තිසහගත යයි කීමටත් මම ඉදිරිපත් නො වෙමි. එහෙත් ඔහු ගේ යහපත් ගති ගුණ කෙරෙහි මා තුළ මහත් ගෞරවයක් තිබෙන බව පවසමි. මගේ වීරයා සිතේ ඇති වන හැඟීම් ගැන පරීක්ෂාකාරීවන, ප්‍රේමය ගැන මන්දෝත්සාහී වූ වයසට වඩා පැසුණු බුද්ධියෙන් යුත් තරුණයෙක් නම් ඔහුට සිදු වූ දෙයින් මගහැර යන බව මම පිළිගනිමි. උතුම් ප්‍රේමයකින් පැන නගින යුක්තිසහගත නොවූ හැඟීම්වලට යටත් වීම ඇතැම් විට යටත් නො වී සිටිනවාට වඩා ප්‍රශංසනීය වෙයි. විශේෂයෙන් ම තුරුණු වියේ දී මෙය සත්‍යයක් ලෙස පෙනෙයි. සිහිනුවණින් ක්‍රියා කරන තරුණයා ගැන නිතර සැක කරනු ලැබෙයි. එසේ ම ඔහු ගේ වටිනා කම ද අඩු වෙයි. මෙය මගේ අදහසයි.

"හැම තරුණයෙක් ම මිථ්‍යා මත අදහන්නේ නැත. ඔබේ වීරයා අනෙක් තරුණයන්ට ආදර්ශයක් විය නො හැකි" යයි සමහර විට යුක්ති සහගත අය ප්‍රශ්න කරන්නට පිළිවනි.

"ඔව්, මගේ වීරයා ආගමභක්තිය ඇත්තෙකි. එය නිර්මල ස්ථිර භක්තියකි. එහෙත් මම ඔහු ගේ නිදහසට කරුණු නොකියමි"යි කියමින් මම ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු දෙමි.

මගේ වීරයා ගේ ගති ගුණ විස්තර කිරීමට හෝ ඔහු ගේ නිදොස් බව ඔප්පු කිරීමට හෝ මා ඉදිරි පත් නොවන බව මම ඉහත සඳහන් කෙළෙමි. සමහර විට මා ඒ ප්‍රකාශය කළේ අපරීක්ෂාවෙන් විය යුතුයි. කෙසේ වෙතත් මා කියන මේ කතාවේ ඉදිරි කොටස අවබෝධ කර ගැනීමට මගේ වීරයා ගැන එක්තරා ප්‍රමාණයක විස්තරයක් අවශ්‍ය යැයි සිතමි. මගේ වීරයා තුළ මේ ශෝකය හා නොසන්සුන් කම ඇති වූයේ හාස්කම් පිළිබඳ විශ්වාසයකින් නොවන බව මම කියමි. ඔහු හාස්කම් සිදුවන තෙක් නො ඉවැසිල්ලෙන් බලා සිටියේ නැත. කලින් ඇති කරගත් කිසියම් අදහසක් මුදුන් පැමිණි නිසා අලෝෂාට එ වේලේ හාස්කම් අවශ්‍ය වන්නේ නැත. නැත, නැත, කිසිසේත් ම අවශ්‍ය වන්නේ නැත. හැම දෙයක් ම ඉස්මතු කරගෙන ඔහුව පෙනුණේ ඔහු ගේ පෙම්බර තවුසා ගේ රූපයයි. ඇත්ත සේ කියන්නේ නම් ඔහු ගේ ආත්ම ශක්තියත්, තරුණ සිතත්, මුළුමනින් ම ඇදී ගියේ ඔහු විසින් හවුරුදු ගණනක සිට භක්තියෙන් පිදූ තවුසා වෙතය. හවුරුදු ගණනක සිට ඔහුගේ සිතේ එක්තැන් වූ ප්‍රේමයෙන් ඔහු තවුසා පිදුවේ ය. එ වේලේ ඔහුට හැම දෙයක් ම හැම කෙනෙක් ම අමතක විය. පෙර දින තම සිතට මහත් තැවුලක් වූ වැඩිමල් සොහොයුරා ගැන ද, ඒ භයානක දිනය ද, සම්පූර්ණයෙන් ම අමතක වූ බව ඔහුට පසු ව සඳහන් විය. පෙර දින සවස ඉලූෂා ගේ පියාට රුබල් දෙදහ නැවත ගෙන ගොස් දීමට අලෝෂා උදක්ම බලාපොරොත්තු වූ මුත් එයද අමතක විය. අලෝෂාට අවශ්‍ය වූයේ හාස්කම් නො ව 'යුක්තිය ධර්මය' පමණි. ඔහු ගේ විශ්වාසයේ හැටියට ඔහු ගේ හදවතට අනුකම්පාවෙන් තොර ව හදිසියෙන් ම වැදුණු දරුණු පහරින් ඒ යුක්ති ධර්මය දූෂණය විය. අලෝෂා උදක්ම බලාපොරොත්තු වූ ඒ යුක්ති ධර්මය කුමක් ද? ඒ යුක්ති ධර්මය ඔහු ප්‍රිය කළ තවුසා ගේ මෘතදේහයෙන් පළවිය යුතු හාස්කම්වල ස්වරූපය ගත්තේ ය. ආශ්‍රමයේ වෙසෙන හැම පූජකයකු තුළ මා වෙනෙකක් තබා අලෝෂා විසින් පුදනු ලැබූ උගත් පියසි පියතුම,

තුළ ද, එ වැනි ම බලාපොරොත්තුවක් පැවැතුණේ ය. එ හෙයින් කිසිවක් සැක නො කළ අලෝෂා ද අනෙක් අය මෙන් හාස්කම් ගැන බලාපොරොත්තු විය. පුරා හවුරුද්දක් ම ආශ්‍රමයේ සිටීමෙන් හටගත් හාස්කම් ගැන පැවැති බලාපොරොත්තුව නමැති මේ පුරුද්ද අලෝෂා ගේ හදවතේ මුල් බැසගත්තේ ය. එහෙත් ඔහු උදෙක් ම බලාපොරොත්තු වූයේ හාස්කම් පමණක් නො වෙයි. ඔහු යුක්ති ධර්මය ද බලාපොරොත්තු විය.

ලොවේ හැම දෙනාට ම වඩා උතුමකු ලෙස අලෝෂා විසින් පිළිගන්නා ලද සොසිමා තවුසාට කීර්ති ප්‍රශංසා වෙනුවට මේ තරම් හදිසියේ නින්දා අපහාස කරනු ලැබුවේ මන් ද? එතුමා විනිශ්චය කරන ලද්දේ කවරකු විසින් ද? එතුමා නින්දා අපහාස ලැබිය යුතු යයි නියම කරන ලද්දේ කවරකු විසින් ද? අලෝෂා ගේ අත්දැකීමෙන් තොර වූ නො කිලිටි හදවතට වද දුන්නේ මෙ වැනි ප්‍රශ්නයි. තමාට වඩා ඉතා පහත් වූ, වැදගැම්මකට නැති, මහා-ජනයා ගේ උසුළු විසුළුවලට හා ද්වේෂ සහගත සිතින් කරන අවමානයට, ඉතා සිල්වත් ගුණවත් මිනිසුන් බඳුන් වීම අලෝෂාට කෝපයෙන් හා අමනාපයෙන් තොර ව විඳගත නොහැකි විය. අලෝෂාගේ බලාපොරොත්තු ඉෂ්ට කිරීමට හාස්කම් හෝ අද්භූත දෙයක් හෝ සිදු නොවූවාට කම් නැත. එහෙත් මෙසේ තවුසාට අපහාස කළ යුත්තේ මන් ද? නින්දා කළ යුත්තේ මන් ද? ඊර්ෂ්‍යාවෙන් පෙළෙන පූජකයන් කියන්නාක් මෙන් 'ස්වභාවධර්මයට විරුද්ධ ව' එතුමා ගේ මිනිය අකාලයේ කුණු වන්නේ මන් ද? මේ පූජකයන් උමතු වූ පෙරාපොන් තවුසාට එකතු වී මහා ජයක් ලැබුවාක් මෙන් පෙන්නා දුන් 'දෙව් ලොවින් මේ ලකුණු පහළ වූයේ මන් ද? ඒ බව ප්‍රීති ඝෝෂා පවත්වමින් කීමට තමන්ට අයිතියක් තිබෙන්නේ යයි ඔවුන් විශ්වාස කරන්නේ මන් ද? දෙවියන්ගේ විනිශ්චයට කුමක් සිදු වී ද? මේ උග්‍ර අවස්ථාවේ දී ස්වභාවධර්මයා ගේ අන්ධ වූ, ගොළු වූ, අනුකම්පාවෙන් තොර වූ නීතිවලට සිය කැමැත්තෙන්ම යටත් වෙමින් දෙවියන් වහන්සේ මුහුණ සඟවා-ගත්තේ මන් ද?' අලෝෂා මෙසේ කල්පනා කෙළේ ය

අලෝෂා ශෝක වූයේ මේ නිසා ය. මං කීවාක් මෙන් ඒ ශෝකයට හේතු වූයේ තමා විසින් මෙලොව වෙසෙන හැම දෙනා-ටම වඩා ප්‍රේම කරන ලද තැනැත්තාට නින්දා අපහාස කිරීම ය. මගේ වීරයා ගේ මේ ශෝකය යුක්ති සහගත නො වන්නට පිළිවන. එහෙත් ඒ මොහොතේ දී මගේ වීරයා එ තරම් යුක්ති සහගත නොවීම ගැන මා ප්‍රතිවචන බව තුන් වන වරට ද කියමි,

මගේ තර්කය ද එ තරම් යුක්ති සහගත නොවන බව පිළිගැනීමට මා සූදනම් ය. මගේ විරයා ඒ මොහොතේ දී යුක්ති සහගත නොවීම ගැන මම ප්‍රීති වෙමි. නුවණැති කවුරුත් සුදුසු වේලාවේ දී සිහි බුද්ධියෙන් යුතු ව ක්‍රියාකරයි. එහෙත් එ වැනි මොහොතක දී තරුණ සිතේ ප්‍රේමය හටනොගත්තේ නම්, ප්‍රේමය හටගත්තේ කුමන වේලාවක ද? මේ තීරණාත්මක අඳුරු මොහොතේ දී අලෝෂා ගේ සිතේ මතු වූ පුදුම දෙයක් ගැන සඳහන් කිරීමට මම අත පසු නො කරමි. ඒ පුදුම දෙය නම් ඉවාන් සමග කතා කරන විට අලෝෂා ගේ සිතේ හටගත් හැඟීමකි. මේ හැඟීම අලෝෂා ගේ සිතේ නිතර හොල්මන් කරමින් වද දෙන්නට විය. මේ මොහොතේ දී ද, ඒ හැඟීම ඔහු ගේ සිතට වද දෙන්නට විය. ඉවාන් ගේ කතාවෙන් අලෝෂා තුල පැවැති දෙවියන් පිළිබඳ විශ්වාසය දෙදරුම් කෑවේ නැත. ඔහු හදිසියෙන් ම දෙවියන්ට විරුද්ධ ව දෙස් කීවත් එතුමාට ප්‍රේම කෙළේ ය. අචල භක්තියෙන් විශ්වාස කෙළේ ය. පෙර දින ඉවාන් සමග කළ කතාව නිසා අලෝෂා තුල ඇති වූ සිතට වදයක් වූ නපුරු නොපැහැදිලි හැඟීම ආයේත් හදිසියෙන් ම මතු වී විඥානය මතු පිටට තල්ලු වන්නට විය.

අඳුරු වැටෙන වේලේ, තපෝවනයේ, පයින් ගස් අතරේ ආශ්‍රමය බලා යන රැකිටින්, ගසක් යට මුණින් අතට බිම වැතිර නිදා සිටින අලෝෂා දැක ලගට ගොස් නම කියා කතා කෙළේ ය.

"අලෝෂා උඹ ද නිදාගෙන ඉන්නේ? අනේ දෙයියනේ උඹත්............?" මෙසේ පුදුමයෙන් ඇසූ රැකිටින් කතාව මැදින් නතර කෙළේ ය. ඔහු ඇසීමට සූදානම් වූයේ "උඹත් මේ තත්වයට වැටුණා ද?" කියා ය.

අලෝෂා රැකිටින් දෙස නොබැලුවේ ය. එහෙත් තමා කී දෙය අලෝෂාට තේරුණු බව රැකිටින් දැනගත්තේ අලෝෂා මඳක් සෙලවුණු නිසා ය.

"මොක ද වෙලා තියෙන්නේ?"යයි ඔහු පුදුමයෙන් විමසුවේ ය, ඒ පුදුමය ක්‍රමයෙන් සිනාවට පරිවර්තනය විය. අනතුරුව එය ව්‍යාජ වෙසක් ගත්තේ ය.

"පැය දෙකක් තිස්සේ මම උඹව හෙව්වා. උඹ හදිසියෙන්ම අන්තර්ධාන වුණා. මොකද මෙ තැන කරන්නේ? මොකද්දී මේ මෝඩ වැඩේ තේරුම? ටිකක් මගෙ දිහා බලාපන්..........."

අලෝෂා සිය උස්සා නැගිට ගසට හේත්තු වී හිඳගත්තේ ය. ඔහු නො අඩා සිටියත් ඔහු ගේ මුහුණේ දුක් වේදනා සමග තුරුස්නා ගතියක් ද පෙනෙන්නට තිබිණි. එහෙත් ඔහු රැකිටින් දෙස නො බලා ඉවත බලා ගත්තේ ය.

"උඹේ මුහුණ සම්පූර්ණයෙන් ම වෙනස් වෙලා තියෙන බව දන්නව ද? උඹේ මුහුණේ දකින්නට තියෙන කවුරුත් වර්ණනා කරන සෞම්‍ය ගතිය දන්නම් ඇත්තෙම නැහැ. කා එක්ක හරි තරහෙන් ද ඉන්නේ? කවුරුවත් හිරිහැර කළා ද?"

"මට කරදර නොකර යන්න"යි අලෝෂා කිවේ තව මත් ඉවත බලා ගෙන අත වනමිනි.

"එහෙනම් උඹත් එහෙම ද? අනෙක් මිනිසුන්ට වගේ උඹටත් පුළුවන් ද කෑගා මිනිසුන් පන්නා දමන්න? එය දේවදූතයකු ගේ තත්ත්වයේ සිටින්නකු ගේ පිරිහීමක්. අලෝෂා, උඹ ගැන මට බොහො ම පුදුම යි. බොහො ම කාලයක ඉඳලා මෙ තැන සිද්ධ වන දේවල් ගැන මම පුදුමයෙන් බලා සිටියා. එහෙත් මෙ පමණ කාල-යක් මම හිතා ගෙන සිටියේ උඹ උගත් තරුණයකු හැටියට යි."

අලෝෂා අන්තිමේ දී රැකිටින් දෙස නො පැහැදිලි බැල්මෙන් බැලුවේ ඔහු කී දෙය නොතේරුණාක් මෙනි.

"නාකි මිනිහකුගේ මිනිය කුණු වීම ගැන ඔය තරම් කලබල වුණා ද? ඒ මිනිහ ගේ මිනියෙන් හාස්කම් ඇතිවෙය කියා උඹත් විශ්වාස කළා ද?"යි රැකිටින් ඇසුවේ සැබැවින් ම පුදුම වෙමිනි.

"ඔව් මම විශ්වාස කළා. මම විශ්වාස කළා. තවමත් විශ්වාස කරනවා. ඉතින් උඹට මෙන මොනව ද උවමනා කරන්නේ?"යි අලෝෂා නො සන්සුන් වෙමින් ඇසීය.

"නැහැ, මට කිසිම දෙයක් එපා. අවුරුදු දහතුනක ශිෂ්‍යයෙක් වත් ඔ වැනි දෙයක් විශ්වාස කරන්නේ නැහැ.........එහෙනම් උඹ උඹේ දෙවියන් එක්ක තරහෙන් ද ඉන්නේ? දෙවියන්ට විරුද්ධ ව පෙරළි කරනව ද? එහෙනම් උඹේ නාකි තාවුසා තත්ත්වයෙන් උසස් වෙලා නැහැ! මිනිහා උත්තමයන් ගේ ලැයිස්තුවට වැටිලා නැහැ! අනේ උඹ වගේ මෝඩයෙක් ඉන්නව ද?"

අලෝෂා නෙත් අඩක් වසා බොහෝ වේලා රැකිටින් දෙස බලා සිටියේ ය. හදිසියෙන් ම ඔහු ගේ නෙත් තුළ අමුතු ආලෝ-කයක් දිස් විය. එහෙත් එය රැකිටින් කෙරෙහි කෝපයෙන් හට ගත් ආලෝකයක් නො වේ.

"මා මගේ දෙවියන්ට විරුද්ධ ව පෙරළි කරනවා නො වෙයි. මා එතුමා ගේ ලෝකය පිළිගන්නේ නැහැ"යි අලෝෂා අමාරුවෙන් සිනාසෙමින් කී ය.

"මේ ලෝකය පිළිගන්නේ නැහැ කියන කතාවේ තේරුම මොකක් ද? මහ මෝඩ කතාවක් නොවැ"යි රකිටින් කීවේ මඳ වේලාවක් කල්පනා කිරීමෙන් පසුව ය. අලෝෂා කරබාගත්තේ ය.

"ඔය පිස්සු කතාව අත් හැර දමමු. කෑම කෑව ද?"

"මට මතක නැහැ .... මා හිතන්නේ කෑවය කියා."

"මුහුණෙන් පේනවා කෑම කාල නැති බව. මුහුණ දක්කම කනගාටු හිතෙනවා. ඊයේ රෑ නිදාගත්තේ නැහැ නේ ද? මට ආරංචියි ඊයේ රැස්වීමක් තිබුණා ය කියා. පූජාවට තියාපු පාන් කෑල්ලක් හැරෙන්න මා හිතන්නේ නැහැ උඹ කිසි ම දෙයක් කන්න ඇතැයි කියා. මගේ සාක්කුවේ ලිංගුස් ටිකක් තියෙනවා. උවමනාවක් වුණොත් ගන්න හිතාගෙන වවුමෙන් ගෙන්න ගත්තා. ලිංගුස් කන්නේ නැහැ නොවැ .... "

"ටිකක් දෙන්න."

"හා එහෙනම් ලිංගුස් කනව ද? උඹ හදන්නේ හැම දෙයකට ම විරුද්ධව පෙරළි කරන්න ද? එහෙනම් අපි හොඳට බඩ පිරෙන්න කමු .... යමු මගේ කාමරයට. වොඩ්කා අඩියක් ගහන්න වුණත් මා අකමැති වන්නේ නැහැ. මට බොහො ම මහන්සි යි. නමුත් වොඩ්කා බීම උඹට සුදුසු නැහැ. .... කොහොම වුණත් පොඩි අඩියක් ගහනව ද?"

"ඔව්, මම වොඩ්කා ටිකකුත් බොන්නම්."

"සහෝදරයා, මට උඹ ගැන බොහෝ ම පුදුම යි." රකිටින් අලෝෂා දෙස පුදුමයෙන් බලා කී ය. "හොඳයි වොඩ්කා හරි ලිංගුස් හරි දෙකින් කොයි එක වුණත් කමක් නැහැ. මේක ලිස්සා යන්න ඉඩ නො දිය යුතු කදිම අවස්ථාවක්. එහෙනම් යමු"

අලෝෂා නැගිට නිහඬ ව රකිටින් පිටිපසින් ගියේ ය.

"බැරි වේලාවත් ඉවාන් මේක දක්කොත් පුදුම වේවි. පොඩි අයියා අද මොස්කව් නුවරට ගියා දන්නව ද?"

"ඔව් මා දන්නවා"යි අලෝෂා උදාසීන ව කීය. හදිසියෙන් ම මිතියා ගේ රූපය ඔහු ගේ මනස ඉදිරිපිට පෙනෙන්නට විය. එහෙත් එසේ පෙනුණේ මොහොතකට පමණි. ඒ සමග ඔහුට යම

කිසිවක් සිහි විය. එය මොහොතකට හෝ අතපසු නොකල යුතු යුතුකමක් නැති නම් භයානක අවශ්‍යතාවක් බව ඔහුට සිහි විය. එහෙත් එයින් ඔහු තුළ කිසි ම හැඟීමක් ඇති නො වී ය. ටික වේලාවකින් ම එය අමතක වී ය. බොහෝ කාලයක් ගත වන තුරු ඔහුට මේ සිද්ධිය සඳහන් ව තිබුණේය.

"වරක් උඹේ පොඩි අයියා මට කිව්වා 'මා කිසිම දක්‍ෂ කමක් නැති නිදහස් මතධාරී නෝංජලයෙක්ය' කියා. මා වංක අදහස් ඇත්තකු බව උඹත් මට වරක් කිව්වා, හොඳයි මට බලාගන්න පුළුවනි දැන් උඹේ බුද්ධියටයි, ගෞරවයටයි, මොක ද වෙන්නේ කියා." අන්තිම වාක්‍යය රැකිටින් අවසන් කළේ රහසක් කියන්නාක් මෙනි.

"අපි ආශ්‍රමයෙන් පිට වෙලා අඩි පාර දිගේ ටවුමට යමු හොලාකෝ මැතිනිය ගේ ගෙදරටත් යන්න උවමනාවක් තියෙනවා අද සිද්ධ වූ හැම දෙයක් ම මම ඈට ලියා දැන්වූවා. උඹ විශ්වාස කරනව ද ඈ මට පැන්සලෙන් ලියා එව්වා සොසිමා තවුසා වැනි කෙනකුගෙන් මෙ වැනි හැසිරීමක් ඈ කවදාවත් බලාපොරොත්තු නොවූ බව. (ඈ ලිපුම් ලියන්න බොහො ම ආසයි.) ඈ ලියා තිබුණේ 'හැසිරීම' යන වචනය යි. ඈට බොහොම තරහ යි. උඹලා, පුදුම මිනිස්සු ජාතියක්. ටිකක් හිටපන්!"යයි රැකිටින් හදිසියෙන් ම කී ය. හදිසියෙන් ම නතර වූ රැකිටින් උරහිසින් අල්ලා අලෝෂා නතර කෙළේ ය.

"අලෝෂා උඹ දන්නව ද?"යි ඔහු අලෝෂා ගේ නෙත් දෙස විමසිල්ලෙන් බලා ඇසුවේ හදිසියෙන් ම ඇති වූ අදහසක් ගැන නිගමනයකට බැස ගෙන ය. ඔහු සිනාසුණේ ය. එහෙත් ඒ අදහස එළිකිරීමට බිය විය. අලෝෂා තුළ බලාපොරොත්තුවක් නැති ව ඇති වූ පුදුම වෙනස ඔහුට තව ම විශ්වාස කල නො හැකි ය. "අලෝෂා උඹ දන්නව ද අපි යන තැන?"යයි කියමින් රැකිටන් අන්තිමේ දී වපිත් පිටිත් ඇසුවේ බයාදු කමක් දක්වමිනි.

"මට කමක් නැහැ කො තැන ගියත් .... කැමැති තැනකට යමු."

"එහෙනම් ගෘෂෙන්කා ගේ ගෙදරට යමුද? යන්න එනව ද?"යි රැකිටින් ඇසුවෙ අලෝෂා තුමක් කියා වි දැයි නො දන වෙව්ලමිනි.

"යමු"යි අලෝෂා එක්වර ම සන්සුන් සිතින් කී ය. ඔහු ගේ ඒ සන්සුන් එකඟත්වය රැකිටින්ට කො තරම් ලොකු පුදුමයක් වූයේ ද කියතොත් ඔහු මදක් පසුබා සිටියේ ය. තරුණයන් දෙදෙනා නිහඬ ව ගමන් කළහ. එහෙත් රැකිටින් කතා නො කළේ කතා කිරීමට තරම් යග වූ හෙයිනි.

"අපි ගියා ම ගෲසෙන්කා බොහෝ ම සතුටු වේවි"යි පැවැසූ රැකිටින් ආයේත් නිහඬ වී ය. ඔහු අලෝෂා කැඳවාගෙන යන්නේ ගෲසෙන්කා සතුටු කිරීමට නො වේ. රැකිටින් තමාට වාසියක් නො වන දෙයක් කිසි ම කලක නො කරයි. ඔහු හැම විට ම තමා ගේ මඩිය පුරවා ගැනීමේ අදහසින් පසුවන්නෙකි. ඔහු අලෝෂා කැඳවාගෙන ගියේ කරුණු දෙකක් මුල් කරගෙන ය. පළමු වැන්න 'යහපත් තැනැත්තා ගේ විනාශය දකීමේ ආශාවෙනි.' අලෝෂා දුර්ජනයකු කිරීමේ අදහසිනි. රැකිටින් මෙ වැනි දෙයක් කිරීමට පෙරුම් පුරමින් සිටියේ ය. දෙ වැන්න, ඔහු මින් පෞද්ගලික ලාභයක් බලාපොරොත්තු විය. ඒ ගැන වැඩි විස්තර පසු ව කියමි.

"අන්තිමේ දී වෙලාව ආවා"යයි රැකිටින් ඊරිසියාවෙන් හටගත් ප්‍රීතියෙන් කල්පනා කෙළේ ය. "අපට උවමනා කළේ මෙ වැනි දෙයක්, තමයි. අපට දැන් අලෝෂා බෙල්ලෙන් ම අල්ලගන්න පුළුවනි."

තුන් වන පරිච්ඡේදය

ලූනු ගෙඩිය

ගෲසෙන්කා වාසය කළේ දේවස්ථාන චතුරශ්‍රයට නුදුරේ, නගරයේ ජනාකීර්ණ පෙදෙසක, මොරාසෝ නමැති වැන්දඹුව ගේ ගෙවත්තේ පිහිටි, ලීයෙන් තනන ලද කුඩා ගෙයක ය. වැන්දඹුව ගේ මහ ගෙය විශාල ගලින් තනන ලද තට්ටු දෙකේ පරණ අවලක්ෂණ ගොඩනැගිල්ලකි. වයසට ගිය අවිවාහක මිනිපිරියන් දෙදෙනා සමග මොරාසෝ වැන්දඹුව හුදෙකලා ජීවිතයක් ගත කළා ය. තමා ගේ ගෙය කුලියට දීමට වැන්දඹුවට උවමනාවක් නො තිබිණ. එහෙත් ඇගේ නෑයකු වන සම්සෝනෝ නමැති වෙළෙන්දා සතුටු කිරීම පිණිස, මීට හවුරුදු හතරකට පෙර වැන්දඹුව ගෲසෙන්කා නතර කරගත් බව කවුරුත් දනිති. සම්සෝනෝ ගෲසෙන්කා ගේ භාරකාරයා ලෙස ප්‍රසිද්ධ වී ය. මේ මහලු ඊරිසියාවන්ත වෙළෙන්දා, ගෲසෙන්කා වැන්දඹුව ගේ නිවෙසේ නතර කරන ලද්දේ මැහැල්ලට තරුණිය ගේ ගමන් බිමන් හා කල්ක්‍රියාව ගැන හෝඩුවාවෙන් සිටිය හැකි නිසා යයි කියනු ලැබේ. එහෙත්

ගෘෂෙන්කා ගැන හෝඩුවාවෙන් සිටීම අනවශ්‍ය විය. එ හෙයින් ගෘෂෙන්කා ගැන හෝඩුවාවෙන් සිටීම මැහැල්ල සම්පූර්ණයෙන් ම අත්හැර දැම්මා ය. මහලු වෙළෙඳා එම පළාතට අයත් ප්‍රධාන නගරයේ සිට, සිහින් සියුමැලි, ලැජ්ජා භයෙන් යුත්, නිතර කල්පනා කරන දහ අට ඇවිරිදි ගෘෂෙන්කා ගෙනවිත් හවුරුදු දෙකක් වන බව සැබෑ ය. ඉක්බිති ව බොහෝ දෑ සිදු වී ය. නගරයේ කිසිවෙක් ගෘෂෙන්කා ගේ වග තුග දැන නොසිටියහ. දැන සිටි සවල්පය ද එ තරම් පැහැදිලි නො වී ය. අග්‍රෆේනා ඇලෙක්සැන්ඩ්‍රොව්නා යන නමින් ප්‍රසිද්ධ වූ මේ සුකුමාළ තරුණිසට ඇලුම් කළ අය බොහෝ වුවත් ඇය ගැන වැඩි තොරතුරු දැනගත නො හැකි වී ය. හවුරුදු දහහතේ දී කිසියම් නිලධරයකු විසින් ඇය දූෂණය කොට අත්හැර දමන ලද බව දූෂමාන වශයෙන් ආරන්චි විය. ගෘෂෙන්කා දිළිඳුකමින් හා අපහාසයෙන් පෙළෙන අතරේ අර නිලධරයා වෙනත් තරුණියක බිරිය කොට ගත්තේ ය. කෙසේ වෙතත් මේ අනාථ තරුණිය මහලු සම්සෝනෝ විසින් රැක බලා ගනු ලැබුවත්, දේවගැති පන්තියට අයත්, වැදගත් පවුලක උපත් දේවගැතියකු ගේ දියණියක බව කියනු ලැබිය.

දැන්, හවුරුදු හතරකට පසු ව, මෙ කලබලකාරී, අසරණ අනාථ තරුණිය, වැඩුණු අංගපසඟින් යුත්, නිර්භීත, එඩිතර, උඩඟු, අහංකාර රූසිසත් සුරූපිකාවක් වූවා ය. ඈ වෙළෙඳාමෙහි දක්ෂ ය, ලෝභ ය, අරපිරිමැස්මම් ඇත්ති ය. හොඳින් හෝ නරකින් හෝ ඈ ප්‍රමාණවත් තරම් ධනයක් රැස්කරගත් බව කියනු ලැබේ. අප හැම දෙනා විසින් ම වාද බේදයෙන් තොර ව පිළිගත් එක් කරුණක් ඇත. එනම් ගෘෂෙන්කා ලෙහෙසියෙන් කැමැති කරවා ගත නොහැකි බව ය. මේ හවුරුදු හතර තුළ දී ඇයගෙන් අනුග්‍රහයක් ලැබුණේ යැයි උදම් විය හැක්කේ ඇය ගේ මහලු වෙළෙඳාට පමණි. එය ඒකාන්ත සත්‍යයකි. ඇයගෙන් අනුග්‍රහයක් ලැබීමට පසුගිය හවුරුදු දෙක තුළ වෙහෙසුණ අය බොහෝ වෙත්. එහෙත් ඔවුන් ගේ ඒ වෑයම් නිෂ්ඵල වී ය. මේ දැඩි සිතැති තරුණිය ගේ විරුද්ධකම්වලට මුහුණ පෑ මනමාලයන්ගෙන් සමහරු ඉතා හාස්‍ය ජනක අත්දමින් පසු බැස ගිය හ. මේ තරුණිය වෙසෙසින් ම මෑතක සිට කිසියම් ව්‍යාපාරයක යෙදෙන්නී ය. ඒ අතින් ඈ විශේෂ දක්ෂතාවක් පෙන්නා ඇති බැවින් බොහෝ දෙනා ඇය යුදෙව්වකුට නොදෙවෙනි යැයි කී හ. එසේ කියන ලද්දේ ඈ මුදල් පොලී කරන නිසා නො වේ. දැන් වික කලක සිට ඈ මහලු පියෝදර පවුලොවිච් කරමසෝ සමග එකතු වී, අය කරගත නො හැකි ණයකර ඉතා සුළු මුදලකට ගෙන, වටිනා කමින් භාගයකට පමණ ගෙන, දහ ගුණයක් පමණ හම්බ කරගත් බවට ප්‍රසිද්ධ විය.

මහලු සම්සෝනෝ, ඉතා මසුරු, අනුකම්පාවෙන් තොර විශාල ධනවතෙකි. ඔහු ගේ බිරිය ජීවතුන් අතර නැත. හෙතෙම වැඩි විය පත් තම පුතුන් ඉතා කෲර අන්දමින් පාලනය කෙළේ ය. එහෙත් පසු ගිය වසීයේ සිට ඔහු රෝගයෙන් පෙළෙයි. ඔහු ගේ ඉදිමුණු කකුල අප්‍රාණික වූ පසු ඔහු තරුණිය ගේ බලපෑමට යට විය. එහෙත් මහලු මසුරා තුළ තමා ගැන දැඩි විශ්වාසයක් ඇති කළ ගෘසෙන්කා අනතුරුව ඔහු ගේ පාලනයෙන් නිදහස් වීමට සමත්වූවා ය. ඔත්පොළ වී සිටින මහල්ලා විශාල වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන ගියේ ය. එකල ඔහු දැඩි මසුරකු ලෙස ප්‍රසිද්ධ විය. ඔහු ගෘසෙන්කා ගේ ග්‍රහණයට කො තරම් තදින් අසු වී සිටියේ ද කියතොත් දුන් ඔහුට ඇය නැති ව ජීවත් විය නො හැකි ය. (පසුගිය හවුරුදු දෙකේ සිට ඔහුට ගෘසෙන්කා, නැති ව කිසිවක් කළ නො හැකි විය.) එහෙත් ගෘසෙන්කා වෙනුවෙන් මහල්ලා ප්‍රමාණවත් ධනයක් වෙන් නො කළේ ය. තමා අත්හැර යන බවට ගෘසෙන්කා තර්ජනය කළත් ඔහු ඇයට කිසිවක් නො දුන්නේ ය. එහෙත් පසු ව ඔහු ඇයට සුළු මුදලක් දුන්නේ ය. පසු කල ඒ බව ආරන්චි වූ විට බොහෝ දෙනා පුදුම වූ හ.

“උඹ මහ කපටි ගැට්ස්සියක් ”යයි මහලු වෙළෙඳා ගෘසෙන්කාට රූබල් අට දහක් දෙමින් කී ය. “උඹ හොඳට සිටපන්. නමුත් දැනගනින් මීට පස්සේ අවුරුද්දකට දෙන ගානමනාව් හැරෙන්නට මං මැරෙන තෙක් මගෙන් තඹයක්වත් නොලැබෙන බව. මගේ අන්තිම කැමැත්තෙන් උඹට කිසි ම දෙයක් ලැබෙන්නේ නැහැ ”

පොරොන්දු වූ පරිදි කටයුතු කළ හෙතෙම මරණයෙන් පසු සියලු ධනය තම පුතුන්ට ලැබෙන්නට සැලැස්සුවේ ය. ජීවත්ව සිටිය දී මහල්ලා ඔහු ගේ පුතුන් ගේ අඹු දරුවන්ට සැලකුවේ දාසයන්ට සලකන්නාක් මෙනි. ඔහු ගේ අන්තිම කැමැති පත්‍රයේ ගෘසෙන්කා ගේ නමවත් සඳහන් කර නො තිබිණි, මේ විස්තර දැනගන්න ලැබුණේ පසු කාලයේ දී ය. මුදල් හම්බ කරගන්නා සැටි ගෘසෙන්කාට කියා දුන් හෙතෙම ඒ සඳහා නොයෙක් මාර්ග ද සලසා දුන්නේ ය.

පියෝදර් කරමසෝ පළමු වරට ගෘසෙන්කා දැනහැඳිනගත්තේ ඇය සමග වෙළෙඳ ව්‍යාපාරයක යෙදීමෙනි. එහෙත් ව්‍යාපාරය අවසන් වන විට ඔහු ගේ බලවත් පුදුමයට, ඔහු ඇය පිළිබඳ සිත් ඇතිකරගත්තේ ය. රෝගාතුර ව සිටි මහලු සම්සෝනෝ මේ ගැන අසා සිනාසිණි. ගෘසෙන්කා මහලු වෙළෙන්දට කිසි-

වක් නොසඟවා ඇත්ත කීවා ය. එය අපූරු දෙයක් ලෙස සැලකිය යුතු ය. ඇ මෙ වැනි ලෙන්ගතු කමක් වෙන කිසිවකුට පෙන්නුවේ නැත. මෑත දී මිතියා ගෲෂෙන්කාට ආලය කිරීමට පටන්ගත් පසු මහල්ලා ඒ ගැන ද සිනාසිණි. එහෙත් ඔහු වරක් ගෲෂෙන්කාට මෙසේ අවවාද කෙළේ ය.

“තාත්තයි පුතයි අතරින් එකෙක් තෝරා ගන්නවා නම් තාත්තා තෝරා ගනින්. ඒ නමුත් උඹ ඒ නාකි තක්කඩිය කසාද බඳින්නේ ඌ උඹේ නමට මුළු බූදලයම ලියනවා ය කියා සතීරව දැනගන්න ලැබුණොත් පමණ යි. නාකියා ගේ පුතා එක්ක නම් දිග යන්න එපා, උඹට කිසි ම වගතුවක් වෙන්නේ නැහැ.”

වලේ පයකුයි ගොඩ පයකුයි ඇති ව සිටි මහලු සල්ලාලයා ගෲෂෙන්කාට දුන්නේ මෙ වැනි අවවාදයකි. ඇත්ත වශයෙන් හෙතෙම පස් මසකට පසු මිය ගියේ ය.

මේ තරුණිය ලබාගැනීම පිණිස කරමසෝ පිය පුතු දෙදෙනා අතරේ පැවැති අස්වාභාවික භයානක තරගය ගැන අපේ නගරයේ බොහෝ දෙනකු දැන සිටියත් ගෲෂෙන්කා පිය පුතු දෙදෙනාට සැලකිල්ලක් දක්වන්නේ කුමන හේතුවක් නිසා දැයි කිසිවකු නොදත් බව මෙහි ලා දන්වනු කැමැත්තෙමි. වෙනෙකක් තබා ගෲෂෙන්කා ගේ සේවිකාවෝ දෙදෙනා (මා පසු ව විස්තර කරන භයානක අපරාධයෙන් පසු) උසාවියේ දී සාක්කි දෙමින් තම ස්වාමි දූ මිතියා පිළිගත්තේ “ඔහු ඇය මරන බවට තර්ජනය කළ නිසා භවයෙන් තිතියෙන්” යයි පැවසූ හ. මේ සේවිකාවන් දෙදෙනාගෙන් එකියක්, ගෲෂෙන්කාට බොහෝ කාලයක සිට ආහාර පිළියෙළ කරදුන්, නිතර රෝගයෙන් පෙළෙන බිහිරි මැහැල්ලකි. අනෙක් සේවිකාව හවුරුදු විස්සක් වයසැති ගෲෂෙන්කා ගේ මිනිබිරිය වූවා ය. මේ කඩිසර දැරිය ගෲෂෙන්කා ගේ ආවතේවකම් කළා ය. අරපරිස්සමින් ජීවත් වූ ගෲෂෙන්කා සුඛෝපභෝගි බඩු බාහිරාදිය නො ගත්තා ය. කාමර තුනකින් යුත් ඇයගේ කුඩා නිවෙසේ තබා තිබුණේ ගෙවල් හිමි වැන්දඹුව සතු 1820 වන වර්ෂයට අයත් පැරණි මොහගනි ලීයෙන් කළ ඇඳ පුටු පමණි.

රැකිටින්, අලෝෂා සමග ගෲෂෙන්කා ගේ කාමරයට පිවිසෙන විට අඳුරු වැටී තිබිණි. එහෙත් ගෙයි පහනක් දල්වා නො තිබුණේ ය. ගෲෂෙන්කා විසිත්ත කාමරයේ විශාල පැරණි සෝපාවක වැතිර සිටියා ය. සෝපාව වසා තිබුණේ පැරණි අපිරිසුදු සමකිනි. ඇ නිදාගන්නා ඇඳෙන් ගෙනෙන ලද කොට්ට දෙකක් හිසට තබා ගෙන සිටියා ය. දෑත හිස යටින් තබාගත් ගෲෂෙන්කා සෝපාව මත

උඩු බැලි අතට දිග ඇදී නිශ්චල ව සිටියා ය. ඈ කළු පට ඇඳුමෙන් සැරසී සිටියේ යම්කිසිවකු ගේ පැමිණීම බලාපොරොත්තු ව සිටි සෙයිනි. ඈ හිස වසාගෙන සිටි රේන්ද සළුව ඉතා අලංකාර ය. උරහිස් උඩින් දමන ලද රේන්ද සළුවට විශාල රත්රන් බ්‍රෝච් කටුවක් ගසා තිබුණේ ය. ඇත්ත වශයෙන් ගෘසෙන්කා යම්කිසි-වකු ගේ පැමිණීම බලාපොරොත්තු ව සිටියි. ඈ ඉතා ඉවැසිල්ලෙන් සෝපාව උඩ වැතිර සිටියේ විඩාපත් වූවක මෙනි. ඇයගේ මුහුණ සුදුමැලි වූ අතරේ දෙතොල් හා නෙත් රතු පාට වී ය. ඈ සෝපාවේ ඇන්දට දකුණු කකුල කෙළවරින් ගසන්නට වූවා ය. අලෝෂා ගේ හා රැකිටින් ගේ ද පැමිණීමෙන් ඇය තුළ මඳ නොසන්සුන්කමක් ඇති වී ය. ඈ වහා සෝපාවෙන් නැගිට "කවු ද?" කියා තැති ගෙන අසනවා ඔවුන්ට ශාලාවේ සිට ඇසිණි. අමුත්තන් දෙදෙනා පිළිගත් සේවිකාව අනතුරු ව වහා ස්වාමිදූට කතා කළා ය.

"එයා නො වෙයි. වෙන කවු ද ඇවිත් ඉන්නවා."

"මොක ද මේ කලබලය?" කියා රැකිටින් ඇසුවේ අලෝෂා සමග විසිත්ත කාමරයට ඇතුළු වෙමිනි.

ගෘසෙන්කා සෝපාව අසල සිටගෙන සිටියේ තවමත් භීතියෙන් තැති ගත්තාක් මෙනි. රේන්ද සළුවෙන් පිටත පැනගත් ඇයගේ කළු හිසකෙස් දකුණු උරහිස මත වැටී පෙනෙයි. ඈ උරහිස මත වැටුණු හිස කෙස් දක අතින් පිටිපසට කළේ අමුත්තන් ඇඳින ගත් පසු ව ය.

"හා රැකිටින් ද ආවේ? මාව භය කළා නොවැ. කවු ද එක්කරගෙන ආවේ?...........අනේ දෙයියනේ මේ ඉලන්දාරියා එක්කර ගෙන ආව ද?"යි ඈ අලෝෂා ඇඳින ගෙන ඇසුවා ය.

"ඉක්මනට ලාම්පුවක් ගෙනෙන්"යයි රැකිටින් කීවේ මේ ගෙදර අයට නියෝග කිරීමට බලයක් තමාට තිබෙන්නාක් මෙනි.

"පෙනියා ඉක්මනට ලාම්පුවක් අරන් වරෙන්........ හොඳ වෙලාවක නොවැ අලෝෂා එක්කරගෙන ආවේ!"යි ගෘසෙන්කා නැවැත අලෝෂා දෙස බලා කීවා ය. අනතුරු ව කැඩපත දෙස බැලූ ගෘසෙන්කා වහා උරහිස මත වැටුණු හිසකෙස් සකස්කර ගත්තා ය. ඈ වැඩි සතුටකින් සිටින බවක් නො පෙනේ.

"ඇයි මගේ පැමිණීම ගැන සතුටු නැද්ද?"යි රැකිටින් විමසුවේ ඇයගේ කතාවෙන් නොසතුටට පත් වූවාක් මෙනි.

"රැකිටින් මාව භය කළා. ඒකයි කිව්වේ" යයි රැකිටින්ට කී ගෘසෙන්කා අනතුරු ව අලෝෂා දෙසට හැරී "අලෝෂා මට භය වෙන්න එපා. අලෝෂා දැක ගැනීම කොතරම් ලොකු සතුටක් ද

කියා දන්නේ නැහැ. නමුත් රැකිටින් මා හය කළා. මා හිතුවා මීතියා ගෙට කඩා පැන්නය කියා. මා දන් විකකට කලින් මීතියා රැවැට්ටුවා. මා කියන දෙය විශ්වාස කරන්නය කියා පොරොන්දු කරවා ගෙන බොරුවක් කළා. මා කිව්වා අද සවස සම්සෝනෝ ගේ ගෙදරට ගිහින් රෑ වනතෙක් එයා ගේ සල්ලි ගණිනවා ය කියා. මම සතියකට වරක් මහ රෑ වන තෙක් එයා ගේ ගණන් හිලව් පිළිසෙල කරලා දෙනවා. අපි කාමරයකට වැදිලා දොර වහගෙන, එයා මුදල් ගණින කොට මම පොත්වල ගනුදෙනු ලියනවා. සම්සෝනෝ විශ්වාස කරන්නේ මා විතරයි. මීතියා හිතාගෙන ඉන්නේ මා තමවත් එ තැනය කියා. නමුත් මම ආපසු ඇවිදින් පණිවිඩය ලැබෙන තෙක් දොර වහගෙන ඉන්නවා. තුඹලාට ගෙට එන්න පෙතියා ඉඩ දුන්නේ කොහොම ද? ....පෙතියා, පෙතියා, ගේට්ටුව ළඟට ගිහින් බලාපන් කපිතාන් එනව ද කියා. සමහර විට කපිතාන් හොරෙන් බලාගෙන ඉන්නවා ඇති. මට බොහො ම භයයි" ගෘෂෙන්කා කීවා ය.

'ගේට්ටුව ළඟ කිසි ම කෙනෙක් නැහැ. මා දන් විකකට ඉස්සෙල්ලා ගිහින් බැලුවා. නෝකාමිනත්මයාට වගේ මටත් බොහො ම බයයි,"

"පෙතියා, උඹ ජනේල වැහැව්ව ද? ජනේල රෙද්ද ඇදලා හොඳට ජනේල වහන එක හොඳයි. ගේ ඇතුළේ එළියක් තියෙන බව දුටු හැටියේ ම මීතියා දුවගෙන ඒවි. අලෝෂා මම තුඹෙ අයියාට බොහො ම බයයි." මෙසේ පැවැසූ ගෘෂෙන්කා තිරය ඇද කවුළුව වැසුවා ය.

ඈ හඩ නගා කතා කළා ය. ඈ මීතියා ගැන භීතියෙන් සිටියත් ඒ අතරේ යම් කිසිවක් ගැන ප්‍රීති වන්නාක් මෙන් පෙනේ.

"ඇයි අද මීතියාට බයෙන් ඉන්නේ?" යයි රැකිටින් විමසුවේය. මා හිතුවා මීතියාට බය නැහැ කියා. තුඹට පුළුවන් නේ ද මීතියාව තුඹෙ පුළැඟිල්ල වගේ කරකවන්න?"

"මා කිසියම් ආරන්චියක් බලාපොරොත්තුව සිටින නිසා මේ වෙලාවේ මීතියා එනවට කැමැති නැහැ. මා සම්සෝනෝ ගේ ගෙදර සිටින බව මීතියා විශ්වාස කළේ නැහැ. ඒක මා හොඳට දන්නවා. මෙලහකට මීතියා මා එන කන් තාත්තා ගේ ගෙයි පිටිපස්සේ හැන්ගිලා බලාගෙන ඉන්නවා ඇති. එයා එහෙ ඉන්නවාංනම් මෙහාට එන එකක් නැහැ. ඒක වැඩියත් හොඳයි.! නමුත් මම සම්සෝනෝ ගේ ගෙදරට ගියා. මා එහාට ගිහින් ඇරලුවේ මීතියා යි. මහ රෑට මා ආපසු ඇරලන්න එන්නය කියා මම මීතියාට කිව්වා. මීතියා ගිහින් මිනිත්තු දහයක් යන්න කලින් මම ආපසු ආවා. මහ දී මීතියා හමුවේය කියා බයෙන් මම ගෙදර එනකන්ම දිව්වා.".

"ඇයි මය විදියට ඇඳ පැළඳ ගෙන ඉන්නේ? ඔළුව වටේ තුවායක් බැඳ ගෙන ඉන්නේ මහ පුදුම සළුවක් නොවැ!"

"රැකිටින් උඹත් මහ පුදුම මිනිහෙක්. මට පණිවිඩයක් ලැබෙන තුරු බලාගෙන ඉන්න බව කිව්වා නේ ද? පණිවිඩය ලැබුණු හැටියේ ම මම යනවා. ඊට පස්සේ කවදාවත් උඹට ආයෙත් මාව දකින්න ලැබෙන්නේ නැහැ. පණිවිඩය ලැබුණු හැටියේ ම යන්න තමයි මා ඇඳ පැළඳ ගෙන සූදානම් වී ඉන්නේ."

"මෙ තරම් ඉක්මනට කොහෙ යන්න ද සූදානම් වෙන්නේ?"

"ඕනෑවට වඩා දේවල් දැනගත්තොත් ඉක්මනට නාකි වෙන්න පුළුවනි."

"සත්තකින් ම ගෲෂෙන්කා නුඹ ඉන්නේ බොහෝ ම සන්තෝෂයෙන්. මා කවදාවත් දැක්කේ නැහැ මෙ තරම් සන්තෝෂයෙන් ඉන්නවා. ඇඳගෙන ඉන්නේ හරියට බාලකට යන්න වගෙයි." මෙසේ පැවසූ රැකිටින් ගෲෂෙන්කා ගේ හිස සිට දෙපා දක්වා පරීක්ෂාවෙන් බැලුවේ ය.

"බාල් ගැන බොහෝ ම දේවල් දන්නවා වගෙයි!"

"දන්නවා ද බාල් ගැන?"

"ඔව් මම බාලක් දැකල තියෙනවා. ගිය අවුරුද්දේ කුස්මා කුස්මිච් ගේ පුතා කසාද බැන්ද දවසේ දමාපු බාල මා දැක්කා. අලෝෂා වගේ කුමාරයෙක් හිටගෙන ඉන්න කොට උඹට කතා කරන එක වටින්නේ නැහැ. අලෝෂා මෙහාට ආවා ය කියා ඇසින් දැකලත් මට විශ්වාස කරන්න බැහැ. අනේ දෙයියනේ අලෝෂා ආවේ මා බලන්න ද? ඇත්ත කියන්න. අලෝෂා කවදාවත් මා බලන්න එවිය කියා මා විශ්වාස කළේ නැහැ. කවදාවත් දැක ගන්න ලැබේ ය කියා මා විශ්වාස කළේ නැහැ. කොහොම වුණත් ආවේ හොඳ වෙලාවක නො වෙයි. ඒ වුණත් අලෝෂා දකින්න ලැබීම ගැන මට බොහෝ ම සන්තෝෂයි. සෝපාව උඩ, මෙන්න මෙ තැනින් ඉඳ ගන්න. අන්න හොඳයි ....මට තවමත් විශ්වාස කරන්න බැහැ.............රැකිටින්. අලෝෂා ඊයේ නැතිනම් පෙරේදා එක්ක හෙත ආවනම් කො තරම් හොඳ ද! ඒ වුණත් අලෝෂා ගේ පැමිණීම ගැන මට බොහො ම සන්තෝෂයි. සමහර විට, ඊයේ නැතිනම් පෙරේදා ආවට වඩා හොඳයි මේ මොහොතේ දී ආපු එක."

අලෝෂා දෙස ප්‍රීතියෙන් බැලූ ගෲෂෙන්කා කෙළිසෙල්ලමින් ප්‍රීතිවන දැරියක මෙන් අලෝෂා ළඟින් සෝපාව උඩ ඉඳගත්තා ය. සැබැවින් ම ඇ සිටින්නේ ප්‍රීතියෙනි. තමා ප්‍රීතියෙන් සිටින්නේ යයි කීමෙන් ගෲෂෙන්කා කිවේ බොරුවක් නො වේ. ඇගේ දෑසින් කාන්තිය විහිදෙයි. දෙතොල් සිනාවෙන් නැටවෙයි. එය කරුණාවෙන් උපන් සිනාවකි. ඇගේ මුහුණේ මෙ තරම් කාරුණික පෙනුමක් ඇතැයි අලෝෂා බලාපොරොත්තු නො වී ය.………පළමු වරට අලෝෂා ගෲෂෙන්කා දුටුවේ පෙර දින සවස කැතිරිනා ගේ නිවෙසෙහි දී ය. එ දින ඇය කැතිරිනාට ඊරිසියාවෙන් කළ ප්‍රයෝගය දුටු අලෝෂා තුළ සංවේගයත් සමග මහත් භීතියක්ද ඇති වී ය. ඇ තමා බලාපොරොත්තු වූවාට වඩා ඉදුරා වෙනස් ගති ගුණ ඇති තැනැත්තියක වීම ගැන ඔහු පුදුම විය. හදවතේ කකියන ශෝකයෙන් විඩාපත් අලෝෂා ගේ දෑස නිතැතින් ම ගෲෂෙන්කා දෙසට යොමු විය. පෙර දින සවසට පසු ව ඇගේ ස්වභාවය යහපත් අතට හැරුණාක් මෙන් පෙනේ. ඇගේ මිහිරි කතාවේ පැවැති ලාමක ගතිය දැන් නැත. ඇගේ ඉරියව්වල පැවැති කාමය අවුස්සන මුදු මොලොක් ගතිය දැන් නැත. ඇ පිළිබඳ හැම දෙයක්ම චාම් ය, කාරුණික ය. ඇ ඉක්මනින් කතා කළා ය. ඒ කතාව අවංක ය, විශ්වාසදායක ය. එහෙත් ඇ නොසන්සුන් වූවා ය.

“හැම දෙයක් ම එක ම දවසේ සිදුවීම ලොකු පුදුමයක් නේද?” ගෲෂෙන්කා සළී දෙවමලූ වූවා ය. “අලෝෂා දකින්න ලැබීමෙන් මගේ හිතේ මේ තරම් ප්‍රීතියක් ඇතිවුණේ මොකද කියා මට තේරුම් ගන්න බැහැ. ඒ ගැන මගෙන් ඇසුවත් කියන්න පුළුවන් කමක් නැහැ.”

“ඇයි, ගෲෂෙන්කා මෙ තරම් සන්තෝෂයෙන් ඉන්නේ මොකද කියා දන්නේ නැද්ද?”යි රැකිටින් දත් නියවා කී ය. “අලෝෂා එක්ක ගෙන එන්න ය කියා මට නිතර ම කරදර කළා මතක නැද්ද? මට අලෝෂා එක්ක ගෙන එන්න ය කිව්වේ යම්කිසි අදහසක් ඇති ව වෙන්න ඕනෑ!”

“ඔව්, එහෙම අදහසක් තිබුණා තමයි. නමුත් දැන් ඒ අදහස නැහැ. එහෙම අදහසකට දැන් වෙලාව හොඳ නැහැ. මා දැන් ඉන්නේ බොහො ම සන්තෝෂයෙන්, ඒක නිසා මං අලෝෂාට හොඳ දෙයක් දෙනවා. රැකිටින් ඉඳගනින්, ඇයි හිටගෙන ඉන්නේ? හා, එහෙනම් දැනට ම ඉඳගත්තා ද? රැකිටින්ට ඉඳගන්න කියන්න ඕනෑ නැහැ. බලන්න අලෝෂාට ඉස්සෙල්ලා එයාට ඉඳගන්න කිව්වේ නැහැ, කියා එයා අප එක්ක තරහෙන්

ඉඳගෙන ඉන්නවා. රැකිටින්, මේ වගේ සුළු දෙයකටත් තරහ වෙන්න එපා. මා අද ඉන්නේ බොහෝ ම සන්තෝෂයෙන්. ඇයි අලෝෂා බොහො ම දුකින් ඉන්නේ? මොකද මට බය ද?" මෙසේ විමසූ තරුණිය ප්‍රීතියෙන් බැබළෙන සරදම් නෙතින් අලෝෂා ගේ දෙසට එබී බැලුවා ය

"මිනිහා කනගාටුවෙන් ඉන්නේ උසස් වීමට නොලැබුණ නිසයි" රැකිටින් කී ය.

"මොන උසස් වීමක්ද?"

"ඔයා ගේ තවුසා කුණු වෙලා ගඳගහනවා."

"මොනවා? විකාර දොඩනවා. උඹ හදන්නේ හිත රිදෙන දෙයක් කියන්න ද? මෝඩයා, කට වහගෙන හිටපන්! අලෝෂා මම නුඹේ ඔඩොක්කුවේ මෙන්න මේ විධියට ඉඳගන්න ද?" මෙසේ ඇසූ තරුණිය සෙල්ලම් කරන කුඩා බළල් පැටවකු මෙන්, සිනා සෙමින් පැන, අලෝෂා ගේ ඔඩොක්කුවේ හිඳ කරවටේ අත දමා මෙසේ කීවා ය. "මට පුළුවනි නුඹ වගේ උපාසකයන් සතුටු කරන්න. ඔඩොක්කුවේ ඉඳගත්තට වරදක් නැහැනේද? මා එක්ක තරහ වෙන්නේ නැහැනේද? කැමැති නැති නම් අහකින් ඉඳගන්නම්."

අලෝෂා නිහඬව සිටියේ ය. හිඳ සිටි තැනින් සෙලවීමට ඇති බියෙන් හිඳ සිටියේ ය. "කැමැති නැති නම් අහකින් ඉඳ ගන්නම්" යයි තරුණිය කියනවා ඔහුට ඇසිණි. එහෙත් ඔහු කතා නොකෙළේය. කාමරයේ මූල්ලක හිඳසිටි රැකිටින් තරහෙන් බලා සිටියේ ය. ඔහු බලාපොරොත්තු වූ කිසිවක් අලෝෂාගෙන් සිදු නො වී ය. අලෝෂාගේ සිතේ ඇති විය හැකි හැම හැඟීමක් ම සිතේ පැවැති ශෝකය විසින් ගිලගන්නා ලදී. ඒ මොහොතේ දී අලෝෂාට පැහැදිලි ව කල්පනා කිරීමට ශක්තිය තිබුණේ නම් සිතේ හටගන්නා හැම කාමාසාවකින් ම, හැම පෙළඹීමකින් ම ආරක්ෂා වීමට තමා තුළ ශක්තිමත් සන්නාහයක් තිබෙන බව අවබෝධ කරගන්නවා ඇත. එහෙත් සිතේ පැවැති නොපැහැදිලි අපේක්ෂාවත්, ආධ්‍යාත්මික ගුණයත්, දුනි ශෝකයත් නිසිය දී තම හදවතේ හටගත් අලුත් අද්භූත හැඟීම් ගැන අලෝෂාට පුදුම නො වී සිටිය නො හැකි විය. මේ තරුණිය – භයානක තරුණිය නිසා දූත් ඔහු බිය නො ගතියි. ගැහැනිය ගැන සිතිවිල්ලක් ඇති වූ වහා ම ඔහු ගේ ආත්මය තුළ පැනනගින භීතිය මේ ගැහැනිය නිසා ඇති නො විය. හැම ගැහැනියකට ම වඩා 'බියකරු වූ' මේ ගැහැනිය, ඔඩොක්කුවේ හිඳ තමා වැළඳගත්

ගැහැනිය, ඔහු තුළ අවදි කළේ කිසිසේත් ම බලාපොරොත්තු නොවූ අමුතු හැඟීමකි ගැහැනුන් නිසා මීට පෙර ඇති වූ භීතියේ ලකුණක් හෝ නැති. ඒ වෙනුවට ඇති වූයේ පිරිසුදු අදහසින් හට ගත් සැලකිල්ලකි. අලෝෂා පුදුම වූයේ ඒ නිසා ය.

"ඔය විකාර කතාව නවත්වලා අපට ෂැන්පේන් බොන්න දෙන්න මට කොහොම හරි ෂැන්පේන් බොන්න ඕනෑ. මතකයි නේ ද පොරොන්දුව?" යයි රැකිටින් කී ය

"ඔව් මට මතකයි. දන්නව ද අලෝෂා, තුඹ මෙහාට එක් කරගෙන ආවොත් රැකිටින්ට ෂැන්පේන් දෙනවය කියා මම පොරොන්දු වුණා. මාත් ෂැන්පේන් ටිකක් බොන්නම්. පෙමියා, පෙමියා, මීතියා ඉතිරිකරපු ෂැන්පේන් බෝතලය අරන් වරෙන්. රැකිටින්, මා කො තරම් ලෝභ වුණත් ෂැන්පේන් බෝතලයක් ගෙනෙන්නම්. උඹට බොන්න නො වෙයි. උඹ මහ නීචයෙක්. නමුත් අලෝෂා උකුස්සකු වගෙයි. දැන් මේ වෙලාවේ මගේ හිතේ තියෙන්නේ වෙන අදහස් ඒ වුණත් උඹ එක්ක ෂැන්පේන් බොන්නම්. ටිකක් දුරාචාරයේ හැසිරීමට මා කැමැතියි."

"මොකද නුඹට වෙලාසියෙන්නේ? මොකක් ද බලාපොරොත්තු වන පණිවිඩයේ? ඒක රහසක් ද?" යි රැකිටින් විමසුවේ ය. තමාට හැම විට ම එල්ලවන ඇනුම්පද ගැන තමා කිසිවක් නොදන්නා බව හැඟවීමට රැකිටින් හැකි තරම් වෑයම් කෙළේ ය.

"ඒක රහසක් නො වෙයි. උඹත් ඒක දන්නවා" යි තරුණිය මදක් ඈතින් සිටි රැකිටින් දෙස බලා කීවේ හදිසියෙන් ම ඇති කරගත් උනන්දුවකින් යුතු ව ය. "මගේ කපිතාන් එනවා, මා කැන්දා ගෙන යන්න එනවා."

'මටත් ආරන්චියි කපිතාන් එන බව. දැන් එයා ළඟට ම ඇවිදින් ද?"

"ඔව්, එයා දැන් මුක්රෝවට ඇවිදින් ඉන්නවා. එ තැන ඉඳලා මට පණිවිඩයක් එවනවා ය කියා මට කලින් ලියා එව්වා. අද මට එයාගෙන් ලියුමක් ලැබුණා. දැන් කොයි මොහොතක හරි මට ඒ පණිවිඩය ලැබේවි."

"ඇයි මුක්රෝවේ ඉඳලා පණිවිඩය එවන්නේ?"

"ඒක දිග කතාවක්. දැන් කියාපු හරිය ඇති."

"මිතියා කලබල කරන්න පුළුවනි, මිතියා මේ ගැන දන්නව ද?"

"නැහැ, දැනගත්තොත් මෙ ගැන මිනීමැරුමක් වෙනවා. දැන් මම මිනීමැරුම්වලට බය නැහැ. මම මිතියාගේ පිහියට බය වෙන්නේ නැහැ. රැකිටින්, මට මිතියා ගැන කතා කරන්නවත් එපා. එයා මගේ හිත තරක් කළා. මේ වෙලාවේ දී මිතියා ගැන කතා කරනවට මා කැමැති නැහැ. නමුත් අලෝෂා ගැන කතා කරනවට මා කැමැතියි. අලෝෂා දිහා බලන්න පුළුවනි .... අලෝෂා මා දිහා බලා සිනා සෙන්න............ කනගාටු වෙන්නේ නැති ව මා දිහා බලා සිනා සෙන්න .... මගේ මෝඩකම්, මගේ සැපත ගැන කල්පනා කරලා සිනා සෙන්න...... ..... අන්න අලෝෂා සිනා සෙනවා. කො තරම් ආදරයෙන් ද මා දිහා බලන්නේ! මා ඊයේ කැතිරිනාව කරපු දෙය නිසා අලෝෂා මා එක්ක තරහ වී ඇතැයි මා කල්පනා කළා. මා අවලම් බැල්ලියක්. ඒක ඇත්තයි...... නමුත් ඊයේ ඒ වැඩේ ඒ විදියට අවසන් වෙච්ච එක හොඳයි. ඒක බොහෝම පිළිකුල් දෙයක්. ඒ වුණත් හොඳයි." මෙසේ පැවසූ ග්‍රෑසෙන්කා සිහිනෙන් සිනා සෙන්නාක් මෙන් සිනාසුණා ය. ඇයගේ ඒ සිනාවේ කුරිරු ගතියක් තිබිණි. "මට තළන්න ඕනෑය කියා කැතිරිනා කෑගාපු බව මිතියා කිව්වා. මම ඇයට බොහෝ ම තරක විදියට නින්දා කළා. ඈ මා යටත් කරගන්න වෑයම් කළා.. .... මට චොකලට් කන්න දීලා යාළු කරගන්න හැදුවා........... කොයි එකටත් ඊයේ ඒ වැඩේ ඒ විදියට අවසන් වෙච්ච එක හොඳයි. නමුත් මට තවමත් බයයි අලෝෂා මා එක්ක තරහ වේ ය කියා." මෙසේ පැවසූ ග්‍රෑසෙන්කා ආයේත් සිනාසුණා ය.

"ඔව් ඒක ඇත්තයි" රැකිටින් හදිසියෙන් ම කීවේ ග්‍රෑසෙන්කාගේ කතාව අසා පුදුම වූවාක් මෙනි. "අලෝෂා වගේ කුකුළු පැටවුන්ට ග්‍රෑසෙන්කා බයයි."

"රැකිටින්; උඹ වගේ මිනිහකුට අලෝෂා පෙනෙන්නේ කුකුළු පැටවකු හැටියටයි. ..... ඒහෙම වෙලා තියෙන්නේ උඹට හෘදයසාක්ෂියට එකඟ ව කල්පනා කරන්න බැරි නිසයි. අන්න ඒක තමයි වැරැද්ද. නමුත් මම අලෝෂාට බොහෝ ම ආදරෙයි. අලෝෂාට මා මුළු හිතින් ම ආදරෙයි කිව්වොත් පිළිගන්නවද?"

"කිසි ම බයක් ලැජ්ජාවක් නැති ගෑනි. අලෝෂා, මේ ගෑනි හදන්නේ උඹව කටින් අල්ලගන්නයි."

"මම අලෙෝෂාට ආදරෙයි. ඉතින් මොකක්ද තියෙන වරද්ද?"

"කැත්ද ගෙන යන්න එන මනමාලයා ගැනයි, මිතියා එවනවා ය කියන වචනා පණිවිඩය ගැනයි මොක ද කියන්නේ?"

"ඒක වෙන ම දෙයක්."

"ඒ ගැනුත්ම පෙනෙන හැටියි."

"රැකිටින් මා තරහ කරන්න එපා" යි ගෘෂෙන්කා කිපී කීවා ය. "මේක වෙන ම දෙයක්. මා අලෝෂාට ආදරය කරන්නේ වෙන ම අදහසකින්, මීට කලින් මා අලෝෂා ගැන නරක අදහසක් ඇති ව සිටිය බව ඇත්තයි. මා බෙහො ම නරක ගැනියක්. නමුත් අනෙක් වෙලාවල දී මා අලෝෂාව සැලකුවේ මගේ හිතට එකඟවයි. මා කල්පනා කළා, අලෝෂා වගේ කෙනෙක්, මා වගේ පිළිකුල් ගැනියක් පහත් කොට සලකන්නේ කොහොමද කියා. ඊයේ අර තරුණ තාන්තාව ගේ ගෙදර ඉඳලා එන ගමන මා මේ ගැන කල්පනා කළා. අලෝෂා, මා බොහො ම කාලයක ඉඳලා තුඹ ගැන කල්පනා කළේ මේ විදියටයි. මිතියාත් ඒ ගැන දන්නවා. මම මිතියාට කිව්වා. සමහර විට අලෝෂා දිහා බලන කොට මගේ හිතේ මා ගැන ම ලොකු ලැජ්ජාවක් ඇති වෙනවා.... .... නමුත් අලෝෂා ගැන මේ විදියට මා කල්පනා කරන්න පටන්ගත්තේ කවද, ඉඳලා ද කියා මා දන්නේ නැහැ. ....මට මතක නැහැ... ...."

පෙමියා මුඞිය ඉවත් කරන ලද බෝතලයක් හා ෂැත්පේන් වීදුරු තුනක් සමඟ බත්දේසියක් ගෙනැවිත් මේසය උඩ තැබුවා ය.

"මෙන්න තියෙනවා ෂැත්පේන්" යයි රැකිටින් කීවේ ය. "ගෘෂෙන්කා අද වෙන ද වගේ නො වෙයි, ටිකක් කලබල වැඩියි. ෂැත්පේන් අඩියක් ගැහුවවට පස්සේ නටන්න පටන්ගනීවි. නමුත් උන්ට ඒකවත් හරියට කරන්න බැහැ." අනතුරු ව ඔහු ෂැත්පේන් බෝතලය දෙස බලා මෙසේ කීවේ ය. "අර නාකි ගැති කුස්සියේ දී අඩියක් ගහලා තියෙනවා, බෝතලෙත් රස්නෙයි. මුඩියත් නැහැ. කොහොම වුණත් පොඩි අඩියක් ගහන්න ඕනෑ."

මේසය ළඟට ගිය රැකිටින් එක උගුරට වීදුරුව හිස්කොට දෙ වන වරට ද වීදුරුව පුරවා ගත්තේ ය.

"මිනිහකුට බැහැ ෂැම්පේන් බීලා මත් වෙන්න" යයි රැකි-ටින් තොල තව ලෙව කමින් කී ය. "දැන් ඉතින් අලෝෂා උඹත් වීදුරුවක් පුරවා ගෙන උඹටත් යමක් කරන්න පුළුවන් බව පෙන්නපන්. අපි මොනවට සව්දිය පතා ද ෂැම්පේන් බොන්-නේ? දිව්‍ය ලෝකයේ ගේට්ටුවලට සව්දිය පතා බොමු. ගෲෂෙන්කා උඹත් වීදුරුවක් අරගෙන දිව්‍ය ලෝකයේ ගේට්ටුවලට සව්දිය පතා බිපන්."

"දිව්‍ය ලෝකයේ මොන ගේට්ටුවලට ද?"

ගෲෂෙන්කා ෂැම්පේන් වීදුරුවක් බීවා ය. අලෝෂා වීදුරුවේ රස බලා තැබුවේ ය.

"නෑ, මම බොන්නේ නැහැ" යි ඔහු සිනාසෙමින් කී ය.

"උඹ මහ ලොකුවට පුරසාරම් දෙඩුවා" යි රැකිටින් කී ය.

"අලෝෂා බොන්නෙ නැති නම් මම බොන්නෙත් නැහැ" යි ගෲෂෙන්කා ද හඬ නඟා කීවා ය. "මටත් ෂැම්පේන් කොහෙත්ම උවමනා නැහැ. උඹට උවමනා නම් බෝතලයම බීපන්. අලෝෂා බොනවා නම් තමයි මම බොන්නේ."

"මොනතරම් හොඳ අදහසක්" යි රැකිටින් ඇනුම්පදයක් කියන්-නාක් මෙන් කීවේ ය. "ඒකට මොකද ඉඳගෙන ඉන්නේ මිනිහ ගේ ඔඩොක්කුව උඩයි. මිනිහට දුක් වෙන්න දෙයක් තියෙනවා. මොකද වෙලා තියෙන්නේ? මිනිහා එයා ගේ දෙයියන් වහන්සේට විරුද්ධ ව ගිහින් කොරොස්ම කාලයේ දී ලිංගුස් කන්න හදනවා........"

"ඒ මොක ද?"

"එයා ගේ තවුසා අද මළා නොවැ—සොසිමා පියතුමා, අර සාන්තුවරයා—"

"සොසිමා පියතුමා මළා ද? අනේ දෙයියනේ මම සාන්තුවක් දන්නේ නැහැ" යි පැවසූ ගෲෂෙන්කා අනතුරු ව මහත් භක්ති-යෙන් කුරුසයේ ලකුණ ඇන්ද ය "අනේ දෙයියනේ මේ වගේ වෙලාවක මේ විදියට ඔඩොක්කුව උඩ ඉඳගෙන මා මොනවද කරන්නේ?" මෙසේ පැවසූ ගෲෂෙන්කා තැති ගත්තාක් මෙන් ඇලෝෂා ගේ ඔඩොක්කුවෙන් නැඟිට සෝපාව උඩ ඉඳගත්තා ය.

අලෝෂා තරුණිය දෙස පුදුමයෙන් බලා සිටියේ ය. ඔහු ගේ මුහුණ ආලෝක විය.

"රැකිටින්" යයි අලෝෂා හදිසියෙන් ම හඬනගා දැඩි ස්වරයෙන් කී ය. "මා දෙවියන්ට විරුද්ධ වූවා ය කියා මට සරදම් කරන්න එපා. මා කැමැති නැහැ තුඹ එක්ක තරහ වෙන්න, ඒ නිසා මට නරක විදියට කතා කරන්න එපා. මා සතු ව තිබුණු බොහෝ ම අගනා වස්තුවක් නැති වුණා. එවැනි වස්තුවක් කවදාවත් තුඹට තිබුණේ නැහැ. ඉතින් තුඹට පුළුවන් කමක් නැහැ මා ගැන විනිශ්චය කරන්න. ඊට වැඩිය හොඳයි ටිකක් ගෲෂෙන්කා දිහා බලන්න. ගෲෂෙන්කා මට අනුකම්පා කරන බව පේනවා නේද? මා අද මේ ගෙදරට ආවේ බොහෝ ම නපුරු තරුණියක් හමුවීමේ අදහසිනුයි. මා නපුරු කෙනකු බලන්න ආවේ මා ද නීච නපුරු සිත් ඇති කෙනකු නිසයි. නමුත් නපුරු තරුණියක් වෙනුවට මට අව්‍යාජ සොහොයුරියක් හමුවුණා. මට බොහෝ ම අගනා වස්තුවක් ලැබුණා, අනුකම්පාවෙන් හා ප්‍රේමයෙන් පිරුණු සිත් ඇති සොහොයුරියක් ලැබුණා. ඈ දැන් මට අනුකම්පා කළා......... මා කතා කරන්නේ ගෲෂෙන්කා ගැනයි. ඉතා පහත් තැනක තිබුණු මගේ ආත්මය ගෲෂෙන්කා උසස් තැනක තැබුවා."

අලෝෂා ගේ තොල් වෙවුලන්නට වී ය. ඔහු හුස්ම ගත්තේ අමාරුවෙනි.

"එහෙනම් ගෲෂෙන්කා උඹ ව ගලවාගත්තා ද?" යි රැකිටින් ද්වේෂයෙන් සිනා සී කී ය. "ගෲෂෙන්කා ලෑස්ති වී ඉන්නේ උඹ ව අල්ල ගන්නයි. උඹ ඒක දන්නෙ නැහැ."

"කට වහගනින් රැකිටින්" යයි ගෲෂෙන්කා නැඟිටිමින් කීවා ය. "උඹලා දෙන්නා ම කට වහගෙන හිටපල්ලා. මම කියන්නම් ඇත්ත. මා බොහෝ ම නරක ගැනියක්. අලෝෂා ගේ කතාවෙන් මගේ හිතේ ලොකු ලැජ්ජාවක් ඇති වුණා. රැකිටින් කට ඇරියොත් කියන්නේ බොරුවක්, ඒ නිසා කට වහගෙන හිටපන්. මගේ හිතේ අලෝෂා වසඟ කර ගැනීමට පහත් අදහසක් තිබුණු බව ඇත්තයි. නමුත් දැන් එ වැනි අදහසක් නැති නිසා උඹ කියන්නේ බොරුවක්. රැකිටින් මීට පස්සේ කට වහගෙන හිටපන්."

ගෲෂෙන්කා මෙසේ කීවේ අවදි වූ හැඟීමෙන් යුතු ව ය.

"උඹලා දෙන්නට ම පිස්සු" යි රැකිටින් දෙදෙනා දෙස පුදුම-යෙන් බලා කී ය. "මට පෙනෙන්නේ මා පිස්සන් කොටුවක ඉන්නවා වගෙයි. උඹල දෙන්න ම තව ටිකකින් අඬන්න පටන් ගනී වි."

"ඔව් මම අඬනවා" යයි ගෘෂෙන්කා කීවා ය. "අලෙෝෂා කියනවා මා එයා ගේ සහෝදරියක් ය කියා. ඒක මට කවදාවත් අමතක වෙන්නේ නැහැ. රැකිටින් උඹ දැනගනින් මා කොතරම් නරක ගෑනියක් වුණත් ලූනු ගෙඩියක් දන් දීලා තියෙන බව."

"ලූනු ගෙඩියක්! ලූනු ගෙඩියට හෙණ ගහල කියාවෙන්. උඹට වේලක පිස්සු තියෙනවා."

එ වේලේ අලෙෝෂා හා ගෘෂෙන්කා දැක්වූ උනන්දුව ගැන රැකිටින් පුදුම විය. ජීවිත කාලයක් තුළ දී කලාතුරකින් හෝ ඇති නොවන ආධ්‍යාත්මික ප්‍රබෝධයක් එ වේලේ ඔවුන් තුළ ඇති වන බව රැකිටින් දුටුවේ ය. ඒ අතරේ ඔහු ගේ සිතේ ශෝකය සමඟ අප්‍රසන්න ගතියක් ද ඇති විය තමා සම්බන්ධ කටයුතුවල දී නොසන්සුන් වන රැකිටින් අනුන් ගේ හැඟීම් ගැන අඹමල් රේණුවකට තරම්වත් සැලකිල්ලක් නොදැක්වූයේ ය. ඔහු තුළ මේ දුබල කම ඇති වූයේ තුරුණු විය, ජීවිතය ගැන පළපුරුද්දක් නැති කම හා දැඩි මමත්වයද නිසා ය.

"අලෙෝෂා, මා ලූනු ගෙඩියක් දන් දීම ගැන රැකිටින්ට කීමෙන් කළේ ආත්ම වර්ණනාවක් කර ගැනීමයි" තරුණිය අලෙෝෂා දෙස බලා කීවා ය. "නමුත් අලෙෝෂාට ඒ කතාව කියන්නේ ආත්ම වර්ණනාවක් හැටියට නො වෙයි. ඒක බොහො ම පොඩි වුණත් බොහො ම වැදගත් කතාවක්. කුඩා කාලයේ දී මා මේ කතාව දැනගත්තේ තවමත් මා ළඟ සිටින මහලු මෙතියෝනා ගෙන්. මෙන්න මේකයි කතාව. එකමත් එක රටක ගැමි ගෑනියක් හිටියා. ඈ බොහො ම නපුරු යි. ඈ මළා. නමුත් ඈ කවදාවත් කිසි ම යහපත් දෙයක් කරලා නැහැ. මළාට පස්සේ ඈ අපායේ ඉපදුණා. යමපල්ලෝ ඈය ඇද ගෙන ගිහින් ලෝකුඹු නිරයේ දැම්මා. එතකොට ඈගේ ආරක්ෂක දේව පුත්‍රයා කල්පනා කළා ඈය ගලවා ගැනීම පිණිස දෙවියන්වහන්සේ ළඟට ගිහින්, ඈය කළ එක ම යහපත් වැඩක් හරි කියන්න. 'වරක් මේ ඉතිරිය වත්තේ සිටුවන ලද ලූනු ගසක් ගලවා හිඟන්නියකට දුන්නා' යයි දේවදූතයා දෙවියන් වහන්සේට කීව්වා. 'එහෙනම් ඒ ලූනු ගහ ගෙන ගොස්, ලෝකුඹු නිරයේ සිටින ඈයට අල්ලාගැනීම පිණිස පහත් කොට, ඈ ලූනු ගෙඩිය අල්ලාගත් පසු ගොඩට ඇද බේරා ගන්න. ඈය ගොඩ ගන්න පුළුවන් නම් ඈයට පුළුවනි දෙව්ලොවට එන්න. නමුත් ලූනු ගෙඩිය කැඩුණොත් ඈයට සදහට ම අපායේ දුක් විඳින්න සිදුවෙනවා' යි දෙවියන් වහන්සේ පිළිතුරු දුන්නා. දේව පුත්‍රයා වහා ම ලූනු ගහ අරන් ගිහින්

ලෝකුඹු තිරයේ සිටින ඇයට අල්ලා ගැනීම පිණිස පහත් කරලා 'ඉක්මනට මේ ලූනු ගෙඩිය අල්ල ගන්න. මම නුඹ මේ අපා දුකින් නිදහස් කරගන්නම්' යයි කියා බොහො ම සෙමෙන් ඇය ගොඩට අදින්න පටන් ගත්තා. දේව පුත්‍රයා යන්තම් ඇය ගිනි ජාලාවෙන් එළියට ගත්තා. නමුත් ඇය ගොඩ එන බව දුටු අනෙක් පව්කාරයෝ ඇගේ ආධාරයෙන් ගොඩ ඒම පිණිස ඇගේ ඇගේ එල්ලුණා. නමුත් මේ මැහැල්ල බොහො ම නපුරැයි. තමා පිටුපසින් එන අනෙක් පව්කාරයන්ට ඈ පයින් අනිමින් 'මේක මගේ ලූනු ගෙඩිය, උඹලට අයිති නැහැ. ගොඩ ගන්නේ මා පමණයි. උඹලා නො වෙයි' කිව්වා. ඈ මෙමෙස් කියා අවසන් වන වාත් සමග ම ලූනු ගෙඩිය කැඩුණා. ඈ අපායට වැටී අද වනතුරු අපාදුක් විඳිනවා. අර දේව පුත්‍රයා අඬා වැලපී යන්න ගියා. ඒක තමා කතන්දරය. අර නපුරු ගෑනි මා වන නිසා මට මේ කතාව කටපාඩමෙන් කියන්න පුළුවනි. මා ලූනු ගෙඩියක් දුන් බව කිය-මින් රැකිටින්ට අහංකාරකම් පෙන්නුවත්, මා ලූනු ගෙඩියක් දීම හැරෙන්නම් වෙන කිසි ම යහපත් වැඩක් කරලා නැති බව කියන්න ඕනෑ. ඉතින් අලෝෂා මට ප්‍රශංසා කරන්න එපා. මා යහපත් තැනැත්තියක් ය කියා කල්පනා කරන්න එපා. මා බොහො ම නරක නපුරු ගෑනියක්. නුඹ මට ප්‍රශංසා කරන විට මගේ සිතේ ලොකු ලැජ්ජාවක් ඇති වුණා. කිසිවක් නොසඟවා ඇත්ත කියන්න. අලෝෂා කරුණාකර මා කියන දෙය අහන්න. නුඹ වසඟ කර ගැනීමට මා කො තරම් ආසාවෙන් හිටියා ද කිය-තවා නම් නුඹ මා ළඟට නොහොවොත් රූබල් විසිපහක් දෙන බවට රැකිටින්ට පොරොන්දු වුණා ....රැකිටින් ටිකක් හිටපන්, දැන් ම යන්න එපා."

ගෲෂෙන්කා වහා මේසය ළඟට ගොස් ලාච්චුවක් ඇර, පොකැට්ටුවක් ගෙන, ඒ පොකැට්ටුවෙන් රූබල් විසිපහේ නෝට්ටුවක් ගත්තා ය.

"උඹට පිස්සු ද?" යි රැකිටින් කලබල වෙමින් කී ය.

"රැකිටින් මේ සල්ලි ගනින්. කොහොම හරි මේ සල්ලි උඹට ගෙවන්න ඕනෑ. නො ගෙන ඉන්න එපා. උඹමයි සල්ලි ඉල්ලුවේ." මෙසේ පැවසූ තරුණිය නෝට්ටුව තරුණයා දෙසට විසි කළා ය.

"නැහැ, මම සල්ලි නො ගෙන ඉන්නේ නැහැ" යි ලැජ්ජා-වෙන් පැවසූ රැකිටින් සිතේ පැවැති නොසන්සුන් කම සඟවා ගැනීමට වෑයම් කෙළේ ය. "මේ සල්ලි මට උවමනා වේවි. මෝඩ-යන් සිටින්නේ ඥානවන්තයන් ගේ ලාභය පිණිසයි."

"දැන් ඉතින් කට වහගෙන මා කියන දෙය අහගනින්. මා කියන දෙයට උඹ එ තරම් කැමැතිවන එකක් නැහැ. අර මුල්ලෙන් ඉඳගෙන කට වහගනින්. අපට කැමැති නැති නම් තියෙන්නේ කට වහගෙන ඉන්න එකයි."

"මා මොනවට ද උඹට කැමැති වන්නේ" යයි නපුරු බසින් පැවසූ රැකිටින් සිතේ පැවැති අසතුට සඟවා ගැනීමට වෑයම් නොකෙළේ ය. ඔහු රූබල් විසිපහ සාක්කුවේ දමා ගත්තේ ය. එහෙත් ඒ ගැන ඔහු ලැජ්ජා වූයේ අලෝෂා බලා සිටි හෙයිනි. ඔහු අදහස් කරගෙන සිටියේ පසු ව අලෝෂාට නො දැනෙන්නට මුදල් ගැනීමට ය. එහෙත් දැන් ලැජ්ජාවම්පත් හෙතෙම අනතුරුව කෝප වී ය. ගෘසෙන්කා තමාට කො තරම් ඇනුම්පද කිව්වත් මේ මොහොත වන තෙක් ඇගේ කතාවට විරුද්ධ නො වී සිටීමට ඔහු අදහස් කරගෙන සිටියේ ඇගෙන් කිසියම් දෙයක් බලාපොරොත්තු වූ නිසයි. එහෙත් ඔහුට කෝපය මැඩ ගත නොහැකි විය.

"කෙනෙක් තවත් කෙනෙකුට ප්‍රේම කරන්නේ කිසියම් හේතුවක් ඇතිවයි. නමුත් උඹලා දෙන්නාගෙන් මට ඇති යහපත මොකක් ද?"

"අලෝෂා ප්‍රේම කරනවා වගේ උඹත් ප්‍රේම කරන්න ඕනෑ කිසි ම ලාභයක් බලාපොරොත්තු වෙන්නෙ නැති ව යි."

"අලෝෂා උඹට ප්‍රේම කරන්නේ මොන කාරණාවක් නිසා ද? උඹ ඒ ගැන කලබල කරන්නේ අලෝෂා උඹට ප්‍රේම කරන බව ඔප්පු කළා ද? ඔප්පු කරන්න මොනවද කළේ?"

කාමරයේ මැද සිටි ගෘසෙන්කා කෝපයෙන් කතා කළා ය. ඇගේ කට හඬේ උමතු ගතියක් දකින්නට තිබිණි.

"රැකිටින් කට වහගෙන හිටපන්. උඹ අප ගැන කිසි ම දෙයක් දන්නේ නැහැ. හයක් සැකක් නැති ව මට ඔය විදියට ආයේත් කතා කරන්න එපා. ඔය විදියට හයක් සැකක් නැති ව කතා කරන්නේ මා කවුරු කියා හිතාගෙන ද? මගේ වැඩකාරයා වගේ අර මුල්ලට වෙලා කට වහගෙන හිටපන්.......... ඉතින් අලෝෂා මම ඇත්ත කියන්නම්. එතකොට පෙනේවි මා කො තරම් කාලකණ්ණියක් ද කියා. මා බලාපොරොත්තුව සිටියේ තුඹ නොමග යවා විනාශ කරන්නයි. තුඹ විනාශ කිරීමට මගේ හිතේ කො තරම් ලොකු ආශාවක් තිබුණා ද කියනවා නම් තුඹ

මෙහාට එක්කර ගෙන ආණෙවාත් රූබල් විසිපහක් දෙන බවට රූකීටින්ට පොරොන්දු වුණා. නමුත් මා තුඹ විනාශ කිරීමට කල්පනා කළේ මොන අදහසකින් ද? තුඹ ඒ ගැන කිසි ම දෙයක් දන්නේ නැහැ. අලෙෝෂා, තුඹ මා ළඟින් යන කොට අහක බලා ගන්නවා. මා තුඹේ දිහැ සිය වරකටත් වැඩිය බලන්න ඇති, මම තුඹ ගැන හැම දෙනාගෙන් ම විපරම් කරල බැලුවා. තුඹේ මූහුණ මගේ හිතේ හොල්මන් කරන්න පටන් ගත්තා. 'මේ ඉලන්දාරියා මා දිහැ නොබලන්නේ මා පහත් කොට සලකන නිසා වෙන්න ඕනැ' කියා මා කල්පනා කළා. මෙන මගේ හිතේ කො තරම් හදින් කාවැදුණා ද කියනොත් මා කොල්ලෙකුට භය වුණා ද? කියා කල්පනා කරලා පුදුම වුණා. 'මේ කොල්ලා මගේ වසඟයට ගෙන හිනා වෙන්න ඕනැ' ය කියා මම කල්පනා කළා. මා ඒ තරම් තරහෙන් හිටියේ. අලෝෂ දන්නවද, මෙහෙ ඉන්න කිසි ම කෙනෙක් නරක අදහසින් මා ළඟට එන්නේ නැහැ මහලු කුස්මා විතරයි මා ආශ්‍රය කරන්නේ, මම මිනිහට දාසියක් වගේ යටහත් ව සිටියා. අප දෙන්නා සමගි කරන්න ඇත්තෙත් සාතන් වෙන්න ඕනැ. සාතන් හැරෙන්න වෙන කිසි ම කෙනෙකුට බැහැ ඒ වගේ වැඩක් කරන්න. නමුත් තුඹ දුටුවාම මට කල්පනා වුණා තුඹ මගේ වසඟෙට ගෙන පසුව හිනා වෙන්න. රේතවා නේද මා කො තරම් කුඩුකේඩු බැල්ලියක්ද කියා. එ වැනි ගෑනියකටයි තුඹ සහෝදරියක් ය කියන්නේ. මා දූෂණය කළ කපිතාන් දැන් ඇවිත් ඉන්නවා. මා බලා ඉන්නේ එයාගෙන් පණිවිඩයක් ලැබෙන තෙක්. මේ මිනිහා මට කො තරම් වැදගත් ද කියා අලෝෂා දන්නේ නැහැ. මීට අවුරුදු පහකට කලින් කුස්මා මා මෙහාට එක්ක ගෙන ආවාට පස්සේ මම කිසි ම කෙනෙකුට නො පෙනෙන්න හැංගිලා හිටියා. කිසිම කෙනෙකුට ඇහෙන්න කතා කළේ නැහැ. මම මහ මෝඩ කෙල්ලක් මම හැම තිස්සේ ම ඇඬුවා. රෑට නිදා නො ගෙන කල්පනා කළා. 'මට මේ විපත්තිය කළ මිනිහා මෙලහකට කොයි ඇද්ද? සමහර විට තව ගෑනියක් එක්ක ඉඳගෙන මට හිනා වෙනවා ඇති. මේ මිනිහා හමු වුණොත්, දකින්න ලැබුණොත්, මා දන්නවා කරන දෙය. මම රෑට කළුවරේ කොට්ටයේ මූහුණ ඔබා ගෙන ඇඬුවා, කල්පනා කළා, ඒ මිනිහා නිසා මගේ හිතේ ඇති වූ කෝපය ගැන ප්‍රීති වුණා. 'මම ඔහුගෙන් පළි ගන්නවා ගන්නවාමයි.' මා මෙහෙම කියමින් තමයි කළුවරේ ඉඳගෙන ඇඬුවේ. එතකොට මට හදිසියෙන් ම කල්පනා වුණා මිනිහට විරුද්ධව කිසි ම දෙයක් නොකරන්න. සමහරවිට මිනිහා මා ගැන හිනාවෙනවා ඇති. නැතිනම් මිනිහට මා සම්පූර්ණයෙන්ම අමතක වෙලා ඇති. මම බිම වැතිර එළිවනකන් ඇඬුවා. මා උදේ

නැගිටින්නේ බල්ලෙක් වගේ තරහෙන්, මුළු ලෝකය ම ඉරා දමීමේ අදහසිනුයි. දන්නව ද ඊට පස්සේ මා මොකද කළේ කියා? මම සල්ලි හම්බකරන්න පටන්ගත්තා. මගේ හිත ගල් වුණා. මගෙ සැක නැති වුණා. මම ලෝබකම් කරන්න පටන්ගත්තා සමහරවිට නුඹ හිතන්න පුළුවනි මා මෝඩකම් අත්හැර ඥාන-වන්ත විදියට කටයුතු කරනවා ය කියා. නැහැ නැහැ, මේ ලෝකේ කිසි ම කෙනෙක් මා කරන දෙය දැන සිටියේ නැහැ. මීට අවුරුදු පහකට කලින් මෝඩ කෙල්ලක් මෙන් බිම වැටී ඇඬුවා වගේ ම දත් මම බිම වැටී දත් සපමින් 'මම උඹෙන් පළි ගන්නවා පළිගන්නවාමයි' කියමින් එළිවනතෙක් අඬනවා. ඇහුණා නේද මා කියන දෙය? එහෙනම් නුඹට මගේ අදහස් තේරුම් ගන්න පුළුවනි. මාසයකට කලින් මට ඒ මිනිහගෙන් ලියුමක් ලැබුණා. 'එයා ඇවිදින් මට කතා කළොත් ගුටි කෑ බල්ලෙක් වගේ මම මිනිහ ළඟට යනවා ය' කියා මට හදිසියෙන් ම කල්-පනා වුණා. මේ වගේ අදහසක් මගේ හිතේ ඇතිවේය කියා විශ්වාස කරන්න පුළුවන් ද? මා එතරම් ම නීච ද? මිනිහ කතා කළොත් යනව ද? නැද්ද? මේ මාසේ දී මා මා ගැන ම කො තරම් කෝපයක් ඇති කරගෙන සිටියා ද කියතොත් මා මීට අවුරුදු පහකට කලින් සිටිය තත්ත්වයට ම ආපසු පැමිණියා. අලෝෂා දන් පේනවා නේද මා කො තරම් නපුරු කුඩුකේඩු ගැනියක් ද කියා. දන් මම නුඹට සම්පූර්ණ ඇත්ත කිව්වා. මා මෙතෙක් කල් මිතියා එක්ක හිටියේ මා දූෂණය කළ මිනිහා එක්ක නො ගිහින් සිටින්නයි. රැකිටින්, කතා කරන්න එපා. මා ගැන විනිශ්චය කිරීම උඹට කරන්න පුළුවන් දෙයක් නො වෙයි. මා කතා කරන්-නේ උඹට නො වෙයි. උඹ එන්න ඉස්සෙල්ලා මා මේ සෝපාව උඩ තිදුගෙන මගේ අනාගතය ගැන කල්පනා කළා. මගේ හිතේ කොයි විදියේ අදහස් ඇති වුණා ද කියා උඹ දන්නේ නැහැ. අලෝෂා අර තරුණ කාන්තාවට කියන්න, පෙරේදා මගේ අතින් වෙච්ච වරදට තරහ වෙන්න එපා ය කියා........
මේ ලෝකේ සිටින කිසි ම කෙනෙක් මා විදින දුක දන්නේ නැහැ කවදාවත් දැනගන්න ලැබෙන්නෙත් නැහැ. සමහර විට මම අද පිහියක් අරන් ගිහින් අර මිනිහා මරන්න පුළුවනි. මොනවා කරන්න ද කියා මට තේරෙන්නේ නැහැ........................"

මේ ශෝකජනක අවස්ථාවේ දී ගෲෂෙන්කාට කතා කරගත නොහැකි විය. ඈ දෑතින් මුහුණ වසා ගෙන සෝපාවේ කොට්ට උඩ වැතිර කුඩා ළමයකු මෙන් ඇඬුවා ය.

අලෝෂා හිඳ සිටි තැනින් නැඟිට රැකිටින් ළඟට ගියේ ය:

"රැකිටින් ගෲෂෙන්කා එක්ක තරහ වෙන්න එපා" යි ඔහු කී ය. "ගෲෂෙන්කා නුඹේ හිත රිද්දවපු බව ඇත්තයි. නමුත් තරහ වෙන්න එපා. ඈ දූන් කියාපු දෙය ඇහුණා නේද? මනුෂ්‍යයා ගේ ඉවසීමේ සීමාවක් තියෙනවා. ඒ බව දනගෙන අපි මිනිසුන්ට අනුකම්පා කළයුතුයි."

අලෝෂා මෙසේ කීවේ ඒ මොහොතේ ඇති වූ හැඟීම්වලට අවනත වෙමිනි. ඔහු රැකිටින්ට කතා කළේ යම් කිසිවකුට කතා කළ යුතු වූ හෙයිනි. රැකිටින් එ තැන නොසිටියේ නම් ඔහු තනියෙන් ම කතා කරනවා ඇත. එහෙත් අලෝෂා කතාව කොටින් නතර කළේ රැකිටින් ඔහු දෙස අවඥවෙන් බැලූ හෙයිනි.

"ඊයේ රෑ උඹ උඹේ තවුසා ගේ දේශනාවෙන් කො තරම් ඔළුව පුරවා ගත්තද කියනවානම් දන් උඹ ඒ ඔණ මට කියන්න ලෑස්ති වෙනවා" යි රැකිටින් කීවේ ද්වේෂයෙන් හටගත් සිනාවකුත් සමග ය.

"රැකිටින් හිනා වෙන්න එපා. මැරිච්ච මිනිස්සු ගැන කතා කරන්න එපා. එතුමා මේ ලෝකේ සිටින අනෙක් අයට වඩා හොඳයි" අලෝෂා කීවේ කඳුළු සලමිනි. "මා නුඹට කතා කළේ විනිශ්චයකාරයකු කතා කරනවා වාගෙ නොවෙයි. විනිශ්චයට අසු වූ ඉතා පහත් තැනැත්තකු හැටියටයි. මගෙත් ඈගෙත් අතර ඇති වෙනස නුමක් ද? මා මෙ තැනට ආවේ මගේ විනාශය පතා නෙනසි. මා බියගුල්ලෙක්. මා කල්පනා කළා මොනවා වුණත් කමක් නැහැ කියා. නමුත් ගෲෂෙන්කා මා වගේ නො වෙයි. ඈ අවුරුදු පහක් දරාගෙන දුක් වින්ද. නමුත් ඈයට ආදරයෙන් කතා කළාම ඈගේ හිත උණුවෙලා ඈයට හැම දෙයක් ම අමතක වුණා. තමාට වැරදි කළ අයට සමාව දුන්නා. ඈයට වැරදි කළ අර මිනිහා අයෙත් ඇවිදින් කතා කරනවා. ඒ මිනිහා තමාට කළ හැම වරදකට ම සමාව දී ඔහු සමග යන්න ඈ සැරසෙනවා. නමුත් ඈ කවදාවත් ඒ මිනිහාගෙන් පළි ගන්න පිහියක් අරන් ගත්තේ නැහැ. මට ඒ ගැන ස්ථිර ව ම කියන්න පුළුවනි. මා ගෲෂෙන්කා වගේ කෙනෙක් නො වෙයි. මා දන්නේ නැහැ නුඹ ඈය වගේ කෙනෙක් ද කියා. මෙක මට හොඳ පාඩමක්.......... ගෲෂෙන්කා ගේ හිත අපේ හිත් තරම් නපුරු නැහැ. ඈගේ හිත ප්‍රේමයෙන් පිරිලා. ඈ කතා කළ හැටි දුටුවානේද? නැහැ නුඹ දුටුවේ නැහැ. දුටුවානම් ඈගේ ගතිගුණ මීට බොහො ම කලින් තේරුම් ගන්නවා ඇති.............. ...පෙරේද ගෲෂෙන්කා ගෙන් අපහාස ලැබූ කැතිරිනා ගෲෂෙන්කාට සමා විය යුතුයි. කැතිරිනා

ගෘසෙන්කා ගේ ගතිගුණ දැනගත්ත වහා ම සමාව දේවි. ඇයට දැනගන්න ලැබේ වි. ගෘසෙන්කා ගේ හිතට තව ම නිදහසක් ලැබිලා නැහැ. ඒ නිසා අපි අනුකම්පා කළයුතුයි. ඇගේ ආත්මය තුළ නිධානයක් තියෙන්න පුළුවනි."

අලෝෂා කතාව නතර කළේ කතාකරගත නොහැකි වූ හෙයිනි. මෙතෙක් වේලා කෝපයෙන් සිටි රැකිටින් ද අලෝෂා දෙස පුදුමයෙන් බැලුවේ ය. කරුණාවෙන් පිරි හදවතක් ඇති අලෝෂා ගෙන් ඔහු මෙ වැනි දෙයක් බලාපොරොත්තු නො වී ය.

"තමා වෙනුවෙන් කතා කරන්න ගෘසෙන්කාට කෙනෙක් ලැබිල තියෙනවා. ඇයි උඹ ගෘසෙන්කාට ප්‍රේම නොකරන්නේ? ගෘසෙන්කා අපේ තරුණ පූජකයා උඹට ප්‍රේම කරනවා, ඒ ගැන සැක කරන්න දෙයක් නැහැ. තුඹ විශාල ජයක් ලැබුවා"යි රැකිටින් දුෂ්ටයකු ලෙස සිනා සෙමින් කී ය.

ගෘසෙන්කා, කොට්ටය මත රඳවා ගෙන සිටි හිස උස්සා කඳුලින් සේදුණු මුහුණේ රැඳී බැබළෙන කරුණාවෙන් පිරී සිනාවකින් යුතු ව අලෝෂා දෙස බැලුවා ය.

"අලෝෂා මගේ දේවදූතයා, රැකිටින් එක්ක තරහ වෙන්න එපා. ජේනවා නේද මිනිහගෙ හැටි. මිනිහා කතා කරන්නට තරම් සුදුස්සෙක් නො වෙයි" මෙසේ පැවසූ ගෘසෙන්කා අනතුරුව රැකිටින් දෙසට හැරී "රැකිටින් උඹට අපහාස කළාට මම උඹෙන් සමාව ඉල්ලන්නයි හිටියේ. නමුත් දැන් මට උඹෙන් සමාව උවමනා නැහැ. අලෝෂා මා ළඟින් ඉඳගන්න"යි ඇ ප්‍රීතියෙන් සිනාසෙමින් අලෝෂාට කතා කළා ය. "බොහොම හොඳයි, මෙ තැනින් ඉඳගන්න, දැන් ඉතින් මට කියන්න" ඇ අලෝෂා ගේ අත ගෙන මුහුණ දෙස සිනාසෙමින් බලා "මට කියන්න මා අර මිනිහට, මට වැරදි කළ මිනිහට ආදරේද නැද්ද කියා. අලෝෂා එන්න කලින් මම කළුවරේ ඉඳගෙන මගෙන් ම ප්‍රශ්න කළා මා මේ මිනිහට ආදරේද නැද්ද කියා. අලෝෂා දැන් ඉතින් නියම වේලාව පැමිණ තියෙනවා. මා මොනවා කරන්න ද? කරුණාකර කියන්න. අලෝෂා කියන දෙය කරන්නම් මා ඒ මිනිහට සමාව දිය යුතු ද? නැද්ද?"

"දැනට ම ඒ මනුෂ්‍යයාට සමාව දීලා අවසානයි නේද?"යි අලෝෂා සිනා සෙමින් ඇසුවේ ය.

"ඔව්, මම එයාට සමාව දුන්නා"යි ගෘසෙන්කා කල්පනා කරමින් කීවා ය. "මගේ හිත කො තරම් නීච ද, ඒ නීච හිතට

දීර්ඝායු ලැබේ වා.” මෙසේ පැවැසූ ගෘසෙන්කා මේසය උඩ තිබුණු ෂැන්පේන් වීදුරුව ගෙන එක උගුරට හිස් කොට උස්සා බිම දමා ගැසුවා ය. මහත් ශබ්දයක් නගා වීදුරුව බිඳිණි. ඈ සිනාසුණා ය. ඒ සිනාවේ නපුරු ගතියක් දකින්නට තිබිණි

“සමහර විට මා එයාට සමාව නොදෙන්න ඇති”යි ඈ ආයේත් කීවා ය; ඇගේ කටහඬේ තර්ජනයක ස්වරූපයක් දකින්නට තිබිණි. තමා සමග තනියෙන් කතා කරගන්නාක් මෙන් ඈ බිම බලාගත්තා ය. “සමහරවිට මගේ හදවත සමාව දීමට සූදානම් වෙනවා ඇති. මම මගේ හදවත සමග සටන් කළ යුතුයි. අලෝෂා දන්නව ද. පසුගිය අවුරුදු පහ තුළ මගේ ඇස්දෙකින් ගලන කඳුළුවලට ප්‍රේම කිරීමට මම පුරුදු වුණා.............. සමහර විට මා ප්‍රේම කරන්නේ ඔහුට නො ව මගේ සිතේ පැසෙන කෝපයට විය යුතුයි..................”

“ඔය නිලධරයා ගේ තත්ත්වයේ සිටීමට නම් මා කොහෙත්ම කැමැති වෙන්නේ නැහැ”යි රකිටින් සිවේ අප්‍රසාදය පළකරමිනි.

“උඹට කවදාවත් එයාගේ තත්ත්වයට පැමිණෙන්න ලැබෙන්නේ නැහැ. උඹ හොඳ මගේ සපත්තු සුද්ද කරන්නයි. උඹට කවදාවත් මා වගේ ගැනියක් ලැබෙන්නේ නැහැ............සමහර විට ඒ නිලධරයාට වුවත් මා වගේ ගැනියක් නොලැබෙන්න පුළුවනි.”

“උඹේ නිලධරයාට උඹ වගේ ගැනියක් ලැබෙන්නේ නැති නම් මොනවටද ඔය විදියට ඇඳ පැළඳ ගෙන ඉන්නේ?” යයි රකිටින් අවඥාවෙන් පිරි බැල්මකින් තරුණිය දෙස බලා ඇසුවේ ය.

“මගේ ඇඳුම් පැළඳුම් දෙස බලා මට අපහාස කරන්න එපා. මගේ හදවතේ තියෙන දේවල් ගැන උඹ කිසි ම දෙයක් දන්නේ නැහැ. මගේ මේ ලස්සණ ඇඳුම් පැළඳුම් ඉරා දමන්න ඕනුණොත් මේ මොහොතේ ම ඉරා දමනවා”යි ගෘසෙන්කා තියුණු විත්විද යන කටහඬින් කීවා ය. “මා මේ ලස්සණ ඇඳුම් අඳගෙන ඉන්නේ මොනවටද කියා උඹ දන්නේ නැහැ. සමහරවිට මා ඔහු දිහා බලා ඔහුගෙන් අහන්න පුළුවනි ‘මා මෙ තරම් ලස්සණව ඉන්නවා මීට කලින් දැකල තියෙනවද?’ කියා. ඔහු මා අත්හැර දමනකොට මා හරියට අවුරුදු දහතක් වයසැති කාසයෙන් පෙළෙන දරුවකු වගෙයි. මම ඔහු ළඟින් ඉඳගෙන ඔහු වසඟ

කරගන්නවා නුඹට පේනවා නේද මගේ හැටි?' කියා මම ඔහුගෙන් අහනවා. රුකිටින් මා මෙ තරම් ලස්සණට ඇඳපැළඳ ගෙන ඉන්නේ ඒ නිසා වෙන්න ඕනැ''යයි ගෲසෙන්කා නපුරු සිනාවක් පා කීවා ය. අලෝෂා මම බොහො ම සාහසික නපුරු ගැනියක්. මට මිනිසුන් රුස්සන්නේ නැහැ. මට පුළුවනි මේ ඇඳුම් ඉරාදමා මුහුණ පුච්චා ගෙන, පිහියකින් කපා ගෙන, මගට බැහැලා හිගා කන්න. මට හිතුණොත් කිසි ම කෙනකු හමුවෙන්න කිසි ම තැනකට යන්නේ නැහැ. මට හිතුණොත් මගේ නාංකි වෙලෙන්ද දුන්න සේරම සල්ලි ආපසු දීලා මුළු ජීවිතයට ම වැඩකාරකම් කරනවා. රුකිටින් උඹේ කල්පනාව මට එහෙම දෙයක් කරන්න බැහැ කියා ද? මට පුළුවනි කිසි ම බියක් සැකක් නැති ව ඕනැ ම දෙයක් කරන්න. මාව කුපිත කරන්න එපා..............මට පුළුවනි අර තිලධරයා ආපසු යවන්න. ඊට පස්සේ මිනිහට කවදාවත් ආයෙත් මා දකින්න ලැබෙන්නේ නැහැ."

ගෲසෙන්කා අන්තිම වචන ස්වල්පය කීවේ උමතු වූවාක් මෙන් කෑගාමිනි. එහෙත් අනතුරු ව ඈ දෑතින් මුහුණ වසා කොට්ටයේ ඔබා ගෙන ඉකිගසමින් අඬන්නට වූවා ය.

රුකිටින් නැඟී සිටියේ ය.

"දැන් ඉතින් අපි යන්න ඕනැ; දැන් ම ගියේ නැති නම් ආශ්‍රමයේ ගේට්ටුව වහනවා."

ගෲසෙන්කා තිඳා සිටි තැනින් වහා නැඟී සිටියා ය.

"අලෝෂා දැන් ම යන්නෙ නැහැ නේද?''යි තරුණිය ශෝකයෙන් ඇසුවා ය. "මගේ හැඟීම් අවුස්සලා, මගේ හිතට වද දීලා, මේ රෑ හැම දෙයකට ම තනියෙන් මුහුණ පාන්නට ඉඩ දීලා යන්න ද කල්පනාව?"

"අලෝෂාට පුළුවන් කමක් නැහැ උඹ එක්ක රෑ ගතකරන්න. කැමැති නම් අලෝෂා සිටපුදෙන්, මම තනියෙන් යනවා''යි රුකිටින් සරදම් බසින් කීවේ ය.

"උඹේ නපුරු කට වහගනින්'' යයි තරුණිය කිපී කීවා ය. "අලෝෂා මට කතා කළ විදියට උඹ කවදාවත් කිසි ම කෙනකුට කතා කරලා නැහැ."

"අලෝෂා මොනවද උඹට කියාපු විශේෂ දෙය?''යයි රුකිටින් ඇසුවේ නොසන්සුන් වෙමිනි.

"මං දන්නේ නැහැ, නමුත් අලෝෂා කියාපු දෙය මගේ හිතට කෙළින් ම කාවැදුණා.....................මට අනුකම්පා කළ පළමු වන තැනැත්තා, එක ම තැනැත්තා අලෝෂායි. ඒක තමා තියෙන වෙනස. අලෝෂා ඇයි මීට කලින් මා ළඟට නො ආවේ?" මෙසේ කී තරුණිය උමතු වූවකු මෙන් අලෝෂා ඉදිරිපිට දණින් වැටුණා ය. "අලෝෂාට සමාන කෙනෙක් හමුවනකන් මම මුළු ජීවිත කාලයක් ම බලා සිටියා. මා කො තරම් නරක ගැනියක් වුණත් යම් කිසිවෙක් මට අවංක ව ප්‍රේම කරන බව මම දැන ගෙන සිටියා."

"මොකක්ද මා කළ යහපත් දෙය?" යයි අලෝෂා කරුණාවෙන් පිරි සිනාවක් පා පහත් වී තරුණිය ගේ අත ගනිමින් ඇසුවේ ය. "මම ලූනු ගෙඩියක් දුන්නා. ඉතා කුඩා ලූනු ගෙඩියක් දුන්නා පමණයි."

මෙසේ කියන අතරේ අලෝෂා ගේ දෑස කඳුළින් පිරුණේ ය. ඒ මොහොතේ ගෙන් පිටත ශබ්දයක් ඇසිණි. යම්කිසිවෙක් ගෙට ගොඩ විය. ගෲෂෙන්කා තැතිගෙන නැගී සිටියා ය. පෙනියා කෑගා-මින් විසිත්ත කාමරයට දිව ආවා ය.

"නෝනාමහත්මයා, අනේ නෝනාමහත්මයා, මිනිහෙක් පණිවිඩයක් අරගෙන ආවා" යයි පෙනියා ප්‍රීතියෙන් හටගත් නොඉවසිල්ලෙන් කීවා ය. "මුක්රෝවේ ඉඳලා තිමෝති පණිවිඩයක් අරන් ආවා. මිනිහා කරත්තයේ අශ්වයා මාරු කරනවා.........මෙන්න ලියුම."

ඈ කතා කළේ අතේ තිබෙන ලියමන වනමිනි. වැඩකාරිය ගෙනා ලියමන උදුරාගත් ගෲෂෙන්කා ඉටිපන්දම ළඟට ගියා ය. ඒ කෙටි ලියමන ඈ එක පුස්මට කියෙව්වා ය.

"එයා මට එන්න ය කියා පණිවිඩයක් එවා තියෙනවා. හොඳයි එහෙනම් මිතිග ළඟට ඔබවාගෙපත් බලුකුක්කා"යි ගෲෂෙන්කා තමාට ම කියා ගත්තා ය. ඇගේ සුදුමැලි වූ මුහුණ වියරු සිනාවකින් අරුප විය.

කුමක් කළයුතුදැයි කල්පනා කරන්නාක් මෙන් ගෲෂෙන්කා මොහොතක් පමණ වේලා දෙගැඩියාවෙන් බලා සිටියා ය. එහෙත් හදිසියෙන් ම ඇගේ රුධිරය හිසට ගලා ගෙන ගියෙන් කම්මුල් රතු විය.

"මම යනවා"යි ඇ කීවා ය. "මගේ ජීවිතයෙන් අවුරුදු පහක් ගතවුණා. අලෝෂා මම යනවා, මා මගේ ඉරණම ගැන තීරණයකට බැස ගෙන ඉවරයි. යන්න යන්න, ඉක්මනට යන්න, ආයේත් මට පෙනෙන්න ඉන්න එපා. මම අලුත් ජීවිතයක් ගතකිරීමට යනවා ....රැකිටින් මීට පස්සේ මා ගැන නරක දේවල් කියන්න එපා. මට නපුරු කම් කරන්න එපා. සමහර විට මා මරණය සොයා ගෙන යනවා විය හැකියි. හම්! මට දැනෙන්නේ මා හරියට වෙරිමතින් සිටිනවා වාගෙයි."

ගෲසෙන්කා වහා නිදන කාමරයට දිව ගියා ය.

"දැන් ඉතින් මීට පස්සේ ගෲසෙන්කා අප ගැන කල්පනා කරන එකක් නැහැ, අපි යමු යන්න"යි රැකිටින් කෙඳිරිගා කීවේ ය. "අපි ඉක්මනට යමු, නැතිනම් ඇගේ උමතු කෑගෑම ආයේත් ඇහෙන්න පුළුවනි. මට මේ ඇඩිලි දෙඩිලි තවත් ඉවසන්න බැහැ."

අලෝෂා රැකිටින් සමග නික්ම ගියේ සිත් පිත් නැති එකකු මෙනි. වත්තේ අඹරුවක් සහිත කරත්තයක් නවතා තිබිණි. කරත්තයට ගැට ගසන ලද අශ්වයෝ මුදා හරින ලදහ. මිනිස්සු ලන්තෑරුම් ගෙන වත්ත පුරා දුවති. හැර දමන ලද ගේට්ටුව තුළින් අලුත් අස්සු තිදෙනෙක් ගෙනෙනු ලැබූ හ. තරුණයන් දෙදෙනා ගෙදරින් පිටවනවාත් සමග ගෲසෙන්කා ගේ නිදන කාමරයේ කවුළුව හදිසියෙන් ම ඇරුණේ ය. ගෲසෙන්කා කවුළුව තුළින් අලෝෂාට කතා කළා ය.

"අලෝෂා, කරුණාකර මිතියා මතක් කළ බව කියන්න. මා මිතියා ගේ ජීවිතය අඳුරු කළත් මා ගැන නරකක් හිතන්න එපා කියන්න. 'ගෲසෙන්කා නන්නත්තාරයකු සමග ගියා මිස උදාර සිතක් ඇති නුඹ සමග ගියේ නැහැ' කියා මා කියන විදියටම කියන්න. ආයේත් කියන්න, ගෲසෙන්කා මිතියාට එක පැය කට පමණක්, එක කෙටි පැයකට ආලය කළාය කියා. පමණක් මිතියා ඒ පැය මුළු ජීවිතයටම මත තියා ගත්තාවෙන් මිතියාට ගෲසෙන්කා කිව්වය කියන්න, ඒ පැය මුළු ජීවිතයටම මතක තියාගන්නය කියා."

මිතියාට දියයුතු පණිවිඩය ඇ අවසන් කළේ ඉකිගසා අඬමිනි. කවුළුව මහත් හඬක් නගමින් වැසිණි.

"හම්! බොහොම ම හොඳයි කතාව. ඒ ගැනි උඹේ අයියා මරා දමා ඒක මුළු ජීවිතයට ම මතක තියා ගන්නලු. කො තරම් අපූරු කතාවක් ද?"යි රැකිටින් සිනා සෙමින් කීවේ ය.

අලෝෂා කතා නොකෙළේ ය. නැසුණාක් මෙන් සිටියේ ය. ඔහු රැකිටින් සමග වහවහා ගමන් කළේ හදිසි කටයුත්තක් සඳහා යන්නකු මෙනි. බර කල්පනාවෙන් සිටි අලෝෂා සිත් පිත් නැත්තකු මෙන් ගමන් කෙළේ ය. තුවාලයක් පැරුණාක් මෙන් රැකිටින්ට හදිසියෙන් ම වේදනාවක් දැනිණි. ගෲෂෙන්කා හා අලෝෂා මුණගැසීමෙන් ඔහු බලාපොරොත්තු වූයේ ඉදුරා වෙනස් දෙයකි. ඔහු බලාපොරොත්තු වූ දෙය සිදු වූ දෙයට වඩා වෙනස් ය.

“ගෲෂෙන්කා ගේ මනමාලයා පෝලන්ත ජාතිකයෙක්” යයි රැකිටින් නැවත නැවතත් කීවේ සිතේ නොසන්සුන්කම මැඩ ගනිමිනි. “මිනිහා නිලධරයෙක් නො වෙයි, චීන දේශ සීමාව අසල සයිබීරියාවේ රේගුවක වැඩ කළා. මිනිහා කොහෙද යන හිගන්නෙක්. දන් රස්සාවක් නැති ලු. ගෲෂෙන්කා ගේ අතේ මිටේ සල්ලි තියෙන බව ආරන්චි වෙලා හොයාගෙන ආවා ලු. ඕක තමයි මේ අභිරහසේ තේරුම.”

අලෝෂා නැසුණෙක් මෙන් ගමන් කෙළේ ය. රැකිටින්ට සිත මැඩගත නොහැකි වී ය.

“එහෙනම් උඹ පව්කාරයෙක් නිදහස් කරගත්තා?” යි රැකිටින් ආයේත් කෝපයෙන් කී ය. “මොකද උඹ මරියා මදලේනා නියම මග යැව්වා ද? යකාගෙන් හත් දෙනා පන්නා ගත්ත ද? එහෙනම් උඹ මෙතෙක් කල් බලාපොරොත්තු ව සිටිය හාස්කම සිදුවුණා ද?”

“රැකිටින් කතා නො කර ඉඳින්” යයි අලෝෂා කීවේ වේදනාවෙන් කකියන හදවතින් යුතු ව ය.

“අර රුබල් විසිපහ ගේනව උඹ මා පහත් කොට සලකනව ද? මා මගේ මිත්‍රයා මුදලට වික්කා ය කියා උඹ හිතනව ද? උඹ ක්‍රිස්තුන් වහන්සේත් නො වෙයි. *මා යුදස්පුත් නො වෙයි.”

“රැකිටින් මේ සිද්ධිය මා සම්පූර්ණයෙන් ම අමතක කළා, ආයේත් ඒ ගැන මතක් කළේ මා නො වෙයි තුඹයි.” අලෝෂා කීය.

මෙය රැකිටින්ට ඉවසිය නොහැකි අන්තිම බර පහර විය.

---

*ක්‍රිස්තුන් වහන්සේ සතුරන්ට පාවා දෙන ලද්දේ එතුමා ගේ යුදස් නමැති ශ්‍රාවකයා විසිනි. ඒ සඳහා යුදස්ට රිදීකාසි තිහක් ලැබුණේ ය.

"උඹලා සේරට ම හෙණ ගහන්න ඕනෑ"යි ඔහු ගත්කටට ම කෑගා කීවේ ය. "මා මොනවටද උඹ වගේ මිනිහෙක් ආශ්‍රය කළේ? මීට පස්සේ මගෙයි උඹෙයි කිසි ම සම්බන්ධයක් නැහැ. ඔන්න තියෙනවා උඹේ පාර, තනියෙන් ම පලයන්!"

මෙසේ පැවැසූ රාකිටින් අලෝෂා අඳුරු පාරේ තනි කර දමා හදිසියෙන් ම ආපසු හැරී වෙනත් පාරක් දිගේ ගියේ ය. පාර දිගේ ගොස් නගර සීමාවෙන් පිට වූ අලෝෂා කුඹුරු හරහා ගමන් කොට ආශ්‍රමයට පැමිණියේ ය.

හතර වන පරිච්ඡේදය

විවා

අලෝෂා තපෝවනයට පැමිණෙන විට ආශ්‍රමයේ විනය අනුව රෑ බෝවී තිබිණි. මුරකාරයා විශේෂ ගේට්ටුවකින් අලෝෂා තපෝවනයට ඇතුළු කෙළේ ය. රාත්‍රි නවය නාද විය. පුරා දවසක් වෙහෙස මහන්සි වීමෙන් අනතුරුව විවේක ගැනීමට නියම වේලාව පැමිණ ඇත. අලෝෂා ඉතා සෙමෙන් දොර ඇරගෙන, තවුසා ගේ මිනිය තැන්පත්කර තිබුණු කාමරයට ඇතුළු විය. මෘතදේහය ළග එකලාවේ හිඳ බයිබලය කියවන පියසි පියතුමා සහ අනෙක් කාමරයේ නිදන පොර්පිරි නමැති ආධුනික පූජකයාද හැරෙන්නට වෙන කිසිවෙක් නොවූහ. පෙර දින රෑ සොසිමා තවුසා ගේ දේශනයට සවන් දීම නිසා නිදිමැරීමෙන්ද, දවස පුරා ඇති වූ කලබලයෙන් හා නොසන්සුන්කමින්ද, විඩා වැටී සිටි ආධුනික පූජකයා බිම වැතිර ගැඹුරු නින්දක් නිඳා සිටියේ ය. අලෝෂා ඇතුළුවන හඬ පියසි පියතුමාට ඇසිණි. එහෙත් එතුමා හිස ඔසවා නොබැලුවේ ය. දොර ළඟින් දකුණට හැරුණු අලෝෂා කාමරයේ මුල්ලට ගොස් දණින් වැටී යාච්ඤා කරන්නට විය. ඔහු ගේ හදවත නොපැහැදිලි හැඟීම්වලින් උතුරා ගියේ ය. එහෙත් ඉන් එක

හැඟීමක්වත් අනෙක් හැඟීම්වලට වඩා පැහැදිලි නො වී ය. ඉතා සෙමෙන් සහ පිළිවෙළින් එක හැඟීමක් අනෙක් හැඟීම් පලවා හැරියේ ය. ඒ සමග ඔහුගේ හදවතේ සාමයක් ද ඇතිවී ය. පුදුමය නම් අලෝෂා ඒ ගැන පුදුම නොවීම ය. ඉදිරිපිට තිබෙන මිනී පෙට්ටියත්, ඒ පෙට්ටිය තුළ වසා තැන්පත් කරන ලද, තමා ආදරය කළ තැනැත්තාගේ ප්‍රාණයෙන් තොරවූ ශරීරයත් අලෝෂා ආයේත් දුටුවේ ය. එහෙත් උදේ ඇති වූ ශෝකය හා වැලපීම දැන් ඔහු ගේ ආත්මයට වද නො දෙයි. කාමරයට ඇතුළුවූ වහා ම අලෝෂා මිනී පෙට්ටිය ළඟ දණින් වැටුණේ පූජනීය වස්තුවක් ඉදිරිපිට දණින් වැටෙන්නාක් මෙනි. ඒ එක්කම ඔහු ගේ හදවත හා සිතත් ප්‍රීතියෙන් ආලෝක විය. කාමරයේ කවුළුවක් හැර දමා තිබුණේ ය. කවුළුව තුළින් හමනා මඳ නළ ප්‍රාණවත් ය. සිසිල් ය. “අනෙක් කවුළුව ඇරියොත් ගඳ වැඩි වෙන්න පුළුවනි” යි අලෝෂා කල්පනා කෙළේ ය. මෙම දුර්ගන්ධය ගැන උදේ කාලේ ඇති වූ පිළිකුලින් හා නින්දාවෙන් යුත් අදහස් නිසා දැන් ඔහු තුළ කාලකණ්ණි ගතියක් හෝ අවමානයක් හෝ ඇති නො වෙයි. ඔහු නිහඬ ව යාච්ඤා කෙළේ ය. එහෙත් වැඩි වේලා යන්නට කලින්, තමා යාච්ඤා කරන්නේ සිහිපිත් නැත්තකු ලෙස බව ඔහුට පෙනී ගියේ ය. ඔහුගේ ආත්මය තුළ බිඳුණු සිතිවිලි පාවෙන්නට විය. ඒ සිතිවිලි සිතිගෙන දැවෙන තාරකා මෙන් කාන්තිය විහිදු වෙනත් තාරකාවලට ඉඩ දී නො පෙනී ගියේ ය. එහෙත් ඔහු ගේ ආත්මය තුළ සම්පූර්ණ වූ කිසියම් දෙයක්, ස්ථිර වූ කිසියම් දෙයක්, සැනසුම ගෙන එන කිසියම් දෙයක්, රජ කරන බව ඔහුට දැනුණේය. ඔහු ඒ බව දැන සිටියේ ය. ඇතැම් විට ඔහු මහත් උනන්දුවෙන් යාච්ඤා කළේ සිතේ හටගත් කෘතඥතාව සහ ප්‍රේම කිරීමට ඇති ආශාව ද බලවත් වූ නිසා විය යුතු ය.................. එහෙත් යාච්ඤා කරන්නට පටන් ගත් පසු වී අලෝෂා ගේ සිතිවිලි වෙනත් අරමුණක් කෙරෙහි ඇදී යයි. එවිට කරමින් සිටි යාච්ඤාවවත්, ඒ යාච්ඤාවට බාධා කළ අරමුණත් අමතක වෙයි. අලෝෂා, පියසි පියතුමා කියවමින් සිටි බයිබලයට සවන් දුන්නේ ය. එහෙත් විඩා වැරී සිටි ඔහු වැඩි වේලා යන්නට කලින් නිදා වැටෙන්නට විය.

“තුන් වන දින ගැලිලියේ, කානාවේ විවා මගුලක් පැවැතුනේය”යි පියසි පියතුමා බයිබලය බලා කියෙව්වේ ය. “මේ විවා මගුලට ක්‍රිස්තුන් වහන්සේ ගේ මෑණියෝද පැමිණ සිටියා හ. ක්‍රිස්තුන් වහන්සේ ඇතුළු එතුමා ගේ ශ්‍රාවකයන්ට ද මෙම විවා මගුලට පැමිණෙන ලෙස ආරාධනා කර තිබුණේ ය.”

" විවාහ මගුලක් ? මොන විවාහ මගුලක් ද?'' මේ වචන අලෝෂා ගේ සිත හරහා සුළි සුළඟක් මෙන් හමා ගියේ ය. "ඇය ද මිත් සැපවත් වන්නේ ය. ඇය ද විවාහ මගුලට ගියා ය. ———නැත, ඇ පිහියක් ගෙන ගියේ නැත. මෙය ශෝකජනක වාක්‍යයක් පමණි——— ශෝක ජනක වාක්‍යවලට සමාව දිය යුතු ය. ශෝකජනක වාක්‍යවලින් සිතට සැනසුම ලැබෙයි. මෙ වැනි දෑ නොතිබුණොත් මිනිසාට දුක දරාගත නොහැකි වෙයි. රාකිටින් වැරදී මග ගියේ ය. තමා විසින් කරන ලද අකුසල් ගැන කල්පනා කරන තෙක් රාකිටින් වැරදි මග යන්නේය. එහෙත් නියම මග පළල් ය. කෙළින් පිහිටියේ ය; පළිගුවක් මෙන් පැහැදිලි ය; මග අවසන් වන තැන සූය‍ර්යාලෝකයෙන් ආලෝක විය............ මොනවද පියසි පියතුමා කියවන්නේ?''

"ඔවුන්ට පානය කිරීමට වයින් අවශ්‍ය වූ විට ක්‍රිස්තුන් වහන්සේ ගේ මෑණියෝ ක්‍රිස්තුන් වහන්සේ අමතා ඔවුන්ට වයින් නැතැයි කීවා හ.''

"තව ටිකින් මට ඒ කොටස අහන්න ලැබෙන්නේ නැහැ. මා ඒ කොටසට බොහො ම කැමැතියි. ඒක තමයි පළමු හාස්කම. ....කො තරම් ශ්‍රේෂ්ඨ හාස්කමක් ද? ....ක්‍රිස්තුන් වහන්සේ පළමු හාස්කම පෙන්වන විට ප්‍රශංසා කළේ මිනිසා ගේ දුකට නො ව සැපතටයි......... 'මිනිසාට ප්‍රේම කරන්නා මිනිසා ගේ සැප කැමැත්තේ ය.' මෙය ක්‍රිස්තුන් වහන්සේ ගේ ශ්‍රේෂ්ඨ අදහසක්. එතුමා මේ අදහස නිතර ම ප්‍රකාශ කළා 'සැපතෙන් තොර ජීවිතයක් නැත.......... සත්‍යය ගැබ් වී ඇති යහපත් වූ හැම දෙයක ම, සැම කල්හි ම, සමාව දීමේ ගුණය පිරී ඇත්තේය' යි මිතියා නිතර කියනවා.''

"සත්‍රිය, ඔබ ළඟ වයින් නැතිනම් ඔබට හා මට ඒ ගැන ඇති කැක්කුම කිම? මට නියමිව ඇති වේලාව තව ම පැමිණ නැතැ යි ක්‍රිස්තුන් වහන්සේ මැයණීන් අමතා කීසේක.

"තොපට එතුමා යම්කිසිවක් කිවේද තොප ඒ දෙය කරවයි, එතුමා ගේ මෑණියෝ සේවකයන් අමතා කිවා හ.''

"ඒ දෙය කරව.........එය මහත් සොම්නසකි. සමහර දුප්පත්, ඉතා දුප්පත් මිනිසුන් සතු ප්‍රීතියෙකි..........ඔවුන් දුප්පත් බැවින් ඔවුන්ගේ විවාහ මගුලට පවා ප්‍රමාණවත් තරම් වයින් නොතිබුණේය. ....ඒ කාලේ ගෙනේසාරත්විල අසල විසූ මනුෂ්‍යයන් දිළිඳුකමේ තුළටම බැස සිටිය බව ඉතිහාසඥයෝ සඳහන් කරති

.........ක්‍රිස්තුන් වහන්සේ පැමිණියේ ඉතා භයානක, එහෙත් උතුම් ජීවිත පූජාවකට පමණක් නොවන බව කරුණාවෙන් පිරි හදවතක් ඇති එතුමා ගේ මෑණියෝ දත සිටියා හ. මෙම දිළිඳු මගුලට පැමිණෙන ලෙස තමාට ආදරයෙන් ආරාධනා කළ මේ චාම්, විනෝදකාමී, අප්‍රකට, නූගත් මිනිසුන්ට පවා ක්‍රිස්තුන් වහන්සේ ප්‍රේම කරන බව මෑණියෝ දත සිටියා හ. ‘මට නියමිව ඇති වේලාව තව ම පැමිණ නැතැ’යි උන්වහන්සේ මුදු මොළොක් සිනාවක් පා කීසේක. (එතුමා එසේ කියන්නට ඇත්තේ මෑණියන්ට විය යුතුය.) එතුමා මෙලොව පහළ වූයේ දුප්පතුන්ගේ විවා මගුල්වලට ප්‍රමාණවත් තරම් වයින් සපයා දීමට ද? එහෙත් උන්වහන්සේ එහි ගොස් මෑණියන් කී ලෙස කළ සේක. ...... පියසි පියතුමා නැවැත බයිබලය කියවන්නට විය.

“පැන් ගෙනැවිත් පැන් බඳුන් පුරවනු යි ක්‍රිසතුන් වහන්සේ කීසේක. ඔවුහු පැන් බඳුන්වල කට දක්වා පැන් පිරවූහ.

දැන් බඳුන්වලින් ගෙන මෙම මංගල භෝජනයේ ප්‍රධානයාට පිළිගන්වනුයි ක්‍රිසතුන් වහන්සේ කීසේක.

වයින්වලට පරිවර්තනය කරනලද පැන්වල රස බැලූ, එහෙත් පැන් වයින් වූ බව නොදත් මංගල භෝජනයේ පාලකයා මනාලයා කැඳෙව්වේ ය. බඳුන්වලින් පැන් ගත් සේවකයෝ ඒ බව දත සිටියෝය.

කැඳවා මෙසේ කීවේ ය. හැම මිනිසාටම පළමුව සංග්‍රහ කරන්නේ හොඳ වයින්වලින්ය. එහෙත් මිනිසුන් බඩ කට පුරා තරක වයින් පානය කරන තෙක් නොපි හොඳ වයින් තබාගත්තහුය.”

“මොකද මේ? මොකක්ද මේ වෙන්න යන්නේ? කාමරයේ බිත්ති ඈත් වෙන්නේ මොකද? හා මේ මගුල්ගෙදර නොවේ ද? අර සිටින්නේ මගුල් ගෙදරට පැමිණි අමුත්තෝ ය. අතන සිටින්නේ යුවතිපති දෙදෙනා සමග ප්‍රීතිවෙන පිරිසකි. මේ මංගල භෝජනයේ නුවණැති පාලකයා කොහිද? නමුත් මෙ තැන සිටින්නේ කවරෙක් ද?” නැවැත කාමරයේ බිත්ති ඈත් වන්නට විය............... “අර විශාල මේසය ළඟ සිට නැඟිටින්නේ කවරෙක් ද?............ඔහු මෙ තැනත් සිටින්නේ ද? ඔහු සිටින්නේ අර මිනීපෙට්ටිය ඇතුළෙහි ය............ඔහු නැඟී සිටියේ ය. ඔහු මෙ තැනට එන්නේ ය............ අහෝ දෙවියනි!”

එය එසේ ම ය. මුහුණේ රැලි වැටුණු, කුඩා සිහින් මහල්ලා ප්‍රීතියෙන් සිනා සෙමින් ඔහු වෙත ගියේ ය. දැන් මෙහි මිනීපෙට්ටියක්

නැත. ඒයේ සවස අමුත්තන් සමඟ සිටියදී ඇද සිටි ඇඳුම් ම ය දුන් ද ඔහු ඇඳ සිටින්නේ. ඔහු ගේ මුහුණ වසා නොතිබුණේ ය. ඔහුගේ දෑස බැබළෙන්නේය. එසේනම් විවාහ මඟුලට ඔහු ද කැඳවන ලද්දේ ය. ගැලිලියේ, කානාවේ විවාහමඟුලට ඔහු ද ගියේ ය..........

"එසේ ය, මා ද මේ විවාහ මඟුලට කැඳවන ලද්දේ ය. අලෝෂා මොකද සැඟවී බලා සිටින්නේ? ඇවිත් අප සමඟ කාඹි ප්‍රීතිවන්න"යි කියන මුදු මොළොක් කට හඬක් අලෝෂාට ඇසුණේ ය.

එය සොසිමා තවුසා ගේ කට හඬ ය. අලෝෂාට කතා කළ බැවින් එය එතුමා විය යුතු ය.

තවුසා අලෝෂා අතින් අල්ලා නැගී සිටෙව්වේ ය.

"අපි ප්‍රීති වන්නෙමු. අලුත් වයින් පානය කරමින් ප්‍රීති වන්නෙමු. ප්‍රීතියේ වයින් පානය කරන්නෙමු. මෙහි අමුත්තෝ කී දෙනෙක් සිටින්නෝදැයි කිව හැකිද?"යි තවුසා ඇසුවේ ය. "මේ සිටින්නේ මනාලිය හා මනාලයා ය. අර සිටින්නේ භෝජන සංග්‍රහයේ පාලකයා ය. ඔහු අලුත් වයින්වල රස බලයි. මා දෙස පුදුමයෙන් බලන්නේ මන් ද? මම හිඟන්නකුට ලූනු ගෙඩිය බැගින් දුන් දී ඇති බැවින් මෙහි පැමිණියෙමි. මෙහි සිටින හැම දෙනා ම කුඩා ලූනු ගෙඩිය බැගින් දුන් දී ඇත්තේ ය. ....කාරුණික දරුව හාමතේ සිටින ඉතිරියකට ලූනු ගෙඩියක් දිය යුතු සැටි ඔබ ද දන සිටියේ ය. මා ප්‍රිය දරුව ඔබ සතු කාරිය අද ම ආරම්භ කරන්න..............ඔබට එතුමා පෙනෙන්නේ ද?"

"මම එතුමා දෙස බැලීමට භය ඇත්තෙමි"යි අලෝෂා සෙමෙන් කී ය.

"එතුමාට භය නො වන්න. එතුමා ගේ මහඟුභාවය බිය උපදවයි. උත්කෘෂ්ඨ කම විස්මය ඇතිකරවයි. එහෙත් එතුමා තුළ අප්‍රමාණ වූ කරුණාව ඇත්තේ ය. එතුමා ප්‍රේමයෙන් අප හා සම තත්ත්වයකට පැමිණ, අප සමඟ ප්‍රීතිවනසේක. මෙහි රැස් වී සිටින අමුත්තන් තුළ ඇත්තා වූ ප්‍රීතිය නැති නොවන ලෙස එතුමා නො නවත්වා අලුත් අමුත්තන්ට කතා කරන සේක............අර බලන්න ඔවුහු අලුත් වයින් ගෙනෙති."

අලෝෂා ගේ හදවතේ යම්කිසිවක් බැබළෙන්නට විය. වේදනාව ඇතිවන තෙක් හදවත පිරුණේ ය. ප්‍රීතියෙන් හටගත් කඳුළු ඔහු ගේ ආත්මය තුළින් ගලා ආවේ ය............... අලෝෂා දෑත දිගහැර නැගී සිටියේ ය.

අලෝෂා මිනීපෙට්ටියත් හැර දමන ලද කවුළුවත් දුටුවේ ය බයිබලය කියවන පැහැදිලි ගැඹුරු කටහඬ ඇසුවේ ය. එහෙත් ඔහු එයට සවන් නොදුන්නේ ය. මහත් පුදුමයකි. අලෝෂා දණගසා ගෙන සිටින අතර නිදා වැටුණේ ය. දැන් ඔහු දෙපසින් නැඟී සිටියි. එහෙත් හදිසියෙන් ම ඉදිරියට තල්ලුකළාක් මෙන් ඔහු මිනීපෙට්ටිය ළඟට ගියේ ය. ඔහු නොදැනුවත්වම ඔහු ගේ උරහිස පියසි පියතුමාගේ උරහිසෙහි ගැටිණි. කියවමින් සිටි පොතින් නෙත් ඉවත ගත් පියසි පියතුමා ආයේත් වහා ඉවත බලාගත්තේ කිසියම් පුදුම දෙයක් තරුණයාට සිදුවන බව දුටු හෙයිනි. අලෝෂා මිනිත්තු භාගයක් පමණ වේලා මිනිපෙට්ටිය දෙස බලා සිටියේ ය. ලයමත තබන ලද සුරුවමින් ද, හිසේ පළඳන ලද අටපට්ටම් කුරුසය සහිත හිස්වැස්මෙන් ද යුත් මෘතශරීරය දෙස බලාසිටි-යේ ය. මීට මොහොතකට කලින් ඔහු මේ මියගිය තැනැත්තාගේ කටහඬට සවන් දුන්නේ ය. ඒ කටහඬ තවමත් ඔහු ගේ සවන් තුළ රැව්දෙයි. ඔහු තවමත් මෘතශරීරය දෙස බලා සිටියේ එය කතාකරතියි යන අදහසිනි. එහෙත් අලෝෂා හදිසියෙන් ම ආපසු හැරී කාමරයෙන් පිට වී ගියේ ය.

පඩිපෙළ ළඟ නතර නොවූ අලෝෂා කෙළින් ම යන්නට ගියේ ය. ඔහු ගේ ආත්මය ප්‍රීතියෙන් හා නිදහසට ඇති ආශාවෙන් උතුරා ගියේ ය. මුදු එළියෙන් බැබළෙන තරුවලියෙන් යුත් අනන්ත අවකාශය විහිදී යයි. මලානික වූ අලෝකයෙන් බැබ-ළෙන ශාඛා දෙකකින් යුත් අහස්ගඟ, අහස මුදුනේ සිට ක්ෂිතිජය තෙක් පැතිරෙයි. ප්‍රාණවත් වූ, සන්සුන් වූ, නිසංකත මිහිකත වැළඳගත්තා ය. දේවස්ථානයේ සුදු කොත් කැරලි හා රන්වන් ගෝලාකාර වහල ඉඳුනිල් මැණිකක් වැනි අහස ඉදිරියේ බැබ-ළෙයි. අසපුව වටා මල් ගොමුවල පිපුණු විසිතුරු පුෂ්ප සමූහයා එළිවන තෙක් නිදති. පොළොව වසා පැවැති නිහැඬියාව අහස සමඟ මුසු වන්නාක් මෙන් පෙනේ. පොළොවේ ගුප්තභාවය අහසේ තාරකාවල පැවැති ගුප්තභාවයට සමාන විය.

මදක් නතර වී අවට ලෝකය දෙස බැලූ අලෝෂා අනතුරුව බිම වැටී මිහිකත බදාගත්තේ ය. ඔහු එසේ කළේ මන්දැයි ඔහු ම නොදනියි. මිහිකත සිඹ ගැනීමට ඔහු තුළ මෙ තරම් දැඩි ආශාවක් ඇත්තේ මන්දැයි කිව නොහැකි ය. එහෙත් ඔහු අඬමින් පොළොව සිඹගත්තේ ය; සදාකල්හි ම ප්‍රේම කරන බවට පොරොන්දු වෙමින් සිඹගත්තේ ය. “ප්‍රීතියෙන් ගලනා තොප ගේ කඳුළින් මිහිකත තෙමා අනතුරුව ඒ කඳුළුවලට ප්‍රේම කරව” යන ප්‍රකාශය ඔහු ගේ ආත්මය තුළ රැව්දුන්නේ ය.

අලෝෂා අඩන්නේ කුමක් නිසා ද? බලවත් සොම්නසකින් සිටින අලෝෂා තමා නිසා ඇත අහසේ බැබලෙන තාරකා ගැන ද අඩයි. එහෙත් ඒ සොම්නස ගැන ඔහු ලැජ්ජා නො වෙයි. දෙවියන් වහන්සේ සතු අනන්ත අප්‍රමාණ වූ ඒ ලෝක සමග ඔහුගේ ආත්මය සම්බන්ධ කරන නූල් ඇත්තාක් මෙන් පෙනේ. ඒ සම්බන්ධයෙන් ඔහු ගේ හදවත සසල වෙයි. හැම දෙයකටම හැම දෙනාට ම කමා වීමට ද හැම දෙයක් වෙනුවෙන්ම හැමදෙනා වෙනුවෙන්ම, කමාව යැදීමට ද, ඔහු තුළ බලවත් ආශාවක් පවතියි. තමා වෙනුවෙන් නොව අනුන් වෙනුවෙන් කමාව යැදීමට ඔහු තුළ බලවත් ආශාවක් පවතියි. "අනෙක් අය මා වෙනුවෙන් යාච්ඤා කරන්නෝය." යන කියමන ආයේත් ඔහු ගේ ආත්මය තුළ රැව්දුන්නේ ය. ගුවන් තලය මෙන් සසල නොවන දෙයක් තමා ගේ ආත්මය තුළට රිංගාගත් බව ඔහුට දැනිණි. කිසියම් අදහසක් මුළු ජීවිතය තුළ ම, සදා කල්හි ම ඔහු ගේ සිතේ රැව්දෙන්නාක් වැන්න. ඔහු බිම වැතිර මිහිකත බදාගත්තේ සිතින් ගතින් දුබලවූවකු මෙනි. එහෙත් යළි නැඟී සිටින්නේ ජයග්‍රහණය කළ වීරයකු මෙනි. ඔහු ඒ බව දැනගත්තේ හදිසියෙන්ම ඔහු ගේ සිත ප්‍රීතියෙන් පිනා ගිය හෙයිනි. අලෝෂාට මේ මොහොත මුළු ජීවිතයට ම අමතක නො වී ය.

"ඒ වෙලාවේ දී යම්කිසි කෙනෙක් මගේ ආත්මය හමුවීමට පැමිණියා"යි අලෝෂා මහත් විශ්වාසයකින් යුතු ව පසු කාලයේ නිතර කීවේ ය.

"ලෝකයට ගොස් එහි තාවකාලික ව පදිංචි වන්න." මෙය ඔහු ගේ සොසිමා තවුසා විසින් ඔහුට දෙන ලද අවවාදයකි. ඒ අවවාදය පරිදි අලෝෂා තෙ දිනකට පසු ආශ්‍රමය හැරපියා ගියේ ය.

අට වන ග්‍රන්ථය

පිතෘ ඝාතනය

පළමු පරිච්ඡේදය

මූලාව

තමා විසින් මීතියාට ආලය කරන ලද පැය මුළු ජීවිතයට ම මතක තබාගන්නා ලෙස අලෝෂා අත දන්වා යවා අලුත් ජීවිතයක් සොයා ගිය ගෘෂෙන්කාට සිදු වූ කිසිවක් මීතියා නොදත්තේ ය. එ වේලේ මීතියා සිටියේ මහත් නොසන්සුන් කමකිනි. හැරත්, ඔහු විසින් කළ යුතු වැඩ මහත් රාශියක් ද විය. පසු දවසක කීවාක් මෙන් පුරා දෙදවසක් ම ඔහු කො තරම් සිත් තැවුලකින් පසුවූයේ ද කියතොත් ඔහුට මොළයේ උණ වැලඳෙන්නට ඉඩ තිබිණි. පෙර දින උදේ තැබෑරුමේ දී මීතියා හමුවීමට ඉවාන් ගත් තැත ද නිෂ්ඵල විය. මීතියා නතර වී සිටි ගෙදරඇත්තෝ ද මීතියා ගේ නියමිය පරිදි ඔහු යන එන තැන් ගැන කිසිවක් නොකීවෝ ය.

ඔහු පසු ව විස්තර කළාක් මෙන් ඔහු ඒ දෙ දවස ඒ මේ අත දුවමින් ගත කළේ 'තමා ගේ දෛවය සමග සටන් කරන අතරේ ජීවිතය ආරක්ෂා කරගැනීමට වෑයම් කරන්නාක් මෙනි.' මොහොතකට හෝ ගෘෂෙන්කා නො දැක සිටීම සිතට මහත්

වදයක් වුවත්, කිසියම් කටයුත්තක් සඳහා මිතියා පැය කීපයක් ම නගරයෙන් බැහැර ගොස් සිටියේ ය. මේ සියල්ල පසු ව විස්තර කොට ලියකියවිලි මගින් ඔප්පු කරන ලදී. එහෙත් දනට වැඩි විස්තර පසක තබා ඔහු ගේ හිස මත කඩාවැටුණු භයානක විපතට කලින් දෙ දවස තුළ සිදු වූ ඉතා අවශ්‍ය වැදගත් කරුණු ගැන පමණක් මෙහි ලා සඳහන් කරමි.

ගෲසෙන්කා මිතියාට පැයක් පමණ වේලා ආලය කළ මුත් ඒ අතරේ කිසි ම තෙතක් මෙතක් නැති ව නපුරුකම් ද කළා ය. මිතියාට දරුණු ම සිත්තැවුල වූයේ ගෲසෙන්කා ගේ අදහස් ඇති සැටියෙන් දනගැනීමට නොලැබීම ය. ඔහුට බලයෙන් හෝ ආදර-යෙන් හෝ ඇගේ සිත් ගත නො හැකි විය. ඇ කිසිවකුට යටත් නොවූවා ය. ඇ තමා සමග අමනාප වී සඳහට ම තමා අත්හැර දමා යන බව මිතියා දන සිටියේ ය. ගෲසෙන්කා ද අභ්‍යන්තර සටනක යෙදෙන බවත්, තීරණයකට බැස ගත නො හැකි ව දෙගඩියාවෙන් පසු වන බවත් මිතියා සැක කෙළේ ය. ඔහු සැක කළාක් මෙන් ගෲසෙන්කා කිසියම් තීරණයකට බැස ගත නොහැකි ව පසු-තැවෙන්නට වූවා ය. තීරණයකට බැස ගැනීමට අවශ්‍ය ආත්ම ශක්තිය ඇයට නො තිබිණි. එ හෙයින් ඇතැම්විට ඇ තමාටත්, තමා ඇයටත් දක්වන ප්‍රේමයටත් පිළිකුල් කරන බව මිතියා දිවැසින් මෙන් දන සිටියේ ය. එය ඔහු ගේ බලවත් ශෝකයට හේතු වී ය. ගෲසෙන්කා ගේ සිතට වද දුන් කරුණු මිතියා නොදන සිටියේ ඒ නිසා විය යුතු ය. මිතියාට වද දුන් ප්‍රශ්නය පැවැතුණේ ඔහු ගේ පියා හා ඔහු අතර ය.

මෙහි දී අප විසින් ඉතා වැදගත් ප්‍රශ්නයක් ගැන සඳහන් කළ යුතු ය. එ නම් පියා ගෲසෙන්කාට විවාහ යෝජනා කිරීමට සැරසෙන බව හෝ, නැති නම් දනට ම යෝජනා කර ඇති බව හෝ මිතියා දැඩි ව විශ්වාස කිරීම ය. එහෙත් ගෲසෙන්කාට රුබල් තුන්දහසක් දී සිතේ ආශාව මුදුන් පමුණුවා ගැනීමට මහලු සල්ලාලයා බලාපොරොත්තු වන බව මිතියා මොහොතකටවත් විශ්වාස නොකෙළේ ය. මිතියා මෙසේ නිගමනය කළේ ගෲසෙන්කා ගේ අදහස් මැනැවින් දන සිටි හෙයිනි. ඇයට වැඩි වාසියක් ලැබෙන්-නේ පියා හා තමා හා අතරින් කවරකු තෝරා ගැනීමෙන්ද යන ප්‍රශ්නය නිසා ඇතැම් විට ගෲසෙන්කා නොසන්සුන් වන්-නේ යැයි ඔහු විශ්වාස කෙළේ ය.

එහෙත් මේ දිනවල ගෲසෙන්කා ගේ පරණ මනමාලයා ගේ පැමිණීම ගැන මිතියා කල්පනා නොකිරීම පුදුමයට කරුණෙකි. මේ නිලධරයා වනාහි ගෲසෙන්කා ගේ ජීවිතය කෙරෙහි විපත්ති

දැයක බලපැවැත්මක් ඇති ව සිටි මිනිසා ය. මෑතක සිට ගෘෂෙන්කා ඔහු ගැන කිසිවක් නොකී බව සැබෑ ය. එහෙත් ඇය දූෂණය කළ ඔහුගෙන් ඇයට මෑත දී ලියුමක් ලැබුණු බව මීතියා දැන සිටියේ ය. ඔහු ඒ බව දැනගත්තේ ගෘෂෙන්කාගෙනි. ඒ ලියුමේ ලියා තිබුණු දේවල් ද ඔහු මඳ වශයෙන් දැන සිටියේ ය. ගෘෂෙන්කා ඒ ලියුම මීතියාට පෙන්නුවේ මීතියා කෝපයෙන් සිටි වේලාවකදීය. එහෙත් ඇගේ බලවත් පුදුමයට වාගේ මීතියා ඒ ගැන වැඩි සැලැකිල්ලක් නොදැක් වී ය. හේතුව කුමක් වියයුතු දැයි කිව නොහැකි ය. ගෘෂෙන්කා ලබා ගැනීම සඳහා පියා සමග පැවැති අප්‍රසන්න භයානක සටනෙහි බරින් මිරිකී සිටි මීතියා මේ මොහොතේ මීට වඩා භයානක අනතුරක් පැමිණෙතැයි කල්පනා කිරීමට අසමත් විය. හවුරුදු පහකට පසු ව ආයේත් හදිසියෙන් ම පැමිණෙන මනමාලයකු ගැන ඔහු විශ්වාස නො කළේ ය. හැරත් ගෘෂෙන්කා විසින් ඔහුට පෙන්වන ලද මේ අලුත් විරුද්ධවාදියා ගේ ලියුමේ, ඔහු ගේ පැමිණීම ගැන පැහැදිලි ව සඳහන් කර නො තිබිණි, හැඟීම් අවදිකරවන අලංකාර බසින් ලියන ලද ඒ හසුන එ තරම් පැහැදිලි නො වී ය. ඔහු ගේ පැමිණීම ගැන සඳහන් කර තිබුණු ලියුමේ අන්තිම කොටස ගෘෂෙන්කා මීතියාට නො පෙන්වා සඟවා තේබව අප මතක තබාගත යුතු ය. සයිබීරියාවේ සිට පැමිණි මේ සන්දේශය ගැන නොකැමැත්තෙන් ඇති කරගත් අහංකාරකමින් යුත් පිළිකුලක් ඒ මොහොතේ දී ගෘෂෙන්කා ගේ මුහුණේ දකින්නට තිබුණු බව මීතියාට පසු ව සඳහන් විය. තමා හා මේ නිලධාරියා හා අතරේ පැවැති සබඳකම ගැන ගෘෂෙන්කා කිසිවක් නොකීවෙන් කල්යත් ම නිලධරයා ගැන මීතියාට සම්පූර්ණයෙන් ම අමතක වී ය.

පසු ව කුමක් වුවත්, පියා හා තමා හා අතරේ පවතින වෛරය ළඟ දී ම උග්‍ර අවස්ථාවකට පැමිණෙන බැවින් අනෙක් හැම දෙයකට ම කලින් ඒ ගැන තීරණයකට බැස ගත යුතුයයි මීතියා කල්පනා කෙළේ ය. ශෝකයෙන් බර වූ හදවතින් යුත් හෙතෙම හැම මොහොතක් පාසා ම ගෘෂෙන්කා ගේ අවසාන තීරණය බලාපොරොත්තු ව සිටියේ ය. කොයි මොහොතේ දී හෝ හදිසියෙන් ම ඇතිවන පෙලඹීමකින් පසු ව ගෘෂෙන්කා එම තීරණයට පැමිණෙතැයි ඔහු විශ්වාස කෙළේ ය. "මා තුඹ සතුය. එ හෙයින් මා විවාහ කරගන්න"යි ඈ හදිසියෙන්ම කියන්නට පිළිවන. එතැනින් හැම දෙයක් ම අවසන් වෙයි. ඇය හැකි තරම් ඈතට, රුසියාවේ ඈත පෙදෙසකට ගෙන ගොස් විවාහ කරගෙන, අප්‍රසිද්ධියේ වාසය කරන්නට පිළිවන. එවිට එතැන හෝ මෙතැන හෝ වෙනයම් තැනක හෝ වෙසෙන කිසිවෙක් ඔහු ගැන කිසිවක් නොදන්නේ ය. ඔහුට අලුත් ජීවිතයක් ආරම්භ කරන්නට පිළිවන.

මේ අමුතු පරිවර්තනය හා 'යහපත්' ජීවිතය ගැන (එය යහපත් ජීවිතයක් විය යුතු ම ය) මීතියා හැම මොහොතක් පාසා ම අවුල් වූ සිතින් කල්පනා කෙළේ ය. ඒ පරිවර්තනයට හා අලුත් ජීවිතයට ඔහු තුළ මහත් පවසක් තිබිණි. ඔහු විසින් සිය කැමැත්තෙන් ම ගිලී සිටින මේ අපවිත්‍ර ජීවිතය ගැන ඔහු තුළ බලවත් පිළිකුලක් ඇති විය. එවැනි නීච තත්ත්වයක සිටින වෙනත් මිනිසුන් තුළ පවතින්නාක් මෙන්, මීතියා තුළ ද මේ පරිවර්තනය ගැන මහත් භක්තියක් පැවැතිණි. ඔහුට පැමිණ තිබෙන මේ කරදරය නිසා නො වේ නම් මේ සාපලත් තැනින් පැන ගොස් උසස් තත්ත්වයකට පැමිණ යහපත් ජීවිතයක් ගත කළ හැකි ය. ඔහු තුළ මේ අදහස ගැන දැඩි විශ්වාසයක් පැවැතිණි. ඔහු එ වැනි ජීවිතයක් ප්‍රාර්ථනා කෙළේ ය.

එහෙත් මේ අදහස් මුදුන් පැමිණෙන්නේ මීතියා ගේ ප්‍රශ්නය සාර්ථක ලෙස විසඳුණොත් පමණි. අනෙක් අතින් එය භයානක ප්‍රතිඵල ගෙන දෙමින් අවසන් වන්නට ද පිළිවන. "පලයන් යන්න මම උඹෙ තාත්තා කසාද බඳිනවා. උඹෙන් මට වැඩක් නැහැ"යි ගෘසෙන්කා හදිසියෙන් ම කියන්නට පිළිවන...............එතකොට මොකද වෙන්නේ? එවැනි අවස්ථාවක දී කුමකින් කුමක් සිදුවේදැයි මීතියාට කිව නො හැකි විය. අන්තිම මොහොත වනතෙක් ඔහු එය නොදන සිටිය බව ඔහුට කරන ප්‍රශංසාවක් වශයෙන් කිවයුතුය. ඔහු තුළ සවිර වැඩ පිළිවෙළක් නො වී ය. කිසිවකුට හිරිහැරයක් හෝ අපරාධයක් හෝ කිරීමට ඔහු අදහස් නො කෙළේ ය. ඔහු තමාගේ දෛවය ගැන සතුටුදායක අවසානයකට සූදානම් වන අතරේ බලවත් චිත්ත වේදනාවකින් යුතු ව විමැසිල්ලෙන් සිටියේ ය. මෙයට සබඳකම් නැති හැම දෙයක් ම ඔහු බැහැර කෙළේය. එහෙත් අවසානය ගැන ඔහු තුළ අමුතු සිත්තැවුලක් ඇතිවිය. එය මීට කලින් ඇතිනොවූ අලුත් සිත්තැවුලකි, අතියම් සිත්තැවුලකි, මාරක සිත්තැවුලකි, විසඳිය නොහැකි ගැටළුවකි.

යම් ලෙසකින් ගෘසෙන්කා ඔහුට කතා කොට "මා නුඹට අයිතියි. එ හෙයින් මං මෙ තැනින් ගෙන යන්නැ"යි කීවොත් ඔහු ඈය කැන්ද ගෙන යන්නේ කෙසේ ද? එයට අවශ්‍ය මිල මුදල් අතේ තිබේ ද? හවුරුදු ගණනක සිට පියා ගෙන් නො කඩවා ලැබුණු එක ම ආදායම මේ ළඟ දී නතර විය. ගෘසෙන්කා ළඟ මුදල් තිබේ. එහෙත් ඈගේ මුදලට අත නො තැබිය යුතුයැයි ඔහු අදහස් කෙළේ ය. ඈය කැන්දගෙන ගොස් නව ජීවිතයක් ආරම්භ කිරීමට ඔහු අදහස් කළේ තමාගේ ම මුදලිනි. ඈගේ මුදලින්

නො වේ. ඇගේ මුදල් ගැනීමේ අදහසට ඔහු සම්පූර්ණයෙන් ම විරුද්ධ විය. ඒ සිතිවිලි මාත්‍රය පමණක් ඔහු තුළ දැඩි සිත්තැවුලක් ඇති කෙළේ ය. ඒ ගැන මෙහි දී වැඩි විස්තරයක් කිරීමට මම අදහස් නො කරමි. එය ඒ මොහොතේ ඔහු තුළ ඇති වූ සිතිවිලි මාත්‍රයක් පමණි. අදහස ඔහු තුළ නොදැනුවත් ව ම ඇති වූයේ ඔහු විසින් වංචා කරන ලද කැතිරිනා ගේ මුදල් ගැන සිතේ සැඟවී පැවැති වේදනාවෙන් විය හැකි ය. "මම කැතිරිනාට තක්කඩිකමක් කෙළෙමි. මම ගෘසෙන්කාට ද දැනදැන ම තක්කඩි කම් කරමි. ගෘසෙන්කා ඒ බව දැනගත්තොත් ඒ තක්කඩියාට කිසි ම සැලැකිල්ලක් නො දක්වන්නට පිළිවන." යන අදහස එ වේලේ තම සිතේ ඇති වූ බව මිතියා පසු ව කිවේ ය.

එසේනම් තමා ගේ දෛවය විසැදෙන ඒ මුදල් මිතියා කො තැනින් කෙසේ ලබා ගන්න ද? මුදල් නැති ව ඔහු අතරමංවෙයි. කිසිවක් කරකියා ගත නොහැකි වෙයි. "මුදල් නැතිකම කො තරම් ලොකු ලැජ්ජාවක්ද?"යි මිතියා තමාට ම කියාගත්තේ ය.

කලින් බලාපොරොත්තු වූ පරිදි, මුදල් ලබා ගත යුතු සැටි මිතියා දැන සිටින්නට ඇත. සමහරවිට ඒ මොහොතේ දී මුදල් තිබෙන තැන ඔහු දැන සිටින්නට ඇත. පසු ව මේ කරුණ ගැන පැහැදිලි ව විස්තර වන බැවින් ඒ ගැන කිසිවක් මම දැන් සඳහන් නො කරමි. තමාට අවශ්‍ය මුදල් ලබාගැනීමට නම් පළමු ව තමා විසින් කැතරිනාගෙන් ලබාගත් රූබල් තුන්දහ ආපසු ගෙවිය යුතු ය. නැතිනම් "මම ගැටකපන්නෙක්මි, තක්කඩියෙක්මි" මිතියා තීරණය කරගත්තේ ය. මෙය ඔහුගේ සිතට වද දුන් ප්‍රධාන කරුණක් බව මෙහිලා සඳහන් කළ යුතු ය. එ හෙයින් හැම දෙයකට ම කලින් අහස පොළොව පෙරළා හෝ කැතිරිනාගේ මුදල් ආපසු දිය යුතු යැයි ඔහු තීරණය කරගත්තේ ය. ඔහු අවසාන වරට තීරණය ට බැස ගත්තේ දෙ දිනකට කලින් ගෘසෙන්කා කැතිරිනාට අපහාසකළ දින සවස මහ මඟදී, අලෝෂා හමුවී ඔහුගෙන් විස්තර දැන අසා, තමා තක්කඩියකු බව පිළිගෙන, කැතිරිනාට ඇගේ සිත සනසා ගත හැකිනම් තමා තක්කඩියකු බව ඇයට දන්වන ලෙස පැවසූ වේලාවේ සිට පැය දෙකකට පසු ව ය. කැතිරිනා ගේ ණය නො ගෙවා සිටිනවාට වඩා කෙනකු මරා මුදල් සොරා ගැනීම හොඳ ය"යි එ දින රෑ අලෝෂා ගෙන් වෙන් වූ මිතියා උන්මාදකාරයකු මෙන් කල්පනා කෙළේ ය. "කවුරුත් මා පිළිගෙන තිබෙන්නේ සොරකු හා මිනීමරුවකු ද හැටියටයි. ගෘසෙන්කා සමග පැනයාමට තමා ගේ මුදල් ගත්තා යැයි කීමට කැතිරීනාට ඉඩ දෙනවට වඩා සයිබීරියාවට යාම හොඳය"යි මිතිය දත් සපමින් තීරණය කරගත්තේ ය. තමා උමතු වෙතියි ඔහු

ඇතැම් විට කල්පනා කෙළේ ය. එහෙත් ඒ අතරේ මුදල් ලබා ගැනීමට ඔහු හැකි තරම් වෑයම් කෙළේ ය.

පුදුමයකි, සුන් වූ බලාපොරොත්තු මිස මීතියාට වෙන කිසිවක් නැතැයි කෙනකු සිතන්නට පිළිවන. මෙ තරම් ලොකු මුදලක් සොයාගැනීමට මෙලොව කිසිවකු නැති මීතියා කුමක් කරන්න ද? එහෙත් ඒ රූබල් තුන්දහ තමාට කෙසේ හෝ ලැබේ ය යන අදහස ඔහු අවසානය දක්වා අත් නොහළේ ය. අහසින් වැටෙන්නාක් මෙන් ඒ මුදල කෙසේ හෝ ලැබෙන්නේ යැයි ඔහු විශ්වාස කෙළේ ය. මුදල් හම්බකිරීමට වෑයම් නොකරන, මුදල් ලැබෙන්නේ කෙසේ දැයි නොදන්නා, මුදලයෙන් ලැබුණු මුදල් නාස්ති කළ මීතියා වැනි අය කල්පනා කරන්නේ මේ විදියට තමා. මීට දෙ දවසකට කලින් අලෝෂා හමුවූ පසු, අද්භූත අදහස් ඔහු ගේ සිත් තුළට වැදී සිහිය අවුල් කෙළේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පළමු ව ඔහු උමතු ව්‍යාපාරයක යෙදීමට අදහස් කෙළේ ය. සමහරවිට මෙ වැනි පුද්ගලයන් තුළ පළමු ව අද්භූත අදහස් පහළ වෙයි. අනතුරු ව ඒ අදහස් ක්‍රියාවේ යෙදවිය හැකි යැයි ඔවුහු විශ්වාස කරති.

ගෘසෙන්කා ගේ ආරක්ෂකයා වන සම්සෝනෝ නමැති මහලු වෙලෙන්ද හමුවී කිසියම් යෝජනාවක් ඉදිරිපත් කොට, එ මගින් වහා ම ඔහු ගෙන් තමාට උවමනා මුළු මුදල ලබාගැනීමට මීතියා අදහස් කෙළේ ය. මේ ව්‍යාපාරයෙන් විශාල ලාබයක් ලැබෙන බවට ඔහුට කිසිම සැකයක් නැත. වෙලෙන්ද මේ යෝජනාව කෙසේ පිළිගනී දැයි ඔහු නොදත්තේ ය. ඒ ගැන ඔහු තුළ මඳ සැකයක් ඇති විය. සමහර විට ඔහු එය වෙළෙඳ ව්‍යාපාරයක් ලෙස නොපිළිගන්නට ද පිළිවන. මීතියා මේ වෙලෙන්ද දැක ඇත,එහෙත් ආශ්‍රය කොට නැත. වචනයක් වත් කතා කොට නැත. ගොඩ පයකුයි වලේ පයකුයි ඇති ව සිටින මේ දුෂ්ට මහල්ලා, ගෘසෙන්කා හොඳ තත්ත්වයක් ඇති ව නඩත්තු කළ හැකි වැදගත් සැමියකු සොයා ගන්නවාට විරුද්ධ නො වන්නට පිළිවන්ය යන අදහස, කිසියම් අප්‍රකට කරුණක් නිසා මීතියා ගේ සිතේ තදින් බලපැවැත්වූයේ ය. මහල්ලා එම අදහසට විරුද්ධ නොවනවා පමණක් නො ව, ඔහු ගේ ආශාව ද එය ම බව මීතියා පිළිගත්තේ ය. ගෘසෙන්කාට විවාහයක් කර ගැනීමට සුදුසු අවස්ථාවක් පැමිණිවිට වෙලෙන්ද උපකාර කරන්නට ද පිළිවන. ගෘසෙන්කා ගේ සැමියා වශයෙන් තමා ගේ පියාට වඩා තමාට මහල්ලා කැමැති වන බව නොයෙක් ආරංචිවලින් හා ගෘසෙන්කා ගේ කතාවෙන් ද මීතියා දැනගත්තේ ය.

මහල්ලා ගේ උපකාරය ඇති ව ඔහු ගෙන් මනාලිය ලබා ගැනීම සඳහා මීතියා පරණ පුරුදු රළු පරුෂ ගති හැරදමා ශිෂ්ට වන්නට ඇතැයි මගේ මේ නවකතාව කියවන පාඨකයන් ගෙන් වැඩි දෙනකු සිතන්නට පිළිවන. එහෙත් මීතියා එ තරම් ශිෂ්ට කමක් නොපෙන්නුවේ ය. ගෘෂෙන්කා ගේ අතීතය සම්පූර්ණයෙන් ම අවසන් වී, අමතක වූ දෙයක් ලෙස මීතියා පිළිගත් බව පමණක් මම මෙහි,ලා සඳහන් කරමි. ඔහු ගෘෂෙන්කා ගේ අතීතය දෙස බැලුවේ දයානුකම්පාවෙන් යුතු ව ය. වරක් ගෘෂෙන්කා තමාට ආලය කරන බව පවසා, තමා සමග විවාහ වීමට කැමැත්ත පැවැසූ විට, ඉන් අදහස් වෙන්නේ, හැම දුසිරිතකින් ම නිදහස් වූ අභිනව මීතියා කෙනකු හා ගෘෂෙන්කා කෙනකුගේ ආරම්භය යැයි මීතියා, ඔහු තුළ පැවැති අනුරාගයේ ශක්තියෙන් අධිෂ්ඨාන කරගත්තේ ය. එවිට ඔවුහු තමන් ගේ අතීත් මෙතෙක් කල් සිදු වූ වැරැදි අමතක කොට නව ජීවිතයක් ආරම්භ කරන්නාහු ය. මහලු වෙලෙන්ද ගෘෂෙන්කා ගේ අතීතය කෙරෙහි බලපැවැත්වූ කෙනකු ලෙස මීතියා පිළිගත්තේ ය. එහෙත් ගෘෂෙන්කා කිසි කලෙක මහලු වෙලෙන්දුව කැමැත්තක් නොදැක්වූවා ය. ඔහු දුන් අතීතයට අයත් පුද්ගලයෙකි. ඒවතුන් අතරේ සිටින්නකුට වඩා නොසිටින්නකුට සමාන ය. තැරත් මීතියා කිසි කලෙක වෙලෙන්ද තියම පිරිමියකු ලෙස නොපිළිගත්තේ ය. වෙලෙන්ද රෝගයෙන් හා මහලු වියෙන් ද දිරාපත් වූවකු බවත්, ඔහු හා ගෘෂෙන්කා හා අතරේ පැවැති සබඳකම බොහෝ කලක සිට සම්පූර්ණයෙන් ම වෙනස් වී, පියකු හා දුවක හා අතරේ පවතින සබඳ කමකට සමාන සත්ත්වයකට පත් වී ඇති බවත්, නගර වැසියෝ දැන සිටියෝ ය.

කෙසේ වෙතත්, මෙ කරුණු නිසා මීතියා ගේ ක්‍රියාකලාපය ඉතා පැහැදිලි විය. දුසිරිතෙහි යෙදෙන්නකු වුවත් ඔහු අවංක සිත් ඇත්තකු විය. මරණාසන්න ව සිටින මහලු වෙලෙන්ද පසුගිය කාලයේ ගෘෂෙන්කා සමග ඇති කරගත් සබඳකම ගැන අවංක ව ම පසුතැවිලි විය යුතු බවත්, මේ අහිංසක මහල්ලා හැර මේ ලෝකේ වෙන කිසි ම හිතවතකු ගෘෂෙන්කාට නැති බවත් පිළිගැනීමට මීතියා පෙලඹුණේ ඔහු ගේ සිතේ පැවැති මේ අවංක කම නිසා විය යුතු ය.

සතර මං සන්ධියේ දී අලෝෂා සමග කළ කතාවෙන් අනතුරුව එදා රෑ මීතියාට නිදාගත නොහැකි වී ය. පසු දින උදේ දහයට ඔහු මහලු වෙලෙන්ද ගේ නිවෙසට ගොස් තමා පැමිණ සිටින බව

දන්වන ලෙස සේවකයාට කීවේ ය. වෙලෙන්ද වාසය කළේ තට්ටු දෙකකින් යුත් විශාල අඳුරු ගෙයක ය. වත්තේ මුර මඩුවත් සමග තවත් කුඩා ගොඩනැගිලි කීපයක් තිබිණි. ගෙයි පහළ තට්ටුවේ වෙලෙන්ද ගේ පුතුන් දෙදෙනා හා ඔවුන් ගේ අඹුදරුවන් මහලු නැගණිය හා අවිවාහක දියණිය ද වාසය කළහ. ඔහු ගේ ලියන මහත්වරුන් දෙදෙනා වාසය කළේ මුර මඩුවෙහි ය. ඉන් එකෙක් ලොකු පවුල්කාරයෙකි. මුර මඩුවත් මහ ගෙයි පහත තට්ටුවත් තද බද විය. එහෙත් මහල්ලා තනියෙන් ම මහ ගෙයි උඩ තට්ටුවේ වාසය කෙළේ ය. ඔහුට සැපසාත්තු කළ දියණියට පවා උඩ තට්ටුවේ නතරවීමට ඉඩ නොදුන්නේ ය. ඇ ඇදුමෙන් රෝගාතුර වී සිටියත් පියා කතා කළ වහා ම තරප්පුව නැග උඩ තට්ටුවට යා යුතුය.

ගෙයි උඩ තට්ටුවේ විශාල කාමර කීපයක් ම තිබුණේ ය. ධනවත් වෙළෙන්දකු ගේ නිවෙසකට සරිලන පරිදි පැරණි ගෘහභාණ්ඩ තබා සරසන ලද ඒ කාමරවල බිත්ති අයින දිගේ විශාල පුටු තබා තිබුණේ ය. සිළිමේ සිට විදුරු පොකුරු පහන එල්ලෙන අතරේ බිත්තිවල කැඩපත් සවිකර තිබිණි. මෙසේ සරසන ලද එම කාමරය පාවිච්චි නොකරන ලදි. මහල්ලා වාසය කළේ ඇත මුල්ලක තිබෙන කුඩා කාමරයක ය. ඔහුට මෙහෙවර කළ මහලු සේවිකාව නිතර හිස වටේ ලේන්සුවක් ගැට ගසා ගෙන සිටිනා අතර සේවක තරුණයා ඉස්තෝප්පුවේ පෙට්ටිය උඩ නිතර හිඳ සිටියේ ය. දෙපා ඉදිමී ඇති බැවින් මහල්ලාට ඇවිදගත නො හැකි ය. කලාතුරකින් පුටුවෙන් නැගිටින හෙතෙම මහලු සේවිකාව ගේ කරේ එල්ලී කාමරය හරහා දෙතුන් වරක් ගමන් කරයි. ඔහු මේ සේවිකාව සමගවත් පිය බසින් කතා නො කෙළේ ය.

'කපිතන්' පැමිණ සිටින බව දන්වූ වහා ම ඔහු හමුවීමට මහල්ලා කැමැති නො වී ය. කෙසේ හෝ ගෙහිමියා හමුවිය යුතු බව බලකර සිටි මිතියා ආයේත් සේවකයා අත නම ගම දන්වා යැව්වේ ය. මේ කපිතන් කොයි විදියේ මිනිහෙක් ද? ඔහු සුරා බී සිටින්නේද? ඔහු කෝලාහලයක් කිරීමට සැරසෙන්නේ ද? වෙ-ලෙන්ද සේවකයා ගෙන් ප්‍රශ්න කෙළේ ය. කපිතන් ඉතා සන්සුන් පුද්ගලයකු බවත්, තම ස්වාමියා හමු වී මිස ආපසු නොයන බවත් සේවකයා කී ය. මහල්ලා මිතියා සමග කතා කිරීමට ආයේත් විරුද්ධ විය. මේ බව කලින් දැන සිටි මිතියා ඒ සඳහා වෙසෙසින් ම ගෙනෙන ලද කඩදසියක ඉතා පැහැදිලි අකුරින් "ගාසෙන්කා සම්බන්ධ ඉතා වැදගත් කරුණක් ගැන සාකච්ඡා කිරීමට පැමිණියෙමි"යි කියා ලියා සේවකයා අත ආයේත් මහල්ලා වෙත යැව්වේ ය.

මදක් කල්පනා කළ මහල්ලා, අමුත්තා විසිත්ත කාමරයට කැඳවා ගෙන එන ලෙස සේවකයාට දන්වා, වහා ම තමා ළඟට පැමිණෙන ලෙස පහත තට්ටුවේ සිටින බාල පුතාට සේවිකාව අත පණිවිඩයක් යැව්වේ ය. අඩි හයක් උසැති, විශිෂ්ට කාය ශක්තියෙන් යුත්, දළිරවුළු කපා යුරෝපීය සිරිතට ඇඳුම් පැළඳුම් කරන බාල පුතා වචනයක්වත් නො කියා වහා පියා ළඟට ගියේ ය. මේ මහලු පියා ඉදිරිපිට දී ඔහු ගේ දූ දරුවෝ තැති ගෙන වෙවුලති. මහල්ලා යෝධයකු වැනි පුතා කැඳෙව්වේ මීතියාට ඇති බියකින් නො ව, කිසියම් ඇබැද්දියක් සිදුවුණොත් සාක්ෂි කාරයකු අවශ්‍ය වන හෙයිනි. පුතා ගේ හා සේවකයා ගේ ද ආධාර ඇති ව මහල්ලා ඉතා අමාරුවෙන් අත්තිමේ දී විසිත්ත කාමරයට ගියේ ය. මීතියා හමු වී කතා කිරීමට මහල්ලා තුළ කිසියම් කුතූහලයක් ඇති වූ බව මෙහි ලා සඳහන් කළ යුතු ය. මීතියා හිඳ සිටි විශාල විසිත්ත කාමරය සිතේ ශෝකය ඇති කරවන තරමට අඳුරු ය. කවුළු පේළි දෙකකින් යුත් විසිත්ත කාමරයට, කිරිගරුඬ සවිකරන ලද බිත්ති සහිත සඳලු තලයක් ද වී ය. සිලිමේ සිට යෝධ වීදුරු පොකුරු පහන් තුනක් එල්ලෙයි.

විසිත්තකාමරයට ඇතුළු වන දොර ළඟ, කුඩා පුටුවක හිඳගත් මීතියා තමා ගේ දෛවය විසඳෙන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියේ ය. අඩි හැත්තෑවක් පමණ දුරින්, කාමරයට පිවිසෙන අනෙක් දොරින් මහල්ලා ඇතුළු වූ වහා ම මීතියා හුන් තැනින් වහා නැගිට යුධහමුදාවට සුදුසු ගමනින් දුර අඩි තබා මහල්ලා හමුවට ගියේ ය. මීට දවස් තුනකට කලින් පවුලේ ඇත්තන් සමග සොසිමා තවුසා ගේ අසපුවේ දී හමු වන විට ඇඳ සිටියාක් මෙන් මීතියා තිකට දක්වා බොත්තම් දමන ලද කබායකින්, වටකුරු හිස්වැස්මකින් හා කළු අත් වැසුම්වලින් සැරැසී සිටියේ ය. මහලු වෙළෙන්ද ද මීතියා තමා ළඟට එන තෙක් උදුර බව හගවා කඳ කෙළින් තබා ගෙන සිටියේ ය. වෙළෙන්ද ළඟට යන විට ඔහු තමා විනිවිද බලන්නට ඇතැයි මීතියා කල්පනා කෙළේ ය. මහල්ලා ගේ ඉදිමුණු මුහුණට මීතියා විශේෂ සැලැකිල්ලක් දක්වී ය. වෙන ද මහතට පෙනෙන ඔහු ගේ යටිතොල මෙද බනිස් ගෙඩියක් මෙන් පහතට එල්ලෙයි. අමුත්තාට හිසට ව ආචාර කළ මහල්ලා හිඳගැනීමට සෝපාව ළඟ තිබෙන කුඩා පුටුවක් පෙන්නා අනතුරු ව පුතා ගේ අතේ එල්ලී ඉතා අමාරුවෙන් කෙඳිරිගාමින් පහත් වී සෝපාව උඩ ඉඳගත්තේ ය. මහල්ලා එසේ කළේ 'මා නොවැදගත්තෙක්ය; මා විසින් හිරිහැර කරන ලද මේ මහල්ලා උදුර පුරුෂයෙක්ය' යන හැඟීම තමා තුළ ඇති කරවීමට යයි මීතියා කල්පනා කෙළේ ය.

"මහත්මයා මොනවචද මා හම්බවෙන්න ආවේ?" යි සෝපාව උඩ හිඳගත් මහල්ලා ඉතා අමාරුවෙන්, එහෙත් පැහැදිලි එඩිතර සවරයෙන් ඇසුවේ ය. ඒ සවරයේ කරුණාව හඟවන ගතියක් ද තිබිණි.

එක්වර ම නැඟී සිටි මිතියා ආයේත් හිඳගත්තේ ය. අනතුරුව ඔහු මහත් නොසන්සුන්කමින් අත වනමින්, උස් හඬින් කතා කරන්නට විය. මිතියා අන්තිම පිදුරු ගසේ එල්ලී නිදහස් විය නො හැකි වුවහොත් දියේ ගිලී මියයාමට සූදානමින් සිටින, විනාශය කරා ලං වූ මිනිසකුට සමාන ය. ප්‍රතිමාවක මුහුණක් මෙන් මහල්ලා ගේ මුහුණේ කිසි ම වෙනසක් දකින්නට නො තිබිණි එහෙත් ඔහු මිතියා වැටී සිටි තත්ත්වය එක්වර ම තේරුම් ගන්නට ඇතිවාට කිසි ම සැකයක් නැත.

"ගරු මහත්මයාණනි, මගේ තාත්තා හා මා හා අතර තිබෙන භේදය ගැන තමුන්නාන්සේ කීප වතාවක් ම අහලා ඇති. මට අම්මා ගෙන් ලැබුණ දේපොළ සේරම තාත්තා කොල්ලකා ගත්තා............ මේ පළාතේ ඉන්න කවුරුත් මේ ගැන දන්නවා ....මේ පළාතේ මිනිසුන් ගේ වැඩේ ම තමන්ට අයිති නැති දේවල් ගැන ඕපා දූප දෙඩීමයි............ සමහර විට මහත්මයා මේ ගැන ගෘසෙන්කා ගෙන්.........මට සමා වෙන්න, මා බොහො ම ගරු කරන අග්‍රපේනා ඇලෙක්සැන්ඩ්‍රෝව්නා ගෙන් දැනගන්න ඇති........."

මෙසේ කතාව පටන්ගත් මිතියා පළමු වාක්‍යයෙන් ම කතාව අවුල් කරගත්තේ ය. ඔහු ගේ කතාව වචනයක් පාසා නො ලියා සාරාංශය පමණක් මෙහි ඇතුළත් කරමි. මීට මාස තුනකට කලින් මිතියා මේ පළාතේ, ප්‍රධාන නගරයේ වෙසෙන දක්ෂ නීතිඥයකු හමුවිය. "පැවල් පවුලොවිච් නමැති ඒ ප්‍රසිද්ධ නීතිඥයා ගැන සමහරවිට මහත්මයා අහලා ඇති. එයා බොහො ම ලොකු උගතෙක්......... එයා මහත්මයා අඳුනනවා.........මහත්මයා ගැන මතක් කළා........." ආයේත් මිතියා ගේ කතාව අවුල් විය. එහෙත් ඔහු පසුබට නො වි ය. ඔහු කැඩුණු බිඳුණු තැන් පුරවමින් ආයේත් කතා කෙළේ ය.

මේ නීතිඥයා ගේ විස්තර අසා, ඔහු ගෙන ගිය ඔප්පු තිරප්පු බලා (මිතියා මේ ඔප්පු ගැන වැඩි විස්තරයක් නො කෙළේ ය.) මව ගෙන් ලැබිය යුතු චමස්නියාව නම් ගමට අයිතිවාසිකම් කියා පියාට විරුද්ධ ව නඩු ගිය හැකි බව කීවේ ය. "හැම දෙරක් ම වැහිලා නැහැ. නීතියෙන් තව ම ඉඩ තියෙන්න පුළුවනි.

චමස්නියාව රූබල් විසිපන්දහක්, නැහැ සමහර විට විසිඅටදහක් පමණ වටින නිසා තාත්තා ගෙන් තවත් රූබල් හය දහක් නැති නම් පන්දහක් ගන්න පුළුවනි. නැහැ මහත්මයා, සමහර විට මේ ගම්මානය රූබල් තිස්දහක් පමණ වටිනවා. නමුත්, හිතක් පපුවක් නැති මගේ තාත්තාගෙන් මට දහත් දහක්වත්, ලැබුණේ නැහැ.'' මුල දී මිතියා නීතිය ගැන කිසිවක් නොදත් නිසා නිහඬ ව සිටියේ ය. එහෙත් ගමට පැමිණි පසු තමා ගෙන් අලාභය ඉල්ලා පියා නඩුවක් දමූ පසු මිතියා ගල් ගැසිණි.(මෙතැනදී ද කතාව අවුල් විය. එහෙත් ඔහු අමාරුවෙන් කතා කෙළේ ය) ''ඉතින් මහත්මයා මගේ තාත්තාට විරුද්ධ ව නඩු දමා මට ලැබෙන්න තියෙන මුදල් අරගෙන එයින් මට රූබල් තුන්දහක් දෙන්න .... කොහොම වුණත් මහත්මයා කවරදාවත් මේ නඩුව පරදින්නේ නැහැ. ඒ බව මට දිවුරා කියන්න පුළුවනි. තුන් දහක් වෙනුවට හය දහක් ලැබෙන්න පුළුවනි......... ......'' මිතියාට එ දින ම මේ ගැන තීරණයකට බැස ගැනීමට අවශ්‍ය විය.

''මම නොතාරිස් කෙනෙක් ළගට නැති නම් වෙන ඕනෑ ම තැනකට ගිහින් මේ කටයුත්ත මහත්මයාට භාර දෙන්නම්...... .... කොයිත් කියනවානම් ඕනෑ ම දෙයක් කරන්නම්.... .... මා ළඟ තියෙන සේරම ඔප්පු තිරප්පු මහත්මයාට භාර දෙන්නම්. ඕනෑ ම ලියවිල්ලකට අස්සන් කරන්නම්.........අපට දැන් ම පුළුවනි මේ ගැන ගිවිසුමක් ඇතිකර ගන්න.......... පුළුවන් කමක් තියෙ-නවානම් අපි දැන් ම ඒ ගිවිසුම පිළියෙළ කර ගනිමු. ඊට පස්සේ මට රූබල් තුන්දහක් දෙන්න. මහත්මයා තරම් පොහොසතෙක් මේ මුළු පලාතේ ම නැහැ. මහත්මයාට පුළුවනි මා බේරාගන්න... මං බේරාගන්නවානම් ඒක බොහොම ලොකු වැඩක්........... මහත්මයා අඳුනන කෙනකුට මගේ ලොකු හිතවත් කමක් තියෙනවා. මහත්මයා ඒ තැනැත්තියට තාත්තා කෙනකු වගේ සලකනවා. නැති නම් මම කවරදාවත් මේ ගමන එන්නේ නැහැ. මේ වැඩේට සම්බන්ධ වී සිටිනවා තුන් දෙනෙක්. මේවා අපේ දෛවය අනුව සිද්ධවන දේවල්. මොනවා කරන්න ද? මෙක බොහො ම භයානක දෙයක්. බොහො ම කනගාටුදායක දෙයක්. මහත්මයා ටික දවසකට කලින් මේ වැඩය අත්හැර දමූ නිසා දැන් අප දෙදෙනකු අතර තරගයක් ඇති වී තියෙනවා වෙන්න ඇති. මා එ තරම් ලොකු උගතෙක් නො වෙයි. එක පැත්තකින් මා ඉන්නවා අනෙක් පැත්තෙන් මගේ තාත්තා, අර අලුගෝසුවා ඉන්නවා. ඉතින් මහත්මයා අප දෙන්නා ගෙන් එක්කෙනෙක් තෝරා ගන්න ඕනෑ. එක්කෝ මා, නැතිනම් අර අලුගෝසුවා. තුන් දෙනකු ගේ ජීවිත හා දෙන්නකු ගේ දෛවය රැඳී ඇත්තේ මහත්මයා ගේ අතේ......... මම මේ සේරම අවුල් කරනවා...... ..

ඒ වුණත් මං කියන දෙය තේරෙනවා නේද? මගත්මයා ගේ මුහුණෙන් පේනවා තේරෙන බව......... මහත්මයාට තේරුම් ගන්න බැරිනම් මං විනාසයි............ දැන් මහත්මයාට මගේ අදහස තේරුම් ගන්න පුළුවන් නේද?"

"......දැන් මහත්මයාට මගේ අදහස් තේරුම් ගන්න පුළුවන් නේද?" යි අසමින් මීතියා ඔහු ගේ අශෝභන කතාව අවසන් කෙළේ ය. අනතුරු ව හෙතෙම පුටුවෙන් නැගිට, තමං කළ අනු- වණ යෝජනාවට ලැබෙන පිළිතුර බලාපොරොත්තු ව සිටියේ ය. තමා ගේ අදහස නිස්සාර වූ බව අන්තිමට කී වචන ස්වල්පයෙන් මීතියා දැනගත්තේ ය.

"කොතරම් ලොකු පුදුමයක් ද? මේ ස්ථානයට එන විට මගේ අදහස් ඥානවන්ත විය. එහෙත් දැන් එය ප්‍රලාපයක් වැන්න." යන අදහස හදිසියෙන් ම මීතිය ගේ බලාපොරොත්තු සුන් වූ සිතේ පහළ වි ය. ඔහු කතා කළ මුළු කාලය තුළ ම මහල්ලා නො සෙල්වී අමනා- පයෙන් බලා සිටියේ ය. මොහොතක් පමණ වේලා මීතියා ගේ සිත දෙගිඩියාවේ තැබූ මහල්ලා නොසතුටින්, එහෙත් ස්ථිර ස්වරයෙන් මෙසේ කී ය.

"අපි ඔය වගේ කටයුතුවලට අතගහන්නේ නැහැ."

මීතියාට හදිසියෙන් ම තමා ගේ දෙපා පණ නැති වන බව දැනිණි.

"එහෙනම් මං මොකද කරන්නේ?" යි ඔහු අමාරුවෙන් සිනාසි ඇසුවේ ය. "දැන් මට වෙන කරන්න දෙයක් නැතිවා වගෙයි. මහත්- මයා ගේ කල්පනාව කොහොම ද?"

මෙසේ පැවැසූ මීතියා, මහල්ලා දෙස නො සැලී බලා සිටියේ ය. මහල්ලා ගේ මුහුණේ අමුත්තක් ඇති වන බව ඔහු දුටුවේ ය.

"අපි මේ විදියේ කටයුතු කරන්නේ නැහැ" යි මහල්ලා සෙමෙන් කී ය. "මේ වගේ වැඩවලට උසාවි තියෙනවා. පෙරකදෝ- රුවන් හා අද්වකාත්වරුන් ඉන්නවා. බොහෝ ම කරදර වැඩක්. මහත්මයා කැමැති නම් මෙහෙ ඉන්නවා හොඳ මිනිහෙක්."

අනේ දෙයියනේ, කව්ද ඒ මිනිහා? කරුණාකර මේ කටයුත්ත කරලා දෙන්න. මහත්මයා මගේ ගැලවුම්කාරයා වගෙයි" මීතියා ප්‍රශංසාත්මක බසින් කී ය.

"දැන් ඒ මිනිහා මෙහෙ නැහැ. පදිංචිය වෙන පළාතකයි. මිනිහා ලී වෙළෙන්දෙක්. නම ලියාගේ. චමස්නියාවේ තියෙන ලී

ගැනීමට මිනිහා ගිය අවුරුද්දේ ඉඳලා මහත්මයා ගේ තාත්තා එක්ක තීරණයකට බැහැගන්න බැරි ව තවමත් කේවල් කරනවා. දැන් මිනිහා ආයෙත් ඇවිදින්, වොලෝවායේ නානායමේ සිට වෙස්-ටාස් දෙළහක් ඇතින් තියෙන ඉයැන්කෝ ගමේ පූජකයා එක්ක නැවතිලා ඉන්නවා. ලී ගැනීම ගැන මගෙන් අහලා මට ලියුමකුත් එව්වා. මහත්මයා ගේ තාත්තා සූදනම් වන්නේ මිනිහා පෞද්ගලික ව හමුවෙලා ගනුදෙනුව ගැන තීරණයකට බැහැගන්නයි. ඉතින් ඊට කලින් මිනිහා හමු වෙලා මට කළ යෝජනාව ඒ මිනිහට කළොත් සමහර විට වැඩේ හරියන්න පුළුවනි ......!"

"බොහො ම හොඳ අදහස" යි මීතියා ඉමහත් ආශාවෙන් මහල්ලා ගේ කතාවට බාධා කරමින් කී ය. "මගේ වැඩේට ගැළපෙන හොඳ මිනිහා. තාත්තා එක්ක කේවල් කරන අතර මට පුළුවනි ඉඩමේ අයිතිය කියා ඔප්පු සේරම දෙන්න, හ ! හා! හා!"

මීතියා හදිසියෙන් ම සිතාසෙන්නට වූයෙන් මහල්ලා තැති ගත්තේ ය.

"මා කොහොම ද මහත්මයා කළ උදව්වට ස්තුති කරන්නේ?" ඔහු මහත් ප්‍රීතියෙන් කී ය.

"නැහැ" ස්තුතියක් උවමනා නැහැ" යි මහල්ලා හිස වනමින් කී ය.

"මහත්මයා මා ගලවා ගත්තා. මා දන්න සිව්යා මට මේ උදව්ව කරන බව. දැන් ඉතින් ලීවෙළෙන්ද බලන්න යන්න ඕනෑ."

" මට ස්තුති කරන්න උවමනාවක් නැහැ."

"දැන් ඉතින් පමා නො වී යන්න ඕනෑ. මා හිතන්නේ නැහැ මගෙ පැමිණීමෙන් මහත්මයා ගේ අසන්පයට කරදරයක් වුණා ය කියා. මට කළ උදව්ව කවදාක්වත් අමතක වෙන්නේ නැහැ......'

"ඒකට කමක් නැහැ ...."

මීතියා මහල්ලා ගේ අත ගත්තේ ය. එහෙත් ඔහු අත අතහැ-රියේ මහල්ලා ගේ දෑසේ බැල්ම දුටු පසු ව ය. මහල්ලා සැක කිරීම ගැන තමාට ම දෙස් පවරා ගත් මීතියා "මිනිහට බොහො ම තෙහෙට්ටු ඇති"යි කල්පනා කෙළේ ය.

"මා මේ සේරම කරන්නේ ඇය වෙනුවෙන්. මහත්මයාට තේරෙනවා නේ ද? ඇය වෙනුවෙන්" හි මීතියා කී ය. ඔහු ගේ කට හඬ කාමරය පුරා රැවු දුන්නේ ය. හිස නමා ආචාර කොට එක් වරම

ආපසු හැරුණු හෙතෙම, ආපසු නො බලා, දුර අඩි තබා, කාමර- යෙන් පිට වී ගියේ ය. ඔහු ප්‍රීතියෙන් වෙවුලන්නට විය.

"විනාශයට මුහුණ පා සිටි මා මගේ ඉටුදෙවියා විසින් බේරා ගත්තා" යි මිතියා කල්පනා කෙළේ ය. සම්සෝනෝ වැනි සූර වෙළෙන්දකු විසින් (ඔහු උදර ගතිගුණ ඇති පුද්ගලයෙකි) කළ යෝජනාව කිරිගහට ඇන්නා වගේ හරි යයි. මිතියා වහා ලී වෙළෙඳා සොයා යාමට අදහස් කෙළේ ය. "මම කොහෙම හරි වැඩේ කරගෙන රෑ වෙන්න ඉස්සෙල්ලා එන්න ඕනෑ. නැති නම් මේ නාකියා මට විහිළුවක් කළා ද?" යි මිතියා සිය නිවෙස බලා යන අතරේ කල්පනා කෙළේ ය. ලී වෙළෙඳාම ගැන හොඳ දැනුමක් ඇති ලියාගේ නමැති (පුදුම නමකි) මේ ලීවෙළෙන්දා අඳුනන සම්සෝ- නෝ වැනි සූර වෙළෙන්දකු විසින් කළ යෝජනාව සාර්ථක වන්නේයයි මිතියා කල්පනා කෙළේ ය. ඒ හැර ඔහුට වෙන කිසිවක් ගැන කල්පනා කළ නොහැකි වී ය. නැති නම් මහලු වෙළෙන්දා කරන්නේ රැවටීමක් ද?

බෙදයකි, මිතියා ගේ දෙවන අදහස නිවැරැදි වී ය. ඒ භයානක විපතින් බොහෝ කලකට පසු තමා කපිතන් මුළා කළ බව කියමින් මහලු සම්සෝනෝ සිනාසුණේ ය. හෙතෙම තදින් වෛර බැඳගැනී- මට සමත්, නපුරු ද්වේෂ සහගත, නිතර ඇනුම්පද කියන මිනි සෙකි.මහල්ලා මිතියා මුළා කළේ, මිතියා ගේ මුහුණේ දක්නට තිබුණු නොසන්සුන් කම නිසා ද?

දෙ වන පරිච්ඡේදය

හරිනොගිය ගනුදෙනුව

දැන් ඉතින් මිතියා හැකි තරම් ඉක්මනින් ලී වෙළෙන්දා සොයා යා යුතු ය. එහෙත් ගමනට උවමනා වාහනයක් කුලියට ගැනීමට අතේ මුදල් නැත. ඔහු ළඟ කොපෙක්ස් හතළිහක් තිබුණේ ය. හවුරුදු ගණනක් ධනවත් ව සිටීමෙන් පසු ව ඔහු ළඟ ඉතිරි වී ඇත්තේ මේ සුළු මුදල පමණි. බොහෝ කාලයක සිට වේලාව නොයන පැරැණි රිදී ඔරලෝසුවක් ඔහු ළඟ තිබුණේ ය. මිතියා වහා ඔරලෝසුව කඩමණ්ඩියේ ඔරලෝසු සාප්පුවක් දමාගෙන සිටින

යුදෙව්වා වෙත ගෙන ගියේ ය. යුදෙව්වා ඔරලෝසුව ගෙන රූබල් හයක් දුන්නේ ය.

“මා මේ තරම් ලොකු මුදලක් බලාපොරොත්තු වුණේ නැහැ”යි මිතියා ප්‍රීතියෙන් කුල්මත් වී කී ය. (ඔහු තවමත් සිටින්නේ ප්‍රීති-යෙන් කුල්මත් වූ තත්ත්වයක ය) ඔහු රූබල් හය ගෙන වහා ගෙදර ගියේ ය. ගෙදර ගිය හෙතෙම ගෘහිණිය ගෙන් තවත් රූබල් තුනක් ඉල්ලා ගත්තේ ය. ඇය ළඟ තිබුණේ ඒ සුළු මුදල පමණි. එහෙත් ඈ මිතියාට කොතරම් ආදරය ද කියතොත් ඒ මුදල ඔහුට දීම පවා ඇගේ ප්‍රීතියට හේතු විය. මහත් නොසන්සුන්කමින් සිටි මිතියා තමන්ගේ දෛවය එදින ම විසඳෙන බව, තමා විසින් මහලු වෙලෙ-න්දාට එළි කරන ලද වැඩපිළිවෙළ, ඔහුගේ තීරණය සහ අනාගතය ගැන තමා තුළ ඇති බලාපොරොත්තු ගැන ගෘහිණියට නොඉව-සිල්ලෙන් විස්තර කෙළේ ය. මීට කලින් මේ ගෙදර නවාතැන් ගත් අය විසින් ඔවුන් ගේ රහස් ගෘහිණියට පවසන ලදි. එ හෙයින් ඈ තම පවුලට අයත් නිරහංකාර මහත්මයකුට සලකන්නාක් මෙන් මිතියාට සැලකුවා ය. මෙසේ රූබල් නවයක් එකතු කර ගත් මිතියා වොලෝවාවට යාම සඳහා කරත්තයක් ගෙනෙන ලෙස දන්වා යැව්වේ ය. පෙර දින දවල් කාලයේ දී මිතියා සතු ව තඹයක්වත් නොතිබුණු බවත්, කිප දෙනකු ඉදිරිපිට මුදල් ලබාගැනීම පිණිස ඔරලෝසුවක් විකුණා ගෘහිණිය ගෙන් රූබල් තුනක් ණයට ගත් බවත් සිහිකොට අනතුරු ව සත්‍යයක් ලෙස ඔප්පු කරන ලද්දේ ඉහත සඳහන් කළ පිළිවෙළට ය.

මා මේ සිද්ධිය මෙහි ලා පවසන්නේ මන්දැයි ඔබට පසු ව දැන ගත හැකි ය.

අන්තිමේ දී තමා ගේ සියලු දුක්කරදර විසඳාගැනීමට අවස්ථා-වක් ලැබුණේ ය යන බලාපොරොත්තුවෙන් හටගත් සොම්නසින් සිටි මිතියා, වොලෝවාවට ළඟාවන විට වෙවුලන්නට වූයේ තමා නැති අතරේ ගෘසෙන්කා කුමක් කරසිද? යන අදහස ඇති වූ හෙයිනි. පියා ළඟට යාමට ගෘසෙන්කා තීරණය කළොත් කුමක් කරන්න ද? ගෘෂෙන්කාට නොකියා ඔහු මේ ගමන යන්නේ මේ කාරුණ නිසා ය. යම් කිසිවෙක් තමා සොයා පැමිණියහොත් තමා ආගිය තැන් හෙළි නොකරන ලෙස ඔහු ගෘහිණියට ද කිවේ ය.

“මම කොහොම හරි අද රෑට ආපසු ගෙදර යන්න ඕනෑ”යි මිතියා කරත්තයේ පැද්දෙමින් යන අතරේ කිපවරක් ම තමාට ම කියා ගත්තේ ය. “ ඔප්පුව ලියාගන්න කොහොම හරි ලී වෙලෙන්දා එක්ක යන්න ඕනෑ” යී මිතියා සැලෙන හදවතින් යුතු ව කල්පනා

කොට කිවේ ය. අහෝ ඛෙදයකි. ඔහු ගේ බලාපොරොත්තු සපල වීමට දෛවයෙන් නියම නො වී ය.

පළමු ව, කෙටි මගකින් ගිය මීතියා වොලෝවාවට පැමිණෙන විට පමා විය. නියම මග සැතැපුම් දොළහක් වන අතරේ ඔහු තෝරාගත් කෙටි මග සැතැපුම් දහඅටක් විය. දෙවනු ව, පූජකයා ගෙදර නොසිටියේ ය. ඔහු අසල ගමකට ගොස් සිටියේ ය. විඩාපත් අසුන් පිට මීතියා පූජකයා සොයා යන විට අඳුරු වැටිණි.

පූජකයා ලජ්ජා භයෙන් හා පියකරු පෙනුමෙන් ද යුත් කුඩා මිනිසෙකි. හෙතෙම මීතියා ඇසූ ප්‍රශ්නවලට වහා පිළිතුරු දෙමින්, පළමු ව ලී වෙලෙන්දා තමා සමග සිටි බවත්, දූන් ඔහු ලී ගැනීම පිණිස සුහෝප්‍රසෝලෝක් නමැති ගමට ගොස් එදින රාත්‍රිය කැලෑ තිලධරයා සමග ගත කරන බවත් කී ය. තමා වහා ලී වෙලෙන්ද ළගට කැඳවා ගෙන යන ලෙස මීතියා කළ හදිසි ඉල්ලීමට පූජකයා කැමැති වූයේ පළමු ව විරුද්ධවීමෙන් පසු ව ය. ඔහු තුළ නිතැතින් ම සැක පහළ වී ය. එහෙත් අවාසනාවට මෙන 'සැතැපුමකට වඩා දුර නැති නිසා' පයින් යාමට පූජකයා අදහස් කෙළේ ය. ඒ අදහසට එකඟ වූ මීතියා යාරයක් පමණ දුරින් අඩි තබා ගමන් කළෙන් අසරණ පූජකයාට දුවන්නට සිදු වී ය. මහලු නො වූවත් පූජකයා ඉතා පරීක්ෂාකාරී පුද්ගලයෙකි.

උනන්දුවෙන් හා නොසන්සුන් සිතින් ද එක්වර ම සිය අදහස් පූජකයාට ද පැවැසූ මීතියා, ලී වෙලෙන්දා ගැන තොරතුරු අසමින් මුළු ගමනේ දී ම කතා කෙළේ ය. එහෙත් සැලකිල්ලෙන් මීතියා ගේ කතාවට සවන් දුන් පූජකයා ලී වෙලෙන්දා ගැන එ තරම් තොරතුරු නො කීවේ ය. "මා දන්නේ නැහැ. මං කියන්න දන්නේ නැහැ. මා කොහොම ද කියන්නේ?" යි කියමින් ඔහු මීතියා ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු නො දී මග හැරියේ ය. තමා ගේ බූදලය ගැන තාත්තා සමග කලහ කරන බව කී විට පූජකයා සැබැවින් ම තැති ගත්තේ ඔහු පියෝදර් කරමසෝගෙන් නඩත්තු වන හෙයිනි. කෙසේ වෙතත් ලී වෙලෙන්දාට ගොස්යන්ලියාගේ කියන්නේ මන්දැයි පුදුමයෙන් විමසූ විට, වෙලෙඳාගේ නියම නම ලියාගේ වූවත්, ඔහු අමනාප වන නිසා කිසි කලක ඒ නමින් කතා නොකරන බවත්, ඔහුට ගොස්කින් කියා ඇමැතීමට අමතක නො කළ යුතු බවත් පූජකයා මීතියාට ඉතා කරුණාවෙන් පැහැදිලි කර දුන්නේ ය. "එහෙම කතා නොකළොත් මිනිහ ගෙන් කිසි ම දෙයක් කර ගන්න ලැබෙන්නේ නැහැ" යි පූජකයා කතාව අවසන් කරමින් පැවසී ය.

පූජකයා ගේ කතාව අසා පුදුම වූ මීතියා, සම්සෝනෝ ලී වෙ-ලෙන්දා ඇමැතුවේ එම නමින් යැයි කී ය. සම්සෝනෝ එම නමින් ලී වෙලෙන්දා ඇමැතුවේ නම් එහි කිසියම් සැක කටයුතු දෙයක් තිබියයුතු ය. සම්සෝනෝ මීතියා මෝඩයකු ලෙස රවටා ඇත. එහෙත් සිතේ හටගත් සැකය වචනයෙන් හෙළි නොකළ පූජකයා ලීවෙලෙන්ද පිළිබඳ කතාව එ තැතින් නතර කෙළේ ය. මෙ වැනි සුළු දේවල් ගැන කල්පනා කිරීමට මීතියාට කාලයක් නැත. ඔහු වහවහා ගමන් කෙළේ ය. තමා සැතැපුම් තුනක් පමණ පැමිණ ඇති බව මීතියාට වැටහුණේ ගමන අවසන් වූ පසු ව ය. ඉන් ඔහු කෝප විය. එහෙත් ඔහු ඒ කෝපය මැඩගත්තේ ය.

අන්තිමේ දී ඔවුහු කැලෑ නිලධරයා ගේ නිවෙසට පැමිණියෝය නිලධරයා නිවෙසේ එක් කාමරයක සිටින අතරේ අනෙක් පැත්-තේ තිබුණු හොඳ කාමරයේ ලී වෙලෙන්දා නතර වී සිටියේ ය. කාමරයට ඇතුළු වූ ඔවුහු සත්ත්ව තෙලින් සාදන ලද ඉටිපන්දමක් ගෙන දැල්වූවෝ ය. කාමරය ඉතා උණුසුම් ය. තිවී ගිය බොයිලේ-රුවක් ද, කෝප්ප තබන ලද තැටියක් ද, හිස් රම් බෝතලයක් ද, අඩක් හිස් වූ වොඩ්කා බෝතලයක් ද, අඩක් කා නිම කරන ලද තිරිඟු පිටිපාන් ගෙඩියක් ද, මේසය උඩ තිබිණි. ලී වෙලෙන්දා කබාය කුඩා වත්තට නමා, කොට්ටයක් මෙන් හිස යටින් තබා, බන්කුව උඩ දිග ඇදී ගොරවමින් නිදා සිටියේ ය. මීතියා වෙලෙන්දා දෙස බැලුවේ නොසන්සුන් සිතිනි.

"මේ මිනිහා කොහොම හරි නැගිට්ටවන්න ඕනැ. මා ආවේ බොහො ම වැදගත් වැඩකටයි. ඉක්මනට ආපසු යන්න ඕනැ." මීතියා මහත් නොසන්සුන්කමින් කී ය. එහෙත් කැලෑ නිලධරයාත් පූජකයාත් කතා නො කළහ. මීතියා තනියෙන් ම බන්කුව ළඟට ගොස් වෙලෙන්දා අවදි කිරීමට වෑයම් කෙළේ ය. එහෙත් වෙ-ලෙන්දා අවදි නො වී ය.

"මේ මිනිහා හොඳට ම බීලා" යි මීතියා තීරණය කෙළේ ය. "අනේ දෙයියනේ, දැන් මා මොනවා කරන්නද?" යි මීතියා නො ඉව-සිල්ලෙන් වෙලෙන්දා ගේ අතින් ඇද්දේ ය, දෙපයින් ඇද්දේ ය, හිස අල්ලා සෙලෙව්වේ ය, උස්සා බන්කුව උඩ ඉන්දෙව්වේ ය. වෙලෙන්දා අසන්නන් තුළ පිනා උපදින ලෙස කෑගැසුවේ ය. අනතුරු ව බැන්නේ ය, ඊට වඩා කිසිවක් කළ නො හැකි විය.

"දැන් ම නො ගිහින් ටික වෙලාවක් ඉන්න එක හොඳයි, මිනිහා ඉන්නේ නැගිටල කතා කරන්න පුළුවන් තත්ත්වයක නො වෙයි" අන්තිමේ දී පූජකයා පැවැසී ය.

"මිනිහා අද මුළු දවසේ ම බිව්වා" යි නිලධරයා කී ය "එළිවන තෙක් මෙ තැන නවතින්න බැහැ."

මෙසේ බලාපොරොත්තු සුන් කරගත් මීතියා නිදා සිටි මිනිසාට යළි පහර දෙන්නට සැරසුණ මුත් ආයේත් නතර වූයේ එයින් කිසි ම ප්‍රයෝජනයක් නොවන බව දැනගත් පසු ව ය. පූජකයා නිහඬ වූ අතර නිදිමතින් සිටි නිලධරයා ශෝකයෙන් බලා සියේ ය.

"සැබෑ ජීවිතයෙන් මිනිසාට කො තරම් දුක්බර විපත් පැමිණෙයි ද!" යි සම්පූර්ණයෙන් ම බලාපොරොත්තු සුන් කරගත් මීතියා කීවේ ය. ඔහු ගේ මුහුණ දහඩියෙන් තෙත් වී ය. මේ මිනිහා අවදි කළත් වෙරිමතින් සිටින නිසා කතා නො කළ හැකි යයි ඉතා සන්සුන් ලෙස පෙන්නා දීමට පූජකයාට අවසරාව ලැබිණි. "මහත්මයා පැමිණියේ බොහො ම වැදගත් කටයුත්තකට නිසා එළිවන තෙක් සිටින්න" යි ඔහු කී ය. මීතියා ඊට එකග වූයේ කළකිරුණු සිතින් අත වනමිනි.

"පියතුමාණෙනි, මම මේ ලාම්පුවත් තියාගෙන මෙතැන නතර වෙලා මේ මිනිහා නැගිටින හැටියේ ම කතා කරන්නම්...... කාලය නාස්ති කරන්න මට පුළුවන් කමක් නැහැ" යි පූජකයාට පැවැසූ මීතියා අනතුරු ව නිලධරයා අමතමින් "......මම මේ ඉටිපන් දමට සල්ලි දෙන්නම්. මේ ගෙදර නවාතැන් ගන්නවාටත් සල්ලි දෙන්නම්. මීතියා කරමසෝ හොඳට මතක තියා ගන්න" යි පවසා ආයේත් පූජකයා අමතමින් "දැන් තමුන්නාන්සේ මොකද කරන්නේ? තමුන්නාන්සේ නිදාගන්නේ කොහෙද?" යි විමසුවේ ය.

"මා ගැන කරදර වෙන්න එපා. මම මේ මහත්මයා ගේ අශ්වයා අරගෙන ආපසු යනවා" යි පූජකයා පිළිතුරු දුන්නේ නිලධරයා ගේ අශ්වයා ගැන සඳහන් කරමිනි. "දැන් ඉතින් මම ගිහින් එන්නම්. මහත්මයා ගේ කටයුත්ත සාර්ථක වේවා යි කියා ප්‍රාර්ථනා කරනවා."

මෙ තැන් සිට කළ යුතු දේ ගැන නිගමනයකට බැස ගත් පූජකයා නිලධරයා ගේ අසු පිට නික්ම ගියේ ය. ඔහු ගියේ මේ අපූරු සිද්ධිය ගැන පසු දින, තමා ගේ ආරක්ෂකයා වන පියෝදර් කරමසෝට දන්වා යැවිය යුතු දැයි කල්පනා කරමිනි. ඔහු නොසන්සුන් සිතින් හිස වැනුවේ ය. මේ කරදරයෙන් පැනයාමට ඉඩ ලැබීම ගැන ඔහු ප්‍රීති විය. සමහර විට අවාසනාවන්ත වේලාවක දී පියෝදර් කරමසෝ මේ ගැන අසා, කිපි, තමාට කරන උපකාරය නතර කරන්න පුළුවනි" යි ඔහු කල්පනා කෙළේ ය.

වචනයක් වත් කතා නොකළ නිලධරයා ඇඟ කසමින් ඔහු ගේ කාමරය බලා යන අතරේ 'සුදුසු වේලාව' පැමිණෙන තෙක් මීතියා බන්කුව උඩ හිඳ බලා සිටියේ ය. ඔහු වෙළෙන්දා අවදිවන වේලාව හැඳින්වූයේ 'සුදුසු වේලාව' යන වචනයෙනි. ගන මීදුම් පටලයකින් වැසෙන්නාක් මෙන් මීතියා ගේ ආත්මය අධෛර්යයෙන් වැසී ගියේ ය. ඔහු කල්පනා කෙළේ ය. එහෙත් තීරණයකට බැස ගත නො හැකි විය. ඉටිපන්දම දුබල එළියක් පතුරුවමින් දල්වෙයි. රැහැයියෝ කෑගාති. අධික උෂ්ණයෙන් යුත් ඒ කාමරය තුළ සිටින මීතියාට ඒ නාදය ඉවසිය නොහැකි තරමට ලං වී ඇසෙයි. තාත්තා ගේ මහගෙය පිහිටි වත්තත්, වත්ත පිටිපසින් වැටී ඇති අඩිපාරත්, මහ ගෙට පිවිසෙන දොර ඇරෙන සැටිත්, ගෘසෙන්කා දොර තුළින් ගෙට ඇතුළු වන සැටිත්, හදිසියෙන් ම මනසින් පෙනෙන්නට වූයෙන් මීතියා වහා බන්කුවෙන් නැඟී සිටියේ ය.

“මේක මහ විපත්තියක්” යයි කෝපයෙන් දත් සපමින් පැවසූ මීතියා අනතුරු ව නොකල්පනාවෙන් නැඟිට නිදා සිටින වෙළෙන්දා ළඟට ගොස් ඔහු ගේ මුහුණ දෙස බැලුවේ ය. වෙළෙන්දා පමණට වඩා දිග මුහුණකින් ද, හණ වැනි අක්ඛමරු හිසකෙසින් ද, රතු සිහින් රැවුලකින් ද, යුත් මැදි වියේ වෙසෙන සිහින් ගැමියෙකි. හෙතෙම නිල් කපු කමිසයක් හා කළු පිට කබායක්ද ඇඳ සිටියේය. රිදී ඔරලෝසුවේ දම්වැල කබායේ සාක්කුවෙන් එබී බලන්නාක් මෙන් පෙනේ. මීතියා දැඩි කෝපයෙන් ගැමියා ගේ මුහුණ දෙස බැලුවේ වෙසෙසින් ම ඔහු ගේ අක්ඛමරු හිසකෙස් කිසියම් අප්‍රකට කරුණක් නිසා තමා තුළ දැඩි පිළිකුලක් ඇති කළ හෙයිනි.

ඉතා වැදගත් කටයුතු අත්හැර දමා ආත්ම පරිත්‍යාගයක් කළ මිතියාට හදිසි වැඩ තිබිය දී තමා ගේ දෛවය සම්පූර්ණයෙන් ම රැඳී ඇති මේ මෘගයා දෙස බලා සිටීම ඉවසිය නොහැකි නින්දාවක් වී ය. එහෙත් මේ මිනිහා කිසිවක් සිදු නො වූවාක් මෙන්, වෙනත් ලොවක සිට මිහි බට එකකු මෙන් ගොරවමින් නිදයි.

“අහෝ දෛවය කරන කවටකමක මහත”යි තමාට ම කියා ගත් මීතියා කෝපයෙන් ආයේත් වෙළෙන්දා අවදි කිරීමට වෑයම් කෙළේ ය. ඔහු වෙළෙන්දා නැඟිට්ටෙව්වේ ය, ඇද්දේය, තල්ලු කෙළේ ය, අන්තිමේ දී පහර දුන්නේ ය. මෙසේ මිනිත්තු පහක් පමණ වේලා නිෂ්ප්‍රයෝජන ප්‍රයත්නයක යෙදුණ මීතියා අන්තිමේ දී බලාපොරොත්තු සුන් ව, අසරණ ව, ආපසු ගොස් බන්කුව උඩ හිඳ ගත්තේ ය.

"මා කළේ කොතරම් ලොකු මෝඩකමක් ද?"යි කියමින් මීතියා කෑගැ වේ ය. "කොතරම් ලොකු නින්දුවක්ද?"යි ඔහු කිසියම් කරුණක් නිසා යළි කී ය. ඔහු ගේ හිස කකියන්නට වි ය. "මේ වැඩේ අත් හැර දමා ආපසු ගිය යුතු දැයි?"යි ඔහු කල්පනා කෙළේ ය. "නැහැ, මේ වැඩේ ඉවරයක් කරගන්න මම හෙට එළිවනකන් ඉන්නවා. නැතිනම් මා මොනවට ද මෙහාට ආවේ? දැන් ආපසු යන්න ක්‍රමයකුත් නැහැ. මා කළේ කොතරම් ලොකු මෝඩකමක්ද?"

ඔහු ගේ හිසරුදාව වැඩි විය. නොසෙල්වී හිඳ සිටි ඔහුට නොකල්පනාවෙන් ම කිරා වැටී අන්තිමේ දී නින්ද ගියේ ය. ඔහු පැය දෙකක් හෝ ඊට වැඩි වේලාවක් නිදාගන්නට ඇත. ඔහු අවදි වූයේ දරුණු හිසරුදාවක් නිසා ය. හිසරුදාව ඉවසාගත නොහැකි වූ තැන ඔහු කෑගැවේ ය. ඔහු ගේ නළල දෙ පැත්තට මිටියකින් ගසන්නාක් මෙන් දැනුණේය. හිස් මුදුන කකියන්නට විය. සම්පූර්ණයෙන් ම අවදි වී තමාට කුමක් සිදු වූයේ දැයි සිතා බැලීමට ඔහුට බොහෝ වේලා ගත විය.

ගිනිඋදුනෙන් නැගෙන දුමෙන් කාමරය පිරී තිබෙන බවත් තමාට හුස්ම ගත නො හැකි ව මියයන්නට පුළුවන් බවත් අන්තිමේ දී ඔහුට කල්පනා විය. සුරාවෙන් මත් වී සිටින ගෑමියා තවමත් ගොරවමින් නිදයි. ඉටිපන්දම නිවී යාමට කිට්ටු ය. කෑගසන්නට පටන් ගත් මීතියා නිලධරයා ගේ කාමරය දෙසට වැනෙමින් දිවගියේ ය. නිලධරයා එක්වර ම අවදි විය. එහෙත් මීතියා ගේ බලවත් පුදුමයට හා කෝපයට නිලධරයා කාමරයේ දුම පිරී තිබෙන බව පිළිගත්තේ වැඩි සැලකිල්ලකින් නො වේ. එහෙත් ඔහු කාමරය බැලීමට ආවේ ය.

"මිනිහා මැරිලා ද? මිනිහා මැරිල ද? මා මොනවා කරන්නද?"යි කියමින් මීතියා කෑගැවේ උමතු වූවකු මෙනි.

ඔවුහු වහා දොර කවුළු සමග දුම්නළය ද ඇර දැමූ හ. ඉස්තෝප්පුවේ සිට වතුර බාල්දියක් ගෙනා මීතියා පළමු ව තමා ගේ හිස තෙමා අනතුරු ව රෙදි කඩක් වතුරින් පොඟා වෙලෙන්ද ගේ හිස උඩ එළුවේ ය. මේ කලබලයට වැඩි සැලැකිල්ලක් නොදැක්වූ නිලධරයා කවුළුව අරිමින් "දැන් සේරම හරි" යි නොඉවසිල්ලෙන් කියා ලන්තෑරුම මීතියාට දී නිදගැනීම පිණිස ආපසු ඔහු ගේ කාමරයට ගියේ ය. වෙලෙන්ද ගේ හිස තෙමමින් පැය භාගයක් පමණ වේලා නිකරුණේ වෙහෙසුණු මීතියා එළිවන තෙක් නො නිද සිටීමට අදහස් කෙළේ ය. එහෙත් කො තරම්

වෙහෙස වී සිටියේ ද කියතොත්, මදක් විවේක ගැනීම පිණිස බන්කුව උඩ හිඳගත් හෙතෙම නොකල්පනාවෙන් ම බන්කුව උඩ දිග ඇදී මලාක් මෙන් නිදා ගත්තේ ය.

ඔහු අවදිවන විට හොඳට ම දවල් වී තිබිණි. වේලාව දවල් නවයට පමණ ඇත. කාමරයේ කුඩා කවුළු තුළින් හිරු එළිය වැටී බැබලෙයි. කබාය ඇඳගත් බොකුටු හිස කෙසින් යුත්වෙලෙන්ද බන්කුව උඩ හිඳ සිටියේ ය. ඔහු ඉදිරිපිට තේවතුර බොයිලේ-රුවක් හා වොඩ්කා බෝතලයක් ද තිබිණි. පෙරදින ගෙනෙන ලද බෝතලය අඩකට වඩා හිස් විය. වහා නැඟී සිටි මීතියා යළි වෙලෙන්ද වෙරි වී සිටින බව දුටුවේ ය. ඔහු මොහොතක් පමණ වේලා වෙලෙන්ද දෙස නෙත් විදහා බලා සිටියේ ය. වෙලෙන්ද ද මීතියා දෙස නිහඬ ව හොර ඇසින් බැලුවේ ය. ඔහු ගේ ඒ බැල්මේ නින්ද ගෙන දෙන සන්සුන් කමක් සමග මානාධික කමක් ද තිබේ යැයි මීතියා සිතුවේ ය. ඔහු වහා වෙලෙන්ද ලඟට ගියේ ය.

"මට සමාවන්න,......................අනෙක් කාමරයේ ඉන්න මහත්මයා මා ගැන කියන්න ඇති. මම ලෙප්ටිනන් මීතියා කරමසෝ, මිහලූ කරමසෝ මගේ තාත්තා. මහත්මයා ලී ගන්නේ මගේ තාත්තා ගෙන්."

"මහ බොරුකාරයෙක්" යයි වෙලෙන්ද සෙමෙන්, එහෙත් ආත්ම විශ්වාසයෙන් යුතු ව කී ය.

"ඇයි මට බොරු කාරයෙක් යයි කියන්නේ? ඇයි මගේ තාත්තා අඳුනන්නේ නැද්ද?"

"මම ඔය කරමසෝලා කිසි ම කෙනෙක් අඳුනන්නේ නැහැ"යි වෙලෙන්ද නොසැලැකිල්ලෙන් කී ය.

"ඇයි අපේ තාත්තා ගෙන් ලී ගන්න ඇහැව්වා නේද? හොඳට කල්පනා කරලා බලන්න. මා මෙහාට එක්ක ගෙන ආවේ පැවල් පියතුමායි. මහත්මයා සම්සෝනෝට ලියුමක් ලිව්වා නේද? මං මහත්මයා හමුවෙන්න මෙහාට එව්වේ සම්සෝනෝ මෙසේ පැවැසූ මීතියා අමාරුවෙන් හුස්ම ගත්තේ ය.

"මහත්මයා කියන්නේ බොරුවක්"යයි ගැමියා ආයේත් අපරීක්ෂාවෙන් කීවේ ය. මීතියා ගේ දෙපා සීතල විය.

"මා කරන්නේ විහිළුවක් නොවන බව අනුකම්පාවෙන් සලකන්න. සමහරවිට මහත්මයා වෙරිමතින් කතා කරනවා ඇති. නැතිනම් මහත්මයා ගේ කතාව මට නොතේරෙනවා වෙන්න ඇති."

"මහත්මයා ගෙවල් අලුත්වැඩියා කරන කෙනෙක් ද?"

"පිංසිද්ද වෙයි මා කියන දෙය අහන්න. මම මීතියා කරමසෝ. මම ආවේ ගනුදෙනුවකටයි. ඒක බොහෝ ම ලාබ තියෙන ගනුදෙනුවක්. ලී ගැන ගනුදෙනුවක්."

ගැමියා රැවුල අත ගෑවේ තමා වැදගතකු බව පෙන්නීමට ය.

"නැහැ, මහත්මයා ලී කොන්ත්‍රාතුවක් ගත්ත මගෝඩිකාරයෙක්, තක්කඩියෙක්."

"මහත්මයාට වැරදිලා" යි මීතියා අත එනා කීවේ සුන් වූ බලාපොරොත්තුවලින් යුතු ව ය. තවමත් රැවුල අතගාමින් සිටි ගැමියා හදිසියෙන් ම මීතියා දෙස කපටි බැල්මකින් බලා මෙසේ විමසුවේ ය.

"හොරකම් කරන්න ඉඩ දෙන නීතිය මට පෙන්නපන් ඇහුණද? උඹ මහ තක්කඩියෙක්, මා කියාපු දෙය තේරුණා නේ ද?"

මීතියා බලවත් කෝපයෙන් පසුබා සිටියේ ය. යම් කිසි අවියකින් තම හිසට ගසන්නාක් මෙන් දැනුණු බව ඔහු පසු ව කීවේ ය. "හදිසියෙන් ම මගේ සිත ආලෝක වුණා. මට කාරණාව සම්පූර්ණයෙන් ම අවබෝධ වුණා." මීතියා බිරාන්ත විය. හොඳ සිහි නුවණින් කටයුතු කරන තමා මෙ තරම් මෝඩකමකට අසුවුණේ කෙසේ ද? මේ ස්ථානයට පැමිණ මේ මිනිහා ගේ හිස තෙමමින් පැය විසිහතරක් නිකරුණේ ගත කළා නො වේ ද?

"මේ මිනිහට වෙරි, හොඳට ම වෙරි, සිහිය නැහැ. මිනිහා තව සුමානයක් ම බොන්න පුළුවනි. මෙ තැන සිටීමෙන් ඇති යහපත කුමක් ද? යම් අදහසක් ඇති ව සම්සෝනෝ මා මෙ තැනට එව්වා නම් මොනවා කරන්න ද? මා නැති අතර ගෘසෙන්කා....................අනේ දෙයියනේ මා මොකක් ද කළ මේ මෝඩකම?"

ගැමියා මීතියා දෙස බලා සිනාසුණේ ය. වෙන වේලාවක නම් මීතියා කෝපයෙන් මේ මෝඩයා මරා දමනවා ඒකාන්ත ය. එහෙත් දැන් තමා දරුවකු මෙන් දුබල වූ බව ඔහුට දැනේ.

ඔහු කරබා ගෙන බන්කුව ළඟට ගොස් කබාය දමා ගෙන දෙවීට බැස්සේ ය. අනෙක් කාමරයේ තිලධරයා නොසිටියේ ය. රාත්‍රි ලැගුම්වලටත්, ඉටිපන්දමටත්, තමා ගෙන් පැමිණි හිරිහැරවලටත් ගනමනාව වශයෙන් මීතියා කොපෙක් පනහක්, ගෙන මේසය උඩ තැබුවේ ය. අවට වනාන්තරය හැර ඔහුට වෙන කිසිවක් නො පෙනේ. වමට යා යුතු ද? දකුණට යා යුතු ද?යි නොදත් හෙතෙම හිස හැරුණු අතේ ගියේ ය. පෙර දින සවස පූජකයා සමග ඉක්මනින් පැමිණි නිසා ඔහුට පාර මතක නැත. ඔහු ගේ සිතේ කිසිවකු ගෙන් පළිගැනුමේ අදහසක් ද නැත. වෙනෙකක් තබා තමා මුලා කළ සම්සෝනෝ ගෙන් වත් පළිගැනීමට අදහසක් නැත. තෝන්තු වූ මීතියා කැලය මැදින් දිවෙන අඩි පාරක් දිගේ ගමන් කෙළේ තමා කො තැන යන්නේ දැයි නො දන ය. ඔහු ගතින් සිතින් කො තරම් දුබල වී සිටියේ ද කියතොත් ළමයකුට වුව ද පහර දී බිම හෙළිය හැකි ය. කෙසේ වෙතත් මීතියා වනාන්තරයෙන් එගොඩ වී ය. එ තැන් සිට, මැත දී ගොයම් කපන ලද කුඹුරු යායක් ඈතට පෙනෙන තෙක් මානයේ විහිදී ගියේ ය.

"කො තරම් ලොකු පසුතැවිල්ලක් ද? හැම තැන ම පෙනෙන්නට තියෙන්නේ මරණයයි" මීතියා යන ගමන් තමාට ම කියා ගත්තේ ය.

කුලි කරත්තයක නැග යන මිතුරු වෙළෙන්දකු හමුවීමෙන් මීතියා යන්තම් බේරිණි. කරත්තය පසු කරන අතරේ මීතියා වෙළෙන්ද ගෙන් යන මං විමසුවේ ය. වෙළෙන්ද වොලෝවාවට යමින් සිටියේ ය. මීතියා කරත්තයට නැග ගත්තේ වෙළෙන්ද සමග ටික වේලාවක් කතා කිරීමෙන් අනතුරු ව ය. පැය තුන-කට පසු ව ඔවුහු වොලෝවාවට පැමිණියෝ ය. වොලෝවාවට පැමිණි වහා ම, නගරයට යාමට වාහනයක් සොයා දෙන ලෙස මීතියා තානායමින් ඉල්ලා සිටියේ ය. අනතුරු ව තමාට කුස ගින්නක් ඇති වූ බව ඔහුට හදිසියෙන් ම දැනිණි. ගමනට අසුන් පිළියෙළ කරන අතරේ මීතියාට බිත්තර බැද කෑම සූදානම් කරදෙන ලදි. එක්වර ම බිත්තර අවසන් කළ මීතියා අනතුරුව ලොකු පාන් කෑල්ලක් සමග ලින්ගුස් කරලක් හා වොඩ්කා වීදුරු තුනක් ම ගිල දැම්මේ ය කුස පිරීමෙන් පසු ව ඔහු ගේ ස්වභාවයත්, සිතත්, මදක් සැහැල්ලු විය. නගරය බලා වහා රථය පදවන ලෙස රියැදුරාට නියම කළ මීතියා, ඒ සාපලත් රූබල් තුන්දහ සවස් වීමට පෙර සොයා ගැනීමට ආයේත් වෙ-නස් කළ නො හැකි වැඩ පිළිවෙළක් සකස් කරගත්තේ ය. "ඉතා තුච්ඡ වූ රූබල් තුන් දහක් නිසා මිනිසකු ගේ ජීවිතය

විනාශ වීම සිතිය හැකි දෙයක් ද?'' යි පිළිකුලින් පැවැසූ මීතියා "අද කොහොම හරි මේ ගැන තීරණයකට බහිනවා'' යි තමාට ම කියා ගත්තේ ය. ඔහු ගේ සිතින් ඉවත් නො වූ ගෲසෙන්කා හා ඇයට කුමක් සිදු වූයේ ද යන අදහස නිසා නො වේ නම් ඔහු නැවැත ප්‍රීතියෙන් සිපිනු ඇත...........තියුණු අවියකින් අනින්නාක් මෙන් හැම මොහොතක් පාසා ම ගෲසෙන්කා පිළිබඳ අදහස ඔහු ගේ සිතට වද දෙන්නට විය.

අන්තිමේ දී නගරයට පැමිණි වහා ම මීතියා ගෲසෙන්කා සොයා ගියේ ය.

තුන් වන පරිච්ඡේදය

රත්රන් ආකර

මහත් භීතියෙන් ගෲසෙන්කා රැකිටින්ට විස්තර කළේ මීතියා පැමිණි මේ ගමන ගැන ය. මීතියා පැමිණෙන විට ගෲසෙන්කා 'පණිවිඩය' බලාපොරොත්තු ව සිටියා ය. එ දිනත් ඊට පෙර දිනත් මීතියා ඇය බැලීමට නො පැමිණීම ඇයට මහත් භැනැසීමක් විය. "අනේ දෙයියනේ, මා යන තෙක් මීතියාට එන්න නො ලැබේ වා'' යි ඈ ප්‍රාර්ථනා කළා ය. මීතියා ගෙට කඩා වැදුණේ ඒ මොහොතේ දී ය. ඊට ඉක්බිති ව සිදු වූ දේ අපි දනිමු. මීතියා ගෙන් නිදහස් වීමට අදහස් කළ ගෲසෙන්කා තමා සමග සම්සෝනෝව් ගේ ගෙදරට යාමට මීතියාට කතා කළා ය. "ගණන් හිලව් බේරීම පිණිස'' තමා කෙසේ හෝ යා යුතු යැයි ඈ කියා සිටියා ය. මීතියා වහා ගෲසෙන්කා සමග වෙලෙන්ද ගේ නිවෙස දක්වා ගියේ ය. ගෲසෙන්කා ගේට්ටුව ළඟ දී මීතියා ගෙන් වෙන් වූයේ ආපසු තමා ගෙදර කැඳවාගෙන යාම පිණිස රෑ දොළහට යළි පැමිණෙන බවට මීතියා ගිවිසගත් පසු ව ය. ගෲසෙන්කා ගේ වැඩ පිළිවෙළ ගැන මීතියා මහත් සතුටට පත් විය. ගෲසෙන්කා සම්සෝනෝව්ගේ ගෙදර සිටින්නේ

නම් ඈ තාත්තා ළඟට නො යන්නී ය. "ඈ මට කරන්නේ බොරුවක් නො වේ නම් හොඳයි" මිතියා තමාට ම කියා ගත්තේ ය. තමාට පෙනෙන හැටියට ඈ බොරුවක් නොකියන්නේ යයි ඔහු සිතුවේ ය.

තමා පෙම්බැඳගත් තරුණිය නැති අතරේ ඇයට සිදුවන දෙය, ඈ තමාට ද්‍රෝහි වන සැටි ගැන එක් වර ම නොයෙක් විදියේ භයානක සිතිවිලි මවා ගන්නා වර්ගයේ ඊර්ෂ්‍යාවෙන් පිරී මිනිසෙකි මිතියා, සංවේගයට පැමිණි විට, සිත පැරුණ විට, ඇගේ වංක කම ගැන සැක ඇති වූ විට, ඔහු ඇය සොයා දුවයි. එවිට සුන්දර සිනාවෙන් ආලෝක වී ආදරයෙන් පිරුණු ඇගේ මුහුණ දුටු හැටියේ ම ඔහු තුළ මහත් ප්‍රබෝධයක් ඇති වෙයි. මෙතෙක් වේලා පැවැති සැකය අතුරුදහන් වෙයි. අනතුරු ව හෙතෙම ප්‍රීතියෙන් පිරි ලැජ්ජාවෙන් යුතු ව තමා ගේ සිතේ පැවැති ඊර්ෂ්‍යාව ගැන තමාට ම අවමන් කරගනියි.

සම්සෝනෝ ගේ ගෙදරට ගෲසෙන්කා ඇරලූ මිතියා අංපසු වහා ගෙදර පැමිණියේ ය. එදින අවසන් කළ යුතු වැඩ මහත් රාශියක් තිබිණි. කෙසේ වෙතත් ඔහු ගේ සිතේ පැවැති විශාල බරක් ඉවත් වී සිත සැහැල්ලු විය.

"දැන් ඉතින් ඉක්මනට ගිහින් පැවල් ගෙන් දැනගන්න ඕනෑ ඊයේ රෑ මා නැති අතර මොනවක්වත් වුණා ද? ගෲසෙන්කා තාත්තා ළඟට ගියා ද? කියා යන අදහස මිතියා ගේ සිතේ පෑවී ගියේ ය.

අංපසු ගෙදර පැමිණීමට කලින් ආයේත් ඔහු ගේ නොසන්සුන් හදවතට ඊර්ෂ්‍යාව ආරූඪ වී ය.

ඊර්ෂ්‍යාව! " ඔතැලෝ ඊර්ෂ්‍යාවෙන් යුත් පුද්ගලයෙක් නො වේ. හෙතෙම දැඩි විශ්වාසයෙන් යුත් පුද්ගලයෙකි"යි පුෂ්කින් කීවේ ය. අපේ ශ්‍රේෂ්ඨ කවියා ගේ ගැඹුරු ඥානය පෙන්වීමට මේ ප්‍රකාශය ප්‍රමාණවත් ය. ඔතැලෝ ගේ ආත්මය විනාශ වී අදහස් අවුල් වූයේ මතය විනාශ වූ හෙයිනි. එහෙත් ඔතැලෝ සැඟවී සිට ඔත්තු බැලුවේ නැත. ඔහු තුළ දැඩි විශ්වාසයක් තිබිණි. ඔහු තුළ ඊර්ෂ්‍යාව ඇති කොට උසිගන්වන ලදි, ඉතා අමාරුවෙන් මුළා කරන ලදි. නියම ඊර්ෂ්‍යාවෙන් පිරි මිනිහා එවැන්නෙක් නො වේ. ඊර්ෂ්‍යාවෙන් පිරි මිනිහකුට, හොඳ නරක විමසා ගැනීමේ බුද්ධියෙන් තොර ව පත් විය හැකි ලැජ්ජාව හා පහත් තත්ත්වය ගැන කෙනකුට සිතාගැනීම පවා අපහසු දෙයකි,

එහෙත් ඊර්ෂ්‍යාවෙන් පිරි හැම මිනිහා ම නීච නැත. එසේ ම ආත්ම පරිත්‍යාගයෙන්, නිර්මල ප්‍රේමයෙන් හා උදාර හැඟීම්වලින් යුත් මිනිහකු මේසය යට සැඟවී බලන්නට පිළිවන. නීචයන්ට අත්ලස් දෙන්නට පිළිවන. ඔත්තු බැලීම පිණිස අගු පිල්වල ලගිමින්, අනුන් ගේ කතා බහ අසා සිටීම වැනි අධම ක්‍රියා කොට පුරුදු ඇත්තකු වන්නට ද පිළිවන.

ද්‍රෝහී කම් කිරීම සඳහා සිත සකස් කර ගැනීමට ඔතැලෝ සමත් විය. දරුවකු ගේ ආත්මය මෙන් ඔහු ගේ ආත්මය ද්වේෂයෙන් නිදහස් විය. අහිංසක විය. සමාන්‍යයෙන් ඊර්ෂ්‍යාවෙන් පිරි මිනිස්සු එසේ නො වෙති. ඔවුන්ට කල්පනා කළ නොහැකි ය. අසවල් දෙයට කමාව දිය යුතු යැයි තීරණය කළ නො හැකි ය. එහෙත් ඉතා ඉක්මනින් ම කමාව දීමට ඔවුහු නිතර සූදානම්ය හැම ගැහැනියක් ම ඒ බව දනියි. ඊර්ෂ්‍යාවෙන් පිරි මිනිහාට අපූරු ඉක්මනින් කමාව දිය හැකි ය. (එහෙත් කමාව දෙන්නේ කලහ කිරීමෙන් පසු ව ය.) සැකයෙන් තොර ව ඔප්පු කරන ලද ද්‍රෝහීකමට පවා කමාව දිය හැකි ය. තම පෙම්වතිය තවෙකකු සමඟ සිප වැලඳ ගත්තා සැටි ඔහු සියැසින් ම දකියි. එසේ සිප වැලඳ ගත්තේ 'අන්තිම වරට' බව කෙසේ හෝ ඔහුට පිළිගැන්විය හැකිනම්, ඒ සමඟ ඔහු ගේ විරුද්ධ වාදියා අතුරුදහන් වන්නේ නම්, නැති නම් ලෝකයේ කෙළවරට යන්නේ නම්, ඒත් නැතිනම්, විරුද්ධවාදියාට පැමිණිය නො හැකි තැනකට තමාට ඇය ගෙන ගිය හැකි බව ඔප්පු කළ හැකි නම්, ඔහු ඇයට කමාව දෙයි. එහෙත් ඒ කමාව පැයකට වැඩි කල් නො පවතියි. පසු දින විරුද්ධවාදියා නො පැමිණියත් ඔහු වෙනත් විරුද්ධවාදියකු සිතින් මවා ගෙන ඔහුට ඊර්ෂ්‍යා කරයි. මෙ තරම් ආරක්ෂා කිරීමට ආලයේ කුමක් තිබේ ද? මෙ තරම් දැඩි ව ආරක්ෂා කිරීමට ආලයේ කුමන වටිනා කමක් තිබේදැයි, කෙනෙක් සිතන්නට පිළිවන. එහෙත් එය ඊර්ෂ්‍යාවෙන් පිරි සිත් ඇති අයට කිසි කලෙක අවබෝධ නො කළ හැකි ය. ඔවුන් අතරේ උත්තමයෝ ද සිටිති.මේ උත්තමයන් අල්මාරියක් පිටිපස සැඟැවී, දෙදෙනකු අතරේ කෑරෙන කතා බහට සවන් දෙමින් හෝ ඔත්තු බලමින් හෝ සිටින මොහොතේ දී, ඔවුන් ගේ ආධ්‍යාත්මික චිත්තයේ වේදනාවක් ඇති නො වී ය. පුදුමයට කරුණකි. කෙසේ වෙතත් තමන් ඉතා නින්දිත දෙයක් කළ බව ඔවුන්ට ඔවුන් ගේ උතුම් හදවත්වලින් පසක් කළ හැකි ය.

ගෲසෙන්කා දුටු පමණින් මෙතෙක් වේලා මිතියා ගේ සිතේ පැවැති සැකය හා ඊර්ෂ්‍යාව ද අතුරුදහන් වී ය. මොහොතකට

පමණ දැඩි විශ්වාසයක් ඇති විය. ත්‍යාගවන්ත විය. තමා ගේ නපුරු කම් ගැන තමාට ම දෙස් කියාගත්තේ ය. එසින් සනාථ වූ එක ම දෙය නම්, ඔහු මේ තරුණියට දක්වන ආලයේ ඔහුට පවා සිතා ගත නොහැකි තරම් උතුම් ගුණයක් තිබෙන බව ය. එය අලෝෂා විසින් විස්තර කරන ලද නාරි දේහය හෝ කාමා-ස්වාදය හෝ නිසා ඇති වූවක් නො වේ. එහෙත් ගෘසෙන්කා ගිය වහා ම මීතියා ආයේත් ඇගේ නිච කම් හා පහත් කම් ගැන සැක කිරීමට පටන් ගත්තේ ය. මෙසේ සැක කිරීම නිසා ඔහු ගේ සිතේ කිසි ම වේදනාවක් ඇති නො වී ය.

ආයේත් වරක් ඔහු ගේ සිත සැකයෙන් පිරෙන්නට විය. කෙසේ වෙතත් ඔහු පලමු ව කළ යුත්තේ සුළු මුදලක් තාවකා-ලික ව ණයට ගැනීම ය. වෙළෙන්ද සොයා ගිය ගමනට අතේ තිබුණු අන්තිම තඹය දක්වා වියදම් විය. අතේ සතේ නැති ව කිසි ම දෙයක් කළ නොහැකි බව අපි දනිමු. කරත්තයෙන් ආපසු එන ගමන මහ මග දී ණයට මුදල් ගත හැකි තැනක් ගැන ඔහු කල්පනා කෙළේ ය. ද්වන්දව යුද්ධවල දී පාවිච්චියට ගන්නා කදිම පිස්තෝල දෙකක් ඔහු ළඟ තිබිණි. තමා සතු හැම දෙයකට ම වඩා මේ පිස්තෝල අගය කළ මීතියා මේ වේලාව වන තෙක් ඒවා උගස් තබා මුදල් ගැනීමට අදහස් නො කෙළේ ය.

මීට ටික කලකට පෙර, අගනුවර තැබෑරුමක දී, මීතියාට සිවිල් සේවකයෙක් හැඳින ගන්නට ලැබිණි. මේ ධනවත් අවිවා-හක තරුණයා පිස්තෝලවලට ලොකු ආශාවක් දක්වන බව මීතියා දැන සිටියේ ය. හෙතෙම පිස්තෝල හා කඩු කිනිසි ගෙදර බිත්තියේ සවි කොට තිතවතුන් ට පෙන්නයි. මෙසේ එකතු කරනලද අවි ආයුධ ගැන උදම් වූ හෙතෙම පිස්තෝල ගැන විශේෂඥයෙක් විය. වැඩි දුර කල්පනා නොකළ මීතියා පිස්තෝල දෙක තරුණයා වෙත ගෙන ගොස් රූබල් දහයකට උගස් තැබීමට කැමැත්ත පළ කෙළේ ය. ප්‍රීතියට පත් තරුණයා පිස්තෝල දෙක තමාට විකුණන ලෙස මීතියාට කීවේ ය. පිස්-තෝල විකිණීමට මීතියා කැමැති නො වී ය. තරුණයා රූබල් දහයක් දුන්නේ කිසි ම කරුණක් නිසා හෝ පොලී ගැනීමට විරුද්ධ වෙමිනි. ඔවුන් දෙදෙනා එකිනෙකා ගෙන් වෙන් වූයේ දැඩි මිත්‍ර කමක් ඇති කරගැනීමෙන් පසු ව ය.

මීතියා වහා මහ ගෙයි පිටිපසින් වැටි ඇති අඩිපාර දිගේ පියා ගේ ගෙදරට ගොස් හැකි තරම ඉක්මනින් පැවල් හමුවීම

පිණිස ලතාමණ්ඩපයට ගියේ ය. මා මෙහි ලං සඳහන් කරන එක්තරා සිද්ධියකට පැය තුනකට හෝ හතරකට හෝ කලින් මිතියා ළඟ තඹසක්වත් නොතිබුණු බවත්, ඔහු බොහෝ අගය කළ උතුම් වස්තුවක් රූබල් දහයකට උගස් තැබූ බවත්, එහෙත් පැය තුන කට පසුව ඔහු ළඟ රූබල් දහස් ගණනක් තිබුණු බවත්, මෙසේ ඔප්පු කරන ලදි..........මට සමාවන්න, සිදු වූ දෑ කල්තියා කීම හොඳ නැත. මහ ගෙට නුදුරේ වෙසෙන මායා නැමැති ගැහැනියක ගෙන් පැවල් අසනීප වූ බව මිතියා දැනගත්තේ ය. මේ ආරන්චියෙන් ඔහු නොසන්සුන් විය. පැවල් මහ ගෙදර බිම කැඩැන්ගුවේ දී මීමැස්මොරයා වැලදී ඇද වැටුණු බවත්, ඒ ගැන තාත්තා කලබල වී දෙස්තර ගෙන්නපු සැටිත්, මිතියාට දැනගන්නට ලැබිණි. එ දින උදේ ඉවාන් මොස්කව් නුවරට ගිය බව මිතියා ඇසුවේ ඒ ගැන ලොකු සැලකිල්ලක් දක්වමිනි.

"එසේ නම් මා යන්නට පෙර ඉවාන් චොලෝවාච පසු කර යන්න ඇති"යි මිතියා කල්පනා කෙළේ ය. එහෙත් පැවල්ගේ අසනීපය ගැන අසා ඔහු සංවේගයට පත් විය. "දැන් ඉතින් මොකද කරන්නේ? ගෲසෙන්කා තාත්තා ළඟට යනව ද කියා බලන්නේ කවුද? ගෲසෙන්කා තාත්තා ළඟට ගියොත් මට පණිවිඩය කියන්නේ කවු ද?"යි මිතියා කල්පනා කෙළේ ය. පෙර දින රාත්‍රියේ දී කිසිවක් සිදු වූයේ දැයි මිතියා මායා ගෙන් ඇසුවේ මහත් උනන්දුවක් දක්වමිනි. මිතියා දැනගැනීමට වෑයම් කරන්නේ කුමක් දැයි දැනගත් ඉතිරිය පෙර දින රූ කිසිවක් සිදු නොවූ බව මිතියා ගේ බිය සැක සම්පූර්ණයෙන් ම දුරු කරමින් කීවා ය. ඊයේ රූ මෙහි කිසිවක් සිදු නො වී ය. ඉවාන් තාත්තා සමග ගෙදර සිටියේ ය. මිතියා කල්පනා කරන්නට විය. අද රට මුර කරන්න සිදු වෙයි. එහෙත් මුර කරන්නේ කො තැන ද? මහ ගෙදර ද? නැති නම්, සම්සෝනෝ ගේ ගේට්ටුව ද? දෙ පොළ ම මුර කිරීමට මිතියා තීරණය කෙළේ ය. ඒ අතරේ තමා ගෙදර එන විට යොදාගත් වැඩ පිළිවෙළ ද ක්‍රියාත්මක කළ යුතු ය. ඒ වැඩ පිළිවෙළ සාර්ථක වෙනවාට කිසි ම සැකයක් නැත. එසේ නම් එය පමා නො වී ක්‍රියාත්මක කළ යුතු ය. ඒ සඳහා පැයක් මිඩංගු කිරීමට මිතියා අදහස් කෙළේ ය. "පැයකින් මට හැම දෙයක් ම දැනගන්න පුළුවනි. බේරුම් කරගන්න පුළුවනි. ඊට පස්සේ ඉස්සෙල්ලා ම සම්සෝනෝ ගේ ගෙදරට ගිහින් ගෲසෙන්කා ඉන්නවා ද කියා බලා, මහ ගෙදරට ගොස් රූ එකොළහ වන තෙක් සිටිය යුතුයි. ඊට පස්සේ ගෲසෙන්කා කැඳවාගෙන ඒමට ආයේත් සම්සෝනෝ ගේ ගෙදරට යා යුතු යි." මිතියා මෙසේ තීරණය කරගත්තේ ය.

වහා ගෙදර ගිය ඔහු මුහුණ සෝදා, හිස පීරා, ඇඳුම් මාරු කොට, හොලාකෝ මැතිනිය හමුවීම පිණිස ගියේ ය. අහෝ ඛේදයකි! මීතියා ඇය ගැන බලාපොරොත්තු ඇති කරගත්තේ ය. මේ කුලකත ගෙන් රූබල් තුන් දහක් අතමාරුවට ගැනීමට මීතියා අදහස් කෙළේ ය. එමතු ද නො ව, මෙ තරම් ලොකු මුදලක් ණයට දීමට ඈ අසතුටු නොවන බව ද ඔහුට හදිසියෙන් ම ඒත්තු ගියේ ය. ඇය ගෙන් මුදල් ණයට ගත හැකි බව එ තරම් විශ්වාස නම්, තමා නො හඳුනන, තමා ගේ පන්තියට අයත් නැති, තමා කතා කිරීමට නොදන්නා, සම්සෝනෝ ළඟට නො ගොස් පළමු ව මේ කුලකත ළඟට නො ගියේ මන්දැයි ඔහුට කල්පනා වන්නට ඇත.

මෙහි ඇත්ත නම් මීතියා හොලාකෝ මැතිනිය වඩා හොඳට ඇඳින ගෙන නොසිටීම ය. පසු ගිය මාසයේ දී මීතියා ඇය එක් වරක් වත් නොදුටුවේ ය. ඈ තමා තුරුස්නා බව ද ඔහු දැන සිටියේය. මුල සිට ම ඈ මීතියා සමඟ අමනාපයෙන් සිටියේ ඔහු කැතිරිනා සමඟ විවාහ ගිවිස ගෙන සිටි නිසායි. කැතිරිනා මීතියා අත් හැර දමා විනීත ගතිගුණවලින් යුත්, උගත්, හිස්ට, දකුම්කලු තරුණයකු වූ ඉවාන් සමඟ විවාහ වෙතියි යන කතාව හදිසි යෙන් ම කිසියම් හේතුවක් නිසා හොලාකෝ මැතිනිය ගේ සිතේ පහළ විය. මීතියා ගේ ගති ගුණ ඈ පිළිකුල් කළා ය. මීතියා ඇය ගැන සඳහන් කොට සිතා පුණා පමණක් නොව ප්‍රකෘති ගතියෙන් සිටින විට ඇය ඉතා ප්‍රාණවත් ස්ත්‍රියක බව ද කීවේ ය. "හොලාකෝ මැතිනිය ඔයතරම් සැලකිල්ලක් දක්ව නවා නම් මම කැතිරිනා සමඟ විවාහ වෙන්නේ නැහැ. (ඈ ඒ ගැන සැබැවින් ම උමතු වෙන් සිටින බව මීතියා දැන සිටියේ ය. සඳහට ම කැතිරිනා අත හැර යාමට හැකි වන ලෙස ඈ දැන් මට රූබල් තුන් දහක් නො දී සිටීවි ද?" යන කදිම අදහස එ දින උදේ කරත්තයෙන් එන අතරේ මීතියා ගේ සිතේ පහළ විය. "දූෂණය වූ මේ සමාජ කාන්තාවන් කුමන දෙයක් ගැන හෝ අදහස් කළොත් ඒ හිතුවක්කාර අදහස මුදුන් පමුණුවා ගැනීමට ඕනෑ ම දෙයක් කරනවා. ඒ වගේ ම හොලාකෝ මැතිනිය බොහොම පොහොසත්"යයි මීතියා තමා සමඟ තර්ක කෙළේ ය.

ඔහු ගේ මේ 'වැඩ පිළිවෙළ ද' මීට පෙර පැවැති වැඩ පිළිවෙළට සමාන විය. එය මව ගෙන් ලැබුණු වැමැස්තියාව නමැති ගමෙන් තමා සතු අයිතිය පවරා දීම විය. එහෙත් පෙර දින සම්සෝනෝට කළ යෝජනාව මෙන් මුදල් ඉල්ලා ගැනීමේ අදහසක් මෙහි නො වී ය. මේ කාන්තාව මුලා කොට රූබල් හය හත් දහක් වංචාවෙන් ගැනීමට ඔහු අදහස් නො කෙළේ ය. ගම් මානය ඇයට පවරා දීම ඇගෙන් ණයට ගන්නා මුදලට තබන ඇපයක් වැන්න. මේ අදහස් සිතේ හැඬගැසෙනවාත් සමඟ ම

ඔහු ගේ ප්‍රීතිය ද වැඩි විය. හදිසි විනිශ්චයකට බැසගත් හැම විට ම මීතියා තුළ දැඩි සොම්නසක් ඇති වෙයි. සිතේ හටගන්නා හැම අලුත් අදහසකට ම ඔහු මහත් ආශාවෙන් අවනත වෙයි. එහෙත් හොලාකෝ මැතිනිය ගේ නිවෙසට ගොඩවන පඩිපෙළ නගින අතරේ හදිසියෙන් ම ඇති වූ භීතියකින් තමා ගේ කොඳු ඇටය හැකිළෙන්නාක් මෙන් ඔහුට දැනිණි. මෙය තමා ගේ අන්තිම බලාපොරොත්තු ව බවත්, මේ බලාපොරොත්තු ව සුන් වුවහොත් මිනියක් මරා හෝ මුදල් සොර කම් කරනවා මිස වෙන කළ හැකි දෙයක් නැති බවත් ඔහුට ප්‍රත්‍යක්ෂ විය. ඔහු සීනුව නාද කරන විට වේලාව සවස හතාමාර ය.

පළමු ව, වාසනාව තමා සමග සිනාසෙන්නාක් මෙන් මීතියාට පෙනුණේ ය.ඔහු පැමිණ සිටින බව දැනගත් වහා ම ගෘහිණිය විශේෂ උනන්දුවක් දක්වා ඔහු පිළිගත්තා ය. "ඈ මගේ පැමිණීම බලාපොරොත්තු ව සිටියා වගෙයි'' මීතියා කල්පනා කෙළේ ය. ඔහු විසිත්ත කාමරයේ අසුන් ගත් වහා ම එහි පැමිණි ගෘහිණිය, තමා ගේ පැමිණීම බලාපොරොත්තු ව සිටි බව එක් වර ම කීවා ය.

"මම මහත්මයා එන තෙක් මඟ බලා සිටියා, නමුත් බලා සිටියේ කිසි ම හේතුවක් ඇති ව නො වෙයි. මහත්මයා පැමිණේ ය කියා මා විශ්වාස කළා. මහත්මයා මගේ සහජබුද්ධිය ගැන පුදුම වෙන්න පුළුවනි. අද උදේ සිටන් ම මා දැන සිටියා මහත්මයා එන බව."

"ඔව්, ඒක පුදුම දෙයක් තමයි'' මීතියා කීවේ නුපුරුදු ලෙස හිඳ ගනිමිනි. මා ඔබ තුමී හමුවන්න ආවේ බොහො ම වැදගත් කටයුත්තක් ගැනයි............... මට වැදගත් වන කටයුත්තක් ගැනයි............ ඒ නිසා මා ඉක්මනට...............''

"වැදගත් කටයුත්තක් සඳහා පැමිණි බව මම දන්නවා. ඒක සිතේ ඇති වන හැඟීමක් නො වෙයි. නැති නම් හාස්කම් ගැන විශ්වාස කිරීම වැනි ප්‍රතිගාමී ක්‍රියාවක් නෝ වෙයි. (සොසිමා තවුසා ගැන ආරන්චි ද?) මේක ගණන් බලා කෙරෙන දෙයක් . කැතිරිනාට සිදු වූ දේවල් ගැන කල්පනාවෙන කොට මහත්මයාට නැවිත් ඉන්න පුළුවන් කමක් නැහැ. මේවා කල් සල් බලා කරන දේවල් වගෙයි."

"මේවා ජීවිතය පිළිබඳ නියම ඇත්ත නැත්ත මිස වෙන දෙයක් නො වෙයි.මේක තේරුම් කරලාදීමට මට කරුණාකරලා ටිකක් ඉඩ දෙන්න."

"ඔව්, මෑත් කැමැතියි යතාඊයට. මම ඕනෑවට වඩා හෑස් කම් දකල තියෙනවා. සොසිමා තවුසා මැරිච්ච බව ආරන්චි ද?"

"නැහැ, මට දනුයි දනගන්න ලැබුණේ"යි මිතියා කීවේ ය. ඔහු තවුසා ගේ මරණය ගැන මදක් පුදුම විය. අනතුරු ව ඔහු අලෝෂා ගැන මොහොතකට පමණ කල්පනා කෙළේ ය.

"තවුසා මළේ ඊයේ රෑ, මා හිතුවා... ...."

"මා බොහො ම අමාරු තත්ත්වයක සිටින බව මිස මට වෙන කිසි ම දෙයක් ගැන කල්පනා කරන්න බැහැ. ඔබතුමී මට පිහිට වුණේ නැති නම් හැම දෙයක් ම විනාශ වන්න පුළුවනි. සේරට ම ඉස්සෙල්ලා විනාශ වෙන්නේ මායි. මගේ කතාවේ ඇති නොවැදගත්කම ගැන මට සමා වන්න. මා ඉන්නේ බොහො ම ලොකු කලබලයකින්................"

"මහත්මයා බොහො ම ලොකු කලබලයකින් ඉන්න බව මම දන්නවා. මහත්මයා හැම තිස්සේ ම ඉන්නේ කලබලයෙන්. මහත්මයා කියන්න ලෑස්තිවන දෙය මම දන්නවා. මම බොහො ම කාලයක ඉඳලා මහත්මයා ගේ අනාගතය ගැන පරීක්ෂාවෙන් ඉන්නේ............... මම ආත්මයට වෙදකම් කළ හැකි දෙස්තර කෙනෙක්"

"ඔබ තුමිය හොඳ පළපුරුදු ඇති දෙස්තර කෙනෙක් නම් මා හොඳ පළපුරුදු ඇති රෝගියෙක්"යයි මිතියා කීවේ ශිෂ්ඨයකු වීමට වෑයම් කරමිනි. "ඔබ මගේ අනාගතය ගැන පරීක්ෂාවෙන් සිටියා නම් එය විනාශ වන්නට නො දී ආරක්ෂා කරගන්නවා ඇති. ඒ නිසා මා ඔබ ළඟට ආවේ මොනවට ද? මා ඔබෙන් බලාපොරොත්තු වෙන්නේ මොනවා ද? කියා පැහැදිලි කරන්න කරුණාකර මට අවසර දෙන්න. මා ආවේ... ...."

"නැහැ නැහැ, ආපු කාරණාව ගැන මට විස්තරයක් උවමනා නැහැ. ඒක එ තරම් වැදගත් දෙයක් නො වෙයි. මහත්මයාට පමණක් නො වෙයි මම බොහො ම දෙනකුට උපකාර කරලා තියෙනවා. සමහර විට මගේ ඥාති සහෝදරියක වන බෙල්-විසෝව් මැතිනිය අඳුනනවා ඇති. ඇගේ සැමියා බොහො ම දුප්පත්. මහත්මයා කියන විදියට 'බොහො ම කනගාටුදායක තත්ත්වයකට පත්වුණා' මම එයාට කිව්වා අශ්වයන් බෝකරන්න කියා, දැන් එයාට බොහො ම ජයයි. මහත්මයා අශ්වයන් බෝ-කරන හැටි දන්නව ද?"

"නැහැ, මා දන්නේ නැහැ"යි නොසන්සුන්කමින් පැවැසූ මිතියා පුටුවෙන් නැඟී සිටියේ ය. "මා කියන දෙයට ඇහුන්කන් දෙන්නය කියා මම බොහො ම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මා පැමිණි කාරණය සම්පූර්ණයෙන් ම විස්තර කිරීමට කරුණා-කරල මට මිනිත්තු දෙකක් නිදහසේ කතා කරන්න ඉඩ දෙන්න. මට වැඩි වෙලාවක් පමා වෙන්න පුළුවන් කමක් නැහැ. ඉක්මනට යන්න ඕනෑ"යි මිතියා උමතු වූවකු මෙන් කීවේ ගෘහිණිය ආයේත් කතා කිරීමට සැරසුණු නිසා ඊට බාධා කිරීමේ අදහ-සිනි. "මා ආවේ සියලු ම බලාපොරොත්තු සුන් වූ මිනිසෙකු හැටියටයි. කරුණා කරල මට රූබල් තුන් දහසක් ණයට දෙන්න. නමුත් ණය දෙන්නේ හොඳ ඇපයක් ඇතිවයි........... මේක විස්තර කරන්න කරුණා කරල මට අවසර දෙන්න...... ..."

"ඒ විස්තර පසු ව කියන්න පුළුවනි"යි ගෘහිණිය අත වනමින් කීවේ තමාට කතා කිරීමට ඉඩ දී නිශ්ශබ්ද විය යුතු බව දන්-වමිනි. "මහත්මයා මට කියන්න ලෑස්ති වන දෙය මම දන්නවා. මා මීට ඉස්සෙල්ලා ඒ බව කිව්වා නේ ද? මගෙන් රූබල් තුන් දහසක් ඉල්ලුවා නේ ද? මට ඊට වැඩිය ලොකු මුදලක් වුණත් දෙන්න පුළුවනි. මහත්මයා බේරාගන්නත් පුළුවනි. නමුත් ඊට ඉස්සෙල්ලා මා කියන දෙය කරන්න ඕනෑ"

මිතියා ආයේත් හිඳ සිටි පුටුවෙන් නැඟී සිටියේ ය.

"මැතිනියෙනි, ඔබට බොහො ම ස්තුතියි, බොහො ම ස්තුතියි. ඔබ බොහො ම කරුණාවන්තයි" මිතියා අවදි වූ හැඟීම්වලින් යුතු ව කිවේ ය. "අනේ දෙයියනේ, ඔබ යම්තම් මා බේරා ගත්තා ඔබ තුමියට මගේ යදු කාලික කෘතඥතාව හිමි විය යුතු යි."

"මම රූබල් තුන් දහසක් දෙන්නම්. ඊට වැඩිය වුණත් දෙන්න පුළුවනි"යි ගෘහිණිය කීවේ තරුණයා තුළ ඇති වූ සතුට දෙස ප්‍රීතියෙන් පිනා ගිය සිනාවකින් බලමිනි.

"උවමනා තරම් මුදල් දෙනවා? මට එ තරම් මුදල් උවමනා නැහැ. මට උවමනා කරන්නේ ඒ මාරක තුන් දහ පමණයි. ඒ මුදල් වෙනුවෙන් මම මගේ සීමාවක් නැති කෘතඥතාවෙන් ඇප වෙන්නම්...........මා කැමැතියි යෝජනාවක් කරන්න..........."

"ඔය ගැන කතා කළා ඇති"යි කුලකත තරුණයා ගේ කතාවට බාධා කරමින් කීවේ පරෝපකාරය නිසා නිරහංකාර ජයග්‍රහණයක් ලද්දකු මෙනි. "මහත්මයාට උදව්වක් කිරීමට පොරොන්දුවක් වුණා. මම ඒ පොරොන්දුව ඉෂ්ට කරන්නම්.

මම මගේ ඥාති සහෝදරයා බේරා ගත්තා වගේ මහත්මයාත් බේරා ගන්නම්. රත්රන් ආකර ගැන අදහස කොහොම ද?''

''මම ඒ ගැන කල්පනා කළේ නැහැ.''

''මහත්මයා වෙනුවෙන් මම ඒ ගැන කල්පනා කළා. කීප වරක් ම කල්පනා කළා. මේ ගැන කල්පනා කරන අතර මම පසු ගිය මාසය තුළ මහත්මයා ගැන සෝදිසියෙන් සිටියා. මහත්මයා මේ ගෙය පසු කර යන අතර මම මහත්මයා දිහැ සියවරකටත් වැඩිය බලා, අර යන්නේ රත්රන් ආකර-වල සිටිය යුතු විරියවන්තයෙක් යැයි මම මට ම කියා ගත්තා 'අන්න ඉන්නවා රත්රන් සොයාගත හැකි මිනිහෙක්'යයි මහත්මයා ගේ ගමන දිහැ බලා මම තීරණය කරගත්තා.''

''මගේ ගමනින් දැනගත්තා''යි මිතියා සිනා සෙමින් ඇසී ය.

''මොකද නැත්තේ? මිනිහකු ගේ ගමනින් ඒ මිනිහ ගේ ගතිගුණ කියන්න පුළුවන් බව විශ්වාස කරන්නේ නැද්ද? මේ මතයට විද්‍යාවෙන් සාක්ෂි ලැබෙනවා. මා දන් යථාර්ථ වාදි-යෙක්. සොසිමා තවුසා ගේ අර කාරණයෙන් පස්සේ මගේ සිත සම්පූර්ණයෙන් ම අවුල් වුණා. අද සිටන් මා පිළිගන්නේ යථාර්ථය පමණයි. ඉන් ප්‍රයෝජන ගැනීමට මා මගේ මුළු කාලය ම යොදනවා. වර්ජිනිච් කිව්වා වගේ මා දන් පුව වූ කෙනෙක්........ ඒ ඇති''

''නමුත් ඔබතුමී මට බොහො ම ත්‍යාගවන්ත කමින් දෙනවා ය කියා පොරොන්දු වූ රුබල් තුන් දහ..............''

''ඒ ගැන කරදර වෙන්න එපා, ඒ මුදල් ලැබේවි''යී ගෘහිණිය එක්වර ම තරුණයා ගේ කතාව නතර කරමින් කීවා ය. ''රුබල් තුන්දහ සාක්කුවේ තියෙනවා ය කියා හිතාගන්න. තුන්දහ නො ව තුන් ලක්ෂයක් තියෙන බව හිතාගන්න. මම මේ අදහස තෑග්-ගක් වශයෙන් දෙන්නම්. රත්රන් ආකර ලැබුණාට පස්සේ ලක්ෂගණන් මුදල් හම්බ කරලා මහා ධනවතකු වෙලා ආපසු ඇවිදින්, අපට පරාර්ථය සඳහා වැඩ කිරීමට පොළඹවන්න. අපි මේ වැඩ යුදෙව්වන්ට භාර දෙන එක හොඳ නැහැ නේද? මහත්මයා විශාල ගොඩනැගිලි තනා, විශාල ව්‍යාපාර ආරම්භ කරනවා ඇති, මේක දුම්රියේ යුගයයි. මහත්මයාට බොහො ම ප්‍රසිද්ධ කෙනෙක් වෙන්න පුළුවනි. මුදල් අමාත්‍යාංශයට නැති ව ම බැරි කෙනෙක් වෙන්න පුළුවනි. දන් අපේ ආණ්ඩුව බොහො ම දුප්පත් තත්ත්වයකයි ඉන්නේ. රුබල් නෝට්ටුවේ වටිනා කම

අඩුවීම ගැන කල්පනා කරන විට මට නින්ද යන්නේ නැහැ. ඒ අතින් මිතිස්සු මා ගැන වැඩිය දන්නෙ නැහැ………"

"මැතිනියෙනි, මැතිනියෙනි"යි කියමින් මිතියා කතාවට බාද කළේ නොසන්සුන් වූ හැඟීම්වලින් යුතු ව ය. "සමහර විට මා ඔබතුමිය ගේ අවවාදය පිළිගන්න පුළුවනි. ඒ ඥානවන්ත අවාදය පිළිගෙන රත්රන් ආකරවලට යන්නම්. එක වරක් නො වෙයි කිප වරක් ම යන්නම්…………………මේ ගැන කතා කරන්න මම වෙන වෙලාවක එන්නම්. කිප වරක් ම එන්නම්………….දැන් ඉතින් මට පොරොන්දු වූ රුබල් තුන් දහ දෙන්න. අද ම දෙන්න. මේ මුදල නිසා මට ලොකු නිදහසක් ලැබෙනවා. ………………මට දැන් මිනිත්තුවක්වත් පමා වෙන්න පුළුවන් කමක් නැහැ…………."

"ඔය ඇති! ඔය ඇති!"යි කුලකත උස් හඬින් කියා මිතියා ගේ කතාවට බදු කළා ය. "දැන් තියෙන ප්‍රශ්නය රත්රන් ආකාරවලට යනවද? නැද්ද? ගැනයි. ඒ ගැන තීරණයකට බැසගත්තා නම් ඔව් කියන්න. නැතිනම්, නැහැ කියන්න."

"මම පස්සේ යන්නම්……..කැමැති තැනකට යන්නම්………..නමුත් දැනට…………"

"විකක් ඉන්නැ"යි පැවැසූ කුලකත වහා හුනස්නෙන් නැගිට බොහෝ ලාච්චු සහිත අලංකාර ලියන මේසයක් ළඟට ගොස්, යම් කිසිවක් සොයන්නට වූවා ය.

"තුන් දහක්"යයි මිතියා කල්පනා කෙළේ ය. ඔහු ගේ හදවත නතර වීමට ළං විය. "එක පාරට ම… …….කිසි ම ලියැවිල්ලක් නැති ව මුදල් දෙනවා. නියම මහත්වරු වැඩ කරන්නේ මේ විදියටයි………….බොහොම හොඳ ගැති."

"මේ තියෙන්නේ………මෙන්න තියෙනවා සොයාපු දෙය"යි ඈ ප්‍රීතියෙන් කියමින් මිතියා ළඟට ගියා ය. එය නූලක ගැට ගසන ලද කුඩා රිදී සුරුවමකි. එවැනි සුරුවම් ඇතැම් විට කුරුස සමග කරවටේ පළඳිනු ලැබේ.

"මේ සුරුවම ලැබුණේ කිව් නුවරිනුයි" ඈ මහත් භක්තියෙන් කීවා ය. "සුද්ධ වූ වර්වාරා ගේ ධාතුවලින් ලැබුණු සුරුවමක්."

ඈ සුරුවම තරුණයා ගේ කර වටේ දමා සකස් කළා ය. අතිශයෙන් ම ව්‍යාකූල වූ සිතැති මිතියා සුරුවම පැලඳවීමට හිස

පහත් කර ගෙන සිටියේ ය. අන්තිමේ දී සුරුවම ඔහු ගේ වයි පටිය හා කමිස කර යටින් පපුව උඩට වැටිණි.

"දැන් ඉතින් යන්න"යි ඈ විශාල ජයක් ලැබූවකු මෙන් හිඳගනිමින් කීවා ය.

"ඔබ තුමියට කොහොම සතුති කරන්න ද කියා මා දන්නේ නැහැ. නමුත්...............මට කාලයේ තියෙන වැදගත්කම දන්නවා නම්...............මා බලාපොරොත්තු ව සිටින අර මුදල් ගැන............ඔබ තුමිය ගේ ත්‍යාගවන්තකම ගැන මම ණය ගැති වෙනවා...මට මෙ තරම් කරුණාවෙන් සැලකූ නිසාත්, අනුකම්පා-වෙන් උපකාර කරන නිසාත්............ඔබ බොහො ම කාලයක සිට දන සිටියත් මම ඔබට මේ කාරණාව කිව යුතුයි.........මම මෙහෙ ඉන්න තරුණියකට ආලය කරනවා...................මම කැතීරිනාට බොරු කළා ....නපුරු කම් කළා, තිත්ද කළා............මම වෙන තරුණියකට ආලය කරනවා. සමහර විට ඔබ ඇය පිළිකුල් කරනවා ඇති. ඇය ගැන හැම දෙයක් ම දන්නවා ඇති. මට කොහොමවත් දැන් ඇය අත්හරින්න බැහැ. ඒ නිසා කරුණා කරල අර රුබල් තුන් දහ............"

"හැම දෙයක් ම තිතෙන් අත්හරින්න"යි තුල කත මීතියා ගේ කතාවට බාද කරමින් එඩිතර ස්වරයෙන් කීවා ය. "හැම දෙයක් ම අත්හරින්න. විශෙෂයෙන් ම ගෑනු ගැන අදහස් අත්හරින්න. මහත්මයා ගේ පරමාර්ථය රත්රන් ආකර විය යුතුයි. එ වැනි පරමාර්ථයක ගෑනුන්ට තැනක් නැහැ. ලොකු පොහොසතකු වෙලා ආවට පස්සේ පුළුවනි තමාට ආලය කළ හැකි තරුණියක් විවාහ කර ගන්න. ඈ අලුත් පන්නයට අයත්, හොඳ අධ්‍යාපනයක් ලබාපු උසස් අදහස් දරන යහපත් තරුණියක් වනවා ඇති. ගැහැනුන් ගැන දැන් සිතේ තියෙන ඔය ලාමක අදහස් ඒ කාලය වන විට දියුණු වනවා ඇති. ඒ කාලයේ දී ඔබට මේ අලුත් කාන්තාව හමුවේ වි."

"ඒක නො වෙයි දැන් තියෙන ප්‍රශ්නය"යි මීතියා කන්නලව්වු කරන්නාක් මෙන් දත එක්කොට කීවේ ය.

"ඒක තමයි දැන් තියෙන ප්‍රශ්නය. ඒක තමයි උවමනා කරල තියෙන්නේ. ඒකට තමයි ඔබ ආශා කරන්නේ. වර්තමාන ස්ත්‍රිය ලබන දියුණුවට මගේ කිසි ම අකැමැත්තක් නැහැ. මගේ බලාපොරොත්තුව නුදුරු අනාගතයේ දී දේශපාලන අයිතිවාසි කම් ලබා ගැනීමට තරම් ස්ත්‍රිය දියුණු කිරීමටයි. මටත් දියණියක්

ඉන්නවා. මේ සම්බන්ධ ව මගේ අදහස් කවුරුවත් දන්නේ නැහැ. මම මේ ගැන මිසිඩරින්ට ලියුමක් ලියා යැව්වා. මේ ගත් කතුවරයා මිට සත්‍රිය ගැන බොහො ම දේවල් කියා දී තියෙනවා. මම ගිය අවුරුද්දේ මගේ නම අස්සන් නො කර මේ ගත් කතුවරයාට පේළි දෙකක ලියුමක් ලියා යැව්වා. "මගේ ගුරු තුමාණෙනි, වර්තමාන සත්‍රිය වෙනුවෙන් මම ඔබ සිප ගනිමි, ඔබේ ව්‍යාපාරය නො නවත්වා ම කරගෙන යමි" කියා ලියුම ලිව්වා. "මීට මවක්" කියා මම අස්සන් කළා. මම ටිකක් කල්පනා කළා 'සමකාලීන මවක්' කියා අත්සන් කරන්න, නමුත් පස්සේ මම 'මවක්' කියා අස්සන් කළා. 'මවක්' කියන වචනය වැඩියත් ලස්සනයි. හැරත් 'සමකාලීන' කිව්වම 'සමකාලීන' කියන පත්‍රය මතක් වෙන්නත් පුළුවනි. ඒ එක්ක ම ඒ කාලේ පොත්පත් තහනම් කළ හැරී සිහි වෙලා හිතේ වේදනාව ඇති වෙන්නත් පුළුවනි............අනේ දෙයියනේ, මොකද මහත්මයාට වෙලා තියෙන්නේ?"

අන්තිමේ දී මිතියා පුටුවෙන් නැගිට ගෘහිණිය ඉදිරිපිට දණින් වැටී කන්නලව් කරන්නාක් මෙන් දෑත එක්කොට ඔබ තුමිය බොහො ම ත්‍යාගවන්ත ලෙස පොරොන්දු වූ මුදල් නුදුන්නොත් මට අඬන්න සිද්ද වෙනවා..........."යි කී ය.

"ඔව් අඬන්න, අඬන්න. අඬන එක බොහො ම උතුම් ක්‍රියාවක්. ඔබ බොහො ම දුර ගමනක් යා යුතුයි. ඇඬීමෙන් හදවතේ තියෙන ශෝකය අඩු වෙන්න පුළුවනි. ආපසු ඇවිදින් ප්‍රීති වෙන්න පුළුවනි. මා සමග ප්‍රීතිය භුක්ති විඳීම පිණිස මහත්මයා සයිබීරියාවේ ඉඳලා ආපසු එනවා ඇති."

"මට කතා කරන්න ටිකකට ඉඩ දෙන්නැ"යි මිතියා හඬිසියෙන් ම කෑගා කීවේ ය. "මට දෙනව ය කියා පොරොන්දු වූ මුදල් අද ලැබෙනවා ද කියා කියන ලෙස මම අන්තිම වරට බොහො ම බැගෑපත් ව ඉල්ලා සිටිනවා. අද දෙන්න බැරි නම් දෙන වෙලාවක් කියන්න, මම එන්නම්."

"මොන මුදල් ද?"

"ඇයි මට දෙනවා ය කියා පොරොන්දු වූ රූබල් තුන්දහ?"

"තුන් දහක්? රූබල් තුන් දහක්? අනේ මා ළඟ රූබල් තුන් දහක් නෑ නොවැ"යි ගෘහිණිය, පුදුමයෙන්, එහෙත් සන්සුන් සිතින් කීවා ය.

මීතියා තෝන්තු විය.

"ඇයි දැන් දෙනවයි කිව්වේ............මගේ අතේ තියෙනවා වගෙයි කිවේවේ............"

"නැහැ, නැහැ, මම එහෙම දෙයක් කිව්වෙ නැහැ. මා වරදවා තේරුම් ගෙන තියෙනවා. මා කිව්වෙ රත්රන් ආකර ගැනයි. රූබල් තුන් දහට වඩා විශාල මුදලක් පොරොන්දු වූ බව ඇත්තයි. මට හොඳට මතකයි............නමුත් මා කිව්වේ රත්රන් ආකර ගැනයි."

"නමුත් මුදල්? රූබල් තුන් දහ?"යි මීතියා මෝඩයකු මෙන් ඇසුවේ ය.

"මහත්මයා අදහස් කළේ මුදල් ගැන නම්, මා ළඟ මුදල් නැහැ, බොහෝ ම කනගාටුයි, මා ළඟ මුදල් නැහැ. මම මගේ කළමනාකාරයා එක්ක හැමදා ම මුදල් ඉල්ලා කෝලාහල කරනවා. දැන් ටිකකට ඉස්සෙල්ලා මම මියුසෝ මහත්මයාගෙන් රූබල් පත් සීයක් ණයට ගත්තා. නැහැ, නැහැ, මා ළඟ මුදල් නැහැ. මා ළඟ මුදල් තිබුණත් ණයට දෙන්නේ නැහැ. මුදල් ණයට දීමෙන් අදහස් කරන්නේ යාළු මිත්‍රකම් නැති කර ගැනීමයි. කාට දුන්නත් ඔබට දෙන්නේ නැහැ. නොදෙන්නේ මා ඔබට කැමැති නිසයි. ඔබව බේරා ගත යුතු නිසා දෙන්නේ නැහැ. ඔබට සුදුසු රත්රන් ආකරයි, රත්රන් ආකරයි, රත්රන් ආකරයි............"

"ඇයි යකෝ!" කියා බෙරිසන් දුන් මීතියා මුළු වැර ම යොදා මිට මොලවා ඇඹසයට පහරක් ගැසුවේ ය.

"මාව බේරා ගත්ත"යි කියා තැති ගෙන කෑ ගැසූ ගෑනිණිය විසිත්ත කාමරයේ අනෙක් කෙළවරට වහා දිව ගියා ය.

බිමට කෙළ ගැසූ මීතියා වහා විසිත්ත කාමරයෙන් පිට වී ගෙයින් දෙරට බැස, අඳුරින් වැසුණු මහ මඟට පැමිණියේ ය. යක්ෂාවේශ වූ එකකු මෙන් ගමන් ගත් හෙතෙම යන ගමන් පපුවට ගසා ගත්තේ ය. ඔහු පපුවට ගසා ගත්තේ මන් ද? කුමන අදහසකින් ද? එය මොහොතකට පමණ රහසක් විය. මෙලොව කිසිවකු නොදන්නා රහසක් විය. ඔහු ඒ රහස අලෝෂාට පවා නො කීවේ ය. එය නින්දාවකට වඩා දරුණු ය. ඔහුගේ විනාශයට හේතු විය.දි වි නසා ගැනීමට සමාන විය. කැතිරීනා ගෙන් ගත්ත

ගෙවා, පපුවේ එම ස්ථානයේ හිරවූ, තමා ගේ ආධ්‍යාත්මික චිත්තයට මහත් බරක් වූ, නින්දුව ඉවත් කළ නො හැකි නම් තමා ගේ විනාශය හා මරණයත් සිදුවන්නේ යයි මීතියා ඉටා ගත්තේ ය. පාඨකයාට මේ හැම දෙයක් ම පසුව විස්තරව දන ගත හැකි ය. එහෙත් මුදල් ලබා ගැනීම සම්බන්ධව අන්තිම බලාපොරොත්තුවත් සුන් කර ගත් මීතියා හොලාකෝ මැතිනිය ගේ නිවෙසින් පිටවී අඩි කීපයක් ගිය පසු දරුවකු මෙන් අඩන්නට පටන් ගත්තේ ය. මෙසේ අඬමින්; කුමක් කළ යුතුදැයි නො දන ගමන් ගත් මීතියා අත මිටින් කඳුළු පිස දම්මේ ය. කඩ පොළට පැමිණි ඔහුට තමා ගේ ඇගේ කිසියම් දෙයක් හැපී වැටුණු බව දනුණේ ය. ඔහු ගේ ඇගේ හැපී බිම වැටුණේ මහලු ඉතිරියකි. ඈ නැගූ කන් කකියවන අඳෝනාව ද ඒ සමග ඇසිණි.

"අනේ දෙයියනේ, තව ටිකින් මා මළා. ඇයි මිනිහෝ පාර බලා ගෙන යන්න බැරි ද?"

"ආ, මේ උඹ ද?"යි මීතියා අඳුරේ මහලු ස්ත්‍රිය ඇඳින ගත්තේය. ඈ සම්සෝනෝ ගේ ගෙදර සිටින මහලු ස්ත්‍රියයි. මීතියා ඇය සම්සෝනෝ ගේ ගෙදර දී දක ඇත.

"තමුන්නාන්සේ කවු ද?"යි මැහැල්ල ඇසුවේ අමුතු කට හඬකිනි. "කළුවරේ තමුන්නාන්සේ අඳුනගන්න බැහැ."

"උඹ ඉන්නේ සම්සෝනෝ ගේ ගෙදර නේ ද? උඹ එ තැන වැඩකාරිය නේ ද?"

"එහෙමයි හාමුදුරුවනේ, මම පොක්රොව් ගේ ගෙදරට යනවා. මම තමුන්නාන්සේ අඳුනන්නේ නැහැ."

"අම්මේ දූත් උඹ එතකොට ගෘසෙන්කා ගෙදර හිටිය ද? දුන් ටිකකට ඉස්සෙල්ලා මම ඇය සම්සෝනෝ ගේ ගෙදරට ඇරලුවා"යි මීතියා මහත් කුහුලින් විමසුවේ ය.

"එහෙමයි හාමුදුරුවනේ ගෘසෙන්කා ගෙදර හිටියා. ටික වෙලාවක් ඉඳලා ගියා."

"මොනවා... ....? කොයි වෙලාවෙ ද ගියේ?"යි මීතියා කෑ ගා ඇසුවේ ය.

"ආපු හැටියේ ම ගියා, මිනිත්තුවකට වැඩිය හිටියේ නැහැ. සම්සෝනෝ හිනස්සලා ආපසු දිව්වා."

"උඹ කියන්නේ බොරු"යි මිතියා ගිගුම් දුන්නේ ය.

"අනේ මාව බේරා ගන්න"යි මැහැල්ල තැති ගෙන විලාප නැඟුවා ය. එහෙත් ඊට කලින් මිතියා අතුරුදහන් විය.

ඔහු මුළු වේර ම යොදා ගෲසෙන්කා නතර වී සිටි ගෙදරට දිව්වේ ය. ඔහු එහි ළඟාවන විට ගෲසෙන්කා මුක්රෝව්වට යමින් සිටියා ය. ඈ පිටත් වී පැය කාලකට වඩා නැත.

මිතියා ගෙට ඇතුළු වන විට පෙනියා ඈගේ මුත්තණියත් වන මෙතියෝනා නමැති මහලු අරක්කැමි ස්ත්‍රිය සමග මුළුතැන් ගෙයි හිඳ සිටියා ය. මිතියා දුටු වහා ම පෙනියා තැති ගෙන විලාප නැඟුවා ය.

"මොකා ද උඹ කෑගහන්නේ? කෝ ගෲසෙන්කා?"යි මිතියා කෑගා ඇසුවේ ය. තැති ගෙන සිටි පෙනියාට පිළිතුරු දීමට ඉඩ නො ලැබිණි. ඊට පෙර මිතියා ඈගේ දෙපා ළඟ බිම වැටී:

"පෙනියා ක්‍රිස්තුන් වහන්සේ ගේ නාමයට ගෲසෙන්කා ගිය තැන කියාපන්"යි කීවේ ය.

"මා දන්නේ නැහැ. මැරුවත් කියන්නේ නැහැ"යි පෙනියා කීවා ය. "දැන් ටිකකට ඉස්සෙල්ලා තමුන්නාන්සේ ගෲසෙන්කා එක්ක ගියා නේ ද?"

"ඈ ආපසු ගෙදර ආවා!"

"නැහැ, ආවේ නැහැ. දෙයියම්පා ආවේ නැහැ."

"උඹ කියන්නේ බොරු, උඹ බය වෙලා කතා කරන හැටියෙන් මා දන්නවා ඈ ගිය තැන"යි කියමින් මිතියා කෑගැවේ ය.

අනතුරුව හෙතෙම වහා නික්ම ගියේ ය. මෙ තරම් ලෙහෙසියෙන් මිතියා ගෙන් නිදහස් වීමට ලැබීම ගැන, තැති ගෙන සිටි පෙනියා ප්‍රීති වූවා ය. මිතියා මෙ තරම් ඉක්මනින් ගියේ කලබලයෙන් පැමිණි නිසා ය. නැති නම් ඔහුගෙන් ලෙහෙසියෙන් නිදහස් විය නොහැකි බව පෙනියා දන සිටියා ය. නමුත් දිව ගිය මිතියා කළ බලාපොරොත්තු නොවූ කිසියම් දෙයක් නිසා පෙනියා හා මහලු මෙතියෝනා පුදුම වූහ. මේසය උඩ මෝල් ගසක් සමග පිත්තල වන්ගෙඩියක් තිබිණි. එය අඟල් හයකට වඩා දිග නැති කුඩා පිත්තල මෝල් ගසකි. එක අතකින් දොර ඇරිය මිතියා අනෙක් අතින් මෝල් ගස ගෙන සාක්කුවේ දමා ගත්තේ ය.

"අනේ දෙයියනේ, මිතියා කවුදෝ මරන්න යනවා"යි පෙනියා දෑත විදහා කීවා ය.

හතර වන පරිච්ඡේදය

අන්ධකාරය

මීතියා දිව ගියේ කොතැනට ද? ඔහුට දිව ගිය හැක්කේ එක් තැනකට පමණි. "තාත්තා ළඟට මිස ගෲසෙන්කා වෙන කොතැන යන්න ද? ඈ සම්සෝනෝ ගේ ගෙදර සිට කෙළින් ම තාත්තා ළඟට යන්න ඇති. ඒ ගැන සැක හිතන්න දෙයක් නැහැ. මුළු කුමන්ත්‍රණය ම, ප්‍රයෝගය ම දැන් හොඳට පැහැදිලියි........" මේ සිතිවිලි මීතියා ගේ සිත තුළ බමන්නට විය. ඔහු මායා හමු වීමට නොගියේ ය. "දැන් එයි යාමෙන් වැඩක් නැත............... කිසි ම උවමනාවක් නැත...............මා කිසි ම කලබලයක් නො කළ යුතු යි. උන් ගිහින් ගෲසෙන්කාට කියන්න පුළුවනි- මායා හා පැවල් මේ උපායට හවුල් වෙන්න ඇති. තාත්තා උන්ට අත්සල් දී පක්ෂ කර ගන්න ඇති!"

එ වේලේ ඇති වූ වෙන අදහස් අනුව මීතියා කෙළින් ම මහ ගෙට නො ගොස් ගෙය වටේ දිව ගියේ ය. අනතුරු ව පටු මග හරහා ගිය හෙතෙම, ඩිමිට්‍රොස්කි පාර දිගේ ගොස් කුඩා පාලමින් එගොඩ වී, මහගෙයි වත්ත පසුපසින් දිවෙන අඩි පාරට පැමිණියේ ය. එක පැත්තකින් මැටි තාප්පයකින් ද අනෙක් පැත්තෙන් මහ ගෙයි වත්තේ උස් වැටෙන් ද යුත් ඒ අඩිපාර කිසිවකු නොයන පාළු පාරකි. මේ අඩිපාර දිගේ ගිය මීතියා වත්තට පැනීමට තෝරා ගත්තේ ලිසවේතා පැනීමට තෝරා ගත් තැන ම ය. "ලිසවේතාට මේ වැට උඩින් පනින්න පුළුවන් නම් ඇයි මට පනින්න බැරි?"යි මීතියා කල්පනා කෙළේ ය. මුළු වෙර ම යොදා වැට උඩට නැග ගත් හෙතෙම, දෙපා දෙපැත්තට දමා වැට උඩ ඉඳ ගත්තේ ය. වැට අයිනේ නාන ගෙය තිබේ. පහන් එළියෙන් ආලෝක වූ මහ ගෙයි කවුළුවක් ඔහු දුටුවේ ය.

"තාකියා ගේ කාමරේ ලාම්පුව පත්තු වෙනවා. ගෲසෙන්කා ඇවිදින් ඇති." මෙසේ කල්පනා කළ මීතියා වැට උඩ සිට වත්තට

පැන්නේ ය. පැවල් පමණක් නොව ගිරිගෝරිස් ද අසනීපයෙන් සිටින හෙයින් තමා පැමිණි බව දන ගැනීමට කිසිවකු නැති බව මීතියා දන සිටියේ ය. එහෙත් කල්පනාවෙන් සැඟවුණ හෙතෙම නිහඬව අසා සිටියේ ය. හැම තැන ම ගැඹුරු නිශ්ශබ්දතාවයක් පැවැතිණි. එය උමතාවෙන් ම ඇති වූ නිශ්ශබ්ද තාවක් වැන්න. හැම දෙයක් ම සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද විය. සුළඟ පවා නො හැමුවේ ය.

'රහසක් කියන්නා වැනි නිශ්ශබ්දතාව මිස වෙන කිසිවක් නැත' යන කවි පදය කිසියම් කරුණක් නිසා මීතියාට සඳහන් විය. "මා වැට උඩින් පනිනවා කාටවත් ඇහුණෙ නැති නම් හොඳයි." ඔහු කල්පනා කෙළේ ය. "නැහැ කිසිවකුට ඇහෙන්නෙ න හැ"යි සිතා ගත් හෙතෙම අනතුරු ව මිනිත්තුවක් පමණ වේලා නිශ්චල ව සිට ඉතා සෙමෙන් ගස් හා පඳුරු මගහරිමින් තණ කොළ වැඩුණු ගෙමිදුල හරහා ගියේ ය. ඉතා සෙමෙන් ගමන් කළ මීතියා හැම පියවරක් පාසා ම සවන් දුන්නේ ය. පහන් එළියෙන් ආලෝක වූ කවුළුව ළඟට යෑමට ඔහුට මිනිත්තු පහක් ගත වි ය. කවුළුව ළග එල්ඩර් හා සුදු බිච් පඳුරු කිපයක් තිබෙන බව ඔහුට මතක් විය. ගෙයි වම් පැත්තේ සිට වත්තට ඇතුළුවන දොර වසා තිබිණි. දොර ලඟින් යන අතරේ දොර පරීක්ෂා කොට බැලීමට ඔහු අමතක නො කෙළේ ය. අන්තිමේදී පඳුරු ළඟට පැමිණි හෙතෙම පඳුරු අස්සේ සැඟවිණි. "සමහරවිට මගේ අඩි ශබ්දය අසා ඔවුන් සෝදිසියෙන් සිටිනවා විය හැකියි. ටිකක් නතර වී සිටින්න ඕනෑ"යි ඔහු කල්පනා කෙළේ ය. "සිතේ සැක හැර ගැනීම පිණිස ශබ්ද නො කර ඉන්න ඕනෑ. කහින්න වත්, කිඹුහුන් අරින්නවත් නැති ව සිටීමට පරිස්සම් වෙන්න ඕනෑ"

මීතියා මිනිත්තු දෙකක් නිහඬ ව සිටියේ ය. ඔහු ගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. ඔහුට හුස්ම ගැනීමට පවා අපහසු විය. "මගේ පපුවේ ගැහිල්ල නවතින්නේ නැහැ. තවත් වේලා බලා ඉන්න බැහැ."යි මීතියා තමාට ම කියා ගත්තේ ය. ඔහු සැඟවී සිටියේ කවුළුව ලග පඳුරින් වැටුණු සෙවණැල්ල යට ය. කවුළුවෙන් වැටුණු පහන් එළියෙන් පඳුරේ ඉදිරි කොටස ආලෝක විය.

"වල් රෝස මල් රැට කො තරම් රතු ද?"යි ඔහු සෙමෙන් කීවේ කුමන කරුණක් නිසා දැයි ඔහු ම නො දනියි. ඉතා සෙමෙන් පියවරින් පියවර තබතබා කවුළුව ළඟට ගිය හෙතෙම ඇඟිලි තුඩින් උස් වී කවුළුව තුළින් බැලුවේ ය. ඔහුට

තාත්තා ගේ නිදන කාමරය සම්පූර්ණයෙන් ම පෙනේ. වඩා විශාල නොවූ එම කාමරය රතු ඉස්කිරිමකින් වෙන් කොට තිබිණි. මිතුරු කරමසෝ එම ඉස්කිරිම හැඳින්වූයේ 'චීන ඉස්කිරිම' යන නමිනි. මිතියාට 'චීන' යන වචනය විදුලි වේගයෙන් සඳහන් විය. "ඉස්කිරිම පිටුපස ගෲසෙන්කා සිටිනවා ඇති"යි මිතියා සැක කෙළේ ය. අනතුරුව ඔහු තාත්තා දෙස බැලුවේ ය. ඉරි වැටුණු පට රෙද්දෙන් කළ කබායක් ඇඳ සිටි හෙතෙම ඉග වටේ රැලි එල්ලෙන අලංකාර පට පටියක් බැඳ සිටියේ ය. මිතියා මීට කලින් තාත්තා එම ඇඳුමෙන් සැරසී සිටිනවා දැක නැත. රත්රන් බොත්තම් පෙළකින් යුත් අලංකාර කමිසය කබායේ කර සවින් පෙනේ. ඔහු රතු පාට බැන්ඩේජ් පටිය හිස වටේ ගැට ගසා ගෙන සිටියේ ය. එය මීට කලින් අලෝෂා දුටු බැන්ඩේජ් පටියමයි.

"මිතීහා ඇඳ පැළඳ ගෙන ලෑස්ති වෙලා ඉන්නවා"යි මිතියා තමාට ම කියා ගත්තේ ය.

මහල්ලා කවුළුව ළඟ හිඳ කල්පනා කරන්නට විය. හදිසි-යෙන් ම හිස හරවා මොහොතක් පමණ වේලා නිහඬව සවන් දී සිටි හෙතෙම කිසි ම හඬක් නො ඇසුණ හෙයින් මේසය ළඟට ගොස් ඩිගැන්ටරයෙන් වීදුරු භාගයක් පමණ බ්‍රැන්ඩි පුරවා ගෙන බිවේ ය. අනතුරු ව හෙතෙම ගැඹුරු සුසුමක් හෙළා මොහොතක් පමණ වේලා නිශ්චල ව සිට, අනතුරු ව බිත්තියේ එල්ලා තිබෙන කැඩපත ළඟට නො සැලකිල්ලෙන් ගොස්, හිස වටේ ගැට ගසා ගෙන සිටි බැන්ඩේජ් පටිය දකුණු අතින් මඳක් උස්සා තුවාලය පිරික්සා බැලුවේ ය. ඒ තුවාලය තව ම සුව වී නැත.

"අනුමානයක් නැහැ තාත්තා තනියෙන් වෙන්න ඕනෑ ඉන්නේ"යි මිතියා කල්පනා කෙළේ ය.

කැඩපත ළඟින් ඈත් වූ මහල්ලා ආයේත් හදිසියෙන් ම කවුළුව ළඟට ගොස් එබී බැලුවේ ය. මිතියා වහා පඳුර යට සැඟවුණේ ය.

"ගෲසෙන්කා අර ඉස්කිරිම පිටිපස සැඟවිලා ඇති. සමහර විට නිදාගෙන ඉන්නවා ඇති"යි මිතියා කල්පනා කෙළේ හදවතේ හටගත් වේදනාවෙන් යුතු ව ය. මහල්ලා කවුළුව ළඟින් ඈත්විය. "සමහර විට තාත්තා කවුළුවෙන් එබී බලන්නේ ගෲසෙන්කා එනවා ද කියා බලන්න වෙන්න ඇති. එහෙනම් ඈ කාමරයේ නැති ව ඇති. මොනවට ද මිතිහා කවුළුවෙන් බලන්නේ? මිතිහට ඉවසිල්ලක් නැහැ, පිස්සු වගෙයි.........." මිතියා ආයේත් කවුළුව ළඟට ගොස් එබී බැලුවේ ය, බලාපොරොත්තු සුන් වූ

මහල්ලා මේසය ළඟ හිඳ සිටියේ ය. අන්තිමේ දී ඔහු වැලමිට මේසය උඩ තබා දකුණු කම්මුල අත්ල මත තබා ගත්තේ ය. මිතියා නො ඉවසිල්ලෙන් බලා සිටියේ ය.

"මිනිහා ඉන්නේ තනියෙන්. ගෘසෙන්කා ඉන්නවා නම් මිනිහ ගේ මුහුණේ හැටි ඔහොම නො වෙයි." මිතියා යළි තමාට ම කියා ගත්තේ ය.

පුදුමයෙකි, ගෘසෙන්කා එ තැන නො සිටීම ගැන මිතියා තුළ කෝපයක් ඇති විය. "ගෘසෙන්කා එ තැන නැතිවා නො වෙයි. ඈ එ තැන ඉන්නවා ද නැද්ද කියා මට හරියට කියන්න බැහැ"යි මිතියා තමාට ම කියාගත්තේ ය. ඒ මොහොතේ දී ඔහු ගේ සිත ඉතා සන්සුන් ව හා පැහැදිලි ව ද තිබුණු බවත්, හැම දෙයක් ම සවිස්තර ව මතක තිබෙන බවත්, කිසි ම දෙයක් අමතක නොකළ බවත්, මිතියාට පසු ව හඳහන් විය. නමුත් හැම මොහොතක් පාසා ම අවිශ්වාසය නිසා ඇති වූ දැඩි දෞර්මනසක් ඔහු ගේ සිතේ වැඩෙන්නට විය. "ගෘසෙන්කා මෙහි සිටිනවා ද? නැද්ද?" යන කෝපයෙන් යුත් සැකයෙන් ඔහු ගේ සිත පිරිණි. හදිසියෙන් ම කිසියම් තීරණයකට බැස ගත් හෙතෙම අත දිගු කොට ඉතා සෙමෙන් කවුළුවට තට්ටු කෙළේ ය. ගෘසෙන්කා පැමිණ සිටින බව තමාට දන්වීම පිණිස මහල්ලා විසින් පැවැල්ට උගන්වන ලද ක්‍රමය අනුගමනය කරමින් මිතියා කවුළුවට දෙවරක් සෙමෙන් ද, තුන් වරක් ඉක්මනින් ද තට්ටු කෙළේ ය.

කවුළුවට තට්ටු කරන හඬ අසා තිගැස්සුණු මහල්ලා, හිස හරවා බලා, වහා හුනස්නෙන් නැඟිට කවුළුව ළඟට දිව ගියේ ය මිතියා වහා පඳුර යට සැඟවුණේ. ය මහල්ලා කවුළුව ඇර හිස එළියට දැම්මේ ය.

"ගෘසෙන්කා, ගෘසෙන්කා, උඹ ද ජනේලයට තට්ටු කෙළේ?"යි මහල්ලා සෙමෙන් එහෙත් වෙව්ලන කට හඬින් ඇසුවේ ය. "මගේ සිදේවි කොහෙ ද ඉන්නේ?" බලවත් නොසන්සුන් කමින් සිටි හෙතෙම හුස්ම ගත්තේ අමාරුවෙනි.

"නාකියා ඉන්නේ තනියෙන්"යයි මිතියා තීරණය කර ගත්තේ ය.

"ගෘසෙන්කා, උඹ කොහෙ ද ඉන්නේ?"යි ආයේත් ඇසූ මහල්ලා තව තවත් කවුළුවෙන් එළියට හිස දමා අවට බැලුවේ ය. හැම දෙයක් දෙස ම බැලුවේ ය. වම් පැත්ත බැලුවේ ය.

දකුණු පැත්ත බැලුවේ ය. "මෙහාට වරෙන් ගෘසෙන්කා පොඩි තෑග්ගක් තියෙනවා, වරෙන් පෙන්නන්න."

"නාකියා කියන්නේ රුබල් තුන් දහ ගැන වෙන්න ඕනෑ"යි මිතියා කල්පනා කෙළේ ය.

"කොහෙ ද ඉන්නේ? දොර ලඟ ද? මම දොර අරින්නම්."

මහල්ලා කවුළුවෙන් එළියට පැනීමට සැරසුණේ ය. ඔහු වත්තට ඇතුළු වන දොර දෙස බැලුවේ අඳුර තුළින් දොර දක ගැනීමට මෙනි. වෙනත් විදියකට කියන්නේ නම් ගෘසෙන්කා ගෙන් පිළිතුරක් ලැබීමට කලින් ඔහු දොර ඇරීමට සූදානම් විය.

කවුළුව අයිනේ සැඟවී සිටි මීතියා, මුල් ඇදගත් ගසක් සේ නො සැලී බලා සිටියේ ය. ඔහු දැඩි ව පිළිකුල් කළ, පියා ගේ එල්ලෙන, උගුරු ඇටය, නැමුණු නාසය, කෑදර සිනාවක් රැඳුණු දෙතොල කාමරයේ සිට වැටුණු පහන් එළියෙන් දුටුවේ ය. මීතියා ගේ සිතේ හදිසියෙන් ම දරුණු වෛරයක් ඇති විය, මේ ඉන්නේ තමාට දහසක් වද දුන්, තමා ගේ ජීවිතය විනාශ කළ හතුරා ය. "අයියා කොහොම ද කියන්නේ තාත්තා මරනවාය කියා?"යි අලෝෂා දින හතරකට කලින්, ගෙවත්තේ ලතා මණ්ඩපයේ හිඳ ඇසූ ප්‍රශ්නයට මීතියා පිළිතුරු දෙමින් විස්තර කළේ සිතට හදිසියෙන් ම පැනනැගුණු මේ නපුරු පළිගැනීමේ වෛරය ගැන ය. ඔහු ඒ වෛරය විස්තර කළේ කලින් දැනසිටි දෙයක් විස්තර කරන්නාක් මෙනි. "මා දන්නේ නැහැ. මා දන්නේ නැහැ. සමහර විට මා තාත්තා මරන්නත් පුළුවනි, නොමරන්නත් පුළුවනි. මට භය ඒ මොහොතේ දී හදිසියෙන් ම මගේ සිතේ තාත්තා ගැන පිළිකුලක් ඇති වේ ය කියයි. තාත්තා ගේ දෙකට බෙදුණු නිකට, නහය, අස් දෙක, විළිලැජ්ජා නැති දත් විලිස්-සිල්ල, මට පෙන්නන්න බැහැ. මා බය අන්න ඒකටයි. සමහර විට ඒ මොහොතේ දී මට මගේ කෝපය මැඩගන්න බැරි වෙන්න පුළුවනි.............."

ඒ මොහොතේ දී පියා කෙරෙහි පැවැති පිළිකුල මැඩ ගත නො හැකි තරමට වැඩෙන්නට විය. මීතියා ගේ සිත අවුල් විය. ඔහු වහා සාක්කුවට අත දමා පිත්තල මෝල එළියට ගත්තේ ය.......

★ ★ ★

"ඒ මොහොතේ දෙවියන් වහන්සේ මා දිහැ බලාගෙන සිටියා"යි මීතියා පසු ව කී ය. ඒ මොහොතේ අසනීපයෙන් සිටි ගිරිගෝරිස් අවදි විය. පැවල් විසින් ඉවාන්ට විස්තර කරන ලද බෙහෙත එදා ගිරිගෝරිස් වේලාසනින් ම ගත්තේ ය. එය රහස් වෙදකමකි. ඉතා සැර කසායක් සමග මිශ්‍ර කරන ලද වොඩ්කා, බිරිය ගේ උපකාරය ඇති ව ඇග හැම තැන ම තවරා ගත් ගිරිගෝරිස් ඉතිරි කොටස බිව්වේ ය. බිරිය තමා ගේ අසනීපය ගැන දෙවියන්ට යච්ඤා කරන අතරේ ගිරිගෝරිස් නිදාගත්තේ ය. සැමියා නිදාගත්තාට පස්සේ මාපා ද බෙහෙත් ස්වල්පයක් බීවා ය. සැර බීමවලට වැඩි පුරුද්දක් නැති ඕ මළාක් මෙන් සැමියා ළඟින් වැටී නිදාගත්තා ය.

එහෙත් ගිරිගෝරිස් රෑ හදිසියෙන් ම අවදි විය. මොහොතක් පමණ වේලා කල්පනා කළ හෙතෙම, පිට දිගේ තියුණු වේදනාවක් ඇති වුවත් නැඟිට ඇඳ උඩ හිඳගත්තේ ය. අනතුරු ව ආයේත් කල්පනා කළ හෙතෙම ඇඳෙන් බැස වහා ඇඳගත්තේ ය. 'සොර සතුරු බිය තිබෙන මෙ වැනි කාලයක දී' ගේ දොර ආරක්ෂා නො කර නිදා ගැනීම ගැන කල්පනා වන විට ඔහු ගේ හිට සිත නොසන්සුන් වන්නට ඇත. මී මැස්මොරයෙන් රෝගාතුර වූ පැවල් අනෙක් කාමරයේ මළාක් මෙන් නිදා සිටියේ ය. මාපා ද මළාක් මෙන් නිදා සිටියා ය. "මේ ගැනිට බීම සැර වැඩි යි" ගිරිගෝරිස් බිරිය දෙස බලා කල්පනා කෙළේ ය. අනතුරු ව හෙතෙම ගෙයි පඩි පෙළ බැස එළියට ගියේ ය. ඔහු අදහස් කළේ පඩි පෙළ උඩ සිට වත්ත පිරික්සා බැලීමට ය. පිටේ හා දකුණු කකුලේද හටගත් වේදනාව ඔහුට ඉවසිය නො හැකි ය. එහෙත් එ දින සවස වත්තට ඇතුළුවන කුඩා ගේට්ටුව නොවැසූ බව ඔහුට හදිසියෙන් ම මතක් විය. ඔහු නියම වැඩේ නියම වේලාවට කරන මිනිසෙකි. හවුරුදු ගණන් පැරණි සිරිත්වලට ඇබ්බැහි වූ මිනිසෙකි. වේදනාවෙන් ඇඹරෙමින් හා කොඳුර ගසමින් පඩි පෙළ බැසගත් මහල්ලා ගේට්ටුව ඇරදමා තිබෙන බව දැක නො කල්පනාවෙන් ම වාගේ ඒ දෙසට ගියේ ය. සමහරවිට තමාට යම්කිසිවක් පෙනෙන්නට ඇතැයි ඔහුට කල්පනා වන්නට ඇත. නැති නම් ඔහුට ශබ්දයක් ඇසෙන්නට ඇත. මහ ගෙය දෙස බැලූ හෙතෙම ඇර දමා තිබෙන සවාමියා ගේ කාමරයේ කවුළුව දුටුවේ ය. එ වෙලේ කිසිවෙක් කවුළුව ළඟ නො සිටියේ ය.

"මොකද ජනේලය ඇරලා තියෙන්නේ? ජනේලය අරින්න දැන් ග්‍රීෂ්ම සෘතුව නො වෙයි." ගිරිගෝරිස් කල්පනා කෙළේ ය. ඒ මොහොතේ ඔහු වත්තේ සෙලවන කිසියම් අපූරු දෙයක්

දුටුවේ ය. අඩි හතළිහක් පමණ ඈතින් අඳුර තුළින් දුවන මිනිසකු දුටුවේ ය.

"දෙයිහාමුදුරුවනේ!" කියා කෑගැසූ ගිරිගෝරිස් පිටේ හා කකුලේද වේදනාව මදකට අමතක කොට, මිනිහා අල්ලාගැනීම පිණිස වහා දිව්වේ ය. ඔහු හරස් පාරකින් ගියේ වත්තේ අගලක් පාසා දන සිටි හෙයිනි. දුවන මිනිස් රුව නාන ගෙයි පිටුපස වැට ළඟට ගියේ ය. ගිරිගෝරිස් මිනිස් රුව පිටුපසින් දිව්වේ ය. මිනිස් රුවින් නෙත් ඉවත නොගත් හෙතෙම හැම දෙයක් ම අමතක කොට දිව්වේ ය. ඔහු වැට ළඟට ගියේ මිනිහා වැට නැගීමට සැරසෙනවාත් සමග ය. කෑගැසූ ගිරිගෝරිස් වහා පැන මිනිහා ගේ කකුල දෑතින් ම අල්ලාගත්තේ ය.

ගිරිගෝරිස් ගේ සැකය හරි ගියේ ය. ඔහු මිනිස්රුව ඇඳින ගත්තේ ය. ඔහු භයානක සත්ත්වයෙකි. පිතෘ ඝාතකයෙකි.

ගිරිගෝරිස් අසල්වාසින්ට ඇසෙන්නට "මිනී මරුවෙක්" කියා කෑගැවේ ය. එහෙත් එයට වඩා කෑගැමට ඔහුට ඉඩ නො ලැබිණි. හෙණ පහරක් වැදුණාක් මෙන් හේ බිම ඇද වැටුණේ ය.

මීතියා වහා ආපසු වත්තට පැන, බිම වැටුණු මිනිහා දෙස පහත් වී බැලුවේ ය. ඔහු අතේ තිබුණු පිත්තල මෝල්ගස බිම දැම්මේ කල්පනාවෙන් නො වේ. එය වැටුණේ ගිරිගෝරිස් වැටී සිටි තැනට අඩි දෙකක් පමණ ඈතින්, කාටත් පෙනෙන පාර මැද ය. ඔහු විනාඩි කිපයක් බිම වැටී සිටි මිනිහා පිරික්සා බැලුවේ ය. මහල්ලා ගේ හිස ලෙයින් තෙත් විය. මීතියා හිස අත ගා බැලුවේ ය. තමා මහල්ලා ගේ හිස පැළුවේ ද? නැති නම් මෝල් ගස් පහරින් සිහි නැති කළේ දැ?යි දැනගැනීමට ඔහු තුළ මහත් නොඉවසිල්ලක් තිබුණු බව පසු ව ඔහුට ඉතා හොඳට සඳහන් ව තිබිණි. එහෙත් ඉතා භයානක ලෙස මහල්ලා ගේ හිසින් ලේ ගලන්නට විය. මොහොතක් යන්නට පෙර මීතියා ගේ ඇඟිලි ලෙයින් තෙත් විය. තමා හොලාකෝ මැතිනිය ගේ ගෙදරට යන විට ගෙන ගිය පිරිසුදු ලේන්සුව, සාක්කුවෙන් එළියට ගෙන, උමතු වූවකු මෙන් මහල්ලා ගේ මුහුණේ හා නලලේද රුඳුණු ලේ පිස දමූ බව මීතියාට මතක තිබිණි. මොහොතකින් ම ලේන්සුව ලෙයින් තෙත් විය.

"අනේ දෙයියනේ මා මොනව ද මේ කරන්නේ?"යි මීතියා සිත එක්තැන් කරගනිමින් කී ය. "මා කොහොම ද දැනගන්නේ ගිරිගෝරිස් ගේ ඔළුව පැළුණා ද කියා? ඔළුව පැළුණත්

නොපැළුණත් දූන් මොනවා කරන්න ද ? මම ගිරිගෝරිස් මැරුවා. මා ගිරිගෝරිස් මැරුවා................ අනේ ගිරිගෝරිස්, උඹට මොකක් ද වුණ විපත්තිය ?'' මෙසේ හඬ නගා කී මීතියා, වැට උඩින් පටු මඟට පැන දුවන්නට විය. ලෙයින් තෙත් වූ ලේන්සුව ඔහු දකුණු අතින් මිරිකා ගෙන සිටියේ ය. දුවන අතරේ ඔහු ලේන්සුව කබායේ යට සාක්කුවේ දමා ගත්තේ ය. ඒ අඳුරු මඟ දිගේ ඔහු වහා දිව ගියේ ය. ඔහුට මඟ දී හමු වූ මිනිසුන් සවල්ප දෙනාට, එදා රෑ මිනිහකු පාර දිගේ දිව ගිය බව සඳහන්ව තිබුණේය. මීතියා කෙළින් ම ගියේ ගෲසෙන්කා නතර වී සිටි ගෙදරට ය.

එදා සවස මීතියා ගියාට පස්සේ පෙමියා මුරකරුවාට කතා කොට ''ක්‍රිස්තුන් වහන්සේ ගේ නාමෙට අදත් හෙටත් කපිතාන්ට ගෙට එන්න දෙන්න එපා''යි කීවා ය. මුරකරුවා පොරොන්දු විය. එහෙත් අවාසනාවකට වාගේ ඒ අතරේ මුරකරුවාට ස්වාමි දූ කතා කළා ය. ස්වාමි දූ හමුවීම පිණිස ගෙයි උඩ තට්ටුවට නගින මුරකරුවා, පිටිසර සිට පැමිණි හවුරුදු විස්සක් පමණ වයසැති ඔහු ගේ මුනුපුරාට කතා කොට, තමා ආ පසු පැමිණෙන තෙක් ගේට්ටුව මුර කරන ලෙස කීවේ ය. එහෙත් මීතියා ගැන සඳහන් කිරීමට ඔහුට අමතක විය. මීතියා දිව ගෙන විත් ගේට්ටුවට ගැසුවේ ය. මීතියා මීට කලින් මේ තරුණයාට මුදල් දී තිබිණි. එක් වර ම මීතියා ඇඳිනගත් තරුණයා, ගේට්ටුව ඇර, සිනාසී ''ගෲසෙන්කා ගෙදර නැතැ''යි කීවේ ය.

''ගෲසෙන්කා කොහෙ ද ගියේ?''යි මීතියා ගේට්ටුව ළඟ නතර වෙමින් ඇසුවේ ය.

''පැය දෙකකට පමණ කලින් තිමෝති එක්ක මුක්රෝවට ගියා.''

''මොනවට ද ගියේ?''

''දන්නෙ නැහැ මොනවට ගියා ද කියා. කවුදෝ නිලධාරියෙක් හමුවෙන්න යනවා ය කිව්වා. කවුදෝ ඇයට එන්න ය කියා පණිවිඩයක් එව්වා. යන්න කරත්තයකුත් එව්වා.''

තරුණයා අත හැරිය මීතියා උමතු වූවකු මෙන් පෙමියා සොයා දිව්වේ ය.

පස් වන පරිච්ඡේදය

හදිසි තීරණය

මීතියා යනවිට පෙම්යා ඇගේ මුත්තණියන් සමග මුළු තැන්ගෙයි හිඳ සිටියා ය. ඔවුහු නිදගැනීමට සූදනම් වූ හ. මුර කාරයා මීතියාට ඇතුළු වීමට ඉඩ නො දෙතියි සිතා ඔවුහු ගෙයි දෙර නොවැසූ හ. ගෙට කඩා වැදුණු මීතියා පෙම්යා ගේ ඇගට පැන බෙල්ලෙන් අල්ලා ගත්තේ ය.

"කියාපිය, කෝ ගෘසෙන්කා? ඈ මුක්රෝවට ගියේ කා එක්ක ද?"යි මීතියා කෝපයෙන් කැගා ඇසුවේ ය.

ගැහැනු දෙදෙනා තැති ගෙන විලාප නැගුවෝ ය.

"මං කියන්නම්, කිසි ම දෙයක් හංගන්නේ නැති ව සේරම කියන්නම්. ගෘසෙන්කා මුක්රෝවට ගියේ ඇගේ නිලධරයා එක්කයි" පෙම්යා මරණ භයෙන් කීවා ය.

"මොන නිලධරයා එක්ක ද?"යි මීතියා ගිගුම් දුන්නේ ය.

"ඇගේ නිලධරයා, ඈ ආශ්‍රය කළ නිලධරයා. අවුරුදු පහකට කලින් ඇය අනාථ කළ නිලධරයා"යි පෙම්යා හැකි තරම් ඉක්මනට කීවා ය.

මීතියා තරුණිය ගේ බෙල්ල අත හැරියේ ය. මළ මිනියක් මෙන් සුදු මැලි වූ හෙතෙම ඇය දෙස ගොළු වී බලාසිටියේ ය. පෙම්යා ගේ පළමු වචනයෙන් ම මීතියා හැම දෙයක් ම තේරුම් ගත් බවත්, තමා පත් වී සිටින තත්ත්වය සක්සුදක් සේ පැහැදිලි වූ බවත්, ඔහු ගේ නෙත් දෙස බලා කිව හැකි විය. එහෙත් මීතියාට තමා කී දෙය තේරුණා ද නැද්ද යන්න තේරුම් ගැනීමට තරම් තත්ත්වයක අසරණ පෙම්යා නො සිටියා ය. ඈ තවමත් ට්‍රක් පෙට්ටිය උඩ හිඳ ගෙන සිටියේ තරුණයා ගෙන් ආරක්ෂාවීමට මෙන් දෑත දික් කරගෙන ය. ඇගේ සරුවාංගයම වෙව්ලන්නට විය. ඈ දර දඬු වූවාක් මෙන් එක ඉරිය වුවෙන් ම හිඳ සිටියා ය. මීතියා දෙසට යොමු වූ ඇගේ දෑස සෙලවුණේ ය. මීතියා ගේ අතේ ලේ තැවැරී තිබෙන බව දුටුවාට පස්සේ ඇගේ භීතිය තවතවත් වැඩි විය. මීතියා එන ගමන් ලේ තැවරුණු අතින් දහඩිය පිස දමන්නට ඇත. එ හෙයින් ඔහු ගේ නළලේ හා දකුණු කම්මුලේද ලේ තැවැරී තිබුණේ ය. පෙම්යා සිහි විකල වීමට තරම් තැතිගත්තා ය. මහලු මෙහෙකාරිය මීතියා දෙස බලා සිටියේ තෝත්තු වූවාක් මෙනි.

මොහොතක් පමණ වේලා බලා සිටි මීතියා, පෙමියා අසල පුටුවෙක හිඳ ගත්තේ කිසි ම කල්පනාවකින් නො වේ. තැතිගත් ඔහුට කල්පනා කළ නොහැකි ය. ඔහු ගේ සරුවාංගය ම භීතියෙන් පණ නැති වූවා වැන්න. එහෙත් ඔහුට හැම දෙයක් ම සක් සුදක් සේ පැහැදිලි ය. ඔහු ගෲසෙන්කා ගේ නිලධරයා ගැන දන සිටියේ ය. ගෲසෙන්කා ගෙන් ම අසා දන සිටියේ ය. තමාට නිලධරයා ගෙන් ලියුමක් ලැබුණු බව ගෲසෙන්කා මාසය-කට පමණ පෙර මීතියාට කීවා ය. මෙසේ පුරා මසක් තුළ මේ නිල්ධරයා පැමිණෙන තෙක් මීතියාට රහසින් හැම දෙයක් ම සිදු විය. ඔහු කිසි ම දවසක ගෲසෙන්කා ගේ අලුත් මනමාලයා ගැන කල්පනා නො කෙළේ ය. ඇයි ද කල්පනා නො කෙළේ? නිලධරයා ගැන ඔහුට අමතක වූයේ මන් ද? ඔහු ගැන එක කනකින් අසා අනෙක් කනින් පිට කළේ මන් ද? තැති ගන්වන මහා භයානක දෙයකට මුහුණ පාන්නාක් මෙන් ඔහුට මේ ප්‍රශ්-නයට මුහුණ පාන්නට සිදු විය. ඒ භයානක ප්‍රශ්නය දෙස බලා සිටිද්දී ඔහු ගේ සරුවාංගය ම භීතියෙන් හිතල විය.

මොහොතකට කලින් තමා පෙමියා තැති ගන්වා හිරිහැර කළ බව සම්පූර්ණයෙන් ම අමතක වූවාක් මෙන් මීතියා යළි පෙමියාට දයාවෙන් හා කරුණාවෙන් ද කතා කළේ දයාබර දරුවකුට කතා කරන්නාක් මෙනි. ඔහු පෙමියා ගෙන් ඉතා සියුම් ප්‍රශ්න අසන්නට විය. ඔහු සිටි තත්ත්වය ගැන කල්පනා කරන විට මෙ වැනි ප්‍රශ්න ඇසීම පුදුමයකි. තරුණ කපිතන් ගේ ලේ තැවැරුණු දුත දෙස භීතියෙන් බැලූ තරුණියා ද, සිතේ පුදුමය ඇති කරවන තරම් උනන්දුවෙන් හා ඉක්මනින් හැම ප්‍රශ්නයකට ම පිළිතුරු දුන්නේ සම්පූර්ණ ඇත්ත හෙළි කිරීමට ඇය තුළ මහත් ආශාවක් තිබුණාක් මෙනි. ක්‍රීඩාවකින් විනෝද වන්නාක් මෙන් පෙමියා හැම දෙයක් ම විස්තර කළේ මීතියා ගේ සිතේ ශෝකය ඇති කිරීමට නො ව ඔහුට පිහිට වීම පිණිස ය. එදා දවස පුරා සිදු වූ හැම දෙයක් ම විස්තර කළ පෙමියා රැකිටින් අලෝෂා සමග පැමිණි සැටි ද, තමා ගෙය මුර කළ සැටි ද, අන්තිමේ දී ගෲසෙන්කා නික්ම ගිය සැටි ද, ඇ කවුළුව තුළින් අලෝෂාට කතා කොට තමා මීතියාව පැයකට ආලය කළ බව දන්වන ලෙස කී සැටි ද කීවා ය.

ගෲසෙන්කා තමාට දන්වන ලෙස කී පණිවිඩය ගැන ඇසූ මීතියා හදිසියෙන් ම සිනාසිණි. ඔහු ගේ සුදුමැලි වූ කම්මුල් ඒ සිනාව නිසා රතු විය. මීතියා ගැන දන් මදක්වත් බිය නොවූ පෙමියා මෙසේ කීවා ය.

"බලන්න තමුන්නාන්සේ ගේ අත්වල ලේ"

"ඔව්" යයි කියමින් මීතියා පිළිතුරු දුන්නේ සිත් පිත් නැත්තකු මෙනි. නො සැලකිල්ලෙන් අත් දෙස බැලූ ඔහුට තමා ගේ ලේ තැවරුණු අත් ගැනත්, ඇසූ ප්‍රශ්නය ගැනත් සම්පූර්ණ-යෙන් ම අමතක විය.

මීතියා ආයේත් නිහඬ විය. ඔහු ගෙට කඩා වැදී මිනිත්තු විස්සක් ගත විය. ඔහු තුළ කලින් පැවැති භීතිය දැන් නැත. එහෙත් භීතිය වෙනුවට ඔහු තුළ සථිර අධිෂ්ඨානයක් ඇති වූ බව පෙනේ. සිහිනෙන් සිනාසෙන්නකු මෙන් සිනා සුණු මීතියා හදිසියෙන් ම නැඟී සිටියේ ය.

"මොකද තමුන්නාන්සේට සිද්ද වුණේ?"යි පෙමියා මීතියා ගේ දුත බලා ඇසුවා ය. ඇ ඉතා ආදරයෙන් කතා කළේ ශෝකයෙන් සිටින තරුණයා සැනැසීමට මෙනි. මීතියා ආයේත් අත් දෙස බැලුවේ ය.

"පෙමියා මගේ අතේ තියෙන්නේ ලේ"යි මීතියා කීවේ තරුණිය දෙස පුදුම බැල්මකින් බලමිනි. "අනේ දෙයියනේ මා මෙතනවටද මනුෂ්‍යයකුගේ ලේ හැලුවේ? නමුත් පෙමියා......... තැනක තියෙනවා වැටක්. (ඔහු තරුණිය දෙස ප්‍රහේලිකාවක් තේරවන්නාක් මෙන් බැලුවේ ය.) ඒ වැට බොහො ම උසයි. බලන්න මෙහෙ. ගෙට එළි වූ හැටියේ ම මීතියා ඒ වැට උඩින් පනිනවා...... පෙමියා උඹට මේවා කිසිවක් තේරෙන්නේ නැහැ. ඒකට කමක් නැහැ. ——— උඹට හෙට සේරම දැනගන්න ලැබේ වි. දැන් ඉතින් මම යනවා. මා ගෑසෙන්කාට බාධා කරන්නේ නැහැ. මම අයින් වෙනවා. මා දන්නවා අයින් විය යුතු හැටි. මගේ සිදේවි, සතුටින් ජීවත් වෙසන් ....තුඹ මට පැයකට ආලය කළා......... මිත්යැන්කා අමතක කරන්න එපා....... ....ගෑසෙන්කා මට මිත්යැන්කා කියා නිතර කතා කළා මතක ද?"

මෙසේ කීමෙන් ඉක්බිති ව මීතියා හදිසියෙන් ම මුළුතැන් ගෙයින් පිට වී ගියේ ය. මීතියා ගෙට වැදී තමාට පහර දුන් විට තැති ගත්තාට වඩා මීතියා නික්ම යාමේ දී පෙමියා තැති ගත්තා ය.

තමා ගේ පිස්තෝල දෙක උගස් තැබූ පියෝතර් පර්හෝටින් නමැති සිවිල් සේවකයා හමුවීමට මීතියා ගියේ මිනිත්තු දහයකට පසු ව ය. වේලාව රාත්‍රී අටහමාරට පමණ ඇත. සවස තේ පානය

නිම කළ පියෝතර් බිලියඩ් ක්‍රීඩාව පිණිස නගරයට යාමට සැරසෙන්නේ කබාය දමාගනිමින් සිටියේ ය. මීතියා ඔහු හමු වූයේ කඩයෙන් පිටවෙනවාත් සමග ය.

මුහුණේ ලේ ගාගත් මීතියා දුටු පියෝතර් පුදුමයෙන් කෑගැවේ ය.

"දෙයියෝ සාක්කි! මොකද වුණේ?"

"මම ආවේ මුදල් ගෙවා මගේ පිස්තෝල දෙක ගෙනියන්නයි. මට කළ උපකාරයට බොහෝ ම ස්තුතියි. ඉක්මන් කරලා පිස්-තෝල දෙක දෙන්න. මට යන්න පමා වෙනවා."

තරුණයා පුදුමයෙනුත් පුදුමයට පත් විය. ඒ සමග මීතියා ගේ අතේ බැන්කු නෝට්ටු මිටියක් තිබෙන බව ද ඔහු හදිසි-යෙන් ම දුටුවේ ය. හැරත්, මීතියා මුදල් ගෙනයන විදියට වෙන කිසිවෙක් මුදල් නො ගෙන යයි. දික්කර ගත් දකුණු අතින් ඔහු මුදල් ගෙන සිටියේ තමා ළඟ මුදල් තිබෙන බව පෙන්නීමට මෙනි. මීතියා මුදල් අතින් ගෙන, අත දික්කර ගෙන, ගෙට ඇතුළු වූ බවත්, මඟ දී ද මෙසේ මුදල් ගෙන එන්නට ඇති බවත්, පියෝතර් ගේ සේවකයා වන මීෂා නමැති ළමයා පසු ව කීවේ ය. ඒවා නොයෙක් පාට රූබල් සීයේ නෝට්ටු කොළ විය. මුදල් ගෙන සිටි අතේ ලේ තැවැරී තිබුණේ ය.

මීතියා ළඟ කොපමණ මුදලක් තිබුණේ ද? යි පසු ව ප්‍රශ්න කළ විට, බැල්ලූ බැල්මට මුදල් ප්‍රමාණය මෙපමණ යයි කිව නොහැකි බවත්, නමුත් ලොකු මිටියක් හැටියට පෙනුණ බවත්, පියෝතර් කී ය. "මීතියා පියෝද්‍රවිච් කරමසෝ එ වේලේ හිටියේ අමුතු මිනිහකු හැටියටයි. බීල හිටියේ නැහැ. නමුත් කිසියම් දෙයක් අමතක වුණා වගේ ලොකු ප්‍රීතියකින් හිටියා. යම්කිසිවක් ගැන කල්පනා කරමින්, යම්කිසිවක් සොයමින්, එහෙත්, තිර-ණයකට බැසගැනීමට නොහැකි වූවාක් මෙන් දෙකට දෙවාර නේ සිටින බව මට පෙනුණා. බොහෝ ම කලබලයෙන් හිටියේ. ඔහු ගේ කතාවේ අගක් මුලක් තිබුණේ නැහැ. මහ පුදුම විදියටයි කතා කළේ. සමහරවිට කතගාටුවෙන් නො ව බොහෝ ම ප්‍රීති-යෙන් සිටියා"යි පියෝතර් පසු ව අධිකරණයේ දී සාක්කි දෙමින් කීවේ ය.

"වෙලා තියෙන්නේ මොකද ?"යි පියෝතර් මීතියා දෙස බලා භීතියෙන් ඇසුවේ ය. "මොකද ඇඟ හැම තැන ම ලේ ගාගෙන? වැටිල තුවාල කරගත්ත ද? බලන්න ටිකක් නුඹේ හැටි!"

මෙසේ පැවසූ තරුණයා, මීතියා වැලමිටින් අල්ලා ගෙන කැඩපත ළඟට ගෙන ගියේ ය.

මුහුණේ ලේ තැවැරී තිබෙන බව දුටු මීතියා කෝපයෙන් ඇඳ බැම හකුලා ගත්තේ ය.

"හෙණ ගහන්න! මේක තමයි මගේ අවසානය"යි කෝපයෙන් පැවසූ මීතියා දකුණු අතේ තිබුණු මුදල් වහා වමතට ගෙන අනතුරු ව සාක්කුවට අත දමා ලේන්සුව එළියට ගත්තේ ය. ලේන්සුව ලෙයින් තෙත් වී තිබිණි. (ඔහු ගිරිගෝරිස් ගේ මුහුණ පිස දැම්මේ මේ ලේන්සුවෙන් ය.) එහි ලේ නොතැවැරුණු තුල් පොටක් සොයාගත නො හැකි ය. ලේ මිදී ලේන්සුව ඇලී තිබිණි. එය දිග හැරිය නොහැකි ය. ඔහු කෝපයෙන් ලේන්සුව විසිකෙළේ ය.

"හෙණ ගහන්න, මගේ මුහුණ පිහදන්න රෙදි කෑල්ලක් නැද්ද?"යි ඔහු ඇසුවේ ය.

"එහෙනම් ලේ ගෑවිලා විතරයි! තුවාල වෙලා නැහැ! හෝද ගන්න"යි පියෝතර් කීවේ ය, "මේ තියෙන්නේ බේසම. මම වතුර ටිකක් දමන්නම්."

"මුහුණ හෝදගන්න පුළුවන්නම් බොහො ම හොඳයි.........කොහෙද මේ සල්ලි තියන්නේ?"

මීතියා මෙසේ අතේ තිබුණු මුදල් පෙන්නමින් කීවේ අපූරු විමතියකින් යුතු ව ය. අනතුරු ව ඔහු තරුණයා දෙස විමතියෙන් බැලුවේ තමා ගේ මුදල්වලට කුමක් කළ යුතු දැයි තීරණය කළ යුත්තේ තමා විසින් ම යැයි හඟවන්නාක් මෙනි.

"සාක්කුවේ දමා ගන්න, නැතිනම් මේසය උඩින් තියන්න. නැති වෙන්නේ නැහැ."

'සාක්කුව හොඳයි. සාක්කුවේ දමා ගන්නම්.........මේ සේරම පිස්සු වැඩ"යි මීතියා අනතුරු ව කීවේ කල්පනාවෙන් නිදහස් වූවකු මෙනි. "සේරට ම ඉස්සෙල්ලා අපි අර පිස්තෝල ගනුදෙනුව ගැන තීරණයකට බහිමු. පිස්තෝල දෙක දෙන්න. මෙන්න ඉල්ලගත්ත සල්ලි......... මට ඒ පිස්තෝල බොහෝ ම අවශ්‍යයි...... මට මිනිත්තු එක් වත් පමා වෙන්න බැහැ."

මීතියා මුදල් මිටියේ උඩට ම තිබුණු නෝට්ටුව ගෙන තරුණයාට දුන්නේ ය.

“රූබල් සියක් මාරු කරන්න මා ළඟ සල්ලි නැහැ. මාරු කරපු සල්ලි නැද්ද?”

“නැහැ”යි මිතියා රූබල් මීටිය දෙස බලා කී ය. එහෙත් අනතුරු ව හෙතෙම උඩ තිබුණ නෝට්ටු කීපයක් පෙරළා බැලුවේ තමා ගේ වචනය විශ්වාස කළ නො හැකි වූවාක් මෙනි.

“මාරු කරපු සල්ලි නැහැ. සේරම එක ජාතියේ නෝට්ටු”යි පැවැසූ මිතියා යළි තරුණයා ගේ මුහුණ දෙස විමසිල්ලෙන් බැලුවේ ය.

“කොහොම ද මෙ තරම් ඉක්මනට පොහොසත් වුණේ?” විමසූ තරුණයා අනතුරු ව මෙසේ ද කී ය. “ටිකක් ඉන්න මම මගේ ළමයා පොලෝනිකෝප් ගේ කඩේට යවලා බලන්නම්. කඩේ වහන්නේ රෑ වෙලා. බලමු යවලා මාරු කරන්න පුළුවන් ද කියා! මීෂා මෙහෙ වරෙන්.”

“පොලෝනිකෝප් ගේ කඩේට යවා මාරු කරන එක හොඳයි!” මිතියා හදිසියෙන් ම කිවේ කිසියම් අදහසක් ඇති වූවාක් මෙනි. “මීෂා”යි තෙතෙම කාමරයට පැමිණි ළමයා දෙසට හැරෙමින් කී ය. “ගිහින් කියාපන් මිතියා කරමසෝ දැන් කඩේට එනව ය කියා............. ෂැම්පේන් බෝතල් දුසින් තුනක් ලෑස්ති කරලා තියන්න කියාපන්. මම එදා දුසින් හතරක් අරන් ගියා”යි මිතියා හදිසියෙන් ම පියෝතර් දෙස බලා කිවේ ය. “ළමයා ඔහොම ටිකක් හිටපන්. කේජුයි, කරවලයි, හැම්මුයි, මාළු බිත්තරයි ලෑස්ති කරලා තියන්න කියාපන්. කඩේ තියෙන සේරම කෑම ජාති ඕනෑ කියාපන්. රූබල් සියක් නැතිනම් එකසිය විස්සක් විතර වටිනා කෑම ජාති ඕනෑ කියාපන්............ටිකක් හිටපන් ....පලතුරුත් දමන්න කියාපන්. කැවිලි, පෙයාස්, දිය කොමඩු ගෙඩි දෙක තුනක් හරි හතරක් හරි දමන්න කියාපන්. ....නැහැ එක ගෙඩියක් තිබුණා ම ඇති. තවත් ඕනෑ චොකොලෙට්, දෝසි, කෝපි............ ගිය පාර මම මුක්රෝවට අරන් ගිය සේරම කෑම ජාති ලෑස්ති කරලා තියන්න කියාපන්. ගිය පාර මම රූබල් සීයක ෂැම්පේන් ගෙනිච්චා. මේ පාරත් ඒ විදියටම ගෙනියනවා. මීෂා මා කියාපු දේවල් හොඳට මතක තියා ගනින්. උඹේ නම මීෂා නේද?............මේ ළමයා ගේ නම මීෂා ද?”යි මිතියා පියෝතර් දෙසට හැරෙමින් විමසුවේ ය.

“ටිකක් ඉන්න, තුඹ ම ගිහින් බඩු ගත්ත එක හොඳයි. මේ ළමයා පටලවා ගන්න පුළුවනි”යි මිතියා ගේ කතාව නොසන්සුන් සිතින් අසා සිටි පියෝතර් මිතියා අමතමින් කී ය.

"ඔව්, ඔව්, ළමයා පටලවා ගන්න පුළුවන් බව මම දන්නවා ……… මිෂා මේ වැඩේට මම උඹෙ මුහුණ සිඹින්නයි ලෑස්ති වුණේ………වරද්දන්නේ නැතිව වැඩේ කරගෙන ආවොත් රූබල් දහයක් දෙනවා. දැන් ඉතින් ඉක්මනට පලයන් ……… මතක නැති කරන්න එපා. ෂැම්පේන් තමයි ඕනෑ ම කරන ජාතිය. බ්‍රැන්ඩි ඕනෑ කියාපන්. රතු වයිනුත් ඕනෑ. සුදු වයිනුත් ඕනෑ………එදා ගෙනිච්ච සේරම ජාති ඕනෑ කියාපන්……… කඩ කාරයා දන්නවා………"

"ටිකක් මා කියන දෙය අහන්න"යි පියෝතර් ආයේත් නොඉවසිල්ලෙන් කී ය. මිෂාට කියන්න ඉක්මනට සල්ලි මාරු කරගෙන එන්න ය කියා. ඒ එක්ක ම දැන් ම කඩේ වහන්න එපා ය කියා මිෂා අත පණිවිඩයක් යවන්න පුළුවනි. ඊට පස්සේ පුළුවන් ගිහින් උවමනා දෙයක් ගන්න……… රූබල් සීය දෙන්න………මිෂා ඉක්මනට ගිහින් මේක මාරු කරගෙන වරෙන්."

පියෝතර් ඕනෑ කමින් ම මිෂා පිටත්කර යැව්වේ, මිෂා පුදුම-යෙන් හා බියෙන් දෑස මහත්කොට කට ඇරගෙන මීතියා ගේ ලේ තැවැරුණු මුහුණ දෙස හා මුදල් ගෙන සිටි ලේ තැවැරුණු වෙව්ලන අත දෙසද බලා සිටි හෙයිනි. මිෂාට මීතියා කී දෙය නොතේරුණාට කිසි ම සැකයක් නැත.

"දැන් ඉතින් මුහුණ හෝද ගන්න"යි පියෝතර් තදින් කතා කොට කීවේ ය. "ඔය සල්ලි මේසය උඩ තියන්න. නැතිනම් සාක්කුවේ දමා ගන්න……… අන්න හොඳයි………දැන් ඉතින් මුහුණ හෝද ගන්න………ඊට ඉස්සෙල්ලා කෝට් එක ගලවන්න බලන්න, කෝට් එකේ ලේ ගෑවිලා"යි ඔහු කීවේ මීතියාට කබාය ඉවත් කිරීමට උපකාර වෙමිනි.

"මෙ තැන කෝට් අතේ ලේ ටිකක් ගෑවිලා. එතැන ලේන්සුව තිබුණා. ලේන්සුවේ තිබුණ ලේ කෝට්එකට උරාගන්න ඇති. පෙනියා ගේ ගෙදර දී මම ලේන්සුව උඩ ඉඳගන්න ඇති. ලේන්-සුව තද වුණ නැතින් ලේ උරාගන්න ඇති." මෙසේ මීතියා කබායේ ලේ ගෑවුණු සැටි විස්තර කළේ කුඩා දරුවකුට සමාන කල්පනාවෙන් යුතු ව ය. එය පුදුම විමට දෙයකි. කතාව අසා සිටි තරුණයා රවා බැලුවේ ය.

"කෝලාහලයක් කරන්න ඇති!"යි පියෝතර් කී ය.

මීතියා මුහුණ සෝදන්නට පටන් ගත්තේ ය. තරුණයා ජෝගුවෙන් වතුර වක්කළේ ය. කලබලයෙන් සිටි මීතියා සබන් ගා අත සෝද ගත්තේ ය. (මීතියා ගේ අත වෙව්ලන්නට විය. ඒ බව තරුණයාට පසුව සඳහන් වී ය.) හොඳට සබන් ගා අතුල්ලා සෝදගන්නා ලෙස හෙතෙම බලකර සිටියේ ය. වෙලාව ගත වනවාත් සමග පියෝතර් ගේ කතාව මීතියා කෙරෙහි බල පැවැත්වූ බව පෙනේ. ඔහු ප්‍රබල චරිතයක්ඇත්තකු බව සඳහන් කළ යුතු ය.

"බලන්න, නියපොතු හෝද ගත්තේ නැහැ. දැන් ඉතින් හොඳට මුහුණ හෝද ගන්න..........කන ලඟයි, කළලයි, හෝද ගන්න........ඔය කමිසය ඇඳගෙන යන්න ද කල්පනාව? බලන්න දකුණු අතේ හැම තැන ම ලේ ගෑවිලා."

"ඔව්, හැම තැන ම ලේ ගෑවිලා"යි මීතියා කීවේ කමිස අත දෙස බලමිනි.

"එහෙනම් කමිසය මාරු කරන්න."

"වෙලාවක් නැහැ..........."යි මීතියා තුවායෙන් මුහුණ හා දෑත පිස දමා කබාය දමා ගනිමින් කීවේ ය. "වැලමිට දක්වා කමිස අත උස්කර ගන්නම්. එතකොට කමිස අත කෝට් අතට වැහෙනවා.......... දැන් ඉතින් පේන්නෙ නැහැ නේ ද?"

"දැන් ඉතින් කියන්න, කා එක්ක ද කෝලාහල කරගත්තේ? ආයෙත් තැබෑරුමක ගහගත්තද? ආයේත් අර නාකි කපිතාන්ට ගැහැව්ව ද?"යි පියෝතර් දෙස් කියන්නාක් මෙන් ඇසුවේ ය. "කාවද ගැහැව්වේ..........නැතිනම් කවුරුවත් මැරුව ද?"

"පිස්සු ද?"

"ඇයි එහෙම අහන්නේ?"

"තරහ වෙන්න එපා"යි පැවැසූ මීතියා හදිසියෙන් ම සිනා සුණේ ය. "මා දැන් ටිකකට කලින් කඩ පොළේ දී නාකි ගෑනි-යකට ගැහැව්වා."

"නාකි ගෑනියකට ගැහැව්වා?"

"ගෑනියක් නොවෙයි, මිනිහෙක්." මීතියා පියෝතර් ගේ මුහුණ බලා කීවේ ය. ඔහු තරුණයාට උස් හඬින් කතා කළේ බිහිරකුට කතා කරන්නාක් මෙනි.

"ඇත්ත කියන්න. ගැහැව්වේ නාංකි ගෑනියකට ද? මිනිහකුට ද? කවුරුත් මැරුව ද?"

"අපි සමාදන වුණා. ....කෝලාහලයක් කරගෙන පසු ව සමාදන වුණා. අපි වෙන් වුණේ යාළුවන් හැටියටයි......... මිනිහා මෝඩයා... මිනිහා මට සමාව දුන්නා.................. මෙලහකට සමාව දෙනව ඇති. නමුත් මිනිහට නැගිටින්න පුළුවන් වුණා නම් මට සමාව දෙන්නේ නැහැ." අනතුරු ව අතින් ඉඟියක් කළ මිතියා "ඒ මිනිහා යකාට ගිය දෙන්, ඒ මිනිහා ගැන කරදර වෙන්න එපා. මේ වේලාවේ කරදර වෙන්න මා කැමැති නැහැ"යි කීවේ ය.

"මොකද හැමෝ ම එක්ක කෝලාහල කරන්නේ? කිසි ම හේතුවක් නැති ව අර නාංකි කපිතාන්ට ගැහැව්වා නේද?...... දැනුත් කා එක්ක ද කෝලාහලයක් කරගෙන ස්වාරියක් යන්න හදනවා. ෂැන්පේන් දුසිම් තුනක් මොනවට ද?"

"හුරේ! දැන් ඉතින් මගේ පිස්තෝල දෙක දෙන්න. මට යන්න පමා වෙනවා. කතා කරන්න මම බොහො ම කැමැතියි. නමුත් වෙලාවක් නැහැ. දැන් බොහො ම පමා වුණා, කෝ මගේ සල්ලි කොහෙ ද දැම්මේ?"යි මිතියා සාක්කුවලට අත දමමින් ඇසුවේ ය.

"ඇයි සල්ලි මේසය උඩ තිබ්බා මතක නැද්ද?............ මෙන්න තියෙනවා. නුඹට මුදල්වල කිසි ම වටිනා කමක් නැහැ! මෙන්න තියෙනවා පිස්තෝල දෙක. මේක මහ පුදුම දෙයක් නොවැ. සවස හයට මේ පිස්තෝල දෙක රුබල් දහයකට උගස් තිබ්බා. නමුත් දැන් ළඟ රුබල් දෙ තුන්දහක් තියෙනවා."

"තුන්දහක් තියෙනවා"යි මිතියා සාක්කුවට මුදල් දමා ගනිමින් කී ය.

"මුදල් නැති කරගන්න එපා. මොකද රත්රන් ආකරයක් ලැබුණ ද?"

"ආකරයක්? රත්රන් ආකරයක්?"යි මහ හඬින් කෑගා ඇසූ මිතියා අනතුරු ව සිනාසෙන්නට විය. "කැමැති ද රත්රන් ආකරවලට යන්න? යනවා නම් රුබල් තුන්දහක් දෙන්න කැමැති ගෑනියක් මේ ගමේ ඉන්නවා. ඈ මුදල් දෙනවා ය කියා මටත් පොරොන්දු වුණා. ඈ රත්රන් ආකරවලටත් බො-

හොඳ ම කැමැතියි, හොලාකෝ මැතිනිය අඳුනනවාද? හෙට එළි වූ හැටියේ ම හොලාකෝ මැතිනිය ලඟට ගිහින් ඈ මට රූබල් තුන්දහසක් දුන්න ද නැද්ද කියා අහන්න."

"මොන කොන්දේසියක් උඩ ඈගෙන් මුදල් ගත්ත ද කවුද දන්නේ.........තුඹෙ කතාවෙ හැටියට මා හිතන්නේ ඈ තුඹට දෙන්න ඇති. මුදල් අරන් සයිබීරියාවට යනවා වෙනුවට නාස්ති කරනවා.........හැබැට ම කොහෙ ද යන්න ලෑස්ති වෙන්නේ?"

"මුක්රෝවට යන්න."

"මේ රෑ මුක්රෝවට යන්න?"

"ජයේ හිටිය හිගන්නා අද පොහොසතා!"යි මීතියා හදිසියෙන් ම කීවේ ය.

"අද ඔච්චර සල්ලි තියාගෙන කොහොම ද හිගන්නෙක් කියන්නේ?"

"මා කිව්වේ සල්ලි ගැන නො වෙයි. සල්ලි යකාට ගියදෙන්, මා කිව්වේ ගැහුන්ගේ හිත ගැනයි.

ගැහැනුන් ගෙ සිත

වංක ය, චපල ය,

දුසිරිතෙන් පිරුණෙ ය.'

මේක කීවේ යුලිසස්. මා ඒ අදහසට සම්පූර්ණයෙන් ම එකගයි" "කියන දෙය තේරුම් ගන්න අමාරුයි."

"මොකද මට වෙරි ද?"

"වෙරිවෙලා නැහැ. නමුත් වෙරි වුණාට හපන්."

"මා ජීවිතයෙන් මත් වෙලා. නමුත් ඒ ඇ-ද."

"මොකද තුඹ කරන්නේ? පිස්තෝලවලට වෙඩි බේත් පුරවනවා ද?"

"ඔව්, පිස්තෝලවලට වෙඩි බේත් පුරවනවා."

මීතියා වෙඩි බේත් ගෙන පරිස්සමින් පිස්තෝලයට දමා, තද කොට, උණ්ඩය දමන්නට කලින් එය ඇඟිලි දෙකින් ගෙන ඉටිපන්දම් එළියට අල්ලා බැලුවේ ය.

"මොකද උණ්ඩය දිහා බලන්නේ?"යි පියෝතර් නොයිවසිල්ලෙන් හා කුතුහලයෙන් විමසුවේ ය.

"නිකම් හිතුණා බලන්න. යම් විදියකින් නුඹ මේ උණ්ඩය මොළය ඇතුලට දමාගන්න හදනවා නම් ඊට ඉස්සෙල්ලා උණ්ඩය දිහා බලනවා ද නැද්ද?"

"මොනවට ද බලන්නේ?"

"මේ උණ්ඩය මගේ මොළය ඇතුලට යනව. ඊට ඉස්සෙල්ලා ඒක කොයි විදියේ දෙයක් ද කියා බැලීම වැදගත් කාරුණක්. නමුත් ඒක මෝඩ කල්පනාවක්. ඒ මොහොතේ දී ඇති වූ මෝඩ කල්පනාවක්. දැන් ඉතින් සේරම ඉවරයි" මෙසේ පැවැසූ මීතියා පිස්තෝලයට වෙඩි බෙහෙත් පුරවා නිම කෙළේ ය. "මිත්‍රයා මං කිවේ කිසි ම තේරුමක් නැති කතාවක්. දැන් ඉතින් මට පොඩි කොළ කෑල්ලක් දෙන්න."

"මෙන්න තියෙනවා කොළයක්."

"නැහැ, ලියුම් ලියන අලුත් කඩදාසියක් දෙන්න.............. ඒක හොඳයි."

මේසය උඩ තිබුණ පෑන ගත් මීතියා, ඉතා ඉක්මනට පේළි දෙකක් ලියා, කොළය හතරට ම නමා සාක්කුවේ දමාගත්තේ ය. අනතුරු ව හෙතෙම පිස්තෝල පෙට්ටියේ දමා අතට ගෙන කල්පනාවෙන් සිනා සි තරුණයා දෙස බැලුවේ ය.

"දැන් ඉතින් යමු."

"කොහෙ ද යන්නේ? නැහැ ටිකක් ඉන්න.........මොකද ඔය උණ්ඩය මොළය ඇතුලට දමා ගන්නවා ය කිව්වේ?"යි පියෝතර් නොසන්සුන් කමින් විමසුවේ ය.

"එහෙම දෙයක් නැහැ. මම බොරුවක් කිව්වේ. මම ජීවත්වෙන්න කැමැතියි. මම ජීවිතයට බොහො ම ආදරෙයි. මම සූරියාටත්, සූරියා ගේ උණුසුම් ආලෝකයටත් බොහො ම ආදරෙයි. නුඹ මග හැර යන්න දන්නවා ද?"

"මොකද මග හැර යනවා ය කියන්නේ?"

"තමා ගේ හිතවත් කෙනෙකුටයි, තමා නොකැමති කෙනෙකුටයි ඉඩ දී ඈත් වන්න. මා කැමැති නැති තැනැත්තා හිතවතකු හැටියට පිළිගන්න. 'මග හැර යනවාය' කියන කතාවේ

තේරුම ඒකයි. මා මෙහෙම සිටින අතර නුඹලා දෙයියන්ගේ පිහිටෙන් සහතින් සිවපල්ලා කියන්න.........''

''කොහොම සිටින කොට ද?''

''ඔය ඇති කතා කළා. දැන් ඉතින් යමු.''

''දෙයියන්ට පිං සිද්ධවෙන්න, ඔය ගමන යන්න එපා. මොනවටද මේ වෙලාවේ මුක්රෝවෙට යන්නේ?''

''එහෙ ගැනියක් ඉන්නවා.........ප්‍රශ්න ඇහැව්වා ඇති. දැන් ඉතින් කතා නො කර යමු.''

''නුඹ ම්ලේච්ඡයකු වුණත් මම නුඹට බොහෝ ම කැමැතියි. ....කොහොම වුණත් මට නුඹ ගැන බයයි.''

''මිත්‍රයා, තමුසේට බොහෝ ම ස්තුතියි. මම ම්ලේච්ඡයෙක්, මා හැම තිස්සේම කියන්නේ ඕක තමයි. ආ, මේ එන්නේ මීෂා, මට මීෂා ගැන අමතක වුණා.''

නෝට්ටු කොළ ගොඩක් අතින් ගෙන දිව ආ මීෂා කඩේ බඩු ලැස්ති කරන බව කීවේ ය. ''ඒ ශෙල්ලෝ බෝතල් මාළු, තේ කොළ, ගෙනල්ලා තව විකකින් සේරම ලැස්ති කරාවී.'' රූබල් දහයේ කොළ දෙකක් ගෙන පියෝතර්ට දුන් මීතියා තවත් රූබල් දහයේ කොළයක් ගෙන මීෂා දෙසට විසිකෙළේ ය.

''එපා ඔය වැඩේ කරන්න.''යි පියෝතර් විරුද්ධ වෙමින් කී ය. ''මේක නරක පුරුද්දක් වෙනවා. මගේ ගෙදර ඔවැනි දෙයක් කරන්න මම ඉඩ දෙන්නේ නැහැ. ළමයට දුන්න සල්ලි තියා ගන්න. මොනවට ද නිකරුණේ මුදල් නාස්ති කරන්නේ? හෙට මුදල් උවමනා වේවි. මගෙන් රූබල් දහයක් ඉල්ල ගන්න නුඹ හෙට එන්න පුළුවනි. මොනවට ද ඔය සාක්කුවේ මුදල් දමා ගත්තේ? නැති වෙන්න පුළුවනි.''

''මිත්‍රයා, අපි දෙන්න ම මුක්රෝවට යමු.''

''මං මොනවට ද යන්නේ?''

''අපි ෂැම්පේන් බෝතලයක් බොමු. මා කැමතියි නුඹ එක්ක අඩියක් ගහන්න. මා නුඹ එක්ක කවදාවත් අඩියක් ගහලා නැහැනේ ද?''

''හොඳයි එහෙනම් අපි ටවුමට යමු. මා ටවුමට යන්නයි ලැස්ති වුණේ.''

"මට වවුමට යන්න වෙලාවක් නැහැ. අපි කඩේ පිටිපස්සේ තියෙන කාමරයට ගිහින් අඩියක් ගහමු. මම තුඹෙන් තේරවිල්ලක් අහන්න ද?"

"කැමති එකක් අහන්න."

මීතියා සාක්කුවට අත දමා කොලයක් ගෙන දිග හැර පෙන්නුවේ ය. එහි ලොකු අකුරින් මෙසේ ලියා තිබිණි.

"මගේ මුළු ජීවිතය නිසා මම මට ම දඬුවම් කරගනිමි. මම මුළු ජීවිතයට දඬුවම් කරමි"යි පියෝතර් කොළයේ ලියා තිබුණු දෙය කියෙව්වේ ය.

"දැන් වවුමට යන්න වෙලාවක් නැහැ. යමු අඩියක් ගහන්න"

කඩය තිබුණේ මහ මග කෙළවර ය. එය විශාල සිල්ලර කඩයකි. එය අපේ නගරයේ තිබුණු විශාල ම කඩයයි පොහොසත් වෙළෙන්දකු සතු එම කඩය එ තරම් නරක නෑ. නොයෙක් වයින් ජාති, පලතුරු, සුරුට්ටු, තේකොළ, සීනි, කෝපි ආදී පීටස්බර්ග් පුරයේ තිබෙන හැම බඩුවක් ම වාගේ මේ කඩේ තබා විකුණන ලදි. බඩු විකුණන මිනිසුන් තිදෙනකු හැර පණිවිඩ ගෙන යන ළමයි දෙ දෙනෙක් කඩේ වැඩ කළහ. අපේ නගරය බොහො ම දුප්පත්. ඉඩම් හිමියෝ ඉඩ කඩම් අත්හැර දමා යති. වෙළෙඳාම අඩු වූවත් කඩය සාර ය. හැම හවුරුද්දක් පාසා ම ලාභ වැඩි විය. කඩයෙන් බඩු ගන්නා අය බොහෝ වූහ.

කඩේ ඇත්තෝ මීතියා පැමිණෙන තෙක් නොයිවසිල්ලෙන් බලා හුන්හ. සති දෙක තුනකට කලින් මීතියා රූබල් සිය ගණනක වයින් සමග නොයෙක් බඩු ගෙන ගිය සැටි ඔවුන්ට හොඳට මතක ය. (ඔවුහු මීතියාට කවදාවත් ණයට බඩු නොදුන් හ.) එදා මෙන් අද ද මීතියා ළඟ රූබල් සීයේ නෝට්ටු මිටියක් තිබුණු බව ඔවුන්ට සඳහන් ව තිබිණි. මීතියා මිල නොවිමසා කියාපු ගණනකට ගනිමින්, තමාට මෙ තරම් බීම වගී හා බඩු කුමකට දැයි කල්පනා නො කර මුදල් වියදම් කළ බව ඔවුන්ට මතක ය. ගෘසෙන්කා සමග මුක්රෝවට ගිය මීතියා එක රැයට රූබල් තුන්දහක් වියදම් කොට පසුව ද අතේ සතේ නැති ව පැමිණි බව නගරය පුරා පැතිර ගියේ ය. මීතියා, එකල අපේ ගම අසල වාඩිලා සිටි අහිකුණ්ටකයන් කණ්ඩායමක් ගෙන ගියේ ය. සුරාවෙන් මත් වී සිටි මීතියා ගෙන් ඔවුහු කිසි ම අමාරුවක් නැති ව මුදල් සොරා ගත්හ. ලෝභ කමින් තොර ව මිල අධික වයින් වගී පානය කළහ. මීතියා දුලි කුණු තවරාගත් ගැමියන්ට

ෂැන්පේන් දුන් බවත්, ගැමි තරුණියන්ට හා කෙල්ලන්ට රස කැවිලි දුන් සැටිත් විස්තර කරමින් ගම් වාසීහු සිනා සුණහ. මීතියා ඉදිරිපිට සිනා සීම භයානක දෙයකි. එ හෙයින් ඔවුහු මීතියා නැති තැන සිනාසුණහ. වෙසෙසින් ම තැබෑරුමේ දී සිනාසුණහ. මෙ තරම් වියදම් කිරීමෙන් පසුවත් ඔහුට ඉඩ ලැබුණේ ගෘසෙන්කා ගේ පය සිඹීමට බවත්, එයට වඩා කිසිවක් කිරීමට ඇ ඉඩ නුදුන් බවත් ඔවුහු කීහ.

කඩයට ලගාවන මිත්‍රයන් දෙදෙනාට අසුන් තිදෙනකු යොදන ලද රථයක් හමු විය. අශ්වයන් ගේ කරේ ගෙජ්ජි එල්ලා තිබිණි. ඇන්ඩි නමැති එහි රියැදුරා මීතියා පැමිණෙන තෙක් කඩේ දොර ලග බලා සිටියේ ය. කඩේ ඇත්තෝ පෙට්ටියක බඩු අහුරා අවසන් කොට, ඇන ගසා වසා කරත්තයට පැටවීමට මීතියා පැමිණෙන තෙක් බලා හුන්හ. පියෝතර් පුදුම විය.

"මෙ තරම් ඉක්මනට මේ කරත්තය ආවේ කොහෙ ඉඳලද?"යි ඔහු මීතියා ගෙන් ඇසුවේ ය.

"නුඹ හමුවීමට එන කොට මග දී මට ඇන්ඩි මුණ ගැසුණා මම මිනිහට කිව්වා කෙළින් ම කඩේ ළගට එන්න ය කියා. පමා වෙන්න බැහැ. ගිය පාර මම මුක්රෝවට ගියේ තිමෝති එක්කයි. නමුත් අද තිමෝති ගෘසෙන්කා එක්ක ගිහින්......... ඇන්ඩි මුක්රෝවට යන්න අපට පමා වෙයි ද?"

"ඒ ගොල්ලෝ පැයකට විතර ඉස්සෙල්ලා මුක්රෝවට යාවි. ඒකත් විශ්වාස කරන්න බැහැ. මෑයි තිමෝතිව යැව්වේ. මිනී හගෙ කෙරුවාව මං දන්නවා. මිනිහට බැහැ අප එක්ක තරගෙට යන්න. කොහොම ද මිනිහ යන්නෙ! අපට පැයකට ඉස්සෙල්ලා ඒ ගොල්ල යන්නෙ නැහැ"යි කබායක් ඇඳගත් රතු හිස කෙසින් යුත්, මැදි වියෙහි සිටි රියැදුරා හිතවත් කමක් දක්වා කී ය.

"අපි ඒ ගොල්ලන්ට පැයකට පසු ව ගියොත් මම උඹට වොඩ්කා බොන්න රූබල් පනහක් දෙනවා."

"පැයක් මොනවට ද, පැය භාගයකට ඉස්සෙල්ලා යනවා."

මීතියා බඩු සෝදිසි කරමින් ඒ මේ අත යන අතර කළ කී දෙයෙහි කිසි ම සබඳකමක් නො තිබිණි. ඔහු වාක්‍යයක් පටන් ගනියි. එහෙත් වාක්‍යය අවසන් නො කරයි. අවසන් කිරීමට පෙර වාක්‍යයේ අවසානය අමතක වෙයි. එ හෙයින් මීතියාට උපකාර වීමට පියෝතර්ව සිදු විය.

"හරීසට ගිය පාර වගේ මේ පාරත් රුබල් හාරසීයක කෑම බීම ඕනෑ. රුබල් හාරසීයට අඩුව එපා. හරීසට ගිය පාර වගේ ෂැම්පේන් දුසිම් හතරක් ඕනෑ. එක බෝතලයක් වත් අඩු කරන්න එපා."

"මෙච්චර බඩු ගොඩක් මොනවට ද? විකක් ඉන්න. මොනව ද මේ පෙට්ටියේ තියෙන්නේ? රුබල් හාරසීයක බඩු මේ පෙට්ටියේ නැහැ."

කලබල සහිත පුද්ගලයකු වූ කඩකාරයා ආරූඪ කරගත් බොරු කරුණාවක් දක්වමින්, පළමුවන පෙට්ටියේ තියෙන්නේ ෂැම්පේන් බෝතල දුසිම් භාගයක් හා කෑවිලි පෙවිලි ආදී අත්‍යවශ්‍ය කෑම වර්ග බවත්, බඩුවල වැඩි හරිය මීතියා ගොස් පැයකට කලින් ලැබෙන්නට, ගිය වතාවේ මෙන් ට්‍රොයිකාවක පටවා එවන බවත් කී ය.

"පැයකට වැඩිය පරක්කු වෙන්න බැහැ. වැඩි පුර පලතුරුයි, කෝපියි, දමන්න මතක නැති කරන්න එපා. එහෙ ඉන්න කෙල්ලෝ ඔය වගේ කෑමවලට බොහො ම කැමැතියි" මීතියා හිතවත් කමක් දක්වා කී ය.

"කෝපි ගෙනිච්චට කමක් නැහැ, නමුත් ෂැම්පේන් දුසින් හතරක් මොනවාට ද? දුසිමක් ඇති"යි තිලධරයා අසතුටින් කී ය. කෑම බීමවල මිල ගැන ප්‍රශ්න කළ හෙතෙම අනතුරු ව ගත්ත බඩුවලට රිසිට්ටුවක් ඉල්ලා සිටියේ ය. ඔහු නිහඬ කළ නො හැකි වි ය. එහෙත් ඉන් ඔහුට හැකි වූයේ මීතියා කෑම බීම සඳහා වියදම් කළ මුදල්වලින් රුබල් සීයක් අඩු කර දීම පමණි. රුබල් තුන්සීයක බඩු ගැනීමට අන්තිමේ දී තීරණය කරගන්නා ලදී.

"තුඹට හෙණ ගැහැව්වත් මට තියෙන අමාරුව මොකක්ද?" පියෝතර් කීවේ මීතියාට මෙතෙක් වේලා දක්වූ හිතවත් කම වෙනස් කරගත්තාක් මෙනි. "තුඹ සල්ලි නාස්ති කළාට මට තියෙන අමාරුව මොකක් ද? අගය නැති නම් සල්ලි විසිකර දමන්න. මට කමක් නැහැ."

"මගේ අවිශ්වාසත්‍රාසයා, තරහ ගන්නේ නැති ව කරුණාකර මෙහාට එන්නෑ"යි කියමින් මීතියා තරුණයා කඩේ පිටිපස්සේ තියෙන කාමරයට කැඳවා ගෙන ගියේ ය. "අපට මෙ තැනට බෝතලයක් ගෙනත් දේවි. අපි ඒ බෝතලේ රහ බලමු. මිත්‍රයා එන්න මා එක්ක යන්න. තුඹ බොහොම හොඳ කෙනෙක්. මා කැමැති තුඹ වගේ අයටයි."

අපිරිසුදු රෙද්දකින් වසනලද කුඩා මේසයක් ලඟ වේවැල් පුටුවක මීතියා හිඳගත්තේ ය. පියෝතර් අනෙක් පුටුවේ හිඳගත් පසු ෂැම්පේන් බෝතලය ගෙනෙන ලදී.

"මහත්වරුනි, දැන් ගෙනාපු ඉස්තරම් ම වර්ගයේ මුහුදු බෙල්ලන් කන්න කැමැති ද?" කඩකාරයා ඇසුවේ ය.

"බෙල්ලන් යකාට ගිය දෙන්, මම බෙල්ලන් කන්නේ නැහැ. අපට කිසි ම දෙයක් එපා." තරුණයා කෝපයෙන් කී ය.

"අපට බෙල්ලන් කන්න වෙලාවක් නැහැ. මට බඩගිනි නැහැ. මිත්‍රයා, මා ඔය වගේ අවුල්වලට වැඩිය කැමැති නැහැ"යි මීතියා කිවේ හදිසියෙන් ම අවදි වූ හැඟීමෙන් යුතු ව ය.

"කවුද කැමැති වෙන්නේ? ගොඩේ මිනිසුන්ට දෙන්න ෂැම්පේන් දුසිම් තුනක් ගන්න බව දැනගන්න ඕනෑ ම කෙනෙකුට තරහ යන්නේ නැද්ද?"

"මා අදහස් කළේ ඒක නො වෙයි. මා කීවේ ඊට වඩා උසස් දෙයක් ගැනයි. මා කිසි ම පිළිවෙතක් තියෙන මිනිහෙක් නො වෙයි............මේ ගැන කතා කරල වැඩක් නැහැ. දැන් පමා වුණා වැඩියි. ඒක යකාට ගිය දෙන්. මගේ මුළු ජීවිතය ම ලොකු අවුලක්. ඒ අවුල නිරවුල් කරගන්න ඕනෑ.............මා කිවේ දෙපැත්ත කැපෙන කතාවක් ද?"

"නැහැ, නුඹ පිස්සුවෙන් දොඩනවා."

හැමට ම උතුම් වූ
මා හද තුළේ වෙසෙනා
දෙවිදුන් හට මගේ මේ-කිත්සිරි වදන් වේ වා!

මෙක මගේ හදවතින් උපන් කවියක්. ඒක කවියක් නො වෙයි. දූසෙන් ගලන කඳුළු...........කඳුළු හැදුවේ මායි............ කපිතන්ගේ රැවුලෙන් ඇදගෙන යන කොට හදපු කවියක් නො වෙයි."

"ඇයි හදිසියෙන් ම කපිතන් ගැන මතක් කළේ?"

"කපිතන් මතක් කළේ විහිළුවටයි. හැම දෙයක්ම තනා තියෙන්නේ සම තත්ත්වයකටයි. කොටින් කතාව එච්චරයි."

"නුඹ දන්නවා මට නුඹේ පිස්තෝල ගැන කල්පනා වෙනවා."

''ඒකත් විහිළුවක්. අඩියක් ගහලා ඔය කතාව මතක නැති කරල දමන්න. මම ජීවත්වීමට බොහො ම කැමැතියි. ඕනෑවට වඩා කැමැතියි. නින්දුවක්වන තරමට කැමැතියි. ඔය ඇති දෙඩුවා දුන් ඉතින් ජීවිතයට සව්දිය පතා අඩියක් ගහමු.මම සව්දිය පතන්නම්. මා මොකද මගේ ජීවිතය ගැන මෙ තරම් සතුටක් දක්වන්නේ? මම තක්කඩියෙක්. එහෙත් මා ගැන මා තුල ලොකු සතුටක් තියෙනවා. මා තක්කඩියෙක් ය යන අදහස මගේ සිතට ලොකු වේදනාවක්. මම දෙවියන් වහන්සේ ගේ මැවිල්ලට ආසිරිවාද කරනවා.........දෙවියන් වහන්සේටත් එතුමා මවාපු ලෝකයටත් කෙලින් ම ආසිරිවාද කිරීමට මා සූදානම් .... නමුත් අනෙක් අය ගේ ජීවිත කාලකණ්ණි කරන අවැඩදායක එක පුද්ගලයකු ගේ ජීවිතය මා නැති කළ යුතුයි......... ...... සහෝදරයා අපි ජීවිතයට සව්දිය පතාඅඩියක් ගහමු. ජීවිතයට වඩා අගනා දෙයක් තියෙනවා ද? කොහෙත් ම නැහැ. ඒ නිසා රජිණියන් ගේත් රැජිණ වූ ජීවිතයට සව්දිය පතා අපි අඩියක් ගහමු.''

''හොඳයි අපි ජීවිතයට සව්දිය පතා බොමු. කැමැති නම් තුඹේ රජින ගේත් සව්දිය පතා බොමු.''

මිත්‍රයෝ දෙදෙනා හැන්පේන් විදුරුව බැගින් පානය කලහ මිතියා නොසන්සුන් විය. ත්‍යාගශීලී විය. ඒ අතරේ ශෝකාකුල විය. කිසියම් විනාශදායක අවුලකින් ඔහු ගේ සිත බර වූවාක් මෙන් පෙනේ.

''මීෂා........ ...මීෂා මෙහාට වරෙන්, හෙට උදේට පායන සූර්යයා ගේ සැපත පතා පොඩි අඩියක් ගහපන්.''

''ඒ ළමයට බොන්න දෙන්න එපා''යි පියෝතර් විරුද්ධ වෙමින් කී ය.

''ඒකට කමක් නැහැ. මම ටිකක් බොනවා.''

මෙසේ කී මීෂා විදුරුව හිස් කොට හිස නමා ආචාර කොට කාමරයෙන් එළියට දිව්වේ ය.

''මීෂාට කවදාවත් මේක අමතක වෙන්නේ නැහැ''යි මිතියා කී ය. ''ගැහැනිය, මම ගහැනියට ආදරෙයි. ගැහැනිය කියන්නේ කුමකට ද? මැවිල්ලේ රජිණියටයි. මගේ හිතේ ලොකු කනගාටුවක් තියෙනවා. හැම්ලට් නාටකය මතක ද? 'යහපත් හොරේෂෝ මට හොහෝ ම කනගාටුයි. අහෝ යෝරික්!' කියන්නේ යෝරික්

මං දන් හෝරික් වුණාට පසු ව හිස් කබලක් වෙනවං.''

පියෝතර් නිහඬ ව අසා සිටියේ ය. මීතියා ද මඳ වේලාවක් නිහඬ ව සිටියේ ය.

"මෙහෙ හොඳ ලස්සණ බල්ලන් ඉන්නව ද?''යි මීතියා කඩ කාරයාගෙන් ඇසුවේ කාමරයේ මුල්ලේ හිඳින තද කළු පාට ඇස්වලින් යුත් බලු පැටවකු දුටු පසුව ය.

"මේ බලු පැටියා අපේ නෝනා මහත්මයාගෙයි''යි කඩ-කාරයා පිළිතුරු දුන්නේ ය. "මතක නැති ව දමා ගිහින්. ආපසු යවන්න ඕනෑ.''

"මා දක්කා මේ විදියේ බලු පැටියෙක් අපේ රෙජමේන්තුවේ ඉන්නවා''යි මීතියා සෙමෙන් කීවේ සිහිනෙන් කතා කරන්නකු මෙනි. "උගේ පස්ස කකුල කැඩිලා.............. ඒක නො වෙයි මිත්‍රයා තමුසේගෙන් ඇසිය යුතු ප්‍රශ්නයක් තියෙනවා. කවදාවත් හොරකම් කරලා තියෙනව ද?''

"හැබෑ ප්‍රශ්නයක් නො ව අහන්නේ!''

"නැහැ මම නිකම් ඇහැව්වේ.............කාගේවත් සාක්කු-වෙන් මුදල් හොරකම් කරලා තියෙනවා ද? ආණ්ඩුවේ සල්ලි නො වෙයි. ආණ්ඩුවේ සල්ලි කවුරුත් හොරකම් කරනවා. තුඹත් ආණ්ඩුවේ සල්ලි හොරකම් කරනවා ඇති..........''

"යකාට පලයන්''

''මං කියන්නේ මිනිසුන්ගේ සල්ලි හොරකම් කිරීම ගැනයි. සාක්කුවෙන් හරි පොකැට්ටුවෙන් හරි සල්ලි හොරකම් කිරීම ගැනයි.''

"අවුරුදු නවයේ දී මම අම්මාගෙන් කොපෙක් විස්සක් හොර-කම් කළා. කිසිවෙක් බලා නොසිටිය දී මේසය උඩ තිබුණ සල්ලි ගෙන මිටමොළව ගත්තා''

"ඉතින් මොකද උණේ?''

"කිසි ම දෙයක් උණේ නැහැ, දවස් තුනක් ම ඒ සල්ලි තියා ගෙන සිටියා. පස්සේ ලැජ්ජා හිතිලා සල්ලි හොරකම් කළ බව කියා ආපසු දුන්නා.''

"ඊට පස්සේ මොකද උණේ?"

"අම්මා මට තැළුවා……….මොකද අහන්නේ? මොකද නුඹත් සල්ලි හොරකම් කළා ද?"

"ඔව්, හොරකම් කරල තියෙනවා"යි මිතියා කීවේ රහසින් ඉඟියක් කරමිනි.

"මොනව ද හොරකම් කළේ?"යි පියෝතර් කුතුහලයෙන් විමසුවේ ය.

"මම අවුරුදු නවයේ දී අම්මාගෙන් කොපෙක් විස්සක් හොරකම් කරලා දවස් තුනකට පස්සේ ආපසු දුන්නා."

මෙසේ කී මිතියා හදිසියෙන් ම නැඟී සිටියේ ය.

"තමුන්නාන්සේ දැන් ම යන්නේ නැද්ද?"යි රියැදුරා දොර ලඟ සිට විමසුවේ ය.

"උඹ ලෑස්ති ද? අපි ඉක්මනට එන්නම්. යන්න ඉස්සෙල්ලා අඩියක් ගහපන්. මිතිහටත් අඩියක් දීපන්. පිස්තෝල තියෙන පෙට්ටිය මගේ ආසනය යටින් තියාපන්. දැන් ඉතින් මම යනවා. ආයුබෝවන් මිත්‍රයා, මා ගැන නරකක් හිතන්න එපා"

"හෙට එනවා නේද?"

"ඔව්, එනවා."

"මේ පොඩි ගනුදෙනුව බේරා යනවා ද?"යි කඩකාරයා ඉදිරියට එමින් ඇසුවේ ය.

"ඔව්, ඔව්, ගනුදෙනුව බේරන්නම්."

ආයෙත් සාක්කුවෙන් නෝට්ටු මිටිය එළියට ගත් මිතියා වහා ඉන් රූබල් තුන් සියක් ගෙන මේසය උඩට විසිකොට සාප්පුවෙන් එළියට දිව්වේ ය. කඩේ සේවක පිරිස ද මිතියා පසු පසින් ගොස්, හිස නමා ආචාර කොට සුබ පැතුවෝ ය. බ්‍රැන්ඩි බීමෙන් පසු කහින්නට පටන් ගත් රියැදුරා කරත්තයට නැඟ ගත්තේ ය. නමුත් කරත්තයට නැගගැනීමට සැරසුණ මිතියා තමා ගේ බලවත් පුදුමයට කරත්තය ලඟ සිටින පෙනියා හදිසියෙන් ම දුටුවේ ය.හති දමමින් මිතියා ලඟට දිව ගිය පෙනියා දෙ අත් එක් කොට මිතියාට වැඳ දෙපා ලඟ වැටී අඬමින් මෙසේ කීවා ය.

"අනේ මගේ නෝනා මහත්මයාට හිරිහැර කරන්න එපා. නෝනා මහත්මයා ගැන හැම දෙයක් ම තමුන්නාන්සේට කීවේ මායි......... අර නිලධාරියා මරන්න එපා. ඉස්සෙල්ලා මගේ නෝනා මහත්මයා හොයා ගෙන ආවේ ඒ මහත්මයායි. මගේ නෝනා මහත්මයා අයිති ඒ මහත්මයාටයි. ඒ මහත්මයා අපේ නෝනා මහත්මයා කසාද බදීවි. ඒ මහත්මයා සයිබීරියාවේ ඉඳලා ආවේ අපේ නෝනා මහත්මයා කසාද බදින්නයි. අනේ මහත්මයා මනුෂ්‍ය ජීවිතයක් නැති කරන්න එපා."

"හා, හා, එහෙනම් තුඹ යන්නේ කෝලාහලයක් කරන්නද?"යි පියෝතර් ප්‍රශ්න කෙළේ ය. "දැන් මට කාරණාව හොඳට තේරෙනවා. තුඹ මනුෂ්‍යයකු හැටියට කටයුතු කරනවා නම් ඔය පිස්තෝල දෙක දැන් ම මට දෙන්න"යි ඔහු මීතියාට කෑගා කී ය. "මීතියා මා කියන දෙය ඇහෙනවා නේ ද?"

"සහෝදරයා බය වෙන්න එපා. යන ගමන් මම පිස්තෝල දෙක ගඟට විසි කරන්නම්" යි මීතියා කීවේ ය. "පෙතිකා නැගිටපන්. මගෙ ලඟ දණින් වැටෙන්න එපා. මීතියා කිසි ම කෙනෙකුට හිරිහැර කරන්නේ නැහැ. මා දැන් ටිකකට ඉස්සෙල්ලා උඹට හිරිහැර කළා. මට අනුකම්පා කරලා සමාවෙයන්. තක්කඩියකුට සමාවේයන්.................උඹ මට සමාව දුන්නත් එකයි. නුදුන්නත් එකයි. දැන් ඉතින් ඇන්ඩ්‍රි, හැකිතරම් ඉක්මනට යමු,"යි මීතියා කරත්තයට නැග ගනිමින් කී ය.

රියැදුරා කසයෙන් අසුන්ට තැළුවේ ය. අශ්වයෝ කරබැඳි ගෙජ්ජි සොලවමින් දිව ගියෝ ය.

"ආයුබෝවන් මිත්‍රයා මගේ ඇසින් ගලන අන්තිම කඳුළු බින්දුව තුඹටයි."

"මිතිහ වෙරිවෙලා නැහැ, නමුත් පිස්සවගේ දොඩනවා"යි මීතියා දෙස බලාසිටි පියෝතර් කල්පනා කෙළේ ය. කඩකාරයා වංචාවක් කරන බව දැන ගත් හෙතෙම මීතියා ගේ බඩු රැගත් අනෙක් කරත්තය නික්ම යනතෙක් නතරවීමට අදහස් කෙළේ ය. එහෙත් හදිසියෙන් ම ඔහු තුළ තමා ගැන ම කෝපයක් ඇතිවූ නිසා බෙලියඩ් ගැසීම පිණිස සාප කරමින් තැබෑරුම බලා ගියේ ය.

"මීතියා බොහෝ ම හොඳයි; නමුත් මෝඩයි" හේ යන ගමන් කල්පනා කෙළේ ය. "ගෘෂෙන්කා තියාගෙන හිටිය ඒ නිලධාරියා ගැන මම අහල තියෙනවා, මීතිකා ආයේත් ගෘෂෙන්කා හොයා

ගෙන ආවානම්........අර පිස්තෝලවලට ඕනෑ ම දෙයක් වුණාවෙන්. මිතියා බලා ගන්න මම මිතියා ගේ කිරි අම්මා නොවෙයි. ඕනෑ දෙයක් කර ගත්දෙන්..........ඒගොල්ලෝ කිසි ම පිළිවෙළක් ඇති ව කටයුතු කරන අය නොවෙයි. 'මම අයින් වෙනවා. මම මටම දඬුවම් කර ගන්නවා' මිතියා කළ ඒ කතාවේ තේරුම කුමක් ද? ඒ කතාවේ කිසි ම තේරුමක් නැහැ. තැබෑරුම්වලට වැදී මත්පැන් බී ගෙන ඔ වැනි වල්පල් දොඩනවා. නමුත් මිනිහා හිටියේ වෛරී මතින් නො වෙයි. සමහර විට ජීවිතයෙන් මත්වෙලා වෙන්න ඇති. ඔය වගේ තක්කඩි මිනිස්සු ලස්සන දේවල් කියන්න බොහෝ ම සමර්ථයි. මා මොනවට ද මිනිහ ගැන කරදර වෙන්නේ? ...... අද හවස මිනිහා කා එක්ක නමුත් කෝලාහලයක් කර ගන්න ඇති. ඒක නමයි ඇඟ හැම තැන ම ලේ ගාගෙන හිටියේ, නමුත් කා එක්ක ගහ ගත්ත ද දන්නේ නැහැ. වවුමට ගියාට පස්සේ දැන ගන්න පුළුවනි. මිනිහ ගේ ලේන්සුව ලෙයින් පෙඟිලා............තවමත් ලේන්සුව මගේ ගෙදර බිම වැටීලා ඇති ....ඒක යකාට ගියදෙන්''

මහත් නොඉවසුන් කමින් සුරා සැලට පිවිසි පියෝතර් වහා ම බෙලියඩ් ගසන්නට පටන් ගත්තේ ය. ක්‍රීඩාවෙන් ඔහු ගේ සිත සන්සුන් විය. දෙවන වරට ද ක්‍රීඩා කළ හෙතෙම හදිසියෙන් ම තම සගයා සමග කතා කරමින්, මිතියා රූබල් තුන් දහක් පමණ ගෙන ගෘසෙන්කා සමග ප්‍රීති වීම පණිස මුක්රෝවට ගිය බව කීය. මේ කතාව අසා සිටි අය තුළ පුදුමයත් සමග උනන්දුවක් ද ඇති විය. ඔවුන් ඒ ගැන කතා කරන්නට වූයේ මහත් සැලැකිල්ලක් දක්වමිනි.

"රූබල් තුන් දහක්? කොහෙන් ද මිනිහට ඔ තරම් ලොකු මුදලක් ලැබුණේ?''යි නොයෙක් දෙනා ප්‍රශ්න කරන්නට වූ හ. ඔවුන් හොලාකෝ මැතිනිය ගේ තෑග්ග පිළිබඳ කතාව පිළිගත්තේ වැ ඩි විශ්වාසයකින් නො වේ.

"ඇයි තාත්තා ගෙන් සල්ලි හොරකම් කරන්න බැරි ද?''

"තුන් දහක් කියන එක පොඩි ගණනක් නො වෙයි. මෙ තැන මොකක් නමුත් සැක කළ යුතු දෙයක් තියෙනවා.''

"මිනිහ තාත්තා මරන බව කියා පුරසාරම් දෙඩුවා. අපි සේරම අහගෙනසී මිනිහ තුන් දහක් ගැන කතා කරනවා.''

පියෝතර් මේ කතාවට නිහඬ ව සවන් දුන්නේ ය. ඔහු වරින් වර කතාවට දුන් පිළිතුරු ඉතා කෙටි විය. මිතියා ගේ මුහුණේ හා දෑතේ ලේ තැවරී තිබුණ බව සඳහන් කිරීමට ඔහු පළමු ව අදහස් කළ මුත් පසු ව ඒ අදහස වෙනස් කරගත්තේ ය.

පියෝතර් තුන් වන වරට ද බෙලියඩ් ගැසුවේ ය. ටිකින් ටික මිතියා පිළිබඳ කතාව ද අඩු විය. තුන් වන ක්‍රීඩාව අවසානයේදී තවත් සෙල්ලම් කිරීමට කිසිවකු නොසිටියෙන් ඔහු පිත්ත තබා කලින් අදහස් කළාක් මෙන් රාත්‍රි ආහාර ගෙන ගෙදර ගියේ ය. කඩ පොළට ගිය හෙතෙම අවුල් වූ සිතින් යුතු ව තමා ගැන කල්පනා කෙළේ ය. තමාට උවමනා කර තිබෙන්නේ කරමසෝ ගේ මහ ගෙදරට ගොස් එහි කිසියම් දෙයක් සිදු වී ඇද්දැයි සොයා බැලීමට බව ඔහුට වැටහිණි. සිතේ හදිසියෙන් ම ඇති වූ මෝඩ අදහසකට අවනත වෙමින් කරමසෝ ගේ ගෙදරට ගොස් නිදා සිටින මිනිසුන් අවදි කොට ඕපාදූප පැතිරවීම සුදුසු ද? ඔවුන් ආරක්‍ෂා කිරීම මට අයිති වැඩක් නො වෙයි.

සිතේ හටගත් කෝපයෙන් යුතු ව කෙළින් ම ගෙදර ගිය පියෝතර්ට හදිසියේ ම පෙනියා සඳහන් විය. "ඒ වේලාවේ මට ඇගෙන් මේ ගැන අහන්න තිබුණා"යි ඔහු අමනාපයෙන් කල්පනා කෙළේ ය. "මට ඇගෙන් සේරම දැන ගන්න තිබුණා" පෙනියා සමග කතා කිරීමට අදහස් කළ හෙතෙම ගෙදර යන ගමන් පියා පෙනියා හමුවීම පිණිස, ගෑසෙන්කා නතර වී සිටි ගෙදරට ගියේ ය. ඔහු ගේට්ටුවට ගසා කතා කෙළේ ය. රාත්‍රියේ පැවැති නිශ්ශබ්ද-තාව තුළින් ඇසෙන ඒ හඬ නිසා ඔහු තුළ නොසන්සුන් කමක් සමග කෝපයක් ද ඇති විය. කිසිවෙක් ඔහුට පිළිතුරු නුදුන්නේ ය. ගෙදර සියල්ලෝ ම නිදා සිටියෝ ය.

"මා නිකරුණේ කලබල වෙනවා"යි කල්පනා කළ හෙතෙම ආපසු ගමන් පියා මුළු වෙර ම යොදා, ගේට්ටුවට ගසා, මහත් කලබලයක් කෙළේ ය.

"කිසි ම කෙනෙක් කතා කරන්නේ නැහැ. හොඳයි මම මුන් සේරම නැගිට්ටවන්නම්"යි ඔහු ගේට්ටුවට ගැසූ හැම පහරක් පාසා ම තමාට ම කියා ගත්තේ තමා සමග ඇති කර ගත් නොමනාපයකින් යුතු ව ය. ඒ අතරේ හෙතෙම මහත් වේගයෙන් ගේට්ටුවට පහර දුන්නේ ය,

හතර වන පරිච්ඡේදය

මම ද එමි

මීතියා වේගයෙන් ගමන් ගත්තේ ය. මුක්රෝවට ඇති දුර සැතැපුම් විස්සකට වඩා සවල්පයක් වැඩි ය. එහෙත් ඇන්ඩ්‍රිගේ අසුන් කො තරම් වේගයෙන් ගමන් ගත්තා ද කියතොත් ඒ දුර පැයකුත් කාලකින් ගෙවා ගිය හැකි විය. මේ වේගවත් ගමනින් මීතියා ප්‍රාණවත් විය. වාතය පිරිසුදුවිය, සිසිල් විය. අහසේ තරු බැබැළිණි. අලෝෂා මිහිකත බදාගෙන සදාකල්හි ම එයට ප්‍රේම කරන බවට ප්‍රීතියෙන් දිවුරුම් දුන්නේ මෙ වැනි රාත්‍රියක දී ය. සමහර විට මෙ වැනි වේලාවක ද විය හැකි ය.

මීතියා ගේ සිත අවුල් විය. ඔහු ගේ හදවතට දුක් වේදනා ගෙන දුන් කරුණු බොහෝ ඇතත්, ඒ මොහොතේ දී ඔහු අන්තිම වරට දක ගැනීමට යන ගෘසෙන්කාට ඔහු ගේ රැජිණට ඔහු ගේ සර්වාංගය ම අයිති කෙළේ ය. මට එක දෙයක් ගැන ස්ථිර ව කිව හැකි ය. එනම් ඔහු ගේ හදවත මොහොතකට හෝ අවිනිශ්චිත ව නොතිබුණු බව ය. අහසින් වැටුණාක් මෙන් හදිසියෙන් ම පැමිණි ඔහු ගේ අලුත් විරුද්ධවාදියා ගැන ඔහු තුළ යන්තම් හෝ ඊර්ෂ්‍යාවක් වත් ඇති නොවූ බව කී විට ඔබ මගේ කීම විශ්වාස නො කරන්නට පිළිවන. වෙන කෙනෙක් පැමිණියේ නම් ඔහු ඊර්ෂ්‍යාවෙන් ඇයේත් දෑත ලෙයින් අපිරිසුදු කරගන්නට පිළිවන. එහෙත් අඳුරු රාත්‍රිය තුළින් වේගයෙන් ගමන් ගත් මීතියා තුළ ගෘසෙන්කා ගේ පළමු පෙම්වතා වන මේ නිලධරයා ගැන ඊර්ෂ්‍යාවක් හෝ කෝපයක් හෝ ඇති නො වී ය. .... මීතියා තව ම මේ මිනිහා දක නැති බව සැබෑවකි.

මෙහි වාද බේද වීමට දෙයක් නැති මෙය ගෘසෙන්කා හා ඇගේ පෙම්වතා සතු අයිතියකි. මෙය ඇගේ පළමු ප්‍රේමයයි. හවුරුදු පහකට පසුවත් ඇයට ඒ ප්‍රේමය අමතක වුණේ නැත. ගෘසෙන්කා ඔහුට හවුරුදු පහක් ම ප්‍රේම කළා ය. මා කොහොම ද

මේ ප්‍රේමයට සම්බන්ධ වුණේ? මට ඇති අයිතිය කුමක් ද? මීතියා, නුඹ පැත්තකට වී ඔවුන්ට ඉඩ දීපන්. දැන් මා සිටින්නේ කොතැන ද? මගේ තත්ත්වය කුමක් ද? මේ නිලධරයා පැමිණි-යත් නො පැමිණියත් දැන් හැම දෙයක් ම අවසානයි........''

මීතියා තුළ කල්පනා කිරීමේ ශක්තියක් තිබුණේ නම් ඉහත සඳහන් වචනවලින් ඔහු ගේ හැඟිම් කොටින් පැහැදිලි වෙයි. එහෙත් ඒ මොහොත හොඳ නරක මෙනෙහි කළ හැකි වේලාවක් නො වේ. ඔහු ඒ මොහොතේ දී අනුගමනය කළේ හිතා මතා ඇතිකරගත් ක්‍රියා මාර්ගයක් නො වේ. පෙනියා ගේ මුවෙන් පිට වූ පළමුවන වචනයෙන් ම අවදි වූ හැඟීම්වලින් මතු වූ මේ ක්‍රියා මාර්ග, ඒ ක්ෂණයෙන් ම අනුගමනය කිරීමට ඔහු අදහස් කළේ, ඉන් ඇති විය හැකි ඵල විපාක ගැන මොහොතකට වත් කල්පනා කොට නො වේ. ඔහු ගේ අධිෂ්ඨානය කෙසේ වෙතත් ආත්මය තුළ බලවත් නොසන්සුන් කමක් පැවැතිණි. එය මහත් වේදනාවක් ගෙන දුන් නොසන්සුන් කමකි. ඔහු ගේ ඒ අධිෂ්ඨානයෙන් ඔහුට කිසිම සාමයක් නො ලැබිණි. ඔහුට දරුණු වධ හිංසා කරන වෙනත් නොයෙක් දෑ ඒ අධිෂ්ඨානය පිරිපසින් තිබිණි. තමා ගේ මරණ දඬුවම තමා විසින් ම ලියා තැබුවේ යැයි කල්පනා කිරීම ඇතැම් විට ඔහුට පුදුමයක් වන්නට ඇත. "මම මට ම දඬුවම් කර ගතිමි"යන වගන්තිය සහිත කඩදාසි කොළය ඔහු ගේ සාක්කුවේ සූදානම් කර තිබේ. පිස්තෝල වෙඩි පුරවා ලෑස්ති කර තිබේ. 'රත් රන් හිස කෙසින් යුත් පෝබස් ගේ' පළමුවන උණුසුම් රැස් පිළිගත යුතු සැටි ගැන ඔහු තීරණයකට බැසගෙන අවසාන ය.

එහෙත් ඔහුට වද දෙන අතීතය අමතක කළ නො හැකි ය. ඒ අතීතය පිළිබඳ අදහස් දුක් දුක් දෙමින් හද පතුලට ගිලා බැස්සේ ය. කරත්තය නතර කොට, බිමට බැස, පිස්තෝලය එළියට ගෙන, එළිවන තෙක් බලා නො සිට, හැම දෙයක් ම අවසන් කිරීමේ අදහසක් ඒ මොහොතේ දී ඔහු තුළ ඇති විය. එහෙත් ඒ මොහොත ගිනි පුපුරක් මෙන් පසුවී ගියේ ය. මුක්රෝවට ඇති දුර ගිල දමීමට වෑයම් කරන්නාක් මෙන් අශ්වයෝ වේගයෙන් දිව ගියෝ ය. මුක්රෝවට ලඟාවනවාත් සමඟ ම, මෙතෙක් වේලා සිතේ හොල්මන් කළ භයානක මානසික සිතුවම් ලුහුබැඳ පැමිණි ගෘසෙන්කා පිළිබඳ සිතිවිලි සිත දැඩි ව අල්ලා ගත්තේ ය. මොහොතකට පමණ, දුර සිට හෝ ගෘසෙන්කා දෙස බැලීමට ඔහු තුළ දැඩි ආශාවක් ඇති විය.

"දුන් ගෲසෙන්කා සිටින්නේ අර මිතිහා එක්කයි." මිතියා කල්පනා කෙළේ ය. "ඈ ඇගේ පලමුවන පෙම්වතා සමග සිටින විට ඈය කුමන විදියේ තැනැත්තියක් දැයි මට දැන ගන්නට පුළුවනි. මට එපමණයි උවමනා කරන්නේ." ඔහු ගේ දෛවය කෙරෙහි බලපැවැත්වූ මේ තරුණිය තුළ මෙ තරම් දැඩි ප්‍රේමයක් කිසි කලක ඇති නොකළා ය. ඈය ඉදිරිපිට තමා ගැන අමතක කරවන, සිතේ භක්තිය ඇති කරවන ඒ අලුත් අප්‍රකට ප්‍රේමය ඔහුට ම මහත් පුදුමයකි. "මම සම්පූර්ණයෙන් ම ගෲසෙන්කාගෙන් වෙන් වෙනවා"යි මිතියා හදිසියෙන් ම කීවේ සිතේ හටගත් උමතු ප්‍රීතියෙන් යුතු ව ය.

ඔවුහු පැයක් පමණ වේලා මෙසේ වේගයෙන් ගමන් ගත්හ. මිතියා මුළු ගමනේදී ම නිහඬ ව සිටියේ ය. කතාවේ සමත් ගැමියකු වන රියැදුරා ද කතා කළේ නැත. ඔහු කතා කිරීමට බිය වූවා වැන්න. ඔහු කළේ ඔහු ගේ කෙට්ටු එහෙත් ශක්තිමත් ගුරුපාට අසුන් තිදෙනාට තැළීම් පමණි. හදිසියෙන්ම මිතියා භයානක සිත් වේදනාවකින් කෑගැවේ ය.

"ඇන්ඩ්, උන් සේරම නිදි නම් මොකද කරන්නේ?"

මිතියා තුළ මේ අදහස ඇති වූයේ දඩු පහරක් වැදුණාක් මෙනි. ඔහු තුළ මේ අදහස මීට පෙර ඇති නො වී ය.

"සමහර විට මෙලහකට ඒ ගොල්ලෝ නිදාගන්න ඇති"

වේදනාවෙන් පීඩිත වූවකු මෙන් මිතියා රවා බැලුවේ ය. එය සේමය, ඔහු වේගයෙන් ගෲසෙන්කා සොයා යයි...... ඒ සමග ඔහු තුළ ගෲසෙන්කා ගැන නොයෙක් හැඟීම් පහළවෙයි.......... එහෙත් ඒ අතරේ ඔවුහු නිදති......... සමහරවිට ගෲසෙන්කා ද නිදනවා විය හැකි ය. කෝපයෙන් පැන නැගුණු හැඟීමක් ඔහු ගේ සිත වෙළා ගත්තේ ය.

"ඉක්මනට කරත්තය දක්කපන්. හයියෙන් දුවන්න අශ්වයන්ට ගහපන්"යි ඔහු රියැදුරාට නියම කෙළේ ය.

"සමහර විට ඒ ගොල්ලෝ තව ම නිදාගෙන නැති ව ඇති" රියැදුරා ටික වේලාවකට පසු කීවේ ය. "තිමෝති කිව්වා එ තැන හුග දෙනෙක් ඉන්නවාය කියා........."

"හුග දෙනෙක් ඉන්නවාය කිව්වේ තානායමේ ද?"

"තානායමේ නො වෙයි, පලස්තිනෝප් ගේ හෝටලේ අශ්වයන් කුලියට දෙන්නේ හෝටලයෙන්"

"මම දන්නවා, එහෙනම් උඹ කියන්නේ එ තැන හුග දෙනෙක් ඉන්නවය කියා ද? කොහොම ද එ තැන හුග දෙනෙක් ඉන්නේ? කවුද ඒ අය?"යි මිතියා ඇසුවේ බලාපොරොත්තුවක් නැති ව පැමිණි මේ ආරන්චියෙන් බලවත් ශෝකයට පත් වෙමිනි.

"තිමෝති කිව්වා එ තැන ඉන්නේ මහත්වරු යකියා. දෙන්නෙක් අපේ ගමේ මහත්වරු ලු. ඒ ගොල්ලෝ කවුද කියා මං දන්නේ නැහැ. තවත් නාඳුනන දෙන්නෙක් හිටිය ලු. තවත් හුග දෙනෙක් ඇති. මම විස්තර ඇහැව්වේ නැහැ. තිමෝති කිව්වා ඒ ගොල්ලෝ කාඩ් ගහනවය කියා"

"කාඩ් ගහනවා?"

"කාඩ් ගහනවා නම් තව ම නිදගෙන නැති ව ඇති. තව ම එකොළහට නැහැ නේ ද?"

"ඉක්මනට යමු. ඉක්මනට යමු."යි මිතියා නොඉවසිල්ලෙන් කී ය.

"තමුන්නාන්සේ ගෙන් මම ප්‍රශ්නයක් අහන්න ද?" යි රියැදුරා මඳ වේලාවකට පසු ව ඇසී ය. "තමුන්නාන්සේ තරහ වේ ය කියා බයයි."

"මොකක් ද ප්‍රශ්නය?"

"පෙතියා තමුන්නාන්සේ ඉදිරිපිට දණිත් වැටී, ඇගේ ස්වාමි දුවත්, තවත් කෙනෙකුටත්, අපරාදයක් කරන්න එපා ය කියා කන්නලවු කළේ මොක ද?... ...... තමුන්නාන්සේට තේරෙනවා නේ ද මගේ කතාව?......... තමුන්නාන්සේ එ තැනට එක්ක යන්නේ මම යි. මට සමාවෙන්න, මම මේ විදියට කතා කරන්නේ මගේ හිතට විරුද්ධ ව වැඩ කරන්න බැරි නිසයි......... මේ ගැන කතා කිරීම මෝඩ කමක් වෙන්න පුළුවනි........."

පිළිපස අසුනේ හිඳ සිටි මිතියා හදිසියෙන් ම රියැදුරා ගේ උරහිස අල්ලා "උඹ කරන්න කාරණයක් නේ ද?"සි උමතු වූවකු මෙන් ඇසුවේ ය.

"එහෙමයි හාමුදුරුවනේ........."

"එහෙනම් අනෙක් අයටත් ඉඩ දියයුතු බව උඹ දන්නවා නේ ද? කිසි ම කෙනෙකුට යන්න ඉඩ නොදී මිනිස්සු යටකර ගෙන යන කරත්ත කාරයා ගැන උඹ මොකද කියන්නේ? කිසි ම කරත්තකාරයකුට පුළුවන් කමක් නැහැ මග යන මිනිසුන් යටකරගෙන යන්න. මිනිසුන් ගේ ජීවිත නැති කරන්න බැහැ. උඹ ජීවිතයක් නැති කළොත් ඒකට දඬුවම් වින්ද යුතුයි. උඹ ජීවිතයක් නැති කළා නම් ඒකට දඬුවම් කරගනින්."

මිතියා මෙසේ කීවේ උමතුවෙන් දොඩන්නකු මෙනි. ඔහු ගේ කතාව අසා රියැදුරා පුදුම විය. එහෙත් ඔහු මිතියා සමග නොනවත්වා කතා කෙළේ ය.

"තමුන්නාන්සේ ගේ කතාව ඇත්ත. කෙනෙක් තවත් කෙනකුට හිරිහැර කරන එක වැරදියි. තිරිසනකුට වත් හිරිහැර කරන්න වටින්නේ නැහැ. හැම සත්ත්වයෙක් ම දෙවියන් වහන්සේ ගේ නිර්මාණයක්. අපි අශ්වයකු ගැන කල්පනා කරලා බලමු. අපේ කරත්ත කාරයන්ට උවමනා කරන්නේ කොහොම හරි අශ්වයා දක්කන්නටයි. කිසි ම කරුණාවක් නැහැ. ඔහේ නිකම් දක්කනවා."

"ඔව්, අපායට දක්කනවා"යි කතාවට බාධා කරමින් පැවැසූ මිතියා සිනා සී අනතුරු ව රියැදුරා ගේ උරහිසින් අල්ලා මෙසේ ඇසුවේ ය. "ඇන්ඩි බලන්න කියාපන් උඹේ කල්පනාවේ හැටියට මිතියා පියෝදරවිච් කරමසෝව් මළාට පස්සේ අපායට යනව ද නැද්ද? කොහොම ද උඹේ අදහස?"

"මං දන්නේ නැහැ. ඒක බලපවත්වන්නේ.........තමුන්නාන්සේ දන්නව ද ක්‍රිස්තුන් වහන්සේ කුරුසයට තියා ඇන ගසා මැරුවට පස්සේ කෙළින් ම අපායට ගිහින් අපායේ දුක් විඳිමින් සිටි සේරම පව්කාරයන් නිදහස් කළා. ඊට පස්සේ අපායට වැඩිය පව්කාරයන් ඉන්න ගන්න අමාරුය කියා යක්ෂයා දුක් වුණා.එතකොට දෙවියන් වහන්සේ යක්ෂයා කැඳවා කිව්වා නෝ දුක් වෙන්න එපාය. මේ ලෝකයේ සිටින සේරම පුළුවන් කාරයන්, ලොකු ලොක්කන්, දේශපාලනඥයන්, නඩුකාරයන් සේරම පෝසත් මිනිසුන් තොපට අයිති වෙනවා. මේ මිනිස්සුන්ගෙන් අපාය පිරේවී'යි කියා. මෙවා දෙවියන් වහන්සේ ගේ කටින් පිටවූ වචන........"

"ජන කතාවක් වෙන්න ඇති. කොහොම වුණත් බොහොම හොඳ කතාව......... වම් පැත්තේ ඉන්න අශ්වයාට ටිකක් තළාපන්."

"තමුන්නාන්සේට පේනවා නේ ද අපායට යන්නේ කොයි විදියේ මිනිසුන් ද කියා?"යි රියැදුරා කිවේ එම් පැත්තේ සිටි අශ්වයාට පහරක් ගසමිනි. "තමුන්නාන්සේ හරියට පොඩි දරුවකු වගෙයි............ අපි තමුන්නාන්සේ ගැන කල්පනා කරන්නේ ඒ විදියට යි......... තමුන්නාන්සේට බොහො ම ඉක්මනට කේන්ති ගියත්, තමුන්නාන්සේ ගේ යහපත් හිත නිසා දෙවියන් වහන්සේ තමුන්නාන්සේට සමාව දේවි."

"ඈන්ඩ්‍රි, උඹ මට සමාව දෙනව ද?"

"මං මොනවට ද සමාව දෙන්නේ? තමුන්නාන්සේ මට කිසි ම වරදක් කළේ නැහැ."

"නැහැ......... අනෙක් අය වෙනුවෙන් සමාව දෙනව ද? හොඳ මිනිහකු වගේ මට කෙළින් පිළිතුරු දීපන්."

"තමුන්නාන්සේ එක්ක යන්න මට භයයි. තමුන්නාන්සේ බොහො ම පුදුම විදියටයි කතා කරන්නේ."

එහෙත් රියැදුරා ගේ කතාව මීතියාට නො ඇසිණි. ඔහු උමතු වූවකු මෙන් දෙවියන්ට කන්නලව් කරන්නට විය.

"අහෝ දෙවියනි, මගේ සියලුම නොහික්මුණු කම්වලට සමාව දී මා ගලවා ගන්න. මා අපායට යවන්නඑපා.තමුන්නාන්සේ නඩු විසඳන විට මා නිදහස් කරන්න...... මා මට ම දඬුවම් කරගත් නිසා මට දඬුවම් කරන්න එපා. අහෝ දෙවියනි, මම ඔබවහන්සේට ප්‍රේම කරමි. මම කාලකණ්ණියෙක්මි. එහෙත් මම ඔබ තුමාට ප්‍රේම කරමි. ඔබ වහන්සේ මා අපායට යැව්වත් මම අපායේ සිට ඔබ වහන්සේට ප්‍රේම කරමි. සදකල්හි ම ඔබ වහන්සේට ප්‍රේම කරන බව කෑගා කියමි.........මගේ අවසානය පැමිණෙන තෙක් ඔබ වහන්සේට ප්‍රේම කිරීමට මට ඉඩ දෙන්න... .... ඔබවහන්සේ ගේ දවස උදාවන තෙක් පැය පහක් ප්‍රේම කිරීමට අවසර දෙන්න............මම මගේ ආත්මයේ රැජිණට ප්‍රේම කරමි...........මම ඇයට ප්‍රේම කරමි. ප්‍රේම නො කර සිටීමට පුළුවන් කමක් නැත......... ඔබ වහන්සේට මගේ හදවත සම්පූර්ණයෙන් ම පෙනෙනවා, මම ඇය ළඟට ගොස් ඇගේ දෙපා ළඟ වැටී 'මා අත්හැර දමා යාමට නුඹට අයිතියක් තිබේ......... මා අත්හැර දමා යන්න...... ...මා ගැන කවදාවත් ශෝක වෙන්න එපා"යි කියමි.

"අන්න පේනවා මුක්රෝව"යි රියැදුරා කසය දික්කොට පෙන්නමින් කී ය.

ඒ මහා තැනිතලාව මත තැනින් තැන පිහිටි ගොඩනැගිලි අඳුර තුළින් කළුපාටට පෙනේ. මේ ගම්මානයේ ගැමියෝ දෙදහසක් පමණ වාසය කරති. නමුත් මේ රෑ, මේ වේලාවේ දී ඔවුහු හැම දෙනා ම නිදති. එහෙත් තවමත් බැබළෙන පහන් එළි කිපයක් පෙනේ.

"ඇන්ඩ්‍රි ඉක්මන් කරපන්..........මම ආවා"යි කියමින් මිතියා නොඉවසිල්ලෙන් කෑගැවේ ය.

"ඒ ගොල්ලෝ තව ම නිදගෙන නැහැ"යි රියැදුරා පලස්තිනෝප් ගේ හෝටලය දෙසට කසය දික්කොට පෙන්නමින් කී ය. මේ හෝටලය තනා තිබුණේ ගමට ඇතුළුවන තැන ය. පාර දෙසට මුහුණ ලා තිබුණු කවුළු හය පහන් එළියෙන් බැබළෙයි.

"උන් තව ම නිදගෙන නැහැ"යි මිතියා ද ප්‍රීතියෙන් කී ය. "ඉක්මන් කරපන්. ගෙජ්ජි වැල් හොඳට හොලවපන්. මං එන බව හැමෝට ම ඇහෙන්න ඝෝෂා කරපන්. මම එනවා! මම එනවා! මම එනවා!"

හොඳ හැටි විඩා වැටී සිටි අසුන්ට රියැදුරා තැළුවේ ය. අශ්වයෝ ද නාස් තුළින් වාෂ්පය පිටකරමින් එක පිම්මට දිව ගොස් හෝටලයට ගොඩ වන පඩි පෙළ ලග නතර වූ හ.

මේ අවේලාවේ පැමිණියේ කවුරුදැයි දන ගැනීමේ කුතුහලයෙන් හෝටලයේ අයිතිකාරයා නිදා ගැනීමට යන ගමන් දොර තුළින් එබී බැලුවේ මිතියා කරත්තයෙන් එළියට බසිනවාත් සමග ය.

"කව්ද ඔය? ට්‍රිෆැන් බොරිසොවිච් ද?"

මඳක් පහත් වී, මහත් ඕනෑ කමින් බලා අනතුරු ව පඩි පෙළ දිගේ පහතට බැස ගත් හෝටල් අයිතිකරු නියාංලු ප්‍රීතියෙන් යුතු ව අමුත්තා ළගට දිව ගියේ ය.

"මිතියා පියෝද්රවිච් කරමසෝ, තමුන්නාන්සේ ආයෙත් ආව ද?"

හෝටලයේ අයිතිකරු තරබාරු නීරෝගි ගැමියෙකි. ඔහු ගේ මුහුණ මඳක් මහත යැයි කිව හැකි ය. ගම් වැසියන්ට නපුරු කම් කරන හෙතෙම ඔවුන්ට කිසි ම බුරුලක් නොදක්-

වන්නේ ය. එහෙත් තමන් ගේ වංසය පෙනෙන හැම විට ම ඕනෑ ම ගැතිකමක් අංරූඪ කර ගැනීමට ඔහුට අපූරු ශක්තියක් තිබිණි. හෙතෙම රුසියන් පිළිවෙත අනුව පැත්තකින් බොත්තන් දමා මසන ලද කමිසයක් ඇඳ සිටියේ ය. ප්‍රමාණවත් ධනයක් රැස් කරගත් ඔහු දිවා රෑ දෙකේහි කල්පනා කළේ තවතවත් පොහොසත් වීම ගැන ය. ගමෙන් අඩක් පමණ ඔහු ගේ ග්‍රහණයට අසු විය. අසල් වැසියෝ ඔහුට ණය ගැති වූ හ. නුදුරේ වෙසෙන ඉඩම් හිමියන් ගෙන් ඉඩම් මිල දී ගත් හෙතෙම ගොවිතැන් කිරීම පිණිස තමන්ට ණය ගැති ගොවියන්ට කුලියට දුන්නේ ය. කො තරම් වැඩ කළත් ඔවුහු ණය බරින් නිදහස් නො වූ හ. තරුණ දියණියන් සතර දෙනකු ඇති හෙතෙම කනවැන්දුම් පුරුෂයෙකි. දැනට ම වැන්දඹුවක වූ එක් දියණියක ඇගේ දරුවන් සතර දෙනා සමග හෝටලයේ නතර වී දාසියක මෙන් මෙහෙ කළා ය. තවත් දියණියක් සුළු නිලධරයකු සමග විවාහ වූවා ය. හෝටලයේ කාමරයක බිත්තියේ එල්ලා ඇති පවුලේ පින්තූර අතරේ, සම්පූර්ණ නිල ඇඳුමෙන් සැරසුණු මේ නිලධරයා ගේ කුඩා ඡායාරූපයක් දක ගත හැකි ය. බාලජේත්තු කාරියන් වූ දියණියන් දෙදෙනා ශරීරයේ පසු පසට තද වන ලෙස මසන ලද නිල් පාට හෝ කොළ පාට ඇඳුම් අඳිති. පල්ලියේ නිවාඩු දිනවල හෝ අසල් වැසියන් බැහැදකීමට යන විට හෝ, යාරයක් පමණ පසු පසින් බිම ඇතිල්ලෙන ඇඳුම් අඳිති. කො තරම් ජේත්තුවට ඇඳුම් පැළඳුම් කළත්, පසු දින උදේ පාන්දරින් නැගිට හෝටලය අතු පතු ගා වලන් පිහන් සේදිය යුතු ය.

රූබල් දහස් ගණන් රැස් කරගෙන ඇතත් හෝටලයට පැමිණි සුරා බී මත් වූ අමුත්තකුගේ ඉණ අත ගා ගැනීමට හෝටල් කාරයා ඉතා කැමැති ය. ගෲසෙන්කා සමග අනාචාරයේ හැසිරීමට පැමිණි මිතියාගෙන්, මීට මසකට පමණ කලින් පැය විසිහතරක් තුළ දී තමා රූබල් දෙතුන් සියක් සොරා ගත් සැටි ඔහුට තව ම මතක ය. මිතියා දුටු වහා ම තමා ගේ ගොදුර පැමිණ සිටින බව ඔහුට ඉව වැටුණේ ය. ඔහු මිතියා මහත් උනන්දුවෙන් පිළිගත්තේ ය.

"තමුන්නාන්සේ ආයේත් දකින්නට ලැබීම අපට බොහොම ලොකු සන්තෝසයක්."

"ඔහොම ටිකක් හිටපන්............. ඉස්සෙල්ලා ම කියාපන් ගෲසෙන්කා කොහෙ ද ඉන්නේ කියා."

"අග්‍රෆේනා ඇලෙක්සැන්ඩ්‍රොව්නා ද?"යි ඔහු එක් වර ම

ඇසුවේ ය. මිතියා ගේ කතාව තේරුම් ගත් හෙතෙම නෙත් කොනින් බලා "ඔව්, මෙහෙ ඉන්නවා"යි කී ය.

"කා එක්ක ද ඉන්නේ?"

"මං අඳුනන්නේ නැහැ, එක් කෙනෙක් නිලධාරියෙක් කතාවෙන් පේනවා පෝලන්ත ජාතිකයකු බව. මිනිහ මෙහෙ ඉඳලා ගෲසෙන්කාට එන්නට කරත්තයක් යැව්වා. එයත් එක්ක තවත් මිනිහෙක් ඉන්නවා. සමහර විට යාළුවෙක් වෙන්න ඇති. කොහොම ද දන්නේ? දෙන්නම ඇඳල ඉඳන්නේ සාමාන්‍ය ඇඳුම්."

"කොහොම ද උන් හොඳට කනව බොනව ද? උන් ළඟ සල්ලි පනම් තියෙනව ද?"

"වැඩි ජය නැහැ. තමුන්නාන්සේ තරම් ජය නැහැ."

"වැඩි ජයක් නැහැ? කවුද අනෙක් අය?"

"ටවුමේ ඉඳල ආපු මහත්වරු දෙන්නෙක් නතර වෙලා ඉන්නවා. එක් කෙනෙක් ඉලන්දූරියෙක්. මියුසෝ මහත්මයා ගේ නෑයෙක් වෙන්න ඇති. මට නම මතක නැහැ............ අනෙක් එක්කෙනා මැක්සිමෝ කියන මහත්මයෙක්. තමුන්නාන්සේ අඳුනනවා ඇති. ටවුමේ තියෙන තාපසාරාමයට වන්දනාවේ ආවාලු. එයා යන්නේ මියුසෝ ගේ නෑයකු වන අර ඉලන්දූරියාත් එක්කයි."

"එච්චර ද ඉන්නේ?"

"එහෙමයි."

"ඔහොම ටිකක් හිටපන්. උඹෙන් බොහො ම වැදගත් දෙයක් අහන්න. කොහො ම ද ගෲසෙන්කාට?"

"ඈ දැනුයි ආවේ. අනෙක් අය එක්ක ඉන්නවා.'

"කොහොම ද සන්තෝෂයෙන් ද ඉන්නේ? ඈ හිනාවෙනවාද?"

මා හිතන්නේ නැහැ වැඩිය හිනා වෙනවය කියා. ඉඳ ගෙන අර ඉලන්දූරියා ගේ කොණ්ඩය පීරනවා. වැඩිය කතා කරන්නේ නැහැ."

"කොණ්ඩය පීරනවා ය කියන්නේ අර නිලධරයා ගේ ද? නැති නම් පෝලන්ත ජාතිකයා ගේ ද?"

"නෑහැ. මියුසෝව් මහත්මයා ගේ නෑයා වන අර ඉලන්දූරියා ගේ මට නම මතක නෑහැ."

"කල්ගානෝ ද?"

"අන්න හරි, කල්ගානෝ."

"බොහෝ ම හොඳයි. එහෙනම් මම ම ගිහින් බලන්නම්, ඒ ගොල්ලෝ තව ම කාඩ් ගහනවා ද?"

"කාඩ් ගැහිල්ල නැවැත්තුවා. අර නිලධාරියා තේ බීලා ඊට පස්සේ අඩියක් ගහන්න ඉල්លුවා."

"හොඳ මිනිහකු වගේ ඔහොම ටිකක් හිටපන්. දැන් ඉතින් තවත් ප්‍රශ්නයකට උත්තර දීපන්...........කොහොම ද අහිකුණ්-ටිකයන් ඉන්නවා ද?"

"මේ රෑ අහිකුණ්ටිකයන් හොයාගන්න බොහෝ ම අමාරුයි. උන් දාණ්ඩුවෙන් පැන්නුවා. නමුත් කෙතාලම් හා රවුතිසඳද ගහන යුදෙව්වන් ඉන්නවා. පණිවිඩයක් යැව්වොත් ඒවි."

"පරක්කු වෙන්නේ නැති ව දැන් ම පණිවිඩයක් යවාපන්"යි. මීතියා කෑගා කී ය. එදා වගේ අදත් අර ලම්ස්සියන් ටික එකතු කර ගනින්. මායාටයි, සෙපනිඩාටයි, අරිනාටයි කොහොම හරි එන්න කියාපන්. සින්දු කියනවට රූබල් දෙසියක් දෙනවා!"

"නිදාගෙන හිටියත් රූබල් දෙසියකට මට පුළුවනි මුළු ගම ම අඩගහගෙන එන්න. මේ ගමේ ඉන්න එවුන්ට මෙ තරම් කරුණාව දක්වන එක හොඳ ද? වනවර නපුරු මිනිස්සුන්ට මෙ තරම් සල්ලි වියදම් කරන්නේ මොනවට ද? හඩු ගඳ ගහන වනවරයින්ට සුරුට්ටුවක් දෙන්න වටින්නේ නැහැ. මෙහෙ ඉන්න ලම්ස්සියන් ගේ කොණ්ඩවල උකුණෝ පිරිලා. සතයක්වත් වියදම් නො කර මම මගේ කොල්ලො ටික අඩගහගෙන එන්නම්. උන් නිදාගන්න ගියේ මේ දැනුයි. තමුන්නාන්සේ වෙනුවෙන් මම උන්ට පයින් ඇනලා සින්දු කියවන්නම්. ගිය පාර තමුන්නාන්සේ මේ වනවරයන්ට ෂැන්පේන් බොන්න දුන්නේ අපරාදේ!"

හෝටල් කාරයා මීතියාට දක්වන ව්‍යාජ කරුණාව කෙසේ වෙතත් ගිය වතාවේ මීතියා ගෙනා ෂැන්පේන් බෝතල දුසිම් භාගයක් සමග මේසය යට තිබී අහුලාගත් රූබල් දෙසියක් සඟවා ගත්තේ ය.

"ගිය පාර මම මෙ හෝටලේ දී රූබල් දහක් වියදම් කළා උඹට මතක ද?"

"එහෙමයි, තමුන්නාන්සේ රූබල් තුන්දහක් විසි කළා. තමුන්නාන්සේ රූබල් තුන්දහක් පමණ වියදම් කරන්න ඇති."

"ඉතින්, මම අදත් ඈංවේ සල්ලි වියදම් කරන්නයි."

මෙසේ පැවැසූ මීතියා නෝට්ටු මිටිය ගෙන පෙන්නුවේ ය

"දූන් ඉතින් මං කියන දෙය හොඳට මතක තියා ගනින්. තව පැයකින් වයින් සමග තවත් නොයෙක් කෑම ජාති ගෙනේ වි. ගෙනාපු හැටියේම මගෙ ළඟට අරන් වරෙන්. කරත්ත කාරයා ළඟ තියෙන අර පෙට්ටිය මෙහාට ගෙනෙන්. පෙට්ටිය ඇරලා විගහට ෂැම්පේන් අරගනින්. කොහොම හරි අර ළමිස්-සියන් ටික අඬගහගෙන වරෙන්. උන් නැති ව බැහැ. කොහොම මංයාට එන්න කියාපන්."

අනතුරු ව මීතියා කරත්තයේ තිබුණු පිස්තෝල සමග පෙට්ටිය ගත්තේ ය.

"ඇන්ඩි, දූන් ඉතින් අපේ ගනුදෙනව බේරමු. මෙන්න කරත්ත කුලියට රූබල් පහළොවයි. වොඩ්කා බොන්න පනහයි ....උඹ ඉක්මන් කරලා ආවට.........මීතියා පියෝදරවිච් කරමසෝ අමතක කරන්න එපා."

"මට භයයි හාමුදුරුවනේ......... මට තව රූබල් පහක් දෙන්න. ඊට වැඩිය ශතයක්වත් ගන්නේ නැහැ. බොරිසොවිච් මට සාක්කි කියා වි. මගේ මෝඩ කතාවට මට සමා වෙන්න.........

"මොනවට ද භය වෙන්නේ?"යි මීතියා රියැදුරා දෙස බලා කී ය. එහෙනම් උඹ යකාට පලයන්'යි කියමින් රියැදුරාට රූබල් පහක් දුන් මීතියා අනතුරු ව හෝටල් හිමියාට මෙසේ කී ය. "දූන් ඉතින් ශබ්ද නොකර මාව කාමරයට එක්ක පලයන්. ඒස්සෙල්ලා උන්ට නොපෙනෙන තැනක ඉඳගෙන උන් කරන කියන දෙය බලාගන්න ඕනෑ. කොහෙ ද උන් ඉන්නේ? නිල් කාමරයේද?"

හෝටල් හිමියා සැකයෙන් හා බියෙන් මීතියා දෙස බැලුවේ ය. එහෙත් වහා මීතියාට කීකරු වෙමින් ඔහු කී දෙය කෙළේය. ඉස්තෝප්පුව දිගේ ගිය හෙතෙම පළමු කාමරයට ගොස් පහනක් ගත්තේ ය. අමුත්තන් හිඳ සිටියේ ඒ ළඟ කාමරයෙහි ය. අනතුරුව

හෙතෙම කිසිවකුට නො පෙනෙන්නට මීතියා කාමරයට කැඳවා ගෙන ගොස්, නොපෙනී හිඳ අනෙක් කාමරයේ කෙරෙන දෑ නිදහස් ව දැක ගත හැකි තැනක් පෙන්නුවේ ය. එහෙත් මීතියා වැඩි වේලා සැඟවී බලා නොසිටියේ ය. කාමරයේ සිටින අයද වඩා හොඳට නො පෙනෙයි. ගෲසෙන්කා දුටු හැටියේ ම ඔහුගේ හදවත වේගයෙන් සැලෙන්නට විය. අනතුරු ව ඔහු ගේ දෑස අඳුරු විය.

ගෲසෙන්කා මේසය ළඟ සිටි පුටුවක හිඳ සිටියා ය. දැකුම්කලු තරුණයකු වූ කල්ගානෝ ඇය ළඟ සෝපාව උඩ හිඳ සිටියේ ය. ඇ තරුණයා ගේ අත අල්ලා ගෙන සිනාසෙන අතරේ තරුණයා ඇය දෙස අමනාපයෙන් බලා සිටියේ ය. මේසයේ අනෙක් පැත්තේ ගෲසෙන්කා දෙසට මුහුණ ලා හිඳ සිටි මැක්සිමෝව ඇසෙන ලෙස ඔහු මොනවා දෝ කී ය. මැක්සිමෝ යම් කිසිවක් ගැන හඬ නගා සිනා සුණේ ය. සෝපාවේ අනෙක් මෙලවරේ හිඳ සිටි අමුත්තා පහත් වී පයිප්පයක් උරමින් සිටියේ ය. මීතියාට ඔහු පෙනුණේ පළල් වූ මුහුණකින් යුත් මිටි මහත මිනිසකු මෙනි. ඔහු කිසියම් දෙයක් ගැන කෝපයෙන් සිටියේ ය. ඔහු ගේ මිත්‍රයකු වූ අනෙක් අමුත්තා ඉතා උස මිනිසෙකි. එයට වඩා කිසිවක් මීතියාට කිව නො හැකි ය. ඔහු තදින් හුස්ම ගත්තේ ය. මීතියාට තවත් මිනිත්තුවක් වත් ඉවසා සිටිය නො හැකි විය. පිස්තෝල සහිත පෙට්ටිය පසකින් තැබූ හෙතෙම සර්වාංගය ම වෙව්ලද්දී, හදවත වේගයෙන් ගැහෙද්දී, කෙළින් ම අමුත්තන් අතරට ගියේ ය.

මීතියා දුටු හැටියේ ම ගෲසෙන්කා තැති ගෙන කෑගැවා ය.

හත් වන පරිච්ඡේදය

කුලුඳුල් පෙම්වතා

මීතියා දුර අඩි තබා සත සුපුරුදු ගමනින් කෙළින් ම මේසය ළඟට ගියේ ය.

"මහත්වරුනි"යි ඔහු උස් හඬින් කී ය. එය කෑගැමට සමාන ය. එහෙත් ඔහු හැම වචනයක් පාසා ම ගොත ගැසුවේ ය.

"ම....... ම..... මගෙන් කිසි ම වරදක් වෙන්නේ නැහැ. භය වෙන්න එපා"යි ඔහු කල්ගානෝ ගේ දෑත අල්ලාගෙන සිටි ගෘසෙන්කාට කීවේ ය. "මම ආවේ තමුන්නාන්සේලා එක්ක සන්තෝස වෙන්නයි. මම එළිවන කන් මෙහි ඉන්නවා, තමුන් නාන්සේලා එක්ක මා කාමරයේ අන්තිම වතාවට එළිවනකන් ඉන්න ද?"

මීතියා අන්තිම වචන ස්වල්පය කීවේ සෝපාව උඩ හිඳ පයිප්පයක් උරමින් සිටි මිටි මහත මිනිහාට ය. මිටි මහත මිනිහා තෝල් අතර රඳවා ගෙන සිටි පයිප්පය ගෙන මහන්තත්ශව කමක් පෙන්නමින් මෙසේ කීවේ ය.

"මහත්මයා මේක අපේ කාමරය. මේ හෝටලයේ තවත් කාමර තියෙනවා."

"මේ ඉන්නේ මීතියා කරමසෝ නේ ද?"යි කල්ගානෝ හදිසියෙන් ම කීය. "මොකද මේ වෙලාවේ? මෙහෙන් වාඩි වෙන්න. කොහොම ද සැප සනීප?"

"මහත්මයා හමුවීම ගැන බොහො ම සන්තෝෂයි. මා මහත්-මයා පිළිගෙන සිටියේ බොහො ම උසස් කෙනෙකු හැටියටයි" මීතියා මහත් සතුටින් කීවේ මේසය හරහා තරුණයාට අතට අත දෙමිනි.

"ඔච්චර තදින් අත මිරිකන්න එපා. මගේ ඇඟිලි කැඩේවි"යි කල්ගානෝ සිනාසෙමින් කී ය.

"මීතියා හැම තිස්සේ ම ඔය විදියට අත මිරිකනවා"යි ගෘසෙන්කා ප්‍රීතියෙන් කීවේ බිය සුළු සිනාවක් දක්වමිනි. මීතියා පැමිණියේ කෝලාහලයක් නො කිරීමට බව ගෘසෙන්කා ඔහු ගේ මුහුණ දෙස බලා හදිසියෙන් ම අවබෝධ කළා ය. ඈ මීතියා දෙස කුතුහලයෙන් හා තවමත් සිතේ පැවැති නොසන්සුන් කමින්ද බලා සිටියා ය. තරුණයා තුළ පැවැති කිසි යම් දෙයක් ඈගේ සිත ඇඳගත්තේ ය. මීතියා මේ වැනි වේලාවක මෙවැනි තැනකට පැමිණ මෙසේ කතා කරතියි ගෘසෙන්කා සිහිනෙන් වත් බලාපොරොත්තු නොවූවා ය.

"කොහොම ද මහත්මයා?"යි වම්පසින් හිඳ සිටි මහලු මැක්සිමෝ ද කී ය. මීතියා වහා ඔහු ළඟට ගියේ ය.

"හා කොහොම ද? මහත්මයාත් ආව ද? බොහො ම සන්තෝ සයි ආපු එක ගැන. මහත්මයාණනි.........(මීතියා පයිප්පයක්

උරමින් සිටි පෝලන්ත ජාතිකයාට කතා කළේ ඔහු එ තැන සිටි වැදගතා හැටියට පිළිගෙනය) මහත්මයාණෙනි, මම මෙහි ආවේ මගේ අන්තිම දවස, අන්තිම පැය, මේ කාමරයේ ගතකිරීමට අදහස් කරගෙනයි:........ මම මේ කාමරයේ දී වරක් මගේ රැජිණට ප්‍රේම කළා.......... මහත්වරුනි මට සමා වෙන්න.........'' ඔහු උමතු වූවකු මෙන් කෑගැසුවේ ය. "මම දිව්රා කියන්නම්, මම මෙහාට ආවේ මගේ අන්තිම රාත්‍රිය ගත කරන්නයි. ඒ නිසා මට භය වෙන්න එපා.........අප අතර පවතින හොඳ හිතට අඩියක් ගහමු. මම ෂැන්පේන් ගෙනාවා. තව ටිකකින් වයින් ගෙනේ වි.........මම මේවාත් ගෙනාවා. (කිසියම් හේතුවක් නිසා ඔහු නෝට්ටු මිටිය සාක්කුවෙන් එළියට ගෙන පෙන්නුවේ ය.) මහත්වරුනි මට සමා වෙන්න. මම නැටුම් ගැයුම් වලට බොහො ම කැමැතියි. ගිය පාර වගේ මේ පාරත් නැටුම් ගැයුම් තියෙන්න ඕනෑ. නමුත් මහත්වරුනි පණුවා – කිසිම වැදගම්මකට නැති පණුවා යන්නට යාවි. මා ප්‍රීතියෙන් සිටින මේ දවස සිහි කරලා අද රෑ අපි සන්තෝෂ වෙන්න ඕනෑ."

මිතියාට හුස්ම ගත නො හැකි විය. කිය යුතු දේ තවත් තිබේ. එහෙත් ඔහු ගේ මුවෙන් පිට වුණේ පුදුම ශබ්ද සමූහයක් පමණි. මිතියා දෙසත්, ඔහු ගේ අතේ තිබෙන මුදල් දෙසත් ඇසි පිය නො සොල්වා බලා සිටි පෝලන්ත ජාතිකයා අනතුරු ව ගෲසෙන්කා දෙස පුදුමයෙන් බැලුවේ ය.

"මගේ රැජිණ අවසර දෙනවා නම්.........''යි කියමින් මිතියා ආයෙත් කතාව පටන් ගත්තේ ය.

"රැජිණ කියන්නේ මට ද''යි අසමින් ගෲසෙන්කා කතාවට බාධා කළා ය. "මග කතාව ඇහෙන කොට මට හිනා යනවා. මිතියා ඉඳගන්න, හිට ගෙන ඉන්න එපා, මොනව ද මේ දොඩන්නේ? පිත්සිද්ධ වෙයි අපට භය කරන්න එපා. අපට භය කරන්නේ නැහැ නේද? භය නො කරනවා නම් මිතියා එක්ක කතා කරන්න මම බොහොම කැමැතියි."

"මම..... ...මම ගෲසෙන්කා භය කරන්න?''යි මිතියා දෑත වනමින් කී ය. "කැමැති තැනකට යාමට මම ගෲසෙන්කාට අවසර දෙනවා. කිසිම බාධාවක් කරන්නේ නැහැ.........''

අනතුරු ව මිතියා පුටුවක හිඳ අඬන්නට පටන්ගත්තේ ය. ඒ ඇඬීම කාමරයේ සිටි අයට පමණක් නො ව මිතියාට ද පුදුම-යක් විය. බිත්තිය දෙසට හැරුණු හෙතෙම දෑතින් ම පුටුව බදාගෙන ඇඬුවේ ය,

"ලැජ්ජා නැද්ද අඩන්න!"යි ගෘසෙන්කා කීවේ දෙස් පවරන්නාක් මෙනි. "ඔය විදියට ද මා බලන්න ආවේ? හදිසියෙන් ම කතා කරන්න පටන් ගත්තා. නමුත් වචනයක් වත් තේරුම් ගන්න බැහැ. මීට ඉස්සෙල්ලා වතාවක් ඔය විදියට ඇඬුවා දැනුත් ඒ විදියට ම අඩනවා . ලැජ්ජා නැද්ද අඩන්න! මොක ද අඩන්නේ? හරියට අඩන්න හේතුවක් තියෙනවා වගෙයි" ගෘසෙන්කා තොරුස්නා ගතියකින් කීවේ වචනයක් පාසා නතර වෙමිනි."

"නැහැ නැහැ, මම අඩන්නේ නැහැ......ඉතින් කොහොමද?" මෙසේ විමසූ මීතියා හිටිහැටියේ ම ආපසු හැරී සිනාසෙන්නට විය.

"දැන් හොඳයි........දැන් ඉතින් සන්තෝෂ වෙන්න."යි ගෘසෙන්කා වාටු බසින් කීවා ය. 'මම බොහො ම සතුටුයි මීතියා ආපු එක ගැන. ඇහුණද? මා කැමැතියි මීතියා මේ කාමරයේ සිටිනවට"යි අනතුරුව ඈ කාමරයේ සිටින පිරිස අමතා කීවා ය. නමුත් ඈ කීවේ සෝපාව උඩ හිඳ සිටින මිටි මහත මිනිහාට ඇසෙන්නට ය. "මීතියා මෙහි සිටිනවාට මම බොහො ම කැමැතියි. මීතියා යනවානම් මාත් යනවා"යිඇ බැබළෙන නෙතින් යුතු ව කීවා ය.

"මගේ රැජිණ ගේ වචනය පිළිපැදිය යුතුයි" පෝලන්ත ජාතිකයා කීවේ ගෘසෙන්කා ගේ අත ගෙන ආසාවෙන් සිඹිමිනි. "මහත්මයා කරුණාකර අප එක්ක ප්‍රීති වෙන්න"යි අනතුරු ව හෙතෙම මීතියා දෙසට හැරී කරුණාවෙන් කී ය.

තවත් දිග කතාවක් කිරීමට මෙන් මීතියා ඒක්ෂණයෙන් ම නැගිට්ටේ ය. එහෙත් ඔහු ගොළු විය.

"මහත්වරුනි අපි වයින් බොමු"යි ඔහු කතාව වෙනුවට කීවේ ය. හැම දෙනා ම සිනාසුණහ.

"මා හිතුවා මීතියා තවත් කතාවක් කරන්න හදනවය කියා!" ගෘසෙන්කා කලබල වෙමින් කීවා ය. "මීතියා මා කියන දෙය හොඳට අහගන්න. මීට පස්සේ උඩ පනින්න එපා. ෂැන්පේන් ගෙනාපු එක බොහො ම හොඳයි. සැර බීම ජාති මට බොන්න බැහැ. කොහොම වුණත් මාත් ටිකක් බොනවා. ඒ තේරටි ම වැඩිය හොඳයි තුඹ ආපු එක. මම බොහො ම කම්මැලි කමින් හිටියේ. නමුත් ආවේ තව පාරක් කා බී මුදල් නාස්ති කරන්න ද? ඔය සල්ලි සාක්කුවේ දමා ගන්න. කොහෙන් ද ඔච්චර මුදල් ලැබුණේ?"

මීතියා මෙතෙක් වේලා සිටියේ පොඩි වූ නෝට්ටු මිටිය මිටමොළවාගෙන ය. හැම දෙනා ම ඔහු ගේ අත දෙස බලා හුන්හ. වැඩි සැලැකිල්ලකින් බලා සිටියේ පෝලන්ත ජාතිකයෝ දෙදෙනා ය, කලබල වූ මීතියා වහා මුදල් සාක්කුවේ දමා ගත්තේ ය. ලැජ්ජාවෙන් ඔහු ගේ මුහුණ රතු විය. ඒ මොහොතේ හෝටල් හිමියා මූඩිය ඉවත් කරන ලද ෂැන්පේන් බෝතලයක් සමග තැටියක තබන ලද වීදුරු කීපයක් ගෙනාවේ ය. මීතියා වහා බෝතලය ගත්තේ ය. එහෙත් ඔහු ගේ සිත කොතරම් අවුල් වූයේ ද කියතොත් බෝතලයෙන් කුමක් කළයුතු දැයි ඔහු නොදත්තේ ය. කල්ගානෝ මීතියා ගේ අතින් බෝතලය ගෙන වීදුරු පිරෙව්වේ ය.

"තව බෝතලයක් ගෙනෙන්, තව් බෝතල්යක් ගෙනෙන්"යි හෝටල් අයිතිකරුට අණ කළ මීතියාට, මීට ටිකකට කලින් තමා විසින් ෂැන්පේන් පානයට කැඳවන ලද පෝලන්ත ජාතිකයා පවා අමතක විය. අනෙක් අය ෂැන්පේන් පානය කරන තෙක් බලා නොසිටි මීතියා හිටිහැටියේ ම වීදුරුව හිස් කෙළේ ය. ඔහු ගේ මුහුණේ ස්වභාවය හදිසියෙන් ම වෙනස් විය. ඔහු කාමරයට පැමිණෙන විට පැවැති කනස්සලු ගතිය වෙනස් වී ළමයකු ගේ මුහුණේ දකින්නට ලැබෙන ස්වභාවයට සමාන ස්වභාවයක් දකින්නට තිබිණි. හදිසියෙන් ම ඔහු ඉතා කරුණා-වන්ත විය. සන් සුන් විය.ඔහු ලජ්ජාවෙන් හා ප්‍රීතියෙන් ද කාමරයේ සිටිය අය දෙස බැලුවේ ය. කරන ලද කිසියම් වරදක් නිසා දඬුවම් කොට සමාව දෙන ලද සුනඛයකු මෙන් බැලුවේ ය. ඔහුට හැම දෙයක් ම අමතක වූවාක් මෙන් පෙනේ. ඔහු ප්‍රීතියෙන් සිටින දරුවකු මෙන් සිනා සී හැම දෙනා දෙස ම බැලුවේ ය. ගෘෂෙන්කා දෙස සිනාවෙන් ආලෝක වූ බැල්මක් හෙළූ මීතියා පුටුව ඇය ළඟින් තබා හිඳගත්තේ ය. ටිකින් ටික ඔහුට පෝලන්ත ජාතිකයන් දෙදෙනා ගැන සෑහෙන ප්‍රමාණයක අවබෝධයක් ඇති විය. එහෙත් ඔවුන් ගේ සිත් තුළ කෙබඳු අදහස් තිබේ දැයි ඔහු නො දත්තේ ය. සෝපාව උඩ හිඳ සිටි පෝලන්ත ජාතිකයා ගේ උදුර පෙනුම, ඔහු පෝලන්ත ස්වරයෙන් කළ කතාව, මීතියා ගේ සිත තදින් ඇදගත්තේ ය. ඔහු උරමින් සිටි පයිප්පයට මීතියා විශේෂ සැලකිල්ලක් දක්වූයේ ය. "කැමැති නම් පයිප්පය බීපු දෙන්. ඒකට වරදක් නැහැ"යි මීතියා කල්පනා කෙළේ ය. ඔහු ගේ කුඩා නහය යටින් පිහිටි කෙළවරින් සිහින් කොට කපා කළු කරන ලද අවිනීත පෙනුමෙන් යුත් රැවුලෙන් වැසුණ තලතුනා මුහුණ ගැන මීතියා සැක නො කෙළේ ය. නළල උඩින් පහතට වැටෙන ලෙස පිරන ලද, දුවුවන් තුළ සිනා උපදවන බොරු කොණ්ඩය ගැන ද මීතියා වැඩි සැලකිල්ලක් නො දක්-වීය.

"බොරු කොණ්ඩයක් දමා ගෙන ඉන්න කැමැති නම් කමක් නැහැ"යි මිතියා කල්පනා කොට විනෝද විය. සෝපාවේ හිඳ සිටි පෝලන්ත ජාතිකයාට වඩා තරුණ වූ අනෙක් පෝලන්ත ජාතිකයා කිසි ම ගරු සරුවක් නො දක්වා පිරිස දෙස බලා පිළිකුල් සහගත නිශ්ශබ්දතාවකින් යුතු ව ඔවුන් ගේ කතාවට සවන් දුන්නේ ය. ඔහු ගේ උස ශරීරය ගැන මිතියා වැඩි සැලකිල්ලක් දක්වී ය. අඩිහයක් හා අඟල් තුනක් පමණ උස ඇතැයි මිතියා කල්පනා කෙළේ ය. ඔහු අනෙක් පෝලන්ත ජාතිකයා ගේ මිත්‍රයකු විය යුතු ය, නැතිනම් ඔහුගේආරක්ෂාව පිණිස සිටින්නකු විය යුතු ය. උස පෝලන්ත ජාතිකයා මිටි මහත පෝලන්ත ජාතිකයා ගේ සේවකයා බවට කිසි ම සැකයක් නැත. එහි කිසි ම වරදක් නැත. ඒ ගැන ප්‍රශ්න කිරීමට ද අවශ්‍ය නැතැ යි මිතියා කල්පනා කෙළේ ය. මිතියා දක්වූ යටහත් කම නිසා ඔවුන් අතරේ පැවැති විරුද්ධ වාදී හැඟීම් නැති වී ය.

ගෲසෙන්කා ගේ ස්වභාවය හා ඇගේ ඇතැම් වචනවල පැවැති ගුප්ත අදහස මිතියාට කෙසේ වත් තේරුම් ගත නො හැකි විය. ඔහුට ප්‍රීතියෙන් කුල්මත් වූ හදවතින් තේරුම් ගත හැකි වූයේ ඈ තමාට හිතවත් බවත්, ඈ තමාට සමා වූ බවත්, ඈ තමා ළඟින් හිඳුවා ගත් බවත් පමණි. ඈ උගුරෙන් උගුර වයින් පානය කරන සැටි බලා මිතියා ප්‍රීති විය. පිරිස අතරේ පැවැති නිශ්ශබ්දතාව ඔහුට අමුත්තක් මෙන් දැනිණි. ඔහු බලාපොරොත්තුවෙන් පිරි නෙතින් හැම දෙනා දෙස ම බැලුවේ ය.

"ඇයි අපි නිකම් ඉන්නේ? ඇයි අපි මොනවත් නොකරන්නේ?" යන ප්‍රශ්නය ඔහු ගේ සිනාවෙන් බැබැළෙන නෙත් තුළින් මතු වන්නාක් මෙන් පෙනේ.

"මේ මහත්මයා පිස්සු කතාවක් කළා. අපි සේරම හිනා වුණා"යි කල්ගානෝ හදිසියෙන් ම මහලු මැක්සිමෝව් පෙන්නා කීවේ මිතියාගේ අදහස් තේරුම් ගත්තාක් මෙනි.

මිතියා එවේලේ ම කල්ගානෝව් දෙස ද අනතුරු ව මැක්සිමෝව් දෙස ද රවා බැලුවේ ය.

"ඔව්, මෙයා පිස්සු දේවල් කියනවා" යි කියා ඔහු සිනාසිණි. කිසියම් දෙයක් ගැන හදිසියෙන් ම ප්‍රීති වූවාක් මෙන් ඔහු සිනාසිණි. "හා! හා! හා!"

"මහත්මයා විශ්වාස කරනව ද, මෙයා කියනවා විසිවන සත වර්ෂයේ දී අපේ සේනාවෙ නිලධාරීන් සේරම පෝලන්ත ගෑනු කසාද බැන්දළු. ඒක බොරුවක් නේ ද?"

"පෝලන්ත ගෑනු?"යි මීතියා කීවේ මහත් ප්‍රීතියෙනි.

මීතියා, ගෘසෙන්කාට දක්වන සැලකිලි ගැන කල්ගානෝ දැන සිටියේ ය. පෝලන්ත ජාතිකයා ද ගෘසෙන්කාට දක්වන සැලකිලි ගැන ඔහු අනුමාන වශයෙන් කල්පනා කළ මුත් වැඩි සැලකිල්ලක් නොදක්වී ය. සමහර විට ඔහු කිසි ම සැලකිල්ලක් නො දක්වන්නට ඇත. ඔහු මැක්සිමෝ ගැන සැලකිලිමත් විය. මැක්සිමෝ සමග කිසි ම බලාපොරොත්තුවක් නැති ව හෝටලයට පැමිණි ඔහුට පෝලන්ත ජාතිකයෝ දෙදෙනා ද හමු වූහ. ඔහු මීට කලින් ඔවුන් දැක නැත. එහෙත් ඔහු ගෘසෙන්කා හැඳින සිටියේ ය. වරක් ඔහු තවෙකකු සමග ඇය හමුවීමට ද ගියේ ය. එදා ඔහුට වැඩි සැලකිල්ලක් නොදැක්වූ ගෘසෙන්කා අද ඔහු දෙස ආදරයෙන් බැලුවා ය. මීතියා එන්නට කලින් ඇ ඔහුට අගර දගර පෑවා ය. එහෙත් ඔහු ඇගේ අදහස්වලට වැඩි අනු-බලයක් නුදුන්නේ ය. පැහැමත් මුහුණින් හා රොෝසු හිස කෙසින් ද යුත් කල්ගානෝ නිතර අලංකාර ලෙස අඳුම් පැළඳුම් කරන හවුරුදු විස්සකට වඩා වයස නැති ගැටයෙකි. ඔහු ගේ පැහැමත් මුහුණ අලංකාරකළ ලාතිල් පැහැති දෑස තුළ නැණවත් ගතියක් සමග ඇතැම් විට ගැඹුරු හැඟීම් ද දකින්නට තිබිණි. ඒ ගැඹුරු පෙනුම ඔහු ගේ වයස ඉක්මවා ගියේ ය. සමහර විට ඔහු ළමයකු මෙන් කතා කරයි. ඒ බව දැනදැනත් ඔහු ලැජ්ජා නො වී ය. සාමාන්‍යයෙන් ඔහු කපටි සිත් ඇත්තෙකි. නිතර මිත්‍ර කම හැගෙව්වත් චපල ය. ඇතැම් විට හිතුවක්කාර ය. ඔහු ඔබ දෙස බලා, ඔබේ කතාවට සවන් දෙයි. එහෙත් ඒ අතරේ කිසියම් දෙයක් ගැන කල්පනා කරයි. ඔහු උදාසීන ය, අලස ය, ඇතැම් විට ඉතා සුළු දෙයටත් නොසන්සුන් වන්නේ ය

"මතක ද තුඹේ සහෝදරයා ඉවාන්, මැක්සිමෝ කරත්ත-යෙන් තල්ලු කළ දවස? එදා ඉඳලා අද දක්වා දවස් හතරක් ම මම මැක්සිමෝ හැම තැන ම එක්ක ගෙන ගියා. ඉවාන්, මැක්-සිමෝ කරත්තයෙන් තල්ලු කළාම මම මිනිහ ගැන ලොකු සැලකිල් ලක් දැක්වූවා. ඉතින් මම මිනිහ පිටිසර පළාතට එක්කගෙන ගියා. දැන් මිනිහ පිස්සු දේවල් කියන නිසා මට මිනිහ එක්ක ඉන්න ලැජ්ජයි. මම දැන් මිනිහ ආපසු එක්ක යනවා"යි කල්ගානෝ ඇද පැද කී ය.

"මේ මහත්මයා කවදාවත් පෝලන්ත කාන්තාවක් දැකලා නැහැ. ඉතින් එයා කියන දෙය කවදාවත් ඇත්ත වෙන්න බැහැ"යි පයිප්පයක් උරමින් සිටි පෝලන්ත ජාතිකයා මැක්සිමෝට කී ය.

හෙතෙම ටිකක් හොඳට රුසියන් බස කතා කෙළේ ය. හැගෙව්වාටත් වඩා හොඳට කතා කෙළේ ය. රුසියන් වචනයක් පාවිච්චි කළ හැම විට ම එය පෝලන්ත ස්වරයෙන් උච්චාරණය කිරීමට වෑයම් කෙළේ ය.

"ඇයි එහෙම කියන්නේ? මම කසාද බැන්දේ පෝලන්ත කාන්තාවක්"යි මැක්සිමෝ සිනාසෙමින් කී ය.

"නමුත් මහත්මයා අශ්ව සේනාංකයේ සේවය කළේ නැහැ නේ ද?" කල්ගානෝ ගත්කටටම ඇසුවේ ය. "අශ්ව සේනාංකය ගැන කතා කළාට එම සේනාංකයේ නිලධරයෙක් ද?"

"අශ්ව සේනාංකයට බැඳී සේවය කළේ නැහැ නේ ද?"යි මිතියා විමසුවේ ඔවුන් ගේ කතාවට ඕනෑ කමින් සවන් දෙමින් හා ඔවුන් දෙස විමැසිල්ලෙන් බලමිනි. ඔවුන් ගෙන් කුමන පිළිතුරක් ලැබේ දැයි ඔහු නොදත්තේ ය.

"නැහැ මහත්මයා මා කියන්න අදහස් කළේ පෝලන්ත තරුණියන් ගැනයි......... උන් බොහො ම රූවයි......... අපේ ඉලන්දාරි එක්ක නටන කොට, ඒ කියන්නේ නටාලා හමාර වූ හැටියේම උන් අම්ම තාත්තා බලා සිටිය දී, ලස්සන බලල් පැටියකු වගේ අර නිලධරයා ගේ ඔඩොක්කුවට පැනලා ඉඳගන්නවා. උන් ගේ දෙමව්පියෝ ඒකට ඉඩ දෙනවා. ඉතින් පසුවද අර ඉලන්දාරියා ගිහින් ළමිස්සිය ව කසාද බඳින්න යෝජනා කරනවා හි! හි! හි!"යි මුකුළු සිනාවක් පාමින් මහලු මැක්සිමෝ කතාව අවසන් කෙළේ ය.

"කිසි ම වැදගත් කමක් නැති රස්තියාදු කාරයෙක්"යි උස පෝලන්ත ජාතිකයා කෝපයෙන් කීවේ කකුලක් පිට කකුලක් දමා ගනිමිනි.

පෝලන්ත ජාතිකයා පය ලා සිටි, අඩියේ මඩ තැවැරුණු, පමණට වඩා ලොකු පාවහන් දෙසට මිතියා ගේ සිත මොහොත කට පමණ ඇදී ගියේ ය. ඇත්ත සේ කියන්නේ නම් පෝලන්ත ජාතිකයන් දෙදෙනා ගේ ම ඇඳුම් මදක් අපිරිසුදු විය.

"රස්තියාදු කාරයෙක්! මොකද මිනිසුන්ට ඔහොම අපහාස කරන්නේ?"යි ගෲසෙන්කා හදිසියෙන් ම කිපී කීවා ය.

"ගෲසෙන්කා මේ මහත්මයා පෝලන්තයේ දී දැකලා තියෙන්නේ වැඩකාරියන් මිස කුල කාන්තාවන් නො වෙයි"යි පයිප්පයක් උරමින් සිටි පෝලන්ත ජාතිකයා කිවේ ය.

"ඔව් , ඒක ඇත්තයි." උස පෝලන්ත ජාතිකයා පිළිකුලින් බලා කී ය.

"ඉතින් මොක ද?"යි ගෲසෙන්කා වහා කීවා ය. "ඒ මිනිහා ඕනෑ දෙයක් කියාපු දෙන්. මිනිස්සු කතා කරන්නේ නැද්ද? ඇයි මිනිසුන් ගේ කතාවට බාධා කරන්නේ? එ වැනි අය එක්ක කතා කිරීම සතුටක්."

"නැහැ ගෲසෙන්කා, මම ඒ මහත්මයා ගේ කතාවට බාධා කළේ නැහැ"යි පැවසූ පෝලන්ත ජාතිකයා බොහෝ වේලා තරුණිය දෙස බලා සිට අනතුරු ව නිහඬ ව පයිප්පය උරන්නට විය.

"නැහැ නැහැ පෝලන්තයේ ඉඳලා ආපු මහත්මයා කියන එක ඇත්තයි" කල්ගානෝ මහත් උනන්දුවෙන් කිවේ මේ කාරණය ඉතා වැදගත් වූවාක් මෙනි. "මැක්සිමෝ මහත්මයා කවදාවත් පෝලන්තයට ගිහින් නැහැ. ඉතින් එයා කොහොම ද පෝලන්තය ගැන කතා කරන්නේ? මහත්මයා කසාද බැන්දේ පෝලන්තයේ දී නො වෙයි නේ ද?"

"නැහැ මහත්මයා මම කසාද බැන්දේ සැමොලෙන්කි පළාතේදීයි. අපේ රෙජමේන්තුවේ ලෙප්ටිනන් කෙනෙක්, අම්මාත්, තාත්තාත් ගැනු නැයෙක් හා ඇගේ ලොකු පුතෙක් සමඟ මගේ තෝනා එක්කගෙන ඇවිදින් මට බාර දුන්නා. මිනිහ බොහො ම හොඳයි. ඉස්සෙල්ලා මිනිහ ඇය කසාද බඳින්නටයි හිටියේ. නමුත් ඒ අදහස අත්හැරියා ඇ කොර වූ නිසා"

"එහෙනම් මහත්මයා බැන්දේ කොර ගැනියක් ද?"යි කල්ගානෝ ඇසුවේ ය.

"ඔව් මහත්මයා, මම කසාද බැන්දේ කොර ගැනියක්. උන් මාව රැවැට්ටුවා. ඉස්සෙල්ලා උන් ඒක රහසක් හැටියට හංගගෙන හිටියා. මා දැක්කා ම ඇ උඩ පනින්නට පටන් ගත්තා. මං හිතුවා ඇ උඩ පනින්නේ සන්තෝසයට කියා........."

"ඒ ගැනි උඩ පනින්න ඇත්තේ තුඹ කසාද බඳින සන්තෝසයෙන් වෙන්න ඇති"යි කල්ගානෝ කීවේ දරුවකු මෙන් විනෝද වෙමිනි.

"ඔව් මහත්මයා ඈ උඩ පැන්නේ සන්තෝසයෙන් තමයි. නමුත් කසාදබැන්ද දවසේ ම ඈ මට කොර වෙච්ච බව කිව්වා. 'පොඩි කාලේ දී මඩ කඩිත්තක් උඩින් පැනලා කකුල කඩා ගත්තා'ය කියා මගෙන් සමාව ඉල්ලුවා.

දරුවකු මෙන් මහ හඩින් සිනාසෙන්නට පටන් ගත් කල්ගානෝ සෝපාව උඩ ඇද වැටුණේ ය. ගෘසෙන්කා ද සිනාසුණා ය. මීතියා ගේ මුහුණ ප්‍රීතියෙන් ප්‍රබෝධ විය.

"දැන් මිනිහ කියන්නේ ඇත්තයි" කල්ගානෝ මීතියාට කීය. තුඹ දන්නව ද මෙයා දෙපාරක් කසාද බැන්දු. ඔය කීවේ පලමුවන කසාදය ගැනයි. නමුත් මෙයාගේ දෙවන කසාද ගැනි පැනල ගියා. ඒ කතාව දන්නව ද?"

"ඈ පැනල ගියා ද?"යි මීතියා හදිසියෙන් ම මැක්සිමෝව් දෙසට හැරෙමින් ඇසුවේ කතාව අසා පුදුම වූවකු මෙනි.

"ඔව් මහත්මයා"යි කියමින් මැක්සිමෝව් ශිෂ්ටයකු ලෙස ඇත්ත පිළිගත්තේ ය. "ඒ ගැනි ප්‍රංශ කාරයෙක් එක්ක පැනල ගියා. ඒ සේරට ම වැඩිය හපන් පැනල යන්න ඉස්සෙල්ලා මට තිබුණු එක ම ඉඩම් කැබෙල්ල ඇගේ නමට ලියවා ගත්තා. උඹ උගත් මිනිහෙක්, ඒ නිසා උඹට කොහොමටත් ජීවත් වෙන්න පුළුවනි කියා මගේ ඉඩමට විද්දු. මට වතාවක් සිල්වත් බිෂොප් කෙනෙක් කිව්වා තමුසේ ගේ ඉස්සෙල්ල ගැනි කොරයි. ඒකට මොක ද දෙවන ගැනි බොහො ම කපටියි කියා. හි! හි! හි!"

"මේක අහන්න"යි කල්ගානෝ මහත් උනන්දුවෙන් කී ය. "මෙයා කියන්නේ බොරුවක් නම් මෙයා හැම තිස්සේ ම කියන්නේ බොරු. නමුත් බොරු කියන්නේ අනෙක් අය සතුටු කිරීමටයි. ඒකේ කිසි ම වරදක් නැහැ. වරදක් තියෙනව ද? සමහර විට මම මිනිහට බොහො ම කැමැති යි. මිනිහ බොහො ම නීචයි. ඒක එයා ගේ ගතිය! එහෙම නේ ද? මොක ද අදහස? සමහර අය පෞද්ගලික වාසියට බොහො ම නීච වැඩ කරනවා. නමුත් අපේ මිත්‍රයා නීච කම් කරන්නේ පුරුද්දටයි. එයා කියනවා ගොගොල් 'මළ මිනිස්සු' ලියන කොට එයා ගැන මතක තියාගෙන ඉන්න ඇතියි කියා. එයා ඊයේ මුළු දවස ම මේ ගැන වාද කළා.

මහත්මයාට මතක ද ගොගොල් ගේ නවකතාවේ නශ්ඩු කියල මිනිහෙක්, මැක්සිමෝ කියන ඉඩම් අයිතිකාරයාට තලාපු හැටි විස්තර කරනවා? මත් පැන් බී මැක්සිමෝට පහර දුන් වරදට නශ්ඩුට විරුද්ද ව නඩු දමනවා මහත්මයාට මතක ද? මෙයා කියනවා නශ්ඩු තැළුවේ මෙයාටලු. ඉතින් ඒක වෙන්න පුළුවන් දෙයක් ද? චිචිකෝප් මළ මිනිස්සු එකතු කරමින් රට පුරා ගියේ විසිවන ශත වර්ෂයේ මුල් කාලයේදීයි. ඉතින් දවස් ගණනත් වැරදියි. එතකොට නශ්ඩු ගෙන් ගුටි කන්න ඇත්තේ මෙයා වෙන්න බැහැ. එහෙම නේ ද?"

කල්ගානෝ මෙ තරම් කලබල වූයේ කුමන කරුණක් නිසා දැයි සිතා ගැනීම අපහසු ය. නමුත් ඔහු කලබල වූයේ හේතුවක් ඇති ව ය. මීතියා තරුණයා ගේ පැත්ත ගත්තේ ය.

"ඉතින් මොක ද මිනිහට තැළුවට වෙන්නේ?"යි මීතියා ඇසුවේ මහ හඬින් සිනා සෙමිනි.

"ඇත්ත කියනවානම් උන් මට තැළුවේ නැහැ"යි මැක්සිමෝ හදිසියෙන් ම කීවේ ය. "මට නිකම් .. ..."

"නිකම් මොකක් ද? උන් තුඹට ගැහැව්වද නැද්ද?"

"වෙලාව කීය ද?"යි පයිප්පයක් උරමින් සිටි මිටි මහත පෝලන්ත ජාතිකයා කෝපයෙන් සිටි උස මහත. පෝලන්ත ජාතිකයා ගෙන් ඇසුවේ ය.

අනෙකා පිළිතුරු දෙනවා වෙනුවට උරහිස් හකුලා ගත්තේ ය. ඔවුන් දෙදෙනා ළඟ ඔරලෝසුවක් නො තිබිණි.

"ඇයි තුඹලා බුම්මාගෙන ඉන්නේ?"යි ගෘසෙන්කා කෝපයෙන් ඇසුවේ ඔවුන් කුපිත කිරීමේ අදහසිනි. "අනෙක් අය ඕනෑ තරම් කතා කරපු දෙන්. මොකද තුඹලා කතාකරන්න කැමැති නැති නිසා අනෙක් අයවත් බුම්මගෙන ඉන්න ද කියන්නේ?"

පළමු වරට කිසියම් දෙයක් හදිසියෙන් ම මීතියාගේ සිතේ ඇති විය. මෙවර පෝලන්ත ජාතිකයා පිළිතුරු දුන්නේ සඟවා නොගත් කෝපයෙන් යුතු ව ය.

"මම කතා කරනවාට විරුද්ධ වුණේ නැහැ. මම කිසි ම දෙයක් කිව්වේ නැහැ."

"එහෙනම් වරදක් නැහැ. මැක්සිමෝ් දන් ජීවිත කතාව කියන්න"යි මහල්ලාට කී ගෘසෙන්කා "මොකද නුඹලා කතා නොකරන්නේ?"යි අනෙක් අය ගෙන් ඇසුවා ය.

"වෙන කියන්න දෙයක් නැහැ. ඒක මහ මෝඩ කතාවක්"යි මැක්සිමෝ් සිනා සෙමින් වහා පිළිතුරු දුන්නේ ය. "ගොගොල් ලිව්වේ උපමා කතාවක්. පොත පුරා ම තියෙන්නේ උපමා. නෂ්ඩ්‍රෝ ගේ නියම නම නසෝ. කුස්ඵතිකෝප් අමුතු ම ජාතියේ නමක් එයා ගේ නියම නම සිවාන්යෝ. පරනාඩි ගේ නම පරනාඩි මයි. තියෙන වෙනස පරනාඩි ඉතාලි කාරයෙක් නො වෙයි. රුසියන් කාරයෙක්. පරනාඩි ගේ නෝනා තද වෙන්න මේස් දමාගත්ත ලස්සන කකුල් ඇති, හොඳ හැඩ රුව ඇති කෙල්ලක්. ඇගේ ගවුම කොටයි. මුළු ගවුම ම දිලිසෙනවා, ඇට පැය හතරක් නොවෙයි මිනිත්තු හතරක් වංචිට කැරකැවෙන්න පුළුවනි. කෙල්ල දුටුවා ම පිරිමි තෝන්තු වෙනවා."

"නමුත් නෂ්ඩ්‍රෝ නුඹට ගැහැව්වේ මොන කාරණයක් නිසාද?"යි කල්ගානෝ ඇසුවේ ය.

"පිරොන් නිසයි ගුටි කන්න වුණේ.

"පිරොන් කියන්නේ කාට ද?"යි මීතියා විමසුවේ ය.

"පිරොන් බොහො ම ප්‍රසිද්ධ ප්‍රංශ නවකතා කාරයෙක්. එදා අපි ඒ සල්පිලේ තිබුණු තැබෑරුමට ගිහින් හොඳට බිව්වා. අපි හුගදෙනෙක් හිටියා. උන් මටත් කතා කළා. ඉතින් මා කළ පළමුවන දෙය ආප්තෝපදේශ වාක්‍යවලින් කතා කිරීමයි. උන්ට තරහ ගිහින් මට මහ වල් විදියට බැන්නා. මම මගේ නරක වෙලාවට පිරොන් ගැන ආප්තෝපදේශය කිව්වා. බොහෙ ම ලොකු උගතෙකු වූ පිරොන් ප්‍රංශ ඇකඩමියට නොගත්ත සැටි විස්තර කරලා, ඒ එක්ක ම පිරොන් තමා මළ පසු සොහොන් කොතේ ලියන්නටය කියා සිතේ කෝපයෙන් රචනා කරදුන් කවි පදය කිව්වා.

මෙහි සැතපෙන පිරොන්,
උගතකු වුවත් නුවණැති,
කිසි ම කටයුත්තක් නිසි
නැත ඉටු කළේ යහතින්.

උන් මාවා අල්ලාගෙන හොඳට ම තැළුවා.!"

"මොනවට ද තැළුවේ?"

"මට තැළවේ මං උගතකු නිසයි. මිනිහකුට තළන්න පුළුවන් හේතු බොහොම තියෙන වා"යි මැක්සිමෝ කොටින් කීවේ ය.

"ඔය ඇති, නිකම් විකාර දෙඩවනවා"යි ගෘසෙන්කා හදිසියෙන් ම කීවා ය. "මං හිතුවා කතාව අහලා විනෝද වෙන්න පුළුවන් ය කියා."

මීතියා මහ හඬින් සිනාසෙන්නට විය. සිහින් උස පෝලන්ත ජාතිකයා හුන් තැනින් නැඟිට දෙඅත් පිටිපසට කරගෙන තමාට නුසුදුසු සමාගමක සිටීමෙන් විඩා වැටුණු බව හඟවා කාමරයේ එක් කෙළවරක සිට අනෙක් කෙළවරට ඇවිදින්නට පටන් ගත්තේ ය.

"අර මිනිහට එක තැනකට වෙලා ඉන්න බැහැ නොවැ"යි ගෘසෙන්කා සෙමෙන්, එහෙත් පිළිකුළින් කීවා ය. මීතියා නොසන්සුන් විය. හැරත් සෝපාව උඩ හිඳ සිටි මිටි මහත පෝලන්ත ජාතිකයා තමා දෙස නොරුස්නා බැල්මෙන් බලා සිටින බව ඔහු දුටුවේ ය.

මීතියා මිතිසුන් දෙදෙනා අමතා "මහත්වරුනි අපි අඩියක් ගහමු"යි කී ය.

අනතුරු ව ඔහු වහා වීදුරු තුනක් ගෙන ෂැන්පේන් පිරෙව්වේ ය.

"මහත්වරුනි මම තමුන්නාන්සේලා ගේ මව් රට වන පෝලන්තයේ සෞභාග්‍යය පතා ෂැන්පේන් බොනවා"යි මීතියා කී ය.

"බොහො ම සන්තෝෂයි" සෝපාව උඩ හිඳ සිටි මිටි මහත මිනිහා මහත්තත්ව කමක් හඟවා කියා වීදුරුව අතට ගත්තේ ය.

"මහත්මයා ගේ මිත්‍රයා ? මොකක් ද එයා ගේ නම? වීදුරුව අරගෙන බොන්න"යි මීතියා අනෙකා අමතා කී ය.

"ව්රුබෙල් ව්ස්කි" මිටි මහත පෝලන්ත ජාතිකයා කී ය.

ව්රුබෙල් ව්ස්කි මේසය ළඟට වැනෙමින් විත් වීදුරුව අතට ගත්තේ ය.

"මහත්වරුනි පෝලන්තයේ සෞභාග්‍යයටයි" මීතියා වීදුරුව උස්සා පවසා අනතුරු ව පානය කෙළේ ය.

තිදෙනා ම විදුරු හිස් කළ ඉක්බිති ව මිතියා බෝතලය ගෙන ඈයෙත් විදුරු තුන ම පිරෙව්වේ ය.

"දැන් ඉතින් මහත්වරුනි අපි රුසියාවේ සෞභාග්‍යය පතා ෂැන්පේන් බිලා සහෝදරයෝ වෙමු"

"මටත් විදුරුවක් දෙන්න. රුසියාවේ සෞභාග්‍යය පැතීමට මාත් කැමැතියි." ගෘසෙන්කා කිවා ය.

"මටත් විදුරුවක් දෙන්න"යි කල්ගානෝ කී ය.

"මේ මහත්වරුන් ගේ අකැමැත්තක් නැති නම් මාත් කැමැතියි අපේ ආදරණීය මිත්තණියන් වන රුසියාවේ සෞභාග්‍යය පතන්න"යි මහලු මැක්සිමෝ ද උසුළු විසුළු කරමින් කී ය.

"අපි සේරම එකට බොමු"යි පැවැසූ මිතියා "තවත් බෝතල අරන් වරෙන්"යි හෝටල් හිමියාට හඬ නගා කීවේ ය.

මිතියා ගෙනා අනෙක් බෝතල් තුන ද මේසය උඩ තබන ලදී. ඔහු ඒ බෝතල් තුන ද විදුරුවලට පිරෙව්වේ ය.

"මහත්වරුනි රුසියාවේ සෞභාග්‍යයටයි" කියමින් මිතියා විදුරුව ඉස්සුවේ ය.

පෝලන්ත ජාතිකයන් දෙදෙනා හැරෙන්නට අනෙක් හැම දෙනා ම ෂැන්පේන් පානය කළහ. ගෘසෙන්කා එක හුස්මට විදුරුව හිස් කළා ය. පෝලන්ත ජාතිකයෝ ඔවුන්ගේ විදුරුවලට අතවත් නො තැබූ හ.

"මොකද මහත්වරුනි, තමුන්නාන්සේලා බොන්නේ නැද්ද?" මිතියා විමසුවේ ය.

ව්රුබෙල් ව්ස්කි විදුරුව අතට ගෙන "1772 මායිම් සහිත රුසියාවේ සෞභාග්‍යයටයි" ගැඹුරු හඬින් කී ය.

"අන්න හරි"යි අනෙක් පෝලන්ත ජාතිකයා ද පැවැසූ පසු දෙදෙනා විදුරු හිස් කළහ.

"තමුසෙලා ෂමෝඩයෝ"යි මිතියා හදිසියෙන් ම කෑගා කී ය.

"මොනව ද මහත්මයා කිව්වේ?"යි පෝලන්ත ජාතිකයන් දෙදෙන එක විට ම ඇසුවේ පොර කුකුළන් දෙදෙනකු මෙන් මිතියා තැති ගන්වමිනි. ව්රුබෙල් ව්ස්කි කෝපයෙන් වෙවුලන්-නට විය.

"මොකද තමන්ගේ රටට ඇලය කරන්න බැරි ද?"යි ඔහු කෑගා ඇසුවේය.

"කෑගාන්න එපා. මෙ තැන කෝලාහල කරන්න එපා. මෙ තැන කිසි ම කෙනෙක් කෝලාහල කරනවාට මා කැමැති නැහැ"යි ගෘසෙන්කා බිම අඩි හපා කිවේ තමා ගේ නියමය පිළිපැදිය යුතු බව හඟවන්නාක් මෙනි. ඇගේ මුහුණ රතු විය. දෑස බැබැළුණේ ය. දන් ටිකකට කලින් ඇ පානය කළ ෂැන්පේන්-වල සැර මතු විය. මිතියා තැති ගත්තේ ය.

"බොහො ම කනගාටුයි, මේක මගේ වරද, මීට පස්සේ මේ වගේ දෙයක් වෙන්නේ නැහැ."

"කට වහ ගනින්, උඹ මෝඩයා, ඔතැනින් ඉඳගනින්"යි ගෘසෙන්කා කෝපයෙන් කෑගැවා ය.

නිහඬ ව ඉඳගත් ඔවුහු අනතුරු ව එකිනෙකා දෙස බැලූ හ.

"මහත්වරුනි, මෙ සේරම මගේ වරද"යි ගෘසෙන්කා ගේ කතාව තේරුම් නොගත් මිතියා ආයේත් කී ය. "අපි මොනවටද නිකම් ඉඳගෙන ඉන්නේ? මොනව හරි කරලා සන්තෝෂ වෙමු"

"මගේ නම් කිසි ම සන්තෝෂයක් නැහැ"යි කල්ගානෝ කම්මැලියකු මෙන් කී ය.

"අපි දන් ටිකකට ඉස්සෙල්ලා කාඩ් ගැහැව්වා වගේ ආයේත් කාඩ් ගහමු"යි මැක්සිමෝ හදිසියෙන් ම යෝජනා කෙළේ ය.

"බොහො ම හොඳයි, පෝලන්ත මහත්වරු කැමති නම් කාඩ් ගහමු"යි මිතියා ද කැමති විය.

"දන් රෑවුණා වැඩියි" සෝපාව උඩ හිඳ සිටි පෝලන්ත ජාතිකයා අසතුට පළකරමින් කිවේ පෝලන්ත බසිනි.

"ඔව් ඒක ඇත්තයි" අනෙකා ද කී ය.

"මොකද රෑ වුණා ය කියන්නේ?"යි ගෘසෙන්කා ඇසුවා ය.

"දන් රෑ වුණා, බොහො ම රෑ වුණා"යි සෝපාව උඩ හිඳ සිටි පෝලන්ත ජාතිකයා පිළිතුරු දුන්නේ ය.

"ඒ ගොල්ලන්ට හැම දෙයට ම රෑ වෙලා"යි ගෘසෙන්කා කෝපයෙන් කෑගා කිවා ය. "හැම දෙයක් ම ඒ ගොල්ලන්ට ලොකු කරදරයක්, ඒ ගොල්ලන්ට කරදරයක් නිසා අනෙක් අයටත් කරදරයක් ය කියා හිතනවා. මිතියා එන්න ඉස්සෙල්ලත් මෙහෙම ඉඳගෙන මට බැන්නා."

"ගෘසෙන්කා මට වැඩිය කැමති නැති බව පේනවා. ඒකයි මම වැඩිය කතා නො කර හිටියේ" මිටි මහත පෝලන්ත ජාතිකයා කී ය. "මහත්මයා දූන් අපි පටන් ගනිමු"යි කියමින් අනතුරු ව ඔහු මිතියා සුදුවට කැඳෙව්වේ ය.

"මහත්මයා පටන් ගන්න"යි පැවැසූ මිතියා සාක්කුවට අත දමා රූබල් දෙසීයක් ගෙන මේසය උඩ තැබුවේ ය; මා කැමැතියි මහත්මයාට පරදින්න. මහත්මයා කුට්ටම අනන්න."

"අපි කුට්ටමක් හෝටලය අයිතිකාරයා ගෙන් ඉල්ලා ගත්තා"යි මිටි මහත පෝලන්ත ජාතිකයා වැදගත් බවක් හඟවා කී ය.

"ඒක හොඳයි" සිහින් උස මිනිහා එකඟ වී ය.

"හෝටලය අයිතිකාරයා ගෙන් කුට්ටමක් ඉල්ල ගත්ත ද? ඒක බොහො ම හොඳයි" මෙසේ පැවැසූ මිතියා කුට්ටමක් ගෙනෙන ලෙස හෝටල්හිමියාට කෑගා කීවේ ය.

අලුත් කුට්ටමක් ගෙනත් දුන් හෝටල් හිමියා, තරුණියන් නැටුමට සැරසෙන බවත්, කයිතාලම් ගසන යුදෙව්වන් ඉක්මනට පැමිණෙන බවත්, නමුත් බඩු රැගත් කරත්තය තව ම නො පැමිණි බවත් කීවේ ය. වහා මේසය ළඟින් ඉවත් වූ මිතියා කළ යුතු දෑ කියා දීම පිණිස අනෙක් කාමරයට ගියේ ය.නැටුමට පැමිණ සිටියේ තරුණියෝ තිදෙනෙක් පමණි. මාරියා ඔවුන් අතරේ නොසිටියා ය. හැරත් ඔවුන්ට කුමක් කිව යුතු දැයි මිතියා නොදත්තේ ය. පෙට්ටියේ දමා ගෙනෙන ලද කැවිලි තරුණියන්ට දෙන ලෙස ඔහු නියම කෙළේ ය. "ඈන්ඩිට වොඩ්කා දීපන්. මිනිහා හිත හොඳින් නො වෙයි ඉන්නේ"යි ඔහු හෝටල් හිමියාට කී ය. ඒ මොහොතේ දී කාමරයට පැමිණි මැක්සිමෝ මිතියා ගේ උරහිසට තට්ටු කොට කතා කෙළේ ය.

"මට රූබල් පහක් දෙන්න"යි ඔහු රහසක් කියන්නාක් මෙන් කී ය. "මා කැමැතියි ඔට්ටුවක් අල්ලන්න."

"බොහො ම හොඳයි. පහක් නො වෙයි දහයක් ගන්න"යි මීතියා කීවේ සාක්කුවෙන් නෝට්ටු මිටිය ගෙන රූබල් දහයක් දෙමිනි. "පැරදුණොත් එන්න. තව සල්ලි දෙන්නම්........"

"බොහො ම ස්තුති"යි මුදල් ගනිමින් පැවැසූ මැක්සිමෝ වහා අනෙක් කාමරයට ගියේ ය.

වහා ආපසු කාමරයට පැමිණි මීතියා ද පමාව ගැන කනගාටුව පළ කෙළේ ය. මේසය ළඟ සුදුවට සූදානමින් හිඳ සිටි පෝලන්ත ජාතිකයෝ අලුත් කුට්ටම විවෘත කළහ. ඔවුහු හොඳ හිතක් පෙන්නූ හ. මිටි මහත පෝලන්ත ජාතිකයා පයිප්පය දල්වා ගෙන කුට්ටම අනන්නට විය. ඔවුන් සතුටින් ව සිටින බව ඔවුන් ගේ මුහුණුවලින් පෙනිණි.

"මහත්වරුනි, කරුණාකර වාඩි වෙන්න"යි සිහින් උස මිනිසා කී ය.

"බැහැ, මම සෙල්ලම් කරන්නේ නැහැ"යි කල්ගානෝ කී ය. "මා දනට ම මේ මහත්වරුන්ට රූබල් පනහක් පැරදිලයි ඉන්නේ"

"මේ තරුණ මහත්මයා එ තරම් ලොකු වාසනා වන්තයෙක් නො වෙයි" සෝපාව උඩ හිඳ සිටි මිටි මහත මිනිහා කී ය. "සමහර විට මේ පාර මහත්මයා දිනන්න පුළුවනි"

"මහත්වරු ළඟ කොච්චර සල්ලි තියෙනව ද?"යි මීතියා උනන්දුවක් දක්වා ඇසුවේ ය.

"මහත්මයා ඔට්ටු අල්ලන තරමට තියෙනවා. සීයක් දෙසීයක් මහත්මයා ඔට්ටු අල්ලන තරමට........"

"ලක්ෂයක්?"යි මීතියා ඇසුවේ මහා හඬින් සිනාසෙමිනි.

"මහත්මයා පොඩ්විසොස්කි ගේ කතාව අහල තියෙනව ද දන්නේ නැහැ"

"මොන පොඩ්විසොස්කි ද?"

"වෝසෝ නුවර තිබුණා සූදු පිටියක්. ඕනෑ ම කෙනකුට පුළුවනි මේ සූදු පිටියට ගිහින් සූදුකෙළින්න. පොඩ්විසොස්කි

මේ සුදු පිටියට ගිහින් රන් කාසි දහක්, සුදු පිටියේ තියෙන තරමක් සල්ලිවලට ඔට්ටු තිබ්බා. එතකොට සුදු පිටියේ ලොක්කා ඇහැව්වා 'මහත්මයා රන් කාසි දහක් ඔට්ටු තියා සෙල්ලම් කරනව ද? නැති නම් කටේ වචනයට සෙල්ලම් කරනව ද?' කියා 'කටේ වචනයට සෙල්ලම් කරනවා' කියා පොඩ්විසොස්කි පිළිතුරු දුන්නා. 'බෙහෝ ම හොඳ ' කියා වචනය පිළිගත් ලොක්කා කුට්ටම ඇනුවා. පොඩ්විසොස්කි දිනුවා. 'ටිකක් ඉන්න' කියා ලොක්කා ලාච්චුවක් ඇර රූබල් කෝටියක් දුන්නා. 'මෙ තරම් විශාල මුදලක් මේ සුදු පිටියේ තියෙන බව මං දන ගෙන හිටියේ නැහැ' කියා පොඩ්විසොස්කි පිළිතුරු දුන්නා. 'මහත්යා මහත්මයා ගේ වචනයට ඔට්ටු තිබ්බා. මම මගේ වචනයට ඔට්ටු තිබ්බා. මහත්මයා දිනුවා. ඉතින් මේ මුදල් ගන්න''යි ලොක්කා කිව්වාම පොඩ්විසොස්කි මුදල් ගත්තා.''

''ඒක බොරු කතාවක්''යි කල්ගානෝව් කී ය.

''මහත්මයා වැදගත් මිනිසුන් අතර ඔය විදියට කතා කරන්නේ නැහැ.''

''හරියට පෝලන්ත සුදුඅන්තුවෙක් කෝටියක් දෙනවා වගෙයි!'' පැවැසූ මිනියා සිය කතාව නතර කර ගත්තේ ය. ''මට සමා වෙන්න. මහත්මයා පැරදුණොත් පෝලන්තයේ ගෞරවය වෙනුවෙන් කෝටියක් දේවි''යි මිනියා කිවේ පෝලන්ත බස කතා කිරීමට වැයම් කරමිනි. ''බලන්න මං කො තරම් හොඳට පෝලන්ත භාෂාව කතා කරනවා ද කියා. හා! හා! හා! ඔන්න මම රූබල් දහයක් ඔට්ටු තිබ්බා. තුරුම්පුව බූරුවා.''

''භාරත පොරවට රූබල් එකක් ඔට්ටු තියනවා''යි සිතා සෙමින් පැවැසු මැක්සිමෝව් භාරත පොරවක් ගෙන අනෙක් අයට නො පෙනෙන්නට සඟවා ගැනීමට වැයම් කෙළේ ය. අනතුරු ව ඔහු මේසය වටේ ගියේ ය. මිනියා දිනුවේ ය. මැක්සිමෝව් ගේ රූබලය ද දිනුවේ ය.

''ඔට්ටුව වැඩි කරනවා''යි මිනියා කී ය.

''මම තවත් රූබලයක් වැඩි කරනවා''යි මැක්සිමෝව් කීවේ රූබලයක් දිනා ගැනීම ගැන ප්‍රීති වෙමිනි.

''පරාදයි'' පැවසූ මිනියා ''හතට දෙගුණයක් ඔට්ටු තියනවා''යි කී ය.

හතේ කොළය පරාජය විය.

'නවත්වන්න, නවත්වන්න''යි කල්ගානෝ හදිසියෙන් ම කී ය.

"මෙන්න ඔට්ටුව වැඩි කළා"යි කියමින් මීතියා අංයේත් ඔට්ටුව වැඩි කළේ ය. එහෙත් ඔට්ටුව වැඩි කළ හැම විට ම ඔහු පරාජය විය.

"මේ පාරත් ඔට්ටුව වැඩි කළා''යි මීතියා කෝපයෙන් කී ය.

"මහත්මයා දත් රූබල් සියක් පරාදයි" සෝපාව උඩ හිඳ සිටි පෝලන්ත ජාතිකයා කී ය. "තවත් රූබල් සියක් ඔට්ටු තියන්න කැමැති ද?''

"මොනවා? රූබල් සියක් පැරදුණා? හොඳයි, එහෙනම් රූබල් දෙසියක් ඔට්ටු තියනවා. සේරම ඔට්ටු දෙගුණයකින් වැඩි කරනවා."

මීතියා සාක්කුවට අත දමා මුදල් ගෙන පොරවට ඔට්ටු තැබුවේ ය. කල්ගානෝ වහා මුදල් අතින් වසා ගත්තේ ය.

''ඔය ඇති සෙල්ලම් කළා''යි කියමින් ඔහු කෑගැවේ ය.

"මොක ද කරන්නේ?''යි මීතියා කෝපයෙන් බලා ඇසුවේ ය.

''ඔය ඇති සෙල්ලම් කළා. මහත්මයා සෙල්ලම් කරනවාට මම කැමැති නැහැ. ඔයිට වැඩිය සෙල්ලම් කරන්න එපා.''

"මොක ද නැත්තේ?''

''ඔය සෙල්ලම නවත්වා මා එක්ක එන්න. ඔයට වැඩිය සෙල්ලම් කරන්න මම ඉඩ දෙන්නේ නැහැ."

මීතියා කල්ගානෝ දෙස පුදුමයෙන් බැලුවේ ය.

"ඔය සෙල්ලම නවත්වන්න මීතියා, කල්ගානෝ කියන දෙය හරි වෙන්න පුළුවනි. දත් හුඟක් පැරදුණා''යි ගෘසෙන්කා ද අමුතු ස්වරයකින් කීවා ය.

හදිසියෙන් ම නැඟී සිටි පෝලන්ත ජාතිකයෝ දෙදෙනා සිත පැරුණාක් මෙන් වේදනාවෙන් බැලුවෝ ය.

"මහත්මයා අපට විහිළු කරනව ද?"යි කුඩා පෝලන්ත ජාතිකයා කල්ගානෝ දෙස රවා බලා ඇසුවේ ය.

"මහත්මයා කිසිම බයක් හැකක් නැති ව අපට විහිළු කරනවා ද?"යි අනෙක් පෝලන්ත ජාතිකයා ද ඇසුවේ ය.

"ගිහි කුකුළෝ, මෙ තැන කැගාන්න එපා"යි ගෘසෙන්කා කෝපයෙන් බැණ වැදුණා ය.

මීතියා දෙදෙනා ගේ ම මුහුණු දෙස පිළිවෙළින් බැලුවේ ය. එහෙත් ඔහු හදිසියෙන් ම ගෘසෙන්කා ගේ මුහුණේ ඇති වූ අමුත්තක් දුටුවේ ය. ඒ සමග ඔහු තුළ අලුත් අදහසක්-පුදුම අදහසක් ඇති විය.

"නෝනා මහත්මයා"යි කියමින් කෝපයෙන් රතු වූ මුහුණින් යුත් කුඩා පෝලන්ත ජාතිකයා කතා කිරීමට පටන් ගත්තේ ය. ඒ සමග මීතියා හදිසියෙන් ඔහු ළගට ගොස් ඔහු ගේ උරහිසට තට්ටු කෙළේ ය.

"මහත්මයා එක්ක වචනයක් කතා කරන්න පුළුවන් ද?"

"මොනවට ද?"

"අනෙක් කාමරයට යමු. මහත්මයාට කියන්න බොහො ම හොඳ දෙයක් තියෙනවා. මහත්මයා ඒක දැන ගැනීමට බොහො ම කැමැති වේවි"

මීතියා දෙස පුදුමයෙන් බැලූ කුඩා පෝලන්ත ජාතිකයා අනතුරුව මීතියා ගැන සැක කෙළේ ය. එහෙත් ඔහු මීතියා සමග අනෙක් කාමරයට යාමට කැමැති වූයේ අනෙක් පෝලන්ත ජාතිකයා ද තමා සමග යාමේ තීරණය උඩ ය.

"මහත්මයා කියන්නේ අනෙක් කාමරයට යන්න මහත්මයා ගේ මුරකාරයාත් ඕනෑ කියා ද? බොහො ම හොඳයි එයාත් ආපුදෙන්, ඔව්, ඒ මහත්මයා අප එක්ක ඉන්න ඕනෑ. එහෙනම් මහත්වරුනි අපි අනෙක් කාමරයට යමු."

"කොහෙ ද යන්නේ?"යි ගෘසෙන්කා තැති ගෙන ඇසුවා ය.

"අපි මිනිත්තුවට එනවා"යි මීතියා කීවේ ය.

මීතියා ගේ මුහුණ කිසියම් ධෛර්යයකින්, බලාපොරොත්තු නොවූ කිසියම් ප්‍රීතියකින් බැබැළිණි. පැයකට පමණ පෙර ඔහු මේ කාමරයට පැමිණෙන විට තිබුණු ස්වභාවය සම්පූර්ණයෙන් ම වෙනස් විය. ඔහු දකුණු පැත්තේ තිබුණ කාමරයට පෝලන්ත ජාතිකයන් සමග ඇතුළු විය එහෙත් එය ගී කීමට පැමිණි තරුණියන් රැස් වන, ආහාර පිළියෙළ කොට තබා ඇති ලොකු කාමරය නො වේ. ඔහු අමුත්තන් සමග ගියේ පෙට්ටි සහ පුළුන් කොට්ට සහිත ලොකු ඇඳන් දෙකක් තබා ඇති කාමරයට ය. කාමරය මුල්ලේ තබා ඇති මේසය උඩ ඉටිපන්දමක් දල්වෙයි. මීතියා කුඩා පෝලන්ත ජාතිකයා සමග මේසය දෙපැත්තේ එකිනෙකා ගේ මුහුණු දෙස බලා හිඳගත් අතර, අනෙක් පෝලන්ත ජාතිකයා දූත පිටිපසට කරගෙන බලා සිටියේ ය. ඔවුහු මීතියා දෙස රවා බැලුවෝ ය. ඔවුන් කුතුහලයෙන් සිටින බව පෙනේ.

"මහත්මයාට මොනව ද අපෙන් උවමනා කරන්නේ?"යි කුඩා පෝලන්ත ජාතිකයා ඇසුවේ ය.

"මට මෙන්න මේ උපකාරය කරන්න"යි මීතියා කී ය. මම කාලය නාස්ති කරන්න කැමැති නැහැ. මීතියා සාක්කුවෙන් මුදල් එළියට ගත්තේ ය. "මෙන්න මේ මුදල අරගෙන, කැමැති නම් රූබල් තුන්දහ ම අරගෙන ඉක්මනට මෙ තැනින් පිටවී යන්න"

පෝලන්ත ජාතිකයා මීතියා ගේ මුහුණ දෙස විමසිල්ලෙන් බැලුවේ ය.

"තුන්දහක්?" යි ප්‍රශ්න කළ හෙතෙම අනතුරු ව තම සගයා දෙස බැලුවේ ය.

"ඔව් රූබල් තුන්දහක් දෙන්නම්. මට පේනවා මහත්මයා මොළය තියෙන කෙනකු බව. මේ තුන්දහ අරගෙන ඉක්මනට මෙ තැනින් පිට වී යන්න. මේ මිතිභාත් එක්ක ගෙන යන්න. මා කියන දෙය ඇහුණ නේ ද? මේ මොහොතේ ම යන්න. නමුත් ආයේත් ආපසු එන්න එපා. මොනව ද අර කාමරයේ තියෙන්නේ, මහත්මයා ගේ කබාය ද? මම ඒක ගෙනත් දෙන්-නම්. දැන් ම කරත්තයකුත් ලෑස්ති කරලා දෙන්නම්.......... මොක ද කියන්නේ?"

මීතියා පිළිතුරක් බලාපොරොත්තු ව බලා සිටියේ ය. ඒ පිළිතුර කුමක් දැයි ඔහු දැන සිටියේ ය. පෝලන්ත ජාතිකයා ගේ මුහුණේ ස්ථිර ගතියක් දකින්නට තිබිණි.

"එතකොට මුදල් ලැබෙන්නේ කොහොම ද?"

"අපි මෙන්න මේ විදියට කරමු. දූනට මහත්වරුන් ගේ ගමන් වියදමටත්, අත්තිකාරම් මුදලක් හැටියටත්, රුබල් පන්සියක් දෙන්නම්. අනෙක් දෙදහස් පන්සිය හෙට උදේ ම දී දෙන්නම්. කොහොම හරි දෙන බවට දිව්රා පොරොන්දු වෙන්නම්."

පෝලන්ත ජාතිකයෝ දෙදෙනා යළි එකිනෙකා ගේ මුහුණු දෙස බැලුවෝ ය. කුඩා පෝලන්ත ජාතිකයා ගේ මුහුණේ සැක පහළ විය.

"පන්සියක් නො වෙයි, හත්සියක් දෙන්නම්. ඒ මුදල් දැන් ම ගෙවන්නම්" යයි මිතියා මුදල වැඩි කරමින් කීවේ කිසියම් වරදක් සිදුවූයේ යැයි කල්පනා කරමිනි. "මොකද කල්පනා කරන්නේ? මාව විශ්වාස කරන්න බැරි ද? දැන් රුබල් තුන් දහක් දෙන්න පුළුවන් කමක් නැහැ. හෙට දෙන්නම්. උදේට මා නතර වී සිටින ගෙදර සල්ලි තියෙනවා." කතා කළ වචනයක් පාසා ම මිතියා ගේ හිතේ ධෛර්යය අඩු විය. ඔහු ගොත ගැසුවේ ය. "මට දිව්රා කියන්න පුළුවනි, ගෙදර සල්ලි හංගලා තියෙනවා."

ඒ ක්ෂණයෙන් ම කුඩා පෝලන්ත ජාතිකයා ගේ මුහුණේ ආත්ම ගෞරවයක ලකුණු පහළ විය.

"මහත්මයාට වෙන මොනවක්වත් ඕනෑ කර තියෙනවා ද?" යි ඇසූ පෝලන්ත ජාතිකයා "මහත්මයා ගේ අදහස් බොහෝ ම කැතයි" කියා කෙළ ගැසුවේ ය. ඒ සමඟ අනෙක් පෝලන්ත ජාතිකයා ද කෙළ ගැසුවේ ය

"කෙළ ගසන්නේ මා දෙන මුදලට වඩා ලොකු මුදලක් ගෘසෙන්කා ගෙන් ලැබේ ය කියා හිතාගෙන ද? තොපි දෙන්නා කප්පාදු කළ කුකුළෝ" යි මිතියා ශෝකයෙන් කීවේ සිය අදහස් සාර්ථක නොවන බව හිතාගෙන ය.

"නුඹ කළේ අපට ලොකු අපහාසයක්" යයි කෝපයෙන් පැවසූ කුඩා පෝලන්ත ජාතිකයා කාමරයෙන් පිට වී ගියේ මිතියා ගෙන් ඊට වඩා කිසිවක් ඇසීමට කැමැත්තක් නැති බව හඟවමිනි. ඔහු ගේ මුහුණ පොකුරිස්සකු මෙන් රතු වී ය.

අනෙක් පෝලන්ත ජාතිකයා ද කාමරයෙන් පිට වී ගියේ ය. බලාපොරොත්තු සුන්කරගත් මිතියා දීනත්වයට පත්වූවකු මෙන් කාමරයෙන් පිට වී ය. ඔහු ගෘසෙන්කාට භය වී ය. පෝලන්ත ජාතිකයන් දෙදෙනා පෙරළියක් කරන්නට පිළිවනැයි ඔහු කල්පනා කෙළේ ය. කාමරයට ඇතුළු වූ ඔවුහු දෙදෙනා අභිනය දක්වන නළුවන් දෙදෙනකු මෙන් ගෘසෙන්කා ඉදිරිපිට නතර වූ හ.

"මේ මහත්මයා අපට අපහාස කළා."

තුවාලයක් පෑරුණාක් මෙන් ගෘසෙන්කා හදිසියෙන් ම කෝපවූවා ය.

"රුසියන් බාසාවෙන් කතා කරපන්. මං කැමැති නැහැ එක ම පෝලන්ත වචනයක්වත් අහන්න" යි ඈ කෑගා කීවා ය. "මීට ඉස්සෙල්ලා රුසියන් බාසාවෙන් කතා කළා. අවුරුදු පහකට පස්සේ රුසියන් බාසාව අමතක වුණා ද? රුසියන් බාසාවෙන් කතා කරන්න බැරි නම් මම අහන්නේ නැහැ."

ඇගේ මුහුණ කෝපයෙන් රතු විය.

අපහාසයෙන් කෝපයට පත් පෝලන්ත ජාතිකයා හති ලන්නට විය. ඔහු ඉක්මනින් හා අහංකාර කමින්, වරද්ද - වරද්ද රුසියන් බසින් කතා කෙළේ ය.

"මම ආවේ අතීතය අමතක කරලා සමාව දීමටයි. අද වනතුරු සිදුවෙච්ච දේවල් අමතක කිරීමටයි............"

"සමාව දෙන්න? තුඹ මෙහාට ආවේ මට සමාව දෙන්න ද?"යි ගෘසෙන්කා කතාවට බාධා කරමින් ඇසුවේ හිඳ සිටි තැනින් නැගී සිටිමිනි.

"ඔව්, මම පටු කල්පනා කාරයෙක් නො වෙයි. මම ත්‍යාගවන්තයෙක්, නමුත් තුඹේ ආදරවන්තයන් දැකලා මම පුදුම වුණා. තුඹව අත්හැරල යනවා නම් කරමසෝව් මහත්මයා මට රූබල් තුන්දහක් දෙන්න අර කාමරයේ දී පොරොන්දු වුණා. මම මිනිහගෙ මූණට කෙළ ගැසුවා."

"මොනවා, මාව අත්හරින්න මුදල් දෙන්න ඇහැව්වා?"යි ගෘසෙන්කා උමතු වූවකු මෙන් ඇසුවා ය. "මිතියා, මේ කතාව ඇත්ත ද? එහෙම දෙයක් කළේ මොන අදහසක් ඇති ව ද? මා විකුණන්න තියෙන දෙයක් නො වෙයි."

"මහත්මයා, ගෲසෙන්කා අලුත වැටුණ හිම වගේ පිරිසුදුයි" මිතියා කමාව ඉල්ලන්නකු මෙන් කීවේ ය. "මම ඇගේ ආදර-වන්තයෙක් නො වෙයි. මහත්මයා කියන්නේ බොරු........."

"ඇයි කිසි ම භයක් හැකක් නැති ව මේ මිනිහා ගෙන් මාව ආරක්ෂා කර ගැනීමට වෑයම් කරන්නේ?"යි ගෲසෙන්කා මිතියා ගෙන් ඇසුවා ය. "මගේ හිත හොඳ නිසාත්, මම කුස්මාට බයෙන් සිටිය නිසාත්, මා පිරිසුදු කෙනෙක් නො වෙයි. මම එහෙම කලේ මේ මිනිහා හමු වුණාම හිස කෙලින් තියාගෙන 'තුඹ වලෙක්' යයි කීමට පුළුවන් වනු පිණිස යි. මේ මිනිහා තුඹ දුන්න මුදල් ගත්ත ද?"

"ගන්න කැමැති වුණා. නමුත් රූබල් තුන්දහ ම එකපාර උවමනා වුණා. දැන් මා ළඟ තියෙන්නේ රූබල් හත්සියක් පමණයි" මිතියා කීවේ ය.

"ඔව්, මිනිහට ආරන්චි වුණා මා ළඟ මුදල් තියෙන බව. ඒ නිසයි මා කසාද බැඳ ගන්න මෙහාට ආවේ."

"මම අවංක මිනිහෙක්, කුලවතෙක්. නැති ව වැදගැම්මකට නැති රස්තියාදු කාරයෙක් නො වෙයි. මම ආවේ තුඹ විවාහකර ගැනීමටයි. නමුත් තුඹ දැන් අමුතු ගෑනියක්, මා දැන සිටි ගෑනිය නො වෙයි. කිසි ම ලැජ්ජා බයක් නැති එකියක්."

"එහෙනම් ආපු අතක් බලාගෙන පලයන්. මෙ තැන ඉන්න මිනිසුන්ට කියා උඹලා පන්නා දමන්න මට පුළුවනි. මං කිවොත් උන් උඹලා පන්නා දමාවි"යි ගෲසෙන්කා කෝපයෙන් කීවා ය. "පහු ගිය අවුරුදු පහ තිස්සේ මම අපරාදේ වෙහෙසුණා. මම මහ මෝඩයෙක්. නමුත් මම වෙහෙසුණේ හිතේ තිබුණු තරහටයි නැති ව මේ මිනිහට ඇති ආදරයකින් නො වෙයි. මෙ තැන ඉන්නේ මා ආදරය කල මිනිහා නො වෙයි. මා ආදරය කල මිනිහා, මේ මිනිහා වගේ ද? සමහරවිට මේ මිනිහා මා ආදරය කල මිනිහා ගේ තාත්තා වෙන්න පුළුවනි. උඹට ඔය බොරු කොණ්ඩය ලැබුණේ කොහෙන් ද? මා ආදරය කලේ උකුස්සකුට සමාන මිනිහකුටයි. නමුත් මේ මිනිහා තාරාවෙක් වගෙයි. එයා මා එක්ක හිනාවෙලා මට ඇහෙන්න සින්දු කියනවා. මම අවුරුදු පහක් ම එයා වෙනුවෙන් ඇඩුවා. මම මහ මෝඩයෙක්. විලිලැජ්ජාවක් නැති තිරිසනෙක්."

මෙසේ පැවසූ ගෲසෙන්කා හිඳ සිටි අත්හැඳි පුටුව උඩ දිග ඇදී දෑතින් මුහුණ වසාගත්තා ය. ඒ මොහොතේ දී කාමරයට කඩා වැදුණු තරුණියෝ ගීයක් ගයමින් නටන්නට වූ හ.

"ඇයි, මේ ඇවිත් ඉත්තේ වල් ගෑනු නොවැ?"යි හඬිසියෙන් ම කෑගා කී පෝලත්ත ජාතිකයා "මේ වල් ගෑනුන් පන්නා දමාපන්"යයි අනතුරු ව හෝටල් හිමියාට නියම කෙළේ ය.

බොහෝ වේලාවක සිට මහත් කුහුලින් දෙරේ සිදුරක් තුළින් කාමරය දෙස බලා සිටි හෝටලේ අයිතිකාරයා කෑගැසීම අසා තමා ගේ අමුත්තන් කලහ කරන බව දැන වහා කාමරයට ඇතුළු විය.

"මොකද මහත්මයා කෑගාත්තේ?"යයි ඔහු පෝලත්ත ජාතිකයා ගෙන් ඇසුවේ කිසි ම ගරු සරු කමක් දක්වා නො වේ.

"ඌරා" කියමින් පෝලත්ත ජාතිකයා බෙරිසත් දුන්නේ ය.

"ඌරා? තමුසේ කොයි විදියේ කුට්ටමකින් ද මෙච්චර වේලා සූදු කෙළියේ? මම දුන්න කුට්ටම හංගලා හොර කුට්ටමකින් නේද සූදු කෙළියේ? මට පුළුවනි හොර කුට්ටමකින් සූදු කෙළිය වරදට තමුසෙව සයිබීරියාවට යවන්න. මේක හොර සල්ලි අච්චුගහනවා වගේ අපරාධයක්."

සෝපාව ළඟට ගිය හෙතෙම කොට්ටය ඇතුලට අත දමා නො කඩන ලද අලුත් කුට්ටමක් එළියට ගත්තේ ය.

"මෙන්න තියෙනවා මම දුන්න කුට්ටම, තව ම කඩලවත් නැහැ"යි ඔහු කීවේ කාමරයේ සිටින හැම දෙනාට ම කුට්ටම පෙන්නමිනි. "මං බලාගෙනයි මගේ කුට්ටම සෝපාව ඇතුලට දමා වෙනත් කුට්ටමක් ගත්තාවා. උඹ මහත්මයෙක් නො වෙයි හොරෙක්."

"මම දුටුවා අනෙක් මිනිහා දෙපාරක් කොල මාරුකරනවා" යයි කල්ගානෝ කීවේ ය.

"අපොයි මෙහෙම නින්දුවක්, මෙහෙම නින්දුවක්"යයි කියමින් ගෘසෙන්කා දෑත එක්කර ගත්තා ය. ඇගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය. "අනේ දෙයියනේ මේ මිනිහට මොනව වෙලා ද?"

"මාත් එහෙම හිතුවා"යි මිතියා ද කීවේ ය.

මිතියා මෙසේ කියනවාත් සමඟ ම පෝලත්ත ජාතිකයා කෝපයෙන් උමතු වූවකු මෙන් ගෘසෙන්කා දෙසට හැරී මිට මොලවා "වල් වේසි" කියා කෑගැවේ ය.

මෙසේ කියනවාත් සමඟ ම කඩා පැත්ත මිතියා පෝලන්ත ජාතිකයා දෑතින් ඔසවා, මීට ටිකකට කලින් ඇතුළු වූ දකුණු පැත්තේ තිබෙන කාමරයට ගෙන ගියේ ය.

"මම මිනිහා කාමරයට ගිහින් දැම්මා"යි මිතියා ආපසු පැමිණ කීවේ ය. මහත් කලබලයෙන් සිටි ඔහු හුස්ම ගත්තේ අමාරුවෙනි. "මිනිහා බොහො ම දඟලනවා. නමුත් මා හිතන්නේ නැහැ ආපසු ඒවි ය කියා." දොර පියනක් වැසූ මිතියා අනෙක් දොර පියන අතින් අල්ලාගෙන සිටියේ ය. "කරුණා කරලා මහත්මයාගේ මිත්‍රයා ළඟට යනවා ද?"යි අනතුරු ව ඔහු කුඩා පෝලන්ත ජාතිකයාගෙන් විමසුවේ ය.

"ඇයි නමුත්නාත්සේ පැරදුණ මුදල් ආපසු නො ගත්තේ? ඒවා හොරකම් කළ මුදල්වලට සමානයි" හෝටලේ අයිතිකාරයා මිතියාට කී ය.

"මම පැරදුණ රූබල් පනහ මට ආපසු උවමනා නැහැ"යි කල්ගානොෆ් කීවේ ය.

"මට උවමනා නැහැ මගේ රූබල් දෙසීය" මිතියා ද කීවේ ය. "ආපසු දුන්නත් ගන්නෙ නැහැ. ඒ මුදල් තියාගෙන සන්තෝස වෙයන්."

"මිතියා ක්‍රියාකළ විදිය බොහො ම හොඳයි" ගෘෂෙන්කා කීවා ය. ඇගේ කටහඬේ බලවත් කෝපයක ලකුණු දකින්නට තිබිණි.

කෝපයෙන් මුහුණ දම්පාට කරගත් කුඩා පෝලන්ත ජාතිකයා තම ගරුත්වය රැකගෙන දොර ළඟ ම නතර වී ගෘෂෙන්කා අමතා මෙසේ කීවේ ය.

"නෝන මහත්මයා කැමැති නම් මා සමඟ එන්න. නැතිනම් මම යනවා."

ආත්මගරුත්වයෙන් හා මහත්තත්වකමින් ද හිස පුම්බාගත් පෝලන්ත ජාතිකයා දොර තුළින් පිටවී ගියේ ය. ඔහු තමා ගැන ඉහළින් කල්පනා කරන්නෙකි. මේ පෙරළියෙන් පසු ව ද ගෘෂෙන්කා තමා සමඟ එතැයි ඔහු බලාපොරොත්තු විය. ඔහුට එතරම් දැඩි ආත්ම විශ්වාසයක් තිබිණි. පෝලන්ත ජාතිකයා නික්ම ගිය පසු මිතියා මහ හඬින් දොර වැසුවේ ය.

“කාමරයේ දොර අගුල් දමා වහපත්”යයි කල්ගානෝ කීවේ ය. එහෙත් යතුර තිබුණේ දොරේ ඇතුළු පැත්තේ ය. ඔවුහු ඇතුළේ සිට දොර වසාගත්හ.

“බොහෝ ම හොඳයි. උත්ට ඔහොම වෙලා මදි. දෙයියන් වහන්සේ හොරු දෙන්නා මෙ තැනිත් පත්තා ගත්තා” යි ගෲසෙන්කා කෝපයෙන් හා ද්වේෂයෙන් ද කීවා ය.

අට වන පරිච්ඡේදය

සිහි මුළාව

අනතුරු ව එහි මදනෝත්සවයකට සමාන දෙයක් ආරම්භ විය. එය මීට පෙර පැවැති සියලු ම උත්සව පරාජය කරන ප්‍රීති උත්සවයකි. හැම දෙනාට ම ප්‍රථම මත්පැන් ඉල්ලා සිටියේ ගෲසෙන්කා ය. “මට ෂැම්පේන් බොන්න ඕනෑ. ඉස්සර වගේ හොඳට ම මත් වෙනකන් බොන්න ඕනෑ. මතක ද මීතියා මතක ද? දූත් ඉතින් අප දෙන්නා හොඳ හැටි එකිනෙකා ඇඳින ගන්න ඕනෑ” යි ගෲසෙන්කා කීවා ය. තමා ගේ ‘සැපත’ දූත් සපිර බව දැනගත් මීතියා ගේ සිහිය අවුල් විය. “හිඟින් සන්තෝෂ වෙන්න! අර ගෑනුන්ට නටන්න කියන්න. මට උවමනා කරන්නේ සේරම සන්තෝෂ වෙන්නටයි. ගිය පාර වගේ නටන්න කියන්න” යි කියමින් ගෲසෙන්කා වරින් වර මීතියා පිටත්කොට යැව්වා ය. ඈ මහත් නොසන්සුන් කමින් පසුවූවා ය. මීතියා ද වහා දිව ගොස් ඈ කියන්නක් කෙළේ ය. වාදනය පිණිස පැමිණි පිරිස අනෙක් කාමරයේ රැස්වූ හ. තිරයකින් වෙන් කරන ලද එය කුඩා කාමරයකි. තිරය පිටිපස පිහාටු පුරවනලද මෙට්ටයකින් යුත් විශාල ඇඳක් තිබිණි. ඒ ඇඳ උඩ පිහාටු කොට්ට ගොඩක් ද විය. මීතියා විසින් දොර ළඟ තබනලද පුටුවෙහි ගෲසෙන්කා හිඳ ගත්තා ය. ඈ කලින් වතාවේ දී ද නැටුම් ගැයුම් දුටුවේ දොර ළඟ, පුටුව උඩ හිඳගෙන ය. එ දින පැමිණි තරුණියෝ ම ය

මෙ දින නැටුමට පැමිණ සිටියේ. සිතාර් හා රවිකිඤ්ඤ ද රැගත් යුදෙව් වාදක මණ්ඩලය ද පැමිණියේ ය. අත්තිමේ දී මෙතෙක් වේලා බලාපොරොත්තු ව සිටි ආහාර හා වයින් ද රැගත් කරත්තය ද පැමිණියේ ය. මීතියාට වැඩ බහුල විය. නැටුම් බැලීම පිණිස ගැමියෝ ද ගැමි ගැහැනු ද කාමරයට රැස්වූ හ. නිඳා සිටි ඔවුන් නැඟිට පැමිණියේ මසකට කලින් පැවැති උත්සවයේ දී කාබී ප්‍රීතිවූවාක් මෙන් මෙවර ද කාබී ප්‍රීතිවීමේ බලාපොරොත්තුවෙනි. මීතියා, මුහුණුවරින් ඇඳිනගත් අය ඉතා ආදරයෙන් පිළිගෙන වැලඳ ගත්තේ ය. ඔහු වයින් බෝතල් ඇර හැමෝට ම සංග්‍රහ කෙළේ ය. ෂැම්පේන් පානයට කැමැති වූයේ තරුණියෝ පමණි. ගැමියෝ රම්, බ්‍රැණ්ඩි හා සැර පන්ච්වලට කැමැති වූ හ. තරුණියන්ට උණු කොකෝ පිළියෙළ කිරීමට නියම කළ මීතියා ඕනෑ ම වේලාවක දී ඕනෑ ම කෙනකුට තේවතුර හෝ පන්ච් බීම පිණිස රෑ එළිවන තුරු බොයිලේරුව රත් කරන ලෙස අණ කෙළේ ය. එ දින රෑ සිදු වූ දෙය ඉතා අද්භූත ය, ව්‍යාකූල ය. එහෙත් මීතියා කිසිවක් සිදු නො වූවාක් මෙන් හැසුරුණේ ය. උත්-සවයේ ස්වභාවය අද්භූත වූ තරමට ඔවුන් ගේ ප්‍රීතිය වැඩි විය. කිසියම් ගැමියෙක් එවේලේ මීතියා ගෙන් මුදල් ඉල්ලුවේ නම් මීතියා වහා සාක්කුවට අත දමා නෝට්ටු මිටිය එළියට ගෙන ගණන් නො කොට දිගට හරහට බෙදනු ඇත. හෝටලය අයිතිකාරයා මොහොතකට හෝ මීතියා ගෙන් නෙත් ඉවත නො ගෙන හැම තැන ම ඔහු පසු පසින් ගියේ මෙය දැන, මීතියා ආරක්ෂා කර ගැනීමට විය යුතු ය. රෑ නිඳා ගැනීමේ අදහස ඔහු අත්හරින්නට ඇත. ඉතා අඩුවෙන් මත්පැන් පානය කළ හෙතෙම මුළු කාලය තුළ ම හැකි තරමින් මීතියා ආරක්ෂා කෙළේ ය (ඔහු පානය කළේ ඉතා කුඩා පන්ච් වීදුරුවක් පමණි) ඉඩ ලත් හැම විට ම ඔහු ඉතා ආදරයෙන් හා නියාළු ගතියෙන් ද යුතු ව, ගැමියන්ට වයින් හා සුරුට්ටු දෙන මීතියාට බාධා කෙළේ ය. මීතියා ගිය වර මෙන් මෙ වරද ගැමියන්ට මුදල් දීමට තැත් කළ හැම විට ම හෝටලය අයිති-කාරයා එය නතර කෙළේ ය. එමතු ද නො ව තරුණියන්ට මත් පැන් හා රසකැවිලි දීම ගැන ඔහු සම්පූර්ණයෙන් ම විරුද්ධ විය.

"මහත්මයා, මුන් මහ නීච මිනිස්සු ජාතියක්" යයි හෝටලයේ අයිතිකරු මීතියාට කීවේ ය. "මම මුන්ට පයින් ඇන්නත් මුන් ඒක පිළිගන්නේ නම්බුවක් හැටියට යි. මුන් ඒ තරම් පහත් මිනිස්සු."

ඒ අතරේ මීතියාට රියකරු මතක් වූයෙන් ඔහුට මත්පැන් යවන ලෙස වහා තියම කෙළේ ය. "මම මිනිහගේ හිත රිදෙන්න කතාකළා" යි මීතියා නිතර සෙමෙන් කීවේ ය. වයින් පානය නොකළ කල්ගානෝව් පළමු ව තරුණියන් ගේ නැටුම් ගැයුම්වලට වැඩි කැමැත්තක් නො දක්වී ය. එහෙත් ෂැම්පේන් වීදුරු දෙක තුනක් හිස් කළ හෙතෙම කෙළිලොල් විය. කාමරය පුරා ඇවිදිමින් සිනාසුණේ ය. හැම දෙයකට ම, හැම දෙනාට ම ඇති ආදරය පළ කෙළේ ය. සංගීතයට කැමැති බව කීවේ ය. මත්පැන් බී ප්‍රීතියෙන් සිටින්නකු මෙන් පෙනෙන මැක්සිමෝව් මොහොතකට වත් කල්ගානෝව් ළඟින් ඉවත් නො වී ය. මත්වන තෙක් මත්පැන් පානය කළ ගෘෂෙන්කා මීතියාට කල්ගානෝව් පෙන්නමින් "කො තරම් හොඳ ළමයෙක් ද?" යි කීවා ය.

ප්‍රීතියෙන් සිටි මීතියා, කල්ගානෝව් හා මැක්සිමෝව් සිඹගැනීම පිණිස ඔවුන් ළඟට දිව ගියේ ය. මීතියා ගෘෂෙන්කා ගෙන් බොහෝ දේවල් බලාපොරොත්තු විය. එහෙත් ඒ බලා-පොරොත්තු සපුරා ලීමට තරුණිය මෙතෙක් කිසිවක් නොකීවා ය. ඇ කතා නො කර සිටීමට වෑයම් කළා ය. ඒ අතරේ ඇ ආදරයෙන් දුවෙන නෙතින් වරින් වර මීතියා දෙස බැලුවා ය. අන්තිමේ දී ගෘෂෙන්කා මීතියා ගේ අත තදින් අල්ලා බලයෙන් ළඟට ම ඇදගත්තා ය. එ වේලේ ඇ හිඳ සිටියේ දොර ළඟ තිබුණ අත්හැඳි පුටුවක යි.

"කොහොම ද මා හොයාගෙන මෙහාට ආවේ? මම බොහො ම බය වුණා. එහෙනම් මීතියා ලෑස්ති වුණේ අර මිනිහට මාව පාවා දෙන්න ද? ඒක කැමැත්තෙන්ම කළ දෙයක් ද?"

"ගෘෂෙන්කා ගේ සැපතට බාධා කිරීමට මම කැමැති වුණේ නැහැ" යි මීතියා ගොතගසමින් කිවේ ය. එහෙත් ඇයට තරුණයා ගේ පිළිතුර අවශ්‍ය නො වී ය.

"යන්න, ගිහින් සන්තෝෂ වෙන්න........." තරුණිය ආයේත් මීතියා පිටත් කොට යවමින් කීවා ය. "අඬන්න එපා, මම ආයේත් කතාකරන්නම්."

ඇගේ නියමය පරිදි මීතියා යන්නට ගියේ ය. ඇ ගීවලට සවන් දෙමින් නැටුම් බැලුවා ය. ඒ අතරේ ඇ මීතියා කෙරෙන් නෙත් ඉවත නොගත්තා ය. එහෙත් පැය කාලකට පස්සේ ගෘෂෙන්කා නැවැත මීතියාට කතා කළ විට ඔහු වහා ඇය ළඟට දිව ගියේ ය.

"මා ලඟින් ඉඳගෙන මා මෙහාට ආපු බව දැනගත්ත හැටි කියන්න. මා මෙහාට ආපු බව කවුද ඉස්සෙල්ලම කිව්වේ?"

මීතියා සවිස්තර ව සියලු තොරතුරු කියන්නට පටන් ගත්තේ ය. එහෙත් ඔහු ගේ කතාව ආකූල විය. කලබල සහිත විය. එහි අද්භූත ගතියක් ද තිබිණි. කතා කරන අතරේ නිතර රවා බැලූ තරුණයා හදිසියෙන් ම කතාව නතර කෙළේ ය.

"මොකද රවා බලන්නේ?" යි ගෘසෙන්කා ඇසුවා ය.

"මුකුත් නැහැ......... මම අසනීපයෙන් සිටින මිනිහෙක් තනිකර දමාලයි ආවේ. මිනිහට සනීප වෙන්න පුළුවන් නම් මගේ ජීවිතයෙන් අවුරුදු දහයක් වුණත් දෙන්න කැමැතියි."

"ඒ මනුෂ්‍යයා අසනීපයෙන් සිටිනවා නම් ඒ ගැන කරදර වෙන්න එපා. මොකද අදහස් කරගෙන සිටියේ හෙට වෙඩි තියා ගන්න ද? මීතියා බොහො ම මෝඩයි. මොනවට ද වෙඩි තියා ගන්නේ? මා බොහො ම කැමැති මීතියා වගේ නිර්භීත අයට යි" ගෘසෙන්කා සෙමෙන් කීවේ අමාරුවෙන් වචන ශබ්ද කරමිනි. "එහෙනම් මා වෙනුවෙන් ඕනෑ ම දෙයක් කරන්න කැමැති ද? හැබෑට ම මීතියා අදහස් කරගෙන හිටියේ හෙට වෙඩි තියා ගන්න ද? කො තරම් මෝඩ අදහසක් ද? ටිකක් ඉන්න, හෙට කිව යුතු දෙයක් තියෙනවා. අද නො වෙයි හෙටයි කියන්නේ. අද කියනවා නම් කැමැතියි නේ ද? නැහැ මම කියන්නේ හෙටයි.......... දැන් ඉතින් ගිහින් සන්තෝෂ වෙන්න."

කෙසේ වෙතත් තෝන්තු වූ සිතින් යුතු ව නොසන්සුන් තත්ත්වයක සිටි ගෘසෙන්කා ආයේත් මීතියාට කතා කළා ය.

"මොකද කණගාටුවෙන් ඉන්නේ?......... මට පේනවා කණගාටුවෙන් ඉන්න බව" යි ගෘසෙන්කා මීතියා ගේ නෙත් දෙස බලා කීවා ය. "ගැමියන් සිඹිමින් කො තරම් කෑගැවත් මට පේනවා කණගාටුවෙන් ඉන්න බව. දැන් ගිහින් සන්තෝෂ වෙන්න. මා ඉන්නේ සන්තෝෂයෙන්. ඔබත් සන්තෝෂයෙන් ඉන්නවා නම් මා බොහො ම කැමැති......... මා බොහො ම ආදරය කරන කෙනෙක් මෙ තැන ඉන්නවා. බලන්න මගේ මේ පොඩි දරුවා තිදී. හොඳට ම වෙරිවෙලා."

ඈ මෙසේ කීවේ මීතියාට කල්ගානෝ පෙන්නමිනි. සුරාවෙන් මත් වූ හෙතෙම සෝපාව උඩ නිදා සිටියේ ය. එහෙත් ඔහු නිදාගත්තේ සුරාවෙන් මත් වූ නිසා ම නො වේ. කිසියම් හේතුවක් නිසා හිටි හැටියේ ම ඔහු තුල ශෝකයක් ඇති විය. ඔහු ගේ ම බසින් කියතොත් අලස කමක් ඇති විය. සුරාවෙන් වැඩි වූ සල්ලාල කමින් සිටි තරුණියන් ගේ සින්දු අසා ඔහු අධෛර්යයට පත් විය. ඔවුන් ගේ නැටුම ද එසේ ම විය, තරුණියෝ දෙදෙනෙක් වලස් වෙස් ගෙන සිටියහ. සිපනීඩා නමැති විලිබිය නැති තරුණිය අතින් දණ්ඩක් ගෙන වලසුන් දෙදෙනා නටවන්නට වූවා ය

"නටපන් මාරියා, නැති නම් පොලු පාර වදීවි!"

කාමරයේ තද වී සිටි ගැනු – පිරිමින් ගේ සිනා හඬ අතරේ වලස්සු දෙදෙනා ඉතා අශික්ෂට ලෙස බිම පෙරලෙන්නට වූ හ.

"ඔහෙ පෙරළුණාවෙන්, පෙරළුණාවෙන්"යයි ගෘසෙන්කා ආඩම්බරයෙන් කිවා ය. ඇගේ මුහුණ ප්‍රීතියෙන් ආලෝක විය. "ප්‍රීති වීමට අවස්ථාවක් ලැබුණු විට මිනිස්සු ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගෙනා ප්‍රීති වුණාට ඇති වරද කුමක් ද?"

කල්ගානෝ මේ සියල්ල බලාසිටියේ කයේ කැත කුණු තවරා ගත්තකු මෙනි.

"ගොඩේ මිනිසුන් ගේ මේ විකාර නැටුම් බොහො ම කැතයි" ඔහු නිදා සිටි තැනින් නැගිට යමින් කී ය. "රෑ එළිවන තෙක් හොඳට හිරු එළිය තියෙන ග්‍රීෂ්ම කාලයේ දී තමයි උන් මේ විකාර නැටුම් නටන්නේ."

ඉඩම් හිමියෙක් පැමිණ ඔහු ගේ ඉඩම්වල මෙහෙ කරන තරුණියන් තමාට ආදරය කරන්නේ ද යන වග සොයා බැලූ සැටි දක්වන ජේත්තුකාර නැටුමකට ගයන ලද අලුත් සින්දුව වෙසෙසින් ම ඔහුගේ සිත් නොගත්තේ ය.

"කෙල්ලන් ටික
ආදරේ ද නැද්ද? යන්න
හොයා බලන්නට ආවා
– ඉඩම් හිමියා

නමුත් තරුණියෝ ඉඩම් හිමියාට ආදරය නො කරති.

"ඒ මිනිහා නපුරු කමින්
මට අල්ලා ගෙන ගහවිය.
ඒ ආදරයෙන් මට කිසි
– වැඩක් නැතේ.

අභිකුණ්ටිකයෙක් පැමිණ තරුණියන් තමාට ආදරය කරන්නේ ද යි බලයි.

"කෙල්ලන් ටික
ආදරේ ද නැද්ද? යන්න
හොයා බලන්නට ආවා
– අභිකුණ්ටිකයා.

නමුත් තරුණියෝ අභිකුණ්ටිකයාට ද ආදරය නො කරති.

"ඒ මිනිහා හොරෙක් වෙයි ද?
අනේ මට බයයි.
රෑ දුවල් නොනවත්වා
අඬන්න වෙයි දෝ.

තවත් බොහෝ දෙනෙක් තරුණියන් ගේ ආදරය දිනා ගැනීමට ආහ. ඔවුන් අතරේ යුඬභටයෙක් ද සිටියේ ය.

"කෙල්ලන් ටික
ආදරේද නැද්ද? යන්න
හොයා බලන්නට ආවා
යුඬ භටයා.

නමුත් මුද්‍රණය කළ නොහැකි ඉතා අසභ්‍ය ජේලි දෙකකින් තරුණියන් විසින් යුඬ භටයා ප්‍රතික්ෂෙප කරන ලදි. කිසි ම පැකිළීමක් නැති ව ගයන ලද එම ජේලි දෙක නිසා එහි රැස්වූවන් අතරේ මහත් අප්‍රසාදයක් ඇති විය. සින්දුව අවසන් වෙන්නේ වෙළෙන්දකු ගේ පැමිණීමෙනි.

"කෙල්ලන් ටික
ආදරේ ද නැද්ද? යන්න
හොයා බලන්නට ආවා
– මුදලාලි අයියා

ඔහුට කැමැති බව තරුණියෝ පැවසූ හ.

"මුදලාලි මට
රත්තරනෙන් මාල සදා වී.
එතකොට මම මුදලාලිගෙ
රජින වන්නෙමි."

සින්දුව අසා කල්ගානෝ සැබැවින් ම කෝප විය.

"මේක ඊයේ පෙරේද හදපු සින්දුවක්. මේ මිනිසුන්ට කවුද මේ වල් සින්දු හදා දෙන්නේ? යුදෙව්වෙක් හරි රේල්ලුවේ වැඩ කරන මිනිහෙක් හරි ආවා නම් ඒ මිනිසුන්ට මේ ලම්ස්සියන් ගෙනියන්න තිබුණා"යි කල්ගානෝ කෑගා කීවේ ය.

අනතුරු ව තමා වෙහෙසට පත් වී සිටින බව පැවැසූ තරුණයා සෝපාව උඩ හිද හදිසියෙන් ම නිදාගත්තේ ය. සෝපාවේ මෙට්ටය උඩ හිස තබාගෙන නිදාසිටි ඔහු ගේ දුකුම්කලු මුහුණ මදක් සුදු මැලි විය.

"බලන්න මේ ඉලන්දරියා කොච්චර ලස්සණ ද කියා?"යි ගෲසෙන්කා කිවේ මිතියා කල්ගානෝ ළඟට කැඳවාගෙන ගොස් පෙන්නමිනි. "ඔබ එන්න ඉස්සෙල්ලා මම එයා ගේ කොණ්ඩය පිරමිනුයි සිටියේ. එයා ගේ කොණ්ඩය බොහො ම ගොරෝසුයි."

ගෲසෙන්කා මදක් පහත් වී ඉතා ආදරයෙන් කල්ගානෝ ගේ නළල සිම්බා ය. එකෙණෙහි ම නෙත් ඇරිය තරුණයා වහා නැගී සිට ගෲසෙන්කා දෙස බලා මැක්සිමෝ සිටින්නේ දැයි මහත් නොසන්සුන් කමක් දක්වා විමසුවේ ය.

"එයාට උවමනා කරන්නේ මැක්සිමෝ විතරයි. ටිකක් මා ළඟින් ඉන්න......... ඉක්මනට ගිහින් මැක්සිමෝට කතා කරන්න"යි ගෲසෙන්කා සිනාසෙමින් මිතියාට කීවා ය.

මැක්සිමෝට තරුණියන් වෙතින් ඉවත් විය නොහැකි බව පෙනී ගියේ ය. ඔහු වරින් වර තරුණියන් වෙතින් යන්තම් ඉවත් වූයේ විදුරුවට මත්පැන් පුරවා ගැනීමට පමණි. ඔහු කොකෝ කෝප්ප දෙකක් බිවේ ය. ඔහු ගේ මුහුණ රතු විය. නාසය නිල් විය. ඇස් තෙත් විය. ඔහු තරුණියන් අතරට ගොස් නටන්න ඕනෑ යැයි කී ය.

"පොඩි කාලයේ දි උන් මට වැදගත් නැටුම් සේරම ඉගැන්නුවා"යි ඔහු කී ය.

"මැක්සිමෝ් එක්ක යන්න. මම මෙ තැන ඉඳගෙන එයා නටන හැටි බලන්නම්"යයි ගෘසෙන්කා මිතියාට කීවා ය.

"මාත් එනවා නැටුම් බලන්න"යි කල්ගානෝ් කීවේ තමා ලඟින් හිඳගැනීමට ගෘසෙන්කා කළ ආරාධනාව ප්‍රතික්ෂෙප කරමිනි. හැම දෙනා ම මැක්සිමෝ් ගේ නැටුම බැලීමට ගියහ. මැක්සිමෝ් ද ඔහු ගේ නැටුම නැටුවේ ය. මිතියා හැරෙන්නට වෙන කිසිවකු තුළ මේ නැටුම ගැන වැඩි ප්‍රසාදයක් ඇති නො වී ය. උඩ පැනීම හා දුර පැනීම හා කකුල් දෙක එකට ගැසීම හැර ඒ නැටුමේ වෙන කිසිම අලංකාරයක් නැත. උඩපැන්න හැම වරක් පාසා ම ඔහු පාවහන් අඩියට අතින් ගැසුවේ ය. කල්ගානෝ් නැටුමට කිසි ම කැමැත්තක් නොදැක්වූ අතර මිතියා මහත් ආසාවෙන් නැළවුවා බදාගෙන සිඹිබේ ය.

"බොහො ම හොඳයි. බොහො ම හොඳයි" මිතියා ප්‍රශංසා කරමින් කී ය.

"බොහො ම මහන්සියි නේද? කේක් කෑල්ලක් කනව ද? සුරුවිට්ටුවක් බොනව ද?"

"සිගරැට්ටුවක් දෙන්න."

"ඇයි පොඩි අඩියක් ගහන්නේ නැද්ද?"

"හොඳයි, පොඩි අඩියක් ගහන්නම්. චොකොලට් එහෙම නැද්ද?"

"ඇයි අර මේසය උඩ ගොඩක් ම තියෙන්නේ. ඔනෑ තරමක් ගන්න."

"මං කැමතියි වැනිලා දමාපු චොකොලට්වලට. ඒවා හොඳ වයසට ගිය අයටයි. හි! හි! හි!"

"නැහැ සහෝදරයා, වැනිලා දමාපු චොකොලට් නැහැ."

"අතන ඉන්න ලස්සණ ගැටිස්සි පේනවා නේ ද? එකිගේ නම මාරියා. හි! හි! හි! ඒකි එක්ක යාළු වෙන්න මට උදව් වෙනව ද?"යි මැක්සිමෝ් රහසක් කියන්නාක් මෙන් පහත් වී මිතියා ගේ කනට කොඳුරා ඇසුවේ ය.

"එහෙනම් මෙච්චර වෙලා ලෑස්ති වුණේ ඒ කෙල්ලව අල්ලගන්න ද? නැහැ සහෝදරයා, ඒක කරන්න බැහැ."

"මම කාටවත් හිරිහැර කරන්නේ නැහැ"යි මැක්සිමෝ අධෛර්ය වෙමින් පැවැසී ය.

"මේ කෙල්ලෝ මෙහාට ආවේ සිඳු කියන්නයි, නටන්නයි, බව දන්නවා නේද සහෝදරයා. ඒක යකාට ගියදෙන්, ටිකක් ඉන්න......... ඒ අතර කාල බීලා ජොලි කරන්න. ඇයි සල්ලි ඔනෑ නැද්ද?"

"පන්සෙ බැරියයි" මැක්සිමෝ සිනාසෙමින් කී ය.

"හොඳයි හොඳයි........."

මිතියා ගේ හිස දූවෙන්නට විය. ඇතුළු පැත්තෙන් ගෙය වටේ ලීයෙන් තනා ඇති සඳලුතලයට ඔහු ගියේ ය. සඳලු තලයේ අඳුරෙන් වැසුණු තැනක සිටි මිතියා හිටි හැටියේ ම දෑතින් හිස බදාගත්තේ ය. මෙතෙක් වේලා අවුල් වෙමින් පැවැති සිතිවිලි හදිසියෙන් ම එක්තැන් විය. ඒක්ෂණයෙන් ම ඔහුට හැම දෙයක් ම පැහැදිලි ව පෙනී ගියේ ය. එය ඉතා භයානක ය. "මම වෙඩි තියාගෙන ජීවිතය නැති කර ගන්නවා නම් ඇයි දූන් ම නොකරන්නේ?" යන අදහස එක් වර ම ඔහු ගේ සිතේ පහළ විය. "ආපසු ගෙට ගොස් පිස්තෝල ගෙන මේ අපිරිසුදු අඳුරු මූල්ලේ ඉඳගෙන හැම දෙයක් ම අවසන් නොකරන්නේ මන් ද?" ඔහු මිනිත්තුවක් පමණ වේලා දෙකට දෙවාරනේ බලාසිටියේ තීරණයක් ගත නො හැකි ව ය. තමා කළ සොරකම හා අපරාධය නමැති අපහාසය මීට ටිකකට කලින් මෙහි පැමිණි තමා පසු පසින් ලුහු බැඳ ආවේ ය... ......එ වේලේ වෙඩි තබා ගැනීම ඔහුට පහසු දෙයක් විය. එ වේලේ ඔහු විනාශ වූ පුද්ගලයකුට සමාන ය. ඔහුට ගෘසෙන්කා අහිමි වූවාය. ඔහු ආලය සිතින් අත්හැර දැම්මේ ය. ගෘසෙන්කා පෝලන්ත ජාතිකයා සමඟ යන්නට ගියා ය. මෙ වැනි දුක්බර තත්ත්වයකට මුහුණ පා සිටි ඔහුට ජීවිතය විනාශ කර ගැනීම ඉතා පහසු දෙයක් විය අවශ්‍ය යෙන්ම කළයුතු දෙයක් විය, එ වේලේ ජීවත්වීමට ඔහුට කිසි ම හේතුවක් තිබුණේ ද? එහෙත් දූන් තත්ත්වය කෙසේ ද? මීට ටිකකට කලින් පැවැති තත්ත්වයට සමාන ද? දූන් අඩුගණනේ ඔහු නැති ගැන්වූ එක අවතාරයක්, එක භීතියක් අවසන් විය. එනම් ගෘසෙන්කා ගේ පළමු පෙම්වතා, ඇගේ ජීවිතයේ ඉතා වැදගත් තැනක් ගත් තැනැත්තා, කිසි ම ලකුණක් නො තබා යන්නට ගියේ ය. ආයේත් නො එන්නට ගියේ ය. ගෘසෙන්කා මේ පෙම්වතා ගැන ලැජ්ජා වූවා ය. දූන් ඇ ආලය

කරන්නේ කවරකුට දැයි ඔහුට ඇගේ නෙත් දෙස බලා කිව හැකි ය. දූත් ඔහුට ජීවිතය සැපවත් කර ගැනීමට අවශ්‍ය හැම දෙයක් ම තිබේ.........එහෙත් ඔහුට ජීවත් විය නො හැකි ය. ජීවත් වීමට පුළුවන් කමක් නැත. අහෝ ඛේදයකි. ...."අහෝ දෙවියනි, වැට ළඟ දී මගෙන් පහර කා බිම වැටුණු මිනිහාට කරුණාකර ජීවත්වීමට ඉඩ ලබා දෙන්න. මගේ දෙතොල් ළඟ තිබෙන මේ භයානක බඳුන ඉවත් කරන්න. මා වැනි පව්කාරයන් වෙනුවෙන් ඔබවහන්සේ ඉතා ආශ්චර්ය-චත් දේවල් කරලා නැද්ද? නමුත් මගෙන් පහර කෑ මහල්ලා ජීවත්වන්නේ නම් මොකද වෙන්නේ? එසේ නම් මම අනෙක් නින්දාව මගේ ජීවිතයෙන් මකා දමමි. මම සොරාගත් මුදල් ආපසු දෙමි. කෙසේ හෝ ඒ මුදල සොයා දෙමි. මගේ සිතේ හැර වෙන කිසි ම තැනක මේ නින්දාවේ ලකුණක් පවා ඉතිරි නො වෙයි. අහෝ මෙය කිසිසේත් සිදු නොවන්නකි. මෙය භයානක සිහිනයක් පමණි. අහෝ ඛේදයකි!"

එහෙත් මේ අන්ධකාරය තුළින් බලාපොරොත්තුවක ජ්‍යා මාත්‍රයක් දකින්නට තිබේ. ඔහු උඩ පැන වහා කාමරයට දිව ගියේ ය. සදාකාලයට ම ඔහු ගේ රැජින වන ගෲෂෙන්කා වෙත දිව ගියේ ය. මොහොතකට පමණ ඇගෙන් ලැබෙන ආදරය, නින්දාව නමැති වේදනාවෙන් පීඩිත වූ තමා ගේ මුළු ජීවිතයට වඩා නොවටින්නේ ද? මේ රාත්‍රියට, පැයකට, මොහොතකට, ඇය ළඟට යාමට, ඇය සමඟ සිටීමට, ඇය නෙතින් දැක ගැනීමට, ඇගේ කටහඬට සවන් දීමට, කිසිවක් ගැන කල්පනා නොකිරීමට, හැම දෙයක් ම අමතක කිරීමට පුළුවන් නම්? යන ප්‍රශ්නය ඔහු ගේ සිත දැඩි ව ගත්තේය. සඳලුතලයේ සිට ගෙට ඇතුළුවන ඔහුට හෝටලේ අයිතිකාරයා හමු විය. කිසියම් දෙයක් ගැන කරදර වන ඔහු ගේ මුහුණ අඳුරුවී ඇතැයි කල්පනා කළ මිනියා ඔහු තමා සොයා පැමිණියේ යයි අදහස් කෙළේ ය.

"මොකද වෙලා තියෙන්නේ? මාව හොයනවද?"

"නැහැ හාමුදුරුවනේ"යි මිනිහා පුදුම වෙමින් කී ය. "මං මොනවට ද තමුන්නාන්සේ හොයන්නේ? තමුන්නාන් සේ කොහෙද හිටියේ?"

"එහෙනම් මොකද මුහුණ පුළුටු කරගෙන ඉන්නේ? මොකද මා එක්ක තරහ ද? බය වෙන්න එපා, ඉක්මනට නිදාගන්න පුළුවනි. දූත් කීය ද වෙලාව?"

"දූත් පාන්දර තුනට විතර ඇති. සමහර විට තුන පහුවෙලා ඇති."

"එහෙනම් අපි ඉක්මනට අපේ පාටිය හමාර කරන්නම්."

"නැහැ නැහැ. තමුන්නාන්සේ උවමනා වෙලාවක් සන්තෝස වෙන්න. ඒකට වරදක් නැහැ."

"මොකද මේ මිනිහට වෙලා තියෙන්නේ?"යයි මොහොතකට පමණ කල්පනා කළ මීතියා තරුණියන් නටමින් සිටි කාමරයට වහා දිව ගියේ ය. එහෙත් ගෲසෙන්කා එහි නොසිටියා ය. සෝපාව උඩ නිදසිටි කල්ගානෝ හැර වෙන කිසිවෙක් නොසිටියේ ය. මීතියා තිරය පිටිපසට එබී බැලුවේ ය. ගෲසෙන්කා මුල්ලේ තබන ලද ට්‍රන්ක් පෙට්ටිය උඩ හිඳ හිසත් දෑතත් ඇඳ උඩ තබාගෙන දුක් ශෝකයෙන් අඬමින් සිටියා ය. කිසිවකුට නොඇසෙන ලෙස ඇ ඇඬීම මැඩගැනීමට වෑයම් කළා ය. මීතියා දුටු වහා ම ඈ අත වනා කතාකළා ය. ඔහු ඇය ළඟට ගිය වහා ම ඈ ඔහු ගේ අත තදින් අල්ලා ගත්තා ය.

"මීතියා, මීතියා, මම එයාට ආලය කළා"යි ඈ සෙමෙන් කීවා ය. "මම මේ අවුරුදු පහ තුළ හැම මොහොතක් පාසා ම එයාට ආලය කළා. නමුත් මම ආලය කළේ එයාට ද? නැති නම් මගේ සිතේ තිබෙන වෛරයට ද? නැහැ මම ආලය කළේ එයාටයි. හිතේ තියෙන වෛරයට ආලය කළා ය කියන එක වැරදියි. එතකොට මගේ වයස දහහතයි එයා මට බොහො ම හොඳට සැලකුවා මා සතුටු කරන්න සින්දු කිව්වා.......... මෝඩ කෙල්ලක් වූ මම එයා වරදවා තේරුම් ගන්න ඇති. නමුත් දූත්! අනේ දෙයියනේ මොකද මිනිහා වෙනස් වුණේ? ඉස්සර වගේ නො වෙයි; බොහො ම වෙනස් වෙලා. එයාගේ මූහුණත් වෙනස් වෙලා.. මූහුණ බලා මට අඳුනා ගන්න බැරි වුණා. මම තිමෝති එක්ක මෙහාට එන ගමන් මඟ දී කල්පනා කළේත්, මට ම කියාගත්තේත් 'මං කොහොම ද එයා ගේ මූහුණ බලන්නේ? මං මොනව ද කියන්නේ? අපි කොහොම ද එකිනෙකාගේ මූහුණ බලන්නේ?' කියා යි. එයා දකගැනීමට මට ඉවසිල්ලක් තිබුණේ නැහැ. නමුත් මෙහාට ආවට පස්සේ මට දැනුණේ එයා මගේ ඔළුවට කුණු වතුර බාල්දියක් දැම්මා වගෙයි. මට කතා කළේ බොහො ම උගත් ඉස්කෝලෙ මහත්මයා කෙනෙක් කතා කරනවා වගෙයි. මහ ලොකු වැදගත්කමක් දක්වා මා පිළිගත් හැටි දුටුවාම

මම අත්දුත්කුත්දුත් වුණා; ගොළු වුණා. මුල දී මම කල්පනා කළා මට එහෙම සැලකුවේ අනෙක් පෝලන්ත ජාතිකයා ළඟ සිටිය නිසා ය කියා. මම මිනිහ දිහැ බලාගෙන සිටියා. මිසක් වචනයක් වත් කතා කරගන්න බැරිවුණා. මිනිහව විනාශ කරන්න ඇත්තේ එයා ගේ ගැති වෙන්න ඇති. එයා මාව අත්හැරියේ ඒ ගැති ව බඳින්නයි. මිනිහ වෙනස් වෙන්න ඇත්තේ ඒ ගැති නිසයි. අනේ මීතියා මේක කොතරම් ලොකු නින්දවක් ද? මුළු ජීවිතයට ම නැති නොවන නින්දවක්. මා මේ මිනිහා බලාපොරොත්තු ව සිටිය මුළු පස් අවුරුද්දට ම සාප වේ වා!''

යළි අඬන්නට පටන් ගත් ගෲසෙන්කා මෙතෙක් වේලා මිරිකාගෙන සිටි මීතියා ගේ අත තව තවත් තදින් අල්ලා ගත්තා ය.

''අනේ මීතියා යන්න එපා, ටිකක් ඉන්න. කිවයුතු දෙයක් තියෙනවා'' යි රහසක් කියන්නාක් මෙන් සෙමෙන් කී තරුණිය හදිසියෙන් ම හිස උස්සා තරුණයා දෙස බැලුවා ය. ''කියන්න, මා කාට ද ආලය කරන්නේ? මම මෙ තැන සිටින කෙනකුට ආලය කරනවා. කවු ද ඒ තැනැත්තා? අන්න ඒක මට කියන්න.''

ඇඬීම නිසා ඉදිමුණු ඇගේ මුහුණ ආලෝක කරමින් සිනාවක් මතු විය. අඳ අඳුරේ සිටි ඇගේ නෙත් බැබළිණි.

''එතකොට ම උස ලස්සණ තරුණයෙක් පැමිණියා. එයා දුටු හැටියේ ම මගේ හදවත කිඳු බැස්සා. 'මෝඩයා, ඒ ආවේ උඹ ආලය කරන තරුණයා ය' කියා ඒ මොහොතේ ම මගේ හදවත මට රහසින් කිව්වා. ඔබ ආපු හැටියේ ම හැම දෙයක් ම මට සක්සුදක් මෙන් පැහැදිලි වුණා. බයෙන් සිටින්නේ මන් ද? කියා මම කල්පනා කළා. ඒ මොහොතේ හිතේ ලොකු බයක් චකිතයක් තිබුණා. ඔබට කතා කරගන්න බැරිවුණා. නමුත් ඔබ බයෙන් සිටින්නේ පෝලන්ත ජාතිකයන්ට නො වෙසි. ඔබ කාටවත් බයවන කෙනෙක් ද? එහෙනම් බය වෙන්න ඇත්තේ මට ය කියා මම කල්පනා කළා. මම ජනේලය තුළින් අලෝෂාට කතා කරලා ඔබට පැයකට ආලය කළ බවත්, දැන් වෙන කෙනෙකුට ආලය කරන්න යන බවත් කියාපු හැටි පෙමියා ඔබට කියන්න ඇති. අනේ මීතියා, මීතියා සිටියදී වෙන කෙනෙකුට ආලය කිරීමට තරම් මා මෝඩ වුණේ මන් ද? මට සමා වෙනව ද? මට සමාව දෙනව ද නැද්ද? මීතියා ඔබ මට

ආදරේ ද? මට ආදරේ ද නැද්ද?" එක් වරම නැඟී සිටි ගෘසෙන්කා මීතියා ගේ කර වටේ දෑත දමා වැලඳ ගත්තා ය. සොම්නසින් ගොළු වූ මීතියා තරුණිය ගේ නෙත් දෙසත්, මුහුණ දෙසත්, සිනාව දෙසත් බලා හදිසියෙන් ම ඇය වැලඳගෙන ආදරයෙන් සිඹගත්තේ ය.

"ඔබට මෙතෙක් කල් දුක් දුන්නට මට සමාවෙනව ද? මම ඔබට වද දුන්නේ සිතේ තිබුණ වෛරය නිසයි. මම අර නාකි මිනිහා මගේ සිතින් අස්කළෙත් සිතේ තිබුණ වෛරය නිසයි. මතක ද දවසක් ඔබ අපේ ගෙදර දී වයින් බොන කොට වීදුරුව බින්ද හැටි? මට ඒ සිද්ධිය අද මතක් වෙලා මගේ දුෂ්ට සිත වෙනුවෙන් වයින් වීදුරුව බින්දා. මීතියා, ඇයි මා සිඹින්නෙ නැත්තේ? එක වතාවක් මාව සිඹලා, දැන් කතා නො කර මා දිහෑ බලා ඉන්නවා. මොනවට ද මගේ කට දිහා බලා ඉන්නේ? මා සිඹින්න. හොඳට සිඹින්න. අන්න හොඳයි — මට ආලය කරනවා නම් දිගට ම ආලය කරන්න. මම දැන් ඔබේ දාසිය වෙන්නම්, සදහට ම දාසිය වෙන්නම්. ඔබට දාසකම් කිරීම මට ලොකු සැපතක්. මා සිඹින්න. මට ගහන්න. මට වද දෙන්න. කැමැති දෙයක් කරන්න........ .... මා දුක් වින්ද යුතුයි..............ටිකක් ඉන්න. පස්සේ පුළුවනි. දැන් මට බැහැ..............." ඈ හදිසියෙන් ම මීතියා තල්ලුකර දමා මෙසේ කීවා ය. "යන්න මීතියා. මාත් ඇවිදින් වයින් ටිකක් බොන්නම්. මම කැමැති වයින් බීලා මත් වෙන්න. මත් වෙලා නටන්න." මෙසේ කී ගෘසෙන්කා, මීතියා ගෙන් ගැලවී තිරය පිටිපසට ගියා ය. මීතියා ද වෙරිමතින් සිටින්නකු මෙන් ඇය පසුපසින් ගියේ ය.

"දැන් ඉතින් වෙන දෙයක් වුණාවෙන්. ඇය සමග ගත කරන එක මිනිත්තුවක් වෙනුවෙන් මම මුළු ලෝකය වුවත් දෙමි"යි මීතියා කල්පනා කෙළේ ය. එක උගුරට ම ෂැන්පේන් වීදුරුවක් හිස් කළ ගෘසෙන්කා ඒ සමග ම මත්වූවා ය. අනතුරු ව කලින් ඈ හිඳ සිටි පුටුව ළඟට ගොස් යළි එහි හිඳ සිනාසෙන්නට වූවා ය. ඇගේ කම්මුල් රතු විය. තොල පිච්චුණේ ය. නෙත් කඳුළින් පිරුණේ ය. ඇගේ නෙත් දුටුවන් සිත් ගන්නා ආදරයකින් බැබළුණේ ය. ඇගේ ඒ නෙත් දැක නොසන්සුන් වූ කල්ගානෝ ද ඇය ළඟට ගියේ ය.

"දැන් ටිකකට කලින් නිදා සිටින විට මා නුඹ සිඹිනවා දැනුණා ද?"යි ගෘසෙන්කා සෙමෙන් ඇසුවා ය. "මා දැන් හොඳට ම

මත් වෙලා.................. ඇයි නුඹ මත් වුණේ නැද්ද? මීතියා ඇයි බොත්තෙ නැත්තේ? මා හොඳට ම මත්වෙලා. ඇයි නොබොත්තේ?...............''

''මං ඉත්තේ මත් වෙලා, හොඳට ම මත් වෙලා. ගෲසෙන්කා නිසා මත් වෙලා. දූත් ඉතින් මම වයින්වලිනුත් මත් වෙන්නම්.''

මෙසේ පැවැසූ මීතියා වයින් වීදුරුවක් බිවේ ය. මේ වයින් වීදුරුව බීමෙන් පසු තමා සම්පූර්ණයෙන් ම මත්වීම පුදුමයක්යැයි ඔහු කල්පනා කෙළේ ය. ඒ මොහොත වනතෙක් හොඳ සිහියෙන් සිටි තමා අන්තිම වයින් වීදුරුව බීමෙන් පසු ව හදිසියෙන් ම මත් වූ බව ඔහුට හොඳට මතක තිබිණි. ඒ මොහොතේ සිට හැම දෙයක් ම කරකැවෙන්නාක් මෙන් ඔහුට දැනිණි. ඔහු ගෙය පුරා ඇවිද්දේ ය. සිනාසුණේ ය. හැම දෙනාට ම කතා කෙළේ ය. එහෙත් ඔහු මේ හැම දෙයක් ම කළේ හොඳ සිහියෙන් නො වේ. ඔහු ගේ බඩ පපුව දැවෙන්නට විය. ඔහුට හැම මොහොතක් පාසා ම දැනෙන්නට තිබුණු එක ම දෙය බඩ පපුවේ ඇති වූ මේ වේදනාව පමණි. ''මගේ පපුවේ ගිනි පුපුරක් තිබෙනව වගේ දැනුණා''යි ඔහු පසු ව කී ය. ඔහු ගෲසෙන්කා ළඟට ගොස් ඇය ළඟින් හිඳ, ඇය දෙස බලා ඇගේ කතාව අසා සිටියේ ය. දෙඩමලු වූ ගෲසෙන්කා එහි සිටි හැම දෙනා ම ළඟට කැඳෙව්වා ය. ගී කියමින් සිටි තරුණියන්ට කතා කලා ය. තරුණියන් ළඟට පැමිණි පසු ඔවුන් සිම්බා ය. නැතිනම් ඔවුන් ගේ හිස උඩින් කුරුසය ඇඳ ආසිරිවාද කලා ය. තවත් මොහොතකින් ඈ අඬන්නට වැයම් කලා ය. ඈ ''කුඩා නාකි මිනිහා'' යන නමින් හැඳින්වූ මැක්සිමෝව් දෙස බලා විනෝද වූවා ය. හැම මොහොතක් පාසා ම ගෲසෙන්කා ළඟට ගිය මහලු මැක්සිමෝව් ඇගේ හැම ඇඟිල්ලක් ම සිඹ, අන්තිමේ දී පරණ සින්දුවක් කියා නැටුවේ ය.

''ඌරූ පැටිය – ඔක්, ඔක්, ගා
හරක් පැටිය – බෑ, බෑ, ගා,
තාර පැටිය – කුවැක්, කුවැක් ගා
පාත්ත පැටිය – ගා, ගා, ගා
කොක්, කොක්, කොක්
කොක් කොක්, කොක් ගා
කිකිළිය ගෙය මැදින් ගියා!

''මැක්සිමෝව්ට මොනව හරි දෙන්න''යි ගෲසෙන්කා මීතියාට කීවා ය. ''එයාට පොඩි තෑග්ගක් දෙන්න. එයා නින්දා අපහාස

විඳ පුරුදු දුප්පතෙක්........... මිතියා, දන්නවද මම කන්‍යාරාමයකට යනවා. දූත් ම නො වෙයි, කවදා හරි යනවා. මුළු ජීවිතයට ම අමතක නොවන දෙයක් අද මට අලෝෂා කිව්වා .... ඔව්......... නමුත් අද අපි නටමු. හෙට කන්‍යාරාමයට යමු. අද අපි සේරම නටමු. මම අද බොහො ම කැමැතියි සෙල්ලම් කරන්න. ඉතින් මම සෙල්ලම් කළාම තියෙන වරද කුමක් ද? දෙවියන් වහන්සේ අපට සමාව දේවි. මම දෙවියන් වහන්සේ නම් හැමෝටම සමාව දෙනවා. සියලු ම පව්කාරයිනි, අද සිට මම උඹලාට සමාව දෙමි. ඒ ලගට මම සමාව ඉල්ලමි. සුදනෙනි, කාලකණ්ණියක් වූ මට සමාවිය යුතුයි. මා මෘගයකුට සමානයි. එහෙත් මම දෙවියන්ට යාච්ඤා කිරීමට කැමැතියි. මම කුඩා ලූනු ගෙඩියක් දන් දුන්නා. මා කො තරම් නපුරුකම් කළත් දෙවියන්ට යාච්ඤා කිරීමට කැමැතියි. මිතියා ඔවුන්ට නටන්නට ඉඩ දෙන්න. බාදා කරන්න එපා. මේ ලෝකේ ඉන්න සේරම හොඳයි, බොහො ම හොඳයි. බොහො ම නරක වැඩ කරන අයත් හොඳයි. මේ ලෝකය බොහො ම ලස්සණ, බොහො ම හොඳ තැනක්. අපි නරක වුණත් ලෝකය හොඳයි. අප තුල හොඳ නරක දෙක ම තියෙනවා,........... තුඹල ගෙන් ඇසිය යුතු දෙයක් තියෙනවා. මා ලගට එන්න. බලන්න කියන්න මා මෙ තරම් හොඳ මොකද කියා. දන්නව ද, මා බොහො ම හොඳ කෙනෙක්. එහෙනම් බලන්න කියන්න මා එ තරම් හොඳ කෙනෙක් වුණේ කොහොම ද කියා!" සුරාමතය වැඩි වෙනවාත් සමඟ ම ගෘසෙන්කා ගේ දෙඩවිල්ල ද වැඩි විය. අන්තිමේ දී ඈ තනියෙන් ම නැටිය යුතු යැයි කීවා ය හිඳසිටි පුටුවෙන් නැගිට්ට ඈ වැනෙන්නට වූවා ය. "මිතියා මීට පස්සේ මට වයින් බින්දුවක්වත් දෙන්න එපා. ඉල්ලුවත් දෙන්න එපා. වයින් බීමෙන් සමාදානය නැති වෙනවා. කාමරය කරකැවෙනවා වගේ මට පේනවා මට නටන්න ඕනෑ. සේරම මා නටනවා බලාසිටියදෙන්.......... මා කො තරම් ලස්සණට නටනව ද කියා බලා සිටිය දෙන්.......... "

ඈ කී දෙය ම කළා ය. ඈ සාක්කුවෙන් සුදු ලේන්සුවක් ගෙන නටනා අතර වැනීම පිණිස දකුණු අතින් ලේන්සුවේ කොනක් අල්ලා ගත්තා ය. මිතියා නටමින් සිටි අනෙක් අය නතර කෙළේ ය. මෙතෙක් වේලා නටමින් සිටි තරුණියන් නිහඬ වූයේ නියමය ලැබුණු වහා ම ගීයක් ගැයීමට සූදානම් වෙමිනි. ගෘසෙන්කා නැටීමට සූදානම් වන බව දැනගත් මැක්සිමෝ ප්‍රීතියෙන් කෑගාමින් හා උඩ පනිමින් ගෘසෙන්කා ඉදිරියෙන් ගියේ ය. ඒ අතර ඔහු ගීයක් ගයන්නට විය.

"කෙසඟ පා යුවලැති
සිහින් දෙපයද කිස උණ,
අඹරමින් කුඩා වූ
වනමින් යන්නෙ කකුට ද"

නමුත් ගෘසෙන්කා ලේන්සුවෙන් ගසා මහල්ලා පන්නා ගත්තා ය.

"මීතියා, ඇයි අර මිනිස්සු මා නටනවා බලන්න නොඑන්නේ? .... ඇයි උන් කාමරයට දමා දොර වැසුවේ? කියන්න මා නටන්න සූදානම් වෙනවය කියා. ඒ මිනිස්සු මා නටනවා බලනවා නම් මම බොහො ම කැමැතියි............"

සුරාවෙන් මත් වී සිටි මීතියා, අගුල් දමා වසන ලද දොර ළඟට ගොස්, පෝලන්ත ජාතිකයන්ට කතා කරමින් දොරට ගැසුවේ ය.

"ඒයි......... එළියට වරෙල්ලා. ගෘසෙන්කා නටන්න ලෑස්ති වෙනවා. උඹලට කතා කරනවා."

"රස්තියාදුකාරයා, පලයන් යන්න"යි පෝලන්ත ජාතිකයන්ගෙන් එකෙක් කෑගා කීවේ ය.

"උඹත් මහ රස්තියාදුකාරයෙක්, තක්කඩියෙක්."

"ඔය මිනිසුන්ට නො බැණ සිටිනවා නම් හොඳයි" සුරාවතින් සිටි කල්ගානෝෆ් කී ය.

"කෑ නොගා හිටපන් ළමයා. මම තක්කඩියාය කිව්වේ ඒ මිනිහට පමණයි. එකෙන් අදහස් වෙන්නේ නැහැ පෝලන්ත ජාතිකයන් හැම දෙනා ම තක්කඩි මිනිස්සු බව. පෝලන්තය සෑදී තියෙන්නේ මේ මිනිහ වගේ තක්කඩියකු ගෙන් නො වෙයි. ළමයා, හොඳ ළමයෙක් වගේ කෑනොගා හිටපන්."

"කොච්චර නරක මිනිස්සු ද? කිසි ම මනුෂ්‍ය ගතියක් නැති ව වගෙයි. ඇයි ඒ මිනිස්සු දෙන්නා අපි එක්ක යාළුවෙන්න කැමැති නැද්ද?" මෙසේ පැවැසූ ගෘසෙන්කා නැටීමට සූදානම් වූවා ය.

ගායක මණ්ඩලය ඉතා ජනප්‍රිය ගැමි ගීයක් ගයන්නට පටන් ගත්තේ ය. හිස පස්සට නමා දෙතොල් අඩක් ඇර ලේන්සුව වනා නටන්නට පටන් ගත් ගෘසෙන්කා හදිසියෙන් ම කාමරය මැද නතර වී පුදුමයෙන් වට පිට බැලුවා ය.

"මගෙ ඇඟට බොහො ම අමාරුයි" ඈ දුබල කටහඬින් කීවා ය. "මට බොහො ම මහන්සියි.........නටන්න බැහැ.........බොහො ම කනගාටුයි........."

ගායක මණ්ඩලයට හිස නමා ආචාර කළ ගෲසෙන්කා අනතුරු ව වට්ටෙට කරකැවෙමින් ආචාර කරන්නට වූවා ය.

"මට බොහො ම කනගාටුයි.........මට සමාවෙන්න........."

"ඒ ලස්සණ නෝනා ඔනෑවට වැඩිය බීලා"යයි කියන කට හඬ ඇසෙන්නට විය.

"ඔව්, ඒ නෝනා ඔනෑවට වැඩිය බීලා"යයි මැක්සිමෝව් තරුණියන්ට කීවේ ඔවුන් සමග මූකුළු කරමිනි.

"මිතියා කරුණා කරලා මා ව මෙ තැනින් අහකට ගෙනියන්න"යි ගෲසෙන්කා ඉතා අසරණ තත්ත්වයකට පත්වූ තැනැත්තියක මෙන් කීවා ය. වහා ඇය දෑතින් ම උස්සාගත් මිතියා, ඒ අනැඟි වස්තුව තිරය පිටිපසට ගෙන ගියේ ය.

"දැන් ඉතින් මාත් යනවා"යි කල්පනා කළ කල්ගානෝව් කාමරයෙන් පිටවී දෙර වැසුවේ ය. එහෙත් මහ කාමරයේ පැවැති හැවුම් ඝෑසුම් ක්‍රමයෙන් වැඩි වී මහත් ඝෝෂාවක් බවට පත්විය. ගෲසෙන්කා ඇඳ උඩ තැබූ මිතියා ඉතා ආදරයෙන් ඇගේ දෙතොල් සිම්බේ ය.

"මගේ ඇඟට අත තියන්න එපා........"යයි ඈ බැගෑ බසින් කීවා ය. "මා තව ම ඔබට අයිති නැහැ. අයිති බව මම කිව්වා. ඒ වුණත් දැන් ම මගේ ඇඟට අත තියන්න එපා. අර මිනිස්සු මෙ තැන සිටිනකන් කිසි ම දෙයක් කරන්න එපා. මා ආදරය කළ මිනිහා තව ම මෙ තැන ඉන්නවා......මෙ තැන හොඳ නැහැ........."

"මම ගෲසෙන්කා කියන දෙයකට කීකරු වෙනවා. එ වැනි දෙයක් කිරීමට මම අදහස් කළේ නැහැ............මම ඔබට බොහො ම ආදරෙයි.........ඔව් මෙ තැන හොඳ නැහැ........."යි මිතියා ගොත ගසමින් කීවේ ය. තවමත් ඇය වැලඳගෙන සිටි මිතියා ඇය ලඟින් බිම දණ ගසා ගත්තේ ය.

"තිරිසනකු වගේ හැසුරුණත් ඔබ සිතින් අවංක බව මම දන්නවා"යි ගෲසෙන්කා ඉතා අමාරුවෙන් මිතියාට කීවා ය. "අපේ ප්‍රේමය අවංක විය යුතුයි, සදහට ම අවංක විය යුතුයි.........

අපි තිරිසනුන් වගේ කටයුතු නොකර යහපත් අය වගේ අවංක ව කටයුතු කරමු. .... මා මෙ තැනින් ගෙනියන්න. මා කියන දෙය ඇහුණ ද? මා ඈත පලාතකට ගෙනියන්න. මෙ තැන ඉඳගෙන කිසි ම දෙයක් කරන්න මම කැමැති නැහැ. කරන දෙයක් ඈත පලාතකට ගිහින් කරමු..........."

"ඔව්, ඔව්, අපි ඈත පලාතකට යමු"යි මීතියා ඇය වැලඳ ගනිමින් කීවේ ය, "මම ඔබත් එක්ක ඈත පලාතකට ඉගිලී යන්නම්.......... නමුත් අර ලේ ගැන දූනගැනීමට පුළුවන් කමක් තියෙනවා නම් මගේ ජීවිතයෙන් අවුරුද්දක් දෙනවා."

"මොන ලේ ගැන ද?"යි ගෲසෙන්කා පුදුම වෙමින් ඇසුවා ය.

"නැහැ නැහැ, මොනවක්වත් නැහැ"යි මීතියා කීවේ ය. "ගෲසෙන්කා කිවා නේද අපි අවංක විය යුතුයි කියා. ගෲසෙන්කා මම හොරෙක්. මම කැතිරිනාගෙන් මුදල් හොරකම් කළා... ... ඒක මහ නින්දුවක්."

"ඔය කියන්නේ අර තරුණ කාන්තාව ගැන ද? නැහැ නැහැ. මීතියා ඇගෙන් මුදල් හොරකම් කළේ නැහැ. මගේ මුදල් අරගෙන ඒ මුදල් ගෙවා දමන්න..........ඔය ගැන මෙ තරම් කරදර වෙන්නේ මොනවට ද? දැන් මට අයිති හැම දෙයක් ම ඔබටත් අයිතියි. අපට මොනවට ද එ තරම් මුදල්? කොහොම වුණත් අපි වියදම් කරනවානේ ද?.........අප වගේ අය මුදල් තියා ගන්නේ නැහැ, නාස්ති කරනවා. අපි ගිහින් ගොවිතැන් කරලා ජීවත් වෙමු. මම මේ දෑතින් බිම කොටා ගොවිතැන් කරන්නම්. අපි මහන්සි වී වැඩ කරමු. ඇහුණ නේ ද? අපි වැඩ කරලා ජීවත් විය යුතු බව අලෝෂාත් කිව්වා. මම ඔබ සතුටු කිරීමට ඔබේ අනියම් බිරිය වෙන්නේ නැහැ. ඒ වෙනුවට නියම බිරිය වී අවංක ව දාසියක් වගේ සේරම වැඩ කරල දෙන්නම්. අපි අර කාන්තාව ළඟට ගිහින් ඇයට ආචාර කරලා ඇගෙන් සමාව ඉල්ලා ගෙන යමු. ඈ සමාව දුන්නත් නුදුන්නත් යමු. ඇගේ මුදල් ආපසු ගෙවා මට ආලය කරන්න......මීට පස්සේ ඇයට ආලය කරන්න එපා. ඇයට ආලය කළොත් මම ඇගේ බෙල්ල මිරිකා මරනවා .....ඉඳිකටුවකින් ඇනලා ඇගේ ඇස් පොට්ට කරනවා..........."

"මම ආලය කරන්නේ ගෲසෙන්කාට පමණයි. සයිබීරියාවට ගියත් ගෲසෙන්කාට ආලය කරනවා."

"මොනවට ද සයිබීරියාවට යන්නේ? කමක් නැහැ කැමැති නම් සයිබීරියාවට වුණත් යමු.........සයිබීරියාවට ගිහින් වැඩ කරමු ....සයිබීරියාවේ බොහො ම හිම තියෙනවා. මම කැමැතියි හිම උඩ කරත්ත දක්කන්න.........අපේ කරත්තයට ගෙජ්ජි වැල් ගැට ගසා තියෙන්න ඕනෑ.........මිතියා, ඇහෙනවා ද ගෙජ්ජි හඬක්?.........කොහෙන් ද ඒ ගෙජ්ජි හඬ එන්නේ? කවුද මෙහාට එනවා.........දැන් ගෙජ්ජි හඬ නතර වුණා."

විඩා වැටී සිටි ගෲසෙන්කා දෑස වසා ගත්තා ය දෑස වසාගත් වහා ම ඇයට නින්ද ගියේ ය. ඈත සිට කරත්තයක ගෙජ්ජි හඬක් ඇසුණ බව සැබෑ ය. එහෙත් එය හදිසියෙන් ම නතර විය. මිතියා ගෲසෙන්කා ගේ ලය මත හිස තබා ගත්තේ ය. ගෙජ්ජි හඬත්, සින්දු කීමත්, සුරා බී සිටි අය නැගූ ඝෝෂාවත් හදිසියෙන් ම නතර වී ගෙය පුරා දැඩි නිශ්ශබ්ද තාවක් ඇති වූ බවත් මිතියා නොදත්තේ ය. ගෲසෙන්කා නෙත් ඇර බැලුවා ය.

"මොක ද වුණේ? මට නින්ද ගියා ද?......කෝ ගෙජ්ජි හඬ?.........ඔව් මට නින්ද ගියා......මට හීනෙන් පෙනුණා මම ගෙජ්ජි බැඳපු කරත්තයක් හිම උඩින් දක්කාගෙන යන බව. මා ගියේ මා ආලය කරන කෙනකු එක්කයි. මිතියා එක්කයි අපි බොහො ම ඈත පළාතකට ගියා. මම ඔබ බදාගෙන සිම්බා. බොහො ම ශීතල නිසා ඔබට තුරුලු වී සිටියා. ඒ අතර හිම දිලිසුණා.........හඳ එළිය වැටී හිම දිලිසෙන හැටි දැකලා ඇති. මට දැනුණා වෙන ලෝකයක සිටිනවා වගේ. නමුත් නැගිටලා බලන කොට මගේ ආදර-වන්තයා මා ළඟ සිටිනවා. කො තරම් හොඳ ද? ...."

"ඔව්, මම ඔබ ළඟ ඉන්නවා" යි, පැවසූ මිතියා අනතුරු ව ඈ ඇඳ සිටි වස්ත්‍රය, ඇගේ ලය හා දෑත සිම්බේ ය. ඒ සමඟ හදිසියෙන් ම ඔහු තුළ පුදුම හැඟීමක් ඇති විය. ඈ තමා දෙස නො ව, තමා ගේ හිස උඩින් යම් කිසිවකු දෙස බලා සිටින බව මිතියා දුටුවේ ය. ඒ සමඟ හදිසියෙන් ම ඇගේ මුහුණේ බියත් පුදුමයත් හඟවන ලකුණු පහළ විය.

"කවුද අර අප දිහා බලාගෙන ඉන්නේ?" යි ඈ රහසක් කියන්නාක් මෙන් සෙමෙන් මිතියාගෙන් ඇසුවා ය

ආපසු හැරී බැලූ මිතියා, යම්කිසිවකු තිරය ඇත් කොට තමා දෙස බලා සිටින බව දුටුවේ ය. එකකු නො ව කීප දෙනකු ම සිටින බව දුටුවේ ය. වහා නැගී සිටි මිතියා තමන් දෙස බලා සිටින ඒ මිනිහා ළඟට ගියේ ය.

"මහත්මයා, කරුණා කරලා මෙහාට එන්න" යි කියමින් තමාට කතා කරන හඬක් මීතියාට ඇසිණි. ඒ කටහඬ පහත් වුවත් සවිර විය. තමාට බලකරන්නාක් මෙන් විය.

තිරය තුළින් කාමරයට පිවිසි මීතියා ගල් ගැසී බලා සිටියේ ය. මුළු කාමරය මිනිසුන්ගෙන් පිරිණි. ඔවුහු මීට කලින් මෙහි රැස්ව සිටි අය නොවූහ. මීතියාගේ කොඳු ඇටය සීතල විය. ඔහු වෙව්ලුවේ ය. ඔහු එක්වර ම එහි සිටි හැම දෙනා ම ඇඳින ගත්තේ ය. පිට කබායක් ඇඳ කැප්තොප්පියක් පැළඳ සිටි උස මහත මහලු මිනිහා පොලිස් කපිතන් මිකේල් මකාරොව්ච් මහතා ය. ජේත්තුවට ඇඳ පැලඳ 'නිතර ඔප දමන ලද' පාවහන් ලා සිටි 'කාස රෝගියකු' වැනි මිනිහා උප මහජන දණ්ඩනායකයා ය. උපැස් පැළඳ සිටි තරුණයා ....මීතියා මේ තරුණයා දන හැඳින සිටියත් ඔහු ගේ වාසගම සිහි කල නොහැකි විය. හෙතෙම මෑත දී නීති විද්‍යාලයයේ සිට පැමිණි නීතිඥයකි. අනෙකා මීතියා දන අඳුනන මෙම පළාතේ පොලිස් ඉන්ස්පැක්ටර ය. අර පින්තල තහඩු පැළඳගත් මිනිස්සු මොකද මෙ තැන කරන්නේ? අර ගැමියන් දෙන්නා........ හෝටලය අයිතිකාරයා සමග කල්ගානෝ දෙර ලඟ බලා සිටින්නේ මන් ද?

"මහත්වරුනි, මොකද මේ කලබලය?" කියා මීතියා ඇසුවේ ය. එහෙත් හදිසියෙන් ම තමා ගැන අමතක වූවකු මෙන් "තමුන්නාන්සේලා ආවේ මොනවට ද කියා මා දන්නවා" යි කියමින් කෑගැහුවේ ය.

උපැස් ලා සිටි තරුණයා මීතියා ලඟට ගොස් ලොකුකම පෙන්නා ඉක්මනින් මෙසේ කී ය.

"අපි ආවේ බොහො ම වැදගත් කටයුත්තකටයි. කරුණා-කරලා සෝපාව ලඟට ඇවිත් මේ කාරණාව පැහැදිලි කරල දෙන්න."

"ඔය කියන්නේ අර මහලු මනුෂ්‍යයාසි, ඔහු ගේ හිසෙන් ගලන ලේසි ගැන ද?.........දන් මට තේරෙනවා" යි මීතියා උමතු වූවකු මෙන් කී ය.

ඔහු ළඟ ම තිබුණු පුටුව උඩ හිඳ ගත්තේ හදවත පළාගෙන යන වෙඩි පහරක් වැදුණකු මෙනි.

"එහෙනම් උඹට තේරුණා ද? මිනිහට තේරෙනවලු! තාත්තා මරාපු මෑගයා. උඹේ මහලු තාත්තා ගේ ඇහෙන්

ගලන ලේ උඹට විරුද්ධ ව දෙස් කියනවා" යි හදිසියෙන් ම මිතියා ළඟට ගිය මහලු පොලිස් කපිතාන් ගිගුම් දුන්නේ ය.

ඔහු ගේ මුහුණ කෝපයෙන් දම්පාට විය. සර්වාංගය ම වෙව්ලන්නට විය.

"ඒක වෙන්න බැරි දෙයක්" යයි මිතියා පුදුමයෙන් කීය. "ඔය විදියට මට කතා කරන්න එපා...... ..කරුණාකරලා මට කතා කරන්න ටිකක් ඉඩ දෙන්න. මහත්මයා ඔය විදියට මට කතා කරන එක බොහො ම වැරදියි."

"මේක මහ පිස්සු වැඩක්" යයි කපිතාන් කෑගා කීවේ ය. "ටිකක් බලන්න මේ මිනිහගෙ හැටි, මේ රෑ ජාමේ හොඳට ම බීලා, තාත්තා ගෙ ලේ අත්වල ගාගෙන, වල් ගෑනු එක්ක නටනවා. මේ මිනිහට පිස්සු!"

"කරුණා කරලා නිශ්ශබ්ද වෙන්න"යි උප මහජන දණ්ඩ-නායකයා වහා සෙමෙන් කීවේ ය. "නැති නම් මහත්මයාට විරුද්ධ ව.........."

එහෙත් උප දණ්ඩනායකයා ගේ කතාව අවසන් වන තෙක් බලා නොසිටි කුඩා නීතිඥයා මිතියා දෙසට හැරී දැඩි ස්වරයෙන් හා උස් හඬින් ද මෙසේ කීවේ ය.

"විශ්‍රාමලත් ලෙප්ටිනන් කරමසෝ, අද රාත්‍රියේ දී යුෂ්මතා යුෂ්මතා ගේ පියා වන පියෝදර් පව්ලොවිච් කරමසෝ මැරූ වරදට යුෂ්මතාට චෝදනා කිරීම මගේ යුතුකම බව දැනුම්දිය යුතු යි.........."

නීතිඥයා තවත් මොනවා දේ කීවේ ය. උප දණ්ඩනායකයා ද යම් කිසිවක් කීවේ ය. මිතියාට ඔවුන් කී දෙය ඇසිණි. එහෙත් කිසිවක් නො තේරිණි. මිතියා ඔවුන් දෙස පුදුමයෙන් බලා සිටියේ ය.

නව වන ග්‍රන්ථය

මූලික පරීක්ෂණය

පළමු පරිච්ඡේදය

තරුණ සිවිල් සේවකයා

මෝරොසෝ නෝනා ගේ වත්තේ අගුල් දමා වසන ලද ශක්තිමත් ගේට්ටුවට මුළු වැර යොදා ගසමින් සිටි පියෝතර් පර්හෝටින් අපි මඳකට හැර දමා ගියෙමු. ගේට්ටුවට වේගයෙන් ගසන හඬ අසා සිටි පෙම්යා සිහිය නරක්වන තරමට තැති ගත්තා ය. මීට දෙ පැයකට කලින් තැති ගත් ඇයට ඒ තැති ගැනීම නිසා තව මත් නිඳගත නො හැකි විය. (මීතියා කරත්තයේ නැග යනවා පෙම්යා දුටුවත්) මීතියා ආයේත් පැමිණ ගේට්ටුවට ගසන්නේ යැයි ඈ කල්පනා කළා ය. මීතියාට මිස වෙන කිසිවකුට මෙ තරම් වේගයෙන් ගේට්ටුවට ගැසිය නො හැකි ය. ගේට්ටුවට ගසන හඬ අසා අවදි වූ මූරකරුවා ළඟට ගිය පෙම්යා ගේට්ටුව නො අරින ලෙස ඔහු ගෙන් බැගෑපත් ව ඉල්ලා සිටියා ය. ඉතා වැදගත් කටයුත්තක් සඳහා පෙම්යා හමුවීමට පැමිණි බව මූරකාරයාට පියෝතර් පර්හෝටින් ගෙන් දැනගන්නට ලැබිණි. අන්තිමේ දී ගේට්ටුව ඇරීමට මූරකාරයා තීරණය කෙළේ ය. මුළුතැන්ගෙට ගිය පියෝතර්ට පෙම්යාගෙන් ඉතා වැදගත් පුවතක් දැනගැනීමට ලැබිණි. ඒ වැදගත් පුවත නම් මීතියා, ගෘසෙන්කා සොයා දුවන විට කුඩා පිත්තල මෝල් ගසක් ගෙන ගිය බවත්, ආපසු එනවිට මෝල් ගස වෙනුවට අතේ ලේ තැවරී තුබුණු බවත් ය. ''මීතියා ගේ අතින් ලේ ගැලුවා'' යයි පෙම්යා සියල්ල විස්තර කරමින් කීවා ය. පියෝතර් ද මීතියා ගේ අතේ ලේ තැවරී තිබෙනවා දුටුවේ ය. ඔහු ඒ ලේ සෝදා ගැනීමට මීතියාට

උපකාර විය. එහෙත් මෙහි ඇති වැදගත් දෙය ලේ වේළීමට ගත වූ වේලාව නො වේ. මීතියා මෝල් ගස ගෙන දිව ගියේ තාත්තාගේ ගෙදරට ද? එය ඔප්පු කිරීමට ඇති හේතු මොනවා ද? යන ප්‍රශ්නයයි. පියෝතර් මේ ගැන පෙම්යා ගෙන් කීප වරක් ම ප්‍රශ්න කළ මුත් ඉන් කිසි ප්‍රයෝජනයක් නො වී ය. එහෙත් මීතියා පියා ගේ ගෙදරට මිස වෙන තැනකට නොගිය බවත්, එහි දී කිසියම් භයානක විපතක් සිදු වූ බවත් ඔහු දැනගත්තේ ය. "මීතියා ආවාට පස්සේ මම දැනගෙන සිටිය හැම දෙයක් ම කිව්වා"යි පෙම්යා නොසන්සුන් කමින් කීවා ය. "මම ඇහැව්වා අත්වල ලේ ගෑවුණේ කොහොම ද කියා. අත්වල තියෙන්නේ මිනිස් ලේය, එයා මිනියක් මැරුවා ය කියා මීතියා මට කිව්වා. ඔව් මහත්මයා, එහෙම තමයි කිව්වේ. මට හැම දෙයක් ම කියා අත්තිමේ දී හිටිහැටියේ ම පිස්සකු වගේ දිව්වා. මම කල්පනා කළා එයා පිස්සකු වගේ දුවන්න ඇත්තේ කොහෙද කියා. මීතියා මුක්රෝව්වට ගිහින් මගේ ස්වාමිදූ මරන්න පුළුවනැයි මම කල්පනා කළා එයා නතර වී සිටින ගෙදරට යන කොට මම දැක්කා, එයා සාප්පුව ළඟ කරත්තයක හැඟිල ඉන්නවා. ඒ වෙලාවේ එයා ගේ අතේ ලේ තිබුණේ නැහැ." (පෙම්යා මීතියා ගේ අතේ ලේ නොතිබුණ බව දුටුවා පමණක් නො ව මතක තබාගෙන ද සිටියා ය.) පෙම්යා ගේ මිත්තණිය පෙම්යා ගේ කතාව හැකි පමණින් සනාථ කළා ය. තවත් ප්‍රශ්න කීපයක් ඇසීමෙන් පසු පියෝතර් තික්ම ගියේ පැමිණෙන විට සිටියාට වඩා නො සන්සුන් කමින් යුතු ව ය.

දැන් කළ හැකි එක ම දෙය කෙළින් ම කරමසෝ ගේ ගෙදරට ගොස් කිසියම් හපුරක් සිදුවී ඇත් දැයි සොයා බැලීම ය. එ වැනි හපුරක් සිදු වී තිබේ නම්, ඒ බව සැක හැර දැන කෙළින් ම පොලිස් කපිතන් වෙත ගොස් දැන්විය යුතු ය, මේ ක්‍රියා මාර්ගය අනුගමනය කිරීමට පියෝතර් ඉටාගත්තේ ය. එහෙත් රාත්‍රිය ඉතා අඳුරු විය. කරමසෝ ගේ වත්තට ඇතුළු වන ගේට්ටුව බොහො ම ශක්තිමත් ය. වේගයෙන් ගේට්ටුවට ගැසිය යුතු ය. යම් විදියකින් ගේට්ටුව ඇර, කිසි ම දෙයක් සිදු වී නැති නම්, පියෝතර් පර්හෝටින් නමැති සිවිල් සේවකයෙක් මිනීමැරුමක් වේලා දැයි බැලීම පිණිස තමා ගේ ගෙට කඩා වැදුණු බව මහලු කරමසෝ ගම පුරා කියා ඇවිදින්නට පිළිවන. එය මහ නින්දාවකි. ලෝකයේ හැම දෙයට ම වඩා මෙ වැනි නින්දාවන්ට පියෝතර් බිය ඇත්තේ ය. එහෙත් එ වේලේ ඔහු ගේ සිතේ ඇති වූ අදහස කො තරම් දැඩි වී ද කියතොත් ඔහු

කෝපයෙන් පය බිම ගසා යන්නට ගියේ ය. ඔහු කෙළින් ම ගියේ කරමසෝ් ගේ නිවෙසට නො ව, හොලාකෝ් මැතිනිය ගේ නිවෙසට ය. ඈ මිතියාට රූබල් තුන්දහසක් ණයට දී නැතිනම්, කෙළින් ම පොලිස් කපිතන් ළඟට යාමට පියෝතර් තීරණය කරගත්තේ ය. මිතියාට රූබල් තුන්දහසක් ණයට දුන් බව ඈ පිළිගත්තොත් කරමසෝ් ගේ ගෙදරට යන ගමන හෙට උදේට කල්දමමි, පියෝතර් අදහස් කෙළේ ය. තමා හාඳුනන සමාජ කාන්තාවක ළඟට රෑ එකොළහට පමණ ගොස්, ඇය අවදි කොට පුදුම ප්‍රශ්නයක් ඇසීම කරමසෝ් ගේ ගෙදරට යනවාට වඩා ඛිපාදූප කතාවලට මඟ පෑදෙන්නට පිළිවන. එය එසේ ම ය. සමහර විට මෙම අවසථාවට සමාන කරුණුවල දී සාහසික නිගමනවලට බසින මිනිසුන් ගේ අදහස් ද මීට සමානයි. ඒ මොහොතේ දී පියෝතර් එවැනි නිගමනයකට බැසගත්තේ යැයි කිය නො හැකි ය. කිසිසේත් මැඩගත නොහැකි නොසන්සුන් කමක් ක්‍රමයෙන් තමා වෙලාගෙන, අන්තිමේ දී සිතේ වේදනාව ඇති කරවන කුතුහලයක් ඇතිකොට, සිතට විරුද්ධ ව ක්‍රියා කළ සැටි ඔහුට මුළු ජීවිතයට ම මතක තිබිණි. එහෙත් අර කුලකත ළඟට යාම ගැන ඔහු මුළු ගමනේ දී ම තමාට ම සාප කරගත්තේ ය. "මොනව වුණත් මේ කාරණාව ගැන ඇත්ත නැත්ත සම්පූර්ණයෙන් ම සොයා බලා මිස නවතින්නේ නැහැ"යි ඔහු දත් සපමින් කී ය. ඔහු ඒ අදහස් අනුවයි ක්‍රියා කෙළේ.

හොලාකෝ් මැතිනිය ගේ නිවෙසට පැමිණෙන විට රෑ එකොළහට ඇත. මුරකාරයා වහා පියෝතර්ට වත්තට ඇතුළු වීමට ඉඩ දුන්නේ ය. එහෙත් සවාමිදූ අවදි වී සිටින්නී දැයි ඇසූ විට මුරකාරයාට ඒ ගැන කිසිවක් කිව නො හැකි විය.

"මහත්මයා උඩට ගිහින් වැඩකාරියක් අත නම කියා පණිවිඩයක් යවන්න. නෝනමහත්මයා කැමැති නම් මහත්මයාට කතා කරාවි. නැතිනම් නිකම් ඉඳීවි"යි මුරකාරයා කී ය.

පියෝතර් උඩුමහලට නැංගේ ය. එහෙත් ගෘහිණිය හමුවීම එ තරම් පහසු නො වී ය. ඔහු පැමිණ සිටින බව සවාමිදූට දැනුම් දීමට අකැමැති වූ සේවකයා අන්තිමේ දී සේවිකාවකට කතාකෙළේ ය. මේ පළාතේ සිටින පියෝතර් පර්හෝටින් නමැති සිවිල්සේවකයකු ඉතා වැදගත් කරුණක් සඳහා සවාමිදූ හමුවීමට පැමිණ සිටින බවත්, ඒ කාරණාව එ තරම් නොවැදගත්

නම් මේ අවේලාවේ නොඑන බවත් දන්වන ලෙස තරුණයා ඉතා කරුණාවෙත්, එහෙත් එඩිතර කමින් යුතු ව අයැද සිටියේ ය. "කරුණා කරල මා කියාපු විදියට ම කියන්න"යි ඔහු සේවිකාවට කී ය.

සේවිකාව තික්ම ගියා ය. ඔහු දොරටුව ළඟ බලා සිටියේ ය. තව ම නිදා නොගත් ගෘහණිය යහන් ගබට වී සිටියා ය. එ දින සවස මිතියා ගේ ගමනින් පසු ඈ මහත් නොසන්සුන් තත්ත්වයක සිටියා ය. මෙ වැනි නොසන්සුන් කමකින් පසු ව ඇති වන හිසරුදවෙන් තමාට වැලැකී සිටිය නොහැකි යැයි ඈ කල්පනා කලා ය. සේවිකාව ගේ කතාව අසා ඈ පුදුම වූවා ය. මේ අවේලාවේ ප්‍රාදේශික සිවිල් සේවකයකු ගේ පැමිණීම ගැන ඇය තුළ කුතුහලයක් ඇති නො වූවත් ඔහු හමුවීමට ඈ විරුද්ධ වූවා ය. තමා හමුවීමට ගෘහිණිය දක්වූ අකැමැත්ත දුටු තරුණයා හිතුවක්කාර කොලුවකු මෙන් සිත් දැඩි කරගත්තේ ය. කෙසේ හෝ ගෘහිණිය හමුවිය යුතු යැයි අදහස් කල හෙතෙම, තමා පැමිණියේ ඉතා වැදගත් හදිසි කටයුත්තකට බවත්, දැන් තමා නො හමු වුවහොත් ඒ ගැන පසු ව ඇයට පසුතැවෙන්නට සිදුවන බවත් කියන ලෙස ඔහු සේවිකාවට ආයෙත් කීවේ ය. "එවේලේ මා සිටියේ ඉතා නොසන්සුන් තත්ත්වයක නිසා මා කුමක් කලේ දැයි කීමට මම නො දනිමි" ඔහු පසු ව කීවේ ය. ඔහු දෙස පුදුමයෙන් බැලූ සේවිකාව පණිවිඩය ගෙන යළි ස්වාමිදූ ළඟට ගියා ය. පුදුමයට පත් ගෘහිණිය මඳක් කල්පනා කරන්නී මේ අමුත්තා කෙබඳු කෙනෙක් දැයි සේවිකාව ගෙන් විමසුවා ය. "ඒ මහත්මයා හොඳට ඇඳපැළඳ ගත්ත කරුණාවන්ත කෙනෙක්"යයි සේවිකාව කීවා ය. තමා දැකුම්කලු තරුණයකු බව පියෝතර් පර්හෝටින් දැන සිටි බව මෙහි ලා සඳහන් කල යුතු ය. ගෘහිණිය, තරුණයා හමුවීමට අදහස් කලා ය. සයනයට අඳින ඇඳුමෙන් සැරසී සෙරෙප්පු ලා සිටි ඕතොමෝ කළු සළුවකින් උරහිස වසා ගත්තා ය. පැය කීපයකට කලින් ඈ මිතියා සමඟ කතා බහ කල විසිත්ත කාමරයට පියෝතර්ට යන ලෙස දන්වන ලදි. විමැසිල්ලෙන් යුතු ව විසිත්ත කාමරයට පැමිණි ගෘහිණිය අමුත්තාට හිඳගන්නටවත් නො කියා "මහත්මයා මොකද ආවේ? මොනව ද උවමනා කරන්නේ?"යි කෙළින් ම ඇසුවා ය.

"මේ අවේලාවේ කරදර කිරීම ගැන බොහො ම කනගාටුයි. මම ආවේ අපේ මිත්‍රයකු වන මිතියා කරමසෝ ගැන ආරංචියක් දැනගැනීමටයි" පියෝතර් කීවේ ය.

මිතියා ගේ නම ඇසූ සැණෙකින් ම කුලකාන්තාව ගේ මුහුණ කෝපයෙන් රතු විය. ඈ කෑගා කතා කරමින් තරුණයා ගේ කතාවට බාධා කළා ය.

"මේ භයානක මිනිහා ගෙන් මා තවත් කො තරම් දුක් විඳින්න ද?"යි ඈ කෑගා ඇසුවා ය. "ඇයි මහත්මයා මේ අවේලාවේ මගේ ගෙදරට කිසි ම බයක් හැකක් නැති ව ඇවිදින්, මීට පැය තුනකට කලින් මේ කාමරයේ දී මා මරන්නට වැයම් කරලා, අන්තිමේ දී කිසි ම ශිෂ්ට කෙනෙක් වැදගත් ගෙයකින් පිට නොවන විදියට මේ ගෙදරින් පිට වී ගිය නපුරු මිනිහකු ගැන අසමින් මට කරදර කරන්නේ?............ මහත්මයා, මම මේක නිකම් යන්න දෙන්නේ නැහැ. මම හෙට මහත්මයාට විරුද්ධ ව පැමිණිල්ලක් කරනවා. දැන් ඉතින් කරුණා කරලා මෙ තැනින් පිටවෙන්න..............මම දරුවෙක් සිටින මවක් ...."

"එහෙනම් මිතියා නෝනමහත්මයත් මරන්න හැදුවද?"

"මොකද එහෙනම් මිතියා මිනියක් මරල ද?"යි ගෘහිණිය කලබල වෙමින් ඇසුවා ය.

"මට කරුණා කරල මිනිත්තු භාගයක් ඉඩ දෙනවා නම් වචන සවල්පයකින් හැම දෙයක් ම විස්තර කරලා දෙන්නම්"යයි පියෝතර් සපිර සවරයෙන් කී ය. "අද සවස පහට මිතියා මගෙන් රූබල් දහයක් ණයට ගත්තා. ඒ වෙලාවේ එයා ළඟ තඹයක් වත් නොතිබුණ බව මම හොඳට ම දන්නවා. එහෙත් රෑ නවයට පමණ මිතියා ආයෙත් මා හමුවෙන්න ආවා. ඒ වෙලාවේ එයා ගේ අතේ රූබල් නෝට්ටු මිටියක් තිබුණා. සමහර විට රූබල් දෙතුන් දහසක් විතර තියෙන්න ඇති. මිනිහගේ අත්වලයි මුහුණෙහි හැම තැන මයි ලේ ගෑවිලා තිබුණා. මිනිහ හිටියේ පිස්සකු වගෙයි. මුදල් කොයින් ද කියා ඇසුවා ම කිව්වා රත්රන් ආකරවලට යන්න ඔබ රූබල් තුන්දහසක් දුන්නය කියා......"

ගෘහිණිය ගේ මුහුණ හදිසියෙන් ම නොසන්සුන් කමින් හා වේදනාවෙන් ද අඳුරු විය.

"අනේ දෙයියනේ, එහෙනම් මිතියා තාත්තා මරන්න ඇති!"යි ඈ දෑත එක්කර ගනිමින් කීවා ය. "මම මිතියාට සල්ලි දුන්නේ නැහැ. කවදාවත් දුන්නේ නැහැ...... පරක්කු වෙන්න එපා. ඉක්මනට ගිහින් ඒ නාකි මිනිහා බේරගන්න......"

"ටිකක් ඉන්න, මිතියාට මුදල් තුදුන් බව හොඳට ම මතක ද?"

"නැහැ, මම මුදල් දුන්නේ නැහැ. මට හොඳට මතකයි. නුදුන්නේ මිතිහා මුදල්වල අගය නොදන්න නිසයි. මිතිහා අඩි පොලොවේ හපා බොහො ම තරහෙන් යන්න ගියා. මට ගහන්න හැදුවහම මම පැනල ගියා. මහත්මයාට තවත් කාරණාවක් කියන්න ද? මහත්මයාගෙන් කිසි ම දෙයක් ගන්න මම කැමැති නැහැ. මිතියා මට කෙල ගැසුවා. මොකද ඒ ගැන කල්පනාව.........මොකද හිටගෙන ඉන්නේ? කරුණා කරලා වාඩිවෙන්න.........නැහැ වාඩි වුණාට කමක් නැහැ ඉක්මනට යන්න.........ඉක්මනට ගිහින් අර නාකි මිතිහා මාරයාගෙන් බේරා ගන්න."

"නමුත්, දූනට ම තාත්තා මරලානම් මොකද වෙන්නේ?"

"ඔව්, අනේ දෙයියනේ, අපි දැන් මොනව ද කරන්නේ? මහත්මයා ගේ අදහස කොහොම ද?"

ඒ අතරේ තරුණයාට අසුනක් පිළිගැන්වූ කුල කත අනතුරු ව ඔහු ඉදිරිපිට හිඳගත්තා ය. තරුණයා ඔහු දුටු දෙය ගැන කෙටි එහෙත් පැහැදිලි විස්තරයක් කෙළේ ය. තමා පෙම්යා ගේ ගෙදරට ගිය සැටිත්, මෝල් ගස පිළිබඳ කතාවත් කීවේ ය. නොසන්සුන් සිතින් පසුවන කුලකත කෙරෙහි මේ විස්තරය තදින් බලපෑවේ ය. තරුණයා කතා කරන අතරේ වරින් වර නැතිගෙන කෑගැසූ ඕතොමෝ දෑතින් මුහුණ වසා ගත්තා ය.

"මේ විපත්තිය වෙන බව මම කලින් දැනගත්තා. මා හිතන දෙය ඒ විදියට ම සිදු වෙනවා. මම ඔය භයානක මිනිහ දිහා බලා කල්පනා කළා කවද හරි ඔය මිනිහා මාව මරා විනාශ වෙන්න පුළුවන් ය කියා. දූන් ඒ විදියට ම සිදු වුණා. මා මරනවා වෙනුවට තාත්තා මැරුවා. දෙයියන් ගේ පිහිටෙන් මා යන්තම් බේරුණා. මිනිහට මාව මරන්න ලැජ්ජා හිතුණේ මම මිනිහගේ බෙල්ලේ සාන්ත වවාරා ගේ සුරුවමක් බැන්ද නිසයි. මම මිනිහ ළඟට ගියාම සුරුවම දමන්න මගෙ දිහැවට බෙල්ල දික්කළා. මහත්මයා දන්නවද (මට බොහොම කනගාටුයි, මහත්මයා ගේ නම පර්හෝටින් කිව්වා නේ ද?) මම හාස් කම් ගැන විශ්වාස කරන්නේ නැහැ. ඒත් අර සුරුවම නිසා මා යන්තම් බේරුණා. මගේ පරණ අදහස්

වෙනස් කොට දුන් මම හැම දෙයක් ම විශ්වාස කරනවා. මහත්මයාට සොසිමා තවුසා ගැන ආරංචියි නේද?.........මා මොනව දෙඩනව ද කියා මට ම තේරුම් ගන්න බැහැ...... මහත්මයා දන්නවද මිතියා අර සුරුවම කරේ දමාගෙන මට කෙළගැසුවා.........ඊට පස්සේ පැනල ගියා. දුන් ඉතින් අපි මොකද කරන්නේ? කොහොම ද කල්පනාව?"

පුටුවෙන් නැගී සිටි තරුණයා තමා පොලිස් කපිතන් හමුවී, සියල්ල පවසා, ඔහු කැමැත්තක් කිරීමට ඉඩ දෙන බව කී ය.

"එයා බොහො ම හොඳ මහත්මයෙක්. මම හොඳට අඳුනනවා. ඔව්, ඔව්, එයා ළඟට යන්න. බොහො ම දක්‍ෂ මිනිහා. කොහොම වුණත් මහත්මයා කරන්න අදහස් කළ දෙය බොහො ම හොඳයි. මට නම් කවදාවත් ඔවැනි අදහසක් ඇතිවන්නේ නැහැ."

"මම පොලිස් කපිතන් බොහො ම හොඳට අඳුනනවා"යි තවමත් සිටගෙන සිටි තරුණයා කීවේ තමාට යන්නට ඉඩ නොදෙන මේ අපරීක්ෂ්‍යකාරී කාන්තාව ගෙන් නිදහස් වීමේ අදහසිනි.

"මහත්මයා කොහොම හරි ආපසු ඇවිදින් මිනීමැරුම සිදුවුණ හැටි, මිනීමරුවාට දෙන ලද දඬුවම, ඒ දඬුවම සඳහා යවන ලද ස්ථානය, මේ සේරම මට කියන්න ඕනෑ. අපේ රටේ මරණ දඬුවම නැහැ නේද? උදේ තුන වුණත්, හතර වුණත්, හතරාමාර වුණත් කමක් නැහැ. කොහොම හරි අවිදින් මට සේරම කියන්න ඕනෑ.......මම නිදාගෙන හිටියොත් වැඩකාරියට කියන්න කොහොමහරි මට කතා කරන්න කියා........ කොහොම වුණත් මට නිදා ගන්න ලැබෙන්නේ නැහැ. මහත්මයා එක්ක මාත් ගියොත් හොඳ නැද්ද? කොහොම ද මහත්මයා ගේ අදහස?"

"නැහැ, නැහැ, එන්න උවමනා නැහැ. නමුත් මිතියා කරමසෝට මුදල් නුදුන් බව දන්වා ලියුමක් දෙන්න පුළුවන් නම් සමහර විට ප්‍රයෝජනවත් වෙන්න පුළුවනි."

"ලියුමක් දෙන්න පුළුවනි"යි මහත් උනන්දුවෙන් පැවැසූ ගෘහිණිය වහා මේසය ළඟට ගියා ය. "මහත්මයා කාරණාවක් දන්නව ද? මට මහත්මයා ගැන බොහො ම පුදුම හිතෙනවා.

මහත්මයා මෙ වැනි දේවල් ගැන දක්වන දක්‍ෂකම ගැන මට බොහො ම පුදුමයි. මහත්මයා රක්‍ෂාව කරන්නේ මේ පලාතේ ද? මහත්මයා මේ පළාතේ රක්‍ෂාව කරනවා දැනගැනීමට ලැබීම කො තරම් ලොකු ප්‍රීතියක් ද?.........”

තරුණයා සමග කතා කරන අතරේ ඈ කඩදාසියක ලොකු අකුරින් මෙසේ ලිව්වා ය.

> “මම මුළු ජීවිතයට ම කාලකණ්ණි මිනියා කරමසෝට (ඔහු දැන් සිටින්නෙත් කාලකණ්ණියකු වගෙයි) රූබල් තුන්දහසක් ණයට දීලා නැහැ. ඒ බව මේ ලෝකේ ඇති ශුද්ධ වූ හැම දෙයක් ගැන ම දිව්රා කියමි.
>
> මිට, කැතිරිනා හොලාකෝ.

“මෙන්න ලියුම”යි ඈ තරුණයා දෙසට හැරී ලියුම දෙමින් කීවා ය. “ගිහින් මිනිහ බේරගන්න. මහත්මයා කරන්නේ බොහො ම ශ්‍රෙෂ්ඨ දෙයක්.”

තරුණයා ගේ හිස උඩින් තුන්වරක් ම කුරුසයේ ලකුණ ඇන්ද කුලකත අනතුරු ව නික්ම යන තරුණයා සමග දොර දක්වා ගියා ය.

“මහත්මයාට මම බොහො ම සතුති කරන්න ඕනෑ. වෙන කො තැනකටවත් නො ගිහින් මා ළඟට ආපුළුක ගැන සතුති කරන්න ඕනෑ. ඇයි අපට මීට කලින් ආශ්‍රය කරන්න නො ලැබුණේ? මහත්මයා මගේ ගෙදරට එනවා නම් මම බොහො ම කැමැතියි. මහත්මයා වැනි දක්‍ෂයෙක් මේ පලාතේ රක්‍ෂාව කරන බව දැනගැනීමට ලැබීම කො තරම් ලොකු වාසනාවක් ද? මහත්මයා කරන උපකාරය ඔවුන් උසස්කොට සලකන්න ඕනෑ.......... මගෙත් උපකාරයක් උවමනා නම් කියන්න.........මම තරුණ අයට බොහො ම ආදරෙයි. බොහො ම දුක් විඳින අපේ රුසියාවේ අනාගතය රැඳී ඇත්තේ මේ තරුණ පරපුර උඩයි.........යන්න......යන්න...ඉක්මනට යන්න...........”

තරුණයා දැනට ම මඟට බැස සිටියේ ය. නැති නම් ගෘහිණිය ඔහුට යාමට ඉඩ නොදෙන්නී ය. කෙසේ වෙතත් ගෘහණිය ඉතා ශිෂ්ට තැනැත්තියක ලෙස ඔහුට පෙනී ගියේ ය. මෙ වැනි අප්‍රිය අකරතැබ්බයකට පත්වීම ගැන ඔහු එ තරම් කනගාටු නොවූයේ මේ කුල කත සමග දැන ඇඳුනුම් කම් ඇතිකර

ගැනීමට ලැබීම නිසා ය. එකිනෙකා ගේ රුචි අරුචිවල වෙනස් කම් පවතින බව අපි දනිමු. ඇයට "එතරම් වයස ද නැතැ"යි තරුණයා කල්පනා කෙළේ ය. ඒ ගැන ඔහු සතුටු විය. "තව ටිකෙන් ඈ ඇගේ දුව ය කියලා මම වැරදිලා කල්පනා කරනවා."

හොලාකෝ මැතිනිය තරුණ සිවිල් සේවකයා ගැන බොහො ම පැහැදුණා ය. "මේ කාලේ මේ තරම් දක්ෂ, නිවැරදි ව කල්පනා කරන්න පුළුවන් තරුණයකු සෙවීම තිකිණි සෙවීම වගේ දුෂ්කර කටයුත්තක්, ඒ වගේ ම ඔහු කෙතරම් ශීලාචාර ද? මේ කාලේ තරුණයන්ට කිසි ම දෙයක් කරන්න බැරි බව සමහරු කියනවා. ඒත් මෙන්න ඉන්නවා බොහො ම හොඳ තරුණයෙක්." මෙසේ කල්පනා කළ ගෘහිණියට මීතියා පිළිබඳ භයානක සිද්ධිය සම්පූර්ණයෙන් ම අමතක විය. තමා මරණයට කො තරම් ළං වී සිටි ද යනු ඇයට සිහිවූයේ සයනයට ගියාට පසු ව ය. "අපොයි, මේක බොහො ම භයානක දෙයක්, බොහො ම භයානක දෙයක්"යයි ඈ කීවා ය. එහෙත් ඇය එක්වර ම බඹරයක් මෙන් නිඳ ගත්තා ය.

මේ වයස්ගත වැන්දඹුව සමඟ ඇති කරගත් දැනඇඳුනුම් කම, ක්‍රියාශූර තරුණයා ගේ ජීවිතය කෙරෙහි බල නොපැවැත්-තුවේ නම් මේ හමුවීම ගැන මම මේ තරම් දිග විස්තරයක් නො කරමි. මේ තරුණයා පිළිබඳ කතාව අද දක්වා අපේ ගම්වැසියෝ කියා පුදුම වෙති කරමසෝ සහෝදරයන් ගැන මා ලියන මේ දිග ඉතිහාසය අවසන් වූ පසු ඉහත සඳහන් තරුණයා ගැන යමක් කීමට හැකි වේ යයි බලාපොරොත්තු වෙමි.

දෙවන පරිච්ඡේදය

අනතුරු හැඟවීම

ලෙප්ට්නන් කර්නල් නිලය දරූ අපේ පොලිස් කපිතන් මිකේල් මකාරොවිච් වැන්දඹුවකි, මහත්මා ගතිගුණ ඇත්තෙකි. හවුරුදු තුනකට පෙර අපේ ගමට පැමිණි ඔහු බෙහෙවින් ජනප්‍රිය වූයේ වෙසෙසින් ම නගරයේ උසස් සමාජය එකමුතු ව තැබීමට දැන සිටි හෙයිනි. ඔහු ගේ ගෙදර අමුත්තකු නැති

වෙලාවක් නැති ඔහුට අමුත්තන් නැති ව ජීවත්විය නොහැකි ය. හැම දා ම ඔහු රාත්‍රි භෝජනය ගත්තේ අමුත්තන් දෙතුන් දෙනකු සමඟ ය. අමුත්තකු නැති ව ඔහු කවරදාවත් කෑම මේසයට නොගියේ ය. ඉතා සුළු දෙයක් ගැන වුව ද ඔහු රාත්‍රි භෝජන සංග්‍රහයක් පැවැත්වූයේ ය. ඇතැම් විට ඉතා පුදුම දේවල් මුල් කරගෙන ද ඔහු භෝජන සංග්‍රහ පැවැත්වූයේ ය. මේ භෝජන සංග්‍රහවල දී පිළිගන්වනු ලබන ආහාර පාන එ තරම් රසවත් නො වූවත් නොමඳ ව තිබුණේ ය. කෙසේ වෙතත් මාළු සුපය රසවත් විය. වයින් රසවත් නො වූවත් නො අඩු ව තිබුණේ ය.

ගෙට පැමිණෙන අමුත්තා පළමු ව ඇතුළු වන්නේ අංග සම්පූර්ණ බිලියඩ් කාමරයට ය. කළු ලීයෙන් රාමු කරන ලද ඉංග්‍රීසි අසුන් ගේ චිත්‍රවලින් කාමරයේ බිත්ති අලංකාර විය. මේ චිත්‍ර අවිවාහකයකු ගේ බිලියඩ් කාමරයකට ඉතා අවශ්‍ය අංගයකි. හැම දා සවස ඔහු මිත්‍රයන් සමග කාඩ් ගැසුවේ ය. ඒ අතරේ මහලු මව්වරුන් හා ඔවුන් ගේ දූවරුන් ඇතුළු නගරයේ උසස් සමාජය බාල් නැටුම් පිණිස නිතර පොලිස් කපිතන් ගේ ගෙදර රැස්වූ හ. කපිතන් වැන්දඹුවකු වුවත් තනියෙන් වාසය නොකෙළේ ය. ඔහු ගේ වැන්දඹු දියණිය ඇගේ, අධ්‍යාපනය අවසන් කළ තරුණ දියණියන් දෙදෙනා සමග එහි වාසය කළා ය. නිතර ප්‍රීතියෙන් සිටින මේ රූමතියන්ට දායාදයක් නැති බව කවුරුත් දැන සිටියහ. එහෙත් තමන් සමඟ ප්‍රිය සාදයෙන් ගත කිරීමට නගරයේ සිටින ධනවත් තරුණයන් මුත්තණුවන් ගේ ගෙදරට කැඳවා ගැනීමට මේ තරුණියෝ සමත් වූ හ.

වෙනත් රජයේ නිලධරයන් මෙන් තමා ගේ රාජකාරිය යන්තම් කළ පොලිස් කපිතන් එ තරම් කාර්ය සූර නොවී ය. ඇත්ත කියන්නේ නම් ඔහු ලොකු උගතෙක් නො වේ. තමාට අයත් බලතල ගැන ඔහු ගේ දැනුම කෙරෙහි එ තරම් විශ්වාසයක් තැබිය නොහැකි ය. වර්තමාන රජය විසින් ඉදිරිපත් කරන ලද සමහර ප්‍රතිසංස්කරණ ගැන පැහැදිලි අවබෝධයක් ඇතත් ඔහු ඒවා වරදවා ක්‍රියාවේ යෙදෙව්වේ ය. ඔහු එසේ කළේ නූගත්කම නිසා නො ව නොසැලැකිල්ල නිසා ය. ඉක්මන් වැඩිකම නිසා ය.

"මට තියෙන්නේ යුධ භටයකු ගේ හදවතක් මිස සාමාන්‍ය මිනිසකු ගේ හදවතක් නො වෙයි" ඔහු තමාට ම කියාගත්තේය.

ගොවිජනයාට නිදහස දීම සඳහා ඇති කරන ලද ප්‍රතිසංස්කරණ සම්බන්ධ ව මූලික ප්‍රතිපත්ති ගැන ඔහුට තව ම පැහැදිලි වැටහීමක් තිබෙන බවක් නො පෙනේ. ඔහු වැඩි සැලැකිල්ලක් නො දක්වා, ඒ ගැන හවුරුද්දක් පාසා ටිකින් ටික දැනුම ලබා ගත්තේ ඒවා ක්‍රියාත්මක කරනවාත් සමග ය. එහෙත් ඔහු ඉඩම් හිමියෙක් විය. එ දින රෑ පොලිස් කපිතාන් ගේ ගෙදරට ගිය විට තමාට අමුත්තන් කීප දෙනකු හමුවන බව පියෝතර් දැන සිටියේ ය. ඔවුන් කවුරුන් විය හැකි දැයි ඔහු නොදත්තේ ය. වාසනාවට මෙන් ඔහු යන විට දණ්ඩ නායකයා ද, පිටස්බර්ග් පුර වෛද්‍ය විද්‍යාලයයෙන් මහ ඉහළින් සමත් වී පැමිණි තරුණ දොස්තර කෙනකු වන වාර්වින්ස්කි ද, කපිතාන් ගේ ගෙදර සුදු කෙළිමින් සිටියෝ ය. ඉපොලිට් කිරිලොවිච් නමැති දණ්ඩනායකයා නැතිනම් උප දණ්ඩනායකයා (හෙතෙම උප දණ්ඩනායකයා වුවත් මහ දණ්ඩනායකයා ලෙස හඳුන්වන ලදී) ඉතා මහත වඳ ගැහැණියක විවාහ කරගත් සයරෝග කාරයකු වැනි ඉතා සිහින් අමුතු වර්ගයක මිනිසෙකි. ඔහු උගතෙකි. කරුණාවන්ත සිතැත්තෙකි. එහෙත් උඩගු සිතැති විගස කිපෙන්නෙකි. ඔහු තුළ පැවැති වරද නම් උවමනාවට වඩා තමා ගැන ඉහළින් කල්පනා කිරීම ය. ඔහු නිතර නොසන්සුන් කමින් පසුවන්නේ මේ අදහස නිසා ය. කෙසේ වෙතත් ඔහු මනෝවිද්‍යාව ගැන ලොකු සැලැකිල්ලක් දැක්වූයේ ය. නිදසුනක් වශයෙන් කියතොත්, මිනිස් හදවත ගැන ද අපරාධකාරයා හා අපරාධ ගැන ද ඔහුට විශේෂ දැනුමක් තිබිණි. උසස් නිලධාරීන් තමා ගේ උගත්කමට සැලැකිලි නොදැක්වීම හා තමාට උසස් තැන්වල සතුරන් සිටීම ගැන ඔහු නිතර මැසිවිලි කීවේ ය. නිලයෙන් අස්වී අපරාධ නඩු සම්බන්ධ වූ නීතිඥයකු ලෙස පෞද්ගලික ව රක්‍ෂාව කිරීමට කෝප වූ අවස්ථාවල දී ඔහු කල්පනා කෙළේ ය. කිසි ම බලාපොරොත්තුවක් නැති ව පැමිණි කරමසෝව් නඩුව නිසා ඔහු නොසන්සුන් විය. "මේ නඩුව රුසියාව පුරා ප්‍රසිද්ධ වෙන්න පුළුවනි"යි කල්පනා කළ හෙතෙම "නැහැ මා ඔනෑවට වඩා ලොකු දේවල් බලාපොරොත්තු වෙනවා වැඩියි." අනතුරු ව තමාට ම කියාගත්තේ ය.

දෙ මසකට පෙර පිටස්බර්ග් පුරයේ සිට පැමිණි තරුණ රාජ නීතිඥයකු වන නිකොලායි පාපෙනෝවිච් නෙලූඩෝ මහතා තරුණියන් සමඟ අනෙක් කාමරයේ හිඳ සිටියේ ය. 'අපරාධය' සිදු වූ දින රෑ මේ නිලධරයන් තිදෙනා, තවත් උසස් නිලධරයකු ගේ

තිවෙසේ උවමනාවට ම වාගේ රැස් වී සිටීම ගැන නගරවාසීහු පසු කාලයේ දී පුදුමයෙන් කතා බහ කළහ. එහෙත් එය සාමාන්‍යයෙන් සිදුවන නොවැදගත් දෙයකි.

දණ්ඩනායකයා ගේ බිරිය තෙදිනක සිට දත් කැක්කුමකින් පෙළෙන්නී ය. ඇගේ කෙඳිරි ගෑමේ කරදරයෙන් නිදහස් වීමට දණ්ඩනායකයා කො තැනක හෝ යා යුතු ය. සවස සූදුවට නො ගොස් සිටීම වාවිත්ස්කි දෙස්තර මහතාට කිසිසේත් කළ හැකි දෙයක් නො වේ. අනෙක් අතින් තරුණ නීතිඥයා එ දින සවස පොලිස් කපිතාන් ගේ ගෙදරට පැමිණීමට තෙ දිනක සිට අරඅඳිමින් සිටියේ ය. පොලිස් කපිතාන් ගේ වැඩිමහල් මිනිපිරිය වන ඔල්ගා මිහේල්ලෝනා රහසක් ලෙස සඟවාගෙන සිටි ඇගේ උපන් දිනය තමා දැන සිටි බවත්, ඇ එය රහසක් ලෙස සඟවාගෙන සිටියේ තමා සමඟ නැටීමට ඇති අකමැත්ත නිසා බවත් ඇයට දන්වා ඇය පුදුමයට පත් කිරීම පිණිස පොලිස් කපිතාන් ගේ ගෙදරට පැමිණීමට තරුණ නීතිඥයා අදහස් කරගෙන සිටියේ ය. ඇගේ වයස ගැනත්, ඇ එය රහසක් ලෙස සඟවාගෙන සිටීම ගැනත්, තමා එය දැන අනෙක් අයට හෙළි කිරීම ගැනත් නොයෙක් විහිළු තහළු කොට විනෝද වීමට ඔහු බලාපොරොත්තු විය. මේ තරුණ නීතිඥයා මේ වැනි දෙයට බොහො ම සමත් ය. එ හෙයින් තරුණියෝ ඔහුට 'දඟ-කාරයා'යි කීහ. ඔහු ඉතා ශිෂ්ට තරුණයෙකි. හොඳ කුලගොත් ඇත්තෙකි. උසස් අධ්‍යාපනයක් ලැබූවෙකි. නිතර විනෝදයෙන් සිටින්නෙකි. එහෙත් ඒ විනෝදය ඉතා ශිෂ්ට විය. අහිංසක විය. ඔහු මිටි ය, සියුමැලි ය. සිහින් දිග ඇඟිලිවල ඔහු නිතර දිලිසෙන විශාල මුදු පැළඳ සිටියේ ය. එහෙත් රාජකාරියේ දී ඔහු ඉතා සන්සුන් වූයේ තමා පිට පැටවී ඇති වග කීමේ බරපතළ කම තේරුම් ගෙන විය යුතු ය. පහත් පන්තියේ මිනීමරුවන් ගේ හා අපරාධකාරයන් ගේ ද සිහිය අවුල් කරමින් කෝන්තර ඇසීමට ඔහු තුළ අපූරු දක්ෂකමක් තිබිණි. ඔවුන් ගෙන් ගරු සැලැකිලි ලබා ගත නොහැකි වුවත් ඔවුන් පුදුම කරවීමට ඔහු සමත් විය.

පොලිස් කපිතාන් ගේ නිවෙසේ විසිත්ත කාමරයට පිවිසි පියෝතර් අන්ද්‍රූත් කුත්ද්‍රූත් විය. මිනීමැරුම පිළිබඳ පුවත හැම දෙනාට ම ආරංචි වී තිබෙන බව ඔහු දුටුවේ ය. ඔවුහු කාඩ් ගැසීම නතර කොට සිටගෙන කතා කරමින් උන්හ. වෙනෙකක් පවා තරුණියන් සමඟ කතා කරමින් සිටි තරුණ නීතිඥයා ද ඒ කතාව නවත්වා සූදානමින් සිටියේ ය. එ දින

සවස මහලු කරමසෝ සිය නිවෙසේ දී මරා දමා මුදල් පැහැර ගෙන තිබෙන බව කාමරයට පිවිසි පියෝතර්ට දන්වන ලදි. දූත් ටිකකට කලින් ඔවුන්ට මේ පුවත දැන ගන්නට ලැබුණේ පහත සඳහන් ක්‍රමයට ය.

එ දින රෑ ගිරිගෝරිස් ගේ බිරිය මාපා, ගැඹුරු නින්දක් නිදා සිටියා ය. ඇයට එළිවන තෙක් මෙසේ නිදාගත හැකි වුවත් ඈ හදිසියෙන් ම අවදි වූවා ය. තිසැකයෙන් ම අවදිවන්නට ඇත්තේ අනෙක් කාමරයේ මීමැස්මොරය වැලඳී සිහි නැති ව සිටි පැවල් විසින් නගන ලද බියකරු කෑගෑම නිසා විය යුතු ය. මීමැස්මොරය වැලැඳීමට පෙර කරන මේ කෑගෑමෙන් මාපා තැතිගත්තා ය. ඒ කෑගෑම නිසා ඇය තුළ දරුණු වේදනාවක් ඇති විය. ඇයට කවරදාවත් ඒ කෑගෑමට පුරුදු විය නොහැකි ය. වහා නැඟී සිටි මාපා පැවල් ගේ කාමරයට දිව ගියා ය. එහෙත් කාමරය අඳුරු විය. ඇයට ඇසුණේ රෝගියා අමාරුවෙන් කරන හුස්ම ගැනීමත් දඟලීමත් පමණි. ඈ කෑගා සැමියාට කතා කළා ය. එහෙත් තමා අවදිවන විට සැමියා තමා ළඟ නිදා නොසිටි බව ඇයට හදිසියෙන් ම සඳහන් විය. ඈ වහා ආපසු ගොස් අඳුරේ ඇඳ අතගා බැලුවා ය. ඇඳ හිස් විය. එසේ නම් ගිරිගෝරිස් ගෙයින් පිට යන්නට ඇත. ඈ වහා පඩි පෙළ උඩට ගොස් ඔහුට කතාකළා ය. එහෙත් ඇයට පිළිතුරක් නො ලැබිණි. ඒ වෙනුවට වත්තේ කෙළවර සිට කෙඳිරි ගෑමක්, රාත්‍රි නිශ්ශබ්දතාව තුළින් ඇසිණි. ඈ නිහඬ ව අසා සිටියා ය. කෙඳිරිය ආයෙත් ඇසෙන්නට විය. ඒ කෙඳිරිය වත්තේ සිට එන බවට කිසි ම සැකයක් නැත. "අනේ දෙයියනේ මේක හරියට ලිසවෙතා ගේ කෑගෑම වගෙයි" යන අදහස ඇගේ ශෝකයෙන් නොසන්සුන් වූ සිත තුළින් විදුලියක් මෙන් ඇති වී ගියේ ය. වහා පඩිපෙළ බැස ගිය ඇයට වත්තට ඇතුළු වන ගේට්ටුව ඇර දමා තිබෙන බව දකින්නට ලැබිණි. වත්තෙන් එළියට යන්නට ඇතැයි කල්පනා කොට ගේට්ටුව ළඟට ගිය ඇයට ඉතා භයානක හඬකින් "මාපා, මාපා," කියා සැමියා තමාට කතා කරන බව පැහැදිලි ව ඇසිණි. "අනේ දෙයියනේ, හාමුත්තාන්සේ අපව ආරක්ෂා කරත් වා"යයි තමාට ම කියාගත් මාපා කෙඳිරිය ඇසෙන තැනට ගියා ය. ඈ ඇගේ සැමියා සොයාගත්තේ ඉහත සඳහන් කළ පිළිවෙළට ය. එහෙත් ගිරිගෝරිස් සිටියේ ඔහු පහර කෑ තැන නො ව ඊට යාර විස්සක් පමණ ඈතින් ය. සිහි ලැබුණු තැනේ සිට ඔහු බොහෝ වේලා බඩගෑ බව ඔහු ගෙන් පසු ව දැනගන්නට ලැබිණි. මෙසේ

බඩගාන අතරේ ඔහුට කීප වරක් ම සිහි නැති විය. සැමියා ගේ ඇඟ පුරා ලේ තැවරී තිබෙන බව දුටු වහා ම මාපා මහ හඬින් කෑගැව්වා ය. ඒ අතරේ ගිරිගෝරිස් ඉතා සෙමෙන් මොනවා දෝ කීවේ ය.

"ලොකු හාමුදුරුවෝ මරලා........ මීතියා ගේ තාත්තා මරලා. මෝඩයා වගේ කෑගාන්නේ නැති ව ඉක්මනට ගිහින් කාට හරි කතා කරපන්........."

මාපා නො නවත්වා කෑගැව්වා ය. එහෙත් තම ස්වාමියා ගේ කාමරයේ කවුළුව ඇර දමා තිබෙන බවත්, කාමරයේ ඉටිපන්දම් එළියක් තිබෙන බවත්, දුටු ඈ වහා කවුළුව ළඟට ගොස් මහලු ස්වාමියාට කතා කළා ය. කවුළුව තුළින් එබී බැලූ මාපා ඉතා භයානක දෙයක් දුටුවා ය. තම ස්වාමියා උඩුබැලි අතට බිම වැතිර සිටියේ ය. ඔහු ඇඳ සිටි ලා පැහැති කබාය හා සුදු කමිසයත් ලෙයින් රතු විය. බිම දිගේ ගලන ලෙයත්, තම ස්වාමියා ගේ නිශ්චල මුහුණත්, ඉටිපන්දම් එළියෙන් පැහැදිලි ව පෙනුණේ ය. භීතියෙන් සිහි විකල වූ මාපා කවුළුව ළඟින් ඈත් වී, වත්තෙන් ඉවතට පැන, මහ ගේට්ටුව ඇරගෙන වත්ත පිටිපසින් වැටී ඇති අඩි පාර දිගේ මාෆා කොන්ද්‍රොනා නමැති අසල් වැසි ස්ත්‍රිය ගේ ගෙදරට දිව ගියා ය. එ වේලේ මවත් දියණියත් නිඳා සිටි මුත් මාපා ගේ විලාපය හා දොරට ගසන හඬ අසා වහා නැගිට ආහ. කෑගාමින් ම මුළු සිද්ධිය පැවැසූ මාපා තමන්ට පිහිට වන ලෙස ඉල්ලා සිටියා ය.

නිතර දඩාවතේ යන පෝමා ද එ දින රෑ එම ගෙදර නිදා සිටියේ ය. ඔවුහු වහා පෝමා අවදි කරවා කරමසෝ ගේ ගෙදරට ගියහ එ දින රෑ අටට පමණ තමාට භයානක කෑ ගැමක් ඇසුණු බව, එන ගමන් මාපාට මතක් විය. එය වැටෙන් පනිමින් සිටි මීතියා ගේ කකුල අල්ලාගත් ගිරිගෝරිස් විසින් "පීතෘ ඝාතකයා" යයි කියා කළ කෑගැම බවට කිසි ම සැකයක් නැත.

"කවුදෝ මිනිහෙක් හිටිහැටියේ ම කෑගා නතර වුණා" යි මාපා දිව යන ගමන් විස්තර කරමින් කීවා ය. ගිරිගෝරිස් වැටී සිටි තැනට දිවගිය ඔවුහු පෝමා ගේ උපකාරය ඇති ව ගිරිගෝරිස් ගෙය තුළට ගෙන ගියහ. අනතුරු ව ඔවුහු ඉටිපන්දමක් දල්වාගෙන පැවල් ළඟට ගොස් බැලූ හ. ඔහු මීමැස්මොරය හැදී වෙවුලමින් සිටියේ ය. ඔහු ගේ දෑස උඩ

ගොස් තිබිණි. කට කෙලවරිත් සෙම ගලන්නට විය. ඔවුහු විනාකිරි සමඟ මිශ්‍රකළ වතුරින් ගිරිගෝරිස් ගේ නළල පිස දැමූහ. නළල පිස දැමූ වහා ම ඔහුට සිහිය ලැබිණි. සිහිය ලැබුණු වහා ම:

"අපේ හාමුදුරුවත් මරලා දැ?"යි ඇසුවේ ය.

මහ ගෙදරට දිව ගිය ගැහැනු දෙදෙනා සහ පෝමා කවුළුව පමණක් නො ව වත්තේ සිට ගෙට ඇතුළුවන දොර ද ඇර දමා තිබෙන බව දුටුවෝ ය. පසු ගිය සතියේ සිට හැම දා රාට අගුල් දමා මේ දොර වසන මහලු කරමසෝ කිසි ම කරුණක් නිසා හෝ දොර නො අරින ලෙස ගිරිගෝරිස්ට ද නියම කර තිබිණි. දොර ඇර තිබෙන බව දුටු ඔවුන් කාමරයට යාමට බිය වූයේ "පසු ව යම්කිසි දෙයක් වෙන්නට පුළුවන් ය" යන අදහසිනි. ආපසු පැමිණි ඔවුන්ට වහා ම පොලිස් කපිතන් සොයා යන ලෙස ගිරිගෝරිස් නියම කෙළේ ය. පොලිස් කපිතන් ගේ ගෙදරට දිව ගිය මායා එහි සිටි හැම දෙනාට ම මිනීමැරුම ගැන තොරතුරු කීවා ය. ඈ එහි ගියේ පියෝතර් යාමට මිනිත්තු පහකට කලින් ය. පියෝතර් පැමිණියේ තමා ඇති කරගත් නිගමනයක් හෝ සිද්ධාන්තයක් හෝ එළිකිරීමේ බලාපොරොත්තුවෙන් නො වේ. ඔහු පැමිණියේ මිනීමරුවා ගැන කා අතරත් පැවැති මතය සනාථ කිරීමට පැමිණෙන සාක්ෂිකරුවකු මෙනි. (එහෙත් හිත යටින් ඔහු අන්තිම මොහොත දක්වා ඒ මතය නොපිළිගත්තේ ය.)

මිනීමැරුම ගැන වහා ම කටයුතු කිරීමට කවුරුත් තීරණය කරගත්හ. සාක්ෂිකරුවන් හතර දෙනකු සමඟ පියෝදර් පවුලොවිච් කරමසෝ ගේ ගෙදරට ගොස් නීතිරීතිවලට එකඟ ව (මම ඒ නීති රීති ගැන මෙහි ලා විස්තරයක් නො කරමි) මිනී මැරුම සිදු වූ තැන විභාගයක් කරන ලෙස නගරයේ පොලිස් ඉන්ස්පැක්ටර නියම කෙළේ ය. උද්‍යෝගවත් පුද්ගලයකු වූ පලාතේ දොස්තර ද, මෙ වැනි වැඩ ගැන වැඩි පලපුරුද්දක් නැතත් පොලිස් කපිතන්, දණ්ඩනායකයා හා නීතිඥයා ද සමඟ යාමට කැමැත්ත පලකර සිටියේ ය.

මහලු කරමසෝ හිසේ තුවාලයක් ඇති ව මියගොස් සිටි බව මම කොටින් සඳහන් කරමි. එහෙත් ඔහු ගේ හිසට පහර දෙන ලද්දේ කුමකින් ද? ගිරිගෝරිස්ට පහර දෙන ලද ආයුධයෙන් ම ඔහුට ද පහර දෙන්නට ඇත. වැඩි වේලා යන්නට පෙර ඒ ආයුධය සොයා ගන්නා ලදි. වහා ප්‍රතිකාර

ලැබූ ඛිරිගෝරිස් ඉතා දුබල කටහඬින් තමාට පහර දුන් සැටි විස්තර කෙළේ ය. ලන්තෑරුමක් ගෙන වැට ළඟ සොයා බැලූ ඔවුහු, වත්තට ඇතුළු වන පාරේ පෙනෙන තැනක තිබී පිත්තල මෝල්ගස සොයා ගත්හ. කරමසෝ මරා දමා තිබුණු කාමරයේ කෝලාහාලයක් ඇති වූ බව හඟවන ලකුණක් නො වී ය. එහෙත් ඉස්කිරිම පිටිපස ඇඳ ළඟ තිබී ලොකු ගොරෝසු ලියුම් කවරයක් සොයා ගන්නා ලදි. "මා ළඟට එන්න කැමැති නම් මගේ සුරදූව වන ගෘසෙන්කාට දීම පිණිස මෙහි රූබල් තුන්දහක තෑග්ගක් තියෙනවා"යයි එහි ලියා තිබිණි. "මගේ කිකිළිටය" කියා ඉහත සඳහන් වාසගම යටින් වැඩි දුරටත් ලියා තිබිණි. ලාකිරිවලින් මුද්‍රා තබා වසා තිබුණ කවරය කඩාදමා මුදල් ගෙන තිබිණි. කවරය ගැට ගසන ලද ලා රතු පාට පීත්ත පටිය ඔවුහු බිම තිබී අහුලා ගත්හ.

පියෝතර් ගේ සාක්ෂියෙන් කොටසකට වෙසෙසින් ම දණ්ඩනායකයා හා රාජ නීතිඥයාත් මහත් සැලකිල්ලක් දක්-වූවෝ ය. ඒ කොටස නම් එ දින එළිවන ජාමයේ මීතියා වෙඩි තබාගැනීමට ඇති කරගත් තීරණයයි. තමා වෙඩි තබාගෙන ජීවිතය නැති කර ගැනීමට අධිෂ්ඨාන කළ බව මීතියා එ දින සවස පියෝතර්ට කීවේ ය. ඔහු පිස්තෝල දෙක ගෙන වෙඩි පුරවා අනතුරු ව ලියුමක් ලියා සාක්කුවේ දමාගත්තේ ය. මිතියා ගේ කතාව විශ්වාස කිරීමට පියෝතර් අකැමැති විය. එහෙත් ඒ බව තවකෙකුට දන්වා දිවි නසා ගැනීම නතර කරන බව කීවිට, "දූත් පමා වුණා වැඩි"යි මීතියා සිනා සෙමින් කීවේ ය. එ හෙයින් දූත් ඔවුන් වහා මූක්රෝවට ගොස් වෙඩි තබාගැනීමට පෙර මිනීමරුවා අල්ලා ගත යුතු ය.

"දූත් කතන්දරේ හොඳට ම පැහැදිලියි" දණ්ඩනායකයා උනන්දුවෙන් කීවේ ය. "ඔය පිස්සත් ගේ හැටි ඔහොම තමයි. හෙට උදේට මැරෙනවා, එතකන් ජොලි කරනවා."

මීතියා වයින් සමඟ වෙනත් නොයෙක් කෑම වර්ග ගත් සැටි දක්වන කතාව ගැන දණ්ඩනායකයා මහත් උනන්දුවක් දක්වූවේ ය.

"මහත්වරුනි, ඔල්සුපේ තමැති වෙළෙන්දා මැරුව මිනිහා තමුන්නාන්සේලාට මතක ද? ඒ මිනිහා රූබල් ලක්ෂ එකහමාරක් හොරාගෙන කෙළින් ම කොණ්ඩය කෙරේල් කර ගැනීමට ගොස් ඊට පසු ව මේ විදියට හැම දෙනාට ම පෙනෙන්න මුදල් අතේ තියාගෙන ගෑනු හොයාගෙන ගියා."

කරමසෝෆ් ගේ ගෙදර පැවැත්වූ පරීක්ෂණයට බොහෝ වේලා ගතවූ බැවින් මූක්රෝෆ්වට ගොස් සිටින මිතියා ගැන හෝඩුවාවෙන් සිටීමට පොලිස්නිලධාරියෙක් යවන ලදි. පෙර දින උදේ ඔහු නගරයට පැමිණියේ ඔහු ගේ වැටුප් ගැනීම පිණිස ය. මූක්රෝෆ්වට ගොස් අනෙක් නිලධාරීන් පැමිණෙන තෙක් කිසි ම කලබලයක් නො කර 'මිනීමරුවා' ගැන පරීක්ෂා-වෙන් සිටින ලෙසටත්, 'මිනීමරුවා' අල්ලා ගැනීමට අවශ්‍ය සාක්කිකරුවන් හා පොලිස් නිලධාරීන් ද එකතු කර ගැනීමටත් ඔහුට නියම කරන ලදි. මේ නිලධරයා කිසිවකුට අඳුනාගත නො හැකි වන ලෙස මූක්රෝෆ්වට ගොස් තමාට නියම කරන ලද සියලු කටයුතු මැනැවින් ඉටු කෙළේ ය. ඔහු ඇඳින ගත්තේ ඔහු ගේ පරණ යහළුවකු වන හෝටලයේ අයිතිකාරයා පමණි. හෝටල් හිමියා සඳලුතලයේ දී මිතියා සමඟ කතා කිරීමට මොහොතකට කලින් ඔහුට මිතියා පිළිබඳ රහස දන්වන ලදි. හෝටල් හිමියා ගේ මුහුණේ හා කඩහඬේ ද ඇති වූ වෙනස මිතියා එක් වර ම දුටුවේ ය. තමන් ගැන සෝදිසියෙන් සිටින බව මිතියා ඇතුළු හෝටලයේ රැස් ව සිටි කිසිවෙක් නො දත්හ. හෝටල් හිමියා පිස්තෝල දෙක සමඟ පෙට්ටිය ගෙන සුදුසු තැනක සඟවා තැබුවේ ය. දණ්ඩනායකයා, රාජනීතිඥයා හා පොලිස් කපිතාන් ඇතුළු පිරිස අසුන් තිදෙනකු යොදන ලද රථ දෙකකින් පැමිණියේ උදේ හතරට පසු ව ය. මිතිය කපා බැලීම පිණිස දොස්තර, කරමසෝෆ් ගේ ගෙදර නතර විය. ඒ අතර ඔහු පැවල් ගේ රෝගය ගැන විශේෂ සැලකිල්ලක් දක්වූයේ ය.

"පැය විසිහතරක් තුළ දී විටින් විට කීප වරක් ම හැදෙන්නේ අමුතු වර්ගයක මීමැස්මොරයක්. මේක බොහො ම කලාතුරකින් දකින්නට ලැබෙන දෙයක්. මේ ගැන සොයා බැලීම වෛද්‍ය ශාස්ත්‍රයේ දියුණුවට හේතු වන්නට පුළුවනි" යි දොස්තර අමුතු උනන්දුවක් දක්වමින් මිත්‍රයන්ට කීවේ ය. ඔවුහු නික්මයන අතරේ අලුත් සොයාගැනීම ගැන සිනා-සෙමින් දොස්තරට ප්‍රශංසා කළහ. පැවල් රෑ එළිවන තෙක් ජීවත් නොවන බව දොස්තර කියනවා දණ්ඩනායකයාටත් රාජනීතිඥයාටත් හොඳට මතක තිබුණේ ය.

මේ දිග, එහෙත් මගේ කල්පනාවේ හැටියට අවශ්‍ය විස්තර-වලින් පසුව අපි අපේ කතාව නතර කළ තැනට ආයේත් යමු.

තුන් වන පරිච්ඡේදය

මිනිසකු විඳින දුක

පළමු වන පරීක්ෂණය

ත්‍රිමාට කුමක් කීවේ දැයි නොදත් මීතියා තමා අවට සිටි පිරිස දෙස භීතියෙන් බැලුවේ ය. හදිසියෙන් ම ඔහු නැඟිට දෑත උස්සා:

"මා වැරදිකාරයෙක් නො වෙයි. මා තාත්තා ගේ මරණයට වැරදිකාරයෙක් නො වෙයි.........මම හිටියේ තාත්තා මැරීමටයි. එහෙත් මම වැරදිකාරයෙක් නො වෙයි." කී ය.

මීතියා මෙසේ කියා අවසන් වීමටත් කලින් තිරය පිටිපස සිටි ගෲෂෙන්කා වහා එළියට පැමිණ පොලිස් කපිතාන් ගේ දෙපා ළඟ බිම වැටී "මේක මගේ වරද, මගේ නපුරු කමින් සිදුවූ වරදක්"යයි හදවත ශෝකයෙන් කකියවන හඬින් කීවා ය. ඇගේ දෑසින් කඳුළු ගලන්නට විය. ඈ නිලධාරීන් දෙස බලා "මීතියා මේක කළේ මා නිසයි. මම මීතියාට වද දී මේ අපරාධය කිරීමට පෙලඹෙව්වා, මම මැරිච්ච ඒ මහලු මිනිහාටත් වද දුන්නා. මීතියාට මේ විපත වුණේ මගේ නපුරු කමින්, මේක මගේ වරද."

"ඔව්, මේක උඹේ වරද, උඹ තමයි පළමු වන මිනීමරුවා, වේසාවි, තෝ තමයි අපරාධය කළේ" යි පොලිස් කපිතාන් ගෲෂෙන්කාට පහර දීමට සැරසෙමින් කීවේ ය. ඊට කලින් දණ්ඩනායකයා දෑතින් අල්ලා ඔහු නතර කෙළේ ය.

"මහත්මයා ගේ ක්‍රියා පටිපාටිය බොහො ම වැරැදියි. අපේ පරීක්ෂණයට කරන්නේ ලොකු බාධාවක්. මහත්මයා මේ විභාගය අවුල් කරනවා" යි දණ්ඩනායකයා පොලිස් කපිතාන්ට කීවේ අමාරුවෙන් හුස්ම ගනිමිනි.

"පුරුදු ක්‍රමයට මේ පරීක්ෂණය පවත්වන්න ඕනෑ. නැතිනම් මේ වැඬේ කොහොමටත් කරගන්න බැරි වෙනවා" යි රාජ-නීතිඥයා නොසන්සුන් වෙමින් කීවේ ය.

"අප දෙදෙනාට ම දඬුවම් කරන්න, අප දෙදෙනා ම එකට විනිශ්චය කරන්න. මම දූත් මිතියා සමඟ මැරෙන්න උණක් කැමැතියි." තවමත් බිම වැතිර සිටි ග්‍රෑසෙන්කා උමතු වූවකු මෙන් කෑගා කීවා ය.

"ග්‍රෑසෙන්කා මගේ නහර දිගේ ගලන ලේවලට සමානයි. මගේ ජීවිතයට සමාන" යි බිම වැටී ග්‍රෑසෙන්කා වැලැඳ ගෙන පැවැසූ මිතියා "මහත්වරුනි, ඈ කියන දෙස විශ්වාස කරන්න එපා, ඈ කිසි ම වරදක් කළේ නැහැ" යි අනතුරු ව තිලධර-යන්ට කීවේ ය.

මිනිසුන් කීප දෙනෙක් තමා අල්ලා ඇය ළඟින් ඉවත් කළ බවත්, ග්‍රෑසෙන්කා කාමරයෙන් එළියට ගෙන ගිය බවත්, සිහි ලැබෙන විට තමා මේසයක් ළඟ හිඳ සිටි බවත් මිතියාට පසු ව සඳහන් විය. පොලිස්කාරයෝ කීප දෙනෙක් ඔහු වට කර ගත්හ. මේසයේ අනෙක් පැත්තේ රාජ නීතිඥයා හිඳ සිටියේ ය. මේසය උඩ තිබෙන වතුර වීදුරුවෙන් වතුර උගුරක් බොන ලෙස ඔහු මිතියාට බල කර සිටියේ ය.

"වතුර ටිකක් බොන්න. ඇඟට සනීපයක් දැනේ වි. හිත ටිකක් සන්සුන් වේවි. භය වෙන්න එපා, කලබල වෙන්න එපා" යි ඔහු මහත් කරුණාවෙන් කී ය මේ තිලධරයා ඇඟිලි-වල පැළැඳ සිටි විශාල මුදු ගැන තමා ලොකු සැලැකිල්ලක් දැක්වූ බව පසු ව මිතියාට සඳහන් විය. එක මුදුවක දම්පාට ගලක් ද, අනිකෙහි විනිවිද පෙනෙන ඉතා දීප්තිමත් කහපාට ගලක් ද සවිකර තිබිණි. තමා ගෙන් නොයෙක් ප්‍රශ්න ඇසූ ඒ භයානක කාලය තුළ දී, තමා ගේ නෙත් මේ මුදු දෙසට ඇදී ගිය බව මිතියා පසු ව මහත් පුදුමයෙන් කීවේ ය, ඔහුට ඒ මුදු දෙසින් නෙත් සිත් ඉවත් කරගත නො හැකි විය. එ දින සවස තමා ගේ වම් පසින් මැක්සිමෝ හිඳ සිටි තැන දැන් නීතිඥයා හිඳ සිටියේ ය. දකුණු පස ග්‍රෑසෙන්කා හිඳ සිටි තැන, සම් සැට්ටයක් ඇඳගත් රෝසපාට කම්මුල්වලින් යුත් තරුණයෙක් හිඳ සිටියේ ය, ඔහු ඉදිරිපිට මේසය උඩ කඩදාසි හා තීන්ත සූදානම් කර තිබිණි. ඔහු රාජ නීතිඥයා ගේ ලියන්නා ය. නීතිඥයා මේ පරීක්ෂණය සඳහා තම ලියන්නා සමඟ පැමිණෙන්නට ඇත. කාමරයේ කෙළවර කවුළුව ළඟ කල්ගානෝ හිඳ සිටි තැන පොලිස් කපිතන් සිටගෙන සිටියේ ය.

"වතුර ටිකක් බොන්න" යි රාජ නීතිඥයා දහ වන වරට ද සෙමෙන් මිතියාට කී ය.

"මම වතුර බිව්වා.........දූත් ඉතිත් ඕනෑ දෙයක් අහන්න. මගේ දෛවය ගැන කැමැති තීරණයකට බහින්න" යි මිතියා රාජ නීතිඥයා දෙස තැති ගත්වන බැල්මෙන් බලා කී ය.

"එහෙනම් තාත්තා ගේ මරණයට වැරදිකාරයා නොවන බව සපිර ව කියා සිටිනවා ද?" යි රාජ නීතිඥයා සෙමෙන්, එහෙත් සපිර සවරයෙන් ඇසුවේ ය.

"ඔව්.........මම වෙනත් මහලු මිනිහකු ගේ මරණයට වැරදිකාරයෙක්, එහෙත් මගේ තාත්තා ගේ මරණයට වැරදිකාරයෙක් නො වෙයි. මම ඒ මහලු මිනිහා මැරුවා. ඒ ගැන මතක් වෙන කොට මට ඇඬෙනවා, එහෙත් මා වැරදිකාරයෙක් නොවන, භයානක මිනීමැරුමක් ගැන මට උත්තර දෙන්න බැහැ...... තමුන්නාන්සේලා මට විරුද්ධ ව නගන්නේ මිනිහකු ගේ සිහිය නැති කරවන තරම් බොහො ම භයානක චෝදනාවක්......... මගේ තාත්තා මැරුවේ කවු ද? මා මැරුවේ නැතිනම් වෙන කවු ද මැරුවේ? මේක මහ පුදුම දෙයක්, අපූරු දෙයක්, වෙන්න බැරි දෙයක්."

"ඒක ඇත්තයි. ඒත් කවුද තාත්තා මැරුවේ?" යි අසමින් රාජ නීතිඥයා මිතියාගෙන් කරුණු විමසන්නට විය. ඊට කලින් රාජ නීතිඥයා දෙස බැලූ දණ්ඩනායකයා අනතුරු ව මිතියාගෙන් මෙසේ විමසුවේ ය.

"ගිරිගෝරිස් ගැන කරදර වෙන්න එපා. මිනිහ මළේ නැහැ, ජීවත් ව ඉන්නවා. මහත්මයා කියනවා ගිරිගෝරිස් ගේ ඔළුවට මැරෙන්න පහරක් ගැසුවය කියා. ගිරිගෝරිසුත් කියනවා මහත්මයා ගැසුවය කියා. ඒත් දොස්තර මහත්මයා කියනවා ගිරිගෝරිස් මැරෙන්නේ නැහැ කියා."

"ගිරිගෝරිස් මළේ නැහැ? මළේ නැහැ?" යි මිතියා දෑත විදහා කී ය. ඒ සමඟ ඔහු ගේ මුහුණ ප්‍රීතියෙන් ආලෝක විය. "අහෝ දෙවියනි, පව්කාරයෙක් වූ මා වෙනුවෙන් ඔබවහන්සේ විසින් දක්වන ලද මේ ප්‍රාතිහාර්යය ගැන ඔබවහන්සේට සතුති වේ වා, එය ඔබතුමා විසින් මගේ යාච්ඤාවට දෙන ලද පිළිතුරක්. මම මුළු රෑ ම යාච්ඤා කළා." මෙසේ පැවැසූ මිතියා අනතුරු ව තුන් වරක් ම කුරුසය ඇන්දේ ය. ඔහු හුස්ම ගත්තේ අමාරුවෙනි.

"ගිරිගෝරිස් කියන මේ මිනිහගෙන් මහත්මයා ගැන බොහො ම වැදගත් කරුණු රාසියක් ම දැනගන්න ලැබුණා......" දණ්ඩනායකයා මෙසේ කියනවාත් සමඟ ම හදිසියෙන් මා හිඳ සිටි පුටුවෙන් නැගී සිටි මිතියා:

"මහත්වරුනි, මට මොහොතකට අවසර දෙන්න. ඈය ළඟට යන්න දෙසියත් ගේ නාමයට මට මොහොතකට ඉඩ දෙන්න" යි කී ය.

"බොහෝ ම කනගාටුයි, මේ වෙලාවේ ඉඩ දෙන්න බැහැ''යි මිතියා සමඟ එක්වර ම නැගී සිටි දණ්ඩනායකයා කෑගා කිවේ ය. එහි සිටි පොලිස් භටයන් වහා මිතියා අල්ලාගත් පසු ඔහු සිය කැමැත්තෙන් ම හිඳගත්තේ ය.

"මහත්වරුනි, ගෲෂෙන්කාට කතා කිරීමට නොලැබීම ගැන මට බොහෝ ම කනගාටුයි. මට උවමනා කළේ මිනිත්තුවකට පමණ ඇයට කතා කරලා ගිරිගෝරිස් නොමළ බවත්, මා මිනීමරුවකු නොවන බවත් කියන්නටයි. ඈ මා විවාහකර ගැනීමට සිටින තරුණිය යි" මිතියා අවට සිටි අය දෙස බලා ප්‍රීතියෙන් කී ය. "කොහොම වුණත් තමුන්නාන්සේලාට බොහෝ ම සතුතියි. මිනිත්තුවක් තුළ දී තමුන්නාන්සේලා මට අලුත් පණක් දුන්නා. අලුත් හදවතක් දුන්නා.........මහත්-වරුනි, කුඩා කල සිට මා හදා වඩා ගත්තේ මේ මහලු මනුෂ්‍යයායි. අවුරුදු තුනේ දී මා සෝදා පිරිසුදු කළේ මේ මනුෂ්‍යයා යි. තාත්තා කෙනකු වගේ මට සැලකුවා........"

"එහෙනම්............" යි කියමින් රාජ නීතිඥයා කතාකිරීමට පටන් ගත්තේ ය.

"මහත්වරුනි, මට තව මිනිත්තුවක් අවසර දෙන්න'' යි රාජනීතිඥයා ගේ කතාවට බාධා කල මිතියා වැලමිට මේසය උඩ තබමින් කී ය. "මට කල්පනා කරන්න ටිකක් ඉඩ දෙන්න. මට හුස්ම ගන්න ඉඩ දෙන්න. මේක මිනිහකු ගේ සිහිය අවුල් කරන භයානක දෙයක්. මහත්වරුනි, මිනිහා බෙරයක් නො වෙයි."

"තව වතුර ටිකක් බොන්න'' යි රාජනීතිඥයා ආයෙත් කී ය.

මිතියා මුහුණ වසාගෙන සිටි දෑත ඉවත ගෙන සිනාසුණේ ය. ආත්ම විශ්වාසයෙන් ඔහු ගේ නෙත් බැබැළිණි. මොහොතකින් ඔහු ගේ සවභාවය සම්පූර්ණයෙන් ම වෙනස් වූ බව පෙනේ. ඔහු ගේ ගත සිත සම්පූර්ණයෙන් ම වෙනස් විය. දවස් දෙක තුනකට කලින් කිසියම් උත්සවයක දී හමු වූ හිතවතුන් පිරිසක් අතරේ සිටින්නාක් මෙන් මිතියා නිලධාරීන් සමඟ සම

තත්ත්වයේ සිටියේ ය. ගමට පැමිණි අලුත දී පොලිස් කපිතාන් ඉතා ආදරයෙන් මිතියා පිළිගත් බවත්, එහෙත් වෙසෙසින් ම පසුගිය මාසයේ දී මිතියා පොලිස් කපිතාන් ගේ නිවෙසට නොගිය බවත්, මග දී හමු වූ විට කපිතාන් තමා දෙස රවා බලා අනතුරු ව චාරිත්‍රය රකිනු පිණිස හිස නමා ආචාර කරන බවත් මෙහි ලා සඳහන් කළ යුතු ය. දණ්ඩනායකයා සමඟ මිතියා වැඩි හිතවත් කමක් නොපැවැත්තුවේ ය. එහෙත් ඉඳ හිට ඔහු දණ්ඩනායකයා ගේ බිරිය හමුවීමට ගියේ ය. ඈ කලබලකාර හිතුවක්කාර ගැනියකි. එහෙත් ඇය හමුවීමට ගියේ කුමන කරුණක් නිසා දැයි මිතියා නොදත්තේ ය. ඉතා ආදරයෙන් මිතියා පිළිගත් මේ කාන්තාව කිසියම් හේතුවක් නිසා අන්තිම මොහොත වනතෙක් මිතියාට ලොකු සැලකිල්ලක් දැක්වූවා ය. දෙවරක් ම හමු වී, ගැනුන් ගැන කතා කොට ඇතත් මිතියාට තව ම රාජ නීතිඥයා අඳුනා ගැනීමට අවසථාවක් නො ලැබිණි.

"මහත්මයා බොහො ම දක්ෂ නීතිඥයෙක් බව පේනවා" යි මිතියා සිනාසෙමින් කී ය. "දැන් මට පුළුවනි මහත්මයාට උපකාර වෙන්න. මහත්වරුනි, දැන් මා අමුතු මිනිහෙක් බව මට දැනෙනවා. තමුන්නාන්සේලාට මේ විදියට කතා කිරීම ගැන මා එක්ක අමනාප වෙන්න එපා ඇත්ත කියනවා නම් මම ඔනෑවට වැඩිය බිව්වා. මගේ නෑයකු වන ඇලෙක්සැන්ඩර් මියුසෝව් ගේ ගෙදර දී මට මහත්මයා හමු වී තියෙනවා. මා තමුන්නාන්සේලාට සමාන තත්ත්වයක ඉන්න බව පෙන්වීමට වෑයම් කරනවා නො වෙයි. මහත්මයා ඉදිරිපිට දැන් මා හිඳ සිටන්නේ කුමන තත්ත්වයක ද කියා මම දන්නවා.........මා ඉතා භයානක මිනීමැරුමකට අහුවෙලයි ඉන්නේ. ගිරිගෝරිස් සාක්කි දුන්නා නම් බොහො ම භයානකයි. මට ඒක හොඳට තේරෙනවා. දැන් ඉතින් අපි අපේ රාජකාරියට බහිමු. මම ඕනෑ ම දෙයකට සූදානම්. අපි මේ කටයුත්ත මොහොතකින් අවසන් කරමු. මා අහිංසකයකු බව දන්න නිසා අපට මේ කටයුත්ත මිනිත්තුවෙන් අවසන් කරන්න පුළුවන් නේද?" මිතියා ඉතා ඉක්මනින් හා කලබලයෙන් ද කතා කළේ තමාට සවන් දී සිටින පිරිස හොඳ ම මිත්‍රයන් ලෙස සලකාගෙන ය.

"එහෙනම් තමාට විරුද්ධ ව තියෙන චෝදනාවට තමා වැරදිකාරයා නොවේයයි ප්‍රකාශ කළ හැටියට අපි දැනට ලියා ගන්නම්" යයි පැවැසූ රාජ නීතිඥයා අනතුරු ව ලියන්නා දෙසට හැරී ලියාගත යුතු දෑ සෙමෙන් කීවේ ය.

"ඒකට වරදක් නැහැ ලියා ගන්න. මා එවැනි ප්‍රකාශයක් කළ බව ලියා ගන්න ඕනෑ නේද? මම සම්පූර්ණ සහයෝගය දෙනවා. ඒත්.........ටිකක් ඉන්න......මේක ලියා ගන්න......... නොමනා හැසිරීම ගැන මා වැරදිකාරයෙක්. මහලු මිනිහකුට පහර දීම ගැන වැරදිකාරයෙක්. මගේ හදවතේ තියෙන එක්තරා දෙයක් ගැනත් මා වැරදිකාරයෙක්.........ඒ ටික ලියාගන්න උවමනා නැහැ. (මීතියා හදිසියෙන් ම ලියන්නා දෙසට හැරුණේ ය) ඒක මගේ පෞද්ගලික දෙයක්. ඒ ගැන කිසි ම කෙනෙක් කරදර වෙන්න එපා. ඒත් මගේ තාත්තා මැරුවාට මා වරද කාරයෙක් නො වෙයි. මේක මහ පුදුම වැඩක්......... .. මම ඒක ඔප්පු කරන්නම්. තමුන්නාන්සේලා ඒක එක පාරට ම පිළිගෙන මා ගැන අවිශ්වාස කිරීම ගැන සිනාසේවි........."

"මීතියා පියෝදර්විච් කරමසෝ ටිකක් සන්සුන් වෙන්න"යි රාජ නීතිඥයා කීවේ තමා ගේ සන්සුන් කමින් මීතියා ගේ සන්සුන්කම සත්සිඳවීමට මෙනි. "අසතුටක් නැති නම් මා කැමැතියි මේ පරීක්ෂණය පැවැත්වීමට කලින්, මහත්මයා පියා සමග නොකැමැත්තෙන් සිටිය බවත්, නිතර කෝලාහල කරගත්ත බවත් දන්වන ප්‍රකාශයක් මහත්මයාගෙන් ලබාගන්නට......දූන් පැය කාලකට කලින් කිව්වා නේද 'මම හිටියේ තාත්තා මරන්නටයි, ඒත් මම තාත්තා මැරුවේ නැහැ' කියා?"

"මම එහෙම දෙයක් කිව්ව ද?.........සමහරවිට එහෙම දෙයක් කියන්න ඇති. ඔව්, තාත්තා මරන්න මට කීප වරක් ම උවමනා කළා.........හිතේ වේගයෙන්........"

"තාත්තා මරන්න හැදුවා? තාත්තාට එ තරම් වෛර කළේ මොන කාරණාවක් නිසා ද කියා අපට කියන්න පුළුවන් ද?"

"මොනවද ඔය තරම් කියන්න තියෙන්නේ?"යි මීතියා බිම බලාගෙන ශෝකයෙන් කී ය. "මම කවදාවත් මගේ හැඟීම් සඟවා ගත්තේ නැහැ. මේ නගරයේ සිටින කවුරුත් ඒක හොඳට දන්නවා. තැබෑරුමේ සිටින අයත් දන්නවා. දූන් ටික දිනකට කලින් මම ඒ ගැන සොසිමා පියතුමා ළඟදීත් කිව්වා. එදා සවස මම තාත්තාට හොඳට ම ගැහැව්වා. තව ටිකින් මරනවා. ආපසු පැමිණ සාක්ෂිකාරයන් ඉදිරිපිට දී තාත්තා මරන බවට පොරොන්දු වුණා......එක සාක්ෂිකාරයෙක් නො වෙයි, සාක්ෂිකාරයන් දහක් ඉදිරිපිට දී කියන්න

ඇති. පසුගිය මාසය තිස්සේ ම නගරය පුරා ම කියමින් ඇවිද්ද. කවුරුත් ඒ ගැන දන්නවා.........එහෙත් කෙනකු තුළ ඇති වන හැඟීම් අමුතු දෙයක්. (රවා බලමින්) මගේ හැඟීම් ගැන ප්‍රශ්න කරන්න තමුන්නාන්සේලාට අයිතියක් තියෙන්න පුළුවනි. මම ඒක දන්නවා.......ඒත් මගේ හැඟීම් මට අයිති දෙයක්. මගේ පෞද්ගලික දෙයක්......කවදාක්වත් මම මගේ හැඟීම් සඟවාගත්තේ නැහැ. එළිපිට ම කිව්වා. තැබෑරුමේ දී හැම දෙනාට ම කිව්වා. ඒ ගැන මට විරුද්ධ ව බොහො ම සාක්ෂි තියෙන්න පුළුවනි. තාත්තා මරන බව මම හැම දෙනාට ම කිව්වා. එහෙත් දැන් හිටිහැටියේ ම තාත්තා මරලා. එහෙනම් තාත්තා මරන්න ඇත්තේ මා මිස වෙන කවුද? හා! හා! හා! මම තමුන්නාන්සේලාට දොස් කියන්නේ නැහැ. මේ කාරණාව මට හොඳට වැටහෙනවා. මා නැති නම් වෙන කවුද තාත්තා මරන්නේ? ඒක එහෙම නේ ද? මා නැති නම් තාත්තා මැරුවේ කවුද?"යි මිතියා හදිසියෙන් ම ඇසුවේ ය. "තාත්තා මරා දමා තියෙන්නේ කොතැන ද? මරා දමා තියෙන්නේ කොහොම ද? කියා මට කරුණා කරලා කියන්න. කොහොමහරි කියන ලෙස මම තමුන්නාන්සේලාට බලකර සිටිනවා"යි නීතිඥයන් දෙදෙනා දෙස බලමින් වහා කීවේ ය.

"තාත්තා නිදන කාමරයේ උඩුබැලි අතට බිම වැටී මැරී සිටියා. තාත්තා මරා තියෙන්නේ ඔළුවට ගහලයි" දණ්ඩ-නායකයා කීවේ ය.

"මේක මහ භයානක මිනීමැරුමක්"යයි මිතියා කී ය. ඔහු හිටිහැටියේ ම වෙවුලන්නට පටන් ගත්තේ ය. අනතුරු ව මේසයට හේත්තු වී දකුණු අතින් මුහුණ වසාගත්තේ ය.

"දැන් ඉතින් අපි අපේ කටයුත්ත කරගෙන යමු"යි රාජ නීතිඥයා කී ය. "තාත්තාට වෛර කළේ මොකද? මොන කාරණාවක් නිසා ද? තාත්තාට වෛර කළේ ඊරිසියාව නිසා බව ප්‍රසිද්ධියේ කිව්වා නේද?"

"ඔව් ඊරිසියාව නිසා තමයි. ඒ ඊරිසියාව පමණක් නො වෙයි."

"මුදල් ගැන ඇති වූ අමනාපයක් නිසා ද?"

"ඔව්, මුදල් ගැනත් අපි කෝලාහල කරගත්තා."

"රූබල් තුන්දහක් ගැන තාත්තා සමඟ කෝලාහල කර ගත්තා නේද? ඒ රූබල් තුන්දහ තමාට අයිති මුදලක කොටසක් බව කිව්වා නේද?"

"තුන්දහ නො වෙයි ඊට බොහෝ ම වැඩියි" මිතියා කලබල වෙමින් කී ය. "හය දහකට වැඩියි, සමහර විට දහ දහකට වැඩි වෙන්නත් පුළුවනි. මම ඒ ගැන හැමෝට ම කිව්වා. ඒත් ඒ ගනුදෙනුව තුන්දහකින් අවසන් කරන්න මම කැමැති වුණා. මට ඒ මුදල් බොහෝ ම උවමනා කරලා තිබුණා. තාත්තා ගෘෂෙන්කාට දීම පිණිස ලියුම් කවරයක දමා කොට්ටය යට තබාගෙන හිටිය රූබල් තුන් දහ මම සැලකුවේ මට අයිති මුදලක් හැටියටයි...... ඔව් මම ඒ මුදල සැලකුවේ මට අයිති මගේ ම දෙයක් හැටියටයි..."

දණ්ඩනායකයා රාජ නීතිඥයා දෙස අර්ථාන්විත බැල්මකින් බලා කිසිවකුට නො පෙනෙන්නට ඉඟියක් කෙළේ ය.

"අපි ඒ ගැන පසුව සොයා බලමු"යි රාජ නීතිඥයා එක්වර ම කී ය "දැන් ඉතින් අපි මේ මුදල් ගැන කතාව ලියා ගනිමු.

"ඔව් ඒ කතාව ලියා ගන්න. මා දන්නවා ඒක මට විරුද්ධ ව ඉදිරිපත් කරන්න පුළුවන් සාක්ෂියක් බව. මම කිසි ම දෙයකට භය නැහැ. මම කරන්නේ මට ම විරුද්ධ ව සාක්ෂි දීමක්. ඇහුණා නේද? මම මට ම විරුද්ධ ව සාක්ෂි ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේලා හිතනවා ඇති මා අමුතු ජාතියේ මිනිහෙක් ය කියා"යි මිතියා හදිසියෙන් ම ශෝකයෙන් කී ය. තමුන්නාන්සේලා කතා කරන්නේ බොහෝ ම අවංක කෙනෙකුට බව අමතක කරන්න එපා. ඒ අතර මම බොහෝ ම නපුරු කම් කරලා තියෙන කෙනෙක්. නපුරු කම් කළත් බොහෝ ම අවංකයි. කොටින් කියනවා නම්....... මේ කාරණාව කොහොම කියන්න ද කියා මට තේරෙන්නේ නැහැ......මා කීමට අදහස් කළේ මගේ මුළු ජීවිතය ම අඳුරු වුණේ අවංක මිනිහකු වීමට වෑයම් කරන නිසයි. හැම කටයුත්තක දී ම මම බොහෝ ම වෑයම් කළා අවංක වෙන්න. එහෙත් මොකද වුණේ? මමත් අනෙක් මිනිස්සු වගේ කැත දේවල් කරන්න පටන් ගත්තා. මම කැත වැඩ කළේ තනියෙන්. ඒක තමයි මම කරගත්ත වරද. ......මගේ හිස කකියනවා.......'' මිතියා ගේ නළල වේදනාවෙන් රැලි වැටිණි. "තාත්තා මා දිහා බලන බැල්ම මට පෙන්නන්න බැහැ. ඒ බැල්ම බොහෝ ම නීචයි. අලජ්ජයි, හැම සුද්ධවූ දෙයක් ම හෙළා දකින, අවඥ සහගත, කිසි ම ගරු සරු

කමක් නැති බොහො ම අප්‍රසන්න බැල්මක්. ඒ බැල්ම බොහො ම භයානකයි. දූත් ඉතින් තාත්තා මල නිසා මම ඒ විදියට කල්පනා කරන්නේ නැහැ. දූත් කල්පනා කරන්නේ අමුතු විදියකටයි.''

''අමුතු විදියකට කල්පනා කරනවා ය කියන්නේ මොකද?''

''අමුතු විදියකට කල්පනා කරනවා නො වෙයි. තාත්තාට මෙ තරම් වෛර කිරීම ගැන දූත් මම කනගාටු වෙනවා.''

''පසුතැවෙනවා ද?''

''නැහැ මම පසුතැවෙන්නේ නැහැ. මෙක ලියා ගන්න එපා. මා එ තරම් හොඳ මිනිහෙක් නො වෙයි. ලස්සණ මිනිහෙක් නො වෙයි. ඒ නිසා තාත්තා ගැන පිළිකුල් කරන්න මට යුතුකමක් නැහැ. අන්න ඒකයි මා අදහස් කෙළේ. උවමනා නම් ඒ කාරණාව ලියා ගන්න.''

අනතුරු ව මිතියා ශෝකාකුල විය. පරීක්‍ෂණය කරගෙන යන අතරේ කිසියම් කරුණක් නිසා ඔහු දුක්මුසු විය.

මේ මොහොතේ දී තවත් බලාපොරොත්තු නොවූ දෙයක් සිදුවිය. කාමරයෙන් ඉවත්කරන ලද ගෲසෙන්කා පරීක්‍ෂණය පැවැත්වෙන කාමරයට යාබද කාමරයට ගෙනයනු ලැබී ය. එය ඔවුන් මෙතෙක් වේලා කාබී ප්‍රීති වූ කාමරයට යාබද ව පිහිටි කවුළුවකින් යුත් කුඩා කාමරයකි. ගෲසෙන්කා මැක්සිමෝෆ් සමග තනියෙන් හිඳ සිටියා ය. තැති ගෙන සිටි මහල්ලා ගෲසෙන්කා ළඟින් හිඳ සිටියේ ඇගේ ආරක්‍ෂාව පතන්නාක් මෙනි. දොර ළඟ තබන ලද පුටුව උඩ ලෝහ පදක්කමක් පැලඳගත් ගැමියෙක් හිඳ සිටියේ ය. ගෲසෙන්කා ශෝකයෙන් හැඬුවා ය. ඒ ශෝකය ඉවසා ගත නො හැකි වූ තැන ඈ හදිසියෙන් ම උඩ පැන දූත වනමින් විලාප නගා මිතියා ළඟට දිව ගියා ය. මෙය කො තරම් බලාපොරොත්තු රහිත ව සිදු වූයේ ද කියතොත් කිසිවකුට ඇය නතර කළ නො හැකි විය. ඇගේ විලාපය ඇසූ මිතියා ගේ සර්වාංගය ම වෙවුලන්නට විය. උඩ පැන මහ හඩින් කෑගැසූ මිතියා සිත්පිත් නැත්තකු මෙන් ගෲසෙන්කා ළඟට දිව ගියේ ය. ඔවුහු එකිනෙකා දුටහ. එහෙත් කතා කළ නො හැකි විය. ඔවුහු වහා මිතියා දූඩි ව අල්ලා ගත්හ. එහෙත් ඒ ග්‍රහණයෙන් මිදීමට මිතියා වෑයම් කෙළේ ය. ඔහු හසුරුවා ගැනීමට

මිනිස්සු තුන් හතර දෙනෙක් අවශ්‍ය වූ හ. ගෲසෙන්කා ද අල්ලා නතර කරන ලදි. කාමරයෙන් ඉවතට ඇද ගෙන යන ඇය තමා දෙසට අත දිගු කළ බව මීතියා දුටුවේ ය. මේ කලබලය අවසන් වූ පසු තමා ආයේත් රාජනීතිඥයා ඉදිරිපිට, මේසය අනෙක් පැත්තේ හිද සිටින බවත්, තිලධාරීන්ට බැණ වදින බවත් දුටුවේ ය.

"මොකද නුඹලා ඇය නතර කරගෙන ඉන්නේ? මොකද ඇයට හිරිහැර කරන්නේ? ඈ කිසි ම වරදක් කරල නැහැ."

දණ්ඩනායකයාත් රාජනීතිඥයාත් එකතු වී මීතියා සන්සුන් කිරීමට මිනිත්තු දහයක් පමණ වේලා වෑයම් කළහ. මෙතෙක් වේලා කාමරයෙන් පිට වී සිටි පොලිස් කපිතන් වහා කාමරයට පැමිණ මහත් කලබලයෙන් මෙහේ කීය.

"ඇය පහල තියෙන කාමරයට ගෙන ගියා. තමුන්නාන් සේලා ඉදිරිපිට මේ අවාසනාවන්ත මිනිහාට කතා කරන්න මට ඉඩ දෙනවා ද්"

"අපේ කිසි ම විරුද්ධයක් නැහැ"යි රාජ නීතිඥයා කීය.

"මිත්‍රයා, දැන් මා කියන දෙය හොඳට අහගන්න"යි පොලිස් කපිතන් මීතියා අමතමින් කීවේ ය. ඔහු ගේ කලබල වූ පෙනුමෙන් යුත් මුහුණේ පියකු දරුවකුට දක්වන ආදරයක් හා කරුණාවක් දකින්නට තිබිණි." මම නුඹේ ගෲසෙන්කා පහල තියෙන කාමරයට ගෙන ගිහින් හෝටලේ අයිතිකාරයා ගේ දූලාට භාර දුන්නා. අර නාකි මිනිහා මැක්සිමෝන් ඇය ළඟ ම ඉන්නවා. මම ඇයට සිත සනසා කතා කළා. ඇහුණා නේද? මම ඇගේ සිත සන්සුන් කළා. නුඹ මේ චෝදනාවෙන් නිදහස් වියයුතු නිසා නුඹට කරදර නොකල යුතු බව, බාධා නොකල යුතු බව ඇයට කිව්වා. කලබල කළොත්, බාධා කළොත් සිත අවුල් වෙලා නොවුවමනා දේවල් කියන්න පුළුවනි ය කියා මම ඇයට කිව්වා......ඇහුණා නේද? මම කියාපු දෙය ඇයට හොඳට තේරුණා. ඈ බොහො ම හොඳ තරුණියක්. නුඹට පිහිට වෙන්න ය කියා ඈ මගේ අත සිඹින්න හැදුවා. ඈ මට කිව්වා ඇය ගැන කරදර වෙන්න එපා ය කියා නුඹට කියන්න ය කියා. මිත්‍රයා මම ආපසු ගිහින් ඇයට කියන්න ඕනෑ නුඹ ඇය ගැන කරදර නො වී සන්සුන් ව සිටින බව. දැන් ඉතින් කලබලවෙන්න එපා.

මම ඇයට නුඹ ගැන වගකිවයුතු බව තේරුම් ගන්න. ඔව්, මහත්වරුනි, ඇය බොහො ම යහපත් අහිංසක ස්ත්‍රියක්. ඉතින් යෑළුවා මම මොනවද ඇයට ගිහින් කියන්නේ? කලබල නො කර සිටනව ද නැද්ද?''

පොලිස් කපිතාන් තැනට තුසුදුසු දෑ කී ය. ගෘසෙන්කා විඳින දුක දකා ඔහු ගේ හදවත උණු විය. දෑස කඳුළින් පිරුණේ ය. මිතියා වහා නැගිට පොලිස් කපිතාන් ළඟට ගියේ ය.

''මහත්වරුනි, මට සමා වන්න, මට සමා වන්න''යි ඔහු කී ය. ''මහත්මයාට තියෙන්නේ සාන්තුවරයකු ගේ හදවතට සමාන හදවතක්. මහත්මයා සාන්තුවරයකු වගෙයි. මම ඇය වෙනුවෙන් මහත්යාට සතුති කරනවා. මම කිසි ම කලබලයක් නො කර සන්තෝෂයෙන් ඉන්නම්. මහත්මයා වැනි හිතවතෙක් ඉන්න කොට සන්තෝෂයෙන් ඉන්න බැරි මන්ද? තව ටිකකින් මම මේ කලබලයෙන් නිදහස් වී ඇය ළඟට යනවා. ඇයට පෙනේවි මම අහිංසක බව. ඈ ඒ කාමරයේ සිටිය දෙන්. දැන් ඉතින් මම තමුන්නාන්සේලාට මා දන්නා හැම දෙයක් ම කියන්නම්. තව ටිකකින් අපට මේ පරීක්ෂණය අවසන් කරන්න පුළුවනි.'' අනතුරු ව මිතියා රාජ නීතිඥයා හා දණ්ඩනායකයා දෙසට හැරී මෙසේ කී ය. ''අපි මේ පරීක්ෂණය කාගේත් හොඳ හිත ඇති ව අවසන් කරමු. මේ තරම අවසන් වූ පසු අපට හොඳට හිනා වෙන්න පුළුවනි. එහෙම නේ ද? එහෙත් මහත්වරුනි, ගෘසෙන්කා මගේ හදවතේ රජ කරන රැජිනයයි. එහෙම කියන්න තමුන්නාන්සේලා මට කරුණා කරලා අවසර දෙන්න ඕනෑ. මා එහෙම කියන්නේ තමුන්නාන්සේලා අවංක මහත්වරුන් නිසයි. මගේ ජීවිතයට තියෙන එක ම ආලෝකය ඇයයි. මම උතුම් කොට සලකන්නේ ඇය පමණයි. 'මම මිතියා සමඟ පෝරකයට උණත් යනවා'ය කියා ගෘසෙන්කා කියනවා තමුන්නාන්සේලාට ඇහුණා නේ ද? තඹයක්වත් නැති හිඟන්නෙක් වූ මම ඇයට කිසි ම දෙයක් දීලා නැහැ, ඈ මට මෙ තරම් ආදරයක් දක්වන්නේ මොක ද? මා වැනි ලජ්ජා භය නැති අවලක්ෂණ මෑගයෙක් එ තරම් ආදරයක් ලැබීමට තරම් සුදුසු-සෙක් ද? බොහො ම උඩගු සිතක් ඇති, එහෙත් අහිංසක තරුණියක් වන ඈ දැන් මොහොතකට කලින් මා වෙනුවෙන් මහත්මයා ගේ දෙපා ළඟ බිම වැටී යාච්ඤා කළා නේ ද? ඉතින් දැන් කලා වගේ මම කොහොම ද ඇය ළඟට නො ගිහින් ඉන්නේ? මට සමා වන්න, දැන් මගේ හිතේ කිසි ම කලබලයක් නැහැ. මගේ හිත බොහො ම සන්සුන්.''

පුටුවේ හිඳගත් මීතියා දෑතින් මුහුණ වසාගෙන අඬන්නට පටන් ගත්තේ සිතේ හටගත් දැඩි සොම්නස නිසා ය. යළි ඔහු සන්සුන් විය. මහලු පොලිස් කපිතන් ඇතුළු නිලධාරි පිරිස සතුටු වූ බව පෙනේ. පරීක්ෂණය අලුත් මුහුණුවරක් ගත් බව පෙනී ගියේ ය. පොලිස් කපිතන් නික්ම ගිය පසු මීතියා නිසැකයෙන් ම සොම්නසට පත් විය.

''දැන් ඉතින් මහත්වරුනි, මා ඕනෑ ම දෙයකට සූදානම්. මේ සුළු දේවල් නිසා නොවේ නම් අපට මේ පරීක්ෂණය බොහොම ඉක්මනට ඉවර කරන්න තිබුණා. කොහෙම වුණත් අප අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් තියෙන්න ඕනෑ. මම තමුන්නාන්සේලා විශ්වාස කරන්න ඕනෑ. නැති නම් අපට කවදාක්වත් මේ වැඩේ ඉවරයක් කරන්න ලැබෙන්නේ නැහැ. මා මේ කාරණාව ගැන මතක් කළේ තමුන්නාන්සේලා ගේ යහපතටයි. දැන් ඉතින් අපි පරීක්ෂණය පටන් ගනිමු. එහෙත් නොවැදගත් ප්‍රශ්න අසමින් මට හිරිහැර කරන්න එපා. උවමනා දේවල් ගැන පමණක් අහන්න. මම තමුන්නාන්සේලා ගේ සිත් සතුටු වන විදියට පිළිතුරු දෙන්නම්. නොවැදගත් විස්තර යකාට ගිය දෙන්.''

පරීක්ෂණය ආයේත් ආරම්භ විය.

හතර වන පරිච්ඡේදය

දෙවන පරීක්ෂණය

''අප අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමට කැමැති වීමෙන් අප තුළ කො තරම් ලොකු ධෛර්යයක් ඇති කළා ද කියා මහත්මයා දන්නේ නැහැ'' යි රාජ නීතිඥයා මහත් උනන්දුවෙන් කී ය. දැන් ටිකකට කලින් උපැස් ඉවත් කරන ලද ඔහු ගේ දුර නොදක්නා දුඹුරු පැහැති දෑස තෘප්තියෙන් බැබළිණි. ''අප අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් තියෙන්න ඕනෑ ය කියන මහත්මයා ගේ අදහස සම්පූර්ණ ඇත්ත. එ වැනි විශ්වාසයක් නැති ව මෙ වැනි වැදගත් පරීක්ෂණයක් පවත්වන්න බැහැ. එ වැනි විශ්වාසයක් ඇති කරගන්න පුළුවන් චෝදනාවෙන් නිදහස් වීමට සැකකරු තුළ කැමැත්තක් තිබුණොත් පමණයි අපි මහත්මයාට පුළුවන් උපකාරයක් කරන්නම්. අපි මේ පරීක්ෂණය කො තරම් හොඳට පවත්වනවා ද කියා මහත්මයාට බලාගන්න

පුළුවනි............" මෙසේ පැවැසූ රාජ නීතිඥයා අනතුරු ව දණ්ඩනායකයා දෙසට හැරී "මහත්මයා මා කියන දෙයට එකඟ වෙනවා නේද?"යි විමසුවේ ය.

"ඔව් ඔව්, මම ඒ අදහසට එකඟ වෙනවා"යි දණ්ඩනායකයා පැවැසුවේ ය. රාජ නීතිඥයා ගේ උනන්දුවට සම කරනවිට දණ්ඩනායකයා ගේ කතාව උදාසීන ය.

මෑත දී අපේ නගරයේ පදිංචි වූ රාජ නීතිඥයා මුල සිට ම දණ්ඩනායකයාට මහත් ගෞරවයක් දැක්වූ බවත්, ඔහු ඉතා කිට්ටුවෙන් ඇසුරු කරන බවත් මෙහිලා සඳහන් කළ යුතු ය. දණ්ඩනායකයා තුළ ඇත්තා වූ මානව විද්‍යාව ගැන පැවැති දැනුම හා දක්ෂ කපිකත්වයත් ගැන අචල විශ්වාසයක් දැක්වූයේ රාජ නීතිඥයා පමණි. සේවයෙන් ජ්‍යෙෂ්ඨ නිලධරයෝ දණ්ඩනායකයා ගේ මේ සමත්කම් පහත් කොට සැලකූ හ. තමාට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ගෙන් ලැබෙන අයුතු සැලැකිල්ල ගැන දණ්ඩනායකයා දැන සිටියේ ය. රාජ නීතිඥයා දණ්ඩනායකයා ගේ සමත් කම් ගැන පීටර්ස්බර්ග් පුරයේ දී ද අසා තිබිණි. අනෙක් අතින් 'අයුතු ලෙස සලකන ලද' අපේ දණ්ඩනායකයා මෙලොව සිටින අය අතරින් අවංකව කැමැත්තක් දැක්වූයේ අපේ තරුණ රාජ නීතිඥයාට පමණි. මිතියා සොයා මුක්රෝවට යන අතරේ මේ පරීක්ෂණය පැවැත්විය යුතු සැටි ගැන ඔවුහු තීරණයට පැමිණියහ. එ හෙයින් මේසය ඉදිරිපිට හිඳ සිටින දණ්ඩනායකයා ගේ මුහුණේ ඇති බැල්මෙන්, මුවෙන් පිටවන වචනයෙන් හා ඉඟියෙන්, තරුණය නීතිඥයා අදහස තේරුම් ගත්තේ ය.

"මගේ කතාව කීමට තමුන්නාන්සේලා මට අවසර දෙන්න ඕනෑ. හැබැයි නොවැදගත් ප්‍රශ්න අසා මට බාධා කරන්න එපා. තව මොහොතකින් මුළු කතාව ම කියන්නම්"යයි මිතියා කලබල වෙමින් කී ය.

"බොහො ම හොඳයි. මහත්මයාට බොහො ම සතුතියි. නමුත් මහත්මයා ගේ කතාවට ඇහුම් කන් දීමට කලින් මහත්මයාගෙන් ඉතා සුළු, එහෙත් බොහො ම වැදගත් ප්‍රශ්නයක් අහන්න අවසර දෙනව ද? මෙන්න මේකයි ප්‍රශ්නය. මහත්මයා ගේ පිස්තෝල දෙක හොඳ මිත්‍රයකු වන පියෝතර් පර්හෝටින් ළඟ උගස් තබා රුබල් දහයක් ගත්තා නේ ද?"

"ඔව්, ඒක ඇත්තයි. වෙන මොනව ද දැනගන්න ඕනේ? පිස්තෝල උගස් තැබුවේ නගරයට ආපු හැටියේ මයි."

"එසේනම් මහත්මයා නගරයෙන් බැහැර ද සිටියේ?"

"ඔව්, මම හැතැම්ම තිහක් පමණ නගරයෙන් ඈත ගොස් සිටියා. ඇයි ඒ බව දත්තේ නැද්ද?"

නිලධාරීහු දෙදෙනා එකිනෙකා දෙස බැලූ හ.

"ඊයේ උදේ ඉඳලා ආගිය තැන් ඇති ව, ඇයි කතාව පිළිවෙලක් ඇති ව නොකියන්නේ? නගරයෙන් පිට ගියේ මොනවට ද? කොයි වෙලාවේද ගියේ? කොයි වෙලාවේ ද ආවේ? මේ කරුණු අපට විස්තර කරලා දෙන්න පුළුවන් ද?"

"මේ ගැන මුල ඉඳලා මගෙන් අහන්න එපා යැ" මීතියා හඬනඟා සිනා සෙමින් කී ය. "මම මගේ කතාව ඊයේ උදේ ඉඳලා නො ව, පෙරේදා උදේ ඉඳලා පටන් ගත්තනම්. එතකොට තේරුම් ගන්න පුළුවන් නේ ද? මම පෙරේදා උදේ සම්සෝනෝව් වෙළෙඳා ළඟට ගියා ඇපයක් පිට රුබල් තුන්දහක් ඉල්ලා ගන්න. මට බොහො ම හදිසි කටයුත්තකට මුදල් උවමනා කරලා තිබුණා."

"මහත්මයාට බාධා කිරීම ගැන බොහො ම කනගාටුයි" දණ්ඩනායකයා කරුණාවෙන් කී ය. "මෙ තරම් විශාල මුදලක්, ඒ කියන්නේ රුබල් තුන් දහක්, මෙ තරම් හදිසියෙන් උවමනා කළේ මොනවට ද?"

"මන් ද? ඇයි ද? කවදා ද? ආදී ප්‍රශ්නවලින් මට කරදර කරන්න එපා. මට මෙ තරම් ලොකු මුදලක් උවමනා කළේ මොනවට ද? මේවා නොවැදගත් ප්‍රශ්න. මේවා ලියන්න පොත් තුනකුත් මදිවේවි."

මීතියා මෙසේ කීවේ ඇත්ත කීමට පුලපුලා සිටින, යහපත් අදහස් ඇති ඉවසිලිවන්ත මිනිසකු මෙනි.

"මහත්වරුනි, සහයෝගය නොදැක්වීම ගැන මා එක්ක අමනාප වෙන්න එපා"යි මීතියා හදිසියෙන් ම සිතිවිලි එක්තැන් කරගනිමින් කීවේ ය. තමුන්නාන්සේලා කෙරෙහි මගේ ලොකු ගෞරවයක් තියෙනවා. මේ අවස්ථාව ගැන මගේ හොඳ අවබෝධයකුත් තියෙනවා. මා වෙරිවෙච්ච මිනිහෙක් ය කියා හිතන්න එපා. මා දැන් ඉන්නේ හොඳ සිහියෙන්. මා වෙරි වුණත් වැඩි වෙනසක් පෙනෙන්නේ නැහැ. අර කතාවක් තියෙනවා නේ ද 'හොඳට ඉන්න කොට මෝඩයා ය, වෙරි

වුණා ම තුවණක්කාරයා ය' කියා. මාත් අන්න ඒ වගේ මිනිහෙක්. හා! හා! කොහොම වුණත් මේ වෙලාවේ තමුන්නාන්සේලා එක්ක කවටකම් කරන එක හොඳ නැහැ, ඒ කියන්නේ අප අතර අන්‍යෝන්‍ය සම්බන්ධයක් ඇති වීමට කලින් කවට කම් කරන එක සුදුසු නැහැ. මගේ ආත්මගරුත්වය ආරක්‍ෂා කර ගන්න මට ඉඩ දෙන්න. අප අතර තියෙන වෙනස මෙන්න මේකයි. මට හොඳට පේනවා. ඒත් තමුන්නාන්සේලාට පේන්නේ මා අපරාධකාරයකු හැටියටයි. ඉතින් තමුන්නාන්සේලා එක්ක මට සම තත්ත්වයක ඉන්න පුළුවන් කමක් නැහැ. මා ගැන පරීක්‍ෂාවෙන් සිටීම තමුන්නාන්සේලාට අයත් යුතු කමක්. මා ගිරිගෝරිස්ට කළ අපරාධය ගැන කල්පනා කරලා බලන කොට තමුන්නාන්සේලාට පුළුවන් කමක් නැහැ මගේ පිටට තට්ටු කරලා නිකම් ඉන්න. මිනිහකුට පුළුවන් කමක් නැහැ නාකි මිනිහකු ගේ ඔළුව පලලා නිදහස් වෙන්න. එහෙම පුළුවන් කමක් නැහැ නේද? මා හිතනවා තමුන්නාන්සේලා මට විරුද්ධ ව නඩු දමා මා හය මාසයකට හරි, අවුරුද්දකට හරි, හිරේ යවාවි ය කියා. මා දන්නේ නැහැ එවැනි අපරාධයකට දෙන දඬුවම මොකක් ද කියා. සිවිල් අයිතිවාසිකම් නැතිවන එකක් නැහැ නේද?''යි මීතියා දණ්ඩනායකයා දෙස බලා විමසුවේ ය. “මා හිතන්නේ සිවිල් අයිතිවාසිකම් නැතිවන එකක් නැහැ. මා දන්නවා දූත් අප අතර තියෙන වෙනස. ඒත්, තුඹ කොහෙ ද ගියේ? කොහොම ද ගියේ? කවද්ද ගියේ? මොකේ ද ගියේ? ආදී ප්‍රශ්න අහන්න ගියොත් දෙයියන් ගේ සිහිය වුණත් අවුල් කරන්න පුළුවන් බව තමුන්නාන්සේ පිළිගන්න ඕනෑ. ඉතින් මේ විදියට ප්‍රශ්න අහන්න ගියොත් මගේ සිහිය අවුල් වෙලා මා කියන හැම දෙයක් ම ලියාගෙන මට විරුද්ධ ව සාක්ෂි හැටියට ඉදිරිපත් කරන්න පුළුවනි. ඉතින් මේ වැඩෙන් තියෙන ප්‍රයෝජනය මොකක් ද? කිසි ම ප්‍රයෝජනයක් නැහැ. දූත් මා කියන දෙය බොරුවක් වුණත්, කරුණා කරලා කියා අවසන් කරන්න මට ඉඩ දෙන්න. තමුන්නාන්සේලා විශ්වවිද්‍යාලයවලින් උසස් අධ්‍යාපනයක් ලබාපු අවංක මහත්වරුන් නිසා මට සමා වෙන්න ඕනෑ. තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරන්න මට කරුණා කරලා අවසර දෙන්න. මේ පරීක්‍ෂණය සාමාන්‍ය පරීක්‍ෂණ පවත්වන ක්‍රමයට පවත්වන්න එපා. ඒ කියන්නේ, මා නැගිට්ටේ කොහොම ද? උදේ කෑවේ මොනවා ද? කෙළ ගැසුවේ කොතනට ද? ආදී නොවැදගත් ප්‍රශ්න අහලා, සිරකරුවා ගේ සිහිය අවුල් කරලා, හිටි හැටියේ ම අහනවා ‘තුඹ මැරුවේ'

කවු ද? හොරකම් කළේ මොනවා ද? කියා. හා! හා! හා! ඒක නේද තමුන්නාන්සේලා සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රමය? ඒ ක්‍රමය දූත් නීතියක් කරගෙන. තමුන්නාන්සේලාගේ දක්ෂකම් රැඳී තියෙන්නේ මේ ක්‍රමය උඩයි. ඔය ක්‍රමයෙන් රවටන්න පුළුවන් නූගත් ගැමියන් පමණයි. මා රවටන්න බැහැ. මම ඔය ලූණු කාල තියෙනවා. මා යුද්ධ හමුදාවේ සේවය කළ මිනිහෙක්. හා! හා! හා! මා එක්ක අමනාප නැහැ නේ ද? මගේ නොහික්මුණුකම ගැන මට සමා වෙනවා නේ දැ"යි මිතියා කා තුළත් පුදුමය ඇතිකරවන තරම් යටහත් පහත් බව පෙන්නමින් ඇසුවේ ය. "මේ විදියට කතා කරන්න පුළුවන් මිතියා කරමසෝව්ට පමණයි. මේ විදියට කතා කරන ඥානවන්ත මිනිහකුට සමාව නුදුන්නොත් මිතියා කරමසෝව් දෙන්න පුළුවනි. හා! හා! හා!"

මිතියාගේ කතාව අසා සිටි රාජ නීතිඥයා සිනාසුණේ ය. එහෙත් දණ්ඩනායකයා සිනාසුණේ නැත. ඔහු මිතියාගේ නෙත් දෙස ඇස පිය නොසොල්වා බලා සිටියේ මිතියා කී හැම වචනයක් ම, හැම ඉරියව්වක් ම, මුහුණේ ඇඳීගිය හැම හැඟීමක් ම, දකගැනීමේ අදහසිනි.

"උදේ නැගිට්ටේ කොහොම ද? උදේ කෑවේ මොනවා ද? මේ වාගේ ප්‍රශ්න අහලා මහත්මයාගේ මොළය අවුල් කරන්න අපි අදහස් කළේ නැහැ"යි රාජ නීතිඥයා තවමත් සිනාසෙමින් කිවේ ය. "අපි පරීක්ෂණය පටන්ගත්තේ බොහො ම වැදගත් ප්‍රශ්න අහලයි."

"මම ඒක දන්නවා. ඒක පිළිගන්නවා. උසස් කොට සලකනවා. මෙ තැන එකතු වී ඉන්න අප තුන්දෙනා උසස් අධ්‍යාපනයක් හා ශික්ෂණයක් ලබාපු උසස් ජන්මයෙන් හා ගෞරවයෙන් එකට බැඳුණු අය වගේ එකිනෙකා විශ්වාස කරමු. මගේ අවංකකම සැක කරන මේ මොහොතේ දී, මගේ මිත්‍රයන්ට සලකනවා වගේ තමුන්නාන්සේලාට සැලකීමට මට ඉඩ දෙන්න. ඒක තමුන්නාන්සේලාට මා කරන වරදක් ද?"

"නැහැ නැහැ, මහත්මයා මේ කාරණය බොහො ම හොඳට පැහැදිලි කර දුන්නා"යි රාජ නීතිඥයා උදාර බවක් හඟවමින් පැවසී ය.

"එහෙනම් අපි මේ නොවැදගත් කරුණු අත්හැර දමමු. නැතිනම් මේ පරීක්ෂණය කොතැනින් කෙළවර වෙයි ද දන්නේ නැහැ"යි මිතියා උනන්දු වෙමින් කීවේ ය.

"මහත්මයා ගේ ගුණ දන්න මුතු කම් අපි හොඳට පිළිපදින්නම්"යයි දණ්ඩනායකයා හදිසියෙන් ම මිතියා අමතා කීවේ ය. නමුත් මගේ ප්‍රශ්නයට පිළිතුරක් දියයුතුය කියා බලකිරීමට මට සිද්ධ වෙනවා. මහත්මයාට විශාල මුදලක්........ හරියටම රූබල් තුන් දහක් හදිසියෙන් ම උවමනා වුණේ මොනවට ද? කියා දැනගැනීම මට බොහො ම වැදගත්."

"මුදල් වලින් කරන්න බොහො ම වැඩ තිබුණා. ණයක් ගෙවන්න තිබුණා."

"කාගෙන් ගත්ත ණයක් ද?"

"ඒ ප්‍රශ්නයට මම පිළිතුරු දෙන්නේ නැහැ. පිළිතුරු නො දෙන්නේ පිළිතුරු දීමට බැරි නිසා නො වෙයි. භය නිසා නො වෙයි. මේ ප්‍රශ්නයේ කිසි ම වැදගත්කමක් නැහැ. ඇත්ත වශයෙන් එය බොහො ම සුළු නොවැදගත් දෙයක්. ප්‍රශ්නයට පිළිතුරු නොදෙන්නේ ප්‍රතිපත්තියක් උඩයි. ඒක මගේ පෞද්ගලික දෙයක්. මගේ පෞද්ගලික ජීවිතයට ඇඟිලි ගැසීමට මම කිසි ම කෙනකුට ඉඩ දෙන්නේ නැහ. ඒක මගේ ප්‍රතිපත්තියයි. මහත්මයා ඇසූ ප්‍රශ්නය මේ අපරාධයත් සමග කිසි ම සම්බන්ධයක් නැහැ. මේ අපරාධයට සම්බන්ධ නොවූ හැම දෙයක් ම මගේ පෞද්ගලික ජීවිතයට අයිතියි. මට උවමනා කර තිබුණා ණයක් ගෙවන්න ඒක මගේ ආත්මගරුත්වය ආරක්‍ෂා කරගැනීමට තිබුණු ණයක්. ණය ගෙවන්න තිබුණේ කාට ද කියා මම කියන්නේ නැහැ."

"මේ කාරණාව ලියා ගන්නාට වරදක් නැද්ද?"යි දණ්ඩ නායකයා විමසුවේ ය.

"කිසි ම වරදක් නැහැ. මම පිළිතුරු දෙන්නේ නැහැ කියා ලියා ගන්න. ඇයි තමුන්නාන්සේලාට කරන්න දෙයක් තියෙන්න එපායැ."

"මහත්මයාට අවවාදයක් දෙන්න ඕනෑ"යි දණ්ඩනායකයා දැඩි සවරයෙන් කි ය. "අප අසන ප්‍රශ්නවලට පිළිතුරු නො දී සිටීමට මහත්මයාට සම්පූර්ණ අයිතියක් තියෙනවා. පිළිතුරු දෙන්න කැමැති නැති නම් බලයෙන් පිළිතුරු ගැනීමට අපට කිසි ම අයිතියක් නැහැ. ප්‍රශ්නවලට පිළිතුරුදීම හෝ නොදීම මහත්මයාට අයිති වැඩක්. මෙ වැනි පරීක්‍ෂණවල දී

පිළිතුරු දීමට විරුද්ධ වීම තමා තමාට ම කරගත්තා ලොකු වරදක් බව පෙන්නා දීම අපේ යුතුකමක්. දූත් ඉතින් මහත්මයා ගේ කතාව කියන්න."

"මහත්වරුනි, මම තමුන්නාන්සේලා එක්ක තරහ නැහැ"යි දණ්ඩනායකයා ගේ තරවටුවෙන් පසු මිතියා මදක් සෙමෙන් කීවේ ය. "ඉතින් මම සම්සෝනෝ වෙලෙන්ද ළගට........."

පාඨකයා දන්නා, මිතියා කළ විස්තරය මම මෙහි ලා නො පවසමි. මුළු සිද්ධියම සවිස්තර ව පවසා හැකි තුරම් ඉක්මනින් පරීක්ෂණය අවසන් කිරීමට මිතියාට අවශ්‍ය වී තිබිණි. මිතියාට ලොකු බාධාවක් වුණේ කතාව කියන අතරේ එය ලියාගත් හෙයිනි. මේ බාධාව ගැන ඔහු විරුද්ධ විය. එහෙත් පසු ව කීකරු විය. ඔහු නොසන්සුන් විය. එහෙත් කෝප නො වී ය. "අනේ දෙයියනේ මේ කරදරය නිසා සුරදූතයන් පවා අඩන්න පුළුවනි." නැතිනම් "මා කුපිත කිරීමෙන් කිසි ම ප්‍රයෝජනයක් නොවන බව දන්නේ නැද්ද?"යි නො කියා සිටීමට ඔහුට නුපුළුවන් විය. එහෙත් මෙසේ කියන අතරේ පුපුරුදු සිනාව රැක ගත්තේ ය. මීට දෙ දිනකට කලින් සම්-සෝනෝ තමා මුලා කළ සැටි මිතියා විස්තර කෙළේ ය. (සම්සෝනෝ තමා මුලා කළබවට ඔහුට කිසි ම සැකයක් නැත) ඒ ගමන යාම පිණිස මිතියා ඔරලෝසුව රූබල් හයකට විකුණූ බව දැනගැනීම නීතිඥයන්ට අමුතු දෙයක් විය. ඔවුහු ඒ ගැන මීට කලින් නො දැන සිටියහ. මේ ආරංචියෙන් උනන්දු වූ ඔවුහු මිතියා ගේ බලවත් පිළිකුලට හා කෝපයට, ඔහු ළඟ මුදල් නොතිබුණ බව සනාථ කිරීම පිණිස, එය සවිස්තර ව ලියාගත යුතු යැයි කීහ. කතාව කියන අතරේ මිතියා ගේ උනන්දුව ද ටිකින් ටික අඩු විය. ලියවෙලෙද හමුවීමට ගිය සැටිත්, දුම්හ් පිරි පැලේ රාත්‍රිය ගත කළ සැටිත්, අනතුරු ව නගරයට පැමිණි සැටිත්, මිතියා විස්තර කළේ ය. නගරයට පැමිණි පසු ගෘසෙන්කා නිසා සිතේ හටගත් ඊර්සියාව හා වේදනාව ගැන විස්තර කළේ කිසි ම බලකිරීමක් නිසා නො වේ.

සියලු දෙනා ම නිහඬ ව මිතියා ගේ කතාවට සවන් දුන්හ. ගෘසෙන්කා පැමිණෙන්නේ දැයි බැලීමට පියා ගේ ගෙය පිටුපස මුර කළ සැටිත්, පැවල් ඔහුට ඔත්තු බැලූ සැටිත් ගැන වෙසෙසින් ම ප්‍රශ්න කොට ලියාගන්නා ලදි. මිතියා තමා තුළ ඇති වූ ඊර්සියාව ගැන අවංක ව දිග විස්තරයක් කෙළේ ය.

සිය හැඟීම් ප්‍රසිද්ධියේ කීම ගැන මිතියා ලැජ්ජා වූවත් ඒ ලැජ්ජාව මැඩගත්තේ නො සඟවා ඇත්ත කීම පිණිස ය. කතාව කියද්දී රාජ නීතිඥයා ද, වෙසෙසින් ම දණ්ඩනායකයා ද, බලාසිටි සැටියෙන් ඔහු ගේ සිත අවුල් විය.

'මීට ටික දිනකට කලින් ගැනු ගැන නොයෙක් විකාර දේවල් කියාපු මේ කොල්ලාටත්, ලෙඩකු වූ දණ්ඩනායකයාටත්, මගේ කතාව කියන්න වටින්නේ නැහැ''යි මිතියා ශෝකයෙන් කල්පනා කෙළේ ය. "මේ වැඩේ බොහො ම නින්දිතයි, නීචයි. කොහොම වුණත් ඉවසපන්, බැගෑපත් වෙයන්, සිත දමනය කරගනින්''යයි ඔහු තමාට ම කියා ගත්තේ ය. යළි ඔහු සිත එක්තැන් කොට කතාව කීමට පටන් ගත්තේ ය. හොලාකෝ මැතිනිය ගේ ගෙදරට ගිය ගමන ගැන විස්තර කරන අතරේ ප්‍රකෘත්ති තත්ත්වයට පැමිණි මිතියා හොලාකෝ මැතිනිය ගැන පරීක්ෂණයට සම්බන්ධ නොවූ කෙටි කතාවක් කීමට සැරසුණේ ය. එහෙත් එය නතර කල රාජනීතිඥයා කතාවට අදාල කරුණු පමණක් කියන ලෙස දැනුම් දුන්නේ ය. තම සිතේ පැවැති බලවත් ශෝකය ගැන විස්තරයක් කල මිතියා හොලාකෝ මැතිනිය ගේ නිවෙසින් පිටවන විට කෙනකු මරා හෝ රූබල් තුන්දහක් සොයා ගැනීමට අදහස් වූ බව කියන විට දණ්ඩ-නායකයා මිතියා නතර කොට 'කෙනකු මරා හෝ' යන කතාවේ අදහස අසා ලියාගත්තේ ය. මිතියා ඊට විරුද්ධ නො වී ය තමා ගෘසෙන්කා, සම්සෝනෝ ගේ ගෙදරට ඇරලූ සැටිත්, ගෘසෙන්කා එහි මහ රෑ වනතෙක් සිටින බව කියා, එහෙත් තමා රවටා ආපසු පැමිණි සැටිත් දක්වන තැනට පැමිණියේ ය.

"මහත්වරුනි, මම පෙම්යා නොමැරුවේ කාලය නොතිබුණු නිසයි'' මිතියා හදිසියෙන් ම කීවේ ය. එය ද ඉතා පරීක්ෂා-කාරි ව ලියා ගන්නා ලදි. මහත් දෙම්නසින් බලා සිටි මිතියා අනතුරු ව තාත්තා ගේ වත්තට දිවගිය සැටි විස්තර කිරීමට සැරසෙන විට රාජ නීතිඥයා වහා ඔහු නවත්වා, සෝපාව උඩ තිබුණ බෑගයක් ඇර කුඩා පිත්තල මෝල්ගහක් ගත්තේ ය.

"මේ මෝල්ගහ අඳුනනවා ද?''යි ඔහු මිතියාට පෙන්නමින් ඇසුවේ ය.

"ඔව්, මම අඳුනනවා''යි මිතියා සිනාසී කී ය. "ඔව් මම අඳුනනවා. කෝ බලන්න.........කමක් නැහැ.''

"මේ මෝල්ගහ ගැන විස්තරයක් කරන්න මතක නැති වුණා නේද?"යි රාජ නීතිඥයා විමසුවේ ය.

"ඒක යකාට ගියදෙන්. මම කොහොමටත් මෝල්ගහ ගැන මතක් නො කර ඉන්නේ නැහැ. මට අමතක වුණා."

"මේ මෝල් ගහ ගත්ත හැටි අපට කරුණා කරලා කියන්න."

"ඔව්, කියන්න පුළුවනි."

අනතුරු ව මිතියා මෝල්ගස ගෙන දිව ගිය සැටි විස්තර කෙළේ ය.

"මේ වගේ ආයුධයක් අතට ගත්තේ මොන අදහසක් ඇති ව ද?"

"මොන ආයුධයක් ද? මම ඔය මෝල් ගහ නිකම් අරගෙන ගියා."

"මේ වගේ ආයුධයක් නිකම් මොනවට ද ගෙනියන්නේ?"

මිතියා ගේ කෝපය නැගී ආවේ ය. 'කොලුවා' දෙස ඔහු තියුණු බැල්මකින් බලා අනතුරු ව දෙම්නසින් හා ද්වේෂයෙන් ද සිනාසුණේ ය. තමා ගේ හැඟීම් 'මෙ වැනි මිනිසුන්ට' අවංක ව කීම ගැන ඔහු ලැජ්ජා විය.

"ඒක යකාට ගිය දෙන්"යයි ඔහු හදිසියෙන් ම කීවේ ය.

"මොනවට ද මෝල් ගහ අරගෙන ගියේ?........."

"බල්ලන්ට ගහන්න. කළුවරේ යනකොට මොනවා හරි වුණොත්........."

"කළුවරේ යන්න ඔය තරම් බයනම් මීට කලිනුත් කළුවරේ යන කොට ආයුධයක් අරන් ගියා ද?"

"තුඹලා එක්ක කතා කරන්න පුළුවන් කමක් නැහැ"යි මිතියා කෝපයෙන් කී ය. ඔහු ගේ ඉවැසීමේ සීමා ඉක්මවා ගියේ ය. අනතුරු ව ඔහු කෝපයෙන් රතු වූ මුවෙන් යුතු ව ලියන්නා දෙසට හැරී මෙසේ කීය.

"මගේ තාත්තා වන පියෝදර් පවුලොවිච් කරමසෝ ගේ ඔළුවට ගසා මැරීම පිණිස මෝල් ගහ ගෙන ගිය බව ලියා ගනිත්........ කොහොම ද? දැන් හිත සන්තෝෂ ද?"යි අනතුරු ව ඔහු රාජ නීතිඥයා දෙස නොසැලැකිල්ලෙන් බලා ඇසුවේ ය.

"අපි ඇසූ ප්‍රශ්නය නිසා තරහෙන් පිළිතුරු දුන්න බව අපි දන්නවා. අපි ඇසූ ප්‍රශ්නය මහත්මයාට නො වැදගත් වුවත් අපට බොහො ම වැදගත්"යයි දණ්ඩනායකයා කී ය.

"ඔව්, මම මෝල්ගහ ගත්තා. නමුත් මොනවට ගත්තා ද කියා දන්නේ නැහැ. මෝල්ගහ අරගෙන දිව්වා. ඊට වැඩිය කිසි ම දෙයක් දන්නේ නැහැ."

මිතියා වැලමිට මේසය උඩ තබා අනතුරු ව හිස අත උඩ තබා හිඳගත්තේ ය. නිතිඥයන් දෙසින් මුහුණ හරවාගෙන හිඳගත් ඔහු බිත්තිය දෙස බලා, සිතේ නැඟ එන කෝපය මැඩගැනීමට වෑයම් කෙළේ ය.

තමා එල්ලා මැරුවත් වචනයක්වත් නොකියන බව පැවැසීමට ඔහු කල්පනා කෙළේ ය.

"දන්නව ද? තමුන්නාන්සේලා ගේ කතාව අහගෙන ඉන්න කොට මට හීනයක් මතක් වෙනවා"යි මිතියා කෝපය මැඩ ගනිමින් කී ය. "ඒක මම නිතර දැකලා තියෙන හීනයක්. ඒ හීනය හැම තිස්සේ ම පේන්නේ එක ම විදියටයි............ කෙනෙක් නිතර මගේ පස්සෙන් එනවා. ඒ තැනැත්තාට මම බොහො ම භයයි. එයා රෑට මා හොයනවා. මම බයේ අල්මාරියක් හෝ දොරක් පිටිපස්සේ සැඟවෙනවා. ඒක ලැජ්ජා නැති දෙයක්. ඒ තැනැත්තා දන්නවා මා සැඟවී සිටින තැන. නමුත් මට තව තවත් දුක් දීම පිණිස නොදන්නවා වගේ ඉන්නවා...............තමුන්නාන්සේලා කරන්නෙත් එ වැනි ම දෙයක්."

"මහත්මයාට හීනෙන් පේන්නේ එ වැනි දේවල් ද?"යි දණ්ඩනායකයා ප්‍රශ්න කෙළේ ය.

"ඔව්, ඒකත් ලියාගන්න ද?"යි මිතියා සරදම් සිනාවක් දක්වමින් ඇසුවේ ය.

"ලියාගන්න උවමනාවක් නැහැ. මේ වගේ තවත් හීන පේනව ද?"

"නැහැ. හීන ගැන කතා කරලා වැඩක් නැහැ. මම කිව්වේ නියම තත්ත්වය ගැනයි. මම වෘකයෙක්, තමුන්නාන්සේලා දඩයක්කාරයෝ. ඉතින්, පුළුවන් නම් වෘකයා දඩයම් කරගනිල්ලා."

"එහෙම කල්පනා කරන එක වැරදියි" රාජ නීතිඥයා ඉතා කරුණාවෙන් කී ය.

"නැහැ, මගේ කල්පනාවේ කිසි ම වරදක් නැහැ"යි මිතියා යළි කෝපයෙන් කෑගා කී ය. ඒ කෑගැමත් සමග සිතේ පැවැති කෝපය පිට වී ගියේ ය. ඔහු කතා කළ වචනයක් පාසා, ඔහු ගේ ප්‍රකෘති සභාවය යළි මතු විය.

"ප්‍රශ්න අසා වද දෙමින්, මිනීමරුවකු ගෙන් වත්, වරදට අසුවී සිටින අයකු ගෙන් වත් කිසි ම දෙයක් දැනගන්න බැහැ. ඔහු කියන දෙය විශ්වාස කරන්නත් බැහැ. ඒත් අවංක මිනිහෙක් කියන දෙය විශ්වාස කරන්න ඕනෑ. විශ්වාස නො කරන්න කිසි ම හේතුවක් නැහැ.

හදවත,
නිහඩ වන්න,
ගැති වන්න,
ඉවසන්න.

හොඳයි දැන් ඉතින් කතාව කියන්න ද?"යි මිතියා ශෝකයෙන් ඇසුවේ ය.

"කරුණා කරල කියන්න"යි රාජ නීතිඥයා කී ය.

පස් වන පරිච්ඡේදය

තුන් වන පරීක්ෂණය

මිතියා මදක් කෝපයෙන් කතා කෙළේ ය. එහෙත් කතා කරන අතරේ කිසිවක් අමතක නොකිරීමට පරෙස්සම් වන බව පෙනෙන්නට තිබිණි. තමා, වැට උඩින් පැන පියා ගේ වත්තට ඇතුළු වී කවුළුව ළඟට ගිය සැටිත්, කවුළුව ළඟ දී සිදු වූ දෙයත් ඔහු විස්තර කොට කීවේ ය. ගෘසෙන්කා තාත්තා සමග සිටිනවා ද නැද්ද යන්න දැනගැනීමේ මහත් ආශාවෙන් කවුළුව ළඟ සිටි ඒ වේලාවේ දී සිත නොසන්සුන් කළ හැඟීම් ගැන ඔහු විස්තර කළේ ඉතා සෙමෙනි, පරීක්ෂාවෙනි, පැහැදිලි

ලෙසිනි. එහෙත් පුදුමයකට මෙන් නීතිඥයන් දෙදෙනා මීතියා ගේ කතාවට සවන් දුන්නේ වැඩි කැමැත්තකින් නො වේ. මීතියා දෙස උදාසීන බැල්මෙන් බලා සිටි ඔවුහු වැඩි ප්‍රශ්න නොඇසූ හ. ඔවුන් ගේ මුහුණු දෙස බලා ඔවුන් තුළ ඇති වූ හැඟීම් ගැන කිසිවක් කීමට මීතියා සමත් නො වී ය.

"මේ මිනිස්සු දෙන්නා මා එක්ක අමනාපයෙනුයි ඉන්නේ, උන් යකාට ගිය දෙන්"යයි ඔහු කල්පනා කෙළේ ය.

තාත්තාට, ගෲසෙන්කා පැමිණි බව දන්වා ඔහු ලවා ගෙයි දෙර ඇරවීම පිණිස 'සංඥාව' කිරීමට අත්තිමේ දී තමා අදහස් කළ සැටි ඔහු විස්තර කළ විට නීතිඥයන් දෙදෙනා වැඩි සැලැකිල්ලක් නො දක්වූයේ 'සංඥාව' යන වචනය තේරුම් ගත නො හැකි වූවාක් මෙනි. ඒ බව මීතියා ද දැනගත්තේ ය. තාත්තා කවුළුවෙන් එබී බලනවාත් සමඟ තමා ගේ කෝපය වැඩි වූ සැටිත්, ඒ සමඟ මෝල්ගස සාක්කුවෙන් එළියට ගත් සැටිත් විස්තර කළ මීතියා හිටිහැටියේ ම නිහඬ වූයේ එසේ නිහඬ වීමට කලින් අදහස් කරගත්තාක් මෙනි. බිත්තිය දෙස නිහඬ ව බලා සිටි ඔහුට තමා දෙස නීතිඥයන් දෙදෙනා බලා සිටින බව දැනුණේ ය.

"ඉතින් මෝල්ගහ සාක්කුවෙන් එළියට ගත්තා, ඊට පස්සේ මොකද වුණේ?"යි රාජනීතිඥයා විමසුවේ ය.

"ඊට පස්සේ මොකද වුණේ? මම තාත්තා ගේ ඔළුවට ගහල මැරුවා. තමුන්නාන්සේලා ගේ කල්පනාවේ හැටියට ඒකයි වුණේ. එහෙම නේ ද?"

ඔහු ගේ දෑස හදිසියෙන් ම බැබැළෙන්නට විය. මෙතෙක් වේලා ඔහු ගේ ආත්මය තුළ මැඩපවත්වන ලද කෝපය හිටි හැටියේ ම අපූර්ව වේගයකින් මතු විය.

"අපේ කල්පනාවේ හැටියට එහෙම ද වුණේ? හොඳයි එහෙනම් මහත්මයා ගේ කල්පනාවේ හැටියට මොකද වුණේ?"යි රාජ නීතිඥයා ප්‍රශ්න කෙළේ ය.

මීතියා බොහෝ වේලා නිහඬ ව බිම බලා සිටියේ ය.

"මගේ කල්පනාවේ හැටියට මෙකයි වුණේ"යි මීතියා සෙමෙන් කී ය. "යම් කිසිවෙක් ඒ මොහොතේ දී මා නිසා කඳුළු සැලුවා ද, නැතිනම් මගේ මව දෙවියන්ට යාච්ඤා කළා ද,

ඒත් නැතිනම් යහපත් දේවදූතයෙක් මට අතපෑවා ද කියා මා දන්නේ නැහැ. ඒ මොහොතේ දී මා තුළ හිටිය යක්ෂයා පරාජය වුණා. මම කවුළුව ලඟින් ඈත් වෙලා වැට ළඟට දිව්වා. තාත්තා බය වුණා. මා දැකලා කෑගා ගෙන කවුළුව ලඟින් ඈත් වුණා. මට ඒක හොඳට මතකයි. මම වත්ත හරහා දිව ගොස් වැට උඩින් පැන්නා.........වැට උඩින් පනින කොට ග්‍රිගෝරිස් මගේ කකුලෙන් ඇද්දා."

මිතියා හිස උස්සා අවට රැස් ව සිටි පිරිස දෙස බැලුවේ ය. ඔවුන් තමා ගේ කතාවට සන්සුන් ව සවන් දී සිටින බව ඔහු දුටුවේ ය. ඔහු ගේ හදවත කෝපයෙන් ගැහෙන්නට විය.

"ඇයි මේ මොහොතේ දී තමුන්නාන්සේලා මට හිනා වෙන්නේ?"යි ඔහු හිටිහැටියේ ම නිශ්ශබ්දතාව බිඳිමින් ඇසුවේ ය.

"ඇයි එහෙම කල්පනා කරන්නේ?"යි රාජ නීතිඥයා විමසුවේ ය.

"තමුන්නාන්සේලා මගේ කතාවේ වචනයක් වත් විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසයි සිනාසෙන්නේ. මා දන්නවා මම මගේ කතාවේ ඉතා වැදගත් අවස්ථාවට පැමිණි බව. මගේ තාත්තා ඔළුව තුවාල වී මැරී සිටිනවා. තාත්තා මරන්න මගේ ලොකු ආශාවක් තිබුණා. මම මෝල්ගහකුත් අරන් ගිහින් අන්තිම මොහොතේ දී කවුළුව ලඟ නො සිට පැනල ගියා. මගේ කතාව හරියට නවකතාවක් වගෙයි, කාව්‍යයක් වගෙයි. මිනිහකු ගේ වචනය විශ්වාස කරන්න පුළුවන් වගෙයි. හා! හා! හා! තමුන්නාන්සේලා මගේ කතාව අසා සිනාසෙනවා!"

ඔහු හිඳ සිටි පුටුව උඩ වටේට කරකැවුණෙත් පුටුවෙන් 'කිරි කිරි' යන හඬක් නික්මිණි.

"මහත්මයා ජනේලය ලඟ ඉඳලා දුවන කොට වත්තේ සිට ගෙට ඇතුළු වන දොර ඇරල තියෙනවා දුටුවද නැද්ද?"යි දණ්ඩනායකයා විමසුවේ මිතියා තුළ ඇති වූ නොසන්සුන් කම ගැන කිසි ම සැලැකිල්ලක් දක්වා නො වේ.

"නැහැ, ඇරල තිබුණේ නැහැ."

"ඇරල තිබුණේ නැහැ?"

"දොර වහලයි තිබුණේ, කවුද දොර ඇරියේ? ටිකක් ඉන්න"යි කියමින් මදක් කල්පනා කළ මිතියා "දොර ඇරලා තියෙනවා කවුරුවත් දැක්කා ද?"යි හදිසියෙන් ම ඇසුවේ ය.

"ඔව්."

"හොඳයි, නුඹ ඇරියේ නැතිනම් වෙන කවුද දොර ඇරියේ?"යි හදිසියෙන් ම තැතිගත්තකු මෙන් මිතියා ප්‍රශ්න කෙළේ ය.

"තාත්තා මැරුව මිනීමරුවා දොර ඇරගෙන කාමරයට ඇතුළු වෙලා තාත්තා මරා එම දොරින් ම පිටවී ගියා"යි දණ්ඩනායකයා සෙමෙන් කීවේ හැම වචනයක ම වැදගත්කම පෙන්වමිනි. "මිනීමරුව තාත්තා මරා තියෙන්නේ ගෙට ඇතුළු වෙලයි. නැති ව කවුළුව තුළින් නො වෙයි. ඒක අපට හොඳට පැහැදිලියි. තාත්තා බිම වැටිලා හිටි හැටියෙනුත්, අනෙක් දේවල්වලිනුත් අපට මේ කාරණාව බොහෝ ම හොඳට පැහැදිලි වුණා."

මිතියා බිරාන්ත විය.

"ඒක වෙන්න බැරි දෙයක්"යයි මිතියා කීවේ තෝන්තු වූවකු මෙනි. "ම...ම...මම කාමරය ඇතුලට ගියේ නැහැ. මම වත්තේ ඉන්න කොට දොර වසා තිබුණ බව මට කිසි ම සැකයක් නැති ව කියන්න පුළුවනි. මම වත්තෙන් පිට වෙන කොටත් දොර වහලයි තිබුණේ. මම කවුළුව ලඟ සිටියා මිස කාමරයට ගියේ නැහැ. මම තාත්තා දැක්කේ කවුළුවෙන්...... අන්තිම මොහොත වෙනකන් මට හැම දෙයක් ම හොඳට මතක තිබුණා. මට මතක නැති වුණත් දොර වසා තිබුණ බව සථිර ව කියන්න පුළුවනි. ගෘසෙන්කා පැමිණි බව දන්වමින් දොරට ගසන සංඥාව දැන සිටියේ පැවලුත්, මාත්, තාත්තාත් පමණයි. මේ සංඥාව නැති ව මේ ලෝකේ කිසි ම කෙනකුටවත් තාත්තා දොර අරින්නේ නැහැ."

"සංඥාව? මොන සංඥාවක් ද?"යි දණ්ඩනායකයා විමසුවේ මහත් ආශාවෙන් හා සිහිය උමතු කරවන තරම් දැඩි කුතුහල-යකින් ද යුතු ව ය. ඔහු මෙතෙක් වේලා රැකගෙන සිටි මහත් තම්වකම අතුරුදහන් විය. ඔහු එම ප්‍රශ්නය ඇසුවේ නුවුවමනා ගැති කමක් දක්වමිනි. තමා මීට කලින් නො දැන සිටි ඉතා වැදගත් දෙයක් මෙහි ඇති බව ඔහුට වැටහිණි. මිතියා එය හෙළි නොකරාවිය යන බියෙන් ඔහු ගේ හදවත පිරිණි.

"එහෙනම් මේ සංඥුව ගැන කිසි ම දෙයක් දැනගෙන හිටියේ නැද්ද?"යි මිතියා ද්වේෂයෙන් පිරි සරදම් සිනාවක් දක්වා දණ්ඩනායකයා ගෙන් ඇසුවේ ය. "මම නො කිව්වොත් මොකද වෙන්නේ? මහත්මයා කාගෙන් ද දැනගත්තේ? තාත්තාත්, මාත්, පැවලුත් හැර වෙන කිසි ම කෙනෙක් මේ සංඥුව ගැන කිසි ම දෙයක් දන්නේ නැහැ. දෙයියොත් දැනගෙන හිටියා. ඒත් මහත්මයාට කවදාවත් ඒක දෙයියන්ගෙන් දැනගන්න ලැබෙන්නේ නැහැ. මේ සංඥුව පිළිබඳ කතාව බොහෝ ම වැදගත් දෙයක්. ඒ වැදගත් දෙයින් බොහෝ ම දේවල් කරන්න පුළුවනි ඒත් මොනව කරයි ද කියා කවුද දන්නේ? හා! හා! හා! කරදර වෙන්න එපා. මම ඒක කියන්නම්. තමුන්නාන්සේලා බොහෝ ම මෝඩයි. තමුන්නාන්සේලා මේ ප්‍රශ්න අහන්නේ කොයි විදියේ මිනිහකු ගෙන් ද කියා දන්නේ නැහැ. ප්‍රශ්න අහන්නේ තමා ගේ ම විනාශයට සාක්ෂි දෙන සිරකරුවකු ගෙන්! මම අවංක මිනිහෙක්. ඒත් තමුන්නාන්සේලා අවංක මිනිස්සු නො වෙයි."

මිතියා ගේ මේ ඇනුම් පදය දණ්ඩනායකයා ගිලගත්තේ අමාරුවෙනි. ඔහු මුවෙන් නො බැණ සිටියේ ය. මේ අලුත් සාක්ෂිය දැනගැනීමේ ආශාවෙන් ඔහු වෙවුලන්නට විය. තාත්තා විසින් පැවල්ට උගන්වන ලද සංඥුව ගැන මිතියා සම්පූර්ණ විස්තරයක් කෙළේ ය. දොරට ගැසීමේ අදහස පැහැදිලි කළ හෙතෙම එය වැඩි දුරටත් විස්තර කිරීම පිණිස මේසයට ගසා පෙන්නුවේ ය. ගෘසෙන්කා පැමිණි බව දන්වමින් දොරට ගැසුවේ දැයි රාජ නීතිඥයා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන් මිතියා තමා හරියට ම එම සංඥුව අනුව දොරට ගැසුව බව කී ය.

"දැන් ඉතින් තමුන්නාන්සේලාට පුළුවනි තමුන්නාන්සේලා ගේ අදහස් අනුව තීරණයකට බහින්න"යි පැවසූ මිතියා පිළිකුලින් ඉවත බලාගත්තේ ය.

"දොරට ගැසීමේ සංඥුව තාත්තා, මහත්මයා, හා පැවල් හැර වෙන කිසි ම කෙනෙක් දැනගෙන සිටියේ නැද්ද?" යි රාජ නීතිඥයා යළි ඇසුවේ ය.

"පැවල් හා දෙයියන් හැර වෙන කිසි ම කෙනෙක් දැනගෙන සිටියේ නැහැ. දෙයියන් දැන සිටි බව ලියා ගන්න. සමහරවිට එය වැදගත් වෙන්න පුළුවනි. තමුන්නාන්සේලාට දෙයියන් ගේ පිහිට උවමනා වෙන්න පුළුවනි."

ඔවුහු දූනට ම එය ලියා ගත්තෝ ය. මෙසේ ලියා ගත්තා අතරේ කිසියම් අලුත් අදහසක් මතු කිරීමට මෙන් දණ්ඩනායකයා මෙසේ විමසුවේ ය.

"පැවල් ද මේ සංඥාව දැනගෙන සිටියා නම්, මහත්මයා, තාත්තා ගේ මරණය ගැන කිසි ම දෙයක් නොදන්නවා නම්, තාත්තා ලවා දොර ඇරවීමට දොරට ගැසූ තැනැත්තා ම නේද තාත්තා මරන්න ඇත්තේ?"

මීතියා බලවත් අමනාපයෙන් හා දැඩි වෛරයෙන් ද දණ්ඩනායකයා දෙස බලා සිටියේ ය. ඔහු මෙසේ කො තරම් වේලා නිහඬ ව බලා සිටියේ ද කියතොත්, අන්තිමේ දී එම බැල්ම ඉවසිය නො හැකි තැන දණ්ඩනායකයා අඩක් නෙත් වසා ගත්තේ ය.

"ආයේත් නරියා අල්ලගත්තා ද?" යි මීතියා අන්තිමේ දී ඇසුවේ ය. "මිනීමරුවා වලිගයෙන් අල්ල ගත්තා? හා! හා! හා! මම මහත්මයා ගේ හැටි හොඳට දන්නවා. මහත්මයා හිතනවා ඇති මම මහත්මයා ගේ අදහස පිළිගෙන තාත්තා මැරුවේ පැවල් ය කියා කෑගාවි ය කියා. එහෙම නේද? ඒක පිළිගන්නවා නම් මම මගේ කතාව කියන්නම්."

එහෙත් කිසිවක් නොපිළිගත් දණ්ඩනායකයා නිහඬ ව බලා සිටියේ ය.

"මහත්මයා වරද්ද ගත්තා, මහත්මයා ගේ අදහස පිළිගෙන තාත්තා මැරුවේ පැවල් ය කියා මම කෑ ගෑවේ නැහැ."

"මහත්මයා පැවල් ගැන සැක කරන්නේ නැද්ද?"

"ඇයි, මහත්මයා පැවල් ගැන සැක කරනවා ද?"

"ඔව්, පැවලුත් මේ මිනීමැරුම ගැන සැකකරුවෙක්."

මීතියා බිම බලාගත්තේ ය.

"මා කියන දෙය හොඳට අහගන්න. අර නිරය පිටිපස්සේ ඉඳලා තමුන්නාසේලා හමුවෙන්න ආපු වෙලාවේ ඉඳලා මම පැවල් ගැන කල්පනා කළා. මෙ තැන ඉඳගෙන තාත්තා ගේ මරණයට මා වැරදිකාරයෙක් නො වේ ය කියා කෑගාන අතර මම පැවල් ගැන කල්පනා කළා. පැවල් ගැන සැකය මට සිතින් ඉවත් කරගන්න බැහැ. දැන් මොහොතකට කලින් මම පැවල්

ගැන කල්පනා කළා. ඒත් ඒ එක්ක ම මට කල්පනා වුණා මේක පැවල්ගේ වැඩක් නො වේ ය කියා. පැවල් මේ වගේ වැඩක් කරන්නේ නැහැ."

"එහෙනම් අවිශ්වාස කරන වෙන කෙනෙක් ඉන්නවා ද?"යි රාජ නීතිඥයා සෙමෙන් ඇසුවේ ය.

"මේ අපරාධය දෙසියයත් කළා ද නැතිනම් සාතන් කළා ද කියා මා දන්නේ නැහැ. ඒත් පැවල් නම් නො වෙයි" මීතියා ස්ථිර ව ම කී ය.

"ඔය තරම් විශ්වාසයක් ඇති ව පැවල් නොකළ බව තීරණය කළේ කොහොම ද?"

"මගේ වැටහීම හා හැඟීම් අනුවයි තීරණය කළේ. පැවල් බොහො ම පහත් නීච බියසුල්ලෙක්. මිනිහා, මේ ලෝකේ තියෙන සියලු ම නීචකම් එක්තැන් කල, දෙපයින් යන සංක්ෂේපයකට සමානයි. මිනිහා බොහො ම බයයි. මම කවදාවත් මිනිහට ගහන්න අතවත් උස්සලා නැහැ. නමුත් මා කතා කරනවිට මරාවිය කියා බයෙන් වෙව්ලනවා. මිනිහා මගේ දෙපා ළඟ වැටී අඩල තියෙනව බය කරන්න එපා ය කියා. මගේ පාවහන් සිඹ කන්නලව් කරල තියෙනවා. පුදුමයි නේද? මම මිනිහට මුදල් දුන්නා. මිනිහා අවුරුදු අටක ළමයකුට පවා බය ඇති මීමැස්මොරකාරයෙක්. මේ වගේ පුද්ගලයෙක් නියම මනුෂ්‍යයෙක් හැටියට ගණන්ගන්න පුළුවන්ද? නැහැ මහත්වරුනි තාත්තා මැරුවේ පැවල් නො වෙයි හැරත් පැවල් මුදල්වලට කෑදර මිනිහෙකුත් නො වෙයි. මගෙන් වුවත් මුදල් ගත්තේ නැහැ. මිනිහා මොනවට ද තාත්තා මරන්නේ? සමහර විට නාකියා මිනිහගෙ තාත්තා වෙන්න පුළුවනි. නමුත්නාත්සේලා ඒ කතාව දන්නවා ද?"

අපි ඒ කතාව අහල තියෙනවා. මහත්මයාත් පියෝදර් පව්ලොවිච් කරමසෝව්ගේ පුතෙක්. මහත්මයා, තාත්තා මරනවා ය කියා හැමෝට ම කිව්වා."

"ඒක මට විරුද්ධ ව එල්ල කළ බොහො ම කෑත, නීච, පහරක්. මම බය නැහැ. මා ඉදිරිපිට එහෙම දෙයක් කීම නමුත්නාත්සේලා ගේ තත්ත්වයට සුදුසු ද? නුසුදුසු, මා කියාපු දෙයක් නිසයි. තාත්තා මැරීමේ අදහස පමණක් නො වෙයි, ඉඩ ලැබුණා නම් තාත්තා මරනවා. ඒ බව මම නමුත්නාත්-සේලාට මගේ කැමැත්තෙන් ම කිව්වා. නමුත් මම තාත්තා

මැරුවේ නැහැ. මගේ ඉටු දෙවියා ඒ අපරාධයෙන් මා බේරුවා. ඒ සත්‍යය තමුන්නාන්සේලා පිළිගත්තේ නැහැ. අන්න ඒකයි තමුන්නාන්සේලා කළ නීච වැඩය. ඒත් මම මගේ තාත්තා මැරුවේ නැහැ— මැරුවේ නැහැ!"

මිතියා හුස්ම ගත්තේ බොහෝ ම අමාරුවෙන්. මුළු පරීක්ෂණය තුළ ම මිතියා මෙ තරම් නොසන්සුන් නො වී ය.

"පැවල් මොකද මේ අපරාධය ගැන කිව්වෙ? මට ඒ ප්‍රශ්නය අහන්න ඉඩ දෙනවා ද?"යි මිතියා ටික වේලාවකට පස්සේ හදිසියෙන් ම ඇසුවේ ය.

"තමා කැමැති දෙයක් ගැන අපෙන් ප්‍රශ්න කරන්න පුළුවනි"යි දණ්ඩනායකයා රළු ගතියක් දක්වා නොසැලැකිල්ලෙන් කී ය." මේ අපරාධයට සම්බන්ධ වූ ඕනෑ ම ප්‍රශ්නයක් අහන්න. අපෙන් අහන හැම ප්‍රශ්නයකට ම පිළිතුරු දීමට අපි බැඳී සිටින බව දැන්වීමට කැමැතියි. මහත්මයා සඳහන් කළ පැවල් නමැති සේවකයා මීමැස්මොරය හැදී සිහි නැතිව නිදා සිටිනවා අපි දුටුවා. සමහර විට පැවල්ට මීමැස්මොරය හැදෙන්න ඇත්තේ දහ වන වතාවට වෙන්න ඕනෑ අප එක්ක ගිය දොස්තර පැවල් පරීක්ෂා කරලා කිව්වා සමහර විට මිතිහා එළිවන තෙක් ජීවත් නො වෙන්න පුළුවනි කියා."

"එහෙනම් තාත්තා මරන්න ඇත්තේ යක්ෂයා වෙන්න ඇති"යි මිතියා හදිසියෙන් ම කීවේ, මේ මොහොත වන තෙක් පැවල් ගැන සැක කළාක් මෙනි.

"අපි ඒ ගැන පස්සේ කල්පනා කරමු"යි රාජ නීතිඥයා තීරණය කෙළේ ය. "දැන් මහත්මයා කතාව කියන්න කැමැති ද?"

මිතියා මඳ විවේකයක් ඉල්ලා සිටියේ ය. ඔහු ගේ ඒ ඉල්ලීමට ඉතා කරුණාවෙන් අවසර දෙන ලදි. විවේක ගැනීමෙන් අනතුරු ව මිතියා ආයේත් කතාව කීමට පටන් ගත්තේ ය. ඔහු තුළ කාලකණ්ණි ගතියක් ඇති විය. දුඃඛ වේදනාවෙන් පෙලෙන්නට විය. සිත අධෛර්‍ය විය. හැරත් දණ්ඩනායකයා හැම මොහොතක් පාසා ම ඉතා සුළු දේවල් ගැන පවා ප්‍රශ්න කරමින් හිරිහැර කෙළේ ය. කකුල් දෙපැත්තට දමා වැට උඩ සිටින විට වම් කකුලේ එල්ලුණු ග්‍රිගෝරිස් ගේ හිසට මෝල්ගසින් පහර දී ඔහුට හුහක් තුවාල වූයේ දූසි

බැලීම පිණිස, යළි වැට උඩින් බිමට පැන්න හැටි සඳහන් කළ වහා ම දණ්ඩනායකයා මිතියා නතර කරමින් වැට උඩ හිඳ සිටි හැටි තවත් හොඳට විස්තර කරන ලෙස කී ය. මිතියා පුදුම විය.

"මම මෙන්න මේ විදියට කකුල් දෙපැත්තට දමා ගෙන ඉඳගෙන හිටියා."

"එතකොට මෝල්ගහ තිබුණේ කොහෙ ද?"

"මෝල්ගහ තිබුණේ මගේ අතේ."

"සාක්කුවේ නො වෙයි ද? ඒක හොඳට මතක ද? තදින් ගැහැව්ව ද?"

"සමහර විට තදින් ගහන්න ඇති. මොනවට ද ඒක දැනගන්න උවමනා කරන්නේ?"

"වැට උඩ හිටිය හැටියට මේ පුටුව උඩ ඉඳගෙන මෝල් ගසින් ගහපු හැටි කරුණා කරල පෙන්නන්න පුළුවන් ද?"

"මහත්මයා මා එක්ක විහිළු කරනවා ද?"යි මිතියා දණ්ඩනායකයා ගෙන් රවා බලා ඇසුවේ ය. එහෙත් නිලධරයා නො සැලී බලා සිටියේ ය. මිතියා ආපසු හැරී පුටුව දෙපැත්තට කකුල් දෙක දමා අත වැනුවේ ය.

"මෙන්න මේ විදියටයි මම ගිරිගෝරිස්ට ගැහැව්වේ. මෙන්න මේ විදියටයි මැරුවේ! වෙන මොනව ද දැනගන්න ඕනේ?"

"බොහො ම සතුතියි. වැට උඩ ඉඳලා ආපසු වත්තට පැන්නේ මොනවට ද? මොන අදහසක් ඇති ව ද?"

"ඒක යකාට ගිය දෙන්. මම ආපසු වත්තට පැන්නේ මගෙන් ගුටිකාපු මිනිහට මොක ද වුණේ කියා බලන්න යි. ඒත් මොන අදහසකින් ද කියා දන්නේ නැහැ."

"ඊට පස්සේ කලබල වෙලා පැනල ගියා?"

"ගිරිගෝරිස්ට පිහිට වෙන්න අදහස් කළේ නැද්ද?"

"අනේ දෙයියනේ නැහැ.........මිනිහට පිහිට වෙන්න මගේ හිතේ උවමනාවක් තියෙන්න ඇති. මට මතක නැහැ.'

"මහත්මයා ගේ අදහසේ හැටියට ඒ වෙලාවේ මහත්මයාට වැඩිය කල්පනාව තිබුණෙත් නැහැ? ඒ වෙලාවේ වෙච්චි දේවල් මතකත් නැහැ?"

"නැහැ, නැහැ, මට හොඳට කල්පනාව තිබුණා. වෙච්ච හැම දෙයක් ම මට මතකයි. මම වැට උඩින් පැනලා මගේ ලේන්සුවෙන් ගිරිගෝරිස් ගේ මූහුණ පිස දැම්මා."

"අපි දැක්කා ඒ ලේන්සුව. මහත්මයාට උවමනා කළේ කොහොම හරි ගිරිගෝරිස්ට ආයෙත් සිහිය ලබා දීමට යි. එහෙම නේද?"

"මම දන්නේ නැහැ. මට උවමනා කළේ ගිරිගෝරිස් මළා ද නැද්ද කියා දැනගැනීමට යි."

"හා, හා, හා, මහත්මයාට උවමනා කළේ ගිරිගෝරිස් මළා ද නැද්ද කියා දැනගැනීමට යි! ඉතින් දැනගත්ත ද?"

"මම දොස්තර කෙනෙක් නො වෙයි. මම පැනල ගියේ ගිරිගෝරිස් මළා ය කියා හිතාගෙනයි. ඒත් මිනිහා මැරිලා නැහැ."

"බොහො ම හොඳයි. මහත්මයාට බොහො ම සතුතියි. දැන් ඉතින් කතාව කියන්න"යි දණ්ඩනායකයා ප්‍රශ්න ඇසීම නතර කරමින් කී ය.

අභාග්‍යයකි. තමා වැට උඩින් පැන්නේ එ වේලේ සිතේ හටගත් අනුකම්පාවෙන් බවත්, බිම වැතිර සිටි ගිරිගෝරිස් ළඟට ගොස් "ගිරිගෝරිස් මේක තුඹේ අවාසනාවට වෙච්ච දෙයක්, කරන්න දෙයක් නැහැ, ඔහොම හිටපන්"යයි තමා ශෝකයෙන් කී බවත් මතක තිබුණත්, නිලධරයාට කීමට මිතියාට අමතක විය. එහෙත් මිතියා ගේ කතාවෙන් දණ්ඩ-නායකයා එක්තරා නිගමනයකට බැස ගත්තේ ය. ඒ නිගමනය නම්; මිතියා මහත් කලබලයෙන් යුතු ව ඒ මොහොතේ වැටෙන් බිමට පැන්නේ තමා කළ මිනීමැරුම දුටු එක ම සාක්ෂිකාරයා මළා ද, නැද්ද, යන්න දැනගැනීම පිණිස ය. ඒ මොහොතේ දී පවා මිතියා ගේ ධෛර්යය, අධිෂ්ඨානය, සන්සුන් කම හා විනිශ්චය බලය තිබුණු බව මින් පැහැදිලි වූ තවත් කරුණකි. දණ්ඩ-නායකයා මිතියා ගේ ප්‍රකාශය ගැන තෘප්තියට පත්විය. "මම මේ නොසන්සුන් වූ මිනිහා ගේ සිත 'නොවැදගත්' ප්‍රශ්න අසා අවුල් කෙළෙමි. ඔහු පමණට වඩා කතා කෙළේ යැ"යි ඔහු අදහස් කෙළේ ය.

සිත් වේදනාවෙන් සිටි මීතියා කතාව කියන්නට විය. මෙ වර හදිසියෙන් ම කතාව නතර කළේ රාජනීතිඥයා ය.

"අත්වල ලේ තැවරී තිබිය දී මහත්මයා වැඩකාරියක් වන පෙම්යා ගේ ගෙදරට දිව්වේ කොහොම ද? අත්වල පමණක් නො ව මුහුණෙත් ලේ ගෑවී තිබෙන බව පසු ව දැනගත්තා නේ ද?"

"මගේ අත්වලයි මුහුණෙයි ලේ ගෑවී තියෙන බව මම එ වේලේ දැනගෙන හිටියේ නැහැ."

"ඔව්, ඔව්, මහත්මයා ගේ කතාව ඇත්තයි" දණ්ඩනායකයා කී ය. "මෙ වැනි දේවල් සිද්ධ වෙනවා."

"මට ඒක කල්පනා වුණේ නැහැ. මහත්මයා බොහො ම හොඳට මගේ අදහස පැහැදිලි කළා"යි මීතියා දණ්ඩනායකයා ගේ අදහස අනුමත කරමින් කී ය

අනතුරු ව මීතියා, ගෲසෙන්කා හා ඇගේ පෙම්වතාටත් සැප සේ ජීවත්වීමට ඉඩ දී අයින් වී සිටීමට තීරණය කරගත් සැටි විස්තර කෙළේ ය. එහෙත් ඔහු ගේ හදවතේ රැජිනිය වන ගෲසෙන්කා ගැන වැඩි විස්තර කීමට ඔහු කැමැති නො වී ය. 'මකුණන් මෙන් තමා ගේ ලේ උරා බීමට' බලාසිටින මේ මිනිසුන්ට ගෲසෙන්කා ගැන විස්තර කිරීමට ඔහු කැමැති නො වී ය. එ හෙයින් ඔවුන් නිතර ඇසූ ප්‍රශ්නවලට ඔහු කෙටි තියුණු පිළිතුරු දුන්නේ ය.

"ඉතින් මම තීරණය කරගත්තා ජීවිතය නැතිකර ගන්න. ජීවත් වීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? යන ප්‍රශ්නය මම නිතර මගෙන් ම ඇසුවා. ගෲසෙන්කා දූෂණය කළ, නමුත් අවුරුදු පහකට පස්සේ සමාව ඉල්ලීමක් වශයෙන් ඇයට ආලය කොට ඇය විවාහ කර ගැනීමට ඇගේ කුලුදුල් පෙම්වතා ආපසු පැමිණියා. දැන් ජීවත්වීමෙන් කිසි ම ප්‍රයෝජනයක් නැති බව මම තේරුම් ගත්තා..............අනෙක් අතින් ගිරිගෝරිස්ට කළ අපරාධය හා ඉන් පැමිණෙන නින්දාව නුළුපටු නො වෙයි. ඉතින් මා මොනවට ද ජීවත්වන්නේ? උගස් තියාපු පිස්තෝල දෙක අරගෙන උදේ පාන්දර හිසට වෙඩි තියාගෙන ජීවිතය විනාශ කරගැනීමට මම තීරණය කරගත්තා."

"ඊට ඉස්සෙල්ලා රෑ එළිවනකන් කාල බීල ප්‍රීති වුණා."

"ඔව්, ඊට ඉස්සෙල්ලා හොඳට කාල බීල ප්‍රීති වුණා...ඒක යකාට ගියදෙන්. කරුණා කරලා ඉක්මනින් මේ වැඩේ ඉවර කරන්න. මම වෙඩි තියා ගැනීමට තීරණය කරගත්තේ වැඩි දුර නො ව, මේ ගමේ කෙළවරට ගිහිල්ලයි. මම පියෝතර් ගේ ගෙදර දී පිස්තෝලවලට වෙඩි පුරවන ගමන් ලියුමක් ලිව්වා. මේ තියෙන්නේ ඒ ලියුම. කියවන්න. මම මේ සේරම කියන්නේ මහත්වරුන් ගේ ප්‍රයෝජනයටයි" කියමින් මිතියා හිටිහැටියේ ම කතාව නතර කෙළේ ය.

අනතුරු ව ඔහු යට කබායේ සාක්කුවේ තිබුණු ලියුම ගෙන මේසය උඩට විසි කෙළේ ය. මහත් සැලැකිල්ලෙන් ලියුම ගෙන කියවූ නිලධාරීහු එය ද නඩුවට සබඳකම් ඇති අනෙක් දේවලට එක් කළහ.

"පියෝතර් පර්හෝටින් මහත්මයා ගේ ගෙදරට යන කොටවත් මහත්මයා අත්වල තිබුණු ලේ සෝදා ගත්තේ නැද්ද? අත්වලයි මුහුණෙයි තියෙන ලේ දැකලා මිනිස්සු මහත්මයා ගැන සැක කරාවිය කියා භය වුණේ නැද්ද?"

"මොනවට සැක කරන්න ද? සැක කළත් නො කළත් මම මෙහාට ඇවිදින් උදේ පහට වෙඩි තියා ගන්නවා. මා නවත්වන්න කිසි ම කෙනකුට ඉඩක් ලැබෙන්නේ නැහැ. තාත්තාට මේ විපත්තිය වුණේ නැතිනම් මහත්වරු කවදාවත් මෙ තැනට එන්නේ නැහැ. තමුන්නාන්සේලාට මා ගැන දැන ගන්න ලැබෙන්නේ නැහැ. මේක යකා ගේ වැඩක්. තාත්තා මැරුවේ යක්ෂයායි. තමුන්නාන්සේලා මේ අපරාධය මෙ තරම් ඉක්මනට සොයා ගත්තේ යක්ෂයා ගේ මාර්ගයෙනුයි. නැතිනම් කොහොම ද මෙ තරම් ඉක්මනට මෙහාට ආවේ? මේක මහ පුදුමයක්!"

"ලේ තැවරුණු අත්වල විශාල මුදලක් තිබුණු බව, රූබල් සීයේ නෝට්ටු මිටියක් තිබුණු බව පියෝතර් පර්හෝටින් මහත්මයා අපට කිව්වා. අනේ මුදල් තියෙනවා එයා ගේ සේවකයාත් දැකල තියෙනවා."

"ඔව් ඒක ඇත්ත."

"දැන් මහත්මයා, අපි ආවේ තවත් සුළු කාරණාවක් දැන ගන්නයි. මහත්මයාට හදිසියෙන් ම මෙ තරම් විශාල මුදලක් ලැබුණේ කොහෙන් ද කියා අපට කියන්න පුළුවන් ද?"යි රාජ නීතිඥයා බොහො ම කරුණාවෙන් ඇසුවේ ය. "ලැබී තිබෙන

සාක්ෂි අනුව බලන කොට එම මුදල් ගැනීමට මහත්මයාට ගෙදර යන්න වෙලාවක් ලැබුණේ නැහැ."

අවුල් නො කොට කෙලින් ම ප්‍රශ්නය ඇසූ රාජ නීතිඥයා දෙස දණ්ඩනායකයා රවා බැලුව මුත් බාධා නො කෙළේ ය.

"නැහැ මම ගෙදර ගියේ නැහැ"යි මීතියා බිම බලාගෙන සෙමෙන් කීවේ ය මීතියා ගේ සිත සන්සුන් ව තිබෙන බව මීතියා කතා කල සැටියෙන් පෙනිණි.

"හොඳයි, එහෙනම් මේ ප්‍රශ්නය නැවැත ඇසීමට කරුණා කරලා මට අවසර දෙන්න"යි රාජ නීතිඥයා ආයේත් කීවේ මීතියා අල්ලා ගැනීමට අදහස් කරමිනි. "එහෙනම් කොහෙන්ද ඔතරම් විශාල මුදලක් ලැබුණේ? මහත්මයා පිළිගන්නා සවස පහට.......... "

"සවස පහට මට රූබල් දහයක් උවමනා වෙලා පියෝතර් ළඟ මගේ පිස්තෝල දෙක උගස් තිබ්බා. ඊට පස්සේ මම හොලාකෝ මැතිනිය ගේ ගෙදරට ගියා රූබල් තුන්දහක් ණයට ඉල්ලා ගන්න. ඈ මට මුදල් දුන්නේ නැහැ. සවස මා ළඟ තඹයක්වත් තිබුණේ නැහැ ඊත් ටික වේලාවකට පස්සේ රූබල් දහස් ගණන් තිබුණා. දැන් ඉතින්, මේ මුදල් ලැබුණේ කොහෙන් ද කියා මා නො කිව්වොත් මහත්වරු දෙන්නා ම අමාරුවේ වැටෙනවා. මහත්වරු දෙන්නා බොහො ම හයෙන් ඉන්නේ. මුදල් ලැබුණ හැටි මම කියන්නේ නැහැ. පුළුවන්නම් සොයා බලන්න. ඒත් කවදාවත් සොයා ගන්න ලැබෙන්නේ නැහැ"යි මීතියා කී ය. ඔහු හැම වචනයක් ම කිව්වේ මහත් චිත්ත ධෛර්‍යයකින් යුතු ව ය.

නීතිඥයෝ දෙදෙනා මඳ වේලාවක් නිහඬ වූ හ.

"මහත්මයාට මුදල් ලැබුණ හැටි දැනගැනීම අපට ඉතා වැදගත් දෙයක් බව මහත්මයා තේරුම් ගන්න ඕනෑ"යි රාජ නීතිඥයා සෙමෙන් කීවේ ය.

'ඔව් මම දන්නවා. ඒත් මම කියන්නේ නැහැ."

දණ්ඩනායකයා ආයේත් පරීක්ෂණයට මැදහත් වී, තමා ගේ යහපත පතා ප්‍රශ්නවලට පිළිතුරු නො දී සිටිය හැකි බවත්, එහෙත් මෙ වැනි වැදගත් ප්‍රශ්නයකට පිළිතුරු නො දී නිශ්ශබ්ද ව සිටීමෙන් තමාට අනතුරක් සිදුවීමට ඉඩ තියෙන බවත් මීතියාට ආයෙත් කී ය.

"ඔය තර්කය මම මීට ඉස්සෙල්ලත් අහල තියෙනවා"යි මිතියා දණ්ඩනායකයාගේ කතාවට බාධා කරමින් කී ය. "මේ ප්‍රශ්නය බොහො ම වැදගත් බව මම දන්නවා. කොතරම් වැදගත් වුණත් පිළිතුරු දෙන්නේ නැහැ."

"මහත්මයා ප්‍රශ්නයට පිළිතුරු දුන්නත් නුදුන්නත් කමක් නැහැ. ඒක මහත්මයාගේ වැඩක්. ඒත් පිළිතුරු නො දීමෙන් මහත්මයා අමාරුවේ වැටෙනවා"යි රාජ නීතිඥයා නොසන්සුන් වෙමින් කී ය.

"නැහැ, ඒක විහිළුවක් නො වෙයි" මිතියා නිලධරයන් දෙදෙනා දෙස බලා කී ය. "මම කල්තියා ම දැනගත්තා මේ මුදල් පිළිබඳ ප්‍රශ්නයේ දී අප අතර භේදයක් ඇති වන බව. එහෙත් මුල දී සාක්ෂි දෙන්න පටන්ගත්ත වෙලාවේ දී මට ඒක එ තරම් පැහැදිලි ව පෙනුණේ නැහැ. මම කතාව කියන්න පටන්ගත්තේ අප අතරේ අන්‍යෝන්‍ය විශ්වාසයක් ඇත ය යන අදහසිනුයි. එහෙත් දැන් මට පේනවා එවැනි විශ්වාසයක් අප අතර නැති බව. දැන් මම මගේ කතාවේ අමාරු තැනට පැමිණියා. මට මුදල් ලැබුණු හැටි ගැන කිසි ම විස්තරයක් කරන්න බැහැ. කාරණය එතැනින් ඉවරයි. මගේ කතාව පිළිගන්නට ය කියා මම කියන්නේ නැහැ."

අනතුරු ව මිතියා නිහඬ විය.

"මේ වැදගත් ප්‍රශ්නය ගැන නිහඬ වීමට මහත්මයා කළ තීරණය වෙනස් නො කොට, මහත්මයාට අහිතකර වූ මේ වැදගත් අවස්ථාවේ පැනනැගුණු වැදගත් ප්‍රශ්නයකට පිළිතුරු නො දී සිටීමට අදාළ වූ හේතුව ගැන අපට යමක් කියන්න බැරි ද?"

මිතියා ශෝකයෙන් බිම බලා සිනාසුණේ ය.

"තමුන්නාන්සේලා හිතනවාට වඩා මා හොඳ මිනිහෙක්. මේ කාරණය දැනගැනීමට තරම් මහත්වරු සුදුසු පුද්ගලයන් නො වුවත් මුදල් පිළිබඳ ප්‍රශ්නය ගැන මා නිහඬ ව සිටීමට හේතුව කියන්නම්. මම මේ ප්‍රශ්නයට පිළිතුරු නො දෙන්නේ පිළිතුරු දීමෙන් මගේ ආත්ම ගරුත්වයට විශාල අපහාසයක් වන නිසයි. මා මේ මුදල් ලබා ගත්තේ කොහොත් ද? යන ප්‍රශ්නයට පිළිතුරු දීම මගේ තාත්තා මරා මුදල් ගැනීමට වඩා නින්දා සහගත දෙයක්. ඒ කියන්නේ මම තාත්තා මරා

මුදල් ගත්තා නම් පමණයි. ඒ නිසයි මට මේ මුදල් ගැන කිසි ම දෙයක් කියන්න බැරි. මට නින්දාකර ගැනීමට මම කැමැති නැහැ.........මොක ද මේ කාරණයත් ලියා ගන්න ද කල්පනාව?"

"ඔව්, මගේ කල්පනාවේ හැටියට ලියා ගන්න එක හොඳයි" රාජනීතිඥයා කී ය.

"නැහැ, ලියා ගැනීම හොඳ නැහැ. මට නින්දා ගෙන දෙන දෙයක් ලියා ගැනීම සුදුසු නැහැ. මම මේ කාරණාව කිව්වේ මහත්වරුන්ට තියෙන කරුණාව නිසයි. නො කියා සිටින්න තිබුණා. මම කිව්වේ මහත්වරුන්ට දෙන තෑග්ගක් හැටියටයි. නමුත්, කියා අවසන් කරන්නටත් කලින් මට විරුද්ධ ව ඇති සාක්ෂියක් හැටියට ලියා ගන්නවා. හොඳයි, මට විරුද්ධ ව කැමැති දෙයක් ලියා ගන්න"යි මිතියා මහත් පිළිකුලක් දක්වමින් කී ය. "මම තමුන්නාන්සේලාට බය නැහැ. මට තවමත් තමුන්නාන්සේලා ඉදිරිපිට හිස කෙළින් තියාගෙන ඉන්න පුළුවනි."

"මේ නින්දා සහගත දෙය ගැන අපට යමක් කියන්න බැරි ද?"යි රාජනීතිඥයා සෙමෙන් විමසුවේ ය.

දණ්ඩනායකයා රවා බැලුවේ ය.

"කරදර වෙන්න එපා. මගේ දූෂ අපිරිසුදු කර ගැනීම සුදුසු වැඩක් නො වෙයි. තමුන්නාන්සේලාට ඇත්ත කියන්න ගිහින් මම දූෂනට ම මගේ දූෂ අපිරිසුදු කරගත්තා. තමුන්නාන්සේලා එ තරම් වටිනා මිනිස්සු නො වෙයි. ඔය ඇති කතා කළා. මම මීට වැඩිය වචනයක්වත් කියන්නේ නැහැ."

මිතියා ගේ කතාව මදක් පැහැදිලි විය. රාජනීතිඥයා ප්‍රශ්න ඇසීම නතර කළමුත් දණ්ඩනායකයා ගේ එ වැනි අදහසක් නොතිබුණ බව ඔහු ගේ නෙත් තුළින් පෙනිණි.

"මහත්මයා පියෝතර් පර්හෝටින් හමු වෙන්න යන කොට අතේ කො තරම් මුදලක් තිබුණ ද කියා අපට කියන්න පුළුවන් ද?.........රූබල් කීයක් විතර තිබුණා ද?"

"බොහො ම කනගාටුයි. මට ඒක කියන්න බැහැ."

"හොලාකෝව් මැතිනිය ගෙන් රූබල් තුන්දහසක් ලැබුණු බව මහත්මයා පියෝතර් පර්හෝටින්ට කිව්ව ද?"

"සමහරවිට කියන්න ඇති. ඔය ඇති. මගෙ ළඟ කොපමණ මුදල් තිබුණ ද කියා මම කියන්නේ නැහැ."

"එහෙනම් අපට කියන්න පුළුවන් ද මහත්මයා මෙහාට ආවේ කොහොම ද? අපු වෙලාවේ සිට කළේ මොනව ද? කියා."

"ඔය ප්‍රශ්නය මෙ තැන සිටින අය ගෙන් අහන්න. නැහැ මම උත්තර දෙන්නම්."

මිතියා ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ ය. ඒ පිළිතුර අපි නැවත නො කියමු. ඔහු කෙටින් පිළිතුරු දුන්නේ වැඩි සැලකිල්ලකින් නො වේ. එහෙත් ගෲසෙන්කාට දැක්වූ ආලය ගැන ඔහු කිසිවක් නො කීවේ ය. එ වේලේ ඇති වූ කිසියම් අලුත් අදහසක් නිසා කලින් ජීවිතය විනාශ කරගැනීමට ඇතිකරගත් තීරණය වෙනස් කළ බව කීවේ ය. එහෙත් හේතු විස්තර කිසිවක් නො කීවේ ය. හැරත් නීතිඥයෝ දෙදෙනා ද ප්‍රශ්න අසමින් ඔහුට වැඩි කරදරයක් නො කළහ. මේ විස්තරය එ තරම් වැදගත් යැයි ඔවුහු නො සිතූ හ.

"අපි මහත්මයා ගේ කතාව ගැන පරීක්ෂා කරල බලන්නම්" යයි කියමින් රාජනීතිඥයා පරීක්ෂණය අවසන් කෙළේ ය. "අනෙක් සාක්ෂිකාරයන් පරීක්ෂා කරන කොට අපට මේ ගැන සොයා බලන්න පුළුවනි. අපි ඒ සාක්ෂිකාරයන් විභාග කරන්නේ මහත්මයා ඉදිරිපිටයි. දැන් මහත්මයා ළඟ තියෙන හැම දෙයක් ම කරුණා කරලා මේසය උඩ තියන්න. අතේ තියෙන මුදල් විශේෂයෙන් ම තියන්න ඕනෑ."

"මගේ මුදල් ද ඕනෑ? කමක් නැහැ, මම දන්නවා මගේ අතේ තියෙන මුදල් දෙන්න ඕන බව. ඒත් මට පුදුම මීට ඉස්සෙල්ලා මුදල් නො ඉල්ලපු එක ගැනයි. මම කාගේත් ඇස් ඉදිරිපිට සිටින නිසා මට පැනල යන්න පුළුවන් කමක් නැහැ. මෙන්න තියෙනවා මගේ මුදල්, ගණන් කරලා ගන්න."

මිතියා සාක්කුවල තිබුණු හැම දෙයක් ම එළියට ගත්තේ ය. වෙස්කෝට් සාක්කුවේ තිබුණු කාසි ද ගත්තේ ය. ඔවුහු මුදල් ගැණ බැලුවෝ ය. එහි රූබල් අටසිය තිස්හයක් සමඟ කොපෙක් හතළිහක් තිබිණි.

"මෙච්චර ද තියෙන්නේ?" දණ්ඩනායකයා ඇසුවේ ය.

"ඔව්"

"දූත් මහත්මයා ගේ කතාවෙත් හෙළිවුණා මහත්මයා පොලෝතිකෝප් ගේ කඩෙත් රූබල් තුන්සියක බඩු ගත්ත බව. මහත්මයා පියෝතර් පර්හෝට්ටිත්ට රූබල් දහයකුත්, කරත්ත කාරයාට විස්සකුත් දුන්නා. මෙ තැන දී රූබල් දෙසියක් පැරදුණා."

රාජනීතිඥයා නැවැත මුදල් ගැණ බැලුවේ ය. මිතියා මුදල් ගණන් කිරීමට සිය කැමැත්තෙන් ම උපකාර විය.

"මේ අටසියත් එක්ක මහත්මයා ළඟ මුල දී රූබල් එක්දහස් පන්සියක් පමණ තියෙන්න ඇති?"

"ඔව්, තියෙන්න ඇති."

"එහෙනම් මහත්මයා ළඟ මුදල් තියෙන බව දුටු අය කොහොම ද කියන්නේ මීට වඩා මුදල් තිබුණු බව?"

"ඕනෑ කෙනෙක් ඕනෑ දෙයක් කියාපු දෙන්."

"නමුත් මහත්මයා කිව්ව නේද?"

"ඔව්, මාත් කිව්වා."

"තවත් ඉන්නවා සාක්ෂි දෙන්න අය. ඒ අය ගේ සාක්ෂි අනුව අපි නැවැත මුදල් ගැණලා බලන්නම්. මුදල් ගැන කරදර වෙන්න එපා. අපි හොඳට මුදල් බලාගන්නම්. ඒවා අපට හොඳට පුරුදු වැඩ. පරීක්ෂණය අවසන් වුණාට පස්සේ මුදල් ගන්න පුළුවනි. හැබැයි මුදල් ලැබෙන්නේ මහත්මයාට මුදල් අයිති බව ඔප්පු වුණොත් පමණයි. දූන් ඉතින්........."

අනතුරු ව හදිසියෙන් ම නැඟී සිටි රාජ නීතිඥයා "දූන් මහත්මයා නේ ඇඳුම් පැළඳුම් සේරම සෝදිසි කිරීම මට අයිති වැඩක්" යයි මිතියාට දැඩි සවරයෙන් කීය.

"බොහො ම හොඳයි. උවමනා නම් සාක්කුවල තියෙන හැම දෙයක් ම එළියට ගන්නම්."

මෙසේ පැවසූ මිතියා සාක්කුවල තිබුණු දේවල් එළියට අදින්නට විය.

"මගේ කල්පනාවේ හැටියට මහත්මයා ඇඳුම් ගැලෙව්වොත් හොඳයි."

"මොනවා! මගේ ඇඳුම් ගලවන්න? ඇයි මෙහෙම බලන්න බැරි ද?"

"එහෙම බලන්න බැහැ කරුණා කරල ඇඳුම් ගලවන්න."

"හොඳයි මහත්මයා කියනවා නම් ඇඳුම් ගලවන්නම්"යයි මිතියා ශෝකයෙන් කී ය. "මෙ තැන බැහැ. අර තිරය පිටිපස්සට යමු. කවුද ඇඳුම් සෝදිසි කරන්නේ?"

"ඔව්. තිරය පිටිපස්සට යමු"යි රාජ නීතිඥයා කැමැත්ත දක්වා හිස වනා කීවේ ය. ඔහු ගේ මුහුණේ අමුතු සත්සුත් කමක් දකින්නට තිබුණේ ය.

හය වන පරිච්ජේදය

දණ්ඩනායකයා මිතියා අසුකර ගනියි.

අනතුරු ව සිදුවූයේ මිතියා කිසි සේත් බලාපොරොත්තු නොවූ සිත මවිත කරවන දෙයකි. තමාට, එ නම් මිතියා කරමසෝව්ට කිසි ම කෙනකු මෙසේ සලකාවියයි ඔහු මොහොතකටවත් කල්පනා නොකෙළේ ය. මේ ක්‍රියාව වඩාත් දරුණු වූයේ එක් අතකින් එය මිතියාට නින්දා අපහාසයක් වන අතර, අනෙක් අතින් නිලධාරීන් ගේ 'අහංකාර කම හා අනුන්ට අපහාස කිරීමේ සිරිත' කැපී පෙනුණ හෙයිනි. කබාය පමණක් ඉවත් කිරීම නම් එ තරම් දෙයක් නො වේ. එහෙත් අනෙක් ඇඳුම් ද ඉවත් කරන ලෙස නියම කරන ලදි. එය අණ කිරීමක් බව ඔහුට හොඳට වැටහුණේ ය. සිතේ පැවැති ගර්වයත් පිළිකුලත් නිසා ඔහු කරබා ගත්තේ ය. රාජ නීතිඥයා සමග දණ්ඩනායකයා ද තිරය පිටිපසට ගියේ ය. ඔවුන් පිටි පසින් ගැමියෝ කීප දෙනෙක් ද ගියහ. ඔවුන් එන්නට ඇත්තේ අවශ්‍ය වුවහොත් තමා මෙල්ල කිරීමට හෝ වෙනයම් උවමනාවක් නිසා හෝ වියයුතු යැයි මිතියා කල්පනා කෙළේ ය

'මොකද, කමිසයත් ගලවන්න ඕනෑ ද?"යි මිතියා තියුණු හඬින් විමසුවේ ය.

රාජ නීතිඥයා කතා නොකෙළේ ය. ඔහු දණ්ඩනායකයා සමඟ මිතියා ගේ කබාය, කලිසම, වේස් කෝට්එක හා කැප්-තොප්පිය පිරික්සන්නට විය. නිලධරයන් දෙදෙනා මේ ඇඳුම් ගැන ලොකු සැලැකිල්ලක් දක්වන බව පෙනේ. "මුන් මට තුච්ඡවූවකටවත් සලකන්නේ නැහැ. මුන් කිසි ම චාරිත්‍රයක් දන්න මිනිස්සු නො වෙයි" මිතියා කල්පනා කෙළේ ය.

"මොක ද කියන්නේ, කමිසයත් ගලවන්න ද? මම මේ අහන්නේ දෙ වන වතාවටයි" මිතියා කෝපයෙන් හා පෙරටත් වඩා තියුණු හඬින් ඇසුවේ ය.

"කරදර වෙන්න එපා. කමිසය ගලවන්න උවමනා වුණොත් කියන්නම්"යයි රාජ නීතිඥයා විනිශ්චයකාරයකු ගේ සවභාවය ආරූඪ කර ගනිමින් කී ය. නැති නම් එ වැනි සවභාවයකින් කතා කරන්නාක් මෙන් ඇසුණේ ය.

ඒ අතරේ රාජ නීතිඥයා හා දණ්ඩනායකයා ද කිසියම් දෙයක් ගැන රහසින් සාකච්ඡා කරන්නට වූ හ. කබායේ වම් අතේ විශාල ලේ පැල්ලමක් තිබෙන බව පෙනේ. ඒ ලේ මිදී වේළී ගල් වී තිබිණි. කලිසමේ ලේ පැල්ලම් තිබිණි. දණ්ඩ-නායකයා ගැමියන් බලා සිටිය දී කෝට් කර, අත් හා කලිසමේ මැහුම් පිරික්සා බැලුවේ මුදල් සඟවා තිබේ දැයි දැනගැනීම පිණිස ය. තමා ඇඳුම්වල මුදල් සඟවා මසන්නට ඇතැයි සැක කරන බව දණ්ඩනායකයා මිතියාට නො සඟවා සිටියේ නැත.

"මේ මිනිහා මට සලකන්නේ නිලධරයකුට සලකන විදියට නො ව හොරකුට සලකන විදියටයි" මිතියා තමාට ම කියා ගත්තේ ය. ඔවුන් මිතියා අසා සිටිය දී මිතියා ගැන කිසි ම චකිතයක් නැති ව කතා කළ සැටි මහත් පුදුමයකි. නිදසුනක් වශයෙන්, තිරය පිටිපස සිට මහත් උනන්දුවෙන් මිතියා ගේ ඇඳුම් පිරික්සීමට නිලධරයන්ට උපකාර වූ ලියන්නා, මිතියා ගේ හිස් වැස්ම බලා මෙසේ කී ය. "තමුන්නාන්සේට මතක ද ග්‍රිඩින්කෝප්? ගම්සභාවේ ලියන්නා? පසු ගිය ග්‍රීෂ්ම කාලයේ දවසක් මිනිහා මුළු කන්තෝරුවේ ම පඩි ගෙනෙන්න ටවුමට ගිහින් ආපසු හිස් අතින් ඇවිදින් කිව්වා, අඩියක් ගහල ඉන්න කොට සල්ලි නැතිවුණා ය කියා. තමුන්නාන්සේට මතක ද මුදල් තිබුණ තැන? රූබල් සීයේ නෝට්ටු කුඩා වෙන්න රෝල් කරලා තොප්පියේ හම ඇතුලට තියල මහල තිබුණා." රාජනීතිඥයාටත් දණ්ඩනායකයාටත් ඒ සොරකම ගැන හොඳට මතක තිබිණි. එ හෙයින් මිතියා ගේ හිස්වැස්ම පසකින් තැබූ ඔවුහු යළි ඇඳුම් පිරික්සීමට තීරණය කළහ.

"මොනවද ඔය කමිස අතේ තියෙන්නේ?"යි රාජ නීතිඥයා මිතියා ගේ කමිස අතේ තිබෙන ලේ පැල්ලම දැක හදිසියෙන් ම ඇසුවේ ය.

"ලේ"යි මිතියා කී ය.

"මොන ලේ ද? ඇයි කමිස අත නමාගෙන ඉන්නේ?"

ග්‍රිගෝරිස් ගේ හිස අතගා බලන විට කමිස අතේ ලේ තැවරුණ බවත්, අත සෝදන විට කමිස අත් නමාගත් බවත් මීතියා කී ය.

"මහත්මයා ගේ කමිසයත් ගන්න ඕනෑ. ඒක බොහො ම වැදගත් සාක්ෂියක් වෙනවා."

මීතියා ගේ මුහුණ කෝපයෙන් රතු විය.

"මොකද මට හෙළුවෙන් ඉන්න කියනව ද?"සි මීතියා කෑගා ඇසුවේ ය.

"කරදර වෙන්න එපා, අපි ඒ ගැන මොනව හරි කරන්නම්. දැන් මේස්කකුල් දෙකත් ගලවන්න."

"මහත්මයා මට විහිළු කරනව ද? මේස් කකුලුත් ගලවන්න කියනව ද?" මීතියා ගේ නෙත් කෝපයෙන් දිලිහුණේ ය.

"දැන් විහිළු කරන වෙලාවක් නො වෙයි" රාජනීතිඥයා තදින් කී ය.

"මේස්කකුල් උවමනා නම් දෙන්නම්"යයි මීතියා ඇඳ උඩ හිඳ මේස්කකුල් ඉවත් කෙළේ ය.

තරුණයා තුල මහත් නොසන්සුන් කමක් ඇතිවිය. අනෙක් හැම දෙනා ම ඇඳුම් ඇඳ සිටිය දී තමාට පමණක් හෙළුවෙන් සිටීමට සිදුවිය. අනෙක් පුද්ගලය නම් හෙළුවෙන් සිටින විට තමා වැරදිකාරයෙක් ය යන හැඟීම ඇතිවීම ය. තමා පහත් කොට සැලකීමට ඔවුන්ට අයිතියක් තිබෙන බවත්, මීතියාට අදහස් විය.

"හැම දෙනා ම ඇඳුම් නැති ව සිටිනවා නම් කෙනකු තුල ලැජ්ජාව ඇති නො වෙයි. එහෙත් අනෙක් අය බලා සිටිය දී එකෙක් පමණක් ඇඳුම් ඉවත් කොට සිටින්නේ නම් එය නවතින්දුවකි"සි මීතියා තමාට ම කියාගත්තේ ය. "මේක හීනයක් වගෙයි. මෙ වැනි තින්දුවකට පත් වූ සැටි මම හීනෙන් දැකල තියෙනවා." මේස් කකුල් ඉවත් කිරීම ඔහුට මහත් සිත් වේදනාවක් විය. මේස් කකුල් පමණක් නො ව ඔහු ගේ යට ඇඳුම් ද ඉතා අපිරිසුදු විය. දැන් ඔවුහු ඒ අපිරිසුදු ඇඳුම් දුටහ. හැරත් තමා ගේ දෙපා ගැන ඔහු වැඩි කැමැත්තක්

නො දැක්වී ය. තමා ගේ පයේ මහපොට ඇඟිලි ඉතා අවලක්ෂණ යැයි ඔහු උපන්දා සිට කල්පනා කෙළේ ය. දකුණු පයේ නැමුණු නියපොත්තෙත් යුත් ඇඟිල්ල ඔහු වෙසෙසින් ම අප්‍රිය කෙළේ ය. දැන් ඔවුහු හැම දෙනා ම ඒ ඇඟිල්ල දුටහ. ලජ්ජාව ඉවසාගත නො හැකි වන විට ඔහු චණ්ඩ විය. ඔහු වහා තනියෙන් ම කමිසය ඉවත් කෙළේ ය.

"මහත්මයාට ලජ්ජාවක් නැති නම් තවත් දේවල් හෝදිසි කරනව ද?"

"දැන් උවමනාවක් නැහැ."

"මොකද මට මේ විදියට හෙළුවෙන් ඉන්න කියනව ද?" මීතියා දැඩි කෝපයෙන් ඇසුවේ ය.

"ඔව් මහත්මයා. මා හිතන්නේ දැනට ඔය විදියට ඉන්න සිදුවේ වි. කරුණා කරල මෙ නැතින් ටිකක් වාඩි වෙන්න. ඔය ඇඳ උඩ තියෙන බැලැත්කෝට්ටුව අරගෙන හොඳට පෙරව ගන්න.........මම අනෙක් කටයුතු බලාගන්නම්."

හැම දෙයක් ම සාක්ෂිකාරයන්ට පෙන්නා පරීක්ෂණය ගැන වාර්තාවක් ද පිළියෙල කරන ලදි. අන්තිමේ දී රාජ නීතිඥයා නික්ම ගියේ ය. ඒ සමඟ මීතියා ගේ ඇඳුම් ද ගෙන යන ලදි. අනතුරු ව දණ්ඩනායකයා යන්නට ගිය පසු මීතියා ළඟ ඉතිරි වුණේ ගැමියෝ ස්ප දෙනෙක් පමණි. ඔවුහු මීතියා ගෙන් මොහොතකට වත් නෙත් ඉවත නො ගත්හ. සීතලය දැනුණෙන් මීතියා බැලැත්කෝට්ටුව ගෙන පෙරවා ගත්තේ ය. එහෙත් බැලැත්කෝට්ටුව යටින් ඔහු ගේ දෙපා පෙනිණි. කොතරම් වෑයම් කළත් බැලැත්කෝට්ටුවෙන් දෙපා වසාගත නොහැකි ය. කිසියම් හේතුවක් නිසා රාජ නීතිඥයා බොහෝ වේලා යනතෙක් ආපසු නොපැමිණියේ ය. "මෙච්චර වේලා මිනිහා මොනව කරනව ද? මිනිහ හිතනව ඇති මම බලු පැටියෙක් ය කියා. දණ්ඩනායකයාත් යන්න ගිහින්. මිනිහ හරියට ඌරෙක් වගෙයි. හෙළුවෙන් ඉන්න මිනිහෙක් දිහා බලන්න බැරි නිසා යන්න ඇති"යි මීතියා දත් සපමින් කල්පනා කෙළේ ය. තමා ගේ ඇඳුම් පිරික්සා බලා තමාට ආපසු දේවියයි ඔහු කල්පනා කරන්නට ඇත. අලුත් ඇඳුම් උස්සාගත් ගැමියකු සමඟ රාජ නීතිඥයා පැමිණි විට මීතියා කෝප විය.

"මෙන්න තියෙනවා අලුත් ඇඳුම්"යයි නිලධරයා කීවේ තම රාජකාරියෙන් ඇති වූ තෘප්තියෙන් හටගත් ප්‍රීතියෙන් යුතු ව ය.

"හොඳ වෙලාවට කල්ගානෝෆ් මහත්මයා ළඟ ඇඳුම් තිබුණා. මෙන්න අලුත් කමිසයක් තියෙනවා. මහත්මයා ගේ යට ඇඳුමයි. මේස් කකුලුයි තියාගන්න පුළුවනි."

මීතියා කෝපයෙන් දැවෙන්නට විය.

"මට උවමනා නැහැ අනුන් ගේ ඇඳුම්. මගේ ඇඳුම් මට ඕනෑ"යි ඔහු තර්ජනය කරමින් කී ය.

"බොහො ම කනගාටුයි, මහත්මයා ගේ ඇඳුම් ආපසු දෙන්න බැහැ."

"මගේ ඇඳුම් මට ඕනෑ. කල්ගානෝෆ් යි මිනිහගේ ඇඳුනුයි යකාට ගිය දෙන්."

මීතියාට තත්ත්වය අවබෝධ කර දීමට බොහෝ වේලා ගත විය. කෙසේ හෝ අන්තිමේ දී ඔහු සන්සුන් කිරීමට ඔවුහු සමත් වූ හ. ඔහු ගේ ඇඳුම්වල ලේ තැවරී ඇති හෙයින් මිනීමැරුමට සබඳකම් ඇති වෙනත් භාණ්ඩ සමඟ ඇඳුම් ද උසාවියට ඉදිරිපත් කළ යුතු බවත්, නඩුවේ තීරණය අනුව මිස ඇඳුම් ආපසු දීමට නොහැකි බවත්, මීතියාට තේරුම් කර දෙන ලදි. අන්තිමේ දී මීතියාට කාරණය අවබෝධ විය. තිගැඩ වූ හෙතෙම වහා ඇඳුම් ඇඳගත්තේ ය. මේ ඇඳුම් තමා ගේ ඇඳුම්වලට වඩා හොඳ බවත්, ඉන් අනිසි ප්‍රයෝජන ගැනීමට තමා අකැමැති බවත්, ඇඳුම් අඳින අතරේ මීතියා කී ය. "මේ ඇඳුම් ඇඟට තදයි. ඇඳුම් ඇන්දහම ජෝකම් බම්මන්නෙක් වගේ සිටිවි. තමුන්නාන්සේලාට මා දිහා බලා විනෝද වෙන්න පුළුවනි."

මීතියා තත්ත්වය ලොකු කොට පෙන්නන බවත්, කල්ගානෝෆ් ටිකක් උස නිසා කලිසම මඳක් කොට බවත්, ඔවුහු කීහ. කබාය උරහිසට තද විය.

"හරියට බොත්තම් දමන්නත් බැහැ"යි මීතියා ආයෙත් කී ය. "මම කල්ගානෝෆ් මහත්මයා ගේ ඇඳුම් ඉල්ලුවේ නැහැ. මම බහුබූතයකු වගේ ඇඳගෙන ඉන්නේ මගේ උවමනාවට නො ව තුඹලා ගේ උවමනාවට බව කරුණා කරල කල්ගානෝෆ් මහත්මයාට කියන්න."

"කල්ගානෝෆ් මහත්මයාට ඒක හොඳට තේරෙනවා. ඒ ගැන බොහො ම කනගාටු වෙනවා........මහත්මයාට ඇඳුම් දීමට සිදුවීම ගැන කනගාටු වෙනවා පමණක් නො ව මේ මුළු සිද්ධිය ගැන ම කනගාටු වෙනවා"යි රාජ නීතිඥයා සෙමෙන් කී ය.

"එයා ගේ කනගාටුව යකාට ගිය දෙන්. ඉතින් මොකද දැන් මම කරන්නේ? මට මෙ තැන ඉඳගෙන ඉන්න ද කියන්නේ?"

මිතියාට 'අනෙක් කාමරයට' යාමට නියම කරන ලදි. කෝපයෙන් රවමින් කාමරයට ගිය මිතියා කිසිවකු දෙස නො බැලීමට වෑයම් කෙළේ ය. ගැමියන් හා හෝටලය අයිතිකාරයා ඉදිරිපිට පවා වෙන අයකු ගේ ඇඳුම් ඇඳ සිටීම මහත් නින්දාවක් බව ඔහු දැන සිටියේ ය. කිසියම් හේතුවක් නිසා හෝටලය අයිතිකාරයා දොර තුළින් එබී බලා යන්නට ගියේ ය. "මම ඇඳ සිටින හැටි බලන්න ඇති"යි මිතියා කල්පනා කෙළේ ය. මීට මඳ වේලාවකට පෙර සිටියාක් මෙන් මිතියා මේසය ළඟ පුටුවක් තබා හිඳගත්තේ ය. හාස්‍යජනක නපුරු සිහිනයක් දුටු පසු ඇති වන හැඟීමට සමාන හැඟීමක් ඔහු තුළ ඇති විය. තමා දැන් සිටින්නේ හොඳ සිහියෙන් නොවන බව ඔහුට හැඟිණි.

"දැන් ඉතින් මහත්මයා ගේ කල්පනාව මොනවා කරන්න ද?"යි මිතියා දත් සපමින් දණ්ඩනායකයා ගෙන් ඇසුවේ ය. "මොකද මට කසයෙන් තලන්න හදනව ද? ඒ හැර කරන්න පුළුවන් වෙන දෙයක් නැහැ." මිතියා රාජ නීතිඥයා දෙස නො බැලුවේ ඔහු සමඟ කතා කිරීමට කැමැත්තක් නො තිබුණාක් මෙනි. "මිනිහ මගේ මේස් කසුල උවමනාවට වඩා සෝදිසි කළා, පෙරළා බැලුවා. මෙහෙම කළේ මගේ ඇඳුම් හුඟක් කිලුටු බව පෙන්නන්නටයි." මිතියා කල්පනා කෙළේ ය.

"දැන් මගේ කල්පනාව අනෙක් සාක්ෂි කරුවන් පරීක්ෂා කිරීමටයි" රාජ නීතිඥයා කීවේ මිතියා ගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නාක් මෙනි.

"ඔව්"යි දණ්ඩනායකයා ද කීවේ කිසියම් දෙයක් ගැන කල්පනා කරමින් සිටින්නකු මෙනි.

"මහත්මයා ගේ යහපතට කළ හැකි හැම දෙයක් ම අපි කළා"යි රාජ නීතිඥයා කී ය. "ඔතරම් විශාල මුදලක් ලැබුණු හැටි කීමට මහත්මයා කැමැති නොවූ නිසා........"

"මොකක් ද ඔය මුද්දට අල්ලා තියෙන ගල?"යි මිතියා රාජ නීතිඥයා ගේ කතාවට බාධා කරමින් හදිසියෙන් ම ඇසුවේ නින්දෙන් අවදි වූවකු මෙන්, නිලධාරයා ගේ දකුණු අතේ තිබුණු මුදු තුනෙන් එකක් පෙන්නමිනි.

"මොන මුද්දකක්ද?"යි රජනීතිඥයා පුදුමයෙන් ඇසුවේ ය.

"මැද ඇඟිල්ලේ තියෙන මුද්ද?.........අර ඉරි වැටිච්ච ගල මොකද්ද? මොන ජාතියේ ගලක් ද?"යි මිතියා ඇසුවේ හිතුවක්කාර දරුවකු මෙනි.

"ඒක දුමාර පුෂ්පරාගයක්. ඇයි, බලන්න ඕනෑ නම් ගලවා දෙන්නම්"යයි රජ නීතිඥයා සිනාමුසු වෙමින් කී ය.

"නැහැ නැහැ, ගලවන්න උවමනා නැහැ"යි මිතියා හදිසියෙන් ම කීවේ තමා සමඟ කෝපයෙන් සිටින්නකු මෙනි. "ගලවන්න උවමනා නැහැ. තමුන්නාන්සේලා මගේ ආත්මය අපිරිසුදු කළා! හිතනවද මම තාත්තා මැරුවා නම් ඒ බව නො කියා බොරු කියමින් සැඟවෙන්න හදනවය කියා? මිතියා කරමසෝ ඒ ජාතියේ මිනිහෙක් නො වෙයි. මම තාත්තා මැරුවා නම් තමුන්නාන්සේලා මෙහාට එන්න ඉස්සෙල්ලා, ඉර පායන්නටත් කලින් වෙඩි තියාගෙන මැරෙනවා. මේ කාලකණ්ණි රාත්‍රියේ දී මා ඉගෙන ගත්ත දේවල් මගේ ජීවිතේ අවුරුදු විස්සකටවත් ඉගෙන ගන්න බැරි බව දැන් මට වැටහෙනවා... .....මම මගේ තාත්තා මැරුවා නම් මේ රෑ මේ විදියට හැසිරෙනව ද? මේ විදියට කතා කරන්න පුළුවන් ද? මගේ අහින් ගිරිගෝරිස් මැරුණා ය කියන වැරදි හැඟීම නිසා මගේ හිතට කිසි ම සැනසුමක් ලැබුණේ නැහැ. තමුන්නාන්සේලා ගෙන් දඬුවම් විඳින්නට සිදුවේ ය යන බියෙන් නො වෙයි, නින්දුව නිසයි. කිසි ම දෙයක් නොපෙනෙන, කිසි ම දෙයක් විශ්වාස නොකරන තුඹලා වැනි අන්ධ වැලි මීයන්ට, මා අපරාධයක් කළත් කියනව ද? තුඹලා ගේ චෝදනාවෙන් නිදහස් වෙන්න පුළුවන් වුණත් මම කියන්නේ නැහැ. ඊට වැඩිය හොඳයි සයිබීරියාවට යනවා. දොර ඇරගෙන ගිය මිනිහා තාත්තා මරලා මුදල් සොරකම් කරගෙන තියෙනවා. කවුද ඒ මිනිහා? මට උවමනා කරන්නේ ඒ මිනිහා කවුද කියා දැනගැනීමට යි. කො තරම් කල්පනා කළත් තාත්තා මැරුවේ කවුද කියා කියන්න පුළුවන් කමක් නැහැ. එහෙත් මට එක දෙයක් කියන්න පුළුවනි. මගේ තාත්තා මැරුවේ මිනිසා කරමසෝ නො වෙයි. මට කියන්න පුළුවන් එ පමණයි. දැන් ඉතින් මට කරදර කරන්න එපා. මා සයිබීරියාවට යවන්න. මා අල්ලා මරන්න. එහෙත් මට තවත් හිරිහැර කරන්න එපා. මම කියන්න තියෙන හැම දෙයක් ම කිව්වා. දැන් ඉතින් අනෙක් සාක්ෂි කාරයන්ට කථා කරන්න."

මිතියා හදිසියෙන් ම තමාට මෙසේ කියාගත්තේ නැවත වචනයක් වත් කතා නො කිරීමට තීරණය කරගත්තාක් මෙනි. මුළු කාලය තුල ම මිතියා දෙස පරීක්ෂාවෙන් බලා සිටි දණ්ඩනායකයා මිතියා තිහඬ වූ වහා ම වැඩි සැලැකිල්ලක් නො දක්වා සාමාන්‍ය දෙයක් ගැන අසන්නාක් මෙන් මෙසේ ප්‍රශ්න කෙළේ ය.

"මහත්මයා දුන් විකකට කලින් මතක් කලා දෙර ගැන. මහත්මයාටත් අපටත් ඉතා වැදගත් සාක්ෂියක් ගිරිගෝරිස්-ගෙන් දැනගන්න ලැබුණා. සිහිය ලැබුණු පසු අපි ගිරිගෝරිස්ගෙන් දෙර ගැන ප්‍රශ්න කලා. වත්තේ ශබ්දයක් ඇහිලා දෙර ඇරගෙන එළියට ආපු ගිරිගෝරිස් ඇර දමා තිබුණු කුඩා ගේට්ටුව ලඟට යන්න කල්පනා කරල තියෙනවා. මහත්මයා ජනේලය ලඟ ඉඳලා කළුවරේ මිදුල හරහා දිව්වේ ඒ වෙලාවෙයි. ගිරිගෝරිස් දැකල තියෙනවා මහගෙයි ජනේලයත්, වත්තේ සිට මහ ගෙට ඇතුළුවන දෙරත් ඇර දමා තියෙනවා. මිනිහට ඒක හොඳට විශ්වාසයි. මිනිහ කියනවා මහත්මයා දෙර ඇරගෙන දුවන්න ඇති කියා. ඒක මහත්තයට කියයුතු වැදගත් දෙයක්. දුර සිට මහත්තයා වැට දිහැවට දුවනවා දුටුවා මිස කාමරයේ ඉඳල එනවා දැකල නැහැ."

මේ කතාව අසා සිටි මීතියා ඉබේට ම පුටුවෙන් නැගිටුණේ ය.

"ඒ මිනිහට පිස්සු" යි මීතියා හදිසියෙන් ඇති වූ කෝපයෙන් කී ය. "ඒක අමූලික බොරුවක්. දෙර වහලයි තිබුණේ. ඉතින් කොහොම ද කියන්නේ දෙර ඇරල තිබුණය කියා? ගිරිගෝරිස් කියන්නේ බොරු."

"දෙර ඇර දමා තිබුණ බව ගිරිගෝරිස්ට හොඳට විශ්වාසයි. මිනිහ දිවුරා කියනවා. ඒක ස්ථිරයි. අපි කීප වරක් ම ප්‍රශ්න කලා. මේ බව මහත්මයාට දැනුම්දීම අපේ යුතුකමක්."

"මාත් කීප වතාවක් ම ගිරිගෝරිස් ගෙන් ප්‍රශ්න කලා" යි රාජ නීතිඥයා ද කී ය.

"මේක බොරුවක්, බොරුවක්, මා අල්ලන්න කියාපු බොරුවක්. නැති නම් පිස්සකු ගේ විකාර කතාවක්" යයි මීතියා කෑගා කීවේ ය.

"තුවාලය නිසා සිහිය නැති ව කියාපු කතාවක් වෙන්න ඇති."

"ගිරිගෝරිස් දොර ඇරල තියෙනවා දැකල තියෙන්නේ සිහිය ලැබුණාට පස්සේ නො වෙයි, ගෙයි ඉඳලා එළියට ආපු වෙලාවෙයි."

"ඒක ඇත්ත වෙන්න බැහැ. මා එක්ක තරහට කියාපු බොරුවක්. දොර ඇරල තියෙනවා දකින්න විදියක් නැහැ. මම දොර තුළින් දිව්වේ නැහැ"යි මිතියා කෑගා කීවේ ය.

දණ්ඩනායකයා රාජ නීතිඥයා දෙස බලා "පෙන්නන්න"යි කී ය.

"මහත්මයාට මේක අඳුනන්න පුළුවන් ද?"යි අසමින් රාජ නීතිඥයා මේසය උඩ දිග ලියුම් කවරයක් තැබුවේ ය. රජයේ කන්තෝරුවල පාවිච්චි කරන ලියුම් කවරවලට සමාන වූ එම කවරයේ නොකඩන ලද සීල් තුනක් තිබිණි. කෙලවරකින් කඩන ලද එම කවරයේ කිසිවක් නො තිබිණි. මිතියා කවරය දෙස පුදුමයෙන් බැලුවේ ය.

"මේක තාත්තා ගේ ලියුම් කවරය වෙන්න පුළුවනි"යි මිතියා ගොත ගසමින් කී ය. "රූබල් තුන්දාහක් තිබුණේ මේක ඇතුලෙයි. කවරය පිට පැත්තේ මොනව හරි ලියා ඇති. කෝ බලන්න. හා මේ තියෙන්නේ. 'මගේ කුඩා කිකිළිට රූබල් තුන්දාහක්' – පේනවා නේද?"

"ඔව් අපි දුටුවා. ඒත් කවරයේ මුදල් තිබුණේ නැහැ. හිස් කවරය ඉස්කිරිම පිටිපස්සේ ඇඳ ළඟ බිම වැටී තිබුණා."

හෙණ පහරක් වැදුණාක් මෙන් මිතියා මඳ වේලාවක් නිහඬ ව බලා සිටියේ ය.

"මහත්වරුනි, මේ අපරාධය කරල තියෙන්නේ පැවල්" මිතියා මහ හඬින් කෑගා කීවේ ය. තාත්තා මරා මුදල් සොරා ගෙන තියෙන්නේ පැවල්. තාත්තා මේ මුදල් සඟවා තිබුණ තැන දැනගෙන හිටියේ පැවල් පමණයි. මේ අපරාධය කරල තියෙන්නේ පැවල් බව මට කිසි ම සැකයක් නැති ව කියන්න පුළුවනි."

"ඒත් මහත්මයා මේ කවරය තාත්තා ගේ කොට්ටය යට තියෙන බව දැනගෙන හිටියා."

"නැහැ, මම දැනගෙන හිටියේ නැහැ. මම මේ කවරය මීට ඉස්සෙල්ලා දැකලත් නැහැ. දැනුයි දැක්කේ. තමුන් කවරය

ගැන දැනගත්තේ පැවල් ගෙන්. තාත්තා කවරය සඟවා තිබුණු තැන දැනගෙන හිටියේ පැවල් පමණයි. මම දැනගෙන හිටියේ නැහැ.”

“නමුත් දත් ටිකකට ඉස්සෙල්ලා මහත්මයා පැහැදිලි ව ම කිව්වා මේ කවරය තාත්තා ගේ කොට්ටය යට තිබුණ බව. එහෙම කියන්න කලින් දැනගෙන ඉන්න ඇති.”

“අපි ඒ බව ලියා ගෙන තියෙනවා”යි රාජ නීතිඥයා ද දණ්ඩනායකයා ගේ කතාව සනාථ කරමින් කී ය.

“පිස්සු ද? මේ කවරය තාත්තා ගේ කොට්ටය යට තිබුණ බව මම කොහෙත් ම දැනගෙන හිටියේ නැහැ. සමහර විට ඒක වෙන තැනක තියෙන්න ඇති. මම කොට්ටය යට තියෙනවා කිව්වේ වැඩිය කල්පනා කරලා නො වෙයි. මේ ගැන පැවල් මොකද කියන්නේ? මුදල් තිබුණේ කොහෙ ද කියා මිනිහගෙන් ඇහැව්ව ද? ඒක බොහො ම වැදගත් ප්‍රශ්නයක්. මම මට ම විරුද්ධ ව ඕනෑ කමින් ම බොරු කිව්වා. මුදල් කොට්ටය යට තියෙන බව කිව්වේ වැඩිය කල්පනා කරලා නො වෙයි.......... දන්නවා නේ ද සමහරක් අය කල්පනා නො කර නොයෙක් දේවල් කියනවා. කවරයේ තියෙන මුදල් ගැන දැනගෙන හිටියේ පැවල් පමණයි. වෙන කිසි ම කෙනෙක් දැනගෙන හිටියේ නැහැ. ඒත් මුදල් තියෙන තැන මිනිහ මට කිව්වේ නැහැ. තාත්තා මැරුවේ පැවල්. වෙන කිසි ම කෙනෙක් නො වෙයි. ඒ ගැන මට කිසි ම සැකයක් නැහැ. මේ අපරාධය වෙච්ච හැටි දැන් මට හොඳට තේරෙනවා”යි මිත්‍යා කෝපයෙන් කී ය. ඔහු ගේ කතාව එ තරම් පැහැදිලි නො වී ය. ඔහු තව තවත් කලබල විය, කෝප විය. “මගේ කතාව පිළිගෙන දැන් ම පැවල් අත්අඩංගුවට ගන්න. මම ග්‍රිගෝරිස් ගේ ඔළුවට ගහලා පැනල ගියාට පස්සේ ග්‍රිගෝරිස් සිහිය නැති ව බිම වැටිලා ඉන්න කොට පැවල් තාත්තා මරන්න ඇති. මට ඒක හොඳට විශ්වාසයි. මිනිහ දොරට තට්ටු කළා ම තාත්තා දොර අරින්න ඇති. දොරට තට්ටු කරන හැටි දැනගෙන හිටියේ පැවල් පමණයි. නියම විදියට තට්ටු නො කර තාත්තා කවදාවත් දොර අරින්නේ නැහැ......”

“ඒත් මහත්මයා වත්තේ සිටින කොට දොර ඇර තිබුණා නම් දොරට තට්ටු කිරීමට උවමනාවක් නැති බව පෙනෙන්නේ නැද්ද?”යි දණ්ඩනායකයා ජයක් ලැබූවකු මෙන් කී ය.

“දොර! දොර!” යයි සෙමෙන් කී මිතියා අසරණ වූවකු මෙන් පුටුවෙහි හිඳ දණ්ඩනායකයා දෙස තුෂ්ණීම්භූත ව බලාසිටියේ ය. සියලු දෙනා ම තුෂ්ණීම්භූත වූ හ.

“ඒ දොර...... ඒ දොර භයානක හීනයක් වගෙයි. දෙයියන් වහන්සේ මට විරුද්ධ වුණා”යි මිතියා හිස් බැල්මෙන් බලා කී ය.

“ඇර දමා තිබුණු දොරෙන් මහත්මයා පැනල ගිය බවට සාක්ෂි එක් පැත්තකින් තියෙනවා. ඒ සාක්ෂිය අපි දෙගොල්ලට ම බොහො ම වැදගත් වෙනවා. අනෙක් අතින් මෙ තරම් විශාල මුදලක් මෙ තරම් හදිසියෙන් ලැබුණු සැටි ගැන මහත්මයා අපට වචනයක් වත් කියන්නේ නැහැ. මහත්මයා ගේ කතාවේ හැටියට ඊට පැය තුනකට ඉස්සෙල්ලා අතේ තඹයක් නැති ව රුබල් දහසකට පිස්තෝල දෙක උගස් තිබ්බා. ඉතින් මේ කරුණු අනුව කාඩ විශ්වාස කරන්න ද? මේ පරීක්ෂණය කොහොම අවසන් කරන්න ද කියා අපට තේරුම් ගන්න බැරි බව වැටහෙන්නේ නැද්ද? ඉතින් අපට, මහත්මයා ගේ හදවතින් ඇති වන ත්‍යාගශීලී කල්පනාව විශ්වාස කිරීමට තරම් ශක්තිය නැති, දරදඬු, හැම දෙයක් ම තුරුස්නා, අනුන්ට ගරහන මිනිස්සු හැටියට දොස් කියන්න එපා.”

මිතියා ගේ කෝපය වචනයෙන් විස්තර කළ නො හැකි ය. ඔහු සුදු මැළි විය.

“හොඳයි එහෙනම් මම මගේ රහස කියන්නම්. මට මුදල් ලැබුණ හැටි කියන්නම්”යයි මිතියා හදිසියෙන් ම කී ය. “මීට පසු ව තමුන්නාන්සේලාට වත් මට වත් දොස් නො කියන්න මම මගේ රහස කියන්නම්.”

එවිට රාජ නීතිඥයා අනුකම්පාවට එක් වූ ප්‍රීතියෙන් යුතු ව මෙසේ කී ය. “දැන් මහත්මයා කියන දෙය පසු ව මහත්මයා ගේ වාසියට හේතු වෙන්න........”

එහෙත් මේසය යටින් කකුල් දමා යන්තම පයින් ඇන රාජ නීතිඥයා ගේ කතාව කල් ඇති ව නතර කිරීමට දණ්ඩනායකයා සමත් විය. ඇත්ත සේ කියන්නේ නම් මිතියාට රාජ නීතිඥයා ගේ කතාව නො ඇසිණි.

හත් වන පරිච්ජේදය

මිතියා ගේ රහස

"මහත්වරුනි, මම තමුන්නාන්සේලාට සම්පූර්ණ ඇත්ත කියන්නම්"යයි මිතියා කෝපයෙන් කී ය. "මේ මුදල් මගේ මුදල්."

නීතිඥයන් දෙදෙනා ගේ මුහුණු අඳුරු විය. ඔවුන් මිතියාගෙන් බලාපොරොත්තු වුණේ මෙ වැනි පිළිතුරක් නො වේ.

"ඇයි එහෙම කියන්නේ? දැන් ටිකකට ඉස්සෙල්ලා කිව්ව සවස පහට……" යි රාජ නීතිඥයා වාටු බසින් කීමට සැරසුණේ ය. එහෙත් ඊට කලින් මිතියා කතා කෙළේ ය.

"මගේ කතාවටත්, සවස පහටත් හෙණ ගහපුදෙන්. ඒ කතාවෙන් දැන් වැඩක් නැහැ. මේ මුදල් මගේ මුදල්. මම හොරකම් කරපු මුදල්. රූබල් එක්දහස් පන්සියයක් තිබුණා. මම ළඟ තියා ගෙන හිටියා."

"කොහෙන් ද මෙ තරම් ලොකු මුදලක් ලැබුණේ?"

"බෙල්ලෙ තිබිල ලිහා ගත්තා……සල්ලි රෙදි කෑල්ලක ගැටගහලා බෙල්ල වටේ බැඳගෙන හිටියා. මාසයක් විතර බැඳගෙන හිටියා……මේක මහ නින්දාවක්."

"කාගෙන් ද මුදල් ගත්තේ?"

"මුදල් හොරකම් කළේ කාගෙන් කියලද අහන්නේ? දැන් අපි කෙළින් කතා කරමු. මගේ කල්පනාව මම ඒ මුදල් හොරකම් කළ බවයි. තමුන්නාන්සේලාට උවමනා නම් මම මුදල් ලබාගත්තා ය කියන්න පුළුවනි. ඒත් මගේ කල්පනාවේ හැටියට නම් මම මුදල් හොරකම් කළා. අන්තිම වරට හොරකම් කළේ ඊයේ රාත්‍රියේයි."

"ඊයේ රෑ හොරකම් කළා? දැන් කිව්ව තේද මාසයකට කලින් හොරකම් කළා ය කියා?"

"ඔව්, නමුත් මම සල්ලි හොරකම් කළේ ඇගෙන්. මට බාධා නො කර කතාව කියන්න ඉඩ දෙන්න. මේක ලෙහෙසියෙන් කියන්න පුළුවන් කතාවක් නො වෙයි. මාසයකට පමණ කලින් මා සමඟ විවාහ ගිවිසගෙන සිටිය කැතිරිනා මට එන්න ය කියා පණිවිඩයක් එව්වා. තමුන්නාන්සේලා ඇය අඳුනනවා නේද?"

"ඔව්, අපි අඳුනනවා."

"ඔව්, මම දන්නවා තමුන්නාන්සේලා ඇය අඳුනන බව. ඇ බොහො ම වැදගත් කුලකාන්තාවක්. බොහො ම කාලයක ඉඳලා ඇ මා එක්ක තරහ වෙලයි හිටියේ. තරහ වුණේ වැදගත් කාරණාවක් නිසයි."

"කැතිරිනා ඉවානොව්නා!" යි රාජ නීතිඥයා පුදුමයෙන් කී ය. දණ්ඩනායකයා ද පුදුමයෙන් නෙත් මහත් කොට බැලුවේ ය.

"ඇගේ නම නිකරුණේ කියන්න එපා. ඇගේ නම ඇදගත්තේ මා තක්කඩියෙක් නිසයි. පළමු වරට මගේ ගෙදරට පැමිණි දා සිටන් ම ඇ මට වෛර කළ බව මම දන්නවා........ නැහැ නැහැ, මේ තරුණිය ගැන කිසි ම දෙයක් කියන්න වටින්නේ නැහැ. තමුන්නාන්සේලා එ තරම් සුදුසු අය නො වෙයි...... ඒ ගැන කතා කරලා වැඩක් නැහැ..... .. මීට මාස තුනකට පමණ කලින් ඇ මට කතා කරලා, මොස්කව් නුවර සිටින ඇගේ නංගිටයි, වෙන නෑයකුටයි, ගිහින් දෙන්නය කියා රූබල් තුන්දහක් දුන්නා. (ඇ මට මුදල් දුන්නේ ඇයට යන්න පුළුවන් කමක් නොතිබුණ නිසයි.) ඒ කාලේ මම වෙනත් තරුණියකට ආලය කළා. ඇ පහළ කාමරයේ සිටින ගෘසෙන්කා. මම ගෘසෙන්කා සමඟ මෙහාට ඇවිදින් ඒ කාලකණ්ණි රූබල් තුන්දහෙන් එක්දහස් පන්සියක් වියදම් කළා. අනෙක් එක්දහස් පන්සිය මම බෙල්ල වටේ ගැටගසා ගෙන සිටියා. මම ඊයේ ඒ මුදලත් වියදම් කළා. දැන් මහත්මයා මගෙන් ගත්තේ ඉතිරි වෙච්ච රූබල් අටසීයයි. මට කැතිරිනා දුන්න රූබල් තුන්දහෙන් දැන් තියෙන්නේ මේ රූබල් අටසීය පමණයි."

"මට පිකකට් සමාවෙන්න. මහත්මයා ගිය පාර ගෘසෙන්කා එක්ක මෙහාට ආපු වෙලාවේ දී රූබල් එක්දහස් පන්සීයක් නො ව තුන්දහක් වියදම් කළා. ඒ බව කවුරුත් දන්නවා."

"කවුද දන්නේ? කවුද ගණන් කරල බැලුවේ? මම කිසි ම කෙනකුට මගේ මුදල් ගණින්න ඉඩ දුන්නේ නැහැ."

"ඇයි, මහත්මයා හැමෝටම කිව්වා රූබල් තුන් දහක් වියදම් කල බව."

"ඔව්, කියාපු එක ඇත්තයි. මම මුළු පලාතට ම කිව්වා. මුළු පලාත ම දන්නවා. මේ පැත්තේ සිටින අයත් කල්පනා කරනවා රූබල් තුන් දහක් වියදම් කලා ය කියා. ඒත් මම තුන් දහක් වියදම් කලේ නැහැ. වියදම් කලේ එක්දහස් පන්සීයයි. අනෙක් එක්දහස් පන්සීය පසුම්බියක දමා වසා බෙල්ලේ එල්ලා ගත්තා. ඒයේ වියදම් කලේ මේ මුදලයි."

"මේක මහ අද්භූත දෙයක්"යයි රාජ නීතිඥයා කී ය.

"මාත් මේ සම්බන්ධ ව ප්‍රශ්නයක් අහන්න ඕනෑ" යි දණ්ඩනායකයා කී ය. "මහත්මයා මේ ගැන.........ඒ කියන්නේ මාසයක සිට රූබල් එක්දහස් පන්සීයක් ලඟ තියාගෙන සිටිය බව කාටවත් කිව්ව ද?"

"කාටවත් කිව්වේ නැහැ."

"ඒක මහ පුදුම දෙයක්. කාටවත් කිව්වේ නැද්ද?"

"නැහැ, කාටවත් කිව්වේ නැහැ."

"ඇයි කාටවත් නො කියා මේ කාරණාව රහසක් හැටියට තියාගත්තේ? තමා නින්දාවක් ලෙස පිළිගත් මේ රහස දූත් මට කිව්වා නේද? වෙන කෙනකුට අයිති රූබල් තුන්දහක් ලඟ තියාගෙන සිටීම නොසැලකිලි කමක්. මහත්මයා ගේ ගතිගුණ අනුව බලන විට ඒක නින්දාවක් වෙන්න බැහැ. ඒක අපකීර්තියක්. ඒත් අපකීර්තිය නින්දාවක් නො වෙයි. කැතිරිනා දුන්න රූබල් තුන් දහ වියදම් කල බව මුළු ගම ම දන්නවා. මහත්මයා කියන්න ඉස්සෙල්ලා මම මේ කතාව අහල තියෙනවා. මේක ගම පුරා පැතිර ගිය ඕපාදූප කතාවක්. ඒත් මහත්මයා මේ කතාව තවත් කෙනකුට කියාපු බව ඔප්පු කරන්න පුළුවන් කරුණු තියෙනවා. මේ රහස හෙළි කාලොක් කිසියම් භයානක දෙයක් සිදුවේ ය යන බියෙන් රහස නො කියා සිටියා ය කියන කතාව විශ්වාස කරන්න අමාරුයි. මේ රහස කියනවාට වඩා සයිබීරියාවට යාම හොඳයි කියා දූත් පිකකට ඉස්සෙල්ලා කිව්වා........."

අනතුරු ව දණ්ඩනායකයා නිහඬ විය. මිතියා සිතේ පැවැති කෝපය සඟවා නොගත්තේ ය. ඔහු එය හෙළි කළේ කිසි ම පිළිවෙළක් ඇති ව නො වේ.

"රූබල් එක්දහස් පන්සිය නින්දාවක් නො වෙයි. තුන්දහසෙන් එක්දහස් පන්සියක් තියාගැනීමයි නින්දාව."

"කොහොම ද නින්දාවක් වෙන්නේ?"යි දණ්ඩනායකයා සිනා මුසු වෙමින් විමසුවේ ය. නින්දිත ලෙස හෝ නීච ලෙස හෝ අයිති කරගත් රූබල් තුන්දහසෙන් එක්දහස් පන්සියක් තියා ගැනීමෙන් කළ නින්දිත කම කුමක් ද? රූබල් තුන් දහ තියම තැනැත්තාට නො යවා තබා ගැනීම, එය වියදම් කිරීමට වඩා වැදගත්. ඒත් රූබල් එක්දහස් පන්සියක් තියා ගත්තේ මොන අදහසක් ඇති ව ද, මොන කරුණක් නිසා ද, කියා අපට කියන්න පුළුවන් ද?"

"මෙහි ඇති ඉතා ම වැදගත් දෙය මුදල් තියා ගැනීමට පිටු දුන් හේතුවයි" මිතියා කී ය. "මම මුදල් තියා ගත්තේ මගේ දුෂ්ටකම නිසයි. ඒ කියන්නේ මගේ ආත්මාර්ථය නිසයි. මෙවැනි දෙයක දී ආත්මාර්ථකාමී වෙන්නේ සිතේ තියෙන දුෂ්ට චේතනාව නිසයි. මුළු මාසයක් ම මම ඒ දුෂ්ට චේතනාවෙන් හිටියා."

"මහත්මයා ගේ කතාව තේරුම් ගන්න බැහැ."

"මගේ කතාව තේරුම් ගන්න බැරිනම් ඒක මහ පුදුමයක්. කොහොම වුණත් මම කාරණාව ආයේත් පැහැදිලි කරල දෙන්නම්. සමහර විට මගේ කතාව තේරුම් ගන්න අමාරු වෙන්න පුළුවනි. හොඳට අහගන්න. කැතිරිනා මා විශ්වාස කරගෙන මට දුන්න රූබල් තුන් දහ මම තිකරුණේ වියදම් කළා ය, නැති නම් වංචා කළා ය කියමු. පසු ව ද උදේ මම ඇය ළඟට ගිහින් කියනවා 'කැතිරිනා මට බොහො ම කනගාටුයි. මම නුඹේ මුදල් වියදම් කළා' ය කියා. ඒක හොඳ වැඩක් ද? නැහැ. ඒක හොඳ වැඩක් නො වෙයි. ඒක ලොකු වංචාවක්. බියගුලු කමක්. එවැනි දෙයක් කළ මා තිරිසනකුට සමානයි. තිරිසනකු තුළ තිබෙන ආත්ම දමනය මා තුළ නැහැ. එහෙම-නේ ද? එහෙත් මම හොරෙක් නො වෙයි. නියම හොරෙක් නොවන බව මහත්මයා පිළිගන්නවා ඇති. මම මුදල් නාස්ති කළා, එහෙත් හොරකම් කළේ නැහැ. දූත් මම පළමු ක්‍රමයට වඩා ටිකක් හොඳ ක්‍රමයක් පෙන්නන්නම්. හොඳට අහගන්න.

මගේ කතාව අවුල් වෙන්න පුළුවනි. මගේ ඔළුව කරකැවෙනවා. ඒක නිසා හොඳට අහගන්න. මම රූබල් තුන්දහෙන් භාගයක් වියදම් කරලා පසු ව ද ඇය ළඟට ගිහින් කියනවා 'කැතිරිනා, නුඹ මට දුන්න මුදලින් භාගයක් වියදම් කළා, මම හොරෙක්, තක්කඩියෙක්. කරුණා කරලා මේ රූබල් එක්දහස් පන්සිය තියාගන්න. නැතිනම් ඒකත් වියදම් වෙන්න පුළුවනි' මම එහෙම කළා නම් හොඳ නැති ද? මම තක්කඩියෙක්, වංචාකාරයෙක්. ඒත් හොරෙක් නො වෙයි. මම හොරෙක් නම් ඉතිරි මුදල ආපසු නො දී තියාගන්නවා. මම මුදලින් භාගයක් ආපසු දුන්න නිසා ඈ දන්නවා කොහොම හරි අනෙක් භාගයත් දෙන බව. එතකොට මා තක්කඩියෙක් මිස හොරෙක් වෙන්නේ නැහැ. නුඹලා මොනවා කිව්වත්, කොහොම කල්පනා කළත් මා හොරෙක් නො වෙයි."

"මෙහි යම් කිසි වෙනසක් තියෙන බව මම පිළිගන්නවා"යි දණ්ඩනායකයා නොකැමැති ලෙස සිනාමුසු වෙමින් කී ය. "නමුත් මහත්මයා මෙහි බොහො ම වැදගත් වෙනසක් තියෙන බව පිළිගැනීම ලොකු පුදුමයක්."

"ඔව්, මෙහි වැදගත් වෙනසක් තියෙන බව මම පිළි-ගන්නවා. නමුත් මෙ තරම් විශාල වෙනසක් තියෙන බව මහත්මයා පිළිගැනීම අපට මහ පුදුමයක්."

"මෙහි බොහො ම වැදගත් වෙනසක් තියෙන බව මම පිළිගන්නවා. හැම මිනිහ ම තක්කඩියෙක් වෙන්න පුළුවනි. එහෙත් හැම මිනිහට ම හොරෙක් වෙන්න බැහැ. හොරෙක් වෙන්න පුළුවන් බොහො ම දක්ෂ තක්කඩියකුට පමණයි. කොහොම වුණත් මෙ වැනි සියුම් වෙනස්කම් පෙන්නන්න මට පුළුවන් කමක් නැහැ. මගේ පිළිගැනීමේ හැටියට හොරා තක්කඩියකුට වඩා නීචයි. මා කියන දෙය හොඳට අහගන්න. මම මාසයක් ම මේ මුදල් ළඟ තියා ගෙන හිටියා. හෙට උදේට ආපසු මුදල් භාර දෙන්න තීරණය කරගත්තා නම් මම තක්කඩියෙක් වෙන්නේ නැහැ. එහෙත් හැම ද ම වෑයම් කළත් තීරණයකට බැහැගන්න බැරිවුණා. මුළු මාසයක් ම වෑයම් කළා. නමුත් මුදල් ආපසු දෙන්න බැරි වුණා. මහත්-වරුන් ගේ අදහසේ හැටියට ඒක හරි ද?"

"නැහැ නැහැ. ඒක හරි නැහැ. ඒක හරි නැති බව මට හොඳට තේරුම් ගන්න පුළුවනි. ඒ ගැන තර්ක කිරීමට

මම කැමැති නැහැ''යි දණ්ඩනායකයා පරිස්සමින් කී ය. ''කොහොම වුණත් අපි මේ කතාව පැත්තකින් තබා මහත්මයා ගේ අකැමැත්තක් නැති නම් වැදගත් කරුණක් ගැන කතා කරමු. මහත්මයා රූබල් තුන් දහ දෙකට බෙදූ භාගයක් වියදම් කළේ මන්ද කියා අහලත් තවම අපට පිළිතුරක් දුන්නේ නැහැ. මොනවට ද රූබල් එක්දහස් පන්සියයක් සඟවා ගත්තේ? ඒ මුදලින් මොනව කරන්න ද අදහස් කළේ? මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන ලෙස මම මහත්මයාට බල කර සිටිනවා.''

''ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නම්. වැදගත් කාරණාව විස්තර නො කර, අනම් මනම් දොඩමින් මහත්වරුන්ට කරදර කරනවාට මට සමාවෙන්න''යි කියමින් මිතියා අත්ලෙන් නළලට පහරක් ගසාගත්තේ ය. ''වැදගත් කාරණාව විස්තර කළා නම් මිනිත්තුවකින් තේරුම් ගන්න පුළුවනි. නින්දුවක් පැමිණෙන්නේ චේතනාවෙනුයි. මේ වැරැද්ද කළේ මගේ තාත්තයි. තාත්තා බොහො ම වෑයම් කළා ගෘසෙන්කා එයා ළඟට ගෙන්න ගන්න. ගෘසෙන්කාට කතා කරමින් නිතර කරදර කළා. තාත්තා ගේ මේ කල්ක්‍රියාව නිසා මගේ හිතේ ලොකු ඊර්ෂ්‍යාවක් ඇති වුණා. අප දෙදෙනා අතරින් කාව තොරා ගන්න ද කියා ගෘසෙන්කා දෙගෙඩියාවෙන් සිටිනවා ය යන අදහසක් මගේ හිතේ ඇති වුණා. බැරිවෙලාවත් ගෘසෙන්කා හිටිහැටියේ ම මා ළඟට ඇවිදින් මම ආදරේ නුඹෙ තාත්තාට නො වෙයි නුඹටයි, කරුණා කරලා මා ලෝකයේ අනෙක් කෙළවරට ගෙනියන්න' යි කිව්වොත් මොකද වෙන්නේ කියා මම හැමදා ම කල්පනා කළා. මගෙ ළඟ තිබුණේ කොපෙක්ස් හතළිහයි. කොපෙක්ස් හතළිහෙන් මොනව කරන්න ද? ගෘසෙන්කා එක්කගෙන යන්නේ කොහොම ද? මොනව කරන්න ද? ඒ දවස්වල මම ඇගේ අදහස් දැනගෙන හිටියේ නැහැ. මම කල්පනා කළා ඈ මගෙන් මුදල් බලාපොරොත්තු වෙනවා ය, මගෙ ළඟ මුදල් නැති බව දැනගත්තාම මට කිසි ම සමාවක් දෙන්නේ නැත කියා. ඉතින් මම අර රූබල් තුන්දහෙන් එක්දහස් පන්සියයක් ගැණලා, බිලා ඔළුව තරක් වෙන්න ඉස්සෙල්ලා රෙදි කෑල්ලකින් ඔතලා මැහැව්වා. ඊට පස්සේ අනේ ඉතිරි මුදල්වලින් බොන්න ගියා. ඒක නීච නින්දිත වැඩක්. දැන් මහත්මයාට තේරුණා නේ ද?''

නීතිඥයෝ දෙදෙනා මඟ හඬින් සිනාසුණහ.

"මුදල් සේරම වියදම් නො කර බාගයක් තියා ගැනීම මගේ කල්පනාවේ හැටියට හොඳ නුවණක්කාර වැඩක්. මේ වැඩෙන් අදහස් කරන්නේ මොකක් ද?" දණ්ඩනායකයා ඇසුවේ ය.

"ඇයි, ඉන් අදහස් වෙන්නේ මා මුදල් සොරකම් කල බවයි. අනේ දෙයියනේ, තමුන්නාන්සේලාට මේ කාරණය අවබෝධ වෙන්නේ නැහැ නොවැ! ඒ රූබල් එක්දහස් පන්සිය බෙල්ලේ එල්ලාගෙන හිටිය මුළු කාලය තුල ම - හැම දා ම, හැම පැයක් පාසා ම, මම මට ම කියා ගත්තා 'තුඹ හොරෙක්! තුඹ හොරෙක්!' කියා. ඒ මුළු මාසය තුල ම මම තරහෙන් හිටියේ මේ කාරණාව නිසයි. මම තැබෑරුමේ දී කෝලාහල කලේ හිතේ තරහෙන්. මම තාත්තාට ගැහැව්වෙත් ඒ නිසයි. මා හොරෙක් ය යන අදහස මා තුල තිබුණ නිසයි. මට කිසි ම ආත්මශක්තියක් තිබුණේ නැහැ. වෙනෙකක් තියා මම අලෝෂාට වත් මේ ගැන කිසි ම දෙයක් කිව්වේ නැහැ. මා වංචාකාරයෙක් ය, තක්කඩියෙක් ය, යන අදහස ඒ තරම් තදින් මගේ හිතේ බලපැවැත්තුවා. ඒ අතර හැම දා ම, හැම පැයක් පාසා ම 'නැහැ මීතියා, තුඹ තව ම හොරෙක් නො වෙයි' කියා මම මට ම කියා ගත්තා. ඇයි නැත්තේ? හෙට කැතිරිනා ළඟට ගිහින් රූබල් එක්දහස් පන්සිය ආපසු දෙන්න පුළුවන් නිසයි. ඊයේ පෙනියා ගේ ගෙදර සිට පියෝතර් පර්හෝටින් ගේ ගෙදරට එන ගමන තමයි මම බෙල්ලේ එල්ලාගෙන හිටිය මේ යන්ත්‍රය ගලවා ගත්තේ. ඒ මොහොත වන තෙක් රූබල් එක්දහස් පන්සිය ගෙන වියදම් කිරීමට මගේ හිත මට ඉඩදුන්නේ නැහැ. නමුත් ඒ මුදල් අතට ගත්ත මොහොතේ දී ම මම මුළු ජීවිතයට ම හොරෙක් හා වංචාකාරයෙක් වුණා. ඒ කොහොම ද? කැතිරිනා ළඟට ගොස් 'මම තක්කඩියෙක් නමුත් හොරෙක් නො වෙයි' කීමට මගේ හිතේ තිබුණ බලාපොරොත්තුව නැති වී ගිය නිසයි. දැන් වත් මා කියන දෙය තේරුණා ද?"

"ඇයි ඊයේ රෑ විතරක් මුදල් වියදම් කරන්න අදහස් කලේ?"යි රාජ නීතිඥයා විමසුවේ ය.

"එහෙම ප්‍රශ්නයක් ඇසීම මහ විහිළුවක්. මුදල් වියදම් කිරීමට මම ඊයේ රෑ තීරණය කරගත්තේ අද උදේ පහට පණ නහ ගැනීමට අදහස් කරගෙන සිටිය නිසයි. අවංක මිනිහකු හැටියට මළත්, හොරකු හැටියට මළත් වෙනසක්

නැතැයි මම කල්පනා කළා. නමුත් මගේ අදහස වැරදි බව දැන් මට තේරුණා. මම ඊයේ මුළු රෑ ම පසුතැවුණේ ගිරිගෝරිස් මරාපු නිසා සයිබීරියාවට යන බයෙන් නො වෙයි. මගේ පෙම්වතිය මට ආයෙත් ලැබී, දිව්‍යසම්පත් ලැබුණු මොහොතේ සයිබීරියාවට යන්න සිදු වූ නිසා නො වෙයි. ඒ ගැන මම එ තරම් පසුතැවුණේ නැහැ. මම පසුතැවුණේ කැතිරිනා ගේ මුදල් ගෙන වියදම් කොට හොරකු වූ නිසයි. මහත්වරුනි, මා වේදනාවෙන් සකියන හදවතින් කියන දෙය විශ්වාස කරන්න. ඊයේ රෑ මම බොහෝ ම දේවල් ඉගෙන ගත්තා. තක්කඩියකු ලෙස ජීවත්වීම පමණක් නො ව. තක්කඩියකු ලෙස මිය යාම ද වරදක් බව මම දැනගත්තා. ....මහත්වරුනි, අපි අවංක මිනිස්සු ලෙස මිය ගිය යුතුයි........."

මිත්‍යා සුදුමැලි විය. නොසන්සුන් වී සිටියත් ඔහු ගේ මුහුණ විඩාවෙන් මලානික විය.

"මහත්මයා ගේ කතාව දැන් මට තේරුම් ගන්න පුළුවනි" දණ්ඩනායකයා ඉතා කරුණාවෙන් හා ආදරයෙන් ද කී ය. "නමුත් මගේ කල්පනාවේ හැටියට මේක මහත්මයා ගේ නහර දුර්වල කමකින් ඇති වූ දෙයක්. එහෙම කියනවට මට සමාවෙන්න ඕනැ......අර කාන්තාව ළඟට ගිහින් මුදල් ආපසු දී, මේ සිත් වේදනාවෙන් නිදහස් වෙන්න ඉඩ තිබුණා නේ ද? ඇයි තමාට තියෙන අමාරුකම් ඇයට විස්තර කරලා තමා අදහස් කල පිළිවෙලට ප්‍රශ්නය විසඳා නො ගත්තේ? තමා අතින් සිදු වූ වරද ඇයට කියා වියදමට උවමනා මුදල් ඇගෙන් ඉල්ලා ගන්න තිබුණා. මහත්මයා ගේ දුක දැකලා, තත්ත්වය ගැන අනුකම්පා කරලා, ත්‍යාගවන්ත කමින් යුතු ව ඇ මුදල් දෙනවා ඇති. ඇයට පොරොන්දු නෝට්ටුවක් අත්සන් කරලා දුන්නා නම්, නැතිනම් සම්සෝනෝ වෙළෙන්දට හා හොලාකෝ මැතිනියට පොරොන්දු වූ විදියට කැතිරිනාට පොරොන්දු වුණා නම් ඇගෙන් මුදල් ගන්න ඉඩ තිබුණා."

මිත්‍යා ගේ මුහුණ හිටිහැටියේ ම රතු විය.

"ම්, එ තරම් නරක තක්කඩියෙක් ය කියා කල්පනා කරනවා ද? මහත්මයා කතා කරන්නේ වැඩිය කල්පනා කරලා නො වෙයි" මිත්‍යා දණ්ඩනායකයා ගේ මුහුණ බලා පිළිකුලින් කීවේ තමා ගේ සවන් අදහාගත නො හැකි වූවාක් මෙනි.

"මම කතා කළේ හොඳට කල්පනා කරලයි. මා කල්පනා නො කර කතා කළා ය කියා මහත්මයා අදහස් කළේ ඇයි?" දණ්ඩනායකයා පුදුම වෙමින් විමසුවේ ය.

"තමුන්නාන්සේලා ගේ අදහස් බොහො ම නීචයි. ඇයි මට මෙහෙම වද දෙන්නේ? හොඳයි එහෙනම් මම සේරම කියන්නම්. මගේ දුෂ්ට කම් සේරම කියන්නම්. සමහර විට තමුන්නාන්සේලා ලැජ්ජා වෙන්න පුළුවනි. මනුෂ්‍යයකු ගේ අදහස් කො තරම් නීච තත්ත්වයකට බහින්න පුළුවන් ද කියා කාටත් දැනගන්න පුළුවනි. දැන් ටිකකට කලින් මහත්මයා පෙන්නා දුන්න වැඩ පිළිවෙලට සමාන වැඩ පිළිවෙලක් මගේ හිතෙත් තිබුණා. මුළු මාසය ම මේ ගැන කල්පනා කරලා අන්තිමේ දී කැතිරිනා ළඟට යන්න මම අදහස් කළා. මම එ තරම් නීච තත්ත්වයකට වැටුණා. ඇය ළඟට ගොස් ඇයට ද්‍රෝහිකම් කළ හැටි කියන්න. ඒ ද්‍රෝහිකම් කිරීම සඳහා ඇගෙන් ණයට මුදල් ඉල්ලීමට. ඒ මුදල් අරගෙන කැතිරිනාට වෛර කළ, නින්දා අපහාස කළ, වෙනත් තරුණියක් සමඟ පැනයන්න. එහෙම දෙයක් මට යෝජනා කිරීමට මහත්මයා පිස්සෙක් වෙන්න ඕනෑ."

"මට එ තරම් පිස්සුවක් නැහැ. මම වැඩිය කල්පනා නො කරයි කතා කළේ.........මම ගෑනුන් ගේ ඊර්ෂ්‍යාව ගැන කල්පනා කළේ නැහැ..........මෙ තැන එ වැනි ඊර්ෂ්‍යාවක් තියෙන බව පේනවා"යි දණ්ඩනායකයා සිනා සෙමින් කී ය.

"එහෙනම් ඒක මහ නින්දිත ක්‍රියාවක් වෙනවා"යි මිත්‍යා මිට මොලවා මේසයට පහරක් ගසමින් කී ය. "ඒක හැම දෙයකට ම වඩා නීච, පිළිකුල් කටයුතු දෙයක් වෙනවා. මහත්මයා දන්නව ද, ඉල්ලුවා නම් කැතිරිනා මට මුදල් දෙනවා. ඇයි එහෙම දෙන්නේ? ඇගේ සිතේ තියෙන පළිගැනීමේ චේතනාව සනසා ගැනීමටයි. මට ඇති පිළිකුල පෙන්නීම පිණිසයි. ඈ බොහො ම නපුරුයි. බොහො ම ඉක්මනට කේන්ති යනවා. මට මුදල් ගෙනියන්නයි තිබුණේ. මගේ මුළු ජීවිතයට ම..............අනේ දෙවියනේ! මට බොහො ම කනගාටුයි. මා මේ විදියට කෑගාන්නේ මේ අදහස මෑතක් වනතුරු මගේ හිතේ තිබුණ නිසයි. එදා රෑ ලී වෙළෙඳා නිසා කරදර වන විටත්, ඊයේ රෑ මේ භයානක දෙය සිදුවන විටත් මට මේ අදහස මතක තිබුණා..............."

"මොන භයානක දෙයක් ද?"යි දණ්ඩනායකයා ඇසුවේ මැඩගත නොහැකි කුතුහලයෙන් යුතු ව ය. එහෙත් මිතියාට ඒ කිසිවක් නො ඇසිණි.

"මම බොහො ම භයානක පාපෝච්චාරණයක් කළා"යි මිතියා කතාව අවසන් කරමින් ශෝකයෙන් පැවසී ය. තමුන්නාන්සේලා එය අගය කොට සැලකිය යුතුයි, ගරු කළ යුතුයි. නමුත් තමුන්නාන්සේලා මගේ මේ කතාව නොපිළි-ගන්නවා නම් ඉන් අදහස් වෙන්නේ මට කිසි ම සැලකිල්ලක් නොදක්වන බවයි. තමුන්නාන්සේලා වැනි මිනිසුන්ට මේ කතාව කීම නිසා මට ලැජ්ජාවෙන් මැරෙන්න වෙනවා. මම වෙඩි තියාගෙන මැරෙනවා. මට පේනවා තමුන්නාන්සේලා දැනට ම මා විශ්වාස නොකරන බව. අනේ දෙයියනේ ඒකත් ලියා ගන්නව ද?"යි මිතියා ශෝකයෙන් ඇසුවේ ය.

"මහත්මයා ගේ අන්තිම ප්‍රකාශය ලියා ගන්න ඕනෑ"යි රාජ නීතිඥයා මිතියා දෙස පුදුමයෙන් බලා කී ය. "ඒ කියන්නෙ අන්තිම මොහොත වෙනතෙක් කැතිරිනා ළඟට ගොස් මුදල් ඉල්ලා ගැනීමට අදහස් කළ බව ලියා ගන්න ඕනෑ......... නඩුවට ඒක බොහො ම වැදගත් සාක්ෂියක් වෙනවා......... මහත්මයාටත් විශේෂයෙන් ම වැදගත් වෙනවා."

"මට ටිකක් අනුකම්පා කරන්න"යි මිතියා දෑත වනමින් කී ය. "ඒක ලියා ගන්න එපා. තමුන්නාන්සේලා තුළ ලැජ්ජාව කියා දෙයක් නැද්ද? මම තමුන්නාන්සේලාට මගේ හදවත දෙකට පලා පෙන්නුවා. නමුත් තමුන්නාන්සේලා කරන්නේ කුමක් ද? ඒ හදවතේ තියෙන තුවාලවලට ඇඟිල්-ලෙන් අනිනවා!"

බලාපොරොත්තු සුන් වූ මිතියා දෑතින් මුහුණ වසා ගත්තේ ය.

"කරදර වෙන්න එපා"යි දණ්ඩනායකයා කී ය. ලියාගත්ත හැම දෙයක් ම පස්සෙ කියවනවා. කැමැති නැති දෙයක් තියෙනවා නම් කැමැති විදියකට වෙනස් කරගන්න පුළුවනි. දැන් මම දෙවෙනි වතාවට පොඩි ප්‍රශ්නයක් අහන්න කැමැතියි. මහත්මයා මුදල් සඟවා ගෙන හිටිය බව කවුරුවත් දැන ගෙන හිටියා ද? මට නම් මේක විශ්වාස කරන්න බැරි දෙයක්."

"කිසි ම කෙනෙක් දැනගෙන හිටියේ නැහැ. දැන් මා මේ කතාව කී පාරක් කිව්ව ද? මා කියන දෙය නොතේරෙනවා ඇති. මට කරදර නො කර ඉන්න."

"නැහැ, අපි කරදර කරන්නේ නැහැ. කොහොම වුණත් මේ කාරණාව ගැන විස්තරයක් කරන්න වෙනවා. ඒකට ඔනෑ තරම් කල් තියෙනවා. නමුත් ඒ අතර මහත්මයා මේ කාරණාව ගැන හොඳට කල්පනා කරල බලන්න. රූබල් එක්දහස් පන්සියයක් නො ව තුන්දහසක් වියදම් කලා ය කියා රට හැම තැන ම කිව්වේ මහත්මයා බව ඔප්පු කරන්න සාක්ෂි දෙලහක් පමණ තියෙනවා. මහත්මායා ගේ අතට ඒයේ මුදල් ලැබුණා ම, රූබල් එක්දහස් පන්සියයක් නො ව තුන්දහසක් ලැබුණු බව හැගෙව්වා."

"සාක්ෂි කාරයන් දෙලොස් දෙනෙක් නො වෙයි සිය ගණනක් ඇති. සිය ගණනකට නො වෙයි මම දහස් ගණනකට කිව්වා."

"දන්න් පේනවා නේද, මේ ගැන හුග දෙනෙක් සාක්ෂි කියනවා. හුග දෙනෙක් සාක්ෂි කියනවා ය කියන එකේ ලොකු වැදගත් කමක් තියෙනවා."

"කිසි ම වැදගත් කමක් නැහැ. මම විකාර කතාවක් කිව්වා ම හැමෝ ම ඒක කියන්න පටන් ගත්තවා."

"මොනවට ද විකාර දේවල් කියන්නේ?"

"දෙයියෝ දනියි......එහෙම කියන්න ඇත්තේ ඔම තරම විශාල මුදලක් වියදම් කිරීමෙන් ඇති වූ සන්තෝෂයෙන් වෙන්න ඔනෑ. සමහර විට මා සගවාගෙන හිටිය මුදල් අමතක කිරීමට වෙන්න ඔනෑ. ඔව්, ඔව්, ඒකට තමයි... .....ඒ කතාව යකාට ගියදෙන්. දැන් කී පාරක් ඔය ප්‍රශ්නය මගෙන් ඇහැව්ව ද? මම කිව්වේ බොරුවක්. ඒක එ තැනින් ඉවරයි. ඒ බොරුව හරිගස්සන්න මට උවමනාවක් නැහැ. සමහර මිනිස්සු බොරු කියන්නේ මොනවට ද?"

"මිනිස්සු බොරු කියන්නේ කුමන හේතුවක් නිසා දැයි කියන්න බොහො ම අමාරුයි" දණ්ඩනායකයා කී ය. "මහත්මයා බෙල්ලේ එල්ලාගෙන හිටිය ඔය යන්ත්‍රය ලොකු දෙයක් ද?"

"නැහැ, ලොකු නැහැ."

"කො තරම් ලොකුවට තිබුණ ද?

"රූබල් සියේ නෝට්ටුවක් දෙකට නැමුවොත්, අන්න ඒ තරමට ඇති."

"ඒ මුදල් ඔතා මසා තිබුණු රෙදි කෑල්ල අපට පෙන්නන්න පුළුවන් ද? ඒ රෙදි කෑල්ල කොහෙ හරි ඇති."

"මොන පිස්සු කතාවක් ද? ඒ රෙදි කෑල්ල කොහෙ දැම්ම ද කියා මට මතක නැහැ."

"මට සමාවෙන්න. බෙල්ල වටේ ගැට ගහගෙන තිරිය මුදල් නැති නම් යන්ත්‍රය ගැලෙව්වේ කො තැන දී ද? මහත්මයා ගේ සාක්ෂිවල හැටියට මහත්මයා ගෙදර ගියේ නැහැ."

"පෙම්යා ගේ ගෙදර ඉඳලා පියෝතර් පර්හෝටින් ගේ ගෙදරට යන අතරමග දී මම බෙල්ල වටේ තිබුණු යන්ත්‍රය ගලවා, ඉරාදමා මුදල් ගත්තා."

"කළුවරේ යන කොට ද ඉරා මුදල් ගත්තේ?"

"මට මොනවට ද එළියක්? මිනිත්තුවකින් මම රෙදි කෑල්ල ඉරා මුදල් ගත්තා."

"මහ පාරේ දී ද කැඩුවේ? රෙදි කෑල්ල කැපුවේ කතුරකින් නො වේ ද?"

"මගේ කල්පනාවේ හැටියට මුදල් ගත්තේ මාරකැට්ටුව ලඟදියි. කතුරක් මොනවට ද? ඒක පාත්කඩයක්. මම ඇඟිලි දෙකින් අල්ලා ඉරුවා."

"ඊට පස්සේ කොහෙ ද රෙදි කෑල්ල දැම්මේ?"

"විසි කළා."

"කොහෙ ද විසි කළේ?"

"මාරකැට්ටුව ළඟ දී විසි කළේ. කො තැන විසි කළා ද කියා මට මතක නැහැ. දැනගෙන මොනවට ද?"

"තුමා ගේ නිදහසට ඒක හොඳ සාක්ෂියක් වෙනවා. මා කියන දෙය තේරුණා නේ ද? කවු ද ඒක මහත්න උපකාර වුණේ?"

"කිසි ම කෙනෙක් උපකාර වුණේ නැහැ. තනියෙන් මැහැව්වා."

"මහත්න පුළුවන් ද?"

"ඇඳුම් මැසීම යුද්ධභටයකු විසින් දැනගත යුතු දෙයක්. කොහොම වුණත් මුදල් තබා කුඩා උරයක් මැසීමට එ තරම් ලොකු දැනුමක් උවමනා නැහැ."

"උරය මැසීමට කොහෙන් ද රෙදි ලැබුණේ?"

"මට කවටකම් කරනව ද?"

"මේක කවට කම් කරන වෙලාවක් නො වෙයි."

"රෙදි කෑල්ල කොහෙන් ගත්ත ද කියා මට මතක නැහැ. කොහෙන් හරි ගත්ත ඇති."

"රෙදි කෑල්ල කොහෙන් ගත්ත ද කියා මතක තියෙන්න ඕනෑ."

"මට මතක නැහැ. මගේ ඇඳුමකින් ඉරාගත්ත ඇති."

"ඒක බොහො ම වැදගත් දෙයක්. සමහර විට අපි හෙට මහත්මයා ගේ ඇඳුම් සෝදිසි කරන කොට රෙදි කෑල්ල ඉරාගත්ත ඇඳුම සොයා ගන්න පුළුවන් වේවි. ඒක කපු රෙදි කෑල්ලක් ද? හණ රෙදි කෑල්ලක් ද?"

"දෙයියො දනියි.........ටිකක් ඉන්න. මට මතක තියෙන හැටියට මම ඒ රෙදි කෑල්ල ඇඳුමකින් ඉරාගත්තේ නැහැ. ඒක කැලිකෝ රෙදි කෑල්ලක්. ගෙවල් අයිතිකාරිය ගේ හිස්-වැස්මෙන් ගත්තේ."

"ගෙවල් අයිතිකාරිය ගේ හිස්වැස්මෙන් ගත්තා?"

"ඔව්."

"කොහොම ද ගත්තේ?"

"මට දැන් මතකයි. සමහර විට මගේ පෑන පිහ දමන්න ගන්න ඇති. ඒක කිසි ම වටිනා කමක් නැති පාත්කඩයක් නිසා ඇගෙන් අහල ගත්තෙ නැහැ. ඒක දෙකට ඉරලා, එක කෑල්ලක මුදල් තියා මැහැව්වා. ඒක දහස් වරකට වඩා සෝදපු කිසි ම වටිනා කමක් නැති රෙදි කෑල්ලක්."

"ඒක හොඳට මතක ද?"

"මට හොඳට ම මතක නැහැ. සමහර විට මම මුදල් තියා මහන්න ඇත්තේ නාළුවෙන් ඉරාගත්ත රෙදි කෑල්ලක වෙන්න ඇති. ඒක මොකක් වුණා ම මොක ද?"

"එහෙනම් ඇගේ සාළුවක් නැති වුණ බව ගෙවල් අයිති කාරියට මතක ඇති."

"ඒක බොහො ම පරණ, තඹයක්වත් නොවටිනා සාළුවක් නිසා ඇයට මතක තියෙන එකක් නැහැ."

"මහත්මයාට කොහෙත් ද ඉදිකටුවයි නූලුයි ලැබුණේ?"

"මම මීට වැඩිය වචනයක්වත් කතා කරන්නේ නැහැ. ඔය අති කතා කලා"යි මිතියා අන්තිමේ දී කෝපයෙන් කී ය.

"ඒ රෙදි කෑල්ල දමාපු තැන මතක නැහැ කියන එක පුදුමයක් නේ ද?"

"ඇයි එහෙනම් හෙට උදේට කඩ පොල අතු ගා නො බලන්නේ?"යි මිතියා දත් විලිස්සමින් විමසුවේ ය. "සමහර විට රෙදි කෑල්ල හොයා ගන්න පුළුවන් වේවි. ඔය ඇති, ඔය ඇති, මා කියන කිසි ම දෙයක් විශ්වාස නොකරන බව මම දන්නවා"යි මිතියා විඩා වැටුණු කට හඬින් කී ය.

"තමුන්නාන්සේලා මා කියන වචනයක්වත් විශ්වාස කරන්නේ නැහැ. ඒක මගේ වරද. තමුන්නාන්සේලා ගේ වරද නො වෙයි. මට මේවා කිසිවක් නො කියා නිශ්ශබ්ද ව ඉන්නටයි තිබුණේ. මගේ රහස් කියා මම බාල්දු වුණේ මොනවට ද? තමුන්නාන්සේලාට මේක හිනහවට කරුණක් බව මට තමුන්නාන්සේලා ගේ ඇස්වලින් පේනවා. මහත්මයා තමයි මගෙන් මේ සේරම අහගත්තේ. මහත්මයා ලැබූ ජය-ග්‍රහණය ගැන ඇයි සිත්දුවක් නො කියන්නේ?......... මට වද දෙන තමුන්නාන්සේලාට හෙණ ගහන්න ඕනෑ!"

මිතියා බිම බලා දෑතින් මුහුණ වසා ගත්තේ ය. නිලධරයෝ දෙදෙනා නිහඬ වූ හ. මිනිත්තුවකට පසු මිතියා හිස ඔසොවා හිස් බැල්මෙන් ඔවුන් දෙස බැලුවේ ය. ඔහු ගේ මුහුණේ බලාපොරොත්තු සුන් වූ බවක් දකින්නට තිබිණි. අභාව වූවකු මෙන් තුෂ්ණීම්භූත වූ හෙතෙම තමා අවට සිදුවන කිසිවක් ගැන නොදන්නකු මෙන් හිඳ සිටියේ ය. මූලික පරීක්ෂණය අවසන් කළ යුතු වූයෙන් අනෙක් සාක්ෂිකාරයන් විභාග කල යුතු විය. වේලාව උදේ අට විය. මෙතෙක් වේලා දල්වෙමින් තිබුණු ඉටිපන්දම් නිවා දමනු ලදි. මිතියාගෙන් ප්‍රශ්න කල වේලාවේ දී නිතර කාමරයට පැමිණි මකාරෝ හා කල්ගානෝ බැහැර ගොස් සිටියහ. නීතිඥයෝ දෙදෙනා විඩා වැටී සිටියහ.

ඒ උදය බොහො ම අඳුරු විය. අහස අඳුරු වලාකුළින් වැසිණි. නො නැවැතී වසින්නට විය. මිතියා හිස් බැල්මෙන් කවුළුව දෙස බලා සිටියේ ය.

"ජනේලය ඇරල බලන්න ද?"යි ඔහු හදිසියෙන් ම රාජ නීතිඥයා ගෙන් ඇසුවේ ය.

"ඕනෑ තරම් බලන්න"යි නීතිඥයා කී ය.

මිතියා හිඳ සිටි පුටුවෙන් නැඟිට කවුළුව ළඟට ගියේ ය. කවුළුවේ කොළ පැහැති කුඩා වීදුරුවලට වැසි පොද වේගයෙන් පහර දුන්නේ ය. පහළ මඩ වූ පාරත්, මදක් ඈතින් ගැමියන් ගේ දිළිඳු පැල්පත් පේළියක් කවුළුව තුළින් ඔහු දුටුවේ ය. වර්ෂාව නිසා ඒ පැල්පත් වඩාත් දිළිඳු ව හා අඳුරු ව ද පෙනේ. සූර්යයා ගේ පළමු රැස් වැටුණු හැටියේ ම වෙඩි තබා ගැනීමට තමා කළ තීරණය මිතියාට සඳහන් විය. "ජීවිතය නැතිකර ගැනීමට සුදුසු මේ වගේ අඳුරු දවසක්"යයි මුවග සිනාවක් ඇති ව කල්පනා කළ මිතියා හදිසියෙන් ම දෑත පහළ දමා ඔහු ගේ 'වදකාරයන්' දෙසට හැරී මෙසේ කීවේ ය.

"මහත්වරුනි, මා විනාශ වූ පුද්ගලයෙක් බව දැන් මට පේනවා. නමුත් ගෘසෙන්කාට මොකද වුණේ? කරුණාකර ඇයට සිදුවුණු දෙය කියන්න. ඇයත් මා සමඟ විනාශ වෙයි ද? ඇ බොහො ම අහිංසකයි. 'මේක මගේ වරද' කියා ඈ ඊයේ කෑගැවේ හොඳ සිහියෙන් නො වෙයි. මේ අපරාධයට ඇගේ කිසි ම සම්බන්ධයක් නැහැ. ඊයේ රෑ මම තමුන්නාන්සේලා සමඟ මෙහි හිඳ සිටින විට නිතර ඇය සිහිකොට දුක් වුණා ......ඇයට මොනවා කරනව ද කියා මට කියන්නේ නැද්ද? කියන්න බැරි ද?

"ඒ ගැන කරදර වෙන්න එපා"යි දණ්ඩනායකයා එක්වර ම මහත් උනන්දුවෙන් කී ය. "මහත්මයා මෙ තරම් විශාල සැලැකිල්ලක් දක්වන ඒ කාන්තාවට හිරිහැර කරන්න කිසි ම හේතුවක් නැහැ. අනාගතයේ දීත් ඇයට කරදර කරන්න සිදුවන එකක් නැහැයි කියා මා විශ්වාස කරනවා......ඇය මේ නඩුවට සම්බන්ධ නො කර ගැනීමට අපි පුළුවන් හැම දෙයක් ම කරන්නම්. මහත්මයා මේ ගැන හිත නරක්කර ගන්න එපා."

"බොහො ම ස්තුතියි. අනෙක් දේවල් කොහොම වුණත් තමුන්නාන්සේලා අවංක මිනිස්සු බව මා දන්නවා. මගේ

හිතේ තිබුණු ලොකු බරක් තමුන්නාන්සේ ඉවත් කළා. දැන් ඉතින් අපි මේ ළඟට මොකද කරන්නේ? මම ඕනෑ දෙයකට ලෑස්තියි."

"හැකි තරම් ඉක්මනට මේ පරීක්ෂණය අවසන් කළ යුතුයි. දැන් ඉතින් අනෙක් සාක්ෂිකාරයන් සෝදිසි කරන්න ඕනෑ. මහත්මයා ඉදිරිපිට සාක්ෂි ඇසිය යුතු නිසා........"

"ඊට ඉස්සෙල්ලා තේ වතුර බොන එක හොඳ නැති ද? අපි තේ වතුර බීලා පටන් ගනිමු"යි රාජ නීතිඥයා කී ය.

තේ වතුර පිළියෙළ කර තිබේ නම් දැනට සුළුපයක් පානය කොට පසු ව සුදුසු වෙලාවක හිල ගන්නා තෙක් සාක්ෂිකාරයන් සෝදිසි කිරීමට තීරණය කරන ලදි. (පොලිස් කපිතාන් තේ බීම පිණිස දැනට ම කාමරයෙන් පිටත ගොස් සිටියේ ය.) රාජ නීතිඥයා විසින් පිළිගන්වන ලද තේ කෝප්පය පළමු ව ප්‍රතික්ෂේප කළ මිතියා පසු ව එය ඉල්ලාගෙන බොහෝ ම ආසාවෙන් බීවේ ය. මහත් පුදුමයකට මෙන් මිතියා ද විඩා වැටී සිටියේ ය. මෙ තරම් කාය ශක්තිය ඇති මිනිහෙක් මුළු රැයක් සුරා බී කෙළි දෙලෙන් ගත කිරීම ඔහු කෙරෙහි බලපවත්වන්නට නැතැයි කෙනෙක් සිතන්නට පිළිවන. එහෙත් තමාට පුටුවක කෙළින් හිඳ සිටිය නොහැකි බව ඔහුට දැනුණා පමණක් නො ව කාමරයේ තිබෙන හැම දෙයක් ම තමා ගේ නෙත් ඉදිරිපිට නටන්නාක් මෙන් පෙනිණි. තව ටික වේලාවකින් මා උමතු වන්නට පිළිවනැයි ඔහු කල්පනා කෙළේ ය.

අට වන පරිච්ඡේදය

අත දරුවා

එ තැන් සිට සාක්ෂිකාරයන් ගෙන් සාක්ෂි විමසීම ආරම්භ කරන ලදි. මෙතෙක් විස්තර ඇති ව කළ අපේ කතාව අපි මේ තැන් සිට වැඩි විස්තර ඇති ව නො කරමු. තමා හිතට එකඟ ව ඇත්ත කියයුතු බවත්, පසු ව එම සාක්ෂි දිවුරුම් පිට නැවත කියයුතු බවත් රාජ නීතිඥයා සාක්ෂිකාරයන්ට පැහැදිලි කර දුන් හැටි හා සාක්ෂිකාරයන් ඔවුන් කළ ප්‍රකාශවලට අස්සන්

කල හැටිත් අපි මෙහි දී විස්තර නො කරමු. හැම සාක්ෂිකාරයකු ගෙන් ම අසන ලද ඉතා වැදගත් ප්‍රශ්නය නම් රූබල් තුන්දහ පිළිබඳ කතාවයි. එ නම් මීට මසකට කලින් මෙම ස්ථානයේ දී මිතියා කරමසෝ වියදම් කළේ රූබල් තුන්දහක් ද? නැති නම් එක්දහස් පන්සියයක් ද? යළි ඊයේ රෑ වියදම් කළේ රූබල් තුන් දහක් ද? නැති නම් එක් දහස් පන්සියයක් ද? යන වගයි. අහෝ ඛේදයකි! හැම දෙනා ම මිතියාට විරුද්ධව සාක්ෂි දුන්හ. එක සාක්ෂිකාරයෙක් වත් මිතියාට පක්ෂ නො වී ය. සමහරු මිතියාට විරුද්ධ ව බිඳිය නොහැකි කරුණු ඉදිරිපත් කළහ.

පළමු ව සාක්ෂි දුන්නේ හෝටලයේ අයිතිකාරයා ය. ඔහු කිසි ම බියක් සැකක් නැති ව සාක්ෂි දුන්නේ ය. ඔහු මිතියා පිළිකුල් කරන බව හැඟෙව්වේ ය. එය ඔහු ගේ ගරුත්වය හා ඔහු ඇත්ත කියන්නකු බව හැඟවීමට උපකාර විය. ඔහු වඩා කතා කළේ නැත. කතා කල සවල්පය ද සංයමයෙන් කෙළේ ය. ප්‍රශ්නයක් අසන තෙක් ඉවසිල්ලෙන් සිටි ඔහු එම ප්‍රශ්නයට පහසුවෙන් පිළිතුරු දුන්නේ ඒ ගැන සැලකිල්ලෙන් කල්පනා කල ඉක්බිති ව ය. මීට මසකට කලින් මිතියා කරමසෝ රූබල් තුන් දහකට නොඅඩු මුදලක් වියදම් කල බවත්, තමා රූබල් තුන්දහක් වියදම් කල බව මිතියා කරමසෝ ගැමියන්ට කී බවට ගැමියන් සාක්ෂි කියන බවත්, හෙතෙම කිසි ම බියක් සැකක් නැති ව කෙළින් ම කීවේ ය. "කරමසෝ මහත්මයා අහිකුණ්ටිකා කෙල්ලන්ට කොච්චර සල්ලි දුන්න ද? උන්ට රූබල් දහක් විතර දෙන්න ඇති."

"මගේ කල්පනාවේ හැටියට මම උන්ට රූබල් පන්සියකට වැඩිය දුන්නේ නැහැ"යි මිතියා ශෝකයෙන් කී ය. "ම, ඒ වෙලාවේ වෙරි වෙලයි හිටියේ. මුදල් ගැණල දුන්නේ නැහැ. ගැණ්නනම් කො තරම් හොඳ ද?"

එවේලේ මිතියා හිඳ සිටියේ තිරයට පිටුපස හරවා ගෙන ය. සාක්ෂිකාරයන්ට ශෝකයෙන් සවන් දුන් හෙතෙම විඩා වැටී සිටියේ ය. "උඹලට ඕනෑ දෙයක් කියාපල්ලා, දැන් මොනව කිව්වත් මට කමක් නැහැ"යි කියන්නාක් මෙන් ඔහු හැඟෙව්වේ ය.

"තමුන්නාන්සේ අහිකුණ්ටිකයන්ට රූබල් දහකට වඩා දෙන්න ඇති"යි හෝටලේ අයිතිකාරයා, මිතියා ගේ කතාව වැරදි බව ඔප්පු කරමින් කී ය. තමුන්නාන්සේ කිසි ම සැලකිල්ලක් නැති ව හැම තැන ම මුදල් විසි කළා. උන් ඒ සේරම

ඇහිඳගත්තා. උත් සේරම පල්හොරු, අශුචහොරු. උත් මේ පලාතෙන් පත්තලයි හිටියේ. තමුන්නාන්සේ කොච්චර මුදල් දුන්නද කියා උන් ගෙන් ඇහැව්වොත් කියාවි. මම දුටුවා- තමුන්නාන්සේ ගේ අතේ තිබුණු මුදල්. මම මුදල් නොගැණ්ත බව ඇත්තයි. තමුන්නාන්සේ මට මුදල් ගණින්න ඉඩ දුන්නේ නැහැ. නමුත් දුටු හැටියේ ම කියන්න පුළුවනි එ තැන රූබල් එක්දාස් පන්සියයකට වැඩිය තිබුණු බව. අපිත් මුදල් දැකල තියෙන නිසා දුටු හැටියේ ම ගණන කියන්න පුළුවනි"

ඊයේ රෑ කො තරම් මුදලක් වියදම් කළා දැයි ඇසූ විට මිතියා කරමසෝ කරත්තයෙන් බැස්ස වහා ම රූබල් තුන් දහක් ගෙනා බව තමා සමග කී බව හෝටලයේ අයිතිකාරයා පිළිතුරු දෙමින් කී ය.

"උඹ කියන්නේ ඇත්තක් ද? රූබල් තුන්දහක් ගෙනා බව මම එ තරම් හොඳට ස්ථිර ව කිව්වේ නැහැ"යි මිතියා කී ය.

"තමුන්නාන්සේ රූබල් තුන් දහක් ගෙනා බව ඇන්ඩ්‍රි ඉදිරිපිට දී කිව්වා. මිනිහට කතා කරලා අහන්න පුළුවනි. තමුන්නාන්සේ සංගීත කාරයන්ට සංග්‍රහ කරන විට හැමෝ-ට ම ඇහෙන්න කිව්වා රූබල් හය දහක් වියදම් කරනවාය කියා.........ඒ කියන්නේ ගිය පාර වියදම් කළ තුන් දහත් එක්කයි. තමුන්නාන්සේ ගේ කතාව ස්පිවන්ටයි, සිම්යොන්ටයි, ඇහුණා. තමුන්නාන්සේ ළඟින් හිටිය කල්ගානෝ මහත්මයාත් අහගෙන හිටියා. සමහර විට ඒ මහත්මයාට මතක ඇති."

හය දහ පිළිබඳ කතාවට නිලධාරිහු අමුතු සැලැකිල්ලක් දැක්වූ හ. මේ අලුත් තර්කය ඔවුන් ගේ සිත් ගත්තේ ය. තුනයි තුනයි හයයි. ඒ කියන්නේ එද තුන් දහයි, අද තුන් දහයි, සේරම හය දහයි. එතකොට තර්කය බොහො ම පැහැදිලියි. හෝටලයේ අයිතිකරු සඳහන් කළ, ගැමියන් හය දෙනා ම කැඳවා ප්‍රශ්න කරන ලදි. ස්පිවන්, සිම්යොන්, ඇන්ඩ්‍රි හා කල්ගානෝ ගෙන් ද කට උත්තර ගන්නා ලදි. ගැමියන් දෙදෙනා හා කරත්තකාරයා කිසි ම පැකිළීමක් නැති ව හෝටලයේ අයිතිකාරයා ගේ කතාව ස්ථිර කළහ. කරත්තකාරයා මඟ දී මිතියා සමඟ කළ කතාව ද මිතියා දුන් පිළිතුරු ද නිලධාරිහු වචනයක් පාසා ලියා ගත්හ. "මම කොහෙ ද යන්නේ? දිව්‍යලෝකයට යනව ද? අපායට යනව ද? අනෙක් ජාතියේ දී මට සමාව ලැබෙයි ද?"යි මිතියා මඟ දී පියාදුරාගෙන් ඇසුවේ ය.

මනෝවිද්‍යාඥයකු මෙන් මිතියා ගේ කතාව අසා සිටි දණ්ඩනායකයා, සාත්තු වරයකු මෙන් සිනා සී, මිතියා යන තැන ගැන සඳහන් කරමින් කී දෙය සාක්ෂියට ඇතුළත් කළ යුතු යයි කී ය.

අනතුරු ව පැමිණියේ කල්ගානෝ ගේ වාරය යි. කල්ගානෝ බොහෝ කාලයක සිට මේ නීතිඥයන් දෙදෙනා දිනපතා හමු වී කතාබහ කොට ඇතත් මෙ දින ඔවුන් සමග නොමනාපයෙන් කතා කළේ කිසිකලෙක ඔවුන් දැක ඇඳින නො සිටියාක් මෙනි. තමා මේ මිනීමැරුම ගැන කිසිවක් නොදන්නා බවත්, දැන ගැනීමට උවමනාවක් නැති බවත් කියමින් ඔහු සාක්ෂි දීම ආරම්භ කෙළේ ය. එහෙත් ඔහුට ද මිතියා ගේ හයදූගේ කතාව ඇසුණු බව පෙනේ. එ වේලේ තමා මිතියා ළඟින් සිටිය බව ඔහු පිළිගත්තේ ය. එ වේලේ මිතියා ගේ අතේ කො තරම් මුදලක් තිබුණේ දැයි ඔහු නො දත්තේ ය. පෝලන්ත ජාතිකයන් දෙදෙනා සූදුවේ දී වංචා කළ බව ඔහු පිළිගත්තේ ය. නැවැත නැවැතත් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දුන් හෙතෙම පෝලන්ත ජාතිකයන් දෙදෙනා පන්නාගත් පසු මිතියා හා ගෘෂෙන්කා හා අතරේ සම්බන්ධය හොඳ අතට හැරුණු බවත්, මිතියාට ආලය කරන බව ගෘෂෙන්කා පැවැසූ බවත් කීවේ ය. මිතියා උසස් කුලකාන්තාවකට කතා කරන්නාක් මෙන්, සංයමයෙන් හා ගෞරවයෙන් ද ගෘෂෙන්කාට කතා කෙළේ ය. ඔහු එක් වරක් වත් ඇයට තම කියා කතා කළේ නැත. තරුණයා සාක්ෂි දීමට නොකැමැත්තක් දැක්වූ වත් දණ්ඩනායකයා බොහෝ වේලා ඔහු ගෙන් නොයෙක් ප්‍රශ්න ඇසුවේ ය. මිතියා හා ගෘෂෙන්කා හා අතරේ පැවැති 'ප්‍රේමය' එදින රෑ අලුත් වූ සැටි ගැන ඔවුන් සියලු තොරතුරු දැනගත්තේ තරුණයාගෙනි. මිතියා එක් වරක්වත් කල්ගානෝ ගේ කතාවට බාධා නොකෙළේ ය. අන්තිමේ දී තරුණයාට යන්නට ඉඩ දෙන ලදි. ඔහු කාමරයෙන් පිට වී ගියේ යගවා ගත් පිළිකුලකින් යුතු ව ය.

පෝලන්ත ජාතිකයන් දෙදෙනාගෙන් ද සාක්ෂි විමසන ලදි. කුඩා කාමරයට වී සිටි ඔවුහු මුළු රෑ ම නිඳා නොගත්තෝ ය. පොලිස් නිලධරයකු පැමිණි වහා ම ඔවුන් ඇඳ පැළඳගත්තේ සාක්ෂි දීමට තමන් කැඳවන බව දැන සිටි හෙයිනි. ඔවුන් මහ අහංකාරකමක් දක්වා සාක්ෂි දුන් බව සැබෑ ය. එහෙත් මදක් නොසන්සුන් වූ හ. කුඩා පෝලන්ත ජාතිකයා පශු-වෛද්‍යවරයකු ලෙස සයිබීරියාවේ සේවය කළ දෙලොස් වන

පත්තියට අයත් විශ්‍රාමලත් සිවිල් සේවකයකු බව පරීක්ෂණයේ දී හෙළි විය. ඔහු ගේ නම මිසියොලොවිච් ය. රුබෙල්ව්ස්කි වැනි උගත්කමක් නැති දත් දොස්තර කෙනෙකි. ඔවුන් ගෙන් ප්‍රශ්න ඇසුවේ රාජ නීතිඥයා වුව ද ඔවුන් පිළිතුරු දුන්නේ ළඟ සිටි පොලිස් කපිතාන්ට ය. මෙම විභාගයේ ප්‍රධාන නිලධරයා පොලිස් කපිතාන් යැයි වරදවා තේරුම් ගත් ඔවුහු හැම වචනයක් පාසා ම, පොලිස් කපිතාන්ට 'කර්නල් මහත්මයා' කියා ඇමතූ හ. කීප වරක් ම පොලිස් කපිතාන් කළ තරවටුවෙන් පසු ව ය ඔවුන් රාජ නීතිඥයාට පිළිතුරු දුන්නේ. සමහර වචන ශබ්ද කිරීමේ දී කළ වැරැදි හැර ඔවුහු රුසියන් බස මැනැවින් දැන සිටියහ. ග්‍රෘෂෙන්කා සමග එදා හා අද පැවැති සබඳකම ගැන ඔහු ඉතා ආදරයෙන් හා අහංකාරකමින් ද යුතු ව කතා කළෙන් කෝපයට පත් මිතියා තමා ඉදිරිපිට 'තක්කඩියකුට' මෙසේ කතා කිරීමට ඉඩ නොදෙන බව කියමින් කෑගැවේ ය. 'තක්කඩියා' යන වචනය ලියා ගතයුතු යැයි පෝලන්ත ජාතිකයා කී විට මිතියා කෝපයෙන් වෙවුලන්නට විය.

"ඌ තක්කඩියෙක්! නිව තක්කඩියෙක්! ඒකත් ලියා ගන්න! මේක මූල් කොටුම්පත වුණාට කමක් නැහැ, ලියා ගන්න! ඌ තක්කඩියෙක් බව මම ආයේත් කියනවා!"

දණ්ඩනායකයා එය ද ලියා ගත්තේ ය. එහෙත් එ වේලේ ඔහු දැක්වූ සථානොචිතප්‍රඥාව හා උපායඥානය ප්‍රශංසනීය විය. මිතියාට තදින් තරවටු කළ හෙතෙම පරීක්ෂණයේ, ප්‍රේමය ගැන සඳහන් වී ඇති කොටස් අත්හැර දමා වෙනත් වැදගත් දෙයක් ගැන ප්‍රශ්න කරන්නට විය. ඒ වැදගත් දෙය නම් පෝලන්ත ජාතිකයන් විසින් හෙළි කරන ලද නීතිඥයන් ගේ සිත් ගත් ඉතා වැදගත් කරුණකි. ඒ වැදගත් කරුණ නම් ග්‍රෘෂෙන්කා අත්හැරයාම පිණිස මිතියා පෝලන්ත ජාතිකයාට රුබල් තුන් දහසක අත්ලසක් දීමට කළ වෑයමයි. එම මුදලින් රුබල් හත්සියක් අත් පිට දීමටත්, ඉතිරි දෙදහස් තුන් සිය පසු දින වචුමේ දී ගෙවීමටත් මිතියා පොරොන්දු විය. එ වේලේ තමා ළඟ මුළු මුදල ම නැති බවත්, මුදල් තිබෙන්නේ නගරයේ බවත් මිතියා විදේශිකයන් දෙදෙනාට දිවුරා කීවේ ය. පසු දින නගරයේ දී ඉතිරි මුදල ගෙවීමට ස්ථිර ව ම පොරොන්දු නොවූ බව මිතියා කෝපයෙන් කී ය. එහෙත් අනෙක් පෝලන්ත ජාතිකයා සිය සගයා ගේ කතාව ස්ථිර කෙළේ ය. මිතියා මඳ වේලාවක් කල්පනා කොට පෝලන්ත ජාතිකයන්

දෙදෙනා ගේ ප්‍රකාශය සමහරවිට ඇත්ත වත්නට පුළුවන් බවත්, එ වේලේ තමා කලබලයෙන් සිටි නිසා එසේ කියන්නට ඇති බවත් කී ය.

දණ්ඩනායකයා මේ සාක්ෂියට විශේෂ සැලැකිල්ලක් දක්වූයේ ය. මිතියා අතට අසු වූ රූබල් තුන් දහෙන් අඩක් නගරයේ හෝ මෙ තැන හෝ සඟවන්නට ඇතැයි යන දණ්ඩනායකයා ගේ අදහස මේ සාක්ෂියෙන් සනාථ විය. මිතියා ගේ අතේ රූබල් අටසීයක් පමණක් තිබීම නිසා නීතිඥයන් තුළ ඇති වූ ප්‍රශ්නය හා අවුලත් මින් පැහැදිලි විය. මිතියා ගේ අතේ රූබල් අටසීයක් පමණක් තිබීම එ තරම් වැදගත් නො වූවත් එය ඔහු ගේ වාසියට තිබුණු එක ම සාක්ෂිය විය. අත්තිමේ දී ඒ සාක්ෂිය ද බිඳ වැටිණි. තමා ලඟ රූබල් එක්දහස් පන්සීයකට වඩා නොතිබුණේ නම් ඉතිරි දෙදහස් තුන් සීය ගෙවන්නේ කෙසේ දැයි දණ්ඩනායකයා ඇසූ ප්‍රශ්නයට එඩිතර ව පිළිතුරු දුන් මිතියා, තමා නමින් තිබෙන චමස්නියා ගම්මානයේ ඔප්පුව මීට පෙර සම්සෝනොව් වෙළෙන්දාට හා හොලාකෝව් මැතිනියටත් පවරා මුදල් ගැනීමට අදහස් කළාක් මෙන් 'මේ පොඩි මිනිහාට ද' ඔප්පුව පැවරීමට අදහස් කල බව කී ය. මේ අමාරු අවස්ථාවෙන් පැනයාමට මිතියා දුන් පිළිතුර ගැන දණ්ඩනායකයාට සිනා නො වී සිටිය නො හැකි විය.

"අත් පිට ලැබෙන රූබල් දෙ දහස් තුන්සීයක් වෙනුවට ඔහු මේ ඔප්පුව භාරගැනීමට කැමැති වේ ය කියා විශ්වාස කරනව ද?"

"ඔව්, මිනිහා මුදල් වෙනුවට ඔප්පුව භාරගනීවි"යි මිතියා උනන්දුවෙන් කී ය. "මේ ඔප්පුවෙන් දෙදහක් නො ව භාර දහක්, නැතිනම් හයදහක් හොයා ගන්න පුළුවනි. පෝලන්ත හා යුදෙව් නීතිඥයන්ට ඔප්පුව භාර දීලා රූබල් දෙදහක් නො ව තාත්තා ගේ මුළු මුදලම අයිති කරගනීවි."

කුඩා පෝලන්ත ජාතිකයා ගේ සාක්ෂි සවිස්තර ව සඳහන් කර ගැනීමෙන් පසු ව, පෝලන්ත ජාතිකයන් දෙදෙනාට ම යන්න අවසර දෙන ලදි. සූදුවේ දී ඔවුන් කල වංචාව ගැන වචනයක් වත් සඳහන් නො වී ය. ඔවුන් ගේ සාක්ෂිවලින් ප්‍රීතියට පත් නීතිඥයා නොවැදගත් විස්තර අයා ඔවුන් වෙහෙස කිරීමට කැමැති නො වී ය. හැරත් එය සුරා බී සිටි අවස්ථාවේ දී සූදු කෙළින අතරේ ඇති වූ සුළු අසන්තෝෂයකි.

එ දින රෑ සුරා බී කලකෝලාහල කිරීම නො අඩු ව පැවැතිණි. එ හෙයින් සුදුවේ දී වංචා කොට දිනා ගත් රූබල් දෙසිය තබා ගැනීමට පෝලන්ත ජාතිකයාට අවකාශ ලැබිණි.

අනතුරු ව මහලු මැක්සිමෝට කතා කරන ලදි. බයාදු කමින් යුතු ව කාමරයට පිවිසි හෙතෙම නොසන්සුන් කමින් හා ශෝකයෙන් ද තැවෙමින් මේසය ළඟට සෙමෙන් ගොස් හිඳගත්තේ ය. මෙතෙක් වේලා පහල කාමරයේ ගෘසෙන්කා සමඟ නිහඬ ව හිඳ සිටි හෙතෙම, පොලිස් කපිතන් ගේ කියමනේ හැටියට 'ඉඳ හිට' ඉකිබිඳිමින් අඩා අතේ තිබුණු නිල් පැහැති ලේන්සුවෙන් කඳුළු පිස දමා ගත්තේ ය. ඔහු සනසා සන්සුන් කෙරුණේ ගෘසෙන්කා විසිනි. තමා ගේ දිළිඳුකම නිසා මිතියා ගෙන් රූබල් දහයක් ණයට ගත් බවත්, එය ආපසු දීමට සූදානම් බවත්, හෙතෙම ගත්කටට ම කී ය. තමා කරමසෝ මහතා ගෙන් මුදල් ණයට ගත් නිසා, අනෙක් අයට වඩා හොඳට කරමසෝ මහතා ගේ අතේ තිබුණු මුදල් දුටු නිසා, එ තැන කො තරම් මුදලක් තිබෙන්නට ඇද්දැයි රාජනීතිඥයා කෙළින් ඇසූ ප්‍රශ්නයට "රූබල් විසි දහක් පමණ තිබුණා" යි මහල්ලා ඉතා පැහැදිලි ව පිළිතුරු දෙමින් කී ය.

"මීට කලින් කො තැනක දී වත් රූබල් විසි දහක් දැකල තියෙනවා ද?" යි රාජ නීතිඥයා සිනා සෙමින් ඇසුවේ ය.

"මගේ නෝනා අපට තිබුණු කුඩා ඉඩම විකුණා මුදල් ගත්ත වෙලාවේ දී මම හුඟක් මුදල් දුටුවා. නමුත් එතැන විසි දහක් තිබුණේ නැහැ. තුන් දහයි තිබුණේ. මගේ නෝනා දුර ඉඳල මට මුදල් පෙන්නුවා මිස අතට දුන්නේ නැහැ. ඈ ඒ ගැන පුරසාරම් දෙඩුවා. ඇගේ අතේ දේදුන්නේ පාට ඇති නෝට්ටු කොළ හුඟක් තිබුණා. කරමසෝ මහත්මයා ගේ අතේ තිබුණේත් දේදුන්නේ පාට ඇති නෝට්ටු කොළ."

මහලු මැක්සිමෝ වැඩි වේලා නො තබා ඉක්මනට ම යවන ලදි. අන්තිමට කැඳවන ලද්දේ ගෘසෙන්කා ය. ගෘසෙන්කා දැකීමෙන් මිතියා නොසන්සුන්වන බව නීතිඥයෝ දෙදෙනා දැනගත්හ. වෙනෙකක් තබා රාජ නීතිඥයා අවවාදයක් වශයෙන් මිතියාට වචන කීපයක් කීවේ ය. පිළිතුරු වශයෙන් මිතියා කළේ කලබල නො කර සිටින බව හැඟවීමට මෙන් හිස බලා ගැනීම ය. ගෘසෙන්කා කාමරයට කැඳවාගෙන ආවේ පොලිස් කපිතන් විසිනි. ශෝකයෙන් අඳුරු වූ ඇගේ මුහුණේ සන්සුන් ගතියක් දකින්නට තිබිණි. රාජ නීතිඥයා විසින් පිළිගන්වන ලද අසුනෙහි ඈ නිහඬ ව හිඳගත්තා ය. ඇගේ

මුහුණ සුදුමැලි විය. සීතල බව හැඟවූ ඈ ඇගේ අලංකාර කළු සාළුව ගෙන පෙරවා ගත්තා ය. උණ සමඟ ඇතිවන සීතලයකින් ඈ පෙළෙන්නට වූවා ය. එය, එදින රාත්‍රියේ සිට කාලයක් ගතවන තුරු ඇය ගොදුරු කරගත් රෝගයක පෙර නිමිති විය. ඇගේ සන්සුන් කම, අවංක බැල්ම, හික්මුණු ගතිය, එහි රැස් ව සිටි අය කෙරෙහි තදින් බලපැවැත්වී ය. රාජ නීතිඥයා ගේ සිත ද තරුණිය කෙරෙහි ඇදී ගියේ ය. මීට කලින් ඇය කිප වරක් ම දුක ඇතත් ඈ ඉතා අලංකාර ස්ත්‍රියක බව දැනගත්තේ එවේලේ බව ඔහු පසුව කී ය. ඊට කලින් ඔහු ඇය පිළිගත්තේ 'ගම්බද වෙසඟනක' හැටියට ය. "උසස් කුලකාන්තාවක තුළ තිබිය යුතු හැම ශිෂ්ට ගතියක් ම ඇය තුළ තිබුණා"යි රාජ නීතිඥයා කාන්තාවන් කිප දෙනකු සමඟ කතා කරන අතරේ උනන්දුවෙන් කී ය. මේ කතාව මහත් පිළිකුලින් යුතු ව පිළිගත් කාන්තාවෝ රාජ නීතිඥයා 'දඟකාරයෙක්'යයි කීහ. එය රාජ නීතිඥයා ගේ සොම්නසට හේතු විය.

ගෘසෙන්කා කාමරයට ඇතුළු වන අතරේ මොහොතකට පමණ මිතියා දෙස බැලුවා ය. මිතියා ද ගෘසෙන්කා දෙස නොසන්සුන් බැල්මෙන් බැලුවේ ය. තරුණිය ගේ මුහුණ දුටු වහා ම තරුණයා ගේ සිත සන්සුන් විය. මූලික කරුණු අසා දැන අවවාදයක් කළ රාජ නීතිඥයා, විශ්‍රාම ලත් ලෙප්ටිනන් මිතියා කරමසෝ සමඟ තමා කෙබඳු සබඳ කමක් පැවැත්වූයේ දැයි මහත් නොකැමැත්තෙන් හා ශිෂ්ට ලෙස ද ගෘසෙන්කා ගෙන් විමසුවේ ය. එම ප්‍රශ්නයට ගෘසෙන්කා ඉතා සෙමෙන්, එහෙත් එඩිතර ව මෙසේ පිළිතුරු දුන්නා ය.

"මම මිතියා කරමසෝ හොඳට අඳුනනවා. පසුගිය මාසයේ දී හිතවතකු හැටියට එයා මා ආශ්‍රය කළා." අනතුරු ව අසන ලද ප්‍රශ්නවලට අවංක ව කෙළින් පිළිතුරු දුන් ගෘසෙන්කා "සමහර විට මම මිතියාට කැමැත්තක් දැක්වූවා. එහෙත් මම එයාට ආලය කළේ නැහැ. මගේ කුඩුකේඩුකම නිසා මම තාත්තාගෙයි පුතාගෙයි දෙන්නගේ ම සිත් දිනා ගත්තා. මිතියා තාත්තා එක්ක බොහෝ ම තරහෙන් හිටියේ. මම එය විහිළුවක් ලෙස සැලැකුවා. මම කවදාවත් මහලු කරමසෝ ළඟට යන්න අදහස් කළේ නැහැ. ඒ වෙනුවට මම මහල්ලා ගේ සල්ලාල කම් ගැන සිනාසුණා. පසු ගිය මාසයේ දී මම මේ දෙන්නා ගැන කල්පනා කළේවත් නැහැ. මා අනාථ කළ තැනැත්තා ගැන බලාපොරොත්තුවෙන් සිටියා..........

ඒ ගැන මගෙත් ප්‍රශ්න අහන්න උවමනාවක් නැහැ. මම ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නෙත් නැහැ. ඒක මගේ පෞද්ගලික දෙයක්''යයි කතාව අවසන් කරමින් කීවා ය.

ගෘසෙන්කා ගේ අදහස් අනුව වහා ක්‍රියා කළ රාජ නීතිඥයා ආංලය පිළිබඳ කරුණු ගැන ප්‍රශ්න ඇසීම නතර කොට, වැදගත් කරුණු ගැන, එ නම් රූබල් තුන් දහ ගැන ප්‍රශ්න කෙළේ ය. මාසයකට කලින් මිතියා මෙම ස්ථානයේ දී රූබල් තුන් දහසක් පමණ වියදම් කළ බවත්, තමා එම මුදල් ගැණ නො බැලුවත් තුන් දහසක් වියදම් කළ බව මිතියා ගෙන් ම දැනගත් බවත් කීවා ය.

''මිතියා ඒ බව කිව්වේ තනියෙන් සිටින විට ද නැතිනම් වෙනත් අය ඉදිරිපිට ද? නැතිනම් ඔබ ළඟ සිටිය දී මිතියා ඒ ගැන වෙනත් අය එක්ක කතා කරනවා අසා සිටියා ද?''යි දණ්ඩනායකයා වහා ප්‍රශ්න කෙළේ ය.

මිතියා වෙනත් අය සමඟ ඒ ගැන කතා කරනවා තමා අසා ඇති බවත්, තමා සමඟ තනියෙන් සිටින විට කී බවත් ගෘසෙන්කා පිළිතුරු වශයෙන් කීවා ය.

"ඔබ එක්ක තනියෙන් සිටින විට කී වතාවක් කිව්ව ද?"යි ප්‍රශ්න කළ දණ්ඩනායකයාට, කීපවරක් ම කියා ඇති බව ගෘසෙන්කාගෙන් දැනගැනීමට ලැබුණේ ය.

ගෘසෙන්කා දුන් පිළිතුර අසා දණ්ඩනායකයා ප්‍රීති විය. ඒ මුදල් කැතිරිනා ගෙන් ලැබුණු බව ගෘසෙන්කා ද දැන සිටිය බව වැඩි දුරටත් ප්‍රශ්න කල දණ්ඩනායකයාට දැනගැනීමට ලැබිණි.

''මිට මාසයකට පමණ උඩ දී මිතියා රූබල් තුන්දහසක් නො ව ඉන් භාගයක් පමණ වියදම් කොට අනෙක් භාගය ළඟ තිසා ගත්ත බව දන්නවා ද?''

"නැහැ, මම දන්නේ නැහැ."

ඒ මාසය තුළ දී, තමා ළඟ තඹයක්වත් නැති බව මිතියා කී බව හෙළි විය. "මිතියා හැම තිස්සේ ම තාත්තා ගෙන් මුදල් ටිකක් ලැබේ ය කියා බලාපොරොත්තු ව සිටියා"යි ගෘසෙන්කා අන්තිමේ දී කීවා ය.

''මිතියා, තාත්තා මරන බව ඔබ ඉදිරිපිට දී කෝන්ති ගිය වෙලාවක දී නිකමටවත් කිව්වේ නැද්ද?''යි රාජ නීතිඥයා එක් වර ම ඇසුවේ ය.

"ඔව්, එහෙම කිව්වා"යි ගෘසෙන්කා සුසුමක් හෙළමින් කීවා ය.

"එක වතාවක් ද කිව්වේ? නැති නම් කීප වතාවක් කිව්ව ද?"

"කීප වතාවක් ම කිව්වා, හැම වතාවේ ම කිව්වේ තරහෙන්."

"මිතියා තාත්තා මරාවි ය කියා විශ්වාස කළා ද?"

"නැහැ, මම කවදාවත් විශ්වාස කළේ නැහැ"යි ගෘසෙන්කා දැඩි විශ්වාසයෙන් කීවා ය. "මිතියා ගේ ගතිගුණ ගැන මගේ ලොකු පාහැදීමක් තියෙනවා."

"මහත්වරුනි, තමුන්නාන්සේලා ඉදිරිපිට දී මේ කාන්තාවට වචනයක් කීමට මට අවසර දෙනව ද?"යි මිතියා හදිසියෙන් ම ඇසුවේ ය.

"ඔව්, ඕනෑ ම දෙයක් කියන්න"යි රාජ නීතිඥයා අවසර දෙමින් කීවේ ය.

"ගෘසෙන්කා, ඔබ දෙවියන් වහන්සේ ගැන විශ්වාස කරනවා වගේ, මගේ තාත්තා ගේ මරණයට මා වැරදිකාරයකු නොවන බව විශ්වාස කරන්න"යි මිතියා හිඳ සිටි තැනින් නැගිට කීවේ ය.

මිතියා හිඳගත් පසු ගෘසෙන්කා පුටුවෙන් නැගිට, කාමරයේ තබා තිබුණු සුරුවම දෙස බලා, මහත් භක්තියෙන් යුතු ව, කුරුසයේ ලකුණ ළය මත ඇඳගත්තේ ය.

"දෙවියන් වහන්සේට ගෞරවාදර වේ වා"යි නැගීමෙන් වෙව්ලන කටහඬින් පැවසූ ගෘසෙන්කා දණ්ඩනායකයා දෙසට හැරී මෙසේ කීවා ය. "මිතියා දැන් කී දෙය විශ්වාස කරන්න. මම මිතියා හොඳට අඳුනනවා. සමහර විට විහිළුවට හා මුරණ්ඩු කමට එයා යම් යම් දේ කියනවා. නමුත් හිතට විරුද්ධ ව කවදාවත් කිසි ම කෙනකු මුලා කරන්නේ නැහැ. මිතියා ඇත්ත කියන බව පිළිගන්න පුළුවනි."

"බොහොම ස්තුතියි. ගෘසෙන්කා මට අලුත් ආත්ම ශක්තියක් ලබා දුන්නා"යි මිතියා වෙව්ලන කටහඬින් කී ය.

පෙර දින රාත්‍රියේ දී මිතියා ළඟ කොතරම් මුදලක් තිබුණේ දැයි ප්‍රශ්න කළ විට, තමා ඒ ගැන කිසිවක් නොදන්නා

බවත්, ඔහු රූබල් තුන් දහසක් ගෙනා බව කීප දෙනකුටම කියනවා තමා අසා සිටි බවත් ඈ කීවා ය. මුදල් ලැබුණේ කොහෙන් දැ?යි ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන් ගෘසෙන්කා, ඒ මුදල් කැතිරිනාගෙන් 'සොරකම් කළ' බවත්, කෙසේ හෝ හෙට ඒ මුදල් ආපසු දෙන බවත්, මීතියා තමාට පමණක් කී බව කීවා ය. කැතිරිනා ගෙන් 'සොරකම් කළ' මුදල් වියදම් කළේ මාසයකට කලින් ද? නැති නම් ඊයේ රාත්‍රියේ දැ? යි දණ්ඩනායකයා කීප වරක් ම ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන් තරුණිය, තමා සඳහන් කළේ මාසයකට කලින් වියදම් කළ මුදල් ගැන බවත්, තමා තේරුම් ගත්තේ ඒ විදියට බවත් කීවා ය.

අත්තිමේ දී ගෘසෙන්කාට යන්නට අවසර දුන් රාජ නීතිඥයා ඇය කැමැති වේලාවක දී නගරයට ගිය හැකි බවත්, ගමනට අසුන් හෝ ආරක්‍ෂාවට කෙනකු හෝ උවමනා නම් ඒ සියල්ලක් ම සලස්සා දීමට තමා ඉතා කැමැති බවත් කීවේ ය.

"බොහොම ස්තුතියි. මම මැක්සිමෝව් මහත්මයා එක්ක නගරයට යනවා"යි ගෘසෙන්කා හිස නමා ආචාර කරමින් කීවා ය. "ඒ අතර මට ඉඩ දෙනවා නම් මීතියා ගැන ගන්නා තීරණය දැනගැනීමට ටික වේලාවකට නතර වෙන්න කැමැති යි."

ඈ නික්ම ගියා ය. මීතියා සන්සුන් විය. ඒ අතරේ ප්‍රීතියෙන් සිටින බව ද හැඟෙව්වේ ය. එහෙත් එය ඉතා සුළු වේලාවකට පමණි. ශරීරයේ හටගත් අමුතු දුර්වල කමකින් තමා පෙළෙන බව ඔහුට දැනිණි. විඩාවෙන් ඔහු ගේ නෙත් වැසෙන්නට විය. සාක්ෂිකාරයන් ගෙන් කටඋත්තර ගැනීම අන්තිමේ දී අවසන් කරන ලදි. අනතුරු ව ඔවුහු සටහන් කරගත් සාක්ෂි නැවතත් සකස් කොට ලියන්නට වූ හ. මීතියා හිඳ සිටි තැනින් නැගිට, කාමරයේ මුල්ලේ තිරය ළඟට ගොස් කම්බිලියකින් වසන ලද විශාල පෙට්ටිය උඩ දිග ඇදී නිදා-ගත්තේ ය. මෙසේ නිදා සිටි ඔහුට තැනටවත්, වේලාවටවත්, නොගැළපෙන සිහිනයක් පෙනිණි. යුධ හමුදාවේ සිටිය දී මීතියා බොහෝ කලක් නතර ව සිටි ස්ටෙප් තණ බිමේ කිසියම් පෙදෙසක් තුළින්, ගැමියෙක් අසුන් දෙදෙනකු යොදන ලද රථයක ඔහු නංවා ගෙන මඩවගුරක් තුළින් යමින් සිටියේ ය. ඔහුට තද සීත ගතියක් දැනිණි. නොවැම්බර මාසයේ මුල් කාලය බැවින් විශාල හිම තලි වැටෙන්නට විය. බිම වැටුණු

හිම වහා දිය වී ගියේ ය. හිතට දිරි ගත් රියැදුරා අසුන්ට තලමින් වේගයෙන් රථය දක්වූයේ ය. රියැදුරාට දිග රැවුලක් තිබිණි. ඔහුට එ තරම් වයස ද නැති. හවුරුදු පනහක් පමණ ඇති. ඔහු ඇඳ සිටියේ ගෙදර වියන ලද, ගැමියන්ට පමණක් විශේෂ වූ කබායකි. ටික වේලාවකින් ඔවුහු ගම්මානයක් දුටහ. ඒ ගමේ තනා ඇති අපිරිසුදු පැල්පත් මිතියා දුරදීම දුටුවේ ය. ඉන් අඩක් පමණ ගින්නෙන් විනාශ වී කළු වූ ලී දඬු පමණක් ඉතිරි වී තිබිණි. රථය ගමට ඇතුළු වනවාත් සමග ගමේ ගෑනු මග දෙපස රැස් වූ හ. ඔවුහු බොහෝ දෙනෙක් සිටියහ. වැහැරී ගිය ඔවුන් ගේ මුහුණු අඳුරු විය. වෙසෙසින් ම පාරේ කෙළවර සිටි ගැහැනිය අනෙක් ගැහැනුන්ට වඩා කෙට්ටු ය, උස ය; වයස හවුරුදු හතළිහක් මෙන් පෙනුණත් හවුරුදු විස්සකට වඩා නැත. ඇගේ මුහුණ ඉතා සිහින් ය. ඈ කුඩා දරුවකු වඩාගෙන සිටියා ය. දරුවා කුසගින්නෙන් අඬන්නට විය. ඇගේ වියළුණු දෙතනේ කිරි බින්දුවක්වත් නැත. සීතලෙන් පෙළෙන දරුවා නිල් වූ අත්පොඩි සහිත නග්න වූ දෑත දික් කරමින් ඇඬුවේ ය.

ඇයි මේ මිනිස්සු අඬන්නේ?'' යි වේගයෙන් යන රිය තුළ සිටි මිතියා රියැදුරා ගෙන් ඇසුවේ ය.

"අඬන්නේ අර අත දරුවා'' යි රියැදුරා කී ය.

රියැදුරා නියම ගැමියකු මෙන් 'අත දරුවා' යැයි කී හැටි මිතියා ගේ සිත් ගත්තේ ය. එහි වැඩි ආදරයක් හා අනුකම්පාවක් ද ගැබ් වී තිබෙන බව ඔහු දුටුවේ ය.

"ඇයි ඒ අත දරුවා අඬන්නේ?'' යි මිතියා මෝඩයකු මෙන් නැවත නැවතත් ඇසුවේ ය.

"උන් බොහො ම දුප්පත්. ගෙවල් දොරවල් පිච්චිලා. කන්න නැති ව හිඟා කනවා.''

"නැහැ, නැහැ, ඇයි ඒ ගෑනු පේළිට ඉන්නේ? මේ මිනිස්සු දුප්පත් වෙන්න හේතුව කුමක් ද? දරුවා දුප්පත් වෙන්න හේතුව කුමක් ද? ඇයි මේ පලාත පාළු වී තියන්නේ? ඇයි උන් එකිනෙකා ආදරයෙන් වැලඳගෙන සිඹින්නෙ නැත්තේ? ඇයි උන් සන්තෝෂයෙන් සිත්දු නො කියන්නේ? ඇයි උන් අවාසනාවන්ත වී සිටින්නේ? ඇයි උන් අර දරුවාට කෑම නො දෙන්නේ?'' යි මිතියා කිසිවක් තේරුම් ගැනීමට නොහැකි වූවාක් මෙන් ප්‍රශ්න කෙළේ ය.

තමා අර්ථයක් නැති නිෂ්ප්‍රයෝජන ප්‍රශ්න අසතත්, ඒ ප්‍රශ්න නො අසා සිටිය නොහැකි බවත්, ඒ ප්‍රශ්න ඇසිය යුත්තේ මේ ක්‍රමයට බවත් ඔහුට හැඟිණි. මීට පෙර ඇති නොවූ දයානුකම්පාවෙන් යුත් අද්භූත හැඟීමක් තමා ගේ හද තුළ ඇති වන බව මීතියාට දැනිණි. මීට පස්සේ දරුවා ගේ ඇඬීම නවත්වා, ඔවුන් ගේ දුක්මුසු පෙනුම වෙනස් කොට, ඔවුන් සුඛිත මුදිත කිරීමට මීතියාට උවමනා විය. තමාට පැමිණෙන්නා වූ හිරිහැර කරදර කිසිවක් නො විමසා කරමසෝ් වරුන්ට සුපුරුදු ගතිගුණ අනුව එ වේලේ ම ඔවුන්ට පිහිටවීමට මීතියාට උවමනා විය.

"මීතියා, මම ඔබ සමඟ එනවා. මීට පස්සෙ මුළු ජීවිතයට ම මම ඔබ අත්හරින්නේ නැහැ"යි ආදරයෙන් කියන, අසල සිටි ගෘසෙන්කා ගේ කට හඬ ඔහුට ඇසිණි. ඔහු ගේ හදවත බැබැළෙන්නට විය. ඉදිරියෙන් ඇත්තා වූ ආලෝකය බලා ඔහු අමාරුවෙන් පා නැගුවේ ය. ජීවත්වීමට ඔහු තුළ මහත් ආශාවක් ඇති විය. මෙසේ ජීවත් වෙමින්, ඉදිරිපිට ඇත්තා වූ, තමා කැඳවන ආලෝකය දෙසට වහවහා යෑමට ඔහු වෑයම් කෙළේ ය.

"මොනවටද යන්නේ? කොහෙ ද යන්නේ?"යි තිත්දෙන් අවදි වූ මීතියා, ඇස් ඇර, පෙට්ටිය උඩ හිඳ ඇසුවේ සිහි නැති ව සිට යළි සිහි ලැබුවකු මෙනි. සිනාවකින් ඔහු ගේ මුහුණ ආලෝක විය. හඬනඟා කියවනු ලබන තමා ගේ සාක්ෂියට තවත් දී අත්සන් කළයුතු බව ඔහු ළඟ සිටි රාජ නීතිඥයා කී ය. තමා පැයක් හෝ ඊට වැඩි වේලාවක් හෝ නිඳසිටි බව මීතියා දැනගත්තේ ය. එහෙත් රාජ නීතිඥයා ගේ කතාව ඔහුට නො ඇසිණි. තමා ගේ හිස යටින් කොට්ටයක් තබා තිබෙන බව ඔහු දුටුවේ ය. තමා විඩා වැටී නිදන විට ඒ කොට්ටය නොතිබුණ බව ඔහුට හොඳට මතක ය.

"කවුද මගේ හිස යටින් කොට්ටයක් තිබ්බේ? කවුද ඒ කරුණාවන්ත තැනැත්තා?"යි මීතියා කෘතඥතාවෙන් හා ප්‍රීතියෙන් ද විමසුවේ තමාට විශාල උපකාරයක් කර තිබෙන්නාක් මෙනි.

එහෙත් ඒ කරුණාවන්ත පුද්ගලයා ඔහුට සොයාගත නොහැකි විය. සමහර විට කොට්ටය තබන්නට ඇත්තේ සාක්ෂි දුන් ගැමියකු වියහැකි ය. නැති නම් රාජ නීතිඥයා ගේ ලියන්නා අනුකම්පාවෙන් කොට්ටයක් තබන්නට ඇත.

මීතියා ගේ ආත්මය ශෝකයෙන් වෙවුලන්නට විය. මේසය ළඟට ගිය හෙතෙම ඔවුන් කැමැති දෙයකට අස්සන් කරන බව කී ය.

"මම හොඳ ගීනයක් දුටුවා"යි මීතියා පුදුම කටහඬකින් කී ය. ඔහු ගේ මූහුණ ප්‍රීතියෙන් හටගත් අලුත් ආලෝකයකින් දීප්තිමත් විය.

නව වන පරිච්ඡේදය

මීතියා සිරභාරයට ගනියි

මීතියා ප්‍රකාශය අස්සන් කළ ඉක්බිති රාජ නීතිඥයා විත්තිකරු දෙසට හැරී, සිරභාරයට ගැනීමේ ප්‍රකාශය කියෙව්වේ ය. අසවල් දින, අසවල් වේලාවේ දී, අසවල් ස්ථානයේ දී, අසවල් දිස්තිරික් කෝට්ටුවේ රාජ නීතිඥයා, අසවල් අපරාධය කළ චෝදනාව පිට (චෝදනා සියල්ලක්ම ඉතා පරිස්සමින් ලියන ලදි) අසවලා (ඒ කියන්නේ මීතියා) හොඳට පිරික්සා බලා, විත්තිකාරයා ඉහත සඳහන් චෝදනාවලට තමා නිවැරදිකාරයා යයි කියන අතර තමා ගේ ආරක්ෂාවට කිසිම සාක්ෂියක් ඉදිරිපත් නොකිරීම ගැන සලකා බලා, ඒ අතරේ අසවල් සාක්ෂිකාරයන් විසින් විත්තිකාරයාට විරුද්ධ ව අසවල් කාරුණු සම්බන්ධ ව සාක්ෂිදුන් හෙයින්, අපරාධ නීති සංග්‍රහයේ අසවල් වගන්තිය යටතේ ක්‍රියා කොට, අසවලා, (මීතියා කරමසෝ) ඉදිරි කාලයේ දී පවත්වනු ලබන නඩු විභාග- යෙන් පැනයාමට නොහැකි වන ලෙස, අසවල් සිරගෙදර සිරකොට තබන බව විත්තිකරුට දන්වා, ඉන් පිටපතක් උප දණ්ඩනායකයාට ඉදිරිපත් කරන බව දැනුම් දුන්නේ ය. කොටින් කියතොත් ඒ මොහොතේ සිට තමා සිරභාරයට ගත් බව මීතියාට දන්වන ලදී. ඉතා සැලැකිල්ලෙන් මේ ප්‍රකාශයට සවන් දුන් මීතියා අන්තිමේ දී උරහිස් හකුලා ගත්තේ ය.

"මහත්වරුනි, මම තමුන්නාන්සේලාට දෙස් කියන්නේ නැහැ. මම ඕනෑ ම දෙයකට සූදානම්. තමුන්නාන්සේලාට වෙන කළ හැකි දෙයක් නැති බව මං දන්නවා."

තවමත් එ තැන සිටි, එම පළාතේ පොලිස් කපිතන්, මිතියා සිරගෙදරට කැඳවාගෙන යන බව රාජ නීතිඥයා මිතියාට ඉතා කරුණාවෙන් පැහැදිලි කර දුන්නේ ය.

"ටිකක් ඉන්න"යි මැඩගත නොහැකි හැඟීමෙන් යුතු ව රාජ නීතිඥයා ගේ කතාවට බාධා කරමින් හදිසියෙන් ම පැවැසූ මිතියා එහි රැස් ව සිටි අනෙක් අය දෙසට හැරෙමින් මෙසේ කී ය. "අපි කවුරුත් දරුණු සිත් ඇති මිනිස්සු. අපි භයානක සතුන්ට සමානයි. අප කරන වැරදි නිසා මිනිස්සු, මව්වරු හා කිරිබොන අත දරුවන් වේදනාවෙන් අඬනවා. මේ නපුරු මිනිසුන් අතරින් මා ඉතා නපුරු නීච, නින්දිත කාලකණ්ණියෙක්. මම හැම දා ම යහපත් ජීවිතයක් ගත කිරීමට දිවුරා පොරොන්දු වෙනවා. එහෙත් හැම දා ම එක ම විදියේ නීච නින්දිත දේවල් කරනවා. මා වැනි අයට දඬුවම් කළ යුතුයි. එය දෛවයෙන් ලැබෙන දඬුවමක් විය යුතුයි. ලණුවකින් බැඳ තබන්නාක් මෙන් අභ්‍යන්තරයෙන් ඇතිවන කිසියම් බලයකින් බැඳ තැබිය යුතුයි. මට කවදාවත් සවුත්සාහයෙන් හොඳ මිනිහෙක් වෙන්න බැහැ. හෙණයක් වැදුණාක් මෙන් දූන් මා මහ විපත්තියකට පත් වී සිටිනවා. අපරාධකාරයකු ලෙස මා ලැබූ චෝදනාවෙන් ඇති වන වේදනාව හා සමාජයෙන් ඇති වන ලැජ්ජාවත් මම ඉවසන්නම්. පැමිණෙන්නා වූ සියලු දුක් විඳ, ඒ දුකින් සිතත් කයත් පිරිසුදු කර ගැනීමට මම වෑයම් කරන්නම්. සමහර විට මා හොඳ මිනිහෙක් වෙන්න පුළුවනි. මහත්වරුනි, මා අන්තිම වතාවට කියන දෙය කරුණා කරල අහන්න. මම මගේ තාත්තා මැරුවේ නැහැ. මම මේ දඬුවම පිළිගන්නේ තාත්තා මැරූ නිසා නො ව තාත්තා මැරීමට අදහස් කළ නිසයි. සමහර විට ඉඩ ලැබුණා නම් මම තාත්තා මරනවා. ඒත් මම තමුන්නාන්සේලාට විරුද්ධ ව සටන් කරන බවට පොරොන්දු වෙනවා. ඒ බව කල්තියා ම දැනුම් දිය යුතුයි. මම අන්තිම දක්වා ම සටන් කරනවා. අන්තිමේ දී දෙවියන් වහන්සේ තීරණය කරාවි. දැන් ඉතින් මට යන්න අවසර දෙන්න. විභාගය පවත්වන වේලාවේ දී කෑගෑවාට මා සමඟ අමනාප වෙන්න එපා. ඒ වේලාවේ දී මා මෝඩයකු හැටියටයි කටයුතු කළේ. තව මොහොතකින් මා සිරකරුවෙක් වෙනවා. ඒ නිසා නිදහස් මනුෂ්‍යයකු ලෙස මම ඔබ හැම දෙනාට ම අත දී සමු ගත යුතුයි."

ඔහු ගේ කටහඬ වෙවුලුවේ ය. ඔහු සමු ගැනීම පිණිස ළඟ සිටි රාජ නීතිඥයාට අත දුන්නේ ය. නීතිඥයා වහා ම

අත පිටුපසට කරගත්තේ ය. නීතිඥයා ගේ මේ ක්‍රියාව දුටු මිතියා තිගැස්සුණේ ය. ඔහු දික්කර ගෙන සිටි අත ඉබේට ම පහත වැටිණි.

"මූලික පරීක්ෂණය තව ම අවසන් වුණේ නැහැ" යි රාජ නීතිඥයා නොසන්සුන් කමින් හා සෙමෙන් ද කී ය. "පරීක්ෂණයේ අවසාන කොටස නගරයට ගිහින් අවසන් කරනවා. නඩුවේ දී මහත්මයා නිදහස් වේ ය කියා මම ප්‍රාර්ථනා කරනවා. මහත්මයා වරදකාරයකුට වඩා අවාසනාවන්තයෙක් ය කියා මම නිතර කල්පනා කළා. මෙහි සිටින හැම දෙනා වෙනුවෙන් මා කියන්න කැමැතියි මහත්මයා හොඳ අවංක හිතක් ඇති එහෙත් අවාසනාවන්ත කමට සිතේ හටගත් ආසාව නිසා සීමා ඉක්මවා කටයුතු කළ තරුණයකු බව........."

මේ දේශනය අවසන් වන විට නීතිඥයා ගේ කුඩා සිරුරින් මහානුභාව සම්පන්න ගතියක් ප්‍රදර්ශනය විය. තව මොහොතකින් මේ 'කොලුවා' තමා මූල්ලකට කැඳවා ගෙන ගොස් නැවත 'කෙල්ලන්' ගැන කතාව පටන් ගන්නට පිළිවනැයි මිතියාට හදිසියෙන් ම කල්පනා විය. එහෙත් මරණ දඬුවම පිණිස ගෙනයනු ලබන සිරකරුවකු තුළ නැඟට නොහැලැපෙන තුසුදුසු සිතිවිලි ඇති වී යළි නැති වී යයි.

"තමුන්නාන්සේලා බොහො ම කරුණාවන්තයි, බොහෝ ම හොඳයි. අන්තිම වතාවට ගෲසෙන්කා ගෙන් සමුගැනීමට මට අවසර දෙනව ද?"

"අවසර දෙන්න පුළුවනි.........නමුත් අප ඉදිරිපිට දී සමු ගන්නවා නම් මිස නැතිනම් අවසර දෙන්න පුළුවන් කමක් නැහැ........."

"ඒකට වරදක් නැහැ."

ගෲසෙන්කා කැඳවනු ලැබුවා ය. එහෙත් සමුගැනීම ඉතා කෙටි විය. ඔවුහු වඩා කතා නොකළහ. මේ සමු ගැනීම ගැන රාජ නීතිඥයා තුළ කිසි ම සතුටක් ඇති නො වී ය. අන්තිමේ දී ගෲසෙන්කා මිතියාට හිස නමා ආචාර කළා ය.

"මිතියා, මා ඔබට අයිති බව මම කිව්වා. මම කවදාවත් ඔබ අත්හරින්නේ නැහැ. කො තැන ගියත් මම ඔබ එක්ක එනවා. ඔබ විනාශ වුණේ ඔබේ වරදින් වුණත් ඔබ වරදකාරයකු නොවන බව මම දන්නවා."

ඇගේ තොල් වෙව්ලන්නට විය. දෑසෙන් කඳුළු කඩා හැලුණේ ය.

"ගෲසෙන්කා, මම ඔබට ආලය කිරීම ගැන මට සමාවන්න. එම ආලයෙන් ඔබ විනාශ කිරීම ගැන මට සමාවන්න."

මිතියාට තවත් කතා කිරීමට උවමනා විය. එහෙත් කතා කරගත නො හැකි ව ගොළු වී කාමරයෙන් පිට වී ගියේ ය. ඔහු ගැන නිතර හෝඩුවාවෙන් සිටි කීපදෙනෙක් වහා ඔහු වටකරගත්හ. පෙර දින රෑ ඔහු මහත් ඝෝෂාවක් නඟමින් ඇන්ඩි ගේ ට්‍රොයිකාවෙන් පැමිණ බෑස්ස පඩි පෙළ මුල කරත්ත දෙකක් නවතා තිබිණි. රැලි වැටුණු මුහුණින් යුත් තරබාරු මිනිහකු වූ පොලිස් කපිතන් කිසියම් කරුණක් නිසා කෝපයෙන් සිටියේ ය. ඔහු කෝපයෙන් කෑගෑවේ ය. ඔහු මිතියාට කරත්තයට නඟින්නට කීවේ උවමනාවට වඩා රළු ගතියක් දක්වමිනි.

"මම මේ මිනිහට තැබෑරුමේ දී බොන්න දෙන කොට මිනිහා මට කවදාවත් මේ විදියට කතා කළේ නැහැ"යි මිතියා කරත්තයට ගොඩ වන අතරේ කල්පනා කෙළේ ය. ගේට්ටුව ළඟ විශාල පිරිසක් රැස්වී හුන්හ. හෝටලයේ අයිතිකාරයා පඩිපෙළ බැස ආවේ ය. ඔවුන් හැම දෙනා ම මිතියා දෙස බලාහුන්හ.

"මට සමාවන්න"යි මිතියා ඔවුන් පසු කර යන අතරේ කෑගා කීවේ ය.

"අපටත් සමාවන්න"යි පිරිසෙන් දෙතුන් දෙනෙක් කීහ.

"ට්‍රිපෑන් බොරිසොවිච් අපි ගිහින් එන්නම්"යයි මිතියා හෝටලයේ අයිතිකාරයාට කී ය.

එහෙත් බොරිසොවිච් මිතියා දෙස බැලුවේවත් නැත. සමහර විට ඔහුට වැඩ අධික වන්නට ඇත. ඔහු කෑගාමින් කිසියම් දෙයක් ගැන කලබල කෙළේ ය. පොලිස් කපිතන් ඇතුළු තවත් නිලධරයන් දෙදෙනෙක් නැඟගත් පසු ව ද කරත්තය පිටත් නොවන බව මිතියා දුටුවේ ය. රිය පැදවිය යුත්තේ තමා නො ව අකිම බව කියමින්, රිය පැදවීමට නියමිත ගැමියා තර්ක කෙළේ ය. එහෙත් අකිම දකින්නටවත් නැත. ඔවුහු අකිම් සොයමින් ඒ මේ අත දුවන්නට වූ හ. ඒ අතරේ ගැමියා රිය පැදවිය නොහැකි බව කියමින් ඔවුන් නවත්වා ගත්තේ ය.

"තමුන්නාන්සේට පේනවා නේද අපේ ගැමියන් ගේ හැටි?"යි හෝටලයේ අයිතිකරු පොලිස් කපිතාන්ට පැමිණිලි කෙළේ ය. "උන්ට කිසි ම ලැජ්ජාවක් නැහැ......... උඹට යොකීම් පෙරේද, කොපෙක් විසිපහක් දුන්නා නේද? ඒ සල්ලිවලින් බීලා දුන් කෑගානවා. තමුන්නාන්සේ මේ මිනිසුන්ට මෙ තරම් කරුණාව දක්වන එක මට ලොකු පුදුමයක්."

"අපට මොනවට ද තවත් කරත්තයක්? මේ කරත්තයට නගින්න"යි මිතියා පොලිස් කපිතාන්ට කී ය. "සීයා, මා ගැන බයවෙන්න එපා. මම පැනල යන්නේ නැහැ. මොනවට ද මා ආරක්ෂා කරන්න තවත් පිරිසක්?"

"මට කතාකරන කොට 'සර්' කියා කතා කරන්න මතක තැතිකරන්න එපා. කතා කරන්න දන්නෙ නැතිනම් අදවත් දැනගනින්. මම නාකියෙක් නො වෙයි 'සීයා' කියන්න. උඹේ ගුණ දැනමුතුකම් මට උවමනා නැහැ"යි පොලිස් කපිතාන් කෝපයෙන් කීවේ මෙතෙක් වේලා සිතේ පැවැති කෝපය පිටකිරීමට අවස්ථාවක් ලැබීම ගැන ප්‍රීති වෙමිනි.

මිතියා සරබාගත්තේ ය. ඔහු ගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය. මඳ වේලාවකට පසු ඔහුට තද සීතලයක් දැනිණි. වැස්ස තුරල් කලත් අහස අඳුරු විය. වේගයෙන් හමා එන සුළඟ මිතියා ගේ මුහුණට වැදිණි.

"මට සෙම්ප්‍රතිස්සාවක් හැදිලා"යි මිතියා කී ය. අන්තිමේ දී කරත්තයට නැඟගත් පොලිස් කපිතාන් මිතියා මුල්ලට තල්ලු කොට හිඳගත්තේ කිසි ම තැලැකිල්ලක් දක්වා නො වේ. ඔහු අසන්තෝෂයෙන් සිටින බවත් ඔහු පිට පැටවී ඇති කටයුත්ත එ තරම් ප්‍රිය උපදවන දෙයක් නොවන බවත් කිය යුතු නො වේ.

"ට්‍රිපෑන් බොරිසොවිච් අපි ඉක්මනින් එන්නම්"යයි මිතියා ඇංජේෂ් කෑගා කී ය. මෙවර තමා හෝටලයේ අයිතිකරුට කතා කළේ හොඳ හිතින් නො ව පිළිකුලින් හටගත් නො කැමැත්තෙන් බව මිතියාට හැඟී ගියේ ය.

අහංකාරකම දක්වමින් දැන පිටුපසට කරගෙන සිටි බොරිසොවිච් මිතියා දෙස රවා බැලුවේ ය.

හදිසියෙන් ම පිරිස අතරින් ඉදිරියට පැමිණි කල්ගානෝෆ් තමාට සුබ පතමින් කෑගාන හඬ මිතියාට ඇසිණි. කරත්තය

පසුපසිත් දිව ඈ හෙතෙම මිතියා දෙසට අත දිගු කෙළේ ය. ඔහු හිස්වැස්මක් පැලඳ නොසිටියේ ය.

ඔහුට අතට අත දීමට මිතියාට යන්තම් ඉඩ ලැබිණි.

"ආයුබෝවන් මිතියා, නුඹේ ත්‍යාගවන්තකම මට කවදාවත් අමතක වෙන්නේ නැහැ"යි ඔහු ආදරයෙන් කී ය.

කරත්තය පිටත් විය. ඔවුන් ගේ දෑත වෙන් විය. අසුන් ගේ කර බැඳි මිණි වැල් නාද දුන්නේ ය. ඔවුහු මිතියා ගෙන ගියෝ ය.

ආපසු හෝටලයට දිවගිය කල්ගානෝ මූල්ලක හිඳ දෑතින් මුහුණ වසාගෙන අඬන්නට විය. ඔහු මෙසේ බොහෝ වේලා ඇඬුවේ හවුරුදු විස්සක තරුණයකු මෙන් නො ව කුඩා දරුවකු මෙනි. මිතියා වරදකාරයකු බවට ඔහු තුළ කිසි ම සැකයක් නො වී ය.

"මුන් මොන විදියේ මිනිස්සු ජාතියක් ද? මීට පස්සේ මේ මිනිසුන් ගේ ඇති යහපත කුමක් ද?"යි ඔහු සුන් වූ බලාපොරොත්තු හා දුඩි දොම්නසින් ද අවුල් වූ සිතින් කී ය. ඒ මොහොතේ දී ඔහු තුළ ජීවත්වීමට ආශාවක් නො තිබිණි.

"මේ ජීවිතයෙන් ප්‍රයෝජනයක් තිබේ ද?"යි තරුණයා ශෝකයෙන් තමාගෙන් ම විමසුවේ ය.

හතරවන කොටස



හතර වන කොටස

දස වන ග්‍රන්ථය

පිරිමි දරුවෝ

පළමු පරිච්ඡේදය

අම්මා ගේ හුරතලා

එය නොවැම්බර මාසයේ ආරම්භය විය. මේ කාලයේ දී අපේ ගමේ තදින් පිත්න පැවැතුණත් හිම නො වැටිණි. එහෙත් රාත්‍රිකාලයේ දී දිය මිදුණු පොළොව මත ඇතැම් විට හිම ස්වල්පයක් වැටෙයි. වියැළි සුළඟක් පාළු පාරවල් දිගේ, විශේෂයෙන් ම කඩපොළ අසල, හිම පිසගෙන යයි. ඒ උදෑසන ඉතා අඳුරු ය. එහෙත් හිම වැටීම නතර වී තිබිණි.

කඩපොළ අසල ප්ලොට්නිකෝෆ් ගේ සාප්පුවට නුදුරේ, ක්‍රාසොට්කින් නමැති කුලකාන්තාව සතු, ඇතුළතින් හා පිටතින් පිරිසුදු වූ කුඩා ගෙයක් තිබුණේ ය. ප්‍රාදේශික සිවිල් සේවකයකු වන ඇගේ සැමියා මියගොස් හවුරුදු දහතරකි. මේ සිවිල් සේවකයා ගේ හවුරුදු තිස් දෙකක් වයසැති රූබර වැන්දඹුව ඇගේ පෞද්ගලික ආදායමින් මේ අලංකාර නිවෙසෙහි වාසය කළා ය. ඈ ඉතා සත්සුන් හුදෙකලා ජීවිතයක් ගත කළා ය. නිතර ප්‍රීතියෙන් සිටි ඕ දයාවෙන් පිරි සිත් ඇත්තියකි. සැමියා මියයන විට ඇගේ වයස හවුරුදු දහඅටකි. විවාහ වී හවුරුද්දක් පමණ සැමියා සමග වාසය කළ ඇයට පුතෙක් ලැබුණේ ය. සැමියා මළ දා සිට ඈ මුළු ජීවිතය ම, තමා සතු එක ම වස්තුව වූ කොල්යා නමැති පුතා ඇති දැඩි කිරීමට කැප කළා ය. හවුරුදු දහතරක් ඈ ඉතා ආදරයෙන් පුතා ඇති දැඩි කළ මුත් ඇයට ඉන් දුකක් මිස සැපතක් නො ලැබිණි. පුතාට අසනීපයක් වේ ය, සෙම්ප්‍රතිශ්‍යාවක් වැළඳේ ය, දඟකාරවේ ය, පුටුවක් උඩ නැග

බිම වැටී තුවාල කරගනී ය, ආදී නොයෙක් විපත් ගැන සිතමින් ඈ මුළු කාලය ම බියෙන් ගතකළා ය. කොල්යා පාසලට යාමට පටන්ගත් දා සිට පුතා ගේ ඉගැනීමට උපකාරවීම පිණිස මව ද පුතා සමග සියලු ම පාඩම් ඉගෙන ගත්තා ය. ඈ ගුරුවරුන් හා ඔවුන් ගේ භාර්යාවන් ද සමග මිත්‍රවූවා ය. අනෙක් ළමයින් පුතාට හිරිහැර කරතියි යන බියෙන් එය වැළැක්වීම පිණිස ඈ ඔවුන් සමග මිත්‍ර වී ඉතා ආදරයෙන් සැළැකුවා ය. ඈ කො තරම් දුරට මෙසේ ක්‍රියා කෙළේ ද කියතොත් ළමයි කොල්යාට "අම්මා ගේ හුරතලා"යි කියමින් විහිළු කළහ.

කිසිවකු ගේ පිහිටක් නැති ව තමන් ගේ වැඩකටයුතු කර ගැනීමේ ශක්තිය කොල්යාට තිබිණි. කොල්යා ඉතා ශක්තිමත් එඩිතර ළමයකු බව ඔහු ගේ පන්තියේ ශිෂ්‍යයෝ කීහ. පසු ව එය සැබෑවක් බව සනාථ විය. ඔහු එඩිතර ය, කඩිසර ය, මුරණ්ඩු ය, නිර්භය ය, උපායෙහි දක්ෂ ය, ඉගැනීමෙහි සමත් ය. ගණිතයෙන් හා ඉතිහාසයෙන් ද ඔහු ගුරුවරයා පවා පැරදවූ බව කියනු ලැබේ. අනෙක් අය තමාට වඩා පහත් කොට සලකන හෙතෙම උඩගු සිතැත්තකු වුව ද හොඳ මිත්‍රයෙක් විය. ඔහු අහංකාර නො වී ය. තමාට පාසල් මිත්‍රයන් දක්වූ ගරු සැළැකිලි තමා සතු අයිතියක් ලෙස පිළිගත් හෙතෙම හැම දෙනාට ම හොඳ මිත්‍රයකු ලෙස සැළැකුවේ ය. ඔහු තමා ගේ වැඩ කටයුතුවල සීමාව දැන සිටියේ ය. ඇතැම් විට ඔහු දැඩි සිතැත්තෙක් විය. ගුරුවරුන් සමග පැවැති සම්බන්ධය ඔහු උසස් කොට සැළැකුවේ ය. ඒ සම්බන්ධයේ ශුද්ධ වූ සීමාව ඉක්මවා යාම, නැති නම් කමාව දිය නො හැකි, නීතිය උල්ලංඝනය කිරීමේ වරදට අසුනොවීමට ඔහු පරිස්සම් විය. කුඩා දරුවකු මෙන් හැම විට ම ඔහු දඟකිරීමට වෑයම් කළේ කලබලයක් ඇති කිරීමට, අලුත් යමක් කිරීමට හා හපන්කම් පෙන්නීමට ඇති ආශාව නිසා ය. ඔහු බොහො ම අහංකාර ය. මව පවා යටත් කරගත යුතු සැටි ඔහු දැන සිටියේ ය. හිතේ හැටියට ඔහු මවගෙන් වැඩ ගත්තේ ය. මව ද පුතා සිතූ දෙයක් කිරීමට ඉඩ හැර නිකම් බලා සිටියා ය. පසුගිය හවුරුදු දහය තුළ ඈ පුතාට කීකරු ව සිටියා ය. ඇයට ඇති වූ මහත් ම සිත්තැවුල නම් පුතා තමාට ප්‍රමාණවත් තරම් ආදරය නොකිරීම ය. තමා හැන දරුවා තුළ කිසි ම හැඟීමක් නැතැයි නිතර කල්පනා කළ මවු, තමා ගැන නො සලකා සිටීම ගැන පුතාට අඩමින් දොස් කීවා ය. එහෙත් පුතා මව ගේ කතාවට වැඩි කැමැත්තක් නොදැක්වූයේ ය. තමාට ආදරය කරන ලෙස මව ඉල්ලා සිටි

තරමට, ඔහු ඉතා කඩිසර නො කර සිටීමට පුතා වැයම් කෙළේ ය. එහෙත් එය ඔහු ඉතා කඩිසර ලෙස කළ දෙයක් නො ව, තිතැතින් ම සිදු වූ දෙයකි. ඔහු එ වැනි ගති ගුණ ඇති දරුවෙක් විය මව පුතා වරදවා තේරුම් ගත්තා ය. පුතා මවට බොහෝ ආදරය කෙළේ ය. පාසල් සිසුන් ගේ බසින් කියන්නේ නම්, කොල්යා මෝඩ හැඟීම්වලට කැමැති නැත.

ඔහු ගේ පියා සතු පොත් අල්මාරියක් ගෙදර තිබිණි. පොත් කියැවීමට මහත් ආශාවක් දැක්වූ කොල්යා ඒ පොත්-වලින් වැඩි හරියක් තනියෙන් ම කියෙව්වේ ය. පුතා පොත් කියවනවාට මව විරුද්ධ නොවූවා ය. සෙල්ලමට නො ගොස් පොත් අල්මාරිය ළඟ හිඳ පොත් කියවන පුතා දැක මව පුදුම වූවා ය. මෙසේ කොල්යා ඔහු ගේ වයසට නුසුදුසු දේවල් පොතපතින් දැනගත්තේ ය. ඔහු තමා ගේ දඟකම්වල සීමාව දැන සිටියත් මෑතක සිට මව තැති ගන්වන සමච්චල් වැඩ කරන්නට විය.

මෙය සිදුවුණේ ජූලයි මාසයේ ග්‍රීෂ්ම නිවාඩු කාලයේ දී ය. මේ නිවාඩුවේ දී මව හා පුතාත්, සැතැපුම් හතළිස් පහක් පමණ ඈත වෙසෙන නෑයකු වෙත නිවාඩුව ගත කිරීමට ගියහ. මේ නෑයා ගේ සැමියා දුම්රිය පොළේ නිලධරයෙකි. (ඊට මසකට පමණ පසු ඉවාන් කරමසෝ අපේ නගරයේ සිට මොස්කව් පුර බලා ගියේ මේ දුම්රිය පොළේ සිට ය. එය අපේ ගමට ඉතා ම ළඟින් තිබෙන දුම්රිය පොළයි) පාසලට ගිය පසු, තමා නිවාඩු කාලයේ දී රැස්කරගත් දැනුම පෙන්වීම පිණිස, කොල්යා දුම්රිය පිළිබඳ හැම දෙයක් ම විස්තර ඇති ව ඉගෙන ගත්තේ ය. ඒ අතරේ ඔහු එම පළාතේ සිටින ළමයින් කීප දෙනකු සමඟ ඉක්මනින් ම මිත්‍ර විය. ඔවුන් අතරින් සමහරුන් දුම්රිය පොළේ සිටින අතර අනෙක් අය දුම්රිය පොළට නුදුරේ වාසය කළහ. හවුරුදු දෙළහේ සිට පහළොව දක්වා වයසැති ඒ පිරිසේ ළමයි හය දෙනෙක්, නැති නම් හත් දෙනෙක් වූ හ. ඉන් දෙදෙනෙක් අපේ නගරයේ සිට ආහ. මේ ළමයි එකතු වී සෙල්ලම් කළහ. කොල්යා දුම්රිය පොළට පැමිණී හතර වන, නැති නම් පස් වන දින, මේ මෝඩ ළමයි ඔට්ටුවක් ඇල්ලූහ. කොල්යා අනෙක් ළමයින්ට වඩා වයසින් බාල වූ නිසා පහත් කොට සලකනු ලැබී ය. බොරු අහංකාර කමින්, නැති නම් නිර්භීත කමින් පොළඹවනු ලැබූ කොල්යා රෑ එකොළහේ

කෝච්චිය එන විට රේල් පාරේ තිඳ සිටින බවට රූබල් දෙකක ඔට්ටු ඇල්ලුවේ ය. ඔට්ටුව භාරගැනීමට කලින් අනෙක් ළමයි පරීක්ෂණයක් පවත්වා කෝච්චිය එන විට රේල් පාරේ තිඳ සිටිය හැකි බවත්, කෝච්චිය ඇගේ නොවදින බවත් දැනගත්හ. එහෙත් ඇගේ නො වැදුණත්, කෝච්චිය යන විට රේල් පාරේ තිඳ සිටීම සෙල්ලමක් නො වේ. තමාට රේල් පාරේ තිඳ සිටිය හැකි බව කොල්යා තදින් කියා සිටියේ ය. පලමු ව ඔවුහු සිනාසී, කොල්යා බොරුකාරයෙක් ය, පුරසාරම් දෙඩන්නෙක් යැයි කීහ. එහෙත් ඉන් කොල්යා තව තවත් පෙලඹිණි. තමා වයසින් බාල පොඩි ළමයෙක් ය, ආශ්‍රයට සුදුසු නැතැයි අනෙක් ළමයින් දක්වූ නොසැලැකිල්ල කොල්යාට ඉවසිය නොහැකි අපහාසයකි.

දුම්රිය පොළේ දී සෙමෙන් ගමනාරම්භ කරන දුම්රිය සැතැපුම් භාගයක් පමණ ගිය පසු වැඩි වේගයෙන් ගමන් කරයි. එ හෙයින් සවස් කාලයේ දුම්රිය පොළින් සැතැපුම් භාගයක් දුර ගොස් සිටීමට ළමයි තීරණය කරගත්හ. තීරණය පරිදි ළමයි නියමිත වේලාවට රැස්වූ හ. සඳඑළියෙන් තොර වූ එම රැය ඉතා අඳුරු ය. නියමිත වේලාවේ දී කොල්යා රේල් පාර මැද තිඳගත්තේ ය. ඔට්ටුවට සම්බන්ධ වූ අනෙක් ළමයි රේල් පාර අයිනේ පඳුරු අස්සේ සැඟැවී බලා සිටියහ. ඔවුන් ගේ හදවත් කුතුහලයෙන් හා ශෝකයෙන් ද වෙවුලන්නට විය. අන්තිමේ දී රාත්‍රි එකොළහට, දුම්රිය පොළින් පිටත්වන දුම්රියෙන් නැගුණු හඬ ඇසිණි. අඳුර තුළින් රතු එළි දෙකක් පෙනෙන්නට විය. භයානක සතකු මෙන් වේගයෙන් එන දුම්රිය බෙරිහන් දුන්නේ ය. පඳුරු අස්සේ සැඟැවී සිටි, භීතියෙන් තැතිගත් ළමයි "දුවපන් දුවපන්" කියා කොල්යාට කෑගා කීවෝ ය. එහෙත් පමා වුණා වැඩි ය. මිහිකත දෙදරවමින් පැමිණි දුම්රිය ඔවුන් පසු කොට ගියේ ය. ළමයි වහා කොල්යා ළඟට දිව ගියෝ ය. කොල්යා නො සෙල්වී බිම තිඳ සිටියේ ය. ඔවුහු කොල්යා උස්සන්නට වෑයම් කළහ. එහෙත් හදිසියෙන් ම නැගී සිටි කොල්යා කිසිවකු සමඟ කතා නො කර යන්නට ගියේ ය. ඔවුන් භය කිරීමට තමා බොරුවට සිහි නැතිවාක් මෙන් බිම තිඳ සිටි බව ඔහු පසු ව කී ය. එහෙත් ඇත්ත අනිකකි. රේල් පාරේ තිඳ සිටින අතරේ ඔහුට සිහි නැති විය. ඒ බව පසු ව ඔහු මවට කී ය. මේ ක්‍රියාව නිසා ඔහු 'දරුණු සිත් ඇත්තකු' ලෙස සදහට ම නහවුරු විය. ආපසු දුම්රිය පොළට පැමිණෙන විට ඔහු පිරුවටයක් මෙන් සුදුමැලි වී සිටියේ ය. පසුදින ඔහුට උණ ගැනිණි. එහෙත් ආත්ම තෘප්තිය ට

පත් හෙතෙම ප්‍රීතියෙන් සිටියේ ය. මේ ක්‍රියාව එක්වර ම ප්‍රසිද්ධ නො වී ය. එහෙත් ඔවුන් නගරයට පැමිණි පසු ව එය පාසල පුරා පැතිර ගොස් ගුරුවරුන්ට ද ආරංචි විය. ඒ නමුත් කොල්යා ගේ මව පුතා වෙනුවෙන් කන්නලව්වු කල නිසා අන්තිමේ දී ඩාඩනලෝප් නමැති පාසලේ සැලැකිය යුතු බලයක් ඇති වැදගත් ගුරුවරයකු ඉදිරිපත් වී කොල්යා ආරක්ෂා කරගත් නිසා මේ සිද්ධිය සම්පූර්ණයෙන් ම අමතක කර දමන ලදි.

මැදි වියේ සිටි අවිවාහකයකු වූ මේ ගුරුවරයා අවුරුදු කිපයක සිට කොල්යා ගේ මව පැතුවේ ය. මීට හවුරුද්දකට පමණ පෙර හෙතෙම සිතේ හටගත් හැඟිම්වලින් හා බියෙන් වෙවුලමින් මහත් ගෞරවයක් දක්වා කොල්යා ගේ මවට විවාහ යෝජනා කෙළේ ය. ගුරුවරයා සමඟ විවාහ වීම තම පුතාට කරන ද්‍රෝහී කමකැයි කල්පනා කළ කුල කත එකපයින් යෝජනාව ප්‍රතික්ෂෙප කළා ය. සිත් ගන්නා සුන්දර පෙනුමෙන් යුත්, එහෙත් පතිදම් රකින, දයාවෙන් පිරි හදවතක් ඇති මේ වැන්දඹුව, තමා ගේ යෝජනාව ප්‍රතික්ෂෙප නො කරාවි යැයි කිසියම් අද්භූත හේතු කිපයක් නිසා ගුරුවරයා විශ්වාස කෙළේ ය. කොල්යා ගේ හිතුවක්කාර ක්‍රියාවෙන් තමා ගේ අදහස් සපුරා ගැනීමට ආයෙත් මඟ පෑදුණේ යැයි ගුරුවරයා කල්පනා කෙළේ ය. මේ අවස්ථාවේ දී තමා, ඔවුන්ට දක්වූ හිතවත් කමින් ප්‍රතිඵල ලැබේ යයි ඔහු ඉදක් ම බලාපොරොත්තු විය. එහෙත් මෙසේ බලාපොරොත්තු ඇති කර ගැනීමට කරුණු පෑදුණේ ඉතා මඳ වශයෙනි. නිමල අදහස් හා ප්‍රණීත ගතිගුණ ද ඊතුම් කොට සලකන ගුරුවරයාට මේ සුළු බලාපොරොත්තුව අපමණ ප්‍රීතියට හේතු විය. ඔහු කොල්යාට ආදරය කෙළේ ය. එහෙත් ඔහු ගේ සිත් ගැනීමට වෑයම් කිරීම නොහොබිනා කමකැයි ඔහු අදහස් කෙළේ ය. පන්තියේ දී ඔහු කොල්යාට තද ගතියක් දක්වූයේ ය. වඩා කතා නොකළේ ය තමා ලෝක ඉතිහාසය කො තරම් හොඳට දැන සිටියේ ද කියනොත් තමාට ගුරුවරයා පවා පරාජය කළ හැකි යැයි කොල්යා කල්පනා කෙළේ ය. දිනක් කොල්යා තම ගුරුවරයාගෙන් "ට්‍රෝයි නගරය තැනුවේ කවුද?" යි ප්‍රශ්න කෙළේ ය. නොයෙක් කාලවල දී නොයෙක් මනුෂ්‍ය ජාතීන් සංක්‍රමණය වූ සැටිත්, ට්‍රෝයි නගරය පිළිබඳ දේව කතාවල ඇත්තා වූ පැරණි කම ගැනත් සඳහන් කළ ගුරුවරයා ප්‍රශ්නයට කෙළින් පිළිතුරු නුදුන්නේ ය. ප්‍රශ්නයට කෙළින් පිළිතුරු නුදුන්නා පමණක් නො ව එය කිසි ම වැඩක් නැති විහිළු ප්‍රශ්නයක් යැයි කී ය.

කොල්යා පියා ගේ පොත් අල්මාරියේ තිබුණු පොත් කියවා ට්‍රෝයි නගරය ඉදි කළ තැනැත්තා ගැන තොරතුරු දැන-ගත්තේ ය. අන්තිමේ දී පන්තියේ ළමයින් සියලු දෙනාට ම පිළිතුරු දැනගැනීමට උවමනා විය. ගුරුවරයා ද පිළිතුරු නොදන්නා බව ඔවුහු දැනගත්හ. එහෙත් කොල්යා පිළිතුරු නො දී නිහඬ ව සිටි නිසා ඔහු ගේ උගත්කම ගැන පැවැති ප්‍රසිද්ධිය තහවුරු විය.

ඉහත සඳහන් දුම්රිය පිළිබඳ සිද්ධියෙන් පසු ව මව හා පුතා අතරේ පැවැති සම්බන්ධයෙහි කිසියම් වෙනසක් ඇති විය. පුතා ගේ ක්‍රියාව ගැන අසා තැති ගත් මව භීතියෙන් උමතු වන තරමට ළං වූවා ය. දවස් කීපයක් ගතවන තුරු ඈ වරින් වර ඔල්මාදයෙන් අසනීප වූවා ය. ඉන් තැති ගත් කොල්යා මීට පසු ව කිසි ම භයානක දෙයක් නොකරන බවට පොරොන්දු විය. ඔහු ශුද්ධ වූ ප්‍රතිමාව ඉදිරිපිට දණින් වැටී දිවුරා පොරොන්දු විය. මව ගේ ඉල්ලීම පරිදි පියා ගේ නම සිහි කොට පොරොන්දු විය. මෙතෙක් කල් ලොකු මිනිහකු මෙන් ක්‍රියා කළ කොල්යා හවුරුදු හයක දරුවකු මෙන් අඬන්නට විය. එදා මුළු දා ම මව හා පුතා වරින්වර එකිනෙකා වැලඳ ගෙන අඬන්නට වූ හ. එ තැන් සිට කොල්යා නිහඬ විය. නිහතමානී විය, තද සිත් ඇති විය, කල්පනාකාරී විය.

මසකට පමණ පසු ඔහු තවත් අවුලකට පටලැවුණු නිසා ඔහු ගේ නම අපේ නගරයේ සාමදාන විනිශ්චයකාරයාට පවා ආරංචි විය. එය විනෝදාත්මක මෝඩ ක්‍රියාවකි. ඔහු එයට සම්බන්ධ වූවා, මිස ප්‍රධාන තැනක් නොගත්තේ ය. එහෙත් ඉන් මව තුළ හටගත් භීතියෙහි නම් කිසි ම අඩුවක් නො වී ය. ඈ බිය වූ තරමට ගුරුවරයා තුළ තිබුණු ඈය පිළිබඳ බලාපොරොත්තු ද වැඩි විය. කොල්යා තම ගුරුතුමා ගේ අදහස් දැන සිටි බව මෙහි ලා සඳහන් කළ යුතු ය. ඔහු ගුරුතුමා පිළිකුල් කෙළේ ය. ගුරුතුමා ගේ අදහස් තමා දන්නා බව හැඟවූ කොල්යා ඒ සමඟ ගුරුතුමා පිළිකුල් කරන බව ද හැඟෙව්වේ ය. දුම්රිය පිළිබඳ සිද්ධියෙන් පසු කොල්යා ගුරුතුමාට දක්වූ නොකැමැත්ත ද මඳක් වෙනස් කෙළේ ය. ගුරුවරයාට විරුද්ධ ව වචනයක්වත් නොකී ඔහු මව ඉදිරිපිට දී ගුරුවරයා ගැන ගරු සරු ඇති ව කතා කෙළේ ය. දරුවා ඉදිරිපිට දී යම් කිසිවකු ගුරුවරයා ගැන සඳහන් කළොත්, රතු රෝස මලක් මෙන් ඈගේ මුහුණ රතු වෙයි. එ වැනි අවස්ථාවල දී කොල්යා කවුළුව තුළින් පිටත

බලා සිටියි. නැති නම් තමා ගේ පාවහන් ගැන සැලැකිලිමත් වෙයි. නැති නම් තමා විසින් මීට මසකට පමණ පෙර, අතර මඟ තිබී ගෙදර ගෙනැවිත්, කිසියම් හේතුවක් නිසා පාසල් මිත්‍රයන්ට නො පෙන්වා ගෙදර සඟවා ගෙන ඇති දැඩි කරන, කුෂ්ට රෝගයකින් පෙළෙන, දිග මයිල්වලින් යුත් පෙරුසුවාන් නමැති යෝධ බල්ලාට කෝපයෙන් කතා කරයි. ඔහු බල්ලාට නොයෙක් විදියේ සෙල්ලම් ඉගැන්නුවේ ය. එ හෙයින් කොල්යා පාසලට ගිය වහා ම බල්ලා නො නවත්වා උඩු බුරන්නේ ය. එහෙත් කොල්යා ගෙදර පැමිණි වහා ම ප්‍රීතියෙන් උමතු වූවාක් මෙන් ගෙය පුරා දුවන බල්ලා අනතුරු ව මළාක් මෙන් බිම වැතිර සිටීම ආදී නොයෙක් සෙල්ලම් කර පෙන්නයි. කොටින් කියතොත් කොල්යා උගන්නා ඇති හැම සෙල්ලමක් ම කර පෙන්නයි. එහෙත් බල්ලා මෙසේ සෙල්ලම් කර පෙන්නන්නේ කිසියම් නියමයක් නිසා නො ව කෘතඥතාව හා ප්‍රීතියත් පෙන්වීම පිණිස ය.

දැනට ම පාඨකයා දන ඇඳින සිටින කපිතන් සෙනග්‍රියෝප්ගේ පුතා ඉලූෂා, පිහියෙන් ඇන්නේ කොල්යාට බව සඳහන් කිරීමට මට අමතක විය. ඉලූෂා පිහියෙන් ඇන්නේ, අනෙක් ළමයින් ඔහු ගේ තාත්තාට කවටකම් කළ නිසා ය.

දෙවන පරිච්ඡේදය

අක්කයි මල්ලියි

නොවැම්බර් මස හිමෙන්, කුණාටුවෙන් හා අධික සීත-ලෙන් ද යුත් උදෑසනක කොල්යා ගෙදර හිඳ සිටියේ ය. එය රිවිදිනයකි. පාසල් යාමක් ද නො වී ය. දවල් දොළහ නාද විය. ඉතා වැදගත් හදිසි උවමනාවක් නිසා ගෙදරින් බැහැර යාමට කොල්යාට උවමනා විය. එහෙත් එ දින ඔහුට තනියෙන් ම ගෙය භාර ව සිටීමට සිදු විය. එ දින සිදු වූ පුදුම දෙයක් නිසා ගෙදර වැඩිහිටියෝ බැහැර ගොස් සිටියහ. ඉස්තොප්පුවකින් වෙන් වූ ගෙයි කුඩා කාමර දෙකක්, දරුවන් දෙදෙනකු ඇති සත්‍රියකට කුලියට දී තිබිණි. ඇගේ සැමියා දොස්තර කෙනෙකි. ඔහු ඕරංබර්ග් හා ටැෂ්කන්ට් යන පළාත්වලට ගොස් හවුරුද්දක් පමණ ඇත. එහෙත් ගිය

හය මාසය තුළ ඇයට සැමියා ගෙන් කිසි ම ආරංචියක් නො ලැබිණි. කොල්යා ගේ මව සමඟ පැවැති මිත්‍ර කම නිසා නො වේ නම් ඇ ශෝකයෙන් මිය යනු ඇත. මේ මිත්‍රකම අවාසනාවන්ත ස්ත්‍රියට මහත් සැනැසීමකි. ඇයට තිබුණු නොයෙක් දුක් කරදර අස්සේ ඇගේ බලවත් පුදුමයට, ඇගේ සේවිකාව පෙර දින උදේ තමාට දරුවකු ලැබෙන්නට සිටින බව කීවා ය. මෙ වැනි හදිසි අවස්ථාවල දී ප්‍රයෝජන ගැනීම පිණිස වින්නඹුවක් අපේ පළාතේ මාතෘ නිවාසයක් පැවැත්වූවා ය. ස්වාමිදුව, ඇගේ සේවිකාව එම නිවාසයට ගෙනයාමට අදහස් කළා ය. අදහස් කළ පරිදි ඇය එහි නතර කොට ඇගේ ආරක්ෂාව පිණිස ඇය සමඟ නතර වූවා ය. එ දින උදේ මාතෘ නිවාසයට පැමිණෙන ලෙස ද කොල්යා ගේ මව ගෙන් ඉල්ලා සිටියා ය.

කාන්තාවෝ දෙදෙනා ම එ දින උදේ ගෙදර නොසිටියහ. කොල්යා ගේ ගෙදර වැඩ කරන මහලු සේවිකාව කඩේ ගියා ය. එ හෙයින් තනියෙන් ම ගෙදර දමා යන ලද දොස්තර බිරිය ගේ කුඩා දියණියත් පුතාත් බලා ගැනීමට කොල්යාට සිදු විය. තනියෙන් ගේ දොර බලාගෙන සිටීමට කොල්යා බය නැත. ගෙයි ශාලයේ බත්කූව යට බල්ලා ද ස්වාමියා ගේ නියමය පරිදි නො සෙලෙවී සිටියි. කොල්යා කාමරයේ සිට ශාලයට පැමිණි හැම විට ම බල්ලා හිස ඔසවා බලා ස්වාමියා ගේ සිත ඇද ගැනීම පිණිස වලිගයෙන් බිමට ගසයි. එහෙත් අභාග්‍යයකට මෙන් බත්කූව යටින් එළියට ඒමට අණ කරන සුරුවත් හඬ කොල්යා ගේ මුවෙන් පිට නො වී ය. තමා ගේ අණ පරිදි බත්කූව යට නො සෙල්වී හිඳ සිටි සුනඛයා දෙස කොල්යා හොර ඇහින් බැලුවේ ය. දරුවෝ දෙදෙනා ඔහුට මහත් කරදරයකි. එහෙත් ඔවුන්ට ආදරය කළ කොල්යා පොතක් දුන්නේ ය. හවුරුදු අටක් වන වැඩිමහල් ගැනු දරුවා වන නස්ටියාට පොත් කියැවිය හැකි ය. හවුරුදු හතක් වන කොස්ට්යා, අක්කා ලවා පොත් කියවා ගැනීමට ආශා කෙළේ ය. දරුවන් දෙදෙනා විනෝද කිරීම පිණිස කොල්යාට ඔවුන් සමඟ නොයෙක් විදියේ සෙල්ලම් කළ හැකි ය. පෙළට සිටවා සේවායන් මෙන් සෙල්ලම් කළ හැකි ය. නැති නම් හැන්ගි මුත්තන් කළ හැකි ය. ඔහු මීට පෙර කීප වතාවක් ම සෙල්ලම් කර ඇති බැවින් ඒ ගැන ලැජ්ජා නො වී ය. කොල්යා අශ්වයකු මෙන් හිස පහත් කරගෙන මේ ළමයින් සමඟ සෙල්ලම් කරන බව පාසලට ද ආරංචි විය. තමා ගේ වයසට සම කරන විට මෙ වැනි කුඩා ළමයින් සමඟ සෙල්ලම් කිරීම

තමා ගේ තත්ත්වයට නො ගැලපුණත් තමා එසේ සෙල්ලම් කළේ ඒ ළමයින් සතුටු කිරීමට බවත්, ඒ ළමයින් තමාට බොහෝ ම ආදරය බවත්, කිසි ම කෙනකුට තමා ගේ අදහස් ගැන ප්‍රශ්න කිරීමට අයිතියක් නැති බවත්, කියමින් කොල්යා ඇනුම්පදවලින් ආරක්ෂා වීමට වෑයම් කෙළේ ය.

එහෙත් මේ මොහොතේ දී කොල්යා සිටියේ සෙල්ලම් කිරීමට ඇති ආශාවකින් නො වේ. සෙල්ලම් කිරීම පසක තබා කළ යුතු ඉතා වැදගත් අද්භූත කටයුත්තක් තිබේ. ඒ අතරේ වේලාව ද ගත වෙයි. දරුවන් බලා ගැනීමට සිටි සේවිකාව ද කඩේ ගිය ගමන් තව ම ආවේ නැත. කොල්යා කීප වරක් ම ඉස්තෝප්පුව හරහා ගොස්, පොත් බලමින් සිටි ළමයින් දෙස දොර ඇර සැලැකිල්ලෙන් බැලුවේ ය. ඔහු දොර ඇර බැලූ හැම විට ම දරුවන් දෙදෙනා ඔහු දෙස බලා සිනාසුණේ ඔහු තමන් සමඟ සෙල්ලම් කිරීමට පැමිණෙතියි යන අදහසිනි. එහෙත් නොසන්සුන් කමින් සිටි කොල්යා දරුවන් සමඟ සෙල්ලම් කිරීමට අදහස් නො කෙළේ ය.

අත්තිමේ දී දුවල් එකොළහ නාද විය. යම් විදියකින්, තව මිනිත්තු දහයකින්, අර කාලකණ්ණි සේවිකාව ගෙදර නො පැමිණිය හොත්, තමා නැති අතරේ දඟ නො කර, නො අඬා සිටින ලෙස දරුවන් දෙදෙනා පොරොන්දුකරවා ගෙන මෙතෙක් වේලා බලා සිටි ගමන යාමට අත්තිමේ දී කොල්යා තීරණය කරගත්තේ ය. අනතුරු ව ඔහු සීත කාලයේ අඳින සම් හැට්ටය ඇඳ ගෙන කුඩා බෑගය උරහිසින් එල්ලා ගත්තේ ය. සීත කාලයේ දී හිම පාවහන් ලාගෙන මිස ගෙන් පිට නො යන ලෙස නියම කර තිබුණේ ය. එහෙත් ඒ නියමයට කිසි ම සැලැකිල්ලක් නොදැක්වූ කොල්යා විසිත්තකාමරයට යන අතරේ එහි තබා ඇති හිම පාවහන් දෙස පිළිකුලින් බැලුවේ ය. මෙසේ ඇඳ පැළැඳ ගෙන සිටින තම ස්වාමියා දුටු පෙරිස්වාන් වලිගය බිම ගසමින් ශබ්ද කෙළේ ය. අනතුරු ව ඌ ඇඹ-රෙමින් දුක්මුසු ලෙස කෙඳිරි ගෑවේ ය. බල්ලා ගේ නොඉවසිල්ල දුටු කොල්යා එය විනය කඩකිරීමක් යයි තීරණය කොට දඬුවමක් වශයෙන් බල්ලා තවත් මිනිත්තුවක් බන්කුව යට තැබුවේ ය. ඉස්තෝප්පුවට පිවිසෙන දොර ඇරිය පසු ව ය කොල්යා බල්ලාට කතාකරමින් හුරුලන් බෑවේ. උමතු වූ සතකු මෙන් උඩ පැන්න සුනඛයා මහත් ප්‍රීතියෙන් ස්වාමියා සමඟ ගියේ ය.

ඉස්තෝප්පුව හරහා ගිය කොල්යා දොර ඇර දරුවන් දෙදෙනා දෙස බැලුවේ ය. මේසය ළඟ හිඳ සිටි ඔවුහු පොත කියවනවා වෙනුවට කිසියම් දෙයක් ගැන මහත් ආශාවෙන් තර්ක කළහ. ජීවිතයට සම්බන්ධ වූ වැදගත් ප්‍රශ්න ගැන කුඩා දරුවෝ නිතර වාද කරති. නස්ටියා හැම විට ම මලණුවන් පරදවා ජය ගත්තා ය. අක්කා ගේ අදහස් නොපිළිගත් හැම විට ම කොස්ටියා කළේ කොල්යාට කතා කිරීම ය. එවැනි ප්‍රශ්නවල දී කොල්යා දෙන තීරණය දෙදෙනා ම පිළිගත්හ. මෙවර සොහොයුරියත් සොහොයුරාත් වාද කළේ ඉතා වැදගත් දෙයක් ගැන ය. කොල්යා වාදය අසා සිටියේ ය. කොල්යා අසා සිටින බව දැනගත් දරුවෝ වඩවඩාත් වේගයෙන් වාද කළහ.

"එළවුළු කොටුවල ගෝවාගෙඩි අස්සේ තිබී නාකි ගැනු ළමයින් සොයා ගන්නවා ය කියන කතාව මම කවදාවත් විශ්වාස කරන්නේ නැහැ"යි කියමින් නස්ටියා වාද කළා ය. "දැන් සීත කාලය නිසා ගෝවා වැවෙන්නේ නැහැ. ඉතින් නාකි ගෑනිට පුළුවන් කමක් නැහැ කැතිරිනාට දුවක් ගෙනත් දෙන්න."

කොල්යා තමාට පමණක් ඇසෙන ලෙස පුදුමය පළකරමින් හුරැලන් බෑවේ ය.

"සමහර විට කසාද බැඳපු අයට පමණක් උන් කොහෙන් හරි ළමයි ගෙනත් දෙනව ඇති."

අක්කා ගේ කතාව අසා සිටි මල්ලී මඳක් කල්පනා කොට මෙසේ කී ය.

"අක්කා කෝ තරම් මෝඩ ද! තවමත් කසාද බැඳල නැති කැතිරිනාට කොහොම ද ළමයෙක් ලැබෙන්නේ?"

නස්ටියා කෝප වූවා ය.

"මල්ලී දන්න එකක් නැහැ. සමහර විට කැතිරිනාට මිනිහෙක් ඉන්න නිසා ළමයෙක් ලැබෙන්න ඇති."

"කැතිරිනා ගේ මිනිහා හිරේ හිටින් ද?"යි පිරිමි දරුවා ගැලැක්ලෙන් විමසුවේ ය.

"මම මල්ලිට ඇත්ත කියන්නම්"යයි නස්ටියා කලබල වෙමින් කීවේ පළමු ව ඉදිරිපත් කළ තර්කය සම්පූර්ණයෙන් ම

බැහැර කරමිනි. "කැතිරිනාට මිනිහෙක් නැහැ. මල්ලි කියාපු දෙය හරි. නමුත් ඈට බොහො ම ආසයි කසාද බඳින්න. ඉතින් කසාද බඳින හැටි ගැන කල්පනා කරලා, කල්පනා කරලා, අන්තිමේ දී ඈට මිනිහෙක් වෙනුවට ළමයෙක් ලැබුණා."

"එහෙම වෙන්න පුළුවනි"යි මලණුවන් කීවේ පරාජය සම්පූර්ණයෙන් ම පිළිගනිමිනි. "අක්කා ඒ බව ඉස්සෙල්ලා කිව්වේ නැහැ. ඉතින් කොහොම ද මම දන්නේ?"

"එන්න යන්න, ඔයගොල්ලෝ බොහො ම නරක ළමයි" කියමින් කොල්යා කාමරයට ඇතුළු විය.

"පෙරුසුවාත් ආවා" කියමින් පිරිමි දරුවා ආදරයෙන් බල්ලාට කතා කෙළේ ය.

"ඒක නො වෙයි, මා හරි අමාරුවක වැටිලයි ඉන්නේ"යි කොල්යා ළමයින් දෙදෙනාට බොහො ම සෙමෙන් කී ය. "මේ ළමයි මට උදව්වක් කරන්න ඕනෑ. අපේ කුස්සිඅම්මා කඩේ ගිහින් තව ම ආවේ නැහැ. අඬමාන නැහැ කකුල කඩා ගන්න ඇති. මට හදිසි ගමනක් යන්න තියෙනවා. ඒ ගමන යන්න මට ඉඩ දෙනව ද?"

ළමයි දෙදෙනා එකිනෙකා දෙස පුදුමයෙන් බැලූ හ. සිනාවෙන් විකසිත වූ ඔවුන් ගේ මුහුණුවල නොසන්සුන් කමක් දකින්නට තිබිණි. තමන් ගෙන් කුමක් බලාපොරොත්තු වන්නේ දැයි ඔවුහු තව ම නොදත්හ.

"මම ගියාට පස්සේ ඔයගොල්ලෝ දඟ කරනව ද? අල්මාරිය උඩ නැඟලා කකුල් කඩාගන්නේ නැහැ නේ ද? හය වෙලා අඬන්නෙ නැහැ නේ ද?"

දරුවන් ගේ මුහුණුවල ගැඹුරු කලකිරීමක ලකුණු පහළ විය.

"දූන් ඉතින් මම ඔයගොල්ලන්ට වෙඩි බෙහෙත් දමා වෙඩි තිබ්බ හැකි පිත්තල කාලතුවක්කුවක් පෙන්නන්නම්."

දරුවන් ගේ මුහුණු ඒ ක්ෂණයෙන් ම ආලෝක විය. "අපට තුවක්කුව පෙන්නන්න"යි පිරිමි දරුවා සිනාසෙමින් කී ය.

කොල්යා බෑගයට අත දමා කුඩා පිත්තල කාලතුවක්කුවක් ගෙන මේසය උඩ තැබුවේ ය.

"බලන්න රෝද උඩ හයිකරලයි තියෙන්නේ"යයි පැවසූ කොල්යා, තුවක්කුව මේසය උඩ තල්ලු කොට පෙන්නුවේ ය.

"මේක ඇතුලට වෙඩි බේත් දමා පත්තු කරන්න පුළුවනි."

"ඕනෑ ම කෙනෙක් මරන්න පුළුවන් ද?"

"හරියට ඉලක්කය අල්ලා වෙඩි තිබ්බොත් මරන්න පුළුවනි"යි කොල්යා වෙඩි බේත් දමන තැන පෙන්නා පත්තු කල විට පස්සට තල්ලු වන බව ද කී ය.

දරුවෝ දෙදෙනා මහත් සැලැකිල්ලෙන් අසා සිටියහ. පත්තු කල තුවක්කුව පස්සට තල්ලු වීම ඔවුන් ගේ සිත්ගත් විශේෂ දෙයකි.

"ඔයා ලඟ වෙඩි බේත් තියනව ද?"

"ඔව්."

"එහෙම්නම් පත්තුකරලා පෙන්නන්න"යයි නෂ්ටියා සිනා-සෙමින් කිවා ය.

කොල්යා බෑගයට අත දමා වෙඩි බේත් භාජනය ගෙන පෙන්නුවේ ය. ඒ සමඟ කොළයක ඔතන ලද වෙඩි මුණ්ඩ කීපයක් ද පෙන්නුවේ ය. අනතුරු ව ඔහු භාජනයේ පියන ඉවත් කොට වෙඩි බේත් සවල්පයක් අත්ලට ගත්තේ ය.

"ලඟ ගින්දර තියෙනවා, නම් පරිස්සම් වෙන්න ඕනෑ. නැති නම් වෙඩි බේත්වලට ගිනි අරගෙන අපව මැරේවි"යි කොල්යා දරුවන් භය කරමින් කී ය.

දරුවෝ භීතියෙන් වෙඩි බේත් දෙස බැලූ හ. ඒ භීතිය මෙනෙක් සිතේ පැවැති ප්‍රීතිය මැඩ ගත්තේ ය. එහෙත් පිරිමි දරුවා, වෙඩි බේත්වලට වඩා වෙඩි මුණ්ඩවලට කැමැති විය.

"ඔය මුණ්ඩ පත්තු වෙනව ද?"යි ඔහු විමසුවේ ය.

"නැහැ."

"මට එකක් දෙන්න"යි ඔහු බැඟ බසින් කී ය.

"හොංදයි, එකක් දෙන්නම්. නමුත් මං එනකන් අම්මට පෙන්නන්න එපා. පෙන්නුවොත් අම්මා භයවෙලා අසනීප වෙන්න පුළුවනි."

"අම්මා අපට කවදාවත් ගහන්නේ නැහැ"යි නශ්ට්යා එක් වර ම කීවා ය.

"ඔව් මම දන්නවා. මීට පස්සේ කවදාවත් අම්මා රවටන්න එපා. ඉතින් මම දූන් යන්න ද? මා නැති අතර හය වෙලා අඬන්නෙ නැහැ නේ ද?"

"අපි අඬනවා, අපි අඬනවා"යි නශ්ට්යා කීවා ය.

"අනේ එහෙනම් මට යන්න ලැබෙන්නේ නැහැ. තව කොච්චර වෙලාවක් ඉන්න වෙයි ද දන්නේ නැහැ. මට පරක්කු වෙනවා."

"පෙරුසුවාන්ට කියන්න මැරුණ වගේ ඉන්න ය කියා"යි පිරිමි දරුවා කී ය.

"ඒකත් කරන්න වෙනවා" යි පැවැසූ කොල්යා, මැරුණාක් මෙන් බිම වැතිර සිටීමට පෙරුසුවාන්ට නියම කෙළේ ය.

• පෙරුසුවාන් අළු පාට ගොරෝසු මයිල්වලින් යුත්, තරමක් ලොකු බල්ලෙකි. ඌගේ දකුණු ඇස කණ වූ අතරේ වම් කන තුවාල වී තිබිණි. ඌ කෙඳිරි ගා උඩ පැන පසු ගාත් දෙකින් ඇවිද්දේ ය. අනතුරු ව ඌ බිම වැතිර මළාක් මෙන් නිශ්චල ව සිටියේ ය. මෙසේ පෙරුසුවාන් ඌගේ අන්තිම සෙල්ලම පෙන්නන අතරේ සේවිකාව දොර ඇරගෙන පැමිණියා ය. මුහුණ පුරා වසූරියෙන් හටගත් කැළැල්වලින් අවලක්ෂණ වූ ඇ හවුරුදු හතළිහක් පමණ වයසැති තරබාරු ස්ත්‍රියකි. කඬේ ගොස් පැමිණි ඈ බඩු පුරවන ලද මල්ලක් අතින් ගෙන සිටියා ය. මෙසේ ගෙට ඇතුළුවන ඈ බල්ලා දෙස බැලීම පිණිස මඳක් නතර වූවා ය. වැඩකාරිය පැමිණෙන තෙක් මෙතෙක් වේලා බලා සිටි කොල්යා, ඈ පැමිණි නිසා බල්ලා ලවා සෙල්ලම් පෙන්නීම නතර නො කෙළේ ය. නියම කාලය පසු වන තුරු බල්ලාට මළාක් මෙන් සිටීමට ඉඩ හැරිය ඔහු, අන්තිමේ දී ඌට කතා කෙළේ ය. උඩ පැන්න බල්ලා අනතුරු ව ඒ මේ අත දුවන්නට පටන් ගත්තේ තමාට අයත් යුතු කම් ඉටු කිරීමට ලැබීම ගැන ප්‍රීතිය පළ කිරීම පිණිස ය.

"මෙහෙමත් බල්ලෙක්!"යයි සේවිකාව බල්ලා දෙස බලා කීවා ය.

"මොක ද ගෑනියේ උඹ පරක්කු වුණේ?"යි කොල්යා කෝපයෙන් ඇසුවේ ය.

"මොන ගැනියක් ද? පලයන් යන්න පැටියා."

"පැටියා?"

"පැටියා තමයි. මම පරක්කු වුණාට කාටවත් තියෙන අමාරුව මොකක් ද? මම පරක්කු වුණේ හේතුවක් ඇතිවයි" සේවිකාව ළිපේ ගිනි මොලවමින් කීවේ කෝපයෙන් හෝ අමනාපයෙන් හෝ නො වේ. විනෝදකාමී කුඩා ස්වාමියා සමඟ කලහ කරගැනීම ඇයට විනෝදයක් විය.

"මෝඩ ගෑනි, මා කියන දෙය හොඳට අහගනින්. මට ගමනක් යන්න තියෙනවා. මා නැති අතර මේ දරුවන් දෙන්නා බලා ගන්නවා ය කියා මේ ලෝකේ තියෙන හැම සුද්ධ වූ දෙයක් ගැන ම දිවුරන්න පුළුවන් ද?"

"මං මොනවට ද දිවුරන්නේ? දිවුරුවේ නැතිවට මට මේ දරුවන් බලාගන්න පුළුවනි"යි ඉතිරිය සිනාසෙමින් කීවා ය.

"උඹ උඹේ සදාකාලික ගැලවිල්ල ගැන දිවුරුවේ නැතිනම් මම දරුවන් දමා යන්නේ නැහැ."

"එහෙනම් යන්න එපා. මට මහත්මයා ගියත් එකයි නො ගියත් එකයි. අද බොහො ම සීතලයි. ගෙදර ඉන්න එක වැඩිය හොඳයි."

"ළමයිනේ මා එනකන්, නැති නම් අම්මා එනකන් කුස්සි අම්මා ඔයගොල්ලන්ව බලාගනීවි. මෙලහකට අම්මා එනවා ඇති. කුස්සි අම්මා කෑම ලෑස්ති කරලා දේවි..............
කුස්සි අම්මේ උඹ මේ බබාලාට කෑම ලෑස්ති කරලා දෙනව නේ ද?"

"ඒක කරන්න පුළුවනි."

"දැන්නම් මට හිතේ බයක් නැති ව යන්න පුළුවනි. කුස්සි අම්මේ උඹ කැතිරිනාට ළමයා ලැබීම ගැන මේ ළමයින්ට පල් හෑලි කියන්න එපා"යි කොල්යා ගෙදරින් පිට වී යන අතරේ යෙමෙන් කීවේ ය. "පෙරුසුවාන් වරෙන්."

"පලයන් යන්න පිස්සු කොල්ලා. ඔය විදියේ කතා කියනවට හොඳට තලන්න ඕනෑ" යි මෙ වර සේවිකාව කීවේ කෝපයෙනි.

තුන් වන පරිච්ඡේදය

පාසල් මිත්‍රයෝ

කොල්යාට සේවිකාව කී දෙය නො ඇසිණි. අත්තිමේ දී ඔහුට මෙතෙක් වේලා බලා සිටි ගමන යාමට ඉඩ ලැබිණි. ගේට්ටුවෙන් පිට වූ හෙතෙම අවට බලා උරහිස් හකුලා "බොහොම හීතලයි" කියා පාර දිගේ ගමන් කොට, දකුණට හැරී කෙළින් ම වෙළෙඳපොළ දෙසට ගියේ ය. වෙළෙඳපොළ ළඟ තිබෙන අන්තිම ගෙය ඉදිරිපිටට ගිය හෙතෙම, ගේට්ටුව ළඟ නතර වී, සාක්කුවට අත දමා, නළාවක් ගෙන, කිසියම් සංඥාවක් කරන්නාක් මෙන් හැකි තරම් වේගයෙන් පිම්බේ ය. නළාව පිඹ මිනිත්තුවක් ගියේ නැත. හොඳට උණුසුම් ඇති, හැඩට මසන ලද කබායක් ඇඳගත්, රෝස පාට කම්මුල් ඇති, හවුරුදු එකොළහක් පමණ වයසැති ළමයෙක් පැමිණියේ ය. සමූරෝව් නමැති මේ ළමයා ප්‍රාරම්භයේ උගන්නා (කොල්යාට වඩා පන්ති දෙකකින් පහළ) ශිෂ්‍යයෙකි. ඔහු ගේ පියා ධනවත් නිලධරයෙකි. දඟකාර ළමයකු වූ කොල්යා සමඟ ආශ්‍රය නොකරන ලෙස සමූරෝව් ගේ මාපියන් ඔහුට නියම කරන්නට ඇතිවාට කිසි ම සැකයක් නැත. සමූරෝව්, කොල්යා සමඟ මේ ගමන හොරෙන් යන්නේ ඒ නිසා විය යුතු ය. පාඨකයන්ට අමතක වී නැතිනම්, මීට දෙ මසකට පෙර ඉලූෂාට ගල් ගැසූ ළමයින් ගෙන් සමූරෝව් ද එකෙකි. අලෝෂාට ඉලූෂා ගැන විස්තරයක් කෙරුණේ සමූරෝව් විසිනි.

"කොල්යා එනකන් පැයක් විතර බලාගෙන හිටියා"යි සමූරෝව් මිත්‍රයාට උදාසීන ගතියක් දක්වමින් කී ය. අනතුරු ව ළමයි දෙදෙනා වෙළෙඳ පොළ දෙසට ගියහ.

"එන්න පරක්කු වුණා. මා එක්ක එනවට තාත්තාගෙන් ගුටිකන්න වෙයි ද?" කොල්යා ඇසුවේ ය.

"තාත්තා කවදාවත් මට ගහන්නෙ නැහැ. පෙරුසුවාත් ගෙනාව ද?"

"ඔව්."

"ඌත් අරන් යනව ද?"

"ඔව්."

"සුචිකා ඉන්නවා නම් කො තරම් හොඳ ද?"

"සුචිකා නැති කොට මොනවා කරන්න ද? ඌ කොහෙ ගියා ද දන්නේ නැහැ."

"අපිට බැරි ද මෙහෙම දෙයක් කරන්න?"යි සමූරෝව් හිටිහැටියේ ම මග නතර වෙමින් විමසී ය "අපි ඉලූෂාට කියමු සුචිකා අළු පාට බල්ලෙක් ය කියා. එතකොට අපට පුළුවනි සුචිකා ය කියා පෙරුසුවාත් පෙන්නන්න. ඉලූෂා අපේ කතාව විශ්වාස කරන්න පුළුවනි."

"හොඳ අදහසකින්වත් බොරුවක් කියන්න එපා. මා එන බව කිව්වේ නැහැ නේ ද?"

"නමුත් පෙරුසුවාත් පෙන්නා ඉලූෂා ගේ හිත හදන්න බැහැ"යි සමූරෝව් සුසුමක් හෙලමින් කී ය. "ඉලූෂා ගේ තාත්තා අඳුනනවා නේද? එයා අද ඉලූෂාට, කහ පාට නහයක් තියෙන බලූපැටියෙක් ගෙනත් දෙනව ලු. එයා හිතනවා ඇති බලූපැටියෙක් ගෙනත් දීලා ඉලූෂා ගේ හිත හදන්න පුළුවන් ය කියා. මං හිතන්නේ නැහැ ඒක හරියාවි ය කියා."

"දැන් කොහොම ද ඉලූෂාට?"

"හුඟක් අමාරුයි. කැස්ස වෙන්න ඇති. හොඳට සිහිය තියෙනවා. නමුත් බොහො ම අමාරුවෙන් හුස්ම ගන්නේ. ටික දවසකට ඉස්සෙල්ලා ඇඳෙන් බැහැලා ඇවිදින්න ඕනෑ ය කිව්වා. ඉතින් ඒගොල්ලෝ සපත්තු දමා ඉලූෂාව ඇවිදින්න ඉඩ දීල තියෙනවා. ඒත් ඉලූෂා ගේ කකුල් පණ නැති ව වැටුණා. එයා ගේ කල්පනාව සපත්තුවල වරදින් වැටුණා ය කියායි. ඒත් ඉලූෂාට කෙළින් හිටගන්නවත් පණ නැහැ. තව සුමානයක්වත් ජීවත්වන එකක් නැහැ. හේසන්ටියුබ් දෙස්තර මහත්මයායි ඉලූෂාට බෙහෙත් කරන්නේ. ඒ ගොල්ලෝ දැන් බොහො ම පොහොසත්, හරියට සල්ලි තියෙනවා."

"උන් හොරු."

"කවුද හොරු?"

"දොස්තර ගොල්ලොයි, වට්ටෝරු වෙද්දුයි, සේරම හොරු. කොටින් කියනවා නම් වෙදකමත් හොර වැඩක්. දොස්තර ගොල්ලොත් හොරු. වෙදකම ගැන මගේ කිසි ම විශ්වාසයක් නැහැ. කිසි ම ප්‍රයෝජනයක් ඇති රක්ෂාවක් නො වෙයි. මම

ඉන්නේ වෙදකම ගැන හොයල බලන්නයි. මොකද ඉලූෂාට මෙ තරම් ආදරේ? පන්තියේ ළමයි හැම දා ම ඉලූෂා බලන්න එනවා වගෙයි."

"මුළු පන්තිය ම එන්නේ නැහැ. ළමයි දහ දෙලොස් දෙනෙක් හැම දා ම ඉලූෂා බලන්න එනවා. ඒකේ කිසි ම වරදක් නැහැ."

"මට තේරුම් ගන්න බැරි අලෝෂා කරමසෝව්, ඉලූෂා ගැන මෙ තරම් උනන්දුවක් දක්වීම ගැන යි. හෙට නැතිනම් අනිද්දට එයා ගේ අයියා ගේ මිනීමැරුම් නඩුව අහනවා. නමුත් අලෝෂා කරමසෝව්ට ළමයිත් එක්ක නාස්ති කරන්න ඕනෑ තරම් කාලය තියෙනවා."

"ඒක එ තරම් දෙයක් නො වෙයි. කොල්යා දැන්වත් ඉලූෂා එක්ක යාළු වෙනව ද?"

"ඉලූෂා එක්ක යාළු වෙන්න? මොන පිස්සු කතාවක් ද? මා කරන කියන දේවල්වල හොඳ නරක කීමට මම කිසි ම කෙනකුට ඉඩ දෙන්නේ නැහැ."

"ඉලූෂා බොහො ම සන්තෝෂ වේවි කොල්යා දුටුවාම. එන බව එයා දන්නේ නැහැ. ඉලූෂා බලන්න එන්න ඇයි මෙච්චර කල් පමා වුණේ?"යි සමුරෝව් හදිසියෙන් ම ඇති කරගත් හිතවත් කමක් දක්වා විමසුවේ ය.

"ඒක මගේ වැඩක්, සමුරෝව්ට අයිති වැඩක් නො වෙයි. මම යන්නේ මගේ කැමැත්තෙන් මයි. තුඹලා යන්නේ අලෝෂා ගේ උවමනාවටයි. මගේ ගමනෙයි, තුඹලා ගේ ගමනෙයි, ලොකු වෙනසක් තියෙනවා. සමහර විට මා යන්නේ ඉලූෂා එක්ක ආයෙත් යාළු වෙන්න පුළුවනි. කාට කියන්න පුළුවන් ද? තුඹේ කතාව බොහො ම මෝඩයි."

"අපි ගියේ අලෝෂා කියාපු නිසා නො වෙයි. පන්තියේ ළමයි කැමැත්තෙන් ම ඉලූෂා බලන්න ගියා. ඉස්මෙල්ලා ම ගියේ අලෝෂා එක්ක තමයි. නමුත් ඒක මෝඩ කමක් හැටියට පිළිගන්න බැහැ. ඉස්මෙල්ලා ම පාර එක් කෙනෙක් ගියා. දෙවෙනි පාර දෙන්නෙක් ගියා. ඉලූෂා ගේ තාත්තා බොහො ම සන්තෝෂ වුණා අපි ගියා ම. ඉලූෂා මළොත් එයා ගේ තාත්තට පිස්සු හැදෙන්න පුළුවනි. තාත්තා දන්නවා ඉලූෂා මැරෙන බව. ඉතින් එයා බොහො ම සන්තෝෂයි අපි

ඉලූෂා එක්ක ආයේත් යාළු වෙනවට. තාත්තා කොල්යා ගැන ඇහැව්වා. මා හිතන්නේ ඉලූෂා මළොත් තාත්තාට පිස්සු හැදී එල්ලී මැරෙන්න පුළුවනි. මීට ඉස්සෙල්ලාත් ඉලූෂා ගේ තාත්තාට පිස්සු හැදුණා. මිනිහා බොහො ම හොඳයි. මේ සේරම වුණේ එයාට ගහපු අර මිනීමරුවා ගේ වරදින්."

"කරමසෝව් පවුලේ අය ගේ හැටි තේරුම් ගන්න බොහො ම අමාරුයි. මට අලෝෂා එක්ක බොහො ම ඉස්සර යාළු වෙන්න ඉඩ තිබුණා. නමුත් තමන් ගේ ආඩම්බරය පෙන්නිය යුතු අවස්ථාවල් තියෙනවා. අලෝෂා ගැන මගේ හිතේ එක්තරා අදහසක් තියෙනවා. ඒ අදහස හරි ද වැරදි ද කියා සොයා නො බලා කිසි ම දෙයක් කරන එක හොඳ නැහැ." අනතුරු ව කොල්යා නිහඬ වුණේ අහංකාර කම පෙන්නීමට මෙනි. සමුරෝව් ද නිහඬ විය. තමා ගේ මිත්‍රයා උසස් පුද්ගලයකු ලෙස සමුරෝව් පිළිගෙන සිටියේ ය. එ හෙයින් තමා හා තම මිත්‍රයා එක තත්ත්වයේ ලා සැලැකීමට සමුරෝව් කැමැති නො වී ය. තමා කැමැත්තෙන් ම ඉලූෂා බලන්න යන්නේ යැයි කොල්යා කී විට සමුරෝව් තුළ ලොකු උනන්දුවක් ඇති විය. කොල්යා හදිසියෙන් ම ඉලූෂා බැලීමට යන මේ ගමනේ කිසියම් රහසක් ඇතැයි සමුරෝව් කල්පනා කෙළේ ය. ඔවුන් කඩ පොළ හරහා යන විට, පිටිසර පළාත්වල සිට ගෙනෙන ලද බඩු කරත්තවලින් වෙළෙඳ පොළ පිරී තිබිණි. විකිණීම පිණිස ගෙනෙන ලද කුකුළෝ ද බොහෝ වූ හ. ගැහැනු ඔවුනොවුන් ගේ කඩ පිල්වල සිට කෑම වගී, හා කපු පුළුන්, නූල්, ආදී නොයෙක් බඩු විකුණති. අපේ නගරයේ රිවිදින මාරකෑට්ටුවට 'පොළ' යැයි කියනු ලැබේ. හවුරුද්දකට මෙ වැනි පොළ දිනවල් බොහෝ තිබේ.

පෙරුසුවාත් මග දෙපස ඉව අල්ලමින් මහත් සතුටින් දුවන්නට විය. වෙනත් බල්ලන් හමු වූ විට, එකෙක් අනිකා ගේ මූහුණ සිඹ බලන්නේ, බල්ලන් අතරේ පවතින චාරිත්‍ර ධර්මයක් අනුගමනය කරමිනි.

"මම බොහො ම කැමැතියි මේ වගේ ස්වාභාවික දේවල් බලන්න"යි කොල්යා හදිසියෙන් ම කී ය. "දැකල තියෙනව ද බල්ලන් හමුවුණාම එකිනෙකා ඉඹින හැටි? ඒක උන් අතරේ පවතින ස්වාභාවික නීතියක් වගෙයි "

"ඒක මහ විහිළු සිරිතක්."

"ඒක විහිළු සිරිතක් නො වෙයි. ඒ අදහස වැරැදියි. අවිචාර අදහස් දරන මිනිසුන්ට මේවා විහිළු දේවල් හැටියට පෙනුණත් ස්වභාව ධර්මය විහිළුවක් නො වෙයි. බල්ලන්ටත් විචාරකයන් වෙන්න පුළුවන්නම්, උන්ට පෙනේවි සමාජ චාරිත්‍රවල බොහෝ ම හාස්‍ය ජනක දේවල් තියෙන බව. මා මේ ගැන ආයේත් කියන්නේ අප අතරේ හාස්‍ය ජනක දේවල් බොහෝ ම තියෙන බව මා පිළිගන්න නිසයි. ඒක රැකිටින් ගේ බොහෝ ම උසස් අදහසක්. සමූරෝව්, මම සමාජ වාදියෙක්."

"සමාජ වාදියා කියන්නේ කාට ද?" යි සමූරෝව් විමසුවේ ය.

"ඒ කියන්නේ හැමෝ ම එක සමානයි. හැමෝට ම පොදුවේ ධනය අයිති වෙනවා. ඕනෑ ම කෙනකුට පුළුවනි කැමැති ආගමක් අදහන්න, කැමැති නීතියක් පිළිපදින්න. මේවා තේරුම් ගන්න උඹ තව ම පොඩි වැඩි යි......... බොහෝ ම සීතලයි."

"ඔව්, අද අංශක දෙළහක් හිම වැටී තියෙනවා. දුන් ටිකකට ඉස්සෙල්ලා තාත්තා තර්මෝමීටරය බැලුවා."

"බොහෝ ම තදින් හිම වැටෙන සීත කාලයේ මැද හරියට වඩා අඩුවෙන් හිම වැටෙන සීත කාලයේ මුල් හරිය බොහෝ ම සීතල බව දැකලා නැද්ද? එහෙම වෙන්නේ අපි සීතලයට පුරුදු නැති නිසයි. සාමාජික, දේශපාලන ආදී හැම දෙයක් ම මිනිහා කරන්නේ පුරුද්ද අනුවයි. මිනිහා හැම ක්‍රියාවකට ම පෙලඹෙන්නේ පුරුද්ද නිසයි.........බලන්න අර මිනිහ ගෙ හැටි. මහ පුදුම මිනිහෙක් නොවැ!"

කොල්යා, දිග කබායක් ඇඳ සිටි, යහපත් පෙනුමෙන් යුත්, උස ගැමියකු පෙන්නුවේ ය. කරත්තයක් ලඟ හිඳ සිටි හෙතෙම ශරීරය උණුසුම් කරගැනීම පිණිස අතින් අත පිරිමැද්දේ ය. ඔහු ගේ දිග රැවුල හිම මෙන් සුදු ය.

"මේ මිනිහ ගෙ රැවුල මිදිලා" යි කොල්යා ගැමියා පසු කොට යන අතරේ කීවේ ගැමියා කෝප කිරීම පිණිස ය.

"හුඟ දෙනකු ගේ රැවුළු මිදිලා" යි ගැමියා කීවේ කිසි මූ අමනාපයකින් නො වේ.

"ඒ මිනිහා තරහ කරවන්න එපා" යි සමූරෝව් කී ය.

"මොන පිස්සු ද, ඒ මිනිහා තරහ වන්නේ නැහැ. බොහෝ ම හොඳ මිනිහා.........ආයුබෝවන් මෙත්වි."

"අංයුබෝවන්."

"නම මෙත්වි ද?"

"ඔව්, ඇයි දත්තේ නැද්ද?"

"නැහැ, දනගෙන හිටියේ නැහැ, නිකම් හිතුවා."

"හැබැට ම, මේ ළමයා තව ම ඉස්කෝලේ යනවා නේ ද?"

"ඔව්."

"ඉස්කෝලේ දී ගුරුවරු තළනව ද?"

"වැඩිය නැහැ."

"රිදෙනව ද?"

"ඔව්, ටිකක් රිදෙනවා."

"හැබෑ ම ජීවිතයක් නොවැ!"යි පැවැසූ ගැමියා හදපත්ලෙන් නැගුණු සුසුමක් හෙළුවේ ය.

"අපි ගිහින් එන්නම්."

"බොහෝ ම හොඳයි......බොහෝ ම හොඳ ළමයා!"

ළමයි දෙදෙනා නික්ම ගියහ.

"ඒ මිනිහා බොහෝ ම හොඳයි" කොල්යා යන ගමන් තම මිත්‍රයාට කී ය.

"මම බොහෝ ම කැමැතියි පිටිසර මිනිසුන් එක්ක කතා කරන්න. උන්ට උපකාර කරන්නත් මම බොහෝ ම කැමැතියි."

"අපට ඉස්කෝලේ දී තළනවා ය කියා ඇයි බොරු කිව්වේ?" ස්මුරෝව් ප්‍රශ්න කෙළේ ය.

"එහෙම කිව්වේ මිනිහා සතුටු කරන්නයි."

"මොනවට ද?"

"මා කැමැති නැහැ මගෙන් එක ම ප්‍රශ්නය දෙපාරක් අහනවට. පළමු පාරට ම කියන දෙය තේරුම් ගන්නවා නම් මම බොහෝ ම කැමැතියි. ගැමියන් ගේ අදහසේ හැටියට ඉස්කෝලේ යන ළමයින් නිතර ගුටි කනවා. ඉස්කෝලේ යන ළමයින්ට තළන්න ඕනෑ. දඬුවම් නොලබන ශිෂ්‍යයා

මොන ශිෂ්‍යයෙක් ද? අපට දඬුවම් කරන්නේ නැහැ කිව්වොත් මිනිහ සතුටු වෙන්නේ නැහැ. ගැමියන්ට කතා කරන හැටි නුඹ තව ම දන්නෙ නැහැ.''

''කොහොම වුණත් මේ මිනිසුන්ට කවටකම් කරන්න හොඳ නැහැ. අර පාත්තයා නිසා අමාරුවේ වැටුණ වගේ ආයේත් පාරක් අමාරුවේ වැටෙන්න පුළුවනි.''

''එහෙනම් බය ද?''

''හිනා වෙන්න එපා, මම භයයි. මා ගෙදරින් පිටවී ගියා ය කියා තාත්තා තරහෙන් ඇති. නුඹ එක්ක කොහෙවත් යන්න එපා ය කියා මට නියම කරල තියෙනවා.''

''භය වෙන්න එපා, මේ පාර කිසි ම දෙයක් වෙන්නේ නැහැ.'' මෙසේ පැවැසූ කොල්යා ''නටාෂා'' කියා කඩයක සිටි මැදවියේ ගැනියකට කතා කෙළේ ය.

''මගේ නම නටාෂා නො වෙයි, මාරියා''යි මැදිවියේ ඉතිරිය කෑගා කීවා ය.

''නම මාරියා නම් බොහො ම හොඳයි, අපි ගිහින් එන්නම්.''

''පැන්වා එනවා මා එක්ක විහිළු කරන්න.''

''පමා වෙනවා. කතා කරන්න වෙලාවක් නැහැ. අනෙක් ඉරිදට ඒ ගැන සේරම කියන්න''යි කොල්යා අත වනා කීවේ තමා ඉතිරියට කරදර කරනවා නො ව ඉතිරිය තමාට කරදර කරන්නී ය යන අදහස හඟවන්නාක් මෙනි.

''අනෙක් ඉරිදට කියන්න දෙයක් නැහැ. මා නො වෙයි කතාව පටන් ගත්තේ මේ ළමයයි'' කියමින් මාරියා කෑගැවා ය. ''මිනිසුන්ට අපහාස කරනවට කසයෙන් තළන්න ඕනෑ.''

අනෙක් මඩුවල බඩු විකුණන වෙළෙන්දියෝ මහ හඬින් සිනාසුණහ. හදිසියෙන් ම කෝප වූ මිනිහෙක් අසල කඩයකින් එළියට පැන්නේ ය. ඔහු එම පලාතේ වෙළෙන්දකු නො ව, පොළට පැමිණි වෙළෙන්දකු ගේ තරුණ ලියන්නෙකි. ඔහු ගේ දිග මූහුණ වසූරියෙන් හටගත් කැළැල්වලින් අවලක්ෂණ විය. හිසකෙස් රැළි වැටුණේ ය. ඔහු දිග තිල්පාට කබායක් සමඟ කැප්තොප්පියක් පැළඳ සිටියේ ය. තොගත්ගුත්කමින් සිටි හෙතෙම කොල්යාට මිට මොලවා තර්ජනය කෙළේ ය.

''මම උඹව අඳුනනවා''යි මිනිහා කෝපයෙන් කෑගා කී ය.

කොල්යා මේ මිනිහා දෙස පුදුමයෙන් බැලුවේ ය. මෙ වැනි මිනිහකු සමඟ තමා කලහ කරගත් බවක් ඔහුට මතක නැත. එහෙත් ඔහු මඟතොට දී කො තරම් කලහ කරගත්තේ ද කියතොත් කලහ කරගත් වාර ගණන මතක් කොට කිව නො හැකි ය.

"මාව අඳුනනවා ද?"යි කොල්යා අවඥාවෙන් ඇසුවේ ය.

"මම උඹව අඳුනනවා. මම උඹව අඳුනනවා"යි මිනිහා මෝඩයකු මෙන් කී ය.

"අඳුනනවා නම් බොහො ම හොඳයි. දැන් මට යන්න ඕනැ. මට පමා වෙනවා. ආයුබෝවන්."

"උඹ තවපාරක් කෝලාහල කරන්න හදනව ද?"යි මිනිහා කෑගැවේ ය. "මං දන්නවා උඹ තව පාරක් කෝලාහල කරන්න හදනවා."

"සහෝදරයා, මම කෝලාහාල කළත් නො කළත් ඒක උඹට අයිති වැඩක් නො වෙයි" කොල්යා කීවේ මඟ නතර වී මිනිහා දෙස පරීක්ෂාවෙන් බලමිනි.

"මට අයිති වැඩක් නො වෙයි?"

"ඔව්, උඹට අයිති වැඩක් නො වෙයි."

"එහෙනම් කාට අයිති වැඩක් ද?"

"ඒක ට්‍රිෆෝන් නිකිච්ච්ට අයිති වැඩක්. උඹට අයිති වැඩක් නො වෙයි."

"මොන ට්‍රිෆෝන් නිකිටිච් ද?"යි මිනිහා මෝඩයකු මෙන් ඇසුවේ තව තවත් කෝප වෙමිනි.

කොල්යා ඔහු දෙස නොසැලැකිල්ලෙන් බැලුවේ ය.

"උඹ සවශීරෝණයේ දේවස්ථානයට ගිහින් තියෙනවා ද?"යි කොල්යා හදිසියෙන් ම තරඟෙන් ඇසුවේ ය.

'මොන සවශීරෝහණයේ දේවස්ථානය ද? මොනවට ද මං එතැනට යන්නේ? නැහැ මං ගිහින් නැහැ" යි මිනිහා මඳක් තිගැස්සී කී ය.

"උඹ අඳුනනව ද සබානිච්ච්?"යයි කොල්යා ආයේත් තරහෙන් ඇසුවේ ය.

"මොන සබානිච්ච් ද? මං අඳුනන්නේ නැහැ."

"එහෙනම් උඹ යකාට පලයන්"යයි කතාව කොට කරමින් පැවැසූ කොල්යා දකුණු අතට හැරී වහවහා ගමන් කෙළේ සබාතිච්ච් නොඅඳුනන මිනිහකු සමග කතා කිරීමත් මෝඩ කමකැයි කල්පනා කරමිනි.

"ටිකක් හිටපන්....මොන සබාතිච්ච් ද?"යි සිහිය එක්තැන්කර ගත් තරුණයා කොල්යාට කතා කරමින් විමසුවේ ය. ඔහු තවමත් සිටියේ තරහෙන් ය. "අර ලමයා මොනවා ද කිව්වෙ?"යි අනතුරු ව ඔහු වෙළෙන්දියකගෙන් ඇසුවේ ය.

"ඒ ලමයා මොනව හිතාගෙන කිව්ව ද දන්නේ නැහැ"යි වෙළෙන්දිය කීවා ය.

"ඒ ලමයා අහන්නේ මොන සබාතිච්ච් ගැන ද?"යි තවමත් කිපී සිටි තරුණයා ඇසුවේ ය.

"කුස්මිච් ගේ ගෙදර වැඩ කල සබාතිච්ච් වෙන්න ඇති. ඔව් ඒ මිනිහා තමයි" ගැහැනිය කීවා ය. තරුණයා ඇය දෙස පුදුමයෙන් බැලුවේ ය.

"කුස්මිච් ගේ ගෙදර වැඩ කරන මිනිහ ගේ නම ට්‍රිපොන් නො වෙයි කුස්මා. ඒත් ලමයා කිව්වේ ට්‍රිපොන් තිකිට්ච් කියායි. එහෙනම් ඒ මිනිහා වෙන්න බැහැ"යි තවත් ගැනියක් කීවා ය

"ඒ මිනිහ ගේ නම ට්‍රිපොනුත් නො වෙයි, සබාතිච්චුත් නො වෙයි. ඒ මිනිහ ගේ නම චිචිකෝප්"යයි මෙතෙක් වේලා නිහඬ ව කතාව අසා සිටි තුන් වන ගැහැනිය හදිසියෙන් ම කීවා ය.

"එහෙනම් ඒ මිනිහා වෙන්න බැහැ"යි වෙනත් ගෑනියක් කීවා ය.

"මිනිහ ගේ නම මිස්කෝප් ඇලෙක්සි ඉවාන්නිච්."

"ඔව් ඔව්, මිනිහ ගේ නම චිචිකෝප් තමයි. ඒ ගැන කිසි ම සැකයක් නැහැ" යි හතර වන ගෑනිය, තුන් වන ගෑනිය ගේ කතාව සනාථ කරමින් කීවා ය.

"පුදුමයට පත් තරුණ ගෑනු දෙදෙනා එකිනෙකා ගේ මූහුණු බැලූ හ.

"අර ලමයා ඒ මිනිහ ගැන ඇහැව්වේ මොකද?"යි තරුණයා ඇසුවේ ය. "උඹ සබාතිච්ච් අඳුනනවා ද? කියා අහනවා. මොණ යකා ද සබාතිච්ච් අඳුනන්නේ!?"

"උඹ මහ මෝඩයෙක්. ඒ මිනිහ ගේ නම සබාතිච්ච නො වෙයි ටිචිකෝප් ඇලෙක්සි ඉවාන්නොවිච්"යයි ගැතියක් කෑ ගා කීවා ය.

"මොන ටිචිකෝප් ද? කවුද ටිචිකෝප් අඳුනන්නේ? උඹ අඳුනනවා නම් කියාපන්."

"ග්‍රීෂ්ම කාලයේ දී නිතර ම මාරකැට්ටුව ළඟ රස්තියාදු වන, නහයෙන් හොටු ගලන උස කෙට්ටු මිනිහා."

"ඒ මිනිහගෙන් මට ඇති වැඩේ මොකක් ද?"

"අපි කොහොම ද දන්නේ?"සි ගැහැනියක් ඇසුවා ය.

"ඒ මිනිහ ගැන ඔය තරම් කලබල වුණා නම් උඹ ඒ මිනිහා ගැන දැනගන්න එපා යැ. ඒ ළමයා කතා කළේ අප එක්ක නො වෙයි උඹ එක්කයි. මෝඩයා, ඇයි ඒ මිනිහ අඳුනන්නේ නැද්ද?"

"මොන මිනිහ ද?"

"ටිචිකොෆ්."

"ටිචිකොප්පුයි උඹලයි යකාට ගිය දෙන්. ඒ ළමයා මට විහිළු කරන්න හදනවා. මම හොඳ පාඩමක් උගන්වන්-නම්."

"ඊට ඉස්සෙල්ලා උඹට හොඳ පාඩමක් උගන්නාවි. උඹ අලි මෝඩයා."

"ටිචිකෝප්ට නො වෙයි මට තාවට කම් කරන අර ළමයාට හොඳ පාඩමක් උගන්වනවා."

ගැහැනු මහ හඬින් සිනාසුණහ. ප්‍රීතියට පත් කොල්යා මඳක් ඈතින් ගමන් කරයි. සමුරෝව් කොල්යා ගේ පිටු පසින් ගමන් කළේ කෑ ගහන ගෑනුන් දෙස බලමිනි. මේ කෝලාහලයට පටලැවීමට අකැමැති වුවත් ඔහු ප්‍රීතියෙන් ගමන් ගත්තේ ය.

"මොන සබාතිච්ච් ගැන ද කිව්වේ?"සි සමුරෝව් මිත්‍රයා ගෙන් ඇසුවේ ඔහු දෙන පිළිතුර කුමක් දැයි දැනගෙන ය.

"මම කොහොම ද දන්නේ? දැන් ඔය මිනිස්සු මුළු දවස ම කෝලාහල කරගනීවි. මම බොහෝ ම කැමැතියි සමාජයේ හැම කොටසක ම ඉන්න මෝඩයන් උසිගන්වන්න. මෙන්න ඉන්නවා තවත් මෝඩයෙක්......අර අතන ඉන්න ගොඩයා.

'මෝඩ ප්‍රංශකාරයකුට වඩා මහ මෝඩයෙක් ලෝකයේ නැහැ' කියා කතාවක් තියෙනවා. නමුත් රුසියත් මෝඩයා ඒ සේරට ම වඩා ලොකු මෝඩයකු බව මූහුණ බලා කියන්න පුළුවනි අර මිනිහ ගේ මූහුණ දිහැ බලා කියන්න බැරි ද මිනිහා මෝඩයකු බව?"

"ඒ මිනිහට කරදර නො කර යමු."

"නැහැ නැහැ, එහෙම යන්න බැහැ..... හා කොහොම ද ලොක්කා?"

සෙමෙන් යමින් සිටි, වටකුරු වාත් මූහුණකින් හා පැසුණු රැවුලින් යුත් තරබාරු ගැමියා ආපසු හැරී කොල්යා දෙස බැලුවේ ය. ඔහු දූනට ම අඩියක් ගසා සිටින බව පෙනේ.

"මහත්මයා මට විහිළුවක් ද කරන්නේ?"යි ගැමියා කී ය.

"හොඳයි මම විහිළුවක් කරනවා නම්?" කොල්යා සිනා සෙමින් ඇසුවේ ය.

"විහිළු කළාට වරදක් නැහැ. විහිළුවක් කළා ම හිනා වෙන එකයි තියෙන්නේ."

"බොහො ම සනගාටුයි සහෝදරයා, මා කළේ විහිළුවක්."

"එහෙනම් දෙයියන් වහන්සේ උඹට සමාව දේවි."

"උඹත් මට සමාව දෙනව ද?"

"ඔව්, මාත් සමාව දෙනවා. දූන් ඉතින් ඉක්මනට යන්න."

"උඹ ඥානවන්ත මිනිහෙක් බව පේනවා."

"මා මහත්මයාට වැඩිය ඥානවන්ත මිනිහෙක්" යයි මහල්ලා කිසි ම බලාපොරොත්තුවක් නැති ව කී ය.

"මා හිතන්නේ නැහැ"යි කොල්යා මඳක් තිගැස්සී කී ය.

"ඔව් ඒක ඇත්තයි."

"වෙන්න පුළුවනි."

"ඔව් ඒක එහෙම තමයි සහෝදරයා."

"ආයුබෝවන්!"

"ආයුබෝවන්!"

"මේ පැත්තේ නොයෙක් විදියේ මිනිස්සු ඉන්නවා"යි කොල්යා සමුරෝව්ට කීවේ මඳ වේලාවක් නිහඬ ව සිටීමෙන් පසු ව ය. "මං කොහොම ද ඥානවන්ත ගොවියකුට කතා කළා ය කියන්නේ? අපේ ගොවියන් අතරේ සිටින ඥානවන්තයන් පිළිගැනීමට මා බොහො ම කැමැතියි."

දේවස්ථානයේ හෝරා යන්ත්‍රයේ දවල් එකොළහමාර වදින හඬ ඇත සිට ඇසේ. ඉලූෂා ගේ ගෙය බලා ළමයි දෙදෙනා වහවහා ගමන් කළහ. ඉලූෂා ගේ නිවෙසට මඳ දුරක් ගිය යුතු ය. නිවෙසේ සිට අඩි විස්සක් පමණ ඈතින් නතර වූ කොල්යා, ගෙට ගොස් අලෝෂා කරමසෝව්ට කතා කරන ලෙස තම මිත්‍රයා පිටත් කොට යැව්වේ ය.

"ටිකක් ඉව අල්ලා බලන්න ඕනෑ"යි ඔහු සමුරෝව්ට කී ය.

"මොනවට ද අලෝෂාට කතා කරන්නේ? අපි යමු ගෙට. අපි ආපු එක ගැන ඒ ගොල්ලෝ බොහො ම සතුටු වේවි. මේ සීතලේ එළියට වෙලා ඉඳගෙන මොනවට ද අලෝෂාට කතා කරන්නේ?"

"සීතලේ ඉඳගෙන අලෝෂාට කතා කරන්න තියෙන උවමනාව මා දන්නවා"යි කොල්යා මිත්‍රයා ගේ කතාවට බාධා කරමින් කීවේ ළමයින්ට කතා කිරීමේ දී අනුගමනය කළ යුතු ස්වෛරීබලය පෙන්නමිනි. සමුරෝව්, කොල්යාට කීකරු වෙමින් වහා ගෙට ගියේ ය.

හතර වන පරිච්ඡේදය

නැති වූ බල්ලා

කොල්යා, අලෝෂා පැමිණෙන තෙක් වැටට හේත්තු වී බලා සිටියේ අහංකාර කමක් ආරූඪ කරගෙන ය. කොල්යා බොහෝ කාලයක සිට ආලෝෂා හමුවීමට ඇති ආශාවෙන් බලා සිටියේ ය. ඔහු ආලෝෂා ගැන බොහෝ දෑ ශිෂ්‍යයන් ගෙන් අසා දැන තිබිණි. එහෙත් ආලෝෂා ගැන සඳහන් කරනු ලැබූ හැම විට ම ඔහු අවඥාවෙන් යුත් නොසැලැකිලි

ගතියක් දක්වී ය. එමතු ද නො ව, අලෝෂා ගැන පවසන ලද නොයෙක් කතාවලට ඔහු දෙස් කී ය. එහෙත් අලෝෂා සමඟ දැනඇඳුනුම් කම ඇති කර ගැනීමට ඔහු තුළ රහසිගත බලවත් ආශාවක් පැවැතිණි. ආලෝෂා ගැන ඔහු අසා ඇති නොයෙක් කතාවල අනුකම්පා උපදවන සිත් ගන්නා සුලු ගුණයක් තිබිණි. එ හෙයින් ආලෝෂා හමුවන මේ මොහොත ඉතා වැදගත් ය. පළමු ව තමා සැල-කිය යුතු වැදගත් නිදහස් පුද්ගලයකු බව කිය යුතු ය. තමාට අපහාස වන කිසිවක් නො කළ යුතු ය, නො කිය යුතු ය. "ආලෝෂා අනෙක් පොඩි ළමයින්ට සලකන්නාක් මෙන් මටත් සලකන්න පුළුවනි. ආලෝෂා මේ ළමයින්ගෙන් මොනවද බලාපොරොත්තු වන්නේ? ඔහු ඇඳිනගත් පසු ඒ ගැන අහන්න ඕනෑ. මා ටිකක් උසට හිටියා නම් හොඳයි. තුෂි-කෝප් මට වඩා වයසින් බාල වුවත් ටිකක් උසයි. මා එ තරම් ලස්සණ නැහැ. නමුත් මගේ මුහුණ දිහැ බැලුවාම මා අනෙක් ළමයින්ට වඩා ඥානවන්ත බව පේනවා. ආලෝෂා සමඟ මිත්‍රවීමට මා තුළ තියෙන කැමැත්ත පෙන්නන්න හොඳ නැහැ. වැඩි හිතවත් කම් දක්වා කතා කරන්න නරකයි."

තමා නිදහස් වැදගත් පුද්ගලයකු බව හැඟවීමට වෑයම් කරන කොල්යා තුළ ඉහත සඳහන් අදහස් ඇති විය. ඔහු මඳක් නොසන්සුන් වූයේ, මඳක් උසින් අඩු වූ හෙයිනි. ඔහු ගේ අවලක්ෂණ මුහුණ එ තරම් සිත් තැවුලට හේතු නො වී ය. ඔහු පසු ගිය හවුරුද්දේ, ගෙයි බිත්තියේ, තමා ගේ උස පැන්සලය-කින් ලකුණු කෙළේ ය. ඊට පසු දෙමසකට වරක් ඔහු මහත් ආශාවෙන් එම ලකුණ අනුව තමා කො තරම් උස ගොස් ඇද්දැයි බැලුවේ ය. එහෙත් ඔහු උස ගියේ ඉතා සෙමෙනි. මෙය ඔහු ගේ බලවත් ශෝකයට හේතු විය. ඔහු ගේ මුහුණ ඔහු හිතන තරම් අවලස්සණ නැත. සියුමැලි කුඩා ලපවලින් යුත් මුහුණ දුටුවත් සිත් ගතියි. ඔහු ගේ දුඹුරු පැහැති කුඩා, එහෙත් ප්‍රාණවත් දෑස තුළ නිර්භීත ගතියක් දකින්නට තිබිණි. ඒ දෑස නිතර සිතේ හටගන්නා හැඟීම්වලින් බැබැ-ළෙයි. ඔහු ගේ හකු ඇට මඳක් ලොකු වූ අතර කට කුඩා විය. තොල් සිහින් ය, රතු ය. කුඩා නාසය උස ය. කැඩපතින් මුහුණ දෙස බැලූ හැම විට ම "මේක මූක්කන් නාහයක්"යයි ඔහු තමාට ම කියා ගත්තේ ය. ඔහු හැම විට ම කැඩපත ළඟින් ඇත් වූයේ නාසය ගැන ඇති කරගත් පිළිකුලින් යුතු ව ය.

"කොහොම වුණත් මගේ මූහුණේ ඥානවන්ත ගතියක් පෙනෙන්න තියෙනවාද?"යි ඔහු ඇතැම් විට කල්පනා කළමුත් ඒ ගැන ද සැක කෙළේ ය. මෙසේ ඔහු මුළු කාලය ම මූහුණ ගැනත්, නහය ගැනත්, කල්පනා කිරීමට ගත කෙළේ යැයි සිතීම වැරදි ය. කැඩපත තුළින් මූහුණ බලන විට ඇති වන පිළිකුල කො තරම් බලවත් වුවත් ඔහු වහා එය අමතක කෙළේ ය. තියම ජීවිතය හා සම්බන්ධ වූ කටයුතුවලට හා අදහස්වලට ඉඩ හරිමින් මූහුණත් නහයත් ගැන කල්පනා කිරීම බොහෝ කාලයකට අමතක කෙළේ ය.

වහා ගෙත් පිටත පැමිණි අලෝෂා, කොල්යා සිටි තැනට ගියේ ය. ආලෝෂා ප්‍රීතියෙන් සිටින බව කොල්යා දුර දී ම දුටුවේ ය. "මා හමුවීම ඔහුට එ තරම් ප්‍රීතියෙක් ද?"යි කොල්යා කල්පනා කෙළේ ය ඒ කල්පනාව ඔහු ගේ ප්‍රීතියට හේතු විය. අප පසු ගිය වර දුටුවාට වඩා දුන් ආලෝෂා අමුතු පුද්ගලයකු වී සිටන බව මෙහි ලා සඳහන් කළයුතු ය. ඔහු ලෝගුව අත්හැර දමා, හැඩට වැඩට මසන ලද කබායක් හැඳ හිස්වැස්මක් පැලඳ සිටියේ ය. ඔහු ගේ පියකරු මූහුණ සිනාවකින් විසිතුරු විය. එහි කාරුණ්‍යාව හා සත්පුත් කම දකින්නට තිබිණි. කොල්යා ගේ බලවත් පුදුමයට අලෝෂා ගෙත් පිටතට ආවේ පිටකබායක් නැති ව ය. කලබල ගතියක් දක්වූ තරුණයා වහා කොල්යාට අත දී ආචාර කෙළේ ය.

"අන්තිමට ආවා නේ ද? අපි මෙ පමණ කාලයක් බලා සිටියා"යි ආලෝෂා කී ය.

"මා නාවේ හේතුවක් ඇති ව යි. ඒක තව ටිකකින් දැනගන්න ලැබේ වි"යි කොල්යා සෙමෙන් හා නොසැලැ-කිල්ලෙන් කී ය. "කොහොම වුණත් අඳුනා ගැනීමට ලැබීම ගැන මම බොහො ම සන්තෝෂයි. ඔබ හමුවීමට අවසථාවක් ලැබෙන තෙක් මා බොහො ම අසාවෙන් බලා සිටියා. මම ඔබ ගැන බොහො ම දේවල් අහල තියෙනවා."

"අප දෙදෙනාට එකිනෙකා අඳුනා ගැනීමට ලැබීම බොහො ම හොඳයි. මාත් ඔබ ගැන බොහො ම දේවල් අහල තියෙනවා. කොහොම වුණත් මෙහි පැමිණීමට පමා වුණා වැඩියි."

"මොනව ද ආරංචි?"

"ඉලූෂාට බොහො ම අමාරුයි. මා හිතන හැටියට ඉලූෂා ජීවත්වන එකක් නැහැ."

"එහෙනම් ඉලූෂා ගේ තත්ත්වය බොහො ම භයානකයි! 'වෙද කම' කියන දෙය ලොකු මූලාවක්"යයි කොල්යා උනන්දු-වෙන් කී ය.

"ඉලූෂා නිතර ම ඔබ මතක් කරනවා. සිහි නැති ව සිටින විටත් ඔබ ගැන දෙඩුවා......අර පිහිය පිළිබඳ සිද්ධියට කලින් දෙන්නා ම බොහො ම මිත්‍ර ව සිටිය බව පේනවා.........තවත් කාරණාවක් තියෙනවා.........මේ ඉන්නේ ඔබේ බල්ලා ද?"

"ඔව්, පෙරුස්වාන්."

"එහෙනම් සුචිකා නො වෙයි ද?"යි අලෝෂා ඇසුවේ දූසේ පිරි අනුකම්පාවෙන් යුතු ව ය. "සුචිකා මළා ද?"

"මා දන්නවා සුචිකා ඉන්නවා නම් මේ ළමයින් බොහො ම සතුටු වන බව. මට ඒ ගැන සේරම ආරංචියි" රහසක් සඟවා ගෙන සිටින්නකු මෙන් කොල්යා සිනා සෙමින් කී ය. "මම ඒ ගැන තොරතුරු සේරම කියන්නම්. මම ආවෙත් ඒකටයි. මම කතා කළේ ගේ ඇතුළට යන්න ඉස්සෙල්ලා සම්පූර්ණ විස්තරයක් කරන්නයි. ඉලූෂා පාසලට එන්න පටන් ගත්තේ පසු ගිය වසන්ත කාලයේ ඉඳලයි. අපේ ප්‍රාරම්භ පාසල්වල හැටි දන්නවා නේද? ළමයින්ගෙන් පිරිලා. ආපු දවසේ ඉඳලා ඉලූෂා ළමයින්ට කවට කම් කරන්න පටන් ගත්තා. මා ඉන්නේ ඊට වඩා පන්ති දෙකකට ඉහළින්. ඉතින් ඒ ළමයි එක්ක අපේ වැඩි සම්බන්ධයක් නැහැ. ඉලූෂා බොහො ම දුර්වල කුඩා ළමයෙක් බව මම දුටුවා. නමුත් ඉලූෂා අනෙක් ළමයින්ට කවදාවත් යටත් වුණේ නැහැ. උන් එක්ක ගහගත්තා. මිනිහ බොහො ම ආඩම්බරයි. ඇස්වලින් පේනවා හිතේ තියෙන වෛරය. මම බොහො ම කැමැතියි ඔය විදියේ ළමයින්ට. අනෙක් ළමයි ඉලූෂාට බොහො ම කවට කම් කළා. ඒ දවස්වල ඉලූෂා හොඳට ඇඳගෙන ආවේ නැහැ. කලිසම ඇඟට තදයි. සපත්තු ගෙවිලා. ළමයි ඇඳුම්වල ඇදකුද පෙන්නමින් තව තවත් විහිළු කළා. ඒවා මට ඉවසන්න පුළුවන් දේවල් නො වෙයි. මම ඒ ළමයින්ට හොඳට ම තැළුවා. මා කොපමණ තැළුවත් උන් මට තව තවත් ආදරය බව දන්නවා ද?"යි කොල්යා ආඩම්බරයෙන් කී ය. "ඒත් මම ළමයින්ට බොහො ම ආදරෙයි. අපේ ගෙදර ඉන්නවා පොඩි ළමයි දෙන්නෙක්. ඒ ළමයි දෙන්නා නිසයි මට එන්න පමා වුණේ. ඉතින් ළමයින් ඉලූෂාට විහිළු කිරීම නතර කළ පසු මම ඉලූෂා ආරක්ෂා කළා. මා දැනගත්තා ඉලූෂා බොහො ම

උඩගු බව. නමුත් අන්තිමේ දී ඉලූෂා මට බොහෝ ම ආදරයෙන් සලකන්න පටන් ගත්තා. මා කල කී හැම දෙයක් ම කළා. දෙයියන්ට කීකරු වෙනවා වගේ මට කීකරු වුණා. මා අනුගමනය කිරීමට වෑයම් කළා. විවේක කාලයේ දී මා ළඟට දුවගෙන එනවා. ඉතින් මා යන හැම තැන ම ඉලූෂා එක්ක ගියා. ඉරිදටත් එහෙමයි ඉලූෂා වගේ පොඩි ළමයකු එක්ක ලොකු ළමයෙක් මිත්‍ර වුණා ම උන් හිනා වෙනවා ඒ ඊර්ෂ්‍යාවටයි. පොඩි ළමයකු එක්ක මිත්‍ර වීමට මට උවමනාවක් තියෙනවා නම් මම මිත්‍ර වෙනවා. ඒක එ තැනින් ඉවරයි. මම ඉලූෂාට පාඩම් කියා දුන්නා. මා ඉලූෂාට කැමැති නම් පාඩම කියා දුන්නට තියෙන වරද කුමක් ද? අලෝෂා මේ පොඩි ළමයින් එක්ක මිත්‍රයි නේද? උන් ගැන ලොකු සැලැකිල්ලක් දක්වනවා නේද? ඔබ බලාපොරොත්තු වන්නේ බාල පරම්පරාව ගේ යහපතට වැඩ කිරීමට නො වේ ද? ඔවුන් ගේ චරිත හැඩගැස්සීමට නො වේ ද? ඔවුන්ට යහපතක් කිරීමට නො වේ ද? ඔබේ මේ පරාර්ථ සේවය ගැන මම බොහෝ ම දේවල් අහල තියෙනවා. ඒ සේවය ගැන මම ලොකු සැලැකිල්ලක් දක්වූවා. දැන් ඉතින් අපි අපේ කතාවට බසිමු. මට පෙනුණා ඔබේ සිත බොහෝ ම මෙලෙක් බව. උපන් දා ඉඳලා මෙලෙක් සිත් ඇති අයට මා සතුරුකම් කරන බව ඔබ අහලා ඇති. ඉලූෂා තුල තිබුණා එකිනෙකට විරුද්ධ ගතිගුණ බොහෝ ම. ඉලූෂා බොහෝ ම ආඩම්බරයි. ඒ එක්ක ම මට බොහෝ ම ලැදියි. දාසයෙක් වගේ භක්තිය තිබුණා. නමුත් මගේ අදහස්වලට විරුද්ධ වෙනවා. මා එක්ක තර්ක කරලා කිපෙනවා. සමහර විට මම ඉලූෂාට නොයෙක් විදියේ අදහස් පැහැදිලි කරල දෙනවා. ඒත් ඉලූෂා විරුද්ධ වුණේ මගේ අදහස්-වලට නො වෙයි. එයා ගේ සුරතල්කම්වලට මම වැඩි සැලැකිල්ලක් නොදක්වූ නිසයි. ඉතින් මා කල්පනා කළා ඉලූෂා සුරතල් වූ තරමට එයාට වැඩි සැලැකිල්ලක් නොපෙන්නා සිටීමට. මා ඒක කළේ ඕනෑවට ම යි. මා අදහස් කරගෙන සිටියෙත් එහෙම කරන්නයි. මට උවමනා කළේ එයා ගේ චරිතය හැඩගස්සා තියම මිනිහකු කිරීමටයි....... තේරුණා නේද මා කියාපු දෙය? නමුත්, දවස් තුනක ඉඳලා ඉලූෂා යම්කිසි කාරණාවක් නිසා නොසන්සුන් තත්ත්වයක සිටින බව මම හදිසියෙන් ම දුටුවා. එයා නොසන්සුන් වුණේ මා දක්වූ නොසැලැකිල්ල නිසා නො වෙයි. ඊට වඩා බොහෝ ම වැදගත් කරුණක් නිසයි. මා කල්පනා කළා මෙහෙම වෙන්න හේතුව කුමක් ද කියා. පස්සේ මම ඉලූෂා ගෙන් බල කරලා දැනගත්තා.

ඉලූෂා කොහොම නමුත් පැවල් එක්ක යාළු වුණා. පැවල් ඔබේ තාත්තා ගේ වැඩකාරයා. එතකොට තාත්තා ජීවත් ව සිටියා. පැවල් ඉලූෂාට මහ මෝඩ සෙල්ලමක් උගන්නා තියෙනවා. ඒක බොහො ම නපුරු සෙල්ලමක්. පාන් කෑල්ලක් ගෙන අල්පෙනෙති කටුවක් ගසා දඩාවතේ යන බල්ලකුට දමන්න ඉගැන්නුවා. මේ බල්ලා හැම තිස්සේ ම බඩගින්නේ ඉන්න නිසා ආහාරයක් ලැබුණු වහා ම ගිලිනවා. ඉතින් ඌට මොකද වෙන්නේ කියා බලන්න පාන් කෑල්ලකට අල්පෙනෙති කටුවක් ගසා දුන්නා. උගේ නම සුචිකා. ඌ ගැන තමයි මෙ තරම් කලබලයක් කරන්නේ. සුචිකා මුළු දවස ම බුරන හොඳ මුර බල්ලෙක්. මට නම් උගේ බිරිල්ල ඉවසන්න බැහැ. උගේ අයිතිකාරයා ඌට කවදාවත් කන්න දුන්නේ නැහැ. ඉතින් සුචිකා පාන් කෑල්ල ගිලලා වේදනාවෙන් කරකැවෙමින් කෑගාන්න පටන් ගත්තා. අන්තිමේ දී ඌ කෑගාගෙන පැනල ගියා. ඊට පස්සේ අද වන තුරු ඌ දකින්න ලැබුණේ නැහැ. ඉලූෂා මේ සිද්ධිය මට සම්පූර්ණයෙන් ම විස්තර කරල අඬන්නට පටන් ගත්තා. මා බදාගෙන ඇඬුවා. අඬන කොට ඉලූෂා ගේ සරුවාංගය ම වෙවුලන්න පටන් ගත්තා. "ඌ කෑගාගෙන දිව්වා. ඌ කෑගා ගෙන දිව්වා"යි ඉලූෂා කිව්වා. බල්ලා කෑගා ගෙන දුවපු හැටි ඉලූෂා ගේ හිතේ නදින් බලපවත්වන්න ඇති. තමා කළ අපරාධය ගැන ඉලූෂා පසුතැවෙන බව මම දුක්කා. මම මේක බොහො ම බරපතල දෙයක් හැටියට පිළිගෙන කල්පනා කළා ඉලූෂාට ගුණ දහම්මුතුකම් ටිකක් දෙන්න. නමුත් මම නියම විදියට ක්‍රියා කළේ නැහැ. මම බොරුවට තරහෙන් සිටින බව හඟවා 'තුඹ කළේ බොහො ම නීච දෙයක්. තුඹ බොහො ම නරක ළමයෙක්. මම මේ ගැන කිසි ම කෙනකුට වචනයක් වත් කියන්නේ නැහැ. ඒත් ටික කාලයක් ගතවනකන් මම තුඹ ආශ්‍රය කරන්නේ නැහැ. ආශ්‍රය කළ යුතු ද? නැති නම් නරක ළමයකු හැටියට අත්හැර දැමිය යුතු ද? යන වග මම සමුරෝව් ගේ මාර්ගයෙන් දන්වන්නම්' කියා ඉලූෂාට කිව්වා. සමුරෝව් කියන්නේ දැන් මා එක්ක ආපු ළමයාටයි. ඒ ළමයා හැම දා ම මට බොහො ම අවංක ව සිටියා. මගේ මේ කතාවෙන් ඉලූෂා ගේ හිත පෑරුණා. මා පමණට වඩා දුර ගිය බව ඇත්තයි. ඒත් ඒකට කරන්න දෙයක් නැහැ. මම ඒ වෙලාවේ හැටියටයි වැඩ කළේ. ඊට පස්සේ කතා නොකරන බව දන්වා, ඊට පසු ව ද මම සමුරෝව් අත ඉලූෂාට පණිවිඩයක් යැව්වා. මිත්‍රයන් දෙදෙනකු අතර අමනාපයක් ඇති වූ විට අප එය

හඳුන්වන්නේ ‘මීට පස්සේ කතා කරන්නේ නැහැ’ කියායි. මා අදහස් කරගෙන හිටියේ, ඉලූෂා ටික දවසකට තමා කළ වරද පිළිගෙන ඒ ගැන පසුතැවුණොත් ආයේත් ඉලූෂා සමඟ යාළු වෙන්නටයි. නමුත් දන්නවද ඉලූෂා කළ දෙය? ඉලූෂාට බොහො ම කේන්ති ගියා. ‘ගිහින් කියාපන් කොල්යාට, මීට පස්සේ මම ෂූසේරම බල්ලන්ට අල්පෙනෙති කටු ගසා පාන් කන්න දෙනවය කියා’ එයා මට සමුරෝව් අත පණිවිඩයක් එව්වා. ‘එහෙනම් ඉලූෂාට කේන්ති ගිහින්. අපි ඒ කේන්තිය අරන් දමමු’ කියා මම ඉලූෂා බොහො ම පහත් කොට සැලැකුවා. හමු වුණා ම අහක බලාගත්තා. නැති නම් විහිළුවට හිනා වුණා. මතක ද ඒ දවස්වල ඉලූෂා ගේ තාත්තාට වෙච්ච දෙය? තාත්තාට වෙච්ච දෙයිත් ඉලූෂා බොහො ම කලබල වුණා. මා කිසි ම සැලැකිල්ලක් නොදක්වන බව දුටු අනෙක් ළමයි ඉලූෂාට ආයේත් කවට කම් කරන්න පටන් ගත්තා. කීප දවසක් ම ඔවුන් කෝලාහල කරගත්තා. ඒ ගැන මට බොහො ම කනගාටු හිතුණා. දවසක් ළමයි සේරම එකතුවෙලා ඉලූෂාට හොඳට ම ගහල තියෙනවා. දවසක් පාසලේ ඉඳලා එන කොට ඉලූෂා ළමයින්ට ගහන්න පනිනවා මම යාර දහයක් පමණ ඈත ඉඳලා බලා ගෙන හිටියා. මට ඒ වෙලාවේ බොහො ම ලොකු කනගාටුවක් ඇති වුණා. මා ඉලූෂා බේර-ගන්න සූදානම් වෙනවාත් එක්ක ම එයා මා දුටුවා. එ වේලේ එයාට මොනවා හිතුණ ද දන්නේ නැහැ. අතේ තිබුණ පෑන්සල් කපන පිහිය අරගෙන, මගේ ඇඟට කඩාපැනලා, කකුලේ මෙන්න මෙ තැනට පිහියෙන් ඇන්නා. මම සෙලවෙන්නේ නැති ව බලා ගෙන හිටියා. සමහර විට මා තුළ නිර්භය කම ඇති වෙනවා. ‘මා නුඹට දුක්වූ හිතවත් කමට නුඹ මට පිහියෙන් අනිනවා නම් ඇනපන්’යයි කියනවා වගේ මම ඉලූෂා දිහා බොහො ම පිළිකුලින් බලා සිටියා. එයා ආයෙත් පිහියෙන් ඇන්නේ නැහැ. භයවෙලා පිහිය වීසිකරලා අඬඅඬා දිව්වා. මම මේ ගැන පැමිණිලි කරන්න අදහස් කළේ නැහැ. අපේ ගුරුවරුන්ට ආරන්චි නො වෙන්නට මේ ගැන වචනයක්වත් කතා නොකරන ලෙස අනෙක් ළමයින්ට කිව්වා. තුවාලය සනීප වන තෙක් මම අම්මාට වත් කිව්වේ නැහැ. ලොකු තුවාලයක් නො වෙයි කකුල ටිකක් හීරුණා පමණයි. එදා ඉලූෂා ඔබේ ඇඟිල්ල හපා ගල් ගැසුවා ය කියා මට ආරංචි වුණා. පේනවා නේද ඉලූෂා කො තරම් ලොකු වේදනාවකින් සිටින්න ඇද්ද? මම මෝඩයකු වගේ කටයුතු කළා. අසනීපයට පසුවවත් මම ඉලූෂාට කමාව දෙන්න,

ඒ කියන්නේ ආයේත් යාළුවෙන්න ගියේ නැහැ. දැන් මට ඒ ගැන බොහො ම කනගාටුයි. මම නො ගියේ තවත් කාරණාවක් නිසයි. දැන් ඉතින් මම මුළු කතාව ම කිව්වා.........නමුත් මගේ කල්පනාවේ හැටියට මා කළේ මෝඩකමක්.''

''ඉලූෂා කොල්යාත් එක්ක මිත්‍ර වී සිටිය බව කලින් දැන ගැනීමට නොලැබීම කො තරම් ලොකු අවාසනාවක් ද?''යි අලෝෂා නොසන්සුන් වෙමින් කී ය. ''කලින් දැනගෙන හිටියා නම් ඔබ එක්ක ඉලූෂා බලන්න යන්න තිබුණා. උණ ගැනිලා සිහිසන් නැති ව ඉන්න කොට ඉලූෂා ඔබ ගැන නොයෙක් දේවල් කිව්වා. ඉලූෂා ඔබ එ තරම් අගය කොට සලකන බව මම දැනගෙන හිටියේ නැහැ. සුචිකා හම්බ වුණෙ නැද්ද? ඉලූෂා ගේ තාත්තයි අනෙක් ළමයිනුයි සුචිකා හොයමින් වටවුම පුරා ඇවිද්දා. 'තාත්තේ මා ලෙඩ වුණේ සුචිකා මරාපු නිසයි. මා කළ වරදට දෙයියන් වහන්සේ මට දඬුවම් කලා'යි ඉලූෂා මා ළඟ සිටිය දී තුන් පාරක් ම කිව්වා. මගේ කල්පනාවේ හැටියට සුචිකා පෙන්නුවොත්, නැතිනම් නොමළ බව ඔප්පු කළොත් ඉලූෂා බොහො ම සතුටු වී සනීප වෙන්නත් පුළුවනි. ඔබ සුචිකා සොයා ගෙන ඒවි ය කියා අපි බලාගෙන හිටියා.''

''මා සුචිකා සොයා ගෙන ඒ විය කියා බලාපොරොත්තු වුණේ මොන කරුණක් නිසා ද? සුචිකා හොයන්න පුළුවන් මට විතරක් ය කියා කල්පනා කළේ මොක ද? ඇයි වෙන කෙනෙක් ගැන බලාපොරොත්තු නො වී මා ගැන පමණක් බලාපොරොත්තු වුණේ?''යි කොල්යා සිතේ හටගත් කුතුහලින් විමසුවේ ය.

''ඔබ සුචිකා සොයනවා ය, සොයා ගත්ත වහා ම ඉලූෂා බලන්න එනවා ය කියා සාමාන්‍ය ආරංචියක් තිබුණා. සමූරෝව් ඔය විදිය කතාවක් කිව්වා. සුචිකා තාම ජීවත්ව සිටිනවා ය, කොහොම නමුත් සොයාගන්න පුළුවන් ය කියා අපි ඉලූෂාට පිළිගැන්වීමට බොහො ම වෑයම් කලා. ඉස්කෝලෙ ළමයි හොඳ ලස්සන හාවෙක් ගෙනත් පෙන්නුවා. ඉලූෂා හාවා දිහෑ බලා හිනාවෙලා ඌ නිදහස් කරලා දමන්නයි කිව්වා. ඉතින් අපි හාවාට යන්න ඇරියා. දැන් ටිකකට ඉස්සෙල්ලා ඉලූෂා ගේ තාත්තා කොහෙන් දෝ ලැබිලා හොඳ බලු පැටියෙක් ගෙනාවා ඉලූෂා ගේ සිත සතුටු කිරීමට. නමුත් සිදු වුණේ ඊට හාත් පසින් ම වෙනස් දෙයක්......''

"ඉලූෂා ගේ තාත්තා ගැන අදහස කොහොම ද? මම මිනිහ අඳුනනවා. නමුත් ඔබේ අදහසේ හැටියට මිනිහා කොහොලමෙක් ද? නැතිනම් බම්මත්තෙක් ද?"

'නැහැ, නැහැ ඉලූෂා ගේ තාත්තා එහෙම කෙනෙක් නො වෙයි. බොහො ම දුක් විඳපු, ගැඹුරු හැඟීම් ඇති අය ඉන්නවා. මේ අය අවුරුදු ගණනක් නිත්‍ය අපහාස විඳල තියෙනවා. ඉතින් තමන්ට නිත්‍ය අපහාස කළ අයට ඇත්ත කියන්න බැරි නිසා ඔවුන්ට විරුද්ධ ව සිතේ පවතින කෝපය හා පිළිකුලත් හෙළි කිරීමට කෝලම් නැටීම මාර්ගයක් කර ගන්නවා. මේ වැනි කෝලම් නැටීම බොහො ම කනගාටුදායක දෙයක්. ලෝකයේ තියෙන හැම වස්තුවකට ම වඩා ඔහුට ඉලූෂා ලොකුයි. ඉලූෂා මලොත් මිනිහා කනගාටුවෙන් මැරෙන්න පුළුවනි. නැතිනම් ජීවිතය නැති කර ගන්න පුළුවනි. මිනිහ ගේ දිහා බැලුවොත් ඒක ස්ථිර ව ම කියන්න පුළුවනි.

"ඔව්, අලෝෂා කියන දෙය දැන් මට තේරෙනවා"යි කොල්යා අවදි වූ හැඟීම් ඇති ව කී ය. මනුෂ්‍ය ස්වභාවය ගැන අලෝෂාට හොඳ අවබෝධයක් තියෙන බව මට පෙනෙනවා."

"බල්ලෙක් එක්ක එන කොට මම හිතුවා ශුචිකා එක්ක එනවයි කියා."

"ටිකක් ඉන්න. සමහර විට අපට ශුචිකා සොයා ගන්න බැරි වෙන එකක් නැහැ. මේ ඉන්නේ පෙරුශුවාන්. මම පෙරුශුවාන් එක්ක ඉලූෂා බලන්න යනවා. සමහර විට ඉලූෂා බලූපැටියාට වඩා මේ බල්ලාට කැමැති වෙන්න පුළුවනි. ටිකක් ඉන්න. තව ටිකකින් වැදගත් දෙයක් දැනගන්න ලැබේවි. ඒත් මා මොනවට ද අලෝෂා නතර කර ගත්තේ?"යි කොල්යා හදිසියෙන් ම කී ය. "ඔබ මේ සීතලේ ඇඳගෙන ඉන්නේ සම්සැට්ටයක් පමණයි. නමුත් සීතලය ගැන කල්පනා නො කර මම ඔබ කතාවට අල්ල ගත්තා. ජේනවා තේද මා කො තරම් ආත්මාර්ථකාමියෙක් ද කියා! ඔව් අලෝෂා, අපි ඔක්කොම ආත්මාර්ථකාමීන්."

"ඒ ගැන කරදර වෙන්න එපා. සීතල බව නම් ඇත්තයි. ඒත් මට ලෙහෙසියෙන් සීතලය දැනෙන්නේ නැහැ. අපි ගෙය ඇතුළට යමු. ඒක නො වෙයි ඔබේ සම්පූර්ණ නම කොහොම ද? මම දන්නේ කොල්යා කියන බව පමණයි."

"නිකොලායි කරාමසොව්කින්. නමුත් මම නිකොලායි කියන නමට කොහෙත් ම කැමැති නැහැ"යි කොල්යා හිටි හැටියේ ම සිනාසී කී ය.

"මොකද කැමැති නැත්තේ?"

"එ තරම් වැදගත් නමක් නො වෙයි. හැමෝට ම කියන නමක්."

"වයස පහළොවයි නේද?"

"නැහැ දහතරයි. සුමාන දෙකකින් දහතර සම්පූර්ණ වෙනවා. මගේ එක දුර්වලකමක් පමණක් කියන්න ඕනෑ. අප පළමු වරට හමු වූ නිසා ඔබ මගේ ගතිගුණ දැනගන්න ඕනෑ. මගේ වයස අහනවට මම කැමැති නැහැ.......... එපමණක් නො වෙයි, මට අපහාස ගෙන දෙන කතාවක් පැතිර යනවා. මා ගිය සතියේ ප්‍රාථමික පන්තියේ ළමයි එක්ක 'හොරා-පොලිස්' සෙල්ලම් කළා ලු. සෙල්ලම් කළ බව ඇත්තයි. ඒත් මගේ උවමනාවට, මගේ සතුටට, සෙල්ලම් කළා ය කියන කතාව මට නින්දාවක්. සමහර විට අලෝෂාටත් මේ කතාව අහන්න ලැබෙන්න ඇති මම සෙල්ලම් කළේ මගේ සතුටට නො වෙයි, ඒ ළමයින් විනෝද කිරීමටයි. ඒ ළමයින් දන්නේ මේ සෙල්ලම විතරයි. මේ පලාතේ මිනිස්සු මහ මෝඩ කතා කියනවා. උන්ට පුළුවන් අනුන් ගේ ඕපා දූප දොඩන්න විතරයි."

"විනෝදය පිණිස සෙල්ලම් කළත් ඇති වරද කුමක් ද?"

"වරදක් තියෙනවා. ඔබ අශ්වයකු වගේ සෙල්ලම් කරන්නේ නැහැ නේ ද?"

"අපි මේ විදියට කල්පනා කරමු"යි අලෝෂා සිනා සෙමින් කී ය. "නොයෙක් විදියේ වීරයන් ගැන කතා ඇතුළත් නාට්‍ය බැලීමට වැඩිහිටියන් නාට්‍ය ශාලාවලට යනවා. සමහර විට ඒ නාට්‍යවල හොරු ඉන්නවා. කෝලාහල තියෙනවා. ඒකත් අර විදියේ දෙයක් නේද? පොඩි ළමයින් පොලිස්කාරයන් හා හොරුන් වගේ කරන සෙල්ලම නාට්‍යයේ මුල් අවස්ථාවක්. ළදරු සිතේ කලාවට ඇති ආශාව අවදි කිරීමක්. එක් අතකින් බලන කොට නාට්‍ය ශාලාවල රඟ දක්වන නාට්‍යවලට වඩා

දරුවන් ගේ මේ කෙළිසෙල්ලම් හොඳයි, තියෙන වෙනස, මිනිස්සු තළු නිළියන් බැලීමට නාට්‍ය ශාලාවලට යනවා. ඒත් ළමයින් ගේ සෙල්ලම්වල නියම නළුවන් ළමයිනුයි.''

''ඔබ කල්පනා කරන්නේ එහෙම ද?''යි කොල්යා මහත් ඕනෑ කමින් අලෝෂා දෙස බලා ඇසී ය. ''ඒ අදහස බොහො ම වැදගත්. ගෙදර ගියාට පස්සේ ඔය ගැන ටිකක් කල්පනා කරලා බලන්නම්. ඔබෙන් හැම තිස්සේ ම අලුත් දෙයක් ඉගෙන ගන්න පුළුවනි. මම ආවේ ඔබෙන් ඉගෙන ගැනීමටයි'' කොල්යා කතාව අවසන් කරමින් කීවේ අවදි වූ හැඟීම්වලින් යුතු ව ය.

''මටත් කොල්යාගෙන් ඉගෙන ගතහැකි බොහො ම දේවල් තියෙනවා''යි අලෝෂා සිනා සෙමින් කීවේ කොල්යා ගේ අත ගෙන මිරිකමිනි.

කොල්යා අලෝෂා ගැන බොහෝ පැහැදිණි. ඔහු පැහැදුණේ අලෝෂා, තමා සම තත්ත්වයේ ලා සලකා, නුවණින් වැඩුණකුට කතා කරන්නාක් මෙන් කතා කළ හෙයිනි.

''අලෝෂා, දැන් මම පොඩි සෙල්ලමක් කරල පෙන්නන්නම්. ඒක නාට්‍යයක් වගෙයි. ඒකටයි මම ආවේ''යි කොල්යා සිනා සෙමින් කී ය.

''අපි ඉස්සෙල්ලා වම් පැත්තේ තියෙන, හෙවල් අයිතිකාරිය ගේ කාමරයට යමු. ඒ කාමරය පොඩියි. රස්නෙයි. ළමයි කබා ගලවා තියන්නේ ඒ කාමරයේයි.''

''මම වැඩි වෙලාවක් ඉන්නේ නැහැ. කබාය පිටින් ම ඉන්නම්. පෙරුස්වාන් මලා වගේ ඉස්තෝප්පුවේ බිම වැටී සිටී වි............පෙරුස්වාන් මළා වගේ බිම වැටී හිටපන්. ....ජේනවා නේද, ඌ දැන් හරියට මළා වගෙයි. ඉස්සෙල්ලා ගෙය ඇතුළට ගිහින් ටිකක් සොයා බලා, නියම වෙලාවට පෙරුස්වාන්ට කතා කරන්නම්. එතකොට ඌ පිස්සා වගේ දුව ගෙන එන හැටි බලා ගන්න පුළුවනි. ඒත් හරියට ඒ වෙලාවට සමුරෝව් පෙරුස්වාන්ට එන්න දොර ඇරල තියන්න ඕනෑ. මම වැඩේ හරියට කරන්නම්. එතකොට ඔබට හොඳ සෙල්ලමක් බලාගන්න පුළුවනි.''

පස් වන පරිච්ඡේදය

ඉලූෂා ගේ ඇඳ ළඟ

විශ්‍රාම්ලත් කපිතාන් සෙනිග්‍රියෝෆ් දරු පවුලත් සමඟ වාසය කරන කාමරය පාඨකයාට දැනට ම සුපුරුදු තැනකි. මේ මොහොතේ දී කාමරය අමුත්තන් කීප දෙනකුගෙන් පිරී තිබිණි. එ දින ළමයි කීප දෙනෙක් ඉලූෂා ගේ ලෙඩ බැලීමට පැමිණියහ. තමන් මෙහි පැමිණ ඉලූෂා සමඟ මිත්‍ර වූයේ අලෝෂා ගේ ඉල්ලීම නිසා යයි සමුරෝව් ඇතුළු අනෙක් ළමයි හැම දෙනා ම නො පිළිගත්තාහු ය. එහෙත් ඇත්ත වශයෙන් ඔවුන් එහි පැමිණියේ අලෝෂා ගේ ඉල්ලීම නිසා ය. කලින් සිතා මතාගත් පිළිවෙලක් අනුව හෝ, සිතේ හටගත් දයා කරුණාවකින් හෝ නො ව, අහම්බෙන් පැමිණියාක් මෙන් එක් එක් ශිෂ්‍යයා බැගින් ඉලූෂා ළඟට යවා යළි යහළු කර-වීමට අලෝෂා රහසින් දන්නා හැම උපායක් ම යෙදුවේ ය. රෝගාතුර ව සිටින ඉලූෂාට පාසල් මිත්‍රයන් ගේ පැමිණීම මහත් සැනැසීමකි. වරක් තමාට සතුරුකම් කළ ශිෂ්‍යයන් දූන් දක්වන ආදරය හා කරුණාව ඉලූෂා ගේ ප්‍රීතියට හේතු විය. නොපැමිණියේ කොල්යා පමණි. ඔහු ගේ නොපැමිණීම ඉලූෂා ගේ සිතට දුකකි. ඔහු ගේ සිතට වද දුන් වේදනා අතරින් දරුණු ම වේදනාව ඇති වූයේ, තමා ගේ මිත්‍රයා හා ආරක්ෂකයා වන කොල්යා ගේ කකුලට පිහියෙන් ඇනීම ය. ඉලූෂා සමඟ පළමුවෙන් ම මිත්‍ර වූ ඥානවන්ත ළමයකු වන කුඩා සමුරෝව් ද ඒ අදහස පිළිගත්තේ ය. එහෙත් කිසියම් කරුණක් නිසා කොල්යා හමුවීමට අලෝෂාට උවමනා කර තිබෙන බව සමුරෝව් කී විට කොල්යා වහා ම හරය් වෙමින් කළ යුතු දෙය තමා දන්නා බවත්, කාගෙන්වත් අවවාද අනුශාසනා උවමනා නැති බවත්, ඉලූෂා ගේ ලෙඩ බැලීමට උවමනාවක් තිබේ නම් එහි යාමට සුදුසු වේලාව තෝරා ගැනීමට තමා දන්නා බවත්, ඊට හේතුවක් තිබෙන බවත් කී ය.

කොල්යා මේ කතාව කීවේ මේ ඉරිදාට දෙසතියකට පෙර ය. කලින් අදහස් කරගත් පරිදි අලෝෂා, කොල්යා හමුවීමට නො ගියේ මේ කතාව නිසා ය. එහෙත් ඔහු දෙ වරක් ම

කොල්යා හමුවීම පිණිස සමුරෝව් යැව්වේ ය. ඒ දෙවර ම කොල්යා ඉලූෂා බැලීම ප්‍රතික්ෂෙප කෙළේ ය. තමාට කරදර නො කරන ලෙස ඒ දෙවර ම කොල්යා, අලෝෂාට දන්වා යැව්වේ ය. අන්තිම දවස වන තෙක්, එ දින උදේ කොල්යා ඉලූෂා ගේ ලෙඩ බැලීමට යන බව සමුරෝව් නො දත්තේ ය. පෙර දින සවස සමුරෝව් ගෙන් වෙන් වී යන අතරේ කොල්යා හදිසියෙන් ම සමුරෝව්ට කතා කොට, තමා හෙට උදේ ඉලූෂා ගේ ලෙඩ බැලීමට යන නිසා, තමා පැමිණෙන තෙක් සිටින ලෙස කී ය. එහෙත් ඒ ගමන අහම්බෙන් පැමිණි ගමනක් බව හැඟවීමට අදහස් කරන හෙයින් තමා ගේ ගමන ගැන කිසිවකුට, කිසි ම කරුණක් නිසා හෝ නොකියන ලෙස කොල්යා වැඩි දුරටත් කී ය. සමුරොව්, කොල්යා ගේ බසට අවනත විය. "බල්ලා ජීවත් ව ඉන්නවා නම් උඹව හොයාගන්න බැරි මේ මිනිස්සු බූරුවන් වෙන්න ඕනෑ"යි කොල්යා කී හෙයින්, ඔහු සුව්කා ගෙන එන්නේ යැයි සමුරෝව් අදහස් කෙළේ ය. සුදුසු වේලාවක් පැමිණෙන තෙක් බලා සිටි සමුරෝව් මහත් බයාදු කමක් දක්වා බල්ලා පිළිබඳ සිය අදහස් කී විට කොල්යා කෝප විය. "මට බල්ලෙක් සිටිය දී අනෙක් අය ගේ බල්ලන් සොයමින් මුළු වටුම පුරා යාමට තරම් මා මෝඩයෙක් නො වෙයි. අල්පෙනෙති කටුවක් ගිලපු බල්ලෙක් කොහොම ද ජීවත් වෙන්නේ?"යි ඔහු සමුරෝව්ට කෝපයෙන් කිවේ ය.

කාමරයේ මූල්ලේ සුරුවම යට තබා ඇති කුඩා සයනයෙන්, පුරා සති දෙකක් ම ඉලූෂා බිමට නො බැස සිටියේ ය. මඟ දී හමු වී අලෝෂා ගේ ඇඟිල්ල හැපුව දට පසු ව ඉලූෂා පාසලට නො ගියේ ය. එ දින ඔහුට උණ ගැනිණි. උණ ගැනුණ ද සිට මසක් ගත වන තුරු ඇඳෙන් බැස කාමරය තුල ඇවිදීමට ඉලූෂාට පුළුවන් කම තිබිණි. මෑතක සිට ඔහු කො තරම් දුර්වල වූයේ ද කියතොත් තාත්තා ගේ උපකාරය නැති ව ඔහුට ඇඳෙන් බැස ඇවිදින්නට නුපුළුවන් විය. ඉලූෂා ගේ අසනීපය ඔහු ගේ පියාට මහත් දුකක් විය. මත්පැන් බීම ද අත් හැර දැමූ හෙතෙම පුතා මියයා ය යන බියෙන් උමතු වන තරමට තැති ගත්තේ ය. ඉලූෂා අතින් අල්ලාගෙන කාමරය වටේ ගෙන ගොස් නැවත ඇඳ උඩ තබන හෙතෙම, වහා කාමරයෙන් පිටත දිවගොස්, හිස බිත්තියට ගසාගෙන, සිතේ හටගත් දරුණු වේදනාවෙන් අඬයි ඔහු ඇඬීම සඟවා ගත්තේ පුතාට ඇසේ ය යන බියෙනි.

අනතුරු ව කාමරයට පැමිණෙන හෙතෙම දරුවා විනෝද කිරීම පිණිස කිසියම් දෙයක් කරයි. ඔහු කතන්දර කියයි. සිනා උපදවන පුවත් කියයි. ඔහුට හමු වූ හාස්‍යජනක මිනිසුන් අනුකරණය කොට පෙන්නයි. සතුන් මෙන් හඬ නගා කෑගායි. තාත්තා කෝලමකු මෙන් හැසිරෙනවා දකීමට ඉලූෂා කැමැති නො වී ය. ඒ නොකැමැත්ත සඟවා ගැනීමට වෑයම් කළ දරුවා, සිය පියා අනුන් ගේ පිළිකුලට බඳුන් වූ බවත්, පියාට තැළුව ඒ අවාසනාවන්ත දවස ගැනත්, ශෝකයෙන් තැකියන හදවතින් සිහි කෙළේ ය.

ඉලූෂා ගේ කොර වූ කරුණාවන්ත නැඟණිය, පියා කෝලම් නටනවා දකීමට කැමැති නොවූවා ය. (වවාරා ඉගැනීම් පිණිස චික කලකට පෙර පීටර්ස්බර්ග් පුරයේ සරසවියට ගියා ය.) ඒ නමුත් සැමියා කෝලම් නටන සැටි දුටු ඔහු ගේ අඩක් මන්ද බුද්ධික බිරිය ප්‍රීතියෙන් සිනාසුණා ය. ඇය විනෝද කළ හැකි එක ම ක්‍රමය මෙයයි. අනෙක් වේලාවල දී, තමා හැම දෙනාට ම අමතක වී ඇති බවත්, තමා නො සලකා හැර දමන ලද බවත්, අනෙක් අය තමාට හිරිහැර කරන බවත්, කියමින් ඈ මැසිවිලි කීවා ය. එහෙත් පසු ගිය දින සවල්පය තුළ දී ඇගේ ගති ගුණ සම්පූර්ණයෙන් ම වෙනස් විය. කාමරයේ මුල්ලේ තබා ඇති ඉලූෂා ගේ ඇඳ දෙස බලා සිටින ඈ නිතර කල්පනා කරන බව පෙනේ. ඈ තුෂ්ණීම්භූත වූවා ය. ඈ අඬනවා නම් ඇඹුවේ කිසිවකුට නො ඇසෙන්නට ය. බිරිය තුළ ඇති වූ වෙනස දුක සැමියා පුදුම විය. මුල දී පාසල් ශිෂ්‍යයන් ගේ පැමිණීම ගැන ඈ කෝප වූවා ය. එහෙත් පසු ව ඔවුන් ගේ කෑගැමත්, ඔවුන් කී නොයෙක් කතන්දරත් අසා විනෝද වූවා ය. අන්තිමේ දී ඈ ළමයින්ට කො තරම් ලොකු කැමැත්තක් දක්වූයේ ද කියතොත්, ඔවුන් නො පැමිණ සිටියා නම් ඇය තුළ සාංකාවක් ඇති වෙයි. ළමයින් කතාන්තරයක් කී විට හෝ සෙල්ලමක් කළ විට හෝ ඈ අත්පොලසන් දෙමින් සිනාසුණා ය. සමහරක් ළමයින් ළඟට කැඳවා සිඹිා ය. ඈ වැඩි කැමැත්තක් දක්වූයේ සමූරෝව්ට ය.

ඉලූෂා ගේ සිත සැනැසීමට පැමිණි ළමයින් නිසා කපිතන් ගේ හදවත ප්‍රීතියෙන් පිරී ගියේ ය. ඉලූෂා ගේ සිතෝ පවතින ශෝකය තුනී වී රෝගය සුවවේ යැයි ඔහු උදක් ම බලාපොරොත්තු විය. පුතා ගේ රෝගය ගැන බිය වූවත්, අන්තිමේ දී කෙසේ හෝ සුවය ලැබෙන බවට ඔහු තුළ කිසි ම සැකයක් නො පැවැතිණි.

කුඩා අමුත්තන් ආදරයෙන් පිළිගත් කපිතන් ඔවුන් පසු පසින් ගියේ ය. ආදරයෙන් සංග්‍රහ කෙළේ ය. අශ්වයකු මෙන් හතර ගාතයෙන් ගියේ ය. තමා ගේ පිට උඩ නැග යාමට පවා අමුත්තන්ට ඉඩ දුන්නේ ය. එහෙත් ඔහු ඒ සෙල්ලම අත්හැර දැම්මේ ඉලූෂා නොකැමැති වූ නිසා ය. ඔහු ඉගුරු විස්කෝතු හා කොට්ටන් ආදී කුඩා දේවල් මිල දී ගෙනැවිත් දුන්නේ ය. සැත්විච් සමග තේ පැන් පිළියෙළ කර දුන්නේ ය. මේ කාලයේ දී ඔහු ළඟ මුදල් තිබුණු බව අමතක නොකළ යුතු ය. කැතිරිනා විසින් අලෝෂා අත එවන ලද රූබල් දෙ දහ කපිතන් බාර ගත්තේ ය. අනතුරු ව ඔවුන් ගේ දිළිඳුකම හා ඉලූෂා ගේ අසනීපය ගැන ඇසූ කැතිරිනා නිතර ඔවුන් බැලීමට ද ගියා ය. පවුලේ ඇත්තන් සමග මිත්‍ර වූවා ය. කපිතන් ගේ බිරිය විනෝද කිරීමට වෑයම් කළා ය. එතැන් සිට කැතිරිනා අතමිට දිගහැර ඔවුන්ට උපකාර කළා ය. පුතා මියයා ය යන බියෙන් තැති ගත් කපිතන් තමා ගේ ආත්ම ගරුත්වය අමතක කොට කැතිරිනා ගේ උපකාරය පිළිගත්තේ ය.

කැතිරිනා විසින් කැඳවන ලද දොස්තර මුළු කාලය තුළ ම, දෙ දවසකට වරක් ඉලූෂා බැලීමට ගියේ ය. ඔහු කළ වෙදකමින් වැඩි ප්‍රයෝජනයක් නො වී ය. ඔහු ඒ කුඩා දරුවාට කිසි ම අනුකම්පාවක් නැති ව නොයෙක් බෙහෙත් දී මත් කෙළේ ය. එහෙත් ඉරිදා උදේ මොස්කව් නුවර වෙසෙන සුප්‍රසිද්ධ දොස්තර කෙනකු ගේ පැමිණීම කවුරුත් බලාපොරොත්තු වූ හ. කැතිරිනා විශාල මුදලක් ගෙවා මොස්කව් නුවර සිට මේ දොස්තර කැඳෙව්වා ය. ඈ එසේ කළේ ඉලූෂා නිසා ම නො ව, තවත් හේතුවක්ඇති ව ය. ඒ ගැන සම්පූර්ණ විස්තරයක් සුදුසු තැන කියමි. දොස්තර පැමිණි පසු ඉලූෂා පිරික්සා බලන ලෙස කැතිරිනා දොස්තර ගෙන් ඉල්ලා සිටියා ය. අනතුරු ව ඈ, ඉතා දක්ෂ දොස්තර කෙනකු ඉලූෂා බැලීමට පැමිණෙන බව දන්වා ඉලූෂා ගේ තාත්තාට පණිවිඩයක් යැව්වා ය. පුතා ගේ සිත් නැවුලට හේතු වූ ශිෂ්‍යයා ගේ පැමිණීම කපිතන් උදක් ම බලාපොරොත්තු විය. එහෙත් එ දින උදේ ඒ ශිෂ්‍යයා නොහොත් කොල්යා එන බව ඔහු නොදත්තේ ය.

කොල්යා කාමරයේ දොර ඇර ගෙන පිවිසෙන විට, කපිතන් ඇතුළු අනෙක් ලමයි, ඉලූෂා ගේ ඇඳ වට කර ගෙන කුඩා බලු පැටවකු දෙස බලා සිටිය හ. මේ බලු පැටවාට දෙ දිනකට වඩා වයස නැති වුවත්, යුවිකා මළ ශෝකයෙන් පසුවන කුඩා

පුතා සැනැසීම පිණිස, කපිතන් බලු පැටවා සතියකට පෙර ගෙනෙන බව කීවේ ය. තමාට ඉතා හොඳ වර්ගයේ බලු පැටවකු ලැබෙන බව ඉලූෂා තෙ දිනකට කලින් දැන ගත්තේ ය. (මෙය ඉතා වැදගත් කරුණකි.) තමා ඒ ගැන සතුටින් සිටින බව හැඟෙව්වේ පියා සතුටු කිරීම පිණිස ය. මේ බලු පැටවා නිසා ඉලූෂාට තමා විසින් මරන ලද අසරණ ෂුච්කා සිහි වන බව ඔහු ගේ පියාටත් මිත්‍රයන්ටත් පෙනී ගියේ ය. ඉලූෂා ශෝකයෙන් සිනාසී සිහින් සිදුමැලි අතින් ළඟ සිටි, යන්තම් සෙලවිය හැකි බලු පැටවා අතගෑවේ ය. ඔහු බලු පැටවාට කැමැති බව පැහැදිලි විය......එහෙත් මේ බලු පැටවා ෂුච්කා නො වේ. ඔහුට බලු පැටවා සමඟ ෂුච්කා ද ලැබෙන්නේ නම් ඔහු ගේ ප්‍රීතිය සම්පූර්ණ වෙයි.

"කොල්යා" කියා එහි සිටි ළමයෙක් හදිසියෙන් ම කෑගා කී ය. කොල්යා කාමරයට ඇතුළුවනවා පළමු ව දුටුවේ ඒ ළමයා ය.

කොල්යා ගේ කලබලය නිසා කාමරය තුළ මඳ නොසන්සුන් කමක් ඇති විය. ළමයින් ඈඳ ළඟින් ඇත් වූයේ කොල්යාට, ඉලූෂා හොඳට දැක ගැනීමට හැකි වන ලෙසට ය. කපිතන් වහා කොල්යා ළඟට ගියේ ය.

"එන්න ඇතුළට.........මහත්මයා ගේ පැමිණීම ගැන අපි බොහො ම සන්තෝෂයි.........පුතා, කොල්යා කාරාතොට්කින් මහත්මයා උඹව බලන්න ඇවිදින් ඉන්නවා"යි කපිතන් වහා කී ය.

වහා කපිතන්ට අතට අත දී ආචාර කළ කොල්යා තමා ශිෂ්ට සමාජ චාරිත්‍ර දන්නා බව හැඟෙව්වේ ය. ඔහු පළමු ව ඉලූෂා ගේ මව දෙස බැලුවේ ය. ඇගේ අත් ඇඳි පුටුවේ හිඳ සිටි ඈ, ළමයින් වට වී සිටින නිසා, බලු පැටවා දැක ගත නොහැකි බව කියමින් කෙඳිරිගෑවා ය. ඇයට ඉතා ආදරයෙන් හිස නමා ආචාර කළ කොල්යා, අනතුරු ව නීනා දෙසට හැරී, කුලකතකට ආචාර කරන්නාක් මෙන් ඇයට ආචාර කෙළේ ය. කොල්යා ගේ මේ කාරුණික හැසිරීම නිසා අඩක් සිහි විකල ව සිටි ගෘහිණිය තුළ සතුටුදායක හැඟීම ඇති විය.

"ජෙනවා තේද බොහො ම හොඳට හැදිච්ච ළමයෙක් බව"යි ඈ දැන උස්සා කීවා ය. "ඒත් අනෙක් ළමයි වගේ එකා පිට එකා එන්නේ නැහැ."

"මොකක් ද අම්මේ එකා පිට එකා එනවය කියන කතාවේ තේරුම?"යි කපිතන්, බිරිය ගෙන් ආදරයෙන් ඇසුවේ ය.

"එහෙම තමයි මේ ළමයි එන්නේ. අර ඉස්තෝප්පුවේ ඉඳලා එකා පිට එකා නැගගෙන, වැදගත් පවුලක් ඉන්න මේ තැනට කඩා පනිනවා. මහ පුදුම ළමයි ජාතියක්."

"කවුද ඒ විදියට ආවේ?"

"ඇයි, අර ළමයා ආවේ අර ඉන්න ළමය ගේ පිට උඩ නැගලයි. මේ ළමය ආවේ අනෙක් ළමය ගේ පිට උඩ නැගලයි."

කොල්යා ඉලූෂා ගේ ඇඳ ළඟට ගියේ ය. රෝගයෙන් පෙළෙන ඉලූෂා බලා සිටිය දී සුදුමැලි විය. ඔහු මඳක් ඉස්සී කොල්යා දෙස සැලැකිල්ලෙන් බැලුවේ ය. කොල්යා දෙමසකින් මේ කුඩා මිත්‍රයා දැක නැත. ඔහු ඉලූෂා දැක පුදුම විය. මෙ තරම් සුදුමැලි වූ මුහුණක්, උණ නිසා රතු වූ විශාල නෙත් දෙකක් හා සිහින් වූ අත්පා දකිමට ලැබේ යැයි කොල්යා බලාපොරොත්තු නො වී ය. ඔහු ඉලූෂා ළඟට ගොස් අත දී නොසන්සුන් කමින් යුතු ව "කොහොම ද යාළුවා?" කියා ඇසී ය. එහෙත් ඔහුට ඊට වඩා කතා කරගත නො හැකි විය. නොසන්සුන් වූ සිත මැඩ ගත නො හැකි විය. මුහුණේ මස් පිඩු ගැහෙන්නට විය. කට කෙලවර වෙවුලුවේ ය. ඉලූෂා, කොල්යා දෙස බලා අනුකම්පාවෙන් සිනාසුණේ ය. තවමත් කතා කරගත නො හැකි ව සිටි කොල්යා කිසියම් කරුණක් නිසා අත උස්සා ඉතා සෙමෙන් ඉලූෂා ගේ හිස අත ගෑවේ ය.

"ඒකට කමක් නැහැ"යි ඔහු ඉලූෂා ගේ සිත සනසා සෙමෙන් කීවේ වෙන කුමක් කිව යුතු දැයි නොදත් හෙයිනි. අනතුරු ව මිනිත්තු ස්වල්පයක් ගතවනතුරු ඔවුහු නිහඬ වූහ.

"එහෙනම් ඉලූෂාට බලු පැටියෙක් ලැබුණා ද?"යි කොල්යා හදිසියෙන් ම රළු හඬින් කී ය.

"ඔ.........ව්"යි ඉලූෂා රහසක් කියන්නාක් මෙන් සෙමෙන් කීවේ අමාරුවෙන් හුස්ම ගනිමිනි.

"නගය කළු නිසා බොහො ම කපුරු බල්ලෙක් වේවි"යි කොල්යා සෙමෙන් කීවේ ඔහු ගේ සැලැකිල්ල බලු පැටවා හා

ඌගේ හාභයටත් පමණක් සීමා වූවාක් මෙනි. ඔහු තවමත් වෑයම් කරන්නේ කුඩා ලමයකු මෙන් නො අඬා සිටීමටත්, සිය හැඟීම් මැඩ ගැනීමටත් ය. කො තරම් වෑයම් කළත් ඔහුට හැඟීම් මැඩ ගත නො හැකි විය. "බලු පැටියා ලොකු වුණායින් පස්සේ හොඳ දම්වැලකින් බැඳලා තියන්න වෙනවා."

"ඌ විශාල බල්ලෙක් වෙනවා"යි ළමයෙක් කී ය.

"ඌ හොඳ ඉතාලි බල්ලෙක්. වසු පැටියෙක් තරම් ලොකු වේවි"යි ළමයි කිප දෙනෙක් ම කීහ.

"ඔව්, වසු පැටියෙක් තරම් ලොකු වේවි"යි කපිතත් ද හඬ නගා කී ය. "මම ඔනෑ කමින්මයි ඔය බලු පැටියා ගෙනාවේ. බොහො ම සැර ජාතියේ බල්ලෙක්. ඌගේ අම්මයි තාත්තයි බොහො ම නපුරුයි.......... මෙච්චර විතර උසයි...... ඉලූෂා ගේ ඇඳ උඩින් ඉඳගන්න. නැති නම් මේ බන්කුව උඩින් ඉඳගන්න..........අපි මහත්මයා ඒවිය කියා බොහො ම කාලයක ඉඳලා බලාපොරොත්තු ව සිටියා. මහත්මයා ආවේ කරමසෝ මහත්මයා එක්ක ද?"

කොල්යා, ඉලූෂා ගේ දෙපා ලඟින් ඇඳ උඩ ඉඳගත්තෝ ය. මෙ තැන දී කතා කළ යුතු දෙය, කතා කළ යුතු හැටි ගැන කලින් හිතා මතා ගෙන පැමිණියත් දැන් ඔහුට එහි අග මුල වත් සොයා ගත නො හැකි ය.

"නැහැ.........මං ආවේ පෙරුසුවාත් එක්කයි. දැන් මා ළඟ ඉන්නවා පෙරුසුවාත් කියා බල්ලෙක්. ඌ එළියේ ඉන්නවා...... මා හුරුලත් බාපු හැටියේ ම ඌ දුවගෙන ඒ වි. මාත් බල්ලෙක් ගෙනාවා. ඉලූෂාට මතක ද සුචිකා?"යි කොල්යා හදිසියෙන් ම ඇසුවේ ය.

ඉලූෂා ගේ මුහුණ වෙවුලුවේ ය. ඔහු කොල්යා දෙස බැලුවේ දරුණු ශෝකයකින් යුතු ව ය. දොර ලඟ සිටි ආලෝෂා, සුචිකා ගැන කිසිවක් නොකියන ලෙස කොල්යා දෙස රවා බලා ඉඟියක් කෙළේ ය. එහෙත් කොල්යාට ඒ ඉඟිය නොපෙනුණේ ද? නැති නම් නො සලකා හැරියේ ද?

"කෝ සුචිකා?"යි ඉලූෂා බිඳුණු ස්වරයෙන් ඇසුවේ ය.

"සුචිකා නැති වෙලා."

ඉලූෂා කතා නොකෙළේ ය. ඔහු නැවත වරක් කොල්යා දෙස නෙත් දල්වා බැලූවේ ය. සුව්කා ගැන මතක් නොකරන ලෙස ඇලෝෂා ආයෙත් කොල්යාට සංඥාවක් කෙළේ ය. කොල්යා අහක බාලාගත්තේ ය.

“ඌ කොහාට නමුත් ගිහින් මැරෙන්න ඇති. පාත් කාලා මැරෙන්න ඇති”යි කොල්යා කිසි ම තෙතක් මෙතක් නැති ව කී ය කිසියම් කරුණක් නිසා කොල්යා හති දමන්නට විය. “නමුත් මගෙ ළඟ ඉන්නවා හොඳ බල්ලෙක්..... ඉලූෂාට පෙන්නන්න ගෙනාවා.”

“මට එපා”යි ඉලූෂා හදිසියෙන් ම කී ය.

“නැහැ නැහැ. ඌ කොහොම හරි බලන්න ඕනෑ........ ඌ බලා සතුටු වුණ හැකියි. මම ඌ ගෙනාවේ ඉලූෂාට පෙන්නන්නයි. ඌත් සුව්කා වගේ ම දිග මයිල් තියෙන බල්ලෙක්......... නෝනමහත්මයා, බල්ලාට ගෙට කතා කරන්න ඉඩ දෙනවා ද?”යි කොල්යා හදිසියෙන් ම ඉලූෂා ගේ මව දෙසට හැරෙමින් විමසුවේ ය.

“මට එපා, මට එපා”යි ඉලූෂා ශෝකයෙන් බිඳුණු ස්වරයෙන් කී ය. ඔහු ගේ දෑසේ තිත්දුව හඟවන පෙනුමක් දකින්නට තිබිණි.

“වෙන වෙලාවක පුළුවනි”යි මෙතෙක් වේලා බිත්තිය අසිනේ පෙට්ටියක් උඩ හිඳ සිටි කපිතන් නැගිටිමින් කී ය. එහෙත් කොල්යා ගණන් කළ නොහැකි ය. “ඉක්මනට දොර අරින්න”යි ඔහු වහා ස්මුරොව්ට කෑගා කී ය. දොර ඇරිය වහා ම කොල්යා හුරුලත් බෑවේ ය. පෙරැස්වාන් කාමරයට කඩා වැදුණේ ය.

“උඩ පැනලා හිඟාකන හැටි පෙන්නපන්”යයි කොල්යා කෑගා කී වහා ම පෙරැස්වාන් උඩ පැන පසු ගාත් දෙකින් කෙලින් සිට, ඉලූෂා ගේ ඇඳ ළඟ සිටගත්තේ ය. ඒ මොහොතේ කිසිවකු බලාපොරොත්තු නොවූ දෙයක් සිදුවිය. ඉලූෂා වහා ඉදිරියට නැමී පුදුමයෙන් ගොළු වූවකු මෙන් පෙරැස්වාන් දෙස බැලුවේ ය. “මේ ඉන්නේ සුව්කා”යි ඔහු ප්‍රීතියෙන් හා වේදනාවෙන් ද බිඳුණු කට හඬින් කී ය.

“එහෙනම් ඉලූෂා හිතුවේ මොකෙක් කියල ද?”යි දෝංකාරය නගන තරමට ප්‍රීතියෙන් කෑගා ඇසූ කොල්යා බල්ලා උස්සා ඉලූෂා ළඟින් තැබුවේ ය.

"පේනවා තේද එක ඇහැක් කණවෙලා, වම් කන ඉරිලා, ඉලූෂා කියාපු ලකුණු මයි. ඒ ලකුණුවලින් තමයි මම බල්ලා හොයා ගත්තේ. වැඩි අමාරුවක් නැති ව හොයා ගත්තා. ඌ කිසි ම කෙනකුට අයිති බල්ලෙක් නො වෙයි." අනතුරු ව කොල්යා ඉලූෂාටත්, ඔහු ගේ මිත්‍රයන්ටත්, අලෝෂාටත් බල්ලා ලැබුණු හැටි විස්තර කරමින් මෙසේ කී ය. "මූ හිටියේ පෙඩෝව්ටොව් ගේ ගෙයි පිටිපස්ස පැත්තෙයි. ඒත් ඒ මිනිස්සු ඌට කන්න දුන්නේ නැහැ. මූ පිටිසර පලාතක ඉඳලා පැනලා ගිහින් දඩාවතේ යන බල්ලෙක්.........මම මූව හොයා ගත්තා ....පේනවා තේද, ඉලූෂා දුන්න පාන්කෑල්ල මූ කාලා නැහැ. කෑවා නම් මෙලහකටත් මැරිලා. සමහර විට වමනය කරන්න ඇති. ඒ නිසා තමයි නො මැරී බේරුණේ. ඉලූෂා දැක්කේ නැහැ මූ පාන් කනවා. අල්පෙනෙති කටුව දිවේ ඇනෙන්න ඇති. ඒකයි ඌ කෑ ගෑවේ. බල්ලන් ගේ දිව බොහො ම සිනිඳුයි. මිනිසුන් ගේ දිවට වඩා සිනිඳුයි" කොල්යා වහවහා කීවේ ය. ඔහු ගේ මුහුණ ප්‍රීතියෙන් ආලෝක විය. කතා කරගත නොහැකි වූ ඉලූෂා පිරිවටයක් මෙන් සුදුමැලි විය. ඔහු පුදුමයෙන් කට ඇරගෙන කොල්යා දෙස බලා සිටියේ ය. ඔහු ගේ නෙත් හිසෙන් එළියට පැනීමට තරම් ලොකු විය. රෝගාතුර වූ දරුවාට මෙ වැනි චිත්ත වේගයක් ඇති වීම ඉතා භයානක බව කොල්යා දැන සිටියේ ය. කාමරයේ සිටි අනෙක් අය අතරින් ඒ බව දැන සිටියේ අලෝෂා පමණි. ඉලූෂා ගේ පියා පොඩි දරුවකු මෙන් හැසිරුණේ ය.

"සුචිකා, සුචිකා, මේ ඉන්නේ සුචිකා"යි ඔහු මහත් ප්‍රීතියෙන් කෑගා කීවේ ය. "ඉලූෂා, මේ ඉන්නේ සුචිකා" ඔහු ගේ දෑසෙන් කඳුළු ගලන්නට විය.

"මේ බල්ලා සුචිකා ය කියා මම කවදාවත් විශ්වාස කළේ නැහැ"යි සමුරෝව් කී ය. "කොල්යා, තුඹ කළ දෙය බොහො ම හොඳයි, තුඹ කොහොම හරි සුචිකා හොයා ගන්න බව මම දැන ගෙන හිටියා."

"කොල්යා සුචිකා සොයා ගත්තා"යි අනෙක් ළමයි ද ප්‍රීතියෙන් කී හ.

"බොහො ම හොඳයි කොල්යා"යි තවෙකෙක් කී ය.

"බොහො ම හොඳයි, බොහො ම හොඳයි" හැම දෙනා ම කී හ.

"ටිකක් ඉන්න, ටිකක් ඉන්න"යි කොල්යා උස් හඬින් කී ය. "මම සුවිකා හොයා ගන්න හැටි කියන්නම්. ඒක තමයි බොහො ම වැදගත් දෙය. මම ඌ හොයාගත්ත වහා ම ගෙදර අරන් ගිහින් හැංගුවා. අද වනතුරු කාටවත් පෙන්නුවේ නැහැ. පසු ගිය සති දෙක තුළ සමූරෝව් පමණයි දැන සිටියේ. නමුත් මම එයාට කිව්වේ මූ පෙරුස්වොන් ය කියායි. සමූරෝව් මගේ කීම විශ්වාස කළේ නැහැ. ඒ අතර මම බල්ලාට නොයෙක් විදියේ සෙල්ලම් ඉගැන්නුවා. ඌට කරන්න බැරි සෙල්ලමක් නැහැ. මම ඌට සෙල්ලම් ඉගැන්නුවේ ඉලූෂාට හොඳ බල්ලෙක් ගෙනත් දෙන්නයි. එතකොට මට කියන්න පුළුවනි 'යාළුවා, බලන්න තුඹට කො තරම් හොඳ බල්ලෙක් ද ඉන්නේ' කියා. මස් කෑල්ලක් දුන්නොත් ඌ, හිනාවෙලා මැරෙන තුරු සෙල්ලම් පෙන්නාවි. මස් කෑල්ලක් තියෙනව ද?"

කාපිතන් වහා හුන් තැනින් නැගිට, ගෙවල් හිමි කාරිය වෙත දිව ගියේ ය. ආහාර පිසන්නේ ඇගේ ගෙදර ය. වටිනා කාලය අපතේ යාමට ඉඩ නොදුන් කොල්යා පෙරුස්වොන්ට "මැරියන්" කියා කෑ ගා අණ දුන්නේ ය. එක්වර ම වටේට කැරකැවුණු බල්ලා ගාත් හතර ම උස්සා උඩු බැලි අතට බිම වැතිරුණේ ය. ලමයි සිනාසුණහ. ඉලූෂා තවමත් වේදනාවෙන් පිරි නෙතින් බලා සිටියේ ය. එ නමුත් ඔහු ගේ අම්මා බල්ලා ගේ සෙල්ලම් බලා ප්‍රීති වූවා ය. ඈ සිනා සී අත්පුඩි ගසමින් "පෙරුස්වොන් පෙරුස්වොන්" කියා කෑගැවා ය.

"මොනව කළත් ඌව හොලවන්න බැහැ"යි මහත් ජයක් ලැබූවකු මෙන් කොල්යා උඩඟු සිතින් කී ය. "ඒත් මම කතා කළොත් ඌ එක පාරට ම උඩ පනීවි.....නැගිටපන් පෙරුස්වොන්" බල්ලා ප්‍රීතියෙන් උඩ පැන කාමරය පුරා දුවන්නට විය. ඒ මොහොතේ දී කාපිතන් මස් කෑල්ලක් ගෙන පැමිණියේ ය.

"මස් කෑල්ල උණු ද?"යි වහා විමසූ කොල්යා එය අතට ගත්තේ ය. "උණු දේවල් කෑමට බල්ලන් කැමැති නැහැ. නැහැ, උණු නැහැ......දැන් ශේරම හොඳට බලන්න ඕනෑ. ඉලූෂා හොඳට බලා ගන්න. ඇයි බලන්නෙ නැත්තේ? බල්ලා හොයා ගෙන ඇවිදිල්ලත් බලන්නෙ නැහැ නේද?"

බල්ලා පස්සා ගාත් දෙකින් සිටවා, නාසය කෙළින් කොට, ඒ‍ට ඉස්සූ පසු කුසගින්න ඇති කරවන මස් කෑල්ල නහය උඩින් තැබීම අලුත් සෙල්ලම විය. මේ අවාසනාවන්ත සුනඛයා

මස් කෑල්ල නහය උඩ තබා ගෙන තම ස්වාමියා කැමැති වේලාවක් සිටිය යුතු ය. සමහර විට පැය භාගයක් විය හැකි ය. එහෙත් කොල්යා මේ ඉරියව්වෙත් සුනඛයා තැබුවේ ඉතා සුළු වේලාවක් පමණි.

"ඉඳ අල්ල ගනින්"යයි කොල්යා කී ය. ඒ ක්ෂණයෙන් ම මස් කෑල්ල බල්ලා ගේ නහය උඩ සිට කටට ගියේ ය. බලා සිටි අය ප්‍රීතියත්, පුදුමයත් පළ කළහ.

"මෙ පමණ කාලයක් නැවිත් හිටියේ මේ බල්ලා පුහුණු කිරීමට ද?"යි අලෝෂා ඇසුවේ දෝෂාරෝපනයක් කරන්නාක් මෙනි.

"ඔව්, ඒක තමයි නැවිත් හිටියේ"යි කොල්යා කියි ම අසතුටක් නැති ව කී ය. "මට උවමනා කළේ බල්ලා ගේ සමත්කම සම්පූර්ණයෙන් ම පෙන්නීමටයි."

"පෙරුසුවාත්, නැඟපන් ඇඳ උඩට"යි කියමින් කොල්යා ඇඳට තට්ටු කළ විට බල්ලා ඊතලයක වේගයෙන් එක්වර ම ඇඳ උඩට පැන්නේ ය ඉලූෂා දෑතින් ම පෙරීසුවාත් ගේ බෙල්ල බදා ගත්තේ ය. එවිට බල්ලා ඉලූෂා ගේ මුහුණ ලෙවකෑවේ ය. බල්ලා ළඟට ඇදුණු ඉලූෂා උගේ දිග මයිල් අතර මුහුණ සඟවා ගත්තේ ය.

"අනේ දෙයියනේ! අනේ දෙයියනේ!"යි කපිතාන් කී ය. කොල්යා යළි ඉලූෂා ළඟින් ඇඳ උඩ හිඳ ගත්තේ ය.

"ඉලූෂාට තවත් සෙල්ලමක් පෙන්නත් ද? ඉලූෂාට දෙන්න, මම පොඩි කාලතුවක්කුවක් ගෙනාවා. මීට ඉස්සෙල්ලා මේ කාලතුවක්කුව ගැන මතක් කළා ම ඒක බලන්න උවමනා වුණා. මෙන්න මම කාලතුවක්කුව ගෙනාවා."

මෙසේ පැවැසූ කොල්යා වහා බෑගයට අත දමා කුඩා ලෝහ කාලතුවක්කුවක් එළියට ගත්තේ ය. කොල්යා මෙසේ වහා කාල තුවක්කුව ගෙන පෙන්නුවේ ඉලූෂා ප්‍රීතියෙන් සිටි නිසා ය. නැති නම් ඔහු ටික වෙලාවක් සිටිනවා ඇත. "දැන් හැම දෙනා ම ඉන්නේ බොහො ම ප්‍රීතියෙන්. ඒ නිසා තව තවත් ප්‍රීතිමත් කළ යුතුයි." ඔහු කල්පනා කෙළේ ය.

"මම මේ කාලතුවක්කුවට බොහො ම කාලයක ඉඳලා ඇහැ ගහගෙන හිටියා. මම මේක ගෙනාවේ ඉලූෂාට දෙන්නයි.

මේක අයිති මොරොව්සෝව්ටයි. දූත් එයාට මේකෙන් කිසි ම ප්‍රයෝජනයක් නැහැ. එයාට මේක ලැබුණේ එයා ගේ අයියාගෙන්. මම මේක ගත්තේ තාත්තා ගේ පොතක් දීලයි පොතේ නම 'මොහොමඩ් ගේ ලේ නෑයා හෙවත් වැඩදායක මෝඩකම.' අවුරුදු සීයකට විතර ඉස්සර, ආණ්ඩුවෙන් පොත් පරීක්ෂා කරන්න ඉස්සර, මොස්කව් නුවර දී ප්‍රසිද්ධ කරන ලද වනචර පොතක්. මොරොව්සෝව් මෙ වැනි පොත්වලට බොහො ම කැමැතියි. පොත ගෙනත් දුන්නට මට බොහො ම සතුති කළා."

හැම දෙනාට ම දැක ගත හැකි වන ලෙස කොල්යා කාල-තුවක්කුව අතේ තබා ගෙන සිටියේ ය. තවමත් දකුණු අත බිල්ලා ගේ බෙල්ල වටේ දමා ගත් ඉලූෂා මදක් ඉස්සී සෙල්ලම් බඩුව දෙස පුදුමයෙන් බැලුවේ ය. තමා වෙඩි බෙහෙත් ගෙනා බවත්, 'කාත්තාවත් භය වන්නේ නැති නම්' තුවක්කුව පත්තු කළ හැකි බවත්, කී විට එහි රැස් ව සිටි අය ගේ පුදුමය වැඩි විය. තුවක්කුව අතට ගෙන බැලිය යුතු යයි ඉලූෂා ගේ අම්මා කීවෙන් වහා ඇයට තුවක්කුව දෙන ලදී. රෝද සහිත ඒ කුඩා කාලතුවක්කුව ගැන මහත් සතුටට පත් අම්මා, එය ඔඩොක්කුව උඩ තබා ඉස්සරහටත් පස්සටත් තල්ලු කරන්නට වූවා ය. 'කාලතුවක්කුවට වෙඩි පුරවා පත්තු කළාට වරදක් නැද්ද?'යි ප්‍රශ්න කළ විට ඈ වහා එයට අවසර දුන්නේ තමා ගෙන් කුමක් ඇසුවේ දැයි නො දැන ය. කොල්යා වෙඩි බෙහෙත් සමඟ වෙඩි මුණ්ඩයක් ගෙන පෙන්නුවේ ය. වෙඩි බෙහෙත් ඉතා ස්වල්පයක් දමා තුවක්කුව සූදානම් කළ කපිතන්, වෙඩි මුණ්ඩය පසු ව දැමිය හැකි යැයි කී ය. කාමරයේ හිස් තැනකට එල්ල කොට බිම තබන ලද තුවක්කුව ගිනිකූරකින් දල්වන ලදී. තුවක්කුවෙන් ඉතා අලංකාර ශබ්දයක් නික්මිණි. ඉලූෂා ගේ මව තැති ගත්තා ය. එහෙත් ආයේත් ප්‍රීතියෙන් සිනාසුණා ය. ලබන ලද ජයග්‍රහණයෙන් ගොළු වූ පිරිසක් මෙන් ළමයි නිහඬ ව බලා සිටියහ. රෝගාතුර වූ තම දරුවා දෙස බලා සිටි කපිතන්, හැම දෙනාට ම වඩා ප්‍රීති විය. කාලතුවක්කු ව අතට ගත් කොල්යා වෙඩි බෙහෙත් හා වෙඩි මුණ්ඩ ද සමඟ එය ඉලූෂාට තෑගි කෙළේ ය.

"මම මේක ගෙනාවේ ඉලූෂාට දෙන්නයි. මා මේක බොහො ම කාලයක ඉඳලා ළඟ තියා ගෙන හිටියේ ඉලූෂාට දෙන්නයි." කොල්යා ආයේත් ප්‍රීතියෙන් කී ය.

"මට දෙන්න, මට දෙන්න"යි කියමින් ඉලූෂා ගේ අම්මා කුඩා දරුවකු මෙන් කාලතුවක්කුව ඉල්ලා කෑගැවා ය. තමාට එය නො ලැබේ ය යන බිය හා ශෝකයත් ඇගේ මුහුණේ පිළිබිඹු විය. කොල්යා කලබල විය. කපිතන් නොසන්සුන් විය.

"අම්මේ මේ කාලතුවක්කුව අයිති අම්මාටයි. නමුත් ඉලූෂාට ගෙනා තෑග්ගක් නිසා ඉලූෂා තියාගන්නාවදෙන්. ඉලූෂා ළඟ තිබුණත් එකයි, අම්මා ළඟ තිබුණත් එකයි. තුවක්කුව අරගෙන සෙල්ලම් කරන්නට ඉලූෂා අම්මාට ඉඩ දේවි. තුවක්කුව දෙන්නට ම අයිතියි."

"නෑහැ, ඒක දෙන්නට ම අයිති වෙන්න උවමනාවක් නැහැ. ඒක මට ඕනෑ"යි අම්මා කීවා ය. අනතුරු ව ඇ අඬන්නට සැරසුණා ය.

"අම්මා තුවක්කුව ගන්න"යි ඉලූෂා කී ය. "කොල්යා මේ තුවක්කුව අම්මාට දෙන්න ද?"යි අනතුරු ව ඔහු කොල්යා දෙස බලා බැගෑපත් ව ඇසුවේ ඔහු දුන් තෑග්ග වෙන අයකුට දීමෙන් ඔහු කිපේ ය යන බියෙනි.

"ඔව්, ඔව්, අම්මාට දෙන්න"යි පැවසූ කොල්යා තුවක්කුව ගෙන මවට දී හිස නමා ආචාර කෙළේ ය. මව මහත් ප්‍රීතියෙන් ඇඬුවා ය.

"ඉලූෂා විතරයි අම්මට ආදරේ"යැයි පැවසූ මව තුවක්කුව ඔඩොක්කුව උඩ තබා ඉස්සරහටත් පස්සටත් තල්ලු කළා ය.

"අම්මේ අත සිඹින්න මට ඉඩ දෙන්න"යි පැවසූ කපිතන් වහා ඇය ළඟට ගොස් ඇගේ අත ගෙන සිම්බේ ය.

"මම කවදාවත් මෙච්චර හොඳ ළමයෙක් දැකලා නැහැ"යි ඇ කොල්යා පෙන්නා කෘතඥතාව දක්වමින් කීවා ය.

"ඉලූෂා තුවක්කුවට උවමනා තරම් වෙඩි බෙහෙත් ගෙනත් දෙන්නම්. අපි වෙඩි බෙහෙත් හදනවා. බොරෝවිකෝෆ් හොයා ගත්තා හදන හැටි. වෙඩි ලුණු විසි හතරයි. ගෙන්දගම් දහයයි. අඟුරු හයයි. මේවා එකට කොටා වතුර දමා පෑප්ප වෙන්න අනා හීන් දැලක් උඩ අතුල්ලනවා. අන්න එහෙම තමයි හදන්නේ."

"සමුරෝව් මට කිව්වා කොල්යා වෙඩි බෙහෙත් හදන බව. නමුත් තාත්තා කියනවා ඒවා හොඳ වෙඩි බෙහෙත් නො වෙයි කියා" ඉලූෂා කී ය.

"හොඳ නැහැ? ඒවා පත්තු වෙනවා. මං දන්නේ නැහැ ඊට වැඩිය දෙයක්"යයි කොල්යා කී ය.

"නැහැ නැහැ. මම එහෙම දෙයක් අදහස් කළේ නැහැ"යි කපිතන් කී ය. "මං කිව්වේ තියම වෙඩි බෙහෙත් හදන්නේ එහෙම නොවන බවයි. ඒක එ තරම් ලොකු දෙයක් නො වෙයි. වෙඩි බෙහෙත් ඔය විදියටත් හදන්න පුළුවනි."

"මං දන්නේ නැහැ. වෙඩි බෙහෙත් හදන හැටි. මට වඩා හොඳට මහත්මයා දන්නවා ඇති. අපි බෝතලයකට දමා පත්තු කළා. හොඳට පත්තු වුණා. අළු ටිකක් ඉතිරි වෙන්න සේරම පත්තු වුණා. එයා ගේ තාත්තා දැකලා, බෝතලය පුපුරාවිය කියා හොඳට ම ගැහැව්වා. එයා හැදුවා මට විරුද්ධ ව ගුරුවරුන්ට පැමිණිලි කරන්න. දැන් එයාට මා එක්ක කොහාටවත් යන්න දෙන්නේ නැහැ. කිසි ම ළමයකුට මා එක්ක කොහාටවත් යන්න දෙන්නේ නැහැ. සමුරෝව්ට යන්න දෙන්නෙත් නැහැ. හැමෝ ම පිළිඅරන් තියෙන්නේ මා නරක ළමයකු හැටියට යි. හැමෝ ම කියනවා මා ජීවිතය ගැන කිසි ම අංශාවක් නැති ළමයෙක් ය කියා." කොල්යා සාවඥවෙන් සිනාසුණේ ය. "කෝච්චි පාරේ දී වෙච්ච දෙයින් පසුවයි මේ සේරම පටන් ගත්තේ."

"ඒ වීර ක්‍රියාව ගැන අපටත් ආරංචි යි" කපිතන් කී ය. "කොහොම ද කෝච්චි පාරේ නිදාගෙන හිටියේ? කෝච්චිය යන කොට බයවුණේ නැද්ද?"

කපිතන් කොල්යා දෙස රවා බැලුවේ ය.

"නැහැ, හයවුණේ නැහැ"යි කොල්යා නො සැලැකිල්ලෙන් කී ය. "මගේ නම නරක් කළේ අර පාත්තයා"යි. මෙසේ පැවැසූ කොල්යා අනතුරු ව ඉලූෂා දෙසට හැරුණේ ය. කතා කරන අතරේ කොල්යා නොසැලැකිලි බවක් දක්වූවත්, සිතේ පැවැති නොසන්සුන් කම මැඩ ගත නො හැකි විය.

"මටත් ඒ පාත්තයා ගැන ආරංචි වුණා"යි කියමින් ඉලූෂා සිනාසිණි. ඒ සිනාවෙන් ඔහු ගේ මුහුණ ආලෝක විය. "නමුත් මට ඒ කතාව තේරුම් ගන්න බැරි වුණා. ඒ ගොල්ලෝ කොල්යාට විරුද්ධ ව නඩු දැම්ම ද?"

''ඒක කිසි ම වැදගත් කමක් නැති මෝඩ කතාවක්. උත් කෙස් ගහ කොස් ගහ කරලා පෙන්නුවා. උත්ගෙ හැටි එහෙම තමයි'' කොල්යා නොසැලැකිල්ලෙන් කී ය. ''දවසක් මම මාරකැට්ටුව ළඟින් යන කොට උත් තාරාවන් එළවමින් හිටියා. මම නැවතිලා තාරාවන් දිහැ බැලුවා. හදිසියෙන් ම ළමයෙක් මා දිහැ බලා 'මොකද තාරාවන් දිහැ බලන්නේ?' කියා ඇසුවා. ඒ ළමයා දුන් කඩයක වැඩ කරනවා. අවුරුදු විස්සක් විතර වයස ඇති මෝඩයෙක් බව මූහුණෙන් පේනවා. මම සාමාන්‍ය මිනිසුන්ට විරුද්ධ ව කිසි ම දෙයක් කියන්නේ නැහැ. මම බොහො ම කැමැතියි සාමාන්‍ය මිනිස්සු ආශ්‍රය කරන්න. අපි සාමාන්‍ය මිනිස්සු ආශ්‍රය කරන්න වැඩිය කැමැති නැහැ. ඒක සහතික ඇත්ත. අලෝෂා මගේ කතාව ගැන හිනා වෙනවා ඇති.''

''නැහැ නැහැ. බොහො ම ආසාවෙන් අහගෙන ඉන්නවා''යි අලෝෂා කී ය. කොල්යා යළි කතාව පටන් ගත්තේ ය.

''මගේ මතය බොහො ම ලෙහෙසියෙන් පිළිගන්න පුළුවනි. පොදු මිනිහා ගැන මගේ ලොකු විශ්වාසයක් තියෙනවා. පොදු මිනිහ ගේ අයිතිවාසිකම් ලබා දීමට මම බොහො ම කැමැතියි. උන් නරක් කරන්න මම කැමැති නැහැ.........මා කියමින් සිටියේ පාත්තයා ගැන කතාව නේ ද? ඉතින් මම අර මෝඩයාට කිව්වා මම කල්පනා කලේ පාත්තය කල්පනා කරන දෙය ගැන ය කියා. මිනිහා මා දිහා මෝඩයකු වගේ බලා ඇහැව්වා 'හොඳයි එහෙනම් පාත්තයා කල්පනා කරන්නේ මොනව ගැන ද?' කියා 'පේනව ද අර ඕට් කරත්තය?' කියා මම ඇහැව්වා. 'අර ගෝනියේ තියෙන ඕට්ස් බිමට වැටෙනවා, පාත්තයෙක් රෝදය යටින් ඔළුව දමා ගෙන ඕට්ස් අහිඳ ගෙන කනවා පේනවා නේ ද?' 'ඔව් මට පේනවා' කියා මිනිහා පිළිතුරු දුන්නා 'හොඳයි කරත්තය ටිකක් ඉස්සරහට ගියොත් පාත්තයා ගේ ඔළුව රෝදෙට අහුවෙනවා නේ ද?' කියා මම ඇසුවා. 'ඔව් ඔළුව අහුවෙනයා' කියා මිනිහා සිනාසුණා. 'එහෙ-නම් අපි කරත්තය ටිකක් දක්කල බලමු' කියා මම යෝජනා කලා. මිනිහ කැමැති වුණා කරත්තය දක්කන්න. අපට වැඩි වෙලා ගියේ නැහැ. මිනිහ කිසි ම කෙනකුට නො පෙනී අශ්වයා ගේ රේන්ස් පටිය අල්ලා ගත්තා. නා එක්ක ද කතා කරමින් හිටිය කරත්තකාරයා අප කරන දෙය දුටුවේ නැහැ. පාත්තයා රෝදය යටින් බෙල්ල දික් කොට ඕට්ස් ඇහිඳගෙන ගිලින්න පටන්ගත්තා. මම මිනිහට සංඥාවක් කළ හැටියේ ම

මිනිහ කරත්තය දක්කුවා. පාත්තයා ගේ බෙල්ල හරියට ම මැදිත් කැඩුණා. නමුත් වාසනාවට වගේ එහි සිටිය අය අපි කරපු දෙය දකලා කෑගාන්න පටන් ගත්තා. 'උඹ ඕනෑවටම ඒ සතා මැරුවා.' 'නැහැ මම මැරුවේ නැහැ.' 'නැහැ උඹ මැරුවා' කියා උන් කෑගෑවා. 'අපි මේ ළමයා නඩුකාරයා ළඟට අල්ල ගෙන යමු.' උන් මාව අල්ලගත්තා. 'උඹත් පාත්තයා මරන්න උදව් කළා.' 'අපි උඹව අඳුනනවා' කියා උන් කෑගෑවා. කිසියම් කාරණාවක් නිසා කඩ පොළේ හිටිය ශේරම මාව අඳුන ගත්තා. ඉතින් අපි ශේරම උසාවියට ගියා. උන් පාත්තයත් අරගෙන ගියා. අර මිනිහා බය වෙලා කෑගාන්න පටන් ගත්තා. 'මේ විදියට මූන් ශේරම මරාවි' කියා පාත්තයත් අයිතිකාරයා කෑගෑවා. අපට විරුද්ධ ව ඕනෑ තරම් සාක්ෂි තිබුණා. නඩුකාරයා බොහො ම ඉක්මනට තීන්දුව දුන්නා. අයිතිකාරයාට රූබල් එකක් ගෙවන්න නියම වුණා. අර මිනිහට පාත්තයා අයිති වුණා. මීට පස්සේ මේ වගේ දේවල් නොකරන ලෙස නඩුකාරයා මිනිහට අවවාද කළා. 'අනේ හමුදුරුවනේ පාත්තයා මරන්න මට කිව්වේ මේ ළමයා' කියා මිනිහා බයෙන් කෑගාන්න පටන් ගත්තා. එතකොට මම කලබල · නො වී නඩුකාරයාට කිව්වා 'මම මිනිහට මගේ අදහස කිව්වා මිස පාත්තයා මරන්න කිව්වේ නැහැ' කියා. මගේ කතාව අසා නඩුකාරයා සිනාසුණා. නමුත් සිනාසීම ගැන එයා, එයා එක්ක ම තරහ වුණා. 'මම තුඹ ගැන තුඹේ පාඨශාලාවට පැමිණිලි කරනවා. මීට පස්සේ ඔ වැනි විකාර අදහස් තියා සො ගෙන හොඳට ඉගෙන ගන්න ඕනෑ' කියා නඩුකාරයා මට කිව්වා. නමුත් මා ගැන පාසලට පැමිණිලි කළේ නැහැ. නඩුකාරයා කළේ විහිළුවක්. මේ සිද්ධිය පාසලට ආරංචි වුණා. අපේ ගුරුවරුන්ට ආරංචි නොවන දෙයක් නැහැ. අපේ පන්තියේ ගුරුවරයාට බොහො ම කේන්ති ගියා. ඒ වුනත් මේ පාරත් මා බේර ගත්තේ ඩාඩනලෝප්. අපේ ගුරුවරයා හැමෝම එක්ක කෝලාහල කරගන්න බූරුවෙක්. ඉලූෂා දන්නවා ද එයා ටික දවසකට ඉස්සෙල්ලා රූබල් දහක දෑවැද්දක් එක්ක කසාද බැන්ද. එහෙත් මනමාලි වැඳිරියක් වගෙයි. තුන් වන පන්තියේ ළමයි ඒ ගැන කවියක් හැදුවා.

"කොල්බැස්තිකෝ නම
මෝඩයි කොටලූවෙකු වැනි.
යන මේ පුදුම එලවන
පුවත පත්තියෙ ගියේ පැතිරී.

"ඒක මහ විකාර කවියක්. මම ඒ කවිය පස්සේ ගෙනක් දෙත්නම්. මම ඩාඩනලෝප්ට විරුද්ධ ව කිසි ම දෙයක් කියන්නේ නැහැ. එයා එක්තරා ප්‍රමාණයක උගතෙක්. මම ඒ වගේ අයට ගරු කරනවා. ගරු කරන්නේ මා බේරාගත්ත නිසා නො වෙයි."

"ඒත් ට්‍රෝයි නගරය ගැන කතාවේ දී ඩාඩනලෝප් බොහො ම පහත් කොට සැලැකුවා"යි සමුරෝව් හදිසියෙන් ම කිව්වේ තම මිත්‍ර කොල්යා ගැන ඒ මොහොතේ දී ඇති කරගත් අහංකාරකමින් යුතු ව ය. පාත්තයා ගැන කතාවෙන් ඔහු අපමණ ප්‍රීතියට පත් විය.

"ඇත්තෙන් ම මහත්මයා එහෙම දෙයක් කළා ද?"යි කපිතන් විමසුවේ ප්‍රශංසනාත්මක මූඛයෙනි. "ඔය කියන්නේ ට්‍රෝයි නගරය ඉදි කළ තැනැත්තා ගැන කතාව ද? අපට ආරංචියි ඩාඩනලෝප්ට උත්තර දෙන්න බැරි වුණා ය කියා. ඒ දවස්වල ඉලූෂා මට මේ කතාව කිව්වා."

"තාත්තේ, කොල්යා හැම දෙයක් ගැන ම දන්නවා. අපට වඩා හොඳ දැනීමක් තියෙනවා. ඔයා ඔහොම හිටියට හැම පාඩමකින් ම බොහො ම ඉහළින් සමර්ථ වෙනවා,"යි ඉලූෂා කීවේ ය.

ඉලූෂා, කොල්යා දෙස බැලුවේ ඉමහත් ප්‍රීතියෙනි.

"ට්‍රෝයි නගරය ගැන කතාව කිසි ම වැදගැම්මකට නැති කතාවක්"යයි කොල්යා කීවේ නිරහංකාර කමක් දක්වමිනි.

තවමත් ඔහු සිටින්නේ නොසන්සුන්කමින් යුතු ව ය. එහෙත් ඔහු ගේ කතාව ටිකින් ටික ප්‍රකෘති තත්ත්වයට පැමිණියේ ය. තමා නොසන්සුන් සිතින් යුතු ව පාත්තයා පිළිබඳ කතාව ඔනෑවට වඩා විස්තර ඇති ව කී බව ඔහුට හැඟී ගියේ ය. මහත් සැලැකිල්ලෙන් කතාව අසා සිටි අලෝෂා වචනයක් වත් නො කීවේ ය. අලෝෂා කතා නො කරන්නේ තමා පහත් කොට සලකන නිසා යැයි මේ අහංකාර ශිෂ්‍යයා කල්පනා කෙළේ ය. ඔහු ඒ ගැන තැති ගත්තේ ය.

"ඒක එ තරම් වැදගත් ප්‍රශ්නයක් නෙ වෙයි" ඔහු යළි උඩඟු කම දක්වමින් කී ය.

"මං දන්නවා ට්‍රෝයි නගරය ඉදි කළේ කවුද කියා"යි මෙතෙක් වේලා නිහඬ ව සිටි ළමයෙක් හැම දෙනා ම පුදුම කරවමින් හිටිහැටියේ ම කී ය. ඒ ළමයා විළිබිය ඇත්තකු බව පෙනේ. ඔහු හවුරුදු එකොළහක් පමණ වයසැති, බලන්න ලස්සණ ළමයෙකි. දොර ළඟ හිඳ සිටි ළමයා දෙස කොල්යා බැලුවේ අහංකාර කමත් සමඟ එක් වූ පුදුමයෙන් යුතු ව ය.

ට්‍රෝයි නගරය ඉදි කළ තැනැත්තා පිළිබඳ පුවත මූළු පන්තියට ම රහසක් විය. සමරාඩෝප් විසින් ලියන ලද පොතකින් මේ රහස් දැනගත හැකි ය. එහෙත් පොත තිබුණේ කොල්යා ළඟ පමණි. දිනක් කොල්යා ඉවත බලා ගෙන සිටිය දී මේ ශිෂ්‍යයා වහා පොත දිග හැර ට්‍රෝයි නගරය ගැන සඳහන් පිටුව කියෙව්වේ ය. මෙය සිදුවුණේ කලකට පෙර ය. එහෙත් ට්‍රෝයි නගරය ඉදි කළ තැනැත්තා ගේ නම ප්‍රසිද්ධියේ කීමට ඔහු බිය විය. කුමක් සිදු වන්නේ දැයි නොදත් හෙයින් බිය විය. සමහර විට කොල්යා අපහාස කරන්න පිළිවන. එහෙත් මේ මොහොතේ දී ළමයාට තම සිත මැඩගත නො හැකි විය. සති ගණනක සිට ඔහු බලා සිටියේ මේ රහස හෙළිකිරීමට ය.

"ඉතින් කවුද ට්‍රෝයි නගරය ඉදි කළේ?"යි කොල්යා ශිෂ්‍යයා දෙස අහංකාර බැල්මෙන් බලා ඇසුවේ ය.

ශිෂ්‍යයා පිළිතුර දැන සිටි බව කොල්යා ඔහු ගේ මූහුණින් දැනගත්තේ ය. තමා කුමන පිළිවෙතක් අනුගමනය කළ යුතු දැයි කොල්යා එක් වර ම තීරණය කරගත්තේ ය. එහි සිටි අනෙක් අය තුළ නොසතුටු ගතියක් දකින්නට තිබිණි.

"ට්‍රෝයි නගරය ඉදි කළේ ටියුසෙ, ඩාඩනස්, එලියස් හා ටොයාස් යන අයයි" ළමයා එක් වර ම එබිතර ව කී ය ඔහු ගේ සර්වාංගය ම ලැජ්ජාවෙන් රතු වූ නිසා ඔහු දුටුවන් තුළ ශෝකය ඇති කරවන්නෙක් විය. මේ ශිෂ්‍යයා දෙස මිනිත්තුවක් පමණ වේලා බලා සිටි අනෙක් ළමයි යළි හදිසියෙන් ම කොල්යා දෙස බැලූ හ. කොල්යා කිසි ම ගරුසරුවක් නැති මේ ශිෂ්‍යයා දෙස හිස සිට දෙපා දක්වා ද, දෙපා සිට හිස දක්වා ද සන්සුන් සාවඥ බැල්මෙන් බැලුවේ ය.

"නමුත්, මේ අය ට්‍රෝයි නගරය ඉදිකළා ය කියන්නේ කොහොම ද? නගරයක් හෝ රාජ්‍යයක් හෝ ඉදිකරනවා ය කීමෙන් අදහස් කරන්නේ කුමක් ද? මොකක් ද මේ අය කළේ? එක

එක්කෙනා ගිහින් ගලක් බැඟිත් ගෙනත් තැබුවා ද?''යි කොල්යා අත්තිමේ දී ඇසුවේ මෙතෙක් වේලා පැවැති නිශ්ශබ්දතාව බිඳිමිනි.

ළමයි සිනාසුණහ. රෝස පාට වී සිටි ළමයා අනතුරු ව රතු පාට විය. කරබාගත්තේ ය. ඇඬීමට සැරසුණේ ය. කොල්යා යළි කතා කළේ ය.

''නගරයක් ඉදිකිරීම වැනි ඓතිහාසික කරුණක් ගැන කතා කරන විට එහි අදහස කුමක් ද කියා තේරුම් ගන්න ඕනෑ''යි කොල්යා දැඩි සවරයෙන් කී ය. ''මම මේ පරණ කතාවලට වැඩි සැලැකිල්ලක් දක්වන්නේ නැහැ. ලෝක ඉතිහාසයට මගේ වැඩි සැලැකිල්ලකුත් නැහැ.''

''ලෝක ඉතිහාසය?''යි කපිතන් නැතිගෙන ඇසුවේ ය.

''ඔව් මහත්මයා, ලෝක ඉතිහාසය එ තරම් වැදගත් දෙයක් නො වෙයි. එහි මිනිසුන් කළ මෝඩකම් මිස වෙන කිසිවක් නැහැ. මම වැදගත් කොට සලකන්නේ ගණිතය හා සවාභාවික ඉතිහාසය පමණයි'' කියමින් කොල්යා තම උගත්කම ගැන පුරසාරම් දෙඩුවේ අලෝෂා දෙස බලමිනි. ඔහු බිය වූයේ අලෝෂා තමා ගැන ඇති කර ගන්නා අදහස් ගැන පමණි. තවමත් කතා නොකළ අලෝෂා සැලැකිල්ලෙන් බලා සිටියේ ය. ඔහු යම් කිසිවක් කීවේ නම් කතාව එ තැනින් නතර වෙයි. එහෙත් අලෝෂා නිහඬ විය. ඒ නිශ්ශබ්දතාව ඔහු ගේ පිළිකුල හඟවන්නක් විය හැකි ය. ඉන් කොල්යා වඩවඩාත් නොසන්සුන් විය.

''අප ඉගෙනගත යුතු පැරැණි භාෂා ගැන ටිකක් සිතා බලන්න. ඒක කිසි ම තේරුමක් නැති පිස්සු වැඩක්. ප්‍රයෝජනයක් නැති දෙයක්. අලෝෂා මගේ අදහස්වලට එකඟවන එකක් නැහැ?''

''නැහැ, මම එකඟ වෙන්නේ නැහැ''යි අලෝෂා සිනාසෙමින් කී ය.

''මගේ කල්පනාවේ හැටියට ආණ්ඩුව පැරැණි භාෂා ඉගෙන ගන්න ය කියා ශිෂ්‍යයන්ට නියම කරල තියෙන්නේ අප උවමනා විදියට පාලනය කරන්නයි'' කොල්යා යළි නොසන්සුන් වෙමින් කී ය. ''ලතින් හා ග්‍රීක් ඉගෙන ගන්නය කියන්නේ අප තුළ ඉගැනීමට අලස කමක් ඇති කොට

අපේ ඥාන ශක්තිය මොට්ට කිරීමටයි. මේ භාෂා ඉස්සරත් සිතට බොහෝ ම අප්‍රියයි. ඉතින් තවතවත් අප්‍රිය කිරීමට මොනවද කරන්න පුළුවන්? මේ භාෂාවල කිසි ම අර්ථයක් නැහැ. තවතවත් අර්ථය නැති කිරීමට උන් කල්පනා කළා ලතින් හා ග්‍රීක් උගන්වන්න. මේක තමයි මගේ අදහස. ඒ අදහස මම කවදාවත් වෙනස් කරන්නේ නැහැ.”

“ඒක ඇත්ත”යි කතාව අසා සිටි සමුරෝව් හිටි හැටියේ ම උස් හඬින් කී ය.

“නමුත් එයා තමයි ලතින් භාෂාවෙන් පන්තියේ පළමු වෙනියායි” ළමයින් අතරින් එකෙක් කී ය.

“ඔව් තාත්තේ, එයා එහෙම කිව්වට ලතින් පාඩමින් එයා හැම තිස්සේ ම පන්තියේ පළමු වෙනියා”යි ඉලූෂා ද කී ය.

“නමුත් ඒකෙන් කිසි ම දෙයක් ඔප්පු කරන්න බැහැ”යි කොල්යා ආරක්ෂා වෙමින් කීවේ තමාට කළ ප්‍රශංසාව ගැන සතුටු වෙමිනි. “ලතින් ඉගෙන ගන්නේ නො ගෙන බැරි නිසයි. විභාගයෙන් සමර්ථ වීමට මම අම්මාට පොරොන්දු වී සිටින නිසයි. මගේ අදහසේ හැටියට අපි යමක් කරනවා නම් ඒක ඉහළින් ම කරන්න ඕනෑ. නමුත් හිතට ඒක මහ පිළිකුලක්. වංචාවක්. අලෝෂා මගේ අදහසට එකඟ වන්නේ නැද්ද?”

“කොහොම ද වංචාවක් කියන්නේ?”යි අලෝෂා සිනාසෙමින් විමසුවේ ය.

“පැරණි පොත් හැම භාෂාවකට ම වගේ පරිවර්තනය කරල තියෙනවා. ලතින් ඉගෙන ගන්න ය කියා ආණ්ඩුව අපට බලකරන්නේ ප්‍රයෝජනයක් ඇති නිසා නො ව අපේ ඥාන ශක්තිය මොට්ට කිරීම පිණිසයි. ඉතින් ඒක වංචාවක් නො වෙයි ද?”

“කවුද මේවා ඉගැන්නුවේ?”යි අලෝෂා පුදුමයෙන් ඇසුවේ ය.

“කවුරුවත් උගන්නන්න උවමනා නැහැ. මට කල්පනා කරන්න පුළුවනි. අනෙක් කාරණාව මා පොත් පරිවර්තනය කිරීම ගැන කී කතාව අපේ ගුරුවරයා තුන් වන පන්තියේ ශිෂ්‍යයන්ට කිව්වා.”

"දෙස්තර මහත්මයා ඇවිදින්"යයි මෙතෙක් නිහඬ ව සිටි නීනා කීවා ය.

හොලාකෝ මැතිනිය ගේ රථය ශේට්ටුව ළඟ නතර විය. උදේ සිට දෙස්තර ගේ පැමිණීම බලාපොරොත්තු ව සිටි කපිතාන්, දෙස්තර පිළිගැනීම පිණිස වහා ශේට්ටුව ළඟට දිව ගියේ ය. හරිබරි ගැසී හිඳගත් ඉලූෂා ගේ මව ඇඳුම් සකස් කරගෙන මහත්තඹව ලීලාවක් දැක්වූවා ය. අලෝෂා ඉලූෂා ගේ ඇඳ ළඟට ගොස් කොට්ටය හරිගැස්සුවේ ය. නීනා නොසන්සුන්කමින් සියල්ල බලා සිටියා ය. ශිෂ්‍යයෝ වහා නික්ම ගියහ. සමහරු සවසට එන බවට පොරොන්දු වූහ. කොල්යා පෙරුසුවාන්ට කතා කළ විට ඌ ඇඳ උඩ සිට බිමට පැන්නේ ය.

"මම දැන් ම යන්නේ නැහැ. එළියට ගිහින් දෙස්තර ගිය හැටියේ ම එන්නම්. පෙරුසුවාන් එක්ක යනවා"යි කොල්යා යන ගමන් වහා ඉලූෂාට කී ය.

එහෙත් දැනට ම දෙස්තර කාමරයට පැමිණ සිටියේ ය. වැදගත් පෙනුමෙන් යුත් හෙතෙම වලස් සම් කබායක් පෙරවා ගෙන සිටියේ ය. මූහුණ දෙපස කාගුල් වැඩී තිබෙන අතරේ රැවුලින් තොර වූ නිකට දිළිසුණේ ය. දොර තුළින් කාමරයට පිවිසි හෙතෙම යමකිසිවක් දැක පුදුම වූවාක් මෙන් නතර විය. තමා වැරදි තැනට එන්නට ඇතැයි ඔහු සිතන්නට ඇත.

"මම මේ කොහාට ද ආවේ?"යි ඔහු විමසුවේ හිස්වැස්ම වත් ඉවත් කොට නො වේ. කාමරයේ පිරී සිටිනා අය, එහි පැවැති දිළිඳු පෙනුම, කාමරයේ මූල්ලක වැලක වනන ලද තෙත රෙදි දැක ඔහු ගේ සිහිය අවුල් විය. ඒ අතරේ කපිතාන් ඔහුට හිස නමා ආචාර කෙළේ ය.

"තමුන්නාන්සේ යහපත් වුණේ මගේ ගෙදරටයි" කපිතාන් බැගෑපත් වෙමින් කී ය.

"සෙනි-ග්‍රි-යෝප්, උඹේ නම සෙනිග්‍රියෝප් ද?"යි දෙස්තර මහත්තඹය පෙන්නමින් උස් හඬින් ඇසුවේ ය.

"එහෙමයි හාමුදුරුවනේ. ඒ මම තමයි."

"ආ එහෙම ද?"

ශල්‍ය කාමරය දෙස පිළිකුලින් බැලූ දොස්තර කබාය ගලවා විසි කෙළේ ය. ඔහු කර වටේ එල්ලා ගෙන සිටි පදක්කම කවුරුත් දුටහ. කපිතන් වහා කබාය අල්ලා ගත්තේ ය. අහඹුරු ව කිස් වැස්ම ඉවත් කළ දොස්තර,

"කෝ ලෙඩා?" කියා කෑගා ඇසුවේ ය.

හය වන පරිච්ඡේදය

වයසට වැඩි නුවණ

"දොස්තර ඉලූෂා ගැන මොනවා කියයි ද?"යි කොල්යා වහා අලෝෂාගෙන් ඇසුවේ ය. "ඒ මිනිහ ගේ මූහුණ කො තරම් කාලකණ්ණි පාට ද? මට මේ දොස්තරවරු පෙන්නන්න බැහැ."

"ඉලූෂා ජීවත් වන්නේ නැහැ. ඒ ගැන මට කිසි ම සැකයක් නැහැ"යි අලෝෂා ශෝකයෙන් කී ය.

"මේ දොස්තරවරු පල්හොරු. වෛද්‍යකම මහ ප්‍රෝඩාවක්. අලෝෂා අඳුනා ගැනීමට ලැබීම ගැන මට බොහො ම සන්තෝෂයි. බොහො ම කාලයක ඉඳලා අඳුනා ගැනීමට මට උවමනා කළා නමුත් අප මේ වැනි කනගාටුදායක අවස්ථාවක දී හමුවීම ගැන මට බොහො ම කනගාටුයි."

මීට වඩා හිතවත්කම හා මිත්‍රකම හැඟවීම පිණිස යමක් කීමට කොල්යා තුළ මහත් ආශාවක් පවතියි. එහෙත් ඔහු නොසන්සුන් විය. මේ බව දුටු අලෝෂා සිනාසී කොල්යා ගේ අතින් අල්ලා ගත්තේ ය.

"අලෝෂා අනෙක් අය වගේ නො වෙයි, බොහො ම වෙනස් කෙනෙක්. එ වැනි දුර්ලභ කෙනකුට සලකනවා වගේ ඔබට සැලකීමට මම ඉගෙන ගත්තා"යි ශිෂ්‍යයා දෙගඩියාවෙන් හා නොසන්සුන් කමින් කී ය. "අලෝෂා ගුප්ත පුද්ගලයකු බවත්, ආරාමයේ නතර වී සිටින බවත්, මට දැනගන්න ලැබුණා. ගුප්ත පුද්ගලයෙක් බව මම දැනගෙන හිටියා..........නමුත් ඔබ ආශ්‍රය නොකළේ ඒ නිසා නො වෙයි. අපි එදිනෙදා ගත

කරන සාමාන්‍ය ජීවිතයට මුහුණ පානවිට ඔය ලෙඩේ හොඳ වෙනවා.........ඔබ වැනි ගුප්ත චරිත ඇති අය හැම තිස්සේම ඔය විදිය මයි."

"මා ගුප්ත කෙනෙක් යයි කීමෙන් අදහස් කළේ කුමක් ද? මොකක් ද මා තුල තියෙන හොඳවෙන රෝගය?"යි අලෝෂා මඳක් පුදුම වෙමින් ඇසුවේ ය.

"දෙයියන් වහන්සේ හා ඊට සම්බන්ද වෙනත් දේවල්."

"ඇයි, දෙයියන් වහන්සේ ගැන විශ්වාස කරන්නේ නැද්ද?"

"දෙයියන් වහන්සේ ගැන මගේ කිසි ම විරුද්ධ කමක් නැහැ. දෙවියන් වහන්සේ සිතිවිලි මාත්‍රයක් පමණයි......... ලෝකයේ පැවැත්මට හා වෙනත් දේවල්වලට දෙවියෙක් අවශ්‍ය බව මම පිළිගන්නවා.........දෙවියෙක් නැතී නම් දෙවියෙක් මවා ගන්නවත් වෙනවා." මෙසේ කියන අතරේ කොල්යා ගේ මුහුණ විළියෙන් රතු විය. තමා ලොකු මිනිහකු බවත්, තමා ගේ පණ්ඩිතකම පෙන්නීමට තමා වෑයම් කරන බවත් අලෝෂා කල්පනා කරාවි යැයි කොල්යා අදහස් කෙළේ ය. "ඔහුට මගේ උගත්කම පෙන්නීමට මගේ කිසි ම ආශාවක් නැහැ"යි කොල්යා නො සතුටින් කල්පනා කෙළේ ය. හදිසියෙන් ම ඔහු කෝප වී ය.

"මෙ වැනි සාකච්ඡාවලට සම්බන්ධ වීමට මගේ කිසි ම ආශාවක් නැහැ"යි කොල්යා කතාව අවසන් කරන්නාක් මෙන් කී ය. "දෙවියකු ගැන විශ්වාස නො කර මනුෂ්‍ය වර්ගයාට ප්‍රේම කරන්න පුළුවනි. ඒ අදහස පිළිගන්නේ නැද්ද? වෝල්-ටයර් දෙවියන් වහන්සේ ගැන විශ්වාස කළේ නැහැ. නමුත් මනුෂ්‍යයන්ට ප්‍රේම කළා." ("මම ඇගේන් වාද කරනවා"යයි ඔහු කල්පනා කෙළේ ය.)

"වෝල්ටයර් දෙවියන් වහන්සේ ගැන විශ්වාස කළා. නමුත් ඔහු තුල එ තරම් ලොකු විශ්වාසයක් තිබුණේ නැහැ. ඔහු මනුෂ්‍ය වර්ගයාට එ තරම් ප්‍රේම කළා ය කියා කියන්නත් අපහසුයි" අලෝෂා ඉතා සෙමෙන් හා කරුණාවෙන් කීවේ සම තත්ත්වයේ සිටින එකකු හෝ තමාට වඩා වයසින් වැඩි එකකු සමග කතා කරන්නාක් මෙනි. තමා වෝල්ටයර් ගැන දරන අදහස් ගැන අලෝෂා දක්වන බයාදු කම කොල්යා ගේ

පුදුමයට හේතු විය. තමා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු තමා විසින් ම සපයා ගතයුතු බව අලෝෂා අදහස් කළේ යැයි කොල්යා කල්පනා කෙළේ ය.

"වෝල්ටයර් ගේ පොත්පත් කියවා තියෙනවා ද?"යි අලෝෂා ඇසුවේ ය.

"පොත් ගේරම කියවා නැහැ......... නමුත් 'කැන්ඩිඩා' රුසියන් පරිවර්තනයක් කියවා තියෙනවා. ඒක බොහො ම පහත් පරිවර්තනයක්." ("මම ආයේත් වාදයට යනවා.")

"පොත තේරුණා ද?"

"ඔව්, මට හොඳට තේරුණා.........ඇයි, මට එය නො තේරෙනවා ය කියා අදහස් කළේ? ඒ පොතේ අසභ්‍ය දේවල් බොහො ම තියෙනවා. ඒක දර්ශනයක් ගැබ් වූ නවකතාවක් බවත් කිසියම් අදහසක් ප්‍රචාරය කිරීම පිණිස ලියන ලද බවත් මම දන්නවා." මෙහි දී කොල්යා ගේ සිතිවිලි අවුල් වන්නට විය. අනතුරු ව ඔහු මෙසේ කීවේ කිසි ම හේතුවක් ඇති ව නො වේ. "මම සමාජවාදියෙක්, හික්මවිය නොහැකි සමාජවාදියෙක්."

"සමාජවාදියෙක්?"යයි අලෝෂා සිනා සෙමින් ඇසී ය. "සමාජවාදියෙකු වීමට තරම් වයස තියෙනව ද? වයස අවුරුදු දහතුනයි නේද?"

කොල්යා වේදනාවෙන් හැකුළුණේ ය.

"පළමු ව, මගේ වයස දහතුන නො වෙයි දහතරයි. තව සුමානයකින් මට දහතරක් වෙනවා. දෙවනුව, මට තේරුම් ගන්න බැහැ සමාජවාදයයි මගේ වයසයි අතර ඇති සම්බන්ධය කුමක් ද කියා. වැදගත් වන්නේ මගේ අදහස් මිස වයස නො වෙයි. ඒක පිළිගන්නේ නැද්ද?"

"මිනිහකු ගේ වයස ඔහු ගේ අදහස් කෙරෙහි කො තරම් දුරට බලපවත්වනවා ද කියන බව වයසින් වැඩුණා ම දැන ගන්න ලැබෙයි. මට පේනවා ඔබ ප්‍රකාශ කරන්නේ ඔබේ ම අදහස් නොවන බව!"යි අලෝෂා සෙමෙන් කී ය. එහෙත් කොල්යා අලෝෂා ගේ කතාවට බාධා කෙළේ කෝපයෙනි

"හොඳයි, ඔබට උවමනා කරන්නේ කීකරු කමයි, භක්ති-යයි නේද? ක්‍රිස්තියානි ධර්මය දුප්පතුන් දාසභාවයේ තබා ගැනීමට පමණක් ධනවතුන්ටත් බලවතුන්ටත් උපකාර වූ බව පිළිගත යුතුයි. ඒක ඇත්ත නේද?"

"මා දන්නවා ඔය අදහස කොයි පොතින් ද දැන ගත්තේ කියා. මට හොඳට විශ්වාසයි කවුරු හරි ඔය අදහස කියන්න ඇති" අලෝෂා කී ය.

"ඇයි මා ඒ අදහස පොතකින් දැනගත්තයි කියන්නේ? ඒ අදහස මට කිසි ම කෙනෙක් කිව්වේ නැහැ........ තනියෙන් කල්පනා කිරීමට මට ශක්තිය තියෙනවා..............ක්‍රිස්තුන් වහන්සේට මගේ කිසි ම විරුද්ධ කමක් නැහැ. එතුමා බොහො ම කරුණාවන්ත කෙනෙක්, එතුමා අද ජීවත් ව සිටිනවා නම් විප්ලව වාදීන්ට එකතු වී ප්‍රධාන තැනක් ගෙන ක්‍රියා කරනවාට කිසි ම සැකයක් නැහැ."

"කොහෙන් ද ඒක දැන ගත්තේ? කොයි මෝඩයා එක්ක ද ඔබ මිත්‍ර වුණේ?"

"සත්‍යය සඟවන්න බැරි බව ඔබ දන්නවා නේද?......... යම් යම් දේවල් ගැන මම රැකිටින් එක්ක කතා කළ බව ඇත්තයි.........මහලු බැලැන්ස්කි මෙ වැනි දේවල් කියන බව මම දන්නවා."

"බැලැන්ස්කි එ වැනි දෙයක් ලියා තියෙන බව මට මතක නැහැ."

"ලිව්වේ නැති නම් අඩු ගණනේ කියන්නවත් ඇති. මා ඒ බව දැනගත්තේ.........දැන ගත්ත තැනැත්තා ගේ නමක් ගමක් උච්චනා නැහැ."

"බැලැන්ස්කි ගේ පොත්පත් කියවා තියෙනවා ද?"

"බැලැන්ස්කි ගේ පොත්පත් සේරම කියවා නැහැ. නමුත් ටච්යානා, ඔනිජින් එක්ක නොයාමට දුන් හේතු මම කියවා තියෙනවා."

"ටච්යානා, ඔනිජින් එක්ක ගියේ නැහැ. හැබැට ම ඔබට මෙ වැනි දේවල් තේරෙනවා ද?"

"අනේ දෙයියනේ ඔබ හිතුව ද මා තව ම සමුරෝව් වගේ පොඩි කොල්ලෙක්ය කියා?" යි කොල්යා නොසතුටින් සිනාසී ඇසුවේ ය. "මා එ තරම් භයානක විප්ලව වාදියෙක් ය කියා කල්පනා කරන්න එපා. මම රැකිටින් ගේ සමහරක් අදහස් පිළිගන්නවා. ටච්යානා ගැන සඳහන් කළාට ස්ත්‍රී පක්ෂයට

සම්පූර්ණ නිදහස දෙනවාට මම කැමැති නැහැ. ස්ත්‍රී පක්ෂය යටහත් වර්ගයක් බවත්, කීකරු ව සිටිය යුතු බවත් මම පිළිගන්නවා.'' කිසියම් හේතුවක් නිසා සිනාසුණු කොල්යා ආයෙත් මෙයේ කී ය. ''ඒ අතින් මම ඒ ශ්‍රේෂ්ඨ මිනිසා ගේ අදහසට එකඟ වෙනවා. තමා ගේ රට අත්හැර ඇමෙරිකාවට පැන යාම මා පිළිගන්නේ බොහො ම නීච දෙයක් හැටියටයි. මේ රටේ සිට, රට වැසියාට විශාල සේවයක් කරන්න පුළුවන් කම තිබිය දී මොනවට ද ඇමෙරිකාවට යන්නේ? විශේෂයෙන් ම මේ කාලේ මේ රටේ කළ යුතු වැඩ බොහො ම තියෙනවා. අන්න ඒකයි මා දුන් පිළිතුර.''

''කාට ද පිළිතුරු දුන්නේ? දැනට ම ඇමෙරිකාවට යන්න කවුරුවත් කතා කළා ද?''

''ඔව්, ඔවුන් මට කතා කළා ඇමෙරිකාවට යන්න. නමුත් මම කැමැති වුණේ නැහැ. මේක රහසක් හැටියට තබා ගන්න. කිසි ම කෙනකුට වචනයක්වත් කියන්න එපා. මම මේ කතාව කියන්නේ ඔබට පමණයි. රහස් පොලීසියට අසුවී හිරගෙදරට යන්න මම කැමැති නැහැ.

සිරගෙය තුළ නොයෙක්
ලෙස ලත් සියලු කරදර
ඔබ ගේ සිතේ නොමැකී
පවතී නිසැක දිගු කල්

මේ කවිය මතක ද? බොහො ම හොඳයි. මොකද හිනා-වෙන්නේ? ඔබේ කල්පනාව මා බොරුවක් කියනවා කියා ද?'' (''තාත්තා ගේ අල්මාරියේ තියෙන්නේ මේ පොතේ එක පිටපතක් බවත්, මා ඒක සම්පූර්ණයෙන් කියවා නැති බවත්, මොහු දැන ගත්තොත් මොන ද වෙන්නේ?'' කියා කල්පනා කළ කොල්යා නැති ගත්තේ ය.)

''නැහැ නැහැ. මම හිනාවුණේ නැහැ. ඔබ බොරුවක් කියනවා ය කියා මොහොතකට වත් හිතන්නේ නැහැ. දැන් ඔබ වච්යානා ගැන කතා කළේ, පුෂ්කින් ගේ ඔයිජින් නමැති කාව්‍ය කියවා තියෙනව ද?''

''නැහැ, තව ම කියවා නැහැ. නමුත් කියවන්න මගේ ලොකු ආශාවක් තියෙනවා. මා පැත්තක් ගන්න කෙනෙක් නො වෙයි. දෙපැත්තෙන් ම කරුණු දැන ගැනීමට කැමැතියි. මොකද එහෙම ඇහැව්වේ?''

"අලෝෂා ඔබ මට කැමැති ද නැද්ද?"යි හදිසියෙන් ම ඇසූ කොල්යා සරඹ දක්වන්නකු මෙන් අලෝෂා ඉදිරිපිට කෙළින් සිට ගත්තේ ය. "කරුණා කරල කියන්න."

"මා ඔබට කැමැති ද නැද්ද?"යි අලෝෂා පුදුමයෙන් ඇසුවේ ය. "මා මොනවට ද ඔබ පහත් කොට සලකන්නේ? ඔබ වැනි යහපත් ළමයෙක් මෙ තරම් ඉක්මනට මේ විකාර අදහස්වලින් නරක් වීම ගැන මට බොහො ම කනගාටුයි."

"මගේ ගති ගුණ ගැන කරදර වෙන්න එපා"යි කොල්යා කතාවට බාධා කරමින් කීවේ ආත්ම සන්තුෂ්ටියකින් නො වේ. "මගේ සිත බොහො ම මෙළෙක් බව ඇත්තයි. ඒක මෝඩ කමක්. දූන් ඔබ හිනා වෙන්නේ........."

"මම හිනා වුණේ වෙන කරුණක් නිසයි ....මෙන්න මේ කාරණාව නිසයි. අපේ රටේ හිටිය ජර්මන් ජාතිකයෙක් අපේ ශිෂ්‍යයන් ගැන ලියාපු දෙයක් මම මෑත දී කියෙව්වා. ඔහු ලියා තිබුණේ මෙ වැනි දෙයක්. 'රුසියන් ජාතික ශිෂ්‍යයකුට, ඔහු මීට පෙර දුක නැති තාරකාවල සිතියමක් දෙන්න. ඔහු පසු දින එහි වැරැදි තැන් ලකුණු කොට ඔබට ආපසු දෙනවා ඇති' මේ ජර්මන් ජාතිකයා අපේ ශිෂ්‍යයන් ගැන කියන්නේ ඔවුන් කිසි ම දැනුමක් නැති, නමුත් ආත්මගෞරවය පමණක් තිබෙන පිරිසක් බවයි."

"ඒක සහතික ඇත්ත"යි කොල්යා හදිසියෙන් ම සිනා-සෙමින් කී ය. "ඒ ජර්මන් ජාතිකයා ගේ කටේ මිහුරත් දමන්න වටිනවා. නමුත් ඒ මිනිහට අපේ ශිෂ්‍යයන් ගේ හොඳ පැත්ත පෙනිලා නැහැ නේ ද? මොකද අදහස? ආත්ම ගෞරවය තියෙන බව මම පිළිගන්නවා. ඒක ශිෂ්‍යයන් ගේ ගතියක්. උවමනා නම් ඒක හරිගස්ස ගන්න පුළුවනි. අනෙක් අතින් රුසියන් ශිෂ්‍යයන් තුළ නිදහසට ආශාවක් කුඩා කාලයේ ඉඳල ම තියෙනවා. නිර්භය ව කල්පනා කරනවා. යමක් නිවැරැදි ව අවබෝධ කරගන්න පුළුවනි.........අනෙක් අතින් කවදාවත් බලය ඉදිරිපිට හිස නමන්නේ නැහැ. කොහොම වුණත් ජර්මන් ජාතිකයා ගේ කතාව ඇත්තයි. නමුත් ජර්මන් ජාතිකයන් නැති කළ යුතුයි. උන් විද්‍යාවට බොහො ම සමර්ථයි. බොහො ම ඥානවන්තයි. ඒ වුණත් ජර්මන් ජාතිකයන් නැති කළ යුතුයි."

"මොනවට ද ජර්මන් ජාතිකයන් නැති කරන්නේ!"යි අලෝෂා සිනා සෙමින් ඇසුවේ ය.

"මෙ පමණ වේලා මා කිවේ පිස්සු කතා. බොහො ම කනගාටුයි. සමහර විට මා පොඩි ළමයකු වගේ හැසිරෙන බව ඇත්තයි. ඒ වුණත් මගේ සිත් ගත් දේවල් ගැන මට නිශ්ශබ්ද ව ඉන්න බැරි ව විකාර දේවල් කියනවා. අර දෙස්තර කාමරයට ගිහින් දැන් බොහො ම වෙලාවක් වෙනවා. මිනිහා ඉලූෂා ගේ අම්මාත්, කොර වූ නීනාත් සෝදිසි කරනවා ඇති. මම නීනාට බොහො ම කැමැතියි. 'මීට කලින් නාවේ මොක ද?' කියා මා එළියට යනකොට ඇ මගෙන් සෙමෙන් ඇහැව්වා. ඇ බොහො ම හොඳ, බොහො ම කරුණාවන්ත තැනැත්තියක් වෙන්න ඕනෑ."

"ඔව්, ඇ කො තරම් හොඳ තැනැත්තියක් ද කියා පස්සේ දැන ගන්න පුළුවනි. මේ වගේ අය අඳුනා ගන්න ලැබීමෙත් ලොකු යහපතක් වෙනවා. බොහො ම දේවල් ඉගෙන ගන්න ලැබෙනවා" අලෝෂා ආදරයෙන් කී ය. "වෙන කිසි ම දෙයකට වඩා මේ දැනුම ඔබේ ජීවිතය කෙරෙහි බලපවත්වන්න පුළුවනි. එයින් ඔබ අමුතු කෙනෙක් වෙන්න පුළුවනි."

"මට බොහො ම කනගාටුයි වේලාසනින් එන්න නොහැකි වීම ගැන. ඒ ගැන මම මට ම සාප කරගත්තා"යි කොල්යා ශෝකයෙන් කී ය.

"ඔව්, කලින් නොපැමිණීම බොහො ම කනගාටු දයකයි. ඔබ දුටුවාට පස්සේ ඉලූෂා තුළ ඇති වූ සතුට දුටුවා නේ ද? ඔබේ නොපැමිණීම ගැන ඉලූෂා බොහො ම කනගාටු වුණා."

"ඔය ගැන කතා කරන්න එපා. මගේ කනගාටුව වැඩි වෙනවා. මට මේකෙන් හොඳ පාඩමක් ඉගෙන ගන්න ලැබුණා. මම නාවේ මගේ පුහු අහංකාර කම නිසයි. ආත්මාර්ථය නිසයි. මගේ මෘග ගතිය නිසයි. කො තරම් වෑයම් කළත් මට මේ පහත් ගතිවලින් නිදහස් වෙන්න අමාරුයි. මා වෑයම් කරන්නේ හොඳ මිනිහෙක් වෙන්නයි. නමුත් දැන් මට පේනවා නොයෙක් කරුණු අනින් මං නරක මිනිහෙක්ව සිටිය බව."

"නැහැ, ඔබ තුළ හොඳ ගතිගුණ තියෙනවා. මේ තත්‍යාග වන්ත ලාමක දරුවා කෙරෙහි ඔබේ ලොකු බලපෑවැත්මක් තියෙන්නේ මන් ද කියා මට තේරුම් ගන්න පුළුවනියි." ආලෝෂා ආදරයෙන් කී ය.

"අලෝෂා මට ඔය කතාව කියනවා.......මම කීප වතාවක් ම හිතුවා, දූනුත් හිතුවා ඔබ මා පහත් කොට සලකනවාය කියා. මා ඔබේ අදහස් බොහො ම උසස් කොට සලකන බව ඔබ දන්නවා නම්"යයි කොල්යා කී ය.

"හැබෑට ම, ඔය වයසේ දී ඔය තරම් ම ඉක්මනට කලබල වෙනව ද? දූන් ඔබ කතා කරන කොට මම කල්පනා කළා ඔබ බොහො ම ඉක්මනට කලබල වන ළමයෙක් ය කියා."

"හැබෑට ම, එහෙම කල්පනා කළා ද? ඔබට මහ පුදුම ඇස් දෙකක් නොවැ තියෙන්නේ! මම ඔට්ටුවක් අල්ලන්න කැමැතියි. මා ඉක්මනට කලබල වන ළමයෙක් බව දූන ගත්ත ඇත්තේ පාත්තයා ගැන කතාව කියන කොට වෙන්න ඇති. මා පුරසාරම් දෙඩන නිසා මා පහත් කොට සලකාවිය යන අදහස මා තුළ ඇති වූ වෙලාවේ දී වෙන්න ඇති. ඒ වෙලාවේ දී ඔබ ගැන මගේ හිතේ ලොකු වෛරයක් ඇති වුණා. ඒ වෛරය නිසා මම මෝඩයකු වගේ කතා කළා. දෙවියෙක් නැති නම් දෙවියෙක් මවන්න ඕනෑ ය කියා දූන් ටිකකට කලින් මා කියන කොට මට කල්පනා වුණා මම මගේ උගත්කම පෙන්නීමට වෑයම් කරනවා ය කියා. මා ඒ අදහස දූනගත්තේ පොතකින්. මම මගේ උගත්කම පෙන්නන්න හැදුවේ කිසි ම අහංකාර කමකින් නො වෙයි. මගේ කල්පනාවේ හැටියට මම එහෙම කළේ මගේ හිතේ තිබුණු ප්‍රීතිය නිසයි. ප්‍රීතිය නිසා අනෙක් මිනිසුන්ට තමන් ගේ උගත්කම පෙන්නීම නිත්‍ය සහගත දෙයක් බව මම දන්නවා. නමුත් දූන් මම දන්නවා ඔබ මා පහත් කොට නොසල-කන බව. ඒක මගේ හිතේ තිබුණු සැකයක් පමණයි. අලෝෂා මම ඉන්නේ බොහො ම කනගාටුවෙන්. සමහරක් වේලාවල දී මට නොයෙක් දේවල් ගැන කල්පනා වෙනවා. සමහර විට මට හිතෙනවා මුළු ලෝකය ම මා ගැන හිනා වෙනවා ය කියා. එතකොට මට හිතෙනවා හැම දෙයක් ම උඩයටි කොට පෙරළා වෙනස් කරන්න."

"එතකොට හැමෝ ම ඔබට භයවේවි"යි අලෝෂා සිනා සෙමින් කී ය.

"ඔව් ඒක ඇත්තයි. කිසි ම කෙනකුට මා පෙන්නන්න බැහැ. විශේෂයෙන් ම මගේ අම්මා මට බොහො ම බයයි. අාලෝෂා මට ඇත්ත කියන්න. මා දූන් හැසිරෙන්නේ මෝඩයකු හැටියට ද?"

"ඔය ගැන කල්පනා කරන්න එපා"යි ඇලෝෂා කී ය. "මෝඩයා කියන වචනයේ අදහස කුමක් ද? කවුද මෝඩ වැඩ නො කරන්නේ? මේ කාලේ සිටින දක්ෂ මිනිස්සු හැම තිස්සේ ම ඉක්තේ තමා ගේ අතින් මෝඩ වැඩක් කෙරේවිය යන බියෙන්. නමුත් මට පුදුම ඔබේ හිතෙත් මෙ තරම් ඉක්මනට ඒ විදියේ බියක් ඇතිවීම ගැනයි. මම ටික කාලයක ඉඳලා දුටුවා ඔබ තුළ පමණක් නො වෙයි වෙනත් ළමයින් තුළ පවා මේ විදියේ බියක් ඇති වෙනවා. ඒක එක්තරා විදියක පිස්සුවක්. යක්ෂයා මේ වේසය ගෙන මුළු බාල පරම්පරාවගේ ම සිත් තුළට වැදිල සිටිනවා"යි ඇලෝෂා කී ය. ඇලෝෂා දෙස ඇසි පිය නො සොල්වා බලා සිටි කොල්යා, ඇලෝෂා ගේ මුහුණේ ඇතිවේවි යැයි බලා-පොරොත්තු වූ සිනාව නුදුටුවේ ය. "ඔබත්, අනෙක් අය අතරත් වැඩි වෙනසක් නැහැ. නමුත් ඔබ අනෙක් අයට වඩා වෙනස් විය යුතුයි" ඇලෝෂා කතාව අවසන් කරමින් කී ය.

"හැම දෙනා ම එක විදිය නම් මොකද කරන්නේ?"

"ඔව්, හැම දෙනා ම එක විදිය නම් ඔබ පමණක් වෙනස් වීමට වෑයම් කරන්න. නමුත් ඔබ අනෙක් අයට වඩා වෙනෙසියි. තමා වැරැදි වැඩක්, නැති නම් පිස්සු වැඩක් කළ බව කීමට ඔබ ලැජ්ජා වුණේ නැහැ. මේ කාලේ මේ විදියට ඇත්ත කියන්නේ කවුද? කවුරුවත් කියන්නේ නැහැ. තමා විසින් ම තමා ගේ ගුණ දොස් විවේචනය කරගතයුතු ය කියා කිසි ම කෙනෙක් කල්පනා කරන්නේ නැහැ. අඩුගණනේ ඔබවත් අනෙක් අය අනුගමනය කරන්න එපා."

"බොහො ම හොඳයි. ඇලෝෂා ගැන මා ඇති කරගෙන හිටිය අදහස හරි. මිනිසුන් ගේ සිත් සනසන හැටි ඔබ දන්නවා. ඔබ අඳුනා ගැනීමට මම බොහො ම කාලයක ඉඳලා බලා සිටියා. ඔබ මා ගැන කල්පනා කළා ද? මා ගැන කල්පනා කළ බව දැන් කිව්වා නේ ද?"

"මට කොල්යා ගැන බොහො ම දේවල් ආරංචි වුණා. මම ඔබ ගැන කල්පනා කළා. ඔබ මේ ප්‍රශ්නය ඇහැව්වේ අහංකාර කමින් ද කියා මා දන්නේ නැහැ. අහංකාර කමින් ඇහැව්වත් වරදක් නැහැ"

"අලෝෂා, අපේ කතාව හරියට ආලය ප්‍රකාශ කිරීමක් වගෙයි" කොල්යා ලැජ්ජාවෙන් හා නොසන්සුන් කමින් යුතු ව කීවේ ය. "ඒක බොහො ම හාස්‍ය ජනක කතාවක් නේ ද?

"නැහැ නැහැ, හාස්‍ය ජනක වුණත් උසස් දෙයක් නිසා වරදක් වෙන්නේ නැහැ"යි අලෝෂා සෙමෙන් කී ය.

"ඔබේ හිතේ ලැජ්ජාවක් ඇති වුණා නේ ද? ඒ බව ඇස්-වලින් පේනවා"යි කොල්යා සඟවා ගත් ප්‍රීතියෙන් සිනාසී කීවේ ය.

"මොනවට ද ලැජ්ජා වෙන්නේ?"

"මොක ද එහෙනම් මූහුණ රතු වුණේ?"

"මා තුළ ලැජ්ජාවක් ඇති කළේ ඔබයි" අලෝෂා සිනා සෙමින් කී ය. ආයෙත් අලෝෂා ගේ මූහුණ සම්පූර්ණයෙන් ම රතු විය. "ඔව් මට ටිකක් ලැජ්ජා හිතුණා, දෙයියෝ දනී මොකද කියා."

"යම් කිසි කාරුණක් නිසා ඔබේ හිතේ ලැජ්ජාව ඇති වුණා, ඒ නිසා මේ මොහොතේ දී මම ඔබට බොහො ම ආදරෙයි. ඔබත් හරියට මා වගෙයි" කොල්යා කීවේ සිතේ හටගත් අවංක ප්‍රීතියෙනි. ඔහු ගේ කම්මුල් රතු විය. නෙත් බැබැළුණේ ය.

"මා කියන දෙය හොඳට අහගන්න. ඔබේ ජීවිතය බොහො ම සැපවත් වන බව මා දන්නවා"යි අලෝෂා හදිසියෙන් ම කී ය. ඒ නමුත් තමා එසේ කීවේ මන්දැයි ඔහු නොදන්නේ ය.

"කල්තියා ම ඒ ගැන දැනගත්තේ කොහොම ද කියා මා දන්නවා"යි කොල්යා අලෝෂා ගේ කතාවට එකඟ වෙමින් කී ය.

"කොහොම වුණත් ඔබ ජීවිතයට ආසිරිවාද කරාවි."

"බොහො ම සන්තෝෂයි. ඔබ සාන්තුවරයෙක්. අලෝෂා අපි හොඳ මිත්‍රයෝ වෙමු. මා සම තත්ත්වයේ කෙනකු ලෙස පිළිගෙන සැලකීම ගැන මට බොහො ම සන්තෝෂයි. ඒ වුණත් අපි සම තත්ත්වයේ අය නො වෙයි. ඔබ මට වඩා උසස්. කොහොම වුණත් අපි යහළුවෝ වෙමු. දන්නවා ද,

පසු ගිය මාසයේ දී මම නිතර මට ම කියා ගත්තා 'එක්කෝ අපි දෙන්නා එක්වර ම මිත්‍ර වෙමු, නැති නම් මිය යන තුරු සතුරු වෙමු'යි කියා."

"එහෙම කියලත් කොල්යා මට ආදරෙයි?" අලෝෂා සිනා සෙමින් කී ය.

"ඔව්, මම බොහො ම ආදරෙයි. මම අලෝෂා ගැන නිතර කල්පනා කළා. නමුත් කොහොම ද මේ සේරම කලින් දැන ගත්තේ? මෙන්න එනවා දොස්තර, අපි මොනව ද මිනිහගෙන් අහන්නේ? බලන්න මිනිහ ගෙ හැටි!"

හත් වන පරිච්ඡේදය

ඉලූෂා

ලෝම කබාය හොඳට පෙරවා ගෙන, හිස් වැස්ම පැළඳ ගත් දොස්තර කාමරයෙන් පිටත පැමිණියේ ය. ඔහු සිය ඇඳුම් පැළඳුම් අපිරිසුදු වේ ය යන බියෙන්, කෝපයෙන් හා කලකිරීමෙන් පසුවන බව පෙනේ. ගෙට පිවිසෙන ඉස්තෝප්පුව දෙස කුතුහලයෙන් බැලූ දොස්තර අනතුරු ව අලෝෂා දෙස බැලුවේ ය. අලෝෂා කරත්ත කාරයාට කතා කළෙත්, දොස්තර නැඟ පැමිණි කරත්තය දොර ළඟ නතර කරන ලදී. දොස්තර පිටුපසින් දිව ගිය කපිතන්, දෙකට නැමී දොස්තරට ආචාර කොට, බැගෑ බසින් අමතා, දොස්තර ගේ අවසාන තීරණය ලැබෙන තෙක් බලා සිටියේ ය. මේ අසරණ මිනිහා බියෙන් හා ශෝකයෙන් මිරිකී සිටින බව පෙනේ.

"අනේ හාමුදුරුවනේ...... හාමුදුරුවනේ......මගේ පුතා......" කියමින් කතාව පටන් ගත් කපිතන් ඊට වඩා කිසිවක් කියා ගත නො හැකි ව, සුන් වූ බලාපොරොත්තුවලින් යුතු ව, දත එක්කොට වැන්දේ ය. එහෙත් ඔහු තවමත් බැගෑ නෙතින් දොස්තර දෙස බලා සිටියේ දොස්තරගෙන් පැවැසෙන වචනයකින් හෝ තමා ගේ දරුවා ගේ මරණ දඬුවම වෙනස් කිරීමට හැකි වූවාක් මෙනි.

"මට කරන්න දෙයක් නැහැ. මම දෙවියන් වහන්සේ නො වෙයි." දොස්තර නොසැලැකිල්ලෙන් කීවේ පුරුදු මහත්තත්ත්වය පෙන්වමිනි.

"අනේ හාමුදුරුවනේ මගේ පුතා ඉක්මනට මැරෙයි ද?"

"ඕනෑ ම ඇබැද්දියකට සූදානමින් සිටින්න ඕනෑ"යි හැම වචනයක් ම සැලැකිල්ලෙන් පැවැසූ දෙස්තර බිම බලා එළිපත්ත උඩින් පැන කරත්තයට ගොඩ වුණේ ය.

"අනේ හාමුදුරුවනේ, ක්‍රිස්තුන් වහන්සේ ගේ නාමෙට මගේ පුතා බේරා ගන්න පුළුවන් ක්‍රමයක් නැද්ද?"යි කපිතන් ආයෙත් දෙස්තර නතර කොට බියෙන් ඇසුවේ ය.

"මට කිසි ම දෙයක් කරන්න බැහැ"යි දෙස්තර නො ඉවසිල්ලෙන් කී ය. "කොහොම වුණත් උඹට පුළුවන් නම් උඹේ පුතා දූත්ම සිරේකියුස්වලට යවපන්. ඒ පළාතේ දේශගුණය නිසා ලෙඩේ සනීප වෙන්න පුළුවනි." (දෙස්තර 'දූත් ම' යන වචනය කෝපයෙන් කී නිසා කපිතන් තැති-ගත්තේ ය.)

'සිරේකියුස්' යන වචනය කපිතන් යළි කීවේ දෙස්තර කී දෙය තේරුම් ගැනීමට නොහැකි වූවාක් මෙනි.

"සිරේකියුස් තියෙන්නේ සිසිලියේ"යි කොල්යා හදිසියෙන් ම කී ය. දෙස්තර ශිෂ්‍යයා දෙස බැලුවේ ය.

"අනේ හාමුදුරුවනේ මං කොහොම ද සිසිලියට යන්නේ? තමුන්නාන්සේට පේනවා නේද මගේ හැටි?"යි කපිතන් දූත වනා කීවේ තමා ගේ දිළිඳුකම පෙන්නීමට මෙනි. "මගේ නෝනා? මගේ පවුල?"

"උඹේ පවුලට සිසිලියට යන්න හොඳ නැහැ. වසන්ත කාලය පැමිණෙනවාත් එක්ක ම දුව කෝකෙස් කඳු පළාතට යවපන්......උඹේ නෝනා ගේ ප්‍රමේහවාතය සනීප වෙන්න නම් කෝකෙස් පළාතට ගිහින් වතුර නාන්න ඕනෑ. ඊට පස්සේ පිස්සුව හොඳ කර ගන්න පැරිසියට ගිහින් විශේෂඥයකුගෙන් බෙහෙත් ගන්න ඕනෑ."

"තමුන්නාන්සේට පේනවා නේ ද"?යි කපිතන් යළි අත වනා තම දිළිඳුකම පෙන්වමින් කී ය.

"ඒක මට අයිති වැඩක් නො වෙයි" දෙස්තර සිනාසෙමින් කී ය. "මම කිව්වේ උඹේ ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් පවුලේ ලෙඩුන් සනීප කළ හැකි පිළිවෙළ ගැනයි. උඹේ දුප්පත්කම ගැන මට බොහො ම කනගාටුයි."

"හග වෙත්න එපා ඇපෝතිකරි, බල්ලා කත්තේ නැහැ"යි කොල්යා හඬ නඟා කීවේ දෙස්තර දොර ලඟ සිටි බල්ලා දෙස සැකයෙන් බැලූ හෙයිනි. කොල්යා ගේ කට හඬේ කෝපය හඟවන ගතියක් විය. දෙස්තර වෙනුවට ඇපෝතිකරි යන වචනය පාවිච්චි කළේ දෙස්තරට අපහාස කිරීමේ අදහසින් බව කොල්යා පසු ව කී ය.

"මොකක් ද උඹ කිව්වේ?"යි දෙස්තර ආපසු හැරී කොල්යා දෙස බලා පුදුමයෙන් ඇසී ය. "උඹ කවුද?"යි ඔහු අලෝෂා-ගෙන් ඇසුවේ තමා ගේ ප්‍රශ්නයට පිළිතුරක් බලාපොරොත්තු වන්නාක් මෙනි.

"පෙරුසුවාන් අයිති මටයි. මා ගැන කරදර වෙන්න එපා"යි කොල්යා කලබල නො වී කී ය.

"පෙරුසුවාන්?"යයි දෙස්තර ඇසුවේ එය බල්ලා ගේ නම බව නො දැන ය.

"පෙරුසුවාන්ට සිනු හඬ ඇහෙනවා. නමුත් කොහෙ ඉඳල ඇහෙනව ද දන්නේ නැහැ. ආයුබෝවන්, අපි සිරේකියුස්-වල දී හමුවෙමු."

"කවුද මේ කොල්ලා? කවුද මේ කොල්ලා?"යි දෙස්තර කෝපයෙන් කෑගා ඇසුවේ ය.

"ඉස්කෝලෙ යන ලමයෙක්"යයි අලෝෂා කොල්යා දෙස රවා බලා වහා කී ය. "බොහො ම දඟයි. ඒ ලමයා කියන දේවල් ගණන් ගන්න එපා........ කොල්යා, කට වහගෙන ඉන්න"යි කී අලෝෂා "ඒ ලමයා කියන දෙය ගණන් ගන්න එපා"යයි ආයෙත් කී ය.

"මේ කොල්ලට හොඳට තලන්න ඕනෑ"යි දෙස්තර කීවේ කෝපයෙනි.

"ඇපෝතිකරි බලාගෙනයි, මගෙ බල්ලා හපන්න පුළුවනි"යි සුදුමැලි වී සිටි කොල්යා වෙව්ලන කටහඬින් කී ය.

"කොල්යා, තවත් කතා කළොත් මම කවදාවත් ඔබ ආශ්‍රය කරන්නේ නැහැ"යි අලෝෂා, වහා පිළිපැදිය යුතු නියෝගයක් කරන්නාක් මෙන් කී ය.

"කොල්යා කරොස්කින්ට අණ කරන්න පුළුවන් එක ම තැනැත්තා මේ පුද්ගලයා විතර යි" කොල්යා අලෝෂා පෙන්නමින් කී ය. "මම ඒ පුද්ගලයාට කීකරු වෙනවා. මම ගිහින් එන්නම්."

අනතුරු ව කොල්යා වහා දොර ඇරගෙන කාමරයට ඇතුළු වූයේ ය. පෙරුසුවන් ද ස්වාමියා පසු පසින් ගියේ ය. අලෝෂා දෙස පුදුමයෙන් බැලූ දොස්තර සාප කරමින් කරත්තය ලඟට ගියේ ය. කරත්තයට නැඟ ගැනීමට ඔහුට උපකාර වීම පිණිස කපිතන් වහා ඉදිරිපත් විය. අලෝෂා ද කොල්යා පසු පසින් කාමරයට ගියේ ය. කොල්යා ඉලූෂා ගේ ඇඳ ලඟ සිටියේ ය. කොල්යා ගේ අත අල්ලා ගත් ඉලූෂා තාත්තාට කතා කෙළේ ය. මිනිත්තුවකට පමණ පසු කපිතන් ද පැමිණියේ ය.

"තාත්තේ, තාත්තේ, එන්න......අපි...... "යි ඉලූෂා නොසන්සුන් වෙමින් කී ය. එහෙත් කතා කර ගත නොහැකි වූවාක් මෙන් දරුවා හදිසියෙන් ම දූත කොල්යා ගේ හා තාත්තා ගේ ඉඟ වටේ දමා තදින් බදාගෙන දෙදෙනා ම සිඹගත්තේ ය. කපිතන් ඉකිගසමින් අඬන්නට විය. ඔහු ගේ සර්වාංගය ම වෙව්ලුවේ ය. කොල්යා ගේ දෙතොල් හා නිකට වෙව්ලන්නට විය.

"තාත්තේ තාත්තේ, මට තාත්තා ගැන බොහෝ ම කනගාටුයි" ඉලූෂා ශෝකයෙන් කී ය.

"පුතා බය වෙන්න එපා.........දොස්තර මහත්මයා කිව්වා පුතාට සනීප වේවි කියා......... ඊට පස්සේ අපට බොහෝ ම සන්තෝෂයෙන් ඉන්න පුළුවනි."

"නැහැ නැහැ තාත්තේ........ මම දන්නවා දොස්තර මහත්මයා මා ගැන කියාපු දෙය.........මම දැක්කා" මෙසේ පැවසූ ඉලූෂා යළි දෙදෙනා ම වැලඳ ගෙන පියා ගේ උරහිස මත මූහුණ සඟවා ගත්තේ ය.

"තාත්තේ අඬන්න එපා. මා මළාට පස්සේ හොඳ ළමයෙක් ලබාගෙන, ඉලූෂා කියා නම තියා මා වෙනුවට ඒ ළමයාට ආදරය කරන්න."

"කැගාන්න එපා ඉලූෂා, ඉලූෂාට සනීප වේවි"යි කොල්යා හදිසියෙන් ම කී ය. ඔහු ගේ කටහඬේ කෝපය හඟවන ගතියක් විය.

"කවදාවත් මා අමතක කරන්න එපා" ඉලූෂා කී ය, "හැම දාම මගේ වළ බලන්න එන්න ඕනෑ. තාත්තේ අපි ඇවිදින්න යන කොට මහ තියෙන ගලක් ළඟ නතර වෙනවා නේද? අන්න ඒ ගල ළඟ මා වළලන්න. කොල්යා එක්ක සවසට මා බලන්න එන්න......පෙරෑසුවානුත් එක්ක එන්න......මම බලාපොරොත්තු වෙනවා.........තාත්තේ, තාත්තේ!"

ඉලූෂාට කතාකරගත නො හැකි විය. ඔවුහු තිදෙනා ම නිහඬ වූ හ. එහෙත් තවමත් ඉලූෂා, පියාත් කොල්යාත් වැළඳ-ගෙන සිටියේ ය. පුටුව උඩ හිඳ සිටි නීනා ද අඬන්නට වූවා ය. හැම දෙනා ම අඬන බව දුටු අම්මා ද අඬන්නට වූවා ය.

"ඉලූෂා! ඉලූෂා"යි කියමින් ඈ ඇඹුවා ය.

කොල්යා හදිසියෙන් ම ඉලූෂා ගේ ග්‍රහණයෙන් මිදුණේ ය.

"දැන් ඉතින් මම යනවා. කෑම කන්න අම්මා මා එනකන් බලා ඉන්නවා"යි කොල්යා වහා කී ය. "ඉලූෂා ගැන අම්මාට කියන්න අමතක වුණා. කිව්වා නම් අම්මා බොහො ම ලොකු කැලෑකිල්ලක් දක්වාවි. කෑම කාලා මුළු රෑ ම ඉලූෂා එක්ක ඉන්න මම ආපසු එන්නම්. මම නොයෙක් විදියේ කතාන්තර කියන්නම්. පෙරෑසුවාත් එක්ක එන්නම්. දැන් තියල යන්න බැහැ. මා නැති ව උඹු බුරන්න පටන් ගනීවි. ඒක ඉලූෂාට මහ කරදරයක්. මං ගිහිත් එන්නම්."

මෙසේ පැවැසූ කොල්යා වහා කාමරයෙන් පිට වී ඉස්තෝප්පුවට ගියේ ය. කාමරයේ දී නො අඬා සිටිය හෙතෙම ඉස්තෝප්පුවට පැමිණි වහා ම අඬන්නට පටන්ගත්තේ ය. අලෝෂා පැමිණෙන විට කොල්යා අඬමින් සිටියේ ය.

"කොල්යා ඔබ පොරොන්දු වුණා වගේ ආපසු එන්න ඕනෑ. නැති නම් ඉලූෂා ගේ හිත නරක් වෙනවා"යි අලෝෂා කී ය

"වරදින්නේ නැති ව එනවා. මීට කලින් නො පැමිණීම ගැන මට බොහො ම කනගාටුයි" කොල්යා අඬමින් කී ය. ඇඬීමට ඔහු ලැජ්ජා නො වී ය.

ඒ මොහොතේ දී කපිතන් කාමරයෙන් පිට වී දොර වැසුවේ ය. ඔහු ගේ මුහුණ පිස්සකු ගේ මුහුණට සමාන විය. ඔහු ගේ තොල් වෙවුලුවේ ය. අලෝෂා හා කොල්යා අතරේ සිටගත් හේ දෑත වනමින් මෙසේ කී ය.

"මට හොඳ ළමයෙක් උවමනා නැහැ. තවත් ළමයෙක් උවමනා නැහැ"යි ඔහු දත් සපමින් කී ය. "ක්‍රිස්තුන් වහන්ස, මට ඔබ වහන්සේ අමතක වුණත් මගේ දිව...... ..." ඔහුට කතා කරගත නො හැකි විය. ඉකිගසමින් අඬන්නට පටන්ගත් හෙතෙම බත්කූව ලඟ දණින් වැටුණේ ය. දෑතින් හිස බදාගත් ඔහු අඬන්නට විය. එහෙත් කාමරයට ඇසේ ය යන බියෙන් ඇඬීම වළකමින් මැඩ ගත්තේ ය.

කොල්යා මඟට බැස්සේ ය.

"මම ගෙදර යනවා. අලෝෂා හවසට එනවා නේද?"යි කෝපයෙන් ඇසුවේ ය.

"ඔව් වරදින්නේ නැති ව එනවා."

"ඉලූෂා ගේ තාත්තා යේරුසලම ගැන කිව්වේ මොකක් ද? මොකක් ද ඒකේ අදහස?"

"ඒක බයිබලයේ පාඨයක්. 'මට යේරුසලම අමතක වුණොත්' යන පාඨයෙන් අදහස් කරන්නේ 'මා උතුම් කොට සලකන හැම දෙයක් ම අමතක වී ඒ ස්ථානය වෙනුවට මා වෙන දෙයකට ඉඩ දුන්නොත් මගේ දිව........."

"මට තේරුණා. ඔය ඇති. හවසට එන්න අමතක කරන්න එපා. පෙරුසුවාත් වරෙන්" කියා අනතුරු ව බල්ලාට කතා කළ කොල්යා වහා ගෙදර ගියේ ය.

එකළොස් වන ග්‍රන්ථය

ඉවාන් කරමසෝ

පළමු පරිච්ඡේදය

ගෲසෙන්කා ගේ ගෙදර විත්ති

අලෝෂා, ගෲසෙන්කා හමුවීම පිණිස දේවස්ථාන චතුරශ්‍රයෙහි වෙසෙන මෝරාසෝව් වැන්දඹුව ගේ නිවෙස බලා ගියේ ය. වහා තමා හමුවන ලෙස දන්වා එ දින උදේ ගෲසෙන්කා, පෙමියා අත අලෝෂාට පණිවිඩයක් යැව්වා ය. පෙර දින සිට ගෲසෙන්කා සොවින් පසුවන බව අලෝෂා පෙමියාගෙන් අසා දැනගත්තේ ය. මීතියා සිරභාරයට ගත් පසු ගිය දෙ මස තුළ අලෝෂා නිතර ගෲසෙන්කා බැලීමට ගියේ ය. ඇතැම් විට ඔහු සිය කැමැත්තෙන් ම ගෲසෙන්කා බැලීමට යන අතරේ අනෙක් අවස්ථාවල දී ගියේ මීතියා ගේ ඉල්ලීම නිසා ය. මීතියා සිරභාරයට ගෙන තෙ දිනකට පසු ගෲසෙන්කා රෝගාතුර වූවා ය. ඈ සුවය ලැබුවේ සති පහකට පමණ පසු ව ය. පුරා සතියක් ම ගෲසෙන්කා සිහි නැති ව සිටියා ය. පසු ගිය දෙ සතිය තුළ නිවෙසින් බැහැර යාමට තරම් සුව වී සිටියත් ඈ බෙහෙවින් වෙනස් වූවා ය. ඈ වතින් සුදු මැලි වූ අතර ගතින් සිහින් වූවා ය. එහෙත් දූත් ඈ පෙරට වඩා දකුම්කලු යැයි අලෝෂා කල්පනා කෙළේ ය. ඇය හමු වූ හැම විට ම ඇගේ නෙත් දෙස බැලීම ඔහුට මහත් ප්‍රීතියකි. එඩිතර ගතියක් සමඟ ඥානවන්තකමක් ඇගේ මුහුණේ ඇඳී තිබිණි. ඇය තුළ ආධ්‍යාත්මික පෙරළියක් ඇති වූ බව ද පෙනේ. කිසිවකට වෙනස් කළ නො හැකි අහිංසක එඩිතර ගතියක් ඇය තුළ දක්නා ලදි. ඇස් බැම අතරේ තිබුණු සිහින් ඉර නිසා ඇගේ සිත්කලු මුහුණට කල්පනාකාරී ගතියක් ආරූඪ විය.

පළමු වරට දකින්නකුට ඇය පෙනෙන්නේ මදක් සැරපරුෂ ගති ඇත්තියක මෙනි. මීට පෙර ඇය තුළ නිතර දක්නා ලද විහිළු - තහළුවට ඇති කැමැත්ත දුන් නැති.

ගෘසෙන්කා විවාහ ගිවිසගත් මොහොතේ දීම ඇගේ පෙම්වතා ඉතා භයානක මිනීමැරුමක් නිසා හිරභාරයට ගන්නා ලදි. නඩු විභාගය අවසානයේ දී ලැබෙන ඉරණම ගැන ද වඩා සැක ඇතිකිරීමට ඉඩක් නැති. අනතුරු ව ගෘසෙන්කා රෝගාතුර වූවා ය. මෙවැනි විපත් වැලකට අසු වූ ගෘසෙන්කා තුළ පෙර පැවැති තුරුණු සතුට හා උද්යෝගය නැති නොවීම අලෝෂා ගේ පුදුමයට හේතු වී ය. වරක් අහංකාරකමින් බැබැළුණු ඇගේ දෑස දැන් ගත සිත සනසන ආලෝකයකින් බැබැලෙයි. එහෙත් සිත නොසන්සුන් කරන අදහසක් හෝ හැඟීමක් හෝ හදවතට ඇතුළු වූ විට ඇගේ දෑස ආයේත් අර පැරණි දුෂ්ට කෝපාග්නියෙන් බැබැලෙයි. ඇගේ සිත නොසන්සුන් කළේ එක ම දෙයකි. එ නම් කැතිරිනා පිළිබඳ අදහසයි. රෝගයෙන් සිහි විකල ව සිටින විට පවා ගෘසෙන්කා නිතර කැතිරිනා ගැන සඳහන් කළා ය. කැතිරිනා ගැන ඇය තුළ බලවත් ඊර්ෂ්‍යාවක් පවතින බව අලෝෂා දැන සිටියේ ය. තමා කැමැති විටක දී මීත්‍යා හමුවීමට අවසර තිබුණත් කැතිරිනා තව ම මීත්‍යා හමුවීමට සිරගෙට නොගියා ය. ගෘසෙන්කා ඇගේ සිතේ පැසෙන දුක්වේදනා නිතර අලෝෂාට පවසා, කළ නොකළ යුතු දෑ විමසන හෙයින් මේ සියල්ල අලෝෂාට විශාල ප්‍රහේලි- කාවක් විය. සමහර විට ගෘසෙන්කාට කුමන අවවාදයක්, අනුශාසනාවක් දිය යුතු දැයි ඔහු නොදන්නේ ය.

අලෝෂා ගෘසෙන්කා ගේ කාමරයට පිවිසියේ මහත් නොසන්සුන්කමින් යුතු ව ය. පැය භාගයකට පමණ කලින් මීත්‍යා බලන්නට ගිය ගෘසෙන්කා ගෙදර පැමිණ සිටියා ය. ඇ මහත් නොඉවසිල්ලෙන් තමා ගේ පැමිණීම බලාපොරොත්තු ව සිටින බව අලෝෂා දැනගත්තේ තමා දුටු වහා ම ඇ හිඳ සිටි පුටුවෙන් නැගී සිටි සැටියෙනි. ඇ සෙල්ලම් කරමින් සිටි කාඩ් කුට්ටම මේසය උඩ තිබිණි. අනෙක් පැත්තේ තබා තුබුණු සමින් වසන ලද සෝපාව උඩ මැක්සිමෝ් දිග ඇදී සිටියේ ය. ඔහු ප්‍රීතියෙන් සිනාසුණ මුත් අසනීපයෙන් දුබල වී සිටින බව පෙනිණි. මීට දෙමසකට පෙර මූක්රෝවේ සිට ගෘසෙන්කා සමඟ පැමිණි, ගෙයක් දෙරක් නැති මේ මහල්ලා, මෙතෙක් ගෘසෙන්කා ගේ ගෙදර නතර වී සිටියේ ය. වැස්සෙන්

තෙමී මඩ තවරා ගෙන පැමිණි හෙතෙම සෝපාව උඩ හිඳ අහිංසක සිනාවක් දක්වා තුෂ්ණිම්භූත ව ගෘසෙන්කා දෙස බලා සිටියේ ය. ගෙදර පැමිණි, දුඹ් ශෝකයෙන් හා අසනීපයෙන් පෙළෙන ගෘසෙන්කාට, පැය භාගයක් පමණ ගතවනතුරු මහලු මැක්සිමෝ ගැන සම්පූර්ණයෙන් ම අමතක විය. ඈ හදිසියෙන් ම මහල්ලා දුටුවා ය. මහල්ලා ද අහිංසකයකු ලෙස සිනාසුණේ ය. ගෘසෙන්කා වහා පෙමියාට කතා කොට මැක්සිමෝට කන්නට දෙන ලෙස නියම කළා ය. එදා මුළු දවස ම මැක්සිමෝ එක තැනකට වී හිඳ සිටියේ ය. එහෙත් අඳුරු වැටුණු පසු පෙමියා ගෘසෙන්කා අමතා "නෝනමහත්මයා, මේ මහත්මයා අද රෑට මෙහි නතරවෙනවා ද?" යි ඇසුවා ය.

"ඔව්, නිදාගන්න අර සෝපාව පිළියෙළ කරල දීපන්" යයි ගෘසෙන්කා කීවා ය.

තමාට යන්නට තැනක් නැති බවත්, තමා ගේ ආරක්ෂකයා ව සිටි කල්ගානෝ මහතා මීට පසු තමා ගෙදරට වැද්ද නොගන්නා බව පවසා තමාට රූබල් පහක් දුන් බවත්, වැඩි දුරටත් තොරතුරු විමසූ ගෘසෙන්කාට මැක්සිමෝ ගෙන් දැනගන්නට ලැබිණි.

"උඹට දෙසියක් ගේ පිහිටයි. කොහෙවත් යන්න උවමනා නැහැ. මෙහෙ නවතින්න පුළුවනි" යි දුකෙන් සිටි ගෘසෙන්කා අනුකම්පාවෙන් සිනා සී මැක්සිමෝට කීවා ය. ඇගේ ඒ සිනාවෙන් මහල්ලා ගේ හදවත උණු විය. කෘතඥතාවෙන් ගටගත් කඳුළින් ඔහු ගේ දෑස පිරුණේ ය. දෙතොල් වෙව්ලුවේ ය. ඉබාගාතේ යමින් සිටි අනාථයකු වූ මහල්ලා එ තැන් සිට ගෘසෙන්කා ගේ ගෙදර නතර විය. ගෘසෙන්කා අසනීපයෙන් සිටින විට පවා ඔහු ගෙයින් පිට නොගියේ ය. පෙමියා හා ඇගේ මුත්තණිය වන ගෙදර ප්‍රධාන සේවිකාව ද, මහල්ලා ගෙදරින් නො පන්නා ආහාර පානයෙන් සංග්‍රහ කොට නිදා ගැනීමට සෝපාව පිළියෙළ කර දුන්හ. ගෙදර නතර වී සිටින මහල්ලා ගේ ආශ්‍රයට පුරුදු වූ ගෘසෙන්කා, මිතියා බැලීමට ගොස් ආපසු පැමිණ, සිතේ කකියන දුක මගහැර ගැනීම පිණිස ඉතා සුළු වේලාවක් නොවැදගත් දේවල් ගැන මහල්ලා සමග කතා කළා ය. මහල්ලා තැනට සුදුසු කතා කීමේ දක්ෂයකු නිසා අන්තිමේ දී ගෘසෙන්කාට මහල්ලා ගේ ආශ්‍රය නැති ව බැරි විය. ගෘසෙන්කා අලෝෂා හැර වෙන කිසිවකු නිතර දැක හමු වී ආශ්‍රය නොකළා ය. දිනපතා ගෘසෙන්කා හමුවීමට

නොගිය අලෝෂා, ගිය දිනවල දී පවා වැඩි වේලාවක් රැඳී නොසිටියේ ය. ඇගේ මහලු වෙලෙන්ද, මේ දිනවල ඉතා අසාධ්‍ය තත්ත්වයකයි සිටියේ. නගරයේ පැතිර ගිය ආරංචියේ හැටියට ඔහු සිටියේ 'වළේ පයකුයි ගොඩ පයකුයි' ඇති ව ය. මීතියා ගේ නඩුව අවසන් වී සතියකට පසු ඔහු මිය ගියේ ය. මිය යාමට සති තුනකට පෙර තමා ගේ අවසානය පැමිණ තිබෙන බව දැනගත් මහල්ලා අන්තිමේ දී පුතුන් හා ඔවුන් ගේ අඹුදරුවන් උඩු මහලට කැඳවා, ආයේත් තමා අත්හැර නොයන ලෙස ඉල්ලා සිටියේ ය. අනතුරු ව, ඒ මොහොතේ සිට ගෲසෙන්කාට ගෙට ගොඩ වීමට අවසර නොදෙන ලෙස සේවකයන්ට අණ කළ මහල්ලා ඇය පැමිණියහොත් 'අපේ ස්වාමියා නුඹට දීර්ඝායුෂ හා සැපවත් ජීවිතයක් ලැබේවායි කියා ප්‍රාර්ථනා කොට මීට පසු එතුමා අමතක කරන ලෙස ඉල්ලා සිටියා'යි කියා දන්වන ලෙස නියම කෙළේ ය. එහෙත් ගෲසෙන්කා දිනපතා මහලු වෙලෙන්ද ගේ සැපදුක් විමසා යැව්වා ය.

"හා අන්තිමේ දී අලෝෂා ආවා!"යි ප්‍රීතියෙන් තරුණියා පිළිගනිමින් පැවසූ ගෲසෙන්කා සෙල්ලම් කරමින් සිටි කුට්ටම මේසය උඩ දමා නැගී සිටියේ ය. "අලෝෂා නො එන්න පුළුවනි කියා මැක්සිමෝව් මා භය කළා. මම අලෝෂා එනතෙක් නොඉවසිල්ලෙන් බලා සිටියා. මේසය ළඟින් වාඩි වෙන්න, මොනව ද බොන්නේ? කෝපි බොනව ද?"

"කෝපි හොඳයි. මට බොහො ම බඩගිනියි" කියමින් අලෝෂා මේසය ළඟින් හිඳගත්තේ ය.

"මා හිතුවා කෝපි බොයි කියා......පෙනියා, පෙනියා, ඉක්මනට කෝපි ගෙනෙන්. කෝපි පිළියෙළ කරලා හුඟ වෙලාවක් වෙනවා. අර පස්තෑල ටිකකුත් ගෙනෙන්, හැබැයි රස්නෙට තියෙන්න ඕනෑ. දන්නව ද! මේ පස්තෑල නිසා අද ලොකු කෝලාහලයක් ඇති වුණා නොවැ. මම මීතියාට දෙන්න පස්තෑල අරන් ගියා. එයා ඒවා නො කා මගේ මූණට දමල ගැහැව්වා. එකක් බිම දමා පයින් පෑගුවා. 'මම මේවා වෝඩන් ළඟ තියල යනවා. සවස් වෙන්න ඉස්සෙල්ලා පස්තෑල නො කැවොත් මීතියා ජීවත් වෙන්නේ ආහාරයෙන් නො ව නපුරුකමින් බව අප පිළිගන්නවා"යි මම මීතියාට කියා ආපසු ආවා. හැම දා ම මා ගිය දාට අප අතර කෝලාහලයක් ඇති වෙනවා."

මහත් නොසන්සුන්කමින් සිටි ගෘසෙන්කා මේ පැමිණිල්ල එක හුස්මට ම කියා නිම කළා ය. ඒ අතරේ බයාදු කමින් සිටි මහලු මැක්සිමෝ බිම බලා ගෙන සිනාසුණේ ය.

"මේ පාර මොනව ගැන ද කෝලාහල කරගත්තේ?"යි අලෝෂා විමසුවේ ය.

"කෝලාහාලයක් වේ ය කියා මා හීනයකින්වත් හිතුවේ නැහැ. අර පෝලන්ත ජාතිකයා ගැන මීතියා ගේ හිතේ ලොකු ඊර්ෂ්‍යාවක් තියෙනවා. 'මොනවට ද අර පෝලන්ත ජාතිකයා කියා ගෙන ඉන්නේ?' කියා මීතියා මට බැන්නා. එයා ගේ හිතේ මා ගැන ලොකු ඊර්ෂ්‍යාවක් තියෙනවා. කන්නෙ බොන්නෙත්, නිදියන්නෙත්, ඊර්ෂ්‍යාවෙන්. ගිය සුමානේ, මරණාසන්න ව සිටින අර මහලු වෙළෙන්ද, මතක් කරලා මට බැන්නා."

"නමුත් පෝලන්ත ජාතිකයා ගෘසෙන්කා එක්ක හිටිය බව මීතියා මීට කලින් දැන ගෙන හිටියා නේ ද?"

"ඔව්, ඒක තමයි මා කියන්නේ, මුල සිට ම පෝලන්ත ජාතිකයා ගැන මීතියා දැන ගෙන හිටියා. නමුත් අද හිටි හැටියේ ම ඒ ගැන මතක් කරලා මට බැන්නා. එයා කියාපු දේවල් කියන්න මට ලැජ්ජයි. පිස්සු මිනිහා. මා එනවාත් එක්ක ම රැකිටින් ගියා මීතියා බලන්න සමහර විට මීතියා කුළප්පු කරන්නේ රැකිටින් වෙන්න ඇති. මොකක් ද අලෝෂා ගේ කල්පනාව?"යි ඈ නොසැලැකිල්ලෙන් ඇසුවා ය.

"අයියා ඔබ ගැන ඊර්ෂ්‍යා කරන්නේ ඔබට ආදරය නිසයි. අයියා ඔබට බොහෝ ම ආදරය ඇති. දැන් තමයි අයියා ඔබ ගැන කල්පනා කරලා කරදර වෙන්නේ."

"හෙට නඩුව පටන් ගන්න නිසා මීතියා ගේ හිතට කිසි ම සැනසීමක් නැති ව ඇති. මා ගියේ නඩුව ගැන කතා කරන්නයි. හෙට මොනව වෙයි ද කියා මට හිතන්නවත් බයයි. ඔබ කියනවා මීතියා ගේ හිතට සැනසීමක් නැහැ කියා. මගේ හිතටත් කිසි ම සැනසීමක් නැහැ. මේ වෙලාවේ අර පෝලන්ත ජාතිකයා මතක් කරලා මට බැණීම කොතරම් ලොකු මෝඩ කමක් ද? මහලු මැක්සිමෝ ගැන විතරයි තව ම මට මතක් කරල නො බැන්නේ."

"මගේ නෝනාත් ඔහොම තමයි. මා ගැන ලොකු ඊර්ෂ්‍යාවකින් පසුවුණා"යි මහලු මැක්සිමෝ ද කතාවට එක්වෙමින් කී ය.

"මොනවා, නුඹේ නෝනා නුඹ ගැන ඊරිසියාවෙන් හිටියා? ඈ ඊරිසියා කළේ කා ගැන ද?"යි ගෲසෙන්කා හැම දෙයක් ම අමතක කොට සිනා සෙමින් විමසුවා ය.

"වැඩකාර කෙල්ලත් ගැන."

"පිංසිද්ද වෙයි කතා නො කර ඉන්න. මා ඉන්නේ හිනා වෙන්න පුළුවන් තත්ත්වයක නො වෙයි. මා ඉන්නේ බොහො ම තරහෙන්. ඔය පස්තෑල දිහා බලන්න එපා. නුඹට දෙන්නේ නැහැ. වොඩ්කා දෙන්නෙත් නැහැ. හරියට දත්සැලක් දමාගෙන මිනිසුන්ට සංග්‍රහ කරනවා වගේ මා මෙයාට සංග්‍රහ කරන්න ඕනෑ"යි කියා ගෲසෙන්කා අනතුරු ව සිනාසුණා ය.

"ඔබේ ආගන්තුක සංග්‍රහය ලැබීමට තරම් මා සුදුස්සෙක් නො වෙයි" මහල්ලා අඩමින් කී ය. "මට වඩා ප්‍රයෝජනය ඇති අයට සංග්‍රහ කරන එක මට සංග්‍රහ කරනවාට වඩා හොඳයි."

"ප්‍රයෝජන නැති කෙනෙක් නැහැ. අසවලාට වඩා අසවලා ප්‍රයෝජනවත් ය කියා අපට කියන්න පුළුවන් කමක් නැහැ. අර පෝලන්ත ජාතිකයා නොසිටියා නම් කො තරම් හොඳ ද? අද ඒ මිනිහාටත් සනීප නැහැ මම එයාත් බලන්න ගියා. මම ඕනෑ කමින් ම එයාටත් පස්තෑල ටිකක් යවනවා. මම එයාට පස්තෑල යැව්වේ නැහැ. නමුත් පස්තෑල යැව්යා ය කියා මිත්‍යා මට බැන්නා. බැන්න නිසා ම යවනවා. මෙන්න පෙම්යා ලියමනක් අරන් එනවා. හා ඒක පෝලන්ත ජාතිකයා එවාපු ලියුමක්. තව වතාවක් සල්ලි ඉල්ලා කන්නලව් කරනවා ඇති."

පෝලන්ත ජාතිකයා ගෲසෙන්කා ගෙන් රූබල් තුනක් ඉල්ලා කන්නලව් කොට, ව්‍යක්ත බසින් ලියන ලද ඉතා දිග ලියුමක් එවා තිබිණි. එම මුදල තුන් මසකින් ආපසු ගෙවන බව දන්වා පෝලන්ත ජාතිකයන් දෙදෙනා විසින් අස්සන් කරන ලද කුයිතාන්සියක් ද ලියමන සමග තිබිණි. පසු ගිය දෙ.සතිය තුළ ගෲසෙන්කාට ඇගේ පළමු පෙම්වතාගෙන් කුයිතාන්සි සමග මෙ වැනි ලියුම් කීපයක් ම ලැබිණි. තමා අසනීප ව සිටිය දී පෝලන්ත ජාතිකයන් දෙදෙනා තමා ගේ ලෙඩ බැලීමට පැමිණි බව ද ගෲසෙන්කා දැන සිටියා ය. පළමු ව ගෲසෙන්කාට ඔවුන් ගෙන් ලැබුණේ පවුලේ ලාංඡනය සහිත

කඩදාසියක ලියන ලද දිග ලියුමකි. ඉතා අලංකාර ව්‍යක්ත බසින් ලියන ලද එම ලියුමෙන් භාගයක් කියවා ඉවත දැමීමේ ඇයට එහි අගමුල නොතේරුණු හෙයිනි. ඒ දවස්වල ඇයට ලියුම් ලිවීමට තරම් ශක්තියක් නො තිබිණි. ඉතා ඉක්මනින් ගෙවන බව දන්වා රූබල් දෙදහක් ඉල්ලා පසු දින ද ඇයට ලියුමක් ලැබිණි. ගෲසෙන්කා එම ලියමනට ද පිළිතුරු නො යැව්වා ය. අනතුරු ව දවසක් ඇර දවසක් ඇයට ලියුම් ලැබෙන්නට විය. ඉල්ලන මුදල් ප්‍රමාණය ද ක්‍රමයෙන් අඩු විය. ගණන රූබල් සීයට බැස්සේ ය. අනතුරු ව සීය විස්සට ද විස්ස දහයට ද බැස්සේ ය. අන්තිමේ දී රූබල් එකක්, ඉල්ලා කුසිතාන්සියක් සමඟ ඇයට ලියුමක් ලැබිණි.

ගෲසෙන්කා තුළ හදිසියෙන් ම අනුකම්පාවක් ඇති වූ හෙයින්, අඳුරු වැටෙන වේලේ ඇ ඔවුන් වෙසෙන තැනට ගියා ය. ඔවුන් දෙදෙනා බඩට ආහාරයක් හෝ බීමට සිගරැට්ටුවක් හෝ නැති ව ගෙවල් හිමිකාරියට ණය ගැති වී ඉතා දුකසේ සිටින බව ගෲසෙන්කා දුටුවා ය. මුක්රෝයේ දී මීතියා ගෙන් වංචා කොට ගත් රූබල් දෙසීය, ටික දවසකින් ම අවසන් විය. එහෙත් ඔවුන් ගේ අහංකාරකම හා පුරවර්ණය දුක ගෲසෙන්කා පුදුම වූවා ය. ඈ මේ පුවත මීතියාට කියා සිනාසුණා ය. මීතියා තුළ ඒ ගැන කිසි ම අමනාපයක් ඇති නො වී ය. එහෙත් එදා සිට පෝලන්ත ජාතිකයන් දෙදෙනා ගෲසෙන්කා ගෙන් මුදල් ඉල්ලා නිතර ලියුම් එව්වෙන් ඈ ඔවුන්ට වරින්වර සුළු මුදල් යැව්වා ය. මීතියා එදා ගෲසෙන්කාට දොස් කීවේ මේ ගැන සඳහන් කරමිනි.

"මීතියා බලන්න යන පාර මම මෝඩයකු වගේ මිනිත්තුවකට විතර පෝලන්ත ජාතිකයා බලන්න ගියා මිනිහ ලෙඩින්"යයි ගෲසෙන්කා නොසන්සුන්කමින් වහවහා කීවා ය. "මම මේ කතාව මීතියාට කියා හිනා වුණා පෝලන්ත ජාතිකයා ගිටාරය වයමින් මට එයා ගේ පරණ සින්දු කිව්වා. එයා හිතුවා සින්දු අහල මම අදහස් වෙනස් කරගෙන එයා කසාද බඳියි කියා. මා මේ කතාව කියාපු හැටියේ ම මීතියා මට කඩා පැන්නා. ඒක නිසා දැන් මම පෝලන්ත ජාතිකයාට පස්තෑල යවනවා. ෆෙනියා, ඒ ගොල්ලෝ මට ලියුම එව්වේ අර පොඩි ගෑනු ලමයා අත ද? රූබල් තුනක් එක්ක පස්තෑල දුසිමක් විතර කොළයක ඔතල ඒ ගෑනු ලමයා අත යවාපන්. අලෝෂා, මම මගේ පරණ මනමාලයාට පස්තෑල යවපු බව මතක ඇති ව මීතියාට කියන්න ඕනෑ"

"කොහොමටවත් කියන්නේ නැහැ"යි අලෝෂා සිනා සෙමින් කීවේ ය.

"එහෙනම් කල්පනාව මිතියා මේ කතාව නොපිළිගනියි කියා ද? එයා ඔනෑකමින් ම මට බැන්නා. මිතියා මට කිසි ම සැලැකිල්ලක් දක්වන්නේ නැහැ"යි ග්‍රෑසෙන්කා ශෝකයෙන් කීවා ය.

"ඔනෑකමින් ම බැන්නා ය කියන්නේ කොහොම ද?"යි අලෝෂා ප්‍රශ්න කෙළේ ය.

"අලෝෂා බොහො ම මෝඩ යි. කො තරම් මොලය තිබුණත් මේ වගේ දේවල් තේරුම් ගන්න බැහැ. මා වැනි තරුණියක් ගැන ඊරිසියා කලාට මම මිතියා එක්ක තරහ වෙන්නේ නැහැ. ඊරිසියා නොකලා නම් මා තරහ වෙන්න ඔනෑ. මා ඒ ජාතියේ ගෑනියක්. ඊරිසියා කලාට මා කවදාවත් තරහ වෙන්නේ නැහැ. මට තියෙන්නේ බොහො ම නපුරු හදවතක්. මටත් පුළුවනි ඊරිසියා කරන්න. මට තරහ මිතියා මට කිසි ම ආදරයක් නො දක්වන නිසයි. දැන් එයා බොරුවට මා ගැන ඊරිසියාවක් පෙන්වනවා ඇයි මට මේවා පෙනෙන්නේ නැද්ද? මා අන්දයෙක් ද? එයා හිටිහැටියේ ම කැතිරිනා ගැන දොඩන්න පටන් ගත්තා. 'ඈ කො තරම් හොඳ තැනැත්තියක් ද? ඈ මොස්කව් නුවර ඉඳලා බොහො ම දක්ෂ දොස්තර කෙනෙක් ගෙන්නුවා නඩුවට කතා කරල මා නිදහස් කරගන්න. බොහො ම උගත් උසස් නීතිඥයෙක් කැඳවනවා ය කියා මට කිව්වා.' මා ඉදිරිපිට ඔය විදියට වර්ණනා කිරීමට නම් තවමත් මිතියා ඈයට ආලය කරනවා ඇති. ලැජ්ජා භයක් නැති කාලකණ්ණි ගෑනි! මා මේ අවුලට පටලවා, දැන් මට බැණලා, මගේ කර උඩ සේරම වැරදි පටවන්න හදනවා. 'උඹ මා එක්ක එන්න ඉස්සෙල්ලා අර පෝලන්ත ජාතිකයා තියාගෙන හිටියා. එහෙනම් ඇයි මට කැතිරිනාට ආලය කරන්න බැරි?' අන්න ඒක තමයි මිතියා කියන්නේ. එයා මේක ඔනෑ කමින් ම කරනවා. මම........."

එහෙත් තමා මේ ගැන අනුගමනය කරන ක්‍රියා මාර්ගය විස්තර කිරීමට ග්‍රෑසෙන්කාට ඉඩ නො ලැබිණි. ඈ ලේන්සුවෙන් මුහුණ වසා ගෙන අඬන්නට පටන්ගත්තා ය.

"මිතියා කැතිරිනාට ආලය කරන්නේ නැහැ"යි අලෝෂා ස්ථිර සවරයෙන් කී ය.

"හොඳයි, මීතියා මට ආලය කරනවා ද හැද්ද? කියා මම ඉක්මනට සොයා ගන්නම්"යයි ගෲසෙන්කා තර්ජනාත්මක ස්වරයෙන් කීවේ මුහුණ වසාගෙන සිටි ලේන්සුව ඉවත ගනිමිනි. ඇගේ මුහුණ විරූප විය. ඇගේ සෞම්‍ය ප්‍රසන්න මුහුණ කෝපයෙන් හා වෛරයෙන් විරූප වී තිබෙන සැටි දුටු අලෝෂා ශෝක විය.

"දැන් ඉතින් මේ මෝඩ කතාවලින් වැඩක් නැහැ"යි ගෲසෙන්කා හදිසියෙන් ම කීවා ය. "අලෝෂාට එන්න කිව්වේ මේවා කියන්න නො වෙයි. අලෝෂා, හෙට නඩු විභාගයේ දී මොනවා වෙයි ද? මට හය නඩුව ගැනයි. මා විතරයි මේ ගැන කරදර වෙන්නේ, අනෙක් අයට කිසි ම ගණනක් නැතිවා වගෙයි. කිසි ම කෙනෙක් කරදර වෙන්නේ නැහැ. අලෝෂාවත් මේ ගැන කල්පනා කළා ද? හෙටයි නඩුව. නඩුව කොහොම අහවි ද? තාත්තා මැරුවේ පැවල්. අනේ දෙසියනේ! වෙන කෙනකු කළ අපරාධයක් නිසා මීතියාට දඬුවම් කරාවි ද? මීතියා වෙනුවෙන් ඉදිරිපත් වෙන්න කිසි ම කෙනෙක් නැද්ද? පොලීසිය පැවල් ගෙන් කිසි ම දෙයක් අහල නැහැ නේද?"

"පැවල් ගෙන් බොහො ම වේලාවක් කටඋත්තර ගත්තා. නමුත් අන්තිමේ දී කවුරුත් තීරණය කළා පැවල් ගේ අතේ වරදක් නැති බව"යි අලෝෂා කී ය. "දැන් පැවල් ලෙඩින්. එදා ඉඳලා මිනිහට කිසි ම සනීපයක් නැහැ. බොරු ලෙඩක් නො වෙයි. ලෙඩේ ඇත්තයි."

"අලෝෂාටවත් බැරි ද නීතිඥයා ළඟට ගිහින් මුල ඉඳලා සම්පූර්ණ ඇත්ත කියන්න. ඒ නීතිඥයා පීටර්ස්බර්ග් නුවර ඉඳලා රූබල් තුන් දහක් ගෙවා ගෙන්නෙව්වා ලු."

"අපි තුන් දෙනා - ඉවානුයි, කැතිරිනායි, මායි එකතු වෙලා රූබල් තුන් දහ ගෙව්වා. නමුත් මොස්කව් නුවර ඉඳලා ආපු දොස්තරට රූබල් තුන් දහක් ගෙව්වේ කැතිරිනා යි. ඒ නීතිඥයා මීට වඩා ලොකු මුදලක් අය කරනවා. නමුත් මේ නඩුව රට පුරා ප්‍රසිද්ධ වුණ නිසා වැඩිය අය කරන්නේ නැහැ. හැම පත්තරේක ම, හැම සඟරාවක ම, මේ නඩුව ප්‍රසිද්ධ වුණා. ඉතින් නඩුවට පෙනී සිටීමෙන් ලැබෙන ප්‍රසිද්ධිය නිසයි නීතිඥයා මේ මුදලට කැමැති වුණේ. මම ඊයේ නීතිඥයා හමුවුණා."

"ඉතින් එයා එක්ක කතා කළා ද?"යි ගෲසෙන්කා මහත් සැලැකිල්ලක් දක්වා විමසුවා ය.

"මා කියාපු දෙය අහගෙන හිටියා මිස කිසි ම දෙයක් කිව්වේ නැහැ. එයා නඩුව ගැන දැනට ම තීරණයකට බැස ගෙන අවසානයි. ඒ වුණත් මා කියාපු දේවල් ගැන සලකා බලන්න පොරොන්දු වුණා."

"සලකා බලන්න පොරොන්දු වුණා! උන් සේරම තක්කඩි. උන් එකතු වෙලා මිතියා විනාශ කරල දමාවි. කැතිරිනා දෙස්තර කෙනෙක් ගෙන්නුවේ මොනවට ද?"

"නඩුවට විශේෂඥයකු හැටියට සාක්ෂි දෙන්නයි. මිතියා ගේ සිහිය හොඳ නැති බවත්, තාත්තා මරන කොට හොඳ සිහියෙන් නොසිටිය බවත් ඔප්පු කරන්න හදනවා"යි අලෝෂා සිනා සෙමින් කී ය. "ඒ වුණත් ඒ අදහසට මිතියා එකඟ වෙන්නේ නැහැ."

"ඔව්, ඒකත් ඇත්තයි. තාත්තා මැරුවා නම් මරන්න ඇත්තේ හොඳ සිහියෙන් වෙන්න බැහැ"යි ගාසෙන්කා කීවා ය. "ඔව්, මිතියා පිස්සුවෙන් තමයි හිටියේ. මිතියා පිස්සා කෙරෙව්වේ මා යි. මා මහ කාලකණ්ණි ගෑනියක්. නැහැ, නැහැ, තාත්තා මැරුවේ මිතියා නො වෙයි. ඒක මම හොඳට දන්නවා. උන් සේරම මිතියා එක්ක තරහයි මුළු පළාත ම මිතියාට විරුද්ධයි. වෙන එකක් තබා පෙමියා ගේ සාක්ෂිවලිනුත් ඔප්පු වෙනවා මිතියා තාත්තා මැරූ බව. සාප්පුවේ වැඩ කරන මිනිස්සු, තිලධාරීන්, වෙනෙකක් තබා තැබෑරුමේ මිනිස්සු සේරම, මිතියා අමාරුවේ දමන්න හදනවා."

"ඔව්, මිතියාට විරුද්ධ ව බොහො ම නරක සාක්ෂි තියෙනවා"යි අලෝෂා සිත් වේදනාවෙන් කී ය.

"ඇයි, දොර ඇරල තිබුණ බව ගිරිගෝරිස් කියනවා. ඒ සාක්ෂිය හොල්ලන්න බැහැ. මම ගිහින් ගිරිගෝරිස්ට කතා කළා. මිනිහට බොහො ම තරහ ගියා."

"ගිරිගෝරිස් ගේ සාක්ෂිය තමයි මිතියාට විරුද්ධ ව තියෙන නරක ම සාක්ෂිය."

"පිස්සුව ගැන කතා කරන කොට, මිතියාට දැන් නම් හොඳට ම පිස්සු තියෙන බව පෙනෙනවා"යි ගාසෙන්කා නොඉවසිල්ලෙන් කීවා ය. "දන්නව ද අලෝෂා, මම හුඟ දවසක ඉඳලා බලා හිටියේ ඔබට මිතියා ගේ පිස්සුව ගැන කියන්න යි. මම මිතියා බලන්න හැම දා ම යනවා, මට එයා ගැන පුදුමයි. හැම තිස්සේ ම දෙඩනවා.

මොනව ගැන ද ඔච්චර දෙඩත්තේ? මට නම් කියන දේවල් මොනවාක්වත් තේරුම් ගන්න බැහැ. මට හිතෙනවා එයා බොහො ම උසස් දෙයක් ගැන කතා කරනවා ය, ඒ වුණත් මා මෝඩයකු නිසා මට තේරුම් ගන්න බැරි ය කියා. දවසක් එයා හදිසියෙන් ම පොඩි දරුවකු ගැන දෙඩන්න පටන් ගත්තා. 'මොකද ඒ දරුවා එ තරම් දුප්පත්? මම සයිබීරියාවට යන්නේ ඒ දරුවා නිසයි. මම මිනීමරුවෙක් නො වෙයි. ඒ වුණත් මම සයිබීරියාවට යනවා' කියා මිතියා කිව්වා. මට නම් ඒ කතාවේ අගක් මුලක් තේරුම් ගන්න බැහැ. කතාව බොහො ම ලස්සණට කියාපු නිසා මට ඇඬුණා. එයාත් ඇඬුවා, මාත් ඇඬුවා. එයා හදිසියෙන් ම මා සිඹලා මගේ හිස උඩින් කුරුසය ඇන්ද. මිතියා කල ඒ වැඩේ අදහස කුමක් ද? කවුද ඒ පොඩි දරුවා?''

''ඒක කරන්න ඇත්තේ රැකිටින්. දැන් ටික දවසක ඉඳලා රැකිටින් නිතර මිතියා බලන්න යනවා''යි අලෝෂා සිනාසෙමින් කී ය. ''අනෙක් අතින් රැකිටින් කල දෙයක් ය කියන්නත් බැහැ. මට ඊයේ මිතියා බලන්න යන්න බැරිවුණා. අද කොහොම හරි යනවා.''

''නැහැ, නැහැ, රැකිටින් නො වෙයි, මිතියා පිස්සා කරන්නේ පොඩි අයියා ඉවාන්''යයි කියමින් ගෘසෙන්කා අඬන්නට පටන් ගත්තා ය. අලෝෂා ගෘසෙන්කා දෙස පුදුමයෙන් බැලුවේ ය.

''මොනවා, ඉවාන් මිතියා බලන්න යනවා? මට මිතියා කිව්වා ඉවාන් එයා බලන්න ආවේ නැහැ කියා.''

''මගේ කට වැරදුණා''යි ගෘසෙන්කා කලබල වෙමින් කීවා ය. ඇගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය. ''ආලෝෂා දැන් ම යන්න එපා. දැන් ඉතින් මගේ කට වැරදුණ නිසා සම්පූර්ණ ඇත්ත කියන්නම්. ඉවාන්, මිතියා බලන්න දෙපාරක් ගිහින් තියෙනවා. පලමු වන පාර කෙලින් ම මොස්කව් නුවර ඉඳලා ගියා. ඒ මට අසනීප වෙන්න ඉස්සෙල්ලයි. දෙ වන පාර ගියේ සතියකට ඉස්සෙල්ලයි. ඉවාන් මිතියාට කිව්වා එයා පැමිණි බව ඔබට කියන්න එපා ය කියා. ඉවාන් මිතියා බලන්න ගියේ රහසින්.''

ආලෝෂා කිසියම් දෙයක් ගැන කල්පනා කරන්නට විය. මේ ආරංචිය ගැන ඔහු මහත් සැලකිල්ලක් දැක්වී ය.

''ඉවාන් කවදාවත් ලොකු අයියා ගේ නඩුව ගැන මා එක්ක කතා කරන්නේ නැහැ''යි ආලෝෂා සෙමෙන් කී ය.

"පසු ගිය දෙමාසය තුළ ඉවාන් මා එක්ක වැඩිය කතා කළේ නැහැ. මා එනවාට වැඩි කැමැත්තක් දක්වූයේ නැහැ. ඉතින් සති තුනකින් මම මීතියා බලන්න ගියේ නැහැ. හොඳයි ....ඉවාන් ගිය සතියේ මෙහෙ හිටියානම්, මේ සතියේ මීතියා තුළ වෙනසක් ඇති වෙන්න ඕනෑ."

"ඔව් ඔව්. මිතියා තුළ වෙනසක් දකින්න තියෙනවා"යි ගෘසෙන්කා වහා කීවා ය. ඒ දෙන්නා අතරේ ලොකු රහසක් තියෙනවා. මීතියා ඊයේ මට කිව්වා ලොකු රහසක් තියෙනවා ය, ඒ රහස නිසා නිදාගන්න බැරි ය කියා. ඊට ඉස්සර මීතියා හිටියේ බොහො ම සතුටින්. දැන් ඉන්නෙත් සතුටින්. ඒත් එයා ඔළුව වනමින් කාමරය පුරා ඇවිදිනවා. හිස කෙස් කඩාගන්නවා. මට පේනවා එයාට මොකක් නමුත් කරදරයක් තියෙන බව.........නමුත් අද හිටියේ සන්තෝෂයෙන්."

"මීතියා ගේ හිතේ කිසියම් කරදරයක් තියෙන බව කිව්වා නේ ද?"

"ඔව්, හිතේ කරදරයක් තිබුණත් සතුටින් ඉන්නවා. මිනිත්තුවක් විතර තරහෙන් ඉඳලා ආයෙත් හොඳට කතා කරනවා. මට පුදුමයි. මේ තරම් භයානක අපරාධයකට අහු වෙලා සිටිය දීත් සමහර විට බොහො ම දේවල් ගැන පොඩි දරුවකු වගේ හිනා වෙනවා."

"ඉවාන් ගේ පැමිණීම මට හංගන්න හදපු බව ඇත්ත ද? ඉවාන් ආපු බව මට කියන්න එපා කිව්ව ද?"

"ඔව්, ඉවාන් ආපු බව අලෝෂාට කියන්න එපා කියා මට කිව්වා. මීතියා වැඩිය බය ඔබටයි. ඒක රහසක් නිසා කියන්න එපා කිව්වා. කරුණා කරල ගිහින් ඒ රහස දැන ගෙන මටත් ඇවිත් කියන්න'යි ගෘසෙන්කා බැගෑපත් වෙමින් කීවා ය. "මට මුහුණ පාන්න සිදුවන විපත්තිය කල් ඇති ව දැන ගෙන, හිත හදා ගන්න හැකි වන ලෙස කරුණා කරල මට ඒ රහස කියන්න. ඒකටයි මම එන්න කිවේ"

"ගෘසෙන්කා ගේ කල්පනාව ඒක ගෘසෙන්කාට සම්බන්ද දෙයක් කියා ද? එහෙනම් මීතියා රහස ගැන ගෘසෙන්කාට කිසිවක් නො කියන්න ඇති."

"මා දන්නේ නැහැ. සමහර විට කියන්න කැමැති වුණත් කියන්න බය ඇති. රහසක් තියෙන බව නම් කිව්වා. ඒ වුණත් රහස කිව්වේ නැහැ."

"ග්‍රෂෙන්කා ගේ අදහස කුමක් කියා ද?"

"මගේ අදහස ද? මේක මගේ අවසානය වෙන්න ඕනෑ. ඒක තමයි මගේ අදහස තුන් දෙනා ම එකතු වෙලා මා විනාශ කරන්න හදනවා. කැතිරිනාත් ඒකට හවුල් වෙලා. මේ සේරම කරන්නේ කැතිරිනායි. එයා බොහො ම හොඳ ගැතියක් ලු. ඒ කියන්නේ මා හොඳ ගැතියක් නොවන බවයි. ඒ බව මට කලින් දැනුම් දීලා මාව පන්නා දමන්න හදනවා. ඒක තමයි සම්පූර්ණ රහස. මීතියායි, කැතිරිනායි, ඉවානුයි, එකතු වෙලා මා විනාශ කරන්න කුමන්ත්‍රණය කරනවා. සතියකට පමණ කලින් මීතියා හිටිහැටියේ ම මට කිව්වා ඉවාන් නිතර කැතිරිනා බලන්න යන නිසා කැතිරිනාට ආලය කරනවා ය කියා. මට අවංක ව කියන්න, අලෝෂා ගේ කල්පනාවේ හැටියට මීතියා මට කිව්වේ ඇත්ත ද?"

"මම ග්‍රෂෙන්කාට බොරුවක් කියන්නේ නැහැ. මගේ කල්පනාවේ හැටියට ඉවාන් කැතිරිනාට ආලය කරන්නේ නැහැ."

"මගේ කල්පනාවත් ඒකමයි. මීතියා මට බොරු කිව්වා. කිසි ම ලජ්ජා භයක් නැති බොරුකාරයා. දැන් මට බණින්නේ පස්සේ මා පිට වරද පටවන්නටයි. එයා මෝඩයා. වැඩි කාලයක් රහසක් තියා ගන්න බැහැ. කටවරද්දා ගන්නවා. මම මිනිහට හොඳ වැඩක් කරනවා. දන්නව ද මට කියාපු දෙය? 'නුඹ හිතනව ද මම තාත්තා මැරුවා ය කියා.' එහෙම කියල තමයි මට බැන්නේ. ඒකට කමක් නැහැ. මම උසාවියේ දී කැතිරිනාට හොඳ වැඩක් කරනවා.........මම උසාවියේ දී සේරම කියනවා."

ග්‍රෂෙන්කා යළි අඬන්නට පටන්ගත්තා ය.

"ග්‍රෂෙන්කාට නො සඟවා කිය යුතු දෙයක් තියෙනවා"යි අලෝෂා හිඳ සිටි අසුනෙන් නැගිට කීවේ ය. "අයියා ඔබට ස්ථිර ව ම ආලය කරනවා. මේ ලෝකේ කිසි ම කෙනකුට වඩා ඔබට ආලය කරනවා. අයියා ආලය කරන්නේ ඔබට පමණයි. මා කියන දෙය විශ්වාස කරන්න. මම ඒ බව හොඳට ම දන්නවා. දෙවෙනි කාරණාව, මා කැමැති නැහැ එයා ගේ රහස දැන ගන්න. අයියා අද මට රහස කිව්වොත් මම කියනවා ඒ රහස ග්‍රෂෙන්කාට කියන බව. එහෙනම් මම අද ඇවිදින් රහස කියන්නම්. මගේ කල්පනාවේ හැටියට මේ රහසයි

කතිරිනා අතරයි කිසි ම සම්බන්ධයක් නැහැ. ඒක වෙන දෙයක් ගැන රහසක් වෙන්න ඕනෑ. දැන් ඉතින් මම යනවා"

අලෝෂා ගෘසෙන්කා ගේ අත ගෙන සමුගත්තා ය. ඈ තවමත් අඬමින් සිටියා ය. තමා ගේ කතාවෙන් ඇයට කිසි ම සැනසීමක් නොලැබුණ බව අලෝෂා දැනගත්තේ ය. ඇගේ සිතට වද දුන් කරුණු හෙළි කිරීමෙන් සැනසීමක් ලැබුණු බව ඔහු දැනගත්තේ ය. ගෘසෙන්කා අඬන අතරේ නික්ම යෑමට අලෝෂා කැමැති නො වී ය. තවමත් කළයුතු වැඩ මහත් රාශියක් තිබෙන හෙයින් පමා විය නො හැකි ය.

දෙ වන පරිච්ඡේදය

තාවකාලික පිස්සුව

ඒ වැඩ රාශිය අතරින් පළමු වැන්න තිබුණේ හොලාකෝ මැතිනිය ගේ නිවසේ බැවින් ඒ කටයුත්ත අවසන් කොට මිතියා හමුවීමට යෑම පිණිස අලෝෂා වහවහා ගමන් ගත්තේ ය. හොලාකෝ මැතිනිය පසු ගිය සති තුන තුළ අසනීපයෙන් සිටියා ය කිසියම් හේතුවක් නිසා ඇගේ කකුල ඉදිමී තිබිණි. ඇඳට වී නොසිටි මේ කුලදුව මුළු කාලය ම ඇගේ විසිතුරු විසිත්ත කාමරයේ තබන ලද සෝපාවක වැතිර සිටියා ය. අසනීප ව සිටියත් ඈ හොඳට ඇඳ පැළඳ සිටින බව ආලෝෂා දුටුවේ ය. ඈ පීත්ත පටිවලින් හිස කෙස් බැඳ, කර පළල් හැට්ටයක් ඇඳ සිටියා ය. ඇගේ මේ විසිතුරු සැරසිල්ල අලෝෂා ගේ අභිසංක විනෝදයට හේතු විය. ඈ මෙසේ සැරසී සිටින්නේ මන්දැයි සැක කළ අලෝෂා අනතුරු ව ඒ සැකය නොවැදගත් දෙයක් හැටියට ඉවත දැම්මේ ය. පසු ගිය දෙ දවස තුළ තරුණ සිවිල් සේවකයකු වූ පියෝතර් පර්හෝටින් නිතර ඇය බැලීමට ගියේ ය.

අලෝෂා මෙම ගෙදරට පැමිණියේ දවස් හතරකට පසු ව ය. ගෙට ගොඩ වූ වහා ම ඔහු ලීසා ගේ කාමරයට යන්නට සැරසුණේ ලීසා හමුවීමට පැමිණි හෙයිනි. 'ඉතා වැදගත් කරුණක් සඳහා' තමා හමුවීමට පැමිණෙන ලෙස දන්වා ලීසා

ඊට පෙර දින සේවිකාවක අතේ අලෝෂාට පණිවිඩයක් යැව්වා ය. කිසියම් කරුණක් නිසා අලෝෂා ලීසා ගේ ඉල්ලීම වැදගත් කොට සැලැකුවේ ය. අලෝෂා පැමිණ සිටින බව ලීසාට දැනුම් දීම පිණිස සේවිකාව නික්ම ගියා ය. අලෝෂා පැමිණ සිටින බව දැනගත් හොලාකෝ මැතිනිය කරුණාකර 'මිනිත්තුවකට පමණ' තමා හමුවන ලෙස දන්වා අලෝෂාට පණිවිඩයක් යැව්වා ය. ලීසා හමුවීමට පෙර ඇගේ මව හමුවිය යුතු යයි අලෝෂා අදහස් කළේ ඇය නොහමුවුව හොත් තමා ලීසා ගේ කාමරයේ සිටින හැම මොහොතක් පාසා ම හොලාකෝ මැතිනිය පණිවිඩ එවන බව දැන සිටි හෙයිනි. හොඳට ඇඳ පැළඳගෙන, බලවත් නොසන්සුන් කමකින් යුතු ව සෝපාවේ වැතිර සිටි කුල කත ඉතා ආදර-යෙන් අලෝෂා පිළිගත්තා ය.

"අනේ අලෝෂා දකින්න ලැබුණු කල්! අනේ දෙයියනේ සතියකින් ම අලෝෂා දකින්න ලැබුණේ නැහැ නොවැ! ඒ වුණත් දවස් හතරකට ඉස්සෙල්ලා, ගිය බදාදා මෙහාට ආවා නේ ද? ආවේ ලීසා හමුවෙන්න ද? අලෝෂා හැදුවේ මට නො දැනෙන්න හිමිහිට ලීසා ගේ කාමරයට යන්නයි. මම ලීසා ගැන කරදරවන තරම අලෝෂා දන්නේ නැහැ. මේක බොහො ම වැදගත් දෙයක්. ඒ වුණත් අපි ඒ ගැන පස්සේ කතා කරමු. ලීසා ගැන නම් මම ඔබ විශ්වාස කරනවා. සොසිමා පියතුමා ගේ මරණයෙන් පස්සේ - දෙවියන් වහන්සේ පියතුමා ගේ ආත්මය සාමයේ සතපන සේක් වා! (ඈ කුරුසයේ ලකුණ අඳිමින් කීවා ය.) අලෝෂා ලස්සණට අලුත් ඇඳුම් මහගත්තේ කොහොම ද? නැහැ නැහැ ඒක එ තරම් වැදගත් දෙයක් නො වෙයි. ඒ ගැන පස්සේ කතා කරමු. අලෝෂා කියා කතා කළාට මට සමා වෙන්න. මා වගේ නාකි ගෑනියක් මේ විදියට කතා කළාට තරහ වෙන්න එපා"යි කුලකත අඟර දඟර පා සිනා සෙමින් කීවා ය. "ඒ ගැනත් අපි පස්සේ කතා කරමු වැදගත් දෙය අමතක කරන්න හොඳ නැහැ. අන්න ඒකයි වැදගත්. වැදගත් දෙය අමතක කරලා වෙනත් දෙයක් ගැන කතා කළ හැටියේ ම මට ඒ ගැන මතක් කරන්න ඕනෑ. ඉතින් මොකක් ද ඒ වැදගත් දෙය? අනේ මා කොහොම ද ඒ වැදගත් දෙය මොකක් ද කියා කියන්නේ? ලීසා ඔබ බඳින්න පොරොන්දු වූ දා ඉඳලා, දන්නවා නේ ද ඒ පොරොන්දුව ඇවිද ගන්න බැරි ව පුටුවට වෙලා සිටින ළමයකු ගේ පිස්සු අදහසක් බව? දෙයියන් ගේ පිහිටෙන් දැන් ඇයට ඇවිදින්න පුළුවනි .... ඔබේ අවාසනාවන්ත අයියා වෙනුවෙන් සාක්කි දීමට

කැතිරිනා මොස්කව් නුවර ඉඳලා ගෙන්නාපු දෙස්තර හෙට ....මොනවට ද අපි හෙට දවස ගැන කතා කරන්නේ? හෙට දවස සිහිවෙන කොට, හෙට වෙන්න යන දේවල් සිහිවෙලා මගේ පණ යාවි ය කියා මට කල්පනා වෙනවා.......... ඒ දෙස්තර ඒයේ මෙහාට ඇවිදින් ලීසා සෝදිසි කරල බැලුවා. ....ඒ ගමන ආවාට මම රූබල් පනහක් ගෙව්වා. නමුත් ඒක නො වෙයි වැදගත් දෙය. මම හැම දෙයක් ම පටලවා ගන්නවා. මට කිසි ම ඉවසීමක් නැහැ. මොක ද මට ඉවසීමක් නැත්තේ? මට කිසි ම දෙයක් තේරුම් ගන්න බැහැ. කිසි ම තේරුමක් නැති ව යම් යම් දේවල් කිරීම කො තරම් භයානක ද? හැම දෙයක් ම අවුල් ජාලයක් වගෙයි මට පෙනෙන්නේ. ඔබ මගේ කතාව එපා වෙලා පැනල යා ය, ඒට පස්සේ මට ඔබ දකින්න නො ලැබේ ය කියා මට භයයි. අනේ දෙයියනේ මෙතැන ඉඳගෙන හිටියා මිස කිසි ම දෙයක් බිව්වේ නැහැ නේද? ජූලියා, ගල්ප්‍රියා, ඉක්මනට කෝපි ගෙනෙල්ලා!''

තමා දූත් ටිකකට කලින් කෝපි පානය කළ නිසා කෝපි නුවුවමනා බව කීමට අලෝෂා වෑයම් කෙළේ ය.

''කොහෙත් ද බිව්වේ?''

''ගෘසෙන්කා ගේ ගෙදර දී.''

''මොනවා, ඒ ගෑනි ගේ ගෙදර දී කෝපි බිව්වා? මේ විපත්තියට මුල ඔය ගෑනි නේ ද? මම ඔය ගැන වැඩිය දන්නේ නැහැ. මට ආරන්චියි ඒ ගෑනි දූත් සාන්තුවරියක් වෙලා ය කියා. මගේ කල්පනාවේ හැටියට පමා වුණා වැඩියි. මීට ඉස්සෙල්ලයි සාන්තුවරියක් වෙන්න තිබුණේ. සාන්තු-වරියක් වෙලා දූත් ඇති ප්‍රයෝජනය මොකක් ද? අනේ අලෝෂාට කියන්න දේවල් කො තරම් තියෙනවා ද කියතොත් ඒ එකක්වත් කියන්න බැරිවේ ය කියා මට භය හිතෙනවා. අනේ මේ නඩුව කො තරම් භයානක ද?.........කොහොම හරි නඩුව බලන්න යන්න ඕනෑ. කකුලේ අමාරුව නිසා ඇවිද ගෙන යන්න බැරිනම් පුටුවක ඉඳගෙනවත් යන්න ඕනෑ. මට හිටගෙන ඉන්න පුළුවනි. මා උස්සා ගෙන යන්න මිනිස්සු ඕනෑ තරම් ඉන්නවා. මාත් සාක්ෂි දෙනවා. නමුත් මොනවා කියන්න ද කියා මා දන්නේ නැහැ. සාක්ෂි දෙන්න ඉස්සෙල්ලා දිවුරුම් දෙන්න ඕනෑ. එහෙම නේ ද?''

''නමුත් මා හිතන්නේ නැහැ සාක්ෂි දීමට තරම් ඔබට සනීප ලැබේ ය කියා.''

"මට පුළුවනි නැගිට්ටින්න. අපොයි, අලෝෂා මගේ ඔළුව අවුල් කරනවා නොවැ. මේ නඩුව, භයානක මිනීමැරුම, ඊට පස්සේ උන් සේරම සයිබීරියාවට යාවි. සමහරක් අය කසාද බඳීවි. ඉතින් මේ සේරම කො තරම් ඉක්මනට සිදුවෙනව ද? හැම දෙයක් ම වෙනස් වෙනවා. අන්තිමේ දී කිසි ම දෙයක් ඉතිරි වෙන්නේ නැහැ. හැමෝ ම වයසට ගිහින් මැරෙනවා. ඒවා එහෙම තමයි. දූන් මට සේරම එපා වෙලා. කැතිරිනා මගේ සේරම බලාපොරොත්තු නැති කළා. දූන් ඈ අලෝෂා ගේ අයියා කෙනකු පස්සේ සයිබීරියාවට යන්න ලෑස්ති වෙනවා. ඒ අතර අනෙක් අයියා කැතිරිනා පස්සේ ගිහින් ළඟ ම තියෙන ගමේ පදිංචි වෙන්න හදනවා. ඉතින් මොක ද වෙන්නේ? එකාට එකා වද දී ගන්න හදනවා. මේවා කල්පනා වෙන කොට මගේ ඔළුව නරක් වෙනවා සේරට ම වැඩිය හපන් මේවාට ලැබෙන ප්‍රසිද්ධිය. මොස්කව් නුවර පත්‍රවල මේ කතාව දහස් වරක් විතර පළවෙන්න ඇති. මා ගැනත් නොයෙක් දේවල් ලියා තිබුණා. මා ඔබේ අයියා ගේ මිතුරියක් ලූ……… මට ඒ වචනය කියන්නත් බයයි. ටිකක් කල්පනා කරලා බලන්න."

"වෙන්න බැරි දෙයක්. මොනව ද පත්‍රකාරයන් ඔබ ගැන ලියා තියෙන්නේ?"

"පත්තරය පෙන්නන්නම්. ඊයේ යි මම පත්තරය කියෙව්වේ. මෙන්න තියෙනවා 'ඔපාදූප' කියන පීටර්ස්බර්ග් නුවර පත්‍රය. පත්‍රය පටන් ගත්තේ මේ අවුරුද්දෙයි. මම බොහො ම කැමැතියි ඔපාදූප කියවන්න. මම පත්‍රයට දායක වුණා. ඉතින් මේක තමයි මට වෙච්ච ලාභය. මෙන්න තියෙනවා. කියවා බලන්න."

ඈ කොට්ටය යට තිබුණු පත්තරයක් ගෙන අලෝෂාට දුන්නා ය. ඇත්ත සේ කියන්නේ නම් ඈ මේ පුවත කියවා නොසන්සුන් වුණේ නැත. එහෙත් ලිපිය නිසා ඇගේ සිහිය මඳක් අවුල් විය. එය සාමාන්‍ය ප්‍රවෘත්තියකට සමාන වුවත් ඇයට එය බලවත් පහරක් වන්නට ඇත. වාසනාවට වාගේ ඇයට එක ම දෙයක් ගැන වැඩි වේලා කල්පනා කළ නො හැකි ය. එ හෙයින් ඇයට මේ පුවත සම්පූර්ණයෙන් ම අමතක කොට වෙන දෙයක් ගැන කල්පනා කරන්නට පිළිවන.

මේ භයානක මිනීමැරුම රට පුරා පතළ වූ බව අලෝෂා දූන සිටියේ ය. අනේ දෙයියනේ මේ දෙ මස තුළ වෙනත්

නොයෙක් භයානක පුවත් සමඟ තමා ගේ සහෝදරයා ගැන, තමා ගේ පවුල ගැන හා තමා ගැන කො තරම් බොරු ප්‍රචාරය වී තිබේ ද? සහෝදරයා කළ භයානක මිනීමැරුමට ඇති බියෙන් තමා තාපසාරාමයකට ගොස් පූජකයකු වූ බව එක් පුවත් පතක පළ විය. එහෙත් මේ පුවත බොරු කරන තවත් පුවත් පතක්, තමා සොසිමා තවුසා සමඟ එකතු වී තාපසාරාමයේ පිං පෙට්ටිය බිඳ පැන ගිය බව කීවේ ය. 'ඔපාදූත' නමැති පත්‍රයේ මේ පුවත පළවූයේ 'ස්කොටෝපිගොන්යැව්ස්කි නගරයේ කරමසෝව් මිනීමැරුම් නඩුව' යන හිසිනි. (අහෝ එය මා විසින් මෙතෙක් කල් සඟවා ගෙන සිටි අපේ කුඩා නගරයේ නමය) ඒ කෙටි පුවතේ හොලාකෝව් මැතිනිය ගේ නම සඳහන් නො වී ය. ඇත්ත වශයෙන් එහි නම් ගම් කිසිවක් නො තිබිණි. ළඟ දී අධිකරණය හමුවට පැමිණෙන මේ භයානක මිනීමැරුම් නඩුවට අසුවී සිටින වරදකාරයා අහංකාර රස්තියාදුකාරයකු වන, දාසයන් හිමි විශ්‍රාම ලත් කපිතන් කෙනකු බවත්, හුදෙකලාවේ කාලය ගත කරන, ගෑහැනුන්ට විශේෂ සැලකිලි දක්වන හෙතෙම මුළු කාලය ම සල්ලාලකමට යොදන බවත් එහි පළ විය. ඔහුට සැලකිලි දක්වන ගෑහැනුන් අතරේ හුදෙකලා ජීවනයක් ගත කරන වැන්දඹුවක සිටින බවත්, වැඩිවිය පැමිණි දියණියක සිටින මේ ස්ත්‍රිය තරුණියක ලෙස ඇඳුම් පැළඳුම් කරන බවත්, මිනීමරුවාට කො තරම් ලැදිකමක් දක්වූවා ද කියතොත් මේ මිනීමැරුම සිදුවීමට පැය දෙකකට පෙර තමා සමඟ වහා ම රත්රන් ආකරවලට පැනයන්නේ නම් රූබල් තුන් දහක් දීමට පොරොන්දු වූ බවත් එහි සඳහන් කර තිබිණි. ඉතා අවශ්‍ය ව තිබුණු රූබල් තුන් දහ තාත්තා මරා සොරාගෙන නඩුවෙන් නිදහස් වීමට බලාපොරොත්තු වීම, මැදිවියේ වෙසෙන වැන්දඹුවක සමඟ සයිබීරියාවට යාමට වඩා යෙහෙකැයි මේ අපරාධකාරයා අදහස් කළ බවත් එහි වැඩි දුරටත් සඳහන් විය මේ විනෝදාත්මක වාර්තාව කවුරුනුත් බලාපොරොත්තු වූ පිළිවෙළට අවසන් කර තිබුණේ, පිතෘඝාතකයා හා මෑත දී දාසයන්ට නිදහස දීම ගැන ලිපිකරු ගේ අහංකාර පිළිකුල ප්‍රකාශ කරමිනි. අලෝෂා සැලැකිල්ලෙන් පත්‍රය කියවා බලා නමා ආපසු ගෘහිණියට දුන්නේ ය.

"ඉතින්, ඔය ලියා තියෙන්නේ මා ගැන වෙන්න ඕනෑ"යි කුලකත වහවහා කීවා ය. "මා ගැන වෙන්න ඕනෑ. නැති නම් වෙන කවු ද? පැයකට විතර ඉස්සෙල්ලා මම මීතියාට රත්රන් ආකර ගැන මතක් කළා. දැන් මේ මිනිස්සු කියනවා මම

මීතියා අල්ලා ගන්න හැදුවය කියා. මගේ එහෙම අදහසක් තිබුණේ නැහැ. මේ මිනිහා මේක ඕනෑ කමින්මයි ලියා තියෙන්නේ. මගේ මැදි වයස හා අහර දහර ගැන දෙයියන් වහන්සේ නඩු අහන දට මේ මිනිහට සමාව දෙන්න ඕනෑ මම මීතියාට සමාව දුන්නා වගේ. දන්නව ද මේක ලියා තියෙන්නේ කවුද කියා? රකිටින්, අලෝෂා ගේ යාළුවා.''

''මට මේ ගැන කිසි ම ආරන්චියක් ලැබුණේ නැහැ. සමහර විට රකිටින් ලියන්න ඇති.....වෙන්න පුළුවනි.''

''වෙන්න පුළුවන් කියා දෙයක් නැහැ. රකිටන් තමයි ලියා තියෙන්නේ. මම රකිටින් මේ ගෙදරින් පන්නා ගත්තා. ඒ කතාව දන්නවා නේ ද?''

'මේ ගෙරට එන්න එපා ය කියාපු බව නම් මා දන්නවා. ඇයි එහෙම කිව්වේ? මට ඒ කතාව දැනගන්න බැරි වුණා.''

''හා! එහෙනම් ඔය කතාව කිව්වේ රකිටින් ද? මොක ද මිනිහ මට බැන්න ද? හුඟක් බැන්න ද?''

''ඔව් බැන්නා. රකිටින් හැමෝටම බණින මිනිහා. ඒ වුණත් ඔබ රකිටින්ට ගෙදරට එන්න එපා ය කිව්වේ මොන කරුණක් නිසා ද කියා මට කිව්වේ නැහැ. මට හුඟ දවසකින් රකිටින් හමුවුණේත් නැහැ. කොහොම වුණත් අප අතරේ වැඩි මිත්‍ර කමක් නැහැ.''

''හොඳයි, එහෙනම් මම මුළු සිද්ධිය ම කියන්නම්. නොකියා ඉන්න පුළුවන් කමක් නැහැ. එක තැනක දී මගේ අතින් පොඩි වරදක් වුණා. ඒක බොහොම සුළු දෙයක් නිසා වැඩිය ගණන් ගන්නත් බැහැ. මෙන්න මේකයි වුණේ.'' හදිසියෙන් ම හොලාකෝව් මැතිනිය විනෝද ගතියක් දැක්වූවා ය ඇගේ මුහුණ ගුප්ත සිනාවකින් ආලෝක විය. ''මම අවිශ්වාස කළා.........අලෝෂා මට සමා වෙන්න ඕනෑ. මම ඔබට කතා කරන්නේ අම්මා කෙනකු වගෙයි. නැහැ..... නැහැ......මම කතා කරන්නේ මගේ තාත්තාට කතා කරනවා වගෙයි. අම්මාට මෙ තැන වැඩක් නැහැ. මම ඔබට කතා කරන්නේ සොසිමා පියතුමාට පාපෝච්චාරණය කරනවා වගෙයි. ඒක මේ වෙලාවට හොඳට ගැළපෙනවා. දැන් මම අලෝෂාට පූජකයා ය කියා කතා කළා නේ ද? ඉතින් ඔබේ යාළුවා රකිටින්, අපට දෙවියන් වහන්සේ අනුකම්පා කරත් වා. මට බැහැ මිනිහ එක්ක තරහ වෙන්න. ඒ වුණත් මට මිනිහ

එක්ක බොහො ම තරහයි. ඒත් වැඩිය තරහ නැහැ ඔය මිතිහා හදිසියෙන් ම මට ආලය කරන්න පටන්ගත්තා. ඒක විශ්වාස කරනව ද? මට පසුවයි දැනගන්න ලැබුණේ. දූන් මාසයක ඉඳලා මිතිහා හැම දා ම වාගේ මා බලන්න එන්න පටන්ගත්තා. මීට ඉස්සෙල්ලා අප දෙන්නා අතරේ ඇඳුනුම් කමක් තිබුණා. ඒත් මම මිතිහ ගේ අදහස් දැනගෙන හිටියේ නැහැ.........මට හදිසියෙන් ම මේ ගැන සැක හිතිලා මිතිහ ගැන කල්පනාවෙන් බලා හිටියා. මට පුදුම හිතුණා. දන්නව ද දූන් මාස දෙකක ඉඳලා අර වැදගත් මහත්මයා — පියෝතර් පර්හෝචිත් මහත්මයා, නිතර මෙහාට එන්න පටන් ගත්තා. මෙහි දී ඔබට පර්හෝචිත් මහත්මයා හමුවෙලා ඇති. බොහො ම හොඳ වැදගත් මහත්මයා. එහෙම නේද? හැම දා ම එන්නේ නැහැ. දවස් තුනකට වරක් එනවා. මම බොහො ම කැමැතියි හැම දා ම එනවා නම් බොහො ම ලස්සණට ඇඳුම් පැළඳුම් කරනවා. අලෝෂා වගේ උගත් නිරහංකාර අයට මම බොහො ම ආදරෙයි. පර්හෝචිත් මහත්මයා උසස් දේශපාලකයකු තරම් ඥනවන්තයි. කතාවට බොහො ම දක්ෂයි. කතාව අහන්න ලස්සණයි. එයා ගේ තත්ත්වය උසස් කරගැනීමට මම එයාට හැම උපකාරයක් ම කරනවා. එයා තනාපති කමකට බොහො ම අගෙයි. ඒ භයානක දවසේ රෑ එයා මෙහාට ඇවිදින් යත්තම් මා බේරගත්තා. ඔබේ යාළුවා රකිටින් අපිරිසුදු පාවහන් දමාගෙන ඇවිදින් මගේ කාපට් එක පාගනවා.........ටිකින් ටික මිතිහා මට එයා ගේ අදහස් කියන්න පටන් ගත්තා. දවසක්, යන්න පිටත් වෙලා මගේ අත මිරිකුවා. ඊට පස්සේ තමයි මගේ කකුල ඉදිමුණේ. රැකිටින්ට මෙහි දී පර්හෝචිත් මහත්මයා හමුවෙලා තියෙනවා. ඉතින් දන්නව ද කිසියම් හේතුවක් නිසා මිතිහ හැම නිස්සේ ම පර්හෝචිත් මහත්මයාට බණිනවා. ඒ දෙන්නා කතා කරනවා බලා ඉඳලා මම හිනැටිත් හිනාවුණා. දවසක් මම මෙ තැන තනියෙන් ඉඳගෙන හිටියා. නැහැ, මේ සෝපාව උඩ ඇලවී හිටියා. එතකොට රැකිටින් ආවා මා බලන්න. දන්නව ද, මිතිහ මගේ ඉදිමුණු කකුල ගැන හදපු කවිපත්තියක් අරන් ආවා. ටිකක් ඉන්න.........මොනවා ලියා තිබුණ ද කියා මට හරියට මතක නැහැ.

'ලස්සණ පාදය, මගෙ පොඩි පාදය
ඇයි ද ඔ තරම් කකියන්නේ?.........'

ඔන්න ඔය වගේ දෙයක් ලියා තිබුණා. මට කවදාවත් කවි මතක හිටින්නේ නැහැ. ඒ කවි ටික මා ළඟ තියෙනවා.

නමුත් බොහො ම ලස්සණ කවි. කකුල ගැන පමණක් නො වෙයි බොහො ම ලස්සණ අදහස් තිබුණා දූත් මට මතක නැහැ. ඉතින් මම මිතිගට බොහො ම ස්තුති කළා. මිතිහත් බොහො ම සතුටු වුණා. එතකොට ම පර්හෝටින් මහත්මයා ආවා. එයා දැක්ක විතරයි රැකිටින් ගේ මුහුණ දලි වලදක් වගේ කළු වුණා රැකිටින් මට කවි පත්තිය දීලා මොකක් නමුත් කියන්න බලාපොරොත්තු වුණා. මට ඒ බව හොඳට තේරුණා. එතකොට ම පර්හෝටින් මහත්මයා ආවා. මම එයාට කවි පෙන්නුවා. ඒත් රැකිටින් ලියාපු බව කිව්වේ නැහැ. මට හොඳට විශ්වාසයි. පර්හෝටින් මහත්මයා දැන ගත්තා රැකිටින් ගේ කවි බව. නමුත් අද දක්වා දන්නා බව හැඟෙව්වේ නැහැ. එයා කවි කියවා හිනාවී කවිවල හරි වැරදි කියන්න පටන් ගත්තා. 'කාලකණ්ණි කවි වගයක්, මේවා ලියන්න ඇත්තේ සෙමනේරියක ඉන්න දේව ධර්මය හදාරන ශිෂ්‍යයෙක් වෙන්න ඕනෑ. හිතේ බොහො ම කාමාධික කමක් ඇති ව ලියන්න ඇති'යි එයා කිව්වා. එතකොට රැකිටින් හිනා වෙනවා වෙනුවට බොහො ම කේන්ති ගියා. අනේ දෙයියනේ මම හිතුවා දෙන්න ගහගනී ය කියා. 'මමයි මේ කවි ලිව්වේ. විහිළුවටයි ලිව්වේ. කවි ලිවීම නොහොබිනා දෙයක් හැටියටයි මා සලකන්නේ...... ඒ වුණත් මගේ කවි හොඳයි. ගෑනියක ගේ කකුල් ගැන කවි ලියාපු තුඹලා ගේ පුෂ්කින්ට සිහිවටනයක් ඉදිකරන්න සැරසෙනවා. නමුත් මගේ කවිවල දේශපාලන ලක්ෂණක් තියෙනවා. උඹලා රටවැසියා දාසභාවයේ තබා ගැනීමට කැමැති ප්‍රතිගාමි පිරිසක්. උඹලා ළඟ කිසි ම මනුෂ්‍යත්වයක් නැහැ. අපේ අලුත් අදහස් කිසිවක් පිළිගන්නේ නැහැ. වර්තමාන දේශපාලන අදහස් අතින් ඇති වී තිබෙන දියුණුව ගැන උඹලා කිසි ම දෙයක් දන්නේ නැහැ. තුඹ අත්ලස් ගන්නවා'යි කියමින් රැකිටින් පර්හෝටින්ට බණින්න පටන් ගත්තා. මම යන්තම් කෑකෝගහලා කෝලාහලය නතර කරන ලෙස ඉල්ලා හිටියා. ඒත් පර්හෝටින් මහත්මයා කිසි ම බයක් හැකක් තියෙන මිනිහෙක් නො වෙයි. එයා නිය ම මහත්මයකු හැටියට හැසුරුණා.. ......එයා රැකිටින් දිහැ අවඥවෙන් බලා, රැකිටින් කියන දෙය අහගෙන ඉඳලා 'මට සමා වෙන්න, මහත්මයා කවි ලියාපු බව මම දැනගෙන හිටියේ නැහැ. දැනගෙන හිටියා නම් මම කවි වර්ණනා කරනවා. කවිකාරයන් කියන අය බොහො ම සුළු දෙයටත් කලබල වෙනවා'යි කිව්වා. කොටින් කියනවා නම් එයා හිතයටින් රැකිටින්ට හිනා වුණා. ඒක හරියට ඔළුව අතගාලා ටොක්කක් ඇන්නා වගෙයි. පර්හෝටින්

මහත්මයා, මට පස්සේ කිව්වා එයා එහෙම කිව්වේ ඇනුම්-පදයක් හැටියට ය කියා. ඒත් මා හිතුවා ඔහු කමින් ම කිව්වය කියා. මේ විදියට මෙ තැන ඉඳගෙන ඉන්න කොට මම කල්පනා කලා මගේ ගෙදරට පැමිණි ආගන්තුකයාට අපහාස කල නිසා, රැකිටින්ට මගේ ගෙදරට එන්න එපා ය කිව්වොත් මගේ තත්ත්වයට හානියක් වෙයි ද? කියා. ඉතින් මම ඇස් දෙක, වහගෙන කල්පනා කලා මේක කරන්න හොඳ ද? නරක ද? කියා. මේ ප්‍රශ්නය මගේ හිතට මහ වදයක් වුණා. මගේ පපුව ගැහෙන්න පටන්ගත්තා. කෑගාන්න ද? එපා ද? කියා මම කල්පනා කලා. මගේ හිතේ එක්කෙනෙක් කෑගාන්න එපා කියන කොට අනෙක් එක්කෙනා කෑගාන්න කියනවා. කෑගාන්න කියාපු හැටියේ ම මම කෑගාලා ක්ලාන්ත වුණා. කවුරුත් කලබල වුණා. ඊට පස්සේ මම නැගිටලා රැකිටින්ට කිව්වා 'මට බොහො ම කනගාටුයි, නමුත් කරන්න දෙයක් නැහැ, මීට පස්සේ මගේ ගෙදරට එන්න එපා'ය කියා. මම වැරදි වැඩක් කලේ. බොරුවක් කලේ. මගේ හිතේ කිසි ම තරහක් තිබුණේ නැහැ. මට හදිසියෙන් ම කල්පනා වුණා රැකිටින් ගෙදරින් පැන්නුවොත් යහපතක් වේ ය කියා. ඒකයි මම එහෙම කලේ. ... ඒත් වැඩේ කො තරම් සවාභාවික විදියට සිදුවුණා ද කියනවා නම් මම දවස් ගණනක් ම ඇඬුවා. ඊට පස්සේ, දවසක් ර. කෑමෙන් පස්සේ මට හිටිහැටියේ ම මුළු සිද්ධිය ම අමතක වුණා. රැකිටින් සුමාන දෙකකින් ආවේ නැහැ. ආයේත් එව් ද කියන්න බැහැ. ඉතින් ඊයේ හවස, පත්‍රය ගැන ආරන්චිය ලැබුණා. පත්‍රය කියවාපු හැටියේ ම මගේ හුස්ම හිරවුණා. කවු ද මේක ලියා තියෙන්නේ? රැකිටින් මිස වෙන කවුද ලියන්න ඇත්තේ? එදා මා එක්ක තරහ වෙලා ගෙදර ගිහින් පත්‍රයට ලියා යවන්න ඇති. පත්‍ර-කාරයෝ පත්‍රයේ ප්‍රසිද්ධ කලා. මේ සේරම වුණේ සුමාන දෙකකට ඉස්සෙල්ලයි. අනේ අලෝෂා මම නිකම් අනම් මනම් දොඩනවා මිස උවමනා දෙය තව ම කිව්වේ නැහැ. මට කවදාවත් කට පරිස්සම් කරගන්න බැහැ."

"අද අයියා බලන්න යන්න ඕනෑ. පමා වෙන්න බැහැ"යි අලෝෂා සෙමෙන් කීවේ ය.

"ඔව් ඔව්, මට දැනුයි මතක් වුණේ. තාවකාලික පිස්සුව කියන්නේ මොකක් ද?"

"මොන විදියේ තාවකාලික පිස්සුවක් ද?"යි අලෝෂා පුදුමයෙන් විමසුවේ ය.

"මම කිව්වේ නීතියේ හැටියට යි. තාවකාලික පිස්සුව තියෙන තැනැත්තාට මොන වරදක් කළත් සමාව දෙනව ලු. පිස්සුවක් තියෙවා නම් මොන වරදක් කළත් සමාව දෙනව ලු."

"මොකක් ගැන ද අදහස් කරන්නේ?"

"හොඳයි, එහෙනම් මම කාරණාව විස්තර කරලා දෙන්නම්. කැතිරිනා කොතරම් හොඳ ළමයෙක් ද! ඈ කාට ආලය කරනවා ද කියා මට නම් කොහොමටවත් කියන්න බැහැ. ඈ ළඟ දී ආවා මා බලන්න. මට ඇගෙන් කිසි ම දෙයක් දැන ගන්න බැරි වුණා. ඈ දැන් කතා කරන්නේ කිසි ම වැදගැම්මකට ඇති දේවල් ගැන නො වෙයි. මගේ සැප සනීප ගැන මිස වෙන කිසි ම දෙයක් ගැන කතා කළේ නැහැ. ඒ වගේ ම බොහො ම අහංකාරයි. 'කමක් නැහැ' කියා මම මට ම කියා ගත්තා. දැන් අපි දෙන්නා කතා කළේ තාවකාලික පිස්සුව ගැන නේද? අන්න ඒකටයි මොස්කව් නුවර ඉඳලා දොස්තර කෙනෙක් ගෙන්නුවේ. අලෝෂා දන්නව නේද දොස්තර කෙනෙක් ආපු බව? මොකද නොදන්නේ? එයා මානසික රෝග ගැන විශේෂඥ-යෙක්. කැතිරිනායි, ඒ දොස්තර ගෙන්නුවේ. හොඳ සිහි කල්පනාවෙන් කටයුතු කළත් තාවකාලික පිස්සුව තියෙන්න පුළුවනි. ඉතින් සමහර විට මිතියාට තාවකාලික පිස්සුව තියෙන්න ඇති. තාවකාලික පිස්සුව කියන ලෙඩේ සොයා ගත්තේ අලුතින් උසාවි ආරම්භ කළාට පසු වයි. අලුත් උසාවිවලින් සිදු වූ ලොකු ම යහපත තාවකාලික පිස්සුව සොයා ගැනීමයි. දොස්තර මගෙ ළඟට ඇවිදින් මිනීමැරුම වෙච්ච දවසේ සිදු වූ දේවල් ගැන, ඒ කියන්නේ රන්රන් ආකර ගැන මගෙන් ප්‍රශ්න කළා. එදා සවස මිතියා සිටියේ තාවකාලික පිස්සුවෙන්. මෙහාට ඇවිදින් 'මට සල්ලි ඕනෑ, සල්ලි ඕනෑ, රූබල් තුන් දහක් ඕනෑ' කියා කෑගැව්වා. කෑගාලා ගිහින් හදිසියෙන් ම තාත්තා මැරුවා 'මට තාත්තා මරන්න උවමනාවක් නැහැ' කියා මැරුවා. අන්න ඒ කාරණාව නිසයි මිතියාට නිදහස ලැබෙන්නේ. එක් අතකින් මිතියා තාත්තා නො මරා සිටීමට වෑයම් කරන අතර අනෙක් අතින් තාත්තා මැරුවා."

"එත් අයියා තාත්තා මැරුවේ නැහැ"යි අලෝෂා කතාවට බාධා කරමින් මඳක් තදින් කී ය.

ඔහු තුළ නොසන්සුන් කමත්, නොඉවසිල්ලත්, ටිකින් ටික වැඩෙන්නට විය.

"ඔව් මං දන්නවා. තාත්තා මැරුවේ නාකි ගිරිගෝරිස්."

"ගිරිගෝරිස්?"

"ඔව් ඔව්, ගිරිගෝරිස් තමයි මැරුවේ. මිතියා ගේ පහරින් ගිරිගෝරිස් බිම වැටුණා. ඊට පස්සේ කාමරේ දොර ඇරලා තියෙන බව දැකලා කාමරයට ගිහින් තාත්තා මැරුවා."

"මොනව ට ද මැරුවේ?"

"තාවකාලික පිස්සුව නිසයි. මිතියා ඔළුවට ගහපු පහරින් මිනිහට තාවකාලික පිස්සුව හැදිලා, නැගිටලා ගිහින් තාත්තා මැරුවා. තාත්තා මැරුවේ නැහැ කියනවා නම් ඒ කියන්නේ කල්පනාව නැති නිසයි. මිතියා ගේ පහරින් ගිරිගෝරිස් මලානම් කො තරම් හොඳ ද? ගිරිගෝරිස් තමයි මැරුවේ. නැහැ ගිරිගෝරිස් නො වෙයි, මිතියා මැරුවා නම් තමයි හොඳ. නැහැ නැහැ, හොඳ වෙන්න විදියක් නැහැ. පුතා තාත්තා මැරීම කොහොම ද හොඳ වැඩක් වෙන්නේ? පුතා තාත්තා මැරීම කොහොම ද හොඳ වෙන්නේ? මා නම් මේ වගේ දේවල්වලට කැමැති නැහැ. දරුවන් මාපියන්ට ගරු කළ යුතුයි. කොහොම වුණත් තාත්තා මැරුවේ මිතියා නම් හොඳයි. එහෙනම් අපට කරදර වෙන්න දෙයක් නැහැ. එයා තාත්තා මැරුවේ හොඳ සිහියෙන් නො වෙයි අනෙක් දේවල් ගැන හොඳ සිහියෙන් හිටියත් තමාට මොනවා වෙනවා ද කියා දැන හිටියේ නැහැ. ඒ ගොල්ලෝ මිතියා නිදහස් කළ දෙන්. මෙ වැනි වැරැදි කරන එක මනුෂ්‍ය ගතිය. අනෙක් කාරණාව අලුතින් ආරම්භ කරන ලද උසාවිවලින් සිදුවන යහපත මිනිසුන්ට දැනගන්න පුළුවනි. මම මේ ගැන කිසි ම දෙයක් දැනගෙන හිටියේ නැහැ. දැන් හුඟ කාලයක ඉඳලා තාවකාලික පිස්සුව තියෙන අයට නිදහස දෙනව ලු. මේ ගැන ඊයේ ආරංචි වුණා ම මට කො තරම් පුදුම හිතුණ ද කියනවානම් එවේලේ ඔබට පණිවිඩයක් යවන්න හිතුණා. යම්විදියකින් මිතියා නිදහස් වුණොත් කෙළින් ම මෙහාට ඇවිදින් මා සමග රාත්‍රි භෝජනය ගන්න කියන්න. මම මගේ යහළු මිත්‍රයන් කැඳවා කන්න බොන්න දී මේ රජ නීතිය ගැන මධුපානය කරන්න ඕනෑ. මා හිතන්නේ නැහැ මිතියා මෙහාට ඇවිදින් කෝලාහල කරාවි ය කියා. මම හුඟ දෙනකුට එන්න කියන්නම්. එතකොට මිතියා කලබල කළොත් දොට්ට දමන්න පුළුවනි. නිදහස් වුණාට පස්සේ මිතියාට පුළුවනි සාමදාන විනිශ්චයකාරයකු හැටියට වෙන පලාතකට යන්න. මේ වගේ දුක් විඳපු අය තමයි හොඳ නඩුකාරයන් වෙන්නේ. අනෙක් කරුණාව, කාට ද මේ කාලේ තාවකාලික

පිස්සුව තැත්තේ? අලෝෂාට, මට, අප හැම දෙනාට ම නොයෙක් තාලේ පිස්සු තියෙනවා. අපි බලමු උදාහරණයක් අරගෙන. මිනිහෙක් බොහො ම සන්තෝෂයෙන් සිත්දුවක් කියනවා. හිටි හැටියේ ම කිසියම් කාරණක් නිසා මිනිහට කේන්ති ගිහින් පිස්තෝලයක් අරගෙන මූණගැහෙන පලමු වන මිනිහාට වෙඩි තියා මරනවා. කිසි ම කෙනෙක් ඒ මිනිහට දොස් කියන්නේ නැහැ. මම මේ විදියේ ප්‍රවෘත්තියක් ලඟ දී පත්‍රයක තිබිලා කියෙව්වා. දොස්තරවරු සේරම කිව්වා මිනිහට පිස්සුයි කියා. දොස්තරවරු ඔනෑ ම දෙයක් ස්ථිර කරාවි. ඇයි ලීසාටත් පිස්සුවක් තියෙනවා. ඊයේ සි පෙරේදා සි ඇ මා ඇඬෙව්වා. නමුත් අද මට කල්පනා වුණා ලීසා මා ඇඬෙව්වේ ලීසාට වැලඳුණු තාවකාලික පිස්සුවක් නිසා ය කියා. ලීසා මට බොහො ම හිරිහැර කරනවා. මගේ කල්පනාව ඇයට තාවකාලික පිස්සුවක් ඇති. ලීසා ඔබට එන්න කිව්වේ මොනවට ද? ලීසා එන්න කිව්වා නේ ද? නැතිනම් ලීසා එන්න නො කියා ඔනෑ කමින් ම ආව ද?''

''ලීසා මට එන්න කිව්වා. දැන් ඉතින් ලීසා බලන්න යන්න ඔනෑ''යි කියමින් අලෝෂා නැගී සිටියේ ය.

''අනේ අලෝෂා ඒක තමයි කියන්න ත්යෙන බොහො ම වැදගත් දෙය''යි ගෘහිණිය හදිසියෙන් ම අඬමින් කීවා ය ''අනේ දෙසියනේ, මම අලෝෂා අවිශ්වාස කරන්නේ නැහැ. අම්මාට නොකියා ලීසා ඔබ ගෙදරට ගෙන්න ගත්තාට මගේ කිසි ම අමනාපයක් නැහැ. නමුත් පොඩි අයියා කො තරම් එඩිතර තරුණයකු වුවත් ලීසා ආශ්‍රය කරනවාට මගේ කිසි ම කැමැත්තක් නැහැ. මේක කිව්වාට මට සමා වෙන්න ඔනෑ. පොඩි අයියා මගේ දැනුමක් නැති ව ලීසා බලන්න ඇවිත් තියෙනවා''

''පොඩි අයියා ලීසා බලන්න ආවා? කවද්ද?''යි අලෝෂා පුදුමයෙන් ඇසුවේ ය. ආයේත් හිඳ නොගත් ඔහු සිටගෙන ම ගෘහිණියට සවන් දුන්නේ ය.

''මං කියන්නම්. ඒක කියන්න තමයි කතා කළේ. නමුත් කතා කළේ මොනවටද කියා මට සම්පූර්ණයෙන් ම අමතක වුණා. මෙන්න මේකයි වුණේ. ඉවාන් මොස්කව් ඉඳලා ආවාට පස්සේ දෙපාරක් ම ආවා මා බලන්න. පලමු පාර ආවේ යාළු කමටයි. දෙවෙනි පාර ආවේ මෙහාට කැතිරිනා ඇප්පු බව ආරංචි වෙලා කැතිරිනා බලන්නයි. ඉවාන්ට බොහො ම වැඩ

තියෙන නිසා නිතර එන්න පුළුවන් වේ ය කියා මා හිතුවේ නැහැ. ඒ වුණත් මට හදිසියෙන් ම දැනගන්න ලැබුණා ඉවාන් තව වතාවක් මෙහාට ආවා ය කියා. ඒ පාර ඇවිත් තියෙන්නේ මා බලන්න නො වෙයි, ලීසා බලන්නයි. මේක වුණේ දවස් හයකට කලින්. මෙහාට ඇවිදින් මිනිත්තු පහක් විතර ඉඳලා යන්න ගියා. මට මේ බව දවස් තුනකට පස්සේ අපේ වැඩකාරිය ගෙන් දැනගන්න ලැබුණා. මම අන්දුන්කුන්දුන් වුණා. මම ලීසාගෙන් ඇහැව්වහම ලීසා හිනාවුණා. ඉවාන් මා නිදාගෙන ඉන්නවා දැකලා මට කතා නො කර ලීසා ළඟට ගියා ලු මගේ සුව දුක් දැනගන්න. එහෙමයි වෙලා තියෙන්නේ. අනේ දෙයියනේ මට ලීසා නිසා තියෙන කරදරය! දැන් දවස් හතරකට ඉස්සෙල්ලා රෑ, අලෝෂා මෙහෙ ඉඳලා ගිය හැටියේ ම වාගේ, ලීසා හදිසියෙන් ම අසනීප වෙලා කෑගාන්න පටන්ගත්තා. ඊයේත් කෑගෑවා, පෙරේදත් කෑගෑවා, මේක තාවකාලික උමතුවයි. 'මට ඉවාන් පෙන්නන්න බැහැ. මීට පස්සේ මේ ගෙදරට එන්න දෙන්න එපා. මේ ගෙදර පස් පාගන්න දෙන්න එපා' කියා ලීසා හදිසියෙන් ම කෑගාන්න පටන්-ගත්තා. මම බිරාන්ත වුණා. 'ශීලාචාර උගත් තරුණයෙක් මේ ගෙදරට ආවාට මොකද වෙන්නේ?' කියා මම ඇසුවා. මෑත දී සිදුවූ දේවල් නිසා ඉවාන් සන්තෝෂයෙන් නො ව දුකින් සිටිනවා ඇති. එහෙම නේද? ලීසා මගේ කතාව අසා හිනාවෙන්න පටන්ගත්තා. බොහො ම නරක විදියටයි හිනා වුණේ. කොහොම වුණත් ඒ කතාව අහලා හිනා වෙලා ලීසාට සනීපවේ ය කියා මම සතුටු වුණා. මගෙන් කිසි ම අවසරයක් නැති ව, අවේලාවේ එන ගමන් නවත්වන්න කියා ඉවාන්ට කියන්න මම අදහස් කරගෙන හිටියා. අවේලාවේ ගෙදරට ඒම ගැන මම ඉවාන් ගෙන් අහන්නයි හිටියේ. අද උදේ නැගිට්ට හැටියේ ම ලීසා මොකක් ද එකකට ජූලියා එක්ක තරහ වෙලා, ජූලියා ගේ මූහුණට ගැහැව්වා. බොහො ම වැරදි වැඩක්. මම මගේ වැඩකාරයන්ට බොහො ම හොඳට සලකනවා. ඒ වුණත් පැයකට පස්සේ ලීසා ජූලියා බදා ගෙන ඇගේ කකුල් දෙක සිම්බා. ඊට පස්සේ මට පණිවිඩයක් එව්වා, මීට පසු ව මා බලන්න එන්නේ නැහැ කියා. ඒත් මම බොහො ම අමාරුවෙන් ඇගේ කාමරයට ගියා ම ඈ මාව බදාගෙන අඩමින් සිම්බා. සිඹින අතර මට වචනයක්වත් නො කියා මා කාමරයෙන් එළියට තල්ලු කළා. මට කිසි ම දෙයක් දැනගන්න ලැබුණේ නැහැ. ඉතින් අලෝෂා දැන් මට තියෙන්නේ ඔබේ බලාපොරොත්තුව

පමණයි. මගේ මුළු ජීවිතය ම රැඳී තිබෙන්නේ ඔබේ අතෙයි. කරුණා කරලා දූත් ම ලීසා ළඟට ගිහින් හැම දෙයක් ම දූත ගෙන මට ඇවිත් කියන්න. ඒක කරන්න පුළුවන් අලෝෂාට පමණයි. මේ විදියට කටයුතු සිදුවුණොත් මා මැරෙන්න පුළුවනි. නැතිනම් මම මේ ගෙදරින් පැනල යනවා. මට තවත් කල් ඉවසන්න බැහැ. මට මොනව වෙයි ද දන්නේ නැහැ. අනේ දෙයියනේ යන්නම් ඇති, අන්තිමේ දී පර්හෝටින් මහත්මයා එනවා"යි හොලාකෝ මැතිනිය ගෙට ගොඩවන පියෝතර් පර්හෝටින් දූක කීවා ය. ඇගේ මුහුණ සිනාවෙන් විකසිත විය. "මහත්මයා පමා වුණා, පමා වුණා. කරුණා කරලා වාඩි වෙලා මගේ හිතේ තියෙන අනුමානය නැති වෙන්න මොනවා හරි කියන්න. නීතිඥයා ගැන මහත්මයා ගේ කල්පනාව කොහොම ද? .... අලෝෂා කොහෙ ද යන්නේ?"

"ලීසා බලන්න යනවා."

"හොඳයි, මා කියාපු දෙය අමතක කරන්න එපා. ඒක ජීවිතයත් මරණයත් අතර දෙයක්!"

"නැහැ, නැහැ, අමතක කරන්නේ නැහැ. පුළුවන් හැම දෙයක් ම කරන්නම්. බොහොම පමා වුණා"යි කියමින් අලෝෂා වහා නික්ම ගියේ ය.

"පුළුවන් නම් කියා දෙයක් නැහැ. කොහොම හරි මා හමුවෙලා කියන්න ඕනෑ"යි ගෘහිණිය කතා කොට කීවා ය. එහෙත් ඊට කලින් අලෝෂා කාමරයෙන් පිට වී ගියේ ය.

තුන් වන පරිච්ඡේදය

කුඩා යකින්නී

කාමරයට පිවිසි අලෝෂා, පුටුවක් උඩ ඇල වී සිටින ලීසා දුටුවේ ය. ඇවිදගත නොහැකි ව අසනීප ව සිටි කාලයේ දී ඇ ඒ මේ අත ගියේ රෝද සහිත මේ පුටුවේ ආධාරයෙනි. අලෝෂා පිළිගැනීම සඳහා පුටුවෙන් නැඟී සිටීමට ඇ වෑයම් නොකළා ය. එහෙත් ඇ ඇගේ තියුණු ඇසින් තරුණයා දෙස සැලැකිල්ලෙන් බලා සිටියා ය. ඇගේ දෑස මදක් තඹිත්සි විය.

මුහුණ සුදුමැලි විය. තෙදිනක් තුළ දී ඈ මෙ තරම් වෙනස් වීම ගැන අලෝෂා පුදුම විය. ඈ පෙරට වඩා සිහින් ය. වෙන ද මෙන් ඈ අලෝෂාට අත නුදුන්නා ය. ඈ ඈගේ වස්ත්‍රය මත තබා ගෙන සිටි දිග සිහින් ඇඟිලි, අතින් ගත් අලෝෂා අනතුරු ව ඈ ඉදිරිපිට කිසිවක් නො කියා හිඳගත්තේ ය.

"මිතියා බලන්න හිරගෙදරට යන්න පමා වෙන බව මම දන්නවා''යි ලීසා කීවා ය. "අම්මා ඔබ පැය දෙකක් නතර කරගෙන ඉඳලා, මා ජූලියාට ගහපු බව දූන් විකකට කලින් කිව්වා නේද?''

"කොහොම ද දන්නේ?''යි අලෝෂා විමසුවේ ය.

"මම අහගෙන හිටියා. මොකද මා දිහා රවා බලන්නේ? මම බොහො ම කැමැතියි අනුන් ගේ කතා අහගෙන ඉන්න. ඒකේ කිසි ම වරදක් නැහැ. කතාව අහගෙන සිටීම ගැන මම සමාව ඉල්ලන්නේ නැහැ.''

"මොකද ලීසාට හිරිහැරයක් වුණා ද?''

"නැහැ, එහෙම දෙයක් නැහැ. මා ඉන්නේ බොහො ම සන්තෝෂයෙන්. ඔබ එක්ක විවාහ වීමට අකැමැති වීම කො තරම් හොඳ දෙයක් ද කියා දූන් මම සිය වන වරටත් කල්පනා කළා. ඔබ කවදාවත් හොඳ ස්වාමි පුරුෂයෙක් වෙන්නේ නැහැ. යම් විදියකින් මම ඔබ කසාද බැන්දට පස්සේ වෙන මිනිහෙක් එක්ක මිත්‍ර වෙලා ඒ මිනිහට ගිහින් දෙන්න ය කියා ඔබ අත ලියුමක් යැව්වොත්, ඔබ ඒ ලියුම ගිහින් දීලා ඒකට පිළිතුරකුත් ගෙනත් දේවි. අවුරුදු හතළිහේ දීත් ඔය විදියට මගේ ලියුම් අරන් යාවි.''

අනතුරු ව ලීසා හදිසියෙන් ම සිනාසුණා ය.

"ලීසා යම්කිසි දෙයක් ගැන බොහො ම තරහෙන් ඉන්නේ. කොහොම වුණත් ලීසා ගේ කතාව බොහො ම අවංකයි. බොහො ම අහිංසකයි'' අලෝෂා සිනා සෙමින් කී ය.

"අලෝෂා එක්ක කතා කරන්න මගේ කිසි ම භයක්, ලැජ්ජාවක් නැහැ. ඒක තමයි මගේ කතාවේ ඇති අහිංසක කම හා අවංක කම. විශේෂයෙන් ම අලෝෂා ගැන ලැජ්ජා වීමට මට කිසි ම උවමනාවක් නැහැ. ඇයි අලෝෂා මගේ හිතේ ඔබ ගැන කිසි ම ගෞරවයක් නැත්තේ? මම අලෝෂාට බොහො ම

ආදරෙයි. නමුත් කිසි ම ගෞරවයක් නැහැ. ගෞරවයක් තියෙනවා නම් ඔබ එක්ක මේ විදියට ලැජ්ජාවක් බයක් නැති ව කතා කරන්න පුළුවන් කමක් නැහැ. එහෙම නේද?"

"එහෙම නො වෙයි."

"මගේ හිතේ ඔබ ගැන කිසි ම ලැජ්ජා භයක් නැත ය කියා හිතනව ද?"

"නැහැ, මම එහෙම හිතන්නේ නැහැ."

ලීසා යළි සිනාසුණා ය. එහෙත් ඈ නො නවත්වා කතා කළා ය.

"හිරේ ඉන්න ලොකු අයියාට මම පැණි රස කෑම ටිකක් යැව්වා. අලෝෂා ඔබ බොහො ම හොඳයි. ඔබට ආලය නොකිරීමට මට මෙ තරම් ඉක්මනට අවසර දීම ගැන මම ඔබට බොහො ම ආදරෙයි."

"ඇයි ලීසා අද මට එන්න කිව්වේ?"

"මගේ හිතේ තියෙන එක්තරා ආශාවක් ගැන කියන්න. මම බොහො ම කැමැතියි කවුරු හරි මා කසාද බැඳලා, පස්සේ අතපය කඩා දමනවා නම්, මා මූලා කරනවා නම්, මා අත්හැර දමා යනවා නම්, සන්තෝෂයෙන් ඉන්න මගේ කිසි ම කැමැත්තක් නැහැ."

"ලීසා කැමැති හැම දෙයක් ම අවුල් කර ගන්න ද?"

"ඔව්, මම බොහො ම කැමැතියි මේ ගෙට ගිනි තියන්න. සමහර විට මේ ගෙට හොරෙන් ගිනි තියන හැටි ගැන මම කල්පනා කරනවා. ගෙට ගිනි තියන්න ඕනෑ කාටත් නොදැනුවත් ව. නැතිනම් කවුරුත් වැයම් කරාවි ගින්න නිවන්න. හොරෙන් ගිනි තිබ්බොත් නිවන්න බැරිවෙනවා. එතකොට මම කිසි ම දෙයක් නො දන්නවා වගේ බලා ඉන්නවා. කො තරම් පිස්සු කතාවක් ද?"

මෙසේ පැවැසූ ලීසා පිළිකුලින් අත වැනුවා ය.

"ලීසා ඔහොම කතා කරන්නේ පොහොසත් නිසයි." අලෝෂා සෙමෙන් කීවේ ය.

"දුප්පත් නම් මීට වඩා තත්ත්වය හොඳ වෙනව ද?"

"ඔව්, මීට වඩා හොඳ වෙනවා."

"එහෙනම් සොසිමා පියතුමා ඉගැන්නුවේ ඔය බණ ද? ඔය බණේ කිසි ම සත්‍යයක් නැහැ. මා විතරක් පොහොසත් වී අනෙක් හැම දෙනා ම දුප්පත් වුණොත් මොකද වෙන්නේ? මම කිසි ම කෙනකුට කිසි ම දෙයක් නො දී හොඳට කනව බොනවා. කිසි ම කෙනෙක් එක්ක කතා කරන්නෙවත් නැහැ"යි ඈ අත වනමින් කීවා ය. එහෙත් අලෝෂා මුවෙන් නො බැණ සිටියේ ය.

"දැන් මට කිසි ම දෙයක් කියන්න එපා. ඔබ මට බොහො ම නීරසයි. මා දුප්පත් නම් මම කවුරු හරි මරනවා. පොහොසත් වුණත් කවුරු හරි මරනවා. නිකම් සිටීමෙන් මොකක් ද තියෙන ප්‍රයෝජනය? දන්නවා ද මා බොහොම කැමැති මොනවට ද කියා? මා කැමැතියි අලෝෂා එක්ක විවාහ වෙලා නියම ගැමියන් වගේ ජීවත් වෙන්න. අපි ගොවිතැන් කරමු. අපි අශ්වයන් තියා ගනිමු. අලෝෂා අශ්වයන් ඇති කරන්න කැමැති ද? කල්ගානෝව් අඳුනනවා ද?"

"ඔව්."

"එයා නොයෙක් දේවල් ගැන කල්පනා කරනවා. 'නොයෙක් දේවල් සිතේ මවා ගෙන කල්පනා කරන්න බැරිනම් මොනවට ද ජීවත්වන්නේ?' කියා අහනවා. එයාට පුළුවනි බොහො ම ලස්සණ දේවල් සිතේ මවා ගෙන කල්පනා කරන්න. හැබැ ජීවිතය බොහො ම නීරසයි. ඒත් එයා ළඟදී ම කසාද බඳින්න යනවා. ඒකට මොකද දැනට ම එයා ගේ ආදරය ප්‍රකාශ කරලා ඉවරයි. බඹර ගහන්න පුළුවන් ද?"

"පුළුවනි."

"එයාත් හරියට බඹරයක් වගෙයි. හැම තිස්සේ ම කරකැ-වෙන්න කැමැතියි. එයා මා කසාද බැන්දෙත් බඹර ගහනවා වගේ මැරෙන තෙක් ම මම එයාව කරකවනවා. මා එක්ක ඉඳගෙන කතා කරන්න අලෝෂාට ලැජ්ජා නැද්ද?"

"නැහැ."

"ආගමික දේවල් ගැන කතා නොකරන නිසා අලෝෂා මා එක්ක බොහො ම තරහ ඇති. මා කැමැති නැහැ උවමනාවට වඩා ආගමට ලැදි වෙන්න. මේ ජාතියේ දී මහා පවක් කළහම අනෙක් ජාතියේ දී මොකද වෙන්නේ? අලෝෂා මේ දේවල් ගැන දන්නවා ඇති."

"දෙවියන් වහන්සේ ලීසාට දෙස් කියාවි"යි පැවැසූ අලෝෂා අනතුරු ව ලීසා දෙස පරීක්ෂාවෙන් බලා සිටියේ ය.

"ඒක තමයි මට උවමනා කරන්නේ. මා මැරිලා දිව්‍ය ලෝකයට ගියාම උන් මට දෙස් කියාවි. එතකොට මම උන්ට හිනා වෙනවා. මගේ බොහො ම ලොකු ආශාවක් තියෙනවා මේ ගෙට ගිනි තියන්න. තවමත් මා කියන දෙය විශ්වාස කරන්නේ නැද්ද?"

"මොකද නැත්තේ? මොන ම දෙයකට හරි ගිනි තියන්න කැමැති අවුරුදු දොළහේ ළමයි ඉන්නවා. ඒ ළමයි අහුවුණ දෙයට ගිනි තියනවා. ඒක එක්තරා ලෙඩක්."

"ඒක බොරුවක්. ඒ වගේ ළමයිත් ඉන්න පුළුවනි. ඒ වුණත් මා අදහස් කළේ ඒ ළමයිත් ගැන නො වෙයි."

"ලීසා නරක දෙය හොඳ දෙයක් හැටියට පිළිගන්නවා. ඒක තාවකාලික අසනීපයක්. සමහර විට ලීසාට වැලඳුණු අසනීපයේ ප්‍රතිඵලයක් වෙන්න පුළුවනි."

"එහෙනම් අලෝෂාත් මා පහත් කරලා සලකනවා ද? මා කැමැති නැහැ යහපත් වැඩ කරන්න. මා කැමැති නපුරු කම් කරන්නයි. ඒක මගේ අසනීපය එක්ක කිසි ම සම්බන්ධයක් නැහැ."

"මොනවට ද නපුරුකම් කරන්නේ?"

"හැම දෙයක් ම විනාශ කිරීමටයි. හැම දෙයක් ම විනාශ වෙනවා නම් කො තරම් හොඳ ද? සමහර විට මට කල්පනා වෙනවා පුළුවන් තරම් නපුරුකම් කරන්න. නරකය කියන හැම දෙයක් ම කරන්න. මා කැමැති බොහො ම කාලයක් ගත වන තුරු හොර රහසේ නපුරුකම් කිරීමටයි. එතකොට කාටත් හදිසියෙන් ම දැනගන්න ලැබේවි. එතකොට හැම දෙනා ම මා වට කරගෙන මට දෙස් කියාවි. එතකොට මට ඔවුන් දිහැ බලන්න පුළුවනි. ඒක බොහො ම ලස්සණ වැඩේ. ඒක ලස්සණ වැඩක් වෙන්නේ කොහොම ද අලෝෂා?"

"මං දන්නේ නැහැ. ඒක යහපත් දෙය විනාශ කිරීමට ඇති ආශාවක්. ලීසා කියනවා වගේ ගෙයක් ගිනි තැබීමට ඇති ආශාවක්. සමහර විට මේ වගේ දේවල් සිද්ධ වෙනවා."

"කියනවා විතරක් නො වෙයි මම කරනවා."

"ඔව් මම දන්නවා. ලීසා කියන දෙය මම විශ්වාස කරනවා."

"මා කියන දෙය විශ්වාස කරන නිසා මම අලෝෂාට බොහො ම ආදරෙයි. අලෝෂා අබ මල් රේණුවක් තරම් වත් බොරුවක් නොකියන බව මම දන්නවා. ඒ වුණත් මා මේ සේරම කියන්නේ ඔබ උවමනාවට ම තරහ කරන්නට ය කියා හිතනවා ඇති."

"නැහැ, මම එහෙම හිතන්නේ නැහැ.........සමහර විට එහෙම හිතන්න ආශාවකුත් තියෙන්න පුළුවනි."

"ඔව්, එහෙම ආශාවකුත් තියෙනවා. මම ඔබට කවදාවත් බොරුවක් කියන්නේ නැහැ"යි ලීසා කීවා ය. මෙසේ කියන අතරේ ඇගේ නෙත් අද්භූත ආලෝකයකින් බැබැළිණි.

හැම දෙයකට ම වඩා ඉහළින් අලෝෂාට පෙනී ගියේ ලීසා ගේ අවංක කම ය. මීට පෙර ඉතා වැදගත් අවස්ථාවල දී පවා ඇගේ මුහුණේ ප්‍රීතිය හා කවට කම දකින්නට ලැබුණත් දැන් එවැනි ලකුණක් දකින්නට නො තිබිණි.

"මිනිසුන් අපරාධවලට කැමැති වන අවස්ථාවල් තියෙනවා"යි අලෝෂා කල්පනා කොට කීවේ ය.

"ඔව්, ඔව්, අලෝෂා කිව්වේ මගේ අදහස මයි. කවුරුත් කැමැතියි අපරාධවලට. විශේෂ අවස්ථාවල දී නො වෙයි, කොයි වේලාවේ දීත් කැමැතියි අපරාධ කරන්න. දන්නව ද, ඒක හරියට සේරම එකතු වෙලා, අපරාධ ගැන බොරුවක් කීමට ගිවිස ගත්තා වගෙයි. අද වනතුරුත් මිනිසුන් කියන්නේ බොරු. හැමෝ ම කියනවා අපරාධ කරන්න කැමැති නැහැ කියා. ඒ වුණත් හිත යටින් බොහො ම කැමැතියි."

"තවමත් නරක පොත් කියවනව ද?"

"ඔව්, අම්මා නරක පොත්, කොට්ටය යට සඟවා ගෙන කියවනවා. මම ඒවා අම්මා ගෙන් සොරකම් කරගෙන කියවනවා."

"තමා විනාශ කරගැනීමට ලැජ්ජා නැද්ද?"

"මා කැමැතියි විනාශ වෙන්න. මේ පලාතේ ඉන්නවා කෝච්චිය යන කොට කෝච්චි පාරේ නිදාගන්න ළමයෙක්.

වාසනාවන්ත ළමයා. තාත්තා මැරූ වරදට දූත් ඔබේ ලොකු අයියා අහුවෙලා. ඒ වුණත් කවුරුත් කැමැතියි ලොකු අයියා තාත්තා මැරුවට."

"තාත්තා මැරුව නිසා කවුරුත් අයියාට ආදරෙයි?"

"කවුරුත් කැමැතියි තාත්තා මාරුවට. එළිපිට මිනීමැරුමට විරුද්ධ ව නොයෙක් දේවල් කිව්වත්, හිත යටින් බොහො ම කැමැතියි. මාත් බොහො ම කැමැතියි."

"ලීසා ගේ කතාවේ යම්කිසි ඇත්තක් තියෙනවා"යි අලෝෂා සෙමෙන් කීවේ ය.

"අදහස් බොහො ම හොඳයි" ලීසා ප්‍රීතියෙන් කෑගා කීවා ය. "ඒකට මොකුද ඔබ පූජකයෙක්. කවදාවත් බොරුවක් නො කියන නිසා මා ඔබට කො තරම් ගරු කරනව ද කියා ඔබ දන්නේ නැහැ. මම මහ විකාර හීනයක් දැක්කා. ඒක කියන්න ඕනෑ. සමහර විට මට හීනෙන් යක්කු පේනවා. දවසක් රෑ මම ඉටිපන්දමක් පත්තු කරගෙන මගේ කාමරයේ තනියෙන් හිටියා. එකපාරට ම කාමරය යකුන්ගෙන් පිරුණා. යක්කු හැම තැන ම, කාමරයේ මූළුවල, මේසය යට, මම දොර ඇරියා. දොර මුල්ලේ යක්කු මහ ගොඩක් හිටියා. උන් සේරම හදන්නේ මා අල්ලා ගන්න යි. උන් සේරම ඇවිදින් මා වටකරගත්තා. මම හදිසියෙන් ම කුරුසයේ ලකුණ ඇන්ද හැටියේ ම උන් මා අතහැරලා ඈත් වුණා. ඒ වුණත් යන්න ගියේ නැහැ. දොර ළඟයි, කාමරයේ මූළුවලයි සැඟවී බලා හිටියා. එතකොට මට හදිසියෙන් ම අදහසක් ඇති වුණා. කෑගා දෙවියන්ට සාප කරන්න. ඉතින් මම කෑගා දෙවියන්ට සාප කරන්න පටන් ගත්තා. එතකොට යක්කු බොහො ම සතුටින් මා වටකරගත්තා. ආයෙත් මම කුරුසයේ ලකුණ ඇන්දා, ආයෙත් උන් ඈත් වුණා. ඒක බොහො ම හොඳ සෙල්ලම."

"මාත් ඔය වගේ ම හීනයක් දැක්කා"යි අලෝෂා හදිසියෙන් ම කී ය.

"හැබෑට ම?"යි ලීසා පුදුම වෙමින් ඇසුවා ය. "අලෝෂා මා කියන දෙය හොඳට අහගන්න. මට හිනා වෙන්න එපා, මේක බොහො ම වැදගත් දෙයක්. දෙදෙනකුට එක විදියේ හීනයක් පෙනෙන්න පුළුවන් ද?"

"පුළුවන් වගේ පේනවා."

"මේක බොහො ම වැදගත් කරුණක්"යයි ලීසා පුදුමයෙන් කීවා ය. "මෙ තැන වැදගත් හීනය නො වෙයි. ඔබ දුටු හීනය මට පෙනීමයි. ඔබ කවදාවත් මට බොරුවක් කියා නැහැ. දැන් කියන්නත් එපා. මේක ඇත්ත ද? හීනා වෙන්න එපා."

"ඔව් ඇත්තයි."

මේ කතාව ගැන මහත් සැලැකිල්ලක් දැක්වූ ලීසා මිනිත්තු භාගයක් පමණ වේලා නිහඬ ව සිටියා ය.

"අලෝෂා නිතර මා බලන්න එන්න"යි ඈ හදිසියෙන් ම බැගෑ බසින් කීවා ය.

"මම ජීවත්ව සිටින තුරු නිතර ලීසා බලන්න එන්නම්"යයි අලෝෂා ස්ථිර සවරයෙන් පිළිතුරු දුන්නේ ය.

"අලෝෂා දන්නව ද? මට කතා කරන්න පුළුවන් කෙනකුට ඉන්නේ ඔබ පමණයි" ලීසා ආයේත් කීවා ය. "තනියෙන් කතා කිරීමත්, අලෝෂා එක්ක කතා කිරීමත් හැර මම වෙන කිසි ම කෙනකු එක්ක කතා කරන්නේ නැහැ. මේ ලෝකේ අලෝෂා හැර වෙන කිසි ම කෙනකු එක්ක කතා කරන්නේ නැහැ. තනියෙන් කතා කරනවට වඩා කැමැතියි අලෝෂා එක්ක කතා කරන්න. අලෝෂාට කතා කිරීමට මගේ කිසි ම ලැජ්ජාවක් නැහැ. ඇයි එහෙම ලැජ්ජාවක් ඇති නො වන්නේ? යුදෙව්වෝ පාස්කු උත්සවයේ දී ළමයෙක් සොරකම් කර ගෙන මරනවා ය කියන්නේ ඇත්ත ද?"

"මා දන්නේ නැහැ."

"ළමයකු සොරකම් කර ගෙන මරාපු යුදෙව්වකුට විරුද්ධ ව දමන ලද නඩුවක් ගැන පොතක තිබිලා කියෙව්වා මට මතකයි. මේ යුදෙව්වා අවුරුදු හතරක ළමයෙක් සොරකම් කරලා අත් දෙකේ ම ඇඟිලි කපා බිත්තියට තබා ඇණ ගැසුවා. ඒ මිනිහා නඩුවේ දී කිව්වා, ළමයා පැය හතරකින් මලා ය කියා. මිනිහ ගේ කතාවේ හැටියට ළමයා ඉක්මනින් මලා. ළමයා පැය හතරක් කෙඳිරිගාලා තියෙනවා. ඒ මිනිහා බොහො ම සන්තෝෂයෙන් බලා සිටියා ලු, බොහො ම හොඳයි."

"ඔව් හොඳයි. සමහර විට මට කල්පනා වෙනවා ඒ ළමයා බිත්තියට තබා ඇණ ගැසුවේ මා ය කියා. ඒ ළමයා බිත්තියේ එල්ලී වේදනාවෙන් කෑගාන කොට මම අන්නාසි දෙසි කමින් බලා හිටියා. අන්නාසි දෙසිවලට මම බොහෝ ම කැමැතියි. අලෝෂා කැමැති ද?"

අලෝෂා ලීසා දෙස නිහඬ ව බලා සිටියේ ය. ඇගේ සුදුමැලි වූ මුහුණ හදිසියෙන් ම විරූප විය නෙත් බැබැළුණේ ය.

"දන්නව ද? මම යුදෙව්වා ගැන ඒ කතාව කියවා මුළු රෑ ම ඇඬුවා. ඒ දරුවා වේදනාවෙන් කෑගා ඇඬූ හැටි ගැන මම කල්පනා කළා. (අවුරුදු හතරක ළමයකුට හොඳට තේරුම් ගන්න පුළුවනි) ඒ අතර අන්නාසි දෙසි ගැන කතාව මගේ සිතට වද දෙන්න පටන් ගත්තා. පසු ව දා උදේ මම මිනිහකුට ලියුමක් යැව්වා වහා ම ඇවිදින් මා හමු වෙන්න ය කියා. ඒ මිනිහට මම මුළු සිද්ධිය ම කියලා, ඒක 'හොඳයි කිව්වා' මිනිහා හදිසියෙන් ම සිනාසී 'ඒක හොඳයි' කියා නැඟිටලා යන්න ගියා. ඒ වුණත් මිනිත්තු පහයි හිටියේ. ඒ මිනිහා මට අවමානයක් කළා ද? අලෝෂා මට කියන්න, ඒ මිනිහා මට අවමානයක් කළා ද? නැද්ද?"යි ලීසා නැඟිට ඇසුවා ය. ඇගේ නෙත් බැබැළුණේ ය.

"ඒ මිනිහට එන්න ය කියා පණිවිඩයක් යැව්වේ ලීසා ද?"

"ඔව්."

"ලියුමක් යැව්ව ද?"

"ඔව්."

"අර ළමය ගැන අහන්න ද?"

"නැහැ, නැහැ, ඒකට නො වෙයි එන්න කිව්වේ. ඒ වුණත් මිනිහ ආපු හැටියේ ම මම ළමයා ගැන ඇසුවා. මිනිහ මට පිළිතුරු දීලා, හිනා වෙලා යන්න ගියා."

"ඒ මිනිහ ලීසාට අපහාස කළා ද?"යි අලෝෂා රහසක් අසන්නාක් මෙන් ඇසුවේ ය.

"මට අපහාස කළා ද? මට හිනා වුණා ද?"

"නැහැ, සමහර විට ඒ මිනිහ හිනා වෙන්න ඇත්තේ ලීසාගේ අන්නාසි දෙසි කතාව අහලා වෙන්න ඇති. ඒ මිනිහට දැන් බොහො ම අමාරුයි."

"ඔව්, මගේ අත්තාසි දෙසි කතාව විශ්වාස කරත්න ඇති"යි ලීසා කීවා ය. ඇගේ නෙත් බැබැළිණි.

"ඒ මිනිහ කිසි ම කෙනකුට අපහාස කරන්නේ නැහැ"යි අලෝෂා කී ය. "ඒ මිනිහ කිසි ම කෙනෙක් විශ්වාස කරන්නේ නැහැ. කිසිම කෙනකු ගැන විශ්වාස කරන්නේ නැති නම් ඒ තැනැත්තාට අපහාස කරන එක ඇත්තයි."

"එහෙනම් මිනිහ මටත් අපහාස කළා ද?"

"ඔව්, ලීසාටත් අපහාස කරන්න ඇති."

"බොහො ම හොඳයි" ලීසා දත් සපමින් කීවා ය. "ඒ මිනිහ හිනා වෙමින් යන කොට මට හිතුණා අපහාස කරන එක හොඳ ය කියා ඇඟිලි කපාපු ළමයාත් හොඳයි. අපහාස ලැබීමත් හොඳයි........"

අනතුරු ව දූරිය අලෝෂා ගේ මුහුණ බලා ද්වේෂයෙන් සිනාසුණා ය.

"අලෝෂා දන්නව ද? මා කැමැතියි............අනේ අලෝෂා මා බේරා ගන්න!" මෙසේ හදිසියෙන් ම පැවැසූ දූරිය වහා හුනස්නෙන් නැඟිට, තරුණයා ළඟට ගොස් ඔහු වැලඳ ගෙන "අලෝෂා මා බේරාගන්න"යි ආයේත් කීවා ය. "මා දූන් කී දෙය ඔබ හැර ලෝකේ වෙන කිසි ම කෙනකුට කියන්නේ නැහැ. මම කිව්වේ සහතික ඇත්ත. මම හැම දෙයක් ම අප්‍රිය කරන නිසා මට ජීවත් වෙන්න ආශාවක් නැහැ. මට කිසි ම දෙයක් පෙන්නන්න බැහැ. මට හැම දෙයක් ම පිළිකුල්. ඇයි අලෝෂා මට ආලය නො කරන්නේ?"යි ඈ උමතුවෙන් දෙඩන්නකු මෙන් ඇසුවා ය.

"මම ලීසාට ආදරෙයි" අලෝෂා කීවේ ය.

"අලෝෂා මා වෙනුවෙන් අඬනව ද?"

"ඔව්"

"අඬන්නේ මා ඔබේ බිරිය වීමට අකැමැති වූ නිසා ද? නැති නම් නිකම් අඬනව ද?"

"නැහැ, නිකම් අඬනවා."

"බොහො ම ස්තුතියි! මට උවමනා කරන්නේ දුක්කඳුළු පමණයි. හැමෝ ම මට දඬුවම් කරාවි. මා පාගා දමාවි. මම

කිසි ම කෙනකුට ආදරය කරන්නේ නැහැ. ඇහුණා නේද? මම කිසි ම කෙනකුට ආදරය නැහැ. ආදරය කරනවා වෙනුවට වෛර කරනවා. දැන් ඉකිත් අයියා බලන්න යන්න වෙලාව හරි." මෙසේ පැවැසූ ලීසා හදිසියෙන් ම අලෝෂාගෙන් ඈත්-වූවා ය.

"ඒ වුණත් මා කොහොම ද මේ විදියට ලීසා දමා යන්නේ?"යි අලෝෂා තැති ගෙන විමසුවේ ය.

"ඉක්මනට යන්න, නැති නම් හිර ගෙදර දොරවල් වසාවි. මෙන්න හිස්වැස්ම, ඉක්මනට යන්න, යන්න, යන්න!"

ඈ තරුණයා කාමරයෙන් පිටතට තල්ලු කර දැම්මට තරම් පෙලඹුණා ය. අලෝෂා ඇය දෙස වේදනාවෙන් හටගත් පුදුමයෙන් බැලුවේ ය. එවිට ඈ තමා ගේ දකුණු අතේ, කුඩා වන්නට නමන ලද ලියුමක් තබන බව දුටුවේ ය. ඔහු එක්වර ම ලියුම දෙස බලා ලිපිනය කියෙව්වේ ය. එහි "ඉවාන් පෙඩොරවිච් කරමසෝ" කියා ලියා තිබිණි. ඔහු වහා ලීසා ගේ මුහුණ බැලුවේ ය. එහි නපුරු ගතියක් දකින්නට තිබිණි.

"කොහොම හරි ඔය ලියුම ඉවාන්ට දෙන්න"යි ලීසා නියම කළා ය. උමතුවෙන් දොඩන්නකු මෙන් කතා කළ ඇගේ සර්වාංගය ම වෙවුලන්නට විය. "අද ම දෙන්න, නැති නම් මම වහ කා මැරෙනවා. ලියුම දෙන්නයි මම අලෝෂාට එන්න කිව්වේ."

අනතුරු ව ඈ වේගයෙන් දොර වසා යතුර දැම්මා ය. ලියුම සාක්කුවේ දමා ගත් අලෝෂා ලීසා ගේ මව හමුවන්නට නො ගොස් කෙළින් ම පහත මාලයට බැස්සේ ය. ඇත්ත සේ කියන්නේ නම් අලෝෂාට ගෘහිණිය ගැන සම්පූර්ණයෙන් ම අමතක විය. තරුණයා නික්ම ගිය වහා ම ලීසා දොර ස්වල්පයක් ඇර ඇඟිල්ල දොර අතරට තබා තුවාල වන ලෙස මුළු වැර ම යොදා දොර වැසුවා ය. තත්පර දහයකට පමණ පසු ඈ ඇඟිල්ල නිදහස් කරගෙන, නිහඬ ව සෙමෙන් ආපසු පුටුව ළඟට ගොස් හිඳ, කළු වූ නියපොත්ත යටින් ලේ ගලනා ඇඟිල්ල දෙස පරීක්ෂාවෙන් බැලුවා ය. ඇගේ තොල් වෙවුලන්නට විය.

"මම මහ කාලකණ්ණියෙක්, කාලකණ්ණියෙක්, කාල-කණ්ණියෙක්"යයි ලීසා සෙමෙන් වහවහා කීවා ය.

හතර වන පරිච්ඡේදය

දේව ස්තෝත්‍රය හා රහස

ඇලෝෂා හිරගෙදර මහ දොරේ සීනුව හඬවන විට රැබෝව් තිබිණි. (නොවැම්බර මාසයේ දවල් කාලය ඉතා කෙටි ය) අඳුරු වැටෙන්නට විය. පමා වුවත් කරදරයක් නැති ව අයියාට කතා කිරීමට අවසර ලැබෙන බව ඔහු දැන සිටියේ ය. අපේ නගරයේ පාලනය වෙනත් නගරවල පාලනයට සමාන ය. මූලික පරීක්ෂණ අවසන් වූ ඉක්බිති අවශ්‍යයෙන් ම පිළිපැදිය යුතු නීති රීතිවලින් පසු ව නෑයන් ඇතුළු තවත් කිප දෙනකුට මිතියා කරමසෝෆ් හමු වී කතා කිරීමට අවසර දෙන ලදි. මේ රෙකුලාසි ලිහිල් නො වුවත් මිතියා හමුවීමට පැමිණි සමහරක් අය කෙරෙහි ඒවා තදින් බලනොපැවැත්වී ය. සිරකරුවන්ට කතා කල හැක්කේ ඒ සඳහා වෙන් කරන ලද කාමරයක, තිලධරයකු ඉදිරිපිට පමණි. එහෙත් සමහර විට තිලධරයකු නැති ව මිතියාට කතා කිරීමට අවසර දෙන ලදි. මේ පහසුකම් දෙන ලද්දේ ගෘසෙන්කාට, අලෝෂාට හා රැකිටින්ට පමණි. අපේ පළාතේ පොලිස් කපිතන් ගෘසෙන්කාට විශේෂ සැලැකිල්ලක් දක්වූයේ ය. මූක්රෝවේ දී පරීක්ෂණ පවත්වන අතරේ තමා ගෘසෙන්කාට කෑගා කතා කිරීම ගැන මේ මහලු තිලධරයා කනගාටු විය. ගෘසෙන්කා පිළිබඳ ඇති තතු දැනගත් පසු ඔහු ඇයට ආදරයෙන් සැලැකුවේ ය. පුදුමය නම්, මිතියා මිනීමරුවකු බව ඔහු දැඩි ව විශ්වාස කලත් හිරභාරයට ගත් පසු මිතියාට කරුණාවෙන් සලකන්නට වීම ය. "බේබද්දු කමින් නොහික්මුණු ජීවිතයක් ගත කොට විනාශ වුවත් මිතියා හිත හොඳ තරුණයෙකි"යි ඔහු කල්පනා කෙළේ ය. මුල දී මිතියා ගැන ඔහු තුළ පැවැති තිතිය පසු ව අනුකම්පාවට පරිවර්තනය විය. බොහෝ කාලයක සිට අලෝෂා දැන ඇඳින සිටි පොලිස් තිලධරයා, අලෝෂාට ඉතා ආදරයෙන් සැලැකුවේ ය. මෑත දී සිට නිතර මිතියා හමුවීමට පුරුදුව සිටි රැකිටින්, පොලිස් කපිතන් ගේ කුළුපග මිත්‍රයෙක් විය. ඔහු පොලිස් තිලධරයා ගේ දූවරුන් හැඳින්වූයේ 'කපිතන් ගේ තරුණියන්' යන නමිනි. ඔහු දවසින් වැඩි හරියක් ගත කලේ පොලිස් කපිතන් ගේ ගෙදර ය. එමතු ද නො ව, ඔහු

හිරගෙදර පාලකයා ගේ දරුවන්ට පාඩම් කියා දුන්නේ ය. දූඩි පාලකයකු වුව ද මේ තිලධරයා කරුණාවන්ත මහල්ලෙකි. අලෝෂා සමග ආගම ගැන සාකච්ඡා කිරීමට විශේෂ ආශාවක් දක්වූ හෙතෙම අලෝෂා ගේ පැරණි හිතවත් මිත්‍රයෙක් විය. 'සව උත්සාහයෙන් ම' උගත් උසස් දර්ශනවාදියකු වූ හෙතෙම ඉවාන්ට ගරු කළ මුත් ඔහු ගේ අදහස් ගැන තැති ගත්තේ ය. එහෙත් ඔහු අලෝෂා කෙරෙහි මහත් ලැදිකමක් දැක්වී ය. පසු ගිය හවුරුද්දේ සිට අලුත් තෙස්තමේන්තුවේ ඇතුලත් දේශනා හැදූරූ හෙතෙම ඒ ගැන අලෝෂා සමග නිතර සාකච්ඡා කෙළේ ය. ආශ්‍රමයට යන හෙතෙම අලෝෂා හා පූජකයන් ද සමග පැය ගණන් බණ දහම් ගැන සාකච්ඡා කෙළේ ය. හිරගෙදරට යාමට පමා වුවොත් අලෝෂාට තිබෙන්නේ මේ තිලධරයා හමුවීම පමණි. එවිට ඔහුට අවශ්‍ය හැම සැපපහසු කමක් ම සලස්සා දෙනු ඇත. හැරත් හිරගෙදර ප්‍රධාන තිලධරයා සිට අන්තිම පහත් තිලධරයා දක්වා හැම දෙනා ම අලෝෂා ඇඳින ගෙන සිටියේ ය. තිලධරයන් ගෙන් අවසර ලබා ඇති නිසා මුරකාරයා අලෝෂාට කිසි ම බාධාවක් නො කෙළේ ය.

හිරකාමරයෙන් කැඳවනු ලැබූ මීතියා කෙළින් ම අමුත්තන් හමුවන පහත කාමරයට ගියේ ය. කාමරයට ඇතුළු වූ අලෝෂාට, මීතියා හමුවීමෙන් පසු ව නික්ම යන රැකිටින් හමුවිය. රැකිටින් මීතියා සමග හඬ නගා කතා කරමින් සිටියේ ය. මීතියා මහ හඬින් සිනාසෙන අතරේ රැකිටින් කොඳුරන්නට විය. මැතක සිට අලෝෂා හමුවීමට රැකිටින් වැඩි කැමැත්තක් නො දැක්වී ය. ඔහු අලෝෂා සමග කලාතුරකින් වත් කතා නො කෙළේ ය. අලෝෂා එන බව දුටු වහා ම රවා බැලූ රැකිටින් තමා ගේ කබායේ බොත්තන් දමන බව හගවා ඉවත බලා ගත්තේ ය. අනතුරු ව ඔහු කුඩය සොයන්නට විය.

"මගේ දේවල් අමතක කොට දමා යන්න හොඳ නැහැ" යි ඔහු කීවේ යම් කිසිවක් කිව යුතු හෙයිනි.

"අනෙක් අය ගේ දේවල් ගැනත් අමතක කරන්න එපා" යි පැවසූ මීතියා, තමා කළ විහිළුව ගැන හඬ නගා සිනාසුණේ ය.

රැකටින් කෝප විය.

"ඔය කතාව කියාපන් වහල්ලු විකුණපු හැතිකරයක් වන උඹේ පවුලේ උදවියට. මට නො වෙයි" රැකිටින් කෝපයෙන් වෙවුලමින් කී ය.

"මොකද කෑගාත්තේ? මා කළේ විහිළුවක්. මූත් සේරම එක වගෙයි" තික්ම යන රැකිටින් පෙත්තමින් පැවැසූ මිතියා අනතුරු ව ආලෝෂා දෙසට හැරී මෙසේ කී ය. "දූන් ටිකකට ඉස්සෙල්ලා මිනිහා මෙ තැන ඉඳ ගෙන හිනා වෙලා කතා කළා. ඒ වුණත් දූත් හිටි හැටියේ ම තරහ ගියා. මොකද මිනිහා මල්ලි එක්ක කතා නො කෙළේ? තරහ වෙලා ද? මොකද එන්න පමා වුණේ? මම උදේ හිටන් ම මඟ බලා හිටියා. කමක් නැහැ. දූන් ඉතින් කතා කරමු"

"මොකද රැකිටින් නිතර අයියා බලන්න එන්නේ? තුඹලා එ තරම් ලොකු යහළුවත් නො වෙයි" ආලෝෂා දෙර තුළින් තික්ම යන රැකිටින් පෙත්තමින් මිතියාගෙන් විමසුවේ ය.

"රැකිටින් එක්ක යාළු වෙන්න? අනේ නැහැ. මිනිහා වගේ ඌරෙක් එක්ක කොහොම ද යාළු වෙන්නේ? මිනිහා පිළිඅරන් තියෙන්නේ මා තක්කඩියකු හැටියටයි. මිනිහට විහිළුවක් තේරුම් ගන්න බැහැ. ඒක තමයි ඔය මිනිසුන් ගේ තියෙන වරද. හිතක් පපුවක් නැහැ. හරියට මේ හිරගෙදර බිත්ති වගෙයි. මෙ මිනිස්සු දකින කොට මා හිරගෙදර බිත්ති මුල දී දුටු හැටි මතක් වෙනවා. ඒ වුණත් මිනිහා හරි ම කපටියා. ඉතින් මල්ලි මගේ වැඩ කටයුතු සේරම ඉවරයි."

බත්කූව උඩ හිඳගත් මිතියා තමා ළඟින් අලෝෂාට හිඳගැනීමට ඉඩ දුන්නේ ය.

"ඔව්, නඩුව හෙටයි. මොකද අයියා සේරම බලාපොරොත්තු අත්හැර දැම්මා ද?"යි අලෝෂා බියෙන් විමසුවේ ය.

"මොනව ගැන ද දෙඩන්නේ?"යි මිතියා මලණුවන් දෙස සැකයෙන් බලා ඇසුවේ ය. "දෙඩන්නේ නඩුව ගැන ද? ඒ නඩුව යකාට ගියදෙන්. අපි මෙ පමණ වේලා කතා කළේ නඩුව ගැන නො වෙයි. ඉතා ම වැදගත් දෙය ගැන මම තව ම වචනයක් වත් කිව්වේ නැහැ. ඔව්, නඩුව හෙටයි. මා ඉවරයි කිව්වාම මම අදහස් කළේ නඩුව ගැන නො වෙයි. මා දිහා සැකයෙන් බලන්නේ මන් ද?"

"එහෙනම් මොනවා ගැන ද අයියා කතා කළේ?"

'අදහස් ගැනයි, ආචාර විද්‍යාව ගැනයි. ආචාර විද්‍යාව කියන්නේ මොනවට ද?"

"ආචාර විද්‍යාව?"

"ඔව්, ඒක විද්‍යාවක් නේද?"

"ඔව්, එහෙම විද්‍යාවක් තියෙනවා .....නමුත් ඒක කොයි විදියේ විද්‍යාවක් ද කියා මා විස්තර කරන්න දන්නේ නැහැ."

"රැකිටින් දන්නවා. රැකිටින් බොහො ම දේවල් දන්නවා. මිනිහා යකාට ගියදෙන්. මිනිහා කවදාවත් පූජකයෙක් වෙන්නේ නැහැ. පීටස්බර්ග් නුවරට ගිහින් ප්‍රගතිශීලී විචාරකයෙක් වීමට අදහස් කරනව ලු. කවුද දන්නේ? සමහර විට මිනිහට හරියන්න පුළුවනි. ඔය වගේ මිනිස්සු කවුරුත් සමර්ථයි රක්ෂාවක් කරන්න. ආචාර විද්‍යාව යකාට ගියදෙන්. මට ඔය විද්‍යාවෙන් කිසි ම වැඩක් නැහැ. මා විනාශයි. මල්ලී නුඹ බොහො ම හොඳයි. මම නුඹට තරම් වෙන කිසි ම කෙනකුට ආදරය නැහැ. නුඹ දකින කොට මගේ හිතේ ලොකු වේදනාවක් ඇති වෙනවා. කාල් බර්නාඩ් කියන්නේ කාට ද?"

"කාල් බර්නාඩ්?"යි අලෝෂා පුදුමයෙන් විමසුවේ ය.

"නැහැ, නැහැ, කාල් බර්නාඩ් නො වෙයි, ක්ලොඩේව් බර්නාඩ්. මොකක් ද මිනිහ කළේ? බේත් වික්කා නේද?"

"එයා පණ්ඩිතයෙක් වෙන්න ඕනෑ"යි අලෝෂා පිළිතුරු දෙමින් කී ය. "ඒ වුණත් හරියට කියන්න දන්නේ නැහැ. එයා පණ්ඩිතයෙක් බව නම් දන්නවා. එහෙත් මොන විදියේ පණ්ඩිතයෙක් ද දන්නේ නැහැ."

"ඒ මිනිහා යකාට ගියදෙන්! මා දන්නෙත් නැහැ මිනිහා ගැන වැඩිය කියන්න. සමහර විට මිනිහා මහ තක්කඩියෙක් වෙන්න පුළුවනි. උන් සේරම තක්කඩි. රැකිටින් කොහොම හරි එයා ගේ වැඩේ කරගනීවි. එයාත් හරියට බර්නාඩ් වගේ මිනිහෙක්. මේ බර්නාඩ් වරු රට හැම තැන ම ඉන්නවා."

"අයියාට මොකද වෙලා තියෙන්නේ?"යි අලෝෂා බලකොට විමසුවේ ය.

"මිනිහා, මා ගැන, මගේ නඩුව ගැන ලිපියක් ලියා, එයා ගේ සාහිත්‍ය කටයුතු ආරම්භ කරන්න හදනවා. ඒ නිසයි මිනිහා නිතර මා බලන්න එන්නේ. මට ඒ බව මිනිහම කිව්වා. මිනිහට උවමනා කරල තියෙනවා යම්කිසි සිද්ධාන්තයක් ඔප්පු කරන්න. 'ඔහුට පියා නො මරා සිටින්න පුළුවන් කමක් තිබුණේ නැහැ. ඔහු පරිසරය නිසා දූෂණය වුණා' ය

කියා ඔය විදියට ලියන්න හදනවා. මට සේරම විස්තර කරලා දුන්නා. මිනිහ හදනවා මේ ලිපියට සමාජවාදී අදහස් එකතු කරන්න. ඕනෑ දෙයක් කරගත්තාවෙන්. මට කමක් නැහැ. මිනිහ ඉවාන්ට කැමැති නැහැ. ඉවාන් පෙන්නන්න බැහැ. මිනිහ තුඹටත් වැඩිය කැමැති නැහැ. මිනිහ දක්ෂයා. පන්න ගන්න විදියකුත් නැහැ. බොහො ම ඉහළින් කල්පනා කරන මිනිහෙක්. මම දූන් මිනිහට කිව්වා 'කරමසෝ පවුලේ මිනිස්සු නරක මිනිස්සු නො වෙයි. දශීනවාදීන්. නියම රුසියන් ජාතිකයා දශීනවාදියෙක්. තුඹ කො තරම් ඉගෙන ගත්තත් කවදාවත් දශීනවාදියෙක් වෙන්න බැරි පහත් ජන්මයක් ලැබූ නිසයි' කියා මිනිහා බොහො ම තරහෙන් හිනා වුණා."

"දූන් ටිකකට ඉස්සෙල්ලා අයියා සේරම ඉවරයි කිව්වේ මොක ද?"යි අලෝෂා කතාවට හරස් වෙමින් විමසුවේ ය.

"මම එහෙම කිව්ව ද?......සම්පූර්ණයෙන් ම ගත්තොත් එහි ඇත්ත නැත්ත මේකයි. දෙවියන් වහන්සේ ගැන මගේ විශ්වාසයක් නැහැ. ඒ ගැන මට බොහො ම කනගාටුයි. ඒ නිසයි මම සේරම ඉවරයි කිව්වේ."

"දෙවියන් වහන්සේ ගැන විශ්වාසය නැති වීම ගැන කනගාටුයි කියන්නේ මොක ද?"

"ඔළුව අතුලේ තියෙන නහර ගැන දන්නව ද? ඒ කියන්නේ මොළයට සම්බන්ද වූ නහර. ඒ නහර යකාට ගියදෙන්. ඒ නහරවල කුඩා වලිග වගේ දේවල් තියෙනවා. ඉතින් මේ වලිග ගැහෙන්න පටන් ගත්තාම.........ඒ කියන්නේ මම යම් කිසි දෙයක් දිහා බැලුවා ම ඒ වලිග වෙවුලන්න පටන් ගන්නවා. එතකොට හිතේ රූපයක් මැවෙනවා. ඒ ක්ෂණයෙන් ම නො වෙයි, තත්පරයකින් ඇබිත්තක් පමණ ගියාට පසුවයි...... ඒක එක්තරා විදියක සෙලවීමක්, නැහැ නැහැ සෙලවීමක් නො වෙයි. ඒ සෙලවිල්ල යකාට ගියදෙන්. යම්කිසි දෙයක්, නැති නම් රූපයක්, නැති නම් සිද්ධියක් ඇති වෙනවා. ඒ නිසා තමයි මම යමක් දූකලා කල්පනා කරන්නේ. මම ඇසින් දූක සිතින් කල්පනා කරන්නේ අර නහර සෙලවෙන නිසයි. නැති ව මට ආත්මයක් තියෙන නිසා හෝ මම දෙසියන් ගේ ස්වරූපයට එකඟ ව මවන ලද නිසා නො වෙයි. මේවා කිසි ම අර්ථයක් නැති පිස්සු කතා. ඊයේ රැකිටින් මට විස්තර කරල දුන්නේ මේ කාරණාවයි. විද්‍යාව මහ පුදුම දෙයක්.........මේ ලෝකේ අලුත් අදහස් ඇති, අලුත් මිනිස් වර්ගයක් උපදින බව මට

අවබෝධ කර ගන්න පුළුවනි............ඒ කොහොම වුණත් දෙවියන් ගැන විශ්වාසය නැති වෙනවාට මට බොහො ම කනගාටුයි.''

''කොහොම වුණත් ඒක හොඳ දෙයක්''යයි අලෝෂා පිළිතුරු දෙමින් කී ය.

''දෙවියන් ගැන විශ්වාසය නැති වීම ද හොඳ දෙය? මේක රස විද්‍යාව. ඒකට කරන්න දෙයක් නැහැ. අපි රස විද්‍යාවට ඉඩ දෙන්න ඕනෑ. රැකිටින් දෙවියන් වහන්සේට කොහෙත් ම කැමැති නැහැ. කිසි ම කැමැත්තක් නැහැ. ඒක තමයි අප කාගේත් තියෙන වරද. ඒ වුණත් අපි ඒ බව නො කියා සඟවා ගෙන බොරු කියනවා. 'තුඹ ලියන ඔය ලිපිවල මේ ගැන සඳහන් කරනවා ද?' කියා මම රැකිටින් ගෙන් ඇහුවා. 'එවැනි දෙයක් ගැන කෙළින් ම ලිව්වොත් මගේ ලිපි පළ කරන එකක් නැහැ' කියා රැකිටින් සිනා සෙමින් කිව්වා. 'මනුෂ්‍යයාට මොකද වෙන්නේ?' කියා මම ඇහුවා. 'දෙවියන් වහන්සේ හා ස්වර්ගය ගැන විශ්වාසයක් නැති ව මනුෂ්‍යයාට මොකද වෙන්නේ කියාද ඇහුවේ? එහෙනම් හැම දෙයක් ම නීතියට එකඟයි ඕනෑ ම කෙනකුට තම තමන් කැමැති දෙයක් කරන්න පුළුවනි. ඇයි ඒ බව දන්නේ නැද්ද? ඥානවන්තයාට ඕනෑ දෙයක් කරන්න පුළුවනි. කරලා බේරෙන්න දන්නවා. ඒත් තුඹ මොකද කළේ? මිනී මරලා හිරගෙදර හිරබත් කනවා.' මේ කෑත ඌරු, මගේ මූහුණ බලා ගෙන කතා කළේ ඔය විදියටයි. ඉස්සර නම් මම ගහලා පන්න ගන්නවා. ඒත් දැන් අහගෙන ඉන්නවා. මිනිහ ගේ කතාවේ ඇත්තක් තියෙනවා. මිනිහා ලියන්නටත් දක්ෂයි. පසු ගිය සතියේ මිනිහ මට ලිපියක් පෙන්නුවා. මම ඒ ලිපියෙන් පේළි තුනක් ලියා ගත්තා. ටිකක් ඉන්න, මෙන්න තියෙනවා.''

මීතියා වහා සාක්කුවේ තිබී කොළයක් ගෙන කියවන්නට විය.

'''මේ ප්‍රශ්නය විසඳන්න නම් තමා පිළිබඳ සත්‍යයට පටහැනි ව තමා ගේ පෞද්ගලිකත්වය ඉදිරිපත් කළ යුතු යි.' මේක තේරුම් ගන්න පුළුවන් ද?''

''මට තේරුම් ගන්න බැහැ''යි අලෝෂා කී ය. ඔහු සොහොයුරා දෙස බලා, කියවන දෙයට කුතුහලයෙන් සවන් දුන්නේ ය.

"මට තේරුම් ගන්නත් බැහැ. මෙහි තියෙන්නේ සැඟවුණු උසස් අදහසක්. මේ කාලේ කවුරුත් ලියන්නේ මේ විදියට ලු. එය අප කෙරෙහි බලපවත්වන පරිසරයේ ප්‍රතිඵලයක් ලු. උන් පරිසරයටත් භයයි. ඔය තක්කඩියා කවිත් ලියනවා. මිතිහ හොලාකෝව් මැතිනිය ගේ කකුල වර්ණනා කරමින් කවි පත්තියක් ලිව්වා. හා හා හා!"

"ඔව් මට ආරංචියි."

"තුඹටත් ආරංචි වුණා ද? ඒ කවි කියෙව්ව ද?"

"නැහැ."

"මෙන්න තියෙනවා. මම කියවන්නම්. මල්ලිට මම මේ ගැන කලින් කිව්වේ නැහැ. අගේ ඇති කතාව. මිතිහ මහ තක්කඩියා. 'තුඹ මහ මෝඩයෙක්. රූබල් තුන් දහසක් නිසා තුඹ මහ අමාරුවක වැටුණා. නමුත් මම රූබල් ලක්ෂ එකාමාරක් අමාරුවක් නැති ව සොයා ගන්නවා. මම වැන්දඹුවක් කසාද බැඳලා පීටස්බර්ග් නුවරින් ගෙයක් ගන්නවා' කියා රැකිටින් මට විහිළු කළා. මිතිහ හොලාකෝව් මැතිනිය කසාද බඳින බව මට කිව්වා. 'ඇයට තරුණ කාලයේ දී වැඩිය මොළේ තිබුණේ නැහැ. දැන් අවුරුදු හතළිහේ දී, තිබුණ මොළෙත් නැති ව ඇති. ඒත් ඇ බොහො ම ලාමකයි. ඒ ලාමකකම නිසා තමයි මම ඇය අල්ල ගන්නේ. මම ඇය කසාද බැන්දට පස්සේ පීටස්බර්ග් නුවර පදිංචි වෙලා පත්තරයක් පටන් ගන්නවා.' මේවා කියන කොට ඒ තිරිසනා ගේ කටට කෙළ උනනවා. කටට කෙල උනන්නේ ඒ ගැනි නිසා නො වෙයි රූබල් ලක්ෂ එකහමාර මතක් වෙලයි. මම මිතිහගෙ කතාව විශ්වාස කලා. මිතිහ හැම දා ම මා බලන්න ඇවිදින් 'ඇ දැන් මගේ දූලේ වැටෙනවා'යයි බොහො ම සන්තෝෂයෙන් කියනවා. ඒත් අන්තිමේ දී ඒ ගැනි මිතිහව ගෙදරින් පන්න ගත්තා. දැන් පර්හෝටින් ඇ සමග හාද වෙලා. බොහො ම හොඳයි. මට පුළුවන් කමක් තියෙනවා නම් රැකිටින් පන්න ගත්තට මම ඔය මෝඩ නාකි ගැනි ගේ දෙපා සිඹිනවා. දැන් මිතිහා ඒ ගැනිට විකට කවි ලියනවා. 'මම පළමු වරට මේ කවි ලියා මගේ ඇඟිලි අපිරිසුදු කරගන්නවා. ඒ නමුත් මම මේ කවි ලියන්නේ ගැහැනියක ගේ සිත දිනා ගැනීමටයි. ඒ නිසා ඒක යහපත් වැඩක් හැටියට පිළිගන්න පුළුවනි. ඔය නාකි ගැනි ගේ බූදලේ අතට ගත්තට පස්සේ මට විශාල සමාජ සේවයක් කරන්න පුළුවන්' කියා මිතිහ කියනවා. උන් ඔක්කෝ ම අශිෂ්ට වැඩක් කරලා කියනවා සමාජයේ යහපතට

කරනවා ලු. 'කොහොම වුණත් තුඹලා ගේ පුෂ්කින් ගේ කවි-වලට වඩා මගේ කවි හොඳයි. කො තරම් නරක් වුණත් මගේ කවිවලින් සමාජයට යහපතක් සිදු වෙනවා'යයි මිතිහා කියනවා. මිතිහා පුෂ්කින් ගැන කියාපු කතාව මට තේරුම් ගන්න පුළුවනි. පුෂ්කින් ගැහැනුන් ගේ කකුල් ගැන පමණක් කවි ලියාපු දක්ෂ කවිකාරයෙක්. ඒකට මොකද මිතිහා මේ කවි ගැන බොහො ම ඉහළින් කතා කළා. කොයි එක නැති වුණත් මූත් ගේ අහංකාර කම තියෙනවා. 'මගේ ප්‍රියාදරිය ගේ ඉදිමුණ කකුල සුව වීම' කවි පත්තියට තබා ඇති මාතෘකාවයි. මිතිහ හරි කවටයෙක්.

කො තරම් සිත්කලු පොඩි කකුලක් ද?
ඉදිමී, රතුවී, මෙලෙක් වුවත්.
දොස්තර වරු ඇවිදින්
වෙදකම් කළමුත්, ඇගේ
කකුල සුවවන බවක් නො පෙනෙයි.

මම ඇගෙ කකුල්
දැක, තැති නොගත්තෙමි.
දෙපා වනමින්,
කවි පද බඳිමින්,
පුෂ්කින් වැනි කවියකු සතු කිරියකි.

ඇගේ හිස ද,
එහි, ඇතිවන ගැටලු ගැන ද,
මා සිත් වෙහෙසන්නේ.

පා ඉදිමෙන විට,
පුදුමයි කියන්නට,
නුවණ ද අඩු වී යන්නේ.

කකුලත් මොළයත්,
සුවවන ඔසුවක්,
සොයමින් මම වෙහෙසෙන්නේ.

මිතිහා උඟරෙක්, කැත උඟරෙක්. පලමු වන පත්තියේ තක්කඩි-යෙක්. ඒ වුණත් මිතිහ ගේ කවිවල බොහො ම දියුණු අදහස් තියෙනවා. ඒ ගැන මිතිහා ගෙදරින් දෙට්ට දැම්මාට කො තරම් තරහ ද කියනොක් මිතිහා දත් මිටි කන්න පටන් ගත්තා.''

"රැකිටින් පත්‍රයට හොලාකෝ මැතිනිය ගැන ලියුමක් ලියා දූනට ම පළිය අරගෙන ඉවරයි" අලෝෂා කී ය. අනතුරු ව ඔහු 'වගතුග' පත්‍රයේ පළ වූ ලියුම ගැන කෙටි විස්තරයක් කෙළේ ය.

"මිනිහා තමයි ඔය ලියුම ලියා තියෙන්නේ"යි මීතියා රවමින් කී ය. "මම දන්නවා මිනිහා ගෲසෙන්කා හා කැතිරිනා ගැන ලියාපු කැත දේවල්." අනතුරු ව නො සන්සුන් වූ මීතියා කාමරය හරහා සක්මන් කරන්නට විය.

"මට වැඩිය පමා වෙන්න බැහැ"යි අලෝෂා මඳ වේලාවකට පසුව කී ය. "හෙට දවස බොහො ම වැදගත්, එහෙත් භයානක දවසක්. දෙවියන් ගේ විනිශ්චය ලැබෙන දවසක්. ඒත් මට අයියා ගේ හැසිරීම ගැන පුදුමයි. නුවුවමනා දේවල් ගැන කතා කරමින් කාමරය පුරා ඇවිදිනවා. මොනව ගැන දොඩනවා ද කියා මට තේරුම් ගන්න බැහැ."

"මා ගැන පුදුම වෙන්න එපා"යි මීතියා ආදරයෙන් කී ය. "මල්ලි අර බල්ලා ගැන, මිනීමරුවා ගැන කතා කරන්න කියනවද? ඔය මිනීමරුවා ගැන කතා කරන්න මා කැමැති නැහැ. ගඳ ගහන ලිසවෙටා ගේ ගඳ ගහන පුතා ගැන කතා කරන්න මා කැමැති නැහැ. දෙවියන් වහන්සේ මිනිහ මරනවා. බලපන් නැද්ද කියා. ඔය ගැන වචනයක් වත් කතා කරන්න එපා."

නො සන්සුන් වූ මීතියා, අලෝෂා ළඟට ගොස් හදිසියෙන් ම අලෝෂා ගේ මුහුණ සිඹියේ ය. ඔහු ගේ නෙත් ගිනි අඟුරු කැට දෙකක් මෙන් දිලිසිණි.

"රැකිටින්ට මගේ අදහස් තේරුම් ගන්න බැහැ. ඒ වුණත් මල්ලිට තේරුම් ගන්න පුළුවනි. ඒ නිසා හැම දෙනාට ම වඩා මම මල්ලිට කැමැති"යි මීතියා සතුටින් කී ය. "කපරාරුව ගැලවී හැලෙන මේ කාමරයේ ඉඳලා, මල්ලිට කියන්න අදහස් කළ දේවල් බොහො ම තියෙනවා. ඒත් ඒ වැදගත් දේවල් ගැන අද වන තුරු නුඹට වචනයක් වත් කියා නැහැ. සුදුසු වේලාවක් තව ම පැමිණියේ නැහැ. දැන් ඉතින් තවත් කල් බලා ඉන්න බැරි නිසා සිතේ පැසෙන දෙය කියන්න ඕනෑ. මල්ලි, පසු ගිය මාස දෙක තුළ දී මම අමුතු මිනිහෙක් වුණා. ඒ අමුතු මිනිහා මා තුළ සැඟවී සිටියා. දෙව්ලොවේ සිට පැමිණි මේ යහපත නිසා නො වේ නම් ඒ යහපත් මිනිහා කවදාවත් මතුවෙන්නේ නැහැ. අවුරුදු විස්සක් හිරගෙදර ගල් කැඩුවත් ඇති වෙනස කුමක් ද? මම හිරේ යන්න කොහෙත් ම බය නැහැ. නමුත් දැන් මම

බය අමුතු දෙයකටයි. මට බය මා තුල සිටින මේ අලුත් මිනිහා මා අත්හැර දමා යාවිය කියා යි. සමහර විට හිර ගෙදර දී යහපත් ගති ගුණ ඇති සිරකරුවෙක්, නැති නම් මිනීමරුවෙක් හමුවෙන්න පුළුවනි. ඒ තැනැත්තා එක්ක මිත්‍ර වෙන්න පුළුවනි. හිරගෙදර දී වුවත් දුක් විඳිමින් අනුන්ට ප්‍රේම කරන්න පුළුවනි. තද හපුරු සිත් ඇති සිරකරුවන් පවා යහපත් අය කරන්න පුළුවනි. අවුරුදු ගණනක් වුවත් මෛත්‍රිය කිරීමෙන්, බොහෝ කාලයක් ජීවිතය නමැති අඳුරු පැලේ දුක් වින්ද අය ඉන් නිදහස් කොට දේවදූතයන් කරන්න පුළුවනි. වීරයන් කරන්න පුළුවනි. එ වැනි අය සිය ගණන් ඉන්නවා. ඒ මිනිසුන් මෙ තරම් දුක් විඳින්නේ අපේ වරදින්. අපියි වැරදිකාරයෝ. මේ වගේ වෙලාවක දී මට අර අත දරුවා හීනෙන් පෙනුණේ මොකද? ඇයි ඒ දරුවා දුප්පත්? ඒක ඒ වෙලාවේ දී මා දුටු පෙර නිමිත්තක්. මම හිරේ යන්නේ ඒ දරුවා වෙනුවෙන්. අපි කවුරුත් දරුවන්ට වගකිව යුතුයි. කුඩා දරුවොත් ඉන්නවා, ලොකු දරුවොත් ඉන්නවා. සියලූ දෙනා ම දරුවන් ලෙස පිළිගත යුතුයි. මම මේ සේරම දරුවන් වෙනුවෙන් හිරේ යනවා. මම යන්නේ, ඒ දරුවන් වෙනුවෙන් කවුරුහරි හිරේ යා යුතු නිසයි. මම තාත්තා මැරුවේ නැහැ. ඒ වුණත් මට හිරේ යන්න වෙනවා. මම සතුටින් යනවා. මට මේ අදහස ඇති වුණේ කපරාරුව ගැලවී හැලෙන මේ හිරගෙදර දීයි. මෙ තැන ගල් කඩන සිරකරුවන් සියගණන් ඉන්නවා. අප යදම්වලින් බැඳ තබා වි. අපට කිසි ම නිදහසක් ලැබෙන්නේ නැහැ. ඒ දුක තුළින් අපි සැපත සොයා ගන්නවා එහෙම නැති ව මිනිහාට කවදාවත් ජීවත් වෙන්න බැහැ. දෙවියෙක් ඇති වෙන්නත් බැහැ. සැපත ලබා දෙන්නේ දෙවියන් විසිනුයි. ඒක දෙවියන්ට අයිති වැදගත් කටයුත්තක්. අනේ දෙයියනේ, මිනිහා කෙළවරක් නැති ව යාච්ඤා කරන්න පුළුවනි. දෙවියන් නැති ව මම හිරේ යන්නේ කොහොම ද? රැකිටින් කියන්නේ බොරු. මිනිසුන් එකතු වී දෙවියන් මේ ලෝකෙන් පන්නා දැම්මත් අපට දෙවියන් නැති ව ඉන්න පුළුවන් වුණත්, හිරගෙදර ඉන්න මිනිහාට දෙවියන් නැති ව බැහැ. අපි හිරගෙදර ඉඳලා දෙවියන්ට තුති ගී ගායනා කරන්නෙමු. සැපත තියෙන්නේ දෙවියන් ළඟයි. දෙවියන් වහන්සේ හා එතුමා ගේ සැපත සැරදේවා! මම එතුමාට ප්‍රේම කරනවා."

මෙසේ කතා කල මීතියා හතිදමන්නට විය. ඔහු ගේ මුහුණ සුදුමැලි විය. තොල් වෙවුලුවේ ය. කම්මුල් දිගේ කඳුළු කඩා හැලෙන්නට විය.

"ජීවිතය සම්පූර්ණ වූ දෙයක්"යයි ඔහු යළි කතා කරමින් කී ය. "පොළොව යටත් ජීවය තියෙනවා. මල්ලී දන්නේ නැහැ, ජීවත්වීමට මා තුළ කො තරම් ලොකු ආශාවක් තියෙනවා ද කියා! ජීවත්වීමට මම බොහො ම ආසයි. මේ හිරගෙදර බිත්ති අතරට වී සිටින මා තුළ ජීවත්වීමටත්, කල්පනා කිරීමටත් බලවත් ආශාවක් තියෙනවා. රැකිටින්ට ඒක තේරුම් ගන්න බැහැ. මිනිහට උවමනා කරන්නේ ගෙයක් හදා කුලියට දීමටයි. ඒ වුණත් මම නුඹ එන තෙක් බලා සිටියා. දුක කියන්නේ කුමක් ද? දුක කො තරම් ලොකු දෙයක් වුවත් මම භය නැහැ. මීට කලින් දුක් විඳීමට මා තුළ බයක් තිබුණත් දැන් නම් කිසි ම බයක් නැහැ. සමහර විට හෙට නඩුවිභාගයේ දී ඔවුන් අසන ප්‍රශ්නවලට මා පිළිතුරු නො දී ඉන්න පුළුවනි. ඔනෑ ම දුක් වේදනාවක් විඳ ගැනීමට උවමනා ශක්තිය මා තුළ තියෙනවා. 'මම ජීවත්වෙමි, මම දහසක් දුක් විඳිමි, මම හිරගෙදර දුක් විඳිමි, එහෙත් මම ජීවත්වෙමි. මම සූර්යයා දකිමි. සූර්යයා නුදුටුවත් සූර්යයා පායා ඇති බව දනිමි.' හැම මොහොතක් පාසා ම මෙසේ කීම සඳහා උවමනා තරම් ශක්තිය මා තුළ තියෙනවා. අලෝෂා, මේ විදියේ නොයෙක් අදහස් නිසා මා තුළ තිබුණු සියලු ම බලාපොරොත්තු නැතිවී ගියා. ඒවා යකාට ගියදෙන්. ඉවාන්........."

"මොක ද ඉවාන් ගැන මතක් කළේ?"යි අලෝෂා මිතියා ගේ කතාවට බාධා කරමින් විමසුවේ ය.

"මේ විදියේ සැක සහිත අදහස් මීට කලින් මගේ හිතේ තිබුණේ නැහැ. සමහර විට ඒ අදහස් සැඟවී තියෙන්න ඇති. සමහර විට මට තේරුම් ගන්න බැරි මේ වගේ අදහස් මා තුළ ඇති වෙන්නට වූ නිසා වෙන්න ඇති. මම මත් පැන් බී කෝලාහල කරමින් නොනැත්පත් ජීවිතයක් ගත කෙළේ, මා කෝලාහල කළේ, මේ අදහස් සඟවා තැබීමට, මැඩ පැවැත්වීමට වියයුතුයි. නිහඬ කිරීමට විය යුතුයි. ඉවාන් රැකිටින්ට වඩා අමුතු කෙනෙක්. ඉවාන් කතා කරන කෙනෙක් නො වෙයි. මිනිහා බොහො ම නිශ්ශබ්ද යි. මගේ හිතට ලොකු කරදරයක් වී තියෙන්නේ දෙවියන් ගැන අදහසයි. නැති නම් මගේ සිතට වෙන කිසි ම කරදරයක් නැහැ. දෙවියෙක් නැතිනම් මොකද වෙන්නේ? රැකිටින් ගේ කතාව හරි නම්, ඒ කියන්නේ දෙවියන් මිනිසා විසින් මවා ගත්ත අදහසක් නම් මොක ද වෙන්නේ? දෙවියෙක් නැති නම් මේ ලෝකයට, විශ්වයට, අධිපති මිනිසායි. කො තරම් විශිෂ්ට දෙයක් ද! ඒ වුණත් දෙවියෙක් නැති නම් මිනිහා හොඳ නරක දැන ගෙන යහපත් වෙන්නේ කොහොම ද?

මේක තමයි වැදගත් ප්‍රශ්නය. දෙවියෙක් නැති නම් මිනිහා ප්‍රේම කරන්නේ කාට ද? කෘතඥ වෙන්නේ කාට ද? ගීතිකා ගයන්නේ කා වෙනුවෙන් ද? මගේ කතාව අසා රැකිටින් හිනා-වෙනවා. රැකිටින් කියනවා දෙවියන්ට ප්‍රේම නොකළාට මනුෂ්‍ය වර්ගයාට ප්‍රේම කරන්න පුළුවන් ය කියා. ඒ කතාව පිළිගන්න පුළුවන් මෝඩයකුට පමණයි. මට මේ අදහස තේරුම් ගන්න බැහැ. රැකිටින්ට ජීවත්වීම එ තරම් අමාරු දෙයක් නො වෙයි. මනුෂ්‍යයන්ට සමාජ අයිතිවාසිකම් දීම හා ආහාරවල මිල අඩු කිරීම ගැන කල්පනා කරන්න. ඔය දාර්ශනික අදහස්වලට වඩා, ඉහත සඳහන් කළ ක්‍රමවලින් බොහෝ ම ලෙහෙසියෙනුත් පහසුවෙනුත් මනුෂ්‍ය වර්ගයාට ප්‍රේම කරන්න පුළුවනි. 'එහෙත් දෙවියන් ගැන විශ්වාසයක් නැති තුඹට අවශ්‍ය නම් ලෙහෙසියෙන් ම පුළුවනි ආහාරවල මිල වැඩි කරල ලාභ ගන්න'යි මා කීවාම මිනිහට බොහෝ ම කේන්ති ගියා. කොහොම වුණත් 'යහපත්කම, කියන්නේ කුමකට ද? යහපත්කම, මා පිළිගන්න ක්‍රමයට නො වෙයි චීන ජාතිකයෙක් පිළිගන්නේ. අප දෙදෙනා යහපත්කම පිළිගන්නේ දෙයාකාරයකටයි. ඒ නිසා යහපත්කම පරස්පර විරෝධී සම්බන්ධකම් ඇති දෙයක්. එහෙම නේ ද? සම්බන්ධකමක් තියෙනවා නේ ද?' මම ඇසුවේ ගැඹුරු ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය නිසා මම රාත්‍රි දෙකක් ම නො නිඳා සිටියා ය කීවාම මල්ලී තුඹ මට හිනා වෙන්න එපා. මිනිස්සු ජීවිතය ගැන කල්පනා නො කර ජීවත්වන හැටි මහ පුදුමයක්. මිනිස්සු ජීවිතය ගැන කල්පනා නොකරන්නේ අහංකාර කම නිසයි. ඉවාන්ට දෙවියෙක් නැහැ. ඒ වෙනුවට අදහසක් තියෙනවා. ඒක මට තේරුම් ගන්න බැරි අදහසක්. ඒ වුණත් ඉවාන් කතා කරන්නෙත් නැහැ. සමහර විට ඉවාන් ෆ්‍රිමේසන් කෙනෙක් වෙන්න ඇති. මම ඒ ගැන ප්‍රශ්න කළා. මිනිහා කතා කරන්නේ නැහැ. මිනිහ ගේ උගත්කමින් ප්‍රයෝජනයක් ගැනීමට මම වෑයම් කළා. ඒත් මිනිහා කතා කරන්නේ නැහැ. එක වතාවක් පමණයි කතා කළේ."

"මොනව ද ඉවාන් කිව්වේ?"යි අලෝෂා වහා විමසුවේ ය.

"'එහෙනම් හැම දෙයක් ම නීතියට එකඟ ද?' කියා මම ඇසුවා. එතකොට ඉවාන් රවා බලා 'අපේ තාත්තා ඌරෙක්, නමුත් තාත්තා ගේ අදහස්වල වරදක් නැහැ'යි කිව්වා. මගේ කතාවේ ඇති වරද මට පෙන්නා දුන්නේ ඔය විදියටයි. ඊට වැඩිය ඉවාන් වචනයක්වත් කිව්වේ නැහැ. ඉවාන් රැකිටින්ට වැඩිය ටිකක් හොඳයි."

"ඔව්"යයි අලෝෂා ශෝකයෙන් කී ය. "කවද්ද ඉවාන්, අයියා බලන්න ආවේ?"

"ඒ ගැන පසු ව කතා කරමු. දූත් වෙන දෙයක් ගැන කියන්න තියෙනවා. අද වනතුරු මම ඉවාන් ගැන කිසි ම දෙයක් කිව්වේ නැහැ. ඒත් මම ඉවාන් ගැන කියන්නේ අන්තිමටයි. මෙ තැන වැඩ ඉවර වෙලා නඩු තීන්දුව දුන්නට පස්සේ මම සේරම කියන්නම්. මෙ තැන තියෙනවා බොහො ම භයානක කටයුත්තක්.........ඒ වෙලාවේ දී මල්ලි මගේ විනිශ්චය කාරයා විය යුතුයි. නමුත් ඒ ගැන දූත් වචනයක්වත් අහන්න එපා. මල්ලි ආවේ හෙට තියෙන නඩුව ගැන කතා කරන්න නේද? ඒත් මම ඒ ගැන කිසි ම දෙයක් දන්නේ නැහැ."

"අයියා නීතිඥයත් එක්ක කතා කළා ද?"

"නීතිඥයන්ට කතා කිරීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? මම මගේ නීතිඥයාට සේරම කිව්වා. මිනිහා ටවුමේ හැදිච්ච නම්බුකාර හොරෙක්. මා කියන වචනයක්වත් විශ්වාස කරන්නේ නැහැ. මිනිහ ගේ කල්පනාව මම තාත්තා මැරුවා ය කියායි. තාත්තා මැරුවේ මා ය කියා විශ්වාස කරනවා නම් මා වෙනුවෙන් කතා කරන්නේ මොනවට ද කියා මම ඇහැව්වා. උන් සේරට ම හෙණ ගහන්න ඕනෑ. මට පිස්සුයි කියා ඔප්පු කරන්න දොස්තර කෙනකුත් ගෙන්නලා. මම ඒකට ඉඩ දෙන්නේ නැහැ. මොනවා වුණත් කැතිරිනා හදන්නේ අන්තිම දක්වා ඇගේ යුතුකම් ඉටු කිරීමටයි." මීතියා ශෝකයෙන් සිනාසුණා ය. "කැතිරිනා බැලලියක් වගේ නපුරුයි. කැතිරිනා බොහො ම ඉක්මනින් කිපෙන ගැහැනියක් ය කියා මම මුක්රෝවේ දී කියාපු කතාව ඇයට ආරන්චි වෙලා. මා එහෙම කියාපු බව උන් ඇයට කියා තියෙනවා. මට විරුද්ධ ව තියෙන කරුණු මුහුදේ රැල්ල වගේ දවසින් දවස වැඩි වෙනවා. ගිරිගෝරිස්, මිනිහගේ සාක්ෂියේ වචනයක්වත් වෙනස් කරන්නේ නැහැ. මිනිහ අවංකයි. ඒ වුණත් මෝඩයි. හුඟ දෙනෙක් අවංක වෙන්නේ මෝඩකම නිසයි. ඒක රැකිටින් ගේ අදහසක්. ගිරිගෝරිස් මගේ හතුරා. මිත්‍රයන්ට වඩා සතුරන් හැටියට ප්‍රයෝජනය ඇති අයත් ඉන්නවා. මා එහෙම කිව්වේ කැතිරිනා ගැනයි. එදා මම ඇයට රූබල් හාර දහස දුන්නාම ඈ මා ඉදිරිපිට දණින් වැටී වැන්ද හැටි ඈ උසාවියේ දී කියාවිය කියා මට බොහො ම භයයි. ඈ අන්තිම තඹය දක්වා ඒ මුදල ආපසු

ගෙවාවි. ඇගේ ඒ පරිත්‍යාගය මට උවමනා නැහැ. උත් උසාවියේ දී මට බොහෝ ම අපහාස කරන්න පුළුවනි. එ තරම් අපහාසයකට මුහුණ පාන්නට මට ශක්තිය තියෙනවා ද කියා මට කල්පනා වෙනවා. මල්ලිට බැරි ද කැතිරිනා හමු වෙලා උසාවියේ දී ඒ ගැන මතක් කරන්න එපා ය කියා කියන්න? ඒක යකාට ගියදෙන්, ඒකට කමක් නැහැ. මම කොහොම හරි උසාවියට මුහුණ දෙන්නම්. ඒ වුණත් මගෙන් කැතිරිනාට කිසි ම අනුකම්පාවක් ලැබෙන්නේ නැහැ. මට ඇය ගැන බොහෝ ම කනගාටුයි. මේක ඇගේ වරද, තුළු වරදට ඇය දඬුවම් ලැබිය යුතුයි. මම වෙච්ච දෙය කියන්නම්. එහෙත් ගෘසෙන්කා මොනවටද මෙ තරම් දුක් විඳින්නේ? අනේ දෙයියනේ මොනවට ද ඇ මෙ තරම් දුක් විඳින්නේ?"යි මීතියා හදිසියෙන් ම දූසේ කඳුළු පිස දමමින් කීවේ ය. "මට ගෘසෙන්කා ගැන බොහෝ ම දුකයි. දූන් විකකට ඉස්සෙල්ලා ඇ මා බලන්න ආවා ....."

"ඔව්, ගෘසෙන්කා මට කිව්වා. අයියා ගේ කතාවෙන් අද ගෘසෙන්කා ගේ හිත බොහෝ ම නරක් වෙලා."

"ඔව්, මම දන්නවා. අද මට බොහෝ ම කේන්ති ගියා. ගෘසෙන්කා යන කොට මට ලොකු දුකක් ඇතිවෙලා මම ඇය සිම්බා. ඒත් මම ඇගෙන් සමාව ඉල්ලුවේ නැහැ."

"ඇයි සමාව ඉල්ලුවෙ නැත්තේ?"යි අලෝෂා විමසුවේ ය.

මීතියා හදිසියෙන් ම මහත් ප්‍රීතියෙන් සිනාසුණේ ය.

"මල්ලී, නුඹේ අතින් වරදක් වුණා නම්, විශේෂයෙන් ම නුඹ ආලය කරන තරුණියකට වරදක් කළා නම් දෙයියන් ගේ නාමෙට කවදාවත් ඇගෙන් සමාව ඉල්ලන්න එපා. නුඹේ අතින් කො තරම් ලොකු වරදක් වුණත් සමාව ඉල්ලන්න එපා. මල්ලී ගෑනුන් ගේ හැටි දන්නේ යක්ෂයා පමණයි. කොහොම වුණත් මම ගෑනු ගැන යමක් කමක් දන්නවා. බැරිවෙලාවත් එහෙම 'මේක මගේ වරද, මට සමාවන්න' කියා ගෑනියකට කිව්වොත් වැඩේ ඉවරයි. කවදාවත් කෙළින් ම සමාව දෙන්නේ නැහැ. පුළුවන් තරම් අපහාස කරාවි. කවදාවත් නොකරපු දේවල් මතක් කොට බණීවි. ගෑනු කවදාවත් කිසි ම දෙයක් අමතක කරන්නේ නැහැ. හැම දෙයක් ම මතක තියා ගන්නවා. ඒ සේරම මතක් කරලා, නැති දේවල් ඇති කරලා හොඳට ම බැණලා තමයි අන්තිමේ දී සමාව දෙන්නේ. ගෑනුන්ගෙන් වැඩි දෙනෙක් ඔහොම තමයි. කළ නොකළ හැම දෙයක් ම

ඇදලා බණිව්. පණ පිටින් ම තුඹේ හම ගසාව්. හැම ගෑනියකගේ ම හැටි ඔහොම තමයි. නමුත් ගෑනු නැති ව අපට ජීවත් වෙන්න බැහැ. මල්ලී මම අවංක ව ඇත්ත කියන්න ද? හැම ශිෂ්ට මිනිහෙක් ම ගෑනියකට යටත් වී සිටිය යුතුයි. ඒක තමයි මගේ පිළිගැනීම. පිළිගැනීම පමණක් නො වෙයි, මගේ හැඟීමත් ඒකයි. මිනිහෙක් වුණොත් උදාර ගති ගුණ තියෙන්න ඕනෑ. උදාර අදහස් තියෙන්න ඕනෑ. ඒකෙන් එයා ගේ ගරුත්වය නැති වෙන්නේ නැහැ. සීසර් වැනි වීරයකු ගේ චරිතයට වුවත් පළුද්දක් වෙන්නේ නැහැ. කොහොම වුණත් කවදාවත් කිසි ම හේතුවක් නිසාවත් ගෑනියකගෙන් සමාව ඉල්ලන්න එපා. ඒ නීතිය හොඳට මතක තියාගන්න. තුඹට මේ නීතිය කියා දුන්නේ ගෑනුන් අතින් විනාශ වූ තුඹේ අයියා වන මීතියා විසිනුයි. කොහොම වුණත් මට පුළුවනි සමාව නො ඉල්ලා ගෲසෙන්කා එක්ක යාළු වෙන්න. මම ඇයට වඳිනවා මල්ලී. මම ඇයට වඳිනවා. නමුත් ඇ ඒ බව දන්නෙ නැහැ. ඇ තවමත් හිතනවා මම ඇයට ආලය කරන්නේ නැහැ කියා. ඇ ඇගේ ආලයෙන් මට දස වද දෙනවා. මීට කලින් ඇගේ ලක්ෂණ ඇඟපත මට මහත් වදයක් වුණා. නමුත් දැන් මම ඇගේ ආත්මය මගේ ආත්මය තුළට ගෙන ඇය තුළින් මිනිහෙක් වුණා. උන් අපට විවාහ වෙන්න ඉඩ දේවි ද? ඇය සමඟ විවාහ වීමට ඉඩ නො ලැබුණොත් මා ඊර්ෂ්‍යාවෙන් මැරෙන්න පුළුවනි. මම හැම දා ම ඇය ගැන නොයෙක් දේවල් හිතින් මවා ගෙන කල්පනා කරනවා......... මොනවද ඇ මා ගැන කිව්වේ?''

එ දින ගෲසෙන්කා තමා සමඟ කී හැම දෙයක් ම අලෝෂා මිතියාට කීවේ ය. සැලැකිල්ලෙන් අසා සිටි මීතියා ඇතැම් දේවල් කීප වරක් අසා දැනගත්තේ ය

''එහෙනම් ගෲසෙන්කා ගැන ඊර්ෂ්‍යා කළාට ඇ මා එක්ක තරහ වෙලා නැහැ. ගෑනුන් ගේ හැටි ඔහොම තමයි මගේ හිත බොහො ම නපුරුයි කියා ඇ මට කිව්වා. මම කැමැති එහෙම අයටයි. අපි කො තරම් කෝලාහල කළත් මම ඇයට බොහො ම ආදරෙයි. උන් අපට කසාද බඳින්න ඉඩ දෙයි ද? සිරකරුවන්ට කසාද බඳින්න ඉඩ දෙනවා ද? ඒක තමයි ප්‍රශ්නය. ගෲසෙන්කා නැති ව මට ජීවත් වන්න බැහැ.........''

කාමරය තුළ සක්මන් කරමින් සිටි මීතියා යළි රවා බැලුවේ ය. ක්‍රමයෙන් අඳුරු වැටෙන්නට විය. තමා හදිසියෙන් ම ඇති වූ සිත් තැවුලකින් පෙළෙන බව ඔහු හැඟෙව්වේ ය.

"එහෙනම් ගෘසෙත්කා හිතනවා ඇති අපි තුන් දෙනා එකතු වෙලා ඇයට විරුද්ධ ව කුමන්ත්‍රණයක් කරනවා ය කියා. කැතිරිනාත් කුමන්ත්‍රණයට හවුල් වෙලා. නැහැ ගෘසෙත්කා තුඹ බුරත්තේ වැරදි ගහටයි. තුඹට වැරදීමක් වෙලා තියෙන්නේ- ඒක ගැනු ගතිය...... එහෙනම් මල්ලී මම තුඹට අපේ රහස කියන්නම්."

වට පිට බැලූ මිතියා ඉදිරිපිට සිටගෙන සිටි ඇලෝෂා ළඟට ගොස් රහසින් අද්භූත කතාවක් කියන්නකු මෙන් යම් කිසිවක් කියන්නට විය. මහ භාරකාරයා කාමරයේ මුල්ලක තබා ඇති බන්කුවක් උඩ හිඳ නිදා වැටෙන අතර මුරකාරයා බොහෝ ඈතින් සිටියේ ය.

"මම මල්ලිට රහස සම්පූර්ණයෙන් ම කියන්නම්" යයි මිතියා පහත් හඬින් වහවහා කීවේ ය. "මා මේ රහස කියන්න අදහස් කළේ පසු වයි. නමුත් මල්ලි ගේ උපකාරය නැති ව මම කොහොම ද කිසි ම දෙයක් ගැන තීරණයකට බහින්නේ? මල්ලි හැර මට කිසි ම කෙනෙක් නැහැ. ඉවාන් අපට වඩා ලොකු උගතෙක්. නමුත් තුඹ මට සුරදූතයකු වගෙයි. ඒකේ ඇත්ත නැත්ත කියන්න පුළුවන් මගේ කතාව අසා මල්ලි ගන්නා තීරණය අනුවයි. සමහර විට අප හැම දෙනාට ම වඩා උසස් ඉවාන් නො ව, තුඹ වෙන්න පුළුවනි. මේක අධ්‍යාත්මය සම්බන්ධ වූ දෙයක් වෙන්න ඕනෑ. මේ රහස කො තරම් වැදගත් ද කියතොත් ඒ ගැන මට තනියෙන් තීරණයක් ගන්න බැහැ. ඒ ගැන තුඹ සමඟ සාකච්ඡා කරන තෙක් තීරණයක් නො ගෙන කල් දැම්මා. කොහොම වුණත් තීරණයක් ගන්න නඩුව අවසන් වනතෙක් ඉන්න ඕනෑ. නඩුව අවසන් වූ වහා ම මල්ලිට පුළුවනි මගේ ඉරණම ගැන තීරණයකට බහින්න. මම රහස කියන්නම්. නමුත් දැන් ම තීරණයකට බහින්න එපා. රහස අහගන්නවා මිස කිසි ම දෙයක් කියන්න එපා. රහස සම්පූර්ණයෙන් ම කියන්නේ නැහැ. විස්තර නැති ව කෙටියෙන් අදහස පමණක් කියන්නම්. කිසි ම දෙයක් කියන්න එපා. කිසි ම ප්‍රශ්නයක් අහන්න එපා. කිසි ම දෙයක් කරන්න එපා. එහෙනම් මගේ යෝජනාවට එකඟ වෙනව ද? නමුත් මල්ලි ගේ ඇස්වල බැල්ම ගැන මොකද කරන්නේ? කතා නො කළත් ඇස්වලින් තුඹේ අදහස හෙළි වේවි. මට ඒ ගැන බයයි. මල්ලි, ඉවාන් මට යෝජනා කළා පැනලා යන්න. නමුත් පැනල යන හැටි මම තුඹට කියන්නේ නැහැ. හැම දෙයක් ම සූදානම් කරලයි තියෙන්නේ මම

ගෘසෙන්කා එක්ක ඇමෙරිකාවට යා යුතුයි. මල්ලී දන්නවා ඇති, මට ගෘසෙන්කා නැති ව ජීවත් වෙන්න බැහැ. ගෘසෙන්කාට මා සමඟ සයිබීරියාවට යන්න ඉඩ නො දුන්නොත් මොකද කරන්නේ? උන් සිරකාරයන්ට විවාහ වෙන්න දෙන්නේ නැහැ නේ ද? ඉවාන් කියනවා බඳින්න දෙන්නේ නැහැ කියා. ගෘසෙන්කා නැති ව මම හිරගෙදර ගල් කඩන්නේ කොහොම ද? මට තියෙන්නේ ගල් කඩනවා වෙනුවට ඔළුව පලාගන්නයි. මට මේ දුකින් පැනලා යන්න ඉඩ තිබුණා. මට අවස්ථාවක් පැමිණියා. නමුත් එය ප්‍රතික්ෂේප කළා. මට ගැලවිල්ලට මාර්ගයක් තිබුණා. මම ඒ මාර්ගයට පිටුපා ගියා. ඉවාන් කියනවා, 'හොඳ චරිතයක් ඇති ව මෙහෙ ඉඳගෙන ගල් කඩනවාට වඩා හොඳයි ලු මම ඇමෙරිකාවට යනවා නම්. නමුත් හිරගෙදරට ගියොත් අපේ ප්‍රාර්ථනයට මොකද වෙන්නේ? ඇමෙරිකාව කියන්නේ කුමන දෙයකට ද? ඇමෙරිකාව කියන්නේ බොරු අහංකාර කමටයි. මගේ කල්පනාවේ හැටියට ඇමෙරිකාවේ හොර බොරු වංචා වැඩ බොහො ම තියෙනවා. මට මේ දුකින් පැනලා යන්න ඉඩ තිබුණා. මල්ලී, මම මේවා කියන්නේ තුඹට තේරුම් ගන්න පුළුවන් නිසයි. තුඹ හැර වෙන කිසි ම කෙනකුට තේරුම් ගන්න බැහැ. මම ගීතය ගැන තුඹට කියාපු කතාව අසා වෙන අය මට පිස්සුයි කියාවි. එක්කෝ මා පිස්සෙක්ය කියාවි, නැතිනම් මා මෝඩයෙක්ය කියාවි. මගේ මොළය නරක් වෙලත් නැහැ. මා මෝඩයෙකුත් නො වෙයි. ඉවාන්ටත් මගේ අදහස් තේරුම් ගන්න පුළුවනි. නමුත් මිනිහ කතා කරන්නේ නැහැ. මිනිහ ගැන විශ්වාසයක් තියන්නත් බැහැ. මල්ලී මට තුඹේ මූහුණෙන් පේනවා තුඹ මා ගැන තීරණයකට බැස ගෙන සිටින බව. කරුණා කර මා ගැන තීරණයකට බහින්න එපා. මට ගෘසෙන්කා නැති ව ජීවත් වෙන්න බැහැ. නඩුව අවසන් වනතෙක් ටිකක් ඉවසන්න."

මිතියා කතාව අවසන් කළේ වියරු වැටුණකු මෙනි. දෑතින් ම අලෝෂා ගේ උරහිස් අල්ලා ගත් ඔහු බැබැළෙන බැහැපත් දෑසින් අලෝෂා ගේ නෙත් දෙස බැලුවේ ය.

"උන් හිරකාරයන්ට කසාද බඳින්න දෙනවා ද?"යි මිතියා තුන් වන වරට ද විමසුවේ කිසිවක් ඉල්ලා යාච්ඤා කරන්නකු මෙනි.

පුදුමයෙන් හා සැලැකිල්ලෙන් සොහොයුරා ගේ කතාව අසා සිටි අලෝෂා තුළ මහත් ශෝකයක් ඇති විය.

"ඉවාන්, අයියාට පැනලා යන්න ය කියා බලකරනව ද? මේක කාගේ අදහසක් ද?"යි අලෝෂා විමසුවේ ය.

"ඉවාන් ගේ අදහසක්. පැනලා යන්න ය කියා මට බල කරන්නේ ඉවාන්. මුල දී ඉවාන් මා බලන්න ආවේ නැහැ. නමුත් දැන් සතියකට පමණ කලින් මෙහාට ඇවිදින් මේ යෝජනාව කළා. මගේ කැමැත්ත අකැමැත්ත විමසන්නේ නැති ව පැනලා යන්න ය කියා බල කරනවා. තුඹ කිව්වා වගේ මම මගේ අදහස් ඉවාන්ටත් පැහැදිලි කරල කිව්වා. නමුත් ඉවාන්ට හොඳට ම විශ්වාසයි මම එයා කියන දෙය කරාවිය කියා. පැනලා යන හැටි මට විස්තර කළා. උවමනා කටයුතු සේරම පිළියෙල කරලා ඉවරයි. ඒ ගැන විස්තර පසු ව කියන්නම්. නමුත් කොහොම හරි පැනලා යන්න ය කියා බල කරනවා. ප්‍රධාන දෙය මුදල්. ඉවාන් කියනවා ගමනට රූබල් දහ දහසකුත්, ඇමෙරිකාවේ පදිංචි වෙන්න විසි දහසකුත් වියදම් කරනවා ය කියා. රූබල් දහ දහසක් වියදම් කළොත් බොහො ම ලෙහෙසියෙන් පැනලා යන්න පුළුවන් ලු."

"මොන ම හේතුවක් නිසාවත් මේ ගැන මට කියන්න එපා කියා ඉවාන් කිව්ව ද?"යි අලෝෂා වැඩි දුරටත් විමසුවේ ය.

"කිසි ම කෙනකුට කියන්න එපා කිව්වා. විශේෂයෙන් ම අලෝෂාට කියන්න එපා කිව්වා. සමහර විට පැනයාමට විරුද්ධවන ලෙස තුඹ මගේ හිත වෙනස් කරාවිය කියා ඉවාන් හය ඇති. පිංසිද්දවෙයි මේ ගැන මා කී බව මතක් කරන්නවත් එපා."

"අයියා ගේ කතාව ඇත්තයි. නඩුව අවසන් වනතෙක් කිසි ම දෙයක් ගැන තීරණයකට බහින්න බැහැ. නඩුව අවසන් වූ පසු අයියාට පුළුවනි තනියෙන් ම වුණත් තීරණයකට බහින්න. අයියා තුළ අලුත් මිනිසකු සිටින බව දැනගන්න ලැබේවි. ඒ අලුත් මිනිහා කළ යුතු දෙය තීරණය කරාවි."

"මේ ගැන අලුත් මිනිහා තීරණයකට බසීවි ද, නැති නම් පරණ මිනිහා පරණ විදියට තීරණය කරාවි ද කියන්න බැහැ. මගේ කල්පනාවේ හැටියට මම බොහො ම නරක මිනිහෙක්" යයි මිතියා වේදනාවෙන් සිනා සී කී ය.

"අයියාට මේ නඩුවෙන් නිදහස් වෙන්න පුළුවන් ය කියා බලාපොරොත්තු වෙන්න බැරි ද?"

මිතියා නොසන්සුන් කම දක්වා, උරහස් හකුලා හිස වැනුවේ ය.

"මල්ලිට දූන් යන්න පමා වෙනවා"යි ඔහු හදිසියෙන් ම කලබල වෙමින් කී ය. "අන්න සුපිරිත්වැන්ඩන් මිදුලේ ඉඳගෙන කෑගානවා. දූන් මිනිහා මෙහාට ඒවි. අපි හුඟ වෙලාවක් කතා කළා. ඒක නීතියට විරුද්ධයි. ඉක්මනට මා බදා ගෙන සිඹින්න. මගේ හිස උඩින් කුරුසය අඳින්න. මට හෙට කුරුසය කරගහගෙන යන්න වෙනවා."

සොහොයුරන් දෙදෙනා එකිනෙකා වැළඳ ගෙන සිඹ ගත්හ.

"මට පැනලා යන්න කිව්වේ ඉවාන්. නමුත් ඉවාන් හිතනවා මම තාත්තා මැරුවා ය කියා"යි මිතියා හදිසියෙන් ම කී ය.

ශෝකයෙන් හටගත් සිනාවක් ඔහු ගේ තොල් මත දකින්නට තිබිණි.

"අයියා තාත්තා මැරුවා ය කියා ඉවාන් පිළිගෙන තිබෙන බව අයියා ඉවාන්ගෙන් ඇහැව්ව ද?"

"නැහැ. අහන්න කල්පනා කළා. නමුත් අහන්න තරම් ආත්ම ශක්තියක් තිබුණේ නැහැ. ඉවාන් ගේ අදහස් මම එයා ගේ මුහුණින් දැන ගත්තා. දූන් ඉතින් යන්න."

ඔවුහු යළි එකිනෙකා වැළඳ ගත්හ. අලෝෂා පිට වී යනවාත් සමඟ මිතියා යළි ඔහු ආපසු කැඳෙව්වේ ය.

"ඔ තැන ඉඳ ගෙන මා දිහා බලන්න. අන්න හරි"යි පැවසූ මිතියා යළි මලණුවන් ළඟට ගොස් ඔහු ගේ උරහිසින් අල්ලා ගත්තේ ය. ඔහු ගේ මුහුණ බලා සිටිය දී සුදු මැලි විය. හොඳට ම අඳුරු වූ එම කාමරයේ අඳුර තුළින් පවා මුහුණේ සුදුමැලිකම දකින්නට තිබිණි. ඔහු ගේ තොල් වෙව්ලුවේ ය. ඔහු ගේ දෑස අලෝෂා දෙසට එල්ල විය.

"මල්ලී දෙවියන් ඉදිරිපිට හිටගෙන ඇත්ත කියනවා වගේ දූන් මා ඉදිරිපිට හිටගෙන ඇත්ත කියන්න. තාත්තා මැරුවේ මා ය කියා සැක කරනවා ද? බොරු නො කියා ඇත්ත කියන්න"යි මිතියා උමතු වූවකු මෙන් කී ය.

හැම දෙයක් ම කරකැවෙන්නාක් මෙන් ඔහුට දැනිණි. අනතුරු ව තම හදවතට තියුණු අවියකින් අනින්නාක් මෙන් දරුණු වේදනාවක් දැනිණි.

"අනේ දෙයියනේ, මොනවා ද අයියා දොඩන්නේ?" යි අලෝෂා නො සන්සුන් වෙමින් කී ය.

"බොරු නො කියා ඇත්ත කියන්න" යි මිතියා ආයේත් කී ය.

"අයියා තාත්තා මැරුවා ය කියා මම මොහොතකටවත් විශ්වාස කළේ නැහැ" යි අලෝෂා කී ය. හදවත තුළින් පැමිණි ඒ වචන වෙව්ලුලුවේ ය. අනතුරු ව ඔහු, තමා ගේ ප්‍රකාශයෙහි සත්‍යතාව ඔප්පු කිරීමට සාක්ෂිකරුවකු ලෙස දෙවියන් කැඳවන්නාක් මෙන් දෑත ඉස්සුවේ ය.

මිතියා ගේ මුහුණ ප්‍රීතියෙන් ආලෝක විය.

"බොහො ම සතුතියි" මිතියා සෙමෙන් කීවේ ක්ලාන්ත ව සිට යළි සිහිය ලැබීමෙන් පසු දිග සුසුමක් හෙළන්නාක් මෙනි. "මල්ලි ගේ කතාවෙන් මම අලුත් මිනිහෙක් වුණා. මට අලුත් ප්‍රාණයක් ලැබුණා. මල්ලි දන්නවා ද, මේ මොහොත වනතෙක් මල්ලිගෙන් පවා මේ ප්‍රශ්නය ඇසීමට මම බයෙන් හිටියා. දැන් ඉතින් යන්න. හෙට නඩුවට පෙනී සිටීමට අවශ්‍ය ශක්තිය මට ලැබුණා. මල්ලිට දෙයියන් ගේ පිහිටයි! ඉවාන්ට ආදරයෙන් සිටින්න." මේ මිතියා ආලෝෂාට පැවැසූ අවසාන වචන කීපයයි.

අලෝෂා නික්ම ගියේ දෑසේ කඳුළු ඇති ව ය. මිතියා කිසි ම කෙනෙක් විශ්වාස කරන්නේ නැහැ. තම මලණුවන් වන අලෝෂා පවා විශ්වාස කරන්නේ නැහැ. තම අවාසනාවන්ත සොහොයුරා ගේ ආත්මය තුළ ඇත්තා වූ ශෝකයේ හා බලාපොරොත්තු නැති කමේ ගැඹුරු පතුල අලෝෂා දුටුවේ ය. මීට පෙර ඔහු මේ ගැන සැක කළේවත් නැත. ඒ මොහොතෙහි ම අලෝෂා තුළ තම සොහොයුරා කෙරෙහි මෙතෙක් යයි කිව නොහැකි තරම් ගැඹුරු දයානුකම්පාවක් ඇති විය. ඔහු ගේ දුකින් මිරිකුණු හදවත යළි කකියන්නට විය. 'ඉවාන්ට ආදරයෙන් සිටින්න'යි මිතියා කී අවසාන වචන අලෝෂාට මතක් විය. ඔහු යන්නේ ඉවාන් හමුවීමට ය. එදා දවස පුරා අලෝෂා ඉවාන් හමුවීමේ අදහසින් බලා සිටියේ ය. ඔහු මිතියා ගැන කරදර වූ තරමට ම ඉවාන් ගැන ද කරදර විය. මිතියා හමුවීමෙන් ඒ නො සන්සුන් කම තව තවත් වැඩි විය.

පස් වන පරිච්ඡේදය

අයියා නො වෙයි, අයියා නො වෙයි

ඉවාන් නතර වී සිටි තැන බලා යන අතරේ කැතිරිනා ගේ නිවෙස පසු කළ යුතු ය. නිවෙසේ කවුළු තුළින් පහන් එළියක් දකින්නට තිබිණි. හදිසියෙන් ම නතර වූ අලෝෂා එහි යාමට තීරණය කෙළේ ය. සතියකින් පමණ ඔහුට කැතිරිනා හමු නොවූවා ය. එහෙත් මේ වේලාවේ ඉවාන් කැතිරිනා සමඟ කතා කරමින් සිටිතැයි ඔහුට කල්පනා විය. සීනුව නාද කළ අලෝෂා, චීන පහන් කුඩුවකින් යන්තම් ආලෝක වූ පඩි පෙළ නැඟ යන අතරේ පඩි පෙළ බැස එන ඉවාන් ඇඳින ගත්තේ ය. එසේ නම් ඔහු එන්නේ කැතිරිනා හමුවීමෙන් පසු ව ය.

"මේ මල්ලී නේද! මම යන්නයි සූදානම් වුණේ. මල්ලී ආවේ කැතිරිනා හමු වෙන්න ද?"යි ඉවාන් ඇසුවේ ඇනුම් පදයක් කියන්නාක් මෙනි.

"ඔව්."

"මා හිතන්නේ නැහැ දැන් කැතිරිනාට කතා කරන්න හොඳ ය කියා. ඈ බොහො ම කලබල වෙලා. සමහර විට මල්ලී කතා කළොත් ඈ තව තවත් කලබල වෙන්න පුළුවනි."

"නැහැ, නැහැ," යන කට හඬ උඩු මහලේ ඇර තබන ලද දොරක් තුළින් ඇසිණි. "අලෝෂා එන්නේ මීතියා හමු-වෙලා ද?"

"ඔව්, මම මීතියා බලන්න ගියා."

"මීතියා පණිවිඩයක් එහෙම කිව්ව ද? අලෝෂා එන්න ගෙය ඇතුළට. ඉවාන් කරුණා කරල එන්න."

කැතිරිනා ගේ කට හඬේ වහා පිළිපැදිය යුතු නියෝගයක ස්වරූපයක් තිබුණ නිසා, මඳක් ලතව වී කල්පනා කළ ඉවාන් අලෝෂා සමඟ ආපසු යාමට තීරණය කෙළේ ය.

"ඈ අපේ කතාව අහගෙන හිටියා"යි ඉවාන් කෝපයෙන් තමාට ම කියාගත්තේ ය. නමුත් එය අලෝෂාට ඇසිණි.

"මගේ කබාය ඉවත් නොකළාට මා සමඟ අමනාප වෙන්න එපා"යි ඉවාන් විසිත්ත කාමරයට යන අතරේ කී ය. "මට ඉඳගන්න බැහැ. මම මිනිත්තුවකට වඩා නවතින්නේ නැහැ."

"අලෝෂා වාඩි වෙන්න"යි තවමත් සිටගෙන සිටි කැතිරිනා කීවා ය. පසු ගිය සතිය තුළ දී ඇය තුළ ඇති වී තිබුණේ ඉතා සුළු වෙනසකි. එහෙත් ඇගේ අඳුරු දෑස තුළ අනතුරු හඟවන ආලෝකයක් දකින්නට තිබිණි. ඒ මොහොතේ දී ඇය තුළ විශේෂ අලංකාරයක් දකින්නට තිබුණු බව අලෝෂා පසු ව කී ය.

"මොකක් ද මිතියා කියාපු පණිවිඩය?"

"එක ම දෙයයි කිව්වේ" අලෝෂා තරුණිය ගේ දෑස දෙස බලා කී ය. "අර නගරයේ දී, පළමු වරට දූන ඇඳුනුම් කම් ඇති කරගත් කාලයේ දී සිදු වූ කිසි ම දෙයක් උසාවියේ දී කියන්න එපා ය කියා අයියා කිව්වා." අලෝෂා මඳක් නොසන්සුන් විය.

"ඔය කියන්නේ අර මුදල් ඉල්ලා මිතියා ළඟ දණින් වැටුණු හැටි ද?"යි කැතිරිනා කෝපයෙන් සිනාසී ඇසුවා ය. "මා ඒ කතාව කිව්වොත් එයාට වරදක් වේ ය කියා බය ද? නැති නම් මට වරදක් වේ ය කියා බය ද? කතාව නො කියා බේරගන්නේ කවු ද? එයා ද මා ද?"

අලෝෂා තරුණිය දෙස පරීක්ෂාවෙන් බලා සිටියේ ඇගේ අදහස් දූන ගැනීම පිණිස ය.

"කැතිරිනාගේත් අයියාගේත් හොඳටයි" අලෝෂා සෙමෙන් කී ය.

"හා එහෙම ද?"යි කැතිරිනා කෝපයෙන් ඇසුවා ය. අනතුරු ව ඇගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය.

"අලෝෂා තව ම මා අඳුනන්නේ නැහැ"යි ඈ තර්ජනාත්මක සවරයෙන් කීවා ය. "මමවත් තව ම මගේ හැටි දන්නේ නැහැ. හෙට සාක්ෂි දුන්නට පස්සේ මා විනාශ කිරීමට අලෝෂාට අදහස් වේවි."

“මා හිතනවා කැතිරිනා අවංක ව සාක්ෂි දේ ය කියා. එ පමණයි උවමනා කරන්නේ”යි අලෝෂා කී ය.

“ගැහැනු බොහෝ විට චපලයි” කැතිරිනා දත් සපමින් කීවා ය. “ඒ භයානක මිනිහාට අත තැබීම පවා භයානක දෙයක් ය කියා දූත් පැයකට කලින් මට කල්පනා වුණා. හරියට විසකුරු සර්පයකු වගෙයි. දූත් මට දැනෙනවා මගේ ඒ අදහස වැරදි බව. තවමත් මම මීතියාට සලකන්නේ මනුෂ්‍යයකුට සලකන විදියටයි. නමුත් මේ භයානක අපරාධය කළේ මීතියා ද? මීතියා මිනීමරුවෙක් ද?”යි ඈ වහා ඉවාන් දෙසට හැරෙමින් උමතුවෙන් කෑගාන්නකු මෙන් කෑගා ඇසුවා ය. තමා පැමිණීමට පෙර කැතිරිනා මෙම ප්‍රශ්නය ඉවාන්ගෙන් ඇසූ බවත්, එක වරක් නො ව සිය වරක් පමණ අසා ඇති බවත්, එහෙත් මේ ප්‍රශ්නය උඩ කැතිරිනා ඉවාන් සමඟ කලහ කරගත් බවත් අලෝෂාට කල්පනා විය.

“මම පැවල් බලන්න ගියා......... තාත්තා මැරුවේ මීතියා බව මට කිව්වේ ඉවාන්. මම විශ්වාස කළේ ඉවාන් කියන දෙය පමණයි” ඈ ඉවාන් අමතමින් කීවා ය.

ඉවාන් අමාරුවෙන් සිනාසුණේ ය. කැතිරිනා දක්වූ කුළුපග භතිය දූක අලෝෂා පුදුම විය. ඔවුන් අතරේ මෙ තරම් කිට්ටු සබඳකමක් ඇතැයි අලෝෂා යන්තමින්වත් සැක නො කෙළේ ය.

“දූත් ඉතින් ඔය ගැන කතා කළා ඇති”යි ඉවාන් තරුණිය ගේ කතාවට බාධා කරමින් කීවේ ය. “මට යන්න පමා වෙනවා. මම හෙට එන්නම්.” මෙසේ පැවැසූ ඉවාන් විසිත්ත කාමරයෙන් පිට වී පඩි පෙළ බැස ගියේ ය. කැතිරිනා වහා දූතින් ම අලෝෂා අල්ලාගෙන “යන්න යන්න, ඉක්මනට යන්න, මොහොතකටවත් ඉවාන් තනි කරන්න එපා. ඉවාන්ට පිස්සු. පෙනෙන්නේ නැද්ද ඉවාන්ට පිස්සු බව? දොස්තර කිව්වා අසනීපයෙන් සිටින බව. ඉක්මනට යන්න”යි රහසක් කියන්නාක් මෙන් පහත් හඬින් වහවහා කීවා ය.

අලෝෂා වහා හුනස්නෙන් නැගිට, යාර පනහක් පමණ ඈතින් ගමන් කරමින් සිටි සොහොයුරා වෙත දිව ගියේ ය.

“තුඹට මොනව ද ඕනේ?”යි ඉවාන් තමා ළඟට දිව පැමිණි මලණුවන්ගෙන් විමසුවේ ය. “මට පිස්සු, ඒ නිසා මා පස්සෙන් එන්න ය කියා කැතිරිනා තුඹට කිව්වා. මට ඒක කට පාඩම්”යයි ඔහු කෝපයෙන් කී ය.

"කැතිරිනා අයියාට පිස්සුයි කියත්තේ කිසි ම දෙයක් දැනගෙන නො වෙයි. නමුත් අයියා අසනීපයෙන් සිටින බව නම් ඇත්තයි. මූහුණ දැක්ක හැටියේ ම මම දැනගත්තා අසනීපයෙන් සිටින බව"යි අලෝෂා කී ය.

ඉවාන් නො නැවැතී ගමන් කෙළේ ය. අලෝෂා ඔහු පසුපසින් ගියේ ය.

"මල්ලී, නුඹ දන්නව ද මිනිසුන්ට පිස්සු හැදෙන හැටි?"යි ඉවාන් හදිසියෙන් ම, කුතුහලයෙන් පිරි සත්සුන් කට හඬින් ඇසුවේ ය.

"නැහැ, මං දන්නේ නැහැ. නොයෙක් විදියට පිස්සු හැදෙනවා ඇති."

"තමාට පිස්සු හැදෙන බව කෙනකුට කියන්න පුළුවන් ද?"

"මා හිතන්නේ නැහැ කියන්න පුළුවන් ය කියා"යි අලෝෂා පුදුමයෙන් කී ය.

ඉවාන් මිනිත්තු දහයක් පමණ වේලා නිහඬ ව සිටියේ ය.

"මල්ලිට මා එක්ක කතා කරන්න උවමනාවක් තියෙනවා නම් කරුණා කර මේ කතාව වෙනස් කරන්න"යි ඔහු හදිසියෙන් ම කී ය.

"මට දැනුයි මතක් වුණේ අයියාට දෙන්න මා ළඟ ලියුමක් තියෙනවා"යි මඳක් ලැජ්ජාවෙන් පැවැසූ අලෝෂා සාක්කුවේ දමා ගෙන සිටි ලීසා ගේ ලියුම ගෙන දුන්නේ ය.

එ වේලේ ඔවුහු පහන් කණුවක් යටට පැමිණියහ. පිට කවරයේ නම ලියා තිබුණු අත් අකුරු ඉවාන් වහා ඇඳින ගත්තේ ය.

"හා, මේක අර පොඩි යක්ෂණිය ගේ ලියුමක්"යයි කෝපයෙන් සිනා සෙමින් පැවැසූ ඉවාන් ලියුම දිග හැර බලනවා වෙනුවට කැලිවලට ඉරා වීසි කෙළේ ය. ඒ කැලි සුළඟත් සමඟ ගසාගෙන ගියේ ය.

"මා හිතන්නේ ඒ කෙල්ලට තව ම අවුරුදු දහසයක්වත් නැති ව ඇති. ඒකට මොකද පිරිමින් ගේ පස්සෙන් එන්න හදනවා"යි ඉවාන් යළි ගමන් පිළිකුලින් කී ය.

"පිරිමින් ගේ පස්සෙන් එන්න හදනවා? මොකක් ද ඒ කතාවේ තේරුම?"යි අලෝෂා විමසුවේ ය.

"වල් ගෑනු වාගේ පස්සෙන් එනවා."

"මොනවද මේ දෙඩවන්නේ?"යි අලෝෂා ශෝකයෙන් විමසුවේ ය. "ඈ තව ම දරුවෙක්. ලෙඩින් සිටින දරුවකුට වල් ගෑනි කියා අපහාස කරනවා. සමහර විට ඇයටත් පිස්සු හැදෙන්න ලං වෙලා ඇති මා බලාපොරොත්තු වුණේ ඇය බේරා ගත හැකි කිසියම් ක්‍රමයක් අයියාගෙන් දැන ගැනීමටයි."

"මට කියන්න දෙයක් නැහැ. ඈ පොඩි දරුවෙක් නම් මම ඇගේ කිරි අම්මා නො වෙයි. කට වහගෙන හිටපන් මල්ලි. මම ඈ ගැන කල්පනා කළේවත් නැහැ."

මිනිත්තු පහක් ගතවන තුරු ඔවුහු නිහඬ ව ගමන් ගත්හ.

"හෙට උසාවියේ දී සාක්ෂි දෙන හැටි දැන ගැනීමට ඈ එළිවන තෙක් දේවමෑණියන්ට යාච්ඤා කරාවි"යි ඉවාන් කෝපයෙන් කී ය.

"කවුද? කැතිරිනා ද?"

"ඔව්, හෙට මීතියා ඇති කරන්න ද? නැතිනම් නැති කරන්න ද? කියා ඈ දෙයියන්ගෙන් අනුශාසනා ලැබෙන තෙක් යාච්ඤා කරනවා. කළ යුතු නොකළ යුතු දෙය ගැන තීරණයකට බැහැ-ගැනීමට තරම් ශක්තියක් ඈට නැහැ. තීරණයකට බැහැ ගැනීමට තරම් කාලයක් තිබුණෙත් නැහැ. කැතිරිනා හිතනවා මම ඇගේ කිරි අම්මය කියා. ඈ මට කියා නළවා ගන්න හදනවා."

"කැතිරිනා අයියාට ආදරෙයි" අලෝෂා ශෝකයෙන් කී ය.

"වෙන්න පුළුවනි. නමුත් මගේ කැමැත්තක් නැහැ."

"ඈ බොහෝ ම ලොකු දුකක් විඳිනවා. ඇයි එහෙනම් සමහර විට ඇගේ හිතේ බලාපොරොත්තු ඇති කරවන දේවල් කියන්නේ?"යි අලෝෂා අහිංසකයකු ලෙස ඇසී ය. "මේ විදියට කතා කරනවට මට සමා වෙන්න."

"කැතිරිනා සමඟ තියෙන සම්බන්ධය එක පාර ම නතර කරන්න පුළුවන් කමක් නැහැ"යි ඉවාන් නො සන්සුන් වෙමින් කී ය. "මිනීමරුවාට දඬුවම් ලැබෙන තෙක් ඉවසන්න ඕනෑ.

නැති නම් ඈ අර කාලකණ්ණි තක්කඩියා උසාවියේ දී විනාශ කර දමාවි. ඈ මිතියා සමග ජන්මාන්ත වෛරයි. ඈ සමඟ තියෙන සම්බන්ධය ඒ විදියට ම තබා ගෙන හිටියොත් ඈ ඒ භයානක මෘගයා විනාශ කරන්නේ නැහැ. ඈ දන්නවා මම මිතියා නිදහස් කර ගැනීමට වෑයම් කරන බව. මේ කාලකණ්ණි නඩුව කවදා අවසන් වෙයි ද?"

'මිනීමරුවා' 'භයානක මෘගයා' යන වචන අලෝෂා ගේ හදවතේ තියුණු වේදනාවක් ඇති කෙළේ ය.

"නමුත් කොහොම ද කැතිරිනා මිතියා විනාශ කරන්නේ?"යි අලෝෂා මඳක් කල්පනා කොට ඇසුවේ ය. "ඈ මිතියාට විරුද්ධ ව ඉදිරිපත් කරන සාක්ෂි මොනවා ද?"

"මල්ලි තව ම ඒ ගැන කිසි ම දෙයක් දන්නේ නැහැ. මිතියා තාත්තා මැරුව බව ඔප්පු කරන්න පුළුවන්, මිතියා ගේ අත් අකුරින් ම ලියාපු ලියුමක් කැතිරිනා ළඟ තියෙනවා."

"ඒක වෙන්න බැරි දෙයක්"යයි අලෝෂා කී ය.

"මොකද නැත්තේ? මම ඒ ලියුම කියෙව්වා."

"එහෙම ලියුමක් තියෙන්න බැහැ"යි අලෝෂා කෝපයෙන් කී ය. "මිතියා තාත්තා මැරුවෙ නැති නිසා එහෙම ලියුමක් තියෙන්න බැහැ. තාත්තා මැරුවේ ලොකු අයියා නො වෙයි."

ඉවාන් ගල්ගැසුණාක් මෙන් නතර විය.

"එහෙනම් තුඹේ අදහසේ හැටියට තාත්තා මැරුවේ කවුද?"යි ඉවාන් පැහැදිලි ව පෙනෙන උදාසීනත්වයකින් යුතු ව විමසුවේ ය. එහි නොසැලැකිලි ගතියක් ද දකින්නට තිබිණි.

"අයියා දන්නවා ඇති මිනීමරුවා කවුද කියා?"යි අලෝෂා තියුණු, එහෙත් පහත් සවරයෙන් විමසුවේ ය.

"මල්ලි කියන්නේ අර පිස්සු මෝඩ මීමැස්මොරකාරයා තාත්තා මැරුවා ය කියන කතාව ද?"

තමා ගේ සර්වාංගය ම වෙවුලන බව අලෝෂාට හදිසියෙන් ම දැනිණි.

"අයියා දන්නවා තාත්තා මැරුවේ කවුද කියා!" යන වචන අලෝෂා ගේ මුවෙන් නො දැනුවත් ව ම පිට විය. ඔහුට හුස්ම ගැනීම පවා අමතක විය.

"කවුද මැරුවේ කියාපන්?"යයි ඉවාන් කෝපයෙන් අණ කෙළේ ය. ඔහු ගේ ආත්ම සංයමය හදිසියෙන් ම අතුරුදහන් විය.

"තාත්තා මැරුවේ අයියා නො වෙයි. එ පමණයි මා දන්නේ"යි අලෝෂා රහසක් කියන්නාක් මෙන් සෙමෙන් කී ය.

"අයියා නො වෙයි? මොකක් ද ඒ කතාවේ තේරුම?" ඉවාන් බිරාන්ත විය.

"තාත්තා මැරුවේ අයියා නො වෙයි" අලෝෂා ආයේත් ස්ථිර ස්වරයෙන් කී ය.

මිනිත්තු භාගයක් පමණ ගතවන තුරු ඔවුහු එකිනෙකා සමඟ කතා නොකළහ.

"තාත්තා මැරුවේ මා නොවන බව මම දන්නවා"යි ඉවාන් අමාරුවෙන් සිනා සෙමින් කී ය. "මොකද මල්ලී තුඹට පිස්සු ද?"

ඉවාන් තම මලණුවන් දෙස ඇසිපිය නො සලා බලා සිටියේ ය. එ වේලේ ඔවුන් දෙදෙනා සිටියේ පහන් රුකක් යට ය.

"අයියා කීප වරක් ම තනියෙන් ම කියා ගත්තා, තාත්තා මැරුවේ අයියා ය කියා."

"මම එහෙම දෙයක් කිව්වේ කවද්ද? එදා මම හිටියේ මොස්කව් නුවරයි" ඉවාන් අවුල් වූ සිතින් කී ය.

"පසු ගිය භයානක මාස දෙකේ දී අයියා තනියෙන් හිටිය හැම විට ම, කීප වතාවක් ම කිව්වා තාත්තා මැරුවේ මම ය කියා"යි අලෝෂා පෙර මෙන් සෙමෙන් හා පැහැදිලි ව ද කී ය. එහෙත් ඔහු එසේ කිවේ සිය කැමැත්තෙන් ම නො ව, මැඩ ගත නොහැකි කිසියම් බලවේගයකට යටත් වන්නාක් මෙනි. "තාත්තා මැරුවේ අයියා බව කියා, අයියා අයියාට ම විරුද්ධ ව චෝදනා කරගත්තා. නමුත් තාත්තා මැරුවේ අයියා නො වෙයි. අයියා අතින් ලොකු වරදක් වුණේ. මිනීමරුවා අයියා නො වෙයි. මා කියන දෙය ඇහුණා නේ ද? මේ බව කියන්න දෙවියන්-වහන්සේ අයියා ළඟට මා එව්වා."

සොහොයුරෝ දෙදෙනා නිහඬ වූ හ. ඒ නිශ්ශබ්දතාව මිනිත්තුවක් පමණ වේලා පැවැතිණි. දෙදෙනා ම එකිනෙකා ගේ

නෙත් දෙස බලා හුන්හ. දෙදෙනා ම සුදුමැලි වූහ. හදිසියෙන් ම කෝපයෙන් වෙව්ලන්නට පටන්ගත් ඉවාන් අලෝෂා උරහිසින් දැඩි ව ගෙන සෙලෙව්වේ ය.

"එදා රෑ ඒ මිනිහ එන කොට මල්ලී මගේ කාමරයේ හිටියා නේ ද? ....මල්ලී දුටුවා නේ ද? ඇත්ත කියාපන්."

"කා ගැන ද අයියා දොඩන්නේ? මිනියා ගැන ද?"යි අලෝෂා පුදුමයෙන් විමසුවේ ය.

"මිනියා නො වෙයි, ඒ තිරිසනා යකාට ගියදෙන්"යයි ඉවාන් මහ හඬින් කෑගා කී ය. "මිනිහා මා හමුවෙන්න එන බව තුඹ දන්නවා නේ ද? කොහොම ද දැනගත්තේ? ඇත්ත කියාපන්."

"මොන මිනිහෙක් ද? මං දන්නේ නැහැ අයියා කා ගැන කතා කරනව ද කියා"යි අලෝෂා තැති ගෙන ඇසුවේ ය.

"මොක ද නොදන්නේ? තුඹ ඒ මිනිහා නොදන්නවා ය කියන කතාව වෙන්න බැරි දෙයක්."

හදිසියෙන් ම යළි ගන සිත මැඩගන්නාක් මෙන් ඉවාන් කතාව නතර කෙළේ ය. තිහඬ වූ ඔහු, කිසියම් දෙයක් ගැන කල්පනා කරන්නාක් මෙන් පෙනිණි. අද්භූත සිනාවකින් ඔහු ගේ දෙතොල් ඇද විය.

"අයියා"යි අලෝෂා යළි වෙව්ලන කටහඬින් ඉවාන් අමතා කී ය. "මා මේ කතාව කිව්වේ අයියා මා කියන දෙය විශ්වාස කරන නිසයි. 'තාත්තා මැරුවේ අයියා නො වෙයි' කිව්වේ මුළු ජීවිතයට ම අයියාට ඒක මතක සිටීම පිණිසයි. ඒ බව අයියාට කියන්න, එය මගේ හදවතට ඇතුළු කළේ දෙවියන් වහන්සේ විසිනුයි සමහර විට මේ මොහොතේ සිට අයියා සදහට ම මට වෛර කරන්න පුළුවනි."

මේ මොහොත වන විට ඉවාන් සම්පූර්ණයෙන් ම සිතත් සයත් සිස්මවා ගත්තේ ය.

"මල්ලී මට, අනාගත වක්තෘවරයෝයි, අපස්මාර ලෙඩ්ඩුයි පෙන්නන්න බැහැ. විශේෂයෙන් ම දේවදූතයන් මට පෙන්-නන්න බැහැ. තුඹ ඒ බව හොඳට දන්නවා. මේ මොහොතේ සිට මම තුඹ එක්ක තියෙන සේරම සම්බන්ධකම් අත්හරිනවා. සමහර විට සදහට ම අත්හරින්න පුළුවනි. කරුණා කරල

මේ හන්දියේ දී මගෙත් වෙත් වී පලයන්. නුඹ ඉන්නේ මේ පාරේ ටිකක් ඈතින් නේද? අද මා ළඟට නො එන්න පරිස්සම් වෙයන්. ඇහුණා නේද?''

අනතුරු ව ඔහු සතරමං සන්ධියෙන් හැරී, ආපසු නො බලා, දුර අඩි තබා, වහවහා ගමන් කෙළේ ය.

''අයියේ, අද යම් කිසිවක් සිදු වුණොත් අනෙක් හැම දෙනාට ම පළමු ව මා මතක් කරන්න''යි අලෝෂා කෑගා කී ය.

ඉවාන් කිසිවක් නො කියා ගමන් කෙළේ ය. සොහොයුරා අඳුර තුළින් නො පෙනී යන තෙක් අලෝෂා මං සන්ධිය ළඟ නතර වී බලා සිටියේ ය. අනතුරු ව ඔහු ආපසු හැරී තමා ගේ නිවෙස බලා ගමන් ගත්තේ ය. ඔවුහු වෙන ම තැන්වල නතර වී හුන්හ. පියා ගේ නිවෙසේ නතරවීමට එකෙක්වත් කැමැති නො වී ය. අලෝෂා වෙළෙන්දකුගෙන් ඇඳ පුටු සමග කුලියට ගත් කාමරයක නතර වී සිටින අතරේ, ඉවාන් මඳක් ඈතින් පිහිටි, මියගිය නිලධරයකු ගේ ධනවත් වැන්දඹුවක සතු අලංකාර නිවසකට සම්බන්ධ වූ සැප පහසු කමින් යුත්, මඳක් ලොකු කාමරයක නතර වී සිටියේ ය. ඉවාන් ගේ සියලු ම වැඩ කටයුතු කරදෙනු ලැබුවේ, සවස හයට නිදා ගෙන උදේ හයට නැගිටින, අත්පා ඉදිමුණු මැහැල්ලක විසිනි. මහත් පුදුමයකට මෙන් තමා ගේ සැප පහසු කම් ගැන වැඩි සැලැකිල්ලක් නොදක් වූ ඉවාන් හුදෙකලාවේ සිටීමට ප්‍රිය කෙළේ ය. තමා ගේ කාමරය අතුපතු ගා පිරිසුදු කරගත් හෙතෙම එම නිවසේ අනෙක් කාමරවලට කලාතුරකින්වත් නොගියේ ය.

ගේට්ටුව ළඟට පැමිණ සීනුව හැඬවීමට සැරසුණු හෙතෙම හදිසියෙන් ම නතර විය. තමා ගේ සර්වාංගය ම කෝපයෙන් වෙවුලන බව ඔහුට දැනිණි. සීනුව අතහැරිය හෙතෙම සාප කරමින් ආපසු හැරී, නගරයේ කෙලවර, තම නිවසේ සිට සැතපුම් එකහමාරක් පමණ ඈතින් පිහිටි ලීයෙන් කළ පැරැණි ගෙයක් බලා වහවහා ගමන් කෙළේ ය. මේ ගෙදර පදිංචි ව සිටියේ මහ ගෙදර ළඟ පදිංචි ව සිටි, කෑම ඉල්ලා මහ ගෙදරට පැමිණෙන, මායා කොන්ද්‍රත්යෙව්නා නැමැති ඉතිරියසි. වරක් පැවල් ගිටාරය වයා ගීයක් කීවේ ඇයට ය. ඈ ඇගේ කුඩා ගෙය විකුණා දමා මවත් සමග පැල්පතක වාසය කලා ය. මහලු කරමසෝ ගේ මරණයෙන් පසු රෝගාතුර වූ පැවල් ඔවුන් සමග වාසය කෙළේ ය. හදිසියෙන් ම ඇති වූ බලකිරීමකට අවනත වූ ඉවාන් මේ තකහනි-යෙන් යන්නේ පැල්පතේ නතර වී සිටින පැවල් හමුවීමට ය.

හය වන පරිච්ඡේදය

පළමු හමුවීම

මොස්කව් නුවර සිට පැමිණි පසු ඉවාන්, පැවල් හමු වීමට ගිය තුන් වන වතාව මෙයයි. පලමු වරට ඉවාන් පැවල් හමු වී කතා කළේ තාත්තා ගේ මරණයෙන් පසු ගමට පැමිණි පලමු දවසෙහි ය. දෙසතියකට පසු ඔහු යළි පැවල් හමු විය. ඉක්බිති ව මසක් පමණ ගතවන තුරු ඔහුට පැවල් ගැන ආරංචිමාත්‍රයක් පවා අසන්නට නො ලැබිණි. ඉවාන් මොස්කව් නුවර සිට ගමට පැමිණියේ පියා ගේ මරණයෙන් පස් වන දිනයෙහි ය. එ හෙයින් හතර වන දින පැවැත්වූ මළගමට සහභාගි වීමට ඔහුට ඉඩ නො ලැබිණි. මේ පමාවට හේතු වූයේ ඉවාන් ගේ මොස්කව් නුවර ලිපිනය නොදත් අලෝෂා, ඉවාන්ට විදුලි පණිවිඩයක් යවන ලෙස කැතිරිනාට භාරදීම ය. ඉවාන් ගේ ලිපිනය නොදත් කැතිරිනා ඇගේ නැන්දනිය හා සොහොයුරිය වෙත විදුලි පණිවිඩයක් යැව්වේ මොස්කව් නුවරට ගිය වහා ම ඉවාන් ඔවුන් හමු වීමට යාවිය යන විශ්වාසය පිට ය. එහෙත් මොස්කව් නුවරට ගොස් හතර දවසකට පසු ව ය ඉවාන් ඔවුන් හමුවීමට ගියේ. විදුලි පණිවිඩය දුටු වහා ම ඉවාන් ආයේත් ආපසු ගම බලා පිටත් විය. ගමට පැමිණි හැටියේ ම ඔහුට හමු වූ පලමු වන තැනැත්තා අලෝෂා ය. නමුත් ඔහු ගේ බලවත් පුදුමයට තාත්තා ගේ මරණය ගැන මිතියා සැක නො කළ අලෝෂා පැවල් ගැන එළිපිට ම සැක කෙළේ ය. අලෝෂා ගේ සැකය ගමේ පිළිගැනීමට පටහැනි විය. පලාතේ පොලිස් කපිතන් හා දණ්ඩනායකයා හමු වී තාත්තා ගේ මරණය ගැන විස්තර දැන ගත් පසු මලණුවන් ගේ අදහස් ගැන ඉවාන් වඩාත් පුදුම විය. අලෝෂා මිතියා ගැන සැක නො කළේ ඔහු මිතියාට ආදරයෙන් සිටින නිසා යයි ඉවාන් අදහස් කෙළේ ය.

අප මෙහි දී, ඉවාන් තම සොහොයුරු වන මිතියා ගැන දරන අදහස් පිළිබඳ විස්තරයක් කොට කාරණය එ තැනින් අවසන් කරමු. ඉවාන්, මිතියාට කිසි ම කැමැත්තක් නො දැක්වී ය. ඇතැම් විට ඔහු තුළ මිතියා ගැන අනුකම්පාවක් ඇති වෙයි. නමුත් එය පිළිකුලත්, නුරුස්නා ගතියත් සමඟ මිශ්‍ර වූ

අනුකම්පාවකි. මීතියා ගේ ගතිගුණ ගැන පමණක් නො ව ස්වරූපය ගැන ද ඉවාන් වැඩි කැමැත්තක් නො දැක්වී ය. කැතිරිනා මීතියාට දැක්වූ ආලය ඉවාන් ගේ පිළිකුලට හේතු විය. එහෙත් පියා ගේ මළගම සඳහා ගමට පැමිණි පළමු දින ම ඉවාන් මීතියා හමුවීමට ගියේ ය. සොහොයුරා හමුවීමෙන් අනතුරු ව ඔහු වැරදි කාරයෙක් ය යන හැඟීම ඉවාන් තුළ තහවුරු විය මීතියා මහත් නොසන්සුන් කමින් පසුවන බව ඔහු දුටුවේ ය. මීතියා ගේ කතාව ආකූල විය. ඔහු කතා කළේ කල්පනාවෙන් නො වේ. තාත්තා මැරුවේ පැවෙල් බව ඔහු කී ය. ඔහු වැඩියෙන් ම කතා කළේ තාත්තා විසින් ඔහුගෙන් සොරා ගන්නා ලද රූබල් තුන් දහ ගැන ය.

"ඒ මුදල් මට අයිතියි. ඒ මුදල් සොරකම් නො කළත් සොරකම් කිරීමට මට අයිතියක් තියෙනවා"යි ඔහු කීප වරක් ම කීවේ ය.

තමාට විරුද්ධව තිබෙන සාක්ෂි ගැන ඔහු කිසිවක් නොකීවේ ය. තමා ගේ වාසියට තිබෙන කරුණක් ඉදිරිපත් කිරීමට අදහස් කළා නම් ඔහු මහ අවුලක් කරගත්තේ ය. ඉවාන්ට හෝ වෙන කෙනකුට හෝ තමා ගේ නිවැරදිකම ඔප්පු කිරීමට ඔහු වෑයම් නො කෙළේ ය. ඔහුට විරුද්ධ ව ඉදිරිපත් කොට ඇති චෝදනා ගැන ඔහු කිපුණේ ය. ප්‍රතික්ෂේප කෙළේ ය. තමා ගේ වාසියට ඇති කරුණක් ඉදිරිපත් කරන විට අවුල් කරගත්තේ ය. තමා ගේ නිවැරදි කම ඔප්පු කිරීමට ඔහුට උවමනාවක් නැතැයි කෙනකුට හැඟී යන්නට පිළිවන. ඔහු නොසන්සුන් විය. වත්තේ සිට ගෙට ඇතුළු වීමට තිබෙන දොර ඇර තිබුණ බව කියමින් ගිරිගෝරිස් දුන් සාක්ෂි ගැන සිනාසුණ මීතියා ඒ දොර යක්ෂයා විසින් ඇර තබන්නට ඇතැයි කී ය. දොර ඇර තිබීම ගැන පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් කිරීමට ඔහු අසමත් විය. 'හැම දෙයක් ම නීතියට එකඟයි' කියන අයට තමා ගැන සැක කරමින් ප්‍රශ්න ඇසීමට කිසි ම අයිතියක් නැතැයි කියමින් මීතියා ඉවාන්ට අපහාස කිරීමට වෑයම් කෙළේ ය. එ වේලේ මීතියා ඉවාන්ට කිසි ම කැමැත්තක් නො දැක්වී ය. අයියා හමුවීමෙන් අනතුරු ව ඉවාන් කෙළින් ම ගියේ පැවෙල් හමුවීමට ය.

මොස්කව් නුවර සිට ආපසු ගමට එන අතරේ, තමා ගමින් නික්ම යාමට පෙර පැවෙල් සමඟ කළ කතාව හා පැවෙල් ගැනත් ඉවාන් කල්පනා කරන්නට විය. බොහෝ දේවල් ගැන ඔහු සැක කෙළේ ය. තවත් බොහෝ දේ ඔහුට ප්‍රහේලිකාවක් විය.

එහෙත් පරීක්ෂණය පැවැත්වූ රාජ නීතිඥයාට ප්‍රකාශයක් කළ ඉවාන් පැවෙල් සමඟ කළ කතාව ගැන කිසිවක් නොකීවේ ය. රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි පැවෙල් හමුවී කතාකරන තෙක් ඔහු එය කල් දැම්මේ ය. 'පියා මරනු ලැබූ දවසේ පැවෙල්ට වැලඳුණු මීමැස්මොරය සැබෑවක් ද? නැතිනම් බොරුවක්ද?'යි ඉවාන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දුන් රෝහලේ දොස්තරවරු දෙදෙනා, පැවෙල් ගේ රෝගය ගැන සැක කිරීමට කිසි ම හේතුවක් නැති බව පවසා එවැනි ප්‍රශ්නයක් ඇසීම ගැන පුදුම වූ හ. එහෙත් දවස් කීපයක් තුළ දී වරින්වර වැලඳෙන මේ රෝගය ඉතා භයානක බවත්, ඉන් රෝගියාට අනතුරක් විය හැකි බවත්, එහෙත් දැන් තමන් විසින් නියම ප්‍රතිකර්ම කොට ඇති හෙයින් රෝගියාට අනතුරක් සිදු නොවන බව නිසැක ව ම කිව හැකි බවත්, වැඩි දුරටත් පැවැසූ හ. කොහොම වුණත් ලෙඩා ගේ කල්පනා ශක්තියට තාවකාලික ව, නැතිනම් සදහට ම හානියක් සිදුවන්නට ඉඩ තිබෙන බව දොස්තර හර්සන්ට්‍යුබ් කී ය. එසේ නම් පැවෙල් උමතුවෙන් සිටින බව මින් අදහස් වන්නේ දැ?යි ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන් දොස්තර, ලෙඩා උමතු නො වූවත් සමහරවිට එක්තරා ප්‍රමාණයකට විපරීත ගතියක් ඇති විය හැකි බව කී ය. විපරීත ගතිය කුමක් විය හැකි දැ?යි තනියෙන් ම සොයා බැලීමට ඉවාන් අදහස් කෙළේ ය.

රෝහලට ගිය වහා ම ඔහුට රෝගියා බැලීමට අවසර දෙන ලදි. පැවෙල් සිටියේ වෙන ම කාමරයකය. එහි තිබුණු අනෙක් ඇඳේ 'ඔජරයෙන්' ඉදිමී සිටි වෙළෙන්ද දවසකින් දෙකකින් මිය යන්නට පිළිවන. තමා ගේ කතාවට ඔහුගෙන් බාධවක් විය නො හැකි ය. සැක සිතින් සිනාසුණු පැවෙල් මුල දී නැති ගත් බවක් හැඟෙව්වේ ය. එය ටික වේලාවකට පමණි. අනෙක් මුළු කාලය තුළ ම පැවෙල් දැක්වූ නැත්පත් ගතිය දැක ඉවාන් පුදුම විය. පැවෙල් ගේ රෝගය ගැන සැක කිරීමට හේතුවක් නැති බව ඉවාන් බැලූ බැල්මට ම දැන ගත්තේ ය. ඉතා දුබල තත්ත්වයක සිටි හෙතෙම ඉතා සෙමෙන් කතා කළේ දිව සොලවා කතා කිරීමට අපහසු වූවාක් මෙනි. ඔහු කෙට්ටුය. සුදුමැලිය. කතා කළ මිනිත්තු විස්ස තුළ දී හිස හා අත්පා කකියන බව කීවේ ය. ඔහු ගේ වියළුණු මුහුණ කුඩා වූවාක්මෙන් පෙනිණි. නළල උඩට වැටුණු හිස කෙස් අවුල් විය. එහෙත් ඔහු ගේ වම් ඇසින් ඔහු ගේ පැරණි ගති ගුණ හෙළි විය. "ඥානවන්තයකු සමඟ කතා කිරීමට ලැබීම ලොකු වාසනාවක්"යයි වරක් පැවෙල් කී කතාව ඉවාන්ට එක් වරම සදහන් විය. ඉවාන් ඇඳ ළඟ පුටුවක

හිඳ ගත්තේ ය. පැවල් ඉතා අමාරුවෙන් මදක් ඉස්සුණේ ය. එහෙත් කතා නොකල හෙතෙම, කතා කිරීමට වැඩි කැමැත්තක් ද නො දැක්වී ය.

"උඹට කතා කරන්න පුළුවන් ද?"යි ඉවාන් විමසුවේ ය. "මම උඹට වැඩිය මහන්සි වෙන්න දෙන්නේ නැහැ."

"කතා කරන්න පුළුවනි"යි පැවල් ඉතා අමාරුවෙන් කී ය. "තමුන්නාන්සේ ගමට ඇවිදින් හුඟ දවසක් වෙනව ද?"යි ඔහු අනතුරු ව ඇසුවේ ඉවාන් ගේ නොසන්සුන් කම පහ කිරීමට මෙනි.

"උඹ කල අවුල බලන්න අදයි ආවේ."

පැවල් දිග සුසුමක් හෙළුවේ ය.

"ඇයි උඹ සුසුම් හෙලන්නේ? ඇයි වෙච්ච දෙය දන්නෙ නැද්ද"යි ඉවාන් අපරික්ෂාවෙන් විමසුවේ ය.

"මෙහෙම දෙයක් වෙන බව මම කලින් දැන ගෙන හිටියා. නමුත් මේ විදියට සිද්දවේය කියා කවු ද දන්නේ?"යි පැවල් කීවේ මිනිත්තු දෙකක් නිහඬ ව සිටීමෙන් පසු ව ය.

"මෙහෙම දෙයක් කියන්නේ මොකක් ද? බබෙක් වගේ කතා කරන්න එපා. කැඩැත්ගුවට නගින අතර උඹට මීමැස්මොරය හැදෙන බව උඹ කලින් කිව්වේ නැද්ද? හැදෙන තැනත් උඹ කිව්වා නේද?"

"තමුන්නාන්සේ ඒ බව පොලීසියට කිව්ව ද?"යි පැවල් විමසුවේ කිසි ම කලබල ගතියක් දක්වා නො වේ.

ඉවාන් ගේ කෝපය ඇවිස්සිණි.

"තව ම පොලීසියට කිව්වේ නැහැ. නමුත් මම ඒ ගැන පොලීසියට කියනවා. යාළුවා, මට බොරු කරන්න එපා. උඹට මගෙන් කිසි ම දෙයක් හංගන්න ලැබෙන්නේ නැහැ. ටිකක් පරිස්සම් වෙයන්. උඹට මා එක්ක සෙල්ලම් කරන්න ලැබෙන්නේ නැහැ."

"දෙයියන් වහන්සේ විශ්වාස කරනවා වගේ මම තමුන්නාන්සේ විශ්වාස කරනවා. ඉතින් මොනවට ද මම බොරු කරන්නේ?"යි ඔහු කීවේ පෙර පැවැති සන්සුන්කම රැකගෙන මොහොතක් පමණ වේලා නෙත් වසා ගනිමිනි.

"කිසි ම කෙනකුට මීමැස්මොරය හැදෙන වේලාව කල්තියා කියන්න බැරි බව මම දන්නවා. මම ඒ ගැන සෝදිසි කලා. එහෙම දෙයක් නැතැයි කියන්න එපා. අසවල් වේලාවට මීමැස්මොරය හැදෙනවා ය කියා කල්තියා කියන්න බැහැ. එහෙනම් අසවල් වේලාවේ දී, කැබැත්ගුවේ දී, මීමැස්මොරය හැදෙන බව උඹ කොහොම ද මට කිව්වේ? ඔනෑ කමින් ම බොරුකලා නම් උඹ කොහොම ද කල්තියා දැනගත්තේ අසවල් වේලාවට මීමැස්මොරය හැදී තරප්පුව දිගේ පහළට වැටෙන බව?"

"කොහොම වුණත් මට දවසට කීප වතාවක් ම කැබැත්ගුවට යන්න වෙනවා. මීට අවුරුද්දකට ඉස්සෙල්ලත් මම තරප්පුව දිගේ වැටුණා. අසනීප වන වේලාව කල්තියා කියන්න බැරි බව ඇත්තයි. නමුත් අසවල් වේලාවට අසනීප වේ ය කියා හිතන්න පුළුවනි. ඒ බව ඇගට දැනෙනවා"යි පැවල් කිසි ම කලබලයක් නො දක්වා කී ය.

"නමුත් අසවල් දවසේ අසවල් වේලාවට මීමැස්මොරය හැදෙන බව උඹ මට කලින් කිව්වා."

"මගේ අසනීපය ගැන දැනගන්න උවමනා නම් දොස්තර මහත්මයා ගෙන් අහන්න. මගේ අසනීපය ඇත්තක් ද බොරුවක් ද කියන වග දොස්තර මහත්මයා ගෙන් දැන ගන්න පුළුවනි. ඒ ගැන ඊට වැඩිය කියන්න දෙයක් නැහැ."

"නමුත් කැබැත්ගුවේ දී මීමැස්මොරය හැදෙන බව උඹ කොහොම ද දන්නේ?"

"තමුන්නාන්සේට කැබැත්ගුව අමතක කරන්න බැරිවා එහෙයි. එදා කැබැත්ගුවට යන කොට මම බොහො ම භයෙන් හිටියේ. මොනවා වෙයි ද කියා මම කල්පනා කලා. මට භය හිතුණේ තමුන්නාන්සේ ගම හැර ගිය නිසා මට පිහිට වෙන්න කෙනෙක් නොසිටිය නිසයි. මම තරප්පුව නැග්ගේ මීමැස්මොරය දැන් හැදේවි ය කියා භයෙන්. ඒ භය නිසාමයි මීමැස්මොරය හැදී තරප්පුව දිගේ වැටුණේ ඊට ඉස්සෙල්ලා දවසේ සවස ගේට්ටුව ළඟ දී මම තමුන්නාන්සේට කියාපු දේවල්, කැබැත්ගුවට යන ගමන ගැන මම භයෙන් සිටිය හැටි සේරම මම දොස්තර මහත්මයාටත්, නඩුකාරයාටත් කිව්වා. ඒ ගොල්ලෝ ඒ සේරම ලියා ගත්තා. මීමැස්මොරය ගැන කල්පනා කිරීම නිසා ම මීමැස්මොරය හැදෙන්න පුළුවන් බව දොස්තර

මහත්මයා කිව්වා. එහෙම කල්පනා කිරීම නිසා තමයි මට අසනීප වුණේ. මා ගයෙත් හිටිය නිසා මට අසනීප වූ බව ලියා ගත්තා."

මෙසේ පැවැසූ පැවල් අනතුරුව තදින් හුස්ම ගත්තේ එඩා වැරී සිටින්නකු මෙනි.

"එහෙනම් පොලිසියට සාක්කි දෙන කොට උඹ මේවා සේරම කිව්ව ද?" යි ඉවාන් විමසුවේ මඳක් පුදුම වෙමිනි. එදා සවස ඔවුන් අතරේ සිදු වූ කතාබහ පොලිසියට හෙළි කරන බව පවසා පැවල් තැති ගැන්වීමට ඉවාන් අදහස් කෙළේ ය. තමුන් ඔහු ගේ කතාවේ හැටියට දූත් ඔහු ඒ සියල්ල පොලිසියට පවසා ඇති බව පෙනේ.

"මං මොනවට ද භය වෙන්නේ? පොලිසිය ඇත්ත ලියා-ගත්තදෙන්" යයි පැවල් කීවේ කිසි ම බියක් සැකක් දක්වා-නො වේ.

"උඹ ගේට්ටුව ලඟ දී මට කියාපු දේවල් සේරම පොලිසියට කිව්ව ද?"

"නැහැ, හැම වචනයක් ම කිව්වේ නැහැ."

"පුරසාරම් දෙඩුවා වගේ ඕනෑ ම වේලාවක දී මීමැස්මොරය හදාගන්න පුළුවන් බවත් කිව්ව ද?"

"නැහැ. ඒක කිව්වේ නැහැ."

"දූත්වත් කියාපන් උඹ මොන අදහසකින් ද මට චමස්නියාවට යන්න කිව්වේ?"

"එහෙම කිව්වේ තමුන්නාන්සේ මොස්කව් නුවරට යාවි ය කියා හිතාගෙනයි. චමස්නියාවේ සිටීම මොස්කව් නුවර සිටිනවාට වඩා ලඟයි."

"උඹ කියන්නේ බොරු. කරදරවලට අහු නොවෙන්න නම ගමින් පිටවී යන්න ය කියා උඹ මට කිව්වා."

"මම එහෙම කිව්වේ තමුන්නාන්සේට ඇති හිතවත්කම හා මිත්‍රකම නිසයි. මේ ගෙදර තියෙන පෙරළිය දකින විට මට තමුන්නාන්සේ ගැන කනගාටුවක් ඇති වුණා. ඊටත් වඩා මා ගැන මට ම කනගාටු ඇති වුණා. මේ කරදරවලට අසු නො වී

ගෙදරින් පිටවී යන්න කිව්වේ, මේ ගෙදර කලබලයක් ඇති වන බව තේරුම් ගෙන, තාත්තා ආරක්‍ෂා කරගැනීම පිණිස තමුන්නාන්සේ නතර වේය යන අදහසිනුයි.''

''මෝඩයා, ඇයි ඒ බව මට කෙළින් ම නොකිව්වේ?''යි ඉවාන් කෝපයෙන් ඇසුවේ ය.

''කොහොම ද කෙළින් ම කියන්නේ? තමුන්නාන්සේ තරහවේ ය කියා මට භය හිතුණා. තමුන්නාන්සේ ගේ සහෝදරයා කලබලයක් කරලා මුදල් පැහැර ගෙන යා ය කියා මට කල්පනා වුණා. ඒ මුදල් තමා ගේ මුදල් හැටියටයි මිතියා අදහස් කරගෙන හිටියේ. නමුත් මා කොහොම ද දන්නේ මේ සේරම මිනී-මැරුම්කිත් අවසන් වන බව? මා කල්පනා කළේ ලොකු හාමුදුරුවෝ ලියුම් කවරයක දමා කොට්ටය යට සඟවා ගෙන සිටින රූබල් තුන්දහ මිතියා අරගෙන යාවි ය කියායි. නමුත් මිතියා තාත්තා මැරුවා. තමුන්නාන්සේට වුවත් මිතියා තාත්තා මරාවි ය කියා හිතන්න පුළුවන් ද?''

''එහෙම මිනීමැරුමක් වේ ය කියා උඹට හිතන්න බැරිනම් මම කොහොම ද හිතාගෙන ගෙදර නවතින්නේ? උඹේ කතාවට ම විරුද්ධවයි උඹ කතා කරන්නේ''යි ඉවාන් මඳක් කල්පනා කොට කීවේ ය.

''තමුන්නාන්සේට මොස්කව් නො ගොස් චමස්නියාවට යන්න කියාපු නිසා මේ ගැන සැක කරන්න ඉඩ තිබුණා.''

''මා කොහොම ද සැක කරන්නේ?''

බලවත් විඩාවකින් සිටින බව හැඟවූ පැවල් මඳ වේලාවක් නිහඬ ව සිටියේ ය.

''මොස්කව් නො ගොස් චමස්නියාවට යන්න කීමෙන් මා අදහස් කළේ වඩා දුර නො ගොස් ළඟ සිටීමට බව තමුන්-නාන්සේට කල්පනා කිරීමට ඉඩ තිබුණා. මොස්කව් දුර වැඩියි. තමුන්නාන්සේ ළඟ පළාතක සිටින බව දැන ගත්තා නම් මිතියා කවදාවත් මේ අපරාධය කරන්න පෙළඹෙන්නේ නැහැ. කොහොම වුණත් යම්කිසි විපතක් සිදුවුණා නම් තමුන්නාන්සේට ඉක්මනට ඇවිත් මා බේරාගන්න ඉඩ තිබුණා. ගිරිගෝරිස් ගේ අසනීපය හා මට හදිසියෙන් ම මීමැස්මොරය හැදෙන බවත් තමුන්නාන්සේට කිව්වේ ඒ නිසයි. දොර ඇරීම පිණිස දොරට තට්ටු කරන පිළිවෙළත්, මිතියා ඒ බව දැන සිටි බවත්, මම

තමුන්නාන්සේට කිවේ මිනිහා මොකක් නමුත් විනාශයක් කරන බව සැක කරලා තමුන්නාන්සේ ගෙදර නතර වේ ය යන විශ්වාසයෙනුයි.''

''මිනිහා වචනය කට ඇතුලේ තියා ගෙන කතා කළත් කතාව බොහො ම පැහැදිලියි'' ඉවාන් කල්පනා කෙළේ ය. ''මිනිහ ගේ කල්පනාව අඩු ය කියා දෙස්තර කිව්වේ බොරුවක්.''

''උඹ හදන්නේ මා රවටන්න ද?''යි ඉවාන් කෝපයෙන් විමසුවේ ය.

''තමුන්නාන්සේට කිව්වට මොකද වෙන්නේ, එදා මම හිතුවා තමුන්නාන්සේට මගේ කතාව හොඳට තේරුණාය කියා''යි පැවල් සන්සුන් ව කී ය.

''උඹේ කතාව තේරුණා නම් නො ගිහින් ගෙදර නවතිනවා''යි ඉවාන් කී ය.

''මා හිතුවා තමුන්නාන්සේ මගේ කතාව තේරුම් ගෙන කරදරවලින් නිදහස් වෙන්න පැනල යනවා ය කියා.''

''උඹේ කල්පනාව අනෙක් අයත් උඹ වගේ හයයි කියා ද?''.

''මට බොහො ම කනගාටුයි. මා හිතා ගෙන හිටියේ තමුන්-නාන්සේ මා වගේ හිත හය නෙනෙක්ය කියා යි.''

''ඔව්, එදා මේ ගැන කල්පනා කරන්නයි තිබුණේ''යි ඉවාන් නො සන්සුන් වෙමින් කී ය. ''ඇත්ත වශයෙන් මම කල්පනා කළා, උඹ මොකක් නමුත් අපරාධයක් කරන්න හදනවය කියා නමුත් උඹ දැන් කියන්නේ බොරුවක්. උඹට මතක ද උඹ මගේ කරත්තය ළඟට ඇවිදින් 'ඥානවන්තයකු සමඟ කතා කරන්න ලැබීම වාසනාවක්'යයි කිව්වා? උඹේ වර්ණනාවෙන් පස්සේ මගේ යාම ගැන උඹ බොහො ම සතුටු වෙන්න ඇති.''

පැවල් ආයේත් දිග සුසුමක් හෙළුවේ ය. ඔහු ගේ මුහුණේ පාට වෙනස් විය.

''මා සතුටු වුණා නම් සතුටු වුණේ තමුන්නාන්සේ මොස්කව් නො ගොස් චමස්නියාවට යාම ගැනයි'' පැවල් අමාරුවෙන් කී ය. ''කැමැති දෙයක් කියන්න. චමස්නියාව මොස්කව් නුවරට

වඩා ලඟයි. මම එහෙම කිව්වේ ඉච්චාවට නො වෙයි. දොෂා-රෝපනයක් හැටියටයි. තමුන්නාන්සේ මා වරදවා තේරුම් ගත්තා.''

''මොන දොෂාරෝපනයක් ද?''

''ඇයි, මේ වගේ විනාශයක් වන බව දැනදැනත් තාත්තා තනි කර දමා, අපවත් ආරක්ෂා නො කර යන්න ගියා. ඒ රූබල් තුන් දහ හොරකම් කල වරදට මාව අල්ලන්න ඉඩ තිබුණා.''

''විකක් හිටපන්, උඹ නඩුකාරයාටයි රාජ නීතිඥයාටයි කිව්ව ද දෙරට තට්ටු කරන සංඥාව ගැන?''

''කියන්න ඕනෑ හැම දෙයක් ම කිව්වා.''

ඉවාන් කල්පනා කෙළේ ය.

''මම යමක් ගැන කල්පනා කලා නම් කල්පනා කළේ උඹ කල අපරාධයක් ගැනයි. අයියා තාත්තා මරන්න ඇති. නමුත් තාත්තා මරා මුදල් හොරකම් කලා ය කියා මම විශ්වාස කළේ නැහැ. නමුත් උඹ අපරාධයක් කරන්න ඇතැයි කියා විශ්වාස කිරීමට නම් මම සූදානම්. ඕනෑ ම වේලාවක මීමැස්-මෝරය හදා ගන්න පුළුවන් ය කියා උඹ මට කිව්වා. උඹ මොකද එහෙම කිව්වේ?''

''එහෙම කිව්වේ අවංක කම නිසයි. මගේ මුළු ජීවිතයට ම බොරුවට මීමැස්මෝරය හැදෙන බව හැඟෙව්වේ නැහැ. නමුත් මම තමුන්නාන්සේට එහෙම කිව්වේ මගේ ලොකු කම පෙන්නීම පිණිස යි. මෝඩ කමටයි. මම තමුන්නාන්සේට ලොකු ඇල්මක් දැක්වූ නිසා අවංක ව කතා කලා.''

''තාත්තා මරලා මුදල් හොරකම් කළේ උඹ ය කියා අයියා ප්‍රසිද්ධියේ ම කියනවා.''

''වෙන මොනව කියන්න ද?''යි පැවල් දත් විලිස්සමින් කී ය. ''එයාට විරුද්ධ ව මෙ තරම් සාක්ෂි තිබිය දීත් කවුද එයා කියන දෙය විශ්වාස කරන්නේ? දොර ඇරල තිබෙන බව ග්‍රිගෝරිස් දැකල තියෙනවා. ඉතින් ඊට වැඩිය සාක්ෂියක් වෙන මොනවට ද? කැමැති දෙයක් කියාපු දෙන්. එහෙම කියන්නේ බයටයි. කල අපරාධයෙන් නිදහස් වෙන්න යි.''

ඔහු සෙමෙන් කතාව නතර කෙළේ ය. එහෙත් හදිසියෙන් ම කිසියම් අදහසක් ඇති වූවාක් මෙන් ආයෙත් මෙසේ කීවේ ය.

"මා කියන දෙය අහන්න. මිතියා ගේ අදහස, මා පිට වරද පටවා තාත්තා මැරුවේ මා බව ඔප්පු කිරීමට යි. මට ඒ බව දැනට ම ආරංචියි. මම බොරුවට මීමැස්මොරය හදාගත්තාලු. තමුන්නාන්සේ ගේ තාත්තා මැරීමට මගේ අදහසක් තිබුණා නම් මා බොරු ලෙඩ හදාගන්න බව තමුන්නාන්සේට කල් ඇති ව කියනව ද? එවැනි භයානක අපරාධයක් කිරීමට මා සූදානම් වුණා නම් කල් තියා ඒ ගැන මට විරුද්ධ ව සාක්ෂි දීමට තරම් මා මෝඩයෙක් ද? එයා ගේ පුතාට ම ඒ බව කියනව ද? සත්තකින් ම එවැනි දෙයක් සිදු විය හැකි ද? එවැනි දෙයක් කවදාවත් සිදුවෙලා නැහැ. උඹ සිටින දෙවියන් හැරෙන්නට අප කරන මේ කතාව වෙන කිසි ම කෙනකුට ඇහෙන්නේ නැහැ. තමුන්නාන්සේ මේ කතාව පොලිසියට කිව්වොත් මොක ද වෙන්නේ? එහෙම කීමෙන් මා ආරක්ෂා වෙන්න පුළුවනි. මිනිහෙක් මැරීමට කලින් ඒ බව එළිපිට කියන මිනීමරුවෙක් ඉන්නව ද? මේ කතාව කිසි ම කෙනෙක් පිළිගන්නේ නැහැ."

පැවල් ගේ අවසාන තර්කය පිළිගත් ඉවාන් ඔහු ගේ කතාවට බාධා කරමින් නැඟී සිට "මම උඹ අවිශ්වාස කරන්නේ නැහැ. මගේ කල්පනාවේ හැටියට උඹ ගැන සැක කිරීම මහ මෝඩකමක්. මගේ හිතේ තිබුණු සැකය නැති කිරීම ගැන උඹට බොහො ම ස්තුතියි. දැන් මම යනවා, නමුත් ආයෙත් එනවා. උඹ ඉක්මනට සනීපවෙයන්. උඹට උවමනා කරන දෙයක් තියෙනවා ද?"යි ඇසුවේ ය.

"තමුන්නාන්සේට බොහො ම ස්තුතියි. මාපා මා අමතක කරන්නේ නැහැ. උවමනා කරන හැම දෙයක් ම මට සපයා දෙනවා. මාපා මට බොහො ම ආදරෙයි. මගේ හිතමිත්‍රයන් නිතර මා බලන්න එනවා."

"මං ගිහින් එන්නම්. උඹ බොරු ලෙඩ හදා ගැනීම ගැන මම කිසි ම දෙයක් කියන්නේ නැහැ. ඒ ගැන උඹත් කිසි ම කෙනකුට නොකියා ඉන්නවා නම් හොඳයි." ඉවාන්, පැවල්ට කීවේ හදිසියෙන් ම ඇති වූ කිසියම් පෙලඹීමක් නිසා ය.

"තමුන්නාන්සේ කියන දෙය මට තේරෙනවා. තමුන්නාන්සේ මගේ බොරු ලෙඩ ගැන කතා නොකර සිටිනවා නම් ගේට්ටුව ළඟ දී අප දෙදෙනා අතර සිදු වූ කතාව ගැන මම නිශ්ශබ්ද වෙන්නම්."

ඉවාන් තික්ම ගියේ ය. පැවල් ගේ කතාවේ, අවසාන හරියේ, අපහාස ගෙන දෙන අර්ථයක් තිබෙන බව ඔහුට වැටහුණේ කොරිඩෝරය දිගේ අඩි දෙලහක් පමණ ගියාට පසු ව ය. ඔහු ආපසු යාමට අදහස් කෙළේ ය. එහෙත් එය 'පිස්සු අදහසක්'යයි කල්පනා කොට වහා රෝහලෙන් පිට වී ගියේ ය.

තාත්තා මැරුවේ පැවල් නො ව, මීතයා බව දැන ගැනීම නිසා ඉවාන් ගේ සිතේ මහත් සැනැසීමක් ඇති විය. පැවල් සමග කළ කතාවෙන් පසු ඔහු තුළ ඇති වූ ප්‍රධාන හැඟීම එයයි. එහෙත් ඔහු විසින් පිළිගත යුතු ව තිබුණේ පැවල් පියා මැරූ බව ය. එ වැනි හැඟීමක් ඇතිවීමට තුඩු දුන් හේතු සොයා බැලීමට ඔහු අදහස් නො කළේ ය. තම හැඟීම් විමසා බැලීමට ඔහු තුළ පිළිකුලක් ඇති විය. කිසියම් දෙයක් වහා අමතක කර දැමීමට ඔහු තුළ ලොකු ආශාවක් තිබෙන බව ඔහුට හැඟුණේ ය. අනතුරු ව පැමිණි දින ස්වල්පය තුළ දී මීතියාට විරුද්ධ ව තිබුණු සාක්ෂි පිරික්සා බැලූ ඔහුට මීතියා තාත්තා මැරූ බව ප්‍රත්‍යක්ෂ විය. කිසි ම වැදගත් කමක් නැති අය විසින් මීතියාට විරුද්ධ ව දෙන ලද සාක්ෂි ද තිබිණි. පෙමියා හා ඇගේ මව එ වැනි අය වෙති. නමුත් ඔවුන් ගේ සාක්ෂි මහ මෙර මෙන් ස්ථිර ය. පර්හෝටින්, තැබෑරුමේ පොට්තිකෝප්, ම්ක්රෝවේ හෝටලේ සිටි අය විසින් දෙන ලද සාක්ෂිවලින් මීතියා ගේ වරද ඔප්පු විය. මේ සාක්ෂිවලට ඇතුලත් විස්තර මීතියා ගේ විනාශයට හේතු විය. ඇර තබන ලද දොර ගැන ගිරිගෝරිස් ගේ සාක්ෂිය හා දෙරට තිට්ටු කිරීම පිළිබඳ රහස ගැන රාජ නීතිඥයා හා දණ්ඩනායකයා ද මහත් සැලැකිල්ලක් දැක්වූ හ. තමා නිඳා සිටි ඇඳ ලඟ සිට අඩි තුනක් පමණ ඇතින්, බිත්තියේ අනෙක් පැත්තේ, පැවල් මූළු රැය ම නිඳා සිටි බවත්, තමා රාත්‍රියේ දී කීප වතාවක් ම අවදි වූ බවත්, ඒ හැම අවස්ථාවක දී ම පැවල් ගේ කෙඳිරිය ඇසුණු බවත් ඉවාන් ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මාපා, හෙවත් ගිරිගෝරිස් ගේ බිරිය කීවා ය

පැවල් ගැන දොස්තර මහතා සමග සාකච්ඡා කළ ඉවාන්, පැවල්ට පිස්සු නැතත් මඳක් දුර්වල බව කීවේ ය. එවිට මහලු දොස්තර සිනා සී මෙසේ කී ය.

"මහත්මයා දන්නව ද දූන් පැවල් කාලය ගත කරන හැටි? මිනිහ ප්‍රංශ භාෂාව ඉගෙන ගන්නවා. ප්‍රංශ වචන රුසියන් බසින් ලියන ලද පොතක් කොට්ටය යට තියා ගෙන කට පාඩම් කරනවා. හා! හා! හ!"

ඉවාන් පැවල් ගැන සිතේ පැවැති සියලු සැක ඉවත් කෙළේ ය. සිතේ පිළිකුලක් නැති ව ඔහුට මිතියා ගැන කල්පනා කළ නො හැකි ය. කෙසේ වෙතත් අපූරු දෙයක් ලෙස පිළිගත හැකි එක් කරුණක් තිබිණි. තාත්තා මැරුවේ මිතියා නො ව, පැවල් බව අලෝෂා තරයේ ම කියා සිටියේ ය. ඉවාන් කවදත් අලෝෂා ගේ අදහස් උසස් කොට සැලැකුවේ ය. ඔහු අලෝෂා ගේ කතාව අසා පුදුම වූයේ ඒ නිසා ය. අනෙක් පුදුමය අලෝෂා කිසි ම දවසක මිතියා ගැන ඉවාන් සමඟ කතා නොකිරීම ය. ඔහු ඉවාන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නා මිස මිතියා ගැන කිසිවක් නොකීවේ ය. මලණුවන් ගේ මේ ගතිය ගැන ඉවාන් විශේෂ සැලැකිල්ලක් දැක්වී ය.

ඒ අතරේ ඔහු මිනීමැරුමට වඩා අමුතු දෙයක් ගැන කල්පනා කෙළේ ය. මොස්කව් සිට පැමිණි පසු ඉවාන් කාලය ගත කළේ කැතිරිනා කෙරෙහි බැඳුණු සිතින් යුතු ව ය. ඉවාන් ගේ ජීවිතය කෙරෙහි බලපැවැත්වූ මේ ප්‍රේමය ගැන විස්තරයක් කිරීමට මෙය කාලය නො වෙයි. ඉවාන් ගේ පෙම් පුවත ඇසුරු කොට නවකතා-වක් ලියන්නට පිළිවන. එහෙත් මා මීට කලින් විස්තර කළ, ඉවාන් අලෝෂා සමඟ කැතිරිනා ගේ නිවෙසේ සිට එන අතරේ ඉවාන් අලෝෂා අමතා "ඈ ගැන මගේ කිසි ම කැමැත්තක් නැතැ යි" කළ කතාව මහ මුසාවක් බව මෙහි ලා සඳහන් නො කොට බැරි ය. ඉවාන් කැතිරිනාට දැඩි ව ආලය කෙළේ ය. එහෙත් ඇතැම් විට ඇය මරා දමන තරමට ඔහු ඇයට වෛර ද කෙළේ ය. ඔවුන් දෙදෙනා අතරේ සබඳ කමක් ඇතිවූයේ කරුණු මහත් රැශියක් මූල් කරගෙන ය. මිතියාට සිදු වූ විපතින් කම්පා වූ කැතිරිනා ඉන් නිදහස් වීම පිණිස, ඉවාන් පැමිණි වහා ම ඔහු සොයා ගියා ය. ඇගේ හැඟීම් තුළ බලවත් වේදනාවක්, අපහාසයක් හා අවමානයක් ඇති විය. ඇයට කලින් දැඩි ව ආලය කළ (ඈ ඒ බව දැන සිටියා ය) ඇයට වඩා උගත්, ඇයට වඩා උණුවන ලයක් ඇති මිනිහා යළි පැමිණ සිටියි. ඉවාන් තුළ ඇත්තා වූ, කරමසෝව් පවුලට පොදු වූ දැඩි රාගයත්, ඔහු ඇයට දැක් වූ දැඩි ආලයත් කෙසේ වෙතත්, උසස් කුල සිරිත් රකින මේ තරුණිය සම්පූර්ණයෙන් ම තරුණයා ගේ ආශාවන්ට යටත් නොවූවා ය. ඒ අතරේ ඈ මිතියා අත්හැරීම නිසා ඇති වූ සිත් වේදනාවෙන් පසුතැවෙන්නට වූවා ය. ඉවාන් සමඟ කලහ කරගත් හැම විට ම (ඈ නිතර ඉවාන් සමඟ කලහ කරගත්තා ය) ඈ ඒ බව නො සඟවා කීවා ය ඉවාන්, කැතිරිනා 'බොරු ගොඩක්' ලෙස අලෝෂාට විස්තර කළේ මේ කරුණ

නිසා ය. ඇත්ත වශයෙන් ම ඔවුන් ගේ සම්බන්ධය බොරුවෙන් වැසුණකි. අනෙක් හැම දෙයකට ම වඩා ඉවාන් ඒ ගැන කිපුණේ ය.........නමුත් අපි ඒ ගැන පසු ව විස්තර කරමු.

ඇත්තේ හැටියට ඉවාන්ට ටික කලක් ගතවන තෙක් පැවල් ගැන සම්පූර්ණයෙන් ම අමතක විය. එහෙත් පැවල් හමුවීමට ගිය පලමු ගමනින් දෙ සතියකට පසු ව, පෙර ඇති වූ අදහස් ආයේත් ඔහු තුල හොල්මන් කරන්නට විය. තමා, ගම හැර යාමට පෙර දින රෑ හොරකු වාගේ තුරප්පුව දිගේ සෝල්දරයට නැග, තාත්තා කරන දෙය බලා සිටියේ මන්ද? යන ප්‍රශ්නය ඔහු නිරතුරු ව ම තමාගෙන් ඇසූ බව මෙහි ලා සඳහන් කලහොත් ප්‍රමාණවත් ය. පසු ව ඔහු මේ කරුණ සිතේ හටගත් පිළිකුලින් යුතු ව සිහි කලේ මන්ද? පසු දින මොස්කව් යද්දී ඔහු ගේ සිතේ හදිසියෙන් ම කාලකණ්ණි ස්වභාවයක් ඇති වූයේ මන්ද? මොස්කව් ගිය පසු "මම තක්කඩියෙක්මි" කියා ඔහු තමාට ම දොස් පවරා ගත්තේ මන්ද? සිතට වද දෙන මේ අදහස් නිසා තමාට කැතිරිනා අමතක වේයයි ඉවාන් අදහස් කෙලේ ය. ඒ අදහස් ඔහු ගේ සිත එ තරම් දූඩි ව ගත් හෙයිනි. මේ ගැන කල්පනා කරමින් මග බැස යන විට ය, ඔහුට හදිසියෙන් ම අලෝෂා හමුවූයේ. ඔහු වහා අලෝෂා නතර කොට මෙසේ විමසුවේ ය.

"දවසක් රෑ කෑමෙන් පස්සේ මීතියා හදිසියෙන් ම ගෙට කඩා පැන තාත්තාට පහර දුන් හැටි මල්ලිට මතක ද? ඊට පස්සේ වත්තේ දී හමු වී 'මගේ හිතේ එක්තරා ආශාවක් තිබෙන බව' තුඹට කිව්වා මතක ද? ඒ වෙලාවේ මගේ හිතේ තාත්තා ගේ මරණය ගැන ආශාවක් තිබුණා ද නැද්ද කියා කියන්න පුළුවන් ද?"

"ඔව්, තාත්තා ගේ මරණය ගැන අයියා තුල ආශාවක් තිබෙන බව ඒ වෙලාවේ දී මට කල්පනා වුණා"යි අලෝෂා සෙමෙන් කීවේ ය.

"ඒ ගැන කල්පනා කරන්න දෙයක් නැහැ. ඒක ඇත්තයි. මා අදහස් කළේ, එක සර්පයෙක් තවත් සර්පයෙක් ගිලදැමිය යුතු බවයි. ඒ කියන්නේ හැකි තරම් ඉක්මනට මීතියා තාත්තා මරා දැමිය යුතුයි. ඒ සඳහා මීතියාට උදව් කිරීමට වුවත් මා සූදානමින් හිටියා."

අලෝෂා සුදුමැලි විය. ඔහු සහෝදරයා ගේ මුහුණ දෙස නිහඬ ව බලා සිටියේ ය.

"කතා නො කර ඉන්න එපා. එදා හිතේ ඇතිවූ අදහස් දැන ගැනීමට මා කැමැතියි. මා ඇත්ත දැන ගැනීමට කැමැතියි. මට ඇත්ත කියන්න."

අනතුරු ව ඉවාන් අලෝෂා දෙස මැඩගත නොහැකි කෝපයෙන් බලා තදින් හුස්ම ගත්තේ ය.

"මට සමා වෙන්න. එදා මම ඒ විදියටයි කල්පනා කළේ"යි රහසක් කියන්නාක් මෙන් සෙමෙන් පැවැසූ අලෝෂ අනතුරු ව ඉවත බලා ගත්තේ ය. එදා ඉවාන් ගේ සිත සැනැසීමට වචනයක් වත් නො කීවේ ය.

"මල්ලිට, බොහො ම ස්තුතියි" පැවැසූ ඉවාන් වහා නික්ම ගියේ ය. එතැන් සිට ඉවාන් තමා මග හරින බවත්, තමා ගැන නො කැමැත්තෙන් සිටින බවත් අලෝෂා දුටුවේ ය. අලෝෂා ද එතැන් සිට ඉවාන් බැලීමට නො ගියේ ය. එහෙත් එදා අලෝෂා හමුවී ඇතිවූ ඉහත සඳහන් කළ කතාවෙන් අනතුරු ව ඉවාන් ගෙදර යන ගමන් හැර පියා, වහා පැවල් හමුවීමට ගියේ ය.

හත් වන පරිච්ජේදය

දෙවන හමුවීම

ඉවාන් යන විට පැවල් රෝහලේ සිට ගෙදර ගොස් සිටියේ ය. පැවල් පදිංචි ව සිටි, ලීයෙන් තැනූ දිරාපත් වූ නිවස තිබෙන තැන ඉවාන් දැන සිටියේ ය. ඉස්තෝප්පුවකින් දෙකට වෙන් වූ එම ගෙයි මායා ඇගේ මවත් සමග පැත්තක පදිංචි වී සිටිනා අතරේ, අනෙක් පැත්තේ පැවල් පදිංචි ව සිටියේ ය. පැවල් එහි නතර වී සිටියේ කුලී සෙවත්තකු හැටියට ද, නැතිනම් ආගන්තුකයකු හැටියට දැයි කිසිවෙක් නොදත්හ. ඔහු එහි නතර වී සිටියේ මායා ගේ මනාලයා හැටියට බවත්, එ හෙයින් පැවල් කෑම බීමවලට හෝ ඉඳුම් හිටුම්වලට හෝ මුදල් නොගෙවූ බවත් පසු ව දැන ගන්නට ලැබිණි. පැවල්ට බොහො ම ඉහළින් ගරු සත්කාර කළ මවත් දුවත්, පැවල් තමන්ට වඩා තත්ත්වයෙන් උසස් පුද්ගලයෙක් යයි කල්පනා කළහ.

ඉවාන් දොරට තට්ටු කෙළේ ය. ඉක්බිති ව දොර ඇරුණු පසු ඔහු ඉස්තෝප්පුවට ඇතුළු විය. මායා පෙත්තු දිසාවට ගිය ඔහු පැවල් පදිංචි වී සිටි වම් පැත්තේ තිබෙන 'හොඳම කාමරයට ගියේ ය. පිහත් ගඩොළු අල්ලා සාදන ලද උදුනක් කාමරයේ බිත්තියේ තිබිණි. ඒ උදුන ගිනියම් විය. කාමරයේ බිත්තිවල පරණ තිල්ප ට කොළ අලවා තිබුණේ ය. ඉරුණු තැන් තුළට රිංගා ගත් කැරපොත්තන් නිසා කොළ නිරන්තුරු ව ම සරසර ගා සෙලවිණි. බිත්තියේ අයින දිගේ තබන ලද බන්කු දෙකක් හා මේසය ළඟ තිබෙන පුටු දෙක හැරෙන්නට කාමරයේ වඩා දූවහාණ්ඩ නො තිබිණි. ලීයෙන් තනන ලද ඉතා චාම් මේසය වසා දමා තිබුණේ ළා රතුපාට රෙද්දකිනි. කුඩා කවුළු කඳන් දෙක උඩ ජෙරෝනියම් මල් බඳුන් දෙකක් තබා තිබිණි. කාමරය මුල්ලේ සුරුවම් සහිත පෙට්ටියක් ඇත. බොහෝ තැන්වලින් ඇතුලට එබුණු කුඩා තඹ බොයිලේරුවක් සමඟ කෝප්ප දෙකක් මේසය උඩ තිබිණි. තේ බී අවසන් කළ පැවල් බොයිලේරුව නිවා දම්මේ ය. මේසය ළඟ බන්කුවක් උඩ හිඳ සිටි හෙතෙම ඇක්සයිස් පොතක මොනවා දෝ ලියමින් සිටියේ ය. ඔහු අසලින් කුඩා තීන්ත බෝතලයක් ද ඉටිපන්දමක් සවිකරන ලද යකඩ පහන් රුකක්ද තිබිණි. පැවල් සම්පූර්ණයෙන් ම සුවය ලබා සිටින බව ඉවාන් ඔහු ගේ මුහුණ බලා දැනගත්තේ ය. ඔහු ගේ මුහුණ මහත් ය, ප්‍රාණවත් ය. හිස කෙස් මුහුණ දෙපැත්තට අලවා තිබිණි. ඔහු ඉතා පරණ, මඳක් කිලුටු වූ, නොයෙක් පැහැයෙන් යුත් ඇඳුමක් ඇඳ සිටියේ ය. ඔහු උපැස් පැළඳ සිටිනවා ඉවාන් මීට පෙර කවදාවත් දැක නැත. මේ සුළු කරුණු නිසා ඉවාන් තුළ පැවැති කෝපය දෙගුණ විය. "මේ කාලකණ්ණියා කන්නාඩියක් දමා ගෙන ඉන්නවා" යි ඔහු තමාට ම කියා ගත්තේ ය.

ඉතා සෙමෙන් හිස උස්සා, උපැස් තුළින් අමුත්තා දෙස සැලැකිල්ලෙන් බැලූ පැවැල් සෙමෙන් උපැස් ඉවත් කොට, හිඳ සිටි බන්කුවෙන් නැගිට්ටේ ය. ඔහු නැගිට්ටේ කිසි ම සැලැකිල්ලක් දක්වා නො වෙ යි ඔහු නැගිට්ටේ චාරිත්‍රානුකූල ව කළ යුතු දෙය ඉතා අඩුවෙන් ම කිරීම පිණිස මහත් අලස කමකින් යුතු ව ය. මේ හැම දෙයක් ම ඉවාන් ගේ සිතේ තදින් ක්‍රා වැදිණි. ඔහු හැම දෙයක් ම හොඳට මතක තබා ගත්තේ ය. ඔහු වෙසෙසින් ම සිහි තබාගත්තේ පැවල් ගේ දෑසේ දකින්නට ලැබුණු දුෂ්ට, අශිෂ්ට, අහංකාර ගතියයි.

"තමුන්නාන්සේ මොනවට ද මගේ ගෙට කඩා වදින්නේ? අපි හැම දෙයක් ගැන ම තීරණයකට බැස ගෙන ඉවරයි.

ඉතින් මොනවටද ආයේත් ආවේ?'' යන්න පැවල් ගේ දෑසින් පැවසෙන්නාක් මෙන් පෙනිණි. ඉවාන්ට සිත මැඩ ගත නොහැකි විය.

''මෙ තැන බොහො ම රස්නෙයි'' ඉවාන් දොර ළඟ සිට කබායේ බොත්තන් ගලවමින් කී ය.

''කබාය ගලවන්න'' යි පැවල් ආදරයෙන් කී ය.

ඉවාන් කබාය ඉවත් කොට, වෙව්ලන අතින් මේසය උඩ තබා, අනතුරු ව පුටුවක් ගෙන මේසය ළඟින් තබා හිඳගත්තේ ය. පැවල් ඉවාන් ඉදිරිපිට බන්කුව උඩ හිඳගත්තේ ය.

''අප දෙන්නා හැරෙන්නට මෙ තැන වෙන කවුරුවත් ඉන්නව ද? අපේ කතාව ගෙදර අයට හැහෙනව ද?''යි ඉවාන් රළු ගතියක් දක්වා ඇසුනි ය.

''අපේ කතාව කිසි ම කෙනකුට ඇහෙන්නේ නැහැ. තමුන්නාන්සේ දුටුවා නේද ගෙය මැදින් ඉස්තෝප්පුවක් තියෙ-නවා?''

''දැන් මං කියන දෙය හොඳට අහගනින්. එදා මම ඉස්-පිරිතාලේ ඉඳලා යන කොට උඹ මොකද කිව්වේ? උඹට බොරු ලෙඩ හදා ගන්න පුළුවන් බව මම පොලීසියට නො කිව්වොත්, ගේට්ටුව ළඟ දී අප දෙදෙනා අතරේ වෙච්ච කතාව ගැන සේරම උඹ පොලීසියට නොකියන බව කිව්වා නේ ද? සේරම කියා උඹ අදහස් කළේ මොනව ද? උඹ මොන අදහසක් ඇති ව ද එහෙම කිව්වේ? මා භය කරන්න හැදුව ද? උඹ හිතුව ද මම උඹ එක්ක ගිවිසුමක් ඇති කරගන්නය කියා? උඹ හිතුව ද මං උඹට භයයි කියා?''

ඉවාන් මේ සේරම කෝපයෙන් කීවේ කිසිවක් සඟවා තැබීමට තමා ගේ අදහසක් නැති බවත්, ඇත්ත එළිපිට කීමට සූදානම් බවත් පැවල්ට අවබෝධ කර දෙමිනි. පැවල් ගේ නෙත් අමනාපයෙන් දිළිහුණේ ය. ඔහු ගේ වම් ඇස නැටවිණි. ඔහු සුපුරුදු සංයමයෙන් යුතු ව පිළිතුරු දුන්නේ ය. ''නුඹට උවමනා කරන්නේ කෙළින් කතා කරන්න ද? හොඳයි එහෙනම් අපි කෙළින් කතා කරමු''යි කියන්නාක් මෙන් ඔහු හැඟෙව්වේ ය.

''මම මෙන්න මේ අදහස ඇතිවයි කිව්වේ. තමුන්නාන්සේ තාත්තා ගේ මරණය කලින් දැන ගෙන හිටියා. නමුත් ඒ ගැන

අබ මල් රේණුවක් තරම් වත් සැලැකිල්ලක් දක්වූයේ නැහැ. ඉතින්, ලෝකයා තමුන්නාන්සේ ගැන වැරදි අදහස් දරන නිසාත්, වෙනත් දෙයක් ගැන සැක සිතන්නට පුළුවන් නිසාත්, පොලීසියට කිසි ම දෙයක් නොකියන බවට මම පොරොන්දු වුණා."

පැවල් මේ සියල්ල සන්සුන් සිතින් හා ආත්ම සංයමයෙන් කීවත් ඔහු ගේ කට හඬේ අස්ථිර අධිෂ්ඨානයක, ද්වේෂයක හෝ අහංකාරකමක ස්වරූපයක් දකින්නට නො තිබිණි. ඔහු ඉවාන් දෙස කිසි ම ගරුසරුවක් නො දක්වා බලා සිටි නිසා ඉවාන්ට මොහොතකට පමණ ක්ලාන්ත ගතියක් දැනිණි.

"ඇයි උඹ එහෙම දෙයක් කිව්වේ? උඹට පිස්සු ද?"

"මට පිස්සුවක් නැහැ. මට හොඳට සිහි කල්පනාව තියෙනවා."

"මම තාත්තා ගේ මරණය ගැන කලින් දැන සිටියා ය කියා උඹ හිතනවා ද?"යි ඉවාන් මේසයට ගසා කෑගා ඇසුවේ ය. "'මේ හැරෙන්න වෙනත් දෙයක්' කියා උඹ අදහස් කළේ කුමක් ද? තක්කඩියා!"

පැවල් කිසිවක් නො කියා ඉවාන් දෙස නොසැලැකිල්ලෙන් බලා සිටියේ ය.

"කතා කරපිය ගඳ ගහන හොරා! 'වෙනත් දෙයක්'යයි කිව්වේ මොකක් ගැන ද?"යි අසමින් ඉවාන් බෙරිහන් දුන්නේ ය.

"'වෙනත් දෙයක්' කියා මා අදහස් කළේ, ඒ දවස්වල තමුන්නාන්සේත් තාත්තා මරන තෙක් ආශාවෙන් බලා සිටිය නිසයි."

ඉවාන් උඩ පැන මිට මොළවා මහත් වේගයෙන් පැවල් ගේ උරහිසට ගැසුවේ ය. පැවල් බිත්තියේ හැපී බිම වැටිණි. අඬන්නට පටන් ගත් හෙතෙම "ලෙඩෙකුට ගහන්න තමුන්නාන්සේට ලැජ්ජා නැද්ද?"යි අසා, අපිරිසුදු තිල්පාට ලේන්සුවකින් කඳුළු පිසදමා යළි සෙමෙන් අඬන්නට පටන් ගත්තේ ය. මිනිත්තුවක් ගත විය.

"ඔය ඇති, දැන් ඉතින් ඔය ඇඬිල්ල නවත්වපන්"යයි ඉවාන් අන්තිමේ දී පුටුවේ හිඳ ගනිමින් කීවේ පිළිපැදිය යුතු නියෝගයක් කරන්නාක් මෙනි. "මගේ යකා අවුස්සන්න එපා."

පැවල් මූහුණ වසාගෙන සිටි අපිරිසුදු ලේන්සුව ඉවතට ගත්තේ ය. දූත් මොහොතකට පෙර තමාට විඳින්නට සිදු වූ අපහාසය ඔහු ගේ මූහුණේ නැගුණු හැම රැල්ලක ම දකින්නට තිබිණි.

"එහෙනම් උඹ කල්පනා කළේ මම මගේ අයියාත් එක්ක තාත්තා මරන්න කුමන්ත්‍රණය කළා කියා ද? තක්කඩියා!"

"ඒ වෙලාවේ තමුන්නාන්සේ ගේ සිතේ කොයි විදියේ අදහසක් තිබුණා ද කියා මා දැනගෙන හිටියේ නැහැ. ගේට්ටුව ළඟ දී මම තමුන්නාන්සේට කතා කළේ තමුන්නාන්සේ ගේ අදහස් දැන ගැනීමටයි" පැවල් පෑරුණු කට හඬින් කී ය.

"මොන අදහසක් ද?"

"හැකි තරම් ඉක්මනින් තාත්තා මැරීමට තමුන්නාන්සේ අදහස් කළා ද කියා දැන ගැනීමට යි."

අනෙක් හැම දෙයකට ම වඩා ඉවාන් කිපුණේ තවමත් පැවල් කිසි ම ගරුසරුවක් නැති ව කරන කතාව නිසා ය.

"එහෙනම් තාත්තා මැරුවේ උඹ ද?"යි ඉවාන් හදිසියෙන් ම ඇසුවේ ය.

පැවල් මහත් පිළිකුලින් සිනාසුණේ ය.

"තමුන්නාන්සේ හොඳ හැටි දන්නවා තාත්තා මැරුවේ මා නොවන බව. ඥානවන්ත මිනිහෙක් කවදාවත් මේ ගැන තවත් කතා කරන්නේ නැහැ කියා මට විශ්වාස කරන්නයි තිබුණේ."

"ඇයි උඹ ඒ දවස්වල මා ගැන සැක කෙළේ?"

"එහෙම සැක කළේ භයටයි. ඒ දවස්වල මම බොහො ම භයෙන් හිටියේ. ඒ භය නිසා මම කවුරුත් සැක කළා. මා කල්පනා කළා, තමුන්නාන්සේ ගේ අදහසත් විමසා බලන්න. මිනියාට වාගේ තාත්තා මැරීමට තමුන්නාන්සේටත් ආසාව තිබුණා නම් වැඩේ සාර්ථක වෙනවා. එහෙම වුණොත් මාත් විනාශයි."

"සුමාන දෙකකට ඉස්සෙල්ලා මා හමු වූ වේලාවේ දී උඹ ඔය කතාව කිව්වේ නැහැ."

"මම තමුන්නාන්සේට ඉස්පිරිතාලයේ දී කිව්වේ මේ අදහස මයි. තමුත් කෙළින් කිව්වේ නැහැ. මා හිතුවා මා කියාපු දෙය තමුන්නාන්සේට තේරුම් ගන්න පුළුවන් ය කියා. අනෙක් අතින් තමුන්නාන්සේ වැනි උගතෙක් මේ ගැන ප්‍රසිද්ධියේ කතා කරන එකක් නැත ය කියා මම කල්පනා කළා."

"උඹ එහෙම ද කල්පනා කළේ? උඹේ නීච හිතේ මේ වගේ අධම සැකයක් ඇති කර ගන්න මා මොනව ද කළේ? මා මොනව ද කිව්වේ? කතා කරපන්."

"තාත්තා මැරුවේ තමුන්නාන්සේ නො වෙයි. තාත්තා මැරීමට තමුන්නාන්සේට උවමනාවක් තිබුණේ නැහැ. තමුන්නාන්සේට උවමනා කළේ වෙන කෙනකු ලවා තාත්තා මරවන්නයි."

"උඹ ඇඟට පතට නොදැනෙන්න කතා කරන හැටි! මම මොනවට ද තාත්තා මරන්නේ? මොන හේතුවකට ද?"

"මොන හේතුවකට ද? ඇයි තාත්තා ගේ බූදලය?"යි පැවල් ඇනුම්පදයක තියාගෙන් කී ය. "තාත්තා මළාට පස්සේ එක්කෙනකුට හතළිස් දහ ගණනේ ලැබෙනවා. ඊට වැඩි වෙන්නත් පුළුවනි. තමුත් තාත්තා ගෲසෙන්කා කසාද බැන්දොත්, බැන්ද හැටියේ ම මුළු බූදලය ම ඈ ඇගේ නමට ලියා ගනීවි. ඈ බොහෝ ම කපටියි. එහෙම වුණොත් තමුන්නාන්සේලා එක්කෙනකුටවත් තඹයක්වත් ලැබෙන්නේ නැහැ. තව කෙස් ගහින් ගෲසෙන්කා තාත්තා බඳිනවා. ඇයට තිබුණේ ඇගේ සුලැඟිල්ල නටවන්න විතරයි. තාත්තා දිව දෙව්ට දමාගෙන ගෲසෙන්කා ගේ පස්සෙන් පල්ලියට දුවාවි."

ඉවාන් කෝපය මැඩගත්තේ මහත් වේදනාවකින් යුතු ව ය.

"බොහො ම හොඳයි." ඔහු අන්තිමේ දී කී ය. "මම උඹ පැන්නේ නැහැ. උඹට ගැහැව්වේ නැහැ. උඹව මැරුවේ නැහැ. ඉතින් උඹේ අදහසේ හැටියට මම මිතියා ලවා තාත්තා මරවන්න අදහස් කළා. මිතියා තාත්තා මරන තෙක් බලාපොරොත්තු ව සිටියා."

"කොහොම ද එහෙම දෙයක් බලාපොරොත්තු වෙන්නේ? මිතියා තාත්තා මැරුවා නම් කුලවතකු හැටියට එයාට තිබෙන අයිතියත්, එයා ගේ නිලයත්, ධනයත් සම්පූර්ණයෙන් ම

නැති වී, අන්තිමේ දී සයිබීරියාවට යන්න වෙනවා. එතකොට මිතියාට අයත් බූදලයේ කොටස තමුන්නාන්සේටත්, මල්ලිටත් අයිති වෙනවා. එක්කෙනකුට හතළිස් දහක් වෙනුවට හැට දහක් ලැබෙනවා. ඉතින්, මිතියා තාත්තා මරාවි ය කියා තමුන්නාන්සේ බලාපොරොත්තු වුණ බවට කිසි ම සැකයක් නැහැ.''

''මේ අහපත් තක්කඩියා. තාත්තා මරාවිය කියා යම් කෙනෙක් ගැන සැක කළා නම් මම සැක කළේ උඹ ගැනයි. අයියා ගැන නො වෙයි. මම දැනගෙන හිටියා උඹ මොකක් හමුත් අපරාධයක් කරන්න අරඅඳින බව.''

''ඔව්, එදා මාත් මොහොතකට පමණ කල්පනා කළා, තමුන්නාන්සේ මා ලවා තාත්තා මරවා ගැනීමට බලාපොරොත්තු වන බව''යි පැවල් ඇනුම්පදයක තියාගෙන් සිනාසී කී ය. ''අනෙක් දේවල්වලට වඩා ඒ කාරණාවෙන් තමයි මම තමුන්-නාන්සේ ගේ යටි අදහස් දැන ගත්තේ. තමුන්නාන්සේ මා ගැන එ වැනි අදහසක් ඇති කරගෙන හිටියේ 'උඹට උවමනා නම් තාත්තා මරාපන්, මම කිසි ම බාධාවක් කරන්නේ නැහැ' යන අදහස ඇති වයි.''

''තක්කඩියා!, එහෙනම් මා කියාපු දෙය තේරුම් ගත්තේ ඔය විදියට ද?''

''මේ සේරම වුණේ තමුන්නාන්සේ චමස්නියාවට ගිය ගමනින්. තාත්තා චමස්නියාවට යන්න කියද්දී තමුන්නාන්සේ මොස්කව් ගියා. තාත්තා කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. නමුත් මගේ මෝඩ කතාව අහලා හදිසියේත් ම ඒ අදහස වෙනස් කරලා චමස්නියාවට යන්න කැමැති වුණා. ඇයි මොස්කව් යන්න තිබුණු අදහස වෙනස් කළේ. මගේ වචනය අහලා චමස්නියාවට යන්න කැමැති වුණේ මගෙන් යම්කිසි දෙයක් බලාපොරොත්තු වූ නිසයි.''

''නැහැ, මම උඹෙන් කිසි ම දෙයක් බලාපොරොත්තු වුණේ නැහැ''යි ඉවාන් දත් සපමින් කෑගා කිව්වේ ය.

''මගෙන් කිසි ම දෙයක් බලාපොරොත්තු වුණේ නැහැ? එහෙනම් තමුන්නාන්සේට කරන්න තිබුණේ මා පොලීසියට අරන් ගිහින්, හිර කරලා, මේ වගේ දෙයක් කිව්වට තළන්නයි. නැති නම් එ තැන දී ම මට කම්මුල් පහරක් ගහන්නයි. තමුන්-නාන්සේ ඒ වගේ දෙයක් කළේ නැහැ. මගේ කතාව අසා කිපුණේ නැහැ. නමුත් මගේ මෝඩ කතාව අසා මොස්කව්

නො ගොස් වමස්තියාවට ගියා. කිව්වට මා එක්ක තරහ වෙන්න එපා. තමුන්නාන්සේ කළේ මහ මෝඩකමක්. තමුන්නාන්සේට තිබුණේ ගෙදර ඉඳලා තාත්තා ආරක්ෂා කරගන්නයි. ඉතින් තමුන්නාන්සේ ගේ කතාව අසා තාත්තා මරන්න ය යන අදහස ඇති කර ගැනීම ගැන මට දෙස් කියන්නේ කොහොම ද?"

ඉවාන් කෝපයෙන් හිඳ සිටියේ ය. දණහිස් මත තද කර ගෙන සිටි ඔහු ගේ දෑත වෙවුලන්නට විය.

"ඔව්, මට බොහො ම කනගාටුයි උඹේ කම්මුල හරහා පහරක් දෙන්න බැරිවීම ගැන"යි ඉවාන් අමාරුවෙන් සිනාසී කී ය. "ඒ වෙලාවේ උඹ පොලීසියට ගෙන යන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. කවුද මා කියන දෙය විශ්වාස කරන්නේ? උඹට විරුද්ධ ව මොනව ගැන පැමිණිලි කරන්න ද? නමුත් උඹට කම්මුල් පහරක් නම් දෙන්න තිබුණා. මට බොහො ම කනගාටුයි ඒ වෙලාවේ දී ඒක අමතක වීම ගැන. වැඩකාරයන්ට ගැසීම නීතියට විරුද්ධ වුණත් උඹේ ඔය කැත මූහුණ තලපයක් වනතෙක් තලන්න තිබුණා."

පැවල් ඉවාන් දෙස ප්‍රීතියෙන් බැලුවේ ය.

පියෝදර් කර්මසෝ ආහාර ගන්නා විට, ඔහු ගේ මේසය ළඟ හිඳ ආත්ම තෘප්තියෙන් යුතු ව ගිරිගෝරිස් සමඟ ආගම ගැන සාකච්ඡා කරන්නාක් මෙන් පැවල් ඉවාන්ට මෙසේ කී ය. "සාමාන්‍ය අවස්ථාවල දී වැඩකාරයන්ට තැළීම නීතියෙන් තහනම් කරලයි තියෙන්නේ. නමුත් විශේෂ අවස්ථාවල දී නම් මිනිස්සු තවමත් වැඩකාරයන්ට තලනවා. අපේ රටේ විතරක් නො වෙයි ලෝකයේ අනෙක් රටවලත් එහෙමයි. වෙනෙසකක් තබා සමූහ ආණ්ඩුවක් තිබෙන ප්‍රංශයේත් වැඩකාරයන්ට තලනවා. ආදම් හා ඒවා සිටි කාලයේ තැළුවා වගේ තවමත් තලනවා. වැඩකාරයන්ට තැළීම කවදාවත් නතර වන දෙයක් නො වෙයි. නමුත් විශේෂ අවස්ථාවක දී පවා තමුන්නාන්සේ මට තැළුවේ නැහැ."

"උඹ මොනවට ද ප්‍රංශ භාෂාව ඉගෙන ගන්නේ?"යි ඉවාන් මේසය උඩ තිබෙන පොත පෙන්නා ඇසුවේ ය.

"ඇයි ඉගෙන ගන්නට වරදක් තියෙනව ද? සමහර විට පිටරට යන්න අවස්ථාවක් ලැබෙන්න පුළුවනි. ඊට ඉස්සෙල්ලා ඉගෙන ගන්න එක හොඳයි."

"මා කියන දෙය හොඳට අහගනින් මෑගයා"යි ඉවාන් කී ය. ඔහු ගේ දෑස කෝපයෙන් දිලියෙන අතරේ සර්වාංගය ම වෙවුලන්නට විය. "උඹේ චෝදනාවලට මම භය නැහැ. මා ගැන ඕනෑ ම දෙයක් කියාපන්. මම උඹ නො මරන්නේ තාත්තා ගේ මරණය ගැන සැක කරන නිසා, උඹ උසාවියට අරන් ගිහින් දඬුවම් කරන්න ඕනෑ නිසයි."

"මගේ අදහසේ හැටියට තමුන්නාන්සේ කට වහ ගෙන ඉන්න එක හොඳයි. මා අතේ කිසි ම වරදක් නැති බව දැනදැනත් මට මොනවා ගැන චෝදනා කරන්න ද? තමුන්නාන්සේ මා ගැන මොනවා හරි කිව්වොත් මම තමුන්නාන්සේ ගැන සේරම කියනවා. මගේ අතේ දොසක් නැති බව ඔප්පු කළ යුතු යි."

"උඹ හිතනව ද මං උඹට භයයි කියා?"

"මා දැන් තමුන්නාන්සේට කියාපු දේවල් උසාවිය නො පිළි ගත්තත් මහාජනයා පිළිගනීවි. ඊට පස්සේ තමුන්නාන්සේට සමාජයට මුහුණ පොවන්න ලැබෙන්නේ නැහැ."

"ඥානවන්තයකු සමඟ කතා කිරීමට ලැබීම හොඳ දෙයක්. ඒක ද උඹේ අදහස?"යි ඉවාන් කෝපයෙන් දත් සපමින් විමසුවේ ය.

"තමුන්නාන්සේ කිරි ගහට ඇන්න වගේ කිව්වා. ඒ නිසා කල්පනාවෙන් වැඩ කරන්න."

කෝපයෙන් වෙවුලන්නට පටන්ගත් ඉවාන් නැගිට, පිට කබාය දමා ගෙන පැවල් දෙසවත් නො බලා වහා යන්නට ගියේ ය. සවස සිසිල් මඳ නළින් ඔහු ප්‍රාණවත් විය. සඳ බැබැළෙයි. නානාප්‍රකාර හැඟීම් හා අදහස්වලින් ඉවාන් ගේ ආත්මය පිරිණි. "මම දැන් ම ගිහින් පැවල් ගැන පොලීසියට පැමිණිලි කරන්න ද? තමුන් මොනවා ගැන පැමිණිලි කරන්න ද? මිනිහගෙ අතේ වරදක් නැහැ. මිනිහා මට විරුද්ධව චෝදනා කරන්න පුළුවනි. කොහොම වුණත් මං මොනවට ද චමස්නියාවට ගියේ? මොන කාරණාවක් නිසා ගියා ද? ……… මිනිහ කියන කතාව හරි. මම යම් කිසිවක් සිදුවේ ය කියා බලාපොරොත්තුවෙනුයි හිටියේ." තාත්තා සමඟ අන්තිම රාත්‍රිය ගතකරන විට තාත්තා ගේ කාමරයේ සිට ශබ්දයක් ඇසෙන තෙක් තමා, තරප්පුව උඩ ඉඳගෙන බලා සිටි සැටි ඔහුට මතක් වූයේ සිය වන

වරට ය. එය දරුණු වේදනාවකි හදවත සිදුරු කරගෙන යන්නට. තියුණු අවියකින් ඇන්නාක් මෙන් ඔහු එක්වර ම නතර විය. "ඔව් ඒක ඇත්තයි. මම තාත්තා ගේ මරණය බලාපොරොත්තු ව සිටිය බව ඇත්තයි. කවුරු හරි තාත්තා මරා දමා ය කියා මම බලාපොරොත්තු වුණා .... මම එහෙම දෙයක් බලාපොරොත්තු වුණා ද? පැවල් මරාදැමිය යුතුයි. දැන් ම පැවල් මැරුවේ නැතිනම් ජීවත්වීමෙන් වැඩක් නැහැ."

ගෙදර යන ගමන් පියා, ඉවාන් කෙළින් ම කැතිරිනා ගේ ගෙදරට ගියේ ය. පිස්සකු මෙන් පැමිණි ඉවාන් දුක ඈ තැති ගත්තා ය. ඔහු පැවල් කී දෙය සම්පූර්ණයෙන් ම කැතිරිනාට කීවේ ය. කො තරම් වෑයම් කළත් කැතිරිනාට ඉවාන් සන්සුන් කළ නොහැකි විය. ඔහු පුදුම විදියට කතා කරමින් කාමරය පුරා ඇවිද්දේ ය. ඒ කතාවේ කිසි ම සම්බන්ධයක් නො තිබිණි. අන්තිමේ දී පුටුවක හිඳගත් හෙතෙම වැළමිට මේසය උඩ තබා, දෑත මත හිස රඳවාගෙන අරුම පුදුම දෙයක් කීවේ ය.

"තාත්තා මැරුවේ මිතියා නො ව පැවල් නම් ඒ මිනීමැරුමට මා ද වැරදිකාරයෙක්. මා ද හවුල් කාරයෙක්. තාත්තා මරන අදහස ඔහු ගේ හිසට ඇතුල් කළේ මම යි. ඒක මට නිවැරදි ව කියන්න බැහැ කොහොම වුණත් තාත්තා මැරුවේ මිතියා නො ව පැවල් නම් මා ද මිනීමරුවෙක්."

ඉවාන් ගේ කතාව ඇසූ වහා ම කැතිරිනා කිසිවක් නො කියා හිඳ සිටි පුටුවෙන් නැඟිට කෙළින් ම මේසය ළඟට ගොස්, පෙට්ටියක් ඇර, කොළයක් ගෙන, ඉවාන් ඉදිරිපිට තැබුවා ය. මිතියා තාත්තා මැරූබවට 'සෙලවිය නොහැකි සාක්ෂි තියෙනවා'යි පසු දවසක ඉවාන් අලෝෂාට මතක් කළේ මේ ලියමන ගැන ය එය මිතියා විසින් සුරා මතින් සිටි අවස්ථාවක කැතිරිනාට ලියන ලද ලියුමකි. ගෘසෙන්කා කැතිරිනාට අපහාස කළ දින සවස අලෝෂා කැතිරිනා ගේ ගෙදර සිට ආශ්‍රමයට යන අතරේ මිතියා මඟ දී හමුවුණේ මෙ දින සවස ය. අලෝෂා ගෙන් වෙන් වූ මිතියා ගෘසෙන්කා හමුවීමට ගියේ ය. ඔහුට ගෘසෙන්කා හමු වුණා ද නැද්ද යන්න කිසිවෙක් නො දනියි. නමුත් එ දින රෑ නගරයට ගිය මිතියා සුරා බී මත් වූ පසු කඩදාසි කොළයක් හා පෑනක් ගෙන, ඔහු ගේ විපතට හේතු වූ එම ලියමන ලිවේ ය. එය උන්මාදයෙන් යුතු ව ලියන ලද, කිසි ම සම්බන්ධයක් නැති විකාර ලියුමකි. කොටින් කියතොත් එය සුරාවෙන් මත් වූ ලියුමකි. එම ලියුම සුරා බී ගෙදර පැමිණි මිනිහකු

අප්‍රමිත කෝපයකින් යුතු ව, තමා ගේ බිරියට හෝ, ගෙදර අයකුට හෝ, තමාට හෝ, යම්කිසිවකු අපහාස කළ සැටිත්, අපහාස කළ තැනැත්තා ගේ වගතුගත්, අනෙක් අතින් තමා ගේ ගුණ යහපත් කමත්, තමාට අපහාස කළ ඒ තක්කඩියාට දඬුවම් කරන සැටිත්, අඬමින් දෙඩමින් හං මේසයට මිට මොළවා ගසමින්, දිගින් දිගට ම කරන අඳෝනාවක් වැන්න. එම ලියුම ලියා තිබුණේ ඉතා ලාබ අපිරිසුදු කඩදාසි කොළයක ය. තැබෑරුමෙන් ඉල්ලා ගන්නා ලද එම කඩදාසි කොළයේ අනෙක් පැත්තේ ඉලක්කම් කිපයක් ලියා තිබිණි. ඔහු ගේ සුරාවෙන් මත් වූ වාග්ප්‍රහාරයට කඩදාසි කොළය ප්‍රමාණවත් නොවූ බව පැහැදිලි ව පෙනෙන්නට තිබිණි. මිතියා කඩදාසි කොළයේ අයින දිගේ පමණක් නො ව, අන්තිම පේළිය ලියමන හරහා ද ලියා තිබුණේ ය. ඒ ලියුම ලියා තිබුණේ මෙසේ ය:

"මාරක කැතිරිනා වෙතටයි. හෙට මම මුදල් ගෙන තුඹේ රූබල් තුන් දහ ආපසු ගෙවන්නම්. ඊට පස්සේ, බොහො ම ඉක්මනට කිපෙන තුඹගෙන් මම වෙන් වෙනවා. මම ප්‍රේම කළ තරුණියගෙන් වෙන් වෙනවා. අප අතරේ තිබෙන සම්බන්ධය අවසන් කරමු. මම හෙට කොහොම හරි මුදල් සොයා ගන්නවා. කාගෙන් හරි ණයට ගන්නවා. ණයට ගන්න බැරිවුණොත් තාත්තා ළඟට ගිහින්, තාත්තා ගේ ඔළුව පලා, කොට්ටෙ යට සඟවා තියෙන මුදල් ගන්නවා ඒකාන්තයි. නමුත් තාත්තා මරා මුදල් ගන්න පුළුවන් ඉවාන් ගෙදර නො සිටියොත් පමණයි. තුඹේ මුදල් ගෙවා සයිබීරියාවට ගියත් කමක් නැහැ. දැන් ඉතින් ආයුබෝවන්. මම තුඹට විරුද්ධ ව බොහො ම තක්කඩි කම් කළා. ඒ නිසා මම තුඹට හිස නමා ආචාර කරනවා. මට සමා වෙන්න. නැහැ මට සමා වෙන්න එපා. සමා වෙන්න උවමනාවක් නැහැ. තුඹටත් සතුටින් සිටිය හැකියි. මටත් සතුටින් සිටිය හැකි යි. තුඹට ආලය කරනවට වඩා හොඳයි සයිබීරියාවට යනවා. මම වෙන ගැනියකට ආලය කරනවා. ඈ කොයි විදියේ ගැනියක් ද කියා අද තුඹට දැනගන්න ලැබෙන්න ඇති. ඉතින් කොහොම ද එහෙම දෙයක් වුණායින් පස්සේ තුඹ මට සමාව දෙන්නේ? මම මගේ ධනය සොරා ගත් මිනිහා මරා, තුඹලා කිසිවකු නොදකින ලෙස, තුඹලා සියලු දෙනා ම අත්හැර දමා පෙරදිගට යනවා. ඇයත් අත් හැර දමා යනවා. මට දුක් දුන්නේ තුඹ විතරක් නො වෙයි. ඇය ද මට දුක් දුන්නා. ආයුබෝවන්!"

"පසුව ලියන ලදී— මම ලියා ඇත්තේ සාපයක්. කොහොම වුණත් මම තුඹට තවමත් ආදරෙයි. මම තුඹට තවමත් ගෞරව කරනවා. මගේ හදවත තුළ තුඹට ඇති ආදරය හා ගෞරවය මගේ කනට ඇහෙනවා. තවමත් මගේ හද තුළ එක තතක් ඉතිරි වී තිබෙනවා. ඒ තත තවමත් රාව දෙනවා. මගේ පපුව දෙකට පළන එක හොඳයි. මම මගේ පණ නහගන්නවා. නමුත් ඊට පෙර අර බල්ලා මරා දැමිය යුතුයි. මම උගෙන් රූබල් තුන් දහක් ගෙන තුඹට දෙනවා. මම තුඹට තක්කඩිකම් කරන්න ඇති. නමුත් මම හොරෙක් නො වෙයි. ඒ බල්ලා රූබල් තුන් දහක් පීත්ත පටියකින් බැඳලා කොට්ටය යට තියා ගෙන ඉන්නවා. මම සොරෙක් නො වෙයි. නමුත් මම මගේ සොරා මරනවා. කැතිරිනා මා පිළිකුල් කරන්න එපා. මීතියා මිනීමරුවකු මිස සොරෙක් නො වෙයි. තුඹේ අහංකාර කමට යටත් වෙනවා වෙනුවට මීතියා තාත්තා මරා විනාශ වුණා. මීතියා තුඹට ආලය කරන්නේ නැහැ.

"මම තුඹේ දෙපා සිඹ තුඹෙන් සමු ගන්නවා. කැතිරිනා, මට කොහෙත් හරි හෙට මුදල් ලැබෙන්නට ය කියා දෙසියන්ට කියන්න. එතකොට මගේ දෑතේ ලේ තවරා ගන්න උවමනා නැහැ. මට කාගෙන් වත් මුදල් නො ලැබුණොත් මම තාත්තා මරනවා."

තුඹේ දාසයා සහ හතුරා වන
මීතියා කරමසෝ.

මේ ලියුම කියවා බැලූ ඉවාන් හිඳ සිටි තැනින් නැගිට්ටේ, තාත්තා මරන ලද්දේ සොහොයුරා බවට සැක හැර ගතිමිනි. තාත්තා මැරුවේ අයියා මිස පැවල් නො වෙයි. පැවල් තාත්තා මැරුවේ නැතිනම් එම මිනීමැරුමට තමා වරද කාරයෙක් නො වෙයි. මේ ලියුම මීතියා තාත්තා මැරූ බව ඔප්පු කළ හැකි හොඳ සාක්ෂියක්. මීතියා තාත්තා මැරූ බවට දැන් ඉවාන් තුළ අබමල් රේණුවක තරම්වත් සැකයක් නැත. අයියා පැවල් සමග එකතු වී තාත්තා මරන්නට ඇතැයි යන සැකය ඉවාන් තුළ ඇති නො වී ය. ඒ ගැන සැක කිරීමට ද හේතුවක් නැත. පසු දින උදේ, ඔහු පැවල් ගේ සරදම් බස් හා කතාව ගැන පමණක් පිළිකුලින් යුතු ව කල්පනා කෙළේ ය. පැවල් ගැන සැක කිරීම නිසා තම සිතේ වේදනාවක් ඇතිවීම ගැන ඔහු ටික දිනකට පසු පුදුම විය. පැවල් ගැන කිසි ම සැලැකිල්ලක් නො දක්වා ඔහු පිළිබඳ අදහස් සම්පූර්ණයෙන් ම සිතින් බැහැර කෙළේ ය.

මෙසේ මසක් ගත විය. ඔහු පැවල් ගැන වඩා විපරම් නො කළේ ය. එහෙත් පැවල් රෝගයෙන් සිහිසන් නැති ව සිටින බව ඔහුට වරක් දෙවරක් ආරංචි විය. "මිනිහට පිස්සු හැදේවි"යි වරක් තරුණ දෙස්තර වැවින්ස්කි කීවා ඉවාන්ට තව ම මතක ය. එම මාසයේ අවසාන සතියේ දී ඉවාන්ට ද අසනීප විය. නඩු විභාගයට සතියකට පමණ පෙර කැතිරිනා විසින් මොස්කව් සිට කැඳවන ලද විශේෂඥයා හමුවීමට ඉවාන් ගියේ ය. කැතිරිනා හා ඉවාන් අතරේ පැවැති සම්බන්ධය උග්‍ර අවස්ථාවකට පැමිණියේ මේ කාලයේ දී ය ඔවුහු එකිනෙකාට ආලය කරනා සතුරන් දෙදෙනකු වැන්න. කැතිරිනා මීතියාට දක්වූ තාවකාලික සහාසික කැමැත්ත දකින විට ඉවාන් ගේ සිහිය අවුල් වෙයි. ඉවාන් ගේ බලවත් කෝපයට කැතිරිනා මීතියාට හිතවත් කම් දක්වූවත්, අලෝෂා කැතිරිනාට මීතියා ගේ පණිවිඩය ගෙනා දවස වන තෙක්, ඒ මාසය පුරා කැතිරිනා මීතියාට එල්ල වී ඇති මිනීමැරීමේ චෝදනාව ගැන සැක කරන බවක් ඉවාන් නො දැන සිටියේ ය. තමා මීතියාට දක්වන වෛරය දවසින් දවස වැඩි වන බවත්, තමා එසේ වෛර කරන්නේ කැතිරිනා මීතියාට දක්වන සැලැකිල්ල නිසා නො ව ඔහු තාත්තා මැරූ නිසා බවත් ඉවාන්ට දැනිණි. ඔහු එය සම්පූර්ණ-යෙන් ම පිළිගත්තේ ය.

කෙසේ වෙතත්, නඩු විභාගයට දවස් දහයකට කලින් මීතියා බැලීමට ගිය ඉවාන්, මීතියාට හිරෙන් පැන යාමට වැඩ පිළිවෙලක් යෝජනා කෙළේ ය. එය ඉවාන් විසින් කාලයක සිට සකස් කරන ලද උපායක් බවට කිසි ම සැකයක් නැත. ඔහු සොහොයුරු නිදහස් කර ගැනීමට අදහස් කළේ පැවල් විසින් කරන ලද කතාවකින් සිත පෑරුණු හෙයිනි. ඒ කතාව නම් මීතියාට තාත්තා ගේ මුදලයෙන් ලැබෙන කොටස ඔහු ගේ මරණයෙන් පසු තමාටත් අලෝෂාටත් හිමි වන නිසා මීතියා වරද කාරයා වීම තමා ගේ වාසියට හේතුවන බව ය. එ හෙයින් මීතියා ගේ පැනයාම සඳහා තමා ගේ මුදලින් තිස් දහක් වියදම් කිරීමට ඔහු අදහස් කෙළේ ය. එහෙත් හිරගෙදර සිට මීතියා හමුවී පැමිණි පසු ඔහු තුළ බලවත් දොම්නසක් සමග චකිතයක් ඇති විය. තමා මීතියා ගේ පැනයාම සඳහා මෙතරම් සැලැකිල්ලක් දක්වන්නේ තිස් දහක් වියදම් කොට, පැවල් කල අපහාසයෙන් නිදහස් වීමට පමණක් නො ව වෙනයම් හේතුවක් නිසා යයි ඔහු කල්පනා කෙළේ ය. "මම අයියා නිදහස් කර ගැනීමට වෑයම් කරන්නේ සිතින් මා ද මිනීමරුවකු වන නිසා ද?"යි ඔහු තමාගෙන් ම ප්‍රශ්න කෙළේය. සිතේ පතුලේ තිබෙන යම් කිසිවක් ඔහු ගේ ආත්මය

තුළ පැසවන බව ඔහුට දැනිණි. ඒ සියල්ලට ම වඩා අසාධ්‍ය වූයේ ඒ මාංසය පුරා ඔහු ගේ අභිමානයට මහත් වේදනාවක් ඇතිවීමයි. ඒ ගැන විස්තර පසු ව කියමි.........

අලෝෂා සමඟ කළ කතාවෙන් ඉක්බිති ව ගෙදර ගිය ඉවාන් දොර ඇරවීම සඳහා සීනුව හැඬවීමට, සීනුවට අත තබනවාත් සමඟ ම යළි පැවල් හමුවීමට හදිසි ආශාවක් ඇති විය. ඔහු ඒ හදිසි ආශාවට අවනත විය. "තාත්තා මැරුවේ මීතියා බව විශ්වාස කිරීමට මා පෙළඹුවේ තුඹ පමණයි" කියමින් මිනිත්තු ස්වල්පයකට පෙර කැතිරිනා අලෝෂා ඉදිරිපිට දී තමාට කෑගැසැටි ඉවාන්ට හදිසියෙන් ම සඳහන් විය. තාත්තා මැරුවේ මීතියා බව ඉවාන් කවදාවත් කැතිරිනාට නො කීවේ ය. ඒ වෙනුවට, පැවල් හමුවී පැමිණි පසු, තාත්තා ගේ මරණයට තමා වරද කාරයකු විය හැකි බව ඔහු ඇයට කීවේ ය. මීතියා විසින් ලියන ලද ලියුම තමාට පෙන්නා, මීතියා වරදකාරයා බව ඔප්පු කිරීමට වෑයම් කළේ කැතිරිනා ය. "මාත් පැවල් හමු වෙන්න ගියා"යි ඈ හදිසියෙන් ම කීවා ය. කැතිරිනා කවදා ද පැවල් හමුවීමට ගියේ? ඉවාන් ඇගේ මේ ගමන ගැන කිසිවක් නො දැන සිටියේ ය. එසේ නම් මීතියා අතේ වරදක් නැති බව ඈ පිළිගන්නවා ඇති. පැවල් කැතිරිනාට කුමක් කියන්නට ඇද්ද? කැතිරිනා පැවල්ට කුමක් කියන්නට ඇද්ද? ඉවාන් ගේ හදවත දැඩි කෝප-යෙන් දැවෙන්නට විය. පැය භාගයකට කලින් තමා ඇගේ කතාව අසා විරුද්ධ නො වූයේ මන්දැයි ඔහුට තේරුම් ගත නොහැකි විය. ඔහු ගෙයි දොරේ සීනුව අත හැර වහා පැවල් හමුවීමට ගියේ ය. "සමහර විට මේ පාර මිනිහා මගේ අතින් මැරුම් කන්න පුළුවනි"යි. ඔහු යන ගමන් තමාට ම කියා ගත්තේ ය.

අට වන පරිච්ඡේදය

අවසාන හමුවීම

ඉවාන්, පැවල් ගේ ගෙදරට ඇති දුරින් අඩක් පමණ ගිය පසු එදින උදේ හැමූ වියළි තියුණු සුළඟ යළි හමන්නට විය. ඒ සමඟ ඉතා සිහින් හිම ද වැටෙන්නට විය. බිම වැටුණු හිම පියාගෙන සුළඟක් හමා ගියෙන් වැඩි වේලා යන්නට පෙර හිම කුණාටුවක් හමන්නට විය. පැවල් වාසය

කළ, නගරයේ මේ කොටසේ පාරවල පහත් නො තිබිණි. හිම කුනාටුවට කිසි ම සැලැකිල්ලක් නො දක්වූ ඉවාන් අඳුර තුළින් පාර සොයා ගෙන ගියේ ය. ඔහු ගේ හිස කකියන අතරේ නළල දෙපස වේදනාවෙන් ගැහෙන්නට විය. ඔහු ගේ දෑත වෙවුලමින් ඇඹරෙන බව ඔහුට දැනිණි. පැවල් නතර වී සිටින කුඩා ගෙයට යාර කිපයක් ඇතිත්, සුරාවෙන් මත් වී තනියෙන් සිටින කුඩා ගැමියෙක් හදිසියෙන් ම ඉවාන්ට හමු විය. අණ්ඩ දමන ලද කබායක් ඇඳ සිටි හෙතෙම පාර හරහා වැනෙමින් හා බණිමින් ගමන් කෙළේ ය. හදිසියෙන් ම බැණීම නතර කළ හෙතෙම රළු හඬින් ගීයක් ගයන්නට විය.

'වන්කා ගියා පීටස්බර්ග් නුවර බලා
මම නොසිටිමි ඔහු ආපසු පැමිණි තුරා.'

එහෙත් දෙවන පෙළ අගින් සිත්දුව නතර කරන ගැමියා යළි අසභ්‍ය බසින් බණින්නට පටන්ගතියි. අනතුරු ව ඔහු ආයෙත් ගීය ගයයි. මේ බේබද්දා ගැන කල්පනා කිරීමටත් පෙර ඉවාන් තුළ ඔහු කෙරෙහි බලවත් වෛරයක් ඇති විය. එහෙත් ගැමියා දුටු ඔහු තුළ ගැමියාට පහර දීමට, මැඩ ගත නොහැකි ආශාවක් ඇති විය. ඒ මොහොතේ දී ම ඔහු ගැමියා පසු කොට ගියේ ය. වැනෙමින් ගමන් ගත් ඒ මිනිහා ඉවාන් ගේ ඇගේ හැපුණෙන් ඉවාන් කෝපයෙන් ඔහු ඉවතට තල්ලු කෙළේ ය. වීසිවී ගිය ගැමියා පාර මැද හිම මත ඇද වැටිණි. ඔහු ශෝකයෙන් කෙඳිරි ගා නිහඬ විය. ඉවාන් ගැමියා ළඟට ගොස් බැලුවේ ය. ගැමියා සිහි නැති ව, උඩුකුරු ව, නිහඬ ව වැටී සිටියේ ය. "මේ මිනිහා හීතලෙන් දරදඬු වී මැරිලා"යි කල්පනා කළ ඉවාන් පැවල් ගේ නිවෙස බලා ගියේ ය.

අතින් ඉටිපන්දමක් ගෙන, වහා දිව පැමිණ දොර ඇරිය ගෘහිණිය, පැවල් අසනීපයෙන් සිටින බව රහසක් කියන්නාක් මෙන් කීවා ය. "සිහි කල්පනාවත් අඩුයි. තේ වතුර දුන්නහම ආපසු ගෙනියන්න කිව්වා. තේ බීවේ නැහැ."

"මොකද මිනිහ කලබල කරනවද?"යි ඉවාන් කිසි ම ගරුසරුවක් නො දක්වා විමසුවේ ය.

"නැහැ හාමුදුරුවනේ, කෑගානවා තියා මියකු ගේ හොල්මනක් වත් නැහැ. නමුත් නමුන්නාන්සේ වැඩි වේලා කතා කරන්න එපා"යි ගැහැනිය කීවේ බැගෑපත් වෙමිනි.

ගිය වතාවේ ඉවාන් එන විට මෙන් මේ වතාවේ දී ද කාමරය ඉතා උණුසුම් විය. එහෙත් කාමරයේ කිසියම් වෙනසක් දකින්නට තිබිණි. බිත්තිය අයිනේ තබා තිබුණු බන්කුව ඉවත් කොට එ තැන පැරණි මොහොගනි සෝපාවක් තබා තිබුණේ ය. ඒ සෝපාව, මදක් පිරිසුදු කොට්ට තබා ඇඳක් මෙන් සකස් කොට තිබිණි. පරණ ඇඳුමකින් සැරසී සිටි පැවල් සෝපාව උඩ සිටියේ ය. සෝපාව ඉදිරිපිට තබා තිබුණු මෙසය නිසා කාමරය තද බද විය. මේසය උඩ කහපාට කවරයකින් යුත් ලොකු පොතක් තිබිණි. එහෙත් පැවල් පොත කියවමින් සිටියේ නැත. ඔහු සෝපාව උඩ හිඳ නිකම් බලා සිටියා මිස කිසිවක් නො කෙළේ ය. ඉතා සෙමෙන් නිහඬ ව ඉවාන් දෙස බැලූ හෙතෙම, ඉවාන් ගේ පැමිණීම ගැන පුදුම වූ බවක් නො දැක්වූයේ ය. ඔහු ගේ මුහුණේ ලොකු වෙනසක් දකින්නට තිබිණි. ඔහු සිහින් විය. සුදු මැලි විය. ඔහු ගේ දෑස ගිලුණේ ය. ඇස් යට කළු විය.

"උඹට සනීපයක් නැහැ නේ ද?"යි ඉවාන් කෝපයෙන් ප්‍රශ්න කෙළේ ය. "මා වැඩි වේලාවක් ගත කරන්නේ නැහැ. මගේ කබායවත් ඉවත් කරන්නේ නැහැ. කො තැන ද මේ කාමරයේ ඉදගන්න ඉඩ තියෙන්නේ?"

ඉවාන් මේසයේ අනෙක් කෙලවරට ගොස් පුටුවක් ගෙන හිඳ ගත්තේ ය.

"ඇයි උඹ ගොළුවකු වගේ මා දිහැ බලා ඉන්නේ? මා ආවේ උඹෙන් එක ප්‍රශ්නයක් අහන්නයි. ඒකට පිළිතුරක් නැති ව මම යන්නේ නැහැ. කැතිරිනා උඹ බලන්න ආව ද?"

පැවල් තවමත් නිහඬ ව ඉවාන් දෙස බලා සිටියේ ය. අනතුරු ව ඔහු හදිසියෙන් ම අත වනා ඉවත බලා ගත්තේ ය.

"මොකද උඹට වෙලා තියෙන්නේ?"යි ඉවාන් විමසී ය.

"මොනවක්වත් නැහැ."

"මොකද මොනවක්වත් නැහැ කියන්නේ?"

"ඔව්, කැතිරිනා අද මා බලන්න ආවා. තමුන්නාන්සේට ඇති උවමනාව මොකක් ද? මට කරදර නො කර යන්න."

"නැහැ, මම යන්නේ නැහැ. ඈ කොයි වෙලාවේ ද ආවේ?"

"මට මතක නැහැ"යි පැවල් පිළිකුල හඟවන සිනාවක් දක්වා කී ය. අනතුරු ව ඔහු හදිසියෙන් ම යළි ඉවාන් දෙස වෛරයෙන් දැවෙන දෑසින් බලා සිටියේ ය.

"මට පෙනෙන්නේ තමුන්නාන්සේටත් වැඩි සනීපයක් නැති බවයි" ඔහු ඉවාන්ට කී ය. "තමුන්නාන්සේ ගේ මූහුණත් හැකිළිලා, බලන්නත් හයයි."

"මගේ සැප සනීප ගැන උඹට උවමනාවක් නැහැ. මා අහපු ප්‍රශ්නයට පිළිතුරු දීපන්."

"මොකද තමුන්නාන්සේ ගේ ඇස් ගිලිලා තියෙන්නේ? සුදු ඉංග්‍රියාව කහ පාටයි. තමුන්නාන්සේ ලොකු කරදරයකින් ඉන්නවා වගෙයි." ඉවාන් දෙස පිළිකුලින් බලා දත විලිස්සූ හෙතෙම අනතුරු ව මහ හඬින් සිනාසුණේ ය.

"මේ බලාපන්, මා කිව්වා නේද පිළිතුරක් නැති ව මෙ තැනින් යන්නේ නැහැ කියා"යි ඉවාන් කෝපයෙන් කී ය.

"ඇයි මට කරදර කරන්නේ? ඇයි මට වද දෙන්නේ?"යි පැවල් වේදනාවෙන් බලා කී ය.

"උඹට හෙණ ගැහැව්වත් මට කමක් නැහැ. මගේ ප්‍රශ්නයට පිළිතුරු දීපන්. ඊට පස්සේ මම යන්නම්."

"තමුන්නාන්සේට දෙන්න පිළිතුරක් නැහැ"යි පැවල් යළි බිම බලා කී ය.

"උඹ දැනගනින්, මට පුළුවනි උඹෙන් බලයෙන් පිළිතුරක් ගන්න."

"ඇයි තමුන්නාන්සේ ඔය තරම් හය?"යි පැවල් යළි ඉවාන් දෙස බලා ඇසුවේ ය. ඒ බැල්මේ පිළිකුල පමණක් නො ව, සිත් නොසන්සුන් කරන ගතියක් ද දකින්නට තිබිණි. "මොකද හෙට නඩුව පටන්ගන්න නිසා ද? තමුන්නාන්සේට කිසි ම අනතුරක් වෙන්නේ නැහැ. කරදර වෙන්නේ නැති ව ගෙදර ගිහින් නිදා ගන්න. කිසි ම දෙයක් ගැන හය වෙන්න එපා!"

"උඹ කියන දෙය මට තේරුම් ගන්න බැහැ. මං මොනවට ද හෙට හය වෙන්නේ?"යි ඉවාන් පුදුමයෙන් විමසුවේ ය. හදිසියෙන් ම ඔහු බියෙන් දෙරදඹු විය. ඒ අතරේ පැවල් ඉවාන් දෙස සෝදිසියෙන් බලා සිටියේ ය.

"තමුන්නාන්සේට මා කියන දෙය තේරුම් ගන්න බැරි ද?"යි හෙතෙම අවලාද කියන්නාක් මෙන් නතර වෙමින් කී ය. "ඇයි තමුන්නාන්සේ දන්නේ නැද්ද? තමුන්නාන්සේ වැනි ඥානවන්ත කෙනෙක් මා මුලා කරන්න වෑයම් කිරීම මහ පුදුමයක්!"

ඉවාන් පැවල් දෙස නිහඬ ව බලා සිටියේ ය. තමාට වරක් දුසකම් කළ මේ මිනිහා කිසි ම ගරුසරුවක් නැති ව කතා කරන සැටි හා දක්වන අහංකාර කම සැබැවින් ම විස්මය ජනක ය. පසු ගිය වතාවේ දී ඔහු මේ අයුරින් කතා නොකළේ ය

"තමුන්නාන්සේ භය නැති ව ඉන්න. භයවෙන්න කිසි ම හේතුවක් නැහැ. තමුන්නාන්සේට විරුද්ධ ව මම කිසි ම දෙයක් කියන්නේ නැහැ. තමුන්නාන්සේට විරුද්ධ ව සාක්ෂි නැහැ. බලන්න තමුන්නාන්සේ ගේ දෑත වෙවුලන හැටි. ඇයි ඔය විදියට වෙවුලන්නේ? ගෙදර යන්න. තාත්තා මැරුවේ තමුන්නාන්සේ නො වෙයි."

ඉවාන් තැති ගත්තේ ය. ඔහුට අලෝෂා කී දෙය සඳහන් විය.

"තාත්තා මැරුවේ මා නොවන බව මම දන්නවා"යි ඉවාන් සෙමෙන් කී ය.

"ආ! එහෙම ද?"

ඉවාන් ඉදිරියට පැන පැවල් ගේ උරහිසින් අල්ලා ගත්තේ ය.

"දුෂ්ටයා, වෙච්ච දෙය මට සේරම කියාපිය!"

පැවල් යන්තම් වත් තැති නොගත්තේ ය. උමතු වෛරයෙන් දිලෙන දෑසින් ඔහු ඉවාන් දෙස බැලුවා පමණි.

"දැන ගන්න කැමැති නම් කියන්නම්. තමුන්නාන්සේ ගේ තාත්තා මැරුවේ තමුන්නාන්සෙයි" පැවල් කෝපයෙන් කී ය.

ඉවාන් පුටුව මත හාන්සි වුණේ යම් කිසිවක් ගැන කල්පනා කරන්නකු මෙනි. අනතුරු ව ඔහු ද්වේෂයෙන් සිනාසුණේ ය.

"උඹ කියන්නේ ගිය වතාවේ කියාපු දෙය ම ද?"

"ඔව්, ගිය වතාවේ මා කියාපු දෙය තේරුණා. දැනුත් මා කියන දෙය තේරුම් ගන්න පුළුවනි."

"උඹ උමතුවෙන් දෙඩන බව නම් මට තේරුම් ගන්න පුළුවනි."

"තමුන්නාන්සේ මේ කතාව අසා විඩාවැටෙන්නේ නැද්ද? අප දෙන්නා මේ කාමරයේ එකිනෙකා ගේ මූහුණු බලාගෙන ඉඳගෙන ඉන්නවා. මේ විදියට අප දෙදෙනා එකිනෙකා රවටා ගැනීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? නැතිනම් තමුන්නාන්සේ තවමත් වෑයම් කරන්නේ සම්පූර්ණ වරද මගේ පිට උඩ පටවන්න ද? තාත්තා මැරුවේ තමුන්නාන්සේයි. නියම මිනීමරුවා තමුන්නාන්සේයි. මම තමුන්නාන්සේ ගේ අවංක දාසයා හැටියට තමුන්නාන්සේ කී දෙය කළා. මම තමුන්නාන්සේ කියාපු නිසා තාත්තා මැරුවා."

"උඹ තාත්තා මැරුවා? ඇයි උඹ තාත්තා මැරුවේ?" ඉවාන් හිතියෙන් ගල්ගැසුණේ ය.

තමා ගේ මොළයේ කිසියම් විපරියාසයක් සිදු වෙන්නාක් මෙන් දැනිණි. ඔහු ගේ සර්වාංගය ම සීතලෙන් වෙවුලුවේ ය. පැවල් ද ඉවාන් දෙස පුදුමයෙන් බැලුවේ ය. සමහර විට ඉවාන් ගේ හිතියෙන් පැවල් ද තැති ගන්නට ඇත.

"ඇයි තමුන්නාන්සේ මේ ගැන දැනගෙන හිටියේ නැද්ද?"යි පැවල් ඉවාන් දෙස සැකයෙන් බලා ඇසුවේ ය. වෑයමින් ඇතිකරගත් සිනාවක් ඔහු ගේ දෑසේ දකින්නට තිබිණි. තවමත් පැවල් දෙස බලා සිටින ඉවාන්ට කතා කරගත නො හැකිවූවාක් මෙන් පෙනිණි.

'වන්කා ගියා පීටර්ස්බර්ග් නුවර බලා
මම නොසිටිම් ඔහු ආපසු පැමිණි තුරා'

යන ගීයේ දෝන්කාරය ඉවාන් ගේ හිසේ රැව් දුන්නේ ය.

"උඹ මා ළඟ ඉඳගෙන ඉන්න සිහිනයක් ය, නැති නම් අවතාරයක් ය, යන අදහස ඇතිවන කොට මට භය හිතෙනවා,"යි ඉවාන් සෙමෙන් කී ය.

"අපි දෙන්නාත් තවත් අයකුත් හැර මෙ තැන අවතාරයක් නැහැ. ඒ තුන් වන තැනැත්තා අප දෙදෙනා අතර මෙ තැන සිටිනවාට කිසි ම සැකයක් නැහැ."

"කවුද ඒ තැනැත්තා? කවුද මෙ තැන ඉන්නේ? කවුද තුන් වන තැනැත්තා?"යි භීතියෙන් තැති ගෙන ඇසූ ඉවාන් කාමරයේ අස්සක් මුල්ලක් නැර සොයන්නට විය.

"තුන් වන තැනැත්තා දෙවියන් වහන්සේයි. උන් වහන්සේ දැන් අප දෙදෙනා අතර සිටිනවා. නමුත් හොයන්න උවමනාවක් නැහැ. හොයා කිසි ම වැඩක් වෙන්නේ නැහැ."

"උඹ තාත්තා මැරුවා කියන්නේ බොරුවට"යි ඉවාන් පිස්සකු මෙන් කෑගා කී ය. "උඹට පිස්සු! නැතිනම් ගිය වතාවේ වගේ උඹ මට ආයේත් කවට කම් කරනව ද?"

පැවල් ආයේත් කිසි ම භයක් සැකක් නැති ව තම ස්වාමියා ගේ මුහුණ දෙස සෝදිසියෙන් බලා සිටියේ ය. ඔහු ගේ සිතේ පැවැති සැකය තව මත් නැති කල නොහැකි ය. ඉවාන් හැම දෙයක් ම දන්නා බවත්, තමා පිට වරද පැටවීම පිණිස නොදන්නා බව හඟවන බවත් ඔහු දැන සිටියේ ය.

"ටිකක් ඉන්න"යි අන්තිමේ දී දුබල කටහඬින් පැවැසූ පැවල් ගිටිහැටියේ ම වම් කකුල මේසය යටින් එළියට ගෙන කලිසම් කකුල උස්සන්නට විය. පැවල් දිග මේස් කකුලක් ඇඳ සෙරෙප්පුවක් ලා සිටියේ ය. ඔහු වැඩි කලබලයක් නො දක්වා ගාටස් ඉවත් කොට, මේස් කකුලේ අඩියට අත දැම්මේ ය. ඔහු දෙස බලා සිටි ඉවාන් හදිසියෙන් ම වෙව්ලන්නට විය.

"පිස්සා!" කියා කෑගෑ ඉවාන් වහා හුනස්නෙන් නැගිට කො තරම් වේගයෙන් පස්සට පැන්නේ ද කියතොත්, පිට බිත්තියේ හැපුණේ ය. අනතුරු ව හෙතෙම හිස සිට දෙපා දක්වා සර්වාංගය ම බිත්තියේ ඇලුණාක් මෙන් උමතු භීතියෙන් ගල්ගැසී පැවල් දෙස නො සැලී බලා සිටියේ ය. ඉවාන් ගේ භීතියට කිසි ම සැලකිල්ලක් නොදැක්වූ පැවල්, ඇඟිලිවලින් යම්කිසිවක් ගෙන එළියට ඇද දැම්මට වෑයම් කරන්නාක් මෙන් මේස් කකුල අතගාන්නට විය. අන්තිමේ දී ඔහු එය අතට ගෙන එළියට ගැනීමට වෑයම් කෙළේ ය. ඔහු එළියට අදින්නේ කඩදාසි මිටියක් බව ඉවාන් දුටුවේ ය. පැවල් එය එළියට ගෙන මේසය උඩ තබා "මෙන්න තියෙනවා"යි සෙමෙන් කී ය.

"මොනව ද තියෙන්නේ?"යි ඉවාන් වෙව්ලමින් ඇසුවේ ය.

"ටිකක් බලන්න"යි පැවැල් එම කටහඬින් ම කී ය.

ඉවාන් මේසය ළඟට ගොස් කඩදාසි මිටිය ගෙන දිගහැර බැලුවේ ය. අනතුරු ව ඔහු එය වහා ඉවත දැම්මේ අතට අසුවූ භයානක පිළිකුල් සර්පයකු ඉවත දමන්නාක් මෙනි.

"තමුන්නාන්සේ ගේ අත වෙව්ලනවා"යි පැවැසූ පැවල් කිසි ම කලබලයක් නො දක්වා කඩදාසි මිටිය දිගහැරියේ ය.

කවරය තුළ දේදුන්නේ පැහැයට සමාන පැහැයෙන් යුත් රූබල් නෝට්ටු මිටි තුනක් තිබුණේ ය.

"රූබල් තුන් දහ ම මෙ තැන තියෙනවා. ගණින්න උවමනා නැහැ. අරගන්න"යි පැවල් මුදල් පෙන්නමින් කී ය.

ඉවාන් ආයෙත් පුටුව උඩ හිඳගත්තේ ය. ඔහු ගේ මුහුණ පිරිවටයක් මෙන් සුදු මැලි විය.

"උඹ මේස් කකුලට අත දමා මා භය කළා"යි ඉවාන් නපුරු සිනාවක් දක්වා කී ය.

"හැබැට ම තමුන්නාන්සේ මේ වනතුරු දැනගෙන හිටියේ නැද්ද?"යි පැවල් ආයෙත් විමසුවේ ය.

"නැහැ, මා දැනගෙන හිටියේ නැහැ. මා මෙතෙක් කල් හිතාගෙන හිටියේ අයියා තාත්තා මැරුවා ය කියායි, අනේ දෙයියනේ! අනේ අයියේ!" කියමින් ඉවාන් හදිසියේ ම දෑතින් හිස බදාගත්තේ ය. "උඹ තාත්තා මැරුවේ තනියෙන් ද? නැතිනම් අයියා ගේ උපකාරය ඇති ව ද?"යි ඔහු ආයෙත් ඇසුවේ ය.

"මම තාත්තා මැරුවේ තමුන්නාන්සේ ගේ උපකාරය ඇතිවයි. තමුන්නාන්සේ ගේ සහෝදරයා අනේ කිසි ම වරදක් නැහැ."

"හොඳයි, මා කළ උපකාරය ගැන පසු ව කතා කරමු. ඇයි මා වෙව්ලන්නේ? ඇයි මට හරියට කතා කරන්න බැරි?"

"එදා නම් තමුන්නාන්සේ බොහො ම නිර්භීතවයි කතා කෙළේ. තමුන්නාන්සේ කිව්වා හැම දෙයක් ම නීතියට එකඟයි කියා. නමුත් දැන් තමුන්නාන්සේ කො තරම් භයෙන් ද ඉන්නේ?"යි පැවල් පුදුම වෙමින් කී ය. "ලැමනේඩ් ටිකක් බොන්න කැමැති ද? ඕනෑ නම් වහා ම ගෙන්වන්න පුළුවනි.

බොහො ම හොඳට ශරීරය ප්‍රාණවත් වෙනවා. නමුත් ඊට කලින් මේ මුදල් හංගන්න ඕනැ''යි ඔහු නෝට්ටු මිටියක් පෙන්නමින් කී ය.

ලැම්තේඩ් ගෙනෙන ලෙස ගෘහිණියට කතා කොට කීම පිණිස ඔහු හුත් තැතිත් නැගිට දොර ළඟට යාමට සැරසිණි. ගෘහිණියට නොපෙනෙන ලෙස මුදල් වසා තැබීම පිණිස යම්කිසිවක් සොයා අවට බැලූ පැවල් පලමු ව සාක්කුවට අත දමා ලේන්සුව ගත්තේ ය. එහෙත් ඔහු මේසය උඩ තිබුණු කහ පැහැති පොතින් මුදල් වැසුවේ ලේන්සුව අපිරිසුදු වූ හෙයිනි. ඉවාන් කාමරයට ඇතුළු වන විට මේ පොත දුටුවේ ය. 'සිරියාවේ ශුද්ධ වූ අයිසැක් පියතුමා ගේ ප්‍රකාශන' පොතේ නමයි. ඉවාන්ට නොකල්පනාවෙන් ම වාගේ පොතේ නම කියවීමට යන්තම් කාලය ලැබිණි.

''මට ලැම්තේඩ් උවමනා නැහැ''යි ඉවාන් කී ය. ''මා ගැන පසු ව කතා කරමු. ඔතැනින් ඉඳගෙන උඹ තාත්තා මරපු හැටි කියාපන්.''

''ඔය කබාය ගලවා තබන්න. නැති නම් හොඳට ම දහඩිය දමා වි.''

කබාය ඉවත් කිරීමේ අදහස ඒ මොහොතේ ම ඇතිවූවාක් මෙන් ඉවාන් වහා නැගිට කබාය ගලවා බන්කුව උඩට වීසි කෙළේ ය.

''දැන් ඉතින් කියාපන්.''

ඉවාන් සන්සුන් වූවාක් මෙන් පෙනේ. පැවල් සිදු වූ හැම දෙයක් ම කියාවි ය යන විශ්වාසයෙන් යුතු ව ඉවාන් පැවල් දෙස බලා සිටියේ ය.

''තාත්තා මරපු හැටි ගැන ද ඇසුවේ? තමුන්නාන්සේ කියාපු විදියට ම මැරුවා''යි හෙතෙම සුසුමක් හෙලමින් කී ය.

''මා කියාපු දේවල් ගැන පසු ව කතා කරමු''යි ඉවාන් කතාවට බාධා කරමින් කී ය. පෙර මෙන් කෑගා කතා නොකල ඉවාන් හැම වචනයක් ම පැහැදිලි ව කීවේ සම්පූර්ණ ආත්ම දමනය ඇති ව සිටින්නාක් මෙනි. ''තාත්තා මරපු හැටි පිළිවෙළකට ඇති ව කියාපන්. කිසි ම දෙයක් අමතක කරන්න එපා. එ පමණයි මට උවමනා කරන්නේ.''

"නමුත්නාත්සේ ගියාට පස්සේ මම ආයේත් වරක් කැඩැත්ගුවේ වැටුණා."

"මීමැස්මොරය හැදිල වැටුණ ද? නැතිනම් බොරුවට වැටුණ ද?"

"බොරු ලෙඩ අරගෙනයි වැටුණේ. මම තරප්පුව බැහැලා, බිම තිදාගෙන කෑගාමින් දඟලන්න පටන් ගත්තා. මාව උස්සා-ගෙන එළියට ගෙනයනකන් වෙව්ලමින් කෑගෑවා."

"ටිකක් හිටපන්. ඊට පස්සේ, ඉස්පිරිතාලයට ගෙනිච්චට පස්සේත් උඹ බොරු ලෙඩ හදාගෙන හිටිය ද?"

"නැහැ. පහු ව ද මා ඉස්පිරිතාලයට ගෙනියන්න ඉස්සෙලා මට මීමැස්මොරය හැදුණා. අවුරුදු ගණනකිත් වත් එ තරම් භයානක විදියට හැදුණේ නැහැ. දවස් දෙකක් ම සිහිය නැති ව හිටියා."

"හොඳයි, හොඳයි, කියාපන්."

"ඉතින් උන් මාව උස්සාගෙන ගිහිත් බිත්තිය පිටිපස්සෙ තියෙන ඇඳ උඩ තිබ්බා. මම දැනගෙන හිටියා උන් මා උස්සාගෙන ගිහින් ඔය ඇඳ උඩ තියන බව. අසනීප වෙච්ච හැම වතාවේ දී ම මාපා මට ඒ ඇඳ උඩ තිදගන්න දුන්නා. උපන් දා ඉඳලා මාපා මට බොහො ම ආදරයෙන් සැලකුවා. රෑ එළිවනතෙක් මම බොහො ම සෙමෙන් කෙඳිරි ගෑවා. නමුත් ඒ එක්ක ම මම මීතියා එනතෙක් බලා හිටියා."

"මීතියා උඹ ළඟට එන තෙක් බලා හිටිය ද?"

"මීතියා මා ළඟට එනතෙක් නො වෙයි, මහ ගෙදරට එන තෙක් බලා හිටියා. මා නැති නිසාත්, මගෙත් කිසි ම ආරංචියක් දැනගැනීමට නො ලැබෙන නිසාත්, වෙන දා වගේ වැට උඩින් පැන මහ ගෙදරට එන බව මම දැනගෙන හිටියා."

"මීතියා ආවේ නැතිනම් මොකද වෙන්නේ?"

"එහෙනම් කිසි ම දෙයක් වෙන්නේ නැහැ. මීතියා ආවේ නැති නම් මම කවදාවත් තාත්තා මරන්නේ නැහැ."

"හොඳයි, හොඳයි.........හෙමින් තේරෙන්න කියාපන්. ඉක්මන් වෙන්න එපා. කිසි ම දෙයක් අමතක කරන්න එපා."

''මීතියා තාත්තා මරාවිය කියා මා බලාපොරොත්තු වුණා. මා හොඳට ම දැනගෙන හිටියා, මීතියා තාත්තා මරන බව. පහු ගිය දවස් කීපයේ දී මම ඒ සඳහා හැම උල්පත්දමක් ම දුන්නා. දොරට තට්ටු කරන හැටි දැන ගෙන හිටියා. ඒක තමයි බොහො ම වැදගත් දෙය. මීතියා පහු ගිය දවස් කීපයක ඉඳලා අවිශ්වාසයෙන් හා සැකයෙන් හිටියේ. ඒ එක්ක ම දොරට ගසන ක්‍රමයත් දැන ගෙන සිටිය නිසා මා දැනගත්තා වත්තට පැන දොරට ගසා, ගෙට ඇතුළු වී තාත්තා මරන බව. මා අත්ත ඒකයි බලාපොරොත්තු වුණේ.''

''ටිකක් හිටපන්''යයි ඉවාන් කතාවට බාධා කරමින් කී ය. ''අසියා තාත්තා මැරුවා නම් මුදල් අරගෙන යනවා. ඒ බව උඹ දැනගෙන හිටියා. ඉතින් උඹ තාත්තා මැරුවේ මොන ප්‍රයෝජනයකට ද?''

''මීතියාට කවදාවත් මුදල් හොයා ගන්න ලැබෙන්නේ නැහැ. කොට්ටය යට මුදල් තියෙන බව මීතියාට කිව්වේ මායි. නමුත් ඊට පස්සේ මම තාත්තාට කිව්වා මුදල් සමඟ ලියුම් කවරය සුරුවම පිටිපසින් තියන්න ය කියා. කොහොමටත් කලබලයෙන් සිටින කෙනෙක් සුරුවම් පිටිපස්සේ මුදල් හොයන්නේ නැහැ. මුදල් තිබුණේ සුරුවම පිටිපස්සේ මුල්ලකයි. කොට්ටය යට මුදල් තියන එක මහ මෝඩ කතාවක්. නමුත් සේරම විශ්වාස කළේ මුදල් කොට්ටය යට තියෙන බවයි. එවැනි දෙයක් විශ්වාස කිරීම මහ මෝඩකමක්. ඉතින් මීතියා තාත්තා මැරුවා නම් මීතියාට තාත්තා ගේ මුදල්වලින් තඹයක්වත් ලැබෙන්නේ නැහැ. මීතියා තාත්තා මරා පැනල යාවි. සාමාන්‍ය-යෙන් මිනී මැරූ අය ඉතා සුළු ශබ්දයෙන් පවා තැති ගෙන පැනල යනවා, නැති නම් පොලිසියට අහුවෙනවා. ඉතින්, පහු ව දා උදේට, නැති නම් එදා රෑ ම සුරුවම පිටිපස්සේ තියෙන මුදල් ගන්න මට පුළුවන් කම තිබුණා. මිනී මැරුමට හා සොරකමට අහුවෙන්නේ නමුත්නාත්සේ ගේ සහෝදරයා. ඒක මට හොඳට විශ්වාසයි.''

''නමුත් තාත්තා නො මරා ඒ වෙනුවට හොඳ හැටි තැළුවා නම් මොකද වෙන්නේ?''

''නොමැරුවා නම් මුදල් ගන්න මම හිතන්නෙවත් නැහැ. නමුත් තාත්තාට සිහි නැති වන තෙක් තැළුවා නම් මුදල් ගන්න මට අවස්ථාවක් ලැබෙනවා. මීතියා මුදල් ගත්ත බව මට තාත්තාට කියන්න පුළුවනි.''

"ටිකක් හිටපන්, උඹේ කතාව අවුල් වෙනවා. එහෙනම් තාත්තා මැරුවේ මිතියා? උඹ කළේ මුදල් සොරා ගැනීම පමණයි?"

"නැහැ, මිතියා තාත්තා මැරුවේ නැහැ. නමුත් තාත්තා මැරුවේ මිතියා බව මට දූත් වුවත් කියන්න පුළුවනි. මේ ගැන තමුන්නාන්සේ කිසි ම දෙයක් තව ම තේරුම් ගෙන නැති නිසාත්, තමුන්නාන්සේ කළ වරද මා පිට පැටවීමට බොරුවට අදහස් නොකරන නිසාත්, මා තමුන්නාන්සේට බොරුවක් කියන්නේ නැහැ. මේ මිනීමැරුමට සම්පූර්ණ වග කියයුත්තා තමුන්නාන්සේයි. තමුන්නාන්සේ මේ මිනීමැරුම ගැන දැනගෙන හිටියා. මා ලවා තාත්තා මැරවීමට බලාපොරොත්තු වෙලා මේ සේරම දැනගෙන යන්න ගියා. මා වැයම් කරන්නේ තාත්තා මැරුවේ මා උවත්, මිනීමැරුමට සම්පූර්ණ වැරදිකාරයා තමුන්නාන්සේ බව ඔප්පු කරන්නයි."

"කොහොම ද මා මිනීමරුවෙක් වෙන්නෙ? අනේ දෙයියනේ"යි කියා ඉවාන් කෑගෑවේ තමා ගැන පසු ව කතා කිරීමට ඇති කරගත් තීරණය අමතක කරමිනි "උඹ ආයේත් කියන්නේ මා චමස්නියාවට ගිය ගමන ගැනයි. මා චමස්නියාවට ගිය ගමන තාත්තා මැරීමට මා දුන් කැමැත්ත හැටියට උඹ පිළිගන්නා නම් ඇයි උඹ ආයේත් මගේ කැමැත්ත ඇහැව්වේ?"

"කිසියම් හේතුවක් නිසා පොලීසිය තමුන්නාන්සේ ගේ සහෝදරයා වෙනුවට මා ගැන අවිශ්වාස කරන්න පුළුවනි. නැති නම් මිනීමැරුමට අනුබල දුන්නා ය කියා සැක කරන්න පුළුවනි. නමුත් තාත්තා මැරීමට තමුන්නාන්සේ ගේ කැමැත්ත දැන සිටියා නම් තමුන්නාන්සේ ආපසු ඇවිදින් නැති වූ තුන්දහ ගැන කලබලයක් කරන්නේ නැහැ. ඒ වෙනුවට තමුන්නාන්සේ මා ආරක්ෂා කරාවි. තමුන්නාන්සේට බූදලය ලැබුණු පසු මා මැරෙන තෙක් මට උපකාර කරාවි. තමුන්නාන්සේට බූදලය ලැබුණේ මා නිසයි. තාත්තා ගෘසෙන්කා බැන්ද නම් තමුන්නාන්සේට තඹයක්වත් ලැබෙන්නේ නැහැ."

"එහෙනම් උඹ බලාපොරොත්තු වුණේ මගේ මුදල් වංචා කරගන්න ද? බැරිවෙලාවත් මම නො ගිහින් උඹ ගැන පොලීසියට කියලා දුන්නා නම් මොකද වෙන්නේ?"

"මට විරුද්ධ ව පොලීසියට මොනවා කියන්න ද? තමුන්නාන්සේ චමස්නියාවට යන්න පෙළඹෙව්ව බව කියන්න ද?

ඒක කිසි ම අර්ථයක් නැති කතාවක්. හැරත් අපේ කතාවෙන් පස්සේ තමුන්නාන්සේට යන්නත් තිබුණා. නො යන්නත් තිබුණා. නො ගිහින් හිටියා නම් කිසි ම දෙයක් වෙන්නේ නැහැ. තාත්තා මැරීමට තමුන්නාන්සේ ගේ කැමැත්තක් නැති බව දුටුවාම මම නිකම් ඉන්නවා. නමුත් චමස්නියාවට යාමෙන් මා අදහස් කළා තමුන්නාන්සේ මට විරුද්ධ ව සාක්ෂි නොදෙන බවත්, රූබල් තුන් දහ ගන්නවාට තමුන්නාන්සේ ගේ අකැමැත්තක් නැති බවත්. නමුත් මට විරුද්ධ ව පොලීසියට පැමිණිලි කළොත් මම උසාවියේදී සම්පූර්ණ ඇත්ත කියනවා. කියන්නේ තාත්තා මරා මුදල් ගත්ත එක ගැන නො වෙයි. මගේ කිසි ම කැමැත්තක් නැති ව තමුන්නාන්සේ තාත්තා මැරීමට මා පෙළඹ වූ සැටි කියනවා. අන්න ඒ කාරණාව නිසයි මට තමුන්නාන්සේ ගේ කැමැත්ත අකැමැත්ත උවමනා කළේ. නැතිනම් අන්තිමේ දී තමුන්නාන්සේ මා පොලීසියට අල්ලා දේවි. දැන් කොහොම ද තමුන්නාන්සේ මා පොලීසියට අල්ලා දෙන්නේ? මොන සාක්ෂියක් උඩ ද? තමුන්නාන්සේ තාත්තා මැරීමට දක්වූ කැමැත්ත හෙළිකොට මට පුළුවනි තමුන්නාන්සේ පොලීසියට අල්ලා දෙන්න. මගේ කතාව මහජනයා විශ්වාස කරාවි. ඉන් තමුන්නාන්සේට වන නින්දාව මුළු ජීවිතයට ම නැතිවෙන්නේ නැහැ.''

“එහෙනම් මම බොහො ම ආශාවෙන් බලා හිටියේ තාත්තා මරන තෙක් ද?”යි ඉවාන් කෝපයෙන් ඇසුවේ ය.

‘‘ඔව්, ඒක සහතික ඇත්ත! එදා තමුන්නාන්සේ නිශ්ශබ්දව තාත්තා මැරීමට මට කැමැත්ත දුන්නා''යි පැවල් ඉවාන් දෙස එඩිතර බැල්මෙන් බලා ඉතා සෙමෙන් කී ය.

ඉතා දුබල තත්ත්වයක සිටි පැවල් විඩාවැටුණකු මෙන් කතා කෙළේ ය. නමුත් ඇතුලත වූ කිසියම් දෙයකින් ඔහු කිසියම් වැඩ පිළිවෙළක් සකස් කොට ඇතැයි ඉවාන් සැක කෙළේ ය.

‘‘දැන් ඉතින් එදා රෑ වෙච්ච දෙය කියාපන්''යයි ඉවාන් කී ය.

‘‘මොනව කියන්න ද? ඉතින් මම නිදාගෙන තාත්තා කෑගානා තෙක් බලා ගෙන හිටියා. නමුත් ඊට ඉස්සෙල්ලා ගිරිගෝරිජ් හදිසියෙන් ම නැගිටලා එළියට ගියා. ටික වේලාවකට පස්සේ මිනිහා කෑගෑවා. ඊට පස්සේ ආයේත් යේරම නිශ්ශබ්ද වුණා. මම කිසි ම දෙයක් නො කර බලා හිටියා. මගේ පපුව ගැහෙන්න

පටන් ගත්තා. අන්තිමේ දී ඉවසා ගන්න බැරි තැන මම නැගිටලා නිදන කාමරයේ ජනේලය ළඟට ගිහින් තවමත් තාත්තා ජීවත්ව ඉන්නවා ද කියා අහගෙන හිටියා. තාත්තා කාමරය ඇතුළේ ඒ මේ අතට ඇවිදිමින් කොඳුරනවා මට ඇහුණා. ඉතින් මම දැනගත්තා තාත්තා තවමත් ජීවත්ව ඉන්න බව. මම ටිකක් කල්පනා කරලා ජනේලය ළඟට ගිහින් මගේ නම කියා කතා කළා. 'මිනිහා ඇවිදින් පැනල ගියා' කියා තාත්තා මට කිව්වා. තාත්තා කිව්වේ තමුන්නාන්සේ ගේ සහෝදරයා ඇවිදින් පැනල ගිය බවයි. 'මිනිහ ගිරිගෝරිස් මැරුවා' කියා තාත්තා මට ආයේත් කිව්වා 'කොහෙ ද?' කියා මම සෙමෙන් ඇසුවා. 'වත්ත කෙළවර' කියා තාත්තා අත දික්කරලා පෙන්නා කිව්වා. 'ටිකක් ඉන්න මං බලා ගෙන එන්නම්' කියා මම වත්තට ගියා. තාප්පය ළඟ බිම වැටී ලේ ගලමින් සිහි නැති ව හිටිය ගිරිගෝරිස් ගේ ඇගේ හැපී මම බිම වැටුණා. මිනියා ඇවිත් තියෙන බව ඇත්තයි. මම කල්පනා කරන්න පටන් ගත්තා. පමා නො වී තාත්තා මරා දැමීමට මා අදහස් කළේ ඒ මොහොතේ දී යි. සිහි නැතිව බිම වැටී සිටින ගිරිගෝරිස්ට පණ තිබුණත් මම තාත්තා මරන හැටි පෙනෙන්නේ නැහැ. හයකට තිබුණේ මාපා හදිසියෙන් නැගිට ආවොත් පමණයි. ඒ මොහොතේ දි මට ඒ ගැන කල්පනා වුණා. තාත්තා මරා දැමීමට මගේ හිතේ කො තරම් ලොකු ආශාවක් තිබුණා ද කියතොත් මට හුස්ම ගන්නවත් බැරි වුණා. මම ජනේලය ළඟට දිව ගිහින් 'ගෘසෙන්කා ඇවිදින් ඉන්නවා. ඈට ගේ ඇතුළට එන්න ඕනෑ ය කියනවා'යයි කිව්වා. තාත්තා දරුවකු වගේ තිගැස්සුණා. 'කෝ ගෘසෙන්කා කෝ?!' කියා මගෙන් ඇසුවා. ඒ වුණත් මගේ කතාව විශ්වාස කළේ නැහැ. 'අන්න ඉන්නවා ඉක්මනට දොර අරින්න'යි මම කිව්වා. තාත්තා ජනේලය තුළින් මා දිහා බැලුවා. මා කියන දෙය විශ්වාස කළයුතු ද? නැද්ද? කියා තාත්තා දැනගෙන හිටියේ නැහැ. දොර අරින්න හය වුණා. 'හා එහෙනම් මෙයා මට හයයි' කියා මට කල්පනා වුණා. තමුන්නාන්සේ දන්නව ද ඒ වෙලාවේ පුදුම දෙයක් වුණා. තාත්තා බලා සිටිය දී ගෘසෙන්කා පැමිණි බව දන්වන සංඥාව අනුව මම දොරට තට්ටු කළා. මගේ කතාව විශ්වාස නො කළත් දොරට තට්ටු කළ වහා ම තාත්තා දොර ළඟට ගිහින් දොර ඇරියාම මම කාමරයට ඇතුළු වුණා. නමුත් තාත්තා මට කාමරයට ඇතුළු වෙන්න ඉඩ නො දී, මග හරස් කරගෙන 'කෝ ගෘසෙන්කා?' කියා මා දිහා බලා ඇසුවා. තාත්තා ගේ සර්වාංගය ම වෙවුලුවා. තාත්තා මට මෙ තරම් හය වීම එ තරම් හොඳ නැහැ කියා මට කල්පනා වුණා. තාත්තා

මට කාමරයට ඇතුළු වෙන්න ඉඩ නො දෙන්න පුළුවනි. නැති නම් කෑගාන්න පුළුවනි. ඒ අතර මාපා පැමිණෙන්න පුළුවනි. නැති නම් වෙන මොනවා හරි සිදුවෙන්න පුළුවනි. යන බියෙන් මගේ දෙපා පණ නැති වුණා. මට හරියට මතක නැහැ. නමුත් මම සුදුමැලි වී තාත්තා දිහැ බලා ඉන්න ඇති. 'අර ඉන්නේ ගෘසෙන්කා. ජනේලය ළඟ ඉන්නවා පෙනෙන්නේ නැද්ද?'යි මම රහසක් කියනවා වගේ කිව්වා. 'එහෙනම් ගෘසෙන්කාට කතා කරපන්.' 'ඈ එන්න හයයි. ඈ කෑගෑවට හය වෙලා පඳුර අස්සේ හැංගිලා ඉන්නවා. ජනේලය ළඟට ගිහින් කතා කරන්න.' තාත්තා ජනේලය ළඟට දිව ගිහින් ඉටිපන්දම අල්ලා 'ගෘසෙන්කා, ගෘසෙන්කා, උඹ ඔතැන ඉන්නවද?' කියා ඇසුවා. ගෘසෙන්කාට කතා කළාට මොකද ජනේලයෙන් එළියට ඔළුව දැම්මේ නැහැ. කො තරම් හයෙන් සිටියා ද කියතොත් මා ළඟින් ඈත් වුණේ නැහැ. මට පිටිපස්ස හැරෙව්වේ නැහැ. මම ජනේලය ළඟට ගිහින් එළියට ඔළුව දමා බලා 'ඇයි මේ ඉන්නේ ගෘසෙන්කා, පඳුර යට හැංගිලා. තමුන්නාන්සේට හිනා වෙනවා. ඇයි පෙනෙන්නේ නැද්ද?'යි කිව්වා. තාත්තා මා කී දෙය විශ්වාස කළා. ගෘසෙන්කාට ඇති ආදරයෙන් වෙව්ලන්න පටන් ගත්තා. තාත්තා ජනේලයෙන් එළියට එබී බැලුවා. එතකොට ම මම මේසය උඩ, කොළ උඩ තබා තිබුණ යකඩ කෑල්ල අතට ගත්තා. තමුන්නාන්සේට මතක ඇති ඒ යකඩ කෑල්ල, රාත්තල් තුනක් විතර බරයි. මම යකඩ කෑල්ලෙන් තාත්තාගේ හිස මුදුනට ගැහැව්වා. තාත්තා කිසි ම කෑගෑමක් නැති ව ගහක් වගේ හදිසියෙන් ම බිම ඇද වැටුණා. බිම වැටුණාට පස්සේ මම යකඩයෙන් තවත් දෙපාරක් ඔළුවට ගැහැව්වා. තුන් වන පාර වදින කොට මම දැනගත්තා ඔළුව පැළුණු බව. එතකොට හදිසියෙන් ම තාත්තා මුණින් අතට පෙරළුණා. සර්වාංගය ම ලෙයින් වැසී තිබුණා. මම මගේ ඇඳුම් සෝදිසි කොට බැලුවා. ලේ බිත්දුවක් වත් තිබුණේ නැහැ. ලේ විසි වුණේ නැහැ. ඉතින් මම යකඩ කෑල්ලේ තිබුණු ලේ පිස දමා මේසය උඩ තබා, සුරුවම ළඟට ගිහින් ලියුම් කවරය අරගෙන, ඉරා, කවරයයි පීත්ත පටියයි බිම දමා, මුදල් අරන් ගියා. මගේ සර්වාංගය ම වෙව්ලන්න පටන් ගත්තා. මම කෙළින් ම ඇපල් ගහ ළඟට ගියා. තමුන්නාන්සේ දන්නවා ඇති, ඇපල් ගහේ කඳේ තියෙන බෙනය. ඒ බෙනය සොයා ගැනීමට පහසුවන ලෙස මම කලින් ම එහි කොළයක් ඔබා තැබුවා. මම රූබල් තුන්දහ හොඳට පාන්කඩයක ඔතා බෙනය තුළට ඔබා සඟවා තැබුවා. මේ විදියට රූබල් තුන් දහ සති දෙකකට වැඩි කාලයක් ගසේ

බෙහෙත් සඟවා තිබුණා. මම මුදල් එළියට ගත්තේ ඉස්පිරිතාලේ ඉඳලා ආවාට පසුවයි. ඉතින් මුදල් සඟවා තැබුවාට පස්සේ මම ආපසු ගිහින් නිදා ගෙන කල්පනා කළා. යම් විදියකින් ගිරිගෝරිස් මලොත් මගේ තත්ත්වය එ තරම් හොඳ වෙන්නේ නැහැ. ගිරිගෝරිස් නො මැරී ජීවත් වුණොත් මට වාසියි. එතකොට මිනියා මහ ගෙදරට පැන තාත්තා මරා මුදල් සොරකම් කළ බව ගිරිගෝරිස් කියාවි. ඉතින් පුළුවන් තරම් ඉක්මනින් මාපා අවදි කරවීම පිණිස හයියෙන් කෙඳිරි ගාන්න පටන් ගත්තා. අන්තිමේ දී ඈ නැඟිට කෙළින් ම මා ළඟට ආවා. නමුත් ගිරිගෝරිස් නැති බව දුටු හැටියේ ම ඈ කෙළින් ම එළියට ගියා. එතකොට ම මට ඇහුණා ඈ කෑ ගානවා. ඊට පස්සේ මම සන්තෝෂයෙන් නිදාගත්තා.''

පැවල් කතාව නතර කෙළේ ය. ඉවාන් නො සෙල්වී, පැවල් දෙසින් නෙත් ඉවත නො ගෙන නිහඬ ව අසා හුන්නේ ය. ඉවත බලාගෙන කතා කළ පැවල් ඉවාන් දෙස බැලුවේ ඉඳ හිට පමණි. කතාව අවසන් කරන විට නොසන්සුන් තත්ත්වයක සිටි පැවල් තදින් හුස්ම ගත්තේ ය. ඔහු ගේ මූහුණ ඩාදියෙන් තෙත් විය. මිනී මැරුම ගැන ඔහු පසුතැවුණේ ද නැද්දැයි කීම අපහසු ය.

''විකක් හිටපන්'' යයි ඉවාන් මඳක් කල්පනා කොට පැවල් ගේ කතාවට බාධා කරමින් කී ය. ''එතකොට දොර ගැන කොහොම ද? තාත්තා උඹට ඇතුළු වීමට පමණක් දොර ඇරියා නම් කලින් දොර ඇර තිබුණ බව ගිරිගෝරිස් දුටුවේ කොහොම ද? දොර ඇර තිබුණ බව උඹට ඉස්සෙල්ලා ගිරිගෝරිස් දුටුවා නේද?''

ඉවාන් කිසි ම කලබලයක් නො දක්වා අමුතු ම ස්වරයකින් මේ ප්‍රශ්නය ඇසීම අපූරු දෙයක් ලෙස සැලකිය හැකි ය. ඇත්ත වශයෙන් ඔහු ගේ කට හඬේ කෝපයක ඡායාවක්වත් දකින්නට නො තිබිණි. යම් විදියකින් යම් කිසිවෙක් එම මොහොතේ දී දොර ඇර ගෙන කාමරයට එබී බැලුවේ නම් ඔවුන් දෙදෙනා ඉතා වැදගත් දෙයක් ගැන සමඟියෙන් සාකච්ඡා කරතියි සිතන්නට පිළිවන.

''දොර ඇරල තිබීමත්, දොර ගැන ගිරිගෝරිස් කළ ප්‍රකාශයත් නිකම් හිතලා කියාපු කතාවක්'' යයි පැවල් කීවේ දමාරුවෙන් සිනාසෙමිනි. ''නමුත් තාත්තේට ඇත්ත කියන්න ද? ගිරිගෝරිස් මිනිහෙක් නො වෙයි, හිතුවක්කාර කොටළුවෙක්.

මිනිහ දොර ඇරල තියෙනවා දැක්කෙ නැහැ. දැක්කය කියා හිතම් හිතනවා. නමුත් ග්‍රිගෝරිස් ගේ සාක්ෂිය කවදාවත් බොරු කරන්න බැහැ. ඒක අප දෙන්නා ගේ වාසනාව. ග්‍රිගෝරිස් ඒ කතාව ගොතා කියන්නේ අපේ වාසනාවටයි. තමුන්නාන්සේ ගේ සහෝදරයා වැරදිකාරයා කිරීමට ඒ සාක්ෂිය ප්‍රමාණවත්.''

''මා කියන දෙය අහගනින්''යයි ඉවාන් කීවේ කතාව අවුල් වන නිසා යම් කිසිවක් දැනගැනීමට වෑයම් කරන්නකු මෙනි. ''උඹෙන් ඇසිය යුතු ප්‍රශ්න බොහෝ ම තිබුණා. නමුත් දැන් මට ඒවා මතක නැහැ .... ඒ ප්‍රශ්න අමතක වෙනවා පමණක් නො ව, මගේ සිහියත් අවුල් වෙනවා. අඩු ගණනේ මේ ප්‍රශ්නයටවත් පිළිතුරු දීපන්. ඇයි උඹ මුදල් අරගෙන කවරය බිම දැම්මේ? උඹ මුදල් හා කවරය ගැන කතා කරන කොට මට කල්පනා වුණා උඹ එහෙම කතා කළේ ඒක සුදුසු දෙයක් නිසා ය කියා ....ඒක සුදුසු දෙයක් වුණේ කොහොම ද කියා මට තේරුම් ගන්න බැහැ.''

''මම එහෙම කළේ හොඳ හේතුවක් ඇතිවයි. යම් කිසි කෙනෙක් මා වගේ හැම දෙයක් ම දැනගෙන හිටියා නම්, මුදල් කවරයක දමා, නම ලියා මුද්‍රා කොට තබනවා සියැසින් ම දුටුවා නම්, ඒ නැනැත්තා තාත්තා මැරුවා නම්, ඒ මොහොතේ දී මහත් කලබලයෙන් ලියුම් කවරය කඩා බලන්නේ මොනවට ද? කවරය ඇතුළේ මුදල් තිබෙන බව දැන සිටියා නම් කවරය කඩා බලන්න උවමනාවක් නැහැ. මිනීමරුවා මා වාගේ කෙනෙක් නම් කවරය නො කඩා සාක්කුවේ දමාගෙන පැනල යනවා. නමුත් මීතියා වගේ කෙනෙක් නම් එහෙම කරන්නේ නැහැ. මිතියා ලියුම් කවරය හා මුදල් ගැන දැනගෙන හිටියේ ආරංචි මාත්‍රයෙන් පමණයි. කවදාවත් ඇහින් දුටුවේ නැහැ. ඉතින් කොට්ටය යට තිබී කවරය ගත්ත වහා ම ඉරා මුදල් තිබෙනව ද කියා බලනවා. නමුත් මිනීමරුවා තියම මහත්මයෙක් නම්, මීට කලින් කවදාවත් හොරකම් කරලා නැතිනම්, හොරකම ගැන පළපුරුද්දක් නැතිනම්, කවරය බිම දමා යාමෙන් එය සාක්ෂියක් හැටියට ඉදිරිපත් කළ හැකි බව කල්පනා කරීමට වේලාවක් නැති නිසා බිම දමා යනවා. යම් විදියකින් ඒ නැනැත්තා හොරකමක් කිරීමට අදහස් කළා නම්, ඔහු එසේ කරන්නේ තමා හොරකමක් කරනවා නො ව, තමා සතු දෙයක් ආපසු ගන්නවා ය යන අදහසින්. තාත්තා ළඟට ගොස්, තමා ගේ මුදල් ගන්නා බව නගරයේ හැම

දෙනාට ම කියා මීතියා බොහෝ ම ඉහළින් කතා කළා. මම මේ ගැන පොලීසියට කිව්වා. නමුත් මෙ තරම් විස්තර ඇති ව කිව්වේ නැහැ. මේක මගේ අදහසක් නො ව මීතියා ගේ අදහස් හැටියට පිළිගන්නා ලෙස, වැඩි වැදගත් දෙයක් නොවන බව හඟවමින් කිව්වා. ඉතින් තමුන්නාන්සේ දන්නව ද වෙච්ච දෙය? මගේ ඒ කතාව අසා දණ්ඩනායකයා ගේ කට්ට කෙල ඉනුවා''

"උඹ කාමරයේ නිදාගෙන ඉන්න අතර මේ සේරම ගැන කල්පනා කළා ද?''යි ඉවාන් පුදුමයෙන් විමසුවේ ය. ඔහු යළි පැවල් දෙස පුදුමයෙන් බැලුවේ ය.

"ඒ වගේ වේලාවක කොහොම ද මේ දේවල් ගැන කල්පනා කරන්නේ? මම මේ දේවල් ගැන කලින් කල්පනා කරලා හැම දෙයක් ම සූදානම් කරගත්තා.''

"එහෙනම් උඹට යක්ෂයා අනුබල දෙන්න ඇති''යි ඉවාන් කී ය. "උඹ මෝඩයෙක් නො වෙයි. මා හිතුවාටත් වඩා උඹ දක්ෂයෙක්.''

ඉවාන් හුනස්නෙන් නැගිට්ටේ කාමරය තුළ මදක් සක්මන් කිරීමේ අදහසින් බව පැහැදිලි ය. ඔහු දැඩි දොම්නසකින් පෙළුණේ ය. එහෙත් මේසය හරස් කොට තිබුණු හෙයින් මේසයත් බිත්තියත් අතරින් ඉතා අමාරුවෙන් යා යුතු විය. ඔහු ආපසු පැමිණ යළි හිඳගත්තේ ය. ඔහු කෝප වූයේ හොඳ හැටි කකුල් දිගහැර හිඳගත නොහැකි වූ නිසා විය යුතු ය. මීට කලින් කතා කළාක් මෙන් යළි ඔහු කෝපයෙන් කෑගා කතා කරන්නට විය

"නීචයා! කාලකණ්ණියා! මම උඹ නො මරන්නේ හෙට උසාවියේ දී උඹ ලවා සාක්ෂි දීමට උවමනා නිසයි. දෙයියෝ දනියි. සමහර විට මගේ අතේ වරද තියෙන්නෙ පුළුවනි''යි ඉවාන් දැන උස්සා කී ය. "සමහර විට, තාත්තා මළා නම් හොඳ ය කියා මා හිත යටින් හිතන්න ඇති. නමුත් උඹ හිතන තරම් මා වැරදිකාරයෙක් නොවන බව මට දිව්රා කියන්න පුළුවනි. සමහර විට තාත්තා මරන්න ය කියා මම උඹට නො කියන්න ඇති නැහැ නැහැ, තාත්තා මරන්න ය කියා මම උඹ ව උසිගැන්නුවේ නැහැ. ඒකට කමක් නැහැ. හෙට උසාවියේ දී මම මට ම විරුද්ධ ව සාක්ෂි දෙනවා. හැම දෙයක් ම කියන්න මම තීරණය කරගෙන ඉවරයි. මම හෙට

උසාවියට යන්නේ තනියෙන් නො ව, උඹත් එක්කයි. උඹ මට විරුද්ධ ව සාක්ෂි දුන්නට මම භය නැහැ. උඹ මට විරුද්ධ ව කියන දෙය මම ස්ථිර කරන්නම්. නමුත් උඹත් උසාවියේ දී සම්පූර්ණ ඇත්ත කියන්න ඕනෑ. හෙට අපි දෙන්නම එකට උසාවියට යමු.''

ඉවාන් මෙසේ කීවේ දැඩි අධිෂ්ඨානයෙන් හා සත්පුත් සිතින් ද යුතු ව ය. ඔහු එසේ කරන බව ඔහු ගේ බැබැලෙන දෑසින් හෙළි විය.

''නමුත්නාත්සේට සනීප නැහැ. මට හොඳට ම පේනවා සනීප නැති බව. ඇස් කහ පාටයි.'' පැවල් ඉවාන් ගැන අනුකම්පා කරන්නාක් මෙන් කී ය. එහෙත් එහි ඇනුම් පදයක ලක්ෂණයක් නො වී ය.

''අප දෙන්නා ම යන්න ඕනෑ''යි ඉවාන් ආයේත් කීවේ ය. ''උඹ නො ගියත් කමක් නැහැ. මම තනියෙන් ගිහින් ඇත්ත කියනවා.''

පැවල් කල්පනා කරන බව හැඟෙව්වේ ය.

''මං යන්නේ නැහැ. නමුත්නාත්සේ යන්නෙත් නැහැ''යි ඔහු අන්තිමේ දී තීරණය කර ගනිමින් කී ය.

''උඹට මා කියන දෙය තේරුම් ගන්න බැහැ''යි ඉවාන් කීවේ අවලාද කරගන්නාක් මෙනි.

''ඇත්ත කියන්න ගියොත් නමුත්නාත්සේට මහ නින්දාවක් වෙනවා. අනෙක් අතින් ඇත්ත කීමෙන් කිසි ම ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. මා එ වැනි දෙයක් නමුත්නාත්සේට නොකී බවත්, නමුත් දැන් නමුත්නාත්සේ මෙ වැනි දෙයක් කියන්නේ එක්කෝ අසනීපයෙන් සිටින නිසා ය, නැතිනම් සහෝදරයාට ඇති අනුකම්පාව නිසා, ආත්ම පරිත්‍යාගයෙන් යුතු ව කටයුතු කරන අතර, මට විරුද්ධ ව බොරුවක් ගොතා කියන බවත් උසාවියට කියනවා. නමුත්නාත්සේ කවදාවත් මට මැස්සකුට කරන්වත් සැලැකුවේ නැහැ කියා මම කියනවා. ඉතින් කවුද නමුත්නාත්සේ ගේ කතාව විශ්වාස කරන්නේ? ඔය කතාව ඔප්පු කරන්න එක ම සාක්ෂියක්වත් තියෙනව ද?''

''උඹ දැන් මට මුදල් පෙන්නුවේ උඹේ කතාව ඔප්පු කරන්න නේ ද?''

පැවල් නෝට්ටු වසා තබා තිබුණු පොත ගෙන පැත්තකින් තැබුවේ ය. "මේ මුදල් අරන් යන්න"යි ඔහු සුසුමක් හෙළමින් කී ය.

"හොඳයි, මම මුදල් අරන් යන්නම්. නමුත් උඹ මේ මුදල් නිසා මිනියක් මැරුවා නම් ඇයි මට මුදල් දෙන්නේ?"යි ඉවාන් පුදුමයෙන් පැවල් දෙස බලා ඇසුවේ ය.

"මට උවමනා නැහැ"යි පැවල් අත වනා වෙවුලන කට හඬින් කීය. "මගේ අදහසක් තිබුණා මේ මුදල්වලින් මොස්කව් නුවරට, නැති නම් පිට රටකට ගිහින් අලුත් ජීවිතයක් ආරම්භ කරන්න. එහෙත් ඒක සිහිනයක් පමණයි. මා එ වැනි දෙයක් ගැන කල්පනා කලේ හැම දෙයක් ම නීතියට එකඟ නිසයි. හැම දෙයක් ම නීතියට එකඟ බව මට ඉගැන්නුවේ තමුන්-නාන්සේයි. මෙ වැනි දේවල් ගැන තමුන්නාන්සේ මට බොහො ම දේවල් කියා දුන්නා. සදාකාලික දෙවිකෙනෙක් නැති නම් සදාචාරය කියා දෙයකුත් නැහැ. එ වැනි දෙයක් අවශ්‍යත් නැහැ. ඔව්, තමුන්නාන්සේ ගේ කතාව ඇත්තයි. මාත් ඒ විදියටයි කල්පනා කරන්නේ."

"උඹ ඔය තීරණයට බැස ගත්තේ තනියෙන් ම කල්පනා කරල ද?" ඉවාන් සිනාවක් අරුණ කරගනිමින් විමසුවේ ය.

"තමුන්නාන්සේ ගේ මාර්ගෝපදේශකත්වය ඇතිවයි."

"දැන් උඹ ආපසු මුදල් දෙන්නේ දෙවිකෙනෙක් ගැන විශ්වාසයක් තිබෙන නිසා ද?"

"නැහැ, මම දෙවිකෙනෙක් ගැන විශ්වාස කරන්නේ නැහැ"යි පැවල් රහසක් කියන්නාක් මෙන් සෙමෙන් කී ය.

"එහෙනම් මොකද ආපසු මුදල් දෙන්නේ?"

"ඔය ගැන ඔයිට වඩා කතා කරන්න උවමනා නැහැ"යි පැවල් අත වනා ප්‍රශ්නය අමතක කරමින් කී ය. "තමුන්-නාන්සේ මට නිතර කිව්වා හැම දෙයක් ම නීතියට එකඟ ය, කොයි දෙයත් සාධාරණ ය කියා. එහෙනම් මොනවට ද දැන් තමුන්නාන්සේ ඔතරම් කලබල වෙන්නේ? තමුන්නාන්සේ උසාවියට ගොස් තමුන්නාන්සේට විරුද්ධ ව ම සාක්ෂි දීමටත් ඉදිරිපත් වුණා.........නමුත් ඒ සාක්ෂිවලින් කිසි ම ප්‍රයෝජනයක් නැහැ. තමුන්නාන්සේ කවදාවත් සාක්ෂි දෙන්නෙත් නැහැ"යි පැවල් යළි නො සෙල්විය හැකි තීරණයකට බැස ගනිමින් කී ය.

"උඹට බලනහැකි මා යනවද නැද්ද කියා."

"කවදාවත් යන්නේ නැහැ. තමුන්නාන්සේ බොහො ම දක්ෂයි, ඥානවන්තයි. මුදල්වලට බොහො ම ආසයි. ඒ බව මම හොඳට දන්නවා. තමුන්නාන්සේ බොහො ම උඩඟුයි. ඒ නිසා අනුන්ගෙන් ගරුසැලකිලි ලබන්නත් ආසයි. ලස්සන ගෑනුන්ටත් බොහො ම කැමැතියි. ඒ සේරට ම වැඩිය තමුන්නාන්සේ කැමැති කාගෙන්වත් යැපෙන්නේ නැති ව සන්සුන් සැපවත් ජීවිතයක් ගත කිරීමටයි. ඒ නිසා උසාවියට ගොස් මුළු ජීවිතයට ම නොමැකෙන අවනම්බුවක් කරගන්න කැමැති වන්නේ නැහැ. තමුන්නාන්සේ අනෙක් සහෝදරයන් දෙන්නාට වඩා තාත්තාට සමානයි. තමුන්නාන්සේට තියෙන්නේ තාත්තාට තිබුණ ආශාවට සමාන ආශාවක්."

"උඹ මෝඩයෙක් නො වෙයි" ඉවාන් කීවේ පුදුමයෙන් ගල්ගැසුණාක් මෙනි. ඔහු ගේ මුහුණ රතු විය. "මා මෙ තරම් කල් හිතා ගෙන හිටියේ උඹ මෝඩයකු කියායි. නමුත් උඹ මෝඩයෙක් නො වෙයි" ඉවාන් යළි හදිසියෙන් කීවේ අමුතු විදියකට පැවල් දෙස බලමිනි.

"තමුන්නාන්සේ ගේ අහංකාරකම නිසයි මා මෝඩයෙක් ය කියා කල්පනා කළේ. මේ මුදල් අරන් යන්න"

ඉවාන් නෝට්ටු මිටි තුන ගෙන කඩදාසියකවත් ඔතන්නේ නැති ව කෙළින් ම සාක්කුවේ දමා ගත්තේ ය.

"මම මේ මුදල් හෙට උසාවියට ඉදිරිපත් කරනවා"යි ඔහු කී ය.

"කිසි ම කෙනෙක් ඔය කතාව විශ්වාස කරන්නේ නැහැ. තමුන්නාන්සේ ළඟ බොහො ම මුදල් තියෙනවා. ඒ මුදල්වලින් රූබල් තුන් දහක් ගෙන උසාවියට ඉදිරිපත් කරන්න පුළුවනි."

ඉවාන් හිඳ සිටි පුටුවෙන් නැගී සිටියේ ය.

"මා දැන් උඹ නො මරන්නේ හෙට උඹ උවමනා කරන නිසයි. ඒ බව හොඳට මතක තියා ගනින්"

"උවමනා නම් මා මරන්න. ඒකට වරදක් නැහැ. දැන් ම මරන්න"යි පැවල් කීවේ අපූරු බැල්මකින් ඉවාන් දෙස බලමිනි. ඔහු ගේ කටහඬේ ද අමුතු ගතියක් දකින්නට තිබිණි. "නමුත්

ඒ එකක්වත් තමුන්නාන්සේට කරන්න ශක්තියක් නැහැ. මීට කලින් තමුන්නාන්සේ බොහො ම තිර්භීතයි. තමුත් දැන් කිසි ම දෙයක් කරන්න බයයි''යි අනතුරු ව පැවල් අවඥාවෙන් සිනාසී කී ය.

''හෙට වෙන තෙක් හිටපන්''යයි කියමින් ඉවාන් දොර ළඟට ගියේ ය.

''විකකට නවතින්න. මට තව වරක් ඔය මුදල් පෙන්නන්න.''

ඉවාන් සාක්කුවෙන් මුදල් ගෙන පෙන්නුවේ ය. පැවල් විනාඩි දහයක් පමණ වේලා මුදල් දෙස බලා සිට ''හොඳයි දැන් යන්න''යි අත වනා කී ය.

ඉවාන් නික්ම ගියේ ය

''කරමසෝව් මහත්මයා'' කියා පැවල් හදිසියෙන් ම කතා කෙළේ ය.

''මොකද උඹ කතා කළේ?''යි ඉවාන් දොර ළඟ නතර වී ආපසු හැරී බලා ඇසුවේ ය.

''ආයුබෝවන්.''

''හෙට වෙන තෙක් හිටපන්'' කියා ඉවාන් ගෙන් පිට වී ගියේ ය.

තවමත් හිම කුනාටුව නො නවත්වා හමයි. ටික දුරක් එඩිතර ව ගිය ඉවාන් හදිසියෙන් ම වැනෙන්නට විය. ''සමහරවිට ශරීරයේ දුර්වල කමටත් මෙහෙම වෙනවා''යි ඔහු සිනා සෙමින් කී ය. සතුටකට සමාන හැඟීමක් ඔහු තුළ ඇතිවෙන්නට විය. ඔහු තුළ සීමාවක් නැති ධෛර්යයක් ඇති විය. පසු ගිය සති කීපය තුළ ඔහුට බොහෝ වදහිංසා ගෙන දුන් සිතේ පැවැති චංචලත්වය අවසන් කළ හැකි ය. දැන් ඔහු තීරණයකට බැස ගෙන අවසාන ය. ''දැන් ඒ තීරණය වෙනස් වන්නේ නැහැ''යි ඔහු ප්‍රීතියෙන් තමාට ම කියා ගත්තේ ය. ඒ මොහොතේ දී ඔහු යම් කිසිවක හැපී වැටෙන්නට ගියේ ය. නතර වී පිරික්සා බැලූ ඔහුට, එන ගමනේ දී තමා ගේ ඇගේ හැපී බිම වැටුණු කුඩා ගැමියා තවමත් වැටුණු තැන සිහි නැති ව සිටින බව දකින්නට ලැබිණි. හිමෙන් ඔහු ගේ මුහුණ වැසිණි. ඉවාන් හදිසියෙන් ම ගැමියා උස්සා ගත්තේ ය. පාරේ දකුණු පැත්තේ

කුඩා ගෙයක දැල්වෙන පහන් එළියක් දුටු ඉවාන්, එහි ගොස් දොරට තට්ටු කොට, දොර ළඟට පැමිණි ගෙහිමියාට කතා කොට, රූබල් තුනක් දෙන බවට පොරොන්දු වී, ගැමියා පොලීසියට ගෙනයාමට උපකාර වන ලෙස කී ය. මිනිහා ගමනට සූදානම් වී එළියට පැමිණියේ ය. ඉවාන් ගැමියා පොලීසියට ගෙන ගිය සැටිත්, අතමිට දිගහැර වියදම් කොට එ වේලේ ම දොස්තර කෙනකු කැඳ වූ සැටිත්, මම මෙහි ලා විස්තර නො කරමි. මෙම කටයුත්තට පුරා පැයක් ගත වූ බවත්, ඉවාන් ඒ ගැන සතුටු වූ බවත්, කොටින් කියමි. ඔහු ගේ සිතිවිලි ඉබාගාතේ යන අතරේ ඔහු නො නවත්වා වැඩ කෙළේ ය.

"හෙට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය ගැන මා ස්ථිර නිගමනයකට බැස ගෙන නොසිටියා නම්, මේ මිනිහා සීතලේ ගල් වී මළත් නො මළත් ඒ ගැන කිසි ම සැලකිල්ලක් නො දක්වා යනවා මිස, මෙ තැන පැයක් පමා වෙන්නේ නැහැ"යි ඉවාන් ප්‍රීතියෙන් කල්පනා කෙළේ ය. "ඒ ගොල්ලෝ මගේ ඔළුව නරක් වන බව කියතත් මට තව ම පුළුවනි හොඳට සිතිවිලි එක්තැන් කොට කල්පනා කරන්න"යි ඔහු ඒ මොහොතේ දී පෙරට වඩා අධික ප්‍රීතියෙන් කල්පනා කෙළේ ය.

ගෙදර පැමිණි ඉවාන් එක් වර ම නතර වී, දණ්ඩනායකයා වෙත ගොස් මේ ප්‍රවෘත්තිය සම්පූර්ණයෙන් ම කිය යුතු දැයි කල්පනා කෙළේ ය. එහෙත් ඔහු යළි ගෙය දෙසට හැරෙමින්, "හෙට සේරම කියනවා"යි තීරණය කර ගනිමින්, තමාට ම සෙමෙන් කියා ගත්තේ ය. නමුත් පුදුමය නම් මෙතෙක් වේලා ඔහු ගේ සිතේ පැවැති ආත්ම තෘප්තියත්, ප්‍රීතියත් ඒ මොහොතේ දී අතුරුදහන් වීම ය.

කාමරයට ඇතුළුවන ඉවාන්ට තමා ගේ හදවත සීතල අතකින් අල්ලන්නාක් මෙන් දැනිණි. එය, අනුස්මරණයකි. වඩාත් හොඳට කියන්නේ නම් තමා ගේ කාමරයේ, එම මොහොතේ දීත්, මීට පෙරත්, සිතේ දරුණු වේදනාවක් ඇති කරන දෙයක් තිබෙන්නේ යැයි ඔහුට මතක් විය. විඩා වැටී සිටි ඉවාන් සෝපාව මත දිගඇදුණේ ය. මහලු ඉතිරිය ගෙනා තේ බොයිලේරුවෙන් ඔහු තේ කෝප්පයක් පිළියෙළ කළ මුත් ඊට අතවත් නො තැබුවේ ය. උදේට පැමිණෙන ලෙස දන්වා මැහැල්ල ආපසු යැවූ ඉවාන්ට කලාන්ත ගතියක් දැනුණෙන් ඔහු සෝපාව මත හිඳගත්තේ ය. රෝගයෙන් පෙළෙන තමා ඉතා

අසරණ තත්ත්වයක සිටින බව ඔහුට දැනිණි. ඔහුට නිදිමත ගතියක් දැනුණෙත් වහා නැගිට නිදිමත මග හැරීම පිණිස කාමරය තුළ සක්මන් කරන්නට විය. ඇතැම් විට තමා දරුණු රෝගයකින් පෙළෙන්නේ යයි ඔහු කල්පනා කෙළේ ය. එහෙත් ඔහු වැඩි වශයෙන් කල්පනා කළේ රෝගය ගැන නො වේ. යළි හිඳගත් ඉවාන් යම් කිසිවක් සොයන්නාක් මෙන් අවට බලන්නට විය. මෙසේ ඔහු කීප වරක් ම අවට බැලුවේ ය. අන්තිමේ දී ඔහු ගේ දෑස එක් දෙයක් කෙරෙහි එල්ල විය. ඔහු ගේ මුහුණ සිනාවකින් ආලෝක විය. යළි කෝපයෙන් රතු විය. ඔහු හිස දෑත මත රඳවා ගෙන බොහෝ වේලාවක් හිඳ සිටියේ ය. ඒ සමග ඔහු, බිත්තිය අසිනේ තබා ඇති සෝපාව දෙස නෙත් කොනින් බලා සිටියේ ය. ඔහු ගේ සිත නොසන්සුන් කරන, කෝප කරන සිතට වද දෙන, කිසියම් දෙයක් සෝපාව මත තිබෙන බව නිසැක ව ම කිව හැකි ය.

නව වන පරිච්ඡේදය

යක්ෂයා හෙවත් ඉවාන් දුටු භයානක සිහිනය

මම දෙස්තර කෙනෙක් නො වෙමි. එහෙත් ඉවාන්ට වැලැඳී ඇති රෝගය ගැන පාඨකයාට කිසියම් විස්තරයක් කළ යුතු වේලාව පැමිණ ඇතැයි සිතමි. සිදුවීම් වැලක් බලාපොරොත්තු ව සිටින හෙයින් මට එක් දෙයක් පමණක් කිව හැකි ය. ඉවාන් එම මොහොතේ දී මොළයේ උණ වැලඳීමට ඉතා ආසන්න ව සිටියේ ය. ඔහු කාලයක සිට අසනීපයෙන් පසුවුවත් මොළයේ උණ වැලඳීම මැඩ ගෙන සිටියේ ය. එහෙත් එ දින සවස ඉවාන් එම රෝගයට සම්පූර්ණයෙන් ම ගොදුරු විය. වෛදකම ගැන මා තුළ කිසි ම දැනුමක් නැත. 'එහෙත් අවසානයේ දී කිසි ම සැකයක් නැති ව, මොළයේ උණ වැලඳීම සම්පූර්ණයෙන් ම මැඩ ගැනීමේ දැඩි අධිෂ්ඨානයෙන් ඉවාන් වික කලකට රෝගයෙන් ඈත් වී සිටීමට වෑයම් කෙළේ ය' යන අදහස ඉදිරිපත් කිරීමට මම අදහස් කරමි. තමා රෝගාතුර ව සිටින බව ඉවාන් දැන සිටියේ ය. එහෙත් අධිකරණය ඉදිරියට ගොස් තමා නිවැරදි

කාරයකු බව තමාටම නිර්ණිතව හා එඩිතරව ද ඔප්පු කිරීමට අවශ්‍ය හැම ඥාන ශක්තියක් ම තිබිය යුතු මේ තීරණාත්මක මොහොතේ දී අසනීප වීම ඔහු හෙළා දුටුවේ ය.

කෙසේ වෙතත් තමා විසින් කලින් සඳහන් කළ පරිදි කිසියම් අද්භූත අදහසක් නිසා, කැතිරිනා විසින් මොස්කව් නුවර සිට කැඳවන ලද අලුත් දොස්තර හමුවීමට ඉවාන් ගියේ ය. ඔහු කී දෙය අසා අනතුරුව පිරික්සා බැලූ දොස්තර, ඉවාන් කිසියම් මොළයේ රෝගයකින් පෙළෙන බව තීරණය කෙළේ ය. ඉවාන් නොකැමැත්තෙන් කී දෙය අසා දොස්තර පුදුම නොවී ය. "මහත්මයා ගේ මානසික තත්ත්වයේ හැටියට මහත්මයාට අද්භූත දේවල් පෙනෙන්න පුළුවනි. ඒ පෙනෙන දේවල් ගැන සෝදිසි කොට බලන එක හොඳයි.......... කොහොම වුණත් මහත්මයා වහා ම ප්‍රතිකාර ගත යුතුයි. නැති නම් රෝගය බරපතල වෙන්න පුළුවනි"යි දොස්තර කී ය. දොස්තර ගේ නැණවත් අවවාදය නො පිළිගත් ඉවාන් ඇඳට වී බෙහෙත් බීම ප්‍රතික්ෂේප කෙළේ ය. "මට තවමත් දෙපයින් ඉන්න පුළුවනි. බැරිවෙලාවත් මා වැටුණොත් තත්ත්වය වෙනස් වෙන්න පුළුවනි. එතකොට කැමැති අයකුට පුළුවනි මට බෙහෙත් කරන්න." මෙසේ තීරණයට බැසගත් ඉවාන් රෝගය පිළිබඳ අදහස සිතින් බැහැර කෙළේ ය.

ඉනික්, සෝපාව උඩ හිඳගත් ඉවාන්, තමා මානසික රෝගයකින් පෙළෙන බව මැනැවින් දැනදැනත්, මා කලින් සඳහන් කළ පරිදි, ඉදිරිපිට බිත්තිය අයිනේ තබා ඇති සෝපාව උඩ හිඳ සිටින අයකු දෙස සැලකිල්ලෙන් බලා සිටියේ ය. යම්කිසිවකු සෝපාව උඩ හිඳ සිටින බව පෙනේ. ඉවාන් කාමරයට ඇතුළු වන විට කිසිවෙක් සෝපාව උඩ නොවූයේ ය. එසේ නම් ඔහු කාමරයට ඇතුළු වූයේ කෙසේ දැයි කිසිවෙක් නො දනිත්. සෝපාව උඩ හිඳ සිටියේ මහත්මයෙකි. වඩාත් නිවැරදිව කියන්නේ නම්, හෙතෙම තරුණ විය ඉක්ම වූ, එක්තරා පන්තියකට අයත් මහත්මයෙකි. ඔහු ගේ මඳක් දිග කළු ගොරෝසු හිසකෙස් තැනින් තැන සුදු විය. ඔහුට මඳක් උල්වූ කුඩා රැවුලක් තිබිණි. නිසැකව ම දක්ෂ මහත්තකු විසින් නිම කරන ලද දුඹුරු පැහැති කබායකට සමාන දෙයක් ඔහු ඇඳ සිටියේ ය. හවුරුදු තුනකට පෙර මසන ලද එම කබාය පරණ වී නූල් පෑදී තිබිණි. නගරයේ ධනවතුන් විසින් හවුරුදු දෙකක් පමණ ඇඳ ඉවත දැමූ පරණ පන්නයට අයත් එම කබාය කාලයට නො ගැළපෙයි. ඔහු ගේ කමිසය හා

සාළුවකට සමාන දිග ටයි පටිය, අලංකාරයට ඇඳුම් පැළඳුම් කරන මහත්වරුන් ගේ කමිස හා ටයිපටිවලට සමාන ය. නමුත් මඳක් කිට්ටුවෙන් පිරික්සා බලන විට ඔහු ගේ කමිසය අපිරිසුදු බවත්, ටයි පටියේ නූල් ගැලවී තිබෙන බවත් පෙනෙයි. ඉරි වැටුණු කලිසම හැඩ වැඩ තබා මසා තිබිණි. එහෙත් එහි සායම ගොස් තිබිණි. අලුත් පන්නය අනුව සලකා බලන විට කලිසම, කකුල්වලට මඳක් තද ය. ඔහු ගේ සුදු මොළොක් හිස් වැස්ම සෘතුගුණයට නො ගැළපෙයි.

කොටින් කියතොත්, හැම අතින් ම ඔහු අගහිඟකමින් පෙළෙන වැදගතකු බව පෙනේ. ඔහු, මිනිසුන් දාසයන් ලෙස තබා ගත් කාලයේ දී ධනවත් ව අලසකමින් කාලය ගත කළ ඉඩම් හිමියන් ගේ පන්තියට අයත් මහතකු ලෙස පෙනේ. එක් කාලයක දී මේ මහතා උසස් සමාජයට අයත් ව සිටි බවට කිසි ම සැකයක් නැත. වරක් ලොකු ලොක්කන් සමඟ ඇති කරගත් සම්බන්ධය තවමත් ආරක්‍ෂා කරගනියි. එහෙත් තරුණ කාලයේ දී විනෝදාත්මක ජීවිතයක් ගත කළ හෙතෙම මෑත දී වහලුන්ට නිදහස දීමෙන් පසු ව ක්‍රමයෙන් දිළිඳු වන්නට විය. එ හෙයින් ඔහු පැරැණි කාරුණික හිතමිත්‍රයන් වෙත ගොස් යැපෙන, උසස් සමාජයට අයත් දිළිඳු නෑයකු ගේ තත්ත්වයට පත් විය. සිත් ගත් ගති පැවැතුම් ඇති ඔහු හිත මිතුරන් විසින් පිළිගනු ලැබී ය. එකට මේසයේ හිඳ කෑම් බීම් කිරීමට පවා ආරාධනා කරනු ලැබී ය. එහෙත් ඔහුට අසුන් ලැබුණේ මේසයේ ඈත කෙළවර ය. කාටත් ගැළපෙන ගති පැවැතුම් ඇති, හොඳ කතාවක් කිව හැකි, සුදුවට හිඳගත හැකි, පවරන ලද ඕනෑ ම වැඩක් කළ හැකි මේ මහත්වරු සිරිත් වශයෙන් හුදෙකලා ජීවිතයක් ගතකරන අවිවාහකයෝ ය. නැතිනම් වැන්දඹුවෝ ය. සමහර විට ඔවුන්ට දරුවෝ ද සිටිති. එසේ නම් ඒ දරුවෝ හැමවිට ම ඈත පළාතක වෙසෙන නැන්දා වරුන් විසින් ඇති දැඩි කරනු ලබති. එහෙත් උසස් සමාජයේ දී කවරදාවත් ඒ නෑයන් ගැන සඳහන් නො කරන්නේ එ වැනි නෑකම් ගැන ලැජ්ජා වන්නාක් මෙනි. ඉඳහිට දරුවන්-ගෙන් ඔවුන්ට නත්තල් පතක් හෝ උපන් දින පතක් හෝ ලැබෙයි. ඇතැම් විට ඔවුහු මේ පත්වලට පිළිතුරු ද යවති. එහෙත් දරුවන් සමඟ තිබෙන සම්බන්ධ ය ක්‍රමයෙන් තුනී වී යයි.

බලාපොරොත්තු රහිත ව පැමිණි අමුත්තා ගේ මුහුණේ පෙනුම එ තරම් යහපත් නො වී ය. එහෙත් තැනට සුදුසු වන පරිදි ප්‍රිය මනාපවීමට කැමැත්ත පළ කෙළේ ය.

ඔහු ළඟ ඔරලෝසුවක් නො තිබිණි. එහෙත් ඔහු කළු පිත්ත පටියක ගැටගසන ලද කැස්බෑ කටුවෙන් කළ කණ්නාඩියක් පැලඳ සිටියේ ය. දකුණු අතේ, මැද ඇඟිල්ලේ, ලාබ මැණික් ගලක් සහිත විශාල රත්රන් මුද්දක් තිබිණි.

කෝපයෙන් නිශ්ශබ්ද ව සිටි ඉවාන් අමුත්තා සමඟ කතා කිරීමට කැමැති නො වී ය. ගෙහිමියා සමඟ තේ පානය කිරීමට පැමිණි දුප්පත් නෑයකු වාගේ අමුත්තා බලා සිටියේ ය. එහෙත් ගෙහිමියා රවමින් යම්කිසිවක් ගැන කල්පනා කරමින් සිටින හෙයින් කතා නො කර සිටීම තුවණට හුරු යයි අමුත්තා කල්පනා කෙළේ ය. කෙසේ වෙතත්, ගෙහිමියා කතාවට කැමැති නම් තමා පිළිසඳරට මහත් කැමැත්තෙන් සිටින බව අමුත්තා හැඟෙව්වේ ය. හදිසියෙන් ම ඔහු ගේ මුහුණේ නොසන්සුන් කමක් දකින්නට ලැබිණි.

"මට සමාවෙන්න. මා මේ කතා කරන්නේ මහත්මයාට යමක් මතක් කිරීමටයි." ඔහු ඉවාන් අමතා කී ය. "මහත්මයා පැවල් හමුවෙන්න ගියේ කැතිරිනා ගැන තොරතුරු දැනගන්නයි. නමුත් ඇය ගැන කිසි ම දෙයක් විමසන්නේ නැති ව ආපසු ආවා. කැතිරිනා ගැන කරුණු විමසීමට මහත්මයාට අමතක වන්න ඇති........"

"ඔව්, මට අමතක වුණා" යි ඉවාන් කී ය. ඔහු ගේ මුහුණ නොසන්සුන්කමින් අඳුරු විය. "ඔව්, මට අමතක වුණා...... කමක් නැහැ. හෙට නැවත යනවා"යි ඉවාන් තමාට ම කියා ගත්තේ ය. අනතුරු ව ඔහු අමුත්තා දෙසට හැරී මෙසේ කී ය. "මගේ හිතේ ලොකු බරක් තිබුණේ මේ කාරණාව අමතක වූ නිසයි. තුඹ කිව්වත් නො කිව්වත් තව ටික වේලාවකින් මට මේ ගැන මතක් වෙනවා. තුඹ මොනවට ද අපේ කටයුතු-වලට ඇඟිලි ගහන්නේ? මේ ගැන මතක් කළේ තුඹ මතක් නොකළා නම් මට අමතක වන බව මා ලවා විශ්වාස කරවන්න ද?"

"එහෙනම් ඒ ගැන විශ්වාස කරන්න එපා" යි අමුත්තා හිතවත් කමක් දක්වා කී ය. "හිතට විරුද්ධ ව විශ්වාස කිරීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? ඔප්පු කළ තරමින් යමක් පිළිගන්න බැහැ. විශේෂයෙන් ම භෞතික කරුණු අතින් යමක් ඔප්පු කළාට පිළිගන්න බැහැ. ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් නැඟිට්ට බව තෝමස් විශ්වාස කළේ ඇසින් දැකලා නො වෙයි.

ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් නැගිටීමට පෙර සිට ඔහුට විශ්වාස කිරීමට අවශ්‍ය වූ නිසයි. උදාහරණයක් වශයෙන් අපි ආගම අදහන අය ගැන සිතා බලමු.................. මම ආගම අදහන අයට බොහො ම කැමැති .... අනෙක් ලෝකයේ සිටින යක්ෂයන් නැති ගන්වන නිසා මේ මිනිස්සු හිතනවා තමන් හොඳට ආගම අදහනවා ය කියා. පරලොවක් තිබෙන බව ඔප්පු කිරීමට ඔවුන් එය සාධකයක් හැටියට ඉදිරිපත් කරනවා. යක්ෂයෙක් සිටින බව ඔප්පු කරන්න පුළුවන් නම් ඒකෙන් දෙවියෙකෙනෙක් සිටින බවත් ඔප්පු වෙනව ද? මා කැමැතියි විඥානවාදීන් ගේ සමාගමකට බැදෙන්න. ඊට පස්සේ එම සමාගම ඇතුලේ විරුද්ධ පක්ෂයක් ඇතිකොට, මම විඥානවාදියෙක් ය, නමුත් භෞතික වාදියෙක් නො වේ යයි කියනවා. හා! හා! හා!''

'මා කියන දෙය හොඳට අහගනින්'' යයි ඉවාන් හදිසියෙන් ම නැගී සිටිමින් කී ය. ''මා සිහිවිකාරයෙන් දෙඩවන්නකු වගෙයි. මගේ සිහිය නරක්වෙලා දැන් මට පිස්සුයි. ඒ ගැන සැක කරන්න දෙයක් නැහැ. ඒ නිසා තුඹට පුළුවනි ඕනෑ ම පිස්සු දෙයක් කියන්න. මට කමක් නැහැ. ගිය වතාවේ වගේ තුඹට පුළුවන් කමක් නැහැ මා තරහ කරවන්න. නමුත් කොහොම වුණත් මගේ හිතේ ලොකු ලැජ්ජාවක් තියෙනවා.........මා කැමැතියි මේ කාමරය ඇතුලේ ටිකක් ඇවිදින්න. ගිය වතාවේ දී වගේ සමහරවිට මට තුඹ නො පෙනෙන්න පුළුවනි. තුඹේ කට හඬ නො ඇසෙන්න පුළුවනි. නමුත් කතා කරන්නේ තුඹ නො ව, මා නිසා, තුඹ දෙඩන දේවල් ගැන මට අනුමානයෙන් සිතා බලන්න පුළුවනි. ගිය වතාවේ දී මා තුඹ දුටුවේ හීනෙන් ද? නැති නම් හැබයින් ද? කියා කියන්න පුළුවන් කමක් නැහැ. මම තුවායක් තෙමා හිසේ ඔතා ගන්නවා. සමහරවිට එනකොට තුඹ අතුරුදහන් වෙන්න පුළුවනි.''

ඉවාන් කාමරයේ මුල්ලට ගොස් තුවායක් ගෙන ඇල්වතුරින් තෙමා හිස වටේ ඔතා ගෙන කාමරය තුළ ඇවිදින්නට විය.

''අපි දෙන්නා පරණ මිත්‍රයන් වගේ කතා කිරීම ගැන මට බොහො ම සන්තෝෂයි'' අමුත්තා කී ය.

''මෝඩයා'' යි ඉවාන් සිනා සෙමින් කී ය. ''මම තුඹට සලකන්නේ අමුත්තකුට සලකනවා වගේ නො වෙයි. මගේ හිසේ බලවත් වේදනාවක් තිබුණත් මා සිටින්නේ බොහො ම සතුටින්......නමුත් ගිය වතාවේ දී වගේ මට බණ කියන්න එපා.

තුඹට මෙ තැතිත් පිටවෙන්න බැරිනම්, අපට සතුටු විය හැකි දෙයක් ගැන කතා කරපන්. අනුන් ගේ ඕපාදූප ගැන කතා කරපන්. තුඹ දූප්පත් නෑයෙක් නිසා අනුන් ගේ ඕපා දූප කිය යුතු යි. ඒක කො තරම් භයානක සිහිනයක් ද? නමුත් මම තුඹට භය නැහැ. කිසි ම කෙනකුට මා පිස්සන් කොටු-වකට ගෙනියන්න ලැබෙන්නේ නැහැ."

"මා දූප්පතෙක් තමයි. නැති නම් මා වෙන කවරෙක් ද? ඒක නො වෙයි, මා තුඹ කියන දෙය අහගෙනයි හිටියේ. ඔය කතාව ගැන මට පුදුමයි. ගිය වතාවේ දී වගේ නො වෙයි මේ වතාවේ, මා හැබෑයින් ම සිටින කෙනකු මිස තුඹේ සිතේ ඇති වූ සිතිවිලි මාත්‍රයක් ලෙස නොපිළිගැනීම ගැන මට පුදුමයි."

"තුඹ හැබෑයින් සිටින කෙනකු ලෙස මම මොහොතකට-වත් පිළිගන්නේ නැහැ"යි ඉවාන් කෝපයෙන් කී ය. "තුඹ ලොකු බොරුවක්. මගේ අසනීපය නිසා පෙනෙන දෙයක්. අවතාරයක්. තුඹ කෙසේ විනාශ කළ යුතු ද කියා මා දන්නේ නැහැ. ඒ නිසා ටික කලක් ගතවන තුරු තුඹ නිසා මා දුක් වින්ද යුතුයි. තුඹ මගේ සිතේ පවතින මූලාවක්. තුඹ මගේ අවතාරයයි, මගේ සිතේ එක අංගයක් පමණයි. මගේ සිතේ ඇති වන නරක සිතිවිලි හා නරක හැඟීම් පමණයි. තුඹ වෙනුවෙන් නාස්ති කිරීමට කාලය තිබෙනවා නම් තුඹ මට බොහො ම වැදගත් වෙන්න පුළුවනි........"

"මට ටිකකට සමාවන්න. ඔය අදහස වැරදි බව මම ඔප්පු කරන්නම්. දූන් පැය කීපයකට කලින් පහන් කණුව යට දී 'උඹ ඒක ඔහුගෙන් ඉගෙන ගත්තා. තුඹ කොහොම ද දැනගත්තේ ඔහු මා බලන්න එන බව?' කියා තුඹ අලෝෂාට කෑගා කිව්වා. තුඹ අදහස් කළේ මා ගැන නො වේ ද? ඉතින් මොහොතකටවත් මා හැබැහින් සිටින කෙනකු බව පිළිගන්නා නේද?' මෙසේ කී අමුත්තා අප්‍රසන්න ලෙස සිනාසුණේ ය.

"ඔව්, ඒක සිත දුර්වල අවස්ථාවක දී සිදුවූ දෙයක්........ නමුත් මම තුඹ විශ්වාස කරන්නේ නැහැ. ගිය වතාවේ තුඹ පැමිණි වෙලාවේ දී මා නිදා සිටියා ද, නැති නම් අවදි ව සිටියා ද කියා මා දන්නේ නැහැ. සමහර විට මා තුඹ හැබැයින් නො ව හීනෙන් දකින්න ඇති."

"එසේනම් දූත් ටිකකට කලින් නුඹ අලෝෂාට තදින් කතා කළේ මොකද? අලෝෂා බොහෝ ම හොඳ ඉලන්දාරියා. සොසිමා තවුසා ගේ මරණයේ දී මා අලෝෂාට සලකපු හැටි ගැන මට බොහෝ ම කනගාටුයි."

"අලෝෂා ගැන කතා කරන්න එපා, බියගුල්ලා! භය නැති ව අලෝෂා ගැන කතා කරනව ද?"යි ඉවාන් සිනා සෙමින් කී ය.

"නුඹ මට බණිමින් සිනා සෙනවා. ඒක බොහෝ ම හොඳ ලකුණක්. කොහොම වුණත් ගිය වතාවේ වගේ නො වෙයි මේ වතාවේ දී නුඹ මට බොහෝ ම කරුණාවෙන් සලකනවා. මා දන්නවා මොකද කියා. නුඹ ඇති කරගත් අධිෂ්ඨානය නිසයි."

"මගේ අධිෂ්ඨානය ගැන කතා කරන්න එපා"යි ඉවාන් කෝපයෙන් කී ය.

"නුඹ හෙට ආත්ම පරිත්‍යාගයක් කොට මිතියා බේරාගැනීමට සැරසෙන බව මම දන්නවා."

"කට වහගෙන හිටපන්, නැතිනම් පයින් ගහනවා."

"නුඹ මට පයින් ගැසුවොත් මගේ අභිප්‍රාය මුදුන් පැමිණෙනවා. ඒ අතින් මට සතුටු වෙන්න පුළුවනි. මට පයින් ගහනවා නම් මා හැබෑයින් සිටින කෙනකු බව නුඹ පිළිගන්න ඕනෑ. කිසි ම කෙනෙක් අවතාරයකට පයින් ගහන්නේ නැහැ. කැමැති නම් මට බණින්න. ඒකට වරදක් නැහැ. මා වගේ කෙනකුට පවා ටිකක් කරුණාවෙන් කතා කළාට වරදක් නැහැ. මෝඩයා, බියගුල්ලා, කදිම වචන!"

"නුඹට බැණීමෙන් මා කළේ මට ම බැණ ගැනීමයි" ඉවාන් යළි සිනා සෙමින් කී ය. "නුඹ මායි. නුඹෙයි මගෙයි වෙනසක් නැහැ. වෙනසකට තියෙන්නේ මුහුණුවර පමණයි. නුඹ කරන්නේ මගේ අදහස් වචනයට නඟා කීම පමණයි. නුඹට කිසි ම අලුත් අදහසක් කියන්න පුළුවන් කමක් නැහැ."

"මගේ අදහස් නුඹේ අදහස්වලට සමාන නම් ඒක මට ලොකු ගෞරවයක්"යයි අමුත්තා ප්‍රණීත ලෙස හා උදාර ලීලාවෙන් කී ය.

"නුඹ තෝර ගත්තේ මගේ නරක, මෝඩ, අදහස් පමණයි. නුඹ මෝඩයි, අශිෂ්ටයි. බොහො ම මෝඩයි. කොහොමටවත් මට නුඹ සමඟ ඉන්න බැහැ"යි ඉවාන් දත් සපමින් කී ය.

"මිත්‍රයා, කැමැති දෙයක් කියන්න. මා කැමැතියි මහත්මයකු වගේ ජීවත්වෙන්න. මා කැමැතියි මිනිස්සු මට මහත්මයකුට සලකනවා වගේ සලකනවා නම්"යයි අමුත්තා, අනුන්ගෙන් කා බී ජීවත්වන නෑයකු මැසිවිලි කියන්නා වාගේ අප්‍රසන්න උඩඟු කමක් දක්වමින් කී ය. "මම බොහො ම දුප්පත්. නමුත් මා බොහො ම අවංක කෙනෙක් ය කියා කියන්නේ නැහැ. අද සමාජය පිළිගෙන තියෙන්නේ මා ගුණ දහම් අතින් පිරිහුණු කෙනකු හැටියටයි. මා ගුණ දහම් අතින් පිරිහුණු කෙනෙක් වුණේ කොහොම ද කියා මට කියන්න පුළුවන් කමක් නැහැ. මා යහපත් මිනිහෙක් ව සිටියා නම් සිටින්නට ඇත්තේ බොහො ම කාලයකට ඉස්සරයි. එහෙම සිටිය කාලය අමතක වීම වරදක් කොට සලකන්න බැහැ. මා දුන් හැම දෙසකට ම වඩා උසස් කොට සලකන්නේ, හැකි තරම් හොඳට කාටත් ප්‍රිය මනාප යහපත් මහත්මයකු ලෙස ජීවත් වීමටයි. මම අවංක සිතින් මිනිසුන්ට ආදරය කරනවා. එහෙත් මට බොහො ම අපවාද අහන්න වෙනවා. වරින්වර නුඹ සමඟ ජීවත්වීමට පැමිණෙන විට මගේ ජීවිතය සැබෑ ජීවිතයක් බව මට වැටහෙනවා. ඒකට මම බොහො ම කැමැතියි. දන්නව ද, මාත් නුඹ වගේ සිතේ මවාගත්ත අද්භූත අදහස් නිසා දුක් විඳින කෙනෙක්. මේ ලෝකේ තියෙන සවාභාවිකත්වයට මා කැමැති ඒ නිසයි. මෙ තැන නුඹ සම්බන්ද ව පවතින හැම දෙයක් ම බොහො ම පැහැදිලියි. නීතියට රීතියට එකඟයි. ජ්‍යාමිතිය වගෙයි. නමුත් අප පිළිබඳ හැම දෙයක් ම නියමයක් නැති සමීකරණයක් වගෙයි. මට මෙ තැන සිට සිහිනෙන් කල්පනා කරනවා වගේ නොයෙක් දේවල් ගැන කල්පනා කරන්න පුළුවනි. සිහිනෙන් කල්පනා කරන්නකු වගේ කල්පනා කිරීමට මම බොහො ම කැමැතියි. හැරත් මේ ලෝකයට පැමිණී පසු මා තුළ නොයෙක් මිථ්‍යා මත ඇති වෙනවා. පිං සිද්ද වෙයි හිතා වෙන්න එපා. සිතේ මිථ්‍යා අදහස් ඇතිවීම ගැන මම බොහො ම කැමැතියි. නුඹලා ගේ ඇබ්බැහි කම්වලට පුරුදු වීමට මාත් බොහො ම කැමැතියි. මම බොහො ම කැමැතියි ප්‍රසිද්ධ නාන ගෙවල්වලට ගිහින් වෙළෙඳුන් හා පූජකයන් සමඟ නාන්න. මගේ ලොකු ම ආසාව, ආයේත් කවදාවත් වෙනස් නොකළ හැකි වන ලෙස, වෙළෙන්දකු ගේ රාත්තල් දෙසිය පනස් දෙකක් බර ඇති

බිරියක් වී ඉපදී, ඈ විශ්වාස කරන හැම දෙයක් ම විශ්වාස කිරීමටයි. පල්ලියට ගොස් අවංක සිතින් ඉටිපන්දමක් දැල්වීමට මගේ ලොකු ම බලාපොරොත්තුවක් තියෙනවා. මේ ඇත්ත මයි. එතකොට මගේ දුක එ තැනින් අවසන් වෙනවා. මම බොහො ම කැමැතියි මේ ලෝකයට ඇවිදින් බෙහෙත් බොන්න. වසන්ත සෘතුවේ දී වසූරිය පැතිරී ගියා. ඉතින් මම අනාථ දරුවන් ගේ ඉස්පිරිතාලයට ගොස් බෙහෙත් විදගත්තා. දන්නව ද, මා එදා කො තරම් සතුටු වුණා ද කියා? මම ස්ලෙව් ජාතිකයන්ට ආධාර පිණිස රූබල් දහයක් පරිත්‍යාග කලා.......මා කියන දෙය අහගෙන නො වෙයි ඉන්නේ. දන්නව ද අද සවස ඉඳලා නුඹට කිසි ම සනීපයක් නැහැ......ඊයේ නුඹ දොස්තර බලන්න ගිය බව මම දන්නවා. කොහොම ද නුඹේ සැප සනීප? මොකද දොස්තර කිව්වේ?''

''මෝඩයා''යි ඉවාන් කී ය.

''නමුත් නුඹ බොහො ම ලොකු ඥානවන්තයා. ආයේත් වරක් මට බණිනව ද? මම ඇහැව්වේ නුඹට ඇති අනුකම්පාවෙන් නො ව හිතවත් කමටයි. කැමැති නැතිනම් උත්තර නුදුන්නට කමක් නැහැ. තව වතාවක් ප්‍රමේහවාතය හැදිලා.........''

''මෝඩයා''යි ඉවාන් ආයේත් කී ය.

''ආයේත් වතාවක් එක ම දෙය කියනවා. මට ගිය අවුරුද්දේ කො තරම් තදින් ප්‍රමේහවාතය හැදුණ ද කියතොත් මට තවමත් ඒක අද වගේ මතකයි.''

''මොනවා, යක්ෂයාටත් ප්‍රමේහවාතය හැදෙනවා?''

''මොකද නැත්තේ. සමහර විට මනුෂ්‍ය ස්වරූපයෙන් පෙනී සිටින විට ප්‍රමේහවාතය හැදෙනවා. මනුෂ්‍ය ස්වරූපයේ ස්වභාවය ගැනීමේ විපාක විඳින්නට සිදුවෙනවා.''

''යක්ෂයාට ඒක එ තරම් නරක නැහැ.''

''අත්තිමේ දී මා නිසා නුඹේ හිතේ සතුටක් ඇති වීම ගැන මට බොහො ම සන්තෝෂයි.''

''නුඹට ප්‍රමේහවාතය හැදුණේ මගෙන් නො වෙයි.'' මෙසේ පැවසූ ඉවාන් හිටි හැටියේ ම නිහඬ විය. ''මහ පුදුමයක්! ඒක මට කවදාවත් කල්පනා වුණේ නැහැ''යි ඔහු අනතුරු ව කී ය.

"මේ වතාවේ දී මම කාරණය අවංක ව විස්තර කරලා දෙන්නම්. විශේෂයෙන් ම බඩේ ඇතිවන අජීර්ණ හා වෙනත් නොයෙක් හේතූන් නිසා මිනිසුන්ට හීනෙන් බොහෝ ම කලාත්මක දේවල් පෙනෙනවා. බොහෝ ම පැටලිලි සහිත ස්වාභාවික දේවල් පෙනෙනවා. මිනිස් අධ්‍යාත්මයේ ඉතා උසස් කරුණු සිට, කමිසයේ බොත්තම දක්වා, සිත මවිත කරවන විස්තර ඇතුලත් කතාවක් මෙන් ගෙතුණු, මහත් රාශියක් සිදුවීම් පෙනෙනවා. මට දිව්රා කියන්න පුළුවනි ලියෝ ටොල්ස්ටෝයිටවත් එ වැනි විස්තර සහිත කතාවක් නිර්මාණය කරන්න බැහැ. නමුත් එ වැනි සිහින පෙනෙන්නේ ලේඛකයන්ට නො ව, සිවිල් සේවකයන්, පත්‍ර වාර්තාකාරයන්, පූජකයන් වැනි සාමාන්‍ය අයට පමණයි......... ඇත්ත කියනවා නම් මේ කාරණාව බොහෝ ම පැටලිලි සහිත ප්‍රශ්නයක්. මට වරක් කැබිනට් ඇමතිවරයෙක් කිව්වා එයාට හොඳ ම අදහස් ඇති වෙන්නේ හීනෙන් ය කියා. අන්න එ වැනි දෙයක් තමයි දැන් සිදුවන්නේ. මා තුඹට මායාවක් මෙන් පෙනෙන්න පුළුවනි. නමුත් සිහිනයක් වගේ මීට පෙර කවදාවත් තුඹේ සිතේ ඇති නොවූ නව අදහස් මම ඉදිරිපත් කරන්නම්. ඉතින් මා තුඹේ අදහස් යළි කියන කෙනෙක් නො වූවත් මා තුඹ දකින භයානක සිහිනයක් මිස වෙන කිසිවක් නො වෙයි."

"තුඹ කියන්නේ බොරු. තුඹ වෑයම් කරන්නේ, තුඹ මා දකින භයානක සිහිනයක් නො ව, හැබැයින් සිටින කෙනකු බව ඔප්පු කිරීමටයි. නමුත් දැන් තුඹ කියනවා තුඹ සිහිනයක් ය කියා."

"මිත්‍රයා, මා අද අනුගමනය කරන්නේ අමුතු ක්‍රියා මාර්ගයක්. ඒ ගැන පසු ව විස්තර කරලා දෙන්නම්. මා කරමින් සිටි කතාව නැවැත්වූයේ කො තැනින් ද? ඔව් දැන් මට මතකයි. මට සෙම්ප්‍රතිශ්‍යාවක් හැදුණා. හැදුණේ මෙහෙ දි නො වෙයි එහි දී........."

"මොකද එහි දී හැදුණය කියන්නේ? තුඹේ කල්පනාව මෙ තැන හුඟ දවසක් නවතින්න ද? ඇයි යන්න බැරි ද?" යි ඉවාන් බලාපොරොත්තු සුන් වූවකු මෙන් ඇසුවේ ය.

කාමරය තුළ සක්මන් කරමින් සිටි ඉවාන් යළි සෝපාව උඩ හිඳ, මේසය මත වැලමිට තබා, දෑතින් හිස බඳ ගත්තේ ය. හිස වටේ ඔතාගෙන සිටි තුවාය ගෙන කෝපයෙන් ඉවත දැම්මේ ය. ඒ තුවායෙන් කිසි ම ප්‍රයෝජනයක් නොවන බව පෙනේ.

“තුඹේ සහර බොහො ම දුර්වලයි” අමුත්තා නොසැලකිල්ලෙන්, එහෙත් මිත්‍ර ස්වභාවයෙන් කී ය. “මට සෙම්ප්‍රතිශ්‍යාව හැදුණේ බොහො ම ස්වාභාවික විදියටයි. නමුත් ඒ ගැනත් තුඹට තරහයි. සැමියාට ඇමැති පට්ටමක් ලබා දීමේ අදහසින් පීටස්බර්ග් නුවර බොහො ම උසස් කුලකාන්තාවක් ලොකු ලොක්කන් කැඳවා ප්‍රියසම්භාෂණයක් පැවැත්වූවා. මට මේ උත්සවයට යන්න පමා වුණා. දන්නෙ නැද්ද ඔය උත්සවවලට අඳින ඇඳුම්. මා ඒ වෙලාවේ කොහෙ හිටියද කියා මට මතක නැහැ. නමුත් පොළොවට එන්න මට අජටාකාශය තුළින් පියාඹාගෙන එන්න සිදුවුණා.........තත්පර ගණනයි ගියේ. පොළොවට සූර්ය රශ්මිය එන්න මිනිත්තු අටක් ගත වෙනවා. ඉතින් මම උත්සවයට සුදුසු ඇඳුම් පිටින් ම ආවා. අවතාරවලට හීතලය දැනෙන්නේ නැහැ. නමුත් මනුෂ්‍ය වේසය ගත්තායින් පස්සේ ලෙඩදුක්වලින් බේරෙන්න බැහැ. මම වැඩිය කල්පනා නො කර කෙළින් ම ආවා. හිස් ආකාසයේ අන්තරීක්ෂයට උඩින් මිදුණු පිනි බොහො ම තියෙනවා. මිදුණු පිනි කියන්නත් බැහැ. එ තැන උෂ්ණය, දිය මිදෙන අංශයට වඩා අංශක එකසිය පනහක් අඩුයි. දන්නව නේද ගැමි තරුණියන් කරන සෙල්ලමක්? උන් මෝඩ තරුණයන්ට කියනවා, අංශක තිහට උෂ්ණය බැස පිනි මිදී තියෙන වේලාවට, පොරෝතලයක් ලෙවකන්න ය කියා. පොරෝතලය ලෙවකාපු හැටියේ ම දිව මිදී පොරෝතලයට ඇලෙනවා. දිව පොරෝතලයෙන් ගලවන කොට හම ගැලවී ලේ ගලන්න පටන් ගන්නවා. එහෙම වෙන්නේ උෂ්ණය දිය මිදෙන අංශයෙන් අංශක තිහක් පහත බැස්සාට පසුවයි. අංශක එකසිය පනහක් බැස්සායින් පස්සේ තියෙන්නේ පොරෝතලයට ඇඟිල්ල තියන්න විතරයි.........ආයේත් ඇඟිල්ල ඉතිරි වෙන්නේ නැහැ. ..... එහෙම වෙන්නේ එ තැන පොරෝතලයක් තිබුණොත් පමණයි.”

“එ තැන පොරෝතලයක් තියෙන්න පුළුවන් ද?”යි ඉවාන් හදිසියෙන් කතාවට බාධා කරමින් ඇසුවේ නොසැලැකිල්ලෙන් හා පිළිකුලෙන් ද යුතු ව ය. තමා දකින මේ උමතු සිහිනය විශ්වාස නොකිරීමටත්, හොඳ සිහිබුද්ධියෙන් සිටීමටත්, ඉවාන් හැකි තරම් වෑයම් කෙළේ ය.

“පොරෝතලයක්!”යයි අමුත්තා ද පුදුම වෙමින් විමසුවේ ය.

“ඔව්, එ තැන පොරොවක් තිබුණා නම් මොකද වෙන්නේ?” ඉවාන් හදිසියෙන් ම ඇසුවේ බිහිසුණු ගතියක් සමඟ මුසු වූ මුරණ්ඩු කමකින් යුතු ව ය.

"හිස් වූ අජටාකාශයේ තියෙන පොරෝතලයට මොකද වෙන්නේ? මගේ කල්පනාවේ හැටියට හුහක් ඈතට ගියොත් පොරෝතලය චන්ද්‍රිකාවක් වගේ පොළොව වටේ කරකැවෙන්න පුළුවනි. පොරොව පායන වේලාවත්, බහින වේලාවත්, තාරකා විද්‍යාඥයන් ගණන් බලා හරියට කියාවි."

"උඹ මහ මෝඩයෙක්" යයි ඉවාන් කීවේ කලඟ කර ගැනීමට සැරසෙන්නකු මෙනි. "බොරුවක් කියනවා නම් පිළිගන්න පුළුවන් විදියට කියාපන්. නැති නම් මම විශ්වාස කරන්නේ නැහැ. නුඹ වැයම් කරන්නේ හැබැයින් සිටින කෙනකු බව ඔප්පු කරන්න ද? නුඹ හැබැයින් සිටින කෙනකු බව මම කවදාවත් විශ්වාස කරන්නේ නැහැ."

"මා කියන්නේ බොරුවක් නො වෙයි, ඇත්තයි. අවාසනාවට සත්‍යය එ තරම් විනෝදය ගෙන දෙන දෙයක් නො වෙයි. නුඹ මගෙන් බොහො ම ලොකු දෙයක්, නැති නම් බොහො ම ලක්ෂණ දෙයක් බලාපොරොත්තු වන බව මට පෙනෙනවා. මට බොහො ම කනගාටුයි, මට දෙන්න පුළුවන් මා ළඟ තියෙන දෙය පමණයි."

"බූරුවා, මට බණ කියන්න එපා."

"මගේ දකුණු පැත්ත සම්පූර්ණයෙන් ම හිරිවැටිලා. වේදනාවෙන් කෙඳිරිගාන කොට මම කොහොම ද බණ කියන්නේ? මම නොයෙක් විදියේ දොස්තරවරු හමුවුණා. ඒ ගොල්ලෝ බොහො ම අගේට ලෙඩ සොයා ගන්නවා. රෝග ලක්ෂණ සේරම කියනවා. අතැඹුලක් සේ ලෙඩේ අඳුනනවා. නමුත් ලෙඩේ සනීප කරන්නේ කොහොම ද කියා දන්නේ නැහැ. වරක් මට, බොහො ම උනන්දුවෙන් වැඩ කරන වෛද්‍ය ශිෂ්‍යයෙක් හමුවුණා. එයා මගේ ලෙඩේ සෝදිසි කොට බලා කිව්වා, 'සමහර විට නුඹ මේ රෝගයෙන් මැරෙන්න පුළුවනි. නමුත් මලත් රෝගය ගැන හොඳ දැනුමක් ලබාගන්න පුළුවනියි' කියා. ඒ ගොල්ලෝ නුඹව විශේෂඥයන් ළඟට යවන හැටි දන්නව ද? 'අපට පුළුවන් නුඹේ ලෙඩේ සොයා ගන්න පමණයි. නමුත් ලෙඩේ තිට්ටාවට සනීප කර ගන්න නම් අසවල් විශේෂඥයා ළඟට යන්න'යි කියනවා. ඔනෑ ම ලෙඩක් සනීප කරන්න පුළුවන් පරණ තාලේ දොස්තරවරු දැන් නැහැ. සම්පූර්ණයෙන්ම අන්තර්ධාන වෙලා. දැන් ඉන්නේ විශේෂඥයන් පමණයි. ඒ ගොල්ලෝ පත්‍රයේ දැන්වීම් දමනවා. නහයේ දෝෂයක් තිබුණොත් පැරීසියට යවනවා. පැරීසියේ ඉන්නවා ලු නහයේ රෝග සනීප කරන විශේෂඥයෙක්. 'යන්න පැරීසියට, ඒ දොස්තර මහතා

තුඹේ නහයේ තියෙන රෝගය සනීප කරාවි.' ඉතින් යාළුවා මිනිහා පැරීසියට යනවා විශේෂඥයා බලන්න. 'මට බොහො ම කනගාටුයි. මට පුළුවන් මහත්මයා ගේ දකුණු නාස් පුඩුවට බෙහෙත් කරන්න විතරයි. මම වම් නාස් පුඩුවට බෙහෙත් කරන්නේ නැහැ. ඒක මගේ විශේෂඥකමට අයිති නැහැ. වියානාවට යන්න. එ තැන ඉන්නවා වම් නාස් පුඩුවට බෙහෙත් කරන විශේෂඥයෙක්.' ඉතින් මොනවා කරන්න ද? මම දන්න තාලේ බෙහෙත් කළා. මට ජර්මන් දොස්තර කෙනෙක් කිව්වා, ඇගේ පැණියි ලුණුයි ගාලා නාන්න ය කියා. ඉතින් මම ඇගේ පැණියි ලුණුයි ගාගෙන නෑවා. නමුත් කිසි ම ප්‍රයෝජනයක් වුණේ නැහැ. බැරි තැන මම මිලාන් නුවර සිටින මතේ සිටුවරයාට ලෙඩේ කියා ලියුමක් යැව්වා. සිටුවරයා මට පොතකුයි බෙහෙත් බින්දු වගයකුයි එව්වා. එයාට දෙයියන් ගේ පිහිටයි. මම එයාට දොස් කියන්නේ නැහැ. නමුත් දන්නව ද වෙච්ච දෙය? යව-වලින් පෙරා පිළියෙළ කළ හෝප් ගේ මත්පැන්වලින් මගේ රෝගය සනීප වුණා. මම බෝතල් එකහමාරක් බිව්වා. ලෙඩේ සම්පූර්ණයෙන් ම නැති වෙලා මට නටන්නටත් පුළුවන් වුණා. ලෙඩේ සනීප වුණාට ස්තුති කරලා පත්තරයට ලියුමක් ලියන්න මම තීරණය කළා. එ වැනි දෙයක් කිරීමට මා පෙළඹෙව්වේ මගේ සිතේ ඇති වූ කෘතඥතාවයි. නමුත් එක ම පත්‍රයක්වත් ඒ ලියුම ප්‍රසිද්ධ කරන්න කැමැති වුණේ නැහැ. නිදහසට දුන්න හේතුවත් මහ පුදුම එකක්. 'මෙහෙම ලියුම් ප්‍රසිද්ධ කිරීම බොහො ම ප්‍රතිගාමි වැඩක්. කිසි ම කෙනෙක් මේක විශ්වාස කරන්නේ නැහැ. නම නො දමා ලියුම ප්‍රසිද්ධ කරන්න' කියා පත්‍රකාරයෝ මට කිව්වා. නමක් නැති ව කරන ස්තුතියෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? මම මේ කතාව කියා පත්‍රකාරයන් සමඟ සිනාසුණා. 'මේ කාලේ දෙවියන් ගැන විශ්වාස කිරීමත් ප්‍රතිගාමි ක්‍රියාවක්. නමුත් මම යක්ෂයා, ඒ නිසා මා ගැන විශ්වාස කරන්න පුළුවනි.' 'බොහො ම හරි, කවුද යක්ෂයා ගැන විශ්වාස නොකරන්නේ?' කියා පත්‍රකාරයෝ ඇසුවා. 'කොහොම වුණත් මේ ලියුම ප්‍රසිද්ධ කරන්න බැහැ, අපේ දේශපාලන ප්‍රතිපත්ති-වලට ගැළපෙන්නේ නැහැ. මේ ලියුම විහිළුවක් හැටියට ප්‍රසිද්ධ කරන්න කැමැති ද?' ලියුම විහිළුවක් හැටියට ප්‍රසිද්ධ කිරීම එ තරම් ඥානවන්ත දෙයක් හැටියට මට පෙනුණේ නැහැ. ඉතින් ලියුම ප්‍රසිද්ධ කරන්න ලැබුණේ නැහැ. ඒ ගැන තාමත් මගේ හිතට බොහො ම අමාරුයි. මගේ සුභද හැඟීම්, විශේෂ-යෙන් ම මගේ කෘතඥතාව, ප්‍රසිද්ධ කරන්න මගේ සමාජ තත්ත්වය නිසා මට ඉඩ ලැබුණේ නැහැ."

“ආයේත් බණ කියන්න හදනවා නේද?”යි ඉවාන් ද්වේෂයෙන් ඇසුවේ ය.

“අනේ දෙයියනේ, මම බණ කිව්වේ නැහැ. ඉදහිටවත් තමාගේ දුක්ගැනවිල්ලක් නො කියා කොහොම ද? මම බොහො ම අපවාද අහපු කෙනෙක්. තුඹත් හැම තිස්සේ ම මෝඩයා කියා මට බණිනවා. තුඹ ඉලන්දාරියකු බව ඕනෑ ම කෙනකුට පෙනෙනවා. ඉලන්දාරියා, උගත්කමින් හැම දෙයක් ම කරන්න බැහැ. මටත් තියෙනවා කරුණාවෙන් පිරි, විනෝදයට කැමැති හදවතක්. මට නොයෙක් තාලේ විකට නාටක ලියන්න පුළුවනි. තුඹ හිතනවා ඇති මා වයසට ගිය කෙලෙස්ටෝ වගේ ය කියා. නමුත් මගේ දෛවය ඊට වඩා බොහො ම බලසම්පන්නයි. කාලය පටන් ගැනීමට පෙර සිට, කිසිසේත් තේරුම් ගන්න බැරි, කිසියම් කාරුණක් නිසා මට නියම වී තිබුණා හැම දෙයකට ම ‘නැති ය’ ‘බැරි ය’ කියන්න. නමුත් මා සවභාවයෙන් ම කරුණා-වන්ත හදවතක් ඇති, කිසි ම දෙයකට ‘නැති ය’ ‘බැරි ය’ කියන්න බැරි කෙනෙක්. ‘නැහැ, නැහැ, තුඹ හැම දෙයක් ම ප්‍රතික්ෂෙප කළ යුතුයි. ප්‍රතික්ෂෙපයක් නැති ව විවේචනයක් නැහැ. විවේචනවලට වෙන ම තීරුවක් වෙන් කර නැති පත්තරය මොන පත්තරයක් ද? විවේචනය නැති තැන දෙවියන් වහන්-සේට ආශීර්වාද වේ වා, කියනවා මිස වෙන කිසිවක් නැහැ. දෙවියන් වහන්සේට ආශීර්වාද වේ වා කීමෙන් පමණක් ජීවිතය සම්පූර්ණ වෙන්නේ නැහැ දෙවියන් වහන්සේට ආශීර්වාද වේ වා කියන මේ කතාව, සැකය නමැති කෝව තුළ දමා පරීක්ෂා කළ යුතුයි. නමුත් ඒක මට අයිති වැඩක් නො වෙයි. මා මේ ලෝකය මැව්වේ නැහැ. මම ඒකට වග කියන්නේ නැහැ. ඉතින් ඔවුන් කළ වරදට දඬුවම් කිරීමක් වශයෙන් මට නියම වී තියෙනවා විවේචනය කිරීමට. මගේ ඒ විවේචනයේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි ජීවිතය ඇති වුණේ. මේ ජීවිතය නමැති විකට නාටකය අපට තේරුම් ගන්න පුළුවනි. ඊට පස්සේ මම එළිපිට ම, අවංක ව ඉල්ලා සිටියා මාව විනාශ කරන්න ය කියා. එතකොට ඔවුන් කියනවා ‘නැහැ, නැහැ, තුඹ විනාශ කරන්න බැහැ. තුඹ ජීවත්වන්න ඕනෑ. තුඹ නැති ව කිසි ම දෙයක් පවතින්නේ නැහැ. මේ ලෝකේ තියෙන හැම දෙයක් ම සිහිනුවණින් ක්‍රියා කරනවා නම් කිසි ම විපතක් වෙන්නේ නැහැ තුඹ නැති ව කිසි ම දෙයක් සිදුවන්නේ නැහැ. නමුත් මේ ලෝකේ නොයෙක් දේවල් සිදුවිය යුතුයි, කියා. ඉතින් මේ ලෝකය පැවැත්විය යුතු නිසා ආයේත් වරක් මම සිතේ වේදනාවෙන් යුතු ව සේවය කරමින්, නියමයෙන් යුක්තියට නො ගැළපෙන මෝඩ දේවල් කරනවා.

අවිවාදයෙන් පිළිගත යුතු, උගතුන් පවා මේ විකාරය බොහො ම ලොකු වැදගත් දෙයක් හැටියට පිළිගන්නවා. ඒක තමයි මිනිසා ගේ විනාශයට හේතුව. මිනිසා බොහො ම දුක් විඳිනවා. දුකින් ජීවත් වෙනවා. සැබෑ ජීවිතයක් ගත කරනවා. ඒක සැබෑ ජීවිතයක් මිස මුළාවක් නො වෙයි. ජීවත්වීම දුකයි. දුක් නො විඳ ජීවිතයෙන් සැපත ලබාගන්නේ කොහොම ද? එය සීමාවක් නැති ආගමික පුද පූජාවලට පරිවර්තනය වෙනවා. ඒක බොහො ම ශුද්ධ වූ දෙයක්. නමුත් ලොකු පිඩාවකුත් ඇති වන දෙයක්......... ඉතින් මගේ තත්ත්වය කොහොම ද? මම බොහො ම දුක් විඳිනවා. නමුත් මා ජීවත්වන කෙනෙක් නො වෙයි. මා නියමයක් නැති සමීකරණයක 'X' අකුරට සමානයි. මා අග මුල නොදන්නා, වෙනෙකක් නබා තමා ගේ නම වත් මතක නැති අවතාරයක් වගෙයි. තුඹ හීනා වෙනවා. නැහැ තුඹ හීනා වෙන්නේ නැහැ. තුඹට ආයේත් තරහ ගියත්. තුඹ හැම විට ම කෝපයෙන් සිටින කෙනෙක්. තුඹට උවමනා කරන්නේ උගත්කම පමණයි. නමුත් වෙළෙඳකු ගේ රාත්තල් දෙසිය විසිහතරක් බර ඇති බිරියක් වී ඉපිද, දෙවියන් වහන්සේ වෙනුවෙන් ඉටිපන්දම් දල්වන්න පුළුවන්නම්, මා අහසේ තාරකා-වලින් ඈත ගත කරන ජීවිතය, මගේ සියලු තරාතිරම් හා ගරු බුහුමන් අත් හරින්න කැමැති බව ආයේත් වරක් කියන්න කැමැතියි."

"එහෙනම් තුඹ දෙවියන් ගැන විශ්වාස කරන්නේ නැද්ද?"යි ඉවාන් ද්වේෂයෙන් සිනා සෙමින් විමසුවේ ය

"ඔය තරම් ම දැනගන්න කැමැති නම් මා කොහොම ද මේක විස්තර කරල කියන්නේ?"

"දෙවියෙක් ඉන්නව ද නැද්ද?"යි ඉවාන් යළි දරුණු කෝපයෙන් ඇසුවේ ය.

"එහෙනම් දෙවියන් ගැන තුඹේ ලොකු ආශාවක් තියෙනවා! මිත්‍රයා, මට දිව්රා කියන්න පුළුවනි, දෙවියන් ඉන්නවා ද නැද්ද කියා මා දන්නේ නැහැ. ඔන්න මගේ පිළිතුර."

"දෙවියෙක් ඉන්නව ද නැද්ද කියා තුඹ දන්නේ නැහැ, නමුත් තුඹට දෙවියන් පෙනෙනවා! තුඹ අමුතු පුද්ගලයෙක් නො වෙයි. තුඹ මායි. තුඹ මා මිස වෙන කිසිවෙක් නො වෙයි. තුඹ වල්පල් ගොඩක්. තුඹ මගේ කල්පනා ශක්තියයි. තුඹ මගේ සිතිවිල්ලයි."

"මගේ දර්ශනය තුඹේ දර්ශනයට සමානයි. ඒක ඇත්තයි. මා වටා තියෙන අනෙක් දේවල්, මේ සියලු ම ලෝකවල්, දෙවියන් වහන්සේ, වෙනෙකක් තබා සාතන් ද, මේවා කිසිවක් තියෙනවා ය කියා තව ම මට කිසිවෙක් ඔප්පු කරලා නැහැ. මේ දේවල් හැබෑයිත් ම තියෙනව ද? නැති නම් මගේ ප්‍රභවයක් ද? සදාකල්හි ම පවතින මගේ මමත්වයේ ඇති වූ තර්කානුකූල වූ වර්ධනයක් ද? නැහැ නැහැ. මා මේ කතාව නවත්වනවා. මට පේනවා තුඹ කෝලාහලයක් කිරීමට සැරසෙන බව."

"ඔයිට වඩා හොඳයි හිනා වෙන්න පුළුවන් කතාවක් කියනවා නම්"යයි ඉවාන් සිතේ හටගත් කැළඹීමෙන් යුතු ව කී ය.

"අප කතා කරන මේ දෙයට සම්බන්ද වූ හාස්‍යජනක කතාවකුත් තියෙනවා. ඒක ජනකතාවක් මිස හාස්‍යජනක කතාවක් නො වෙයි. තුඹ මා අවිශ්වාස කොට මට නින්දා කළා, අපහාස කළා. තුඹට මා පෙනෙනවා. තුඹ මා සමග කතා කරනවා. ඒත් තුඹ මා විශ්වාස කරන්නේ නැහැ. නමුත් මිත්‍රයා, එ වැනි තත්ත්වයක ඉන්නේ මා පමණක් නො වෙයි. අප සියලු දෙනා ම මහ අවුලක පැටලැවිලයි ඉන්නේ. ඒ අවුලට මූල තුඹලා ගේ විද්‍යාවයි. මේ ලෝකේ, පරමාණුව, පංචේන්ද්‍රියත් හා මහා භූතයන් සතර තිබුණ කාලයේ දී කිසියම් තේරුමක් තිබුණා. පුරාණ කාලයේ හිටිය අයත් පරමාණුව ගැන දැනගෙන හිටියා. නමුත් තුඹලා රසායනික අණුව හා ප්‍රොටෝප්ලැසම්, යක්ෂයා දනියි මොනව ද කියා, සොයා ගත් පසු උන් වලිගය කකුල් දෙක අස්සේ ගහගත්තා. හැම දා ම, හැම තැන ම අවුල, ඒ සේරට ම වැඩිය හපන් ඊට පස්සේ මිථ්‍යා මත අදහන්න පටන් ගත්තා. ඕපාදූප කියන්න පටන් ගත්තා. තුඹලා අතරට වඩා අප අතර ඕපාදූප දෙඩුම තදින් බල-පවත්වනවා. සමහරවිට අපේ අය තුඹලා ගේ අයට වඩා සමර්ථයි. අනෙක් කාරණාව ඔත්තු බැලීමයි. පෞද්ගලික තොරතුරු එකතු කරන අපේ රහස් පොලිසියක් තියෙනවා. මේ අශිෂ්ට ජනකතාව අයිති මධ්‍යම කාලීන යුගයටයි. තුඹලා ගේ මධ්‍යම කාලීන යුගයට නො වෙයි, අපේ මධ්‍යම කාලීන යුගයටයි. රාත්තල් දෙසිය විසි හතරක් බැරෑති ගෑනු හැර වෙන කිසි ම කෙනෙක් මේ කතාව විශ්වාස කරන්නේ නැහැ. තුඹලා ගේ ගෑනු නො වෙයි අපේ ගෑනු. තුඹලා ළඟ තියෙන හැම දෙයක් ම අප ළඟත් තියෙනවා. මේවා කිසි ම කෙනකුට නොකියන ලෙස තහනම් කරලයි තියෙන්නේ

නමුත් අපේ මිත්‍රකම සලකාගෙන මම තුඹට කියනවා. මේක පාරාදීසිය ගැන පැවැත එන ජනකතාවක්. මේ ලෝකයේ තිබියලු නීතිය, අධ්‍යාත්මය, භක්තිය, ඒ සේරට ම වඩා පරලොව ප්‍රතික්ෂේප කළ මහා චින්තකයෙක්. අන්තිමේ දී මරණය හා සදාකාලික අන්ධකාරයට පැමිණිය හැකි ය යන විශ්වාසයෙන් යුතුව මිනිහා මළා. මළාට පස්සේ මිනිහා ආයේත් ඉපදුණා. මිනිහා පුදුම වුණා. ඒ එක්ක ම හිතේ ලොකු කෝපයක් ඇති වුණා. 'නැවත ඉපදීම මගේ ප්‍රතිපත්තියට විරුද්ධයි' මිනිහා කිව්වා. ඒකට මිනිහට දඬුවම් විඳින්න සිදු වුණා......... මට සමා වෙන්න. මා කියන්නේ ඇසූ දෙයයි. අනෙක් අතින් මේක පැරණි ජනකතාවක්, මේ චින්තකයාට අන්ධකාරයේ කිලෝමීටර දහස්කෝටි ප්‍රකෝටියක් ඇවිදින්න නියම වුණා. මේ ගමන අවසන් වූ පසු මිනිහට සවර්ගයේ දොර ඇරිලා සියලු ම පව්වලට සමාව ලැබෙනවා.........''

''අන්ධකාරයේ, කිලෝමීටර දහස්කෝටි ප්‍රකෝටියක් ඇවිදීම හැර අනෙක් ලෝකයේ වෙන මොනවද තියෙන දඬුවම් ක්‍රම?''යි ඉවාන් අපූරු උනන්දුවක් දක්වා විමසුවේ ය.

''ඒ ගැන අහල වැඩක් නැහැ. ඉස්සර නම් නොයෙක් විදියේ දඬුවම් ක්‍රම තිබුණා. දැන් ඒවා බොහො ම දුරට වෙනස් වෙලා. දැන් තියෙන්නේ සදාචාරය පිළිබඳ දඬුවම් ක්‍රම පමණයි. අධ්‍යාත්මයට වද දීම වැනි විකාර ක්‍රම පමණයි. අපට මේ දඬුවම් ක්‍රමයත් පුරුදු වුණේ තුඹලාගෙනුයි. තුඹලා ගේ සිරිත් විරිත්වල නැර අඩුවීමෙන් පසුවයි අපට බෝවුණේ. කාට ද ඒකෙන් වාසි වුණේ? හිතක් පපුවක් නැති අයට පමණයි. ලෙහි අනුකම්පාවක් නැති එවුන් ගේ පපුව කොනහලා ඇති ප්‍රයෝජනය කුමක් ද? නමුත් හිතක් පපුවක් හා ආත්ම-ගරුත්වයක් ඇති මිනිසුන්ට ඒකෙන් ලොකු හිරිහැරයක් වුණා. කලින් සූදානමක් නො කොට, ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කළවිට, ඇතිවන විපත මෙයයි. වඩාත් නරක් වෙන්නේ වෙනත් රටවලින් ණයට ගත්, අපේ සමාජයට නො ගැළපෙන ප්‍රති-සංස්කරණ ඉදිරිපත් කළ විටයි. පුරාණ කාලයේ තිබුණු නිරාදූක මේ අලුත් දඬුවම් ක්‍රමවලට වඩා හොඳයි. ඉතින් අර චින්තකයා මොකද කළේ? මිනිහා නතර වෙලා වට පිට බලා 'මම යන්නේ නැහැ, ප්‍රතිපත්තියක් වශයෙන් මම විරුද්ධ වෙනවා' කියා පාර මැද නිදාගත්තා, ජීවිතය ගැන අවබෝධයක් ලබාගත්, දෙවියන් ගැන විශ්වාස නොකරන, රුසියන් ජාතිකයකු ගේ ආත්මය ගෙන, තල්මහකු ගේ බඩ ඇතුළේ

දවස් තුනක් හා රාත්‍රි තුනක් ගත කළ ජෝනා ගේ ආත්මය සමඟ මිශ්‍ර කොට බලන්න. එතකොට පාර හරහා නිදාගත්ත අර චින්තකයා ගේ චරිතය ගැන දැනුමක් අපට ලබාගන්න පුළුවනි."

"මොනවට ද පාර හරහා නිදා ගත්තේ?"

"නිදාගන්න තැනක් තිබුණු නිසා නිදාගන්න ඇති. මොක ද හිනා වෙන්නේ?"

"මිනිහා බොහො ම නිර්භීතයි"යි ඉවාන් කීවේ පෙර පැවැති උනන්දුවෙන් යුතු ව ය. කිසිසේත් බලාපොරොත්තු නොවූ කුතුහලයකින් ඔහු කතාව අසා සිටියේ ය. "මිනිහා තවමත් එ තැන නිදි ද?"

"අන්න ඒක තමයි වැදගත් දෙය. මිනිහා අවුරුදු දහසක් පමණ කල් එ තැන නිදා ගෙන ඉඳලා, පස්සේ නැගිටල ගියා."

"මිනිහා බූරුවෙක්"යයි ඉවාන් නොසන්සුන් ලෙස සිනා සෙමින් කී ය. තවමත් ඉවාන් කිසියම් දෙයක් ගැන සැලැ-කිල්ලකින් යුතු ව කල්පනා කරන බව පෙනේ. "මිනිහා එ තැන සදාකල්හි ම නිදා සිටීමේත්, කිලෝමීටරයක් ඇවිදීමේත් වෙනසක් තියෙනව ද? කිලෝමීටර දහස් කෝටි ප්‍රකෝටියක් ඇවිදීමට කල්ප ගණනක් ගතවෙනව ද?"

"ඊට වඩා කල් ගතවෙනවා. බොහො ම කනගාටුයි මා ළඟ පැන්සලයකුයි කඩදාසි කොළයකුයි නැතිවට. තිබුණ නම් ගණන් බලා කියන්න තිබුණා. ඒ වුණත් මිනිහා බොහො ම ඉස්සර ගමන අවසන් කොට තිබුණා. එතැන ඉඳලා තමයි කතාව පටන් ගත්තේ."

"මිනිහ ගමන අවසන් කළා? ගමන අවසන් කිරීමට කල්පයක් ලැබුණේ කොහො ම ද?"

"ඇයි එහෙම අහන්නේ? තුඹලා ගේ මේ පෘථිවිය ගැන කල්පනා කරල බලන්න. මේ පෘථිවිය කෝටි වාරයක් ඇති වී යළි නැති වෙන්න ඇති. වරක් අභාවයට යනවා, යළි මිදෙනවා, කෑලිවලට පුපුරනවා, පුපුරා කෑලිවලට වෙන් වී ඊට අයත් මූලික ද්‍රව්‍යවලට පරිවර්තනය වෙනවා. ආයේත් අන්තරීක්ෂයට උඩින් ජලයට පෙරළෙනවා, පෙරළී ධූමකේතුවක් වෙනවා, ධූමකේතුව තරුවක් වෙනවා, තරුවෙන් පෘථිවිය ඇතිවෙනවා,

මේ පරිණාමය කිසි ම වෙනසක් නැති ව අනන්ත අප්‍රමාණ වාරයක් ඔය විදියට ම සිදු වෙන්න ඇති, එය ඉතා අශෝභන, නීරස, වෙහෙස කරවන දෙයක්.........."

"මිනිහා එ තැනට ගියාම මොකද වුණේ?"

"මොකද වුණේ? සවගීයේ දොර ඇරිය හැටියේ ම මිනිහා ඇතුළු වුණා. සවගීයට ඇතුළු වෙලා තත්පර දෙකක්වත් ගියේ නැහැ. මේ තත්පර දෙක කිලෝමීටර දහස්කෝටි ප්‍රකෝටියක් නොව, දහස්කෝටි ප්‍රකෝටි ප්‍රකෝටි ගණනක් වුවත් වටිනවා කියා කෑගෑවා. තත්පර දෙක එයා ගේ ඔරලෝසුවේ හැටියටයි. මගේ කල්පනාවේ හැටියට එයා ගේ ඔරලෝසුව අතරමග දී මූලධාතුවලට දියවී යන්න ඇති. ඇත්ත කියනවා නම් මිනිහා 'දෙවියන්ට ආශීර්වාද වේ වා' කියා කෑගෑවා. කො තරම් කෑගෑව ද කියතොත් එ තැන හිටිය උසස් අදහස් ඇති සමහරු මූල දී මිනිහට අතට අත දී කතාකිරීමට අකැමැති වුණා. ඒ ගොල්ලන්ගේ අදහසේ හැටියට මිනිහා බොහො ම ඉක්මනට ප්‍රතිගාමියෙක් වුණා. ඒක රුසියන් ජාතිකයන් අතරේ දකින්න තියෙන සවභාවයයි. මේක ජනකතාවක්. මා මේ ජනකතාව කීවේ එහි වැදගත් කමක් තියෙන නිසයි. අද වුව ද අපි මේ දේවල් ගැන දරන්නේ මේ විදියේ අදහස් මයි."

"මම නුඹ අල්ලා ගත්තා"යි ඉවාන් දරුවකු මෙන් ප්‍රීතියෙන් කෑගා කීවේ අන්තිමේ දී යම්කිසිවක් සඳහන් වූවාක් මෙනි. "මේ හාස්‍ය ජනක ජනතාව ගෙතුවේ මමයි එතකොට මගේ වයස හවුරුදු දහතයි. ඉස්කෝලෙ යන කාලේ. මම කතාව ගොතා කොරෝකින් කියන මගේ මිත්‍ර පාසල් ශිෂ්‍යයකුට කිව්වා. මා ඒ කාලේ හිටියේ මොස්කව් නුවරයි. මේක කොහෙන්වත් ගන්න එකක් නො වෙයි, මගේ ම නිමැණුයක්. මට කතාව අමතක වෙලයි තිබුණේ. මට දැන් කතාව නොකල්පනාවෙන් ම මතක් වුණා. මම කතාව මට ම කියා ගත්තා මිස නුඹ මට කිව්වේ නැහැ. පෝරකයට ගෙන යන විට පවා කෙනකුට නොකල්පනාවෙන් ම වාගේ දහයක් දේවල් මතක් වෙනවා. මට මේ කතාව මතක් වුණේ සිහිනෙන්. එතකොට ඒ සිහිනය නුඹයි. නුඹ සිහිනයක් මිස හැබෑඹින් සිටින කෙනෙක් නො වෙයි."

"මා ජීවත් ව සිටින්නකු නොවන බව මූරගා කියන හැටියෙන් මට හොඳට ම පෙනෙනවා නුඹ මා ගැන විශ්වාස කරන බව"යි අමූත්තා සිනා සෙමින් කී ය.

"නුඹ ගැන අබමල් රේණුවක් තරම්වත් මම විශ්වාස කරන්නේ නැහැ. මංචාඩියක සියෙන් කොටසක් වත් විශ්වාස කරන්නේ නැහැ."

"නමුත් දහසෙන් කොටසක් විශ්වාස කරනවා. දස දහසකින් කොටසක් වත් විශ්වාස කරන බව කියන්න."

"නැහැ, මොහොතකටවත් නුඹ ගැන විශ්වාස කරන්නේ නැහැ" යි ඉවාන් කෝපයෙන් කී ය. "නමුත්, කොහොම වුණත් නුඹ ගැන විශ්වාස කරන්න පුළුවන් නම් මා කැමැතියි." ඉවාන් අනතුරු ව පුදුමයට මෙන් කී ය.

"අන්න පිළිගත්තා. මම හොඳ මිතියෙක්. මම නැවත නුඹට පිහිට වෙන්නම්. මා කියන දෙය හොඳට අහගන්න. නුඹ මට අහුවුණා මිස මා නුඹට අහුවුණේ නැහැ. නුඹට අමතක වූ කතාව මම නුඹට කිව්වේ මා ගැන නුඹ තුළ ඇති විශ්වාසය සම්පූර්ණයෙන් ම නැති කිරීමටයි."

"නැහැ, නුඹ කියන්නේ බොරු. මා හමු වෙන්න ආවේ නුඹ හැබෑසිත් සිටින්නකු බව මට ඔප්පු කිරීමටයි."

"ඇත්ත. නමුත් පසුතැවිල්ල, කුතුහලය, විශ්වාසය හා අවිශ්වාසය අතර පවතින ගැටුම, නුඹ වැනි සිහිබුද්ධිය තියෙන අයට ඇතැම් විට මහත් වේදනාවක් වෙනවා. ඒ වේදනාව විඳිනවාට වඩා හොඳයි බෙල්ලේ වැල දමා ගන්නවා. මා ගැන විශ්වාස කිරීමට නුඹ තුළ පෙලඹීමක් ඇතිවන බව මට දැනුණ නිසා නුඹ තුළ අවිශ්වාසයක් ඇති කිරීම පිණිස මම කතන්දරය කිව්වා. වරක් මම නුඹ තුළ විශ්වාසය ඇති කරලා, අනෙක් මොහොතේ ඒ විශ්වාසය නැති කරනවා. මා එහෙම කළේ කිසියම් අදහසක් ඇතිවයි. මේක අලුත් ක්‍රමයක්. මා ගැන නුඹ තුළ පවතින විශ්වාසය සම්පූර්ණයෙන් ම නැති වූ වහා ම නුඹ මට ඔප්පු කරාවි මා සිහිනයක් නො ව හැබෑසිත් සිටින කෙනකු බව. මම නුඹේ ගති ගුණ හොඳට දන්නවා. ඊට පස්සේ මම මගේ අභිමතාර්ථය මුදුන්පත් කරගන්නවා. මගේ අභිමතාර්ථය බොහෝ ම අවංකයි. මම නුඹේ හිතේ භක්තිය නමැති කුඩා බීජය රෝපනය කරනවා. ඒ බීජය විශාල ගසක් මෙන් වැඩේවි. ඒ ගස උඩ සිටින නුඹ තුළ, මරුකතරේ තවුස්දම් රකින තවුසන්ට හා සාන්තුවරයන් වැනි කන්‍යා සත්‍රීන්ට එකතු වීමට ලොකු ආශාවක් ඇති වේවි. නුඹ, හිත යටින් පතන්නේ එ වැනි තත්ත්වයක් ලැබීමටයි. නුඹේ

ආත්මය ගලවා ගැනීම සඳහා තුඹ පලාබිරවුත් වැනි සතුන් හා ජීවත් වෙමින් මරුකතරේ ඇවිදීවි."

"තක්කඩියා, එහෙනම් තුඹ මේ සේරම කරන්නේ මගේ ගැලවිල්ලට ද?"

"මිනිහෙක් වුණොත් ඉඳහිටවත් හොඳ වැඩක් කළ යුතුයි. තුඹ බොහො ම කිපුණා වගෙයි. මට ඒ බව හොඳට පේනවා."

"මෝඩයා, කුරුමිණියත් කමින්, ඇගේ පාසි බැඳෙන තෙක් අවුරුදු දහතක් යාච්ඤා කළ බැතිමතුන් පොළඹවන්න වැයම් කළා ද?"

"මිත්‍රයා, ඒ හැරෙන්නට මා වෙන කිසි ම දෙයක් කරලා නැහැ. තුඹ මේ මුළු ලෝකයත්, අනෙක් ලෝක සියල්ලත් අමතක කරලා, මේ වගේ මිනිසකු අත්නොහැර සිටින්නේ ඒ මිනිහා මැණිකකට සමාන නිසයි. දන්නව ද, එ වැනි කෙනෙක් සමහරවිට චක්‍රවාටයකට වඩා වටිනවා.........අපට තියෙනවා විශේෂ ගණිත ක්‍රමයක්. එ වැනි මිනිසකු මැඩ ජය ගැනීම බොහො ම වටිනා දෙයක්. තුඹ විශ්වාස නො කළත්, සමහරක් අය නැණ උගත්කමින් තුඹට වඩා පහත් නොවන බව මට සථිර ව කියන්න පුළුවනි. එක ම මොහොතේ දී, විශ්වාසය හා සැකය ගැන සිතේ පතුලට ම බැස මෙනෙහි කරන මේ මිනිසුන්ට පිස්සු නොවැටීම මහ පුදුමයක්!"

"ඉතින් වැඩේ හරිගියේ නැද්ද?"

"'සාළුවා, නහය සම්පූර්ණයෙන් ම නැති කරගෙන සනවට වැඩිය හොඳයි නහය ඇදගන්නවා.' මේ කතාව රෝගාතුර වූ වංශාධිපතියෙක් ජේසුවිට් පූජකයකුට පාපෝච්චාරණය කරන අතර කිච්චා. ඒ වෙලාවේ මාත් එ තැන හිටියා. බලාඉන්න අහෙයි. 'මගේ නහය ආපසු දියන්' කියමින් මිනිහා පපුවට ගහගත්තා. 'පුතා, මේ ලෝකේ හැම දෙයක් ම සිද්ධවෙන්නේ දෙවියන් වහන්සේ ගේ තේරුම් ගත නොහැකි නීගමනය අනුවයි. සමහර විට මහා විපත්තියකින් බලාපොරොත්තු නොවූ යහපතක් සිද්ධවෙනවා. නපුරු දෛවයක් නිසා තුඹේ නහය නැති වුණා. නමුත් මීට පස්සේ, මුළු ජීවිතයට ම කිසි ම කෙනකුට අඳින්නට නහයක් නැති නිසා, නහය නැතිවීමෙන් තුඹට සිද්ධවුණේ යහපතක්.' 'ශුද්ධ වූ පියාණෙනි! ඔය කතාවෙන් මගේ හිත සැනසෙන්නේ නැහැ. මගේ නහය තියෙම්

නැත තියෙනවා නම් හැම දා ම වුණත් මගේ නහය අදිනවාට මා කැමැතියි' කියා බලාපොරොත්තු සුත් වූ මිනිහා කිව්වා. 'දරුව හැම ආශිර්වාදයක් ම එකවිට ඉල්ලා සිටීම වැරදියි. එය දෙවියන් වහන්සේට විරුද්ධ ව යටිහිතින් දෙස් කීමකට සමාන වෙනවා. මේ අමාරු අවස්ථාවේ දී පවා එතුමා නුඹ අමතක කළේ නැහැ. දූන් නුඹ කියනවා වගේ මුළු ජීවිතයට ම නහය අදිනවාට නුඹ කැමැති නම්, අනියම් ක්‍රමයකින් නුඹේ ඒ කැමැත්ත දූනට ම සාර්ථක වී තියෙනවා. නහය නැති වීමෙන් අදහස් වන්නේ නහය අදින බවයි.''

''කොතරම් මෝඩ කතාවක් ද!''යි ඉවාන් කී ය.

''මිත්‍රයා මට උවමනා කළේ නුඹ විනෝද කිරීම පමණයි. නමුත් මෙය ජේසුවිට්වරුන් ගේ නියම ධර්ම විචාර ක්‍රමය බව මට දිව්රා කියන්න පුළුවනි. මා කියාපු හැම වචනයක් ම ඇත්ත බව දිව්රා කියන්න පුළුවනි. මේ සිද්ධිය වුණේ මෑත දීයි. ඒකෙන් මටත් ලොකු හිරිහැරයක් වුණා. දුකින් සිටිය ඒ තරුණයා ගෙදර ඇවිදින් එදා රෑ ම වෙඩි තියාගෙන මලා. අන්තිම මොහොත වන තෙක් මම මිනිහ ළඟ හිටියා........ නමුත් අර පූජකයා ගේ ධර්මානුශාසනාව තමා මා ශෝකයෙන් සිටින විට සිත විනෝද කරගැනීම පිණිස කියන කතාව. දූන් වික දිනකට කලින් සිද්ධ වූ තවත් දෙයක් කියන්නම්. හවුරුදු විස්සක් පමණ වයසැති, රන්වන් හිස කෙසින් යුත්, නෝර්වේ ජාතික ළමිස්සියක් පූජකයකු ළඟට පව් සමාකර- ගැනීම පිණිස ගියා. ඈ හොඳට ඇඟපත මහත ලක්ෂණකාරියක්. දූකපු ඔනෑ ම මිනිහකු ගේ කටට කෙළ උනනවා ඉතින් මේ ළමිස්සි මහලු පූජකයා ළඟට ගිහින් පහත්වී, දූල තුළින් බොහො ම සෙමෙන්, කළ පව් කිව්වා. 'අනේ දුව උඹ මය තරම් ඉක්මනට තව වතාවක් පාපයේ බැඳුණා ද? සත්ත මරියා! උඹ තව වතාවක් පාපයේ බැඳුණේ ඒ මිනිහා එක්ක ද? කොපමණ කාලයක ඉඳලද මේ වැඩේ කරන්නේ? ලැජ්ජා නැද්ද?'යි මහලු පූජකයා ඇසුවා.

''පව්කාරිය මෙසේ පිළිතුරු දුන්නා. පශ්චාත්තාපයෙන් හටගත් කඳුළු ඇගේ කම්මුල් දිගේ ගලා බැස්සා.

'''අනේ පියතුමාණෙනි, ඔහුට එය ලොකු සැපතක්, නමුත් මට දුකක්.' ඉතින් ටිකක් කල්පනා කරල බලන්න ඈ දුන්න පිළිතුර ගැන. මම එ තැනින් ඉවත් වුණා. ඒක ස්වාභාවික අවශ්‍යතාවක්. ස්වභාවධර්මය කෑගා කියන කතාවක් වගෙයි. නුඹ

කැමැති නම් ඒක අහිංසක කමට වඩා හොඳයි කියන්න පුළුවනි. මම එ තැන දී ම ඇගේ පව් සමා කොට යන්න හැරුණ. නමුත් මට බලයෙන් ම ආපසු යන්න සිද්ධවුණා. මට ඇහුණා අර නාකි පූජකයා, එදා සවස ඇය සමග හාදකමක් ඇතිකර ගැනීමට දූල තුළින් ඇය කැමැති කර ගත්තාවා. ඒ නාකි මිනිහා, ගිනි ගලක් වගේ හයිය හක්තිය තිබුණත් අර ළමිස්සිට වසඟ වුණා. ඒ සවභාධර්මයේ හැටි තමයි සවභාධර්මීය සිය අයිතිය තහවුරු කර ගැනීමේ සත්‍යයයි. මොකද අහක බලා ගත්තේ? තව වතාවක් තරහ වුණා ද? තුඹේ සිත කොහොම සතුටු කරන්න ද කියා මට තේරුම් ගන්න බැහැ....... ”

“කරුණා කරල මට හිරිහැර නො කර ඉන්න. භයානක සිහිනයක් වගේ තුඹ මගේ මොළයට වද දෙනවා”යි ඉවාන් තමාගේ ම අවතාරය ඉදිරිපිට අසරණ කාලකණ්ණියකු මෙන් කෙඳිරි ගෑවේ ය. “තුඹ මහ කරදරකාරයෙක්. තුඹ මහ වදයක්. තුඹෙන් නිදහස් වෙන්න පුළුවන් නම් ඕනෑ ම දෙයක් දෙන්නම්.”

“තුඹේ බලාපොරොත්තුවල සීමාවක් තිබිය යුතුයි කියා මම ආයෙත් වරක් කියනවා. බොහො ම ලක්‍ෂණ, බොහො ම ශ්‍රේෂ්ඨ හැම දෙයක් ම මගෙන් බලාපොරොත්තු වෙන්න එපා. එහෙම කළොත් අප දෙන්නාට බොහො ම හොඳට කලදවස ගෙවන්න පුළුවනි”යි අමුත්තා සිත් ගන්නා කට හඬින් කීවේ ය. “ඇත්ත කියනවා නම් තුඹ මා සමග තරහ මා රතු ආලෝකයක් පිට කරගෙන, මේඝගර්ජනා කරගෙන, ගින්නෙන් පිළිස්සුණ පියාපත් ඇති ව නොපැමිණ, බොහො ම නිහතමානී ලෙස පෙනී සිටීම නිසයි. පළමු ව, තුඹේ කලාත්මක හැඟීම් නිසා තුඹේ සිතේ වේදනාවක් ඇති වී තියෙනවා. දෙවනු ව, තුඹේ උඩඟු සිත පැරුණා. මා වැනි අශිෂ්ට යක්‍ෂයෙක්, තුඹ වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් හමුවීමට ආවේ කෙසේ ද? බිලින්ස්කි විසින් බොහෙ ම සමච්චල් කරන ලද අද්භූත රසයට ඇති ආශාව තුඹ තුළ තියෙනවා. ඉලන්දරියා, තුඹ හමුවීමට එන්න ලැස්තිවන කොට මට කල්පනා වුණා, විහිළුවට වාගේ කඛාගේ පදක්කම් පැලඳගත්, කෝකසස් ප්‍රදේශයේ සේවය කොට විශ්‍රාම ලත්, සේනාධිපතියකු ගේ සවරූපයෙන් එන්න. ඇත්ත කියනවා නම් එහෙම එන්න මට භය හිතුණා. පදක්කම් පැළඳ ගත්ත නිසා තුඹ මට සමහර විට තලන්න පුළුවනි. තුඹ මට නිතර කියනවා මා මෝඩයෙක් ය කියා. තුඹේ පාණ්ඩිත්‍යයට සමාන පාණ්ඩිත්‍යයක් මට තියෙනවා ය කියා මා කියන්නේ නැහැ.

තමා තුළ පව් කිරීමට මහත් ආශාවක් ඇතත්, තමා කරන්නේ යහපත් වැඩ පමණක් බව මෙෆිස්ටෝෆිස් පියේස්ට කිව්වා. තමා කැමැති දෙයක් කිරීමට ඔහුට නිදහස තියෙනවා. නමුත් මා ඊට ඉඳුරා වෙනස් කෙනෙක්. සමහර විට මේ මුළු මැවිල්ලට ම අයත්, සත්‍යයට ගරුකරන, අවංක ව ම යහපතට කැමැති එක ම පුද්ගලයා මා විය යුතුයි කුරුසය මත මිය ගිය එතුමා, පව් කළ සොරා ගේ ආත්මය සිය හදවතින් ගෙන දෙව්ලොවට වඩින විට මම එ තැන හිටියා. 'දෙවියන්ට ආශිර්වාද වේ වා' කියමින් කුඩා දේව දූතයන් කළ ගී ගැයීමත්, කෑගෑමත්, මහා දේව දූතයන් දෙව්ලොවත් මුළු මැවිල්ලත් දෙවනත් කරමින් නැගූ ප්‍රීති ඝෝෂාවත් මා අසා සිටියා. ඔවුන්ට එකතු වී 'දෙවියන්ට ආශිර්වාද වේ වා' කියා කෑගෑමට මා තුළ ලොකු ආශාවක් තිබුණ බව මට ශුද්ධ වූ හැම දෙයක් ගැන ම දිව්රා කියන්න පුළුවනි. ඒ වචන තව ටිකින් මගේ කටින් පිට වෙනවා.........
දන්නවා නේද බොහොම පහසුවෙන් මගේ හැඟීම් ඇවිස්සෙන බව. සෞන්දර්යයට මගේ ලොකු කැමැත්තක් තියෙන බව. නමුත් මගේ චරිතයේ බලපවත්වන ඉතා කනගාටුදායක ලක්ෂණය වන සහජබුද්ධිය, මා දමනය කරගත්ත නිසා මම නිහඬ ව සිටියා. යම් විදියකින් මම 'දෙවියන්ට ආශිර්වාද වේ වා' කියා කෑගැව්වා නම් මොකද වෙන්නේ? කියා මම කල්පනා කළා. එහෙම කෑගැව්වා නම් මේ ලෝකයේ හැම දෙයක් ම නිවී අඳුරු වෙනවා. ඊට පස්සේ කිසි ම දෙයක් සිද්ධවෙන්නේ නැහැ. ඉතින්, හුදෙක් මගේ සමාජ තත්ත්වයත්, යුතු කම් පිළිබඳ හැඟීමත් නිසා ඒ යහපත් මොහොත පසුවී යාමට ඉඩ හැර, මගේ පිළිකුල් කටයුතු රාජකාරිය කළා. යහපත් දෙයට ලැබෙන සියලු ප්‍රශංසා වෙන අයකුට ලැබෙන අතර මට හැම අප්‍රිය වැඩක් ම කිරීමට සිද්ධ වෙනවා. නමුත් වංචාසහගත ජීවිතයක් ගත කිරීමෙන් ලැබෙන ගෞරවයට මගේ කිසි ම ඊර්ෂ්‍යාවක් නැහැ. මම එ තරම් කීර්ති ප්‍රශංසාවට කැමැති මිනිහෙක් නො වෙයි. සියලු සතුන් අතරින් මා පමණක්, යහපත් ශිෂ්ට මනුෂ්‍යයන් ගේ සාපයට හා පා පහරට ගොදුරු වූයේ මන්ද? මිනිස් වෙස් ගත්තොත් ඇතැම් විට එ වැනි අකර-තැබ්බවලට මුහුණ පෑමට සිදු වෙනවා. මා දන්නවා එහි රහසක් තියෙන බව. නමුත් උන් මට කිසි ම රහසක් කියන්නේ නැහැ. සමහර විට මා එහි අර්ථය තේරුම් ගෙන 'දෙවියන්ට ආශිර්වාද වේ වා' කියා මා කෑගසාවි ය කියා උන් හිතනවා ඇති. එවිට අයහපත නැති වී ගොස් මුළු ලොවේ ම යහපත රජ කරනවා ඇති. එහෙම වුණොත් එ තැනින් හැම දෙයක් ම

අවසන් වෙනවා. වෙනෙකක් තබා පුවත්පත් හා සඟරාදියත් අවසන් වෙනවා. යහපත රජ කරන විට කවුද පුවත්පත් සඟරාදියට ලිපි සපයන්නේ? කවුද පුවත් පත් සඟරාදිය කියවන්නේ? අවසානයේ දී මා දන්නවා මට සමාදානය ලැබෙන බව. මට අයත් කිලෝමීටර දහස් කෝටි ප්‍රකෝටිය ඇවිදීමෙන් පසු ව මට රහස දැන ගන්න පුළුවනි. එතෙක් මම මහත් නොකැමැත්තෙන් වුව ද එක් අයකු ගේ ගැලවිල්ල පතා දහසක් දෙනා විනාශ කිරීමේ මට අයත් කටයුත්ත ඉෂ්ට කරනවා. එක යහපත් මිනිසකු වන ජෝබ් වෙනුවෙන් මා මිනිසුන් කී දෙනෙක් විනාශ කළා ද? යහපත් අවංක මිනිසුන් කී දෙනෙ-කුගේ චරිතය කිලුටු කළා ද? ඒ ඈත කාලයේ දී ඒ මිනිහා නිසා මට මෝඩයකු ලෙස සැලැකුවා. ඔව් ඒක එහෙම තමයි. රහස හෙළිවන තෙක් මා සතු සත්‍ය දෙකක් තියෙනවා. ඉන් එකක් ඔවුන් සතු සත්‍යයයි. මා ඒ සත්‍යය ගැන කිසි ම දෙයක් දන්නේ නැහැ. දෙවැන්න මා සතු සත්‍යයයි. මෙ දෙකින් කොයි එක හොඳ වේ ද කියන්න බැහැ.........නුඹ නිදි ද?''

''නින්ද ගියා නම් මා කැමැතියි'' ඉවාන් කෝපයෙන් කෙඳිරි ගා කී ය. ''මගේ සියලු ම මෝඩ අදහස්, මා මීට බොහෝ පෙර අත් දුටු දේවල්, සිතින් තර්ක කොට මළ කුණක් මෙන් බැහැර කළ දේවල්, නුඹ මට අලුත් දේවල් හැටියට පෙන්නා දෙන්න වෑයම් කරනවා.''

''නුඹ ලෙහෙසියෙන් සතුටු කරන්න බැහැ. මගේ රචනා ශෛලියෙන් වත් නුඹ සතුටු කරන්න පුළුවන් ය කියා මම කල්පනා කළා. දෙව්ලොවේ දී දෙවියන්ට ආශිර්වාද වේ වා යි කී කතාව එ තරම් නරක නැහැ නේ ද?''

''නැහැ, මා එ වැනි නීචයෙක් නො වෙයි. එසේ නම නුඹ වැනි නීචයෙක් මගේ සිතින් මවා ගන්නේ කොහොම ද?''

''මිත්‍රයා, කාගේත් සිත් ගන්නා බොහො ම ලක්ෂණ රුසියන් ජාතික තරුණ මහතෙක් මම ඇඳිනගෙන සිටියා. ඒ ඉලන්දාරියා චින්තකයෙක්. සාහිත්‍ය හා කලා රසිකයෙක්. බලාපොරොත්තු ඇති කර ගත හැකි, 'කතෝලික ධර්මාධිකරණයේ නායකයා' යන උසස් කාව්‍යයෙහි කර්තෘ. මා ඒ තරුණයා ගැනයි කල්පනා කළේ.''

'''කතෝලික ධර්මාධිකරණයේ නායකයා' කාව්‍ය ගැන කතා නොකරන ලෙස මම නුඹට අණ කරනවා''යි ඉවාන් කී ය. ඔහු ගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය.

"එහෙනම් 'භූගර්භවිද්‍යාජලප්‍රවාහය' කාව්‍යය මතක ද?"

"කට වහගෙන හිටියේ නැති නම් මම තුඹ මරනවා."

"මා මරන්න? බොහො ම කනගාටුයි. මොනව කළත් කියන්න තියෙන දෙය කියනවා. මා පැමිණියේ තුඹ සමග කතා කොට ප්‍රීතිවීමටයි. ජීවිතයට ඇති ආසාවෙන් වෙවුලන, මගේ රාගාධික තරුණ මිත්‍රයන් දකින සිහිනවලට මම බොහො ම කැමැතියි. 'හැම දෙයක් ම විනාශ කොට ආයේත් මිනී මස් කෑමෙන් ජීවිතය ආරම්භ කිරීමට කැමැති අලුත් මිනිසුන් ඉන්නවා ය' කියා තුඹ ගිය වසන්ත සෘතුවේ දී මෙහාට එන්න ඉස්සෙල්ලා කිව්වා. උන් සේරම මෝඩයෝ. උන් කවදාවත් මගේ අවවාද අනුශාසනා පිළිගත්තේ නැහැ. මගේ කල්පනාවේ හැටියට කිසි ම දෙයක් විනාශ කරන්න කොහෙත්ම උවමනාවක් නැහැ. විනාශ කළ යුතු එක ම දෙය මිනිස් වර්ගයා ගේ සිතේ තිබෙන දෙවියන් පිළිබඳ විශ්වාසයයි. අන්න ඒ තැනින් තමයි පටන් ගන්න ඕනෑ.........ඔව්, අපි ඒ තැනින් තමයි පටන් ගන්න ඕනෑ..... උන් ඇස් අන්ධ කරගත්ත මෝඩයෝ. උන්ට කිසි ම දෙයක් තේරුම් ගන්න බැහැ. අන්තිම මිනිහා දක්වා, මුළු මිනිස් වර්ගයා ම දෙවියකු නැති බව පිළිගත් වහා ම, මෙතෙක් කල් මිනිසා ජීවිතය හා ලෝකය ගැන ඇති කරගෙන සිටිය පැරණි අදහස් මිනීමස් නො කා වෙනස් වෙනවා. පැරණි සදාචාරය නැති වී ගොස් අලුත් යුගයක් උදා වෙනවා. මේ ලෝකයේ ප්‍රීතියත් සැපතත් පතා ජීවිතයෙන් ලබා ගත හැකි සියලු දෙයක් ම ලබා ගැනීම පිණිස මිනිසා එකතු වී සහයෝග-යෙන් වැඩ කරා වි. මිනිසා දිව්‍යමය වූ ප්‍රබල අභිමානයකින් නැගී සිටින විට, මිනිස් දෙවියා ලොව පහළ වෙයි. මිනිසා ඔහු ගේ විද්‍යාවෙන් හා ආත්ම ශක්තියෙන් හැම පැයක් පාසා ම සොබාදහම නතු කරගන්නා විට ඔහු තුළ උතුම් ප්‍රීතියක් ඇති වෙයි. ඒ ප්‍රීතිය, මිනිසා දෙව්ලොව දිව්‍ය සම්පත් ගැන දකින සිහින සහ ප්‍රීතියට වඩා ශ්‍රේෂ්ඨ වෙයි. සියලු දෙනා ම අනිත්‍යය සිහි කොට, තමා මැරෙන බව දැන, දෙවියකු මෙන් සන්සුන් සිතින් හා අභිමානයෙන් යුතු ව මරණයට මුහුණ පානවා ඇත. ජීවිතය ඉතා කෙටි බව සිතා ලතවීම නිෂ්ප්‍රයෝජන දෙයක් බව ඔහු ගේ අභිමානය ඔහුට උගන්වනවා ඇත. එවිට ඔහු කිසි ම ලාභ ප්‍රයෝජනයක් නො තකා, ඔහු ගේ සහෝදරයාට මෛත්‍රිය කරනවා ඇත. ප්‍රේමය ප්‍රමාණවත් වන්නේ ජීවිතයේ මොහොතකට පමණයි. නමුත් ප්‍රේමයේ ක්ෂණික පැවැත්ම ගැන සිතේ ඇති වන දැනුම ප්‍රේමයේ

කිත්න දල්වා තබනු ඇත. නමුත් දූත් ඒ ගිත්න මරණයෙන් පසු ලැබෙන සදාකාලික ප්‍රේමය ගැන සිතා විනාශ වී ඇත." මෙසේ ඔහු එක හුස්මට නො නවත්වා කතා කෙළේ ය. කො තරම් ලක්ෂණ ද!

ඉවාන් බිම බලා, දූතින් කන් වසා ගෙන සිටියේ ය. ඔහු ගේ සර්වාංගය ම වෙවුලන්නට විය. නමුත් අමුත්තා නො නවත්වා කතා කෙළේ ය.

"මෙ වැනි කාලයක් පැමිණිය හැකි ද? කියා මගේ තරුණ චින්තකයා කල්පනා කළා. අන්න ඒකයි ප්‍රශ්නය. එ වැනි කාලයක් පැමිණියොත් හැම දෙයක් ම නිරාකරණය වී, මනුෂ්‍ය වර්ගයා ගේ සියලු ම බලාපොරොත්තු සපල වෙනවා. නමුත් මිනිසුන් තුළ මුල් බැස ගත්ත මෝඩකම් නිසා අඩු ගණනේ තව හවුරුදු දහකින්වත් එ වැනි කාලයක් නො ලැබෙන්න පුළුවනි. සත්‍ය දන්නා හැම දෙනාට ම පුළුවනි මේ අලුත් ප්‍රතිපත්තිවලට එකඟ ව, තමා රිසි ලෙස ජීවත් වෙන්න. ඒ අනුව ඕනෑ ම දෙයක් කිරීමට ඔහුට අවසර තිබෙනවා. ඒ අභිනව කාලය නො පැමිණි-යත්, සදාකාලිකත්වයත්, දෙවියකුත් නැති නිසා මේ අලුත් මිනිසාට මිනිස් දෙවියකු වීමට ඉඩ තියෙනවා සමහර විට මුළු ලොවේ ම සිටින එක ම මිනිස් දෙවියා ඔහු විය හැකි යි. අභිනව තත්ත්‍වයට පැමිණි එක ම තැනැත්තා ඔහු විය හැකියි. මෙසේ මේ අලුත් තත්ත්‍වයට පැමිණි මිනිසාට අවශ්‍ය යැයි හැඟුණොත්, පැරණි මිනිසා දාසයන් බැඳ තැබූ පැරණි ගුණ දහම් පිළිබඳ නීති රීති ඉක්මවා යන්න පුළුවනි. දෙවියන්ට නීතියක් රීතියක් නැහැ. දෙවියන් සිටියේ යම් කිසි තැනක ද එ තැන ශුද්ධ වූ තැනක් වෙනවා. මා සිටින ස්ථානය එක් වර ම අග්‍රස්ථානය වෙනවා. ...... හැම දෙයක් ම නීතියට එකඟයි එ නිසා ත් එහාට ප්‍රශ්නයක් නැහැ. මේවා කොයි දෙයත් බොහො ම හොඳයි. නමුත් තුඹට අපරාධකාරයකු වගේ ජීවත්වෙන්න උවමනා, නම් ඒ සඳහා සත්‍යයෙන් අවසර උවමනා කරන්නේ මොනවට ද? අපේ නවීන රුසියාවේ හැටි ඔහොම තමයි. සදාචාරයේ අවසර නැති ව අපරාධ කරන්න බැහැ. ඔහු සත්‍යයට එ තරම් ගරු කරනවා........."

තමා ගේ කපිකත්වයෙන් තෝන්තු වූවකු වාගේ අමුත්තා නො නවත්වා කතා කෙළේ ය උස් හඬින් කතා කළ ගෙතෙම ඉවාන් දෙස සමච්චල් බැල්මෙන් බැලුවේ ය. නමුත් ඔහුට සනාථව අවසන් කළ නො හැකි විය. ඉවාන් හදිසියෙන් ම මේසය උඩ තිබුණු වීදුරුව ගෙන අමුත්තාට දමා ගැසුවේ ය.

වහා පුටුවෙන් නැගී සිටි අමුත්තා කබායේ රැඳුණු තේ පිස දැම්මේ ය. "තුඹට ලූතර්ගේ තීන්ත බෝතලය මතක් වෙලා, මා හීනයක් යයි සිතා, ඒ හීනයට වීදුරුවෙන් දමා ගැසුවා. තුඹ හරියට ගෑනියක් වගෙයි. තුඹ බොරුවට කන වහගෙන හිටියට මගේ කතාව අසා සිටිය බව මම දැනගත්තා."

ඒ මොහොතේ දී කවුළුවට නො නවත්වා වේගයෙන් කවුළුවට ගසන්නට විය. ඉවාන් වහා සෝපාවෙන් නැගී සිටියේ ය.

"ජතේලයට ගහනවා ඇහෙන්නේ නැද්ද? ඉක්මනට දොර අරින්න. ජතේලයට ගහන්නේ තුඹේ මල්ලි අලෝෂා. බොහො ම වැදගත් ආරංචියක් තියෙනවා කියන්න."

"කට වහගෙන හිටපන් වංචාකාරයා! තුඹ කියන්න ඉස්සෙල්ලා මා දැනගෙන හිටියා ජතේලයට ගහන්නේ අලෝෂා බව. අලෝෂා හොඳ ආරංචියක් ඇතුව මිස නිකම් එන්නේ නැහැ"යි ඉවාන් උමතු වූවකු මෙන් කී ය.

"ඉක්මනට දොර අරින්න. එළියේ හිම කුණාටුවක් හමනවා. කුණාටුවට අහුවෙලා ඉන්නේ තුඹේ මල්ලී නේද? මේ වෙලාවේ බල්ලකුටවත් දෙව්ට බහින්න බැහැ."

කවුළුවට ගැසීම නො නැවතිණි. වහා දිව ගොස් දොර ඇරීමට ඉවාන්ට උවමනා විය. නමුත් යම් කිසිවක් ඔහු ගේ දෙපා හා දෑත ද බැඳගෙන සිටින්නාක් මෙන් දැනිණි ඒ දම්වැල් කඩා දැමීමට ඔහු වෑයම් කෙළේ ය. ඒ වෑයම නිෂ්ඵල විය. කවුළුවට ගසන හඬ ද වේගයෙන් ඇසේ. අන්තිමේ දී දෙපා බඳින ලද දම්වැල් කැඩී ගිය පසු, ඉවාන් වහා සෝපාවෙන් නැගී සිටියේ ය. ඔහු උමතු වූවකු මෙන් වට පිට බැලුවේ ය. දූල් වෙමින් තිබුණු ඉටිපන්දම් දෙක ම අවසන්වීමට කිට්ටු විය. මොහොතකට කලින් අමුත්තාට දමා ගැසූ වීදුරු බඳුන මේසය උඩ තිබිණි. අනෙක් පැත්තේ තිබෙන සෝපාව උඩ කිසිවෙක් හිඳ නොසිටියේ ය. කවුළුවට ගසන හඬ ඉතා සෙමෙන් ඇසේ.

"මේක සිහිනයක් නො වෙයි. මට දිවිරා කියන්න පුළුවනි සිහිනයක් නොවන බව. මේ හැම දෙයක් ම දැන් ටිකකට පෙරයි සිදුවුණේ." මෙසේ පැවැසූ ඉවාන් වහා කවුළුව ළඟට ගොස් පියන ඇරියේ ය.

"මම තුඹට කිව්වා තේද එන්න එපා ය කියා!"යි ඔහු කෝපයෙන් අලෝෂාට කී ය. "මොකද ආවේ? ඉක්මනට කියාපන්."

"දැන් පැයකට පමණ කලින් පැවල් එල්ලීලා මළා"යි අලෝෂා මිදුලේ සිට කී ය.

"ඉස්සරහ දොර ලඟට එන්න. මම දොර අරින්නම්"යයි පැවැසූ ඉවාන් වහා දොර ඇරීමට ගියේ ය.

දහ වන පරිච්ඡේදය

ඔහු ඒ බව කීවේ ය

පැයකට පමණ පෙර, මාෆා පැමිණ, පැවල් පණ නසාගත් බව තමාට කී බව අලෝෂා ඉවාන්ට කීවේ ය. "මම බොසිලේරුව අරන් එන්න කාමරයට ගියා. බිත්තියේ ගහපු ඇනයකින් පැවල් එල්ලී ඉන්නවා දුටුවා"යි මාෆා කීවා ය. "ඒ බව පොලීසියට දැන්වූවා ද?"යි අලෝෂා විමසූ විට තමා කිසිවකුට නොකී බව ඈ කීවා ය. "තමුන්නාන්සේට කියන්න දුවගෙන ආවා"යයි ඈ උමතුවෙන් සිටින්නකු මෙන් කීවා ය. මෙසේ පැවැසූ අලෝෂා සුළඟට වැනෙන කොළයක් මෙන් වෙව්ලන්නට විය. අලෝෂා, මාරියා සමඟ දිවයන විට පැවල් එල්ලී සිටියේ ය. "මම මගේ ජීවිතය මගේ කැමැත්තෙන් ම නැති කර ගනිමි. එ හෙයින් මගේ මරණය ගැන කිසිවකුට දොස් නො කිය යුතුයි." සඳහන් ලියුමක් මේසය උඩ තිබිණි. අලෝෂා ලියුම තිබුණු තැන ම තබා පොලිස් කපිතන් හමුවීමට ගියේ ය. "මම පොලිස් කපිතන් ලඟ ඉඳලා කෙළින් ම අයියා හමුවෙන්න ආවා"යි කියමින් අලෝෂා අත්තිමේ දී කතාව අවසන් කළේ ඉවාන් ගේ මුහුණ දෙස බලමිනි. ඉවාන් ගේ මුහුණේ ස්වභාවය ගැන සැලැකිලිමත් වූ අලෝෂා කතා කරන අතරේ මුහුණෙන් නෙත් ඉවත නො ගත්තේ ය

"මොකද අසනීපයෙන් ද? මා කියන දෙය තේරුම් ගන්න බැරිවා වගෙයි" අලෝෂා විමසුවේ ය.

"ඇපු එක හොඳයි." කල්පනාවේ ගිලී සිටි ඉවාන් කීවේ අලෝෂා කී දෙය නෑසුණාක් මෙනි. "පැවල් පණ නහගන්න බව මම දැනගෙන හිටියා."

"කාගෙන් ද දැන ගත්තේ?"

"කාගෙන් දැනගත්තා ද කියා මම දන්නේ නැහැ. නමුත් මා දැන ගෙන හිටියා.........ඇයි මා දැන ගෙන හිටියේ නැද්ද? දැන් ටිකකට ඉස්සෙල්ලා ඔහු මට කිව්වා"යි කාමරය මැද සිටි ඉවාන් බිම බලාගෙන කල්පනා කරමින් කී ය.

"කවුද ඔහු කියන්නේ?"යි අලෝෂා ඇසුවේ ඉබේට ම වාගේ වට පිට බලමිනි.

"මිනිහ පැනල ගියා."

ඉවාන් හිස උස්සා සෙමෙන් සිනාසුණේ ය.

"මිනිහ මල්ලිට භය වුණා. තුඹ වගේ පරෙවියකුට භය නො වී සිටියි ද? තුඹ කුඩා පිරිසුදු දේවදූතයෙක් වගෙයි. මිනියා තුඹට කියන්නේ 'දේවදූතයා, කියායි...............තුඹ දේවදූතයන් නහන ගිගුම් දෙන ප්‍රීති ඝෝෂාවට සමානයි. දේවදූතයා කියන්නේ කාට ද? සමහර විට නක්ෂත්‍ර මණ්ඩලය වෙන්න ඇති. නක්ෂත්‍ර මණ්ඩලයේ රසායන ද්‍රව්‍යයක අණුවක් වෙන්න ඇති. සිංහ හා සූර්ය ලග්ගන තියෙන බව දන්නවා නේ ද?"

"කරුණා කරල ඔය සෝපාව උඩ ඉඳගන්න"යි අලෝෂා තැති ගනිමින් කී ය. "අයියාට බොහො ම අසනීපයි. ඔය කොට්ටය උඩ ඔළුව තියා නිදාගන්න. තුවායක් තෙමා ඔළුවෙ වටේ ඔතන්න ද? ඒකෙන් ගුණයක් තියෙන්න පුළුවනි."

"ඔය පුටුව උඩ තියෙන තුවාය මෙහාට දෙන්න. මම දැකුයි තුවාය ඔතැන තිබ්බෙ."

"මෙ තැන තුවායක් නැහැ. කරදර වෙන්න එපා. මා දන්නවා තුවාය තියෙන තැන.........මේ තියෙන්නේ"යි අලෝෂා කීවේ කාමරයේ කෙළවර සක්කාඩි මේසය ළඟ තිබෙන අලුත් තුවාය ගැනීමට යමිනි. ඉවාන් පුදුමයෙන් තුවාය දෙස බැලුවේ ය. ඒ මොහොතේ දී ඔහුට පසු ගිය දේ සිහිවන්නට විය.

"ටිකක් ඉන්න"යි කියමින් ඉවාන් සෝපාවෙන් නැගී සිටියේ ය. "දූන් පැයකට කලින් මම ඔය තුවාය තෙමා ඔළුවේ ඔතාගෙන පසු ව ඔතැන තිබ්බා..........කොහොම ද තුවාය ඔච්චර ඉක්මනට වේළුණේ? මට වෙන තුවායක් තිබුණේ නැහැ."

"තුවාය තෙමා ඔළුවේ ඔතා ගත්තා තේ ද?"යි අලෝෂා විමසුවේ ය.

"ඔව්, දූන් පැයකට කලින් තුවාය ඔළුවේ ඔතාගෙන මේ කාමරය ඇතුළේ ඒ මේ අතට ඇවිද්දා. මොකද ඉටිපන්දම නිවී තියෙන්නේ? දූන් වෙලාව කීය ද?"

"දොළහට කිට්ටුයි."

"නැහැ, නැහැ, මේක හීනයක් නො වෙයි" ඉවාන් හදිසියෙන් ම කෑගා කීවේ ය. "ඒ මිනිහා මේ සෝපාව උඩ ඉඳගෙන හිටියා. තුඹ ජනේලෙට ගහන කොට මම මිනිහට මේ වීදුරුවෙන් දමා ගැසුවා.........නැහැ, නැහැ, මම ගිය පාරත් මේ මිනිහා හීනෙන් දුටුවා. මේ හීනය හීනයක් නො වෙයි. මෙ වගේ දේවල් මීට කලිනුත් සිදුවී තියෙනවා. අලෝෂා දූන් මට නිතර හීන පේනවා. ඒ වුණත් ඒවා හීන නො වෙයි. හැබැයින් සිදුවන දේවල්. මම නිදාගෙන හිටියත් නැගිට කතා කරනවා. ඒ මේ අතට ඇවිදිනවා. ඒ මිනිහා අතන තියෙන සෝපාවේ ඉඳගෙන හිටියා ....මිනිහා අලි මෝඩයා." මෙසේ පැවැසූ ඉවාන් හදිසියෙන් ම සිනා සී කාමරය තුළ ඒ මෙ අතට සක්මන් කරන්නට විය.

"කාට ද මෝඩයා කියන්නේ? කා ගැන ද කතා කරන්නේ?"යි අලෝෂා යළි විමසුවේ සිත්තැවුලෙන් යුතු ව ය.

"මා කතා කළේ යක්ෂයා ගැනයි ඌ මා හමු වෙන්න ආවා. දෙපාරක් මෙහාට ආවා. නැහැ තුන් පාරක් ආවා. මිනිහා පිච්චුණු පියාපත් ඇති ව මේඝ ගර්ජනා කරගෙන පැමිණි සාතන් නො ව සාමාන්‍ය යක්ෂයෙක් නිසා මා කිපුණාට මට සරදම් කළා. නමුත් මේ යක්ෂයා සාතන් නො වෙයි. මිනිහා කියන්නේ බොරුවක්. ඌ වංචාකාරයෙක්. කිසි ම වැදගත් කමක් නැති නීච යකෙක්, හොඳට ඇඳ පැළඳ ගෙන නාන ගෙවල්වලට යනවා. මිනිහ ගේ ඇඳුම් ඉවත් කළොත්

වලිගයක් තියෙනවට කිසි ම සැකයක් නැහැ. මිනිහට ග්‍රේට්ඩේන් බල්ලකුට වගේ යාරයක් පමණ දිග දුඹුරු පාට වලිගයක් ඇති.........මල්ලිට සීතලයි නේ ද? හිම කුණාටුවට අහුවුණා ද? තේවතුර ටිකක් බොන්න කැමැති ද? ඇයට කියන්න ද තේ කෝප්පයක් ගෙනෙන්න?''

අලෝෂා වහා වතුර බේසම ළඟට ගොස් තුවාය තෙමා, සෝපාව උඩ හිඳ හිස වටේ ඔතා ගත්තා ලෙස සහෝදරයාට පෙරැත්ත කෙළේ ය. ඉවාන් අලෝෂා ළඟින් හිඳ ගත්තේ ය.

''තුඹ දැන් මට ලීසා ගැන මොනව ද කිව්වේ?''යි ඉවාන් අලෝෂාගෙන් විමසුවේ ය. (ඔහු දෙඩමලු වන්නට විය) ''මාත් ලීසාට බොහො ම කැමැතියි. මම ඇය ගැන නරක දෙයක් කිව්වා. නැහැ, මම බොරුවක් කිව්වේ. මම ඇයට බොහො ම කැමැතියි. හෙට කැතිරිනා මොනවා කරයි ද කියා මට බොහො ම බයයි. සේරට ම වැඩිය බය කැතිරිනා ගැනයි. මට අනාගතය ගැනත් බොහො ම බයයි. හෙට උසාවියේ දී ඈ මා විනාශ කරන්න පුළුවනි. ඇය ගැන තියෙන ඊර්ෂ්‍යාව නිසා මා මිනියා විනාශ කරන්න හදනවා ය කියා ඈ හිතනවා. ඈ එහෙම තමයි කල්පනා කරන්නේ. ඒ වුණත් ඒ කතාවේ කිසි ම ඇත්තක් නැහැ. හෙට මට අයිති වෙන්නේ පෝරකය නො ව කුරුසය යි. මට බෙල්ලේ වැල දමා ගන්න පුළුවන් කමක් නැහැ. මල්ලී මට පණ නහගන්න බැහැ. පණ නහගන්න බැරි මා නීචයෙක් නිසා ද? මම මැරෙන්න භය මිනිහෙක් නො වෙයි. එහෙනම් මැරෙන්න බැරි, ජීවිතයට ඇති ආශාව නිසා ද? පැවල් පණ නහගත් බව මා දන්නේ කොහොම ද? දැන් මට මතකයි. පැවල් පණ නහගත් බව කිව්වේ මෙහාට පැමිණි යක්ෂයා යි.''

''මේ කාමරයේ මිනිහෙක් හිටිය බව අයියාට හොඳට විශ්වාස ද?''

''ඔව්, අර මුල්ලේ සෝපාව උඩ ඉඳගෙන හිටියා. තුඹ එලවා දමන්න ඇති. මොකද නැත්තේ, තුඹ තමයි එලවා දැම්මේ. තුඹ කාමරයට එනවාත් එක්ක ම යක්ෂයා අතුරුදහන් වුණා. මල්ලී මම තුඹේ මුහුණට බොහො ම කැමැතියි. දන්නවද මම තුඹේ මුහුණට කැමැති බව? නමුත් යක්ෂයා වගේ මේනන හිටියේ මා යි, මා තුළ තිබෙන නීච අධම හැම දෙයක් ම යක්ෂාවේශයෙන් පෙනී සිටියා. මා අලංකාරයට කැමැති කෙනෙක්. එක අපකීර්තියක් වෙන්න පුළුවනි. යක්ෂයා ඒ බව දැනගත්තා.

යක්ෂයා මහ මෝඩයෙක්. නමුත් ඒ මෝඩකම උගේ වාසියට හේතුවී තියෙනවා. ඒ වගේ ම බොහො ම කපටියි. තිරිසනෙක් වගේ කපටියි. මා තරහ කරන හැටි මිනිහා දනගෙන හිටියා. මිනිහ ගැන විශ්වාස කරන්න කියා මට කරදර කළා. ඒ නිසා තමයි මම මිනිහ ගේ කතාවට ඇහුම්කන් දුන්නේ. පොඩි ළමයකු රවටනවා වගේ මා රැවැට්ටුවා. ඒ වුණත් මිනිහා එයා ගැන සත්‍ය කරුණු මට බොහොමයක් කිව්වා. ඒ මිනිහ තියම යක්ෂයා මිස මා නොවන බව පිළිගන්න පුළුවන්නම් මා බොහො ම කැමැතියි'' ඉවාන් සැලකිල්ලෙන් හා ආත්ම විශ්වාසයෙන් කී ය.

''ඒ මිනිහා නිසා අයියා බොහො ම වෙහෙස වෙලා වගෙයි?'' අලෝෂා සොහොයුරා දෙස අනුකම්පාවෙන් බලා කී ය.

''මිනිහා මට සරදම් කළා. සරදම් කිරීමට මිනිහා බොහො ම සමර්ථයි. 'විඥනය, විඥනය කියන්නේ මොකක් ද? විඥනය නිර්මාණය කළේ මායි. මන්ද මා විඥනය නිසා දුක් විඳින්නේ? මා දුක් විඳින්නේ පුරුද්ද නිසයි. පසු ගිය හවුරුදු හත් දහස තුළ මිනිහා ඇතිකරගත් සාමාන්‍ය පුරුද්ද නිසයි. මේ පුරුද්ද නැති කරගත් පසු අපට දෙවිවරු වෙන්න පුළුවනි, මේ කතාව කිව්වේ යක්ෂයායි.''

''එහෙනම් ඔය කතාව කියා තියෙන්නේ අයියා නො වෙයි'' අලෝෂා කීවේ මැඩගත නො හැකි හැඟීම්වලින් හා සන්සුන් බැල්මෙන් සොහොයුරා දෙස බලමිනි. ''කමක් නැහැ, ඔය යක්ෂයා අත්හැර දමන්න. සිතින් අත්හැර දමන්න. දූත් අයියා සාප කරන හැම දෙයක් ම ගෙනයන්න යක්ෂයාට ඉඩ දෙන්න. ආයේත් ආපසු කවදාවත් එන්න ඉඩ දෙන්න එපා.''

''ඔව්, නමුත් යක්ෂයා බොහො ම ඊරිසියා සහගතයි. මට සමච්චල් කරනවා. බොහො ම අවිනීතයි'' ඉවාන් කීවේ මහත් පිළිකුලින් යුතු ව ය. ''මට බොහො ම අසාධාරණ විදියට සැලැකුවා. මා ඉදිරිපිට මා ගැන බොරු කිව්වා. 'තුඹ බොහො ම උතුම් දෙයක් කරන්න යනවා. තාත්තා මැරුවේ තුඹ බව කියන්න යනවා, තුඹේ කියමන පිට පැවල් තාත්තා මැරූ බව කියන්න යනවා'යි යක්ෂයා මට කිව්වා.''

''ඔය කතාව නවත්වන්න. අයියා තාත්තා මැරුවේ නැහැ. ඒක බොරු කතාවක්''යයි අලෝෂා කී ය.

“නමුත් යක්ෂයා කියනවා මා තාත්තා මැරුවා ය කියා. ‘තුඹ අද බොහො ම යහපත් වැඩක් කරන්න සූදානම් වෙනවා. නමුත් යහපත් වැඩ ගැන තුඹ තුළ විශ්වාසයක් නැහැ. ඒ නිසයි කිපෙන්නේ. නො සන්සුන් වෙන්නේ. පළි ගැනීමට අදහස් කරන්නේ.’ යක්ෂයා මා ගැන මේ විදියටයි කතා කළේ. යක්ෂයා ආවාට ගියාට කතා කරන කෙනෙක් නො වෙයි.”

“ඔය විදියට කතා කරන්නේ අයියා මිස යක්ෂයා නො වෙයි” අලෝෂා ශෝකයෙන් කීවේ ය. “ඔය විදියට කතා කරන්නේ අසනීපයෙන් සිටින නිසයි. අයියාට සනීප නැහැ. නිකරුණේ වද විඳිනවා.”

“නැහැ මල්ලී, යක්ෂයා කියන්නේ බොරුවක් නො වෙයි. ‘තුඹ සාක්ෂි දෙන්න යන්නේ සිතේ තියෙන අහංකාර කම නිසයි. තුඹ නැගිටලා ‘තාත්තා මැරුවේ මා ය’ කියා කියාවි. ඇයි ඔය තරම් බය වෙලා බලා ඉන්නේ? තුඹ කියන්නේ බොරු. මම තුඹේ අදහස්වලට, තුඹේ භීතියට අවමන් කරමි. තුඹ මහජනයා ගේ ප්‍රශංසාවට බොහො ම කැමැතියි. ‘මේ තරුණයා කොතරම් ලොකු ත්‍යාගවන්තයෙක් ද? සහෝදරයා බේරාගැනීම පිණිස පාපෝච්චාරණය කළා.’ මහජනයා කරන මේ ප්‍රශංසාවට තුඹ බොහො ම කැමැතියි.’ යක්ෂයා මා ගැන කතා කළේ ඔය විදියටයි. යක්ෂයා කියන්නේ අමූලික බොරුවක්”යයි ඉවාන් හදිසියෙන් ම කෑගා කී ය. ඔහු ගේ දෑස කෝපාග්නියෙන් බැබළිණ “මහජනයාගෙන් ලැබෙන පහත් කීර්ති ප්‍රශංසාවට මගේ කිසි ම කැමැත්තක් නැහැ. යක්ෂයා කිව්වේ බොරුවක්. මම කීර්ති ප්‍රශංසාවට කැමැති නැහැ. අන්න ඒ නිසයි මම වීදුරුවෙන් දමා ගැසුවේ වීදුරුව උගේ අවලක්ෂණ මූහුණේ වැදිලා බිඳුණා.”

“අයියා කලබල වෙන්න එපා”යි අලෝෂා බැගෑ බසින් කී ය.

“මිනිහකුට වද දෙන හැටි යක්ෂයා දන්නවා. හොඳට දන්නවා. යක්ෂයා බොහො ම කෲරයි” ඉවාන් නො නවත්වා කීවේ මලණුවන් ගේ කතාවට සවන් දෙමින් නො වේ. “යක්ෂයා ආවේ මොනවට ද කියා මම මුල සිට ම දැන ගෙන හිටියා. ‘තුඹ අහංකාර කමින් යුතු ව සාක්ෂි දුන්නොත් ඔවුන් තුඹේ තාත්තා මැරූ වරදට පැවල් සයිබීරියාවට යවන්න පුළුවනි. මිනියා නිදහස් කරලා, මිනියා කළ දුශ්චරිතයන්ට පමණක් දෙස් කියන්න පුළුවනි. මහජනයා තුඹට ප්‍රශංසා කරන්න පුළුවනි (මෙයේ

කියා මිනිහා සිනාසුණා' නමුත් පැවල් එල්ලිලා මලා. ඉතින් උසාවියේ දී කවුද තුඹෙ කතාව විශ්වාස කරන්නේ? කොහොම වුණත් තුඹ උසාවියට යනවා. උසාවියට යාමට තීරණය කරගත්තා. දැන් මොකද කරන්නේ?' යක්ෂයා මගෙන් මේ විදිහට අහනවා. මේක බොහොම භයානකයි. මල්ලී මට මේ වගේ දේවල් තවත් අහන්න බැහැ. කවුද මගෙන් බය නැති ව මෙ වැනි ප්‍රශ්න අහන්නේ?"

"අයියේ"යි අලෝෂා ඉවාන් ගේ කතාවට බාධා කරමින් කී ය. ඔහු ගේ හදවත හිතියෙන් හැකිළිණි. එහෙත් සොහොයුරා ගේ සිහිය යළි ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒමට තවමත් ඉඩ තිබෙන බව ඔහුට පෙනී ගියේ ය. "මා කියන්න ඉස්සෙල්ලා යක්ෂයා කොහොම ද පැවල් මල බව කිව්වේ? පැවල් මල බව කිසි ම කෙනෙක් දන්නේ නැහැ. දැනගැනීමට වෙලාවක් තිබුණේ නැහැ."

"පැවල් මල බව මට යක්ෂයා කිව්වා"යි ඉවාන් ස්ථිර ව ම කියා සිටියේ ය. එහි සැකයක් ඇතැයි පිළිගැනීමට ඔහු අකැමැති විය. "ඇත්ත වශයෙන් යක්ෂයා පැවල් ගේ මරණය හැර වෙන කිසි ම දෙයක් ගැන කතා කළේ නැහැ. 'තුඹ ගුණ දහම් ගැන කල්පනා කරනවා නම් ඔවුන් තුඹ කියන දෙය විශ්වාස නො කළත් කමක් නැහැ. තුඹ හෙට සාක්ෂි දෙන්නේ ප්‍රතිපත්තියක් උඩයි. තාත්තා වගේ තුඹත් ඌරෙක්. තුඹට ගුණ දහම්වලින් ඇති ප්‍රයෝජනය කුමක් ද? තුඹෙ ආත්ම පූජාවෙන් කිසි ම කෙනකුට ප්‍රයෝජනයක් නැති නම් මොනවට උසාවියට යනව ද? උසාවියට යන්නේ මොනවට ද කියා තුඹ ම දන්නේ නැහැ. දැනගැනීමට පුළුවන් නම් තුඹ ඕනෑ ම දෙයක් දේවි. යනව ද, නොයනව ද කියා තීරණයට බැස ගත්ත ද? නැහැ, තව ම තීරණයට බැහැලා නැහැ. යන්න ද නො යන්න ද කියා කල්පනා කරමින් අද තුඹ මුළු රැය ම නිදි මරන්න පුළුවනි. නමුත් තුඹ හෙට උසාවියට යනවා. තුඹ දන්නවා කොහොම හරි හෙට යන බව. මොන තීරණයකට පැමිණියත්, ඒ තීරණය තුඹ මත රැඳී නොපවතින බව තුඹ දන්නවා. නො ගිහින් ඉන්න බය නිසා යනවා. ඇයි යන්න බය? ටිකක් හිතා බලන්න. ඒක හොඳ ප්‍රහේලිකාවක්.' මෙයේ කියා යක්ෂයා යන්න ගියා. තුඹ එන කොට ම යන්න ගියා. බියගුල්ලා ය කියා මට බැන්නා. 'අහසේ පියාසර කළයුත්තෝ තුඹ වගේ උකුස්සන් නො වෙයි' කියා යක්ෂයා මට කිව්.වා පැවල් ද මට ඔය කතාව කිව්වා. මේ යක්ෂයා මරන්න ඕනෑ.

කැතිරිනා මට අපහාස කරනවා. මාසයක ඉඳලා ඒ බව මම දැනගෙන හිටියා. වෙනෙකක් තබා ලීසාත් මට අපහාස කරන්න පටන් ගනීවි. 'තුඹ යන්නේ ප්‍රශංසාව ලැබීමටයි' කියන කතාව මහ බොරුවක්. මල්ලී, තුඹත් මට අපහාස කරාවි. දැන් ඉතින් මා තුඹට වෛර කළ යුතුයි. මම භයානක සතකු වන මීතියාටත් වෛර කරනවා. ඒ භයානක සතා බේරා ගැනීමට මට කිසි ම උවමනාවක් නැහැ. හිර ගෙදර කුණු වුණා වෙත්. මම හෙට උසාවියට ගිහින් මීතියා ඉදිරිපිට සිට මීතියා ගේ මූහුණට කෙළ ගහනවා."

හිඳ සිටි තැනින් වහා නැගී සිටි ඉවාන් තුවාය වීසිකොට යළි කාමරය හරහා ඒ මේ අතට සක්මන් කරන්නට විය. "මම එක විට නිදාගෙනත් අවදිවත් සිටිනවා. මම ඇවිදිනවා. කතා කරනවා. මට හොඳට පෙනෙනවා. නමුත් මා සිටින්නේ නිදාගෙනයි." තම සොහොයුරා ටිකකට පෙර කළ කතාව අලෝෂාට සිහි විය. දැන් සිදුවන්නේ ද එවැනි ම දෙයකි. අලෝෂා සොහොයුරා තනි කර දමා නොගියේ ය. වහා දිව ගොස් දොස්තර කෙනකු කැඳවා ගෙන ඒමට ඔහුට හදිසියෙන්ම මතක් විය. නමුත් සොහොයුරා තනි කර යාමට ඔහු බිය විය. තාතර කොට යාමට ද කෙනෙක් නැත. ටිකින් ටික අන්තිමේ දී ඉවාන් ගේ සිහිය සම්පූර්ණයෙන් ම නැති විය. ඔහු තවමත් කතා කරයි. නොරතෝන්වියක් නැතිව කතා කරයි. නමුත් කතාව ආකූල විය. වෙනෙකක් තබා අමාරුවෙන් වචන උච්චාරණය කෙළේ ය. අන්තිමේ දී හිටිහැටියේ ම ඔහු භයානක ලෙස බිම ඇද වැටිණි. සූදානමින් බලා සිටි අලෝෂා, ඉවාන් අල්ලා ගත්තේ ය. තමා ඇඳට ගෙන යාමට ඉවාන් අලෝෂාට ඉඩ දුන්නේ ය. අලෝෂා කෙසේ හෝ සොහොයුරා ගේ ඇඳුම් මාරු කොට නිදාගැනීමට සැලැස්සුවේ ය. අනතුරුව ඔහු පැය දෙකක් ඇඳ ළඟ හිඳ සිටියේ ය. රෝගියා කිසි ම නොසන්සුන් කමක් නො දක්වා සෙමෙන් හුස්ම ගනිමින් සුවසේ නිදාගත්තේ ය. අලෝෂා ද ඇඳුම් මාරු නො කොට කොට්ටයක් ගෙන සෝපාව උඩ නිදාගත්තේ ය.

නිදාගැනීමට පෙර ඔහු සොහොයුරන් දෙදෙනා සිහි කොට දෙවියන්ට යාච්ඤා කෙළේ ය. සොහොයුරාට වැලඳී ඇති රෝගය අලෝෂාට අවබෝධ වන්නට විය. එය උඩඟු සිතින් ඇති කරගත් අධිෂ්ඨානයක් නිසා ඇති වූ වේදනාවකි. අව්‍යාජ විඥනයක් නිසා ඇති වූ රෝගයකි. ඔහු විශ්වාස නොකළ දෙවියන් හා ඒ දෙවියන් පිළිබඳ සත්‍යය ඔහු ගේ සිත අභිභවා

ගත්තේ ය. එහෙත් ඔහු ගේ සිත දෙවියන් හා දෙවියන් පිළිබඳ සත්‍යයට යටත් නොවීමට වෑයම් කෙළේ ය. “දූත් පැවල් ජීවතුන් අතරේ නැති නිසා ඉවාන් ගේ කතාව කිසි ම කෙනෙක් විශ්වාස කරන්නේ නැහැ. එහෙත් ඔහු හෙට උසාවියට ගොස් සාක්ෂි දේවි.” යන අදහස කොට්ටය මත රඳවාගෙන සිටි අලෝෂා ගේ හිස තුළින් පාවී ගියේ ය. අලෝෂා සෙමෙන් සිනාසුණේ ය. “දෙවියන් වහන්සේ ජය ගනීවි. එක්කෝ ඉවාන්ට සත්‍යය අවබෝධ වේවි. නැති නම් සිතේ වෛරයෙන් යුතු ව තමා විශ්වාස නො කල ව්‍යාපාරයන්ට සේවය කිරීම නිසා තමාගෙන් ද, අන්‍යයන් ගෙන් ද, පළි ගනිමින් විනාශ වෙන්න පුළුවනි”යි ශෝකයෙන් පැවැසූ අලෝෂා යළි නොහොයුරා සිහි කොට යාච්ඤා කෙළේ ය.

දොළොස් වන ග්‍රන්ථය

විනිශ්චයේ දෝෂය

පළමු පරිච්ඡේදය

මාරක දවස

මා ඉහත සඳහන් කළ සිදුවීම්වලට පසු දා උදේ දහයට, අපේ පළාතේ දිස්ත්‍රික්ක උසාවියේ දී 'කරමසෝ මිනීමැරුම් නඩුව' ආරම්භ විය.

එම නඩු විභාගයේ දී සිදු වූ දෙය සවිස්තර ව නො ව, සිදු වූ පිළිවෙළට විස්තර කිරීමට පවා මා සමත් නොවන බව පළමු ව ඔබට පැහැදිලි කළ යුතු ය. හැම දෙයක් ම සවිස්තර ව සඳහන් කරන්නට ගියොත් මගේ කල්පනාවේ හැටියට නඩුව ගැන වෙන ම පොතක් ලියන්නට සිදුවන. එය ද විශාල පොතක් විය හැකි ය. එහෙත් පෞද්ගලික වශයෙන් මගේ සිතට කාවැදුණු දෙය පමණක් විස්තර කළොත් මගේ පාඨකයන් මා සමඟ අමනාප නො වෙතියි මම විශ්වාස කරමි. සමහර විට මා වැදගත් දෙය හැටියට නො වැදගත් දෙය තෝරා ගෙන ඉතා අවශ්‍ය වැදගත් දේවල් බැහැර කරන්නට සිදුවන. එහෙත් කළ හැකි හොඳ ම දෙය ඔබ්ගෙන් සමාව ඉල්ලීම නො ව මට පුළුවන් තරමින් නඩුව විස්තර කිරීම ය. එවිට, මට පුළුවන් දෙය, මා කළ බව මගේ පාඨකයන් පිළිගන්නවා ඇත.

එ හෙයින් අනෙක් හැම දෙයකට ම පෙර මා උසාවියට ඇතුළු වන විට, වෙසෙසින් ම මගේ සිත් ගත් දෙය ගැන විස්තරයක් කළ යුතු ය. ඇත්ත කියනවා නම් එදා උදේ උසාවිය දැක පුදුම වුණේ මා පමණක් නො වේ. හැම දෙනා ම පුදුම වූ බව අපට පසු ව දැන ගන්න ලැබිණි. මේ නඩුව ගැන බොහෝ දෙනෙක් මහත් සැලකිල්ලක් දක්වන බවත්, නඩු විභාගය

පටන් ගන්නා තෙක් පුලපුලා බලා සිටින බවත්, පසු ගිය දෙමස පුරා මේ නඩුව ගැන අපේ නගරයේ නොයෙක් විදියේ කතාබහ, වාද විවාද ඇති වූ බවත් අපි කවුරුත් දනිමු. මේ නඩුව රුසියාව පුරා ව්‍යාප්ත වූ බව ද බොහෝ දෙනා දැන සිටියහ. එහෙත් අපේ නගරයේ පමණක් නො ව, රුසියාව පුරා සිටින හැම දෙනාට ම වාගේ මේ නඩුව නිසා කො තරම් භයානක සංවේගයක් ඇති වූයේ දැයි එද උදේ උසාවියේ දී ඔප්පු වනතෙක් කිසිවෙක් තේරුම් ගත්තේ නැත. නඩුව බැලීමට අපේ පළාතේ ප්‍රධාන නගරවලින් පමණක් නො ව, රුසියාවේ වෙනත් නගරවලින් ද, මොස්කව්, පීටස්බර්ග්, යන නගරවලින් ද, සෙනග පැමිණියහ. ඔවුන් අතරේ නීතිවේදීහු ද, පඩු දනෝ ද, සමාජ කාන්තාවෝ ද වූ හ. උසාවියට ඇතුළුවීමට දෙන ලද අවසර පත්‍ර කලින් ම අවසන් විය. කීර්තිමත් පඩු දනන් සඳහා විනිශ්චයකාරයන් තිදෙනා පසු පසින් අසුන් පනවා තිබිණි. ඒ පඩු දනන් අතරින් විශේෂ අය සඳහා අත් හැඳි පුටු පේළියක් තබා තිබිණි. මීට පෙර කවරදාවත් උසාවියක මෙ වැනි අසුන් පනවා නො තිබිණි. මගේ කල්පනාවේ හැටියට එහි රැස් ව සිටි පිරිසෙන් අඩකට නො අඩු ගණනක් අපේ නගරයේ සහ වෙනත් නගරවලින් ද පැමිණි කුලකාන්තාවෝ වූ හ. නීති වේදීහු පමණක් කො තරම් විශාල ගණනක් පැමිණ සිටියෝ ද කියතොත් කො තැනින් ඉඩ කඩ ලබාගත යුතු දැයි ඔවුහු ම නො දත්හ. උසාවියේ අසුන් සඳහා දෙන අවසර පත්‍ර කලින් බෙදා හැර තිබිණි. සමහරෙක් අවසර පත්‍ර සොයමින් වෙහෙසුණහ. අවසර පත්‍ර අතින් අතට ගියේ ය. ශාලාවේ කෙළවරේ වේදිකාව පසුපසින් හදිසියේ ම තනන ලද වැටක් පසු පස, නීතිවේදීන් සියලු දෙනාට ම ඉඩ කඩ සලසා තිබුණේ ය. ඉඩ වැඩිය ලබා ගැනීම පිණිස සියලු ම පුටු ඉවත් කරනු ලැබී ය. අඩු ගණනේ සිටගෙන සිටීමට වත් ඉඩ ලැබීම වාසනාවක් යයි ඔවුහු කල්පනා කළහ. එ හෙයින් කොටුව පසුපස සිටි නීති වේදීහු නඩුව අවසන් වන තෙක් තද බද වී සිටියහ. සමහරක් කාන්තාවෝ, වෙසෙසින්ම, පිට පළාත්වල සිට පැමිණි, හැඩට වැඩට ඇඳ පැළඳගත් කාන්තාවෝ ගැලරියේ අසුන් ගෙන සිටියහ. එහෙත් වැඩි දෙනෙක් ඇඳුම් පැළඳුම් ගැන පවා වැඩි සැලැකිල්ලක් දක්වා ඇති බවක් නො පෙනිණි. සිහිය අවුල් කරන තරම් නොසන්සුන් කමක් හා අශෝභන කුතුහලයක් ඔවුන් ගේ මුහුණුවල දකින්නට තිබිණි. කාන්තාවන්ගෙන් වැඩි දෙනකු, නැති නම් සියලු දෙනා ම වාගේ, මීතියා ගේ පැත්ත ගෙන, ඔහු නිදහස් වෙතියි යන

ආශාවෙන් සිටි බව බොහෝ දෙනෙක් පසු ව කීහ. සමහර විට වැඩි වශයෙන් ම මීට හේතු වන්නට ඇත්තේ මීනියා ගැහැනුන් ගේ සිත් ගැනීමේ සමතකු වීම විය යුතු ය. විරුද්ධවාදී ගැහැනුන් දෙදෙනකු සාක්ෂි දෙන බව දැන ගන්නට ලැබිණි. ඉන් එකියක් කැතිරිනා ය. ඈ කාගෙන් සැලැකිල්ලට බඳුන් වූවා ය. ඈ ගැන නොයෙක් මාදිලියේ අපූර්ව කතා කියන ලදි. මිනීමරුවකු වුවත් ඈ මීනියාට දක්වන සෙනෙහස ගැන පුදුමාකාර කතා බහුල ව පැවැතිණි. ඇගේ කුලගර්වය හා අහංකාරකම ද ගැන වෙසෙසින් ම සඳහන් කරන ලදි. (අපේ නගරයේ කිසිවකු ගේ නිවෙසකට ඈ කලාතුරකින්වත් නොගියා ය) මිනීමරුවා සමඟ සයිබීරියාවට ගොස් විවාහ වීමට අවසර පතා ඈ රජයට කන්නලව් කිරීමට අදහස් කරන බව ද කියන ලදි කැතිරිනා ගේ විරුද්ධවාදියා වන ගෲෂෙන්කා ගේ පැමිණීම කවුරුත් ඊට නොදෙවෙනි ආශාවකින් හා උනන්දුවකින් බලා හුන්හ. උඩඟු රදළ තරුණිය ගේ විරුද්ධවාදියා වන 'වෙසඟන ගේ' පැමිණීම කවුරුත් සිතට පීඩාවක් වන තරම් කුතුහලයකින් යුතු ව බලාපොරොත්තු වූ හ. එහෙත් නගරයේ වනිතාවෝ කැතිරිනාට වඩා හොඳට ගෲෂෙන්කා හැඳින සිටියහ. පියෝදර් කරමසෝ ගේ හා ඔහු ගේ අවාසනාවන්ත පුතා ගේ විනාශයට හේතු වූ ඉතිරිය ඔවුහු කලින් දැන දැක සිටියහ. පහත් පන්තියට අයත්, වැඩි ලක්ෂණයක් නැති, මේ සාමාන්‍ය තරුණියට පිය පුත් දෙදෙනා කුමන කරුණක් නිසා ඇලය කළෝ දැයි ඔවුහු විශේෂයක් නැති ව කල්පනා කළහ.

කොටින් කියතොත් නොයෙක් දෙනා නානාප්‍රකාර අදහස් පළ කළහ. මීනියා නිසා පවුල් කීපයක් ම කලහ කරගත් බව මම ඇත්ත වශයෙන් ම දනිමි. මේ භයානක මිනීමැරුම් නඩුව ගැන ඇති වූ විවිධ මත නිසා ගැහැනු බොහෝ දෙනෙක් ඔවුන් ගේ සැමියන් සමඟ කලහ කරගත්හ. එ හෙයින් මේ ගැහැනුන් ගේ ස්වාමිපුරුෂයන් මීනියා කෙරෙහි ඇති කරගත් අගතියෙන් යුත් අදහස් ඇති ව උසාවියට පැමිණීම ස්වාභාවික ය.

කාන්තා පක්ෂය වාගේ නො ව, පිරිමි පක්ෂය එළිපිට ම වරදකරුවාට එදිරිවාදු කම් කළ බව ඒකාන්තයෙන් ම කිව හැකි ය. තද පරුෂ ගතියෙන් යුත් මූහුණු, රවා බලන මූහුණු, පළි ගැනීමේ චේතනාවෙන් දැවෙන මූහුණු, අධිකරණ ශාලාව තුළ දකින්නට තිබුණේ ය. මීනියා නගරයේ නතර වී සිටි කාලයේ දී පෞද්ගලික වශයෙන් කීප දෙනකු සමඟ කලහ

කරගත් බව ඇත්තයි. එ හෙයින් අධිකරණ ශාලාවේ රැස් වූ මිනිසුන් ගෙන් බොහෝ දෙනකු මිතියා ගේ දෛවය ගැන කිසි ම තැකීමක් නැති ව ප්‍රීතියෙන් සිටියාට කිසි ම සැකයක් නැත. නඩුවෙන් ඇති වන ප්‍රතිඵලයට මිස නඩු විභාගය ගැන ඔවුහු කිසි ම සැලැකිල්ලක් නො දැක්වූ හ. නීතිවේදීන් හැර අනෙක් හැම දෙනා ම වාගේ මිඩියා වරද කරුවා වෙනවා දැකීමේ ආශාවෙන් සිටියෝ ය. නඩුවෙන් ඇති වන ඉෂ්ටානිෂ්ට විපාක ගැන සැලැකිලිමත් නොවූ නීතිවේදීන් සැලැකිලිමත් වූයේ නඩුවේ දී අනුගමනය කරන අලුත් නීති සම්ප්‍රදාය ගැන පමණි.

සුප්‍රසිද්ධ නීතිඥයකු වන පෙට්යොකොවිච් ගේ පැමිණීමෙන් හැම දෙනා ම කලබල වූ හ. ඔහු ගේ සමත්කම් රට පුරා පතළ ය. නම ගිය මිනීමැරුම් නඩුවල දී විත්තිය වෙනුවෙන් පෙනී සිටි ඔහු අපේ පළාතට පැමිණි පළමු වතාව මෙය නො වෙයි. ඔහු පෙනී සිටි මෙ වැනි සුප්‍රසිද්ධ මිනීමැරුම් නඩු බොහෝ ය. ඒ නඩු කාලයක් ගතවනතුරු අමතක නො වෙයි. පැමිණිල්ලේ නීතිඥයා හා ප්‍රධාන විනිශ්චයකාරයා ගැන ද විනෝදාත්මක කතා පැතිර පවතියි. විත්තියේ නීතිඥයා සමඟ මුහුණට මුහුණ ලා සටන් කිරීමට පැමිණිල්ලේ නීතිඥයා, හෙවත් දණ්ඩනායකයා තුළ මාරක බියක් පවතින බවත්, පීටස්බර්ග් පුරයේ දී නීති වෘත්තිය පටන්ගත් දා සිට ඔවුන් දෙදෙනා සතුරන් වූ බවත්, ඉක්මනින් කලබල වන පැමිණිල්ලේ නීතිඥයා පීටස්බර්ග් නුවර දී තමා ගේ සමත්කම් නොපිළිගත් හෙයින් යම් කිසිවකු තමාට හිරිහැර කරන බවත්, කරමසෝ මිනීමැරුම් නඩුවෙන් තමා ගේ නැති වන ප්‍රසිද්ධිය ලබා ගැනීමට වෑයම් කරන බවත්, එහෙත් ඔහු විත්තියේ නීතිඥයාට බිය වූ බවත්, කියන ලදි. ඔහු විත්තියේ නීතිඥයාට දක්වන බිය ගැන පැතිර පැවැති කතා එ තරම් සාධාරණ නැත. ඔහු භයානක අවස්ථාවල දී අධෛර්යවත් වන ජාතියේ මිනිහෙක් නො වේ. අධෛර්යවත් වනවා වෙනුවට වැඩි වන අනතුරත් සමඟ කීර්තියට හා බලයට ඇති ආශාව ද වැඩි වී පියාපත් ලබයි. සාමාන්‍ය වශයෙන් අපේ පළාතේ දණ්ඩනායකයා පමණට වඩා කලබල වන, අශෝභන කතා කියන මිනිසෙකි. මුළු ශක්තිය යොදවා කිසියම් නඩුවක් සකස් කරන හෙතෙම, ඒ නඩුවට කතා කරන්නේ තමා ගේ මුළු දෛවයත්, වාසනාවත්, ඒ නඩුවේ ප්‍රතිඵල මත රැඳී තිබෙන්නාක් මෙනි. ඔහු ගේ මේ ක්‍රියා-කලාපය නීතිඥයන් අතරේ එක්තරා ප්‍රමාණයකට සිනාවට හේතු විය. ඔහු ගේ තත්ත්වයට කිසිසේත් බලාපොරොත්තු විය

නොහැකි ප්‍රසිද්ධියක් ඔහුට ලැබුණේ ඔහු ගේ මේ ගති ගුණ නිසා ය. ඔහු මනෝවිද්‍යාවට දක්වූ දැඩි ආශාව මිතිසුන් ගේ සිනාවට හේතු විය. මගේ කල්පනාවේ හැටියට ඔවුන් ගේ අදහස් වැරැදි ය. අපේ දණ්ඩනායකයා මිනිසකු වශයෙන් ද, චරිතයෙන් ද, කවුරුනුත් සිතුවාට වඩා ගැඹුරු පුද්ගලයෙකි. එහෙත් නීති වෘත්තිය ආරම්භයේ දී ඔහුට සිය සමත් කම් දක්විය නොහැකි වූයේ සෞඛ්‍ය තත්ත්වයේ ඇති වූ දුබලකම නිසා ය. පසු කාලයේ දී පවා ඔහුට ඒ අඩුව පිරවිය නොහැකි විය.

අපේ අධිකරණයේ ප්‍රධාන විනිශ්චයකාර තුමා උගත්කමින් හා දයානුකම්පාවෙන් යුත්, සිය රාජකාරිය ගැන හොඳ අත්දැකීමක් හා දැනුමක් ඇති, කාලයට සුදුසු ප්‍රගතිශීලී අදහස් දරන පුද්ගලයෙකි. උසස් වීමට ආශාවක් තිබුණ ද, රක්ෂාව ගැන වැඩි සැලැකිල්ලක් නො දක්වූයේ ය. ඔහු ගේ ජීවිතයේ උසස් ම පරමාර්ථය වූයේ දියුණු අදහස් ඇත්තකු වීම ය. එසේ ම, එතුමා ලොකු ලොක්කන් සමඟ සබඳකම් පැවැත්වූ ධනවතෙකි. එතුමා 'කරමසෝෆ් මිනීමැරුම් නඩුව' ගැන මහත් සැලැකිල්ලක් දක්වූ බව අපට පසු ව දැනගන්නට ලැබිණි. නමුත් ඒ සැලැකිල්ල සාමාජික වශයෙන් මිස පෞද්ගලික වශයෙන් නො වෙයි. නඩුව ඔහු ගේ සිත් ගත්තේ සමාජ ආශ්චර්යයක් හැටියට ය. එය රුසියන් ජාතිකයන් ගේ සවභාවය එළිදරව් කරන, සමාජයේ තත්ත්වයෙන් ඇති වූවක් ලෙස වර්ග කළ හැකි විය. නඩුව ගැන, නඩුවේ දුක්මුසු වැදගත් කම ගැන, සිරකරුවා හා ඔහු සමඟ සම්බන්ධ වූ පුද්ගලයන් ගැන, එතුමා එ තරම් සැලැකිල්ලක් නො දක්වූයේ ය. සමහර විට නඩුව ගැන කල්පනා කරන විට එතුමා දක්වූ නොසැලැකිල්ල නිවැරැදි වන්නට පිළිවන.

විනිශ්චයකාරයන්, විනිශ්චයාසනාරූඪ වීමට පෙර අධිකරණ ශාලාව සෙනඟින් පිරී ඉතිරී ගියේ ය. ශබ්දයට බාධාවක් නොවන, ඉඩකඩ ඇති එම අධිකරණ ශාලාව අපේ නගරයේ තිබෙන හොඳ ම ශාලාවයි. විනිශ්චාසනයට දකුණු පසින් ජූරි සභාව සඳහා වේදිකාවක් උඩ මේසයක් සමඟ පුටු දෙ පෙළක් තබා තිබිණි. චෝදනා කාරයා ඔහු ගේ නීතිඥයා සමඟ වම් පැත්තේ හිඳ සිටියේ ය. මිනීමැරුමට සම්බන්ධ වූ උපකරණ සහිත මේසයක් ශාලාවේ මැද තබා තිබුණේ ය. මේ මේසය උඩ, පට රෙද්දෙන් මසන ලද මහලු කරමසෝෆ් ගේ ලේ තැවරුණ රාත්‍රී ඇඳුම ද, (මිනීමැරුමට ගන්නා ලද) භයානක පිත්තල මෝල්ගස ද,

ලේන්සුව දමන විට සාක්කුවට උඩින් ලේ තැවරුණු කබාය ද, ලේ මිදී ගොරෝසු වූ, එහෙත් දූත් කහ පාට වූ ලේන්සුව ද, මූක්රෝවේ හෝටල්කාරයා විසින් සොරා ගන්නා ලද, මිතියා පණ නහ ගැනීම සඳහා සූදානම් කරගත් පිස්තෝල ජෝඩුව ද, මහලු කරමසෝ විසින් ග්‍රෑසෙන්කාට තෑගි දීම පිණිස රූබල් තුන් දහ දමා නම ලියන ලද ලියුම් කවරය ද, එම ලියුම් කවරය ගැට ගැසූ රෝස පාට සිහින් පීත්ත පටිය ද, දූත් මට සඳහන් කළ නොහැකි තවත් නොයෙක් බඩු ද, එම මේසය උඩ තිබුණේ ය. මඳක් ඈතින් ශාලාව මැද, මහාජනයා සඳහා අසුන් පනවා තිබුණේ ය. අත්වැල ඉදිරිපිට පුටු කීපයක් තබා තිබුණේ, සාක්ෂි දී නිම කළ සාක්ෂිකරුවන් ගේ ප්‍රයෝජනය පිණිස ය.

දවල් දහයට විනිශ්චයකාරයෝ තිදෙනා ධර්මාධිකරණයේ අසුන් ගත්හ. ඉන් කෙනකු විනිශ්චය මණ්ඩලයේ සභාපති වන අතරේ, දෙවැන්නා වැටුප් නැති ව සේවය කරන සාමදාන විනිශ්චය කාරයකි. තුන් වැන්නා සාමාන්‍ය විනිශ්චයකාරයෙක් විය. පැමිණිල්ලේ නීතිඥයා ඒ එක්ක ම පැමිණියේ ය. සභාපති හවුරුදු පනහක් වයසැති තරබාරු මිනිසෙකි. ඔහු ගේ මුහුණ සුදුමැලි විය. සුදු වන හිසකෙස් කොට වන ලෙස කපා තිබිණි. ඔහු රතු පීත්ත පටියක් පැළඳ සිටිය මුත් ඉන් හඳුන්වන තරාතිරම මට මතක නැත. සුදුමැලි වූ මුහුණින් හා නිවට පෙනුමෙන් ද යුත් පැමිණිල්ලේ නීතිඥයා මගේ පමණක් නො ව හැම දෙනා ගේ ම සැලැකිල්ලට බඳුන් විය. ඔහු ගේ මුහුණ හදිසියෙන් ම සිහින් වූවාක් මෙන් පෙනේ. සමහර විට එක රැයින් සිහින් වූවා වැන්න. දෙ දිනකට කලින් ඔහු ගේ ප්‍රකෘති මුහුණ මම දිටිමි. ජූරි සභාවේ සියලු ම සාමාජිකයෝ පැමිණ සිටින් දැයි විමසමින් ප්‍රධාන විනිශ්චයකාරතුමා නඩු විභාගය ආරම්භ කෙළේ ය.

එහෙත් මේ නඩු විභාගයේ කෙරුණු කතාබහින් සමහරක් මට නො ඇසුණු නිසාත්, සමහරක් මා තුදුටු නිසාත්, සමහරක් මට අමතක වූ නිසාත්, ඒ සියල්ලට ම වඩා මා මීට කලින් සඳහන් කළාක් මෙන්, නඩු විභාගයේ දී කෙරුණු කියවුණු හැම දෙයක් ම විස්තර කිරීමට කාලයත් ඉඩත් නැති නිසාත්, නඩුව ගැන හැම දෙයක් ම විස්තර කළ නොහැකි ය. නමුත් පැමි-ණිල්ලේ නීතිඥයා හා විත්තියේ නීතිඥයා එක ම ජූරි සභිකයකු ගැනවත් විරුද්ධ නොවූ බව මට හොඳට මතකයි. ජූරි සභිකයන් දොළොස් දෙනා ගැන ද මට හොඳට මතකයි. එයින් හතර දෙනෙක් අපේ නගරයේ සුළු නිලධාරීහු වෙති. දෙදෙනෙක්

වෙලෙන්ද්දේ ය. හය දෙනෙක් ගොවියෝ හා කම්කරුවෝ ද වූ හ. මෙ තරම් ගැටළු සහිත සියුම් මානසික මිනීමැරුම් නඩුවක් පිළිබඳ තීරණය ගැනීම සඳහා, තත්ත්වයෙන් පහත් නිලධාරීන් හා ඒවක් පහත් ගැමියන් පිරිසකට භාර දිය හැකි ද? යන ප්‍රශ්නය නඩුව ආරම්භ වීමට පෙර සිට නගරයේ උසස් අය අතරේ, වෙසෙසින් ම කාන්තාවන් අතරේ පැවැති බව මට හොඳට මතකයි. ජූරි සභාවේ නිලධාරිහු හතර දෙනා පහත් නිලතල උසුලන, වයසින් වැඩි, කිසි ම වැදගත්කමක් නැති අය වෙති. තරුණයකුට සිටියේ එකෙක් පමණි. පැසුණු හිස කෙසින් යුත් අනෙක් අය වැඩි ප්‍රසිද්ධියක් නැති, ඉතා සුළු පඩියකින් දුක සේ ජීවත් වන්නෝ වෙති. සමහර විට ඔවුන්ට සමාජයත් සමඟ මිශ්‍ර විය නො හැකි මහලු භාර්යාවන් හා පාවහන් නොමැති ව හිස් පයින් දුව පැන ඇවිදින දරුවන් ද බොහෝ දෙනකු සිටිනවා විය හැකි ය. විවේක කාලයේ දී ඉතා සුළු මුදලකට කාඩ් ගසන ඔවුහු මුළු ජීවිතයට ම පොතක් පතක් කියවා නැත්තෝ ය. වෙලෙන්අේ දෙදෙනා වැදගතුන් ලෙස පෙනෙත්. එහෙත් පුදුමයකට වාගේ වචනයක්වත් කතා නො කළහ. නඩුව ගැන කිසි ම උනන්දුවක් නො දැක්වූ හ. දුලි රැවුළ කපා සිටි එකකු යුරෝපීය ඇඳුමෙන් සැරසී සිටි අතරේ, කුඩා ඉදුණු රැවුලකින් යුත් අනෙකා රතු පීත්ත පටියක ගැටගසන ලද පදක්කමක් බෙල්ල වටේ එල්ලා ගෙන සිටියේ ය. ජූරි සභාවේ සිටි කම්කරුවන් හා ගොවියන් ද ගැන කතා කිරීම නිෂ්ප්‍රයෝජන දෙයකි. එම පලාතේ කම්කරුවෝ ද යුරෝපීය ඇඳුමෙන් සැරසී සිටියහ ඒ නිසා ම ඔවුහු අනෙක් අයට වඩා අපිරිසුදු වූහ. ඇසට අප්‍රිය වූ හ. 'මෙ වැනි මිනිසුන්ට, මෙ වැනි බරපතල නඩුවක් තේරුම් ගත හැකි ද?' යන ප්‍රශ්නය මා මෙන් ඔවුන් දුටු කවරකු වුව ද නඟනවා ඇත. එහෙත් ඔවුන් ගේ මුහුණුවල අපූරු බැරෑරුම් තර්ජනාත්මක හැඟීමක් දකින්නට තිබිණි. ඔවුහු හිත් පිත් නැති අප්‍රසන්න බැල්මෙන් බලා සිටියෝ ය.

අන්තිමේ දී ප්‍රධාන විනිශ්චයකාරතුමා 'පියෝදර් පව්ලොවිච් කරමසෝ මිනීමැරුම් නඩුව' ආරම්භ කෙළේ ය. එතුමා මහලු කරමසෝ ගැන විස්තර කළ සැටි මට හරියට මතක නැත. සිරකරුවා කැඳවාගෙන ඒමට අධිකරණ ප්‍රවේශකයාට නියම කරන ලදින් ඔහු මිතියා කැඳවාගෙන ආවේ ය. මිතියා ගේ පැමිණීමත් සමඟ ම අධිකරණය පුරා දැඩි නිශ්ශබ්දතාවක් පැතිර ගියේ ය. අල්පෙනෙති කටුවක් වැටෙන හඬ පවා ඇසෙන්නට ඇත. මිතියා දැකීමෙන් අනෙක් අය තුළ කෙසේ වෙතත් මා තුළ නම් කිසි ම පැහැදීමක් ඇති නො වී ය. අලුත් කබායක්

ඇඳ සිටි මීතියා කිසි ම ගරු සරුවක් නැති ජේත්තු කාරයකු මෙන් පෙනිණි. ඔහු මේ කබාය මොන්කච් පුර සිටිනා, ඔහු ගේ ඇඳුම්වල මිම්ම දන්නා, ඇඳුම් මසන්නා ලවා මෙම අවස්ථාව සඳහා ම මසා ගත් බව මට පසු ව දැන ගන්නට ලැබිණි. ඔහු කහ පාට පිරිසුදු අත්මේස් සමඟ වටිනා රෙදි වර්ගයකින් මසන ලද කමිසයක් ද ඇඳ සිටියේ ය. යාරයක් පමණ දුරින් අඩි තබා, හිස කෙළින් කර ගෙන පැමිණි හෙතෙම තමාට වෙන් කොට තිබුණු අසුනේ හිඳගත්තේ කිසි ම සැලැකිල්ලක් දක්වා නො වේ. ඒ මොහොතේ දී ම වාගේ ඔහු ගේ නීතිඥයා ද පැමිණියේ ය. ඔහු ගේ පැමිණීමත් සමඟ අධිකරණ ශාලාව පුරා මැඩගත් නිශ්ශබ්දතාවක් පැතිර ගියේ ය. හෙතෙම දිග සිහින් කකුල්වලින් යුත් උස සිහින් මිනිසෙකි. ඔහු ගේ සුදුමැලි සිහින් ඇඟිලි ඉතා දිග ය. කොටට කපන ලද හිස කෙස් පස්සට පීරා තිබිණි. ඔහු ගේ සිහින් දිග දෙතොල් මත ඇතැම් විට සිනාවක් ද විරිත්තීමක් ද රැඳී තිබුණේ ය. ඔහුට හවුරුදු හතළිහක් පමණ ඇතැයි කිව හැකි ය. ඔහු ගේ දෑස නිසා නො වේ නම් මුහුණ දැකුම්කලු යයි කිව හැකි ය. ඉතා කුඩා, කිසි ම ආලෝකයක් නැති ඔහු ගේ දෑස කො තරම් එකිනෙකට කිට්ටුවෙන් පිහිටියේ ද කියතොත්, එය වෙන් වූයේ සිහින් රේඛාවක් මෙන් පෙනෙන දිග නාසයෙන් යයි කිව හැකි ය. ඇත්ත සේ කියන්නේ නම් ඔහු ගේ මුහුණ කුරුල්ලකු ගේ මුහුණට සමාන ය. රාත්‍රි උත්සව සඳහා අඳින ඇඳුමෙන් හා සුදු ටයි පටියකින් ද හෙතෙම සැරසී සිටියේ ය.

විනිශ්චයකාරතුමා මීතියා ගෙන් නම ගම, තරාතිරම විමසා, ඇසූ ප්‍රශ්නය මට හොඳට මතකයි. මීතියා හදිසියෙන් ම කිසි ම බලාපොරොත්තුවක් නැති ව උස් හඬින් පිළිතුරු දුන් නිසා, ප්‍රධාන විනිශ්චයකාරතුමා මඳක් තිගැස්සී සිරකරුවා දෙස පුදුමයෙන් බැලුවේ ය. අනතුරු ව සාක්ෂිකාරයන් ගේ සහ සාක්ෂි දෙන විශේෂඥයන් ගේ නාම-ලේඛනයක් කියවන ලදී. එය දිග ලේඛනයකි. සාක්ෂිකාරයෝ හතර දෙනෙක් පැමිණ නො සිටියහ. මූලික පරීක්ෂණයේ දී සාක්ෂි දුන් ඇලෙක්සැන්ඩර් මියුසෝව් මහතා මේ දවස්වල සිටියේ පැරීසියෙහි ය. හොලාකෝව් මැතිනිය සහ මැක්සිමෝව් මහතා අසනීපය නිසා පැමිණ නො සිටියහ. පැවෙල් හදිසියෙන් ම දිවි නසා ගත්තේ ය. ඔහු ගේ හදිසි මරණය ගැන පොලීසිය ප්‍රකාශයක් කෙළේ ය. පැවෙල් ගේ මරණය පිළිබඳ ආරංචිය නිසා අධිකරණය තුළ නොසන්සුන් කමක් ඇති විය. එහි රැස් ව සිටි බොහෝ දෙනෙක් මරණය ගැන අසා නො තිබිණි. එහෙත් ඔවුන් නොසන්සුන් වූයේ මරණය

ගැන ආරංචිය නිසා නො ව, මීතියා ගේ හදිසි කෑගෑම නිසා ය. පැවල් ගේ මරණය ගැන දූත්වූ වහා ම "ඌ බල්ලා! බල්ලෙක් වගේ මළා!"යි කියා මීතියා මහ හඬින් කෑගෑවේ ය.

ඔහු ගේ නීතිඥයා වහා ඔහු ළඟට ගිය සැටිත්, මීට පස්සේ ආයේත් කෑගැවොත් තදින් ක්‍රියා කරන බව දන්වමින් ප්‍රධාන විනිශ්චයකාරතුමා කළ තරවටුවත් මට මතකයි. මීතියා හිස වනා "මීට පස්සේ මම කෑගාත්තේ නැහැ. මා නො දනයි කෑගැවේ"යි කීප වරක් ම නීතිඥයාට කීවේ ය. එහෙත් කෑගෑම ගැන පසුතැවෙන බවක් නොහැඟෙව්වේ ය.

මේ කෙටි සිද්ධිය නිසා ජූරිසභාව හා මහජනයා තුළ එ තරම් හොඳ ප්‍රතිඵලයක් ඇති නො වී ය. මේ සිද්ධිය නිසා මීතියා ගේ ගතිගුණ කාටත් දූනගත හැකි විය. දණ්ඩනායකයා මීතියාට විරුද්ධ පැමිණිල්ල ඉදිරිපත් කළේ මේ බලපැවැත්ම තිබෙන විට ය.

පැමිණිල්ල සිදුවූ හැම දෙයක් ම අළලා කරන ලද කෙටි ප්‍රකාශයකි. අසවලා සිරභාරයට ගෙන නඩු පවරන ලද්දේ අසවල් කරුණු නිසා යයි දක්වන ප්‍රධාන කරුණු පමණක් එහි සඳහන් කොට තිබිණි. කෙසේ වෙතත් එය මගේ සිත් තදින් ගත්තේ ය. ලියන්නා හඬ නගා පැහැදිලි ව පැමිණිල්ල කියෙව්වේ ය. මුළු අපරාධය ම යළි හැම දෙනා ඉදිරිපිට ඉතා පැහැදිලි ව හා භයානක ලෙසත් මැවී පෙනෙන්නට විය. ප්‍රකාශය කියවා අවසන් කළ වහා ම විනිශ්චයකාරතුමා මීතියා අමතා "සිරකරුව, යුෂ්මතා වැරදිකරුවෙක් ද? නිවැරදි-කරුවෙක් ද?" කියා ඇසූ සැටි මට හොඳට මතකයි.

මීතියා හිඳ සිටි තැනින් වහා නැඟී සිටියේ ය.

"මම බේබදුකමට හා දුරාචාරයට වැරදිකාරයෙක්. කම්මැලිකමට හා සල්ලාල කමට වැරදිකාරයෙක්. මගේ දෛවය විසින් මා මේ භයානක අපරාධයට අසු කරන වේලාවේ දී මා අදහස් කරගෙන හිටියේ මුළු ජීවිතයට ම හොඳ යහපත් මිනිසකු වීමටයි. මගේ පියා ගේ, මගේ හතුරා ගේ මරණය ගැන මා වැරදි කාරයෙක් නො වෙයි. මා ඔහු ගේ මුදල් සොරා ගත්ත වැරදිකාරයෙක් නො වෙයි. මා වැරදිකාරයෙක් වෙන්න බැහැ. මීතියා කරමසෝ නක්කඩියෙක්, නමුත් සොරෙක් නො වෙයි." මීතියා අසන්නන් තැති ගන්වන උමතු හඬින් කී ය.

ඔහු යළි හිඳගත්තේ ය. ඔහු ගේ සර්වාංගය ම වෙවුලත්නට විය. අසන ලද ප්‍රශ්නයට පමණක් පිළිතුරු දෙනවා මිස නුවුවමනා දේවල් කියමින් උමතුවෙන් කෑගොගා සිටින ලෙස විනිශ්චයකාරතුමා යළි කෙටියෙන්, එහෙත් කාවදින ලෙස කියා, අනතුරු ව නඩු විභාගය ආරම්භ කරන ලෙස නියම කෙළේ ය. පළමු ව දිවුරුම් දීම පිණිස සාක්ෂිකාරයෝ කැඳවන ලදහ. මා සාක්ෂිකාරයන් දුටුවේ එවිට ය. සිරකාරයා ගේ සහෝදරයන් දෙදෙනාට දිවුරුම් නො දී සාක්ෂි දීමට ඉඩ දෙන ලදි. පූජකයා හා ප්‍රධාන විනිශ්චයකාරතුමා ද විසින් කරන ලද කෙටි කතාවෙන් අනතුරු ව යළි සාක්ෂිකාරයෝ අධිකරණ ශාලාවෙන් එළියට කැඳවාගෙන ගොස්, හැකි තරම් එකිනෙකාගෙන් ඈත් වී සිටීමට සලස්වන ලදහ. සාක්ෂි දීම පිණිස එකිනෙකා වෙන වෙන ම කැඳවන ලද්දේ අනතුරු ව ය.

දෙ වන පරිච්ඡේදය

භයානක සාක්ෂිකාරයෝ

විත්තියට හා පැමිණිල්ලට සාක්ෂි දෙන සාක්ෂිකාරයෝ ප්‍රධාන විනිශ්චයකාරතුමා ගේ නියමය අනුව කොටස් දෙකකට බෙදන ලදහ. එසේ බෙදන ලද්දේ, කිසියම් වැඩ පිළිවෙළක් අනුව සාක්ෂි විභාග කිරීමට දැයි මම නො දනිමි. එසේ වූවාට කිසි ම සැකයක් නැති. පැමිණිල්ලේ සාක්ෂිකාරයන් පමණක් පළමු ව කැඳවන ලද බව මම දනිමි. ඔවුන් ගෙන් අසන ලද හැම ප්‍රශ්නයක් ම මෙහි ලා විස්තර කිරීමට අදහස් නොකරන බව මම ආයෙත් කියමි. පැමිණිල්ලේ හා විත්තියේ නීතිඥයන් දෙදෙනා විසින් සියලු ම සාක්ෂි එක්තැන් කොට ඉතා ප්‍රබල ලෙස සකස් කරන ලද දේශනා දෙකින් උපුටා ගන්නා ලද කොටස් මම ඉදිරි කාලයේ දී ඉදිරිපත් කරමි. ජූරි සභාවට ඒ අවසාන දේශනා ඉදිරිපත් කිරීමට පෙර කිසි ම බලාපොරොත්තුවක් නැති ව සිදු වූ අපූර්ව දෙයක් නඩු තීන්දුව කෙරෙහි ඉතා භයානක ලෙස හා කෲර ලෙස බලපැවැත්වී ය. මා ඒ සිද්ධිය විස්තර කිරීමට අදහස් කරන නිසා නඩු විභාගය ගැන සම්පූර්ණ විස්තරයක් අනවශ්‍ය වෙයි.

නඩු විභාගය ආරම්භ කළ මොහොතේ සිට නඩුව පිළිබඳ කාටත් පැහැදිලි ව පෙනුණ අමුතු ලක්ෂණයක් තිබුණු බව පමණක් කියමි. ඒ අමුතු ලක්ෂණය නම් විත්තිය සිරකරුවා ගේ නිදහසට ඉදිරිපත් කළ තර්ක අනුව සලකා බලන කල පැමිණිල්ල ඉතා ශක්තිමත් බව ය. එක ම කරුණක් වටා සාක්ෂි ගොඩ නැගෙන්නට පටන් ගත් බවත්, ඒ සමඟ භයානක මිනීමැරුම පිළිබඳ සියලු තොරතුරු ටිකින් ටික හෙළිවන බවත්, නඩුව ආරම්භ කළ මොහොතේ සිට කාටත් පැහැදිලි විය. නඩුව ගැන මතභේදයක් නැති බවත්, මිනීමැරුම ගැන සැකයක් නැති බවත්, ඒ ගැන වාද විවාද කිරීමට කරුණක් නැති බවත්, සිරකරුවා වෙනුවෙන් නීතිඥයකු අති ව නඩුවිභාගයක් පවත්වන්නේ නීතියේ අවශ්‍යතාවක් සපුරාලීමට පමණක් බවත්, සිරකරුවා වරද කරු බවත්, නියම වශයෙන් ම වරද කරු බවත්, ඒ ගැන සැක කිරීමට හේතුවක් නැති බවත්, සමහර විට අධිකරණ ශාලාවේ සිටි හැම දෙනාට ම මුල සිට ම වාගේ පෙනීයන්නට ඇත. මේ වැදගත් සිරකරුවා ගේ නිදහස් වීම නොඉවසිල්ලෙන් බලා සිටි කාන්තාවන් පවා සිරකරුවා වරදකරු බව පිළිගත්හයි මම විශ්වාස කරමි. එමතු ද නො ව, සිරකරුවා කළ අපරාධය ඔප්පු නො වුව හොත් ඔහු නිදහස් වන අන්තිම ජවනිකාව සංවේගයෙන් අඩුවන හෙයින්, සිරකරුවා කළ අපරාධය සපිර ව ම ඔප්පු නො වුව හොත් කාන්තාවන් කෝප වන්නට පිළිවනැයි මට විශ්වාස නො කර සිටිය නොහැකි ය. පුදුමය, සිරකරුවා නිදහස් වේ ය යන අදහස අවසානය දක්වා හැම කාන්තාවක් ම විශ්වාස කිරීම ය. "ඔහු තාත්තා මැරූ බව ඇත්තයි. එහෙත් දූන් පවතින නව පන්නයක් හැටියට පිළිගෙන තිබෙන, දියුණු අදහස් හා දයාව හා අනුකම්පාව නිසා ඔහුට නිදහස ලැබේවි" යි ඔවුහු කීහ. මේ කාන්තාවන් නොඉවසිල්ලෙන් අධිකරණ ශාලාවට රොක් වුණේ මේ අදහස ඇති ව ය. දෙපක්ෂයට පෙනී සිටින නීතිඥයන් දෙදෙනා අතරේ පැවැති තරගය ගැන පිරිමි පක්ෂය වැඩි සැලැකිල්ලක් දැක්වී ය. මෙ තරම් දක්ෂ මේ නීතිඥයා පවා කිසි ම බලාපොරොත්තුවක් ඇති කරගත නො හැකි නඩුවක් ගැන මොනවා කරන්න ද? යි තමන්ගෙන් ම ප්‍රශ්න කළ හැම දෙනා ම මහත් සැලැකිල්ලකින් යුතු ව නඩුවට සවන් දුන්හ.

. නඩුවේ අවසානය දක්වා, ඔහු ගේ අවසාන දේශනය දක්වා, විත්තිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥයා කාටත් මහත් ප්‍රහේලිකාවක් මෙන් පෙනිණි. ඔහු නඩුවට පෙනී සිටින්නේ කිසියම් වැඩ පිළිවෙළක් ඇති ව ය, කිසියම් අදහසක් ඇති ව ය,යි

නීතිඥයා ගැන අත්දැකීම් ඇති අය කල්පනා කළහ. එහෙත් නීතිඥයා ගේ අදහස් මොනවා දැයි කීමට කිසිවෙක් නොදත්හ. කෙසේ වෙතත් ඔහු ගේ ආත්ම විශ්වාසය හා ආත්ම ශක්තිය ගැන සැක කරන්නට හේතුවක් නැත. හැරත් ඔහු අපේ නගරයේ නතර වී සිටි කාලය තුළ නඩුව ගැන හොඳ සියුම් දැනුමක් ලබාගත්තේ ය. එය කාගෙත් සතුටට හේතු විය. ඔහු නියම වේලාවට, පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ඉතා දක්ෂ ලෙස උපායෙන් මුලා කොට, හැකි තරම් සිත් අවුල් කොට, එ මතු ද නො ව ඔවුන් ගේ ගරුත්වයට හානි කොට, ඔවුන් දුන් සාක්ෂි-වල වැදගත් කම අඩු කළ සැටි, පසු කාලයේ දී පලාත් වාසීහු මහත් ආශාවෙන් කීහ. ඔහු එසේ කළේ හුදෙක් විනෝදය පිණිස ය, නීතිඥයකු හැටියට තමා ගේ දක්ෂ කම් පෙන්නීමටය, පිළිගත් නීති සම්ප්‍රදාය අකුරට ම අනුගමනය කළ බව සහිර ව දැන ගැනීමටය සි, පසු කාලයේ දී කියන ලදි. එහෙත් සාක්ෂිකාරයන් අපකීර්තියට පත්කිරීමෙන් වැඩි ප්‍රයෝජනයක් නොවන බව කවුරුත් දැනගත්හ. අනෙක් අයට වඩා හොඳට ඔහු ඒ බව දැන සිටින්නට ඇත. ඔහු එය නියම වේලාවට විත්තියේ වාසියට ගත හැකි ආයුධයක් මෙන් සඟවාගෙන සිටියේ ය. එහෙත් නියම වේලාවට ඔහු එම ආයුධය පාවිච්චි කරනවා ඇත. ඒ අතරේ තමා ගේ සමත් කම් ගැන හොඳ විශ්වාසයක් ඇති ව සිටි නීතිඥයා සාක්ෂි කාරයන් පරීක්ෂා කිරීමේ දී විනෝද වන්නාක් මෙන් පෙනිණි.

නිදසුනක් වශයෙන්, එදා රෑ මහ ගෙදර ඇර තබන ලද දොර ගැන විනාශකාරී සාක්ෂියක් දුන් මහලු ගිරිගෝරිස්ගෙන් කෝන්තර ඇසීමේ අවස්ථාව පැමිණි විට විත්තියේ නීතිඥයා කුඩැල්ලකු වාගේ මහලු ගිරිගෝරිස් අල්ලා ගත්තේ ය. අධිකරණ ශාලාවේ පැවැති අනුභාවය හෝ එහි රැස් ව සිටි මහ පිරිස ගැන හෝ කිසි ම සැලැකිල්ලක් නො දක්වා සන්සුන් සිතින් යුතු ව ගිරිගෝරිස් සාක්ෂි දුන් බව මෙහි ලා සඳහන් කළ යුතු ය. ඔහු දැඩි ආත්ම විශ්වාසයකින් යුතු ව සාක්ෂි දුන්නේ ගෙදර දී බිරියට කතා කරන්නාක් මෙනි. මඳ වෙනසකට තිබුණේ බිරියට කතා කරනවාට වඩා ගෞරවයෙන් යුතු ව කතා කිරීම ය. ඔහු ගේ සාක්ෂිය සෙලවිය නොහැකි විය. පළමු ව පැමිණිල්ලේ නීතිඥයා කරමසෝව් පවුල ගැන සියලු තොරතුරු ගිරිගෝරිස්ගෙන් විමසුවේ ය. පවුලේ පියපුතුන් අතරේ පැවැති සබඳකම හොඳට පැහැදිලි වන්නට විය. සාක්ෂිකාරයා අවංක ව හා අපක්ෂපාත ව සාක්ෂි දෙන බව කාගෙත් ඇසටත් කනටත් පෙනී ගියේ ය.

මහලු කරමසෝ ඔහු ගේ වැඩිමහල් පුතා වන මීතියාට අඩන්තේට්ටම් කළ සැටිත්, කරමසෝ නියම ලෙස දරුවන් ඇති දැඩි නොකල බවත්, මහලු සේවකයා මිය ගිය ස්වාමියාට දක්වූ භක්තිය පසකින් තබා කී ය. "මා නොසිටියා නම් මීතියා කුඩා කාලයේ දී හිසේ උකුණන් කා මැරෙනවා"යි හෙතෙම මීතියා ගේ කුඩා කාලය ගැන විස්තර කරමින් කී ය. "අම්මා ගෙන් ලැබුණු ඉඩකඩම් පුතාගෙන් උදුරා ගැනීම පියකු විසින් කලයුතු හොඳ වැඩක් නො වෙයි."

"මහලු කරමසෝ මුදල් සම්බන්ධ ව පුතාට වංචා කලා ය, කියන්නේ කුමන කරුණක් ඇති ව ද?"යි පැමිණිල්ලේ නීතිඥයා ප්‍රශ්න කල විට, හැම දෙනා ගේ ම පුදුමයට එය ඔප්පු කල හැකි සාක්ෂියක් ඉදිරිපත් කිරීමට ගිරිගෝරිස්ට නුපුළුවන් විය. නමුත් පියා පුතාට මුදල් ගෙවූ සැටි අසාධාරණ බව තරයේ කියා සිටි ගිරිගෝරිස්, තවත් රූබල් දහස් ගණනක් ගෙවිය යුතුයයි කී ය. මීතියාට මවගෙන් ලැබිය යුතු මුදල් මහලු කරමසෝ ඇත්ත වශයෙන් ම නො ගෙවා සිටියේ ද? යන ප්‍රශ්නය අලෝෂා හා මීතියා ඇතුළු ඇසිය හැකි හැම සාක්ෂිකාරයකුගෙන් ම දණ්ඩනායකයා ඇසුවේ ය. එහෙත් ඒ එකකුගෙන් වත් ඇත්ත දැනගත නොහැකි විය. මවගෙන් හිමි වූ ධනය මහලු කරමසෝ විසින් මීතියාට ගෙවිය යුතු බව කවුරුත් පිළිගත්හ. එහෙත් ඒ එක සාක්ෂිකාරයෙක් වත් තාත්තා මීතියාට මුදල් නොගෙවූ බව ඔප්පු කල හැකි සාක්ෂියක් ඉදිරිපත් නොකෙලේ ය. රාත්‍රි කෑම ගත්තා විට මීතියා මහ ගෙදරට කඩාවැදී තාත්තාට පහර දී අංපසු පැමිණ මරන බවට තර්ජනය කල සැටි අනතුරු ව ගිරිගෝරිස් විස්තර කෙලේ ය. මේ සාක්ෂිය නිසා එහි රැස් ව සිටි හැම දෙනා තුළ ම අප්‍රසන්න ගතියක් ඇති විය. වෙසෙසින් ම මහලු සේවකයා සත්සුත් ව, අමතර වචන පාවිච්චි නො කර ඔහුගේ ම බසින් විස්තර කල එම සිද්ධිය ඉතා භයානක ලෙස පෙනිණි. බිම දමා තමා ගේ මූහුණට පහර දුන් සැටි විස්තර කල ගිරිගෝරිස්, ඒ ගැන මීතියා සමඟ තරහ නැති බැවින්, ඒ වරදට බොහෝ කාලයකට පෙර සමාව දුන් බවත් කී ය. පැවල් ගැන සඳහන් කල හෙතෙම කුරුසයේ ලකුණ ඇඳ, පැවල් දක්ෂ තරුණයකු වුවත් මෝඩ බවත්, මීමැස්මොර රෝගයෙන් දුබල වුවත් දෙවියන් ගැන විශ්වාස නොකල බවත්, දෙවියන් ගැන විශ්වාස නො කිරීමට ඔහුට කියා දුන්නේ මහලු කරමසෝ සහ ඔහු ගේ දෙවන පුතා ඉවාන් කරමසෝ බවත් කී ය. එහෙත් පැවල් ගේ අවංක කම ගැන සැක කිරීමට දෙයක් නැතැයි ආදරයෙන් පැවැසූ ගිරිගෝරිස්,

එය ඔප්පු කිරීම පිණිස වරක් පැවල් වත්තේ තිබී තම සවාමියා සතු මුදල් අහුලාගෙන සඟවා නො ගෙන ආපසු දුන් සැටිත්, තෑග්ගක් වශයෙන් රූබල් දහයේ රත් කාසියක් දුන් සවාමියා ඊට පස්සේ පැවල් ගැන ලොකු විශ්වාසයක් ඇති ව සිටි සැටිත් විස්තර කෙළේ ය. වත්තේ සිට මහ ගෙදර කාමරයට ඇතුළුවන දොර ඇර තිබුණු බව ඔහු තරයේ ම කියා සිටියේ ය. ඔහුගෙන් ප්‍රශ්න රාශියක් ම අසනු ලදි. දූත් මට ඒවා කිසිවක් මතක නැත.

අත්තිමේ දී විත්තියේ නීතිඥයා ග්‍රිගෝරිත් ගෙන් හෝත්තර අසන්නට විය. ඔහු පළමු ව ඇසුවේ, යම් කිසි තැනැත්තියකට දීම පිණිස පියෝදර් පව්ලොවිච් කරමසෝෆ් රූබල් තුන් දහසක් තැන්පත් කොට තිබුණු ලියුම් කවරය ගැන ය—"යුෂ්මතා ගේ සවාමියාට බොහො ම කාලයක් ඉතා කිට්ටුවෙන් සේවය කළ යුෂ්මතා එම ලියුම් කවරය දුටුවා ද?" තමා ලියුම් කවරය නුදුටු බවත්, අනුන් ගෙන් දැන ගන්නා තෙක් එ වැනි ලියුමක් තිබෙන බව තමා නො දැන සිටි බවත්, ග්‍රිගෝරිත් පිළිතුරු දෙමින් කී ය. පැමිණිල්ලේ නීතිඥයා, මිතියාට මවගෙන් හිමි වූ ධනය ගැන හැම සාක්ෂිකාරයකු ගෙන් ම ප්‍රශ්න කළාක් මෙන් විත්තියේ නීතිඥයා මුදල් සමඟ ලියුම් කවරය ගැන හැම සාක්ෂිකාරයකු ගෙන් ම ප්‍රශ්න කළ මුත් ලියුම් කවරය දුටු කිසිවෙක් නො වී ය. හැම දෙනා ම වාගේ ඒ බව දැන සිටියේ ආරංචි මාත්‍රයෙන් පමණි. නීතිඥයා මුල සිට ම මේ මුදල් සමඟ ලියුම් කවරය ගැන මහත් සැලැකිල්ලක් දැක්වූ බව කවුරුත් දුටහ.

"දැන් යුෂ්මතා ගෙන් අවසර ඇති ව යුෂ්මතාගෙන් ප්‍රශ්නයක් ඇසීමට මා කැමැතියි" නීතිඥයා කිසි ම බලාපොරොත්තුවක් නැති ව හදිසියෙන් ම කී ය. "මේ නඩුව ගැන පැවැත්වූ මූලික පරීක්ෂණයේ දී යුෂ්මතා කිව්වා නේ ද යුෂ්මතාට වැළඳී ඇති කටි වායුව සනීප කරගැනීම පිණිස එදා රෑ පිටේ බෙහෙතක් ගෑවා ය කියා? මොනවාවලින් ද ඒ බෙහෙත හැදුවේ?"

මඳ වේලාවක් නීතිඥයා දෙස හිස් බැල්මෙන් බලා සිටි මහල්ලා "ඒ බෙහෙත්වල සහ තිබුණා"යි කී ය.

"සහ විතරක් ද තිබුණේ? වෙන බෙහෙත් ජාතියක් තිබුණේ නැද්ද?"

"කෙසෙල් තිබුණා."

"ගම්මිරිස් තිබුණා නේ ද?"

"ඔව්, ගම්මිරිස් තිබුණා."

"ඔය විදියට නොයෙක් බෙහෙත් ජාති තිබුණා. මේ සේරම බෙහෙත් ජාති දිය කරලා තිබුණේ වොඩ්කාවලින් වෙන්න ඕනෑ."

"නැහැ, ඉස්පිරිත්තුවලින්."

අධිකරණ ශාලාවෙන් සුළු සිනා හඬක් නික්මිණි.

"ඔව්, ඔව්, ඉස්පිරිත්තුත් තිබුණා. ඉතින් ඉස්පිරිත්තු පිටේ අතුල්ලා, යුෂ්මතා ශේ බිරිය පමණක් දන්නා යාච්ඤාවක් කරලා, ඉතිරි බෙහෙත් ටික බිව්වා?"

"ඔව්."

"කොපමණ විතර බිව්ව ද? වීදුරුවක්? නැතිනම් දෙකක්?"

"වීදුරුවක් විතර බිව්වා."

"වීදුරුවක් පිරෙන්න බිව්ව ද? වීදුරු එකහමාරක් නොබිව්ව බව යුෂ්මතාට හොඳට විශ්වාස ද?"

ගිරිගෝරිස් පිළිතුරු නුදුන්නේ ය. ඔහුට ප්‍රශ්නය යටින් සැඟවුණු අදහස පෙනිණි.

"ඉස්පිරිත්තු වීදුරු එකහමාරක් බිව්වාම එ තරම් නරක නැහැ. එහෙම නේ ද? ගෙයි සිට වත්තට ඇතුළුවන දොර පමණක් නො වෙයි, යුෂ්මතාට දිව්‍ය ලෝකයට ඇතුළු වන ගේට්ටුවත් ඇරල තියෙනවා පෙනෙන්න ඇති!"

ගිරිගෝරිස් කතා නො කර සිටියේ ය. යළිත් සභා ගර්භයෙන් සිනා හඬක් නික්මිණි. ප්‍රධාන විනිශ්චයකාරතුමා මඳක් නොසන්සුන් විය.

"දොර ඇර තියෙනවා දකින කොට යුෂ්මතා නිඳගෙන හිටියද, නැති නම් නැගිටල හිටියද කියා හොඳට මතක ද?" යි නීතිඥයා බලකොට ඇසුවේ ය.

"මම දෙපයින් හිටියා."

"යුෂ්මතා නිඳ නො ගෙන හිටිය බව පෙන්වීමට ඒක සාක්ෂියක් නො වෙයි. (සභා ගර්භයෙන් යළි සිනා හඬක්

තික්මිණි.) යම් කිසි කෙනෙක් ඒ මොහොතේ දී යුෂ්මතා ගෙන් ප්‍රශ්නයක් ඇසුවා නම්, 'මෙය මොන අවුරුද්ද ද?' කියා ඇසුවා නම්, යුෂ්මතාට පිළිතුරු දෙන්න පුළුවන් ද?"

"මා දන්නේ නැහැ."

"මේ අවුරුද්ද මොන අවුරුද්ද ද කියා දන්නේ නැහැ?"

ගිරිගෝරිස් තමා ගේ වදකයා දෙස පුදුමයෙන් බැලුවේ ය. පුදුමයකට වාගේ එය මොන අවුරුද්ද දැයි ඔහු නො දැන සිටියේ ය.

"අඩු ගණනේ යුෂ්මතා ගේ අතේ ඇඟිලි කීයක් තියෙනව ද කියා අපට කියන්න පුළුවන් ද?"

"මා දාසයෙක්, මට විහිළු කිරීම සුදුසු ය කියා තමුන්නාන්සේ හිතනවා නම් මා ඒ දඬුවම විඳින්න කැමැතියි." ගිරිගෝරිස් හදිසියෙන් ම කෑගා කාටත් තේරුම් ගත හැකි වන ලෙස කී ය.

නීතිඥයා මදක් තිගැස්සුණේ ය. ප්‍රධාන විනිශ්චයකාරතුමා මැදහත් වී තැනට නුසුදුසු ප්‍රශ්න නො ඇසිය යුතු බව කී ය. හිස නමා ආචාර කරමින් විනිශ්චයකාරතුමා ගේ නියෝගය පිළිගත් නීතිඥයා ඇසීමට වෙනත් ප්‍රශ්න නැතැයි කී ය. එහෙත් කිසියම් වට්ටෝරු බෙහෙතක් පානය කළ විට දෙව්ලොවේ ගේට්ටුව ඇර තිබෙන බව පෙනෙන, එසේ ම මොන අවුරුද්ද දැයි නොදත් මහල්ලකු ගේ සාක්ෂිවල ඇති වැදගත් කම ගැන මහජනයා තුළ හා ජූරිසභාව තුළ ද සැක ඇති කිරීමට නීතිඥයා සමත් විය. අනෙක් කාරණාව කෙසේ වෙතත් විත්තියේ නීතිඥයා සිය අදහස් මුදුන් පමුණුවා ගත්තේ ය. එහෙත් ගිරිගෝරිස් සාක්ෂි කූඩුවෙන් පිටවීමට පෙර තවත් දෙයක් සිදු විය. සාක්ෂිකාරයා ගේ සාක්ෂි ගැන කිය යුතු දෙයක් ඇද්දැ?යි ප්‍රධාන විනිශ්චය කාරතුමා සිරකරුවා දෙසට හැරී විමසුවේ ය.

"දොර පිළිබඳ කතාව හැරෙන්නට ගිරිගෝරිස් කිව්වේ ඇත්තයි" මීතියා උස් හඬින් කී ය. "නුඹ මගේ හිසේ උකුණන් අරන් දමා, මා ඇති දැඩි කළා, මා ගැසූ පහර ගැන මට සමාව දෙන නුඹට බොහො ම ස්තුතියි. බල්ලන් හත්සියක් වගේ ගිරිගෝරිස් මගේ තාත්තාට මුළු ජීවිතයට ම අවංක ව සේවය කළා."

"යුෂ්මතා පාච්චි කරන වචන ගැන පරිස්සම් විය යුතුයි" කියමින් ප්‍රධාන විනිශ්චයකාරතුමා ආයේත් වරක් මීතියාට අවවාද කෙළේ ය.

"මම බල්ලෙක් නො වෙයි" ගිරිගෝරිස් ද කී ය.

"එහෙනම් මායි බල්ලා"යි මීතියා කී ය. "ඒක අපහාසයක් නම් ඒ අපහාසය භාරගෙන තුඹෙත් සමාව ඉල්ලන්න කැමැතියි. මම කිරිසනෙක්. මම ගිරිගෝරිස්ට බොහො ම නපුරු කම් කළා. මම ඊසෝප්පටත් නපුරු කම් කළා."

"කවු ද ඊසෝප් කියන්නේ?"යි ප්‍රධාන විනිශ්චයකාරතුමා ප්‍රශ්න කෙළේ ය.

"මගේ තාත්තා."

තමා ගේ කතාව ගැන පරිස්සම් වන ලෙස විනිශ්චයකාරතුමා ආයේත් මීතියාට තදින් අවවාද කෙළේ ය.

"යුෂ්මතා ගේ කතාව නිසා යුෂ්මතා ගේ විනිශ්චයකාරයන් තුළ යුෂ්මතාට අහිතකර වූ හැඟීම් ඇතිවෙන්න පුළුවනි."

විත්තියේ නීතිඥයා පෙරටත් වඩා දක්ෂ අත්දමින් සිය උපා යොදවා රැකිටින්ගෙන් කෝත්තර ඇසුවේ ය. රැකිටින් ප්‍රධාන සාක්ෂිකාරයන් අතරින් එකෙකි. පැමිණිල්ල ඔහු ගේ සාක්ෂි ඉතා වැදගත් කොට සැලකූ බව මෙහි ලා සඳහන් කළයුතු ය. ඔහු හැම දෙයක් ගැන ම දැන සිටිය බව පෙනිණි. ඔහු ගේ දැනුම පුදුමාකාර ය. ඔහු නඩුවට සම්බන්ධ වූ හැම දෙයක් ම දැන, හැම දෙනාට ම කතා කොට තිබිණි. ඔහු කරමසෝ පවුලේ හැම දෙනාගේ ම වතගොත දැන සිටියේ ය. මුදල් සහිත ලියුම් කවරය ගැන ඔහු සවිර ව යමක් කීමට දැන නොසිටියේ ය. ඔහු ඒ ගැන දැනගත්තේ මීතියා ගෙනි. අනෙක් අතින් රැකිටින් මීතියා නගරයේ දී කළ කී හැම දෙයක් ම විස්තර ඇති ව කීවේ ය. මීතියා කපිතන් සෙනිග්‍රියෝප්ට මඟ මඟ දී කල අපහාසය ද විස්තර කෙළේ ය. එහෙත් මීතියාට මවගෙන් ලැබුණු ධනය, හා තාත්තා ඒ ධනය මීතියාට දුන්නේ ද? යන ප්‍රශ්නය ගැන කිසිවක් කීමට නොදත් රැකිටින් ඒ වෙනුවට මීතියා පිළිබඳ සිතේ පිළිකුල් උපදවන දෑ කීවේ ය. "තාත්තයි පුතයි අතරින් වරදකාරයා කවුද කියා කාට ද කියන්න පුළුවන්? කවුද කියන්න දන්නේ? කරමසෝ පවුලේ එකකුටවත් කිසි ම දෙයක් හරිහැටි කරන්න

බැහැ. සේරම වැඩ අවුල් කරගන්නවා." මේ මිනීමැරුමට ප්‍රධාන හේතුව, යුග ගණනක් අපේ රටේ පැවැති වහල් භාවයේ ප්‍රතිඵලය හා නියම පාලනයක් නැති ව රටේ පවතින අවුල් තත්ත්වය බව රැකිටින් විස්තර කරමින් කී ය. ඇත්ත යේ කියන්නේ නම් සිත්සේ සිය අදහස් පැවැසීමට ඔහුට අධිකරණයෙන් අවසර ලැබිණි. තමා ගේ සමත්කම් පලමු වරට පෙන්නා මහජනයා ගේ සිත් ගැනීමට අවස්ථාවක් රැකිටින්ට මේ නඩුවෙන් ලැබිණි. රැකිටින් මෙම නඩුව ගැන සඟරාවක පළකිරීම පිණිස ලිපියක් පිළියෙළ කරන බව පැමිණිල්ලේ නීතිඥයා දැන සිටියේ ය. තමා දැනට ම එම ලිපිය කියවා ඇති බව දන්වූ නීතිඥයා ඔහු ගේ අවසාන දෙසුමේ දී එම ලිපියෙන් කොටස් ඉදිරිපත් කළ බව අපට පසු ව දැනගත හැකි ය. රැකිටින් සාක්ෂි දෙමින් කළ විස්තරයෙන් ඉතා ඛේදජනක භයානක චිත්‍රයක් මැවී පෙනුණා පමණක් නො ව, මිතියාට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද චෝදනා ශක්තිමත් කරන්නක් ද විය. අදහස්වල ඇති සවාධීනත්වය හා උතුම් පරමාර්ථය නිසා රැකිටින් ගේ කතාව මහජනයා ගේ සිත් තදින් ඇදගත්තේ ය. රුසියාවේ පැවැති වහල් මෙහෙය හා මහජනයාට මුහුණ පෑමට සිදු වී තිබෙන දුක් ගිරිහැර ගැන විස්තර කරන විට අධිකරණ ශාලාවේ රැස් ව සිටි මහජනයා තුන් හතර වරක් අත්පොළසන් දුන්නෝ ය.

එහෙත් රැකිටින් ගේ තරුණ මතය නිසා ඔහු අතින් සුළු වරදක් සිදුවිය. විත්තියේ නීතිඥයා වහා ඒ වරද තමා ගේ වාසියට හරවා ගත්තේ ය. ග්‍රූසෙන්කා ගැන අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සිටි රැකිටින් සිය අදහස්වල ඇති ශ්‍රේෂ්ඨත්වය දැන ලැබූ ජයග්‍රහණයෙන් ඔද වැඩුණු සිතැත්තෝ 'ග්‍රූසෙන්කා සම්සෝනෝ ගේ අනියම් බිරිය' ලෙස අඳුන්වමින් ග්‍රූසෙන්කාට නිගා වන ලෙස කතා කෙළේ ය. නීතිඥයා එක්වර ම එම කතාව අල්ලාගත් හෙයින් ඒ කතාව ආපසු ගැනීමට පුළුවන් කමක් තිබෙන්නේ නම් විශාල මුදලක් වුවත් දීමට රැකිටින් කැමැති වනවා ඇත. මේ නීතිඥයා මෙ තරම ඉක්මනට මේ නඩුව ගැන කො තරම් කරුණු දැනගෙන ඇත්දැයි රැකිටින් කල්පනා නො කෙළේ ය.

කෝත්තර ඇසීමට තමා ගේ වාරය පැමිණි විට නීතිඥයා මහත් ගරුසරු ඇති ව, වෙනෙසක් නබා පියකරු සිනාවකින් යුතු ව මෙසේ ඇසුවේ ය. "'මිය ගිය සොසිමා තවුසාණන් ගේ චරිතාපදානය' යන හිසින් බොහො ම ගැඹුරු ආගමික අදහස්-

වලින් පිරුණු, අග්‍රරාජගුරුප්‍රසාදීන් වහන්සේට මහත් ගෞරව-යෙන් පිළිගන්වනු ලැබූ, එසේ ම අග්‍රරාජගුරුප්‍රසාදීන් වහන්සේ ගේ අනුමැතිය ඇති ව ප්‍රසිද්ධ කරන ලද පත්‍රිකාව ලියාපු රැකිටින් මහත්මයා මේ මහත්මයා ම ද කියා මට දැන ගන්න පුළුවන් ද? මම ඒ පත්‍රිකාව බොහො ම ආශාවෙන් කියෙව්වා.''

''මම ඒ පත්‍රිකාව ලිව්වේ ප්‍රසිද්ධ කරන අදහසින් නො වෙයි. ....එක ප්‍රසිද්ධ කළේ පසුවයි'' රැකිටින් කිසියම් කරුණක් නිසා කලබලයෙන් හා ලජ්ජාවෙන් ද කී ය.

''එහෙම කළ එක බොහො ම හොඳයි. මහත්මයා වැනි චින්තකයෙක් මගේ කල්පනාවේ හැටියට හැම සමාජ ප්‍රශ්-නයක් ගැන ම සැලැකිලිමත් විය යුතු යි. මහත්මයා පිළියෙල කළ ලොකු වැදගත් කමක් ඇති ඒ පත්‍රිකාව, අග්‍රරාජගුරුප්‍රසාදීන් වහන්සේ ගේ දායකත්වය ඇති ව බොහො ම හොඳට ප්‍රචාරය වුණා. ඉන් ලොකු සේවයකුත් වුණා...... නමුත් මහත්මයා ගෙන් මා දැනගන්න කැමැති ප්‍රධාන දෙය මෙන්න මේ කාරණාවයි. මහත්මයා දැන් අපට කිව්වා මහත්මයා බොහො ම කිට්ටුවෙන් සෙව්ට්ලෝව් මහත්මිය ආශ්‍රය කළා ය කියා'' (ගෘසෙන්කා ගේ වාසගම සෙව්ට්ලෝව් බව මෙහි දී මතක තබා ගත යුතු ය. පළමු වරට මා ඒ නම දැනගත්තේ නඩු විභාගය පවතින අතර ය)

''මා ආශ්‍රය කරන හැම දෙනා ගැන ම මට තොරතුරු කියන්න බැහැ.........මම තරුණයෙක්. තමාට හමුවන හැම දෙනා ගැන ම කාට ද වගකියන්න පුළුවන්?''යයි රැකිටින් කී ය ඔහු ගේ මුහුණ රතු විය.

''මට තේරෙනවා, හොඳට තේරෙනවා''යි නීතිඥයා කීවේ එ වැනි ප්‍රශ්නයක් ඇසීම ගැන ලතවෙමින්, ඒ ගැන කමාව ඉල්ලීමට ඉක්මන් වන්නාක් මෙනි. ''මේ නගරයේ සිටින තරුණයන් විනෝද කිරීමට කැමැති ලක්ෂණ තරුණියක් සමඟ මිත්‍ර වීමට, වෙනත් තරුණයන් වගේ මහත්මයාත් කැමැති වන්න පුළුවනි.........මට මහත්මයා ගෙන් දැනගන්න උවමනා කරන්නේ මෙන්න මේ කාරණාවයි. මාස දෙකකට පෙර ගෘසෙන්කා, කරමසෝ සහෝදරයන්ගෙන් බාලයා වන අලෝෂා කරමසෝ අඳුනා ගැනීමට බොහො ම ආශාවෙන් සිටිය බව මට දැනගන්න ලැබුණා. අලෝෂා කරමසෝ පූජක-යකු ගේ ඇඳුම් පිටින් ම තමා ළඟට කැඳවාගෙන ආවොත්

රූබල් විසිපහක් දීමට ගෲසෙන්කා පොරොන්දු වුණා. මේ භයානක මිනීමැරුම සිදු වූ දින සවස යුෂ්මතා ගෲසෙන්කා ළඟට අලෝෂා කරමසෝව් කැඳවා ගෙන ගියා. පොරොන්දු වූ රූබල් විසි පහ යුෂ්මතාට ලැබුණා ද? අන්න ඒකයි මට යුෂ්මතා ගෙන් දැන ගන්න උවමනා කරන්නේ."

"ඒක විහිළුවට කළ දෙයක්.........මහත්මයා ඒ කාරණාව ගැන ඔතරම් ලොකු සැලකිල්ලක් දක්වන්නේ මොන කරුණක් නිසා ද කියා මට තේරුම් ගන්න බැහැ. මම ඇගෙන් මුදල් ගත්තේ විහිළුවටයි.........පසු ව මුදල් ආපසු දීමට මා අදහස් කළා."

"එහෙනම් මහත්මයා ගෲසෙන්කා ගෙන් මුදල් අරන් තියෙනවා. නමුත් තව ම ඒ මුදල් ආපසු දුන්නේ නැහැ?"

"ඒක කිසි ම වැදගත් කමක් ඇති ප්‍රශ්නයක් නො වෙයි ......එ වැනි ප්‍රශ්නවලට පිළිතුරු දීමට මා කැමැති නැහැ...... ඒ මුදල් මම ආපසු දෙනවා."

මෙහි දී ප්‍රධාන විනිශ්චයකාරතුමා මැදහත් විය. එහෙත් සාක්ෂිකාරයාගෙන් ඇසිය යුතු වෙනත් ප්‍රශ්න නැතැයි නීතිඥයා කී ය. රැකිටින් සාක්ෂි කූඩුවෙන් පිට වී ගියේ එක්තරා ප්‍රමාණයක අපකීර්තියක් ඇති ව ය. ඔහු ගේ කතාවෙන් පල වූ උසස් අදහස් නිසා මහජනයා තුළ ඇති වූ ප්‍රසාදය තරමක් පළුදු විය. "මිනියාට විරුද්ධ ව සාක්ෂි දෙන, බොහො ම ශුභළින් කල්පනා කරන මිනිසුන් ගේ හැටි ඔහොම තමයි" මහජනයාට රැකිටින් පෙන්නා කියන්නාක් මෙන් නීතිඥයා සාක්ෂි කූඩුවෙන් බැස යන රැකිටින් දෙස බලා සිටියේ ය. මේ සිද්ධිය ද මිනියා ගේ කැගැමෙන් තොර ව අවසන් නොවූ බව මට හොඳට මතකයි. ගෲසෙන්කාට කළ නින්දාවෙන් කිපුණු මිනියා හදිසියෙන් ම කැගැවේ ය. රැකිටින් ගෙන් කෝන්තර අසා නිමවීමෙන් පසු ප්‍රධාන විනිශ්චයකාරතුමා මිනියා දෙසට හැරී සාක්ෂිකාරයා ගැන කිය යුතු දෙයක් ඇද්ද? යි විමසූ විට මිනියා කෑගා "මා සිරභාරයට ගත් දා සිට රැකිටින් මගෙන් මුදල් ණයට ගන්නා. මිනිහා අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න වනචරයා. ඌ දෙයියන් ගැන විශ්වාස කරන්නේ නැහැ. වෙනෙකක් තබා බිෂොප්-තුමාටත් වංචා කළා"යි කී ය.

මිනියා ගේ කතාව ගැන විනිශ්චයකාරතුමා යළි මිනියාට අවවාද කෙළේ ය. රැකිටින් ගේ සාක්ෂියෙහි ඇති වැදගත් කම

නැති විය. අනතුරු ව සාක්ෂි දුන් කපිතන් සෙනිග්‍රියෝප් ගේ සාක්ෂිය ද නිෂ්ප්‍රයෝජන විය. ඒ සාක්ෂි නිෂ්ප්‍රයෝජන වූයේ ඉඳුරා වෙනස් හේතුවක් නිසා ය. ඉරුණු ගොමස්කඩ ඇඳ, මඩ තැවරුණු පාවහන් ලාගෙන සිටි කපිතන්, පොලිස් නිලධාරීන් ගේ දැඩි පරීක්ෂණය හා ආරක්ෂාව කෙසේ වෙතත් සුරා බී මත් වී සිටියේ ය. ඔහුට මිතියා කළ අපහාස ගැන ප්‍රශ්න කළ විට ඔහු කතා නො කර සිටියේ ය.

"ඔහුට දෙවියන් වහන්සේ ගේ ආශිර්වාදය ලැබේවා ඕනෑ. ඉලූෂා මට කිව්වා කිසි ම දෙයක් කියන්න එපා ය කියා. දෙවියන් වහන්සේ මට අනුකම්පා කරත් වා!"

"කවුද යුෂ්මතාට කතා කරන්න එපා කිව්වේ? කා ගැන ද යුෂ්මතා කතා කරන්නේ?"

"මගේ පොඩි පුතා ගැනයි. 'තාත්තේ ඒ මිනිහා තාත්තාට බොහො ම අපහාස කළා'ය කියා මගේ පුතා මට ගල ළඟ දී කිව්වා. නමුත් දැන් මගේ පුතාට අන්තිමයි............"

හදිසියෙන් ම අඬන්නට පටන්ගත් කපිතන් නඩුකාරයා ගේ දෙපා ළඟ දණින් වැටුණේ ය. එහි රැස් ව සිටි අය ගේ සිනා මධ්‍යයේ ඔහු වහා එ තැනින් ඉවත් කරන ලදි. පැමිණිල්ලේ නීතිඥයා බලාපොරොත්තු වූ ප්‍රතිඵලය කපිතන් ගේ සාක්ෂියෙන් නො ලැබිණි.

ලැබුණු හැම අවස්ථාවෙන් ම හැකි තරම් ප්‍රයෝජනය ගත් විත්තියේ නීතිඥයා තමා තුළ නඩුව ගැන පැවැති සියුම් දැනුම පෙන්නමින් මහජනයා වඩවඩාත් පුදුම කෙළේ ය. උදාහරණයක් වශයෙන්, ත්‍රිෆොනොව් හෝටල් හිමියා මිතියාට විරුද්ධ ව හොඳට සාක්ෂි දුන්නේ ය. පළමු වතාවේ මිතියා මුක්රෝයේ හෝටලයට පැමිණි ගමනේ දී රුබල් තුන් දහක්, නැති නම් ඊට ටිකක් අඩුවෙන් වියදම් කළ බව හෝටල් හිමියා ඇඟිලි ගණිමින් කිය. "අහිකුණ්ටික තරුණියන්ට පමණක් කො තරම් විශාල මුදලක් දුන්න ද! අපේ කාලකණ්ණි ගැමියන්ට අහුලා ගැනීම පිණිස මහ පාරට පොඩි කාසි විසි කළේ නැහැ. ඒ වෙනුවට උන්ට මුදල් දුන්නා. එකකුටවත් රුබල් විසිපහකට අඩු ව දුන්නේ නැහැ. අනේ හාමුදුරුවනේ, මේ මහත්මයා ගෙන් කො තරම් මුදලක් හොරකම් කළා ද? හොරකම් කරපු එකෙක්වත් අල්ලන්න බැහැ. මේ මහත්මයා මුළු කාලය ම මුදල් වීසිකරන කොට කොහොම ද හොරු

අල්ලත්තේ? නමුත්නාත්සේ දන්නවා ඇති අපේ ගොවියෝ පල් හොරු. උන් ආගම ධර්මයට කිසි ම භයක් නැහැ. ගමේ කෙල්ලෝ මේ මහත්මයා ගෙන් කො තරම් මුදලක් ගත්ත ද? උන් දූන් බොහො ම පොහොසත්. බොහො ම ආඩම්බරයි. ඉස්සර උන් පල්ලියේ සිටින මීයන් වගේ දුප්පත්.'' මෙසේ, හෝටලේ අයිතිකාරයා මිතියා කල සියලු ම වියදම් සිහි කොට, වියදම් කල සම්පූර්ණ මුදලේ ප්‍රමාණය ද කීවේ ය. එ හෙයින් මිතියා රූබල් එක්දස් පන්සියක් වියදම් කොට ඉතිරි මුදල් රෙදි කෑල්ලක ගැටගසා බෙල්ලේ එල්ලා ගත්තේ ය යන මතය ඉන් පිළිගත නො හැකි විය.

''අනේ රූබල් තුන් දහක් තියෙනවා මගේ මේ ඇස් දෙකින් දැක්කා. මුදල් දිහෑ බලා මෙ තරම් මුදලක් තියෙනවා ය කියා මට කියන්න පුළුවනි'' හෝටලේ අයිතිකාරයා පැමිණිල්ලේ නීතිඥයා සතුටු කිරීමේ අදහසින් කී ය.

විත්තියේ නීතිඥයාට හෝටලේ අයිතිකාරයා ගෙන් කෝත්තර ඇසීමේ වාරය පැමිණි විට හෝටලේ අයිතිකාරයා දුන් සාක්ෂි බොරු කිරීමට නීතිඥයා වෑයම් නො කළේ ය. ඒ වෙනුවට, මිතියා සිරභාරයට ගැනීමට මසකට පමණ පෙර ඔහු මුක්රෝවට ගිය පළමු ගමන ගැන ප්‍රශ්න කරන්නට විය. මිතියා මත් වී සිටින විට බිම දැමූ රූබල් සීයේ නෝට්ටුවක් රියැදුරා හා අකිම් නමැති ගැමියා අහුලා හෝටල් හිමියාට දුන්නේ ය. මුදල් අහුලා දුන් නිසා හෝටල් හිමියා ඔවුනට රූබල් එක බැගින් දුන්නේ ය. ''හොඳයි ඉතින් එදා රූ කරමසෝ මහත්මයාට රූබල් සීය ආපසු දුන්න ද?''යි නීතිඥයා ප්‍රශ්න කෙළේ ය. හෝටල් හිමියා ප්‍රශ්නයට පිළිතුරු නො දී මග හැරීමට හැකි තරම් වෑයම් කෙළේ ය. නමුත් මුදල් ඇහිඳ දුන්නු බව ගැමියන් දෙදෙනා ගේ සාක්ෂිවලින් ඔප්පු වූ පසු මුදල් ලැබුණු බවත්, ඒ මුදල් කරමසෝ මහත්මයාට ආපසු දුන්නු බවත් හෝටල් හිමියා කියා සිටියේ ය. ''මුදල් ආපසු දුන්නු බව සහතික ඇත්තයි. ඒ වෙලාවේ කරමසෝ මහත්මයා මත් වී සිටිය නිසා මා මුදල් දුන්නු බව මතක නැති ව ඇති. නමුත් ගැමියන් දෙදෙනා ගේ සාක්ෂිවලින් ඔප්පුවන තෙක් මිතියා ගේ මුදල් නොගත් බව තරයේ කියා සිටි හෝටල් හිමියා මිතියාට ආපසු මුදල් දුන්නේ ය කියන කතාව කිසිසේත් පිළිගත නො හැකි විය. එ හෙයින් පැමිණිල්ල වෙනුවෙන් සිටි හොඳ ම සාක්ෂිකාරයා බොරුකාරයෙක් විය.

පෝලන්ත ජාතිකයන් දෙදෙනාට ද ලැබුණේ එවැනි ම ඉරණමකි. ඔවුහු අහංකාර වූහ. නිදහස් බවක් දක්වූහ. ඔවුන් දෙදෙනා ම රජ්‍යසේවයේ සිටිය බවත්, මීතියා රූබල් තුන් දහසක් දී තමන් ගේ ආත්ම ගෞරවය මිල දී ගැනීමට තැත් කළ බවත්, මීතියා ගේ අතේ විශාල මුදලක් තිබුණු බවත් කෝපයෙන් කෑගා කීහ. පෝලන්ත ජාතිකයා කතා කරන අතරේ පෝලන්ත වචන මහත් රාශියක් පාවිච්චි කෙළේ ය. ප්‍රධාන විනිශ්චයකාරයා හා පැමිණිල්ලේ නීතිඥයා තමා පෝලන්ත වචන භාවිත කිරීම උසස් කොට සැලැකුවේ යයි කල්පනා කළ පෝලන්ත ජාතිකයා අන්තිමේ දී පෝලන්ත බසින් ම කතා කිරීමට පටන්ගත්තේ ය. එහෙත් විත්තියේ නීතිඥයා පෝලන්ත ජාතිකයන් දෙදෙනා ම තමා ගේ උගුලට අල්ලා ගත්තේ ය. තමා දුන් සුදු කූට්ටම වෙනුවට පෝලන්ත ජාතිකයන් දෙදෙනා හොර කූට්ටමක් දමා මීතියා ගේ මුදල් වංචාවෙන් ගත්ත බව නීතිඥයා හෝටල් හිමියා ලවා ඔප්පු කෙළේ ය. කල්ගානෝෆ් ද ඒ බව සපිර කෙළේ ය. අපහාසයට පත් වූ පෝලන්ත ජාතිකයන් දෙදෙනා අන්තිමේ දී කුඩුවෙන් බැස ගියේ එහි රැස් ව සිටි අය ගේ සිනා හඬ මධ්‍යයෙහි ය.

මීතියාට විරුද්ධ ව සාක්ෂි දුන් අනෙක් අයට ද හිමිවූයේ මෙවැනි ම ඉරණමකි. මීතියා ගේ නීතිඥයා ඔවුන් ගේ සාක්ෂි බොරු කොට සරදමට ලක් කෙළේ ය. එහි සිටි නීතිඥයෝ හා විශේෂඥයෝ විත්තියේ නීතිඥයාට ප්‍රශංසා කළෝ ය. එහෙත් මේ දක්ෂකම්වලින් ඇති ප්‍රයෝජනය කුමක් දැ?යි ඔවුහු කල්පනා කළහ. මීතියාට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද චෝදනා කිසිවක් බොරු කළ නොහැකි බවත්, ඉදිරිපත් කරන ලද සාක්ෂිවලින් ඒවා තව තවත් තහවුරු වන බවත්, එහි රැස් ව සිටි හැම දෙනා ම පිළිගත් බව මම ආයේත් කියමි. එහෙත් විජ්ජාකාරයකු වැනි නීතිඥයා ගේ ආත්ම විශ්වාසය මේ කිසිවකින් නොසන්සුන් නොවන බව ඔවුහු දුටහ. මෙවැනි දක්ෂ නීතිඥයකු පීටර්ස්බර්ග් නුවර සිට පැමිණියේ නිකම් නො වේ. ඔහු ආපසු හිස් අතින් යන ජාතියේ මිනිහකු ද නොවන බව දැන සිටිය ඔවුහු අවසානයේ කුමක් සිදුවන්නේ දැයි නොඉවසිල්ලෙන් බලා සිටියහ.

තුන් වන පරිච්ඡේදය

වෛද්‍ය සාක්ෂි

වෛද්‍ය විශේෂඥයන් ගේ සාක්ෂිවලින් ද මිතියාට එ තරම් වාසියක් සිදු නො වී ය. ඔහු ගේ නීතිඥයා ද වෛද්‍ය සාක්ෂි ගැන වැඩි බලාපොරොත්තුවක් නොදක්වූ බව පසු ව පෙනී ගියේ ය. මිතියා වරද කරු නොවන බව ඔප්පු කිරීම සඳහා වෛද්‍ය සාක්ෂි ඉදිරිපත් කරන ලද්දේ කැතිරිනා ගේ බලකිරීම නිසා ය. ඈ ඒ සඳහා මොස්කව් නුවරින් සුප්‍රසිද්ධ වෛද්‍යවරයකු කැඳෙව්වා ය. විත්තියට එයින් වාසියක් විනා පාඩුවක් වීමට හේතුවක් නැත. වෛද්‍යවරුන් ගේ අදහස් අතර පැවැති පරස්පර විරෝධයක් නිසා ඒ සාක්ෂි එක්තරා ප්‍රමාණයකට හාස්‍ය ජනක විය. වෛද්‍ය සාක්ෂි දීමට ඉදිරිපත් වූයේ මොස්කව් නුවර සිට පැමිණි විශේෂඥයාත්, අපේ නගරයේ සිටින දොස්තර හේසන්ට්‍යුබ් හා වාවින්ස්කි නමැති තරුණ දොස්තරත් පමණි. විශේෂඥයා විත්තියට සාක්ෂි දෙන අතරේ අනෙක් දෙදෙනා පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන්හ.

පළමු ව වෛද්‍ය විශේෂඥයකු හැටියට කැඳවන ලද්දේ දොස්තර හේසන්ට්‍යුබ් ය. හෙතෙම තලඑලලු පැහැති, මුඩු හිසින් යුත්, හවුරුදු හැත්තෑවක් පමණ වයසැති තරබාරු මිනිසෙකි. අපේ පළාතේ කවුරුත් ඔහුට ගරු කළහ. හෙතෙම සිතට එකඟ ව වෙදකම් කරන, පවට බය උසස් පුද්ගලයෙකි. අපේ නගරයේ බොහෝ කාලයක සිට පදිංචි වී වෙදකම් කරන හෙතෙම කාගෙත් ගරු සැලැකිලි ලැබුවේ ය. ඔහු කරුණාවන්ත පුද්ගලයෙකි. දුප්පතුන් ගේ පැල්පතට පවා යන හෙතෙම දුප්පතුන් ගෙන් මුදල් අය නො කෙළේ ය. ඇතැම් විට බෙහෙත් ගැනීමට මුදල් දුන්නේ ය. එහෙත් ඔහු කොටළුවකු මෙන් මුරණ්ඩු ය. ඔහු යම්කිසි තීරණයක් ඇති කර ගත්තොත් කවරදාවත් එය වෙනස් කළ නොහැකි ය. මොස්කව් නුවරින් පැමිණි විශේෂඥයා, දොස්තර හේසන්ටයුබ් ගේ වෙදකමට අතිශයෙන් ම අපහාස වන යම් කිසිවක් පැවැසූ බව නගරයේ කවුරුත් දැන සිටයහ. මේ විශේෂඥයා ලෙඩකු පරීක්ෂා කිරීමට රූබල් විසිපහක් අය කෙළේ ය. එහෙත් ඔහු ගේ පැමි-ණීමෙන් ප්‍රයෝජන ගත් කීප දෙනෙක් වියදම් නො බලා

ඔහු ගෙන් බෙහෙත් ගැනීමට ගියහ. ඔවුහු දෙස්තර හේසන් ටියුබ් ගේ රෝගියෝ වූ හ. විශේෂඥයා දෙස්තර හේසන්ටියුබ්ගේ වෙදකමට අපහාස වන ලෙස කතා කෙළේ ය. අන්තිමේ දී හෙතෙම රෝගීන්ගෙන් "කවුද මීට ඉස්සර බේත් කළේ දෙස්තර හේසන්ටියුබ් ද?"යි අසා "හ! හ! හ!" කියා සිනා සුණේ ය. දෙස්තර හේසන්ටියුබ් මේ බව දැන සිටියේ ය. අන්තිමේ දී මේ දෙස්තරවරු තිදෙනා ම සාක්ෂිදීම පිණිස අධිකරණයට පැමිණියහ

සිරකරුවා ගේ මානසික තත්ත්වය විපරීත වී ඇති බව හොඳට ම පැහැදිලි යයි දෙස්තර හේසන්ටියුබ් තරයේ කියා සිටියේ ය. අනතුරුව හෙතෙම සිය මතය සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කෙළේ ය. මම ඒ කිසිවක් මෙහිලා නො පවසමි. සිරකරුවා ගේ මානසික තත්ත්වයේ ඇති අතිස්ථිරත්වය මීට පෙර ඔහු කී දෙයින් පමණක් නො ව, මෙ තැන දී කියන කරන දෙයින් ද පැහැදිලි වන්නේ යයි දෙස්තර කී ය. මේ මොහොතේ දී පැහැදිලි වන්නේ කෙසේ ද?යි ප්‍රශ්න කළ විට, "සිරකරුවා අධිකරණ ශාලාවට ඇතුළුවන අවස්ථාව අනුව සලකා බලන කල ඔහු අපූර්ව විදිසට ඉස්සරහ බලාගෙන, යුධ භටයකු වගේ ඇතුළු වුණා. ඔහු කාන්තා පක්ෂයට බොහො ම ප්‍රිය කෙනෙක්. තමා ගැන කාන්තාවන් කියන දේවල් ගැන සැලැකිලිමත් වෙන්න ඕනෑ. ඔහු නියම සවභාවයෙන් සිටිනවා නම් අධිකරණ ශාලාවට ඇතුළු වන විට කාන්තාවන් හිඳ සිටි පැත්ත බලන්න ඕනෑ"යි මහලු දෙස්තර අමුතු බසකින් කියා නිම කෙළේ ය.

ඔහු රුසියන් බසින් හොඳට කතා කළ බව කිය යුතු යි. එහෙත් හැම වාක්‍යයක් ම ජර්මන් භාෂාවේ රීතියට අනුව හැඩ ගසා තිබිණි. ඔහු ඒ ගැන කවරදා වත් අමුත්තක් නො සිතුවේ ය. තමා රුසියන් ජාතිකයකුට වඩා හොඳට රුසියන් බස කතා කරන්නේ යයි ඔහු කල්පනා කෙළේ ය. එය ඔහු ගේ කල්පනාවේ ඇති දුබල කමකි. හැම විට ම රුසියන් උපමා හා ප්‍රස්තාවපිරුළු පාවිච්චි කිරීමට මහත් ආශාවක් දක්වූ හෙතෙම අදහස් පැහැදිලි ව පැවැසීමට ලොවේ ඇති උසස් ම උපමා අලංකාර ඇත්තේ රුසියන් බසෙහි යයි කියමින් වර්ණනා කෙළේ ය. නොකල්පනාවෙන් කතා කිරීම නිසා ඔහු මැනැවින් දැන සිටි සාමාන්‍ය වචන පවා ඔහුට අමතක වූ බව සඳහන් කළ යුතු ය. ජර්මන් බසින් කතා කරන විට පවා එ වැනි දෝෂ සිදුවිය. එ වැනි අවස්ථාවල දී හෙතෙම මුහුණ

ඉදිරිපිට අත වනන්නේ අමතක වූ වචනය සොයා ගැනීමට වෑයම් කරන්නාක් මෙනි. ඒ වචනය සොයා ගෙන මිස කවුරුත් කුමක් කීවත් ඔහු කතාව අවසන් නො කරයි. සිරකරුවා අධිකරණ ශාලාවට ඇතුළු වන විට කාන්තාවන් දෙස බැලිය යුතු ව තිබුණේ යයි ඔහු කී කතාව අසා විනෝද වූවත් අතරින් කසුකුසුවක් ඇති විය. අපේ නගරයේ කාන්තාවෝ මේ මහලු දොස්තරට මහත් කැමැත්තක් දක්වූහ. ආගමධර්මීය අදහන පිරිසුදු චරිතයකින් යුත් දොස්තර කාන්තාවන් උසස් කොට සලකන බව කවුරුත් දන සිටියෝ ය. එ හෙයින් ඔහු බලාපොරොත්තුවක් නැති ව කල මේ ප්‍රකාශය කාටත් කවට කමක් ලෙස පෙනිණි.

මොස්කව් නුවර සිට පැමිණි විශේෂඥයා සාක්ෂි දෙමින් සිරකරුවා ගේ මානසික තත්ත්වය මුළුමනින් ම විකෘත වී ඇතැයි කියා සිටියේ ය. 'තාවකාලික උමතුව' හා 'නිත්‍ය උමතුව' ගැන ඉතා දක්ෂ ලෙස විස්තරයක් කල හෙතෙම සියලු ම කරුණු එක් තැන් කොට විමසා බලන විට, සිරකරුවා සිරබාරයට ගැනීමට ටික දිනක සිට, තාවකාලික උමතුවකින් පෙළුණු බවත්, යම් ලෙසකින් ඔහු මේ අපරාධය කළා නම් එසේ කළේ සිත මැඩගෙන සිටි අශෝභන වූ හදිසි ආවේශය පාලනය කර ගැනීමට ශක්තියක් නොතිබුණු නිසා බවත්, එ හෙයින් තමාගේ ක්‍රියාව ගැන දැනුමක් තිබුණත් එසේ කළේ කිසි ම කැමැත්තකින් නොවන බවත් තීරණය කල හැකි යයි කී ය.

තාවකාලික උමතුවත් සමඟ සිරකරුවාට සාමාන්‍ය උමතුවක් තිබෙන බව පැවැසූ හෙතෙම අනාගතයේ දී එයින් නිත්‍ය උමතුවට මඟ පෑදෙන්නේ යයි ස්ථිර ව ම කී ය. (දොස්තර කල ප්‍රකාශය මා සඳහන් කරන්නේ මගේ ම බසිනි. දොස්තර එම ප්‍රකාශය කළේ වෛද්‍යශාස්ත්‍රයට අයත් លොකු හර බර වචනවලිනි. "සිරකරුවා ගේ ක්‍රියා පටිපාටිය බුද්ධියට එකඟවන්නේ නැහැ, තර්කයට ගැලපෙන්නේ නැහැ"යි ඔහු කී ය. "නුදුටු මිනීමැරුම හා සිදු වූ මහා විපත ගැන මම තර්ක කරන්නේ නැහැ. පෙරේදා සිරකරුවා මා සමඟ කතා කරන අතර ඔහු ගේ නෙත් තුළ ස්ථිර බැල්මක් දකින්න තිබුණා. නමුත් එ වැනි බැල්මක් ඇතිවීමට කිසි ම හේතුවක් නැහැ. සිනාසීමට කිසි ම හේතුවක් නැති ව සිනාසුණා, කිපුණා, නොසන්සුන් වුණා, අමුතු වචන පාවිච්චි කළා." සිරකරුවා ගේ උමතුව ගැන විශේෂ කරුණක් හැටියට දොස්තර ඉදිරිපත් කළේ රූබල් තුන්දහ පිළිබඳ කතාවයි. තමාට මුහුණ පෑමට සිදු වූ නොයෙක් දුක් පීඩා ගැන සිරකරුවා

සන්සුන් ව කතා කෙළේ ය. එහෙත් තමාගෙන් වංචා කොට ගත්තා ලද්දේ යයි සැක කරන රූබල් තුන්දහ ගැන සිරකරුවාට කෝප නො වී කතා කළ නොහැකි විය. තමා කළ පරීක්ෂණ අනුව පෙනී ගියේ මීට පෙර වුව ද රූබල් තුන් දහ ගැන සිහි වන විට සිරකරුවා කිපුණු බවයි. අනෙක් අතින් බලන විට ඔහු මුදල් ගැන කිසි ම සැලැකිල්ලක් දක්වන කෙනෙක් ද නො වෙයි.

අවසානයේ දී විශේෂඥයා දෙස්තර හේසන්ට්‍රියුබ් ගේ මතය ගැන ඇනුම්පදයක් කියන්නාක් මෙන් මෙසේ කී ය. "සිරකරුවා අධිකරණ ශාලාවට ඇතුළු වනවිට කාන්තාවන් දෙස නො බලා කෙළින් බලාගෙන ඇතුළුවීම වැරදි යයි පැවසූ මගේ උගත් මිත්‍රයා ගේ අදහස ගැන මට කියන්න පුළුවන් එක ම දෙයයි. එය කවට කමට කියන ලද කතාවක් පමණක් නො ව, කිසි ම හේතු සාධකයක් නැති වැරදි අදහසක්. තමා ගේ දෛවය විසඳෙන මෙම සභාවට ඇතුළුවන තැනැත්තා හිස කෙළින් තබා ගත්තේ නැහැ. එසේ කිරීමෙන් පෙනෙන්නේ සිරකරුවා ගේ මානසික තත්ත්වයේ ඇති අස්වාභාවික ගතියයි. ඒ සමඟ මා කියන්න කැමැතියි, සිරකරුවා ඇතුළු වන විට කාන්තාවන් දෙස නො ව, තමා ගේ අනාගතය රැඳී පවතින, තමා ගේ නිවැරදි කම ගැන සටන් කරන නීතිඥයා සිටින පැත්ත බැලිය යුතුයි කියා" මෙසේ විශේෂඥයා සිය අදහස ඉතා පැහැදිලි ව හා අවධාරණයෙන් කී ය. එහෙත් මේ වෛද්‍යවරුන් දෙදෙනා ගේ අදහස් අතරේ පැවැති පරස්පර විරුද්ධතාව, අන්තිමට සාක්ෂි දුන් දෙස්තර වාර්වින්ස්කි විසින් කිසි ම බලාපොරොත්තුවක් නැති ව කළ ප්‍රකාශයෙන් පැහැදිලි විය. තමා ගේ අදහසේ හැටියට සිරකරුවා මීට පෙරත් දැනුත් හොඳ සිහියෙන් සිටින්නේ යයි තරුණ දෙස්තර වාර්වින්ස්කි කී ය කෙසේ වෙතත් සිරභාරයට ගැනීමට පෙර ඔහු ඉතා ඉක්මනින් කලබල වන තත්ත්වයක සිටින්නට ඇති බවත්, ඊර්ෂ්‍යාව, කෝපය, බේබදුකම ආදී නොයෙක් කරුණු එම තත්ත්වයට හේතු වන්නට ඇති බවත්, දෙස්තර පැහැදිලි කෙළේ ය. සිරකරුවා අධිකරණ ශාලාවට ප්‍රවිෂ්ට වන විට දකුණු පැත්ත බැලිය යුතු ද, නැති නම් වම් පැත්ත බැලිය යුතු ද යන ප්‍රශ්නයට පිළිතුරු දුන් හෙතෙම 'තමා ගේ නිරහංකාර අදහසේ' හැටියට සිරකරුවා ගේ මූළු දෛවය ම රැඳී පවතින විනිශ්චයකාර මණ්ඩලය හා නීතිඥයන් දෙස බැලිය යුතු ය. "එ හෙයින් කෙළින් බැලීමෙන් පෙනෙන්නේ මේ මොහොතේ දී සිරකරුවා ගේ මානසික තත්ත්වයෙහි කිසි ම වරදක් නැති බවයි" කියමින් තරුණ දෙස්තර ඔහු ගේ නිරහංකාර අදහස මඳක් වේගයෙන් ප්‍රකාශ කෙළේ ය.

"කදිමයි, කදිමයි, තමුන්නාන්සේ ගේ අදහස හරි"යි මිතියා අසුනේ හිඳ කෑගා කී ය.

මිතියාට යළි තරවටු කරනු ලැබී ය. නමුත් තරුණ දෙස්තර ගේ සාක්ෂිය විනිශ්චයකාර මණ්ඩලය හා මහජනයා තුළ තීරණාත්මක බලපෑමක් ඇති කෙළේ ය. සවුරුනුත් ඔහු ගේ අදහස පිළිගත් බව පසු ව දැන ගන්නට ලැබිණි. එහෙත් යළි කැඳවන ලද දෙස්තර හේසන්ට්‍යුබ් දුන් සාක්ෂි කිසි ම බලාපොරොත්තුවක් නැති ව මිතියා ගේ වාසියට හේතු විය. බොහෝ කාලයක සිට මේ පලාතේ වෙදකම් කළ දෙස්තර හේසන්ට්‍යුබ් හවුරුදු ගණනක සිට කරමසෝ පවුල දැන ඇඳින සිටියේ ය. පැමිණිල්ලට වැදගත් වූ තොරතුරු රැසක් ම හෙළි කළ හෙතෙම හදිසියෙන් ම යම්කිසිවක් සිහි වූවාක් මෙන් මෙසේ කී ය.

"මේ ඉලන්දුරියා ගේ ජීවිතය බොහො ම වෙනස් වෙන්න ඉඩ තිබුණා. ඔහු පොඩි කාලේ බොහො ම හොඳයි. ඊට පසුවත් බොහො ම හොඳට හිටියා. රුසියන් ප්‍රස්තාවපිරුළක් තියෙනවා 'මිනිහකුට එක මොළයක් තියෙනවා නම් හොඳයි. නමුත් තවත් දක්ෂ මිනිහෙක් ඔහු ළඟට ආවොත් එක මොළයක් වෙනුවට මොළ දෙකක් ඇති වන නිසා ඊටත් වැඩිය හොඳයි' කියා."

"එක මොළයත් හොඳයි. මොළ දෙකක් තියෙනවා නම් ඊටත් වැඩිය හොඳය"යි පැමිණිල්ලේ නීතිඥයා නො ඉවසිල්ලෙන් කී ය. තමා ගේ කතාව නිසා අනෙක් අය තුළ ඇති වන හැඟීම් හා පමාව ගැන කිසිත් නො තකා ඉතා සෙමෙන් හිතා මතා කතා කිරීමේ පුරුද්දක් මහලු දෙස්තරට තිබෙන බව පැමිණිල්ලේ නීතිඥයා දැන සිටියේ ය. අසන්නන්ට නීරස වූ තමා ගේ ජර්මන් මූකරි කතාව ගැන බොහො ම ඉහළින් කල්පනා කළ මහල්ලා කවට කතා කීමට ආසා ඇත්තෙකි.

"ඔව්, ඔව්, ඒක තමයි මම කිව්වේ. එක මොළයත් හොඳයි, නමුත් මොළ දෙකක් එක මොළයට වඩා හොඳයි. හොඳ මොළයක් තියෙන කෙනෙක් මේ ඉලන්දුරියාට එකතු වුණේ නැති නිසා මිනිහට තිබුණු මොළයත් නැති වුණා... ... . මොළේ නැති වුණේ කොහොම ද? නැති වුණේ කවද්ද ද? නැති වුණේ කොතැන දී ද? මට වචනය මතක නැහැ." මෙසේ පැවසූ මහල්ලා වචනය සිහි කරමින් නෙත් ඉදිරිපිට අත වනන්නට විය. "ඔව්, ඔව්, දැන් මට මතකයි. දඩාවතේ ගියා."

"දඬාවතේ ගියා?"

"ඔව්, ඔව්, දඬාවතේ ගියා. ඒක තමයි මම කිව්වේ. මිනිහගේ මොලේ දඬාවතේ ගිහින් ගැඹුරු වලකට වැටී මහ වැරදුණා. ඒ වුණත් මිනිහා කලගුණ සලකන, සියුම් හැඟීම් ඇති දරුවා. මේ දරුවා පොඩි කාලේ හිටිය හැටි මට හොඳට මතකයි. මෙන්න මෙච්චර විතර උස ඇති. තාත්තා මේ දරුවාට කිසි ම සැලැකිල්ලක් දක්වූයේ නැහැ. කුස්සිය මිදුලේ පාවහන් නැති ව, ඇඟ පුරා මඩ තවරාගෙන දුව පනිනවා මට මතකයි. දරුවාගේ කලිසම ඇගේ රැඳී තිබුණේ එක බොත්තමකින් පමණයි..............."

මේ මහලු අවංක මිනිහාගේ කට හඬ හදිසියෙන් ම දයාවෙන් මොලොක් විය. යම්කිසිවක් සිදුවන බව දැනගත් මීතියාගේ නීතිඥයා වහා එය අල්ලා ගත්තේ ය.

"ඔව් ඔව්, ඒ කාලේ මාත් ඉලන්දාරියා. මට අවුරුදු හතළිස් පහක් විතර ඇති. මේ පළාතට ආපු අලුත, මේ දරුවා දැකල මට කො තරම් අනුකම්පාවක් ඇති වුණා ද කියතොත් මම මගෙන් ම ඇහැව්වා, ඇයි මම මේ දරුවාට රාත්තලක් .... මොනවා රාත්තලක් ද?.............. මොනව ද ඒවට කියන්නේ?............ මට දැන් මතක නැහැ......... ළමයි ඒවා කෑමට බොහො ම කැමැතියි." යළි දෙස්තර නෙත් ඉදිරිපිට අත වනන්නට විය. "ඒවා ගස්වල පලගන්නේ. එකතු කරලා තෑගි වශයෙන් දෙනවා............"

"ඇපල් ද?"

"නැහැ, නැහැ, රාත්තලක්, රාත්තලක් .... අපි ඇපල් දුසිම් ගණනේ මිස රාත්තල් ගණනේ ගන්නේ නැහැ. රාත්තලකට හුඟක් අල්ලනවා......... බොහො ම පොඩියි. කාටේ දමා විකනවා."

"රට කොට්ටන් ද?"

"අන්න හරි, රට කොට්ටන් ගැන තමයි මං කිව්වේ" යි දෙස්තර කිසි ම කලබලයක් නො දක්වා කීවේ තමා ඒ වචනය කවදාවත් සොයා වෙහෙසුණ බව නො දක්වමිනි. "ඉතින් මම රට කොට්ටන් රාත්තලක් මේ දරුවාට ගෙනත් දුන්නා. නමුත් ඊට කලින් කවදාවත් කිසි ම කෙනෙක් මේ දරුවාට එ වැනි තෑග්ගක් දීලා නැහැ. මම තෑග්ග දීලා ඇඟිල්ල

උස්සා කිව්වා 'දේව පියාණෙණි' කියා. දරුවා සිනාසී 'දේව පියාණෙණි, දේව පුත්‍රයාණෙණි' කිව්වා, ආයේත් සිනා සී 'දේව පුත්‍රයාණෙණි, ශුද්ධාත්මයාණෙණි' කිව්වා. ඉතින් මම යන්න ගියා. දෙ දිනකට පස්සේ මා ඒ පැත්තෙන් යන කොට දරුවා මට කතා කරලා 'මාමේ, දේව පියාණෙණි, දේව පුත්‍රයාණෙණි' කියා කෑගැවා. නමුත් දරුවාට 'ශුද්ධාත්මයාණෙණි' අමතක වූ නිසා මම ආයේත් මතක් කරල දුන්නා. මට දරුවා ගැන බොහො ම ලොකු කනගාටුවක් ඇති වුණා. ඊට පස්සේ දරුවා කොහේ දෝ අරන් ගිය නිසා දකින්න ලැබුණේ නැහැ. අවුරුදු විසි තුනකට පස්සේ දවසක් මම මගේ කාමරයේ ඉඳගෙන ඉන්න කොට (එතකොට මම වයසට ගිහින්, මගේ කොණ්ඩෙත් හොඳට ම සුදු වෙලා.) හොඳට හැඩ වැඩ්ම ඇති, මා නාඳුනන තරුණයෙක් හදිසියෙන් ම කාමරයට ඇතුළු වෙලා ඇඟිල්ල උස්සා සිනා සී 'දේව පියාණෙණි, දේව පුත්‍රයාණෙණි, ශුද්ධාත්මයාණෙණි' මම දනුයි මේ පළාතට ආවේ. මම ආවේ මට පොඩි කාලයේ දී ගෙනත් දුන්න රට කොට්ටන් රාත්තලට ස්තුති කරන්නයි. දොස්තර මහත්මයා හැරෙන්න මට වෙන කිසි ම කෙනෙක් තෑග්ගක් දීලා නැහැ'යි කිව්වා. එතකොට ම මට මගේ තරුණ කාලයත්, පාවහන් නැති ව ඇඟ පුරා මඩ තවරාගෙන, දුව පැන ඇවිද්ද දරුවාත් මතක් වුණා. මේ තරුණයා ගැන මගේ හිතේ ලොකු ආදරයක් ඇති වුණා. 'පුතා තුඹ බොහො ම යහපත් තරුණයෙක්. මම තුඹට පොඩි කාලයේ දී අරන් දුන්න තෑග්ග මුළු ජීවිතයට ම මතක තිබුණා' කියා මම තරුණයා වැලඳගෙන ඇඬුවා. මිනිහ හිනා වුණා, නමුත් පස්සේ ඇඬුවා. ඇඬිය යුතු අවස්ථාවේ දී සිනා සීම රුසියන් ජාතිකයන් ගේ සිරිතයි. මිනිහ පසු ව අඬනවා මම දුටුවා. දැන් මොන විපතක් ද වෙලා තියෙන්නේ ...."

"මම දනුත් අඬනවා. මහත්මයා බොහො ම යහපත් මනුෂ්‍යයෙක්"යයි කියා මීතියා හදිසියෙන් ම කෑගැවේ ය.

කෙසේ වෙතත් මේ කතාව නිසා අධිකරණ ශාලාවේ රැස් ව සිටි අය තුළ මීතියා ගැන අනුකම්පාවක් ඇති විය. එහෙත් මීතියා ගේ වාසියට හේතු වූ ඉතා ම වැදගත් සාක්ෂිය දෙනු ලැබුවේ කැතිරිනා විසිනි. තව ටිකකින් මම ඒ සාක්ෂි විස්තර කොට කියමි. විත්තිය වෙනුවෙන් කැඳවනු ලැබූ සාක්ෂි කරුවන් සාක්ෂි දීමට පටන් ගත් විට හදිසියෙන් ම වාසනාව මීතියා දෙස බලා සිනා සෙන්නට විය. වෙනෙකක්

තබා එය චිත්තියේ නීතිඥයා ගේ පුදුමයට ද හේතු විය. නමුත් කැතිරිනා සාක්ෂි දීමට පෙර අලෝෂා සාක්ෂි දුන්නේ ය. පැමිණිල්ල විසින් මිතියාට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද ඉතා වැදගත් සාක්ෂියට විරුද්ධ වූ සිද්ධියක් අලෝෂා ගේ සාක්ෂියෙන් හෙළි විය.

හතර වන පරිච්ඡේදය

වාසනාව සිනාසෙයි

එය අලෝෂාට පවා මහත් පුදුමයක් විය. ඔහුට දිවුරුම් දීමට අවශ්‍ය නො වී ය. සාක්ෂි දීමට පටන් ගත් තැන් සිට දෙපක්ෂයේ නීතිඥයෝ ඔහුට ඉතා කරුණාවෙන් හා අනුකම්පාවෙන් ද සැලැකුවෝ ය. ඔහු ගේ යහපත් කම ගැන පැවැති ප්‍රසිද්ධිය ඉතා ඉහළින් පිළිගෙන තිබෙන බව පැහැදිලි ය. අලෝෂා විනීත ලෙස හා සංයමයෙන් යුතු ව සාක්ෂි දුන්නේ ය. එහෙත් ඔහු ගේ අවාසනාවන්ත සහෝදරයාට ඔහු තුළ පැවැති අනුකම්පාව, දයාව හා ආදරය, පැහැදිලි ව දකින්නට තිබිණි. ප්‍රශ්නයකට පිළිතුරු දුන් අලෝෂා සොහොයුරා ගේ චරිතය විස්තර කරමින් ඔහු සමහර විට වහා කිපෙන, සිතේ ආශාවන්ට අවනත ව ක්‍රියා කරන, එසේ ම අහංකාර කමින් යුත්, අවංක, අවශ්‍ය වුවහොත් ආත්ම පරිත්‍යාගයට වුව ද කැමැති, ත්‍යාගශීලී අයකු යයි කීවේ ය. ගෘෂෙන්කාට දක්වූ ආදරයත්, ඇය නිසා තාත්තා සමඟ පැවැති විරෝධයත් නිසා තාත්තා මැරීමට ටික දිනක සිට සොහොයුරා නොඉවසිල්ලෙන් සිටිය බවත් කී ය. සොහොයුරාට මහත් හිරිහැරයක් ව පැවැති රුබල් තුන් දහස සිතින් ඉවත් කළ නොහැකි සිතිවිල්ලක් වුව ද ඒ මුදල් නිසා සොහොයුරා තාත්තා මැරුවේ ය යන අදහස අලෝෂා පිළිකුලින් බැහැර කෙළේ ය. එම මුදල් සොහොයුරාට මවගෙන් ලැබුණු බවත්, එහෙත් තාත්තා වංචා කොට ගත් බවත්, සාමාන්‍යයෙන් මුදල් ගැන වැඩි සැලැකිල්ලක් නො දක්වුවත් සොහොයුරාට කෝප නො වී එම මුදල් ගැන කතා කළ නොහැකි බවත් අලෝෂා කී ය. පැමිණිල්ලේ නීතිඥයා විසින් විස්තර කරන ලද තාත්තාවත් දෙදෙනා අතරේ පැවැති තරගය, එනම්

ග්‍රාසෙන්කා හා කැතිරිනා ද අතරේ පැවැති තරඟය ගැන ඇසූ ප්‍රශ්නයට මඟහරිමින් පිළිතුරු දුන් අලෝෂා ප්‍රශ්නයකට හෝ දෙකකට පිළිතුරු දීමට විරුද්ධ විය.

"කොහොම හරි තාත්තා මරන බව අයියා කිව්වා නේ ද?"යි ඇසූ පැමිණිල්ලේ නීතිඥයා "යුෂ්මතා අකැමැති නම් මේ ප්‍රශ්නයට පිළිතුරු නො දුන්නත් වරදක් නැහැ"යි කී ය.

"තාත්තා මරන බව කෙළින් කිව්වේ නැහැ"යි අලෝෂා පිළිතුරු දෙමින් කී ය.

"කෙළින් කිව්වේ නැති නම් කොහොම ද කිව්වේ?"

"තාත්තා සමඟ ඇති වෛරයත්, කෝප වූ අවස්ථාවක දී තාත්තා තමා අතින් මැරුම් කා ය යන බියත් තමා තුළ තියෙන බව අයියා කිව්වා."

"යුෂ්මතා ඒ කතාව විශ්වාස කළා ද?"

"ඔව්, මම විශ්වාස කළා. එහෙත් එවැනි තීරණාත්මක අවස්ථාවක් පැමිණි විට ඔහු ගේ සිතේ ඇති වන කිසියම් උසස් හැඟීමකින් අයියා ආරක්ෂා වේ ය කියා මම විශ්වාස කළා. ඇත්ත කියනවා නම්, එවැනි හැඟීමකින් අයියා ආරක්ෂා වුණා. තාත්තා මැරුවේ අයියා නො වෙයි" අලෝෂා ස්ථිර සවරයෙන් හඬ නඟා කී ය. ඔහු ගේ කටහඬ අධිකරණ ශාලාව පුරා රැව් දුන්නේ ය.

හොරණෑ හඬින් තිගැස්සුණු යුද අසකු සේ පැමිණිල්ලේ නීතිඥයා නැඟී සිටියේ ය.

"යුෂ්මතා ගේ අවංක හැඟීම් මා සම්පූර්ණයෙන් ම විශ්වාස කරන බව මට සහතික කොට කියන්න පුළුවනි. ඒ හැඟීම් යුෂ්මතා ගේ අවාසනාවන්ත සහෝදරයාට දක්වන ආදරය සමඟ අඳුනා දීමට හෝ විස්තර කිරීමට හෝ මම වෑයම් කරන්නේ නැහැ. මේ අවාසනාවන්ත සිද්ධිය ගැන යුෂ්මතා දරන අමුතු අදහස් මූලික පරීක්ෂණය පැවැත්වූ වේලාවේ සිට අප දැන ගෙන හිටියා. එම අදහස් පෞද්ගලික වූවා පමණක් නො ව, පැමිණිල්ල විසින් මෙතෙක් රැස් කරන ලද සියලු ම සාක්ෂිවලට පටහැනි බව යුෂ්මතාට නො සඟවා කියයුතුයි. යුෂ්මතා සොහොයුරා ගේ අහිංසක කම ගැන තීරණයකට පැමිණියේ කුමන හේතුන් නිසා ද? මූලික පරීක්ෂණයේ දී යුෂ්මතා විසින් විරුද්ධ ව සාක්ෂි දෙන ලද

වෙනත් කෙනෙක් මේ මිනීමැරුමට සම්බන්ධ වී ඇතැයි කල්පනා කරන්නේ කුමන කරුණක් නිසා ද? කියා යුෂ්මතා ගෙන් ප්‍රශ්න කළ යුතුයි."

"මා කළේ මූලික පරීක්ෂණයේ දී මගෙන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දීම පමණයි" අලෝෂා ඉතා සෙමෙන් කී ය. "මම පෞද්ගලික වශයෙන් පැවල්ට විරුද්ධ ව කිසි ම චෝදනාවක් ඉදිරිපත් කළේ නැහැ."

"නමුත් යුෂ්මතා පැවල්ට විරුද්ධ ව සාක්ෂි දුන්නා?"

"මම පැවල්ට විරුද්ධ ව සාක්ෂි දුන්නේ අයියා ගේ කතාව විශ්වාස කරගෙනයි. අයියා සිර භාරයට ගත්ත වේලාවේ දී සිදුවූ දෙයත්, මගෙන් සාක්ෂි ඇසීමට පෙර අයියා මිනීමරුවා හැටියට පැවල් පෙන්නා දුන් බවත් මට ආරංචි වුණා. අයියා මේ මිනීමැරුමට සම්බන්ධ නැති බවත්, අයියා සම්පූර්ණයෙන් ම අහිංසක බවත් මම විශ්වාස කරනවා. අයියා තාත්තා මැරුවේ නැති නම් තාත්තා මැරුවේ කවු ද?"

"එහෙනම් තාත්තා මැරුවේ පැවල් ද? ඇයි පැවල් ගැන සැක කරන්නේ? යුෂ්මතා අයියා ගේ අහිංසක කම ගැන ඔතරම් විශ්වාස කරන්නේ මන් ද?"

"අයියා ගේ වචනය විශ්වාස නො කර බැහැ. මට කවදාවත් අයියා බොරුවක් කියා නැහැ. බොරුවක් නොකියන බව අයියා ගේ මූහුණ බලා කියන්න පුළුවනි."

"මූහුණ බලා විතරක් ද කියන්න පුළුවන්? අයියා නිර්දෝෂ බව ඔප්පු කරන්න වෙන සාක්ෂියක් නැද්ද?"

"වෙන සාක්ෂියක් නැහැ."

"අයියා ගේ වචනයත්, ඔහු ගේ මූහුණේ දකින්නට තිබුණු සවභාවයත් හැර පැවල් මිනීමරුවා බව ඔප්පු කරන්න පුළුවන් වෙන සාක්ෂියක් නැද්ද?"

"නැහැ."

පැමිණිල්ලේ නීතිඥයා අලෝෂාගෙන් ප්‍රශ්න ඇසීම මෙ තැනින් හමාර කෙළේ ය. අලෝෂා ගේ සාක්ෂි නිසා මහජනයා තුළ පැවැති බලාපොරොත්තු සුන් විය. නඩුව විභාග වීමට පෙර පැවල් ගැන නොයෙක් දෙනා නොයෙක් දෑ කීහ. සොහොයුරා ගේ

නිර්දෝෂකම හා පැවල් ගේ වරද ඔප්පු කළ හැකි ඉතා වැදගත් කරුණු රාශියක් ම අලෝෂා රැස් කරගෙන ඇතැයි සමහරු කී හ. නමුත් සාක්ෂි දෙන අතරේ එ වැනි කිසිවක් ඉදිරිපත් නො වී ය. සහෝදරයකු තුළ සවභාවයෙන් ම ඇතිවන හොඳ නරක පිළිබඳ විශ්වාසය මිස වෙන පිළිගත හැකි සාක්ෂියක් ඉදිරිපත් නො වී ය.

අනතුරු ව මිතියා ගේ නීතිඥයා අලෝෂා ගෙන් කෝත්තර අසන්නට විය. මිතියා තාත්තාට වෛර කරන බවත්, තාත්තා මරා දැමීමට අදහස් කරන බවත්, මිතියා කීවේ කවර දා?යි නීතිඥයා අලෝෂා ගෙන් ඇසුවේ ය. තාත්තා මැරීමට කලින් හමු වූ අවස්ථාවක දී එසේ කීවේ ද? මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන අතරේ තමාට හදිසියේ ම යම් කිසිවක් මතක් වී අවබෝධ වූවාක් මෙන් අලෝෂා තිගැස්සුණේ ය.

“මෙතෙක් කල් අමතක වූ ඉතා වැදගත් දෙයක් දැන් මට මතක් වුණා. එහි ඇති වැදගත් කම මට ඒ වෙලාවේ දී අවබෝධ වුණේ නැහැ. නමුත් දැන්.........”

එදා සවස, තාපසාරාමයට යන අතර මග ගස යට දී තමාට මිතියා හමු වූ සැටිත්, ඒ වෙලාවේ දී මිතියා පපුවේ උඩ කොටසට ගසා ගනිමින්, තමා ගේ නැති වූ ගෞරවය යළි ලබා ගැනීමට මඟක් එහි තිබෙන බව කීප වරක් ම කී සැටිත්, ඉන් අදහස් වන්නේ ඒ දෙය පපුවේ උඩ කොටසේ තිබෙන බවත්, අලෝෂාට වහා මතක් විය. “අයියා පපුවට ගහ ගන්න කොට මට හිතුණා ඒ දෙය තියෙන්නේ අයියා ගේ හදවතේ ය කියා”යි අලෝෂා කී ය. “තමාට මහත් තර්ජනයක් වූ, මට පවා කීමට අකැමැති වූ, ඉතා භයානක අපකීර්තියකින් පැනයාමට පුළුවන් ශක්තිය තියෙන්නේ අයියා ගේ හදවතේ ය කියා මම කල්පනා කළා. අයියා සඳහන් කළේ තාත්තා ගැනයි. භයානක අපකීර්තියක් හැටියට පෙනුණේ තාත්තා ළඟට ගොස් ඔහු මරා දැමීම විය යුතු ය කියා ඒ වෙලාවේ දී මට අදහස් වුණා. ඒ මොහොතේ දී තමයි අයියා පපුවේ තියෙන කිසියම් දෙයක් පෙන්නුවේ. නමුත් හදවත තියෙන්නේ අයියා පෙන්නාපු තැන නො ව ඊට පහළින් බවත්, අයියා පපුවේ උඩ කොටසට, එනම් බෙල්ල ළඟට ගසා ගනිමින් ඒ ස්ථානය පෙන්නූ බවත්, ඒ වෙලාවේ දී මට කල්පනා වුණා. නමුත් මම ඒ අදහස විහිළුවක් හැටියට සැලැකුවා. සමහර විට අයියා පෙන්නන්න ඇත්තේ බෙල්ලේ එල්ලාගෙන හිටිය රූබල් එක් දස් පන්සිය සමඟ කුඩා උරය වෙන්න ඕනෑ.”

"මල්ලි කියන්නේ ඇත්තයි. මම මිට මොලවා ගැසුවේ මුදල් තිබුණු උරයටයි" මිතියා කෑගා කී ය.

නිශ්ශබ්ද ව සිටින ලෙස මිතියා ළඟට ගොස් බැගෑ බසින් ඉල්ලා සිටි නීතිඥයා යළි අලෝෂා ගෙන් ප්‍රශ්න අසන්නට විය. මෙම අනුස්මරණයෙන් උද්‍යෝගවත් වූ අලෝෂා තම සොහොයුරා 'අපහාසය' කියා සඳහන් කළේ බෙල්ලේ එල්ලා ගෙන සිටිය රූබල් එක්දස් පන්සිය බවත්, එය කැතිරිනාට ගෙවිය යුතු ණයෙන් අඩක් නිසා එය ඇයට ආපසු ගෙවීමට ඉඩ ඇතත් වෙනත් කටයුත්තක් සඳහා වියදම් කිරීම පිණිස තබාගත් බවත්, ඒ උවමනාව නම් ගෘසෙන්කා කැමැති වුවොත් ඇය සමඟ පැනයාමට බවත්, විස්තර කොට තමා ගේ සිද්ධාන්තය ඉදිරිපත් කරමින් කී ය.

"ඒක තමා ඇත්ත. ඒක ඇත්ත විය යුතුයි." අලෝෂා ආයේත් කෑගා කීවේ ය. "අයියා මට කිව්වා එයාට පැමිණ තියෙන නින්දාවෙන් බාගයකින් (බාගයකින් යන වචනය ඔහු කිප වරක් ම කීවේ ය.) එක් වර ම නිදහස් වෙන්න පුළුවන් ය කියා. නමුත් අයියා ඒ මුදල් කැතිරිනාට ආපසු නුදුන්නේ ඊට අවශ්‍ය ආත්ම ශක්තිය නොතිබුණ නිසයි. ඒ මුදල් ආපසු දීමට නොහැකි බව අයියා කලින් දැන ගෙන හිටියා."

"යුෂ්මතා ගේ සහෝදරයා පපුවේ උඩ කොටසට ගසා ගත් බව හොඳට මතක ද?" යි නීතිඥයා උනන්දුවෙන් ප්‍රශ්න කෙළේ ය.

"ඔව්, මට හොඳට මතකයි. අයියා පපුවේ උඩ කොටසට ගසා ගත්තේ මන්ද කියා මම ඒ වෙලාවේ දී කල්පනා කළා. නමුත් එසේ කල්පනා කිරීම මෝඩ කමක් හැටියටයි මට පෙනුණේ. දැන් මට ඒක මතක් වුණේ ඒ කාරණාව නිසයි. මෙපමණ දවසක් මට මේ කාරණාව අමතක වුණේ මන්ද? මුදල් ආයේත් ආපසු කැතිරිනාට ගෙවන්නේ නැහැ කියා ගසාගත්තේ බෙල්ලේ එල්ලාගෙන සිටිය මුදල් පසුම්බියටයි. කැතිරිනා ගෙන් ගත්ත මුදලින් බාගයක් ආපසු ගෙවන්න පුළුවන් කම තිබිය දී ඒ සඳහා හිත නම්ම ගන්න බැරිවුණා. මුදල් නො ගෙවා කැතිරිනාට හොරකු වී සිටීමට කැමැති වුණා. අතේ මුදල් තිබිය දී නො ගෙවා සිටීම මහ නින්දාවක් බව කියා සිරභාරයට ගන්න වෙලාවේ දී අයියා කෑගැවා. මට ඒ බව පසු ව ආරංචි වුණා. මේ මුදල් නිසා අයියා කො තරම් දුකක් වින්ද ද?"යි අලෝෂා අවසානයේ දී කීවේ ය.

පැමිණිල්ලේ නීතිඥයා ආයේත් අලෝෂාගෙන් කෝත්තර අසන්නට ඉදිරිපත් විය. සිදු වූ දෙය යළි මුල සිට විස්තර කිරීමට නියම කළ හෙතෙම "යුෂ්මතා ගේ සහෝදරයා එදා යුෂ්මතා සමඟ කතා කරන අතර යම් කිසිවක් දුටුව ද? සමහර විට ඔහු තිකම් අත මිට මොලවා පපුවට ගහගන්න ඇති?" යන ප්‍රශ්නය කීප වරක් ම ඇසුවේ ය.

"අතමිට මොලවා පපුවට ගහගත්තේ නැහැ"යි අලෝෂා කී ය. "අයියා ඇඟිල්ලෙන්, පපුවට හුඟක් උඩින්, මෙන්න මෙතැන පෙන්නුවා. මේ මොහොත වන තෙක් මට මේ කාරණය අමතක වුණේ මන්ද?"

අත්තිමට සාක්ෂි දුන් සාක්ෂිකරුවාගේ සාක්ෂි ගැන තමාට යමක් කියන්න තිබේ දැයි ප්‍රධාන විනිශ්චයකාරයා මිතියාගෙන් ප්‍රශ්න කෙළේ ය. එම සාක්ෂිය ස්ථිර කළ මිතියා තමා පෙන්නුවේ බෙල්ල වටේ එල්ලාගෙන සිටිය රූබල් එක් දහස් පන්සිය සමඟ පසුම්බිය බවත්, තමා නින්දාවක් ලෙස හැඳින්වූයේ එම මුදල් බවත් පවසා ආයේත් මෙසේ කී ය.

"ඒක මහ නින්දාවක්. එ තරම් නින්දා සහගත දෙයක් මම මුළු ජීවිතයට ම කරලා නැහැ. ඒ මුදල් ආපසු දෙන්න තිබුණා. නමුත් මම දුන්නේ නැහැ. ඒ මුදල් ආපසු දෙනවාට වඩා කැතිරිනාට හොරකු වීමට මා කැමැති වුණා. මුදල් ආපසු නොදෙන බව කලින් දැන සිටීමෙන් ඒ නින්දාවේ බරපතල කම තවත් වැඩි වුණා. මල්ලී තුඹේ කතාව ඇත්තයි. තුඹට බොහොම ස්තුතියි."

මෙසේ අලෝෂා ගේ සාක්ෂි අවසන් විය. එම සාක්ෂියෙහි ඇති වැදගත් කම නම් අත්තිමේ දී නඩුවට සම්බන්ධ වූ වටිනා කරුණක් හෙළි වීමයි. එය ඉතා සුළු ඉඟියක් වැනි දෙයක් වුවත්, මිතියා කරේ කුඩා පසුම්බියක් එල්ලා ගෙන සිටියේ ය. එම පසුම්බියේ රූබල් එක්දහස් පන්සියයක් තිබුණේ ය. මුක්රෝයේදී පැවැත්වූ මූලික පරීක්ෂණයේ දී තමා ළඟ රූබල් එක්දහස් පන්සියයක් තිබුණේ යයි සිරකරුවා කළ ප්‍රකාශය බොරුවක් නොවන බව අනුමාන වශයෙන් ඔප්පු වූයේ ය. ප්‍රීතියට පත් අලෝෂා රතු වූ මුහුණින් යුතු ව, තමාට වෙන් කරන ලද අසුනෙහි හිඳගත්තේ ය. "මට කොහොම ද මෙ තරම් වැදගත් දෙයක් අමතක වුණේ? දැන් පමණක් එය මතක් වුණේ මන්ද?"යි ඔහු තමා ගෙන් ම ප්‍රශ්න කෙළේ ය.

අනතුරු ව කැතිරිනා සාක්ෂි දීම පිණිස කැඳවන ලදි. ඈ සාක්ෂි කූඩුවට නගිනවාත් සමග ම අධිකරණ ශාලාව තුළ අපූරු දෙයක් සිදුවිය. කාන්තාවෝ ඔප්රා කණ්නාඩි ගෙන සූදානම් වූහ. පිරිමින් අතරේ කලබල ගතියක් ඇති විය. සමහරු තරුණිය දැකගැනීමේ ආශාවෙන් නැගී සිටියහ. කැතිරිනා සාක්ෂි දීමට පැමිණෙනවාත් සමග මිතියා පිරුවටයක් මෙන් සුදුමැලි වූ බව පසු ව කවුරුත් කීහ. සම්පූර්ණයෙන් ම වාගේ කළු ඇඳුමෙන් සැරසී සිටි කැතිරිනා, ඇයට පෙන්වන ලද ස්ථානයට, විනීත ලෙස හා බයාදු කමින් යුතු ව පැමිණියා ය. ඈ නොසන්සුන් කමින් පසුවන බව ඇගේ මුහුණ බලා කිව නොහැකි විය. එහෙත් ඇගේ දෙම්නසින් පිරුණු අඳුරු දෑස අධිෂ්ඨානයෙන් දිළිසුණේ ය. ඈ ඒ මොහොතේ දී ලක්ෂණට සිටිය බව බොහෝ දෙනෙක් පසු ව කීහ. මුළු උසාවියට ම ඇසෙන ලෙස ඈ සෙමෙන්, එහෙත් පැහැදිලි ව කතා කළා ය. ඈ සන්සුන් ව කතා කළා ය. නැතිනම් අඩු ගණනේ සන්සුන් ව සිටින බව හැඟෙව්වා ය. ප්‍රධාන විනිශ්චයකාරයා කල්පනාවෙන් යුතු ව, ගරුසැලැකිලි ඇති ව, තරුණිය ගෙන් ප්‍රශ්න ඇසීමට පටන් ගත්තේ ය. 'සමහරක් කරුණු' ගැන විමසීමට බිය වූවාක් මෙන් අසන ලද පලමු ප්‍රශ්නයට පිළිතුරු දුන් කැතිරිනා සිරකරුවා සිය කැමැත්තෙන් ම තමා අත්හැර යන තුරු ඔහු සමග විවා ගිවිස ගෙන සිටිය බව කීවා ය. තමා ගේ නෑයකු වෙත තැපැල් කොට යැවීම සඳහා සිරකරුවාට දෙන ලද රූබල් තුන් දහ ගැන ප්‍රශ්න කළ විට "මම ඒ මුදල් දුන්නේ තැපැල් කරලා යැවීම සඳහා ම නො වෙයි. ඒ වෙලාවේ මිතියාට මුදල් අවශ්‍ය ව තිබුණු බව මම දැන ගෙන හිටියා. මා මුදල් දුන්නේ කැමැති නම් මාසයකින් තැපැල් කරලා යැවීමේ තීරණය උඩයි. මගෙන් ගත්ත ණය මුදල් ගැන එ තරම් කරදර වෙන්න උවමනාවක් තිබුණේ නැහැ"යි කැතිරිනා ස්ථිර ව කියා සිටියා ය.

ඇගෙන් අසන ලද සියලු ම ප්‍රශ්නත්, ඒ ප්‍රශ්නවලට ඈ දුන් පිළිතුරු ගැනත්, මම සවිස්තර ව මෙහි ලා සඳහන් නො කරමි. මා කරන්නේ ඈ දුන් සාක්ෂි පිළිබඳ ව ඉතා කෙටි විස්තරයක් පමණි.

"තාත්තාගෙන් මුදල් ලැබුණු වහා ම මිතියා මා දුන්න මුදල් යවන බව මම හොඳට දැන ගෙන හිටියා"යි ඈ කීවා ය. "මිතියා මුදල් ගැන දක්වූ නොසැලැකිල්ලත් අවංක කමත් ගැන මගේ කිසි ම සැකයක් තිබුණේ නැහැ. තාත්තාගෙන් රූබල් තුන් දහක්

ලැබෙන බව මිතියා දැන ගෙන හිටියා. ඒ බව මටත් කීප වරක් ම කිව්වා. තාත්තා හා පුතා ද අතරේ ආරවුලක් තිබුණු බව මම දැන ගෙන හිටියා. තාත්තා මිතියාට කරදර කළ බව මම දැන ගෙන හිටියා. මිතියා තාත්තා මරන බව කියා තර්ජනය කරනවා මට මතක නැහැ. මා ඉදිරිපිට දී කවදාවත් තාත්තාට විරුද්ධ ව කිසි ම දෙයක් කිව්වේ නැහැ. ඒ වෙලාවේ මා ළඟට පැමිණියා නම් මට ණය තිබුණ රූබල් තුන් දහ ගැන කරදර නොවන ලෙස මම කියනවා. මිතියා මා හමුවීම නතර කරල තිබුණා. ඔහු ගෙදරට කැඳවීමට මට පුළුවන් කමක් තිබුණේ නැහැ.........එ වැනි තත්ත්වයක නො වෙයි මා ඉත්තේ. මිතියා ගෙන් මුදල් ඉල්ලා බල කිරීමට මට පුළුවන් කමක් තිබුණෙත් නැහැ''යි පැවැසූ තරුණිය යළි හදිසියෙන් ම මෙසේ කීවා ය. ''වරක් මම රූබල් තුන්දහකට වැඩි මුදලක් මිතියාගෙන් ණයට ගත්තා. මම ඒ මුදල ණයට ගත්තේ ඒ වෙලාවේ ආපසු ගෙවන්න නුපුළුවන් බව හොඳ හැටි දැනගෙනයි.''

ඇගේ කට හඬේ නොසැලකිලි ගතියක් දකින්නට තිබිණි. මිතියා ගේ නීතිඥයා ඇගෙන් කෝන්තර අසන්නට පටන් ගත්තේ ඒ මොහොතේ දී ය.

''යුෂ්මතිය ඒ මුදල් ණයට ගත්තේ මෙහි දී නො වෙයි. මිතියා ඇඳින ගත්ත මුල් කාලයේ දී නො වේ ද?''යි නීතිඥයා ඉතා සෙමෙන් තරුණිය ගෙන් ඇසුවේ තමා ගේ වාසියට එහි යම් කිසිවක් ඇතැයි සිතමිනි. මේ නීතිඥයා අඩක් කැතිරිනා ගේ උවමනාව උඩ පීටස්බර්ග් නුවරින් කැඳවනු ලැබී ය. කැතිරිනා මිතියාගෙන් රූබල් පන්දහක් ඉල්ලාගෙන, මිතියා ඉදිරිපිට බිම වැටී ආචාර කළ බව ඔහු නොදත්තේ ය. ඈ එම පුවත නීතිඥයාට නො කියා සඟවා ගත්තා ය. එය පුදුමයට කරුණක් ලෙස සැලැකිය යුතු ය. මෙම පුවත උසාවියේ දී කිය යුතු දැයි අන්තිම මොහොත වන තෙක් නොදත් කැතිරිනා ඒ සඳහා අවශ්‍ය ප්‍රබෝධය ලැබෙන තෙක් බලා සිටියා ය.

''නැහැ, මට ඒ මොහොත කවදාවත් අමතක කරන්න බැහැ''යි කැතිරිනා කීවා ය.

මිතියා ආලෝෂාට පැවැසූ කතාව, එනම් කැතිරිනා ගේ පියා ගැන සිද්ධිය හා ඇ මිතියා ළඟට මුදල් ඉල්ලා ගැනීම සඳහා ගිය සැටි කැතිරිනා උසාවියට කීවා ය. එහෙත් මුදල් ඉල්ලා ගැනීම සඳහා තමා මිතියා ළඟට යා යුතුයයි, මිතියා තමා ගේ සහෝදරියට කළ යෝජනාව ගැන කැතිරිනා වචනයකින් වත්,

ඉඟියකින් වත් සඳහන් නොකළා ය. මේ පුවත සඟවා ගත් කැතිරිනා මුදල් ඉල්ලා ගැනීම පිණිස සිය කැමැත්තෙන් ම මිතියා ළඟට දිවගිය බව කීමට ලැජ්ජා නොවූවා ය. ඇගේ සාක්ෂිය ආශ්චර්යයකි. සාක්ෂියට සවන් දී සිටි මගේ සර්වාංගය ම සීතල වී වෙවුලන්නට විය. අධිකරණ ශාලාවේ හැම දෙනා ම, ඇගේ මුවෙන් පිට වූ හැම වචනයක් ම අසා ගැනීමේ ආශාවෙන් හුස්ම නො ගෙන අසාහුන්හ. එය කිසිවකට සම කළ හැකි දෙයක් නො වේ. ඇය වැනි ආත්ම ශක්තියෙන් යුත්, අවමන් කළයුතු තරම් අහංකාර වූ තරුණියකගෙන් මෙ තරම් අවංක කතාවක්, ආත්ම පූජාවක්, ආත්ම පරිත්‍යාගයක් බලාපොරොත්තු විය නොහැකි ය. ඈ මේ හැම දෙයක් ම කළේ කුමක් සඳහා ද? කා වෙනුවෙන් ද? ඇය මුළා කළ, ඇයට නිගා කළ, මිනිහා බේරා ගැනීමට ය. ඉතා සුළු කරුණක් වුව ද වාසියට හේතුවන ලෙස අධිකරණය තුළ හැඟීම් ඇති කොට මිතියාගේ නිදහස පතා කටයුතු කිරීමට ය. මේ ලෝකයේ තමා ළඟ අන්තිමට ඉතිරි වී තිබුණු රූබල් පන් දහ අහිංසක තරුණියකට ආචාර කොට දුන් තරුණ නිලධරයා ගැන කා තුළත් අනුකම්පාව ඇති විය. .... එහෙත් මගේ හදවත වේදනාවෙන් හැකුළුණේ ය. මෙය මිථ්‍යාපවාදයකට පෙරළෙතැයි මා තුළ බියක් ඇති විය. (එය එසේ ම විය.) ඇගේ කතාව සම්පූර්ණ නැති බවත්, තරුණ නිලධරයා තරුණියට ගරුසරු ඇති ව අචාර කිරීමෙන් පසු ව යන්නට ඉඩ හැරියේ ය යන කතාව සම්පූර්ණ ඇත්ත නොවන බවත්, එහි කිසියම් අඩුවක් තිබෙන බවත්, පසු ව අපේ පළාතේ බොහෝ දෙනා සිනා සෙමින් කීහ.

මේ කතාවේ කිසි ම අඩු පාඩුවක් නැති වෙන්න පුළුවනි. මෙය සම්පූර්ණ කතාව වෙන්න පුළුවනි. එහෙත් තම පියා බේරා ගැනීමේ චේතනාවෙන් උව ද තරුණියක් මෙසේ හැසිරීම ප්‍රශංසනීය ක්‍රියාවක් ද යන්න සැක සහිත යයි අපේ පළාතේ ඉතා ඉහළින් ගරු කරනු ලැබූ කාන්තාවෝ කීහ.

මිනිසුන් මෙ වැනි වල්පල් දොඩන බව හොඳ සිහිබුද්ධියක් ඇති, අශෝභන ලෙස කිපෙන, කැතිරිනාට තේරුම් ගත නො හැකි වී ද? ඈ ඒ බව දැන සිටින්නට ඇත. එහෙත් සිදු වූ සියල්ල නො වළහා කීමට ඈ ඉටා ගත්තා ය. කෙසේ වෙතත් ඇගේ කතාවේ සත්‍යතාව ගැන සිතේ පිළිකුල් ඇතිවන තරමට සැක පහළ වූයේ පසු ව ය. මුල දී ඇගේ කතාව කාගේත් සිත් තදින් ඇදගත්තේ ය. රජතුන්කට්ටුව හා

නීතිඥයෝ ද ගෞරවයෙන් හා වෙනෙකක් තබා ලැජ්ජාවෙන් මිරිකී නිහඬ ව සවන් දුන්හ. පැමිණිල්ලේ නීතිඥයා කැතිරිනාගෙන් එක ද ප්‍රශ්නයක් වත් නො ඇසුවේ ය. විත්තියේ නීතිඥයා කැතිරිනාට හිස නමා ආචාර කෙළේ ය කැතිරිනා ගේ සාක්ෂිය විත්තියේ නීතිඥයා ලැබූ විශිෂ්ට ජයග්‍රහණයකි. ඇගේ සාක්ෂියෙන් මිතියාට විශාල වාසියක් ඇතිවිය. තමා ළඟ ඉතිරි ව තිබුණු රුබල් පන්දහ ත්‍යාගවන්ත ව දෙන මිනිහා අනතුරු ව රුබල් තුන්දහක් සොරා ගැනීමේ අදහසින් පියා මරා දැමීම පිළිගත නොහැකි, තර්කයට නො ගැළපෙන කතාවකි. සොරකම පිළිබඳ චෝදනාව සම්පූර්ණයෙන් ම බොරු වූයේ යයි ඔහුට හැඟිණි. නඩුව සම්පූර්ණයෙන් ම වෙනස් විය. මිතියා ගැන කා තුළත් අනුකම්පාව ඇති විය. කැතිරිනා සාක්ෂි දෙන අතරේ මිතියා වරක් දෙවරක් අසුනෙන් නැගී සිට ආයේත් ඉඳගෙන මූහුණ සඟවාගත් බවත්, ඈ සාක්ෂි දී අවසන් වූ පසු ''කැතිරිනා, ඇයි මා විනාශ කළේ?'' කියා අසමින් ඇඬූ බවත්, ඒ ඇඬීම මුළු උසාවියට ම ඇසුණු බවත්, එහෙත් ඔහු ආයේත් සිත මැඩගෙන ''දැන් මා විනාශයි'' කියා කෑගෑ බවත් මට දැනගන්නට ලැබුණේ ය.

අනතුරු ව මිතියා දත්මිටි කා ගෙන, දෑත පපුව හරහා අකුලාගෙන, නො සෙල් වී හිඳ සිටියේ ය. කැතිරිනා ඇයට හිමි අසුනෙහි හිඳගත්තා ය. සුදුමැලි වූ ඈ බිම බලා ගත්තා ය. උණෙන් ගැහෙන්නාක් මෙන් ඈ බොහෝ වේලා ගත වන තුරු වෙවුලූ බව ඇය ළඟ සිටි අය කීහ. අනතුරු ව සාක්ෂි දීම සඳහා ගෲසෙන්කා කැඳවනු ලැබුවා ය.

මිතියා ගේ විනාශයට හේතු වූයේ යයි සිතිය හැකි මහා විපත තව ටිකකින් විස්තර කොට කියමි. මේ දෙය සිදු නො වූයේ නම් අඩු ගණනේ සිරකරුවාට අනුකම්පා කරන ලෙස නඩුව තීරණය වන්නට ඉඩ තිබුණු බව මට හොඳට විශ්වාසයි. ඒ බව හැම දෙනා ම කීහ. එහි රැස් ව සිටි නීතිඥයෝ ද ඒ බව පසු ව කීහ. ඒ පුවත මම පසු ව කියමි. දැනට ගෲසෙන්කා ගැන වචන ස්වල්පයක් කිව යුතු ය.

කැතිරිනා මෙන් කළු වතින් සැරැසී සිටි ගෲසෙන්කා, කර වටේ අලංකාර සළුවක් පැළඳ සිටියා ය. ඈ ඉතා සෙමෙන්, ශබ්ද නො ඇසෙන ලෙස පා තබා, තරබාරු ගැහැනුන්ට සුපුරුදු ලැසි ගමනින් සාක්ෂි කූඩුවට ගියා ය. අවට නො බැලූ ඈ කෙළින් ම ප්‍රධාන විනිශ්චයකාරයා දෙස බලා සිටියා ය.

මගේ කල්පනාවේ හැටියට ඒ වෙලාවේ ගෘසෙන්කා ගේ මුහුණේ අමුතු ලක්ෂණයක් දකින්නට තිබිණි. ඒ වෙලාවේ ඈ සුදුමැලි වී සිටිය බව ගැහැනු කිප දෙනෙක් පසු ව කීහ. ඒ කතාවේ ඇත්තක් නැත. ඇගේ මුහුණේ ආරූඪ කරගත් ඊරිසියාවක් දකින්නට තිබුණු බව ද ගැහැනු කීහ. මගේ විශ්වාසයේ හැටියට අනුන් ගේ ඕපාදූප කතාවලට ප්‍රිය කරන මහජනයා, පිළිකුල් සහගත බැල්මෙන් තමා දෙස බලා සිටින බව දැනගත් ගෘසෙන්කා කෝපයෙන් හා සිත් වේදනාවෙන් ද සිටින්නට ඇත. උඩගු සිතක් ඇති ඇයට අවමානය ඉවසා ගත නො හැකි ය. යම් කිසිවෙක් තමාට නින්දා අපහාස කරන්නේ ය යන සැකයෙන් කිපි පළි ගැනීමට පෙලඹෙන වර්ගයේ තැනැත්තියකි ගෘසෙන්කා. ඇය තුළ බයාදු කමක ලකුණු ද දකින්නට තිබිණි. ඒ බයාදු කම ගැන ඈ ලැජ්ජා වූවා ය. එ හෙයින් සාක්ෂි දෙන අතරේ ඇගේ කට හඬ වෙනස් වීම පුදුමයක් ලෙස සැලකිය යුතු නො වේ. වරක් ඈ කිපෙයි; අනෙක් මොහොතේ උඩගු වෙයි; රළු වෙයි; අනතුරු ව අවංක හැඟීමෙන් යුතු ව තමාට ම දොස් පවරා ගනියි; ආයේත් තමා සදොස් යයි කියයි. "මොනවා වුණත් කමක් නැහැ; කියන්න තියෙන දෙය කියනවා" යන හැඟීමෙන් යුතු ව, බියක් සැකක් නැති ව අනතුරට මුහුණ පාන නියායෙන් කතා කරයි. පියෝදර් පව්ලෙවිච් කරමසෝ සමඟ පැවැති සබඳකම ගැන ප්‍රශ්න කළ විට "ඒක කිසි ම තේරුමක් නැති කතාවක්, ඒ මිනිහා මට පෙරැත්ත කිරීම මගේ වරද ද?" කියා, මිනිත්තුවකට පසු ව "මේක මගේ වරද, මම තාත්තාටයි පුතාටයි හිනා වුණා. මා නිසා ඔවුන් දෙන්නා ම විනාශ වුණා"යි කීවා ය.

කෙසේ හෝ සම්සෝනෝ ගේ නම ද නඩුවිභාගයේ දී සඳහන් විය. "ඒක කාටවත් අයිති කතාවක් නො වෙයි. මා ගෙදරින් පන්නලා, බඩට ගෝස්තරයක් නැති ව, යන්න එන්න තැනක් නැති ව ඉන්න කොට මාව භාරගෙන හදා ගත්තේ සම්සෝනෝ, සම්සෝනෝ මගේ ආරක්ෂකයා"යි ගෘසෙන්කා බලවත් විරුද්ධත්වයක් සමඟ මුසු වූ අහංකාර කමින් යුතු ව කීවා ය. තමාගෙන් අසන ලද ප්‍රශ්නවලට කෙළින් පිළිතුරු දෙනවා මිස නුවුවමනා විස්තර අනවශ්‍ය බව ප්‍රධාන විනිශ්චය-කාර තුමා කරුණාවෙන් කීවේ ය. ගෘසෙන්කා ගේ මුහුණ රතු විය. නෙත් දීප්තිමත් විය.

මුදල් සමඟ ලියුම් කවරය ගැන අසා තිබුණා මිස ගෘසෙන්කා එය දැක නො තිබිණි. "අර නාකි මිනිහා, පියෝදර් පෙඩොරව්ච්

කරමසෝ, රූබල් තුන් දහසක් ලියුම් කවරයක දමාගෙන, මට දෙන්න බලා සිටින බව, මට අර දුෂ්ට කාලකණ්ණියා කිව්වා. ඒක පිස්සු කතාවක්. මම ඒ බව අසා සිනා සුණා. මට මොනවා දුන්නත් මම ඒ මිනිහ ළඟට යන්නෙ නැහැ."

"ඔබ 'දුෂ්ට කාලකණ්ණි මිනිහා' කියා අඳුනා දුන්නේ කවු ද?"යි පැමිණිල්ලේ නීතිඥයා විමසුවේ ය.

"සවාමියා මරා, ඊයේ රෑ එල්ලී පණ නහගත්ත දාසයා, පැවල් සෙමාඩියාකෝප්."

තමා පැවල්ට මහලු කරමසෝ මැරූ බව කියා චෝදනා කරන්නේ කුමන හේතුවක් ඇති ව දැයි එක්වර ම ඇගෙන් අසන ලදි. එහෙත් පැවල් මිනීමරුවා බව ඔප්පු කළ හැකි පිළිවෙලක් ගෲසෙන්කාට ද නො තිබුණේ ය.

"පැවල් තාත්තා මැරූ බව මට මිතියා කිව්වා. මිතියා ගේ වචනය විශ්වාස කල හැකියි. අප දෙදෙනාට හතුරු කම් කල ගැහැනිය මිතියාව විනාශ කළා මේ විපත්තිය වුණේ ඇගේ වරදින්"යයි ගෲසෙන්කා කීවා ය. ගෲසෙන්කා ගේ සර්වාංගය ම කෝපයෙන් වෙවුලන්නට විය. ඇගේ කට හඬට ද්වේෂය ආරූඪ විය.

ඇ කතා කරන්නේ කවරකු ගැන දැයි ආයේත් ඇගෙන් විමසන ලදි.

"අර අතන ඉන්න කැතිරිනා ඉවනොව්නා ගැනයි. ඇ මා ඇගේ ගෙදරට කැඳවලා, මට කන්න දීලා, මා රවටා ගන්න හැදුවා. ඇයට ලැජ්ජා භය කියා දෙයක් නැහැ. අන්න ඒකයි වරද!"

ඒ මොහොතේ දී ප්‍රධාන විනිශ්චයකාරතුමා ගෲසෙන්කාට තදින් අවවාද කොට, ඇගේ කතාව මැඩගන්නා ලෙස දන්වා සිටියේ ය. එහෙත් ඊර්ෂ්‍යාවෙන් පිරුණු තරුණිය ගේ සිත කෝපයෙන් දැවෙන්නට විය. තමා කියන කරන දෙය ගැන ඇ කිසි ම සැලැකිල්ලක් නො දැක්වූවා ය.

"මුක්රෝවේ දී සිරකරුවා සිරභාරයට ගත්ත වේලාවේ දී ඔබ අනෙක් කාමරයේ සිට එළියට දිවවිත් 'මේක මගේ වරද, අප දෙන්නා ම එකට සයිබීරියාවට යනවා' කියා කෑගානවා එහි සිටි කවුරුත් දුටුවා. එහෙනම්, සිරකරුවා ඔහු ගේ තාත්තා මැරූ බව ඔබ ඒ වේලාවේ විශ්වාස කළා ද?"යි පැමිණිල්ලේ නීතිඥයා ප්‍රශ්න කෙළේ ය.

"ඒ වෙලාවේ මා කුමක් කළා ද කියා මට මතක නැහැ"යි ගෘසෙන්කා කීවා ය. "ඒ වෙලාවේ හැමෝ ම කිව්වා මිතියා තාත්තා මැරුවා ය කියා. ඒකට වැරදිකාරයා මා ය කියා ඒ වෙලාවේ මට කල්පනා වුණා. නමුත් තාත්තා නොමරාපු බව මිතියා කිව්වට පස්සේ මම ඒ කතාව විශ්වාස කළා. මම මිතියා කියන දෙය එදත් විශ්වාස කළා, අදත් විශ්වාස කරනවා, හැම දා ම විශ්වාස කරනවා. මිතියා බොරු කියන කෙනෙක් නො වෙයි."

අනතුරු ව විත්තියේ නීතිඥයා ගෘසෙන්කාගෙන් කෝන්තර අසන්නට විය. නීතිඥයා ගෘසෙන්කාගෙන් ඇසූ නොයෙක් ප්‍රශ්න සමග "අලෝෂා කරමසෝ ළඟට කැඳවාගෙන ආවොත් රුබල් විසිපහක් දෙන බවට ඔබ රැකිටින්ට පොරොන්දු වුණා ද?" යන ප්‍රශ්නය ද ඇසූ බව මට මතකයි.

"රැකිටින් මගෙන් මුදල් ගැනීම පුදුම වීමට දෙයක් නො වෙයි" ගෘසෙන්කා කෝපයෙන් හා පිළිකුලින් කීවා ය. "රැකිටින් නිතර ම මගෙන් මුදල් ඉල්ලාගෙන ආවා. මාසයකට කොහොමටත් රුබල් තිහක් පමණ මගෙන් ඉල්ල ගත්තවා. මගෙන් මුදල් නො ගෙන ජීවත්වීමට උවමනා තරම් මුදල් රැකිටින් ළඟ තිබුණා."

"ඔබ රැකිටින්ට අතමිට දිග හැර මුදල් දුන්නේ මන්ද?"යි නීතිඥයා එක් වර ම ඇසුවේ විනිශ්චයකාර තුමා එම ප්‍රශ්නය වැළැක්වීමට තැත් කළ හෙයිනි.

"ඇයි, එයා මගේ මස්සිනා. එයා ගේ අම්මා මගේ අම්ම ගේ නංගි. නමුත් අපේ නෑ කම, මෙහි සිටින කිසි ම කෙනකුට කියන්න එපා ය කියා රැකිටින් මගෙන් බැගෑපත් ව ඉල්ලා සිටියා. එයා මට නෑකම කියන්න ලැජ්ජා වුණා."

මේ ප්‍රකාශය හැමට ම පුදුමයක් විය. නගරයේ හෝ ආශ්‍රමයේ හෝ සිටින කිසිවෙක්, වෙනෙකක් තබා මිතියා පවා මේ නෑකම නො දැන සිටියේ ය. රැකිටින් ගේ මුහුණ ලැජ්ජාවෙන් දම්පාට වූ බව කියනු ලැබේ. රැකිටින්, මිතියාට විරුද්ධ ව සාක්ෂි දුන් බව අධිකරණ ශාලාවට පැමිණීමට පෙර ගෘසෙන්කාට ආරංචි විය. එ හෙයින් ඈ රැකිටින් සමග කෝපයෙන් සිටියා ය. රුසියාවේ පැවැති දේශපාලන නොසන්සුන් කම් විස්තර කොට, මහජනයා වහල් භාවයේ තබා ගැනීමට පහර දෙමින් රැකිටින් පළ කළ උසස් අදහස්වලින් මහජනයා තුළ

ඇති වූ පැහැදීම අන්තිමේ දී විනාශ විය. මෙය මීතියා ගේ නීතිඥයා ගේ අපමණ ප්‍රීතියට හේතු විය. එය දෙවියන් අත පෑවා වැන්නැයි ඔහු කල්පනා කෙළේ ය. ග්‍රෑසෙන්කා ගෙන් කෝන්තර ඇසීම වැඩි වේලා නො පැවැතිණි. ඇගේ සාක්ෂියෙන් විශේෂ අලුත් කිසිවක් හෙළි නො වී ය. එහි රැස් ව සිටි අය තුළ ඇය ගැන පිළිකුලක් ඇති විය. සාක්ෂි දී නිම කොට කැතිරිනා සිටි තැනට ඈතින් තබා තිබුණු ඇගේ අසුනෙහි හිඳගන්නා විට පිළිකුලින් පිරුණු සිය ගණනක් නෙත් ඇය දෙසට එල්ල විය. ඈ සාක්ෂි දෙන අතරේ මීතියා තිගැඩි ව හිඳ සිටියේ ය. සිත් පිත් නැති ගලකට පරිවර්තනය වූවාක් මෙන් බිම බලාගෙන සිටියේ ය.

අනතුරු ව සාක්ෂි දීම සඳහා ඉවාන් කැඳවන ලදි.

පස් වන පරිච්ඡේදය

හදිසි විපත

අලෝෂාට ප්‍රථම සාක්ෂි දීම සඳහා ඉවාන් කැඳවන ලද බව සඳහන් කළ යුතු ය. කිසියම් අසනීපයක් නිසා සාක්ෂිකාරයාට ඒ මොහොතේ දී පැමිණිය නොහැකි බවත්, එහෙත් සුවය ලැබූ වහා ම සාක්ෂි දෙන බවත්, අධිකරණයේ ප්‍රවේශකයා ප්‍රධාන විනිශ්චයකාරතුමාට දැනුම් දුන්නේ ය. අධිකරණයේ ප්‍රවේශකයා කළ මේ ප්‍රකාශය කිසිවකුට ඇසුණේ නැත. ඒ බව දැනගන්නට ලැබුණේ පසු ව ය.

ඉවාන් අධිකරණ ශාලාවට පිවිසෙනවා මුල දී කිසිවෙක් නුදුටුවේ ය. ප්‍රධාන සාක්ෂිකාරයන් ගෙන්, වෙසෙසින් ම විරුද්ධවාදීන් වූ කාන්තාවන් දෙදෙනාගෙන් සාක්ෂි විමසන ලදින් පළමු වරට මහජනයා තුළ පැවැති කුතුහලය සංසිඳී වෙහෙසක් දැනෙන්නට විය. තවත් සාක්ෂි දීමට කීප දෙනෙක් සිටිති. දැනට හෙළි වී ඇති දේවල් ගැන සලකා බලන කල මේ සාක්ෂිකාරයන්ට හෙළිකිරීමට වැදගත් දෙයක් ඇතැයි සිතිය නො හැකි ය. කාලය ගෙවී ගියේ ය. දුටුවන් තුළ පුදුමය ඇති කරවන තරම් සෙමෙන් සාක්ෂි කූඩුව වෙත පැමිණි ඉවාන් කිසිවකු දෙස නො බලා, යම්කිසිවක් ගැන ශෝකයෙන් කල්පනා

කරන්නාක් මෙන් හිස පහත් කරගෙන සිටියේ ය. පිරිසුදු ඇඳුමෙන් සැරසී සිටි ඉවාන් ගේ මුහුණ දැකීමෙන් අඩු ගණනේ මා තුළවත් ශෝකය ඇති විය. ඔහු ගේ මුහුණේ අමනුෂ්‍ය ගතියක් දකින්නට තිබිණි. එය පණ අදින මිනිසකු ගේ මුහුණට සමාන ය. ඔහු ගේ දෑස ප්‍රාණවත් කමින් තොර විය. අන්තිමේ දී ඔහු සෙමෙන් හිස උස්සා අධිකරණය අවට බැලුවේ ය. හදිසියෙන් ම හුනස්නෙන් නැඟී සිටි අලෝෂා කෙඳිරි ගානවා මට මතකයි. නමුත් ඒ කෙඳිරිය කිසිවකුට ඇසුණු බවක් දකින්නට නො තිබිණි.

ඉවාන් දිවුරුම් පිට සාක්ෂි නොදෙන සාක්ෂිකාරයකු බවත්, තමාගෙන් අසන ලද ප්‍රශ්නවලට කැමැති නම් පිළිතුරු දිය හැකි බවත්, නොකැමැති නම් පිළිතුරු නොදී සිටිය හැකි බවත්, එහෙත් සාක්ෂි දිය යුත්තේ තමා ගේ හෘදයසාක්ෂියට එකඟ ව බවත් දන්වමින් ප්‍රධාන විනිශ්චයකාරතුමා සාක්ෂි ඇසීම ආරම්භ කෙළේ ය. විනිශ්චයකාරතුමාට සවන් දුන් ඉවාන් අනතුරු ව ඔහු දෙස හිස් බැල්මෙන් බැලුවේ ය. එහෙත් ටිකින් ටික ඔහු ගේ මුහුණට සිනාවක් නැඟුණේ ය. ඔහු දෙස පුදුමයෙන් බලා කතා කළ විනිශ්චයකාරතුමා කතාව අවසන් කළ වහා ම ඉවාන් සිනාසී,

"වෙන මොනව ද කියන්න තියෙන්නේ?"යි ඇසුවේ ය.

අධිකරණ ශාලාව තුළ දැඩි නිශ්ශබ්දතාවක් පැවැතිණි. ඉතා අද්භූත දෙයක් සිදුවන්නේ යයි කවුරුත් සිතූ හ. ප්‍රධාන විනිශ්චයකාරතුමා නොසන්සුන් විය.

"යුෂ්මතාට තව ම හොඳට සනීප නැද්ද?"යි විනිශ්චයකාරතුමා ඉවාන්ගෙන් ප්‍රශ්න කළේ අධිකරණ ප්‍රවේශකයා සිටින්නේ දැයි අවට බලමිනි.

"තමුන්නාන්සේ මා ගැන කරදර වෙන්න එපා. මට එ තරම් අසනීපයක් නැහැ. තමුන්නාන්සේ ගේ දැනගැනීම පිණිස ඉතා වැදගත් දෙයක් කියන්න තියෙනවා"යි ඉවාන් හිටිහැටියේ ම ඇති කරගත් සන්සුන් කමින් යුතු ව, මහත් හරසර දක්වා කී ය.

"යුෂ්මතාට විශේෂ යමක් කියන්න තියෙනවා ද?"යි විනිශ්චයකාරතුමා ඇසුවේ තවමත් සිතේ ඇති කරගත් සැකයෙන් යුතු ව ය.

ඉවාන් විනාඩි කීපයක් බිම බලාගෙන සිට අනතුරු ව හිස උස්සා ගොත ගසමින් "නැහැ...............විශේෂ දෙයක් කියන්න නැහැ"යි කී ය.

අනතුරු ව ඔවුහු ඉවාන්ගෙන් ප්‍රශ්න අසන්නට වූ හ. ඉවාන් වැඩි කැමැත්තක් නො දක්වා, හැකි තරම් ලුහුඬින් හා විකින් වික පැහැදිලි වන්නට වූ පිළිකුලකින් යුතු ව සිහිකල්පනා-වෙන් පිළිතුරු දුන්නේ ය. තමා කිසිවක් නොදන්නා බව හඟවා ඉවාන් ප්‍රශ්න කීපයකට පිළිතුරු නො දී සිටියේ ය. මිනියා හා තාත්තා ද අතරේ පැවැති ගනුදෙනු ගැන ඔහු කිසිවක් නොදන්නේ ය. "මම ඒ ගනුදෙනු ගැන සැලැකිල්ලක් දක්වූයේ නැහැ"යි ඔහු කී ය. සිරකරුවා විසින් තාත්තා මැරීමට කරන ලද තර්ජන ගැන ඔහු සිරකරුවා ගෙන් ම අසා තිබිණි. මුදල් සහිත ලියුම් කවරය ගැන තොරතුරු ඔහු දැනගත්තේ පැවල් ගෙනි.

"අප කරන්නේ එක ම දෙය කීප වරක් ම කීමයි." ඉවාන් ප්‍රශ්න ඇසීමට බාධා කරමින් කීවේ විඩා වැටී සිටින්නකු මෙනි. "මට විශේෂ දෙයක් කියන්න නැහැ."

"යුෂ්මතා අසනීපයෙන් සිටින බව මා දන්නවා. යුෂ්මතා ගේ හැඟීම් මට තේරුම් ගන්න පුළුවනි"යි පැවැසූ ප්‍රධාන විනිශ්චය-කාරතුමා පැමිණිල්ලේ හා විත්තියේ ද නීතිඥයන් දෙස බලා, අවශ්‍ය නම් සාක්ෂිකාරයාගෙන් ප්‍රශ්න ඇසිය හැකි යයි කී ය. ඒ මොහොතේ දී ඉවාන් විනිශ්චයකාරතුමා දෙස බලා "කරුණාකර මට යන්න අවසර දෙන්න. මට සනීප නැහැ"යි විඩා වැටුණු කටහඬින් කී ය. ඉක්බිති ව අවසර ලැබෙන තෙක් බලා නොසිටි ඉවාන් සාක්ෂි කූඩුවෙන් බැස දොර දෙසට ගියේ ය. අඩි හතරක් පමණ ගිය හෙතෙම යම්කිසිවක් ගැන තීරණයකට පැමිණියාක් මෙන් නතර වී, සෙමෙන් සිනාසී, ආයේත් ආපසු සාක්ෂි කූඩුවට ගියේ ය.

"ස්වාමීනි, මාත් හරියට අර ගැමි තරුණිය වගෙයි......... තමුන්නාන්සේ දන්නවා ඇති ගැමි තරුණිය ගේ කතාව පල්ලියට ගොස් කසාද බැඳීම පිණිස ඔවුන් මේ තරුණියට ඇඳුම් අන්දවන්න බොහො ම වෑයම් කළා. ඇඳුම් අරගෙන ඇගේ පස්සෙන් ගියා. ඉඳගන්න තැනින් නැඟිටින්න ය කියා කන්නලව් කළා. 'මා කැමැති නම් නැඟිටිනවා. නැතිනම් නිකම් ඉන්නවා'යි ඈ කිව්වා. මෙක අපේ ජනකතාවක තියෙනවා

මට මතකයි. මගේ හැටිත් එහෙම තමයි. කැමැති නම් නැගිටිනවා. නැති නම් නිකම් ඉන්නවා.........මේක අපේ ජාතික පුරුද්දක් වගෙයි.''

''මේ කතාව කීමෙන් යුෂ්මතා අදහස් කරන්නේ කුමක් ද?''යි විනිශ්චයකාරතුමා තදින් ඇසුවේ ය.

''ඇයි එහෙම අහන්නේ? මෙන්න මේකයි හේතුව''යයි කියමින් ඉවාන් නෝට්ටු මිටියක් එළියට ගනිමින් ''මෙන්න තියෙනවා අර ලියුම් කවරයේ තිබුණු මුදල්''යයි කියමින් මේසය උඩ තිබුණු ලියුම් කවරය පෙන්නමින් කී ය. නඩුවට සම්බන්ධ වූ සියලු ම බඩු බාහිරාදිය එම මේසය උඩ තබා තිබිණි. ''මේ මුදල් නිසයි මගේ තාත්තා මැරුම් කෑවේ. මේ මුදල් තියන්නේ කොතැනින් ද? සුපිරින්ටැන්ඩන් මහත්මයා, කරුණා කරල මේ මුදල් භාර ගන්න.''

අධිකරණ ප්‍රවේශකයා මුදල් ගෙන ප්‍රධාන විනිශ්චයකාරතුමාට දුන්නේ ය.

''මේ මුදල් ලියුම් කවරයේ තිබුණා නම් යුෂ්මතාට කොහෙන් ද ලැබුණේ?''යි විනිශ්චයකාරතුමා පුදුමයෙන් ප්‍රශ්න කෙළේ ය.

''මට මේ මුදල් ඊයේ පැවල්ගෙන් .... මිනීමරුවාගෙන් ලැබුණා. මිනිහා එල්ලී මැරෙන්න ඉස්සෙල්ලා මම මිනිහා හමුවෙන්න ගියා. තාත්තා මැරුවේ පැවල් මිස අයියා නො වෙයි. තාත්තා මැරුවේ පැවල්, මම තාත්තා මරන්න පැවල්ට කිව්වා. තමා ගේ තාත්තා මැරෙනවට කවු ද අකැමැති.?''

''යුෂ්මතා කතා කරන්නේ හොඳ සිහියෙන් ද?'' ප්‍රධාන විනිශ්චයකාරතුමාට නිනැතින් ම කියැවිණි.

''මගේ කල්පනාවේ හැටියට මා ඉන්නේ හොඳ සිහියෙන් ....තමුන්නාන්සේ ඇතුළු මෙහි සිටින විරූප වූ මුහුණු-වලින් යුත් අය වගේ මා ද ඉන්නේ දුෂ්ට සිතකින් යුතුව යි.'' අනතුරු ව ඔහු හදිසියෙන් ම මහජනයා දෙස බලා ''මගේ තාත්තා මිනීමරුවකු අතින් මැරුම් කෑවා. මෙ තැන ඉන්න මේ මිනිස්සු වැයම් කරනවා බොරුවට කම්පා වූ බව පෙන්-නන්න''යි ඉවාන් කෝපයෙන් හා පිළිකුලින් ද යුතු ව දත් තියවා කීවේ ය. ''මුන් සේරම වංචාකාරයෝ! මුන් සේරම කැමැතියි මුන් ගේ තාත්තලා මැරෙනවා නම්..... එක සර්පයෙක් අනෙක් සර්පයා මරා ගෙන කනවා ....මේ තැන මිනීමැරුමක්

වුණේ නැතිනම් මුත් සේරම සුත් වූ බලාපොරොත්තුවලිත් හා කෝපයෙත් ද යුතු ව ගෙදර යාවි. මූත්ට උවමනා කරන්නේ විනෝදයයි. මට තවත් කතා කරන්න තියෙනවා. මෙ තැන වතුර තියෙනව ද? දෙයියන් ගේ නාමෙට මට වතුර ටිකක් දෙන්න''යි කියමින් ඉවාන් හදිසියෙන් ම දෑතින් හිස බඳා-ගත්තේ ය.

ප්‍රවේශකයා වහා සාක්ෂි කාරයා ළඟට ගියේ ය. අලෝෂා වහා නැගිට ''අයියාට සනීප නැහැ. අයියා කියන දෙය විශ්වාස කරන්න එපා. මොළයේ උණ හැදිලා''යි කී ය. එකෙණෙහි ම හුනස්නෙන් නැගී සිටි කැතිරිනා භීතියෙන් දරදඬු වී ඉවාන් දෙස බලා සිටියා ය. හුනස්නෙන් නැගී සිටි මීතියා ද තම මලණුවන් දෙස බලා, මූවගට නඟාගත් අපූරු සිනාවකින් යුතු ව සැලැකිල්ලෙන් සවන් දුන්නේ ය.

''කලබල වන්න එපා. මා පිස්සෙක් නො වෙයි, මිනීමරුවෙක් පමණයි''යි ඉවාන් ආයේත් කී ය. ''මිනීමරුවන් ගෙන් ව්‍යක්ත කතා බලාපොරොත්තු වෙන්න බැහැ''යි කිසියම් හේතුවක් ඇති ව හදිසියෙන් ම පැවැසූ හෙතෙම සිනාසුණේ ය.

කලබල වූ දණ්ඩනායකයා ප්‍රධාන විනිශ්චයකාරතුමා ළඟට ගොස් සෙමෙන් සාකච්ඡා කෙළේ ය. නොසන්සුන් වූ අනෙක් විනිශ්චයකාරයෝ දෙදෙනා ද එකිනෙකා සමඟ රහස් කියන්නාක් මෙන් සාකච්ඡා කළහ. විත්තියේ නීතිඥයා මේ සියල්ලට ම මහත් ඕනෑ කමින් සවන් දුන්නේ ය. කුමකින් කුමක් සිදුවන්නේ දැයි දැනගැනීමේ ආශාවෙන් හා කුතුහලයෙන් ද පෙළෙන මහජනයා තිහඬ ව බලා සිටියහ. අන්තිමේ දී ප්‍රධාන විනිශ්චය කාරතුමා හදිසියෙන් ම නැගී සිටියේ යම්කිසිවක් සිහි වූවකු මෙනි.

''යුෂ්මතා ගේ කතාව බොහෝ ම ව්‍යාකූලයි. අපට ඒ කතාව පිළිගන්න බැහැ. පුළුවන් නම් යුෂ්මතා ගේ සිත සන්සුන් කරගෙන, යම් කිසිවක් කියන්න තියෙනවා නම් කියන්න. යුෂ්මතා උමතුවෙන් දෙඩවන්නෙක් නො වේ නම් යුෂ්මතා ගේ කතාව ඔප්පු කරන්නේ කොහොම ද?''

''ඒක තමයි වැදගත් දෙය. මගේ කතාව ඔප්පු කරන්න පුළුවන්කමක් නැහැ. අර බල්ලා, පැවල්, පරලෝකයේ ඉඳලා ලියුම් කවරයක දමා, මගේ කතාව ඔප්පු කරන්න පුළුවන් සාක්ෂි එවන්නේ නැහැ. තමුන්නාන්සේ කල්පනා කරන්නේ

ලියුම් කවර ගැන පමණයි. වෙන කිසි ම දෙයක් ගැන කල්පනා කරන්න බැහැ. එක ලියුම් කවරයක් ගැන කල්පනා කළාම ඇති. මට තියෙන්නේ එක ම සාක්ෂියක් පමණයි''යි පැවසූ ඉවාන් අනතුරු ව කල්පනාවෙන් සිනාසුණේ ය.

''කවුද ශ්‍රීමතා ගේ සාක්ෂිකාරයා?''

''මගේ සාක්ෂිකාරයාට වලිගයක් තියෙනවා. තමුන්නාන්සේ එය තුච්ඡ, නොගැලපෙන දෙයක් ලෙස පිළිගන්න පුළුවනි. ඒ ගැන එ තරම් සැලකිල්ලක් දක්වන්න උවමනා නැහැ. ඒකා වැඩි වැදගත් කමක් නැති යකෙක්''යයි ඉවාන් හදිසියෙන් ම කී ය. සිනා සීම නතර කළ ඔහු කතා කළේ රහසක් කියන්නකු මෙනි. ''සමහර විට මේ යක්ෂයා මෙ තැන ඉන්නට පුළුවනි. මිනීමැරුමට සම්බන්ධ වූ බඩු තබා ඇති මේසය යට ඉන්න පුළුවනි. එතැන නැති නම් වෙන කොතැන ඉන්න ද? මා කියන දෙය හොඳට අහගන්න. මා නිශ්ශබ්ද ව ඉන්නේ නැහැ කිව්වා ම යක්ෂයා භූගර්භයේ සිදුවන කම්පන ගැන කතා කරන්න පටන් ගත්තා.........විකාර කතා; එන්න, ඇවිත් මේ යක්ෂයා නිදහස් කරන්න. ඌ ආගමික ගීයක් ගායනා කරනවා. එහෙම ගී ගයන්නේ සිතේ නරක චේතනාවක් නැති නිසයි. මහ පාරේ සින්දු කියමින් යන බේබද්දකු වගෙයි. තත්පර දෙකක් තුළ ලැබිය හැකි සැපත සඳහා මා අවුරුදු කෝටි ප්‍රකෝටි ගණනක් වුවත් දෙන්න කැමැතියි. උඹ මා අඳුනන්නේ නැහැ. මා අඳුනන්නේ නැහැ. මේ සියල්ලක් ම කොතරම් අඥාන ද? ඔහු වෙනුවෙන් මා භාරගන්න. මා නිකම් ආවේ නැහැ. මේ ලෝකේ ඇති හැම දෙයක් ම මෙ තරම් අඥාන මන්ද?.........''

මෙසේ පැවසූ ඉවාන් යළි අධිකරණ ශාලාව දෙස සෙමෙන් බැලුවේ ය. එහෙත් දැනට ම අධිකරණ ශාලාව තුළ මහත් නොසන්සුන් කමක් පැවැතිණි. අලෝෂා ඉවාන් ළඟට දිවගියේය. ඊට පෙර ප්‍රවේශකයා ඉවාන් අතින් අල්ලා ගත්තේ ය.

''මොකද මිනිහෝ උඹ කරන්නේ?''යි ප්‍රවේශකයා දෙස බලා ඇසූ ඉවාන් හදිසියෙන් ම ඔහු ගේ උරහිසින් අල්ලා උස්සා වේගයෙන් බිම ගැසුවේ ය. එහෙත් එ තැනට පැමිණි පොලිස් භටයෝ වහා ඉවාන් අල්ලා ගත්හ. අනතුරු ව ඉවාන් වේගයෙන් කෑගාන්නට පටන් ගත්තේ ය. ඔහු ශාලාවෙන් ඉවත් කරන අතරේ මොනවා දෝ කියමින් කෑගැසුවේ ය.

මුළු අධිකරණය ම අවුල් විය. එදා එ තැන සිදු වූ හැම දෙයක් ම මට මතක නැත. මා තුල ද මහත් නොසන්සුන් කමක් ඇති වූ නිසා එහි සිදු වූ දෑ ගැන පරීක්ෂාවෙන් සිටිය නොහැකි විය. පසු ව අධිකරණය සන්සුන් වී, සිදු වූ දෙය කවුරුනුත් දැනගත් පසු, ප්‍රධාන විනිශ්චයකාර තුමා ප්‍රවේශකයාට තදින් දොස් කීවේ ය. එහෙත් ප්‍රවේශකයා විනිශ්චයකාරයාත් අමතා, සාක්ෂිකාරයා මුළු කාලය තුල ම හොඳ සුවයෙන් සිටිය බවත්, පැයකට පමණ පෙර සාක්ෂිකාරයාට සුළු ක්ලාන්ත ගතියක් දැනුණ හෙයින් දොස්තරකෙනකු ඔහු පරීක්ෂා කල බවත්, අධිකරණ ශාලාවට ඇතුළු වීමට පෙර ඔහු හොඳ සිහියෙන් කතා කල බවත්, සාක්ෂි දිය යුතු ය කියා ඔහු බලකර සිටි බවත්, ඔහු මෙ වැනි පෙරළියක් කරාවියයි සිතීමට ඉඩ නොතිබුණු බවත් විස්තර කොට කී ය. එහෙත් ඉවාන් නිසා ඇති වූ මේ පෙරළිය සන්සුන් වීමට පෙර තවත් පෙරළියක් ඇති විය. කැතිරිනා කෑගා අඬන්නට පටන් ගත්තා ය. අධිකරණ ශාලාවෙන් ඇය ඉවත් කරන විට ඊට තදින් විරුද්ධ වූ කැතිරිනා තමාට අධිකරණ ශාලාව තුල සිටීමට ඉඩ හරින ලෙස අයැද සිටියා ය. අනතුරු ව හිටි හැටියේ ම ප්‍රධාන විනිශ්චයකාරතුමාට කෑගා කතා කල කැතිරිනා, "මට තවත් කියන්න දේවල් තියෙනවා. ඒවා දැන් ම කිය යුතුයි. මෙන්න තියෙනවා ලියුමක්........ මේ ලියුම අරගෙන ඉක්මනට කියවන්න. අර භයානක සතා, අර අතන ඉන්න මිනිහා ලියාපු ලියුමක්"යයි ඈ මිතියා පෙන්නමින් කීවා ය. "තාත්තා මැරුවේ ඒ මිනිහා බව මේ ලියුමෙන් ඔප්පු වෙනවා. තාත්තා මරන හැටි විස්තර කරලා මට මේ ලියුම ලියා එව්වා. නමුත් අනෙක් සහෝදරයා අසනීපයෙන්. ඔහුට බොහො ම අමාරුයි. ඔහුට පිස්සු. ඔහු පිස්සුවෙන් සිටින බව දවස් තුනක ඉඳලා මම දැනගෙන හිටියා"යි කියමින් කැතිරිනා අඬන්නට වූවා ය.

අධිකරණයේ ප්‍රවේශකයා කැතිරිනා විසින් ප්‍රධාන විනිශ්චය කාර තුමාට දික්කරන ලද ලියුම ගත්තේ ය. අනතුරු ව පුටුවෙහි හිඳ ගත් කැතිරිනා දෑතින් මුහුණ වසාගෙන අඬන්නට පටන් ගත්තා ය. තමා උසාවියෙන් දොට්ට දමා ය යන බියෙන් හඬ මැඩගෙන අඬන්නට පටන්ගත් ඇගේ සර්වාංගය ම වෙව්ලන්නට විය. ඈ විනිශ්චයකාර තුමාට භාර දුන්නේ මිතියා විසින් නගරයේ තැබෑරුමේ සිට ලියා ඇය වෙත එවන ලද ලියුම ය. ඉවාන් මේ ලියුම අදුනා දුන්නේ කිසිවකුට බොරු කල නොහැකි ලියවිල්ලක් හැටියටය. අහෝ ඛේදයකි!

එහි නිවැරැදි භාවය අධිකරණය විසින් පිළිගන්නා ලදි. මේ ලියුම නො තිබුණේ නම් මීතියාට භයානක අවසානයෙන් නිදහස් වන්නට ඉඩ තිබිණි. නො එසේ නම් ඒ අවසානය එ තරම් භයානක නො වන්නට ද ඉඩ තිබිණි එ දින එ තැන සිදු වූ හැම දෙයක් ම සවිස්තර ව කීම අපහසු බව මම ආයෙත් කියමි. එ තැන සිදු වූ හැම දෙයක් ම තවමත් මට මහත් අවුලක් සේ පෙනේ. මගේ කල්පනාවේ හැටියට ප්‍රධාන විනිශ්චය කාරතුමා එම ලියුම අනෙක් විනිශ්චයකාරයන් දෙදෙනාටත්, දෙපක්ෂයේ ම නීතිඥයන් දෙදෙනාටත් ජූරි සභාවටත් පෙන්නුවේ ය. ඔවුන් කැතිරිනා ගෙන් සාක්ෂි අසනවා මට හොඳට මතකයි. සාක්ෂි දීමට තරම් සුදුසු තත්ත්වයක සිටින්නේ දැයි ප්‍රධාන විනිශ්චයකාරතුමා විමසූ විට, "මම ලෑස්තියි, මම ලෑස්තියි, තමුන්නාන්සේ ගේ ප්‍රශ්නවලට මට පිළිතුරු දෙන්න පුළුවනි"යි කැතිරිනා කීවා ය. තමා ගෙන් සාක්ෂි නො අසා සිටී ය යන බියක් තවමත් කැතිරිනා තුළ පවතින බව ඇගේ කතාවෙන් පෙනිණි. මෙම ලියුමත්, ලියුම ලැබුණු හැටි ගැනත් සම්පූර්ණ විස්තරයක් කරන ලෙස ඇයට දන්වන ලදි.

"මට මේ ලියුම ලැබුණේ මිනීමැරුමට ඉස්සෙල්ලා දවසෙයි. මීතියා මේ ලියුම ලිව්වේ ඊට දවසකට කලින් තැබෑරුමක සිටින විටයි. ඒ කියන්නේ මේ ලියුම ලියා තියෙන්නේ මිනීමැරුමට දවස් දෙකකට කලින්. බලන්න, මේ ලියුම ලියා තියෙන්නේ බිල් පතක වැනි දෙයකයි" කැතිරිනා එක හුස්මට කෑගා කීවා ය. "ඒ දවස්වල මීතියා අර ගෑනි ගේ පස්සේ යමින් නින්දිත විදියට හැසුරුණ නිසා මා සමඟ අමනාපයෙන් හිටියා ....මට රූබල් තුන් දහක් ණය තිබුණා. මා සමඟ තරහ වීමට ඒක තවත් හේතුවක්. මට රූබල් තුන් දහක් ණය තිබීම තමාට මහත් නින්දාවක් හැටියටයි ඔහු සැලැකුවේ. ඒකට ප්‍රධාන හේතුව ඔහු ගේ නීචකමයි. ඒ රූබල් තුන් දහ පිළිබඳ කතාව මෙන්න මෙහෙමයි. කරුණා කරල ඒ කතාව අහන්න. තාත්තා මරන්න සති තුනකට කලින් දවසක් උදේ මීතියා මා හමුවෙන්න ආවා. මම දැනගත්තා ඔහුට මුදල් අවශ්‍ය වී තිබෙන බව. මුදල් අවශ්‍ය වීමට හේතුවත් මම දැනගත්තා.........මුදල් අවශ්‍ය වුණේ අර ගෑනි යාළු කරගෙන, ගෑනිත් එක්ක පැනල යන්න. මීතියා මට බොරු කියා, මා අත්හැර දමන්න වෑයම් කරන බව මම දැනගත්තා. මගේ ඕනෑ කමින් ම මම මීතියාට රූබල් තුන් දහක් දුන්නා. මොස්කව් නුවර සිටින මගේ සහෝදරියට යවන්න යයි යන බොරු

අදහසිත් මුදල් දුන්නා. මුදල් දෙන අතර මුහුණ බලා 'කැමැති දවසක මුදල් යවන්න. මාසයකින් යැව්වත් ඇති'යි කිව්වා. නමුත් මම ඔහු ගේ මුහුණ බලා 'උඹට මුදල් උවමනා කරන්නේ අර ගෑනිත් එක්ක මට ද්‍රෝහිකම් කිරීමටයි. එහෙනම් මා ඔනෑ කමින් ම දෙන මේ මුදල් අරගනින්. මුදල් ගැනීමට තරම් ආත්ම ගරුත්වයක් නැති නම් අරගනින්'යයි කියන බව මොකද ඔහුට තේරුම් ගන්න බැරි වුණේ? මට උවමනා කළේ ඔහු ගේ පහත් ගති ඔහුට පෙන්නා දීමටයි. ඉතින් මොකද වුණේ? මුදල් අරගෙන ගිහින් අර ගෑනිත් එක්ක එක රැයෙන් විනාශ කළා......... නමුත් ඔහු දැනගෙන හිටියා ඔහු පිළිබඳ හැම දෙයක් ම මා දන්නා බව. මා ඔහුට මුදල් දුන්නේ ඔහු පරීක්ෂා කොට බැලීමටයි. මගෙන් මුදල් ගැනීමට තරම් ආත්ම ගරුත්වයක් නැති බව දැනගැනීමටයි. මම ඔහු ගේ මුහුණ බැලුවා. ඔහු මගේ මුහුණ බලා මගේ අදහස් දැනගත්තා. දැනදැනත් මුදල් අරන් ගියා."

"කැතිරිනා කියන දෙය ඇත්තයි" මිතියා හදිසියෙන් ම කෑගා කී ය. "නුඹේ මුහුණ දෙස බලා මම දැනගත්තා නුඹ මට අපහාසයක් කරන බව. දැනදැනත් මම මුදල් ගත්තා. මා තක්කඩියෙක්, මට අපහාස කරන්න. නුඹලා සියලු දෙනා ම මට අපහාස කරන්න, නින්දා කරන්න. මා නින්දා අපහාස ලැබීමට සුදුස්සෙක්."

"සිරකරුව, නිහඬ ව සිටින්න, තව එක වචනයක් කීවොත් මම නුඹ මෙතැනින් ඉවත් කිරීමට අණ කරනවා"යි ප්‍රධාන විනිශ්චයකාර තුමා බෙරිසන් දුන්නේ ය.

"ඒ මුදල් ඔහු ගේ සිතට මහත් වේදනාවක් වුණා"යි කැතිරිනා මහත් කලබලයෙන් වහවහා කීවා ය. ඒ මුදල් ආපසු මට ගෙවන්න ඔහුට උවමනා වුණා. ඔව්, ඒක ඇත්තයි. නමුත් අර ගෑනි වෙනුවෙන් වියදම් කිරීමටත් මුදල් උවමනා වුණා. ඉතින් තාත්තා මැරුවා. නමුත් මට මුදල් ගෙව්වේ නැහැ. ඒ වෙනුවට අර ගෑනිත් එක්ක අර ගමට පැනල ගියා. ඒ ගමට ගිහින් තාත්තා මරා ගත්ත මුදල් අර ගෑනිත් එක්ක නාස්ති කළා. තාත්තා මරන්න දවසකට ඉස්සෙල්ලා ඔහු මේ ලියුම ලිව්වා. ලියුම ලියා තියෙන්නේ සුරා බී මත්වී සිටින විටයි. මම ඒ බව එක පාරට ම දැනගත්තා. ඔහු මේ ලියුම තිතේ වෛරයෙන් යුතු ව ලියා තියෙන්නේ තාත්තා මැරුවත් මා මේ ලියුම කිසිවකුට නොපෙන්නන බව දැනගෙනයි. නැතිනම් මෙවැනි ලියුමක් කවදාවත් ලියන්නේ නැහැ. මම පළිගනිමින්

ඔහු විනාශ නොකරන බව ඔහු දැන සිටියා. නමුත් කරුණා කරලා මේ ලියුම කියවන්න. පරිස්සමින් කියවන්න. හැකි තරම් පරිස්සමින් කියවන්න. තාත්තා මුදල් තබා තියෙන තැන, තාත්තා මරන හැටි, සේරම කලින් ලියා තියෙන හැටි පේනවා නේද? කරුණා කරලා හොඳට බලන්න. කිසි ම දෙයක් මඟ හැරෙන්න දෙන්න එපා. 'මම තාත්තා මරන්නේ ඉවාන් ගියොත් පමණයි' කියා වගන්තියක් තියෙනවා. පේනවානේ ද තාත්තා මරන්න කලින් සූදානම් වූ බව''යි කැතිරිනා ද්වේෂයෙන් හා වෛරයෙන් ද හටගත් ප්‍රීතියෙන් පෙන්නා දුන්නා ය. ඈ ඒ විනාශදායක ලියුම ඉතා පරිස්සමින් කියවා, හැම වචනයක් ම දැන සිටිය බව පැහැදිලි විය. "නමුත් ඔහු සුරා බී නො සිටියා නම් කවදාවත් මේ ලියුම ලියන්නේ නැහැ. බලන්න හැම දෙයක් ම කලින් විස්තර කරලා තියෙන හැටි. සිදුවන විදියට ම ලියා තියෙනවා තාත්තා මරන හැටි ඒ විදියට ම තියෙනවා ......මුළු වැඩපිළිවෙළ ම තියෙනවා."

නොත්තු වූ කැතිරිනා, තමාට සිදුවන දෙය හෝ ලැබෙන ප්‍රතිඵලය හෝ කිසිවක් නො තකා කෑගාන්නට වූවා ය. ඈ මෙ වැනි දෙයක් සිදුවන බව මසකට පෙර දැනසිටින්නට ඇත. නඩු විභාගයේ දී මේ ලියුම ඉදිරිපත් කළ යුතු ද නැද්ද යන වග කෝපයෙන් සියොලඟ වෙවුලද්දී කල්පනා කරන්නට ඇත. දැන් ඈ ඒ මාරක පියවර ගත්තා ය. මගේ කල්පනාවේ හැටියට කැතිරිනා සාක්ෂි දී නිම වූ වහා ම ලියන්නා එම ලියුම මුළු උසාවියට ම ඇසෙන ලෙස උස් හඬින් කියෙව්වේ ය. එම ලියුම මුළු උසාවිය කෙරෙහි ම තදින් බලපෑවැත්වූයේ ය. තමා එම ලියුම ලිව්වේ දැයි අනතුරු ව මීතියා ගෙන් ප්‍රශ්න කරන ලදි.

"ඔව්, මේ ලියුම ලිව්වේ මම යි'' මීතියා පිළිතුරු දෙමින් කී ය. "මම සුරා බී මත් වී නොසිටියා නම් කවදාවත් මේ ලියුම ලියන්නේ නැහැ......කැතිරිනා අපි නොයෙක් හේතූන් නිසා එකිනෙකාට වෛර කළා. නමුත් වෛර කරන අතර මම නුඹට ආලය කළ බව ද මට දිවුරා කියන්න පුළුවනි. නමුත් නුඹ කවදාවත් මට ආලය කළේ නැහැ."

මෙසේ පැවැසූ මීතියා බලාපොරොත්තු සුන් වූ සිතින් අත වනා ආපසු පුටුවේ හිඳ ගත්තේ ය. අනතුරු ව පැමිණිල්ලේ හා විත්තියේ ද නීතිඥයන් දෙදෙනා කැතිරිනා ගෙන් කෝන්තර අසන්නට වූ හ. ප්‍රධාන වශයෙන් ඔවුන්ට දැනගැනීමට අවශ්‍ය

වූයේ මෙ තරම් වැදගත් ලියවිල්ලක් සඟවාගෙන අමුතු ම විලාසයකිත් හා උනන්දුවකිත් යුතු ව සාක්ෂි දීමට ඇය පෙළඹ වූ හේතුත් ගැනයි.

"ඔව්, ඔව්, මම ඉස්සෙල්ලා බොරු කිව්වා"යි කැතිරිනා උමතුවෙන් කෑගා කීවා ය. මගේ ආත්ම ගරුත්වයට හා හිතට විරුද්ධ ව මම හැම දා ම බොරු කිව්වා. මට වෛර කළ නිසාත්, බොහො ම නින්දා අපහාස කළ නිසාත්, මා කල්පනා කළා, ඔහු මේ නඩුවෙන් බේරා ගන්න. ඔහු මට බොහො ම භයානක විදියට අපහාස කළා. හැම දා ම අපහාස කළා......අර මුදල් ඉල්ලා ගැනීම පිණිස ඔහු ඉදිරිපිට දණින් වැටුණු දා සිට ඔහු මට අපහාස කළ බව මම හොඳ හැටි දැන සිටියා. මම හොඳට දුටුවා......මට දැනුණා. නමුත් බොහො ම කාලයක් ගතවනතුරු ඒ බව විශ්වාස කිරීමට මා කැමැති වුණේ නැහැ. 'කොහොම වුණත් එදා තුඹ ඕනෑකමින් ම මා ළඟට ආවා නේ ද?' යන හැඟීම ඔහු තුළ තියෙන බව මම කීප වරක් ම ඔහු ගේ නෙත් දෙස බලා දැන ගත්තා. ඔහුට මගේ අදහස් තේරුම් ගන්න බැරි වුණා. ඔහු කවදාවත් තේරුම් ගත්තේ නැහැ. එදා මම මුදල් ඉල්ලා ගෙන ඔහු ළඟට දිව ගියේ මන්ද කියා ඔහු තේරුම් ගත්තේ නැහැ. ඔහුට තේරුම් ගන්න පුළුවන් ඉතා පහත් දේවල් පමණයි. ඔහු ඔහු ගේ මිම්මෙන් මා මැන්නා. හැම දෙනා ම ඔහු වගේ ය කියා හිතනවා"යි කැතිරිනා ඔල්මාදයෙන් සිටින්නකු මෙන් බලවත් කෝපයෙන් කීවා ය "ඔහු මා සමඟ විවාහ වීමට දැක්වූ එක ම හේතුව මා විශාල මුදලයකට හිමි කාරියක් වීමයි. මගේ ධනයට ඇති ආශාවෙන් තමයි මා විවාහ කර ගැනීමට කැමැති වුණේ. මම ඒ ගැන සැක කළා. ඔහු මෘගයෙක්! එදා මම ඔහු ළඟට ගිය නිසා ඔහු හිතනවා මම හැම දා ම ඔහු ඉදිරිපිට දී වෙවුලනවා ය කියා. මට හැම දා ම නින්දා කරන්න පුළුවන් ය කියා හිතුවා. මේ කාරණාව තමා ගේ වාසියට හරවා ගත්තා. අන්න ඒ නිසයි ඔහු මා සමඟ විවාහ වීමට කැමැති වුණේ. මම ඔහුට දැඩි ව ප්‍රේම කළා. ඒ ප්‍රේමයේ සීමාවක් නැහැ. ඒ ප්‍රේමයෙන් ඔහු ගේ සිත් දිනාගැනීමට මම වෑයම් කළා. නමුත් ඔහුට කිසි ම දෙයක් තේරුම් ගන්න බැරි වුණා. ඔහු මෘගයෙක්! මෘගයකුට හොඳ නරක තේරෙන්නේ කොහොම ද? මට මේ ලියුම ලැබුණේ මිනීමැරුමට කලින් දින සවසයි. තැබෑරුමේ ඉඳලයි මේ ලියුම මට එවා තිබුණේ. එදා උදේ මම ඔහුට සමාව දීමට අදහස් කළා. හැම දෙයකට ම, වෙනෙකක් තබා මට කළ ද්‍රෝහිකම්වලටත් සමාව දීමට අදහස් කළා......"

ප්‍රධාන විනිශ්චයකාරතුමා හා රාජ නීතිඥයා ද කැතිරිනා සත්සුත් කිරීමට වෑයම් කළහ. ඇගේ උමතුවෙන් ප්‍රයෝජන ගැනීමටත්, ඇගේ දෙඩවිල්ලට සවන් දීමටත්, ඔවුන් ලැජ්ජා වූ බව මට හොඳට විශ්වාසයි. "මේ කාරණාව ඔබට කො තරම් ලොකු සිත් වේදනාවක් ද යන වග අපි දන්නවා. අපටත් ඒ ගැන බොහො ම කනගාටු යි" ආදී නොයෙක් දේ කියමින් ඇගේ සිත සැනසීමට ඔවුන් වෑයම් කරනවා මට මතකයි. එහෙත් ඒ අතරේ ඔවුහු උමතුවෙන් කෑගානා තරුණියගෙන් හැකි තරම් කරුණු දැන ගැනීමට වෑයම් කළහ. තමා ගේ සහෝදරයා වන 'භයානක මෘගයා හා මිනීමරුවා' බේරා ගැනීමට පසුගිය දෙමස තුළ ඉවාන් උමතුවන තරමට වෑයම් කළ සැටි අත්තිමේ දී කැතිරිනා සිතේ පුදුමය ඇති කරවන තරමට පැහැදිලි ව විස්තර කළා ය. ඔල්මාදයෙන් දොඩන අයට මෙසේ පැහැදිලි ව කතා කළ හැකිවන බව නිතර පෙනෙන්නට තිබෙන දෙයක්. එහෙත් එසේ කතා කළ හැක්කේ ස්වල්ප වේලාවකට පමණි.

"ඉවාන්, අයියා බේරා ගැනීමට ගොස් බොහොම දුක් වින්දා. අයියා කළ අපරාධය සුළු කොට පෙන්නීමට වෑයම් කළා. තමා තාත්තාට කිසි ම ආදරයක් නොදැක් වූ බවත්, සමහර විට ඔහු ගේ මරණය ගැන ආශාවෙන් බලාපොරොත්තු වූ බවත් ඉවාන් මට කිව්වා. ඔහු ගේ හිත බොහො ම ලාමකයි. හිතේ ඇති ලාමක කම නිසා බොහෙ ම දුක් වින්දා. ඔහු මට හැම දෙයක් ම ඇවිදින් කිව්වා. හැම දා ම මා හමුවීමට පැමිණ ඔහුට සිටින එක ම මිතුරා හැටියට මා පිළිගෙන හැම දෙයක් ම මට කිව්වා. ඔහු ගේ විශ්වාසය දිනාගත්ත එක ම තැනැත්තා වීමේ ගෞරවය මට ලැබුණා"යි මැන දොඩත්තියක මෙන් කැතිරිනා කීවා ය. ඇගේ දෑස දිළිහුණේ ය. "ඉවාන් දෙවරක් පැවල් හමුවීමට ගියා. දෙවසක් ඉවාන් මා හමුවීමට ඇවිදින් 'තාත්තා මැරුවේ අයියා නො ව පැවල් නම් සමහර විට මා ද ඊට වැරදිකාරයෙක් විය යුතුය. මා තාත්තාට වැඩි කැමැත්තක් නොදක්වන බව පැවල් දැන ගෙන සිටියා. සමහර විට තාත්තා මරනවාට මගේ ද කැමැත්තක් ඇතැයි පැවල් සිතන්න ඇති'යි මට කිව්වා (මහලු කරමසෝ මැරුවේ මිනියා නො ව පැවල් බව හඟවන කතාවක් එකල ප්‍රචාරය වෙමින් පැවැතිණි) එතකොට මම මේ ලියුම ඉවාන්ට පෙන්නුවා. තාත්තා මැරුවේ අයියා බව ලියුම් කියවීමෙන් පසුව ඉවාන් එකහෙළාම පිළිගත්තා. ඊට පස්සේ ඉවාන් ගේ සිහිය සම්පූර්ණයෙන් ම අවුල් වුණා. තමා ගේ සහෝදරයා තාත්තා මැරුවා ය කියන අදහස

ඔහුට ඉවසා ගන්න බැරි වුණා. මේ අදහස ඉවසා ගන්න බැරි ව ඉවාන් අසනීප වන බව සතියකට කලින් මම දැන ගත්තා. පසු ගිය දවස් කීපය තුල දී ඔහු මා හමුවීමට ඇවිදින් පිස්සකු වගේ කතා කළා. මා දැන ගත්තා ඔහු ගේ සිහිය නරක්වන බව. ඔහු පිස්සකු වගේ කතා කරමින් ඇවිද්දා. ඔහු තනියෙන් කතා කරමින් පාරේ යනවා නොයෙක් දෙනා දැකල තියෙනවා. මගේ ඉල්ලීම පිට, දවස් දෙකකට කලින් මොස්කව් නුවර සිට පැමිණි දෙස්තර ඉවාන් පරීක්ෂා කරලා මට කිව්වා වැඩි දවසක් යන්න ඉස්සෙල්ලා ඉවාන්ට පිස්සු හැදේ ය කියා, ඒයේ පැවල් මල බව ආරංචි වූ පසු ඔහුට සම්පූර්ණයෙන් ම පිස්සු හැදුණා. මේ සේරම සිද්ධ වුණේ අර භයානක සතා නිසයි. ඒ භයානක සතා බේරා ගැනීමට යාම නිසයි.''

සැබැවින් ම කෙනකුට මෙසේ කතා කල හැක්කේ, මෙ වැනි ප්‍රාපෝච්චාරණයක් කල හැක්කේ ජීවිතයට වරක් පමණි. එය ද මැරෙන මොහොතේ දී, නැති නම් පෝරකයට නගින විට පමණි. එහෙත් මෙසේ හැසිරීම කැතිරිනා ගේ චරිතයේ විශේෂ ලක්ෂණයකි. මේ මොහොත ද ඇගේ ජීවිතයේ එ වැනි අවස්ථාවකි. තම පියා ගේ ජීවිතය බේරා ගැනීම පිණිස තරුණ සලලකු ඉදිරියේ දණින් වැටුණේ ද මේ කැතිරිනා ම ය. ටික වේලාවකට පෙර උඩඟු සිතක් හා නිර්මල චරිතයක් ද ඇති එම කැතිරිනා මිතියා ගේ ඉරණම ආරක්ෂා කිරීමේ බලාපොරොත්තුවෙන් යුතු ව, මහජනයා ඉදිරිපිට ඇගේ තුරුණු විනීතභාවය පරිත්‍යාග කළා ය. දූනුදූ ඈ කළේ එ වැනි ම ආත්ම පරිත්‍යාගයකි. මෙ වර ඈ මේ ආත්ම පරිත්‍යාගය කළේ වෙන අයකු සඳහා ය. ඒ තැනැත්තා තමාට කො තරම් අගනේ ද යන්න සමහර විට ඇයට වැටහෙන්නට ඇත්තේ මේ මොහොතේ දී විය යුතු ය. කැතිරිනා මෙ වැනි පරිත්‍යාගයක් කළේ ඉවාන්ට ඇති බියෙනි. ඉවාන් ගේ සාක්ෂියෙන් ඉවාන් සම්පූර්ණයෙන් ම විනාශ වූ බව ඇයට හදිසියෙන් ම අවබෝධ විය. තාත්තා මැරුවේ අයියා නො ව තමා බව කියමින් ඉවාන් තමා ම විනාශ කරගන්නා බව කැතිරිනා තේරුම් ගත්තා ය. එ හෙයින් ඈ මේ ආත්ම පරිත්‍යාගය කළේ ඉවාන් ගේ නමත් ගරුත්වයත් ආරක්ෂා කර ගැනීම පිණිස ය.

එහෙත් මේ හැම දෙයක් ගැන ම කෙනකු තුල භයානක සැකයක් ඇති වෙන්නට පිළිවන. මිතියා සමඟ පැවැත්වූ සබඳකම ගැන කැතිරිනා බොරුවක් ගොතා කියන්නී ද? ඒ තමා අප විසින් ඇසිය යුතු ප්‍රශ්නය. තමා මිතියා ඉදිරිපිට

දණින් වැටීම නිසා, මිතියා තමා පහත් කොට සලකන බව කීමෙන් කැතිරිනා කළේ සිතාමතා බොරුවක් කීම නො වේ. මිතියා තමාට අවමන් කරන්නේ යයි ඈ විශ්වාස කළා ය. එකල ඇයට දැඩි ව ප්‍රේම කළ යහපත් සිතක් ඇති මිතියා, ඔහු ගේ කාමරයේ දී ඔහු ඉදිරිපිට දණින් වැටුණු ද, සිට තමාට සිනාසෙන්නේ ය, තමා පහත් කොට සලකන්නේ යයි කැතිරිනා කල්පනා කළා ය. ඈ උමතු ප්‍රේමයෙන්, සිතට වේදනාවක් වූ ප්‍රේමයෙන් මිතියාට ප්‍රේම කළේ ඇය තුළ පැවැති උඩඟු කම නිසා ය. පෑරුණු උඩඟු සිත නිසා ය. එය ප්‍රේමයට වඩා, පළි ගැනීමක ස්වරූපයක් ගත්තේ ය. සිතට වේදනාවක් වූ එම ප්‍රේමය අන්තිමේ දී සැබෑ ප්‍රේමයකට පරිවර්තනය වන්නට ඇත. සමහර විට කැතිරිනා බලාපොරොත්තු වන්නට ඇත්තේ එ වැනි දෙයකි. එහෙත් මිතියා ග්‍රෑසෙන්කා සමඟ මිත්‍ර වීමෙන් කැතිරිනාට මහත් අපහාසයක් කෙළේ ය. ඒ ගැන නම් මිතියාට කැතිරිනා ගෙන් සමාවක් නො ලැබේ. මිතියාගෙන් පළිගැනීමට අවස්ථාවක් ඇයට හදිසියෙන් ම ලැබිණි. කැතිරිනා ගේ සිතේ මෙතෙක් කල්, ඔබ්බු දුවන ලද වණයක් මෙන් පැවැති වේදනාව හදිසියෙන් ම කිසි ම බලාපොරොත්තුවක් නැති ව පුපුරා ගියේ ය. කැතිරිනා මිතියාට ද්‍රෝහි කමක් කරන අතරේ තමාට ද ද්‍රෝහි කමක් කරගත්තා ය. මෙතෙක් කල් සිතේ පෑසෙමින් පැවැති හැම දෙයක් ම අන්තිමේ දී හෙළි කිරීමෙන් ඉක්බිති ව සිතේ වේගයත්, කෝපයත්, අඩු වී ලැජ්ජාවක් ඇති විය. කැතිරිනා ආයෙත් වරක් කෑගා අඬන්නට පටන් ගත්තා ය. කෑගාමින් බිම ඇද වැටුණා ය. ඇය වහා ම අධිකරණ ශාලාවෙන් ඉවත ගෙනයනු ලැබුවා ය. ඒ මොහොතේ දී ග්‍රෑසෙන්කා විලාප නගා ගෙන මිතියා ළඟට දිව ගියා ය. කිසිවකුට ඇය අල්ලා නතර කර ගත නොහැකි විය.

"මිතියා, තුඹේ සර්පයා තුඹ විනාශ කළා"යි පැවැසූ ග්‍රෑසෙන්කා අනතුරු ව විනිශ්චය කාරයන් දෙසට හැරී "තමුන්-නාන්සේලාට අර ගෑනි ගේ හැටි පෙනුණා නේද?"යි ඇසුවා ය. කෝපයෙන් ඇගේ සියලඟ වෙව්ලුවේ ය. ප්‍රධාන විනිශ්චයකාර තුමා ගේ නියමය පරිදි ඔවුහු ග්‍රෑසෙන්කා අධිකරණ ශාලාවෙන් ඉවත් කිරීමට වෑයම් කළහ. ඊට ඉඩ නුදුන් ග්‍රෑසෙන්කා ඔවුන් සමඟ සටන් කරමින් මිතියා ළඟට යෑමට වෑයම් කළා ය. මිතියා ද කෑගා ග්‍රෑසෙන්කා අල්ලා ගැනීමට තැත් කෙළේ ය. ඔවුහු වහා මිතියා අල්ලා මෙල්ල කර ගත්හ

මගේ කල්පනාවේ හැටියට නඩුව බැලීමට පැමිණි කාන්-තාවන් මේ සියල්ල බලා මහත් සතුටට පත්වන්නට ඇත.

එ තැන සිදු වූ පෙරළිය සැබැවින් ම චමත්කාරජනක ය. අනතුරු ව මොස්කව් නුවර සිට පැමිණි වෛද්‍යවරයා කැඳවනවා මට මතකයි. මගේ කල්පනාවේ හැටියට විනිශ්චයකාර තුමා ඉවාන්ට අවශ්‍ය සියලු ම වෛද්‍යාධාර ලබා දීම පිණිස ප්‍රවේශකයා යවන්නට ඇත. ඉවාන්ට ඉතා භයානක ලෙස මොළයේ උණ වැලඳී ඇති බවත්, වහා ම ඔහු මෙ තැනින් ඉවත් කළ යුතු බවත්, වෛද්‍යවරයා විනිශ්චයකාරතුමාට දැනුම් දුන්නේ ය. රෝගියා දෙ දිනකට පෙර සිය කැමැත්තෙන් ම තමා හමුවීමට පැමිණි බවත්, තමා ඔහු පිරික්සා බලා, කොයි මොහොතේ හෝ ඔහුට මොළයේ උණ වැළඳිය හැකි බව කී බවත්, වහා වෙදකම් ගතයුතු බව ද කී බවත්, එහෙත් ඔහු වෙදකම් ගැනීමට අකැමැති වූ බවත්, වෛද්‍යවරයා, පැමිණිල්ලේ හා විත්තියේ නීතිඥයන් විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කීවේ ය. "සාක්ෂිකාරයා හොඳ සිහියෙන් නොසිටිය බව මට ස්ථිර ව කියන්න පුළුවනි. අවදියෙන් සිටින විට නොයෙක් දේවල් පෙනෙන බවත්, බොහෝ කාලයකට පෙර මිය ගිය අය මඟ දී හමුවන බවත්, හැම දා ම සවස සාතන් ඔහු හමු වීමට පැමිණෙන බවත්, සාක්ෂිකාරයා මට කිව්වා"යි වෛද්‍යවරයා සාක්ෂි අවසන් කරමින් කී ය. අනතුරු ව හෙතෙම අධිකරණ ශාලාවෙන් නික්ම ගියේ ය. කැතිරිනා ඉදිරිපත් කළ ලියුම නඩුවට සම්බන්ධ වූ අනෙක් ලියවිලි හා උපකරණ-වලට එකතු කරන ලදි. රජතුන්කට්ටුව හා නීතිඥයෝ එකිනෙකා සමඟ සාකච්ඡා කිරීමෙන් ඉක්බිති ව නඩු විභාගය පවත්වා ගෙන යාමටත්, කිසි ම බලාපොරොත්තුවක් නැති ව ඉවාන් හා කැතිරිනා දුන් සාක්ෂි නඩු වාර්තාවට ඇතුළත් කිරීමටත් තීරණය කළහ.

ඉක්බිති ව ඉදිරිපත් කරන ලද සාක්ෂි ගැන මම මෙහිලා විස්තර නො කරමි. අනෙක් සාක්ෂිකරුවන් කළේ ඔවුන්ට විශේෂ වූ ගති ලක්ෂණ අනුව, මීට පෙර ඉදිරිපත් කරන ලද කරුණු යළි ඉදිරිපත් කිරීමත්, ඒවා සනාථ කිරීමත් පමණි. මා මඳ වේලාවකින් ඉදිරිපත් කිරීමට අදහස් කරන දණ්ඩ-නායකයා ගේ දේශනයට ඒ සියල්ලක් ම ඇතුළත් කොට ඇතැයි මම ආයේත් කියමි. එහි රැස් ව සිටි මහජනයා මහත් නොසන්සුන් කමකින් පසුවූ හ. අන්තිමේ දී ඇති වූ කලබලයෙන් තෘප්තියට පත් ඔවුහු පැමිණිල්ලේ හා විත්තියේ ද නීතිඥයන් ගේ දේශනා හා අවසාන තීන්දුව ලැබෙන තෙක් නොඉවසිල්ලෙන් බලා හුන්හ. විත්තියේ නීතිඥයා කැතිරිනා ගේ සාක්ෂියෙන් නොසන්සුන් වූ බව දකින්නට ලැබිණි. අනෙක්

අතින් රාජ නීතිඥයා ජයග්‍රහණයෙන් උදම් විය. සාක්ෂි ඇසීම අවසන් වීමෙන් ඉක්බිති ව උසාවිය පැයකට පමණ කල් දමනු ලැබී ය. අත්තිමේ දී ප්‍රධාන විනිශ්චයකාරතුමා පැමිණිල්ලේ හා විත්තියේ ද නීතිඥයන් අමතා සිය දේශනයන් කරන ලෙස ඉල්ලා සිටියේ ය. මට මතක තිබෙන හැටියට දණ්ඩ-නායකයා සිය දෙසුම පටන් ගත්තා විට වේලාව අටට පමණ ඇත.

හය වන පරිච්ඡේදය

දණ්ඩනායකයා ගේ දේශනය හා චරිත නිරූපණය

ඩයාදු කමින් සර්වාංගය ම වෙවුලද්දී දණ්ඩනායකයා සිය දේශනය ආරම්භ කෙළේ ය. ඔහු ගේ නළල ඩහදියෙන් තෙත් විය. වරක් තමා ගේ සර්වාංගය ම සීතල වන අතරේ අනෙක් මොහොතේ ගිනියම් වූ බව ඔහු පසු ව කීවේ ය. එම දේශනය ගැන සඳහන් කල හෙතෙම එය තමා විසින් මෙතෙක් කර ඇති හොඳ ම දේශනය බවත්, එසේ ම තමා ගේ අවසාන දේශනය බවත් කී ය. නව මසකට පසු හෙතෙම ක්ෂය රෝගයෙන් මිය ගියේ ය. තමා ටික කලකින් ම මිය යන බව දැන සිටියේ නම් මෙය තමා ගේ අවසාන දේශනය ලෙස සැලකීමට ඔහුට අයිතියක් තිබිණි. හෙතෙම සිතත්, කයත්, මොලයත්, වෙහෙසවා එම දේශනය පිළියෙල කෙළේ ය. මහජන ශුභසිද්ධිය හා රාජකාරිය ගැන ඔහු තුල කිසියම් හැඟීමක් සැඟවී තිබෙන බව කිසි ම බලාපොරොත්තුවක් නැති ව හෙළි විය. ඔහු ගේ දේශනය ඉතා උසස් කොට සලකනු ලැබීමට ප්‍රධාන ලක්ෂණය එහි පැවැති අවංක භාවයයි. සිරකරුවා සැබැවින් ම වරද කල බව ඔහු අවංක ව පිළිගත්තේ ය. සිරකරුවා පියා මැරූ බව කියා ඔහු චෝදනා කළේ තමාට පැවැරී ඇති රාජකාරිය ඉටුකිරීමේ අදහසින් ද නො ව, පළිගැනීමේ චේතනාවෙන් ද නො ව, සමාජය ආරක්ෂා කිරීමට ඔහු තුල පැවැති දැඩි ආශාව නිසා ය. දණ්ඩනායකයාට විරුද්ධ වූ අපේ කාන්තා පක්ෂයට පවා තමන් තුල දණ්ඩනායකයා කෙරෙහි ගෞරවයක් ඇති බව නො පිළිගෙන සිටිය නොහැකි විය.

දණ්ඩනායකයා වෙවුලන දුබල කට හඬින් දේශනය ආරම්භ කෙළේ ය. එහෙත් වැඩි වේලා යන්නට පෙර ප්‍රාණවත් වූ එම කට හඬ අධිකරණ ශාලාව පුරා රැව් දුන්නේ ය. අවසානය දක්වා වේගයෙන් කතා කල හෙතෙම, දේශනය අවසානයේ දී ක්ලාන්ත වන්නට ගියේ ය.

"ජූරි සභාවේ මහත්වරුනි, මේ නඩුව නිසා රුසියාව පුරා ආංදෝලනයක් ඇති වී තියෙනවා"යි කියමින් දණ්ඩ-නායකයා දේශනය ආරම්භ කෙළේ ය. "නමුත් මේ නඩුව ගැන මෙ තරම් පුදුම වීමට ඇති හේතුව කුමක් ද? විශේෂයෙන් ම අප තුළ භීතිය ඇති කිරීමට සමත් මේ නඩුවේ ඇති විශේෂ ලක්ෂණය කුමක් ද? මෙ වැනි භයානක අපරාධ අප අසා දැක පුරුදු නැති අමුතු දේවල් නො වෙයි. මේ නඩුවේ ඇති භයානක කම රැඳී ඇත්තේ අන්න එ තැනයි. මේ අපරාධ අප තුළ භීතිය ඇති කිරීමට සමත් නොවීම තමා මෙහි ඇති භයානක කම. අප බිය විය යුත්තේ වෙන් වෙන් ව සිදුවන මේ භයානක අපරාධ ගැන නො වෙයි, අප මේ අපරාධවලට දක්වන නොසැලැකිල්ල ගැනයි මෙ වැනි භයානක අපරාධ, අපට නො වැලැක්විය හැකි, වෙනස් කළ නොහැකි අනාගතයක පෙර නිමිති බව අප විසින් පිළිගත යුතුයි. එහෙත් අප ඒ ගැන උදාසීන වන්නේ මන්ද? නොසැලැකිලිමත් වන්නේ මන්ද? කුමන හේතුවක් නිසා ද? අප තුළ ඇත්තා වූ තුරුස්නාකම නිසා ද? කො තරම් තරුණ වුවත්, විනාශයට හා පරිහානියට ගොදුරු වූ සමාජයක බුද්ධිය හා සිතිවිලි අකාලයේ අවසන් වීම නිසා ද? සදාචාරය පිළිබඳ අපේ ප්‍රතිපත්ති විනාශ වී යාම නිසා ද? නැති නම් එ වැනි ප්‍රතිපත්ති අප තුළ දුර්ලබ නිසා ද? මේ ප්‍රශ්න මගේ සිත කම්පා කරයි. එහෙත් මට ඒවාට පිළිතුරු දිය නොහැකි ය. හැම පුරවැසියකු විසින් ම මේ ගැන සැලැකිලිමත් විය යුතුයි. එසේ සැලැකිලිමත් වීම තමා විසින් ඉටුකළ යුතු යුතුකමක් ලෙස සැලැකිය යුතුයි. තවමත් බයාදු කමින් යුත් අපේ කුලුදුල් පුවත් පත් මේ අතින් දැනට ම යහපත් සේවයක් කර තිබෙනවා. නො මැඩපවත්වන ලද සාහසික කම් හා ගුණ දහම්වල පිරිහීම නිසා ඇතිවන භයංකරත්වය, පුවත් පත් නැති නම් අපට කවදාවත් දැනගන්න ලැබෙන්නේ නැහැ. වර්තමාන රජය විසින් ආරම්භ කරන ලද ජූරි සභා සහිත අධිකරණවලට සම්බන්ධ ව කටයුතු කරන අයට පමණක් නො ව, රට පුරා සිටින හැම දෙනාට ම වාගේ දූත් රටේ සිදුවන අපරාධ දැනගත හැකියි. අපට දිනපතා ම පුවත් පත් මගින් කියවන්න ලැබෙන්නේ කෙබඳු දේවල් ද?

අපට කියවන්නට ලැබෙන අපරාධ, දූත් අපි විභාග කරන මේ මිනීමැරුම පවා කණ්ඩෙකිම්යකු බවට පත්කරන භයානක අපරාධ යි. මෙහි ඇති වැදගත් කම අපේ රටේ සිදුවන අපරාධවලින් වැඩි කොටසක් ම අප අතරේ මුල් බැසගෙන ඇති ජාතික උවදුරු වීමයි. අපට මේ උවදුරුවලට විරුද්ධ ව කෙසේවත් සටන් කල නොහැකියි. එක් තැනක උසස්, කුලවත්, සමත්, යුද හමුදාවේ තරුණ නිලධරයෙක්, වරක් තමා ගේ ආරක්ෂකයා ව සිටි නිලධරයා හා ඔහු ගේ සේවිකාව කිසි ම හිතක් පපුවක් නැති ව මරා, තමා ඔහුගෙන් මුදල් ණයට ගෙන දූත් පොරොන්දු නෝට්ටු සමග තවත් මුදල් සොරාගෙන 'මගේ අනාගත දියුණුවට හා උසස් සමාජයේ ජීවත් වීමට මට මේ මුදල් අවශ්‍ය ය'යි කියයි. අනතුරු ව හෙතෙම තමාගෙන් මැරුම් කෑ නිලධරයාගේත්, සේවිකාවගේත් හිස් යටින් කොට්ට තබා නික්ම යයි. ඊ ළගට නිර්භීත ක්‍රියා කොට සම්මාන ලැබූ තරුණ වීරයෙක්, මං පහරන සොරකු සේ තම ස්වාමියා ගේ මව, මහ මග දී මරා, මිතුරන් කැඳවා, පුතකුට ආදරය කරන්නාක් මෙන් මේ ඉතිරිය තමාට ආදරය කල බව සහතික කොට, තමා ගේ අවවාදය පිළිගෙන පරිස්සම් වීමට වෙහෙස නොවන ලෙස දන්වයි. ඔහු ඉතා භයානක සතකුට සමාන බව මම පිළිගන්නවා. එහෙත් මේ කාලේ රුසියාවේ සිටින එක ම භයානක සතා ඔහු පමණක් යයි මම කියන්නේ නැහැ. කෙනෙක් තවෙකකු මරන්න නුපුළුවනි. නමුත් ඔහු ද අර භයානක සතා ලෙස කල්පනා කරයි. ඔහු තුල ද එ වැනි හැඟීම් ඇති වෙයි. සිතින් නින්දිත වෙයි. රැ ජාමේ ඔහු තනියෙන් සිටින විට මෙසේ තමාගෙන් ම විමසන්න පුළුවනි. 'ධර්මිෂ්ඨකම කියන්නේ කුමක් ද? ලේ සෙලවීමට විරුද්ධ වීම අවිචාර හැඟීමක් නො වේ ද? සමහර විට මහජනයා මට විරුද්ධ වී, මගේ සිතිවිලි ඉතා අශෝභන ය. මා උමතුවෙන් දොඩන්නේ ය, මා කරන්නේ බලවත් නින්දාවකි, වල්පල් දෙඩීමකි. අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමකි' කියන්න පුළුවනි. ඔවුන් එසේ කීවාට වරදක් නැහැ. එසේ කියන්නේ නම් පළමු ව ප්‍රතිවන තැනැත්තා මමයි. මා කියන දෙය විශ්වාස කරන්න එපා. මා රෝගියකු ලෙස පිළිගන්න. කෙසේ වෙතත් මා කියන දෙය සිහි තබා ගන්න. මා කියන දෙයින් දහයෙන් හෝ විස්සෙන් හෝ පංගුවක් ඇත්ත නම් එය ඉතා භයානක දෙයක්. ජූරි සභාවේ මහත්වරුනි, අපේ රටේ තරුණයන් වෙඩි තබාගෙන පණ නහ ගන්නා හැටි බලන්න. ඔවුන් එසේ කරන්නේ හැම්ලට් තමාගෙන් ඇසූ 'මරණයෙන් පසු කිසියම්

දෙයක් ගැන ඇතිවන භීතිය හා පරලොව ගිය මගියකු ආපසු නොපැමිණි ගමන හා කිසිවකු සොයාගෙන ආපසු නොපැමිණි රට' ගැන ප්‍රශ්න මේ තරුණයන් තම තමාගෙන් නො අසන නිසයි. 'මරණයෙන් පසු ව අපේ ආත්මයට මොකද වෙන්නේ? මරණයෙන් පසුව අප කොතැන ද යන්නේ?, යන ප්‍රශ්න නොඅසන නිසයි. බොහෝ කාලයකට පෙර සිතින් මකා දැමූ දෙයක් මෙන්, වලලා දැමූ දෙයක් මෙන්, ඔවුහු මරණය ගැන කිසිවක් නො විමසති. අවසාන වශයෙන් අප අතරේ පවතින දුසිරිත් හා අප කරන දුරාචාරකම් ගැන කල්පනා කරල බලන්න. අප කරන දුරාචාරකම් ගැන කල්පනා කරන විට මෙම නඩුවට සම්බන්ධ වූ, මැරුම් කෑ අවාසනාවන්ත මහලු කරමසෝෆ් බහ නො දන්නා දරුවකුට සමානයි. එහෙත් අපි හැම දෙනා ම මහලු කරමසෝෆ් හැදිනගෙන සිටියා. ඔහු අප අතරේ ජීවත් වුණා!

"කවදා හරි රුසියාවේ හා යුරෝපයේ සිටින ප්‍රධාන පෙළේ පඬිවරු, රුසියාවේ සිදුවන අපරාධවලට හේතු වූ මානසික තත්ත්වය ගැන පරීක්ෂණයක් පවත්වන්න පුළුවනි. එවැනි පරීක්ෂණයක් පැවැත්වීමට තරම් එය වැදගත් දෙයක්. අප ගතකරන මේ ශෝක ජනක අවුල් ජීවිතය ගෙවී ගිය පසු ඒ ගැන පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. මේ ප්‍රශ්නය තිව්-හැන්නේ ඥානවන්ත ලෙස හා අපක්ෂපාත ව පරීක්ෂා කල හැක්කේ එවිටයි. දැන් අපි මේ අපරාධය ගැන කම්පා වී සිටිනවා. නැතිනම් කම්පා වී සිටින බව බොරුවට පෙන්වනවා. අපි ඇත්ත වශයෙන් කරන්නේ අනෙකක්. අප තුල අශෝභන හැඟීම් අවුස්සන, අනවශ්‍ය ලෙස පිනවන ලද තිත්ත ශීලී වූ උදාසීන කම කිතිකවන මෙ වැනි අපරාධවලට අපි කැමතියි. නැති නම් අපි භයානක අවතාරයක් සිතින් ඉවත් කිරීම පිණිස කොට්ටයේ මුහුණ සඟවාගෙන සිට, ඒ අවතාරය බැහැර ගිය පසු, යළි සෙල්ලමට යාමට සැරසෙන කුඩා දරුවන්ට සමානයි. නමුත් කවදා හෝ අපි සත්සුන් සිතින් යුතු ව උත්සාහයෙන් ජීවත් විය යුතුයි. අපි සමාජය දෙස බලන ඇසින් ම අප දෙස ද බැලිය යුතුයි. සමාජ ජීවිතය ගැන අවබෝධයක් ලබා ගැනීමට වෑයම් කල යුතුයි. එවැනි අවබෝධයක් ලබා ගෙන නැතිනම් දැන්වත් එවැනි අවබෝධයක් ලබා ගැනීමට වෑයම් කල යුතුයි.

"පසුගිය යුගයට අයත් අපේ ශ්‍රේෂ්ඨ ලේඛකයෙක්, නොදන්නා ස්ථානයක් බලා වේගයෙන් යන අසුන් තිදෙනකු යොදනලද

අශ්ව කරත්තයකට රුසියාව සම කරමින් *'අහෝ ත්‍රොයිකාව, පක්ෂියකුට සමාන වූ ත්‍රොයිකාව, තොප තිපදවන්ට ඇත්තේ කවරෙක් ද?'සි අසා, මෙම ත්‍රොයිකාවට යාමට ඉඩ හැර මුළු ලෝකය ම මහත් ගෞරවයෙන් යුතු ව පසකට වී බලා සිටින බව උඩඟු කමින් හා ඔද වැඩුණු සිතින් කිව්වා. ජූරිසභාවේ මහත්වරුනි, එය එසේ විය හැකියි. ලෝකයා ගෞරවයෙන් යුතු ව පසකට වූවත් නො වූවත් කමක් නැහැ. මගේ දිළිඳු අදහසේ හැටියට, එම ශ්‍රේෂ්ඨ ලේඛකයා ඔහු ගේ නිර්මාණය මෙසේ අවසන් කළේ සියල්ල හොඳ ය යන ලාමක හා බොළඳ, අව්‍යාජ අදහසින් විය හැකියි. නැතිනම් එකල පැවති පොත් පත් පාලනයට බියෙන් විය යුතුයි. නමුත් ඔහු ගේ වීරයන් වන සභාකෝවිච්, නෂ්ඩ්‍රෙව් හා චිචිකෝප් මෙම රථයට බඳින ලද අසුන් නම් රථයට කිසි ම තැනකට යා නොහැකි යි. රිය පදවන රියැදුරා කවුරු වුවත්, රිය අදින එම අසුන් අයත් වන්නේ පසු වී ගිය පරපුරකටයි. නමුත් දැන් සිටින අය ඊට වඩා අන්තයි................"

මේ අවස්ථාවේ දී නැගුණ ප්‍රීති ඝෝෂා නිසා දණ්ඩනායකයා ගේ කතාවට බාධා පැමිණිණ. ඔහු රුසියානු ත්‍රොයිකාව විස්තර කරද්දී දක්වූ උදාර ගතිය මහජනයා ගේ සිත් තදින් ඇද-ගත්තේ ය. එම ප්‍රීතිඝෝෂාව පැවතුණේ සවල්ප වේලාවක් පමණි. එ හෙයින්, නිශ්ශබ්ද නො වුව හොත් අධිකරණ ශාලාවෙන් ඉවත් කරන බව දන්වා මහජනයාට තරවටු කිරීම නුවුවමනා යයි ප්‍රධාන විනිශ්චයකාරතුමා කල්පනා කෙළේ ය. ඒ වෙනුවට හෙතෙම, අත්පුඩි තලා ප්‍රීති ඝෝෂා කළ මහජනයා දෙස තෑති ගත්වන බැල්මෙන් බැලුවේ ය. එහෙත් දණ්ඩනායකයා ප්‍රීති ඝෝෂාවෙන් ඔද වැඩිණි. මීට පෙර කවදාවත් ඔහුට මේ තරම් උසස් සැලැකිලි නො ලැබිණි. හවුරුදු ගණනාවක් මහජනයා විසින් නොසලකා හරින ලද මෙම නීතිඥයාට හදිසියෙන් ම රුසියාව පුරා ඇසෙන ලෙස සිය අදහස් පැවැසීමට අවස්ථාවක් ලැබිණි.

"තිවිහැටියේ ම රුසියාව පුරා අපකීර්තියට පත් වූ මේ කරමසෝ පවුල කුමක් ද?"යි ඔහු ආයේත් දෙසුම අරඹමින් ප්‍රශ්න කෙළේ ය. "සමහර විට මා අතිශයෝක්තියෙන් කතා කරනවා විය හැකියි. නමුත් මගේ කල්පනාවේ හැටියට අපේ වර්තමාන උගත් සමාජය පිළිබඳ සමහරක් මූලික ලක්ෂණ එක්තරා ප්‍රමාණයකට මේ කරමසෝ පවුලෙන් බලා ගත හැකියි. සම්පූර්ණ-යෙන් නො වෙයි, දිය බින්දුවක පිළිබිඹු වූ සූර්යයා මෙන් දැකගත හැක්කේ සවල්පයක් පමණයි. මෙ තරම් ඛේදජනක අවසානයකට

* නිකොලායි ගොගොල් ගේ 'මළ මිනිස්සු'

පත් වූ මේ පවුලේ ප්‍රධානයා වන අවාසනාවන්ත, කාමුක පාපිෂ්ඨයකු වූ මහලු කරමසෝ ගැන කල්පනා කරල බලන්න. උසස් ජන්මයක් ලැබූ මේ මනුෂ්‍යයා අනුන්ගෙන් කා බී ජීවත් වෙමින්, කිසි ම බලාපොරොත්තුවක් නැති ව කරගත්ත පෙලවාසි-යකින් සුළු ධනයක් ලබාගත්තා. මේ මිනිහා තක්කඩියෙක්, නිවටයෙක්, කතාවේ දක්ෂ කවටයෙක්. ඔහුට, වඩා දියුණු නොවූ, තරමක් හොඳ ඥානශක්තියක් තිබුණා. ඒ සේරට ම වඩා ඔහු මුදල් පොලී කරන්නෙක්. පොහොසත් වන්නට වන්නට ඔහු කිසි බයක් හැකක් නැති ව මුදල් පොලී කළා. ඔහු තුළ තිබුණු නීච කම් නැති වී ගොස්, දුෂ්ට කම් හා අනුන්ට තිගා කිරීමේ චේතනාව පමණක් ඉතිරි වුණා. ආගම අතින් ඔහු ගේ කිසි ම දියුණුවක් දකින්න තිබුණේ නැහැ. ඔහු ගේ ආශාව පුදුමා-කාරයි. කාමුක ආශාව මුදුන් පමුණුවා ගැනීම හැර ඔහුට ජීවිතයේ වෙන කිසි ම දෙයක් වැදගත් වුණේ නැහැ. ඔහු දරුවන්ටත් ඉගැන්නුවේ ඒ ටික මයි. පියකු වශයෙන් දරුවන්ට සලකන හැටි ඔහු දැන ගෙන හිටියේ නැහැ. ඔහු දරුවන්ට ආගම ධර්මය පුරුදු කළේ නැහැ. හොඳ නරක කියා දුන්නේ නැහැ. ඔහු එ වැනි දේවල් ගැන සිනා වුණා. ඔහු දරුවන්, වැඩකාරයන්ට භාර දී සම්පූර්ණයෙන් ම අමතක කර දැම්මා. දරුවන් ගෙන් නිදහස් වීමට ඔහු බොහො ම කැමැති වුණා. කොටින් කියනවා නම් දරුවන් සිටින බව පවා ඔහුට සම්පූර්ණයෙන් ම අමතක වුණා. ගුණ දහම් ගරුකරන, යුතුකම් ඉටුකරන, පුරවැසියකුට අයත් ලක්ෂණවලට ප්‍රතිවිරුද්ධ ලක්ෂණ තමා ඔහුට තිබුණේ. ඔහු සමාජයටත්, එහි පැවැත්මටත් සම්පූර්ණයෙන් ම විරුද්ධ වුණා. මට පාඩුවක් වෙන්නේ නැති නම්, මේ ලෝකය ගිනි ගෙන විනාශ වුණත් මට කමක් නැහැ යි කියන වගීයේ මිනිහෙක්. ඔහුට කිසි ම අග තිග කමක් තිබුණේ නැහැ. ඔහු හැම දෙයකින් ම සම්පූර්ණ වෙච්ච පුද්ගලයෙක්. තව අවුරුදු විස්සක් හෝ තිහක් හෝ ඔහු මේ විදියට ජීවත් වීමට බලාපොරොත්තු වුණා. ඔහු පුතාගෙන් වංචාකොට ලබාගත්ත මුදල් වියදම් කළා. ඒ මුදල් ඔහු ගේ පුතාට අම්මාගෙන් උරුම වූ ධනයයි. ඔහු පුතාගෙන් සොරාගත් ධනය, පුතා ආලය කළ තරුණිය වසඟ කර ගැනීමට වියදම් කළා. මේ සිරකරුවා වරදින් ආරක්ෂා කර ගැනීමේ කටයුත්ත මම පීටර්ස්-බර්ග් පුරයේ සිට පැමිණි මගේ උගත් මිත්‍රයාට පවරන්නේ නැහැ. ඇත්ත කිය යුතුයි. මහලු කරමසෝ තමාට විරුද්ධ ව පුතා ගේ හදවතේ කො තරම් ලොකු වෛරයක් ඇති කළා ද කියා මට තේරුම් ගන්න පුළුවනි.

"අපි ඒ අවාසනාවන්ත මහලු මනුෂ්‍යයා ගැන කතා කළා ඇති. ඔහු පාපයට වන්දි ගෙව්වා. කෙසේ වෙතත් ඔහු පියකු බව, අද ජීවත්වන වගීයේ පියකු බව අපි මතක තබා ගනිමු. අද ජීවත්වන බොහෝ පියවරුත් ඔහුට සමාන යයි කීවොත් මා කියන්නේ අයුතු කතාවක් නො වෙයි. ඔවුන් ගේ ඇති වෙනස කරමසෝ වාගේ කරන දෙය එළිපිට නො කිරීමයි. ඔවුන් කරමසෝට වඩා උගත් වෙන්න පුළුවනි, ශිෂ්ට වෙන්න පුළුවනි. නමුත් ඔවුන් ගේ ජීවිතය පිළිබඳ දශීනය හා කරමසෝ ගේ ජීවිතය පිළිබඳ දශීනය එක සමානයි. සමහර විට මා හැම දෙයක ම අශුභ පක්ෂය පමණක් දකින කෙනෙක් ය කියා ඔබ සිතන්න පුළුවනි. එහෙත් මම අතින් වරදක් වුවොත් මට සමාව දීමට ඔබ එකඟ වන බව මම දන්නවා. එහෙත් අපි කල් තියා එකඟත්වයට පැමිණෙමු. ඔබ මා කියන දෙය විශ්වාස නො කළාට කමක් නැහැ. මට කතා කිරීමට ඉඩ දෙන්න. කියන්න උවමනා දෙය මට කියන්නට ඉඩ දී ඉන් සවල්පයක් මතක තබා ගන්න.

"දැන් අපි මේ පියා ගේ දරුවන් ගැන මඳක් කල්පනා කොට බලමු. අප ඉදිරිපිට සිටින සිරකරුවා ඔහු ගේ වැඩි මහලු පුතා ය. මගේ කතාවේ ඉතිරි කොටස කැප කරන්නේ ඔහු වෙනුවෙන්. ඒ අතරේ අනෙක් පුතුන් දෙදෙනා ගැන කෙටියෙන් යමක් කීමට මම අදහස් කරනවා.

"මහලු කරමසෝ ගේ දෙවන පුතා උසස් අධ්‍යාපනයක් ලබා තියුණු ඥාන ශක්තියක් ඇති, එහෙත් කිසිවක් විශ්වාස නො කරන, වර්තමාන පරපුරට අයත් තරුණයෙක්. ඔහු ගේ පියා මෙන් ඔහු ද දැනට ම බොහො ම දේවල් ප්‍රතික්ෂෙප කරපු කෙනෙක්. අපි දැන් ඔහු ගේ සාක්ෂිය අසා සිටියා. අපේ නගරයේ කවුරුත් ඔහු බොහො ම ආදරයෙන් පිළිගත්තා. ඔහු කවදාවත් සිය අදහස් සඟවා ගෙන සිටින වර්ගයේ කෙනෙක් නො වෙයි. ඔහු ඒවා එළිපිට ම පවසනවා. ඒ නිසා මට ඔහු ගැන එළිපිට ම යමක් කීමට අවසර තියෙනවා. නමුත් මම ඔහු ගැන කතා කරන්නේ ඔහු පුද්ගලයකු හැටියට වෙන් කොට නො ව, කරමසෝ පවුලේ කෙනකු හැටියට පිළිගෙනයි. මේ නඩුවට සම්බන්ධ වූ තවත් අයෙක් ඊයේ රෑ පණ නහ ගත්තා. කරමසෝ ගේ සේවකයකු වන ඒ තැනැත්තා රෝගයෙන් පෙළෙන මත්දබුද්ධිකයෙක්. සමහර විට මේ පුද්ගලයා මහලු කරමසෝ ගේ අවජාත පුතකු වෙන්න පුළුවනි. ඔහු ගේ නම පැවල් සමාඩියාකෝෆ්. මූලික පරීක්ෂණයේ දී මේ තැනැත්තා

උමතු වූවකු වගේ අඩමින් කිව්වා, ඉවාන් කරමසෝ' ආගමට දක්වූ නොසැලැකිල්ල නිසා ඔහු සම්පූර්ණයෙන් ම තැති ගත් බව. 'මේ ලෝකේ තියෙන හැම දෙයක් ම නීතියට එකඟවයි පවතින්නේ. මිනිසාට ඕනෑ ම දෙයක් කළ හැකියි. අනාගතයේ දී කිසි ම දෙයක් තහනම් නොකල යුතුයි' කිව්වා. ඔහුට මේ බණ උගන්වා තියෙන්නේ ඉවාන් කරමසෝ'. මගේ කල්පනාවේ හැටියට මේ අදහස්වලින් ඒ මෝඩයා ගේ මොළය සම්පූර්ණයෙන් ම අවුල් වෙන්න ඇති. මේ සේවකයාට වරින්වර හැදෙන මීමැස්මොරයත් මේ අදහසුත් නිසා මිනිහ ගේ සිහිය නරක් වුණා. නමුත් මේ මෝඩයා බොහො ම හොඳ කතාවක් කිව්වා. එ වැනි කතාවක් කියන්න පුළුවන් හොඳ ඥානශක්තියක් තියෙන අයකුට පමණයි. ඒ නිසා තමා මා ඔහු ගැන මතක් කළේ. 'මහලු කරමසෝ'ට සමාන පුතකු හිටියා නම් ඒ පුත්‍රයා ඉවාන් කරමසෝ'යි කියා මේ තරුණයා කිව්වා. මම මේ කාරණාව මතක් කරලා මේ තරුණයා ගැන විස්තරය මෙ තැනින් නතර කරන්නේ ඔහු ගැන තව දුරටත් විස්තර කිරීම අසභ්‍ය කතාවක් වන නිසයි. කපුටකු වගේ කෑගාමින් ඉවාන් කරමසෝ ගැන තවත් විස්තර කරලා ඔහු ගේ අනාගතය විනාශ කිරීමට මම කැමැති නැහැ. මේ තරුණයා තුළ තවමත් සත්‍යයට සහජ ආශාවක් තියෙන බව අද අපි මේ අධිකරණ ශාලාවේ දී දුටුවා. සිතේ හටගත් අවිශ්වාසයත්, ද්වේෂයත් නිසා සිය පවුලට තිබෙන ආදරය විනාශ නො වී පවතින බව අපි දුටුවා. ඔහු තුළ මෙ වැනි නරක අදහස් උපන්නේ වේදනා ඇති කරවන නිදහස් කල්පනා ශක්තිය නිසා නො ව, ජන්මයෙන් ලැබූ දායාදයක් හැටියටයි.

"දැන් අපි තුන් වන පුතා ගැන කල්පනා කර බලමු. ඔහු බොහො ම ආගම ධර්මයට ලැදි, නිහතමානී ගතිගුණවලින් යුත් ළාබාල තැනැත්තෙක්. ඔහු, තම සොහොයුරා ජීවිතය ගැන දරන දූෂණය වූ විනාශකාරී අදහස් පිළිගත්තේ නැහැ. අපේ උගත් තැණවත් අය අතරේ භාවිතා වන 'මහජනයා ගේ මූලික විශ්වාස' යන පුදුම වචනයෙන් හැඳින්වෙන දෙය දැඩි ව පිළිගත්තා කෙනෙක්. තාපසාරාමයට බැඳුණු ඔහු තව ටිකෙන් පූජකයෙක් වෙනවා. ජීවිතයේ අප්‍රසන්නතාවට හා ඉන් ඇතිවන දූෂණයට බිය වූ අපේ අවාසනාවන්ත සමාජයේ සිටින බොහෝ දෙනෙක් තුළ ඇතිවන, බියසුලු බලාපොරොත්තු කඩ වීමෙන් අපේ තරුණයා තරුණ කාලයේදී ම නොකල්පනාවෙන් ම වාගේ තැති ගෙන තිබෙන බව මට පෙනෙනවා. අපේ රටේ

ඇත්තා වූ හැම ද්‍රෝහයකට ම මුල් හේතුව යුරෝපීය ශිෂ්ටාචාරය යයි පවසන මේ පිරිස, අවතාරවලට නැති ගෙන තමන් ගේ දුබල මව් වරුන් ගේ තුරුල්ලට වී හැම දෑ ම තිඳු ගැනීමට කැමැති ළමයින් වාගේ තමන් ගේ මව් රටට අයත් හැම දෙයක් ම බදා ගන්නවා. මම ඒ දක්ෂ යහපත් තරුණයාට සිය ජීවිතය සාර්ථක වේ වා කියා ප්‍රාර්ථනා කරනවා. ඔහු ගේ උසස්, එහෙත් මට පෙනෙන හැටියට අලංකාරයෙන් පිරි තුරුණු විඥාන වාදය හා පොදු ජනයා ගේ විශ්වාසයත් උසස් කොට සැලකීම, කිසිකලක නො පිරිහේ වා කියා මම ප්‍රාර්ථනා කරනවා. එනෙත් එ වැනි හැඟීම් නිතර හොඳ නරක අතින්, අඳුරු ගුඪවාදයට පෙරලෙනවා. දේශපාලනය අතින්, දේශානුරාගයෙන් අන්ධ වූ විශ්වාසයක් බවට පිරිහෙනවා. එසේ නො වේ වා කියා මම ප්‍රාර්ථනා කරනවා. යුරෝපීය ශිෂ්ටාචාරය වරදවා තේරුම් ගැනීමෙන් හා නිකරුණේ අනුගමනය කිරීමෙන් ද ඇතිවන අකාලයේ පිරිහීමට වඩා ඉහත සඳහන් කළ කරුණු දෙක භයානකයි. ඔහු ගේ සොහොයුරාට සිදු වී ඇත්තේ යුරෝපීය ශිෂ්ටාචාරය වැරැදි ලෙස පිළිගෙන අනුගමනය කිරීමෙන් ඇති වූ පිරිහීමයි.''

උමතු ජාතිවාදය හා ගුඪවාදය හෙළා දකිමින් දණ්ඩනායකයා කළ කතාව අනුමත කරමින් මහාජනයා ගෙන් දෙතුන් දෙනෙක් අත් පොළසන් දුන්හ. දණ්ඩනායකයා සිය කපිකත්වයෙන් උද්දාම විය. ඔහු ගේ කතාව හා නඩුව අතරේ වැඩි සබඳකමක් නො තිබිණි. ඒ කතාව එ තරම් පැහැදිලි ද නො වී ය. ක්ෂය රෝගයෙන් පෙළෙන මේ මිනිහා එක් වරකට හෝ සිය අදහස් පැවැසීමට ඇති ආසාවෙන් මඩනා ලද්දේ විය. ඔහු ඉවාන් කරමසෝ ගැන නො තිසි විවේචනයක් කළේ පෞද්ගලික හේතුවක් නිසා ය, යන කතාව පසු ව අපේ ගමේ පැතිර ගියේ ය. ප්‍රසිද්ධ ස්ථානයක දී ඉවාන් විසින් වරක් හෝ දෙවරක් හෝ දණ්ඩනායකයා තර්කයෙන් දුර්මුඛ කරන ලදි. එම නින්දාව සිහි තබාගෙන සිටි නීතිඥයා ඉවාන් ගෙන් පළි ගැනීමට මෙය අවස්ථාවක් කරගත්තේ ය. මෙ වැනි නිගමනයකට බැසීම හරි දැයි මම නො දනිමි. මෙතෙක් ඔහු කළේ දේශනයේ හැඳින්වීම පමණි. අනතුරු ව ඔහු ගේ දේශනය නඩුව කෙරෙහි යොමු විය.

''ජූරි සභාවේ මහත්වරුනි,

''දැන් අපි මහලු කරමසෝ ගේ වැඩිමහල් පුතා ගැන කරුණු විමසා බලමු. දැන් අප ඉදිරිපිට සිටින සිරකරුවා

ඔහු ය. අපි ඔහු ගේ ගති ගුණ හා කල්ක්‍රියාව දැන සිටිමු. මේ තීරණාත්මක දවසේ දී ඔහු පිළිබඳ හැම දෙයක් ම හෙළිදරව් වී තිබේ. ඔහු ගේ සහෝදරයන් දෙදෙනා ගෙන් එකෙක් යුරෝපා ශිෂ්ටාචාරය ද, අනෙකා 'මහජන ප්‍රතිපත්තිය' ද අනුගමනය කරන අතර, මොහු අද පවතින රුසියාව පිළිබිඹු කරයි. නමුත් මුළු රුසියාව නො වෙයි. එහෙනම් අප කවුරුත් දෙවියන් වහන්සේ විසින් ආරක්ෂා කරගත යුතුයි. එහෙත් අපේ ප්‍රියාදර රුසියන් මාතාව මෙ තැන සිටිනවා. අපට ඇගේ නියම සුගන්ධය දැනෙනවා. ඇගේ මිහිරි හඬ ඇසෙනවා. අපි එ තරම් දියුණු වූ අය නො වෙමු. අපි හොඳ නරක දෙකින් ම සැදුණු කදිම මිනිස්සු වෙමු. අපි සාහිත්‍ය, කලාශිල්ප ප්‍රිය කරන්නෝ වෙමු. එහෙත් අපි තැබෑරුම්වලට වැදී සුරා බී කෝලාහල කරන්නෙමු. දුප්පත් මිනිසුන් ගේ රැවුලෙන් ඇද හිරිහැර කරන්නෙමු. බේබද්දෝ අපේ කල්‍යාණ මිත්‍රයෝ වෙති. අප යහපත් ශිෂ්ට මනුෂ්‍යයන් වෙන්නේ හැම දෙයක් ම අපේ වාසියට තිබුණොත් පමණයි. අනෙක් අතින් අප ශිෂ්ට අදහස්-වලින් පෙලඹෙන්නට ද පුළුවනි. එහෙම වෙන්නේ ඒ අදහස් අහසින් වැටුණොත් පමණයි. නැති නම් අතින් සතයක්වත් වියදම් නො කොට නිකම් ලැබුණොත් පමණයි. අපේ මුදල් වියදම් වෙනවාට අපි කැමැති නැහැ. කොයි දෙයත් නිකම් ලබා ගැනීමට නම් අපි බොහො ම කැමැතියි. හැම දෙයක් ම එහෙම තමයි. අපට ජීවිතයේ ඇත්තා වූ හැම හොඳ දෙයක් ම දෙන්න. දෙන්න පුළුවන් හැම දෙයක් ම දෙන්න. අප කැප්තියට පැමිණෙන්නේ හැම දෙයක් ම ලැබුණොත් පමණයි. අනෙක් අතින් අපට බාධා කරන්න එපා. හිරිහැර කරන්න එපා. එතකොට අපටත් පුළුවනි අපත් හොඳ මිනිස්සු බව පෙන්නන්න. අපි ධනයට ඇති ආශාවෙන් පෙලෙන්නෝ නො වෙමු. එහෙත් අප ළඟ මුදල් තිබිය යුතුයි. ටිකක් නො වෙයි, හුඟක් තිබිය යුතුයි. එතකොට අපත් කො තරම් ත්‍යාගවන්තයෝ ද කියා බලන්න පුළුවනි. කිසි ම ගරු සරුවක් නැති ව අයුතු ලෙස හම්බ කරන ලද ධනයට අප තුළ ඇත්තා වූ පිළිකුල දක්වන්නට ඒ ධනය එක රැයකින් විනාශ කරන සැටි දැනගත යුතුයි. අනෙක් අතින් අප ළඟ මුදල් නැති නම් මුදල් අවශ්‍ය වූ විට ඒ මුදල් ලබාගැනීම පිණිස අප බොහෝ දේවල් කිරීමට සූදානමින් සිටින බව ඔබ දැනගත යුතුයි. අපි මේ හැම දෙයක් ම පසුවට තබා මේ මිනීමැරුමට සම්බන්ධ වූ දේවල් පිළිවෙළින් ගෙන බලමු.

"අපට පලමු ව දකින්න ලැබෙන්නේ, විදේශික ආරම්භයක් ඇති, අපේ සම්භාවනීය පුරවැසියකු විසින් පවසන ලද වචන-

යෙත් ම කියතොත් 'මාපියන් විසින් අත්හැර දමන ලද, හිස් පයින් ගෙයි කුස්සිය පැත්තේ දුව පැන ඇවිදින දරුවෙකි.' මේ සිරකරුවා ආරක්ෂා කිරීම සඳහා වෙන කෙනකුට භාර නොදෙන බව තව වතාවක් කියන්නට කැමැතියි. ඔහුට විරුද්ධ ව චෝදනා කරන්නේ මමයි. ඒ අතර මම ඔහු ආරක්ෂා ද කරමි. ජූරිසභාවේ මහත්වරුනි, මා තුළ ද මනුෂ්‍ය ගති තියෙනවා. මිනිසකු ගේ චරිතය හැඩගැස්සීම කෙරෙහි ඔහු ගේ ළමා වියත් ගෘහ ජීවිතයත් බල පවත්වන සැටි මා දන්නවා. එහෙත් මේ දරුවා ඇති දූඩි වී පුද හමුදාවේ නිලධරයෙක් වුණා. එහි දී කළ කෝලාහලයක් නිසා රුසියාවේ ඈත පළාතකට මාරු කරනු ලැබුවා. එහි දී ඔහු නිලධරයකුට තුසුදුසු, නොහික්මුණු ජීවිතයක් ගත කළා. විශාල නැවකට ගැඹුරු දිය තිබිය යුතුයි. ඔහුට මුදල් අවශ්‍ය වුණා. හැම දෙයකට ම වඩා මුදල් අවශ්‍ය වුණා. අන්තිමේ දී බොහෝ කාලයක් පියා සමඟ කෝලාහල කර ගැනීමෙන් පසු ව, මව ගෙන් ලැබෙන්නට තිබුණු ධනයෙන් ඉතිරි ව තිබුණු රූබල් හය දහ ගැනීමට තීරණය කරගත්තා. පියා ඒ මුදල් ඔහුට යැව්වා. ජූරිසභාවේ මහත්වරුනි, කරුණා කර මේ වැදගත් ප්‍රශ්නය හොඳට සිහි තබා ගන්න. මේ තරුණයා ඉතිරි ඉඩකඩම්වලට තිබුණු අයිතිය අත් හැර දමා රූබල් හය දහක් ගෙන ලියවිල්ලකට අත්සන් කළා. ඒ ලියවිල්ල අප ළඟ තියෙනවා. යහපත් චරිතයක් හා උසස් උගැන්මක් ලැබූ තරුණිය ඔහුට හමු වුණේ මේ කාලයේ දී යි. නමුත්–නාත්සේලා ඒ ගැන සියලු තොරතුරු අසා ඇති නිසා ඒ ගැන විස්තර කිරීමට මම හිතන්නේවත් නැහැ. මෙහි ආත්ම ගරුත්වය, ආත්ම පරිත්‍යාගය, ආදී වචන පටලැවී තියෙන නිසා, මම නිශ්ශබ්ද වෙනවා. නියම ශ්‍රේෂ්ඨත්වයට හා උතුම් අදහසකට ආචාර කළ, අනාචාරයෙන් පිරි නිස්සාර ජීවිතයක් ගත කළ, තරුණ නිලධරයකු ගේ චරිතය ඉතා සුළු වේලාවකට අප ඉදිරිපිට සිතේ අනුකම්පාව ඇති වන ලෙස විස්තර කරනු ලැබුවා. එහෙත් ඒ සමඟ කිසි ම බලාපොරොත්තුවක් නැති ව මේ අධිකරණය ඉදිරිපිට දී අපට එම පදක්කමේ අනෙක් පැත්තත් දකින ගන්න ලැබුණා. මෙය සිදුවුණේ කෙසේ ද කියා විග්‍රහ කිරීමට මගේ කිසි ම බලාපොරොත්තුවක් නැහැ. නමුත් එ වැනි දෙයක් සිදුවීමට හේතුවක් ඇතැයි මම විශ්වාස කරනවා. උතුම් ත්‍යාගශීලි පරමාර්ථයන් ගෙන් හටගත්, එහෙත් අපරීක්ෂ්‍යකාරි වූ, සමහර විට නොසැලැකිලිමත් වූ ක්‍රියාවන්ට මේ තරුණ නිලධරයා නින්දා කළ බව, තරුණිය බොහෝ කාලයක සිට යටපත් කරන ලද කෝපයෙන් ගලාගෙන ආ

කඳුළින් යුතු ව අපට විස්තර කරල කිව්වා. මේ තරුණ නිලධරයා, එනම් ඇය සමඟ විවාහ ගිවිසගත් මිනියා කරමසෝව් ඇයට අපහාස කළා. වෙන කෙනකු කළ අපහාසයකට වඩා සිය පෙම්වතා කළ අපහාසය ඇයට ඉවසාගත නොහැකි වුණා. දැනට ම පෙම්වතා තමා මුලා කළ බව දැනදැනත් මේ තරුණිය ඔහුට රුබල් තුන් දහක් දුන්නා. (තමා කරන හැම දෙයක් ම, වෙනෙකකක් තබා තමා කරන ද්‍රෝහිකම් ද ඉවසන බව විශ්වාස කොට ඔහු ඇය මුලා කළා.) තමා මුලා කිරීම පිණිස මුදල් දෙන බව ඉතා පැහැදිලි ව පෙන්වමින් තරුණිය ඔහුට මුදල් දුන්නා. 'තුඹ මේ මුදල් ගන්නවා ද නැද්ද? මේ මුදල් ගැනීමට තරම් තුඹ තුළ ලැජ්ජාව කියා දෙයක් නැද්ද?' යන ගොළු ප්‍රශ්නය ඇගේ සියුම් පරීක්ෂ්‍යකාරී දෑසේ දකින්නට ලැබුණා. ඔහු ඇය දෙස බලා ඇගේ අදහස් දැනදැනත් (ඔහු තමා ගේ අදහස් තේරුම් ගත් බව ඈ තමුන්නාන්සේලා ඉදිරිපිට පිළිගත්තා) කිසි ම කොන්දේසියක් නැති ව එම මුදල් ගෙන, අලුත සොයාගත්ත පෙම්වතියත් සමඟ දවසින් දෙකින් විනාශ කළා.

"එහෙනම් අපි කුමක් ද විශ්වාස කරන්නේ? තමා තුළ හටගත් ත්‍යාගවන්තකම නමැති උතුම් හැඟීමට අවනත ව, සදාචාරයට ආචාර කරමින්, තමා ළඟ තිබුණු අන්තිම තඹය පරිත්‍යාග කළ තරුණ නිලධරයා පිළිබඳ අද්භූත කතාව ද? නැති නම් සිතේ පිළිකුල් ඇති කරවන අනෙක් කතාව ද? සාමාන්‍යයෙන් සීමාන්තික කරුණු දෙකකට මැදි වූ විට සත්‍යය සොයා ගැනීමට නම් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම සාමාන්‍ය නීතියයි. නමුත් මේ අවස්ථාවේ දී එය එසේ නො වෙයි. පළමු අවස්ථාවේ දී සිරකරුවා උත්තමයකු ලෙස ද, දෙවන අවස්ථාවේ දී අධමයකු ලෙස ද ක්‍රියා කළා. මන්ද? ඔහු තුළ කරමසෝව් පවුලට අයත් චරිත ලක්ෂණ තිබුණු නිසයි. මා වෑයම් කරන්නේ තමුන්නාන්-සේලාට ඒ බව පෙන්නා දීමටයි. එක ම වේලාවට එකිනෙකට නොගැළපෙන නොයෙක් මාදිලියේ පරස්පර විරෝධී දේවල් කළ හැකියි ශ්‍රේෂ්ඨ දේවල් කරන අතර ඉතා පහත් තිහීන දේවල් ද කළ හැකියි. කරමසෝව් පවුල ඉතා ළඟින් ආශ්‍රය කළ තරුණයකු වන රැකිටින් කළ විස්තරය තමුන්නාන්සේලා ඇසුවා නේද? 'උදාර ත්‍යාගශීලි භාවය ගැන පවතින ඔවුන් ගේ අදහස් වගේ ම මේ වැනි සාහසික නොහික්මුණු කම් ද ඔවුන් ගේ පිරිහීමට අවශ්‍යයි' රැකිටින් කිව්වා. ඒක සහතික ඇත්තයි. එකිනෙකට පටහැනි වූ මේ අස්වාභාවික මිශ්‍රණය ඔවුන්ට නිරන්තරයෙන් ම අවශ්‍ය දෙයක්. එක විට ම මේ සීමාන්තික

ගති ගුණ දෙක ම අවශ්‍යයයි. නැති නම් එය ඔවුන්ට මහත් දුකක්, වේදනාවක්. ඒ සීමාන්තික දෙක නැති නම් ඔවුන් ගේ ජීවිත සම්පූර්ණ වෙන්නේ නැහැ. ජූරිසභාවේ මහත්වරුනි, කරමසෝව් පවුලේ ඇත්තන් ගේ ජීවිතය බොහො ම විශාලයි. අපේ මව් බිම වූ රුසියාව තරම් විශාලයි. ඔවුන් හැම දෙයක් ම සහභාගි කරගෙන හැම දෙයක් සමඟ ජීවත් වෙනවා.

"ජූරි සභාවේ මහත්වරුනි, මම දූත් රූබල් තුන් දහ ගැන සඳහන් කළා. ඒ ගැන සුළු විස්තරයක් කිරීමට ඔබ මට අවසර දිය යුතුයි. බලවත් ලැජ්ජාවකින් යුතු ව, නින්දා අපහාස විඳගෙන, පිරිහීමක් ඇති ව ලැබූ රූබල් තුන් දහසකින් භාගයක් ම එම දින ම වියදම් කොට අනෙක් භාගය කුඩා මල්ලක දමා මසා, මුදල් ඉතා අවශ්‍ය ව තිබිය දීත් එම මුදලට අත නො තබා බෙල්ල වටේ එල්ලාගෙන සිටීමට මෙ වැනි මිනිහකුට පුළුවන් වේ ය කියා තමුන්නාන්සේලා විශ්වාස කරනව ද? තැබෑරුම්වලට වැදී මදනෝත්සව පවත්වද්දීත්, තමා ආලය කරන තරුණිය පියා ගේ කාමතණ්හාවෙන් ආරක්ෂා කරගැනීම සඳහා අවශ්‍ය මුදල් කාගෙන් දෝ ලබා-ගැනීම පිණිස දෙයියෝ දනියි කාගෙන් ද කියා – පිටිසරට දිව ගිය අවස්ථාවේ දී වත් ඔහු බෙල්ල වටේ එල්ලාගෙන සිටිය මුදල් පසුම්බියට අත තිබ්බේ නැහැ. මන්ද? තමා ගේ පෙම්වතිය, තමා වෛර කරන පියා ගේ කාම තෘෂ්ණාවෙන් ආරක්ෂා කර ගැනීමට නම්, එම මුදල් ගෙන ගෙදර නැවතී සිට, පෙම්වතිය පියාගෙන් ආරක්ෂා කරගෙන 'මා නුඹට අයිති'යයි ඇ කී වහා ම ඇයත් සමඟ මේ භයානක ස්ථානයෙන් පැනයාමි ... ට ඉඩ තිබුණා.

"නැහැ, ජූරි සභාවේ මහත්වරුනි. ඔහු බෙල්ල වටේ එල්ලාගෙන සිටිය මේ සුරයට අත තැබුවේ වත් නැහැ. මන්ද අත නො තැබුවේ? මා දූත් සඳහන් කළ ප්‍රධාන හේතුව නිසයි. එනම් 'මා දූන් අයිති නුඹටයි, නුඹ කැමැති තැනකට මා ගෙනියන්න'යයි පෙම්වතිය කී වහා ම ඇය ගෙනයාමට අතේ මුදල් තිබිය යුතුයි. සිරකරුවා ගේ කතාවේ හැටියට පළමු හේතුවට වඩා දෙවන හේතුව වැදගත්. 'මා ළඟ මුදල් තබාගෙන සිටින තෙක් මා තක්කඩියෙක් මිස හොරෙක් නො වෙයි. ඕනෑම වෙලාවක, මා විසින් නින්දා කරන ලද මනාලිය ළඟට ගොස්, ඇගේ මුදලින් නාස්ති කොට ඉතිරි වූ රූබල් එක්දහස් පන්සිය ඇය ඉදිරිපිට තබා 'බලන්න, නුඹ මට දූන් මුදලින් භාගයක් විනාශ කොට, මා දුශ්චරිතයට නැමුණු ඉතා දුබල මිනිසකු බව ඔප්පු කළා. කැමැති නම් මට තක්කඩියෙක් යයි

කියන්න. (මා පාවිච්චි කරන්නේ සිරකරුවා පාවිච්චි කළ වචනමයි.) මා තක්කඩියෙක් වෙන්න පුළුවනි. නමුත් මා හොරෙක් නො වෙයි. මා හොරෙක් නම් නුඹ මට දුන්න මුදලින් භාගයක් ආපසු ගෙනත් දෙන්නේ නැහැ. අනෙක් භාගය විනාශ කළා වගේ මේ භාගයත් විනාශ කරනවා'යි සිරකරුවා කිව්වා. මේක මහ පුදුම කතාවක්. වහා කිපෙන, එහෙත් දුර්වල මිනිහා, තමාට බලවත් තිඤුවක් හා අපහාසයක් ද ගෙන දුන් රූබල් තුන් දහ ගැනීමට ඇති ආශාව මැඩගත නොහැකි වූ මේ මිනිහා, හදිසියෙන් ම කො තරම් සිත මැඩ ගත්තේ ද කියතොත්, අත තබන්නේ වත් නැති ව රූබල් එක්දස් පන්සියක් බෙල්ලේ එල්ලාගෙන හිටියා. අප දුන් විභාග කර බැලූ චරිතයත් සමග මේ හැසිරීම ගැලපෙනවා ද? නැහැ. ජූරි සභාවේ මහත්වරුනි, එය කිසි සේත් ම ගැලපෙන්නේ නැහැ. කුඩා පසුම්බියක මුදල් දමා මසා බෙල්ලේ එල්ලාගත්තා නම් නියම මිනියා කරමසෝ හැසිරෙන හැටි මම නමුත්-නාත්සේලාට විස්තර කරලා දෙන්නම්.

"රූබල් තුන් දහෙන් භාගයක් වියදම් කොට පෙම්වතියක් සමග ප්‍රීති වූ මිනියා කරමසෝට ආයේත් වරක් ඒ විදියට ම ප්‍රීතිවීමට ආශාවක් ඇති වුණා නම් ඔහු පසුම්බිය ලිහා ඉන් රූබල් සීයක් ගන්නවා ඇති. රූබල් තුන්දහෙන් මොනවට ද හරියට ම භාගයක් ම ගිහින් දෙන්නේ? එක්දස් හාරසීයක් දුන්නහම මදි ද? 'මම තක්කඩියෙක් මිස හොරෙක් නො වෙමි. මම රූබල් එක්දස් හාරසීයක් ආපසු ගෙනත් දුන්නා. හොරෙක් නම් එම මුදල ගෙනත් දෙන්නේ නැහැ'යි කියන්න තිබුණා. ඊට පස්සේ දෙවන වරටත් තුන් වන වරටත් රූබල් සීය ගණනේ වියදම් කරන්න තිබුණා. අන්තිම රූබල් සීය ඉතිරි වන තෙක් වියදම් කොට ඒ රූබල් සීය ගෙන ගොස් ආපසු භාර දී 'මම තක්කඩියෙක් මිස හොරෙක් නො වෙමි'යි කියන්න ඉඩ තිබුණා. හොරෙක් නම් ඒ රූබල් සීය ආපසු දෙන්නේ නැහැ. නමුත් අන්තිමේ දී ඔහු එම රූබල් සීය දෙස බලා, 'මේ රූබල් සීය ආපසු දෙන්නේ මොනවට ද? ඒකත් වියදම් කරනවා' කියා වියදම් කරනවා ඇති. අප දන්නා කරමසෝ ක්‍රියා කරනවා ඇත්තේ මේ විදියටයි. මුදල් පිළිබඳ ඉදිරිපත් කළ කතාව කිසි ම කෙනකුට විශ්වාස කරන්න පුළුවන් දෙයක් නො වෙයි. වෙන කුමක් විශ්වාස කළත් මේ කතාව නම් විශ්වාස කරන්න බැහැ. අපි ඒ ගැන පසු ව කල්පනා කරලා බලමු"

පිය පුතුන් දෙදෙනා අතරේ පැවැති මුදල් ගනු දෙනු හා ඔවුන් එකිනෙකාට දක්වූ සැලැකිල්ල ගැන නඩු විභාගයේ දී මතු වූ සාක්ෂි ගැන දිග විස්තරයක් කොට මීතියා ගේ මව ගේ ධනය ගැන කවුරුන් කවරකුට වංචා කළේ දැයි කිව නොහැකි බව පෙන්නා දුන් දණ්ඩනායකයා, මීතියාට ලැබිය යුතු ව තිබුණු රූබල් තුන් දහ ගැන මීතියා බැසගත් නිගමනය පිළිබඳව ඉදිරිපත් කරන ලද වෛද්‍ය සාක්ෂි පිරික්සන්නට විය.

හත් වන පරිච්ඡේදය

ඓතිහාසික පරීක්ෂණය

"සිරකරුවා ගේ මානසික තත්ත්වයේ වරදක් ඇති බවත්, ඇත්ත වශයෙන් ඔහු පිස්සකු බවත්, ඔප්පු කිරීමට වෛද්‍ය විශේෂඥයන් වෑයම් කළා. සිරකරුවා ගේ මානසික තත්ත්වයේ කිසි ම වරදක් නැතැයි මා කියා සිටිනවා. ඔහු හොඳ සිහියෙන් නො සිටියා නම් මීට වඩා ඥානවන්ත විදියට කටයුතු කරනවා ඇති. ඔහු පිස්සෙක් ය යන අදහස සමඟ නම් මා එකඟ වෙනවා. එකඟ වෙන්නේ එක කරුණක් උඩයි. එනම්, තාත්තා-ගෙන් ලැබෙන්නට තියෙනවා ය කියන රූබල් තුන් දහ ගැන සිරකරුවා දරන ස්ථිර අදහස උඩයි. කෙසේ වෙතත් මගේ අදහස නම් ඔහු ගේ උමතුවට පිටු දුන් හේතුව විස්තර කරනවාට වඩා, රූබල් තුන් දහ සඳහන් කරන විට ඔහු තුළ ඇති වන දරුණු කෝපය විස්තර කිරීම පහසු බවයි. සිරකරුවා ගේ මානසික තත්ත්වයේ කිසි ම වරදක් නැත, ඔහු තුළ ඇති එක ම වරද නිතර කෝපවීම පමණක් යයි විස්තර කරමින් තරුණ දොස්තර මහතා දුන් සාක්ෂියට මා සම්පූර්ණ-යෙන් ම එකඟ වෙනවා. සිරකරුවා නිතර දරුණු අත්දමින් කිපුණේ මුදල් නිසා ම නො වෙයි. ඔහු ගේ කෝපයට විශේෂ හේතුවක් තිබුණා. ඒ හේතුව නම් ඊර්ෂ්‍යාවයි."

මෙහි දී දණ්ඩනායකයා, සිරකරුවා ග්‍රෂෙන්කාට දක්වූ මාරක ආශාව ගැන දිග විස්තරයක් කෙළේ ය. 'ඇයට නැළීම පිණිස' සිරකරුවා තරුණිය ගේ නිවසට ගිය තැනේ සිට ඔහු විස්තර කෙළේ ය. "මම සිරකරුවා ගේ ම වචන පාවිච්චි කරනවා"යි දණ්ඩනායකයා කී ය. "නමුත් ඇයට තළනවා

වෙනුවට ඔහු ඇගේ දෙපා ලඟ වැටුණා. එ තැන් සිට තමයි ඔවුන් ගේ ප්‍රේමය පටන් ගත්තේ. ඒ සමඟ සිරකරුවා ගේ පියාත් එම තරුණිය ලබා ගැනීමට වෑයම් කළා. එය, මහ පුදුම භයානක විපාකවලට හේතු වූ දෙයක්. පිය පුතුන් දෙදෙනා ම මේ තරුණිය කලින් දැන සිටියා. දෙදෙනා ම එක වර ම ඇය ලබා ගැනීමට වෑයම් කළා. ඈ එක වර ම පිය පුතුන් දෙදෙනා තුළ ඉතා උග්‍ර ආශාවක්, වෙසෙසින් ම කරමසෝ පවුලට අයත් රාගයක් ඇති කළා. මේ තරුණිය දුන් සාක්ෂි අපට මෙහි දී ඉදිරිපත් කරන්න පුළුවනි''යි දණ්ඩනායකයා කී ය. '''මම තාත්තාටයි, පුතාටයි හිනා වුණා'යි ඈ කිව්වා. පිය පුතුන් දෙදෙනාට ම සිනාසීමට ඇයට හදිසියෙන් ම අදහස් වුණා. මීට කලින් නම් එ වැනි අදහසක් ඇති වුණේ නැහැ. එහි ප්‍රතිඵලයක් වශයෙන් පිය පුතුන් දෙදෙනා ම ඇගේ මායමට අහුවුණා. ඇයට වසඟ වුණා. දෙවියන්ට වැඳුම් පිදුම් කරන්නාක් මෙන් කාසියට වැඳුම් පිදුම් කළ මහල්ලා එක්වර ම රූබල් තුන් දහක් වෙන් කොට තබා, තමා ලඟට පැමිණිය හොත් ඒ මුදල් දෙන බවට පොරොන්දු වුණා. අන්තිමේ දී තත්ත්වය වෙනස් වුණා. ඈ තමා ගේ නීත්‍යනුකූල බිරිය වුණොත් තමා සතු මුළු ධනය ම ඇගේ දෙපා ලඟ තැබීමට මහල්ලා පොරොන්දු වුණා. ඒ බව ඔප්පු කිරීමට පුළුවන් ප්‍රබල සාක්ෂි තියෙනවා. එහෙත් සිරකරුවා ගේ දෛවය මුහුණ පා ඇති ඛේදජනක තත්ත්වය දැන් අපේ නෙත් ඉදිරිපිට පෙනෙන්න තියෙනවා. මේ තරුණිය කළ සෙල්ලමේ රඟ පේනවා නේ ද? අන්තිම මොහොත වන තෙක් මේ මෝහිනිය, මේ අවාසනාවන්ත තරුණයාට කිසි ම බලාපොරොත්තුවක් දුන්නේ නැහැ. අන්තිම මොහොතේ දී, තමා ගේ විරුද්ධවාදියා වන තාත්තා ගේ ලෙයින් අපිරිසුදු වූ දෑත් දික් කොට ඇය ඉදිරිපිට දණින් වැටෙන තෙක් අ· මොහුට කිසි ම බලාපොරොත්තුවක් දුන්නේ නැහැ. ඔහු සිරභාරයට ගත්තේ එ වැනි අවස්ථාවකයි. 'මොහුට මේ විපත කළේ මා ය. මා මොහු සමඟ සයිබීරියාවට යවන්න. මීට වරද කාරයා මායි.' තරුණයා සිරභාරයට ගන්න වේලාවේ දී තරුණිය අවංක සිතින් කිව්වා.

''මා දැන් ටිකකට කලින් සඳහන් කළ දක්ෂ තරුණයකු වන රැකිටින් මේ කතා නායිකාව ඉතා ලුහුඬු, එහෙත් සිත් ගන්නා වචනයෙන් විස්තර කළා. 'ඈ දූෂණය කොට අත් හැර දමන ලද තරුණියක්. අඩු වයසේ දී ඇය රවටා විනාශ කොට මුලා කරනු ලැබුවා. ඈ වැදගත් පවුලකට අයිතියි. ඒ පවුලේ අය ඇයට සාප කොට, ඇය අත් හැර දැම්මා. දහදුක්

විඳිමින් සිටිය ඇය මහලු පොහොසත් මිනිහෙක් භාර ගත්තා. මේ මහල්ලා තවමත් තමා ගේ ආරක්ෂකයා හැටියට ඈ පිළිගත්තවා. ඇගේ තරුණ හදවතේ යහපත් අදහස් තියෙන්න ඇති. එහෙත් ඒ අදහස් තරුණ කාලයේ දී ම ඇයට තිත්ත වුණා. එ තැන් සිට සිහිනුවණින් ක්‍රියා කළ ඈ මුදල් හම්බ කරන්න පටන් ගත්තා.' ඈ සමාජයට බැන්නා. මේ තරුණිය පිය පුතුන් දෙදෙනා ගැන හුදෙක් විනෝදයෙන් යුතු ව, ද්වේෂයෙන් හටගත් විනෝදයෙන් යුතු ව, සිනාසෙන්නට ඇතැයි අපට ඉහත සඳහන් චරිත විවරණයෙන් පසු ව තේරුම් ගන්න පුළුවනි.

"පිරිහුණු චරිතයකින් හා බලාපොරොත්තු සුන්කරගත් ආලයකින් පෙළෙන මේ තරුණයා මාසයක් දුකින් ගත කළා. ඒ මාසය තුළ දී, ඔහු සරණ ගිවිසගත් කුලකතට ද්‍රෝහිකම් කොට ඇය දුන් මුදල් වංචා කළා. නිතර ඇති වූ ඊර්ෂ්‍යාවෙන් උමතු වුණා......ඔහු කාට ද ඊර්ෂ්‍යා කළේ? ඔහු ගේ තාත්තාටයි. ඒ පිස්සු මහලු මිනිහා කළේ කුමක් ද? අම්මාගෙන් තමාට අයිති වූ මුදල් යයි පුතා විසින් විශ්වාස කළ මුදල් වංචාවෙන් ගෙන, ඒ මුදල්වලින් පුතා ගේ පෙම්වතිය වසඟකර ගැනීමට වෑයම් කළා. මෙය ඉවසිය නොහැකි දෙයක් බව මම පිළිගන්නවා. මෙය මිනිසකු පිස්සකු කිරීමට තරම් ප්‍රමාණවත්. සිරකරුවා කිපුණේ මුදල් ගැන නො වෙයි. ඔහු කිපුණේ එම මුදල් ඔහු ගේ සැපත විනාශ කිරීම පිණිස, මෙ තරම් නින්දිත විදියට පාවිච්චි කිරීම ගැනයි."

සිරකරුවා ගේ හිසට පියා මැරීමේ අදහස ඇතුළු වූ සැටි විස්තර කළ දණ්ඩනායකයා, තම සිද්ධාන්තය සනාථ කිරීම පිණිස නොයෙක් කරුණු ඉදිරිපත් කෙළේ ය.

"පළමු ව සිරකරුවා පියා මැරීම ගැන තැබෑරුමේ දී කතා කළා. ඔහු පසු ගිය මුළු මාසය තුළ ම ඔය ගැන මයි කතා කළේ. ඔහු බොහො ම කැමැතියි නිතර සෙනඟ පිරිවරාගෙන සිටීමට. ඔහු බොහො ම කැමැතියි තමා පිරිවරාගෙන සිටින අයට හැම දෙයක් ම කියන්න. වෙනෙකක් තබා තමා ගේ පාපිෂ්ට හා භයානක අදහස් පවා ඔහු එළිපිට කිව්වා. තමා ගේ අදහස් දැනගත් අය, ඒ අදහස්වලට එකඟ වී, තමා විඳින සියලු ම හිරිහැර කරදරවලට සහභාගි වී, තමා ගේ පැත්ත ගෙන, තමාට පක්ෂ ව ක්‍රියා කරනවා මිස තමාට විරුද්ධ නො වේ ය කියා කිසියම් හේතුවක් නිසා ඔහු විශ්වාස කළා. තමා සමඟ එකඟ නො වුවොත් කෝප වී, තැබෑරුමේ තියෙන හැම දෙයක් ම

බිඳ දමා විශාල කෝලාහලයක් කිරීම ඔහු ගේ සිරිතයි. (අනතුරු ව දණ්ඩනායකයා මිතියා, කපිතත් සෙනෙග්‍රියෝප්ට කළ අඩත්තේට්ටම් ගැන විස්තරයක් කෙළේ ය.) සිරකරුවා තාත්තා මැරීම ගැන කළ කතාව ඇසූ අය අත්තිමේ දී කල්පනා කළා, මොහු කරන්නේ තර්ජනයක් පමණක් නො වෙයි, මොහු ඒ තර්ජනය ක්‍රියාත්මක කරන්න පුළුවන් ය කියා."

මෙහි දී නීතිඥයා, කරමසෝ පවුල තාපසාරාමයේ දී හමු වූ හැටිත්, මිතියා අලෝෂා සමග කළ කතාවත්, රාත්‍රි කෑමෙන් පසු සිරකරුවා පියා ගේ ගෙදරට කඩාවැදී කළ භයානක කෝලා-හලය ගැනත් දිග විස්තරයක් කෙළේ ය.

"මෙම සිද්ධියට කලින් සිරකරුවා පියා මැරීමට අදහස් කළා ය කියා ස්ථිර ව ම කියන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. නමුත් ඔහු තුළ පියා මැරීමේ අදහස කීප වරක් ම ඇති වූ බවත්, ඔහු ඒ ගැන බොහෝ දුරට කල්පනා කළ බවත්, ඔප්පු කිරීමට ඕනෑ තරම් සාක්ෂි තියෙනවා. ඒ බව ඔහු ගේ වචන-යෙන් ම ඔප්පු කරන්න පුළුවනි. ජූරි සභාවේ මහත්වරුනි, මා ඔබට පාපෝච්චාරණයක් කරන්න කැමැතියි. කලින් සිතා මතා කළ දේවල් සිරකරුවා පිට පැටවිය යුතු ද කියා මම මෙතෙක් කල් දෙගඩියාවෙන් කල්පනා කළා. මේ භයානක අපරාධය ගැන සිරකරුවා කලින් සිතා ගෙන හිටිය බව මට හොඳට විශ්වාසයි. ඔහු තාත්තා මැරීමට සිතුවා පමණක් නො ව, එය කළ හැකි දෙයක් යයි විශ්වාස කළා. නමුත් තාත්තා මරන්නේ කෙසේ ද? කොයි වෙලාවේ දී ද? යන වග ඔහු අවසාන වශයෙන් තීරණය කරගෙන හිටියේ නැහැ.

"මා දෙගඩියාවෙන් හිටියේ අද දවස වන තෙක් පමණයි. දූත් ටිකකට කලින් අර භයානක ලියුම මේ උසාවියට ඉදිරිපත් කරන තෙක් පමණයි. 'මේ ලියුම තමයි මිනීමැරුමට යොදා ගත්ත නියම සැලැස්ම, නියම වැඩ පිළිවෙළ'යයි අර තරුණ කාන්තාව කළ කතාව ඔබ සියලු දෙනා ම අහගෙන හිටි යා. මේ අවාසනා-වන්ත සිරකරුවා සුරාවෙන් මත් වී ලියාපු ඒ කාලකණ්ණි ලියුම ඇ විස්තර කළේ මේ විදියටයි. ඇත්ත වශයෙන් අපට ඒ ලියුමෙන් පැහැදිලි ව පෙනෙනවා, මේ මිනීමැරුම කලින් සිතා මතා කළ දෙයක් බව. ඒ ලියුම ලියා තිබුණේ මිනීමැරුමට දවස් දෙකකට කලිනුයි. මුදල් නො ලැබුණොත්, ඉවාන් ගෙදරින් පිට වී ගිය වහා ම තාත්තා මරා, මෙට්ටය යට ලියුම් කවරයක දමා සඟවා තියෙන මුදල් ගන්නා බව, මිනීමැරුම සිදුවීමට පැය හතළිස් අටකට කලින් සිරකරුවා දිව්රා කී බව අපි දන්නවා.

'ඉවාන් ගෙදරින් පිට වී ගිය වහා ම' යන පාඨය තමුන්නාන්සේලාට ඇහුණා නේ ද? ඔහු කලින් සිතා මතා ලියුමේ ලියා තියෙන විදියට ම ක්‍රියා කළා. මිනීමැරුම කලින් සිතා මතා කළ බව ස්ථිරයි. ඔහු තාත්තා මරන්න ඇත්තේ මුදල් ගැනීමේ අදහසිනුයි. ඒ බව පැහැදිලි ලෙස ලියුමේ ලියා අස්සන් කරල තියෙනවා. සිරකරුවා ඒ අස්සන තමා ගේ නොවන බව කියන්නේ නැහැ.

"මේ ලියුම ලියන විට ඔහු සුරා බී හොඳ සිහියෙන් නො සිටිය බව මට දන්වන්න පුළුවනි. ඉන් ලියුමේ ඇති වැදගත් කම අඩුවෙන්නේ නැහැ. ඔහු ලියුම ලිව්වේ සුරා බී මත් වී සිටින විටයි. ඒ වුණත් ඔහු තාත්තා මැරීමට කුමන්ත්‍රණ කළේ හොඳ සිහියෙන් සිටින විටයි. ඔහු හොඳ සිහියෙන් සිටින විට කුමන්ත්‍රණය නොකළා නම් සුරා බී මත් වී සිටින විට මේ ලියුම ලියන්නේ නැහැ. 'එහෙනම් ඔහු ඒ ගැන තැබෑරුමේ දී කතා කළේ මන්ද?' කියා ඔබ මගෙන් ප්‍රශ්න කරන්න පුළුවනි. මිනියක් මැරීමට කලින් අදහස් කරන මිනිහා ඒ ගැන කතා කරන්නේ නැහැ. ඒ වුණත් සිරකරුවා ඒ ගැන කතා කළේ තාත්තා මැරීමට කුමන්ත්‍රණය කිරීමට කලින්. ඊට පස්සේ ඔහු ඒ ගැන කතා කිරීම ටිකින් ටික අඩු කළා. එදා ඔහු තැබෑරුමේ සිට මේ ලියුම ලියද්දී මිනීමැරුම ගැන කතා කළේ නැහැ. සුරා බී සිටියත් කතා කළේ නැහැ. කතා නො කර සිටීම ඔහු ගේ පිළිවෙත නො වෙයි. කිසිවකු සමග කතා නො කර මුල්ලකට වී හිඳ සිටිය ඔහු බිලියඩ් ගැසීමට වත් ගියේ නැහැ. ඔහු තැබෑරුමේ දී මිනිහෙක් දෙවට ඇද දැම්ම බව ඇත්තයි. නමුත් ඒක කළේ කල්පනාවෙන් නො වෙයි. ඔහුට කවදාවත් කෝලාහලයක් නො කර තැබෑරුමට ඇතුල් වෙන්න බැහැ. තාත්තා මැරීම ගැන ඔහු ගම පුරා ම ඔහෑවට වඩා කතා කළ නිසා තාත්තා මැරීමෙන් පසු ව තමා හිරභාරයට ගැනීමට ඒ කතාව උපකාර වෙන්න පුළුවන් වේ ය කියා, තාත්තා මැරීමට තීරණය කරගත් සිරකාරයාට කල්පනා වුණා. ඒ වුණත් කටින් පිට වූ දෙය ආපසු ගන්න බැහැ. කොහොම වුණත් තමා අමාරුවේ වැටුණු හැම වතාවක දී ම කොහොම හරි ඉන් බේරුණා. ඒ වගේ ම මේ වතාවේ දීත් බේරෙන්න පුළුවනි. අපි අපේ වාසනාව කෙරෙහි ලොකු විශ්වාසයක් තබනවා. ජූරි සභාවේ මහත්වරුනි, මේ සිරකරුවා මේ භයානක මිනීමැරුමෙන් වැළකී සිටීමට බොහො ම වෑයම් කළ බව මට නො පිළි ගෙන සිටින්න බැහැ. 'හෙට මම පුළුවන් තරම් වෑයම් කරනවා කාගෙන් හරි

අතමාරුවට රූබල් තුන්දහක් ගන්න. බැරි වුණොත් මිනීමැරුමක් වෙනවා'යි ඔහු ඔහුට ම විශේෂ වූ භාෂාවෙන් ලිව්වා. ඔහු මෙසේ ලිව්වේ සුරා බී මත් වී සිටින විටයි. එහෙත් ඔහු එය ක්‍රියාවේ යෙදෙව්වේ හොඳ සිහියෙන් සිටින විටයි."

එදා මිනියා මිනීමැරුමෙන් වැලකී සිටීම සඳහා මුදල් සොයා ගැනීමට කල හැම වෑයමක් ගැන ම නීතිඥයා දිග විස්තරයක් කෙළේ ය. සම්සෝනෝව් හමුවී මුදල් ඉල්ලා සිටි සැටි, ලී වෙළෙඳා හමුවීම පිණිස ඈත පිටිසරට ගිය ගමන, වෙහෙස මහන්සියෙන්, තිත්ත අපහාසයෙන් හා කුස ගින්නෙන් පෙළෙන ඔහු ගමනට උවමනා මුදල් ගැනීම සඳහා ඔරලෝසුව වික්ක සැටි, (නමුත් ඔහු අපට කියනවා ඔහු ළඟ රූබල් එක්දස් පන්සීයක් තිබුණ බව) තමා ආලය කරන වස්තුව නගරයේ තනි කර දමා පැමිණි නිසා තමා නැති අතරේ ඈ තාත්තා ළඟට යන්නට ඇත ය යන බියෙන්, සැකයෙන් හා ඊරිසියාවෙන්, පෙළුණු සැටි, අන්තිමේ දී ඔහු මුදල් නැති ව ආපසු නගරයට පැමිණි සැටි, දණ්ඩනායකයා විස්තර කෙළේ ය. "තමා නැති අතරේ ඈ තාත්තා ළඟට නොගිය බව දැන ඔහු ලොකු සැනසීමක් ලැබුවා. ඊට පස්සෙ ඔහු ඇය සමඟ සම්සෝනෝව් ළඟට ගියා. (සම්සෝනෝව් ගැන සැක නොකිරීම පුදුමයක්. එය මානසික විද්‍යාව අතින් වැදගත් දෙයක් වෙන්න පුළුවනි) ඊට පස්සෙ ඔහු මහ ගෙදර වත්තට පැන සැඟවී බලා සිටියා. එහි දී ඔහුට දැනගන්න ලැබුණා පැවල් මීමැස්මොරයෙන් අසනීප වී සිටින බව. ගිරිගෝරිස් සිටියේ අසනීපයෙන්. දැන් තමාට කිසිවකු ගෙන් බාධාවක් නැහැ. ගෘසෙන්කා පැමිණි බව දැන්වීම පිණිස දෙරට තට්ටු කරන හැටිත් ඔහු දැන සිටියා. තාත්තා මැරීමට මීට වඩා සිත් පොළඹවන අවස්ථාවක් තවත් සොයාගත හැකි ද? එහෙත් ඔහු සිතේ අදහස්වලට යටත් නො වී, ටික කලක සිට අපේ නගරයේ පදිංචි ව සිටින, අප කාගෙත් ආදර ගෞරවය දිනා ගත් හොලාකෝව් මැතිනිය හමු වෙන්න ගියා. කලක සිට අනුකම්පාවෙන් යුතු ව තරුණයා ගේ ක්‍රියා කලාපය ගැන පරීක්ෂාවෙන් බලා සිටිය මේ කාන්තාව සිරකරුවාට කතා කරලා, තමා ගත කරන නොහික්මුණු ජීවිතය අතහැර දමා, දුෂ්ට ප්‍රේම සම්බන්ධය නතර කොට, සුරා සැල්වලට නො ගොස්, සල්ලාලකමින් තමා ගේ තරුණ භාවයත්, ශරීර ශක්තියත් විනාශ කර නො ගෙන, සයිබීරියාවේ රත්රන් ආකර-වලට යන්න ය කියා අවවාද කලා. 'නුඹේ නොහික්මුණු කාය ශක්තියට, ප්‍රේමසහගත ජීවිතයට, හා නිර්භීත ක්‍රියාවලට ඇති පිපාසය සයිබීරියාවෙන් ලබාගන්න පුළුවනියි' ඈ කිව්වා.

කුල කත සමඟ ඇති වූ සාකච්ඡාවේ ප්‍රතිඵල විස්තර කිරීමෙන් පසු ව, ග්‍රෑසෙන්කා මහලු වෙලෙන්ද ගේ ගෙදර නැති බව දැනගත් වහා ම, ඈ තමා මූලා කොට තාත්තා ළඟට ගියේ යයි කල්පනා කොට, ඊරිසියාවෙන්, හා මහන්සියෙන් විඩා වැටී සිටි අවාසනාවන්ත තරුණයා තුළ ඇති වූ හැඟීම් විස්තර කළ දණ්ඩනායකයා, අනතුරු ව ඒ අවස්ථාවේ සිදු වූ දෙයින් ඇති වූ භයානක ප්‍රතිඵල විස්තර කිරීමට පටන් ගත්තේ ය.

"තමා ගේ ස්වාමිදූව ඇගේ පරණ පෙම්වතා සමඟ මුක්රෝවට පැන ගිය බව දාසිය කිව්වා නම් කිසි ම දෙයක් වෙන්නේ නැහැ. නමුත් පණ භයෙන් දාසිය ගේ සිහිය අවුල් වුණා. තමා කිසිවක් නොදන්නා බව කියමින් ඈ දිවුරන්න පටන් ගත්තා, ඒ මොහොතේ දී සිරකරුවා මේ දාසිය නො මැරුවේ තමා රවටා පැන ගිය පෙම්වතිය අල්ලා ගැනීමට දිව ගිය නිසයි. මේ කාරණාව හොඳට සිහි තබා ගන්න. ඒ වෙලාවේ සිරකරුවා කො තරම් කෝපයෙන් සිටියත් පිත්තල මෝල්ගහ ගෙනයාමට අමතක කළේ නැහැ. ඇයි මෝල්ගහ ගෙන ගියේ? වෙන ආයුධයක් ගෙන යන්න ඉඩ තිබුණේ නැද්ද? මේ සිරකරුවා පියා මැරීමට මාසයකට කලින් තීරණය කරගෙන ඒ සඳහා හැම දෙයක් ම සූදානම් කරගෙන සිටිය නිසා, අතට අහු වුණ ආයුධය තමා ගේ කටයුත්තට ප්‍රමාණවත් ය කියා කල්පනා කළා. ඒ නිසා තමයි ඔහු එක් වර ම තමා ගේ කටයුත්තට පිත්තල මෝල්ගහ ප්‍රමාණවත් ය කියා කල්පනා කළේ. ඉතින් ඔහු ඒ භයානක ආයුධය අතට ගත්තේ නොකල්පනාවෙන් නො වෙයි. නොකැමැත්තෙන් නො වෙයි. ටික වේලාවකට පස්සේ ඔහු පියා ගේ වත්තට පැනගත්තා. දැන් පියා මැරීමට කිසි ම බාධාවක් නැහැ. සාක්ෂියක් කියන්න කෙනෙක් නැහැ. මිනීමැරුමට සුදුසු අන්ධකාරයත්, සිතේ වෛරයත් නො මඳ ව තියෙනවා. සමහර විට තම පෙම්වතිය ගේ ඇතුළේ ඉන්නවා ඇතියි, තාත්තා වැලඳගෙන ඉන්නවා ඇතියි, තමා ගැන සිනා සිනා සෙනවා ඇතියි, කල්පනා වෙන කොට ඇති වූ කෝපයෙන් ඔහු ගේ හුස්ම හිරවුණා. අවිශ්වාස කරන්න දෙයක් නැහැ. ඈ ගේ ඇතුළේ ඉන්නවා. අර ලාම්පුව පත්තුවෙන කාමරයේ ඉන්නවා. ඉස්කිරීම පිටිපස්සේ ඉන්නවා. ඉතින් මේ අවාසනාවන්ත තරුණයා බොහො ම සෙමෙන් කවුළුව ළඟට ගොස්, බොහො ම භයෙන් කවුළුව තුළින් එබී බලා, කිසියම් භයානක අශිෂ්ට දෙයක් සිදු වේ ය යන බියෙන් ආපසු පැමිණියා. මේ කතාව විශ්වාස කරන්න ය

කියා අපට කියනවා. මේ සිරකරුවා ගේ ගතිගුණ අපි හොඳට දන්නවා. කල්ක්‍රියාව අපි දන්නවා. ඒ වෙලාවේ ඔහු ගේ සිත ක්‍රියා කල හැටි අපි දන්නවා. ගෙට ඇතුල්වීම පිණිස දොරට තට්ටු කරන ක්‍රමයත් ඔහු දැන ගෙන හිටිය බව අපි දන්නවා. ඉතින් ඔහු කවුළුව ලඟින් පැනගියා ය කියා අපි විශ්වාස කරන්නේ කොහොම ද?"

මෙහි දී දණ්ඩනායකයා මේ විස්තරය මෙ තැනින් නතර කොට පැවල් හා මිනීමැරුම අතර පැවැති, සැක කරනු ලැබූ සම්බන්ධය ගැන දිග විස්තරයක් කරන්නට පටන් ගත්තේ ය. ඔහු මේ කාරණය තියුණු පරීක්ෂණයකට බඳුන් කෙළේ ය. ඒ සම්බන්ධ ව ඔහු තුල දැඩි පිළිකුලක් තිබුණත් ඔහු එය ඉතා වැදගත් කොට සලකන බව කාටත් පෙනී ගියේ ය.

අට වන පරිච්ඡේදය

පැවල් ගේ චරිත විභාගය

"ජූරි සභාවේ මහත්වරුනි, පැවල් ගැන සැක ඇති වුණේ කොහොම ද? කුමන කරුණක් නිසා ද? කියා අපි පළමු ව සොයා බලමු"යි යන ප්‍රශ්නය ඉදිරිපත් කරමින් දණ්ඩනායකයා ඈපේත් දේශනය ආරම්භ කෙළේ ය. "මහලු කරමසෝව් මැරුවේ පැවල් ය යන අදහස පළමු වරට ඉදිරිපත් කළේ සිරකරුවා සිරභාරයට ගන්නා ලද අවස්ථාවෙයි. ඒ මොහොතේ සිට මේ මොහොත දක්වා එම අදහස ඔප්පු කිරීමට පුළුවන් සාක්ෂියක් තව ම ඔහු ඉදිරිපත් කරලා නැහැ. ඉදිරිපත් කරන බවක් හැඟෙව්වෙත් නැහැ. පැවල්ට විරුද්ධ ව මිනීමැරුමේ චෝදනාව ඉදිරිපත් කළේ තුන් දෙනෙක් පමණයි. සිරකරුවා ගේ සහෝදරයන් දෙදෙනා හා ගෘසෙන්කා පමණයි. සහෝදරයන් දෙදෙනාගෙන් වැඩිමලා පැවල්ට මිනීමැරීමේ චෝදනාව එල්ල කළේ අදයි. මොළයේ උණ වැලඳී සිටින විටයි. පසු ගිය දෙමාසය තුළ, මේ මිනීමැරුම පිළිබඳ ව අප දැරූ අදහස් ඔහු සම්පූර්ණයෙන් ම පිළිගත්තා. තමා ගේ අයියා වැරදි කරුවා බව පිළිගත්තා. ඒ අදහසට විරුද්ධ වුණේ නැහැ. අපි ඒ ගැන පසු ව විස්තර කරමු. පැවල් මිනීමරුවා යයි තමා දරන අදහස ඔප්පු කිරීමට කිසි ම සාක්ෂියක් නැතැයි බාල සහෝදරයා

කියනවා. පියා මැරුවේ පැවල් ය යන තීරණයට ඔහු බැස ගත්තේ සිරකරුවා ගේ කතාවෙන් සහ මුහුණේ පැවැති සවභාවයෙන් පමණයි. ඔහු අද දෙවරක් ම මේ පුදුම අදහස ඉදිරිපත් කළා. ගෘසෙන්කා ගේ කතාව ඊට වඩා පුදුමයි. 'සිරකරුවා කවදාවත් බොරුවක් කියන්නේ නැහැ. ඒ නිසා ඔහු කියන දෙය විශ්වාස කල යුතුයි.' මේ ඇගේ තර්කයයි. සිරකරුවා ගේ දෛවය ගැන ලොකු සැලැකිල්ලක් දක්වන මේ සාක්ෂිකාරයන් තිදෙනා, මිනීමරුවා පැවල් බව ඔප්පු කිරීමට ඉදිරිපත් කර තිබෙන්නේ මෙ වැනි තර්කයි. එහෙත් පැවල් වරදකාරයා ය යන අදහස තවමත් හැම තැන ම පැතිර පවතිනවා."

සිත නොසන්සුන් වූ අවස්ථාවක දී දිවි නසා ගත් පැවල් ගැන කෙටි විස්තරයක් කිරීමට මෙහි දී දණ්ඩනායකයා කල්පනා කෙළේ ය. පැවල් සුළු අධ්‍යාපනයක් ලැබූ, දුබල සිත් ඇති, කල්පනා ශක්තියට ඔරොත්තු නොදෙන දාර්ශනික අදහස්-වලින් හිස පුරවාගත් තැනැත්තකු හැටියට ඔහු විස්තර කෙළේ ය. "යුතුකම් ඉටු කිරීම පිළිබඳ ඇතැම් නවීන සිද්ධාන්ත ඔහු සවාමියා ගේ නොහික්මුණු ජීවිතයෙන් ලැබූ අත්දැකීමෙන් ඉගෙන ගත්තා. ඔහු ගේ සවාමියා වන මහලු කරමසෝ සමහරවිට ඔහු ගේ පියා වෙන්නට ද පුළුවනි. ඒ අතර ඉවාන් කරමසෝ සමඟ කළ දාර්ශනාත්මක කතාබහින් ඔහු යුතුකම් ඉටුකිරීම පිළිබඳ සිද්ධාන්ත ඉගෙන ගත්තා. ඉවාන් කරමසෝ ඔහැ කමින් ම දාසයා සමඟ ගැඹුරු දහම් ගැන සාකච්ඡා කළේ ජීවිතයේ නීරස ගතියෙන් නිදහස් වීමට විය යුතුයි. නැතිනම් කරන්නට වෙන දෙයක් නැති නිසා, ඉන් විනෝදයක් ලබා ගැනීමට විය යුතුයි. සවාමියා ගේ ගෙදර නතර වී සිටි අන්තිම දවස් සවල්පය තුළ දී තමා ගේ මානසික තත්ත්වය ගැන විස්තරයක් පැවල් මා සමඟ කිව්වා. පැවල් ගේ මානසික තත්ත්වය, සිරකරුවා, ඔහු ගේ සහෝදරයා, සහ වෙනෙකක් පවා මහලු ගිරිගෝරිස් ද දැන ගෙන හිටියා.

"එ පමණක් නො වෙයි; නිතර මිමැස්මොරයෙන් අසනීප වන 'පැවල්ට කුකුළ් පැටියකුට තරම්වත් ධෛර්‍යයක් තිබුණේ නැහැ. මිනිහා මගේ දෙපා ළඟ බිම වැටී දෙපා සිඹිබා'යි සිරකරුවා අප සමඟ කිව්වා. ඒ ප්‍රකාශය තමාට කො තරම් අවාසියක් ද කියන වග ඔහු තේරුම් ගත්තේ නැහැ. සිරකරුවා, මේ දාසයා විශ්වාසදායක පුද්ගලයකු ලෙස පිළිගෙන, බය කොට, අන්තිමේ දී පියාට විරුද්ධ ව තමාට ඔත්තු කීමට කැමැති කරවා ගත්තා. දාසයා ද මුදල් සමඟ ලියුම් කවරය තියෙන තැන, ගෙට ඇතුළු

වීමට උවමනා වූ විට දෙරට තට්ටු කරන හැටි, සිරකරුවාට කියා දී, තම ස්වාමියාට ද්‍රෝහිකම් කළා. 'මං කොහොම ද මේවා නො කියා ඉන්නේ? නො කිව්වොත් මිනියා කරමසෝ මා මරාවි' යයි ඔහු අප ඉදිරිපිට හිතියෙන් වෙවුලමින් කිව්වා. ඒ වෙලාවේ ඔහු ගේ වදකයා වන මිනියා කරමසෝ සිරභාරයේ සිටියේ. එහෙත් ඔහුගෙන් හිරිහැරයක් වේ ය කියා පැවල් කතා කිරීමට භය වුණා. 'ඔහු නිතර මා අවිශ්වාස කළා. මම බියෙන් වෙවුලමින් ඔහු ළඟට ගොස්, ඔහුට හැම දෙයක් ම කිව්වේ මා විශ්වාස කොට, මා නො මරා යන්න හරීවි ය යන අදහසින්. මට බණින කොට මම ඔහු ගේ දෙපා ළඟ බිම වැටෙනවා.' මේවා පැවල් ගේ කටින් පිට වූ වචනයි. මම ඒ වචන ලියාගත්තා. දූන් මට ඒවා හොඳට මතකයි.

''පැවල් බොහො ම අවංක දාසයෙක්. වරක් ඔහු ස්වාමියා ගේ නැති වූ මුදල් සොයා දුන්නා. එදා ඉඳලා ඔහු ස්වාමියා ගේ විශ්වාසය සම්පූර්ණයෙන් ම දිනා ගත්තා. ඒ නිසා තමා රැක-බලාගත්, තමා ආදරය කළ තම ස්වාමියාට ද්‍රෝහි වූ දා සිට ඔහු බලවත් සිත් වේදනාවකින් සිටින්නට ඇතැයි අපට විශ්වාස කරන්න පුළුවනි. දක්ෂ දෙස්තරවරු අපට පෙන්නා දී තියෙනවා බොහො ම තදින් මිමැස්මොරය වැලඳෙන අය නිතර ම වාගේ තමන්ට දෙස් කියා ගන්නා බව. තමන් ගේ නපුරු-කම් ගැන නිතර දුක්වෙනවා ලු. කිසි ම හේතුවක් නැති ව නිතර සිත් වේදනාවෙන් පෙළෙනවා ලු. නොකළ වැරැදි, නොකළ අපරාධ, කළ බවට සිතින් මවාගෙන දුක්වෙනවා ලු. බය ගැන්වීමෙන් වැරැදි කිරීමට පොළඹවන ලද එවැනි මිනිහෙක් දූන් අපට දකින්න සිටිනවා.

''තමා ගේ නෙත් ඉදිරිපිට සිදුවන මේ දෙයින් කිසියම් භයානක ප්‍රතිඵලයක් ඇති වෙනවා ය යන දැඩි හැඟීමක් මේ දාසයා තුළ තිබුණා. මේ භයානක විපත්තිය සිදුවීමට කලින්, ඉවාන් කරමසෝ මොස්කව් නුවරට යන්න සූදානම් වන විට, එසේ නො යන ලෙස ඔහු ඉවාන් කරමසෝගෙන් ඉල්ලා සිටියා. සිදුවන්නට යන දෙය ඉවාන් කරමසෝට කීමට ඔහු බය වුණා. කෙළින් නො කියා ඉඟියකින් කීමට ඔහු වෑයම් කළා. නමුත් දාසයා කළ ඒ ඉඟිය ඉවාන් කරමසෝට තේරුණේ නැහැ.

''පැවල්, ඉවාන් කරමසෝ ආරක්ෂකයකු ලෙස පිළිගත් බව මෙහි දී මතක් කළ යුතුයි. ඉවාන් කරමසෝ ගෙදර

සිටියොත් භයානක දෙයක් සිදු නොවන බව පැවෙල් විශ්වාස කළා. 'ඉවාන් ගෙදරින් ගියොත් මම නාකියා මරනවා' කියා සිරකරුවා බේබදු ලියුමේ ලියා තිබුණා නමුත්නාත්සේලාට මතකයි නේද? ඉතින්, ඉවාන් කරමසෝව් ගෙදර සිටීම, ගෙදර සාමයටත් යහපත් පාලනයටත් හේතු වන බව කාටත් පෙනී ගියා.

"නමුත් ඔහු යන්න ගියා. තමාගේ තරුණ ස්වාමියා තික්ම ගොස් පැයක් යන්නට කලින් පැවෙල්ට මීමැස්මොරය හැදුණා. ඒක අපට තේරුම් ගන්න පුළුවනි. භීතියෙන් හා බලාපොරොත්තු කඩවීමෙන් ඇති වූ දුකින් සිටි පැවෙල්ට, විශේෂයෙන් ම ඒ අන්තිම දවස් ස්වල්පය තුළ දී තමා, ආයේත් මීමැස්මොරයෙන් අසනීප වේ ය කියා දැනුණ බව, මෙහි දී සඳහන් කළ යුතුයි. මීට පෙර මෙ වැනි නොසන්සුන් අවස්ථාවල දී, තමාට අසවල් දින අසවල් වේලාවේ දී, හිටිහැටියේ ම මීමැස්මොරය හැදෙනවා ය කියා කල් ඇති ව කීම අපහසුයි. නමුත් හැම මීමැස්මොර කාරයකුට ම, අසනීප වීමට කලින් ඒ බව කල් තියා කියන්න පුළුවනි. දොස්තරවරු ඒ බව කියා තියෙනවා. ඉවාන් කරමසෝව් රථයට නැඟ තික්ම ගිය වහා ම, තනිකමින් හා ආරක්ෂාවක් නැති කමින් තැති ගෙන සිටි පැවෙල්, යම් කිසිවක් ගැනීම සඳහා කැඩැන්ගුවට ගිහින් තරප්පුව බසින අතර 'මට මීමැස්මොරය හැදෙයි ද නැද්ද? හදිසියෙන් ම හැදුණොත් මොකද කරන්නේ?' කියා කල්පනා කළා. එම කල්පනාවත්, ඒ සමඟ ඇති වූ බියත් නිසා ඔහු ගේ දත කට පියැවී, තරප්පුව දිගේ කැඩැන්ගුවට ඇද ගෙන වැටුණා. ඒක අපට පිළිගත හැකි ස්වාභාවික දෙයක්. එහෙත් පැවෙල් බොරු ලෙඩක් හදා ගත්තා ය කියා සමහරෙක් කල්පනා කරනවා. හොඳයි, බොරු ලෙඩක් හදාගත්තා නම් එ වැනි දෙයක් කළේ කුමන අදහසක් ඇති ව ද? යන ප්‍රශ්නය පැනනගිනවා. අපි වෛද්‍ය ශාස්ත්‍රයෙන් ලැබෙන පිළිතුරු පැත්තකින් තියමු. විද්‍යාවේ නොයෙක් විට වැරැදි සිදුවන බව මිනිස්සු කියනවා, බොරුව හා ඇත්ත අතරේ ඇති වෙනස දොස්තරවරුන්ට සොයන්න බැරි වී තියෙනවා. ඒක එහෙම වෙන්න පුළුවනි. නමුත් මේ ප්‍රශ්නයට පමණක් මට පිළිතුරු දෙන්න. පැවෙල් එවැනි බොරුවක් කළේ කුමන හේතුවක් ඇති ව ද? ඔහු මහලු කරමසෝව් මැරීමට කුමන්ත්‍රණය කොට, මිනීමැරුමට පෙර බොරු ලෙඩක් හදාගෙන, ගෙදර ඇත්තන් ගේ සැලැකිල්ල ඔහු වෙත ඇද ගැනීමට අදහස් කළා ද?

"ජූරි සභාවේ මහත්වරුනි, මිනීමැරුම සිදු වූ දවසේ මහ ගෙදර පස් දෙනෙක් හිටියා. මහලු කරමසෝව් හිටියා, නමුත් ඔහු පණ නහ නොගත් බව අපි හොඳට දන්නවා. ග්‍රිගෝරිස් හිටියා. මිනිහටත් මැරෙන තරමට හිසට ගසා තිබුණා. ගෙදර සිටිය තුන් වන තැනැත්තිය මාෆා. මාෆා ඇගේ ස්වාමියා මැරුවා ය කියා කල්පනා කිරීම ලැජ්ජාවිය යුතු දෙයක්. එහි සිටිය අනෙක් සැකකරුවත් දෙදෙනා සිරකරුවා හා පැවල් පමණයි. තමා ගේ පියා මැරුවේ තැතැයි සිරකරුවා කියන කතාව අපි විශ්වාස කරනවා නම් මිනීමරුවා පැවල් විය යුතු ය යන අදහස පිළිගත යුතුයි. සැක කළ හැකි වෙන කෙනෙක් එදා ගෙදර හිටියේ නැහැ. ඒයේ පණ ඛාහගත්ත ඒ අවාසනාවන්ත මෝඩයාට විරුද්ධ ව පුදුමාකාර චෝදනාවක් ඉදිරිපත් කර තියෙන්නේ අන්න ඒ කාරණාව නිසයි. එදා ඒ ගෙදර හය වන තැනැත්තෙක් හිටියා නම්, මට හොඳට විශ්වාසයි සිරකරුවා වුවත්, මිනීමරුවෙක් ය කියා පැවල්ට විරුද්ධ ව චෝදනා කිරීමට ලැජ්ජා වෙනවා ඇති. ඒ වෙනුවට ඔහු හය වන තැනැත්තාට විරුද්ධ ව චෝදනා කරනවා ඇති. මන් ද? මහලු කරමසෝව් මැරුවා ය කියා පැවල්ට චෝදනා කිරීම අර්ථයක් නැති කතාවක් නිසයි.

"ජූරි සභාවේ මහත්වරුනි, අපි මානස ශාස්ත්‍රය පසකින් තබමු. වෛද්‍ය ශාස්ත්‍රය පසකින් තබමු. වෙනෙකක් තබා තර්ක ශාස්ත්‍රයත් පසකින් තබමු. අපි ඇත්ත කරුණු පමණක් ගෙන ඉන් පැවසෙන අදහස් මොනවා දැයි සොයා බලමු. පැවල් මහලු කරමසෝව් මැරුවා නම් ඔහු එය කළේ කොහොම ද? තනියෙන් ද? නැති නම් සිරකරුවා ගේ උපකාරය ඇති ව ද? ඔහු මේ මිනීමැරුම තනියෙන් කළා ය කියන කතාව ගෙන පරීක්ෂා කොට බලමු. ඔහු එය තනියෙන් කළා නම් ඉන් කිසියම් ලාභ ප්‍රයෝජනයක් බලාපොරොත්තු ව කරන්න ඇති. එහෙත් සිරකරුවා තුළ තිබුණු වෛරය, ඊර්ෂ්‍යාව ආදී කිසි ම හැඟීමක් පැවල් තුළ තිබුණේ නැහැ. පැවල් ඔහු ගේ ස්වාමියා මරන්න ඇත්තේ ලියුම් කවරයේ තිබුණු රූබල් තුන් දහ ගැනීමේ චේතනාවෙන් විය යුතුයි. නමුත් ඔහු, මේ මුදල් ගැන ලොකු සැලැකිල්ලක් දැක්වූ තවත් කෙනකුට, එ නම් සිරකරුවාට, මුදල් ගැන සියලු ම තොරතුරු, මුදල් සමඟ ලියුම් කවරය තියෙන තැන, ලියුම් කවරයේ ලියා ඇති දෙය, එය ගැට ගසා තියෙන හැටි, ඒ සියල්ලටම වඩා, ගෙට ඇතුළු වීම සඳහා දොර ඇර ගැනීමට දොරට තට්ටු කරන හැටි කියා දුන්නා.

ඔහු මේ සේරම කළේ තමා පාවා දීමට ද? නැතිනම් එම මුදල් බලාපොරොත්තු ව සිටින තවත් අයෙක් කැඳවා ගැනීම පිණිස ද? ඔහු මේ සියලු ම තොරතුරු කිව්වේ සිරකරුවාට ඇති භයෙන් ය කියා මට කෙනෙක් කියන්න පුළුවනි. එය විශ්වාස කළ හැකි ද? මෙවැනි ම්ලේච්ඡ ක්‍රියාවක් කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීමට පසුබට නොවූ, අනතුරු ව එය ක්‍රියාත්මක කළ කෙනෙක්, මේ ලෝකේ තමා හැර වෙන කිසි ම කෙනෙක් නො දන්නා, නිහඬ ව සිටියොත් කිසි ම කෙනකුට කිසි ම කලක සැක කළ නොහැකි කරුණු කියාවි ය කියා ඔබ සිතනව ද?

"නැහැ, ජූරි සභාවේ මහත්වරුනි, ඔහු කො තරම් බියසුල්ලකු වුවත්, ඔහු මේ අපරාධය කිරීමට සැරසුණා නම් මුදල් සහිත ලියුම් කවරය පිළිබඳ විස්තර සහ ගෙට ඇතුළු වන ක්‍රමය කිසි ම කෙනකුට කියන්නේ නැහැ. එය මිනීමැරුමට කලින් තමා පාවා දීම වැනි ක්‍රියාවක්. සිරකරුවා බලකර සිටියා නම් බොරුවක් කියන්න ඉඩ තිබුණා. නමුත් ඔහු නිහඬ ව සිටියා. මම නැවත වරක් කියනවා, ඔහු මුදල් ගැන නිහඬ ව සිටියා නම්, මුදල් සොරා ගැනීම පිණිස මිනීමැරුවේ ය කියා ඔහුට මේ ලෝකේ කිසි ම කෙනෙක් චෝදනා කරන්නේ නැහැ. මන්ද? ඔහු හැර කිසි ම කෙනෙක් ගෙදර මුදල් තියෙන බව දැන ගෙන හිටියේ නැහැ. මිනීමැරුම ගැන ඔහුට චෝදනා කරනු ලැබුවත් මුදල් සඳහා මිනීමැරුවේ ය යන චෝදනාවට අහුවෙන්නේ නැහැ. වෙන අදහසක් නිසා මරන්න ඇතැයි කල්පනා කරන්න පුළුවනි. එ වැනි අදහසක් ඔහු තුළ තිබුණ බව කිසි ම කෙනෙක් දැන ගෙන හිටියේ නැහැ. ඒ වෙනුවට ඔහු ගේ ස්වාමියා ඔහුට විශ්වාසයෙන් සැලැකූ බව කවුරුත් දැන සිටිය නිසා කිසි ම කෙනෙක් මිනීමැරුම ගැන ඔහු සැක කරන්නේ නැහැ. මහලු කරමසෝ මැරීමේ අදහසින් සිටිය තැනැත්තා, ඒ බව එළිපිට පැවසූ තැනැත්තා, කොටින් කියතොත් මැරුම් කෑ තැනැත්තා ගේ පුත්‍රයා වන මිතියා කරමසෝ ගැන සැක කරනවා ඇති. පැවල් මහලු කරමසෝ මරා මුදල් සොරා ගත්තා නම්, මිනීමැරුම සම්බන්ධ ව ඔහු වෙනුවට කරමසෝ ගේ පුතා මිතියා කරමසෝ සැක කරනු ලැබුවා නම්, ඒ ගැන පැවල් සතුටු වෙනවා ඇති. එහෙම නො වේ ද? එහෙත් මහල්ලා මැරීමට කුමන්ත්‍රණය කරන අතරේ, මහල්ලා ගේ පුතාට ගෙදර මුදල් තියෙන තැනත්, ගෙට ඇතුළු වන හැටිත් හෙළිකරාවි ය කියා අපට විශ්වාස කරන්න පුළුවන් ද? එය තර්කයට ගැළපෙනවා ද?

"පැවල් මහල්ලා මැරීමට නියම කරගත් දිනය පැමිණියා. මොකද පැවල් කළේ? බොරු මීමැස්මොරයක් හදාගෙන තරප්පුව දිගේ කැඩැත්ගුවට ඇදවැටුණා. පැවල් එහෙම කළේ කුමන අදහසක් ඇති ව ද? පළමු වැන්න: එදා බෙහෙත් බීමට සූදානම් වී සිටි ගිරිගෝරිස් බෙහෙත් බීම කල් දමා, මහ ගෙය බලා ගැනීමට කෙනෙක් නැති නිසා, ඒ කටයුත්ත කරන්නට යනවා ඇති. දෙවන කාරණාව: තමා ආරක්ෂා කර ගැනීමට කෙනෙක් නැති නිසා, මහලු කරමසෝව් වැඩිමල් පුතා පැමිණේ ය යන බියෙන්, පෙරට වඩා පරීක්ෂාවෙන් සිටිනවා ඇති. අන්තිම කාරණාව: මීමැස්මොරයෙන් අසනීප වූ පැවල්, ඔහු නිතර නිදාගන්නා මුළුතැන් ගෙයි සිට ගෙයි අනෙක් කෙළවර තියෙන ගිරිගෝරිස් ගේ කාමරයට ගෙනියනවා ඇති එහි දී ගිරිගෝරිස් ගේ ඇඳ ළඟ සිට අඩි තුනක් ඈතින් තියෙන බිත්තියේ අනෙක් පැත්තේ තබා ඇති ඇඳේ ඔහු තබනවා ඇති. ඔහු ගේ මහලු සවාමියාත්, කරුණාබර හදවතක් ඇති මාපාත් පැවල්ට අසනීප වූ හැම විට ම නිදාගැනීමට ඉඩ සලසා දෙන්නේ මෙ තැනයි. මෙසේ ඇඳ උඩ නිදා සිටින පැවල් තමා අසනීපයෙන් සිටින බව පෙන්වීම පිණිස බොරුවට කෙඳිරිගානවා ඇති. මේ කෙඳිරිගෑම නිසා ගෙදර සිටින අයට මුළු රෑ ම නිදා ගැනීමට ඉඩ ලැබෙන්නේ නැහැ. (ගිරිගෝරිස් ගේ හා මාපා ගේ සාක්ෂි අනුව පැවල් එළිවන තෙක් කෙඳිරි ගෑවා.) මේ සේරම කරන්නේ මොනවට ද? ඇඳෙන් නැගිට ගොස් මහලු කරමසෝව් මැරීමට පහසුවන නිසයි.

"නිසිවකු තුළ තමා ගැන අවිශ්වාසයක් ඇති නොවන ලෙස පැවල් බොරු ලෙඩ හදාගත් බවත්, සවාමියා මැරීම පිණිස මුදල් සඟවා තියෙන තැනත්, ගෙට ඇතුළු වන පිළිවෙළ සිරකරුවාට කියා දුන් බවත්, සිරකරුවා ගෙට ඇතුළු වී සවාමියා මරා මුදල් සොරාගෙන, නිදා සිටි අය අවදිවන ලෙස විශාල ඝෝෂාවක් නගාගෙන පැන ගිය බවත්, ඊට පස්සේ පැවල් ඇඳෙන් නැගිට ගිය බවත් ඔබ මට කියන්න පුළුවනි. හොඳයි, පැවල් ඇඳෙන් නැගිට මහ ගෙය ඇතුළට ගියේ මොනවට ද? දෙවන වරටත් සවාමියා මරා, සොරකම් කරන ලද මුදල් ඈසේත් සොරකම් කර ගැනීමට ද? ජූරි සභාවේ මහත්වරුනි, තමුන්නාන්සේලා සිනාසෙනවා ඇති. මෙ වැනි තර්කයක් ඉදිරිපත් කළ මට මහත් ලැජ්ජවක්. නමුත් සිරකරුවා ඉදිරිපත් කරන්නේ මෙ වැනි අදහසක්. සිරකරුවා අපට කියනවා 'මා ගිරිගෝරිස්ට පහර දී කලබලයක් කොට පැන ගියාට පස්සේ පැවල් මහ ගෙට ඇතුළු වී, මහලු කරමසෝව් මරා

මුදල් ගත්තා'ය කියා. පැවල් මෙ වැනි වැඩ පිළිවෙළක් කලින් සකස් කළා ය කියා මා අදහස් කරන්නේ නැහැ. ඒ කියන්නේ, පියා සමඟ බද්ධවෛරයෙන් පසුවන පුතා වත්තට පැන මහ ගෙට ඇතුළු වන ක්‍රමය දැනදැනත් එසේ නො කොට, කවුළුවෙන් බොහො ම හරසර දක්වා එබී බලා, පැවල්ට මුදල් ගන්න ඉඩ තබා පැන ගියා ය කියා හිතන්න පුළුවන් ද? ජූරි සභාවේ මහත්වරුනි, මා මේ ප්‍රශ්නය ඔබගෙන් ඇසීමට කැමැතියි. පැවල්, මහලු කරමසෝ මරන්නට ඇත්තේ කොයි වේලාවේ දී ද? මට ඒ වේලාව කියන්න. නැති නම් ඔහුට චෝදනා කිරීමට තමුන්නාන්සේලාට පුළුවන් කමක් නැහැ.

"සමහර විට ඔහුට වැලඳුණු අසනීපය සැබෑවක් වෙන්න පුළුවනි. අසනීපයෙන් සිටි පැවල්ට හදිසියෙන් ම ශබ්දයක් ඇසී නින්ද සිටි ඇඳෙන් නැඟිට එළියට ගියා. ඉතින් ඊට පස්සේ මොකද වුණේ? ඔහු වටපිට බලා 'ඇයි මහ ගෙට ගොස් නාකියා නො මරන්නේ?' කියා තමාගෙන් ම ඇසුවා. ඒ මොහොත වන තෙක් කිසි ම සිහියක් නැති ව හිටිය මේ මිනිහා සිදු වූ දෙය දැනගත්තේ කොහොම ද? ජූරි සභාවේ මහත්වරුනි, සිතේ මවා ගන්නා මෙ වැනි සිතිවිලිවලට පවා සීමාවක් තිබිය යුතුයි.

"'තුඹේ කතාව හරි වෙන්න පුළුවනි'යි තීක්ෂ්ණ කල්පනා ශක්තියක් ඇති අය කියන්න පුළුවනි. 'දෙදෙනා ම එකතු වෙලා මහලු කරමසෝ මැරීමට කුමන්ත්‍රණය කළා නම්, අන්තිමේ දී ඔහු මරා මුදල් බෙදා ගත්තා නම් මොකද වෙන්නේ?' කියා ඔවුන් මගෙන් ප්‍රශ්න කරන්න පුළුවනි.

"ඒක බොහො ම බර ප්‍රශ්නයක්. සලකා බැලිය යුතු වැදගත් ප්‍රශ්නයක්. ඊට පක්ෂ ව වැදගත් සාක්ෂි තියෙන නිසා සලකා බැලිය යුතු ප්‍රශ්නයක්. මහා කුමන්ත්‍රණකාරයෙක් සියලු බර කරට ගෙන මිනීමරන අතර අනෙක් කුමන්ත්‍රණකාරයා බොරු ලෙඩක් හදාගෙන නිදා ඉන්නවා. මොනවට ද? ගෙදර ඉන්න අය තුළ සැක ඇති කරලා ස්වාමියා හා ගිරිගෝරිස් තුළ බය ඇති කිරීමට ය. වෙන මොනවට ද? මේ මිනිසුන් දෙදෙනා මෙ වැනි උමතු වැඩපිළිවෙළක් අනුගමනය කළේ කුමන අදහසක් ඇති ව ද කියා සොයා බැලීම වැදගත් වන්නට පුළුවනි.

"සමහර විට පැවල්ට එ තරම් වැදගත් කොටසක් හිමි නො වන්නට පුළුවනි. පැවල් වැනි ලෙඩකුට කළ හැකි සුළු කොටසක් පමණක් හිමිවන්නට ඇති. මහලු ස්වාමියා මරා දැමීමට අවහිර

නොකරන ලෙස තැති ගත්වා, එකඟ කරවා ගත්ත ඇති. ස්වාමියා මරන විට එය වැළැක්වීම පිණිස උපකාර ඉල්ලා කෑ නො ගැසීමෙත්, අවහිරයක් නො කිරීම නිසා හෝ තමා ද මිනීමැරුමට සහයෝග වූයේ ය යන චෝදනාවට අසුවේ ය යන බියෙන් යුතු ව 'නමුත්නාත්සේ කැමැති විදියකට තාත්තා මරත්න. ඒ ගැන මගේ කිසි ම සම්බන්ධයක් නැහැ' කියා බොරු ලෙඩක් හදාගෙන ඇඳේ සිටීමට පැවල් සිරකරුවාගෙන් අවසර ගත්ත ඇති ඒ වුණත් පැවල් අසනීප වුණොත් ගෙදර ලොකු කලබලයක් ඇති වන බව දැන සිටිය සිරකරුවා කවදාවත් පැවල් ගේ අදහසට එකඟ වෙන්නේ නැහැ. අපි ඒ තර්කය එ තැනින් අවසන් කොට අනෙක් පැත්ත ගෙන බලමු. හොඳයි, සිරකරුවා පැවල් ගේ අදහසට එකඟ වුණා යයි කියමු. එහෙම වුණොත් සිරකරුවා තමයි නියම මිනීමරුවා මිනීමැරුමට කුමන්ත්‍රණය කළේත් ඔහු මයි. පැවල් ආධාරකාරයෙක් පමණයි. සිරකරුවා කෙරෙහි පැවැති බිය නිසා නො කැමැත්තෙන් ම එකඟ වුණා පමණයි. එහෙම දෙයක් තිබුණා නම් ඒක නඩු විභාගයේ දී හෙළි වෙනවා. නමුත් කුමක් ද වුණේ? සිරකරුවා සිරභාරයට ගත්ත වහා ම වරද පැවල් පිට පටවා ඔහු තනියෙන්ම තාත්තා මැරුවා ය කියා චෝදනා කළා. 'ඌ තනියෙන් ම තාත්තා මැරුවා මරලා මුදල් හොරකම් කළා' කියා චෝදනා කළා. එකපාර ම එකිනෙකාට චෝදනා කරගන්නා මේ මිනිස්සු මොන විදියේ හවුල්කාරයෝ ද? මෙයින් සිරකරුවා කො තරම් භයානක තත්ත්‍වයකට පත්වනවා ද කියා සිතා බලන්න. සහකාරයා ඇඳේ නිදා සිටින අතර සිරකරුවා ඔහු ගේ පියා මරා ඒ වරද ඇඳේ නිදා සිටි රෝගියා පිට පටවනවා. පැවල්ට තිබුණා මිනීමැරුමට තමා ගේ ඇති අසතුට පෙන්නා ආත්මාරක්ෂාව පතා ඇත්ත කියන්න. 'අපි දෙන්නා මිනීමැරුමට කතිකා කරගත්ත බව ඇත්තයි. නමුත් මම සම්බන්ධ වුණේ නැහැ. ඔහුට තිබුණු බය නිසා මිනීමැරුමට ඔහුට ඉඩ දී මම අයින් වුණා' යයි කියන්න තිබුණා. තමන් කළ වරදෙහි ඇති වෙනස බලා ඒ අනුව දඬුවම් කළොත්, මිනී මරා තමා පිට වරද පටවන තැනැත්තාට ලැබෙන දඬුවමට වඩා අඩු දඬුවමක් තමාට ලැබෙන්න පුළුවන් ය කියා පැවල් කල්පනා කරන්න ඇති. ඔහු එසේ කල්පනා කළා නම් මිනීමැරුම ගැන ප්‍රකාශයක් කරනවා ඇති. නමුත් ඔහු එ වැනි දෙයක් කළේ නැහැ. නියම මිනීමරුවා පැවල් ය, ඔහු තනියෙන් ම මේ අපරාධය කළා ය කියා නිතර නිතර චෝදනා කරන විට පවා පැවල් මිනීමැරුමට හවුල් වූ බවක් කිව්වේ නැහැ. එ පමණක් නො වෙයි.

සිරකරුවාට, මුදල් සමග ලියුම් කවරය තියෙන තැනත්, ගෙට ඇතුළු වන ක්‍රමයත් කියා දුන්නේ තමා බවත්, තමා නොමැති නම් සිරකරුවාට එම තොරතුරු කිසිවකු ගෙන් දැනගත නොහැකි බවත්, පැවල් පරීක්ෂණයේ දී සිය කැමැත්තෙන් ම ප්‍රකාශ කළා. ඔහු මේ මිනීමැරුමට සම්බන්ධ වුණා නම් සිය කැමැත්තෙන් ම එවැනි ප්‍රකාශයක් කරයි ද? ඒ වෙනුවට ඔහු ඇත්ත සඟවනවා ඇති නැති නම් නොපිට පෙරළා කියනවා ඇති. නමුත් ඔහු එවැනි දෙයක් කළේ නැහැ. මිනීමැරුමට සම්බන්ධ වූයේ ය යන චෝදනාවට කිසි ම භයක් නැති, අවංක මිනිහකුට පමණයි එවැනි ප්‍රකාශයක් කළ හැක්කේ. අසනීපය හා මේ භයානක විපත්තිය නිසා ඇති වූ ශෝකය ඉවසා ගත නොහැකි වූ පැවල් ඊයේ එල්ලී මළා. 'කිසිවකු වරදට අසු නොකිරීම පිණිස මම සිය කැමැත්තෙන් ම පණ නහ ගතිමි' කියා අමුතු විදියේ ලියුමක් ලියා තිබුණා. 'මහලු කරමසෝෆ් මැරුවේ මීතියා කරමසෝෆ් නො ව මා ය' කියා එම ලියුමේ ලියන්න ඉඩ තිබුණේ නැද්ද? ඔහු එවැනි දෙයක් ලිව්වේ නැහැ. ඔහු ගේ සිත පණ නහ ගැනීමට ඉඩ දෙන අතර, වරද පිළිගැනීමට ඉඩ නුදුන්නේ මන්ද?

"ඊට පස්සේ මොකද වුණේ? දැන් ටිකකට කලින් රූබල් තුන් දහක් මේ උසාවියට ඉදිරිපත් කරනු ලැබුවා. එම මුදල් මේ මේසය උඩ තියෙන ලියුම් කවරයේ තිබුණු මුදල් බවත්, තමාට ඒ මුදල් දවසකට කලින් පැවල්ගෙන් ලැබුණු බවත්, සාක්ෂිකාරයා කියා සිටියා. ජූරි සභාවේ මහත්වරුනි, ඊයේ සිදු වූ කනගාටුදායක සිද්ධිය නුඹුත්නාත්සේලාට මතක ඇති. ඒ ගැන දිග විස්තරයක් කිරීමට මා කැමැති නැහැ. එහෙත් බැලූ බැල්මට නො පෙනෙන ඉතා සුළු කරුණු කීපයක් පමණක් තෝරා ගෙන විස්තර කිරීමට මා කැමැතියි. මා මේ ඉතා සුළු නො වැදගත් කරුණු ගැන පමණක් සඳහන් කරන්නේ ඒවා අමතක වීමට ඉඩ තිබෙන නිසයි. පළමු ව පැවල් මුදල් ආපසු දී ශෝකයෙන් එල්ලී මැරෙන්න ඇති. ඉවාන් කරමසෝෆ් කියන විදියට පැවල් මහලු කරමසෝෆ් මැරූ බව පිළිගෙන තියෙන්නේ ඊයේයි. එය එසේ නො වේ නම්, අද වන තුරු ඉවාන් කරමසෝෆ් නිහඬ ව සිටියේ මන්ද? හොඳයි, අන්තිමේ දී ඔහු මිනීමැරූ බව පිළිගත්තා නම් ඒ බව ඔහු ගේ අන්තිම ලියුමේ ලියා නො තිබ්බේ මන්ද කියා මම ආයේත් ප්‍රශ්න කරනවා. නිර්දෝෂී, අහිංසක, සිරකරුවා එම වරදට නිරපරාදේ අසුවන බව දැනදැනත් ඒ බව ලියුමට ඇතුළත් නො කළේ මන්ද? කියා මම ප්‍රශ්න කරනවා.

"මුදල් ඉදිරිපත් කළ පමණින් කාරණාව ඔප්පු කරන්න බැහැ. මීට සතියකට පෙර හදිසියෙන් ම වාගේ, මා ඇතුළු මේ උසාවියේ සිටින තවත් දෙදෙනකුට දැනගන්න ලැබුණා ඉවාන් කරමසෝව් සියයට පහ ගණනේ රූබල් පන්දහේ කූපන් දෙකක්, ඒ කියන්නේ රූබල් දස දහසක් මාරු කිරීම පිණිස මෙම පළාතේ ප්‍රධාන නගරයට යැව්වා ය කියා. මා මේ කාරණාව සඳහන් කළේ ඕනෑ ම කෙනකු ළඟ මුදල් තිබිය හැකි බවත්, දැන් උසාවියට ඉදිරිපත් කරන ලද මුදල් ලියුම් කවරයේ තිබුණු මුදල් බව ඔප්පු කළ නොහැකි බවත්, පෙන්නා දීම පිණිසයි. ඊයේ තියම මිනීමරුවා ගැන එ තරම් වැදගත් ආරංචියක් ලැබුණු පසුවත්, ඉවාන් කරමසෝව් ඒ ගැන කිසිවක් නො කොට ගෙදරට වී සිටියා. මන්ද ඔහු ඒ ගැන වහා ම පැමිණිලි නොකළේ? ඒ ගැන ක්‍රියා කිරීමට ඇයි පසු දින එළිවනතෙක් බලා සිටියේ? මා හිතනවා මේ ගැන සොයා බැලීමට මට අයිතියක් තියෙනවා ය කියා. සතියක සිට ඉවාන් කරමසෝව් අසනීපයෙන් සිටියා. තමාට මිය ගිය අය ගේ අවතාර හා නොයෙක් විකාර දේවල් පෙනෙන බව ඔහු දොස්තරට හා ඔහු ගේ හිතවතුන්ට ද කියා තියෙනවා. ඔහුට මොළයේ උණ වැළඳෙන්න ආසන්න ව සිටියා. අද ඔහුට මොළයේ උණ ගැනුණා. මෙ වැනි තත්ත්වයක සිටින විට ඔහුට හදිසියෙන් ම පැවල් ගේ මරණය ගැන ආරංචි වුණා. 'දැන් මිනිහා මළා. ඔහු පිට වරද පටවා සහෝදරයා නිදහස් කර ගන්න පුළුවනි. මා ළඟ මුදල් තියෙනවා. මුදල් ටිකක් අරගෙන ඒ මුදල්, පැවල් මැරෙන්නට කලින් මට දුන්න බව කියන්න පුළුවනි'යි කීමට ඔහු අදහස් කළා. එය අධර්මිෂ්ඨ කමක් යයි තමුත්නාත්සේලා සිතන්න පුළුවනි. තමා ගේ සොහොයුරා බේරා ගැනීමේ චේතනාවෙන් පවා මිය ගිය අය ගැන බොරු කීම අධර්මිෂ්ට කමක් තමයි. එහෙත් ඔහු කල්පනාවෙන් ම බොරුවක් කිවා නම් මොකද වෙන්නේ? දූසයා ගේ මරණය පිළිබඳ පුවතින් සිහිය අවුල් වී, දූසයා පියා මැරුවා ය කියා කල්පනා කළා නම් මොකද වෙන්නේ? දැන් ටිකකට කලින් මෙහි සිදු වූ දෙය තමුත්නාත්සේලා දකින්න ඇති. ඉවාන් කරමසෝව් ගේ සිහි කල්පනාවේ තත්ත්වය තමුත්නාත්සේලා දකින්න ඇති. ඔහු දෙපයින් නැඟී සිට කතා කළ මුත් ඔහු ගේ සිහිය කොහෙ ද තිබුණේ? මිනීමැරුමට දෙ දිනකට කලින් මිනීමැරුම ගැන සම්පූර්ණ විස්තරයක් ඇතුළත් ලියුමක් සිරකරුවා විසින් කැතිරිනා වෙත යවා තිබුණා. ඒ ලියුම ඉවාන් කරමසෝව් ගේ සාක්ෂියෙන් පසු උසාවියට ඉදිරිපත් කරනු ලැබුවා. මිනීමැරුම පිළිබඳ සියලු විස්තර ඇතුළත් ලියවිල්ලක් තිබිය දී අපි

මොහාවට ද වෙනත් සාක්ෂි හොයන්නේ? හරියට ම ලියුමේ ලියා තිබුණු විදියට මයි මිනීමැරුම සිද්ධ වුණේ. එහි කර්තෘ අප ඉදිරිපිට සිටින මේ සිරකරුවා මිස වෙන කෙනෙක් නො වෙයි. ජූරි සභාවේ මහත්වරුනි, මිනීමැරුම හරියට ම ලියුමේ ලියා තිබුණ පිළිවෙළට කිසි ම බාධාවක් නැති ව සිද්ධ වුණා. තමා පතන තරුණිය පියා සමඟ කාමරයේ සිටින බව දැනදැනත් ඔහු කාමරයේ කවුළුව ළඟ සිට, බියෙන් හා ගෞරවයෙන් යුතු ව පැනල ගියේ නැහැ. ජූරි සභාවේ මහත්වරුනි, එය සිදුවිය හැකි දෙයක් නො වෙයි. ඔහු ගෙට ඇතුළු වී පියා මරා දැම්මා. කිසි ම සැකයක් නැති ව ඔහු සිතේ පැවති දැඩි කෝපයෙන් යුතු ව මරන්න ඇති. සමහර විට අතේ තිබුණු පිත්තල මෝල්ගසින් ගැසූ එක පහරින් ම මැරෙන්න ඇති. ඊට පස්සේ, තමා පතන තරුණිය එහි සිටිනවා ද කියා ඔහු සොයා බැලුවා. ඈ නැති බව දැන ගත්ත ඔහුට කොට්ටය යට සොයා බැලීමට අමතක වුණේ නැහැ. ඔහු ලියුම් කවරය ඉරා දමා එහි තිබුණ මුදල් ගත්තා. ඒ ලියුම් කවරය තමුන්නාන්සේලා ඉදිරිපිට මේ මේසය උඩ තියෙනවා.

"මා මේ කාරණාව ගැන සඳහන් කළේ, මගේ කල්පනාවේ හැටියට ඉතා වැදගත් සිදුවීමක් ගැන ජූරි සභාවේ මහත්වරුන් ගේ සැලකිල්ල යොමු කිරීම පිණිසයි. ඔහු පළපුරුදු ඇති මිනීමරුවෙක් නම්, ලාභය පතා ගෙන මේ මිනීමැරුම කළා නම්, මිනිය ළඟ බිම ඉරන ලද ලියුම් කවරය දමා යාවි ද? යම් විදියකින් පැවල් මුදල් ගැනීමේ අදහසින් ස්වාමියා මැරුවා නම්, මිනියා ළඟ සිට ලියුම් කවරය කඩා නො බලා ලියුම් කවරයත් සමඟ මුදල් ගෙන යනවා ඇති. මන්ද? ලියුම් කවරයේ මුදල් තියෙන බව ඔහු දැන සිටිය නිසයි. ලියුම් කවරය තුළ මුදල් දමා මුද්‍රා තබන ලද්දේ ඔහු බලා සිටියදීයි. මුදල් හොරකම් කළේ පැවල් නම් ඔහු ලියුම් කවරය කඩා නො බලා ගෙන යනවා ඇති. එතකොට හොරකම ගැන කිසි ම කෙනකුට දැනගන්න ලැබෙන්නේ නැහැ. ජූරි සභාවේ මහත්වරුනි, මා තමුන්නාන්සේලාගෙන් අහනවා පැවල් ලියුම් කවරය කඩා, බලා, බිම දමා, මුදල් පමණක් ගෙනයාවි ද කියා?

"නැහැ, ජූරි සභාවේ මහත්වරුනි, මෙය උමතු මිනිහකු ගේ ක්‍රියාවක්. මීට කලින් කවදාවත් හොරකම් කරලා නැති මිනීමරුවකු ගේ ක්‍රියාවක්. ඔහු කොට්ටය යට තිබුණු මුදල් ගත්තේ අනුන් සතු දෙයක් ගන්නා කෙනකු හැටියට නො ව, තමා සතු දෙයක් හොරා ගත් හොරකු ගෙන් ඒ දෙය ආපසු පැහැර

ගත්තාක් මෙනි. සිරකරුවා ඒ මුදල් සැලැකුවේ තමාගෙන් සොරා ගත්තා ලද මුදලක් හැටියටයි. මේ මුදල් ඔහු ගේ සිතේ හොල්මන් කරමින් තිබුණා. මීට කලින් කවදාවත් දැක නො තිබුණු ලියුම් කවරය දුටු හැටියේ ම, ඔහු එය ගෙන, එහි මුදල් තිබෙන්නේ දැයි දැන ගැනීම පිණිස ඉරා බැලුවා. තමාට විරුද්ධ ව ඉතා වැදගත් සාක්ෂියක් බිම දමා යන බව වත් කල්පනා නො කොට සිරකරුවා ලියුම් කවරය බිම දමා මුදල් සාක්කුවේ දමාගෙන පැනල ගියා. මිතියා කරමසෝ හැරෙන්නට වෙන කිසි ම කෙනෙක් මෙ වැනි දෙයක් කරන්නේ නැහැ. ඔහු කිසි ම දෙයක් ගැන කල්පනා කළේ නැහැ. ඔහු ක්‍රියා කළේ සිහි කල්පනාවෙන් නො වෙයි. කොහොම ද ඔහු සිහි කල්පනාවෙන් ක්‍රියා කරන්නේ? ගිරිගෝරිස් ගේ කෑගැම අසා ඔහු පැන ගියා, ගිරිගෝරිස් ඔහු අල්ලා නතර කිරීමට වෑයම් කළ විට අතේ තිබුණු පිත්තල මෝලෙන් ඔළුවට ගැසුවා.

"එහෙත් එ වේලේ ම සිතේ ඇති වූ අනුකම්පාවෙන් යුතු ව සිරකරුවා වැට උඩින් ආපසු පැන මහල්ලා පරීක්ෂා කොට බැලුවා. තමුන්නාන්සේලාට විශ්වාස කරන්න පුළුවන් ද සිරකරුවා ආපසු පැමිණියේ සිතේ හටගත් අනුකම්පාවෙන් යුතු ව මහල්ලාට උපකාරයක් කළ හැකි දැයි බැලීමට ය කියා? එය අනුකම්පාව දක්විය හැකි වෙලාවක් ද? නැහැ. ඔහු ආපසු පැමිණියේ තමාට විරුද්ධ ව සිටින එක ම සාක්ෂිකාරයා මලා ද? නැද්ද? කියා සොයා ගැනීමටයි. වෙනත් අදහසකින් පැමිණියා ය කියනවා නම් ඒක පිළිගත නො හැකි අස්වාභාවික දෙයක්. හොඳට මතක තියා ගන්න. ගිරිගෝරිස් ගේ ඔළුව ලේන්සුවෙන් පිස දමා, මළ බව සැක හැර දැනගත් පසු, දෑතේ ලේ තවරා ගත් සිරකරුවා තෝන්තු වූ හිසින් කෙළින් ම පෙම්වතිය ගේ ගෙදරට දිව්වා. තමා ගේ දෑතේ ලේ තැවරී තියෙන බවත්, අනෙක් අයට පෙනෙන බවත්, ඔහුට කල්පනා නො වූයේ මන්ද? දෑතේ තිබුණු ලේ නුදුටු බව සිරකරුවා අප සමඟ කිව්වා. ඒ කතාව විශ්වාස කරන්න පුළුවනි. එය සිදුවිය හැකි දෙයක්. මෙ වැනි අවස්ථාවල දී මිනීමරුවන්ට මෙ වැනි දේවල් සිදුවෙනවා. සමහරක් දේවල් ගැන බොහො ම පරීක්ෂාවෙන් ක්‍රියා කරන අතර, වෙනත් දේවල් අමතක වෙනවා. ඒ වෙලාවේ සිරකරුවා එක ම දෙයක් ගැන පමණයි කල්පනා කළේ. තමා ගේ පෙම්වතිය ගිය තැන ඒ වෙලාවේ ම ඔහුට දැනගැනීමට අවශ්‍ය වී තිබුණා. ඇගේ නවාතැනට ගිය ඔහුට කිසි සේත් ම බලාපොරොත්තු නොවූ දෙයක් දැනගන්න ලැබුණා. එනම්, ඈ ඇගේ පළමු පෙම්වතා හමුවීම පිණිස මුක්රෝවට ගිය බව දැනගන්න ලැබුණා.

නව වන පරිච්ඡේදය

පැමිණිල්ලේ දේශනයේ අවසානය

දේශනයේ මෙම අවස්ථාවට පැමිණි දණ්ඩනායකයා සිය අදහස් පැවැසීමට ඓතිහාසික සම්ප්‍රදායයක් තෝරාගත් බව පැහැදිලි ව පෙනෙන්නට විය. සාමාන්‍යයෙන් සියලු ම සභාර දුර්වල කථිකයන් අතරේ මේ සම්ප්‍රදාය ජනප්‍රිය වී ඇත්තේ, එයින් ඔවුන් ගේ ඉවසීමක් නැති උද්වේගය මැඩ තැබීම සඳහා කථිකත්වය සීමා කොට තැබිය හැකි නිසයි. මේ අවස්ථාවේ දී දණ්ඩනායකයා ගෲසෙන්කා ගේ 'නොඉඳුල් පෙම්වතා' ගැන විස්තරයක් කොට ඉතා වැදගත් අදහස් කීපයක් ඉදිරිපත් කෙළේ ය.

"හැම දෙනා ගැන ම උමතු ඊරිසියාවෙන් පෙළෙන සිරකරුවා, ඔහු පැතූ තරුණිය ගේ 'නොඉඳුල් පෙම්වතා' ගැන අසා, හිටිහැටියේ ම අතුරුදහන් වුණා. මේ සේරට ම වඩා ලොකු ම පුදුමය සිරකරුවා තමා ගේ මේ විරුද්ධවාදියා ගැන මීට කලින් කල්පනා නොකිරීමයි. ඔහු මේ විරුද්ධවාදියා පිළිගත්තේ ඈතින් සිටින අනතුරක් හැටියටයි. අනාගතය ගැන කල්පනා නො කළ සිරකරුවා නිතර ජීවත් වුණේ වර්තමානයේයි. ඔහු මේ විරුද්ධවාදියා පිළිගත්තේ නවකතාවක් පිළිගන්නා විදියටයි. තමා පැතූ තරුණිය ඇගේ 'නොඉඳුල් පෙම්වතා' පිළිබඳ පුවත තමා ගෙන් සඟවාගෙන, තමාට ආලය කළා ය යන අදහස, වේදනාවෙන් සකියන ඔහු ගේ හදවතට එක් වර ම අවබෝධ වුණා. ඈ මේ සියල්ල තමා ගෙන් සඟවා-ගෙන සිටියේ ඇගේ ඒ 'නොඉඳුල් පෙම්වතා' මිථ්‍යාවක් නො ව, නියම පෙම්වතකු වන නිසයි. ඇයට ජීවිතයේ ඇති එක ම බලාපොරොත්තුව මේ පෙම්වතා වන නිසයි. මේ සත්‍යය තේරුම් ගත් සිරකරුවා ඊට යටත් වුණා.

"ජූරි සභාවේ මහත්වරුනි, කිසි ම බලාපොරොත්තුවක් නැති ව හදිසියෙන් ම සිරකරුවා ගේ චරිතයේ ඇති වූ මේ වෙනස ගැන කිසිවක් නො කියා නිහඬ ව සිටීම මට කළ හැකි දෙයක් නො වෙයි. ඔහු තුළ හදිසියෙන් ම යුක්තිය ඉෂ්ට කිරීමට මැඩ පැවැත්විය නොහැකි ආශාවක් ඇති වුණා.

ඇය කැමැති අයකුට ආලය කිරීමට ඇයට අයිතියක් තියෙන බව ඔහු පිළිගත්තා. මේ හැම දෙයක් ම වුණේ, ඇය වෙනුවෙන් ඔහු ගේ දූත, පියා ගේ ලෙයින් අපිරිසුදු කරගත්ත මොහොතේ දීයි ඔහු විසින් හෙළන ලද පියා ගේ ලේ දූතට ම පළි ගැනීමට සඳහා සූදානම් වන බව ඇත්තයි. තමා ගේ ආත්මයත්, තමා ගේ මුළු අනාගතයත් විනාශ කරගත් ඔහුට, තමා කවරෙක් ද? තමා ගේ ආත්මයට වඩා අගය කළ තරුණිය හා තමා අතර පවතින සම්බන්ධය කුමක් ද? යන ප්‍රශ්නය ඒ මොහොතේදී තමාගෙන් නො අසා සිටීමට නොහැකි වුණා. ඇගේ නොඉඳුල් පෙම්වතා, ඇයට නියම අයිතියක් ඇති පෙම්වතා, ඇය විනාශ කළ පෙම්වතා, තමා කළ වරදට පසුතැවී, අලුත් ප්‍රේමයකින් යුතු ව, අලුත් සැපවත් ජීවිතයක් ගත කරන බවට පොරොත්දු ඇති ව ආපසු පැමිණ සිටියි. ඔහුට සම කරන විට තමා කවරෙක් ද? තමා ගේ තත්ත්වය කුමක් ද? අවාසනාවන්තයකු වන තමා දූත් ඇයට කුමක් පිරිනමන්න ද? සිරකරුවා මේ සියල්ල දූන සිටියා. තමා කළ අපරාධය නිසා හැම මාර්ගයක් ම වැසී ඇති බව ඔහු දුටුවා. තමා අනාගතයක් ඇති මනුෂ්‍යයෙක් නො ව, මරණ දණ්ඩනයට මූහුණ පා සිටින මිනීමරුවකු බව දූන සිටියා. ඔහු ගේ ආත්මය පරාජය කොට ඔහු විනාශ කළේ ඔහු තුළ ඇති වූ මේ අදහසයි. ඉතින් ඒ මොහොතේ දී ඔහු පුදුමාකාර තීරණයකට පැමිණියා. මේ භයානක තත්ත්වයෙන් පැනගන්න පුළුවන් එක ම මාර්ගය එය බව කරමසෝව් පවුලට අයත් ගති ගුණ තිබෙන අයකුට එක්වර ම පෙනී යනවා ඇති. ඒ මාර්ගය තමා ගේ පණ නහ ගැනීමයි. ඔහු ගේ මිත්‍රයකු වන පියෝතර් පර්හෝටින් ළඟ උගස් තබන ලද පිස්තෝල දෙක ගැනීමට ඔහු වහා දිව ගියා. මෙසේ දිව යන අතරේ සාක්කුවේ තිබුණු රූබල් තුන් දහ එළියට ගත්තා. ඔහු තාත්තා ගේ ලෙයින් දූත අපිරිසුදු කරගත්තේ මේ මුදල්වලට ඇති ආශාව නිසයි. කිසි කලක නොවූ තරමට දූන් ඔහුට මුදල් අවශ්‍යයයි. මිතියා කරමසෝව් මෙලොව හැර දමා යාවි; මිතියා කරමසෝව් පණ නහ ගනීවි. එහෙත් ඒ සිද්ධිය කාටත් මතක තිබිය යුතුයි. ඔහු කවියකු වගේ අලංකාර ලෙස වැඩ කළේ හේතුවක් නැති ව නො වෙයි. ඔහු මුළු ජීවිතය ම විනාශ කරගත්තේ හේතුවක් නැති ව නො වෙයි. 'මම ඇය ළඟට යමි. එහි දී මම විශාල උත්සවයක් පවත්වමි. බොහෝ කාලයක් ගතවන තුරු කිසිවකුට අමතක නොවන විදියේ උත්සවයක් පවත්වමි. ප්‍රීතියෙන් නගින ඝෝෂාව මැද්දේ, අභිකුණ්ඨික තරුණියන් ගේ කෑගැසුම් ගැයුම් මධ්‍යයේ, මා ආලය කළ තරුණියට හා ඇගේ

අලුත් සැපතට සව්දිය පතා වයිත් පානය කරමි. අන්තිමේ දී ඇගේ දෙපා ළඟ මගේ මොළය සුනු විසුනු වන්නට වෙඩි තබා ගෙන දඬුවම් විඳිමි. එවිට ඇයට කවදා හරි මිතියා කරමසෝ මතක් වෙනවා ඇති. ඇයට මිතියා කරමසෝ ආලය කළ සැටි පෙනේවි. ඇය තුළ මිතියා කරමසෝ ගැන ශෝකයක් ඇතිවේවි.' මේ විදියටයි සිරකරුවා කල්පනා කෙළේ.

"අපට මෙහි දී අලංකාරයක්, අද්භූත ප්‍රේමයක්, බලාපොරොත්තු නැතිවීමෙන් ඇතිවන අලංකාරයක්, සිතේ මෘදු කමක් සමඟ කරමසෝ පවුලට පොදු වූ ප්‍රචණ්ඩ නොසන්සුන් කමක් දකින්නට ලැබෙනවා. ජූරි සභාවේ මහත්වරුනි, ඒ සමඟ ම මෙහි තවත් වැදගත් දෙයක් තියෙනවා. සිරකරුවා ගේ ආත්මය තුළ හිරවී කෑගාන, සිත තුළ නොනවත්තා සැලෙන, හදවතේ ප්‍රාණය පිටවන තෙක් විෂ ගන්වන, තවත් දෙයක් තියෙනවා. ඒ දෙය තමා ඔහු ගේ ආධ්‍යාත්මක චිත්තය. එහි තීන්දුව, භයානක තීන්දුව, එහෙත් පිස්තෝලයට පුළුවනි හැම දෙයක් ම තීරණය කරන්න. නිදහස කරා ගිය හැකි එක ම මාර්ගය පිස්තෝලයයි. එහෙත් ඒ නිදහසට එපිටින් තියෙන්නේ කුමක් ද? සිරකරුවා ඒ ගැන, ඒ මොහොතේ දී කල්පනා කළා ද කියා මා දන්නේ නැහැ. හැම්ලට් ප්‍රශ්න කළා වාගේ 'මරණයට එපිටින් තියෙන්නේ කුමක් ද?' කියා ප්‍රශ්න කළා දැයි මා දන්නේ නැහැ. නැහැ, ජූරි සභාවේ මහත්වරුනි, ඔවුන් අතරේ හැම්ලට්වරුන් සිටින අතරේ අප අතරේ කරමසෝවරුන් සිටිනවා."

ඉක්බිති ව, සිරකරුවා උත්සවයට සැරසුණ සැටි, පියෝතර් පර්හෝටින්ගේ නිවෙසේ දී සිදු වූ දෙය, සාප්පුවේ දී බඩු ගත් සැටි සහ රියැදුරා සමඟ මුක්රෝවට යන අතරේ සිදුවූ කතාබහ ගැන දණ්ඩනායකයා දිග විස්තරයක් කෙළේ ය. සාක්ෂිකාරයන් විසින් සනාථ කරන ලද සිරකරුවා කළ කී නොයෙක් දේවල් ඉදිරිපත් කරමින් නීතිඥයා ඇඳ පෙන්නූ චිත්‍රයෙන් මහජනයා තුළ භයානක ප්‍රතිඵලයක් ඇති විය. මෙසේ කරුණු එක් තැන් කළ පසු, දුක් පීඩාදියෙන් පෙළෙන, බලාපොරොත්තු සුන්කර ගත් සිරකරුවා ගේ වරද සක්සුදක් සේ පැහැදිලි විය.

"තමා කියන කරන දේවල් ගැන පරිස්සම් වීමට සිරකරුවාට කිසි ම උවමනාවක් තිබුණේ නැහැ. වරක් හෝ දෙවරක් හෝ තමා කළ භයානක ක්‍රියාවන් හෙළි කිරීමට ඔහු සැරසුණා. නමුත් අන්තිම මොහොතේ දී නිශ්ශබ්ද වුණා. (මෙහි දී දණ්ඩනායකයා සාක්ෂි කරුවන් විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි

කියෙව්වේ ය) මූක්රෝවට යන අතර මඟ දී 'උඹ කරත්තයේ තශ්ගා ගෙන යන්නේ මිනීමරුවකු බව දන්නව ද?' කියා ඔහු රියැදුරාගෙන් කෑගා ඇසුවා. එහෙත් ඇත්ත කීමට ඔහුට පුළුවන් කමක් තිබුණේ නැහැ. ඊට කලින් මූක්රෝවට ගොස් උත්සවය පැවැත්විය යුතුයි. නමුත් මේ අවාසනාවන්ත මිනිහාට මූක්රෝවට ගියාට පස්සේ මොකද වුණේ? එහි ගිය මොහොතේ සිට ඔහුට පෙනී ගියා තමා ගේ විරුද්ධවාදියා නියම විරුද්ධ-වාදියෙක් නොවන බව. තමා පැතූ තරුණියත්, ඇ ඇගේ පළමු පෙම්වතා සමඟ ලබා ගත් අලුත් සැපතටත් සම්දිය පිරිමට තමා තුළ පැවැති අදහස අනවශ්‍ය බව ඔහුට පෙනී ගියා. එදා එ තැන සිදු වූ දෙය ගැන විස්තරයක් තමුන්නාන්සේලාට මූලික පරීක්ෂණයෙන් දැනගන්නට ලැබෙන්න ඇති. සිරකරුවා ඔහු ගේ විරුද්ධවාදියා මැඩ ජය ගත්තා. එතැන් සිට ඔහු ගේ ආත්මය අලුත් අවස්ථාවකට පැමිණියා; ඉතා භයානක අවස්ථා-වකට පැමිණියා. මෙ තරම් භයානක අවස්ථාවකට කවදාවත් නො පැමිණෙන්නට ඇති. අනාගතයේ දී පවා නොපැමිණෙනවා ඇති.

"ජූරි සභාවේ මහත්වරුනි, මෙලොව පවතින කිසිම යුක්ති ධර්මයකට කල නොහැකි තරම් හොඳට; සහාසිකකම, ස්වභාවධර්මය හා දුෂ්ට සිත එකිනෙකාගෙන් පළිගන්නා බව නිසැක ව ම කියන්න පුළුවනි. එ පමණක් ද නො වෙයි. මෙලොව ඇත්තා වූ යුක්ති ධර්මය හා දඬුව ම ස්වභාවධර්මයාගේ පළිගැනීමෙහි ඇති දරුණුකම සැහැල්ලු කරනවා. බලාපොරොත්තු සුන් වූ අවස්ථාවල දී සැනසීමක් වශයෙන් මෙය මිනීමරුවා ගේ ආත්මයට අවශ්‍ය වෙනවා. මේ තරුණිය තමාට ආලය කරන බව, තමා වෙනුවෙන් පළමු පෙම්වතා අත්හරින බව, තමා සමඟ අලුත් ජීවිතයක් ආරම්භ කිරීමට ඇ ආරාධනා කරන බව, තමාට සියලු සැප-සම්පත් දීමට පොරොන්දු වන බව, දැනගත් පසු මීතියා කරමසෝ තුළ ඇති වූ භීතිය, හා යහපත අයහපත පිළිබඳ දරුණු වේදනාව මට සිතින් සිතා ගැනීම පවා අපහසුයි. ඇ ඔහුට හැම දෙයක් ම පිදුවේ කුමන අවස්ථාවක දී ද? හැම දෙයක් ම විනාශ වූ පසු ව ය, අවසන් වූ පසු ව ය. කිසි ම දෙයක් නො කල හැකි අවස්ථාවක දී ය.

"එ මොහොතේ දී සිරකරුවා වැටී සිටි නියම තත්ත්වය පෙන්වා දීම සඳහා ඉතා වැදගත් කරුණක් ගැන සඳහන් කිරීමට මට අවසර දිය යුතුයි. මේ තරුණිය, ඔහු පැතූ තරුණිය, අන්තිම මොහොත වනතෙක්, ඔහු සිරභාරයට ගන්නා මොහොත වනතෙක්, ඔහුට ලබා ගන්න බැරි වුණා.

ඔහු තුළ ඇය ලබා ගැනීමට ලොකු ආශාවක් තිබුණා. එහෙත් ඇය ලබා ගන්න බැරි වුණා. ඔහු ඒ වෙලාවේ දී වෙඩි තබා නො ගත්තේ මන්ද? වෙඩි තබා ගැනීමට තිබුණු අදහස අත්හැර දමා පිස්තෝල දෙක තිබුණු තැන පවා අමතක කර දැම්මේ මන්ද? ඇයට තිබුණු ආදරයත් ඇය ලබා ගැනීමට තිබුණු ආශාවත් නිසයි. මේ සාදය පැවැති මුළු කාලය තුළ ම ඔහු පෙම්වතිය අත්නොහැර ඇය ළඟින් ම හිටියා. වෙන කවර දක වත් නොතිබුණු ලක්ෂණයක් එවේලේ ඇය තුළ දකින්නට ලැබුණා. ඔහු මොහොතකට වත් ඇය ළඟින් ඉවත් වුණේ නැහැ. ඇය දෙසින් දෑස ඉවත ගත්තේ නැහැ. ඇය ළඟ සිටිය දී ඔහුට මුළු ලෝකය ම අමතක වුණා.

"තමා සිරභාරයට ගනී ය යන බිය පමණක් නො ව, සිතේ පැවැති වේදනාව ද මේ ආදරය නිසා අමතක වුණා. එය මොහොතකට පමණයි. ඒ මොහොතේ දී ඔහු ගේ සිත, බිඳ දැමූ කරුණු තුනකට යටත් ව තිබුණු සැටි අපට සිතාගත හැකියි. පළමු කරුණ නම් මත්පැන්වල පැවැති බලපැවැත්මයි. නැටුමේ ඇති තාලයෙන් හා ගීතයේ ඇති මිහිරින් නැඟුණු ඝෝෂාවයි. ගී ගයමින්, නටමින්, සුරාවෙන් රතු වූ මුහුණින් යුතු ව ඔහු සමග සිනා සෙමින් සිටි ඔහු ගේ පෙම්වතියයි. දෙවන කාරණය, ඒ භයානක අවස්ථාවට තවත් කල් ඇත. එළිවන තුරු තමා සිරභාරයට ගැනීමට පොලීසිය නොයෙන්නේ ය යන බලාපොරොත්තුවයි. ඒ නිසා ඔහුට තවත් පැය කීපයක් සිටිය හැකියි. එය දිග කාලයකි. පැය කීපයක් තුළ දී කෙනකුට බොහෝ දේවල් ගැන කල්පනා කළ හැකියි. පෝරකයට ගෙන යන අපරාධකාරයකු තුළ ඇති වන අදහස් මොහු තුළ ද ඇති වුණා යයි සිතන්නට පුළුවනි. තවත් දිග පාරක් දිගේ පියවර ගමනින් මඟ දෙපස බලා සිටින දහසක් දෙනා පසුකොට ගිය යුතුයි. පෝරයකය සවිකොට ඇති ඒ භයානක ස්ථානය තියෙන්නේ ඒ මාර්ගය අවසන් වන තැනයි. මගේ කල්පනාවේ හැටියට පෝරකයට යන ගමන ආරම්භයේ දී, කරත්තයේ නැඟ යන ඒ අවාසනාවන්ත මනුෂ්‍යයාට හැඟෙනවා ඇති තමාට ජීවත් වීමට තවත් බොහෝ වේලා තියෙන බව. කරත්තය ගමන් කරයි. මඟ දෙපස ගේ දොර පසු වී යයි. 'ඒකට වරදක් නැහැ, අනෙක් පාරට හැරෙන්න තවත් දුරයා යුතුයි. මඟ දෙපස තමා දෙස බලා සිටින දහත් දහසක් දෙස ඔහු තවමත් එඩිතර බැල්මෙන් බලයි. තමා ද ඔවුන්-ගෙන් එකෙක් යයි කල්පනා කරයි. දැන් අනෙක් පාරට හැරෙන තැනට පැමිණ ඇත. 'ඒකට කමක් නැහැ. තවත්

පාරක් පසු කර ගිය යුතුයි.' ගේ දෙර පසු වී යයි. 'පසු කර යාමට තවත් ගෙවල් දෙරවල් බොහො ම තියෙනවා'යි කල්පනා කරයි. මාගීය අවසත් වී පෝරකයට පැමිණෙන තෙක් ඔහු මෙසේ කල්පනා කරයි.

''එදා සිරකරුවා කල්පනා කළේ මේ ක්‍රමයට ය කියා, මම අදහස් කරනවා. 'ඔවුන්ට මා අල්ලා ගන්න තව ම වෙලා ලැබුණේ නැහැ. මේ අවුලෙන් පැනල යන්න ක්‍රමයක් තියෙන්න ඕනෑ. ආරක්ෂා වෙන්න ක්‍රමයක් සූදානම් කරගන්න පුළුවනි; බලන්න ඈ කොතරම් ලක්ෂණ ද කියා!'' ඔහු මේ විදියට කල්පනා කරන්න ඇති.

''සිරකරුවා ගේ සිතේ පතුලේ නොසන්සුන් කමක් සමග බයක් ඇති වුණා. කොහොම වුණත් ළඟ තියෙන මුදලින් භාගයක් සඟවා තැබීමට ඔහු සමත් වුණා ටික වේලාවකට කලින්, සිරකරුවා විසින් පියා ගේ කොට්ටය යට තිබී සොරා ගත්ත රූබල් තුන් දහෙත් භාගයකට කුමක් වුණා ද කියා මට කියන්න බැහැ. ඔහු මීට පෙරත් කීප වතාවක් ම මුක්-රෝවට ගිහින් තියෙනවා. එහි දෙ දවසක් ම උත්සව පවත්වා තියෙනවා. ඔහු ඒ ගොඩනැගිල්ල හොඳට දන්නවා. ඔහු සිරභාරයට ගැනීමට විකකට කලින් ඒ ගොඩනැගිල්ලේ කොහේ හරි මූල්ලක හෝ වහලය යට හෝ පොළොව යට හෝ මුදල් සඟවා තබන්න ඇතැයි මම කල්පනා කරනවා. එහෙම මුදල් සඟවන්නේ කුමන අදහසක් ඇති ව ද කියා මගෙන් ප්‍රශ්න කරන්න පුළුවනි. මේ විපත්තිය එක්වර ම සිදුවන්නට පුළුවනි. එහෙත් ඒ අවස්ථාව පැමිණි විට ඊට මුහුණ පාන්නේ කෙසේ ද කියා ඔහු තව ම තීරණය කරගෙන නැහැ. සුදුසු වැඩ පිළිවෙළක් යොදා ගැනීමට ඔහුට තව ම අවස්ථාවක් ලැබුණේ නැහැ. ඔහු ගේ හිස තෝන්තු වුණා. හිත ගෑසෙන්නා වෙනින් ඉවන ගන්න බැහැ. එහෙත්, කොයි දෙය කිරීමටත් මුදල් තිබිය යුතුයි. අතේ මිටේ මුදල් තියෙනවා නම් මිනිහකුට ඕනෑ තැන ගියත් නියම මිනිහකු වගේ ජීවත් වෙන්න පුළුවනි. මෙ වැනි වේලාවක, මෙ වැනි අදහසක් සිරකරුවා තුළ ඇතිවීම ස්වාභාවික ය කියා තමුන්නාන්සේලා හිතන්න පුළුවනි. එහෙත් මාසයකට කලින් ඇති වූ ඉතා භාරදූර නොසන්සුන් අවස්ථාවක දී ඔහු අතේ තිබුණු මුදල් දෙකට බෙදා, ඉන් භාගයක් කුඩා මල්ලක දමා මසා බෙල්ල වටේ එල්ලාගත්ත බව ඔහු අපට විස්තර කරල දුන්නා. ඒ කතාවේ ඇත්තක්

නො තිබුණත්......ඒ කතාව ඇත්ත නොවන බව තව ටිකකින් දැනගන්න ලැබෙනවා ඇති......මුදල් සඟවා තැබීමේ අදහස සිරකරුවාට අලුත් අදහසක් නො වෙයි. කොහොම වුණත් ඒ මුදලින් බාගයක් සඟවා තැබීමට ඔහු අදහස් කරන්න ඇති. රූබල් එක්දස් පන්සියක් කුඩා මල්ලක දමා සඟවා තැබූ බව ඔහු පරීක්ෂණයේ දී කිව්වා (එහෙම මල්ලක් තිබුණේ නැහැ.) ඔහු ඒ කතාව ඒ මොහොතේ දී සිතේ ඇති වූ ප්‍රබෝධයෙන් ගොතපු කතාවක් වෙන්න ඕනෑ. ඔහු එවැනි කතාවක් කිව්වේ දෙපැයකට කලින් මුදල් දෙකට බෙදා, ඉන් කොටසක්, අවශ්‍ය වුවහොත් ගැනීම පිණිස, මුක්රෝයේ හෝටලේ සඟවා තැබීමෙන් පසුවයි. ඔහු එසේ සඟවා තැබුවේ ළඟ තබා ගැනීමට ඇති භය නිසයි. ජූරි සභාවේ මහත්වරුනි, එක ම වේලාවේ දී දෙ විදියකට කල්පනා කිරීමේ ශක්තියක් මිනියා කරමසෝව්ට තියෙන බව මතක තබා ගන්න.

"අපි හොඳට හෝටලය සෝදිසි කරල බැලුවා. නමුත් මුදල් සොයා ගන්න බැරි වුණා. තවමත් එහි මුදල් සඟවා තියෙන්න පුළුවනි. නැති නම් පසු ව දා අතුරුදහන් වූ ඒ මුදල් දැන් සිරකරුවා ළඟ තියෙනවා ඇති. එය කෙසේ වෙතත් අපි එහි යනවිට සිරකරුවා තරුණිය ළඟ දණින් වැටී හිටියා. ඈ ඇඳේ නිදා සිටි අතර, සිරකරුවා බිම දණගසා ගෙන දෑතින් ඇය වැලඳගෙන හිටියා. ඒ වෙලාවේ ඔහුට හැම දෙයක් ම අමතක වුණා. ඔහු සිරභාරයට ගැනීමට මිනිසුන් එන බව වත් ඇහුණේ නැහැ. මිනීමැරුමෙන් නිදහස් වීමට වැඩ පිළිවෙළක් සකස් කර ගැනීමට වත් ඔහුට අවස්ථාවක් ලැබුණේ නැහැ. කිසි ම බලාපොරොත්තුවක් නැති ව අසු වූ සිරකරුවා ඔහු ගේ දෛවයේ විනිශ්චයකාරයන් ඉදිරියට පමුණුවනු ලැබුවා.

"ජූරි සභාවේ මහත්වරුනි, මිනිසකු ගේ මුහුණ බැලිය නොහැකි වන අවස්ථා, රාජකාරිය කරන වේලාවල දී අපට දැකගන්න ලැබෙනවා. අපරාධකාරයකු ගේ තත්ත්වය දෙස බලන විට සිතේ බිය උපදින අවස්ථා පැමිණෙනවා. සියලු දෙයක් ම විනාශ වූ බව දැනදැනත් සටන් කරන, සටන් කිරීමට අදහස් කරන මිනීමරුවකු ගේ මෘග බියට මුහුණ පෑමට සිදුවන අවස්ථා තියෙනවා. එවැනි අවස්ථාවල දී ඔහු තුළ ආත්මාරක්ෂාවට ඇති හැම බලයක් ම එක විට අවදි වෙනවා. ඔහු නුඹ දෙස දුකින් පිරි සැක සහිත දෑසින් බලා, නුඹේ මුහුණ හා සිතිවිලි සෝදිසි කොට, කොයි පැත්තෙන් තමාට

පහර වදී දැයි කල්පනා කොට, මොහොතකින් ඔහු ගේ නොසන්-සුන් වූ සිතින් දහසක් උපා යොදා ගන්නවා. එහෙත් තවමත් ඔහු කතා කිරීමට බයයි. අහුවේ ය කියා බයයි. මිනිසකු ගේ ආත්මය තුළ ඇති වන මේ තිත්ත සහගත මොහොත, ආත්මයේ ඇති වන පීඩාව හා ආත්මාරක්ෂාවට ඇති ආශාව බොහොම භයානකයි. ඇතැම් විට නීතිඥයා තුළ පවා අපරාධකාරයා ගැන සිතිය හා අනුකම්පාව ඇති වෙනවා. එදා අපි මේ හැම දෙයක් ම දුටුවා. මුල දී සිරකරුවා අත්දුත් කුත්දුත් වුණා. සිතේ හටගත් සිතියත් සමඟ 'මා කළ අපරාධයට මට මෙ වැනි දෙයක් වෙලා මදි' වැනි සමාදානයට කැමැති වචන කීපයක් ඔහු ගේ කටින් පිට වුණා ඒ සමඟ ඔහු වහා ම සිත මැඩ ගත්තා. අප අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙන හැටි ඔහු කලින් සූදානම් කරගෙන හිටියේ නැහැ. ඔහු සූදානම් වී හිටියේ තමා මිනීමරුවකු නොවන බව කීමට පමණයි. 'තාත්තා ගේ මරණය ගැන මා වරදකාරයෙක් නො වෙයි' ඔහු කිව්වා. මෙතෙක් වෙලා ඔහු ආරක්ෂා වීමට තනාගත් වැට මේ ප්‍රකාශයයි. තමා ගේ ආරක්ෂාව සඳහා මේ වැට පිටු පසින් තවත් කිසියම් වැටක් තනා ගැනීමට ඔහු අදහස් කරන්න ඇති. අපෙන් නැඟෙන ප්‍රශ්න බලාපොරොත්තු වූ සිරකරුවා, මුල දී කළ ප්‍රකාශය විස්තර කරමින් 'මම මහලු ගිරිගෝරිස් ගේ මරණයට පමණක් වරදකාරයෙක්; නමුත් තාත්තා මැරුවේ කවු ද? මා නො වෙයි නම් වෙන කවුද තාත්තා මරන්න ඇත්තේ?' කියා ඇසුවා. නමුත්නාත්සේලාට ඇහුණා නේ ද? අපි ගියේ ඔහුගෙන් එම ප්‍රශ්නය ඇසීමටයි. නමුත් ඊට කලින් ඔහු අපෙන් ඒ ප්‍රශ්නය ඇසුවා. කලින් බලාපොරොත්තු නොවූ, නො ඉවසිල්ලෙන් යුතු ව අසන ලද 'මා නො වේ නම් වෙන කවුද?' යන කොටස නමුත්නාත්සේලාට ඇහුණා නේ ද? තිරිසනුන්ට ඇති කපටි කමට සමාන කපටි කම, බොළඳ කම, කරමසෝව් පවුලේ ඇත්තන්ට අයත් නො-ඉවසිල්ල නමුත්නාත්සේලා දුටුවා නේ ද? 'මම තාත්තා මැරුවේ නැහැ. මම තාත්තා මැරුවා ය කියා කල්පනා කරන්න එපා. එහෙත් මා අදහස් කරගෙන හිටියේ තාත්තා මරා දැමීමටයි.' සිරකරුවා මෙසේ කියා, 'එහෙත් මම තාත්තා මැරුවේ නැහැ, තාත්තා ගේ මරණයට මා වරද කාරයෙක් නො වෙයි' ආයේත් වරක් වහවහා කිව්වා. පියා මැරීමට ඔහු තුළ අදහසක් තිබුණු බව ඔහු පිළිගත්තවා. ඒ එක්ක ම කියනවා 'නමුත්නාත්සේලාට පේනවා නේ ද මා ඇත්ත කියන බව? ඒ නිසා නමුත්නාත්සේලා මා තාත්තා නොමරපු බව

පිළිගන්න ඕනෑ'යි කියනවා. මෙ වැනි අවස්ථාවල දී මිනීමරුවන් කිසි ම කල්පනාවකින් තො වෙයි කතා කරන්නේ. ඒ එක්ක ම බොහො ම පහසුවෙන් පැහැදෙනවා.

"එ වෙලේ එ තැන සිටිය රාජනීතිඥයා අහම්බෙන් වගේ සිරකරුවා ගෙන් 'මිනීමරුවා පැවෙල් වෙන්න බැරි ද?' යන බොහො ම සුළු ප්‍රශ්නය ඇසුවා. ඒ වෙලාවේ අප කලින් බලාපොරොත්තු ව සිටි දෙය ම සිදු වුණා. මිනීමැරුමට පැවල් ගේ නම ඇද ගැනීමට තියම වේලාව පැමිණෙන තෙක් සිරකරුවා බලා සිටියා. එහෙත් ඔහු පැවල් ගේ නම ඇද ගැනීමට කලින් අප ඒ ප්‍රශ්නය ඇසීම ගැන, අපි බලාපොරොත්තු වුණා වගේ ම ඔහු බොහො ම කිපුණා. නිතර කරන පුරුද්දට එකඟ ව සිරකරුවා අනෙක් සීමාවට ගොස්, පැවල් තාත්තා තොමැරූ බවත්, මිනිහෙක් මැරීමට තරම් පැවල්ට ශක්තියක් නැති බවත් කියා සිටියා. සිරකරුවා ගේ කතාව විශ්වාස කරන්න එපා. ඔහු එහෙම කිව්වේ කපටි කමටයි. ඔහු ගේ අදහස තිබුණේ මිනීමැරුමට පැවල් අල්ලා ගැනීමටයි. පැවල් නැති ව අල්ලන්න පුළුවන් වෙන කෙනෙක් නැහැ. ඔහු ගේ උපායට අපේ කතාව බාධාවක් වූ නිසා ඔහු ඒ අදහස පසුවට කල් දැම්මා. සමහර විට, ඔහු පසු ව දාට, පැවල් ගේ නම මිනීමැරුමට සම්බන්ධ කරගන්න පුළුවනි. නැති නම් දවස් කීපයකට පසු ව, හොඳ අවස්ථාවක් බලා පැවල් පිට වරද පටවා 'පැවල් මෙ මිනීමැරුමට සම්බන්ධ නොවූ බව තුඹලාට වඩා මා විශ්වාස කළා. ඒ ගැන තුඹලාට මතක ඇති. ඒ වුණත් පැවල් මිනීමරුවා බව දැන් නම් මට හොඳට ම විශ්වාසයි. තාත්තා මරන්න ඇත්තේ පැවල් මිස වෙන කෙනෙක් වෙන්න බැහැ'යි කියන්න පුළුවනි. නමුත් දැනට පැවල් මිනීමැරුමට සම්බන්ධ නොවූ බව කනගාටුවෙන් හා නොසන්සුන් කමින් ද කියා සිටියා. පළමු ව පියා ගේ කවුළුව තුළින් එබී බලා, පසු ව බොහො ම ගරුසරු ඇති ව කවුළුව ළඟින් ඈත් වූ බව හැඟවීම පිණිස; තො සිතිය හැකි හේතුවක් ඉදිරිපත් කරමින් නිදහසට කරුණු කියා සිටියේ නොඉවසිල්ලත් කෝපයත් විසින් පොලඹවනු ලැබූ නිසයි. එ පමණක් නො වෙයි, ගිරිගෝරිස් සනීප වීමත්, ඔහු දුන් සාක්ෂියත් තමාට බොහො ම අහිතකර බව සිරකරුවා දැන සිටියේ නැහැ.

"අපි හොඳට සිරකරුවා සෝදිසි කොට බැලුවා. සෝදිසි කිරීම ගැන ඔහු බොහො ම කිපුණා. ඒ සමඟ ධෛර්යවත් වුණා. නමුත් අපට රූබල් තුන් දහ ම සොයා ගන්න බැරි වුණා.

ඉත් භාගයයි ලැබුණේ. කිසි ම සැකයක් නැති ව ඔහුට අර කුඩා මුදල් පසුම්බිය ගැන බොරුව කීමට කල්පනා වුණේ අපි සෝදිසි කරන විට කෝපයෙන් තිගඩ ව සිටිය ඒ වෙලාවේ දී යි. මුදල් පසුම්බිය පිළිබඳ කතාව පිළිගැනීමට අපහසු බව ඔහු දැන ගෙන හිටියා. එහෙත් එය ඇත්ත බව පෙන්නීමට ඔහු බොහො ම වෑයම් කළා. මෙ වැනි පරීක්ෂණ වල දී පරීක්ෂණ පවත්වන නිලධාරීන් සතු ප්‍රධාන කටයුත්ත අපරාධකාරයාට නිදහසට කරුණු සොයා ගැනීමට අවකාශ නො දීමයි. අපරාධකාරයා විසින් ආදරයෙන් රැකගෙන සිටින, එකිනෙකට නො ගැළපෙන, අනුමාන සහිත අදහස් අවුල් කිරීම පිණිස අපරාධකාරයාට අවස්ථාවක් නො දී හිටිහැටියේ ම ප්‍රශ්න ඇසීමයි. අපරාධකාරයකුට කතා කිරීමට මඟ සැලැස්විය හැක්කේ කිසියම් අලුත් දෙයක් ගැන අහම්බෙන් ප්‍රශ්න ඇසීමෙන් පමණයි. ඔහු කලින් කල්පනා නො කළ, ඔහු නො දන්නා, එහෙත් ඉතා වැදගත් කිසියම් අවස්ථාවක් ගැන ප්‍රශ්න ඇසීමෙනුයි. ඔහු කලින් නො සිතූ, නො දැන සිටි, එහෙත් කිසියම් වැදගත් අවස්ථාවක් ගැන ප්‍රශ්න කළ යුතු යි. අපි ද එ වැනි වැදගත් කරුණක් සූදානම් කරගෙන හිටියා. ඒ වැදගත් කරුණ නම් ගිරිගෝරිස් විසින් දකින ලද, මහ ගෙදර ඇර තබන ලද දොර පිළිබඳ සාක්ෂියයි. සිරකරුවාට මේ දොර ගැන සම්පූර්ණයෙන් ම අමතක වී තිබුණා. ගිරිගෝරිස් ඒ දොර දකින්න ඇතැයි ඔහු කවදාවත් හිතුවේ නැහැ.

"මේ ප්‍රශ්නය ඇසීමෙන් ලැබුණු ප්‍රතිඵලය විස්මය ජනකයි. සිරකරුවා එක්වර ම උඩ පැන 'තාත්තා මැරුවේ පැවල්, මිනීමරුවා පැවල්' කියා කෑගැහුවා. මෙසේ කෑගැහීමෙන් ඔහු මෙතෙක් සඟවාගෙන සිටිය ආරක්ෂාවේ මූලික රහස් අනුමාන ලෙස හෙළි කළා, පැවල්ට මහලු කරමසෝව් මැරීමට අවස්ථාවක් ලැබුණේ සිරකරුවා ගිරිගෝරිස්ට පහර දී පැන ගියාට පසු ව පමණයි. සිරකරුවා ගෙන් පහර කෑමට කලින් ගිරිගෝරිස් මහ ගෙයි දොර ඇර තිබෙන බව දුටු බවත්, කාමරයෙන් පිට වී යාමට කලින් බිත්තියේ අනෙක් පැත්තේ නිදා සිටි පැවල් ගේ කෙඳිරිය ඔහුට ඇසුණු බවත්, අපි සිරකරුවාට දන්වූ විට සිරකරුවා මැලවී ගියා. සිරකරුවා ගේ දීන තත්ත්වය දුටු විට තමා ගේ ඇස්වල කඳුළු පිරුණු බව මගේ උගත් මිත්‍රයකු වන නිකොලේ පෙපොනොවිච් මට පසු ව කිව්වා. ඒ වෙලාවේ දී තමයි සිරකරුවා වැටී සිටි තත්ත්වයෙන් ගොඩවීම පිණිස අර සුප්‍රසිද්ධ මුදල් පසුම්බිය පිළිබඳ කතාව කිව්වේ. හොඳයි, එහෙනම් අපි ඒ කතාව විභාග කරලා බලමු.

"ජූරි සභාවේ මහත්වරුනි, මිනීමැරුමට මාසයකට කලින්, මුදල් දමා මසා බෙල්ල වටේ එල්ලගත්තා ලද මුදල් පසුම්බිය පිළිබඳ කතාව මේ අවස්ථාවේ ඉදිරිපත් කරන ලද හාස්‍යජනක කතාවක් පමණක් නො ව, කිසිසේත් විශ්වාස කළ නො හැකි ප්‍රබන්ධයක් ලෙස පිළිගත යුතු බව මා තමුන්නාන්සේලාට කලින් විස්තර කරල දුන්නා. යම් කිසි කෙනෙක් පිළිගත නො හැකි කතාවක්, ඔට්ටුවක් දිනා ගැනීම සඳහා ඉදිරිපත් කරනවා නම් මීට වඩා හොඳ කතාවක් සොයා ගැනීම අපහසුයි. මෙ වගීයේ කතාවල ඇත්තා වූ විශේෂ ලක්ෂණය නම් කතාවට ඇතුළත් විස්තරවලින් ම කතාකාරයා පරාජය කොට කට වසා දැමීමට හැකි වීමයි. සැබෑ ජීවිතයෙන් මෙ වැනි කරුණු ඕනෑ තරම් සොයා ගන්න පුළුවනි. එහෙත් මේ අවාසනාවන්ත කතාකාරයා ඒ කරුණු ඕනෑකමින් ම බැහැර කරනවා. ඉතා අලංකාර දේවල් නිර්මාණය කිරීමට නැමුණු ඔහු ගේ කල්පනා ශක්තියට මේ සුළු නො වැදගත් දේවල් පෙනෙන්නේ නැහැ. එ වැනි තැන්වල දී තමයි ඔවුන් අහු-වෙන්නේ. 'මේ කුඩා මුදල් පසුම්බිය මැසීමට උවමනා උපකරණ ලැබුණේ කොහෙන් ද? පසුම්බිය මැසුවේ කවුද?' කියා ඇසූ විට සිරකරුවා 'මායි පසුම්බිය මැසුවේ' කියා පිළිතුරු දුන්නා. "පසුම්බිය මැසීමට උවමනා බඩු කොහොන් ද ලැබුණේ?' කියා ප්‍රශ්න කළ විට සිරකරුවා කිපුණා එ වැනි නො වැදගත් ප්‍රශ්නයක් ඇසීම තමාට කරන ලද අපහාසයක් හැටියටයි ඔහු පිළිගත්තේ. තමුන්නාන්සේලා විශ්වාස කරනව ද, සිරකරුවා ඒ අතින් නම් බොහො ම අවංකයි. මේ වගීයේ මිනිසුන් ගේ හැටි ඔහොම තමයි. 'මම කමිසයක් ඉරා ගත්තා' කියා සිරකරුවා පිළිතුරු දුන්නා. 'බොහො ම හොඳයි, එහෙනම් පසුම්බිය මැසීමට ඉරාගත්ත කමිසය අපට හෙට සොයා ගන්න පුළුවනි.' ජූරි සභාවේ මහත්වරුනි, අපි ඒ කමිසය සොයා ගත්තා නම් එය ඔහු ගේ කතාව ඇත්ත බව ඔප්පු කිරීමට සාක්ෂියක් වෙනවා. (එවැනි කමිසයක් තිබුණා නම් අපට එය සොයා ගන්න බැරි වෙන්නේ නැහැ.) නමුත් සිරකරුවාට එ වැනි දෙයක් තේරුම් ගැනීමට තරම් ශක්තියක් නැහැ. 'මට මතක නැහැ. මම ඒ රෙදි කෑල්ල ඉරාගත්තේ මගේ කමිසයකින් නො වෙන්න පුළුවනි. මගේ ගෘහිණිය ගේ හිස් වැස්මෙන් වෙන්න පුළුවනි' සිරකරුවා ආයේත් කියනවා. 'මොන විදියේ හිස් වැස්මක් ද?' 'ඒක අහක දමා තිබුණු පරණ රෙදි කෑල්ලක්.' 'ඒ ගැන හොඳට මතක ද?' 'නැහැ, මට මතක නැහැ.' සිරකරුවා බොහො ම කිපුණා. කිපුණාට මොකද

රෙදි කෑල්ල ගැනූ මතක නැහැ. මිනිසකු ගේ ජීවිතයේ බොහෝ ම භයානක අවස්ථාවල දී, නිදසුනක් වශයෙන් කියතොත් පෝරකයට යන අවස්ථාවේ දී, ඔහුට බොහෝ ම නො වැදගත් දේවල් පවා මතක් වෙනවා. ඔහු එන මග දුටු කොළ පැහැති පියස්සක්, කුරුසයක් මත වසා සිටි කවුඩු පතික්කියෙක්, අනෙක් හැම දෙයකට ම වඩා හොඳට මතක් වෙනවා. ගෙදර සිටින අතර තමා කුඩා පසුම්බියක් මැසූ බව සිරකරුවා සඟවා තැබීමට වෑයම් කළා. තමා ඉදිකටුවක් අතින් ගෙන මසන අවස්ථාවේ දී යම් කිසිවෙක් ගෙදරට පැමිණ තමා කරන දෙය දකී ය යන බියෙන් හිටිය හැටි ඔහුට මතක් වෙන්න ඇති. ඉතා සුළු දෙයින් පවා තැති ගත්තා ඔහු ඉස්කිරිම පිටිපස්සේ සැඟවුණු හැටි ඔහුට සිහිවන්නට ඇති. (ඔහු නතර වී සිටි ගෙදර ඉස්කිරිමක් තිබුණා.)

"ජූරි සභාවේ මහත්වරුනි, තමුන්නාන්සේලාට මා මේ විස්තර කියන්නේ කුමන කරුණක් නිසා ද? මේ නොවැදගත් දේවල් කියන්නේ මන්ද?" යි දණ්ඩනායකයා හදිසියෙන් ම ඇසීය. "සිරකරුවා මේ මොහොත වන තෙක් මුරණ්ඩුකමින් යුතු ව හාස්‍යජනක කතාවේ එල්ලී සිටින නිසයි. දෙ මසකට කලින් මිනීමැරුම සිදු වූ දවසේ සිට අද වන තුරු ඔහු මේ හාස්‍ය ජනක කතාව ඔප්පු කිරීමට පුළුවන් එක ම කරුණක් වත් ඉදිරිපත් කරලා නැහැ. 'මේවා බොහෝ ම සුළු නො වැදගත් දේවල්. තමුන්නාන්සේලා මගේ වචනය විශ්වාස කළ යුතුයි' සිරකරුවා කියනවා. අපි ඔහු ගේ වචනය විශ්වාස කිරීමට බොහෝ ම කැමැතියි. අපි ලේ පිපාසයෙන් පෙළෙන කැනහිලුන් නො වෙයි. අපි එහෙම අය ද? නැහැ, එහෙම අය නො වෙයි. සිරකරුවා ගේ වාසියට හේතු වන එක වචනයක් අපට පෙන්-නන්න. අපි බොහෝ ම ප්‍රීති වෙනවා. එහෙත් එය පිළිගත හැකි දෙයක් විය යුතුයි. නැති ව එය සිරකරුවා ගේ සහෝදරයා විසින් සිරකරුවා ගේ මූහුණ බලා බැස ගත්ත නිගමනයක් නොවිය යුතුයි. නැති නම්, 'කළුවරේ සිට පපුවට ගසා ගත්තා විට ඔහු කලේ බෙල්ල වටේ එල්ලා ගෙන සිටිය මුදල් පසු බිය පෙන්වීමයි' වැනි ප්‍රකාශයක් නොවිය යුතුයි. පිළිගත හැකි සාක්ෂියක් ඉදිරිපත් කරනවා නම් අපි බොහෝ ම සතුටුයි. වහා ම චෝදනාව අස්කර ගැනීමට අපි සූදානම්. නමුත් දූත් 'යුක්තිය ඉෂ්ට විය යුතු ය' කියා යුක්තිය ම කෑගා කියනවා. එ හෙයින් අපි මේ චෝදනා ඒ විදියට ම ඉදිරිපත් කරනවා. කිසි ම දෙයක් අස්කර ගැනීමට පුළුවන් කමක් නැහැ."

මෙ තැන දී දණ්ඩනායකයා දේශනයේ අවසානයට පැමිණි-යේ ය. ඔහුට උණ ගැනී තිබෙන්නාක් මෙන් පෙනේ. "සොර කම් කිරීමේ නීච චේතනාවෙන් යුතු ව පුතා විසින් පියා මරා හලන ලද ලෙසින් පළිගත යුතුයි" කියා ඔහු කෑ ගැවේ ය. ඔහු, බොරු කළ නොහැකි සාක්ෂි ඉතා පැහැදිලි ලෙස පෙන්නා දුන්නේ ය. "විත්තිය වෙනුවෙන් පෙනී සිටින සුප්‍රසිද්ධ උගත් නීතිඥයාගෙන් තමුන්නාන්සේලාට කුමන දෙයක් අසන්නට ලැබුණත්, තමුන්නාන්සේලා ගේ කාරුණික හැඟීම් අමතා එතුමා කො තරම් ව්‍යක්ත ලෙස කතා කළත්, මේ මොහොතේ දී තමුන්නාන්සේලා යුක්තියේ දෙවොල තුළ සිටින බව සිහි තබා ගත යුතුයි. තමුන්නාන්සේලා අපේ යුක්ති ධර්මය ආරක්ෂා කරන වීරයන් බව මතක තබා ගත යුතුයි. අපේ ශුද්ධ වූ මව් බිම, ඇගේ ප්‍රතිපත්ති, ඇගේ පවුල සහ ඈ ශුද්ධ වූ දේවල් මෙන් ආරක්ෂා කරන හැම දෙයක් ම ආරක්ෂා කරන වීරයන් තමුන්නාන්සේලා බව සිහි තබා ගන්න. රුසියන් මාතාව, තමුන්නාන්සේලා ඇගේ වීරයන් ලෙස, ඇගේ විනිශ්චයකාරයන් ලෙස පිළිගෙන, තමුන්නාන්සේලා දෙන තීන්දුවට සවන් දෙනවා ඇත. තමුන්නාන්සේලා දෙන තීන්දුව අසා ඈ ධෛර්යයෙන් පිබිදෙන්නට පුළුවනි. නැතිනම් අධෛර්යයෙන් මැලවෙන්නට පුළුවනි. තමුන්නාන්සේලා ගේ රුසියන් මාතාව විසින් ඇති කර ගන්නා ලද බලාපොරොත්තු කඩ කරන්න එපා. අපේ අවා-සනාවන්ත ත්‍රොයිකාව[1] වේගයෙන් ගමන් කරනවා. සමහර විට එය ගමන් කරන්නේ විනාශය කරා විය හැකියි. හවුරුදු බොහෝ ගණනක සිට රුසියන් ජාතිකයන් ඒ විනාශකාරී ගමන නවත්වන ලෙස දෑත දික්කොට ඉල්ලා තියෙනවා. අනෙක් ජාතීන්, වේගයෙන් යන මේ ත්‍රොයිකාවෙන් ඈත් වී සිටින්නේ, අපේ ලේඛකයන් කියන්නාක් මෙන් කිසි ම ගරු සරුවකින් නො වෙයි, භීතිය නිසයි. සමහර විට කලකිරීමෙන් හා පිළිකුලින් ද විය යුතුයි. ඒ බව හොඳට සිහි තබා ගන්න. වේගයෙන් යන ත්‍රොයිකාවෙන් ඈත් වී සිටීම හොඳ දෙයක්. නමුත් යම් කිසි දවසක ඔවුන් ඈත් වී සිටිනවා වෙනුවට, වේගයෙන් එන ඒ අවතාරය හරහා, ශක්තිමත් පවුරක් මෙන් සිට, ඔවුන් ගේ ආරක්ෂාව, ඥානාලෝකය සහ ශිෂ්ටාචාරය පතා අපේ ආශාවන් මැඩ පවත්වනු ඇත. යුරෝපයේ සිට එන එ වැනි අනතුරු හඟවන හඬ අපට දැනට ම ඇහෙනවා. දැනට ම අපේ

1. ත්‍රොයිකාව - අශ්වයන් තිදෙනකු යෙදූ රථය. නිකොලායි ගොගොල් ඔහු ගේ 'මළ මිනිස්සු' නමැති නවකතාවේ රුසියාව ත්‍රොයිකාවකට සමාන කොට තිබේ. දණ්ඩනායකයා දෙඩන්නේ ඒ ත්‍රොයිකාව ගැන ය.

රටෙත් ද එ වැනි හඬ තික්මෙනවා. ඔවුන් පොළඹවන්න එපා. පුතා විසින් පියා මරා දමා කරන ලද භයානක අපරාධය නිදෙස් බව පවසා තීන්දුව දෙමින් ඔවුන් ගේ වැඩෙන වෛරය නමැති ගින්නට පිදුරු දමන්න එපා.”

දණ්ඩනායකයා, අව්‍යාජ හැඟීම්වලින් පිරීගිය සිතේ හටගත් වේගයෙන් කතා කළත්, දේශනය අවසන් කළේ අනුකම්පාවෙන් හා දයාවෙන් ද යුතු ව ය. ඉන් අපූර්ව ප්‍රතිඵලයක් ඇති විය. දේශනය නිම කළ වහා ම හේ උසාවියෙන් පිට වී ගියේ ය මා කලින් සඳහන් කළාක් මෙන් අනෙක් කාමරයට ගිය හෙතෙම ක්ලාන්ත වන්නට ගියේ ය. සභා ගර්භයේ රැස් ව සිටි අය අත්පොළසන් නුදුන්හ. නඩුව ගැන මහත් සැලැකිල්ලක් දැක්වූ අය තෘප්තියට පත්වූ හ. වඩා සතුටු නො වූයේ කාන්තාවෝ පමණි. එහෙත් ඔවුහු නීතිඥයා ගේ ව්‍යක්ත දේශනය ගැන පැහැදුණහ. විශේෂයෙන් ම නඩුවේ අවසානය ගැන ඔවුන් තුළ සැකයක් ඇති නොවූ හෙයින් ෆිත්තියුකොවිච් නීතිඥයා ගැන ලොකු විශ්වාසයක් තැබූ හ. “ඔහු අන්තිමට කතා කොට නඩුව දිනාවි”යි ඔවුහු කල්පනා කළහ. ඔවුහු මීතියා දෙස බැලූ හ. පැමිණිල්ලේ නීතිඥයා දේශනය කළ කාලය තුළ දී මීතියා දෑත අකුලා ගෙන, තොල් තද කර ගෙන බිම බලා සිටියේ ය. ඔහු ඉඳහිට හිස උස්සා දේශනයට සවන් දුන්නේ විශේෂයෙන් ම දණ්ඩනායකයා ග්‍රෙෂෙන්කා ගැන සඳහන් කරන විට ය. රැකිටින් ග්‍රෙෂෙන්කා ගැන පවසන ලද අදහස් දණ්ඩනායකයා ඉදිරිපත් කරන විට මීතියා ගේ මුහුණ මත ද්වේෂයෙන් හා පිළිකුලින් ද හටගත් සිනාවක් පහළ විය. ඔහු මොනවා දෝ සෙමෙන් කී ය. මුක්රෝයේ දී තමාගෙන් ප්‍රශ්න අසමින් තමාට වද දුන් හැටි දණ්ඩනායකයා විස්තර කරන විට මීතියා හිස උස්සා පුදුමයෙන් අසා සිටියේ ය. දේශනයේ එක් අවස්ථාවක දී ඔහු උඩ පැන මොනවා දෝ කීමට සැරසිණි. එහෙත් වහා සිත මැඩ ගත් ඔහු පිළිකුලින් උරහිස අකුලා ගත්තේ ය. පැමිණිල්ලේ නීතිඥයා මීතියා අත් අඩංගුවට ගෙන ප්‍රශ්න ඇසීමෙන් කළ වික්‍රමය ගැන නඩුවෙන් පසු අපේ ගම් වැස්සෝ නොයෙක් දෑ කීහ. විහිළු කළහ. “මිනිහට පුරසාරම් නො දෙඩා ඉන්න බැහැ”යි ඔවුහු සිනාසෙමින් කීහ.

පැය භාගයක් නැති නම් අඩු ගණනේ මිනිත්තු විස්සක් පමණ වේලා අධිකරණය කල් දමන ලදි. ඒ කාලය තුළ දී එහි රැස් ව සිටි අය අතරේ නොයෙක් විදියේ කතා බහ ඇති විය. ඉන් සමහරක් මට තව ම මතකයි.

"බොහො ම හරබර ඇති කතාව"යි එක් තැනක රැස් ව සිටි මහත්වරු කීප දෙනෙක් සැලැකිල්ලෙන් කීහ.

"මනෝවිද්‍යාව ගැන කතා කළා වැඩියි" තවෙකෙක් කී ය.

"නමුත් ඒ සේරම ඇත්ත. සම්පූර්ණ ඇත්ත."

"හොඳට තමන් ගේ රාජකාරිය දන්නවා."

"බොහො ම හොඳට කාරණා එකතු කරල පැහැදිලි කරල කිව්වා."

"ඔව්, වැඩේ නම් හොඳට කළා. මතක ද කතාවේ මුල හරියේ දී කිව්වා අපි සේරම කරමසෝව් වගේ ය කියා?"

"කතාව අගදිත් කිව්වා. ඒ හරිය කිසි ම තේරුමක් නැති වල්පල් ගොඩක්."

"වැඩිය පැහැදිලි නැහැ."

"හැඟීම් ඇවිස්සුවා වැඩියි."

"එහෙම කියන එක වැරදියි."

"නැහැ නැහැ, බොහො ම හොඳ කතාව. නමුත් මේ වගේ කතාවක් කිරීමට අවස්ථාවක් ලැබෙන තෙක් මිනිහට බොහො ම කාලයක් බලා ඉන්න සිද්ධ වුණා. කොහොම වුණත් මිනිහට අන්තිමේ දී අවස්ථාවක් ලැබුණා. හා! හා! හා!"

"විත්තියේ නීතිඥයා මොනවා කියයි ද දන්නේ නැහැ."

තවත් පිරිසක් අතරේ මෙ වැනි කතාවක් ඇති විය.

"'නුඹේ හැඟීම්වලින් පිහිට ඉල්ලා සිටිනවා'ය කියමින් මිනිහ විත්තියේ නීතිඥයා අවුස්සා වැඩ වරද්දා ගත්තා. මතකයි නේ ද?"

"ඒක එ තරම් හොඳ වැඩක් නො වෙයි."

'මිනිහ කලබල වුණා වැඩියි."

"මිනිහ ලෙඩා."

"අපි හිනා වෙනවා.........සිරකරුවාට මොනව හිතෙනව ද දන්නේ නැහැ."

"ඔව්, මිනියාට මොනවා හිතෙනව ද දන්නේ නැහැ."

තුන් වන පිරිස මෙසේ කතා කෙළේ ය.

"අර පුටු පෙළ කෙළවර ඉඳගෙන ඉන්න මහත ගෑනි කවු ද?"

"ජනරාල් කෙනකු ගේ බිරියක්. දික්කසාද වෙලා. මං හොඳට අඳුනනවා."

"ඒ නිසා වෙන්න ඇති ඇ කන්නාඩියක් පාවිච්චි කරන්නේ!"

"ඒ ගෑනි ගේ එ තරම් වැදගත් කමක් පෙනෙන්න නැහැ."

"එහෙම කියන්න එපා. හරි සැර බඩුව."

"අඩි දෙකක් විතර එහායින් ඉඳගෙන ඉන්න ගෑනි නම් වැඩියත් ලස්සනයි."

"මුක්රෝවේ දී මිනීමරුවා බොහො ම අගේට අල්ලා ගෙන තියෙනවා?"

"වෙන්න ඇති. අපි මීට ඉස්සෙල්ලාත් ඔය කතාව ඇහැව්වා. අපේ දණ්ඩනායකයා ඒ ගැන ටවුමේ ගෙයක් ගානේ පුරසාරම් දෙඩමින් යනවා."

"අහංකාර කම නිසයි පුරසාරම් දෙඩන්නේ."

"දුක්ගැනවිල්ලක් තියෙන මිනිහෙක් නොවැ!"

"ඔව්, මිනිහට බොහො ම ඉක්මනට කේන්ති යනවා. කතාවටත් බොහො ම දක්ෂයි. වාක්‍ය කො තරම් දිග ද?"

"අප බය කරන්න හදනවා. ඇයි අහගෙන හිටියේ නැද්ද? ට්‍රොයිකාවේ කතාව මතක නැද්ද? 'ඔවුන් අතරේ හැම්ලට්වරුත් ඉන්න අතර අප අතරේ කරමසෝවරුත් ඉන්නවා' බොහො ම හොඳ කියමන."

"එහෙම කිව්වේ නිදහස්මතධාරීන් සතුටු කරන්න. මිනිහා නිදහස්මතධාරීන්ට බොහෙ ම බයයි."

"ඔව්, මිනිහා විත්තියේ නීතිඥයාටත් බයයි."

"විත්තියේ නීතිඥයා මොනවා කියයි ද දන්නේ නැහැ."

"මොනව කිව්වත් අපේ ගොවියත් නම් පක්ෂ කරගන්න ලැබෙන්නේ නැහැ."

"එහෙම කියන්න එපා."

හතර වන පිරිස.

"ට්‍රොයිකාව හා අනෙක් රටවල් ගැන කියාපු කොටස හොඳයි."

"අනෙක් රටවල් බලා ඉන්නේ නැහැ කී කතාව ඇත්තයි."

"ඇයි එහෙම කියන්නේ?"

"ඇයි, ගිය සතියේ එන්ගලන්තයේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී-වරයෙක්, ශූන්‍ය වාදීන් ගැන කතා කරලා, ඇමතිවරයාගෙන් ඇහැව්වා, ම්ලේච්ඡ ජාතිය කරන කටයුතුවලට මැදහත් වී හොඳ පාඩම කියා දීමට කාලය පැමිණ නැද්ද කියා. දණ්ඩ-නායකයාට ඒ ගැන මතක තිබුණා. ගිය සතියේ මිනිහා ඔය කාරණාව ගැන කතා කරනවා මම අහගෙනයි."

"ඒ මෝඩයන්ට කවදාවත් එ වැනි දෙයක් කරන්න ලැබෙන්නේ නැහැ."

"මොකද කරන්න බැරි?"

"අපි එන්ගලන්තයට තිරිඟු නො දී සිටිමු. එතකොට ඒ ගොල්ලෝ කොහෙන් ද තිරිඟු ගන්නේ?"

"අමෙරිකාවෙන් ගනීවි."

"අර්ථයක් නැති දේවල් කියන්න එපා."

ඒ මොහොතේ දී සීනුව නාද වූ නිසා ඔවුහු වහා උසාවිය තුලට ගොස් අසුන් ගත්හ. විත්තියේ නීතිඥයා කථිකාසනයට නැඟ ගත්තේ ය.

දහ වන පරිච්ඡේදය

විත්තියේ දේශනය, දෙපැත්ත කැපෙන තර්කය

ඒ කීර්තිමත් ව්‍යක්ත දේශකයා ගේ පළමු වචන ස්වල්පය රැව්දෙන විට අධිකරණය තුළ දැඩි නිශ්ශබ්දතාවක් ඇති විය. රැස් ව සිටි සියළු දෙනා ගේ ම නෙත් සිත් ඔහු දෙසට යොමු විය. හෙතෙම සිය දෙසුම ලිහිල් බසින් හා ආත්ම විශ්වාසයෙන් යුතු ව ද ආරම්භ කෙළේ ය. එහි අබමල් රේණුවක් තරම් වත් අහංකාර කමක් දකින්නට නො තිබිණි. කපිකත්වය ප්‍රදර්ශනය කිරීමට වෑයමක් හෝ, සිතේ හැඟීම් ඇවිස්සෙන සුළු පාර් භාවිතයක් හෝ එහි නො වී ය. හෙතෙම අනුකම්පාවෙන් පිරි, හිතවත් මිතුරන් කිප දෙනකුට කතා කරන මිනිසකුට සමාන විය. විනිවිද ගිය ඔහු ගේ කට හඬ කන්කලු ය. එහි කිසියම් අව්‍යාජ ගතියක් හා අවංක භාවයක් ද දකින්නට තිබිණි. එහෙත් දේශකයාට හදිසියෙන් වුව ද අනුකම්පා රසයෙන් හා කරුණා රසයෙන් ද දේශනය රසවත් කොට, අසා සිටින්නවුන් ගේ හදවත්, වචනයෙන් විස්තර කළ නොහැකි වේගයකින් විනිවිද ගිය හැකි බව හැම දෙනා ම එක්වර ම දුනගත්හ. ඔහු ගේ කතාව පැමිණිල්ලේ නීතිඥයා ගේ කතාවට වඩා විෂම විය. එහි පිළිවෙළක් නො වී ය. එහෙත් දිග වාක්‍යවලින් තොර වූ ඔහු ගේ කතාව සම්පූර්ණ විය. කාරණයට වඩාත් ගැළපෙන්නේ විය. ඔහු පිළිබඳ එක් කරුණක් ගැහැනුන් ගේ සිත් නො ගත්තේ ය. වෙසෙසින් ම දේශනයේ ආරම්භයේ දී හෙතෙම මඳක් ඉස්සරහට නැමුණේ ය. එය ආචාර කිරීමක් ලෙස පිළිගත නොහැකි ය. එය තමා ගේ දේශනයට සවන් දී සිටින්නවුන් වෙත කඩා පැනීමට තැත් කිරීමක් වැන්න. ඔහු ඔහු ගේ දිග කොඳුඇටය මැදින් නැමුවේ, එය සෑජ් කෝනයක හැඩයට නැමිය හැකිවන තරමට එහි ඇත්තේ කවිකොට ඇත්තාක් මෙනි.

ආරම්භයේ දී ඔහු ගේ දේශනයේ වැඩි සම්බන්ධයක් නො වී ය. පිළිවෙළක් නො වී ය. හෙතෙම එක් කරුණක සිට තවත් කරුණකට පැන්නේ ය. ඔහු කරුණු වෙන වෙන ම

ගෙන විග්‍රහ කෙළේ ය. එහෙත් අන්තිමේ දී මේ කරුණු සියල්ලක් ම එකට සම්බන්ධ විය. ඔහු ගේ දේශනය කොටස් දෙකකට බෙදිය හැකි ය. පළමු කොටස, ඔහු සිරකරුවාට එල්ල වී ඇති චෝදනා විග්‍රහ කොට ඒවා වැරැදි බව ඔප්පු කෙළේ ය. ඇතැම් විට ඔහු ගේ කතාව දොෂයෙන් පිරුණේ ය. ඇනුම් පද සහිත විය. දෙවන කොටසේ දී හදිසියෙන් ම කතාවේ ස්වරය පමණක් නො ව කතා විලාසය ද වෙනස් වී අනුකම්පා රසයෙන් හා කරුණා රසයෙන් ද පිරුණේ ය. ඔහුට සවන් දී සිටි පිරිස මෙ වැනි දෙයක් කලින් බලාපොරොත්තු වූවාක් මෙන් උද්වේගයෙන් වෙව්ලන්නට විය.

කෙළින් ම නඩුව ගැන කතා කරන්නට පටන් ගත් නීතිඥයා තමා පීටර්ස්බර්ග් පුරයේ වෙසෙමින් සිය වෘත්තියෙහි යෙදුණත් චෝදනා ලැබ සිටින සිරකරුවන් වෙනුවෙන් පෙනී සිටීමට ප්‍රාදේශික නගරයකට ගිය පළමු වතාව මෙය නො වේ යයි කී ය. ඔහු එසේ ගියේ සිරකරුවන් ගේ නිදොස් බව පිළිගෙන ය. නැති නම් නිදොස් බව ගැන ඇති කරගත් පිළිගැනීමකින් යුතු ව ය. "මේ නඩුවේ දී මට මුහුණ පෑමට සිදු වී තියෙන්නේ එ වැනි තත්ත්වයකටයි. මුල සිට ම පුවත්පත්වල පළ වූ ප්‍රවෘත්ති අනුව සිරකරුවා ගේ වාසියට හේතු වූ යම් කිසිවක් මගේ සිත ඇදගත්තා මගේ සිත නඩුව කෙරෙහි වඩාත් ඇදී ගියේ නීති වෘත්තියේ දී අපට මුහුණ පෑමට සිදුවන වැදගත් ප්‍රශ්නයක් නිසයි. මේ නඩුවේ දී තරම් ඒ ප්‍රශ්නය අංග සම්පූර්ණ ව දකින්න ලැබෙන්නේ බොහො ම කලාතුරකින්. ඒ ප්‍රශ්නය මතුකරන්න තිබුණේ කතාවේ අන්තිමටයි. මගේ අදහස් සඟවා නො ගෙන, නඩුව පිළිබඳ ව මා සතු ව ඇති වැදගත් කරුණු පිරිමසා නො ගෙන, කෙළින් ම දේශනයට බැසීම මා තුළ ඇති දුර්වල-කමක් නිසා ඒ වැදගත් ප්‍රශ්නය මුල දී ම ඉදිරිපත් කිරීමට මා . අදහස් කරනවා. ඒක එ තරම් නුවණට හුරු දෙයක් නො වෙන්න පුළුවනි. එහෙත් ඒක අවංක ව කරන දෙයක්. මගේ නිගමනයත් ඒක මයි. සිරකරුවාට විරුද්ධ ව බොහො ම සාක්ෂි ඉදිරිපත් කරල තියෙනවා. නමුත් ඒ සාක්ෂි වෙන වෙන ම ගෙන විභාග කොට බැලුවොත් කිසි ම වටිනා කමක් නැහැ. පුවත්පත්වල පළ වූ මූලික පරීක්ෂණයේ වාර්තා කියවා බැලූ මට මගේ අදහස් නිවැරැදි බව පෙනී ගියා. ඒ අතරේ මේ නඩුවේ විත්තිය වෙනුවෙන් පෙනී සිටින්නට ය කියා මට සිරකරුවා ගේ නෑයන්ගෙන් හදිසියෙන් ම කැඳවීමක් ලැබුණා. මම වහා ම මේ නගරයට පැමිණියා. මගේ අදහස්

තිවැරැදි බව මට මෙහාට පැමිණී පසු සම්පූර්ණයෙන් ම පෙනී ගියා. මේ භයානක සාක්ෂි එක්තැන් කොට තනන ලද යදම බිඳ දමා, හැම සාක්ෂියක් ම වෙන් වෙන් ව ගත් කල ඒ එක සාක්ෂියක්වත් ඔප්පු කර නැති බවත්, ඒවා අද්භූත කතාවලට සමාන බවත් ඔප්පු කිරීම පිණිස මම මේ නඩුව භාරගත්තා.''

මෙසේ දේශනය පටන් ගත් මීතියා ගේ නීතිඥයා හදිසියෙන් ම මෙසේ කී ය.

''ජූරි සභාවේ මහත්වරුනි, මා මේ පළාතට අමුත්තෙක්. මේ නඩුව ගැන මා කලින් නිගමනවලට බැහැ ගෙන නැහැ. සැර පරුෂ කමින් හා මැඩ ගත නොහැකි කෝපයකින් යුත් මේ සිරකරුවා මට අපහාස කරලා නැහැ. ඔහු මේ නගරයේ වෙසෙන සිය ගණන් නගර වැසියන්ට අපහාස කරලා කලින් ම තරහ කරගත්තා. මේ නගරයේ වෙසෙන අය සිරකරුවාට විරුද්ධ වීම අසාධාරණයක් නොවන බව මම දන්නවා. සිරකරුවා දැඩි කෝපයෙන් යුත් නොහික්මුණු තරුණයකු බව මා පිළිගන්නවා. එහෙත් මේ නගරයේ කවුරුත් ඔහු ආදරයෙන් පිළිගත්තා. වෙනෙකක් තබා මගේ උගත් මිත්‍ර දණ්ඩනායකයා පවා සිය නිවසේ දී මේ තරුණයා පිළිගෙන සංග්‍රහ කළා.''

මේ කතාව අසා සිටි දෙතුන් දෙනෙක් සිනාසුණහ. ඒ සිනාව වහා මැඩ ගන්නා ලදි. එහෙත් එය කවුරුත් අසා සිටියහ. දණ්ඩනායකයා සිය නිවෙසේ දී මීතියා පිළිගත්තේ නොකැමැත්තෙන් බව කවුරුත් දනිති. ඔහුට මීතියා පිළිගැනීමට සිදුවූයේ ඔහු ගේ බිරිය කෙසේ හෝ මීතියා ගැන සැලැකිලිමත් වූ නිසා ය. ඈ කුලකතකි. එසේ ම ඉතා සුළු කරුණුවල දී සැමියා ගේ අදහස්වලට විරුද්ධවීමට කැමැති හිතුවක්කාරියකි. එහෙත් මීතියා නීතිඥයා ගේ නිවෙසට නිතර නො ගියේ ය. ''කෙසේ වෙතත් මගේ උගත් මිත්‍රයා වැනි ධර්මිෂ්ඨ චරිතයක් හා නිදහස් සිතක් ද ඇති කෙනකු පවා අවාසනාවන්ත සිරකරුවා ගැන අවිචාර අදහස් ඇති කරගත් බව පැවසීමට මා බෙඩීවත් වෙනවා. එය සිදුවිය යුතු සාධාරණ දෙයක්. මේ සිරකරුවා අන්‍යයන් තුළ අවිචාර අදහස් ඇති කරවීමට සමත් ගතිගුණවලින් යුත් තැනැත්තෙක්. දූෂණය කරන ලද සදාචාරය හා සෞන්දර්යයීය පිළිබඳ හැඟීම් කෲරයි, නපුරුයි. පැමිණිල්ලේ නීතිඥයා, එතුමා ගේ ව්‍යක්ත දේශනය කරන අතරේ සිරකරුවා ගේ චරිතය, කල්ක්‍රියාව හා නඩුව ගැන කරන ලද දැඩි විවේචනය අපට අහන්නට ලැබුණා. එ පමණක් ද

නො වෙයි, මේ නඩුවේ සාරය ගෙන හැර දක්වීම පිණිස ඉතා ගැඹුරු මානසික විග්‍රහයක් ද කළා. සිරකරුවාට විරුද්ධ ව ද්වේෂයෙන් පිරි අගතිගාමී අවිචාර හැඟීමක් යත්නම් හෝ ඕනෑ කමින් ම ඇති කරගත්තා නම් එවැනි ගැඹුරු මානසික විග්‍රහයක් කරන්න බැරි වෙනවා. ඕනෑ කමින් ම ඇති කර ගත් ද්වේෂය සහගත විරුද්ධ අදහස්වලට වඩා භයානක, මාරක දේවල් ද තියෙනවා. කලාත්මක සහජ බුද්ධිය හා දෙවියන් විසින් අපට ප්‍රදානය කරන ලද සිත විනිවිද දක්නා ඥානය තිබේ නම් නවප්‍රබන්ධයක් නිර්මාණය කිරීමට ඇති ආශාවට අපි අපේ සිතට ඉඩ දුන්නොත් මහ විපතක් සිදුවීමට ඉඩ තියෙනවා. මා මේ නගරය බලා පිටත් වීමට කලින් පීටර්ස් බර්ග් නුවර දී මට නොයෙක් දෙනා කිව්වා, අපේ නීති වෘත්තියෙහි අලුත් විදියේ ප්‍රසිද්ධියක් දිනා ගත්, නිපුණ විචක්ෂණ භාවයක් හා මිනිස් සිත විනිවිද දක්නා ශක්තියක් ද ඇති විරුද්ධවාදියකුට මුහුණ දීමට සිදුවන බව. මා ද ඒ බව කලින් දැන ගෙන හිටියා. ජූරි සභාවේ මහත්වරුනි, මිනිස් සිත විනිවිද දැකීම ගැඹුරු විද්‍යාවක්. ඒ වගේ ම දෙපැත්ත කැපෙන තියුණු අවියක්. (උසාවියෙන් සිනා හඬ නික්මෙයි) මගේ දිළිඳු උපමාව ගැන තමුන්නාන්සේලා මට සමා විය යුතුයි. මා ව්‍යක්ත කථිකයෙක් නො වෙයි. මගේ අදහස විස්තර කිරීම සඳහා දණ්ඩනායකයා ගේ දේශනයෙන් නිදර්ශනයක් ගැනීමට මා කැමැතියි.

"රාත්‍රි අන්ධකාරයේ මහ ගෙයි වත්ත හරහා දිව යන සිරකරුවා වැට උඩින් පනිනවා ඔහු අල්ලා නතර කර ගැනීමට තැත් කළ ග්‍රිගෝරිස් ගේ හිසට, සිරකරුවා අතේ ගෙන ගිය පිත්තල මෝලෙන් පහර දෙනවා. ඊට පස්සේ ඔහු ආපසු වැටෙන් පැනල ග්‍රිගෝරිස් මළා ද නැද්දැයි සොයා ගැනීම පිණිස මිනිත්තු පහක් පමණ ගත කරනවා. තමා ආපසු ග්‍රිගෝරිස් ළඟට ගියේ සිතේ ඇති වූ අනුකම්පාවෙන් යයි සිරකරුවා කරන ප්‍රකාශය පිළිගැනීමට පැමිණිල්ලේ නීතිඥ මහතා කැමැති නැහැ. එවැනි අවස්ථාවල දී අනුකම්පා සහගත හැඟීම් ඇති වෙන්නේ නැහැ. එය අස්වාභාවික දෙයක්. සිරකරුවා ආපසු ග්‍රිගෝරිස් ළඟට ගියේ තමා දුටු එක ම සාක්ෂිකාරයා මළා ද නැද්ද කියා දැන ගැනීමටයි. සිරකරුවාට ආපසු පැමිණීමට වෙනත් හේතුවක් නැති නිසා, ඉන් ඔහු මිනීමරුවකු බව ඔප්පු වෙනවා.' මෙය දණ්ඩනායකයා ගේ තර්කයයි. මෙය සිත විනිවිද බැලීමෙන් කරන පරීක්ෂණයක ප්‍රතිඵලයක්. අපි එම පරීක්ෂණය ගෙන අනෙක් පැත්තට යොදා බලමු. ඉන් ලැබෙන ප්‍රතිඵලය පිළිගැනීමට අපහසුවක්

නැති බව තමුත්නාත්සේලාට පෙනී යනවා ඇති. තමාට විරුද්ධ ව සිටින එක ම සාක්ෂිකාරයාට තවමත් පණ තියෙනවා ද නැද්ද කියා සොයා බැලීමට සිරකරුවා ආපසු වැට උඩින් පැන්න බව අපට දණ්ඩනායකයා කිව්වා. රූබල් තුන් දහක් තිබෙන බව දන්වා පිටතින් ලියා ඇති, ඉරන ලද ලියුම් කවරයක් සිරකරුවා පියා ගේ කාමරයේ, පියා ගේ මිනිය ළඟ දමා ගිය බව ද අපට දණ්ඩනායකයා කියා සිටියා. මේ ලියුම් කවරය සිරකරුවාට විරුද්ධ ව ඉදිරිපත් කරල තියෙන භයානක සාක්ෂියක්. 'සිරකරුවා ලියුම් කවරය ගෙන ගියා නම්, මුදල් සහිත ලියුම් කවරයක් තිබුණු බවත්, සිරකරුවා එහි තිබුණු මුදල් සොරා ගත් බවත්, මේ ලෝකේ කිසි ම කෙනකුට දැනගන්න ලැබෙන්නේ නැහැ' මේවා දණ්ඩනායකයා ගේ මුවෙන් පිට වූ වචනයි. ඉතින් තමුත්නාත්සේලාට පෙනෙනවා නේ ද එක වේලාවක දී සිරකරුවා තමා ගේ ආරක්ෂාව ගැන කිසි ම සැලකිල්ලක් දක්වන්නේ නැති ව, බියෙන් සිහිය අවුල් කරගෙන, තමාට විරුද්ධ ව ඉදිරිපත් කළ හැකි ඉතා වැදගත් සාක්ෂි පවා, දමා යනවා. ඊට මිනිත්තු දෙකකට පස්සේ, පහර දී, මිනිසකු මරා, තමා ගේ ආරක්ෂාව පතා අමනුෂ්‍යයකු වගේ ක්‍රියා කරනවා. ඇත්ත වශයෙන් ම මේ වැනි දෙයක් සිදුවුණා ය කියා අපට පිළිගන්න පුළුවන් ද? මේ සියලු ම මානසික පරීක්ෂණවලින් වැයම් කරන්නේ, එක් අවස්ථාවක දී, තියුණු දූසිත් යුත්, ලේ පිපාසයෙන් පෙළෙන කෝසිකත් උකුස්සකු මෙන් හැසිරෙන මිනිහෙක්. අනෙක් මොහොතේ දී, කිසි ම වැදගැම්මකට නැති මෝඩ අන්ධ වැලි මීයකු වගේ ක්‍රියා කරන බව ඔප්පු කිරීමටයි. නමුත්, මා ලේ පිපාසයෙන් පෙළෙන කෲර කපටියෙක් නම් මිනියක් මරා, එය දුටු සාක්ෂිකාරයාට පණ තියෙනවා ද නැද්ද කියා බැලීමට මොනවට ද ආපසු එන්නේ? මොනවට ද එ තැන මිනිත්තු පහක් හෝ ඊට වැඩි කාලයක් හෝ ගත කොට තවත් මට විරුද්ධ සාක්ෂිකාරයන් වැඩි කර ගන්නේ? පසු ව මට විරුද්ධ ව සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කරන බව දැනදැනත් මා මොනවට ද මගේ ලේන්සුව ගෙන ගිරිගෝරිස් ගේ හිස පිස දමා ලේන්සුවේ ලේ තවරා ගන්නේ? මා ලෙහි අනුකම්පාවක් නැති කපටි මිනීමරුවෙක් නම් ඊට වඩා හොඳ නැද්ද ගිරිගෝරිස් මැරුණ බවට සැක හැර ගැනීම පිණිස තවත් කීප වරක් අතේ තිබුණු දඬුයෙන් හිසට පහර දී සාක්ෂිකාරයා විනාශ වූ බව දැන ගෙන හිත සනසා ගන්නා නම්? අනෙක් අතින් සිරකරුවා තමාට විරුද්ධ ව සිටින එක ම සාක්ෂිකාරයා මළා ද නැද්දැයි සොයා ගැනීම

පිණිස ආපසු පැමිණ තවත් සාක්ෂියක් මඟ දමා යනවා. සිරකරුවා සේවිකාවත් දෙදෙනා ගේ ගෙදරින් ගෙනා පිත්තල මෝල්ගහ මඟ දමා ගියා. මේ ගැහැනු දෙදෙනාට පසු ව ඕනෑ ම වේලාවක ඒ පිත්තල මෝල්ගහ තමන් ගේ බව හැඳින ගෙන සිරකරුවා එය ගෙන ගිය බව කියන්න පුළුවනි. සිරකරුවා එම අවිය අමතක වී දමා ගියේ නැහැ. ඔහු එය වීසි කළා. එය වැටී තිබුණේ ගිරිගෝරිස් සිටි තැනට අඩි පහළොවක් පමණ ඈතින්. සිරකරුවා එවැනි දෙයක් කළේ මන්ද කියා තමුන්නාන්සේලා ප්‍රශ්න කරන්න පුළුවනි. මනුෂ්‍යයකු මැරීම ගැන, තමා ගේ මහලු දාසයා මැරීම ගැන එවේලේ සිරකරුවා තුළ දරුණු වේදනාවක් ඇති වූ නිසයි. ඔහු සාප කරගනිමින් ඒ භයානක අවිය වීසි කළා. එය සිදුවන්නට ඇත්තේ මේ විදියටයි. නැති නම් මොනවට ද ඔහු එම අවිය එතරම් දුර වීසි කරන්නේ? මනුෂ්‍යයකු මැරීම ගැන ඔහු තුළ ශෝකයත් සමඟ අනුකම්පාවක් ඇති වුණා නම් ඉන් ඔප්පු වෙනවා ඔහු පියා නොමැරූ බව. ඔහු පියා මරා පැන යන අතරේ තමා ගේ අතින් තවත් එකෙක් මැරුම් කෑවා නම්, මැරුම් කෑ තැනැත්තා ළඟට ඔහු අනුකම්පාවෙන් යුතු ව ආපසු යන්නේ නැහැ. ඒ වෙලාවේ ඔහු ගේ සිතේ තමා ගේ ආරක්ෂාව ගැන මිස අනුන් ගැන අනුකම්පාවක් ඇතිවෙන්නේ නැහැ. එය එසේ මයි. නැති නම් ඔහු මහලු දාසයා ළඟ මිනිත්තු පහක් නාස්ති නො කර, අවියෙන් ගසා මොළය පොඩිකර දමනවා ඇති. එහෙත් ගිරිගෝරිස්ට පහර දෙන තෙක් සිරකරුවා ගේ සිත පැහැදිලි ව ක්‍රියා කළ නිසා තමයි එහි අනුකම්පාව ඇති වුණේ. දැන් මෙ තැන තියෙන්නේ අමුතු විදියේ මානසික විද්‍යාවක්. ජූරි සභාවේ මහත්වරුනි, මා මෙහි දී මානසික විද්‍යාව ඕනෑ කමින් ම ආධාර කරගත්තේ එමගින් ඕනෑ ම දෙයක් ඔප්පු කළ හැකි බව පෙන්වීම පිණිසයි. වෙනසකට තියෙන්නේ එම විද්‍යාව උපයෝගි කරගන්නා අය අතරේ ඇති වෙනස් මතයි වග කිව යුතු මිනිසුන් පවා, ඕනෑ කමින් තනා ගත් අලංකාර කතා පැවසීමට මානසික විද්‍යාවෙන් අනුබල ලබනවා. ජූරි සභාවේ මහත්වරුනි, මා මෙ පමණ වේලා කීවේ මානසික විද්‍යාවෙන් නොහිසි ප්‍රයෝජන ගැනීම ගැනයි.”

විත්තියේ නීතිඥයා ගේ දේශනය අනුමත කරන සිනා හඬක් උසාවියෙන් නික්මිණි. ඔවුන් සිනාසුණේ දණ්ඩනායකයා ගැන ය. මම විත්තියේ නීතිඥයා ගේ දේශනය සම්පූර්ණයෙන් ම නො කියා ඉතා වැදගත් කොටස් පමණක් ඉදිරිපත් කරමි.

එකොළොස් වන පරිච්ඡේදය

මුදලුත් නැත, කළ සොරකමකුත් නැත

කථා තුළත් විස්මය ඇති කළ එක් කරුණක් චිත්තියේ නීතිඥයා ගේ දේශනයට ඇතුළත් විය. හෙතෙම රූබල් තුන් දහේ කතාවත්, අනතුරු ව එය සොරා ගැනීමේ සිද්ධියත් සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කෙළේ ය.

"ජූරි සභාවේ මහත්වරුනි" නීතිඥයා ජූරි සභාව අමතමින් යළි දේශනය ආරම්භ කෙළේ ය. "මේ නඩුවට සම්බන්ධ වූ විශේෂ ලක්ෂණයෙන් යුත් එක් කරුණක් අවිචාර හැඟීමෙන් තොර වූ හැම දෙනා තුළ ම සැලැකිල්ලක් ඇති කළ යුතුයි. ඒ කරුණ නම්, සොරකම් කිරීමේ චෝදනාව ගැනත්, නියම වශයෙන් ම අසවල් දෙය සොරකම් කළා යයි ඔප්පු කිරීමට ඇති අපහසුව ගැනත්, සැලැකිලිමත් විය යුතුයි. රූබල් තුන් දහක් සොරකම් කළා ය කියා සිරකරුවාට චෝදනා කර තිබෙනවා. එ වැනි මුදලක් තිබුණු බව දැන සිටිය කෙනෙක් පෙනෙන්නට නැහැ. ටිකක් කල්පනා කරල බලන්න; පළමු ව, රූබල් තුන් දහක් තිබෙන බව අප දන්නේ කොහොම ද? එම මුදල දැක්ක කෙනෙක් ඉන්නව ද? ඒ මුදල් දුටු, මුදල් ලියුම් කවරයක දමා කවරය උඩ මුදල් ලැබිය යුතු තැනැත්තිය ගේ නම ලියනවා දුටු එක ම තැනැත්තා පියෝදර් කරමසෝ ගේ දාසයා වන පැවල් ස්මාඩියාකෝප් පමණයි. මහලු කරමසෝ මරා දැමීමට කලින් සිරකරුවාටත්, ඔහු ගේ සහෝදරයා වන ඉවාන් කරමසෝටත්, රූබල් තුන් දහ ගැන විස්තර කිව්වේ පැවල්; ගෘසෙන්කාට ද ඒ බව දන්වා තිබුණා. නමුත් මේ තුන් දෙනා ගෙන් එක් කෙනෙක් වත් මුදල් දුටුවේ නැහැ. මුදල් දුටුවේ පැවල් පමණයි. මෙහි දී මෙ වැනි ප්‍රශ්නයක් මතු වෙනවා. මුදල් තිබුණු බව ඇත්ත නම්, පැවල් ඒ මුදල් දුටුවා නම්, ඔහු එය අන්තිම වරට දුටුවේ කවදා ද? අන්න එකයි ප්‍රශ්නය ඔහුට නො කියා මහලු කරමසෝ, මෙට්ටය යට තිබුණු මුදල් ගෙන මුදල් පෙට්ටියේ තැබුවා නම් මොකද වෙන්නේ? පැවල් ගේ කතාවේ හැටියට මුදල් තිබුණේ මෙට්ටය යටයි. එහෙනම් සිරකරුවා මෙට්ටය යට තිබුණු මුදල් එළියට

ගත යුතුයි. නමුත් මහලු කරමසෝ තිඳගත්තා ඇඳ කොහොමටවත් අවුස්සා නොතිබුණු බව පරීක්ෂණ වාර්තාවේ ඉතා පරිස්සමින් හා පැහැදිලි ව ද සඳහන් වී තිබුණා. කොහොම ද සිරකරුවා ඇඳ අවුස්සන්නේ නැති ව මුදල් ගත්තේ? ඔහු කමින් ම පිරිසුදු ඇතිරිලි දමා පිළියෙළ කරන ලද එම ඇඳේ, සිරකරුවාගේ අතේ තිබුණු ලේ නො ගෑවුණේ මන්ද? එතකොට නමුත්නාත්සේලා මගෙන් අහන්න පුළුවනි, ලියුම් කවරය බිම තිබුණේ කොහොම ද කියා. කොහොම වුණත්, එම ලියුම් කවරය ගැන වචන සවල්පයක් කීම අවශ්‍යයි. දැන් සවල්ප වේලාවකට කලින් මගේ උගත් මිත්‍රයා මේ ලියුම් කවරය ගැන කතා කරන විට මා තුළ ලොකු පුදුමයක් ඇති වුණා. මගේ උගත් මිත්‍රයා; මහලු කරමසෝ මැරුවේ පැවල් ය යන චෝදනාවේ ඇති හාස්‍යජනක ගතිය ගැන විස්තර කරන අතර 'මේ ලියුම් කවරය නො තිබුණා නම්, සාක්ෂියක් හැටියට එය බිම දමා නො ගියා නම්, සිරකරුවා ලියුම් කවරය ගෙන ගියා නම්, මෙ වැනි ලියුම් කවරයක් තිබුණු බව වත්, එම ලියුම් කවරයේ මුදල් තිබුණු බව වත් ලෝකයේ කිසි ම කෙනකුට දැනගන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා සිරකරුවා මුදල් සොරාගත්ත ඇතැයි' කිව්වා, දණ්ඩනායකයා කල මේ කතාවේ හැටියට සොරකමක් සිදු වූ බව ඔප්පු කරන්න පුළුවන් එක ම සාක්ෂිය මේ ලියුම් කවරය පමණයි. 'නැති නම් ලියුම් කවරයක් තිබුණු බවත්, ඒ ලියුම් කවරයේ මුදල් තිබුණු බවත්, එම මුදල් සොරකම් කල බවත්, ලෝකයේ කිසි ම කෙනකුට දැනගන්න ලැබෙන්නේ නැහැ.' ලියුම් කවරයේ මුදල් තිබුණු බවත්, එම මුදල් සොරා ගන්නා ලද බවත්, බිම වැටී තිබුණු ඉරා දමන ලද ලියුම් කවරයෙන් කිසිසේත් ම ඔප්පු වෙන්නේ නැහැ. ඒ වුණත් පැවල් ලියුම් කවරය සමඟ මුදල් දුටු බව කියා නමුත්නාත්සේලා මගේ කතාවට විරුද්ධ වෙන්න පුළුවනි. එසේ නම් පැවල් අන්තිම වරට මුදල් දුටුවේ කවදා ද? කියා මා දැනගැනීමට කැමැතියි. මම ඒ ගැන පැවල් සමඟ සාකච්ඡා කළා. මිනී-මැරුමට දෙ දිනකට කලින් මුදල් දුටු බව ඔහු මට කිව්වා. යම් විදියකින් මහලු කරමසෝ ලියුම් කවරය සහිත මුදල් සේප්පුවේ දමා වැසුවා නම්? ඊට පස්සේ රෑ ගෲෂෙන්කා එන තෙක් නො ඉවසිල්ලෙන් බලා සිටින විට, කරන්නට දෙයක් නැති ව, ලියුම් කවරය සේප්පුවෙන් ගෙන කවරය ඉරා බිම දමා මුදල් ගෙන බැලුවා නම් මොකද වෙන්නේ? 'ලියුම් කවරය පමණක් පෙන්නීමෙන් වැඩේ හරි නො යන්නට

පුළුවනි. එහි මුදල් තියෙන බව ගෘසෙත්කා විශ්වාස නොකරන්න පුළුවනි. නමුත් දේදුත්තේ පාවින් යුත් රූබල් සියේ නෝට්ටු තිහ දුටු හැටියේ ම, මට හොඳට විශ්වාසයි ඇගේ කටට කෙල උනනවා ඇති' මේ විදියට කල්පනා කරලා මහලු කරමසෝ සේප්පුවෙන් ලියුම් කවරය ගෙන ඉරා මුදල් ගෙන මිනීමරුවකු අල්ලා ගැනීමට උපකාර වන සාක්ෂියක් ඉතිරි කරන බවක් කල්පනා නො කොට ලියුම් කවරය බිම දමන්න ඇති. මුදල්වල අයිතිකාරයා හැටියට එ වැනි දෙයක් කිරීමට මහලු කරමසෝට සම්පූර්ණ අයිතියක් තියෙනවා. ජූරිසභාවේ මහත්වරුනි, මෙ වැනි දෙයක් සිදුවුණේ නැත කියා අපට කල්පනා කරන්න පුළුවන් ද? එ වැනි දෙයක් සිදුවුණා නම් හොරකම ගැන චෝදනාව සම්පූර්ණයෙන් ම බිඳ වැටෙනවා. මන්ද? මුදල් නො තිබුණා නම් හොරකමක් සිදුවිය නො හැකියි. ලියුම් කවරය බිම තිබීම එහි මුදල් තිබුණු බව ඔප්පු කළ හැකි සාක්ෂියක් ලෙස පිළිගත හැකි නම් මන්ද එහි විරුද්ධ පැත්ත ගෙන, ලියුම් කවරය බිම දමා තිබුණේ එහි මුදල් නො තිබුණු නිසා ය, මුදල් ගත්තේ එහි අයිතිකාරයා ය, කියා මට තර්ක කරන්න බැරි මන්ද? 'බොහො ම හොඳයි, මහලු කරමසෝ ලියුම් කවරය ඉරා මුදල් ගත්තා නම් ඔහු ඒ මුදල් තිබ්බේ කොහෙ ද? ගෙය සෝදිසි කරන විට මුදල් නො ලැබුණේ මන්ද?' කියා මගෙන් ප්‍රශ්න කරන්න පුළුවනි. පළමු ව එම මුදලින් කොටසක් සේප්පුවේ තිබී ලැබුණා. දෙවනු ව, ඔහු එදා උදේ නැති නම් සවස එම මුදල් ගෙන වෙන වැඩක් කරන්න ඇති. යම් කිසිවකුට දෙන්න ඇති. කොටහරි යවන්න ඇති. නැති නම් අත්තිමේ දී පැවල්ට නො කියා, මුදල්වලින් කිරීමට අදහස් කරගෙන තිබිය වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් ම වෙනස් කරන්න ඇති. එ වැනි දෙයක් සිදුවුණා ය කියා පිළිගත හැකි නම් මුදල් සොරකම් කිරීම සඳහා සිරකරුවා ඔහු ගේ පියා මරුවා යයි කියන්නේ කොහොම ද? මේක නවකතාවක් වගෙයි. යම්කිසි කෙනෙක් යම්කිසි දෙයක් සොරකම් කළේ ය කියා චෝදනා කරනවා නම් ඔහු සොරකම් කළ දෙය ඉදිරිපත් කළ යුතුයි. නැති නම් සැකයක් ඇති නො වන ලෙස ඒ දෙය තිබුණු බව ඔප්පු කළ යුතු යි. එහෙත් සොරා ගත්තා යයි කියන මේ මුදල් දුටු කිසි ම කෙනෙක් නැහැ. ටික කලකට පෙර පීටර්ස්බර්ග් නුවර නැතිත් නැත බඩු විකුණන, අවුරුදු දහ අටක පමණ තරුණයෙක් මහ දවල් පොරවක් ගෙන මුදල් මාරු කරන්නකු ගේ සාප්පුවකට ගිහා, කිසි ම බයක් සැකක් නැති ව, අයිති කාරයාට පොරොවෙන්

ගසා, මරා, රූබල් එක්දස් පත්සීයක් ගෙන ගියා. පැය පහකට පස්සේ ඒ තරුණයා මුදලුත් සමග හිරභාරයට ගත්තා. ඔහු සොරාගත් මුදලින් වියදම් කරල තිබුණේ රූබල් පහළොවක් පමණයි. මිනීමැරුමට පස්සේ සාප්පුවට පැමිණි සාප්පුවේ සේවකයා සොරා ගත්තා ලද මුදල පමණක් නො ව එහි තිබුණු නෝට්ටු ගණන, ඒ කියන්නේ රූබල් සීයේ නෝට්ටු, දහයේ නෝට්ටු, හා පහේ නෝට්ටු හා කාසි ගණන හරියට කිව්වා. එම ගණන ම සිරකරුවා ළඟ තිබී සොයා ගත්තා. ඒ සමග සිරකරුවා ද ඝාතකයා මරා මුදල් ගත්ත බව කිව්වා. ජූරි සභාවේ මහත්වරුනි, එවැනි කරුණු තමයි මා සාක්ෂි හැටියට පිළිගත්තේ. එහි දී අපට සොරා ගත්ත මුදල ඇහින් දකින්න පුළුවන්. අත ගා බලන්න පුළුවන්. එවැනි මුදලක් නොතිබුණු බව කියන්න බැහැ. මේ නඩුවේ එ වැනි පිළිගත හැකි සාක්ෂියක් නැහැ. එහෙත් මිනිසකු ගේ ජීවිතයත් මරණයත් ඒ සාක්ෂි මත රැඳී තියෙනවා. 'ඔය කතාව ඇත්ත වෙන්න පුළුවනි. නමුත් එදා රෑ සිරකරුවා මුදල් විසිකරමින් උත්සව පැවැත්වූවා. ඔහු ළඟ රූබල් එක්දස් පත් සීයක් තිබුණා. ඔහුට කොහෙන්ද ඒ මුදල් ලැබුණේ? කියා මගෙන් අහන්න පුළුවනි. සිරකරුවා ළඟ තිබුණේ රූබල් එක්දස් පත් සීයක් පමණයි. අනෙක් එක්දස් පත්සීය සොයා ගන්න ලැබුණේ නැහැ. ඔහු ළඟ තිබුණු එක්දස් පත්සීය සොරා ගත්තා ලද තුන් දහේ කොටසක් නොවන බවත්, ඒවා ලියුම් කවරයේ නොතිබුණු බවත්, මෙයින් ඔප්පු වෙනවා. මිනීමැරුම සිදු වූ ද රාත්‍රියේ දී පොලීසිය විසින් කරන ලද තියුණු පරීක්ෂණයෙන් පැහැදිලි ව හෙළිවුණා, සිර කරුවා ගෘසෙන්කා ගේ ගෙදරට පැමිණ, සේවිකාවන් දෙදෙනා සමග කතා කළ පසු කෙළින් ම ගෙදර නො ගොස් පියෝතර් පර්හෝටින් හමුවෙන්න ගිය බව. ඊට පස්සේ ඔහු සිටියේ විශාල පිරිසක් අතරයි. ඒ නිසා රූබල් තුන් දහෙන් භාගයක් නගරයේ කොතැනකවත් සඟවා තැබීමට ඔහුට අවස්ථාවක් ලැබුණේ නැහැ. සිරකරුවා මුක්රෝවේ හෝටලයේ කිසියම් තැනක මුදල් සඟවා තබන්නට ඇතැයි පැමිණිල්ලේ නීතිඥයා කල්පනා කළේ ඒ නිසා විය යුතුයි. ජූරි සභාවේ මහත්වරුනි, ඇයි මේ මුදල් උඩල්පේ මාලිගෙයි බිම්ගෙයක් යට සඟවා තබන්න නො තිබුණේ? ඇයි මේ අදහස පිළිගත නො හැකි අද්භූත කතාවක් මෙන් පෙනෙන්නේ? මුදල් සඟවා තැබීම පිළිබඳ මේ අදහස පිළිගත නො හැකි නම්, හොරකම පිළිබඳ චෝදනාව හිරු දුටු මීදුමක් මෙන් අතුරුදහන් වන බව කරුණා කර සිහි තබා ගන්න. එසේ නම් අනෙක් රූබල් එක්දස් පත්සීයට

මොකද වුණේ? සිරකරුවා මූක්රෝව්වට හැර වෙන කිසි ම තැනකට නොගිය බව ඔප්පු වී තිබෙනවා නම් මුදල් අතුරුදහන් වුණේ කුමන ප්‍රාතිහාරියකින් ද? අපි මිනිසකු ගේ ප්‍රීතිය විනාශ කිරීමට වෑයම් කරන්නේ මෙවැනි අද්භූත කතා විශ්වාස කරගෙන ද? 'එසේ නම් සිරකරුවාට මුදල් ලැබුණේ කාගෙන් ද? ඊට පෙර රාත්‍රියේ දී ඔහු ළඟ මුදල් නොතිබුණු බව කවුරුත් දැන ගෙන හිටියා' යන ප්‍රශ්නය මගෙන් අහන්නට පුළුවනි. කවුද ඒ බව දැන ගෙන හිටියේ? තමාට මුදල් ලැබුණු සැටි සිරකරුවා කිසි ම බියක් සැකක් නැති ව පැහැදිලි කරල දුන්නා. ජූරි සභාවේ මහත්වරුනි, තමුන්නාන්සේලා සිරකරුවා ගේ ප්‍රකාශය පිළිගන්නවා නම් ඊට වඩා පිළිගත හැකි ප්‍රකාශයක් නැත ය කියා පෙන්නාදීමට මා කැමැතියි. ඒ ප්‍රකාශය සිරකරුවා ගේ ගතිගුණ සමඟ හොඳට ගැළපෙනවා. පැමිණිල්ලේ නීතිඥ මහතා සිරකරුවාට මුදල් ලැබුණු හැටි විස්තර කරමින් අද්භූත කතාවක් ඉදිරිපත් කොට ඒ ගැන තෘප්තියට පැමිණ සිටිනවා. ආත්මශක්තියක් නැති මිනිසකුට, ඔහු ගේ විවාහ ගිවිස ගත්ත තරුණිය විසින් තිත්ද කොට දෙන ලද රූබල් තුන්දහෙන් භාගයක් වෙන් කොට, කුඩා මල්ලක දමා මසා තැබිය නොහැකි බව පැමිණිල්ලේ නීතිඥ මහතා අපට පෙන්නා දුන්නා. වෙන් කොට තැබුවත්, වරින්වර ඉන් ටික ටික ගෙන මසක් ඇතුළත දී සම්පූර්ණ මුදල වියදම් කරන බව පිළිගන්නා ලෙස අපට කිව්වා. නීතිඥ මහතා එහෙම කිව්වේ ඒ අදහස ප්‍රතික්ෂේප නො කළ යුතු යයි අපට හඟවන ස්වරයකින් බව තමුන්නාන්-සේලාට මතක ඇති. මුදල් ලබා ගැනීම පිළිබඳ කතාව වෙන විදියකට සිදුවුණා නම් මොකද වෙන්නේ? මේ කතාව වෙන ම මිනිසකු සම්බන්ධ කොට ගොතන ලද කතාවක් නම් මොකද වෙන්නේ? අන්න එතැන තමයි වරද තියෙන්නේ. මෙතැන කරල තියෙන්නේ අමුතු ම වර්ගයේ මිනිසකු මවා පෙන්වීමකි.

''මිනීමැරුමට මාසයකට පමණ කලින් තමා විවාහ ගිවිස ගත් කාන්තාව විසින් දෙන ලද රූබල් තුන් දහ සිරකරුවා මූක්රෝව්වේ දී එක රැයින් වියදම් කළ බව ඔප්පු කිරීමට පුළුවන් සාක්ෂි තියෙනවා. ඒ නිසා රූබල් එක්දහස් පන්සීයක් ඉතිරි කරගත්ත කතාව විශ්වාස කළ නොහැකි' බව මට පෙන්නා දෙන්න පුළුවනි. කවුද මේ සාක්ෂිකාරයෝ? මේ සාක්ෂිකාරයන් විශ්වාස කළ නො හැකි මිනිසුන් බව අපි මේ උසාවියේ දී ම දුටුවා. කෙනකු ගේ අතේ තියෙන පාන් කෑල්ල වුවත් තවත් කෙනකුට පෙනෙන්නේ බොහො ම ලොකු දෙයක් හැටියටයි. එක ම සාක්ෂිකාරයෙක්වත් සිරකරුවා ගේ අතේ තිබුණු මුදල් ගැණලා

බැලුවේ නැහැ. ඇසින් බලා කියනවා පමණයි. සිරකරුවා ගේ අතේ රූබල් විසිදහක් තිබුණු බව මැක්සිමෝ කිව්වේ නැද්ද? ඉතින් ජූරි සභාවේ මහත්වරුනි, පෙනෙනවා නේද මනෝවිද්‍යාව දෙපැත්ත කැපෙන අවියක් බව? ඒ නිසා මේ අවියේ අනෙක් පැත්තෙන් කපා කුමක් සිදුවන්නේ දැයි බලමු.

"මිනීමැරුමට මාසයකට පමණ කලින් තැපැල් කරන ලෙස කැතිරිනා සිරකරුවාට රූබල් තුන් දහක් භාර දුන්නා. ඒ මුදල් සිරකරුවාට නින්දා අපහාස වන විදියට භාරදුන් බව පැමිණිල්ලේ නීතිඥ මහතා දුන් අපට කිව්වා. ඒ කතාව ඇත්ත ද? අන්න ඒක තමයි අප විසින් ඇසිය යුතු ප්‍රශ්නය. මේ කාන්තාව නඩු විභාගයේ දී මුලින් කළ ප්‍රකාශයෙහි එවැනි අදහසක් තිබුණේ නැහැ. සම්පූර්ණයෙන් ම වෙනස් වූ අදහසක් තිබුණේ. නමුත් දෙවන වර ඈ කළ ප්‍රකාශයෙන් අපට මොනවද අහන්න ලැබුණේ? සිරකරුවා කෙරෙහි පැවැති අමනාපය, පළිගැනීමේ චේතනාව, කාලයක සිට යටපත් කර ගෙන හිටිය වෛරයෙන් නැගුණු විලාපය, මෙන්න මේවා තමයි අපට අහන්න ලැබුණේ. සාක්ෂිකාරිය පළමු වර කළ ප්‍රකාශය බොරුවක් බව මින් පෙනෙනවා. ඈ පළමු වර කළ ප්‍රකාශය බොරුවක් නම්, දෙවන වර කළ ප්‍රකාශය ද බොරුවක් ලෙස පිළිගැනීමට අපට අයිතියක් තියෙනවා. පැමිණිල්ලේ නීතිඥ මහතා ඒ ගැන වචනයක් වත් කතාකළේ නැහැ. කතා කිරීමට තරම් එඩිතරකමකුත් තිබුණේ නැහැ. බොහො ම හොඳයි; මා ද ඒ ගැන වචනයක් වත් කතා කරන්නේ නැහැ. නමුත් කැතිරිනා ගේ සාක්ෂිය ගැන මෙ වැනි අදහසක් ඉදිරිපත් කිරීමට මා කැමැතියි. කැතිරිනා වැනි ඉතා උසස් චරිතයක් ඇති – ඒ ගැන සැක කරන්න දෙයක් නැහැ – කුලකාන්තාවක් මේ උසාවියේ දී පළමු වර කළ ප්‍රකාශය, සිරකරුවා විනාශ කිරීමේ චේතනාවෙන් දෙවන වර වෙනස් කළා නම් ඈ එසේ කළේ අපක්ෂපාත සත්සුන් සිතින් නොවන බව ඉතා පැහැදිලි ව පෙනෙනවා. පළි ගැනීමේ දුෂ්ට චේතනාවෙන් පෙළෙන තැනැත්තියක්, යම්කිසිවක් පමණට වඩා විශාල කොට කියන බව පිළිගැනීමට අපට අයිතියක් නැද්ද? විශේෂයෙන් ම, සිරකරුවාට මුදල් දීමෙන් කළ නින්දාව ඈ අතිශයෝක්තියෙන් කියන්න ඇති. නැහැ, එම මුදල් භාර ගත හැකි පිළිවෙලකට – වෙසෙසින් ම සිරකරුවා වැනි කල්පනාවක් නැති ව කටයුතු කරන කෙනකුට, භාර ගත හැකි වන ලෙස දෙන්නට ඇතැයි මා අදහස් කරනවා. අනෙක් වැදගත් කරුණ, තමා ගේ ණයත් බේරීමේ හැටියට තමාට තාත්තාගෙන් ලැබිය යුතු රූබල්

තුත්දුන ළඟ දී ම ලැබෙන්නට පුළුවනි ය කියා සිරකරුවා බලාපොරොත්තු වුණා. එය ඔහු ගේ නොසැලැකිලිලෙන් සිදුවූ දෙයක්. තාත්තාගෙන් මුදල් ලැබෙන බව සපුර ව ම දැන සිටිය නිසා තමාට කැතිරිනාගෙන් ලැබුණු මුදල් වෙනුවට එම මුදල් තැපැල් කර යවා ණයෙන් නිදහස් විය හැකි යයි ඔහු කල්පනා කළා. ඔහු තාත්තාගෙන් බලාපොරොත්තු වූ මුදල් ගැන එ තරම් ලොකු විශ්වාසයක් තැබුවේ නොසැලැකිලිකම නිසයි.

කැතිරිනා ගේ මුදල් ලැබුණු දවසේ ම, සිරකරුවා ඉන් භාගයක් වෙන් කොට, කුඩා පසුම්බියක දමා මසා කරේ එල්ලා ගැනීම පිළිබඳ කතාව පැමිණිල්ලේ නීතිඥ මහතා පිළිගන්නේ නැහැ. 'එ වැනි දෙයක් සිරකරුවා ගේ ගතිගුණවලට ගැළපෙන්නේ නැහැ. එ වැනි හැඟීමක් ඔහු තුළ ඇතිවීමට ඉඩ නැහැ'යි ඒ මහතා අපට කියනවා. නමුත් මගේ උගත් මිත්‍රයා කරමසෝව් පවුලට අයත් ජන්මගත ගතිගුණ විග්‍රහ කරමින්, ඔවුන්ට එක වර හොඳ නරක දෙක ම කළ හැකි බව කිව්වේ නැද්ද? දුරාචාරයට ඇති මැඩගත නොහැකි ආශාවෙන් පෙළෙන අවස්ථාවල දී පවා වෙනත් දෙයක් සිදු වූ විට, මිනියා කරමසෝව්ට එක්වර ම ඒ ආශාවෙන් මිදෙන්නට පුළුවනි. වෙනත් දෙය තමා ප්‍රේමය. සිරකරුවා ගේ හදවත ප්‍රීතියෙන් ආලෝක කළ ඒ තරුණ ප්‍රේමය සඳහා ඔහුට මුදල් අවශ්‍ය වුණා. මුදල් අවශ්‍ය වුණේ ඔහු ආලය කළ තරුණිය සමඟ ප්‍රීතිවීමට පමණක් නො වෙයි. 'මම නුඹේ තාත්තා අත්හැර දමා නුඹ සමඟ එනවා' යි ගෲෂෙන්කා කී විගස, ඇය කැඳවාගෙන යාමට මුදල් අවශ්‍යයි. ඇය සමඟ උත්සව පැවැත්වීමට වඩා ඇය කැඳවා ගෙන යාම වැදගත්. කරමසෝව් පවුලේ කෙනකුට ඒ බව තේරුම් ගන්න බැරි ද? ගෲෂෙන්කා කැඳවා ගෙන යාම ගැන තමයි ඔහු කරදර වුණේ. එ වැනි අවස්ථාවක දී ප්‍රයෝජනය ගැනීම සඳහා මුදලින් භාගයක් වෙන් කොට සඟවා තැබීමේ ඇති පුදුමය කුමක් ද?

"කාලයක් ගතවුණා. සිරකරුවා බලාපොරොත්තු වූ මුදල් තාත්තාගෙන් ලැබුණේ නැහැ. ඒ වෙනුවට තමා ආලය කරන තරුණිය වසඟ කර ගැනීමට තාත්තා එම මුදල් පාවිච්චි කරන බව ඔහුට ආරංචි වුණා. 'තාත්තා මට මුදල් නොදුන්නොත් මම කැතිරිනාට හොරෙක් වෙනවා.' ඒ නිසා සිරකරුවාට අදහස් වුණා කැතිරිනා ළඟට ගොස් තවමත් බෙල්ල වටේ එල්ලා ගෙන සිටිය රූබල් එක් දස් පන්සිය ආපසු දී 'මම තක්කඩියෙක්, නමුත් හොරෙක් නො වෙයි' කියන්න. සිර

කාරුවා ඇගේ කළුඹුංග්‍රිරියාව ආරක්‍ෂා කරනවා වගේ මුදල් ආරක්‍ෂා කළේ මන්ද? වරින් වර මුදල් පසුම්බිය ලිහා සිය බැගින් මුදල් වියදම් නො කළේ මන්ද? ඊට හේතු දෙකක් පෙන්නන්න පුළුවනි. සිරකරුවාට හිමි වී ඇති ගෞරවය අපි ඔහුට පිරිනැමිය යුතුයි. ඔහු තුළ ගෞරවය කියා දෙයක් තිබුණා. එය වරදවා තේරුම් ගත් ගෞරවයක්. එහෙත් ඔහු තුළ එ වැනි ගෞරවයක් තිබුණා. ඔහු ඒ බව ඔප්පු කළා. අවාසනාවකට වාගේ ගෘෂෙන්කා හා සිරකරුවා අතරේ පැවැති සම්බන්ධය අවුල් වන විට සිතේ ඊරිසියාවෙන් හටගත් වේදනාව ද වැඩි වී උග්‍ර අවස්ථාවකට පැමිණියා. මුදල් පිළිබඳ ප්‍රශ්න දෙක සිරකරුවා ගේ උණෙන් පෙළෙන මොළයට වඩවඩාත් වද දුන්නා. ‘කැතිරිනා ගේ මුදල් ආපසු දුන්නොත් ගෘෂෙන්කා කැඳවා ගෙන යාමට අවශ්‍ය මුදල් කාගෙන් ඉල්ලා ගන්න ද?’ යන ප්‍රශ්නය ඔහුට මහත් හිරිහැරයක් වුණා. පසු ගිය මාසයේ සිරකරුවා නොතිසි ලෙස හැසුරුණා නම්, තැබෑරුම්වල බී ගෙන කෝලාහල කළා නම්, එසේ කළේ ඉවසිය නොහැකි තරමට සිතේ වේදනාව අධික වූ නිසා විය යුතුයි. මේ ප්‍රශ්න දෙක කො තරම් උග්‍ර වුණා ද කියතොත් අන්තිමේ දී ඔහු ගේ සියලු ම බලාපොරොත්තු සුන් වුණා. ඔහු අන්තිම වරට තාත්තා ගෙන් රූබල් තුන් දහ ඉල්ලා යාච්ඤා කොට සහෝදරයා අතේ පණිවිඩයක් යවා, එහෙත් පණිවිඩයට පිළිතුරක් ලැබෙන්නටත් කලින් ගෙට කඩාවැදී සාක්ෂිකාරයන් බලා සිටිය දී තාත්තාට තැළුවා. ඊට පස්සේ මුදල් ලබාගැනීමේ බලාපොරොත්තු සම්-පූර්ණයෙන් ම නැති වී ගියා. තැළීමෙන් පසු තාත්තාගෙන් කවදාවත් මුදල් නොලැබෙන බව සිරකරුවා දැනගත්තා.

“එදා සවස ඔහු පපුවට ගසා ගනිමින්, කුඩා මුදල් පසුම්බිය එල්ලාගෙන සිටිය තැනට ගසා ගනිමින්, තමා සොරකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය ක්‍රමය තිබෙන බවත්, ඒ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය චරිතය හා ආත්මශක්තිය නොමැති නිසා එය ක්‍රියාත්මක කළ නොහැකි බවත්, ඒ නිසා ඔහුට තවත් කල් තක්කඩියකු ලෙස සිටීමට සිදුවන බවත්, බාල සහෝදරයාට කිව්වා. අලෝෂා කරමසෝව් විසින් සිය කැමැත්-තෙන් ම අවංක ව හා අව්‍යාජ ලෙස දෙන ලද, විශ්වාස කළ හැකි සාක්ෂි පැමිණිල්ලේ නීතිඥ මහතා නොපිළිගත්තේ මන්ද? එහෙත් ඒ අතර සිරකරුවා උඩල්පේ මාලිගෙයි බිම්ගෙවල් යට මුදල් සඟවා තිබෙන බව විශ්වාස කරන ලෙස අපට කියන්නේ මන්ද?

"එදා සවස බාල සහෝදරයා හමුවීමෙන් පසු ව සිරකරුවා අර භයානක ලියුම ලිව්වා. සිරකරුවා මුදල් සොරකම් කළ බව ඔප්පු කරන ප්‍රධාන සාක්ෂිය වශයෙන් ඉදිරිපත් කර ඇත්තේ ඒ අරුම පුදුම ලියුමයි. 'මම අඳුනන හැම දෙනා ගෙන් ම මුදල් ඉල්ලා බලනවා. මුදල් නො ලැබුණොත්, ඉවාන් ගෙදරින් ගිය වහා ම තාත්තා මරා ඇඳේ මෙට්ටය යට තබා ඇති මුදල් සහිත ලියුම් කවරය ගන්නවා'යි ඒ ලියුමේ සඳහන් කරල තියෙනවා. මිනීමැරුම සම්බන්ධ ව නියම වැඩ පිළිවෙළ මේ ලියුමේ විස්තර කර තියෙන බව අපට පැමිණිල්ලේ නීතිඥ මහතා පෙන්නා දී තියෙනවා. එසේ නම් මහලු කරමසෝ මරන්න ඇත්තේ සිරකරුවා විය යුතුයි. 'ලියුමේ සඳහන් කර තිබෙන පිළිවෙළට ම සිරකරුවා තාත්තා මැරුවා'යි පැමිණිල්ලේ නීතිඥ මහතා වැඩි දුරටත් විස්තර කළා.

"පළමු ව, ඒ ලියුම සුරාවෙන් මත් වී සිටි මිනිසකු විසින් බලවත් චිත්ත වේදනාවකින් සිටිය අවස්ථාවක දී ලියන ලද ලියුමක්. දෙවනු ව, ඔහු ලියුමේ සඳහන් කරන්නේ පැවල්ගෙන් අසා දැනගත්ත ලියුම් කවරයක් ගැන මිස ඔහු ඇසින් දුටු ලියුම් කවරයක් ගැන නො වෙයි. තුන් වෙනු ව, ඔහු ලියුම ලියාපු බව ඇත්තයි. අපි ඒක පිළිගන්නවා. නමුත් ලියුමේ සඳහන් කර තිබුණු ක්‍රමයට තාත්තා මැරුවා ය කියා අපි පිළිගන්නේ නැහැ. ඒ බව ඔප්පු කරන්නත් බැහැ. සිරකරුවා ඇඳේ මෙට්ටය යට තිබී ලියුම් කවරය ගත්තා ද? ඔහු ලියුම් කවරයේ තිබුණු මුදල් ගත්තා ද? කොටින් කියතොත් ලියුම් කවරයේ මුදල් තිබුණා ද? වහා දිව ගියේ මුදල් ගැනීමට ද? ඔහු වහා දිව ගියේ ගෲෂෙන්කා ගැන සොයා බැලීමටයි. නැති ව ලියුමේ සඳහන් කර තිබුණු විදියට මුදල් සොරකම් කිරීමට නො වෙයි. ඔහු ඉබේට ම වාගේ වේගයෙන් දිව ගියේ ඔහු පැතූ තරුණිය නිසා සිතේ හටගත් දැඩි ඊර්ෂ්‍යාව නිසයි. 'නැහැ, සිරකරුවා ගෙට කඩාවැදී මහලු කරමසෝ මරා මුදල් ගෙන ගියා'යයි ඔබ මට පෙන්නා දෙන්නට පුළුවනි. නමුත් මහලු කරමසෝ මැරුම් කෑවේ සිරකරුවා ගෙන් ද? මේ මිනීමැරුමේ චෝදනාව මම ඉතා පිළිකුලින් යුතු ව ප්‍රතික්ෂේප කරනවා. අසවල් දෙය සොරකම් කළා ය කියා ඔප්පු කරන තෙක් කිසි ම කෙනකුට සොරෙක් ය කියා චෝදනා කරන්න බැහැ. ඒක සිද්ධාන්තයක්. ප්‍රත්‍යක්ෂ සත්‍යයක්. මහලු කරමසෝ මරා දමන ලද්දේ මේ සිරකරුවා විසින් ද? ඔහු තාත්තා මරා මුදල් නො ගෙන සිටියා ද? ඒ බව ඔප්පු කර තියෙනවා ද? ඒකත් නවකතාවකට සමාන කතාවක් නො වේ ද?

දොළොස් වන පරිච්ඡේදය

මිනිමැරුමකුත් නැත

"ජූරි සභාවේ මහත්වරුනි, මිනිසකු ගේ ජීවිතය අවදානම් තත්ත්වයක පවතින බව පෙන්නා දීමට කරුණා කර මට අවසර දිය යුතුයි. ඒ නිසා අපි ඉතා පරිස්සමින් කටයුතු කළ යුතුයි. අන්තිම දවස වන තෙක්, නඩු භාගය පවත්වන දිනය වන තෙක්, සිරකරුවා ද්වේෂ සහගත සිතින් යුතු ව, කලින් සිතා මතා තාත්තා මරා දැමූ බව ඔප්පු කරන අර භයානක ලියුම උසාවියට ඉදිරිපත් කරන තෙක්, සිරකරුවාට මිනී මැරුම ගැන චෝදනා කිරීමට තමා නො කැමැත්තෙන් සිටිය බව පැමිණිල්ලේ නීතිඥ මහතා පිළිගත්තාවා අපි අසා සිටියා. එහෙත්, සිරකරුවා මහ ගෙදරට දිව ගියේ තාත්තා මැරීමට නො ව ගෲෂෙන්කා සොයා ගැනීමට පමණක් බව නැවත කිය යුතුයි. එය ප්‍රතික්ෂේප කළ නො හැකි සත්‍යයක්. ගෲෂෙන්කා ඇගේ ගෙදර සිටියා නම් සිරකරුවා ද ඇය සමඟ ගෙදර නතර වී සිටිනවා මිස ලියුමේ සඳහන් වූ විදියට තාත්තා මරන්න යන්නේ නැහැ. ඔහු මහ ගෙදරට දිව ගියේ ඒ මොහොතේ දී සිතේ ඇති වූ වේගයෙන් මිස කලින් සිතා මතා ගෙන සිටිය නිසා නො වෙයි. ඔහුට ඒ වෙලාවේ දී 'අර සුරාවෙන් මත් වූ භයානක ලියුම' මතක් වුණේ නැහැ. 'මෙසේ දිවයන අතර සිරකරුවා පිත්තල මෝල්ගස අතට ගත්තා'යි පැමිණිල්ලේ නීතිඥ මහතා කිව්වා. මේ පිත්තල මෝල්ගස තාත්තා මැරීමට සුදුසු ආයුධයක් ලෙස සිරකරුවා කල්පනා කෙළේ මන්ද? මේ පිත්තල මෝල්ගසට අදාළ වූ නොයෙක් කරුණු ගැන පැමිණිල්ලේ නීතිඥ මහතා විසින් කරන ලද මානසික විග්‍රහ අපට අසන්නට ලැබුණා. ඒ මොහොතේ දී මට මෙන්න මේ විදියේ අදහසක් ඇති වුණා. මේ මෝල්ගස කාටවත් නො පෙනෙන තැනක, නැතිනම් සේප්පුවක දමා වසා තිබුණා නම් මොකද වෙන්නේ? එහෙනම් සිරකරුවා ආයුධයක් නො ගෙන හිස් අතින් දුවනවා ඇති. හිස් අතින් දිව්වා නම් කිසි ම කෙනෙක් ඔහු ගේ අතින් මැරම් කන්නේ නැහැ. මේ අනුව බලන විට මිනීමැරුම පිළිබඳ කුමන්ත්‍රණය ඔප්පු කිරීමට මේ ආයුධය උපකාර වෙන්නේ කොහොම ද? තාත්තා මැරීමේ අදහසින් මේ ආයුධය ගෙන

ගිය බව ඔප්පු කරන්නේ කොහොම ද? සිරකරුවා තාත්තා මරන බව කියමින් තැබෑරුමේ දී කෑගැවා. එහෙත් තාත්තා මැරීමට දවස් දෙකකට කලින්, සුරාවෙන් මත් වූ අර භයානක ලියුම ලියාපු දින සවස සිරකරුවා බොහෝ ම නිශ්ශබ්ද ව හිටියා. කොහොම වුණත් කරමසෝව් පවුලේ ඇත්තක්ට කෝලාහලයක් නො කර සිටිය නො හැකි නිසා සිරකරුවා එදා සවස තැබෑරුමේ අයිතිකාරයා සමග සුළු කෝලාහලයක් කරගත්තා පමණයි. නැති ව තාත්තා මරන බවක් කිව්වේ නැහැ. මගේ තර්කය මේකයි. සිරකරුවා ලියුමේ සඳහන් කර තිබුණු ක්‍රමයට තාත්තා මැරීමට අදහස් කලා නම් ඔහු කවදාවත් තැබෑරුමේ අයිති කාරයා සමඟ කෝලාහල කරන්නේ නැහැ. වෙනෙකක් තබා ඔහු එදා සවස තැබෑරුමට යන්නෙත් නැහැ. මිනිහකු මැරීමට අදහස් කරගෙන ඉන්න තැනැත්තා කාටවත් නො පෙනී නිහඬ ව, අප්‍රසිද්ධ ව සිටීමට වෑයම් කරනවා. 'පුළුවන් නම් මා වැනි කෙනෙක් සිටින බව අමතක කරන්න'යි ඔහු කියනවා ඇති. ඔහු එසේ කියන්නේ හිතා මතා නො වෙයි; ඉබේට ම කියවෙනවා. ජූරි සභාවේ මහත්වරුනි, මනෝවිද්‍යාව දෙපැත්ත කැපෙන අවියක් වගෙයි. ඒ අවිය පාවිච්චි කරන හැටි අපිත් දන්නවා. සිරකරුවා ඒ මුළු මාසයේ ම තාත්තා මරන බව කියමින් තැබෑරුමක් ගානේ යන්න ඇති. කුඩා ළමයිත් ද තැබෑරුම්වල සිට එළියට එන සුරා බී මත් වූ මිනිසුන් ද, එකිනෙකා සමඟ, කෝලාහල කරගන්නා විට 'මං තෝ මරනවා, තොපි සේරම මරනවා' කියා කෑගානවා අපි අසා නැද්ද? නමුත් ඔවුන් එකිනෙකා මරා ගන්නව ද? නැහැ. මේ භයානක ලියුම සුරා බී මත් වී සිටින විට සිතේ පැවැති නොසන්සුන්කමින් ලියන ලද ලියුමක් නො වේ ද? මේ ලියුම, තැබෑරුමෙන් එළියට පැමිණ 'මං තොපි මරනවා, සේරම මරනවා' කියා බෙබද්දකු කරන කෑගැමට සමාන නො වේ ද? සමාන නොවන්නේ මන්ද? එය භයානක ලියුමක් නො ව, විකාර ලියුමක් ලෙස නො පිළිගන්නේ කුමන හේතුවක් නිසා ද? මෙන්න මේ හේතුව නිසයි. සිරකරුවා ගේ පියා මරා දමා තිබියදී. සිරකරුවා අතින් අවියක් ගෙන වත්ත හරහා දිව ගොස් වැටෙන් පනිනවා දුටු සාක්ෂි කාරයෙක් ඉන්නවා. අන්තිමේ දි සිරකරුවා මේ සාක්ෂි කාරයා ගේ හිසට ගැසුවා. මේ හැම දෙයක් ම සිදුවුණේ ලියුමේ සඳහන් කර තිබුණු පිළිවෙළටයි. ඒ නිසා එම ලියුම විකාර ලියුමක් නො ව භයානක ලියුමක් ලෙස පිළිගත යුතුයි.

"දෙයියන්ට පිං සිදුවන්නට දූත් අපි මේ නඩුව පිළිබඳ ඉතා ම වැදගත් කරුණට පැමිණ සිටිනවා. 'සිරකරුවා වත්තේ

සිවිය නිසා තාත්තා මරන්න ඇති.' 'සිවිය නිසා මරන්න ඇති' යන වචන මත තමයි පැමිණිල්ල සම්පූර්ණයෙන් ම රැඳී තියෙන්නේ. සිරකරුවා වන්නේ සිවින්න ඇති. එහෙත් ඔහු තාත්තා නොමැරුවා නම් මොකද වෙන්නේ? මේ නඩුවට සම්බන්ධ වූ සියලු ම කරුණු එක්තැන් කල විට සිරකරුවාට විරුද්ධ ව ඇති සාක්ෂි බොහෝ ම ශක්තිමත් බව මම පිළිගන්නවා. එහෙත් මේ සාක්ෂි සමූහයක් වශයෙන් නො ව, වෙන් වෙන් ව ගෙන බලන්න. 'මම පියා ගේ කාමරයේ කවුළුවෙන් එබී බලා පැනල ගියා' යයි කියමින් සිරකරුවා කල ප්‍රකාශය පැමිණිල්ල නොපිළිගන්නේ මන්ද? ඒ මොහොතේ දී සිරකරුවා තුල හදිසියෙන් ම ඇති වූ විනීතකම හා ධර්මිෂ්ඨ හැඟීම් පැමිණිල්ලේ නීතිඥ මහතා උපහාසයට ලක් කරමින් කතා කල හැටි තමුන්නාන්සේලා අසා සිටින්නට ඇති. ඒ මොහොතේ දී සිරකරුවා තුල එ වැනි උතුම් හැඟීම් ඇති වුණා නම් මොකද වෙන්නේ? 'ඒ මොහොතේ දී මගේ අම්මා මා වෙනුවෙන් යාච්ඤා කරන්න ඇති'යි සිරකරුවා ඔහු තුල උතුම් හැඟීම් ඇති වීමට හේතුව පෙන්නමින් මූලික පරීක්ෂණයේ දී කිව්වා. ඒ නිසා ගාසෙන්කා තාත්තා සමඟ නැති බව දැනගත්ත වහා ම සිරකරුවා පැනල දිව්වා. 'නමුත් කවුළුව තුලින් බලා ගාසෙන්කා තාත්තා සමඟ ඉන්නවා ද නැද්ද කියා දැනගන්න පුළුවන් කමක් තිබුණේ නැහැ'යි පැමිණිල්ලේ නීතිඥ මහතා අපේ අදහසට විරුද්ධ වෙමින් කිව්වා. ඇයි දැනගන්න බැරි? සිරකරුවා, ගාසෙන්කා පැමිණ සිටින බව දන්වන සංඥාව අනුව කවුළුවට තට්ටු කල විට තාත්තා කවුළුව ඇරියා. ගාසෙන්කා කාමරයේ නැති බව හඟවන යම් කිසිවක් මහලු පියා ගේ කටින් පිට වෙන්න ඇති. ඇයි අපි සිතින් මවා ගත්තා හැම දෙයක් ම පිළිගන්නේ? ඇයි අපි යම් යම් දේවල් සිතින් මවා ගන්නේ? මවාගෙන ඒ දේවල් විශ්වාස කරන්නේ? සූර නවකතාකාරයකු ගේ මනසට පවා අහුනොවන සැබෑ ජීවිතයේ සිදුවන දේවල් දහස් ගණන් වුවත් තියෙන්න පුළුවනි.

"'මහ ගෙයි දොර ඇර තියෙන බව ග්‍රිගෝරිස් දුටුවා. දොර ඇර තිබුණා නම් සිරකරුවා ගෙට ඇතුළු වෙන්න ඇති. ගෙට ඇතුළු වුණා නම් තාත්තා මරන්න ඇති.' මෙය පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද තවත් තර්කයක්. ජූරි සභාවේ මහත්වරුනි, අපි දැන් මේ දොර ගැන ටිකක් කල්පනා කරල බලමු. ගෙට ඇතුළු වන දොර ඇර තියෙන බව ඔප්පු කිරීමට තියෙන්නේ එක ම සාක්ෂියයි. ඒ සාක්ෂිය

දුන්නු සාක්ෂිකාරයාත් ඒ වෙලාවේ එ තරම් හොඳ තත්වයක නො වෙයි හිටියේ.........නමුත් යම් විදියකින් දොර ඇර තිබුණා නම්, සිරකරුවා තමා ගේ බේරිල්ලට බොරුවක් කිව්වා නම් - එහෙම දෙයක් කීම ස්වාභාවිකයි - ඔහු ගේ ඇතුළට ගියා නම් - ඉන් මොනව ද ඔප්පු වෙන්නේ? සිරකරුවා ගේ ඇතුළට ගොස් තාත්තා මැරුවා ය කියා ඔප්පු කරන්නේ කොහොම ද? ඔහු ගෙට කඩාවැදී, තාත්තා තල්ලු කර දමා, කාමරයක් ගානේ ගොස් සොයා බලා, ගෘසෙන්කා නැති බව දැන, තාත්තා නො මැරීම ගැන ප්‍රීතිවෙමින් පැන යන්න ඇති. කලබලයෙන් පැන යන අතරේ තමා ගෙන් පහර කෑ ග්‍රිගෝරිස් ගැන සොයා බැලීමේ අදහසින් ආපසු වැට උඩින් පැන වත්තට ඇතුළු වුණේ තාත්තා මැරීමට සිතේ තිබුණු පෙළඹීමෙන් නිදහස් වූ නිසා විය යුතුයි. තාත්තා නො මැරීමේ ප්‍රීතියෙන් විය යුතුයි. සිතේ පිරිසුදු අදහස්, ආදරය කරුණාව වැනි නිර්මල අදහස් ඇති වූ නිසා විය යුතුයි. මූක්රෝවට ගිය සිරකරුවාට තමා පෑතු තරුණියත්, ඇය සමඟ සැපවත් අලුත් ජීවිතයක් ආරම්භ කිරීමට තිබුණු ආරාධනයත්, එහෙත් පියා මරා පැමිණි තමාට එහි ප්‍රතිඵලවල විපාක ලැබිය යුතු නිසා ඒ ප්‍රේමය අහිමි වන බවත්, දැනගත් විට සිරකරුවා තුළ ඇති වූ චිත්ත පීඩාව ගැනත් පැමිණිල්ලේ නීතිඥ මහතා, අසන්නන් ගේ සිත් තැති ගන්වන විස්තරයක් කළා. එහෙත් තරුණිය ගේ ආලයේ රස විඳීමට සිරකරුවාට ඉඩ දුන්නු පැමිණිල්ලේ නීතිඥ මහතා මනෝ විද්‍යාවට එකඟ ව විභාග කරමින් එම ආලය 'සුරා බී මත් වී සිටින අවස්ථාවකට හා පෝරකයට ගෙන යනු ලබන අපරාධ කාරයකුට ජීවත්වීමට ලැබී ඇති කෙටි කාලයකට' සමාන වන හැටි පෙන්නා දුන්නා. මා නැවත වරක් මගේ උගත් මිත්‍රයා ගෙන් අහන්න කැමැතියි, නමුත්නාත්සේ මෙ වැනි තර්ක ඉදිරිපත් කිරීමෙන් නළේ අලුත් පුද්ගලයෙක් මවා පෙන්නීම නො වේ ද? කියා සිරකරුවා නියම වශයෙන් ම තාත්තා මැරුවා නම් පෙම්වතියත් සමඟ සිටිය ඒ මොහොතේ දී දඬුවමින් බේරී පැන යාමට සුදුසු උපා ගැන කල්පනා කිරීමට තරම් හිතක් පපුවක් නැති මිනිහෙක් ද? නැහැ නැහැ. ඔහු ගේ පෙම්වතිය ඔහු සමඟ විවාහ වී අලුත් ජීවිතයක් ආරම්භ කිරීමට කැමැත්ත පල කොට ඔහු ඇය ළඟට කැඳවාගත් ඒ මොහොතේ දී ඔහු පියා මරා සිටියා නම් ඔහු තුළ පණ නහ ගැනීමට තිබුණු අදහස දෙගුණ ගුණයකින් වැඩි වී වහා පණ නහ ගන්නා බවට කිසි ම සැකයක් නැහැ. පිස්තෝල දෙක තිබුණු තැන ඔහුට නවදවත් අමතක

වත්තේ නැහැ. පැමිණිල්ලේ නීතිඥ මහතා විස්තර කළාක් මෙන් සිරකරුවා හිතක් පපුවක්, හෙතක් මෙතක් නැති මිලේච්ඡයකු බව මම පිළිගන්නවා. ඒ විස්තරය සිරකරුවා ගේ ගතිගුණවලට හොඳට ගැළපෙනවා. ඔහු පණ නහ ගන්නවාට කිසි ම සැකයක් නැහැ. නමුත් ඔහු වෙඩි තබා නො ගත්තේ කාත්කා හොමැරූ නිසයි. 'ඔහු ගේ මව ඔහු වෙනුවෙන් යාච්ඤා කොට ඔහු ගේ ජීවිතය ආරක්ෂා කරගත් නිසයි.' එදා රෑ සිරකරුවා මූක්රෝයේ දී කාලය ගතකළේ බලවත් සිත් තැවුලකින් යුතු වයි. ඒ සිත් තැවුලට හේතු වුණේ මහලු ගිරිගෝරිය්. තමා ඔහු ගේ හිසට ගැසූ පහර එ තරම් බරපතළ නො වේ වා, දෙවියන් වහන්සේ ඔහු ගේ ජීවිතය ආරක්ෂාකර දෙත් වා, තමා කළ අපරාධයට දඬුවම් විඳීමට නො ලැබේ වා, කියා ඔහු යාච්ඤා කළා. ඇයි අපි සිරකරුවා පිළිබඳ මේ කතාව විශ්වාස නො කරන්නේ? සිරකරුවා බොරුවක් කියන බව ඔප්පු කිරීමට තිබෙන පිළිගත හැකි සාක්ෂි මොනවා ද?

"'මහලු කරමසෝව් මරා දමා තිබියා. ඔහු මරන ලද්දේ ඔහු ගේ පුතා වන සිරකරුවා විසින් නො වේ නම්, වෙන කවරෙක් විසින් ද?' යන ප්‍රශ්නය මගෙන් අහන්නට පුළුවනි. පැමිණිල්ලේ මුළු තර්කය ම රැඳී ඇත්තේ මේ ප්‍රශ්නය උඩ බව පෙන්නා දීමට මා කැමැතියි. මහලු කරමසෝව් මරන ලද්දේ සිරකරුවා නො වේ නම් වෙන කවරෙක් ද? සිරකරුවා හැර මිනීමරුවා ගේ තැන පිරවිය හැකි වෙන කෙනෙක් නැහැ.

"ජූරි සභාවේ මහත්වරුනි, ඔය තර්කයේ සත්‍යයක් තියෙනව ද? සිරකරුවා හැර, සැක කළ හැකි වෙන කෙනෙක් නැති බව සහතික ඇත්ත ද? එදා රෑ මහ ගෙදර හිටිය අය සේරම, පැමිණිල්ලේ නීතිඥ මහතා අතේ ඇඟිලිවලින් ගැණලා පෙන්නුවා අපි බලාගෙනයි. එදා රෑ මහ ගෙදර පස් දෙනෙක් හිටියා. ඉන් තුන් දෙනෙක් මිනීමැරුමට සැක කළ නොහැකි බව මම පිළිගන්නවා ඒ තුන් දෙනා මැරුම් කෑ කරමසෝව්, ගිරිගෝරිස් සහ ඔහු ගේ බිරිය යි. මේ තුන් දෙනා ඇරුණාම ගෙදර හිටියේ සිරකරුවා සහ පැවල් පමණයි. නීතිඥ මහතා අපට කිව්වා, සිරකරුවා මිනීමැරුමට පැවල් ඇල්ලුවේ වෙන කෙනෙක් නොසිටිය නිසා ය කියා. නමුත් හය වන කෙනෙක් සිටියා නම්, හය වන කෙනකු ගේ අවතාරයක් පවා තිබුණා නම, සිරකරුවා එක් වර ම හය වන තැනැත්තාට විරුද්ධ ව චෝදනා කරනවා ඇතැයි නීතිඥ මහතා පෙන්නා දුන්නා. ජූරි සභාවේ මහත්වරුනි, මට මේ ප්‍රශ්නයේ අනෙක් පැත්ත

ගෙන තර්ක කරන්න නො හැකි මන්ද කියා මම ප්‍රශ්න කරනවා. එදා මහ ගෙදර සැක කල හැකි පුද්ගලයන් දෙන්නෙක් හිටියා. පැම්ණිල්ලේ නීතිඥ මහතා සිරකරුවාට විරුද්ධ ව චෝදනා කරන්නේ චෝදනා කල හැකි වෙන කෙනෙක් නැති නිසා ද? කියා මා ප්‍රශ්න කරන්න කැමැතියි. මිනීමැරුමේ චෝදනාවෙන් පැවල් නිදහස් කිරීමට වෑයම් කරන පැමිණිල්ලට සිරකරුවා හැර චෝදනා කල හැකි වෙන කෙනෙක් නැහැ.

"පැවල්ට විරුද්ධ ව සාක්ෂි දුන්නේ සිරකරුවා, ඔහු ගේ සහෝදරයන් දෙදෙනා හා ගෘසෙන්කා පමණක් බව ඇත්තයි. මේ හතර දෙනා හැරෙන්නට පැවල් ගැන සැක කරන අය තවත් බොහොම දෙනෙක් ඉන්නවා. මේ නගර වැසියන් තුල නොපැහැදිලි කලකිරීමක ලකුණු දකින්න තියෙනවා. ඔවුන් අතරේ නොයෙක් විදියේ කතා බහ සමඟ එක්තරා බලා- පොරොත්තුවක් තියෙනවා. ඒ අතරේ සැලැකිය යුතු සිදුවීම් පිළිබඳ සාක්ෂි දකින්න තියෙනවා. ඒවා අවිනිශ්චිත බව මා පිළිගන්නවා. ඒ වුණත් අපි ඒ සාක්ෂි එකින් එක ගෙන බලමු. පලමුවැන්න, මිනීමැරුම සිදු වූ දින පැවල්ට හැදුණු මිමැස්මොරය ගැන අපි සැලැකිලිමත් විය යුතුයි. කිසියම් හේතුවක් නිසා එම අසනීපය බොරුවක් නොවන බව ඔප්පු කිරීමට පැමිණිල්ලේ නීතිඥ මහතා බොහො ම වෑයම් කළා. දෙවනු ව, නඩු විභාගය ආරම්භ කිරීමට ඔන්න මෙන්න කියා තිබිය දී පැවල් පණ නහගත්තා. තුන් වෙනු ව, මෙතෙක් කල් නියම වරද කරුවා සිරකරුවා යයි විශ්වාස කරගෙන සිටිය ඉවාන් කරමසෝ හදිසියෙන් ම උසාවියට පැමිණ රූබල් තුන් දහක් ඉදිරිපත් කොට පැවල් තාත්තා මැරූ බව කියා සිටියා. මේ සාක්ෂිකාරයා මොළයේ අසනීපයකින් පෙළෙන බවත්, මිය ගිය පැවල් පිට වරද පටවා සහෝදරයා නිදහස් කරගැනීමට වෑයම් කරන බවත්, පැමිණිල්ලේ නීතිඥ මහතා කියා සිටියා. මම ඊට එකඟ වෙනවා. ඒ වුණත් පැවල් ගේ නම මේ මිනීමැරුමට සම්බන්ධ වී තියෙනවා. එහි කිසියම් අභිරහසක් තියෙන බව අපට පෙනෙනවා. ජූරි සභාවේ මහත්වරුනි, මේ නඩුවේ තවමත් අවසන් නොවූ කොටසක් තියෙනවා. යම්කිසි දවසක ඒක පැහැදිලි වෙන්න පුළුවනි. අපි ඒ ගැන පසු ව කතා කරමු. ඒ අතරේ පැවල් ගේ චරිතය ගැන වචන සවල්පයක් කීමට මා අදහස් කරනවා. පැමිණිල්ලේ නීතිඥ මහතා පැවල් ගැන ව්‍යක්ත අන්දමින් විස්තරයක් කළා. මගේ උගත් මිත්‍රයා ගේ සාපිකත්වය ගැන මම බොහො ම

ආඩම්බර වෙනවා. ඒ වුණත් එතුමා පැවල් ගැන පැවසූ අදහස් සමග මා එකඟ වෙන්නේ නැහැ. මම පැවල් හමුවෙන්න ගියා. හමු වී ඔහු සමග කතා කළා. එහෙත් ඔහු ගැන මා තුළ ඇති වූ හැඟීම් මගේ උගත් මිත්‍ර නීතිඥ මහතා තුළ ඇති වූ හැඟීම්වලට ඉඳුරා වෙනස් ය. ඔහු සෞඛ්‍යයෙන් දුර්වල පුද්ගලයකු බව ඇත්තයි. නමුත් චරිතයෙන් හා සිතින් බලන විට පැමිණිල්ලේ නීතිඥ මහතා අපට පෙන්නා දුන් දුර්වල කම කිසිවක් දකින්න තිබුණේ නැහැ. පැමිණිල්ලේ නීතිඥ මහතා විසින් පෙන්නා දෙන ලද කිසි ම බයාදු කමක් ඔහු තුළ දකින්න තිබුණේ නැහැ. ඔහු තුළ අවංක කමක් වත් මා දුටුවේ නැහැ. ඒ වෙනුවට මට දකින්න ලැබුණේ බොළඳ කම නමැති සමින් වසා ගත් භයානක සැකයක් හා විශ්වාසයක් පමණයි. ඔහුට යමක්කමක් තේරුම් ගත හැකි හොඳ ඥාන ශක්තියකුත් තිබුණා. ඔහු දුබල සිතැත්තකු බව පෙන්නීමට ගොස් මගේ උගත් මිත්‍රයා කරගත්තේ ලොකු වරදක්. පැවල් ගේ ගති ගුණ මගේ සිතේ තදින් බලපැවැත්වූවා. මම ආපසු පැමිණියේ පැවල් ඊරිසියාවෙන් පැසුණු සිතක් ඇති, උසස් වීමට මහත් ආශාවකින් පෙළෙන, පළිගැනීමේ දුෂ්ට චේතනාවෙන් යුත්, කුඩුකේඩු පුද්ගලයෙක් ය යන අදහසින් යුතු වයි. මම ඔහු ගැන නොයෙක් දේවල් සොයා බැලුවා. ඔහු තමා ගේ තත්ත්වයට වෛර කළා; ඒ ගැන ලැජ්ජා වුණා. තමා 'ගඳගහන ලිසවේතා ගේ පුතා' බව සිහි වූ හැම විට ම ඔහු කෝපයෙන් දත් මිටි කෑවා. තමා කුඩා කාලේ සිට බලා හදා ගත් ග්‍රිගෝරිස්ට වත් ඔහු ගේ බිරියටවත් ඔහු කිසි ම ආදරයක්, ගෞරවයක් දක්වූයේ නැහැ. තමා ගේ මව් රට වන රුසියාවට ඔහු අපහාස කොට කතා කළා. ප්‍රංශයේ පදිංචි වී ප්‍රංශ ජාතිකයකු ලෙස ජීවත්වීමට ඔහු තුළ ලොකු ආශාවක් තිබුණා, ඒ ගැන නිතර කතා කළ මුත් ප්‍රංශයේ පදිංචි වීමට අතේ මුදල් නැතැයි කිව්වා. ආත්මාර්ථ කාමියකු වූ ඔහු කිසිවකුට ආදරයක් කරුණාවක් දක්වූයේ නැහැ. ඒ අතරේ තමා ගැන බොහෝ ම ඉහළින් කල්පනා කළා. ඔහු ගේ කල්පනාවේ හැටියට ශිෂ්ට මිනිහා ය කියන්නේ හොඳට ඇඳුම් පැළඳුම් කරන, පිරිසුදු කමිස ඇඳ, ඔප වැටෙන්නට මැදපු පාවහන් පළඳින තැනැත්තාටයි. තමා, තම ස්වාමියා ගේ අවජාත පුත්‍රයා බව විශ්වාස කළ පැවල් ස්වාමියා ගේ නීත්‍යානුකූල අනෙක් පුත්‍රයන් තිදෙනා ගේ තත්ත්වයක් සමඟ තමා ගේ තත්ත්වය සසඳා බලා කෝපයෙන් සිටින්න ඇති. (පැවල්, පියෝදර් කරමසෝ ගේ අවජාත පුත්‍රයා බව

පිළිගැනීමට හේතු බොහො ම තියෙනවා) ස්වාමියා ගේ අනෙක් පුත්‍රයන්ට හැම දෙයක් ම තියෙන අතර, පැවල්ට කිසි ම දෙයක් තිබුණේ නැහැ. ඔවුන්ට හැම අයිතියක් ම තිබුණා. ඔවුන්ට පියා ගේ ධනය අයිති වෙනවා. නමුත් පැවල් අරක්කැමියෙක් පමණයි. රූබල් තුන් දහ ලියුම් කවරය තුළ දැමීමට තම ස්වාමියාට උපකාර වූ බව ඔහු කිව්වා. ඔහුට අලුත් ජීවිතයක් ආරම්භ කිරීමට තරම් ප්‍රමාණවත් වූ එම මුදල් ස්වාමියා වියදම් කිරීමට අදහස් කරන කරුණ ඔහු ගේ දැඩි පිළිකුලටත් කෝප-යටත් හේතු වුණා. දේ දුන්නේ පාටින් පෙනෙන එ තරම් විශාල මුදලක් ඔහු කවදාවත් දැකලා නැහැ. ඒ ගැන මම ඕනෑ කමින් ම ඔහුගෙන් ප්‍රශ්න කළා. උසස් වීමේ දැඩි ආශා-වෙන් පෙළෙන, ද්වේෂයෙන් යුත් මිනිසකුට මෙ තරම් විශාල මුදලක් පෙන්වීම භයානක වැඩක්. එක මිනිහකු ගේ අතේ මෙ තරම් විශාල මුදලක් තියෙනවා ඔහු මීට පෙර කවදාවත් දැකලා නැහැ. ඉතා අලංකාර වර්ණයෙන් යුත් මේ මුදල් දැකීමෙන් ඔහු ගේ සිතේ අශෝභන සිතිවිලි පහළ වෙන්න ඇති. එහෙත් ඒ සිතිවිලි එ වේලේ ම ක්‍රියාත්මක වුණේ නැහැ.

"පැවල්ට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද චෝදනාවට පක්ෂ ව හා විපක්ෂ ව අපූරු විචක්ෂණ භාවයකින් යුතු ව කරුණු ඉදිරිපත් කරමින් තර්ක කළ පැමිණිල්ලේ දක්ෂ නීතිඥ මහතා පැවල් බොරු ලෙඩක් හදාගත්තේ කුමන යටි අදහසක් ඇති ව දැයි විශේෂයෙන් ම අපෙන් ප්‍රශ්න කළා. පැවල්ට බොරුවට ලෙඩ හදාගන්න උවමනාවක් නැහැ. ඔහුට මීමැස්මොරය ස්වාභාවික ලෙස වැලඳී, පසු ව ආයේත් ස්වාභා-වික ලෙස සනීප වෙන්න ඇති. වෙනත් මීමැස්මොරකාරයන්ට වගේ සමහර විට ඔහුට එදා රෑ ම ආයේත් සිහිය ලැබෙන්න ඇති. සම්පූර්ණයෙන් ම නො ව යන්තම් සනීප වෙන්න ඇති.

"පැවල්, මහලු කරමසෝ මරන්නට ඇත්තේ කොයි වේලාවේ ද කියා පැමිණිල්ලේ නීතිඥ මහතා අපෙන් ප්‍රශ්න කළා. මරාපු වේලාව පෙන්නීම බොහො ම ලෙහෙසි වැඩක්. ගිරිගෝරිස් සිරකරුවා ගේ කකුලෙන් අල්ලාගෙන 'පිතෘඝා-තකයා' කියා යටිගුරින් කෑ ගාපු වේලාවේ දී ගැඹුරු නින්දක නිදා සිටි පැවල්ට ඇහෙන්න ඇති. සාමාන්‍යයෙන් මීමැස්මොරය හැදුණාට පස්සේ බොහො ම තදින් නින්ද යනවා. මග සිහි නැති වෙන්නේ නැහැ. රාත්‍රි නිශ්ශබ්දතාව හා අඳුර තුළින් ගිරිගෝරිස් ගේ කෑගැම බොහො ම තදින් ඇහෙන්න ඇති.

පැවල් තිස්දෙන් නැගිටින්න ඇති. ඒ වෙලාවේ පැවල්ට එ තරම් තදින් නින්ද නො යන්න ඇති. ඇදෙන් නැගිට්ට ඔහු කුමක් සිදු වුණේ දැයි දැනගැනීම පිණිස නො කල්පනාවෙන්, නියම අරමුණක් නැති ව ශබ්දය ඇසුණු දිසාවට යන්න ඇති. නවමත් අඩ නින්දේ සිටිය ඔහු ගේ හිස තෝන්තු වී තිබෙන්නට ඇති. වත්තට ගිය පසු පහන් එළියෙන් ආලෝක වූ මහ ගෙයි කවුළුව දැක, කවුළුව ළඟට ගොස් සවාමියාට කතා කොට සිරකරුවා ගිරිගෝරිස්ට පහර දුන් බව දැනගත්තා. පැවල් දැකීමෙන් කරමසෝ බොහො ම සන්තෝෂ වෙන්න ඇති. ඔහු ගේ සිත වහා ම ක්‍රියා කරන්න පටන් ගත්තා. තැති ගෙන සිටිය සවාමියාගෙන් ඔහු සියලු තොරතුරු දැනගත්තා. ඉතින් මේ මිනිහගේ, රෝගයෙන් අවුල් වූ මොළයේ ඉතා භයානක, සිත් පොළඹවන, තර්කානුකූල වූ අදහසක් හැඩ ගැසෙන්නට පටන් ගත්තා. ඒ අදහස කුමක් ද? මහලු සවාමියා මරා රූබල් තුන් දහ සොරා ගෙන, සම්පූර්ණ වරද සිරකරුවා පිට පැටවීමයි. සිතේ පැවැති අධික ධන තණ්හාවෙන් හා කාටවත් අසු නො වී මහල්ලා මරා මුදල් ගැනීමට ලැබුණු මේ කදිම අවස්ථාවෙන් පැවල් ගේ සිත පෙළඹුණා. සතුටුදායක අවස්ථාවන් පැමිණි විට මැඩ ගත නො හැකි මෙ වැනි ආශාවන් හදිසියෙන් ම ඇති වෙනවා. මිනීමැරීමට කලින් අදහස් කරගෙන නොසිටි මිනීමරුවන් තුළ වෙසෙසින් ම මෙ වැනි අදහස් ඇති වෙනවා. ඉතින් පැවල් ගෙය ඇතුළට ගොස් මහලු කරමසෝ මරන්න ඇති. මරන්න ඇත්තේ මොන විදියේ ආයුධයකින් ද? වත්තේ තිබී ඇහිඳ ගත්ත ගලකින් ගසා මරන්න ඇති. මොනවට ද මැරුවේ? මොන අදහසකින් ද මැරුවේ? ඇයි, රූබල් තුන් දහ ගන්න. ඒ මුදලින් ඔහුට අලුත් ජීවිතයක් ආරම්භ කරන්න පුළුවනි......මා එකිනෙකට පටහැනි අදහස් පවසනවා නො වෙයි......රූබල් තුන් දහක් තියෙන්නට ඇති. මුදල් තියෙන තැන, සවාමියා මුදල් තුබූ තැන දැන සිටින්නට ඇත්තේ පැවල් පමණක් විය හැකියි. 'එතකොට මුදල් දමා තිබුණු ලියුම් කවරය? ඉරා බිම දමා තිබුණු ලියුම් කවරය? ඒ ගැන මොක ද කියන්නේ?' කියා මගෙන් ප්‍රශ්න කරන්න පුළුවනි.

"දැන් ටිකකට කලින් මේ ලියුම් කවරය පිළිබඳ ගැඹුරු සිද්ධාන්තය ඉදිරිපත් කරන අතර, තමාට විරුද්ධ ව ඉදිරිපත් කළ හැකි සාක්ෂියක් මෙසේ බිම දමා යන්නේ මිතියා කරමසෝ වැනි පළපුරුද්දක් නැති සොරෙක් ය; එහෙත් පැවල් වැනි කෙනෙක් එ වැනි සාක්ෂියක් තබා නොයන බව පැමිණිල්ලේ

නීතිඥ මහතා අපට පෙන්නා දුන්නා. නීතිඥ මහතා ගේ කතාව අසා සිටි මට මතක් වුණා මෙ වැනි ම දෙයක් මම මීට කලින් අසා තිබුණු බව. මිනියා කරමසෝ වැනි කෙනෙක් ලියුම් කවරය බිම දමා යන බව දක්වන එම අදහස ම හරියට ම මීට දෙදිනකට කලින් මට පැවල්ගෙන් අහන්න ලැබුණා. එ පමණක් නො වෙයි. ඒ වෙලාවේ මට පෙනී ගියා ඔහු බොරු අවංක කමක් පෙන්නන්න හදන බව. මේ ලියුම් කවරය පිළිබඳ ඔහු දක්වූ අදහස මගේ ම අදහසක් හැටියට පෙන්නීමට ඔහු වෑයම් කළා. මේ මිනිමැරුම පරීක්‍ෂා කළ අයටත් ඔහු මේ අදහස ඉදිරිපත් කළේ නැද්ද? මගේ උගත් මිත්‍රයා වන දණ්ඩනායකයාටත් ඔහු මේ අදහස අහම්බෙන් වගේ වංචාවෙන් පිළිගන්වන්න වෑයම් කළේ නැද්ද?

" 'බිත්තියෙන් එහා පැත්තේ නිදා සිටි පැවල් මුළු රෑ ම කෙඳිරි ගෑවා ගිරිගෝරිස් ගේ බිරියට ඇහුණේ නැද්ද?' යන ප්‍රශ්නය මගෙන් අහන්න පුළුවනි. ඔව් ඇයට ඇහුණ බව ඇත්තයි. එහෙත් ඇගේ සාක්‍ෂිය පිළිගැනීම අපහසුයි. වත්තේ සිටින බල්ලා ගේ බිරීම නිසා මුළු රාත්‍රිය ම නිඳගන්න නො හැකි වූ බව කියමින් පැමිණිලි කළ කාන්තාවක් ගැන මම දන්නවා. එහෙත් ඒ අසරණ තිරිසනා මුළු රාත්‍රියට ම වරකට දෙවරකට වඩා බුරා නැති බව කරුණු පරීක්‍ෂා කිරීමෙන් පසු ව අපට දැනගන්න ලැබුණා. ඒක පිළිගත හැකි දෙයක්. යම් කිසි කෙනකුට නිදා සිටින අතර ශබ්දයක් ඇහුණොත් තමා ගේ නින්දට බාධා කිරීම ගැන ඇතිවූ කෝපයෙන් යුතු ව අවදි වී ආයේත් එවේලේ ම නිදා ගන්නවා. පැය දෙකකට පස්සේ ආයේත් ඔහු ශබ්දය ඇසී අවදි වී නිදා ගන්නවා. පැය දෙකකට පස්සේ ආයේත් වරක් එම දෙය ම සිදුවෙනවා. මේ විදියට ඔහු මුළු රෑ ම තුන් වරක් අවදි වී නිදා ගන්නවා. පසු දා උදේ නැගිටින මේ තැනැත්තා, කවුදෝ මුළු රෑ ම කෙඳිරිගාමින් තමාට නිදා ගැනීමට ඉඩ නුදුන් බව කියනවා. ඔහුට පෙනෙන්නේ තමා මුළු රාත්‍රිය ම නිදා නො ගෙන සිටි බවයි. වරකට පැය දෙක බැගින් නිදාගන්න බව ඔහුට අමතක වෙනවා. ඔහුට මතක තියෙන්නේ අවදි වූ වේලාව පමණයි. ඒ නිසා ඔහු කල්පනා කරන්නේ තමාට රෑ එළිවන තෙක් නිදා ගැනීමට නොලැබුණු බවයි.

" 'පැවල් පණ නහ ගැනීමට පෙර ලියන ලද ලියුමේ තමා මහලු සවාමියා මැරූබව නො ලිව්වේ මන් ද? ඔහු ගේ විඥනය එක් කරුණක් හෙළි කරන අතරේ අනෙක් කරුණ

සහවන්නේ මන්ද?'යි පැමිණිල්ලේ නීතිඥ මහතා ආයෙත් ප්‍රශ්න කළා. ජූරි සභාවේ මහත්වරුනි, අපි මේ කාරණාව සිහි තබා ගත යුතුයි. විඥානයෙන් අදහස් වෙන්නේ පශ්චාත්-තාපයයි. ඔහු පණ නහ ගන්නට ඇත්තේ පශ්චාත්තාපය නිසා නො ව, බලාපොරොත්තු කඩවීම නිසයි. පශ්චාත්තාපයත් බලාපොරොත්තු කඩවීමත් එකිනෙකට වෙනස් කරුණු දෙකක්. බලාපොරොත්තු කඩවීමෙන් ඊර්ෂ්‍යාව ඇති විය හැකියි. පරස්පර විරෝධි විය හැකියි. පණ නහ ගන්නා මොහොතේ දී පණ නහ ගන්න තැනැත්තා මුළු ජීවිත කාලය තුළ ම වෛර කළ අයට දෙතුන් ගුණයක් වෛර කරන්න ඇති.

"ජූරි සභාවේ මහත්වරුනි, මේ නඩුවේ දී යුක්තිය ඉෂ්ට නො වන්නට පුළුවනි ඒ ගැන පරිස්සම් වියයුතු යි. මෙතෙක් වේලා මා නමූත්නාත්සේලාට විස්තර කළ කරුණු සිදුවිය නො හැකි අනුමාන සහිත දේවල් ලෙස බැහැර කරන්නේ කෙසේ ද කියා නමූත්නාත්සේලා ගෙන් ප්‍රශ්න කරන්න කැමැතියි. මගේ තර්කයේ ඇති වරද පෙන්නා දෙන්න. ඒවා සිදුවිය නො හැක්කේ මන්ද? හාස්‍ය ජනක වෙන්නේ මන්ද? යනු මට පෙන්නා දෙන්න. මගේ තර්කයේ අබ මල් රේණුවක තරම්වත් පිළිගත හැකි, සිදුවිය හැකි දෙයක් තිබේ නම් සිරකරුවාට විරුද්ධ ව නඩුව තීන්දු නො කරන ලෙස මම නමූත්නාත්යේලා ගෙන් ඉල්ලා සිටිනවා. මා ඉදිරිපත් කළ කරුණුවල ඇත්තේ පිළිගන්නට පුළුවන් අබ මල් රේණුවක් තරම් කොටසක් පමණක් ද? මේ මිනීමැරුම සම්බන්ධ ව මා ඉදිරිපත් කළ කරුණු මා සම්පූර්ණයෙන් ම විශ්වාස කරන බව මා දන්නා ශුද්ධ වූ හැම දෙයක් ගැන ම දිවුරා කියන්න පුළුවනි. මා තුළ බලවත් කැළඹීමක් හා කෝපයක් ඇති වෙන්නේ සිරකරුවාට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද සාක්ෂි මහත්. රාශියෙන් යම්ර වූ ද, බිඳ හෙළිය නො හැකි වූ ද, එක ම සාක්ෂියක් වත් නොමැති වීමයි. එහෙත් එක්රැස් කරන ලද මේ සාක්ෂි නිසා අසරණ තරුණයා සම්පූර්ණයෙන් ම විනාශ වෙන්න පුළුවනි. සිරකරුවාට විරුද්ධ ව රැස් කරන ලද මේ සාක්ෂි බොහෝ ම භයානකයි. මහලු කරමසෝ මැරූ හැටි, ඇඟිලි දිගේ ලේ පෙරෙන හැටි, ලේ තැවරුණු ඇඳුම්, 'පිතෘඝාතකයා' යන භයානක හඬ රාත්‍රියේ අන්ධකාරය විනිවිද ගිය හැටි, ඒ වචනය කියා කෑගෑ මිනිහා, හිසට ගසනු ලැබූ පහරකින් බිම ඇද වැටුණු හැටි, නොයෙක් විදියේ වාක්‍ය, නිවේදන, ප්‍රකාශන, සංඥාවල්, විලාප ආදී නොයෙක් දේවල් සිරකරුවාට විරුද්ධ ව ඉදිරිපත් කරල තියෙනවා.

මේවා මිතිසුන් ගේ සිත් තුළ බලපවත්වන්නට පුළුවනි. මිනිසුන් තුළ අගතියට ගිය අදහස් ඇති කරවන්නට පුළුවනි. නමුත් ජූරි සභාවේ මහත්වරුනි, මේ සාක්ෂිවලින් නමුත්නාත්සේලා ගේ සිත් තුළ අගතියට ගිය අදහස් ඇතිවීමට ඉඩ තිබෙනවා ද? සිරකරුවාට දඬුවම් කිරීමට හෝ නිදහස් කිරීමට හෝ විශාල බලයක් නමුත්නාත්සේලාට දී තිබෙන බව කරුණා කර සිහි තබා ගන්න. බලය වැඩි වූ තරමට වගකීම භයානක වෙනවා.

''මා දුන් පැවැසූ කරුණුවලින් අබ ඇටයක තරම් දෙයක් වත් මම අස්කර ගන්නේ නැහැ. සිරකරුවා ඔහු ගේ පියා මැරුවේ යයි කියමින් පැමිණිල්ලේ නීතිඥ මහතා විසින් සිරකරුවාට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද චෝදනාව තර්කය සඳහා සුළු වේලාවකට ඇත්ත ලෙස පිළිගෙන බලමු. මෙය තර්ක මාත්‍රයක් පමණයි. සිරකරුවා ගේ නිර්දෝෂී කම ගැන මම මොහොතකටවත් සැක කරන්නේ නැහැ. එය කෙසේ වෙතත් සිරකරුවා පියා ගේ මරණයට වරදකාරයා ය කියා අපි සිතා බලමු. මා කියන දෙයට සවන් දෙන ලෙස මා නමුත්නාත්සේලා ගෙන් ඉතා බැගෑපත් ව ඉල්ලා සිටිනවා. නමුත්නාත්සේලා ගේ සිත් තුළ හා හදවත් තුළ විශාල සටනක් තිබෙන බව මට පෙනෙන නිසා නමුත්නාත්සේලාට කිය යුතු තවත් වැදගත් කරුණක් මගේ හදවතේ නැත්පත් වී තියෙනවා .... ජූරි සභාවේ මහත්වරුනි, දැන් මොහොතකට කලින් මම නමුත්නාත්සේලා ගේ සිත් හා හදවත් සම්බන්ධ ව කී දෙය ගැන මට සමා විය යුතුයි. ඒ වුණත් නඩුව අවසන් වනතෙක් ඇත්ත කීමටත්, අවංක වීමටත් මා කැමැතියි. අපි සියලු දෙනා ම අවංක විය යුතුයි........''

මේ මොහොතේ දී අත්පොළසන් නාදයෙන් නීතිඥයා ගේ කතාවට බාධා විය. ඔහු අන්තිම වචන ස්වල්පය ඉතා අවංක ස්වරයකින් පැවසූ හෙයින්, ඔහුට යමක්කිසිවක් කීමට තිබෙන බවත්, ඔහු දැන් කීමට සැරසෙන්නේ ඉතා වැදගත් දෙයක් බවත් හැම දෙනාට ම පෙනී ගියේ ය. එහෙත් අත් පොළසන් දීම අසා සිටි ප්‍රධාන විනිශ්චයකාරතුමා ආයේත් එ වැනි බාධාවක් ඇති වුවහොත් සියලු දෙනා ම උසාවියෙන් දෙට්ට දමන බව උස් හඬින් තර්ජනය කරමින් කී ය. යළි උසාවිය තුළ දැඩි නිශ්ශබ්දතාවක් ඇති විය. විත්තියේ නීතිඥයා කලින් කතා කල ස්වරයට වඩා අමුතු විහිවිද යන ස්වරයකින් ආයේත් දේශනය ආරම්භ කෙළේ ය.

දහතුන්වන පරිච්ඡේදය

සිත් දූෂණය කරන්නා

"ජූරි සභාවේ මහත්වරුනි, සිරකරුවා ගේ විනාශයට හේතු වී තිබෙන්නේ ඔහුට විරුද්ධ ව රැස්කරන ලද සාක්ෂි පමණක් නො වෙයි. සිරකරුවා ගේ විනාශයට හේතු වී තිබෙන්නේ එක ම කරුණක් පමණයි, ඒ කරුණ නම් ඔහු ගේ පියා ගේ මලමිනියයි. මෙය සාමාන්‍ය මිනීමැරුම් නඩුවකට සමාන නම්, සිරකරුවාට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද සාක්ෂිවල ඇත්තා වූ නොවැදගත්කම නිසාත්, අසම්පූර්ණකම නිසාත්, අද්භූත ගතිය නිසාත්, ඒ සාක්ෂි වෙන්වෙන් ව ගෙන පරීක්ෂා කරන විට සිතේ සැකයක ඡායාවක්වත් ඇති නොවන ලෙස ඔප්පු කල නොහැකි නිසාත්, සිරකරුවාට විරුද්ධ ව ඇති මිනීමැරුමේ චෝදනාව තමුන්නාන්සේලා ප්‍රතික්ෂේප කරනවා ඇති. මිනිසකුට විරුද්ධ ව ඇත්තා වූ අහිතකර හැඟීම් උඩ මිනිසකු ගේ ජීවිතය විනාශ කිරීමට තමුන්නාන්සේලා මදක් පසුබට වෙනවා ඇති. අභාග්‍යයකට වාගේ මේ සිරකරුවා නම් එ වැනි දඬුවමක් ලැබීමට සුදුස්සෙක්. අපි මෙහි දී විභාග කරන්නේ සාමාන්‍ය මිනීමැරුම් නඩුවක් නො ව පියා මැරීමේ නඩුවකි. පිතෘඝාතනය මහජනයා ගේ සිත් තුල තදින් බල පවත්වන අපරාධයකි. කො තරම් තදින් බලපවත්වන්නේ දැයි කියතොත් සිරකරුවාට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද සාක්ෂි නොවැදගත් වුවත්, ඔප්පු කල නොහැකි වුවත්, මැදහත් සිත් ඇත්තකු පවා ඒ සාක්ෂි වැදගත් කොට සලකන්න පුළුවනි. එ වැනි සිරකරුවෙක් වරදින් නිදහස් කරන්නේ කෙසේ ද? යම විදියකින් ඔහු පියා මරා නිදහස් වන්නේ නම් මොකද වෙන්නේ? හැම දෙනා තුල ම නොකැමැත්තෙන් ම, නිතැතින් ම මෙ වැනි හැඟීම් ඇති වන්නට පුළුවනි.

"පියා මැරීම මහ පොළොව පවා උසුලන්නේ නැති අපරාධයක්. තමා ගේ උත්පාදකයා වූ, දරු ස්නේහයෙන් හා ජීවිත පරිත්‍යාගයෙන් යුතු ව තමා ගේ කටයුතු කරදුන්, කුඩා කල සිට ලෙඩ දුකේ දී රැකබලාගත්, තමා ගේ ජීවිතය සැපවත් කිරීමට මුළු ජීවිත කාලය ම වෙහෙස වූ, සැපතේ දීත්,

සමාද්ධියේ දීත් හවුල් වී ප්‍රීති වූ, පියෙක් මරා දැමීම සිතන්න වත් බැරි අපරාධයක්. ජූරි සභාවේ මහත්වරුනි, පියා කියන්නේ කවරකුට ද? නියම පියා කියන්නේ කෙබඳු පුද්ගලයකුට ද? ඒ ශ්‍රේෂ්ඨ වචනයේ තේරුම කුමක් ද? එහි තිදන් වී ඇති උතුම් අර්ථය කුමක් ද? නියම පියා කවරෙක් ද? ඔහු කෙබඳු ගතිගුණවලින් සමන්විත වූ කෙනකු විය යුතු ද? වචනයේ අර්ථය ගැනත්, නියම පියකු තුළ තිබිය යුතු ගති ගුණ ගැනත්, අපි මොහොතකට පෙර සුළු හැඳින්වීමක් කළා. නමුත්, අප දැන් මහත් සැලැකිල්ලක් දක්වා පරීක්ෂා කරන, අපේ සිත් තුළ බලවත් වේදනාවක් ඇති කරන මේ නඩුවට සම්බන්ධ වූ පියා වන පියෝදර් පවුලොවිච් කරමසෝ අපි දැන් විග්‍රහ කළ පියකු ගේ ගතිගුණවලට කොහෙත් ම ගැලපෙන්නේ නැහැ. ඒක විශාල අභාග්‍යයක්. සමහරක් පියවරුන් දරුවන්ට ලැබෙන විශාල අභාග්‍යයක් ලෙස සැලැකිය හැකියි. අපි මේ අභාග්‍ය සම්පන්න පියා මඳක් කිට්ටුවෙන් සෝදිසි කොට බලමු. ජූරි සභාවේ මහත්වරුනි, නමුත්නාත්සේලා විසින් ගත යුතු තීරණයේ ඇති වැදගත් කම ගැන සලකා බලන කල කිසි ම දෙයකට භය වෙන්න උවමනා නැහැ. පැමිණිල්ලේ දක්ෂ නීතිඥ මහතා විස්තර කළාක් මෙන්, ළමයින් හා නැනි ගත් ගැහැනුන් මෙන් අපි කිසි ම දෙයක් ගැන බය වෙන්න හොඳ නැහැ. පැකි-ළෙන්න හොඳ නැහැ.

"මගේ උගත් මිත්‍රයා එතුමා ගේ වේගවත් දේශනය කර ගෙන යන අතරේ කීප වරක් ම 'නැහැ, මම කිසි ම කෙනකුට සිරකරුවා ආරක්ෂා කරන්න දෙන්නේ නැහැ. පීටර්ස්බර්ග් පුරයේ සිට පැමිණි නීතිඥයාට පවා සිරකරුවා ආරක්ෂා කරන්න දෙන්නේ නැහැ. මම ඔහුට විරුද්ධ ව චෝදනා කරන අතරේ ඔහු ගේ නිදහස පතා සටන් කරනවා'යි කිව්වා. ඒ මහතා මේ කතාව කීප වරක් ම කිව්වා. නමුත්, කුඩා කාලයේ දී පියා සමඟ මහ ගෙදර සිටින විට, එක ම මනුෂ්‍යයකු විසින් ආදරයෙන් ගෙනත් දුන්නු රටකොව්වන් රාත්තල මේ භයානක සිරකරුවාට හවුරුදු විසිතුනක් කල් මතක තිබුණා. එසේ නම් කරුණාවන්ත පුද්ගලයකු වූ දෙස්තර හේසන්ස්ටියුබ් ගේ වචන-වලින් ම කියතොත්, තමා කුඩා කාලයේ දී පාවහන් නැති ව, කුඩා කලිසම එක බොත්තමකින් රඳවා ගෙන, පියා ගේ ගෙදර මිදුලේ දුව පැන ඇවිද්ද හැටි සිරකරුවාට අමතක වෙයි ද?

"ජූරි සභාවේ මහත්වරුනි, අපි මේ අවාසනාවන්ත දේවල් නැවත නැවතත් පරීක්ෂා කරන්නේ කුමකට ද? දැනටම හැම

දෙනා ම දන්නා දේවල් පුලපුලා කියන්නේ කුමන අදහසකින් ද? සිරකරුවා පියා ගේ ගෙදරට පැමිණි පසු දකින්නට ලැබුණේ මොනවා ද? සිරකරුවා හිතක් පපුවක් නැති, ආත්මාර්ථකාමී, භයානක සතකු ලෙස විස්තර කරන්නේ කුමට ද? ඔහු කිසි ම කෙනකුට මැඩ පවත්වන්න පුළුවන් කෙනෙක් නො වෙයි. ඔහු බොහො ම චණ්ඩයි. කිසි ම හික්මීමක් නැහැ. ඔහු අධිකරණය ඉදිරියට පමුණුවා තියෙන්නේ මේ කාරණා නිසයි. ඔහු තුළ ඇත්තා වූ මේ දුර්ගුණවලට වග කියයුත්තා කවු ද? යහපත් චරිතයක් හා කෘතඥතාවෙන් පිරි, වහා හැඟීම් ඇති කරවන හදවතක් ඇති සිරකරුවා මෙ තරම් අශෝභන ලෙස ඇති දැඩි වීම ගැන වග කියයුත්තා කවු ද? සිහි මොළේ ඇති ව වැඩ කිරීමට කවුද ඔහුට කියා දුන්නේ? ඔහුට හොඳ අධ්‍යා-පනයක් ලැබුණා ද? කුඩා කාලයේදී ආදරයෙන් රැක බලාගත්තා ද? මේ සිරකරුවා දෙයියන් ගේ පිහිටෙන් කැලේ සතකු වාගේ යන්තම් ඇති දැඩි වුණා. බොහෝ කාලයකට පසුව පියා දකීමට ඔහු තුළ ආශාවක් ඇති වන්නට ඇති. තමා ගේ ළමා විය රෑ දුටු සිහිනයක් වාගේ දහස් වරක් පමණ සිහි වෙන්න ඇති. ඒ සිහිනයේ තමා නැති ගන්වන අවතාර එළවා දමා පියා වැලඳ ගෙන සමාව දීමට ඔහු තුළ ආශාවක් තියෙන්න ඇති. නමුත් මොකක් ද වුණේ? පියා ඔහුට නින්දා කළා, අපහාස කළා, සැක කළා. ඔහුට මවගෙන් ලැබුණු මුදල් වංචාවෙන් ගැනීමට වෑයම් කළා. ඔහුට හැම දා ම අහන්න ලැබුණේ පියා මත් පැන් බීගෙන කළ පිළිකුල් සහගත කතාබහ හා දුෂ්ට උපදෙස් පමණයි. අන්තිමේ දී තමා පැතූ තරුණිය තමා ගේ මුදල්-වලින් ම පොලඹවා ගැනීමට පියා සැරසෙන බව සිරකරුවා දුටුවා. ජූරි සභාවේ මහත්වරුනි, මේක බොහො ම දරුණු වැඩක්, පිළිකුල් සහගත වැඩක්. මෙම මහලු පියා, තමා ගේ පුතා තමාට ගරු නොකරන බව, නපුරු කම් කරන බව, කියමින් ඇවිද්ද, නරක මිනිහකු හැටියට සමාජයට පෙන්නා දුන්නා, හිංසා කළා, අපවාද කිව්වා. පුතා හිරේ දැමීමේ නපුරු අදහසින්, ඔහු ගෙවන්න තිබුණු ණයකර සේරම එකතු කරගත්තා. ජූරි සභාවේ මහත්වරුනි, මේ සිරකරුවා වැනි පිටතින් බොහො ම භයානක, කිසි ම විනයක් නැති, හික්මීමක් නැති, අය සමහර විට බොහො ම කරුණාවන්තයි. නමුත් ඒ බව පිටට පෙන්-නන්නේ නැහැ. මගේ අදහස් ගැන තමුන්නාන්සේලා හිතා වෙන්න එපා. සිරකරුවා ගෘෂෙන්කාට ආලය කළා ය, ශ්‍රේෂ්-ඨත්වයට, රූප සෞන්දර්යයට ආලය කළා ය කියා පැමිණිල්ලේ නීතිඥ මහතා දුෂ්ට චේතනාවෙන් සිනාසුණා. මම මගේ උගත්

මිත්‍රයා ගේ තත්ත්වයේ සිටියා නම් කවදාවත් ඔය විදියට සිතාසෙන්නේ නැහැ. සිරකරුවාට සමාන ගතිගුණ තියෙන අය ඉන්නවා. එවැනි මිනිසුන් වෙනුවෙන් කතා කිරීමට මට අවසර දෙන්න. මේ මිනිසුන් නිතර ම වාගේ වරදවා තේරුම් ගෙන තියෙනවා. ඔවුන් තුළ ආදරයට, සෞන්දර්යයට, යුක්ති ධර්මයට, ලොකු ආශාවක් තියෙනවා. ඒ ආශාව ඔවුන් ගේ සැහැසිකම්, නපුරුකම් හා නොහික්මුණු කම්වලට පටහැනියි. එහෙත් ඔවුන් තුළ ආශාවක් තියෙනවා. එය නො කල්පනා-වෙන් ම වාගේ ඇති වන ආශාවක්. පිටකින් රාගාධික වුවත්, කෲර වුවත්, ඔවුන්ට හිතේ දරුණු වේදනාවක් වන තරමට ගැහැනියකට ආලය කරන්න පුළුවනි. ඒ ආලය බොහෝ ම ශ්‍රේෂ්ඨයි, බොහෝ ම භක්තිවන්තයි. ජූරි සභාවේ මහත්වරුනි, මට ආයේත් වරක් හිනා වෙන්න එපා. මෙ වැනි ගතිගුණ ඇති මිනිසුන් ගේ හැටි ඔහොම තමයි. එක ම දුර්වලකම හිතේ නැලියන රාගය මැඩ ගැනීමට ඔවුන්ට පුළුවන් කමක් නැහැ. සමහර විට රාගය බොහෝ ම රළු යි. පිට අයට පෙනෙන්නේ ඔවුන් ගේ බාහිර ගතිගුණ පමණයි. ඔවුන් ගේ අභ්‍යන්තරයේ ඇති වන පෙරළිය පෙනෙන්නේ නැහැ. ඔවුන් ගේ ඒ රාගය බොහෝ ම ඉක්මනට විඩා වැටෙනවා. එහෙත් උසස් කුල කාන්තාවක ගේ ආශ්‍රයට වැටෙන මේ මිනිස්සු අලුත් ජීවිතයක් ආරම්භ කිරීමට වෑයම් කරනවා. කලින් කළ වැරදි හදා ගැනීමට වෑයම් කරනවා. යහපත් මිනිසුන් වීමට වෑයම් කරනවා. ශ්‍රේෂ්ඨ ආත්ම ගරුක මිනිසුන් වීමට වෑයම් කරනවා. මන්ද මේ විපරියාසය ඇතිවෙන්නේ? ඔවුන් තුළ ශ්‍රේෂ්ඨත්වයට හා රූප සෞන්දර්යයට තියෙන ආශාව නිසයි.

"සිරකරුවා හා කැතිරිනා අතරේ පැවැති ප්‍රේම සම්බන්ධය ගැන වචනයක්වත් නොකියන බව මම මීට ටිකකට කලින් කිව්වා. නමුත් ඒ ගැන සඳහන් කිරීම අවශ්‍ය යයි දැන් මට හැඟී යනවා. දැන් ටිකකට කලින් අපට කැතිරිනා ගෙන් අහන්න ලැබුණේ සාක්ෂියක් නො ව කෝපයෙන් දැවෙන උන්මාද වූ ස්ත්‍රියක ගේ විලාපයක් පමණයි. ඇයට කිසි ම අයිතියක් නැහැ සිරකරුවා තමාට ද්‍රෝහිකම් කළා ය කියා චෝදනා කිරීමට. සිරකරුවාට ද්‍රෝහිකම් කළේ ඇයයි. ඈ ටිකක් සිහි බුද්ධියෙන් කල්පනා කළා නම් කවදාවත් ඔය විදියට සාක්ෂි දෙන්නේ නැහැ. ඇගේ සාක්ෂිය නමුත්නාත්සේලා විශ්වාස කරන්න එපා. සිරකරුවා ඈ කියන විදියේ භයානක සතෙක් නො වෙයි. මනුෂ්‍ය වර්ගයා ගේ මහා කාරුණිකයා කුරුසය මත තබා ඇන ගැසීමට පෙර 'මම යහපත් එඬේරෙක්මි.

එක ද බැටෙළු පැටවෙක් වත් මංමුලා නොවීම පිණිස මගේ ජීවිතය පූජාකරමි'යි කිව්වා. ඒ නිසා අප ද මනුෂ්‍යයකු ගේ ආත්මය විනාශ නොකිරීමට වග බලාගත යුතුයි.

"මම දුත් විකකට කලින් 'පියා' යන වචනයේ අර්ථය කුමක් ද?'යි ප්‍රශ්න කොට, එය ශ්‍රේෂ්ඨ වචනයක් බවත්, අගනා නමක් බවත් කිව්වා. නමුත් ජූරි සභාවේ මහත්වරුනි, වචන පාවිච්චි කිරීමේ දී අපි අවංක විය යුතුයි. ඒ නිසා මේ අවස්ථාවේ දී යම් යම් දේවල් නියම නමින් අඳුනා දීමට මා අදහස් කරනවා. මරා දමන ලද පියෝදර් කරමසෝ වැනි මිනිසකුට 'පියා' යන වචනය පාවිච්චි කරන්න බැහැ. එවැනි නමකින් ආමන්ත්‍රණය කිරීමට තරම් ඔහු සුදුස්සෙක් නො වෙයි. දරුවන් ගේ ආදර සැලැකිලි ලැබීමට තරම් සුදුසු කමක් නැති මිනිහකුට ආදරය කිරීම අයුක්තියක්, හාස්‍ය ජනක දෙයක්, කළ නොහැකි දෙයක්, නැති දෙයකින් ආදරයක් ඇති කරන්න බැහැ. නැති දෙයකින් යම් කිසිවක් නිර්මාණය කරන්න පුළුවන් දෙවියන් වහන්සේට පමණයි. 'පියවරුනි තොප ගේ දරුවන් ගේ සිත් තුළ ක්‍රෝධය, වෛරය ඇති නො කරවූ' කියා ක්‍රිස්තුන් වහන්සේ ගේ ශ්‍රාවකයෙක් ලියා තැබුවේ ප්‍රේමයෙන් ආලෝකවූ හදවතකින් යුතු වයි. මා මේ ශුද්ධ වූ ධර්ම පාඨය සඳහන් කළේ සිරකරුවා වෙනුවෙන් නො ව සියලු ම පියවරුන් වෙනුවෙන්. පියවරුන්ට දේශනා කිරීමට මට අවසර දුන්නේ කවුද කියා මගෙන් ප්‍රශ්න කරන්න පුළුවනි. මට කිසි ම කෙනෙක් අවසර දීලා නැහැ. නමුත් මිනිසකු හා පුරවැසියකු හැටියට මම මෙසේ කන්නලව් කිරීමට කැමැතියි. අපි වැඩි කලක් මේ මිහිපිට ජීවත් වන්නේ නැහැ. අප ජීවත්වන පුළු කාලය තුළ දී බොහො ම නපුරු වැඩ කරනවා. නපුරු දේවල් කියනවා. ඒ නිසා අප කාටත් හොඳ යහපත් වචනයක් කියා ගැනීමට පුළුවන්, අප සියලු දෙනා ම එක තැනකට එකතු වන හොඳ අවස්ථාවකින් ප්‍රයෝජන ගත යුතුයි. එවැනි දෙයක් තමයි දුන් මා කරන්නේ. මේ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගැනීමට මම කැමැතියි. උසස් බලයකින් අපට මේ අධිකරණය ලැබී තියෙන්නේ නිකම් නො වෙයි. අපි මේ ස්ථානයේ සිට කියන දෙය මුළු රුසියාවට ම ඇහෙනවා. මා මේ කාරණය කියන්නේ මෙ තැන සිටින පියවරුන්ට පමණක් නො ව, රුසියාව පුරා සිටින පියවරුන්ට ඇහෙන්නටයි. 'පියවරුනි, තොප ගේ දරුවන් කෝප නො කරන් වා' කියා ක්‍රිස්තුන් වහන්සේ දේශනා කළා. පළමු ව අපි මේ බණපදය පිළිපැද, පසු ව දරුවන්ට පිළිපදින ලෙස කියමු. නැති නම් අපි

දරුවන් ගේ සතුරන් මිස පියවරු නො වෙමු. ඔවුහු ද අපේ සතුරන් මිස දරුවෝ නො වෙති. අපි ම අපේ දරුවන් සතුරු කර ගන්නවා. 'තොප අනුන්ට බෙදන හැන්දෙන් තමයි තොපටත් බෙදන්නේ' මේ කියමන, දේශනාවට ඇතුළත් කියමනක් මිස මගේ කියමනක් නො වෙයි. අපි දරුවන්ට සලකන විදියට දරුවන් ද අපට සලකනවා නම් අපි දරුවන්ට දෙස් කියන්නේ කොහොම ද? මීට ටික කලකට පෙර පින්ලන්තයේ එක්තරා ගෙයක සේවය කළ තරුණියක් සොරෙන් දරුවකු වැදුවා ය කියා සැක කළා. ඇය ගැන සෝදිසි කිරීමෙන් පසු ව, අටුවේ මූල්ලේ ගල පිටිපස්සේ සඟවා තබන ලද පෙට්ටියක් සොයා ගත්තා. කිසි ම කෙනෙක් මේ පෙට්ටිය ගැන කිසි ම දෙයක් දැන ගෙන හිටියේ නැහැ. පෙට්ටිය ඇර බලන කොට ඈ විසින් මරා දමන ලද දරුවා ගේ කුණු පෙට්ටිය තුළ තිබුණා. එම පෙට්ටියේ ම තවත් දරුවන් දෙදෙනකු ගේ ඇටසැකිලි තිබුණා. ඈ කිව්වා ඒ ඇටසැකිලි උපන් හැටියේ ම මරන ලද දරුවන් දෙදෙනකු ගේ ඇටසැකිලි බව. ජූරි සභාවේ මහත්වරුනි, මේ ස්ත්‍රිය ඇගේ දරුවන්ට ආදරය ඇති මවක ලෙස පිළිගත හැකි ද? ඈ ඒ දරුවන් කුසේ දරා වැදූ බව ඇත්තයි. එහෙත් ඈ අම්මා කෙනකු ලෙස පිළිගත හැකි ද? ඇයට 'අම්මා' නමැති ශුද්ධ වූ වචනයෙන් කතා කිරීමට තමුන්නාන්සේලා හිතේ බියක් සැකයක් නැති ව ඉදිරිපත් වෙනවා ද? ජූරි සභාවේ මහත්වරුනි, අපි එඩිතර විය යුතුයි. වෙනෙකක් තබා නිර්භීත විය යුතුයි. මේ මොහොතේ දී එසේ ක්‍රියා කිරීම අපේ යුතු කමයි. 'ඔස්ට්‍රොවුව්ස්කි' නාටකයේ සිටින මොස්කව් පුර වෙළෙඳුන් ගේ භාර්යාවන් නොතේරෙන වචනවලට බිය වන්නාක් මෙන් අප ද සමහරක් වචන හා අදහස්වලට බිය විය නොයුතුයි. පසු ගිය අවුරුදු කීපය තුළ ඇති වූ දියුණුව අප කෙරෙහි ද බලපැවැත්වූ බව ඔප්පු කළ යුතුයි. කෙනෙක් දරුවන් ලැබූ පමණින් පියකු වන්නේ නැහැ. ඔහු දරුවන් ලබා තමන් ගේ යුතුකම් ඉටු කරන තෙක් පියකු නොවන බව අවංක ව කිය යුතුයි.

" 'පියා' කියන වචනයට තවත් තේරුමක් තියෙනවා. මගේ පියා භයානක සතෙක් වුවත්, දරුවන් ගේ සතුරකු වුවත්, ඔහු මා උත්පාදනය කළ නිසා ඔහුට මා 'පියා' යන වචනයෙන් ආමන්ත්‍රණය කළ යුතු ය කියා බල කර තිබෙනවා. මගේ ඥාන ශක්තියේ හැටියට මට එය පෙනෙන්නේ ගුඪ අර්ථයක් ගැබ් වූ වචනයක් හැටියටයි. මට එය පිළිගන්න බැහැ. පිළිගන්න පුළුවන් විචාර බුද්ධියෙන් නො වෙයි; පිළිගන්න

පුළුවන් භක්තියෙන් පමණයි. තවත් පැහැදිලි කොට කියනවා නම් ආගම් භක්තියෙන් පමණයි. අපට නොතේරෙන දේවල් බොහො ම තියෙනවා. අපි ඒවා පිළිගත්තේ ආගම බලකර සිටින නිසයි. එහෙනම් අපි ඒ වචනය සැබෑ ජීවිතයෙන් එදිනෙදා ජීවිතයෙන් ඈත් කොට තබමු. අප ගත කරන සැබෑ ජීවිතය සතු අයිතිවාසිකම් තියෙනවා. ඒ සමග අප මත විශාල වගකීමක් ද පැවරෙනවා. සැබෑ ජීවිතයේ අපි යහපත් මනුෂ්‍යයන් වෙන්නට නම්, නියම ක්‍රිස්තු භක්තිකයන් ලෙස ක්‍රියා කරන්නට නම්, උරගා පරීක්ෂා කරන ලද, අත්දැකීමෙන් හා තර්කයෙන් නිදොස් බව පිළිගත් අවබෝධය අනුව ක්‍රියා කළ යුතුයි. කොටින් කියතොත් අපි සිහිබුද්ධියෙන් කටයුතු කළ යුතුයි. සිහිනෙන් ක්‍රියා කරන්නවුන් මෙන් හෝ සිහි මූලාවෙන් සිටින්නවුන් මෙන් හෝ ක්‍රියා නොකළ යුතු යි. අපි කිසිවකුට වැරදි නොකළ යුතුයි, පීඩා නොකළ යුතුයි. කිසිවකු විනාශ නොකළ යුතුයි. අපි ආගමට එකඟ ව වැඩ කළා යයි කියන්න පුළුවන් එතකොටයි. සිහි බුද්ධියෙන් හා ඥානවන්ත ව ද වැඩ කළා යයි කියන්න පුළුවන් එතකොටයි.''

දේශකයා ගේ මුවෙන් මේ වචන පිටවෙනවාත් සමග ම උසාවියේ හැම පැත්තෙන් ම අත්පොළසන් හඬ නික්මිණි. එහෙත් දේශකයා අත වැනුවේ බාධාවක් නැති ව කතාව අවසන් කිරීමට ඉඩ දෙන ලෙස ඇයැද සිටින්නාක් මෙනි. එක් වර ම මිය පිම්බාක් මෙන් නිහඬ විය. දේශකයා දේශනය කර ගෙන ගියේ ය.

''අපේ දරුවන් වයසින් වැඩෙන විට, කල්පනා කරන්නට පටන් ගත් විට, මෙ වැනි ප්‍රශ්න ගැන කල්පනා නො කර සිටිවිය කියා තමුන්නාන්සේ ලා විශ්වාස කරනව ද? කවදාවත් විශ්වාස නො කර ඉන්න බැහැ. අප කවදාවත් ඔවුන් ගෙන් එ වැනි ආත්ම සංයමයක් බලාපොරොත්තු වෙන්න හොඳ නැහැ. නොභික්මුණු පියකු දකින තරුණයකු තුළ සිතට වද දෙන ප්‍රශ්න නිතැතින් ම ඇති වෙනවා. එ වැනි වේදනා සහිත සිති-විලි ඇති වෙන්නේ තමා ගේ පියා හිත මිත්‍රයන් ගේ උසස් ගති ගුණ ඇති පියවරුන් සමග සසඳා බලන විටයි. මීට දිය හැකි ලෝක සම්මත පිළිතුර නම් 'පියා නිසා අපි උපන්නෙමු. පියා ගේ ලෙයින් මසින් සෑදුණෙමු. ඒ නිසා පියාට ගරු කළ යුතුයි.' එතකොට තරුණයා නොකැමැත්තෙන් ම වාගේ මෙසේ කල්පනා කරන්න පුළුවනි. 'නමුත් පියා මා උත්පාදනය කරන විට මා ගැන කල්පනා කළා ද? මට ආදරය කළා ද?' ඔහු තවත්

දුරට කල්පනා කරනවා 'ඔහු මා උත්පාදනය කළේ මා වෙනුවෙන් ද? ඒ මොහොතේ දී ඔහු මා දැන සිටියේ නැහැ. මා ඇඳින සිටියේ නැහැ. මා ගැහැනියක් ද පිරිමියෙක් ද යන වගවත් දැන සිටියේ නැහැ. සමහර විට ඔහු රාගයෙන් අන්ධ වී සිටින්න ඇති. ඒ රාගය සුරාවෙන් ප්‍රාණවත් වී තිබෙන්න ඇති. සමහර විට ඔහු මට සුරාවට ගිජුකමක් දායාදය කොට දෙන්න ඇති. මා වෙනුවෙන් ඔහු කර ඇත්තේ එපමණයි.........එසේ නම් ඔහුට ආදරය කිරීමට, ගරු බුහුමන් දැක්වීමට මා බැඳී සිටින්නේ මන්ද? මා උත්පාදනය කොට ඊට පසු ව මුළු ජීවිතයට ම මා නොසලකා සිටිය නිසා ද?'

"සමහර විට මේ ප්‍රශ්න බොහො ම රළු පරුෂ කෲර ප්‍රශ්න ලෙස, තමුන්නාන්සේලාට පෙනෙන්න පුළුවනි. එහෙත් තරුණ සිතකින් ඇති කළ නොහැකි සංයමයක් බලාපොරොත්තු වෙන්න එපා. 'මනුෂ්‍ය ස්වභාවය දොරින් එළියට එළෙව්වොත් කවුළුවෙන් ආපසු ගෙට එනවා.' ඒ සේරට ම වඩා නොතේරෙන වචනවලට බය වෙන්න හොඳ නැහැ. අපි මේ ප්‍රශ්නය හොඳ සිහිකල්පනාවෙන් හා දයානුකම්පාවෙන් යුතු ව විසඳනවා මිස ගුඪ අදහස්වලට වහල් වී විසඳන්න හොඳ නැහැ. එහෙනම් කොහොම ද අපි මේ ප්‍රශ්නය විසඳන්නේ? මෙන්න මේ ක්‍රමයට විසඳන්න පුළුවනි. පුතා තාත්තා ඉදිරිපිට සිට 'මා පියාට ආදරය කළ යුත්තේ, ගෞරව කළ යුත්තේ, මොන කාරණාවක් නිසා ද? අසවල් කාරණාව නිසා මා පියාට ආදරය කළයුතු ය, ගෞරව කළයුතු ය කියා පෙන්නා දෙන්න.' යන ප්‍රශ්නය අහන්න පුළුවනි. එතකොට ඒ පියාට පුළුවනි පුතා ගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. අසවල් කාරණාව නිසා තමාට ආදරය කළයුතු ය, ගෞරව කළයුතු ය කියා පෙන්නා දෙන්න පුළුවන් නම් ඒ පිය පුතුන් අතර නියම සම්බන්ධයක් තියෙනවා. එය සිහි බුද්ධියෙන් යුතු ව, වගකීමක් ඇති ව, දයාව, කරුණාව, උඩ ඇතිවන ආදර ගෞරවයක් මිස ගුඪ, අවිචාර හැඟීම් උඩ ගොඩනැගුණු සම්බන්ධයක් නො වෙයි. පියාට පිළිතුරු දිය නො හැකි නම් පිය-පුත්‍ර සම්බන්ධය එ තැනින් අවසන් වෙනවා. එතකොට පියාට පියකු විසින් ලැබිය යුතු සැලකිලි ලැබෙන්නේ නැහැ සමහර විට පුතා ආගන්තුකයකුට සලකන්නාක් මෙන්, වෙනෙකක් තබා සතුරකුට සලකන්නාක් මෙන් පියාට සලකන්න පුළුවනි. ජූරි සභාවේ මහත්වරුනි, අපේ මේ අධිකරණය තර්කානුකූල අදහස් දරන, සත්‍යයට ගරු කරන, විද්‍යා පීඨයක් වියයුතුයි."

මෙහි දී මැඩ ගත නොහැකි උමතු ප්‍රීති ඝෝෂාවකින් කපිකායාට බාධා විය. එහි රැස් ව සිටි මුළු පිරිස ම නො ව ඉන් අඩකට වඩා ප්‍රීති ඝෝෂා කළහ. පියවරුන් හා මව්වරුන් ද අත්පොළසන් දුන්හ. කාන්තාවන් අසුන් ගෙන සිටි ගැලරියේ සිට කෑගෑමක් ඇසිණි. සමහරෙක් ලේන්සු ගෙන වැනූහ. ප්‍රධාන විනිශ්චයකාරතුමා මුළු වැර ම යොදා සීනුව නාද කෙළේ ය. මහජනයා ගේ හැසිරීමෙන් එතුමා නොසන්සුන් වූ බව පැහැදිලි ව පෙනිණි. එහෙත් මහජනයා ශාලාවෙන් පිටකරන බවට තර්ජනය නො කෙළේ ය. වෙනෙකක් තබා විනිශ්චයාසනය පිටි පසින් පනවන ලද විශේෂ අසුන්වල හුන්, පපුවේ පදක්කම් පැළඳගත් මහලු කුලවත්තු පවා අත්පොළසන් දී අනතුරු ව ලේන්සු ගෙන වැනූහ. ආයේත් මහජනයා නිහඬ වූ හ. එහෙත් යළි ඝෝෂා කළහොත් ශාලාවෙන් පිට කරන බවට විනිශ්චයකාරතුමා පරණ තර්ජනය ආයේත් අලුත් කළ පසු ජයග්‍රහණයෙන් උදම් වූ නීතිඥයා දේශනය කරගෙන ගියේ ය.

"ජූරි සභාවේ මහත්වරුනි, සිරකරුවා වැට උඩින් පැන ගෙට ඇතුළු වී අන්තිමේ දී තමා උත්පාදනය කළ තමා ගේ සතුරා වූ, වදකයා වූ පියා සමග මුහුණට මුහුණලා සිටි ඒ භයානක රාත්‍රිය තමුන්නාන්සේලාට මතක ඇති සිරකරුවා ගෙට කඩාවැදුණේ සොරකම් කිරීමට නොවන බව මම යළිත් අවධාරණයෙන් බල කර කියනවා. මා කලින් ඔප්පු කළාක් මෙන් සිරකරුවාට විරුද්ධ ව සොරකම් කිරීම ගැන ගෙනෙන ලද චෝදනාව හාස්‍ය ජනක මෝඩ කතාවක්. නැහැ, නැහැ, සිරකරුවා ගෙට කඩාවැදුණේ තාත්තා මැරීමට නො වෙයි. ඔහු තාත්තා මැරීමේ අදහසින් ගියා නම් නොකල්පනාවෙන් ම ගෙන ගිය පිත්තල මෝල් ගස නො වෙයි, ඊට වඩා හොඳ ආයුධයක් ගෙන යනවා ඇති. පිත්තල මෝල් ගස ගෙන ගියේ මොනවට ද කියා ඔහු දන්නේ නැහැ. ඔහු කවුළුවට තට්ටු කරලා තාත්තා මුළා කොට ගෙට ඇතුළු වුණා යයි කියමු. සිරකරුවා ගෙට ඇතුළු වූ කතාව මොහොතකටවත් විශ්වාස නොකරන බව මා කලින් කිව්වා. කමක් නැහැ, දැනට එය ඇත්ත හැටියට අපි පිළිගනිමු. ජූරි සභාවේ මහත්වරුනි, ගේ ඇතුළේ සිටියේ තාත්තා නො ව සාමාන්‍ය සතුරෙක් නම් සිරකරුවා ගේ ඇතුළේ හැම තැන ම සොයා බලා තමා පතන තරුණිය එහි නැති බව සැක හැර දැන ගත් පසු සතුරාට කිසි ම අනතුරක් නො කොට වහා පැන යන බව මට හැම ශුද්ධ වූ වස්තුවක් ගැන ම දිවුරා කියන්න පුළුවනි. සමහර විට ඔහු ගේ ඇතුළේ සිටි සතුරාට පහරක් ගහන්න පුළුවනි. තල්ලු කර

දමන්න පුළුවනි. ඊට වඩා වෙන කිසි ම හිරිහැරයක් කරන්නේ නැහැ. එ තරම් වේලාවක් පමාවීමට ඔහුට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඔහුට උවමනා කළේ තරුණිය සිටින තැන දැන ගැනීමට පමණයි එහෙත් මේ තැනැත්තා ඔහු ගේ පියා නම්, ළමා කාලයේ සිට වෛර කළ තැනැත්තා නම්, ඔහු ගේ සතුරා නම්, වදකයා නම්, අස්වාභාවික විරුද්ධවාදියා නම්, හැම විපතකට ම හේතු වූ තැනැත්තා නම්, ඒ මොහොතේ දී ඔහු තුළ මැඩ ගත නො හැකි, දැඩි කෝපයක් ඇති වෙනවා. ඒ කෝපය නිසා සිහිය සම්පූර්ණයෙන් ම අවුල් වෙනවා. කල්පනා කිරීමට කාලයක් ලැබෙන්නේ නැහැ. ඒ ක්ෂණයෙන් ම ඇති වන පෙලඹීමක්. එය සිහි විකාරයෙන් ඇති වන පෙලඹීමක්. එහෙත් එය ස්වාභාවික පෙලඹීමක්. අනෙක් හැම පෙලඹීමක් මෙන් ම එය ද සදාකාලික නීති කෙලෙසීම නිසා පළි ගැනීමේ චේතනාව මුල් කොට නිතැතින් ම ඇති වන, මැඩ ගත නොහැකි පෙලඹීමක්. එහෙත් සිරකරුවා පියා නොමැරූ බව මම සවිර ව ම කියා සිටිනවා. ඒ මොහොතේ දී ඇති වූ දැඩි පිළිකුල නිසා අතේ තිබුණු පිත්තල මෝලෙන් දමා ගසන්න ඇති. එහෙත් පියා මැරීමේ අදහසින් ගැසුවේ නැහැ. පහර වැදී පියා මැරේ ය කියා හිතුවේ නැහැ. ඒ ආයුධය අතේ නොතිබුණා නම් අතින් පයින් පහර දෙනවා ඇති. ආපසු දුවන විට පහර කෑ මිනිහා මලා ද නැද්දැයි ඔහු දැන සිටියේ නැහැ. එ වැනි මරණයක් මිනීමැරුමක් ලෙස පිළිගන්න බැහැ. එ වැනි පියකු මරා දැමීම පිතෘ-ඝාතනයක් ලෙස පිළිගන්න බැහැ. එය පිතෘඝාතනයක් ලෙස සලකන්නේ අගතියට ගිය අය විතරයි එහෙත් එ වැනි මිනීමැරුමක් සැබැවින් ම සිදුවුණා ද? ජූරි සභාවේ මහත්වරුනි, මා ආයෙත් වරක් තමුන්නාන්සේලාට මගේ හද පත්ලෙන් ම කියා සිටිනවා, අපි මේ සිරකරුවා වරදට අසුකොට දඬුවම් කළොත් ඔහු තමාට ම මෙසේ කියා ගන්න පුළුවනි. 'මේ මිනිස්සු මගේ ඇතිදැඩි වීමට, මගේ දියුණුවට, මගේ අධ්‍යා-පනයට කිසි ම දෙයක් කරලා නැහැ. මා යහපත් මිනිසකු කිරීමට කිසි ම වෑයමක් කළේ නැහැ. මේ මිනිස්සු මට කන්න බොන්න දුන්නේ නැහැ. හිරගෙදර සිටින විට මා බලන්න ආවේ නැහැ. නමුත් බරපතල වැඩ ඇති ව මා හිරගෙදරට යවා තිබෙනවා. දැන් මා නිදහස්, මා ඔවුන්ට ණයගැති නැහැ. ඔවුන් මට නපුරු කම් කළා මාත් ඔවුන්ට නපුරු කම් කරනවා.' වරදකරු කිරීමෙන් සිරකරුවා ගේ තත්ත්වය තවතවත් නරක් කරනවා. තමා ගේ සිතට වද දෙන 'මම

වරදකරුවෙක්මි' යන අදහස නිසා ඔහු විනාශ වෙනවා. පියා මැරීම ගැන ඔහු කවදාවත් පසුතැවෙන්නේ නැහැ. තව තවත් සාප කරාවි. ඔහු යහපත් මිනිසකු කිරීමට තිබෙන අවස්ථාව නැති වී යනවා. ඔහු මිය යන තෙක් මෝහයෙන් අන්ධ වූ, නපුරුකමින් විනාශ වූ, ජීවිතයක් ගත කරනවා ඇති.

"සිතින් සිතා ගත හැකි ඉතා ම භයානක දඬුවමකින් ඔහුට දරුණු ලෙස දඬුවම් කොට, ඒ සමඟ ඔහු නිදහස් කොට, ඔහු ගේ ආත්මය සඳහට ම ප්‍රකෘතිමත් කළ හැකි යයි තමුන්නාන්සේලා කල්පනා කරනව ද? එසේ නම් ඔබ ගේ දයානුකම්පාවෙන් ඔහු සම්පූර්ණයෙන් ම වසා දමන්න. එතකොට ඔහු ගේ ආත්මය වේදනාවෙන් මිරිකෙන හැටි, තැති ගෙන වෙව්ලන හැටි තමුන්නාන්සේලාට අහන්න පුළුවනි, දකින්න පුළුවනි. 'මට දක්වන මේ දයානුකම්පාව ඉවසා සිටින්නේ කොහොම ද? මෙ තරම් ආදර සැලකිලි ලැබීමට තරම් මා සුදුස්සෙක් ද?'යි ඔහු තමාගෙන් ම ප්‍රශ්න කරනවා ඇති.

"මම මේ සිරකරුවා හොඳට අඳුනනවා. ඔහු බොහො ම චණ්ඩයි, ඒ වුණත් බොහො ම උදාරයි. බොහො ම ත්‍යාගශීලියි. ජූරි සභාවේ මහත්වරුනි, තමුන්නාන්සේලා ගේ දයානුකම්පාවට සිරකරුවා සිරස නමා ආචාර කරනවා ඇති. දයානුකම්පාවෙන් පිරි ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් සඳහා ඔහු තුළ විශාල පිපාසයක් තියෙනවා. එම දයානුකම්පාව ගිනිජාලාවක් මෙන් නැඟ සඳහට ම බුරබුරා දූල් වෙනවා ඇති. පටු කල්පනාවෙන් යුතු ව මුළු ලොවට ම දෙස් කියන අය සිටිනවා, එහෙත් ඔවුන්ට අනුකම්පා කරන්න, ප්‍රේම කරන්න, එවිට ඔවුන් අතීතයේ දී කළ පාප ක්‍රියාවලට සාප කරනවා ඇති. යහපත් මනුෂ්‍යයන් වීමට අවශ්‍ය උසස් ගතිගුණ ඔවුන් තුළ බොහො ම තියෙනවා. ඔවුන් ගේ හදවත් ප්‍රීතියෙන් විකසිත වී, දෙවියන් තුළ දයානුකම්පාවත්, මනුෂ්‍යයන් තුළ යුක්ති ධර්මයත්, යහපත් ගතිගුණත් තිබෙන බව පිළිගන්නවා ඇති. එ වැනි තැනැත්තා භීතියෙන් තැති ගන්නවා ඇති. එ තැන් සිට ඔහු තමා පිට පැටවී ඇති විශාල වගකීමෙන් හා පසුතැවිල්ලෙන් මිරිකෙනවා ඇති. එතකොට ඔහු කවදාවත් 'මා නිදහස්' යයි කියන්නේ නැහැ. ඒ වෙනුවට 'මම මනුෂ්‍ය වර්ගයා ඉදිරිපිට වරදකරුවෙක්මි. නුසුදුස්සෙක්මි'යි කියනවා ඇති. පශ්චාත්තාපයෙන් හා දුඃඛ ශෝකයෙන් හටගත් කඳුළින් හා මෘදු හැඟීමෙන් යුතු ව 'අනෙක් මිනිසුන් මට වඩා යහපත් ය. ඔවුන් මා විනාශ කරනවා වෙනුවට මා බේරා ගැනීමට වෑයම් කළා' යයි කියනවා ඇති. නියම

සාක්ෂියක් ලෙස පිළිගත හැකි කිසිවක් ඉදිරිපත් කොට නැති නිසා 'සිරකරුවා වරද කරුවෙක්' යයි කීම භයානකයි. ඒ නිසා සිරකරුවාට දයානුකම්පාවෙන් සැලකීම බොහො ම පහසු කටයුත්තක්.

''එක අහිංසක මිනිහකුට දඬුවම් කරනවට වඩා වැරදි-කාරයන් දහ දෙනෙක් නිදහස් කොට යැවීම යහපත් ක්‍රියාවකි. අපේ රටේ ශ්‍රේෂ්ඨ ඉතිහාසය තුළින් පසු ගිය ශතවර්ෂයේ සිට පැමිණෙන ඒ ප්‍රතාපවත් කටහඬ තමුන්නාන්සේලාට ඇහෙන-වා ද? අපරාධ කරුවන්ට දඬුවම් කිරීමට පමණක් නො ව ඔවුන් ගේ ගැලවිල්ල ලබා දීමට ද රුසියන් ධර්මාධිකරණය පිහිටවන බව තමුන්නාන්සේලාට මතක් කරදීම මා වැනි නො වැදගත් පුද්ගලයකුට තරම් නො වෙයි. නීතිය අකුරට ම පිළිපැද දඬුවම් පැමිණවීමේ කටයුත්ත අපි අනෙක් ජාතීන්ට භාර දෙමු. අපි නීතියේ ආත්මයට හා අර්ථයට ගරුකොට අපරාධකාරයන් ගේ ගැලවිල්ල හා ගුණ වගාව ඇති කිරීමට බලාපොරොත්තු වෙමු. මෙය සත්‍යය නම්; අපේ රටත්, අපේ ධර්මාධිකරණයත් සැබැවින් ම එවැනි දෙයක් නම්; අපේ රට යහතින් ම ඉදිරියට ගමන් කරත් වා! හැම ජාතියක් ම ඇත් වී පිළිකුලින් බලා සිටින, උමතුවෙන් දුවන, ට්‍රොයිකාවලින් අප නැති ගන්වන්න වෑයම් කරන්න එපා. රුසියාව නමැති ප්‍රතාපවත් රථය උමතුවෙන් දුවන ට්‍රොයිකාවක් නො වෙයි. ඒ රථය බොහො ම සන්සුන් ව හා මහානුභාවයෙන් ද යුතු ව දිනුම් කණුවට පැමිණෙනවා ඇති. මේ සිරකරුවා ගේ දෛවය රැඳී ඇත්තේ තමුන්නාන්සේලා ගේ අතෙහිය. එ පමණක් ද නො ව රුසියන් ධර්මාධිකරණයේ දෛවය ද රැඳී ඇත්තේ තමුන්නාන්සේලා ගේ අතෙහිය. තමුන්නාන්සේලා එය රැක ගනීවි. අපකීර්තියෙන් වළකා ගනීවි. අපේ ධර්මාධිකරණය ආරක්ෂා කිරීමට ශක්තිය ඇති මිනිසුන් සිටින බව, අපේ ධර්මාධිකරණය යහපත් මිනිසුන් අතේ තිබෙන බව, ඔප්පු කොට පෙන්නාවි.''

දාහතර වන පරිච්ඡේදය

නඩු තීන්දුව

විත්තියේ නීතිඥයා දේශනය අවසන් කළේ මේ විදියට ය. මහජනයා ගේ බලවත් උද්යෝගය නො වැළැක්විය හැකි කුණාටුවක් මෙන් එක්වර ම නැඟ ආවේ ය. එය වැළැක්විය හැකි දෙයක් නො වේ. කාන්තාවෝ ඇඬූ හ. පිරිමින්ගෙන් බොහෝ දෙනෙක් ද ඇඬූ හ. වෙනෙකක් තබා ඉතා වැදගත් උසස් පුද්ගලයෝ දෙදෙනෙක් ද කඳුළු සැලූ හ. මෙම සෝභාවට යටත් වූ ප්‍රධාන විනිශ්චයකාර තුමා ද මහජනයා නිහඬ කිරීම සඳහා සීනුව ගැසීම කල් දැම්මේ ය. පසු කාලයේ දී කාන්තාවන් විස්තර කළාක් මෙන් මෙ වැනි උද්යෝගයක් මැඩ පැවැත්වීම ශුද්ධ වූ දෙයක් මැඩ පැවැත්වීම වැන්න. මේ උද්යෝගය නිසා දේශකයා ගේ හැඟීම් ද අවදි විය.

විත්තියේ දේශනයේ ඇතැම් කරුණු ගැන විරුද්ධත්වය ප්‍රකාශ කිරීම පිණිස පැමිණිල්ලේ නීතිඥයා වන දණ්ඩනායකයා නැඟී සිටියේ මේ මොහොතේ දී ය. මහජනයා ඔහු දෙස කෝපයෙන් බැලූ හ. ‘මොකක් ද මේකේ තේරුම? මිනිහා භය නැති ව කතා කරන්න ලෑස්ති වෙනව ද?’යි කියමින් කාන්තාවෝ එකිනෙකා සමඟ දෙඩන්නට වූ හ. තමා ගේ බිරිය ඇතුළු ව කාන්තා සනුහරේ ම විරුද්ධ වුවත් ඒ මොහොතේ දී දණ්ඩනායකයා නතර නො වනු ඇත. ඔහු සුදු මැලි විය. උද්වේගයෙන් වෙවුලන්නට විය. මුල දී ඔහු කී දෙය කිසිවකුට නො තේරිණි. ඔහු අමාරුවෙන් හුස්ම ගත්තේ ය. කතාව පැහැදිලි නො වී ය. එහෙත් ඔහු ඉක්මනින් ම සිහිවිලි එක් තැන් කොට පැහැදිලි ව කතා කරන්නට විය. ඔහු ගේ දෙ වන කතාවෙන් කොටස් සවල්පයක් පමණක් මෙහි ලා මම සඳහන් කරමි.

“.........මා ප්‍රබන්ධ කතාවක් නිර්මාණය කළා ය කියා විත්තියේ නීතිඥ මහතා මට දෙස් කිව්වා. මා අහන්න කැමැතියි විත්තියේ නීතිඥ මහතා කළේ කුමක් ද කියා. එතුමා කළෙත් ප්‍රබන්ධ කතාවක් නිර්මාණය කිරීම නො වේ ද? අඩුපාඩුවකට තියෙන්නේ කාව්‍යයක් පමණයි. මහලු කරමසෝ

ඔහු ගේ අතියම් බිරිය බලාපොරොත්තු ව සිටින අතර ලියුම් කවරය ගෙන ඉරා බිම දැම්මා. වෙනෙකක් තබා ඔහු මේ පුදුම ක්‍රියාව කරන අතර කියාපු දෙයත් විත්තියේ නීතිඥ මහතා අපට කිව්වා. ඉතින් මේක ප්‍රබන්ධ කතාවක් නො වේ ද? මහලු කරමසෝ ලියුම් කවරය ඉරා මුදල් එළියට ගත්ත බව ඔප්පු කිරීමට මගේ උගත් මිත්‍රයා ඉදිරිපත් කළ සාක්ෂි මොනවා ද? ඒ වෙලාවේ කරමසෝ කියාපු දෙය කවුද අහගෙන හිටියේ? දුර්වල හිතක් ඇති මෝඩයකු වන පැවල් මහා වීරයකු වී, තමා ගේ පහත් ජන්මයෙන් කිපී, සමාජයෙන් පළි ගන්නට පටන් ගත්තා. මේක බයිරන් මහා කවියා ගේ සම්ප්‍රදාය අනුව නිර්මාණය කරන ලද කාව්‍යයක් නො වේ ද? ගෙට කඩා වැදුණු පුතා තාත්තා නො මරා මැරීම ගද්‍ය කාව්‍යයකුත් නො ව පද්‍ය කාව්‍යයකුත් නො ව යක්ෂණියට පවා විසඳිය නො හැකි යක්ෂණිය ගේ ප්‍රහේලිකාවකට සමානයි. සිරකරුවා තාත්තා මැරුවා නම් මැරූ හැටියට පිළිගත යුතුයි. නො මරා මැරුවා යි කියන කතාවේ තේරුම කුමක් ද? මේ කතාවේ අගමුල තේරෙන්නේ කාට ද? ඊළඟට අපේ ධර්මාධිකරණය සත්‍යය මත ගොඩනැගුණු, ප්‍රගතිශීලී අදහස් දරන ධර්මාධිකරණයක් බව අපට බොහො ම ගරු ගම්භීර ලෙස පෙන්නා දුන්නා. පියා මැරීම පිතෘඝාතනය ලෙස පිළිගන්නේ අවිචාර හැඟීමෙන් බව, සත්‍යය මත ගොඩනැගුණු ප්‍රගතිශීලී අදහස් දරන මේ ධර්මාධිකරණයේ සිට ගරු ගම්භීර දිවුරුමකින් ශක්තිමත් වූ සිද්ධාන්තයක් ලෙස අපට අහන්න ලැබුණා. පිතෘඝාතනය අගතියට ගිය මතයක් නම් 'මා තුඹට ආදරය කළ යුත්තේ, ගෞරව කළ යුත්තේ මන්ද?' කියා හැම දරුවෙක් ම ඔහු ගේ පියාගෙන් අහන්න ගියොත් අපේ සමාජයට මොකද වෙන්නේ? මාපිය දූ දරුවන් සම්බන්ධයට මොකද වෙන්නේ? පිතෘඝාතනය මොස්කව් නුවර වෙළෙඳුන් ගේ භාර්යාවන් සිතේ මවා ගත්ත අවතාරයක් ලු. රුසියාවේ යුක්ති ධර්මයේ අනාගතය හා ඉරණම ආරක්ෂා කරනා, අගය කියා නිම කළ නො හැකි වූ, පරිශුද්ධ වූ ප්‍රඥප්තිය, කිසියම් බලාපොරොත්තුවක් ඉටුකර ගැනීමේ අදහසින්, අයුක්තිය යුක්තිය ලෙස පිළිගැන්වීමේ අදහසින්, වැරදි ලෙස විහිළුවක් කොට පෙන්නා දී තියෙනවා. 'සිරකරුවා දයානුකම්පාවෙන් මිරිකන්න ය' කියා විත්තියේ නීතිඥ මහතා අපෙන් ඉල්ලා සිටියා. සිරකරුවාට උවමනා කර තියෙන්නේ එ වැනි දෙයක් තමයි. එතකොට අපට හෙට බලාගන්න පුළුවනි දයානුකම්පා- වෙන් ඔහු කො තරම් මිරිකී තියෙනව ද කියා. සිරකරුවා

නිදහස් කරන්න ය කියා විත්තියේ නීතිඥ මහතා කළේ බොහො ම නිරහංකාර ඉල්ලීමක් නො වේ ද? ඇයි මේ පිතෘඝාතකයා ගේ වීර ක්‍රියාව අනාගත පරපුර අතර අමරණීයත්වයට පැමිණවීම පිණිස පිතෘඝාතකයා නමින් අරමුදලක් ආරම්භ නො කරන්නේ? වෙනෙකක් තබා අපේ ආගමත්, ක්‍රිස්තුන් වහන්සේ ගේ දේශනාවත් සංශොධනය කළා. ආගම ගුප්ත වාදයක් ලු. උරගා බලන ලද, අත්දැකීමෙන් හා තර්කයෙන් නිදොස් ලෙස පිළිගත් ආගම පමණක් ලු නියම ආගම. ඉතින් ඔවුන් මේ විදියට වැරදි ක්‍රමයකට අපට ක්‍රිස්තුන් වහන්සේ මවා පෙන්නීමට වෑයම් කරනවා. 'ඔබ යම්කිසි ක්‍රමයකට අන්‍යයන්ට සලකන්නේ ද ඒ ක්‍රමයට ම ඔබට ද සැලකුම් ලැබෙන්නේ ය' කියා විත්තියේ නීතිඥ මහතා කියනවා. ඒ වුණත් ආයේත් ඒ එක්ක ම අපට සලකන විදියට ම අන්‍යයන්ට ද සලකන්න ය කියා ක්‍රිස්තුන් වහන්සේ දේශනා කළ බවත් කියනවා. කොහි සිට ද කියන්නේ? සත්‍යය හා ප්‍රගතිශීලී අදහස් මත ගොඩ නැඟුණු මෙම ධර්මාධිකරණයේ සිටත්, අපි බයිබලය පෙරළා බලන්නේ, අසා සිටින්නන් තුළ අපට අවශ්‍ය හැඟීම් අවදිකොට, අපේ අදහස් මුද්‍රත් පමුණුවා ගැනීම පිණිසයි; අමුතු ම නිර්මාණයක් ලෙස පිළිගත හැකි බයිබලය පිළිබඳ අපේ ගැඹුරු දැනුම ප්‍රදර්ශනය කරමින් කතා පැවැත්වීමට අවශ්‍ය වූ විට පමණයි. නමුත් අනුගමනය කරන ලෙස අපට ක්‍රිස්තුන් වහන්සේ නියම කොට ඇත්තේ ඊට ඉඳුරා වෙනස් දෙයක්. මේ නපුරු ලෝකය අසවල් දෙය කරන නිසා ඒ දෙය ගැන පරිස්සම් වන ලෙස ක්‍රිස්තුන් වහන්සේ අපට කියා දී තියෙනවා. අප කළ යුත්තේ අපේ කම්මුලට ගැසූ තැනැත්තාට සමා වී අනෙක් කම්මුල පෙන්නීම මිස අපට සැලකූ ක්‍රමයට ඔහුට සැලැකීම නො වේ. ක්‍රිස්තුන් වහන්සේ අපට උගන්නා තියෙන්නේ මෙ වැනි ධර්මයක්. නැති ව පියා නොමරන ලෙස දරුවාට අවවාද කිරීම අවිචාරයෙන් කරන අනුශාසනාවක් හැටියට පෙන්නා දීම නො වෙයි. සත්‍යය හා ප්‍රගතිශීලී අදහස් මත ගොඩ නැඟුණු මේ ධර්මාධිකරණයේ සිට ක්‍රිස්තුන් වහන්සේ ගේ ධර්මය සංශෝධනය කිරීමට අපි අදහස් කරන්නේ නැහැ. සත්‍යලබ්ධික මුළු මහත් රුසියාව එතුමාට කියන්නේ 'ස්වාමි-දරුවාණන් වන ඔබ තුමා අපේ දෙවියන් වහන්සේ ය' කියා යි. නමුත් අපේ උගත් නීතිඥ මහතා ක්‍රිස්තුන් වහන්සේ ඇම්තීමට අදහස් කරන්නේ 'කුරුසයේ ඇණ ගසන ලද මනුෂ්‍ය වර්ගයා ගේ පෙම්වතා' යන වචනවලිනුයි."

මෙහි දී ප්‍රධාන විනිශ්චයකාරතුමා, අධික උද්‍යෝගයකින් කතා කළ පැමිණිල්ලේ නීතිඥයාට බාධා කරමින් (සාමාන්‍යයෙන් ප්‍රධාන විනිශ්චයකාරයන් ගේ සිරිත අනුව) නුවූවමනා දේවල් අතිශයෝක්තියෙන් වර්ණනා නො කොට, නඩුවට අදාල වූ කරුණු ගැන පමණක් කතා කරන ලෙස නියම කෙළේ ය. නීතිඥයා ගේ කතාව අසා මහාජනයා ද නොසන්සුන් වූහ. අසුන් මත ඒ මේ අතට ඇඹෙරෙන්නට වූ ඔවුහු කතාවට විරුද්ධ ව නොයෙක් දේ කියන්නට වූ හ. පැමිණිල්ලේ නීතිඥයා ගේ කතාවට පිළිතුරු දීම අවශ්‍ය යැයි විත්තියේ නීතිඥයා කල්පනා නොකෙළේ ය. කථිකාසනයට නැඟ ගත් හෙතෙම ළය මත දෑත තබා කෝපයෙන් හා පිළිකුලෙන් ද යුත් වචන කීපයක් කීවේ ය. 'ප්‍රබන්ධ කතා' 'මානස විද්‍යාව' ආදිය ගැන ඇනුම් පද ස්වරූපයෙන් වචන කීපයක් පැවැසූ හෙතෙම සුදුසු තැන් බලා 'සුරගුරුතුමෙනි, ඔබතුමා කෝපයෙන් සිටින සේක. එ හෙයින් ඔබතුමා ගේ අදහස් ද අසත්‍ය ය' ආදී පාඨ ගෙන හැර පෑවේය. පැමිණිල්ලේ නීතිඥ මහතා හා සුරගුරු අතරේ කිසි ම සබඳකමක් නැති හෙයින් විත්තියේ නීතිඥයා ගේ කතාව අසා මහජනයා මහ හඬින් සිනාසුණහ. පියා මරන ලෙස බාල පරපුරට අනුශාසනා කළේ යයි කියමින් තමාට එල්ල කරන ලද චෝදනාව ගැන සඳහන් කළ නීතිඥයා තමා එම චෝදනාවට පිළිතුරු දීමට පවා අදහස් නොකරන බව අහංකාර බවක් දක්වා කී ය. ආගමට පටහැනි වූ දේවල් කීම ගැන තමාට කළ චෝදනාව පෞද්ගලික දෝෂාරෝපනයක් ලෙස පිළිගත් නීතිඥයා 'කීකරු පුරවැසියකු' වූ තමාට ඉන් හානියක් වන බව පවසා මෙම ධර්මාධිකරණයේ දී වත් මෙ වැනි දෝෂාරෝපනවලින් තමාට ආරක්ෂාවක් ලැබෙනවා ඇතැයි තමා කල්පනා කරන බව පැවසුවේ ය. මෙම ප්‍රකාශයට බාධා කළ ප්‍රධාන විනිශ්චයකාර තුමාට හිස නමා ආචාර කළ නීතිඥයා, එම අදහස නිවැරැදි බව පිළිගනිමින් මහජනයා අතරේ කසුකුසුවක් පවතින අතර ආපසු ගොස් හිඳගත්තේ ය. අපේ කාන්තාවන් ගේ අදහසේ හැටියට පැමිණිල්ලේ නීතිඥයා හෙවත් දණ්ඩනායකයා සදහට ම පරාජය විය.

අනතුරු ව සිරකරුවා දෙසට හැරුණු ප්‍රධාන විනිශ්චයකාර තුමා කිය යුතු දෙයක් තිබේ දැයි ඇසුවේ ය. සිරකරුවා අසුනෙන් නැඟී සිටියේ ය. එහෙත් ඔහු වඩා කතා නො කෙළේ ය. ඔහු සිතින් කයින් විඩා වැටී සිටියේ ය. උදේ උසාවියට පැමිණෙන විට ඔහු තුළ දකින්නට තිබුණු ආත්ම ශක්තිය හා නිදහස් බව සම්පූර්ණයෙන් ම අතුරුදහන් විය. මෙතෙක් තමා තේරුම්

නොගත් ඉතා වැදගත් දෙයක් එදින උසාවියේ දී උගත් බවත්, මුළු ජීවිතයට ම අමතක නොවන අත්දැකීමක් ලැබූ බවත් ඔහුට පෙනී ගියේ ය. ඔහු ගේ කටහඬ දුබල විය ඔහු පෙර මෙන් කෑගා කතා නො කෙළේ ය. ඔහු ගේ වචනවල යටත් වීමක, පරාජයක, ගැඹුරු අවබෝධයක සවරයක් දකින්නට තිබිණි.

"ජූරි සභාවේ මහත්වරුනි, මා මොනවා කියන්න ද? මගේ තීන්දුව දෙන මොහොත දැන් පැමිණ තියෙනවා. දෙවියන් ගේ අතේ පහස මට දැනෙනවා. අනාචාරයේ හැසුරුණු මිනිහකු ගේ අවසානය පැමිණ තියෙනවා. ඒ වුණත් මගේ තාත්තා ගේ මරණයට මා වැරැදිකාරයකු නොවන බව දෙවියන් ඉදිරිපිට සිට කියනවා. මා තාත්තා නොමැරූ බව අන්තිම වරට මා ආයේත් කියනවා. මා නොමඟ ගිය මිනිහෙක්. එහෙත් මා යහපතට ගරු කළා. යහපත් මිනිහකු වීමට හැම මොහොතක් පාසා ම මා තුළ ලොකු ආශාවක් තියෙනවා. එහෙත් මම චණ්ඩ වන සතකු වගේ ජීවත් වුණා. පැමිණිල්ලේ නීතිඥ මහතාට මම ස්තුති වන්ත වෙනවා. එතුමා මා ගැන, මා නොදන්නා බොහොම දේ කිව්වා. නමුත් මා තාත්තා මැරුවා යි කියා එතුමා කළ චෝදනාවේ කිසි ම සත්‍යයක් නැහැ. එතුමා එ තැන දී වරද්ද ගත්තා. මා වෙනුවෙන් කතා කළ මගේ නීතිඥ මහතාටත් මා ස්තුති වන්ත වෙනවා. එතුමා ගේ කතාව අසා සිටින විට මට ඇඬුණා නමුත් මා තාත්තා මැරුවා යයි කීම වැරැදියි. එතුමා ඒ විදියට මොහොතකට වත් කල්පනා කිරීම වැරැදියි. දොස්තරවරුන් ගේ සාක්ෂි මා විශ්වාස කරන්නේ නැහැ. මගේ සිහිය නරක් වෙලා නැහැ. ඒ වුණත් මගේ හිතේ විශාල ශෝකයක් තියෙනවා. මා නිදහස් කළොත්, මට ජීවිත දානය දුන්නොත්, මම තමුන්නාන්සේලා වෙනුවෙන් යාච්ඤා කරන්නම්. මා වැරැදිකාරයා කළොත් මම යහපත් මිනිහෙක් වෙන්නම්. සියලු ම දුශ්චරිත අත් හරින බව දෙවියන් ඉදිරිපිට දිව්රා කියන්නම්. මා වැරැදි කාරයෙක් කළොත් මම මගේ කඩුව ගෙන හිස උඩින් කඩා කැලි සිඹින්නම්. මා නිදහස් කරන්න. මා තුළ සිටින දෙවියන් සොරා ගන්න එපා. මගේ හැටි මම හොඳට දන්නවා. මම දෙවියන්ට විරුද්ධ ව කැරලි ගසනවා. මගේ හිතේ විශාල ශෝකයක් තියෙනවා. ජූරි සභාවේ මහත්වරුනි............... මා නිදහස් කරන්න."

ඔහු අසුන මත ඇද වැටෙන්නාක් මෙන් හිඳ ගත්තේ ය. ඔහු ගොළු විය. ඔහු අන්තිම වචන ස්වල්පය කීවේ ඉතා

අමාරුවෙති. අනතුරු ව ජූරි සභාවට පිළිවෙළින් ප්‍රශ්න ඉදිරිපත් කරන්නට වූ රජතුත් කට්ටුව ඒ ප්‍රශ්නවලට සංක්ෂෙපයෙන් පිළිතුරු සපයන ලෙස දෙපක්ෂයේ නීතිඥයන්ට අවසර දුන්නේ ය. එහෙත් ඒ කිසිවක් විස්තර කිරීමට මම අදහස් නො කරමි. අන්තිමේ දී ජූරි සභාව උපදෙස් ලැබීම පිණිස නැඟී සිටියේ ය. විඩාපත් වී සිටි ප්‍රධාන විනිශ්චයකාරතුමා ජූරි සභාව අමතා කළ දෙසුම එ තරම් ප්‍රාණවත් නො වී ය. "බොහො ම අපක්ෂපාත වන්න. විත්තියේ නීතිඥ මහතා ගේ ව්‍යක්ත කතාව සිතේ බලපවත්වන්න දෙන්න එපා. එහෙත් ඒ මහතා ඉදිරිපත් කළ කරුණු ගැන හොඳ හැටි කල්පනා කරල බලන්න. තමුන්-නාන්සේලා මත විශාල වගකීමක් තිබෙන බව සිහි තබා ගන්න........." මේ ආදී වශයෙන් ප්‍රධාන විනිශ්චයකාරතුමා ස්වකීය දේශනය කරගෙන ගියේ ය.

ජූරි සභාව නික්ම ගිය පසු ටික වේලාවකට උසාවියේ වැඩ කල් දමන ලදි. දූත් මිනිසුන්ට මඳක් ඇවිද, මෙතෙක් වේලා හිරිවැටී තිබුණු අත්පා දිගහැර ගත හැකි ය මෙතෙක් වේලා සිතේ රැස් කරගෙන සිටි අදහස් හෙළි කළ හැකි ය. අවන් හලට ගොස් කෑබී ගත සිත යළි ප්‍රාණවත් කරගත හැකි ය. රෑ බෝ විය. වේලාව රාත්‍රි එකට පමණ ඇත. එහෙත් කිසිවෙක් ගෙදර යාමට අදහස් නොකළහ. කො තරම් වෙහෙස වුවත් විවේක ගැනීමට අදහස් නොකළහ. කවුරුනුත් නඩු තීන්දුව දෙනතෙක් බලා සිටියේ ශෝකයෙන් පිරි හදවතකින් යුතු ව ය. එහෙත් කාන්තා පක්ෂය ගැන එ වැනි දෙයක් කිව නොහැකි ය. ඔවුන් තුළ පැවැතුණේ උමතු නොසන්සුන් කමක් පමණි. ඔවුන් ගේ සිතේ කිසි ම දුකක් ඇති නො වූයේ සිරිකරුවා නිසැක ව ම නිදහස් වන බව විශ්වාස කළ නිසයි. සාමාන්‍ය උද්යෝගයකින් යුතු ව ඒ තීරණාත්මක මොහොත පැමිණෙන තෙක් කවුරුත් සූදානම් වූ හ. පිරිමින් අතර ද සිරකරුවා නිදහස් වෙතියි යන විශ්වාසයෙන් යුත් බොහෝ දෙනකු සිටිය බව කිව යුතු ය. සමහරකු සතුටින් සිටින අතර තවත් සමහරෙක් අමනාපයෙන් රවා බැලූ හ. සිරකරුවා නිදහස් වීම ගැන විරුද්ධ වූ අය දුර්මුඛ වූ හ. නඩුව දිනන බවට විත්තියේ නීතිඥයා තුළ බලවත් විශ්වාසයක් තිබිණි. ඔහුට සතුට පළ කළ අය ද, ඔහු වටකර ගත්හ.

"විත්තියේ නීතිඥයා ජූරි සභාව සමඟ බැඳ තබන අදෘශ්‍යමාන නූල් තිබෙනවා"යි වටකර ගෙන සිටි පිරිසට ඔහු කී බව පසු ව ආරංචි විය. "ජූරි සභාව අමතා කතා කරන අතර මේ නූල්

තද වන බව දැනෙනවා. මේ නඩුවේ දී එවැනි බැඳුමක් ඇති වූ බව මට දැනුණා. අපි දිනනවා, භය වෙන්න හේතුවක් නැහැ, අපි දිනනවා.”

“දැන් අපේ ගොවියන් මොනවා කියයි ද දන්නේ නැහැ” මුහුණේ බිබිලි ඇති මිටි මහත්මයෙක්, කතා කරමින් සිටි මහත්වරුන් කිප දෙනකු ළඟට ගොස් රවා බලමින් කී ය. හෙතෙම තුදුරේ වෙසෙන ඉඩම් හිමියෙකි.

“උන් සේරම ගොවීයන් නො වෙයි. ජූරි සභාවේ ලියන්නන් හතර දෙනකුත් ඉන්නවා.”

“ඔව් ඒක ඇත්තයි” පලාත් පාලන සභාවේ නියෝජිත-යෙක් පිරිසට එකතු වෙමින් කී ය.

“ජූරි සභාවේ සිටින නශ්රෝව් අඳුනනවා ද? කෝට් එකේ පදක්කමක් පැලඳ ගෙන හිටිය වෙළෙන්දා.”

“ඉතින් මොකද?”

“මිනිහට හොඳට මොළේ තියෙනවා.”

“නමුත් මිනිහ කවදාවත් කතා කරන්නේ නැහැ.”

“ඒක ඇත්ත, මිනිහ වැඩිය කතා කරන්නේ නැහැ. කතා නොකරන එක තමයි හොඳ. පීටර්ස්බර්ග් සිට පැමිණි නීතිඥයාට පුළුවන් කමක් නැහැ නශ්රෝව්ට උගන්වන්න. නශ්රෝව්ට පුළුවනි නීතිඥයාට උගන්වන්න. මිනිහට ළමයින් දොළොස් දෙනෙක් ඉන්නවා. කොහොම ද ඒ ගැන කල්පනාව?”

“ඇයි දෙයියනේ, සිරකරුවා නිදහස් නො කරයි කියා ද තමුසෙලා කල්පනා කරන්නේ?” තවත් පිරිසක් සමඟ කතා කරමින් සිටි තරුණ නිලධරයෙක් ප්‍රශ්න කෙළේ ය.

“මිනිහා නිදහස් වේවි. ඒ ගැන සැක කරන්න දෙයක් නැහැ”යි කවුදෝ සඝිර සවරයෙන් කී ය.

“මිනිහ නිදහස් කළොත් මහ ලැජ්ජාවක්, මහ නින්දාවක්”යි තවත් නිලධරයෙක් කී ය. “බැරි වෙලාවත් මිනිහ තාත්තා මැරුවා නම් මොකද වෙන්නේ? හොඳ තාත්තලාත් ඉන්නවා නරක තාත්තලාත් ඉන්නවා ......ඒ වෙලාවේ මිනිහ හොඳ සිහියෙන් නො වෙයි ඉන්න ඇත්තේ.........මගේ කල්පනාවේ

හැටියට මිනිහ පිත්තල මෝල වහන කොට තාත්තා ගේ ඔළුවෙ වදින්න ඇති ...නමුත් අර දූසයා පටලවා ගත්ත එක බොහො ම වැරදියි. දූසයා මිනීමරුවා ය කියන කතාව කිසි ම තර්කයකට ගැළපෙන්නේ නැහැ. චිත්තියේ නීතිඥයා මා නම් 'සිරකරුවා තමයි තාත්තා මැරුවේ. නමුත් මිනිහ වැරදි කාරයා නො වෙයි. තුඹලා යකාට ගිය දෙන්' කියා කෙළින් ම කියනවා."

"ඒක තමයි මිනිහ කිව්වෙ, 'තුඹලා යකාට ගිය දෙන්' කියන කොටස විතරයි නොකිව්වේ."

"නැහැ නැහැ, මිනිහ ඒකත් කිව්වා."

"ඇයි එහෙම කියන්නේ? පාස්කු කාලයේ දී නලඟනක් ඇගේ පෙම්වතා ගේ නිත්‍යානුකූල බිරිය ගේ බෙල්ල කපා නිදහස් වුණේ නැද්ද?"

"නමුත් සම්පූර්ණයෙන් ම බෙල්ල කැපුවේ නැහැ."

"ඒකේ ඇති වෙනසක් නැහැ. ඈ බෙල්ල කපන්න පටන් ගත්තා."

"කොහොම ද නීතිඥයා දරුවන් ගැන කියාපු කතාව? බොහො ම අගෙයි නේද?"

"ඔව් බොහො ම අගෙයි."

"ආගම ගැන කියාපු කතාව කොහොම ද?"

"ආගම ගැන කතාව පැත්තකින් තබා අපේ පැමිණිල්ලේ නීතිඥයා ගැන ටිකක් කල්පනා කරල බලමු." තවෙකෙක් කතා-වට එක් වෙමින් කී ය. "ජීවත් වීමෙන් මිනිහට ඇති වැඩේ මොකක් ද? මිනිහ මිතියා ගැන කියාපු කතාවලට මිනිහ ගේ නෝනා මිතියා වෙනුවෙන් ඇස් දෙක උගුල්ලා දමාවි."

"ගෑනි ඇවිදින් ඉන්නව ද?"

"දත් කැක්කුමක් නිසා ඇවිදින් නැහැ. ඇවිදින් හිටිය නම මෙ තැන දී ම මිනිහ ගේ ඇස් දෙක උගුල්ලා දමනවා. හා! හා! හා!"

"හ! හ! හා!"

තුන් වන පිරිසක් අතරේ මෙ වැනි කතාවක් ඇති විය.

"මගේ කල්පනාවේ හැටියට මිතියා නිදහස් කරාවි."

"එහෙනම් මිනිහ හෙට තැබෑරුම විනාශ කරාවි. දහ දවසක් නො කඩවා අඩි ගහවි."

"මිනිහ යකෙක්!"

"ඔව් යක්ෂයා මිනිහ එක්ක අත්වැල් බැඳගෙන ඇති. යකා මිනිහ එක්ක යාළු වෙන්නෙ නැතිනම් කවුරු එක්ක ද යාළු වෙන්නේ?"

"නීතිඥයා ගේ කතාව නම් බොහො ම ඉහළයි. නමුත් මෝල් ගහකින් ගහල තාත්තා මරන එක එ තරම් හොඳ දෙයක් නො වෙයි. මොකක් ද මේ රටට වෙන්න යන්නේ?"

"කොහොම ද, මංගල රථයේ කතාව මතක ද?"

"ඔව්, මිනිහ සාමාන්‍ය කරත්තයක් මංගල රථයක් කරල පෙන්නුවා."

"ආයේත් හෙට එයා ගේ වැඩේ කරගන්න මංගල රථය සාමාන්‍ය කරත්තයක් කරල පෙන්නාවි."

"දූත් කාලේ කො තරම් කපටි මිනිස්සු ඉන්නව ද? අද රුසියාවේ යුක්ති ධර්මය කියා දෙයක් තියෙනව ද?"

යළි සීනුව නාද විය. තීරණයකට බැස ගැනීම පිණිස ජූරි සභාව අඩුවත් නැති ව වැඩියත් නැති ව හරියට ම පැයක් ගත කෙළේ ය. මහාජනයා අසුන් ගත් පසු උසාවිය තුළ දැඩි නිශ්ශබ්දතාවක් ඇති විය. ජූරි සභාවේ මහත්වරුන් ආපසු පැමිණ අසුන් ගත් සැටි මට හොඳට මතකයි. අන්තිම මොහොත පැමිණියේ ය. ප්‍රධාන විනිශ්චයකාර තුමා ජූරි සභාවෙන් ඇසූ ප්‍රශ්න මෙහි ලා සඳහන් කිරීමට මම වෑයම් නො කරමි. මට ඒ ප්‍රශ්න දැන් මතක නැත. ප්‍රධාන විනිශ්චය කාරතුමා ඇසූ පලමු ප්‍රශ්නයට ලැබුණ පිළිතුර නම් මට හොඳට මතකයි. "සිරකරුවා පියා මැරුවේ මුදල් ලබා ගැනීම සඳහා ද? එසේ කිරීමට කලින් කුමන්ත්‍රණය කලා ද?" (ඒ වචන මට හොඳට මතකයි.) උසාවිය තුළ දැඩි නිශ්ශබ්ද තාවක් ඇති විය. ලියන්නන් අතරින් බාලයා වූ ජූරි සභාවේ ප්‍රධානියා දැඩි නිශ්ශබ්දතාව අතරින් ඉතා පැහැදිලි උස් හඬින් පිළිතුරු දුන්නේ ය.

"ඔව්, වැරදිකාරයා."

අසන ලද හැම ප්‍රශ්නයකට ම "ඔව්, වැරදිකාරයා" කියා පිළිතුරු දෙන ලදි. එක ම පිළිතුරකවත් බරපතලකම අඩු වන ස්වභාවයක් නො වී ය. මෙ වැනි තීන්දුවක් කිසි ම කෙනෙක් බලාපොරොත්තු නො වී ය. අඩු ගණනේ සිරකරුවාට අනුකම්පාව දක්වන ලෙස උපදේශයක් වත් ලැබෙතැයි කවුරුත් බලාපොරොත්තු වූ හ. උසාවිය තුළ පැවැති දැඩි නිශ්ශබ්දතාවට කිසි ම බාධාවක් නො වී ය. සිරකරුවා මිනීමැරීමේ චෝදනාවට වැරැදිකරුවා වෙතැයි ආසාවෙන් බලා සිටි අයත්, අනෙක් අතින් ඔහු නිදහස් වෙතැයි බලාපොරොත්තු වූ අයත් ගල් ගැසී බලාහුන්හ. එහෙත් එම නිශ්ශබ්දතාව පැවැතුණේ මිනිත්තු ස්වල්පයක් පමණී. අනතුරු ව ඉතා භයානක කැලඹීමක් ඇති විය. පිරිමි පක්ෂයෙන් වැඩි දෙනෙක් තීන්දුව ගැන ප්‍රීති වූ හ. සමහරෙක් අත්ලෙන් අත්ල පිරිමදිමින් ප්‍රීතිය එළිපිට පළ කළහ. නඩු තීන්දුව සමඟ එකඟ නොවූ අය පරාජය වූවාක් මෙන් පෙනිණී. ඔවුහු උරහිස් අකුලා ගෙන සෙමෙන් කතා කළහ. එහෙත් සිදු වූ දෙය තේරුම් ගැනීමට අසමත් වූ හ. කාන්තා පක්ෂය මුහුණ පා සිටි තත්ත්වය මා විස්තර කරන්නේ කෙසේ ද? ඔවුන් කෝලාහලයක් කරතැයි මම කල්පනා කෙළෙමි. පළමු ව ඔවුන්ට ඔවුන් ගේ සවන් ඇදහිය නොහැකි විය. අනතුරු ව හදිසියෙන් ම උසාවිය පුරා කෑ ගැමක් පැතිර ගියේ ය. "මොකක් ද මේකේ තේරුම? මොකක් ද මේ ඝෝෂාව?" හැම දෙනා ම හිඳ සිටි තැන්වලින් නැඟී සිටියහ. එවේලේ ම නඩු තීන්දුව වෙනස් කළ හැකි යයි ඔවුන් කල්පනා කරන්නට ඇත. එම මොහොතේ දී අසුනෙන් නැඟී සිටි මිතියා දූත දික්කොට හදවත ශෝකයෙන් දෙපළු කරන හඬින් කෑගා කතා කෙළේ ය.

"මම මගේ තාත්තා නොමැරූ බව දෙවියන් වහන්සේ ගැන ද, එතුමා ගේ තීන්දුව දෙන භයානක දවස ගැන ද දිව්රා කියමි. කැතිරිනා මම ඔබට සමාව දෙනවා. මගේ සහෝදර වරුනි, මිත්‍රවරුනි, ගෲසෙන්කාට අනුකම්පා කරන්න."

ඔහුට ඊට වඩා කතා කරගත නොහැකි විය. ඉතා පුදුම අමුතු, අස්වාභාවික හඬකින් ඔහු භයානක ලෙස විලාප නඟා අඬන්නට විය. ඒ විලාපය උසාවිය පුරා රැව් දුන්නේ ය. උසාවියේ ඈත කෙළවරේ සිට කන් සිදුරු කරන, යටි උගුරෙන් කෑගාන හඬක් ඇසිණි. යටි උගුරෙන් කෑගැවේ ගෲසෙන්කා ය.

නීතිඥයන් ගේ දේශනා ආරම්භ වීමට පෙර ඈ කෙසේ හෝ අධිකරණ ශාලාවට ඇතුළු වීමට සමත් වූවා ය. මිතියා අධිකරණ ශාලාවෙන් ඉවත් කරන ලදි. දඬුවම නියම කිරීම පසු දිනට කල් දමන ලදි. අධිකරණ ශාලාව තුළ මහත් පෙරළියක් ඇති විය. මම එහි නතර නූණෙමි. සවන් නුදුන්නෙමි. උසාවියෙන් පිට වී යන අතරේ පඩි පෙළ උඩ දී මගේ සවන් වැකුණු අසභ්‍ය වචන සවල්පයක් පමණක් මට මතකයි.

"මිනිහට අවුරුදු විස්සක් පතල්වල රස විඳින්න පුළුවනි."

"ඒට අඩු වෙන්නේ නැහැ."

"අපේ ගොවියන් කෙළින් හිටියා."

"මිතියාට වැඩේ වැරදුණා."

අවසානය

පළමු පරිච්ඡේදය

මිතියා බේරා ගැනීමට උපා යෙදීම

මිතියාට විරුද්ධ ව තිබුණු නඩු විභාගය අවසන් වී දින පහකට පසු ව, උදේ නවයට පමණ, අලෝෂා කැතිරිනා හමුවීමට ගියේ දෙදෙනාට ම ඉතා වැදගත් වූ කරුණක් ගැන තීරණයකට බැස ගැනීම පිණිස ය. ඒ සමඟ කැතිරිනාට කිය යුතු පණිවිඩයක් ද තිබිණි. ඈ අලෝෂා සමග කතා කළේ වරක් ඈ ගෲෂෙන්කා පිළිගෙන කතා කළ කාමරයේ හිඳ ගෙන ය. අධික උණයෙන් සිහි නැති වූ ඉවාන් අනෙක් කාමරයේ නිදා සිටියේ ය. අධිකරණ ශාලාවේ දී ඇති වූ කලබලයෙන් පසු අසනීප වී සිහි නැති වූ ඉවාන් වහා තම නිවෙසට ගෙනයන ලෙස කැතිරිනා නියම කළා ය. එසේ කිරීම නිසා නිතැතින් ම ඇති වන ඕපාදූප දෙඩුම් හා මහජන අප්‍රසාදය ද කැතිරිනා ගණන් නොගත්තා ය. ඇය සමඟ නතර වී සිටි ඇගේ නෑයන් දෙදෙනා ගෙන් එකියක් උසාවියේ සිදු වූ කලබලයෙන් පසු ව වහා මොස්කව් බලා ගියා ය. අනෙක් නෑයා නතර වූවා ය. නෑයන් දෙදෙනා ම තමා අත්හැර ගියත්, කැතිරිනා තම අදහස් දැඩි ව ගෙන, ඉවාන් ළඟ දිවා රෑ දෙක්හි ම හිඳ සාත්තු කරනවා ඇත. දොස්තර වාවින්ස්කි හා දොස්තර හේසන්ස්ටියුබ් එකතු ව ඉවාන්ට බෙහෙත් කළහ. රෝගයේ අවසානය ගැන සිය අදහස් පැවැසීම ප්‍රතික්ෂෙප කළ, මොස්කව් සිට පැමිණි මහ දොස්තර ආපසු යන්නට ගියේ ය. දොස්තරවරු දෙදෙනා කැතිරිනා ගේ හා අලෝෂා ගේ සිත් සැනසූහ. එහෙත් ඉවාන් ගේ රෝගය සුව වේ යයි ඔවුන්ට ස්ථිර ව කිව නොහැකි බව පැහැදිලි විය.

අලෝෂා රෝගාතුර වූ සොහොයුරා බැලීමට දවසකට දෙවරක් ගියේ ය. මෙ වර ඔහු ගියේ විශේෂ හදිසි කටයුත්තක් සඳහා ය. මෙම කටයුත්ත ගැන කතා කිරීමට ඇති අපහසුව ඔහු කලින් දැන සිටියේ ය. එය පමා නො කළ යුතු දෙයකි. පමා වීමට පුළුවන් කමක් ද නැති. එ දින උදේ ඔහුට තවත් හදිසි කටයුත්තක් යෙදී තිබිණි. එය ද කල් දැමිය හැකි දෙයක් නො වේ.

ඔවුහු පැය කාලක් පමණ වේලා කතා කරමින් සිටියහ. දැඩි විඩාවෙන් පෙළෙන කැතිරිනා සුදුමැලි වූවා ය. එහෙත් ඒ අතරේ උමතු කරවන තරම් කලබල වූවා ය. අලෝෂා තමා හමුවීමට පැමිණි හේතුව කැතිරිනා දැන සිටියා ය.

"එයා ගේ තීරණය ගැන කරදර වෙන්න එපා. කොයි ක්‍රමයෙන් හරි එයා ඒ අදහසට එකඟ වෙන්න ඕනෑ. කොහොම හරි එයා බේරී පැනල යන්න ඕනෑ"යි කැතිරිනා අවධාරණ-යෙන් කීවා ය. "අර අවාසනාවන්ත මනුෂ්‍යයා, උදාර භාවයේ හා ප්‍රතිපත්තිවල වීරයා – මා කතා කරන්නේ මීතියා ගැන නො වෙයි, තමා ගේ සහෝදරයා වෙනුවෙන් ආත්ම පරිත්‍යාගයක් කළ අනෙක් කාමරයේ සිහි නැති ව වැතිර සිටින ඉවාන් ගැනයි. මීතියා ගේ පැනයාම ගැන සම්පූර්ණ වැඩ පිළිවෙල විභා කලකට කලින් ඉවාන් මට කියා දුන්නා. ඉවාන් දැනට ම ඒ සම්බන්ද ව නොයෙක් දෙනා සමඟ සාකච්ඡා පවත්වා තියෙනවා...............ඒ ගැන සමහරක් කරුණු මා දැනට ම අලෝෂාට විස්තර කරලා ඇති........ මෙහෙ ඉඳලා සිරකරුවන් සයිබීරියාවට ගෙන යන අතර මඟ දී, තුන් වන නැවතුම් පොළේ දී, මීතියාට පැනල යන්න කටයුතු සූදානම් කරලා ඇති. ඒකට තව බොහො ම කල් තියෙනවා. ඉවාන්, තුන් වන නැවතුම් පොළේ දී සිරකරුවන් භාර ව සිටින නිලධරයා හමු වී මේ ගැන සාකච්ඡා කරල තියෙනවා. එහෙත් සිරකරුවන් භාර ව යන්නේ කවු ද කියන එක අපට තව ම දැනගන්න ලැබුණේ නැහැ. කලින් දැන ගන්න අමාරුයි. තමාට යම්කිසි විපත්තියක් සිදුවේ ය යන අදහසින් ඉවාන් මීතියා ගේ පැනයාම ගැන සම්පූර්ණ විස්තරයක් නඩුවට කලින් මට භාර දුන්නා. ඒ විස්තරය මම හෙට කියන්නම්.........දවසක් සවස අලෝෂා මෙහාට එන කොට මම ඉවාන් එක්ක කෝලාහල කරගත්තා මතකයි නේ ද? ඉවාන් පඩි පෙළ බැහැල පහළට ගියා. ආලෝෂා ආවාට පස්සේ මම ආපසු ඉවාන්ට කතා කළා මතකයි නේද? එදා සවස අපි කෝලාහල කළේ මොනවට ද කියා දන්නව ද?"

"නැහැ, මම දන්නේ නැහැ."

"ඉවාන් මේ ගැන අලෝෂාට කිසි ම දෙයක් කිව්වේ නැහැ. අපි කෝලාහල කරගත්තේ මීතියා බේරා ගැනීමට සකස් කරගත්ත වැඩ පිළිවෙල ගැනයි. දවස් තුනකට කලින් ඉවාන් මට මේ වැඩ පිළිවෙලේ ප්‍රධාන අදහස් කියා දුන්නා. අපි ඒ වෙලාවේ ඉඳලා ඒ ගැන කෝලාහල කරගත්තා. දවස් තුනක් ම කෝලාහල කළා. මීතියා වරදකාරයා වුණොත් අර ගෑනිත් එක්ක පිට රටකට පැනල යන බව ඉවාන් කිව්වා. අපි කෝලාහල කරගත්තේ ඒ ගැනයි. මීතියා අර ගෑනිත් එක්ක පැනල යනවා ය කීවාම මට බොහෝ ම කේන්ති ගියා. මොන කරුණක් නිසා ද කියා මා දන්නේ නැහැ. මට ම තේරුම් ගන්න බැහැ......... අර ගෑනි ගැන මට බොහෝ ම තරහයි. ඒ ගෑනි මීතියා එක්ක වෙන රටකට පැනල යනවා ය කීවාම මට තවත් කේන්ති ගියා"යි කැතිරිනා හදිසියෙන් ම කීවා ය. ඇගේ තොල් කෝපයෙන් වෙව්ලන්නට විය. "ඒ ගෑනි ගැන මට කේන්ති ගියා ම, මා තවමත් මීතියාට ආලය කරනවා ය කියා ඉවාන් කල්පනා කළා. ඒ ගැන තමයි අපි පළමු ව කෝලාහල කරගත්තේ. මට කේන්ති ගියේ මොකද කියා මම ඉවාන්ට තේරුම් කරල දුන්නේ නැහැ. එයාගෙන් සමාව ඉල්ලන්න මම කැමැති වුණෙත් නැහැ. මීතියා වගේ මිනිහකුට මා තවමත් ආලය කරනවා ය කියා ඉවාන් වගේ කෙනෙක් සැක කරාවි ය යන අදහස මට කොහෙත් ම රුස්සන්නේ නැහැ. මා ගැන එහෙම සැක කළේ මා මීතියාට ආලය නොකරන බවත්, ඉවාන් හැර වෙන කිසි ම කෙනකුට ආලය නොකරන බවත්, කිව්වාට පසු වයි. මා ඉවාන් එක්ක කෝලාහල කරගත්තේ අර තිරිසනා එක්ක තියෙන අමනාපය නිසයි. දවස් තුනකට පස්සේ; එයා ආපු දා සවස ඉවාන් මට මුද්‍රා තබන ලද ලියුමක් ගෙනත් දීලා, එයාට කිසියම් විපතක් වුණොත් වහා ම ලියුම කඩා බලන ලෙස මට නියම කළා. තමාට අසනීප වන බව ඉවාන් කලින් දැන ගත්ත ඇති. මීතියාගේ පැනයාම ගැන සම්පූර්ණ විස්තරයක් එම ලියුමේ තියෙනවා ය; යම් විදියකින් ඉවාන් මළොත්, නැති නම් භයානක ලෙස අසනීප වුණොත්, මා තනියෙන් ම ඉදිරිපත් වී මීතියා බේරා ගත යුතුයි කියා මට නියම කළා මට රූබල් දහ දාහක් පමණ මුදල් දුන්නා. ඉවාන් මිනිහෙක් යවා මුදල් මාරු කර ගත්තා ය කියා පැමිණිල්ලේ නීතිඥයා නඩුවිභාගයේ දී කිව්වේ මේ මුදල් ගැනයි. මා තව මත් මීතියාට ආලය කරනවා ය

කියා ඉවාන් මා ගැන සැක කරනවා. මා ගැන ඊරිසියා කරනවා. ඒ අතර මීතියා බේරා ගැනීමට අදහස් කරගෙන ඒ සම්බන්ධ ව සේරම කටයුතු මට භාර දුන්නා. ඉවාන් ගේ මේ ක්‍රියාව බොහො ම තදින් මගේ හිතේ බලපැවැත්තුවා. ඉවාන් කළේ විශාල ආත්ම පරිත්‍යාගයක්. අලෝෂා, මේ වැනි ආත්ම පරිත්‍යාගයක ඇති ශ්‍රේෂ්ඨකම තුඹට කවදා වත් තේරුම් ගන්න බැහැ. ඉවාන් ගේ දෙපා ලඟ වැටී මගේ ගෞරවය පෙන්නීමට මට අදහස් වුණා. එහෙත් මා එ වැනි දෙයක් කළොත්, මීතියා නිදහස් වීම ගැන මා තුළ ලොකු ප්‍රීතියක් ඇති වූ හැටියට ඉවාන් සැක කරන්න පුළුවන් ය කියා මට හදිසියෙන් ම කල්පනා වුණා. ඉවාන් ඒ විදියට මා සැක කරනවාට කිසි ම සැකයක් නැහැ. ඉවාන් ඒ වගේ අසුතු අදහසක් ඇති කර ගනීවි ය කියා ඒ වෙලාවේ මට කො තරම් කේන්ති ගියා ද කියතොත් මම ඉවාන් ගේ දෙපා සිඹිනවා වෙනුවට ඇඟට කඩා පැන්නා. දූත් මම බොහො ම කනගාටුවෙන් ඉන්නේ. ඒ මගේ ගතිගුණවල හැටි. මා අත්හැර දමා තමා සමඟ සමගියෙන් ජීවත්විය හැකි තවත් තරුණියක් සොයා ගැනීමට පෙළඹෙන තෙක් මා ඉවාන්ට හිරිහැර කරන්න පුළුවනි. මා මීතියාට කළෙත් එ වැනි ම දෙයක්.........ඉවාන් වෙන තරුණියක් සොයා ගත්තොත් ඒක මට කවදාවත් ඉවසන්න බැහැ. එහෙනම් මම පණ නහ ගන්නවා. එදා සවස අලෝෂා මා බලන්න පැමිණි වෙලාවේ මම ආපසු ඉවාන්ට කතා කළා. ඒ වෙලාවේ ඉවාන් කො තරම් පිළිකුලකින් හා කෝපයෙන් මා දිහැ බැලුවා ද කියනවානම් මට බොහො ම කේන්ති ගියා. මීතියා මිනීමරුවකු බව මට පිළිගැන්නුවේ ඉවාන් කියා මා කෑගැවා තුඹට මතක ඇති. මම ඒ හයානක කතාව කිව්වේ ඉවාන් ගේ හිත රිදවීමටයි. නමුත් මීතියා තාත්තා මැරුවා ය කියා ඉවාන් කවදා වත් මට කිව්වේ නැහැ. මීතියා තාත්තා මරාපු බව ඉවාන්ට කිව්වේ මායි. මේ හැම විපත්තියකට ම ප්‍රධාන හේතුව මගේ දරුණු කෝපයයි. නඩු විභාගයේ දී අර හයානක දෙය සිද්ධ වුණේ මගේ වරදින්. ඉවාන්ට උවමනා කරල තිබුණා එයා බොහො ම උදාර ගතිගුණ තියෙන කෙනකු බව පෙන්නීමට. මා මීතියාට ආලය කළත්, ඒ නිසා ඔහුගෙන් පළි ගැනීමට වත්, ඔහුට ඊරිසියා කිරීමට වත්, ඔහු විනාශ කිරීමට වත් තමා තුළ කිසි ම අදහසක් නැති බව, පෙන්නීමට ඉවාන්ට උවමනා කරල තිබුණා. ඒ නිසයි එයා සාක්ෂි දෙන්න ගියේ........... මේ හැම විපත්තියකට ම වැරදිකාරයා මමයි.”

මිට කලින් කවදාවත් කැතිරිනා අලෝෂාට මේ වගේ පාපෝච්චාරණයක් කර නැත. අභිමානයෙන් දූපුණු හදවතක් වේදනාවෙන් බිඳවැටී ශෝකයට යටත් වන්නාක් මෙන් කැතිරිනා දරුණු ශෝකයකින් පෙළෙන බව අලෝෂා දුටුවේ ය. ඇගේ මේ දරුණු ශෝකයට හේතු වූ තවත් භයානක කරුණක් තිබෙන බව අලෝෂා දැන සිටියේ ය. නඩු විභාගයෙන් පසු ඈ එය සඟවා තැබීමට වෑයම් කළා ය. එහෙත් දැන් එය හෙළි කිරීමට තරම් පහත් තත්ත්වයකට ඈ වැටී සිටිසි. ඈ එම තත්ත්වයට පත් කල හේතුව අලෝෂාට පවා බලවත් සිත්-තැවුලක් වන්නට ඇත. ඇගේ සිතට වද දුන් එම හේතුව නම් ඈ නඩු විභාගයේ දී මිතියාට කල ද්‍රෝහිකම ය. කිම වැටී පෙරළෙමින්, උමතුවෙන් විලාප නගමින්, අඬමින්, දෙඩමින්, ඈ කල එම ද්‍රෝහිකම හෙළි කිරීමට ඇගේ ආධ්‍යාත්මික චිත්තය ඇයට වද දෙන බව අලෝෂා දැන සිටියේ ය. එ වැනි දෙයක් සිදුවේ ය යන අදහසින් තැති ගත් අලෝෂා ඉන් ඇය වැළැක්වීමට අදහස් කෙළේ ය. මේ හේතුව නිසා ඇයට පණිවිඩය කීම වඩාත් දුෂ්කර විය. අලෝෂා ආයේත් වරක් මිතියා ගැන කතා කෙළේ ය.

"මිතියා ගැන කරදර වෙන්න එපා," යි කැතිරිනා ආයේත් නපුරුකමින් හා මුරණ්ඩුකමින් ද යුතු ව කීවා ය. "මිතියා බොහො ම ඉක්මනට වෙනස් වෙනවා. මම හොඳට මිතියා අඳුනනවා. හිරෙන් පැනල යාමට මිතියා කැමැති වන බවට කිසි ම සැකයක් නැහැ. කොහොම වුණත් දැන් ම පැනල යන්න ලැබෙන්නේ නැහැ. ඒ ගැන තීරණයකට බැස ගැනීමට බොහො ම කල් තියෙනවා. ඒ දවස් වෙන කොට ඉවාන් හොඳට සනීප වේවි. ඒ කටයුතු සේරම එයාට කරන්න පුළුවනි. මට පුළුවනි අයින්වෙල ඉන්න. කරදර වෙන්න එපා. හිරෙන් පැනයාමට මිතියා කැමැති වේවි. ඇත්ත කියනවා නම් මිතියා දැනටමත් කැමැති වෙලා. මිතියා දැන්වත් අර ගෑනි අත්හරී ය කියා හිතනව ද? මිතියා එක්ක සයිබීරියාවට යාමට ඔවුන් ඇයට ඉඩ දෙන්නේ නැහැ ඒ නිසා හිරෙන් පැනල යනවා මිස වෙන කරන්න දෙයක් නැහැ. මිතියා බයෙන් ඉන්නේ තුඹටයි. යම් කිසි හේතුවක් නිසා හිරෙන් පැනල යාම තුඹ අනුමත නො කරාවි ය කියා මිතියා බයයි. මේ කටයුත්තට අලෝෂාගේ අනුමතිය එ තරම් අවශ්‍ය නම් අලෝෂා බොහො ම ත්‍යාගවන්ත කමක් දක්වා ඒට ඉඩ දෙන්න ඕනැ" යි කැතිරිනා කුඩුකෝඩුකමින් කීවා ය. අනතුරු ව ඈ කතාව නතර කොට සිනාසුණා ය.

"ගීතිකා ගැන, කරගහගන්න තියෙන කුරුසයක් ගැන, පුතුකම් ගැන ඉවාන් බොහොම දේවල් කියනවා. එදා සවස ඉවාන් මේ ගැන කතා කරනවා මට මතකයි" කැතිරිනා හදිස්සියෙන් ම කීවේ යටපත් කළ නොහැකි හැඟීම්වලින් යුතු ව ය. "මේවා කියන කොට ඉවාන් අර කාලකණ්ණි මිනිහට කොතරම් ආදරයක් පෙන්නුවද? සමහර විට ඒ එක්ක ම වෛර කරන්නත් ඇති. මම ඉවාන් ගේ කතාව අසා, ඉවාන් අඬන හැටි බලා, අහංකාරකමින් හිනාවුණා. මම මෘගයෙක්, මහ මෘගයෙක්. ඉවාන්ට වැලඳී තියෙන උණයට වැරදිකාරයා මම යි. නමුත් අර හිරේ ඉන්න මිනිහට දුක් විඳින්න බැහැ. ඒ වගේ මිනිහකුට දුක කියා දෙයක් ඇති වෙනව ද? ඒ වගේ මිනිසුන්ට කවදා වත් දුක් වේදනා ඇති වෙන්නේ නැහැ" යි කැතිරිනා නොරුස්නා ගතියෙන් කීවා ය.

කැතිරිනා ගේ කතාවේ වෛරයත්, අවමානයත් සමඟ මිශ්‍ර වූ පිළිකුලක් දකින්නට තිබිණි. එහෙත් මීතියාට ද්‍රෝහිකම් කළේ ඇයයි. 'තමා මීතියාට විශාල වරදක් කළ බව ඈ දන්නා නිසා මොහොතකට පමණ ඇය තුළ මීතියා ගැන කෝපයක් ඇති වෙනවා විය හැකියි' අලෝෂා කල්පනා කෙළේ ය. ඈගේ එම කෝපය මොහොතකට පමණක් සීමා වීම ගැන අලෝෂා ප්‍රීති විය. කැතිරිනා ගේ අවසාන වචනවල අභියෝගයක ස්වරූපයක් ඇතැයි අලෝෂාට කල්පනා විය. එහෙත් ඒ අභියෝගය පිළිගැනීමට ඔහු තුළ කැමැත්තක් නැත.

"අද උදේ මා හමුවෙන්න ය කියා මම අලෝෂාට කිව්වේ මීතියාට කතා කරලා හිරෙන් පැනයාමට මීතියා කැමැති කරවා ගන්නා බවට පොරොන්දු කරවා ගැනීමටයි" කැතිරිනා කීවා ය. "නැති නම් හිරෙන් පැනයාම අපකීර්තියක් ය, බියසුලුකමක් ය, ගුණදහම්වලට විරුද්ධ ය කියා අලෝෂා කල්පනා කරනවද?" යි කැතිරිනා අභියෝගයක ස්වරූපයක් දක්වා විමසුවා ය.

"නැහැ, මම එහෙම කල්පනා කරන්නේ නැහැ" යි අලෝෂා පිළිතුරු දුන්නේ ය. "මම මීතියාට සේරම කියන්නම්. කැතිරිනා හමුවීමට කැමති ය කියා මීතියා කියන්න කිව්වා." යි අලෝෂා කැතිරිනා ගේ මුහුණ දෙස බලා අපරීක්ෂාවෙන් කීවේ ය. හිටි හැටියේ ම තිගැස්සුණ තරුණිය සෝපාව මත හිඳ සිටි තරුණයා වෙතින් මඳක් ඈත් වූවා ය.

"මා හමුවන්න? මීතියා මා හමුවන්න ඔනෑ ය කිව්වා?" තරුණිය සුදුමැලි වෙමින් ඇසුවා ය.

"ඔව්, හමුවන්න ඕනෑ ය කිව්වා" යි අලෝෂා අවධාරණයෙන් කීවේ ය. ඔහු ගේ කතාව වඩ වඩාත් ප්‍රාණවත් විය. "විශේෂයෙන් ම, මේ වෙලාවේ දී අයියාට කැතිරිනා මුණගැහෙන්න උවමනා කරල තියෙනවා. එ තරම් අවශ්‍ය නැති නම් මම කැතිරිනාට කරදර කරන්නේ නැහැ. අයියා මුණගැහෙන්න කියන්නෙත් නැහැ. අයියාට සනීප නැහැ. කල්පනාවත් හොඳ මදි. නිතර කැතිරිනා ගැන අහනවා. කැතිරිනාට එන්න කිව්වේ කැතිරිනා එක්ක සමාදාන වීමට නො වෙයි. කැතිරිනා ගිහින් දොර ළඟ පෙනී සිටියහම ඇති. නඩුවට පස්සේ අයියා බොහො ම වෙනස් වෙලා. කැතිරිනාට බොහො ම ලොකු වරදක්, සමාව දිය නොහැකි වරදක් කළා ය කියා අයියා කල්පනා කරනවා. අයියාට කැතිරිනාගෙන් සමාව උවමනා නැහැ. 'මා කළ වරදට සමාව දීම කරන්න පුළුවන් දෙයක් නො වෙයි' කියා අයියා කියනවා. උවමනා කරන්නේ අයියාට පෙනෙන්න දොර ළඟ සිටීම පමණයි.

"මේක හදිසියෙන් සිද්ධ වූ දෙයක්............" යයි කැතිරිනා ගොත ගසමින් කීවා ය. "අලෝෂා ඔය පණිවිඩය ගෙනෙන බව මම දවස් ගණනක ඉඳලා දැන ගෙන හිටියා.........මිතියා මට එන්න කියන බව මම දැන ගෙන හිටියා......මේක වෙන්න බැරි දෙයක්."

"මේක වෙන්න බැරි දෙයක් වෙන්න පුළුවනි. ඒ වුණත් කරුණා කරල අයියා බලන්න යන්න. කැතිරිනාට හිරිහැර කළ බව ජීවිතයේ පළමු වරට අයියා තේරුම් ගෙන තියෙනවා. ඒ ගැන කරුණා කර කල්පනා කරල බලන්න. ඔබට හිරිහැර කළ බව මීට කලින් කවදා වත් අයියා සම්පූර්ණයෙන් තේරුම් ගත්තේ නැත. කැතිරිනා නාවොත් තමා ගේ මුළු ජීවිතය ම කාලකණ්ණි වන බව අයියා කිව්වා. කැතිරිනාට මා කියන දෙය ඇහෙනවා නේද? බරපතල වැඩ ඇති ව අවුරුදු විස්සකට හිරගෙදරට යවන ලද මේ අපරාධකාරයා තවමත් සතුටින් ජීවත්වීමට කල්පනා කරනවා. ඒක අනුකම්පා කිරීමට සුදුසු දෙයක් නො වේ ද? ඒ ගැන හොඳට කල්පනා කරල බලන්න. ඔබ බලන්න යන්නේ නිර්දෝෂී වුවත් මුළු ජීවිතය ම විනාශ වූ මිනිසකු බව මතක තියා ගන්න" යි අලෝෂා අභියෝගයක ස්වරූපයෙන් කීවේ ය. "අයියා ගේ දූත පිරිසුදුයි. තාත්තා ගේ ලේ තැවරී නැහැ. අනාගතයේ දී අයියා විසින් විඳිද යුතු සීමාවක් නැති දුක සිහි කරලා ඒ වෙනුවෙන්

අයියා බලන්න යන්න. අද්‍රූ ලෝකයකට යන අයියා බලන්න යන්න. කොහොම හරි යන්න. ගිහින් අයියාට පෙනෙන්න දොර ලඟ ඉන්න. කොහොම හරි යන්න" යි අලෝෂා කොහොම හරි යන වචනය බර කොට කීවේ ය.

"කොහොම හරි යන්න ඕන බව ඇත්තයි. නමුත් මට යන්න බැහැ"යි කැතිරිනා කෙඳිරිගාන්නාක් මෙන් සෙමෙන් කීවා ය. "මිතියා මා දිහැ බලාවි. මට ඒ බැල්ම ඉවසන්න බැහැ."

"ඔව්, තුඹලා දෙන්නා එකිනෙකා දෙස බැලිය යුතුයි. අයියා බලන්න නොයනවා නම් ඒක ලොකු වරදක්. ඒ වරද හිතේ තියාගෙන ජීවත් වන්නේ කොහොම ද?"

"මිතියා ගේ මුහුණ බලනවාට වඩා හොඳයි මුළු ජීවිතය ම දුකින් ගත කිරීම."

"කොහොම හරි යන්න. කොහොම හරි යන්න ඕනෑ"යි අලෝෂා ආයේත් අවධාරණයෙන් කීවේ ය.

"මොකද හදිසියෙන් ම අද යන්න කියන්නේ?.......... ඉවාන් අසනීප ව සිටිය දී යන්න පුළුවන් කමක් නැහැ."

"ටික වේලාවකට යන්න බැරි ද? ටික වේලාවක් හිටියොත් ඇති. අද නො ගියොත් අයියාට පිස්සු හැදේවි. මා කවදාවත් කැතිරිනාට බොරුවක් කියන්නේ නැහැ......ටිකක් අනුකම්පා කරන්න."

"ඇයි මට අනුකම්පා නො කරන්නේ?"යි කෝපයෙන් ඇසූ කැතිරිනා අනතුරු ව අඬන්නට පටන් ගත්තා ය.

"එහෙනම් අයියා බලන්න යනවා නේ ද? හොඳයි කැතිරිනා තව ටික වේලාවකින් එන බව මම ගිහින් අයියාට කියන්නම්"යයි අලෝෂා ස්ථිර ස්වරයෙන් කීවේ ය.

"නැහැ නැහැ. මොන ම හේතුවක් නිසාවත් කියන්න එපා"යි කැතිරිනා තැති ගෙන කීවා ය. "මම මිතියා බලන්න යන්නම්. නමුත් ඒ බව මිතියාට කලින් කියන්න එපා. මම යන්නම්, නමුත් කාමරය ඇතුළට යන්නේ නැහැ.........ඒ වුණත් යන නොයන එක මට තව ම හරියට කියන්න පුළුවන් කමක් නැහැ."

කැතිරිනාට කතා කරගත නොහැකි විය. ඈ හුස්ම ගත්තේ අමාරුවෙනි. අලෝෂා නිස්ම යාමට නැගී සිටියේ ය.

"එ තැන දී මට කවුරු හරි හමුවුණොත් මොකද කරන්නේ?"යි කැතිරිනා සෙමෙන් ඇසුවා ය. ඇගේ මුහුණ භීතියෙන් සුදුමැලි විය.

"ඒ නිසා තමයි දූත් ම යන්න කියන්නේ. දූත් ම ගියොත් කිසි ම කෙනෙක් හමු වන එකක් නැහැ. එ තැන කිසි ම කෙනෙක් නැති බව මට ස්ථිර ව කියන්න පුළුවනි. අපි ඔබේ පැමිණීම බලාපොරොත්තු ව සිටිනවා."

මෙසේ අවධාරණයෙන් පැවසූ අලෝෂා කාමරයෙන් පිට වී ගියේ ය.

දෙ වන පරිච්ඡේදය

මොහොතකට බොරුව ඇත්ත වෙයි

රෝගාතුර වූ මිතියා නගර වී සිටින රෝහල බලා අලෝෂා වහා ගමන් ගත්තේ ය. තමා ගේ ඉරණම විසඳුණු දිනට පසු දින සිට ස්නායු උණයකින් පෙළෙන්නට වූ මිතියා නගරයේ රෝහලේ සිරකරුවන් සඳහා වෙන් කරන ලද කොටසට යවන ලදි. එහෙත් (අලෝෂා, හොලාකෝව් මැතිනිය හා ලීසා ආදී) කීප දෙනකු ගේ ඉල්ලීම පිට දොස්තර වාර්වින්ස්කි මිතියා අනෙක් සිරකරුවන් ගෙන් වෙන් කොට, වෙන ම කුඩා කාමරයක තැබුවේ ය. පැවල් සිටියේ මෙම කාමරයෙහි ය. කොරිඩෝරයේ කෙළවර මිතියා මුර කිරීමට මුරකරුවකු සිටිය බව ඇත්තයි. කාමරයේ කවුළුවේ යකඩ පොලු සවිකොට තිබිණි. එ හෙයින් සිරකරුවාට දක්වන ලද එ තරම් නීත්‍යානුකූල නොවූ පහසුකම් ගැන දොස්තරට නැතැසිල්ලේ සිටිය හැකි විය. හෙතෙම දයානුකම්පාවෙන් යුත් තරුණ දොස්තර කෙනෙකි. මිතියා වැනි කෙනකුට හිටි හැටියේ ම පල්හොරුන් හා මිනීමරුවන් ද අතරේ ජීවත් විය නොහැකි බවත්, ඒ සඳහා ඔහු ටිකින් ටික පුරුදු විය යුතු බවත්, දොස්තර දැන සිටියේ ය. හිත මිතුරන් හා නෑයන්ට නිතර සිරකරුවා හමුවීමට දොස්තර, ඕවර්සියර් හා පොලිස් කපිතාන් විසින් අනියම් ලෙස අවසර දෙන ලදි. එහෙත් මෙතෙක් කල් මිතියා බලන්නට ගියේ අලෝෂා හා ගෲසෙන්කා පමණි. රකිටින් කීප වරක් ම මිතියා බැලීමට බලයෙන් ම ගියේ ය. එහෙත් ඔහුට ඇතුළු වීමට ඉඩ නොදෙන ලෙස දොස්තර මහතා නිතර කියා සිටියේ ය.

අලෝෂා යන විට මීතියා, තුවාලවලට බෙහෙත් දමන කාමරයේ ඇඳක් උඩ හිඳ සිටියේ ය. යත්තම් උණ ගැනී සිටි හෙතෙම විනාකිරි සමඟ වතුර පොඟන ලද තුවායක් හිස වටේ ඔතා ගෙන සිටියේ ය. ඔහු කාමරයට ඇතුළු වූ මලණුවන් දෙස නොපැහැදිලි ලෙස බැලුවේ ය. ඔහු ගේ නෙත් තුළ භීතියට සමාන ලක්ෂණයක් දකින්නට තිබිණි.

සාමාන්‍යයෙන් නඩුවට පස්සේ මීතියා නිතර කල්පනා කරන්නට විය. සිතට වද දෙන කිසියම් බරපතල දෙයක් ගැන තීරණයකට බැස ගැනීමට වෑයම් කරන්නාක් මෙන් ඇතැම් විට පැය භාගයක් පමණ වේලා තුෂ්ණිම්භූත ව සිටියි. ඒ කාලය තුළ දී ඔහුට අවට සිදුවන දේවල් ගැන අමතක වෙයි. එම ගැඹුරු කල්පනාවෙන් අවදි වූ වහා ම ඔහු කතා කිරීමට පටන් ගනියි. මෙසේ හදිසියෙන් ම කතා කිරීමට පටන් ගන්නා හෙතෙම නොයෙක් දේවල් ගැන දොඩයි. කවර දෑ වත් කියන්නට උවමනා දෙය නො කියයි. ඇතැම් විට ඔහු දුකින් පිරි දෑසින් සොහොයුරා දෙස බලා සිටියි. ඔහු අලෝෂාට වඩා ගෲසෙන්කා සමඟ සතුටින් සිටින බව පෙනෙයි. ඔහු ගෲසෙන්කා සමඟ වඩා කතා නොකරන බව ඇත්තයි. එහෙත් ඈ කාමරයට ඇතුළු වූ වහා ම ඔහු ගේ මුහුණ ප්‍රීතියෙන් ආලෝක වෙයි.

අලෝෂා නිහඬ ව සොහොයුරා ළඟින් ඇඳ උඩ හිඳ ගත්තේ ය. මෙ වර මීතියා අලෝෂා ගේ පැමිණීම බලා සිටියේ මහත් නො ඉවසිල්ලෙන් යුතු ව ය. එහෙත් මලණුවන්ගෙන් කිසිවක් විමසීමට ඔහු බිය විය. කැතිරිනා තමා බැලීමට එකඟ නොවන බව මීතියාට හොඳට විශ්වාසයි. එහෙත් ඈ නැවිත් නො සිටී ය යන හැඟීමක් ද ඔහු තුළ ඇති විය. අලෝෂා සොහොයුරා ගේ අදහස් හැඳින ගත්තේ ය.

"ට්‍රිෆොන් බොරිසිච් මූක්රෝවේ හෝටලය අයිතිකරයා නඩුව අවසන් වෙලා ගමට ගිය වහා ම; මා සඟවපු තිදූනය සොයා මුළු නවාතැන ම කැඩුවා ය කියා මට ආරංචියි. දණ්ඩනායකයා, මා හෝටලයේ සඟවා තැබුවා ය කියා විස්තර කළ රූබල් එක් දස් පන්සිය සොයා ගන්න හෝටලේ බිත්ති කැඩුවලු, ඉස්තෝප්පුව ගැලෙව්වලු. කිම සවිකර තිබුණු ලෑලි ඉවත් කළාලු. ඔය හොරාට ඔහොම වෙලා මදි. මට මේ කතාව කිව්වේ ඉස්පිරිතාලේ ඉන්න මුරකාරයා. ඒ මිනිහා මූක්රෝවේ ඉඳලයි එන්නේ."

"කැතිරිනා අයියා බලන්න එනවයි කිව්වා. නමුත් කොයි වෙලාවේ එයි ද දන්නෙ නැහැ. සමහර විට අද එන්න පුළුවනි.

නැති නම් තව දවස් කිපයකින් එන්න පුළුවනි. එන දවස මට හරියට කියන්න බැහැ. කොහොම නමුත් ඒවී. එන බව නම් මට ස්ථිර ව කියන්න පුළුවනි."

මිතියා තිගැස්සිණි. ඔහු යම්කිසිවක් කීමට සැරසුණ මුත් යළි නිහඬ විය. මෙම ආරංචිය ඔහු කෙරෙහි තදින් බල-පැවැත්වී ය. අලෝෂා කැතිරිනා සමඟ කළ සාකච්ඡාව ගැන තොරතුරු දැනගැනීමට ඔහු තුළ දැඩි ආශාවක් පැවතිණි. එහෙත් ඒ ගැන විමසීමට ඔහු බිය විය. එ වේලේ කැතිරිනා මිතියා ගැන නපුරු පිළිකුල් දෙයක් කීවා නම් එය මිතියාට ගසන ලද මරු පහරක් වැන්න.

"හිරෙන් පැනයාම ගැන බයක් හෝ සැකයක් හෝ ඇති කර නො ගෙන, කරදර නො වී ඉන්නට ය කියා කැතිරිනා කිව්වා. ඉවාන්ට කල්වේලා ඇති ව සනීප නූණොත් ඒ සේරම කටයුතු තමා ම කරනවා ය කියා කැතිරිනා පොරොන්දු වුණා."

"ඒ ගැන තුඹ මට කලින් කිව්වා"යි මිතියා සිනා සෙමින් කි ය.

"අයියා ඒ ගැන ගෲසෙන්කාට කිව්වා ද?"යි අලෝෂා විමසුවේ ය.

"ඔව්, මම ගෲසෙන්කාට කිව්වා"යි මිතියා පිළිගත්තේ ය.

"ගෲසෙන්කා උදේට එන්නෙ නැහැ. හවසට විතරයි එන්නේ. කැතිරිනා මට හිරෙන් පැනයාමට කටයුතු සූදානම් කරනවා ය කිව්වාම ඈ කතා කළේ නැහැ. නමුත් ඇගේ මූහුණ ඇඹුල් වුණා. 'ඈ ඒ කටයුතු සූදානම් කරපු දෙන්' යයි සෙමෙන් කිව්වා. මේක බොහො ම වැදගත් දෙයක් බව ඈ තේරුම් ගත්තා. මේ ගැන ඊට වඩා වචනයක්වත් මම කිව්වේ නැහැ. මා හිතනවා, කැතිරිනා මට නො ව ඉවාන්ට ආදරය බව ගෲසෙන්කා තේරුම් ගන්න ඇති."

"ගෲසෙන්කා ඒ බව පිළිගන්නවා ද?"යි අලෝෂා අපරීක්ෂා-වෙන් විමසුවේ ය.

"සමහර විට නොපිළිගන්නවත් ඇති. ඈ අද උදේ එන්නෙ නැහැ. මා වෙනුවෙන් පොඩි වැඩක් කරන්න භාර දුන්නා. මල්ලී, ඉවාන් අපට වඩා කල් ජීවත් වෙන්න ඕනැ. අප නො වෙයි ජීවත්විය යුත්තේ ඉවාන්. ඉවාන්ට සනීප වේවි. ඒ ගැන මට හොඳට විශ්වාසයි."

"කැතිරිනා ඉවාන්ට ආදරය කළත් ඉවාන් ජීවත්වේ ය කියා ඈ විශ්වාස කරන්නේ නැහැ"යි අලෝෂා කීවේ ය.

"ඒ කියන්නේ ඉවාන්ට සනීප නොවන බව කැතිරිනා පිළිගෙන ඉවර බවයි. නමුත් ඉවාන්ට සනීප වේ ය කියා ඈ විශ්වාස කරන්නේ බයටයි."

"ඉවාන් ගේ ශරීර ශක්තිය බොහො ම හොඳයි. ඉවාන්ට සනීප වන බව මට හොඳට විශ්වාසයි."

"ඔව් ඉවාන්ට සනීප වේවි. නමුත් ඉවාන් මැරේ ය කියා කැතිරිනා කල්පනා කරනවා. ඇගේ දුකට සීමාවක් නැහැ ...."

සොහොයුරන් දෙදෙනා අතරේ නිශ්ශබ්දතාවක් ඇති විය. කිසියම් වැදගත් දෙයක් ගැන මිතියා සිත් තැවුලෙන් සිටින බව පෙනේ.

"මල්ලී, මම ගෲසෙන්කාට බොහො ම ආදරෙයි" මිතියා වෙව්ලන කටහඬින් හදිසියෙන්ම කීවේ ය.

"නමුත් අයියා එහාට ගියාම ඔවුන් ගෲසෙන්කාට අයියා එක්ක ජීවත්වීමට ඉඩ දෙන එකක් නැහැ"යි අලෝෂා එක් වර ම කී ය.

"මල්ලිට කිය යුතු තවත් දෙයක් තියෙනවා"යි මිතියා හදිසියෙන් ම හඬ නගා කීවේ ය. "බැරි වෙලාවත් උන් මට මඟ දී හෝ එහි දී හෝ කසයෙන් තළන්න සූදානම් වුණොත් මම උන්ට ඉඩ දෙන්නේ නැහැ. මම උන්ගෙන් එකෙක් මරනවා. එතකොට උන් මට වෙඩි තියා මරාවි. මේ දුක මම අවුරුදු විස්සක් ඉවසිය යුතුයි. මෙහි දී වුණත් උන් මට බොහො ම නැන විදියටයි කතා කරන්නේ. මුරකාරයන් මට බොහො ම අපහාස කරනවා. මම මෙ තැන මුළු රෑ ම නො නිදා මා ගැන තීරණයකට බහින්න කල්පනා කළා. මෙ වැනි දුකක් විඳීමට මම තව ම සූදානම් නැහැ. මට මේ නින්දා අපහාස විඳින්න බැහැ. මා ඉවසීමට කැමැතියි. නමුත් මට මුරකාරයෙක් අපහාස වන පිදියට කතා කළොත් ඉවසා ගැනීමට තරම් ශක්තියක් නැහැ. ගෲසෙන්කා වෙනුවෙන් මට ඕනෑ ම දුකක් විඳින්න පුළුවනි. ගුටිකන්න විතරයි බැරි..........නමුත් උන් ගෲසෙන්කාට මා එක්ක ඉන්න දෙන්නේ නැහැ."

අලෝෂා සෙමෙන් සිනාසුණේ ය.

"මේ කාරණාව ගැන මා කල්පනා කරන්නේ මේ විදියටයි. අන්තිම වශයෙන් මා ඒක අයියාට කියන්න ඕනෑ. මා කවදා වත් අයියාට බොරුවක් නොකියන බව අයියා දන්නවා ඇති. මේ වගේ දුකක් විඳීමට අයියා තව ම සූදානම් නැහැ. අයියාට මෙ වැනි දුකක් විඳින්නත් බැහැ. එපමණක් නො වෙයි, දුක් විඳීමට සූදානමක් නැති අයියාට එ තරම් ආත්ම පරිත්‍යාගයක් කරන්න උවමනාවකුත් නැහැ. අයියා තාත්තා මැරුවා නම් දඬුවම් වින්ද යුතුයි. තාත්තා මරා දඬුවම් විඳීමට මැලි වෙනවා නම් මම ඒ ගැන කනගාටු වෙනවා. එහෙත් අයියා නිර්දෝෂයි. ඒ නිසා මේ වගේ දුකක් විඳීමට අයිතියක් නැහැ. දුක් විඳීමෙන්, දුක මඟින් අලුත් මිනිසකු වීමට අයියා වෑයම් කරනවා නේද? එහෙනම් ඒ අලුත් මිනිසා මතක තබා ගන්න අයියා ගේ මුළු ජීවිතයට ම, අයියා යන යන තැන ඒ අලුත් මිනිසා ගැන මතක තබා ගන්න. එය ප්‍රමාණවත් වෙනවා. මේ දඬුවමට විරුද්ධ වීමෙන්, අයියා ගේ, යුතුකම් ඉටු කිරීම පිළිබඳ කැමැත්ත මුළු ජීවිතය ම ශක්තිමත් වෙනවා. නිතර ඇතිවන එම හැඟීම නිසා සයිබීරියාවට යන්න කලින් අයියාට අලුත් මිනිසකු වෙන්න පුළුවනි. නමුත් සයිබීරියාවේ දී අයියාට කවදා වත් මේ දුක විඳින්න බැහැ. අයියා කැරලි ගසන්න පුළුවනි. සමහර විට අන්තිමේ දී එම දුකට යටත් වෙන්න පුළුවනි. ඒ ගැන අර නීතිඥයා කියාපු කතාව ඇත්තයි. හැමෝටම බැහැ දරුණු දුක් විඳින්න. සමහරක් අයට දුක් විඳින්න ම බැහැ. මේ කාරණාව ගැන මේවා තමයි මගේ අදහස්........... වෙනත් අයට, ඒ කියන්නේ සොල්දාදුවන්ට හා නිලධාරීන්ට වග කියන්න වෙනවා නම්, හිරිහැර වෙනවා නම්, මම අයියාට හිරෙන් පැන යන්න ඉඩ දෙන්නේ නැහැ"යි අලෝෂා සිනා සෙමින් කීවේ ය. "නමුත් සිරකරුවන් භාර ව යන සුපිරින්ටැන්ඩන් ඉවාන්ට කියා තියෙනවා වැඩේ හොඳට කරන්න පුළුවන් බව පැන යන සිරකරුවන් ගැන එ තරම් ලොකු විභාගයක් පවත්වන්නේ නැති ලු. විභාගයක් පැවැත්වුවත් ලෙහෙසියෙන් බේරෙන්න පුළුවන් ලු. මෙ වැනි කටයුත්තක දී වුවත් අත්ලස් දීම වැරැදියි. නමුත් මේ වැඩේ දී මට ඒ ගැන හොඳ නරක කියන්න බැහැ. ඉවාන් හෝ කැතිරිනා හෝ මේ වැඩේ මට භාර කළා නම් සමහර අයට අත්ලස් දෙන්න වෙන බව මා දන්නවා. ඇත්ත කියන්න ඕනෑ. ඒ නිසා අයියා ගේ කටයුතු ගැන හොඳ නරක කියන්න මට පුළුවන් කමක් නැහැ. නමුත් මම කවදාවත් අයියාට දොස් කියන්නේ නැහැ. ඒ නිසා හිරෙන් පැනයාමට කරන මේ සූදානම ගැන මා හරි වැරැද්ද

කියන්න ගියොත් ඒක පුදුම දෙයක් වෙන්න ඕනෑ. දැන් ඉතින් මම හැම දෙයක් ම විස්තර කළා."

"නමුත් මම මට ම දෙස් කියා ගන්නවා"යි මීතියා කී ය. "මම හිරෙන් පැනල යනවා. අපි ඒ ගැන මල්ලි ගේ අදහස් විමසන්නේ නැති ව තීරණයකට පැමිණියා. හිරෙන් පැනල යන්නේ නැති ව මීතියා කරමසෝව්ට වෙන කරන්න පුළුවන් දෙයක් තියෙනව ද? නමුත් ඒ ගැන මම මට ම දෙස් කියා ගන්නවා. මා කරන ලද පව්වලට සමාව දෙන ලෙස මම හැම දා ම යාච්ඤා කරනවා. ක්‍රිස්තුන් වහන්සේ කිව්වෙත් ඒක ම නේද? ක්‍රිස්තුන් වහන්සේ කිව්වෙත් දැන් අපි කියන දෙය ම නේ ද?"

"ඔව්"යි කියා අලෝෂා සිනාසුණේ ය.

"කිසි ම දෙයක් සඟවන්නේ නැති ව සම්පූර්ණ ඇත්ත කීම ගැන මම මල්ලිට බොහො ම ආදරෙයි"යි මීතියා සිනා සෙමින් කී ය. "තුඹ ක්‍රිස්තුන් වහන්සේ කෙනකු වගේ වැඩ කරනවා මම දුටුවා. ඒකට තුඹව සිඹින්න වටිනවා. දැන් ඉතින් මගේ කතාවේ අනෙක් කොටසටත් ඇහුම් කන් දෙන්න. මගේ හදවතේ අනෙක් කොටසත් මම මල්ලිට පෙන්නනන්නම්. මගේ කතාවේ අනෙක් කොටස ගැන මල්ලිට විස්තර කිරීමට මම තීරණය කර ගත්තා. මා ගමන් අවසර පත්‍රයක් හා මුදල් ගෙන අමෙරිකාවට පැනල ගියත්, මා පැන යන්නේ සැපවත් ජීවිතයක් ගත කිරීමට නො ව, සමහර විට සයිබීරියාවට සමාන පිටුවහලකට ය සිතා මට සිත සනසා ගන්න පුළුවනි. මල්ලී, මම ඇමෙරිකාවට කැමැති නැහැ. මට ඇමෙරිකාව පෙන්නන්න බැහැ. ගෲසෙන්කා මා එක්ක සිටියත් මම ඇමෙරිකාවට යාමට කැමැති නැහැ. ගෲසෙන්කා ඇමෙරිකන් ජාතිකයෙක් ය කියා හිතන්න පුළුවන් ද? ඇ රුසියන් ජාතිකයෙක්, මස් ලේ ඇට මිදුළු දක්වා ඈ රුසියන් ජාතිකයෙක්. ඇමෙරිකාවට ගියාට පස්සේ රුසියාවට පැමිණීමට ඇති ආශාවෙන් ඈ පෙළෙන්නට පුළුවනි. හැම මොහොතක් පාසා ම ඈ මා නිසා කාලකණ්ණි ජීවිතයක් ගත කරන්න පුළුවනි. ඈ එවැනි දුකක් විඳිමට කළ වරද කුමක් ද? නමුත් හිතනව ද මට උන් එක්ක සමාදානයෙන් ජීවත් වෙන්න පුළුවන් ය කියා? නැහැ, නැහැ, මට දැනට ම ඇමෙරිකාව පෙන්නන්න බැහැ. උන් සේරම බොහො ම දක්ෂ ඉංජිනේරුවන් වෙන්න පුළුවනි. උන් කවුරු වුවත් මට කමක් නැහැ. උන් යකාට ගියදෙන්. උන් මගේ ජාතියට අයිති නැහැ. මට ගැළපෙන

අය නො වෙයි. මම මගේ රටට ආදරෙයි. මම තක්කඩිකම් කළත් රුසියත් දෙවියන්ට ආදරෙයි. ඇමෙරිකාවේ දී මම බල්ලකු වගේ මැරේවි.''

මිතියා ගේ දෑස හදිසියෙන් ම දීප්තිමත් විය. කටහඬ ශෝකයෙන් වෙව්ලන්නට විය.

''ඉතින් මල්ලී, මම මෙන්න මේ විදියේ ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමට තීරණය කරගත්තා''යි මිතියා සිතේ පැවැති නොසන්සුන් කම යටපත් කර ගනිමින් කී ය. ''මම ග්‍රෑසෙන්කා එක්ක ඇමෙරිකාවට ගිය වහා ම, මනුෂ්‍ය වාසයෙන් තොර වූ වලසුන් සිටින ඈත පළාතක පදිංචි වෙලා ගොවිතැන් කරනවා. මා හිතනවා අපට මිනිසුන් නැති පළාතක් සොයා ගන්න බැරි වන එකක් නැහැ. ඇමෙරිකාවේ බොහො ම ඈත, ක්ෂිතිජයට කිට්ටු වෙන්න තවමත් රතු ඉන්දියන් ජාතිකයන් සිටිනවා ය කියා මට ආරංචියි. අන්න ඒ පළාතට තමයි අපි යන්නේ. පදිංචි වූ වහා ම ඉංග්‍රීසි ඉගෙන ගන්න පටන් ගන්නවා. බොහො ම මහන්සි වී වැඩ කරන අතර අපි භාෂාවත් ඉගෙන ගන්නවා. අවුරුදු තුනකට පස්සේ ඉංග්‍රීසි කාරයන්ටත් වඩා හොඳට අපට ඉංග්‍රීසි කතා කරන්න පුළුවන් වේවි. ඉංග්‍රීසි ඉගෙන ගෙන අවසන් වූ වහා ම අපි අමෙරිකන්කාරයන් වගේ රුසියාවට ආපසු ඇවිදින් පදිංචි වෙනවා. භය වෙන්න එපා, අපි මේ පළාතට එන්නේ නැහැ. අපි රුසියාවේ උතුරේ හෝ දකුණේ හෝ ඈත පළාතක පදිංචි වෙනවා. හැබැයි ග්‍රෑසෙන්කායි මායි කිසි ම කෙනකුට අඳින ගන්න ලැබෙන්නේ නැහැ. ඇමෙරිකාවේ දී මම දොස්තර කෙනකුට කියා මගේ මුහුණ වෙනස් කර ගන්නවා. ඇමෙරිකාවේ දක්ෂ දොස්තරවරු ඉන්නේ නිකම් නො වෙයි. එහෙම කරන්න බැරි වුණොත් මම ඇහැක් කණ කර ගෙන අඩියක් විතර දිගට රැවුල වවනවා. මගේ රැවුල සුදු වේවි. මගේ රටට ඇති ආදරය නිසා මා ඉක්මනට නාකි වෙන්න පුළුවනි. එකට දහයක් ඔට්ටු අල්ලනවා මා කිසි ම කෙනකුට ඇඳින ගන්න බැරි වෙනවට. ඇඳින ගත්තොත් මාව සයිබීරියාවට යවන්න පුළුවනි. කමක් නැහැ. ඒක මගේ අවාසනාවයි. මෙහි දී අපි ඈත පළාතක පදිංචි වෙලා ගොවිතැන් කරනවා. අපි මුළු ජීවිතය ම ඇමරිකන්කාරයන් වගේ ගත කරනවා. අන්තිමේ දී අපට පුළුවනි අපේ රටේ මැරෙන්න. මේක තමයි මා ක්‍රියාවේ යෙදවීමට අදහස් කරන වැඩ පිළිවෙල. මල්ලි ඒක අනුමත කරන්නෙ නැද්ද?''

"මම අනුමත කරනවා"යි අලෝෂා කිවේ සොහොයුරා ගේ කතාවට විරුද්ධ වීමට ඇති අකැමැත්ත නිසා ය.

මිනිත්තුවක් පමණ වේලා නිහඬ ව සිටිය මිතියා ආයේත් හදිසියෙන් ම මෙසේ කීවේ ය.

"උන් බොහො ම ලස්සනට නඩුව ඉදිරිපත් කළා නේද?"

"කොහොම වුණත් අයියාට බේරෙන්න ලැබෙන්නේ නැහැ"යි අලෝෂා සුසුමක් හෙළමින් කී ය.

"ඔව්, මහජනයාට මාව පෙන්නන්න බැරි ව ගියා. කරන්න දෙයක් නැහැ. කොහොම වුණත් මේක මහ දුකක්"යයි මිතියා කාලකණ්ණියකු මෙන් කෙඳිරි ගෑවේ ය.

ඇංයේත් ඔවුන් දෙදෙනා අතරේ මිනිත්තුවක නිශ්ශබ්දතාවක් ඇති විය.

"මගේ හිතේ තියෙන වේදනාව එකපාර ම නැති කර දමන්න මල්ලිට පුළුවනි. කැතිරිනා මං බලන්න එනව ද? නැද්ද? කියන්න. මොනව ද ඈ කිව්වේ?"යි මිතියා හදිසියෙන් ම ඇසුවේ ය.

"කැතිරිනා එනවා ය කිව්වා. නමුත් අද එයි ද කියා දන්නෙ නැහැ. කැතිරිනාටත් හිතට බොහො ම අමාරුයි" අලෝෂා සොහොයුරා දෙස බලා කීවේ ය.

"එහෙම වෙන්න පුළුවනි. කැතිරිනාටත් බොහො ම හිතට අමාරු ඇති. මල්ලී මේ වැඩේ නිසා මට පිස්සු හැදෙන්න පුළුවනි. ගෲසෙන්කා මා දිහැ බලනවා. ඈට මගේ අදහස් තේරෙනවා ඇති. අනේ දෙයියනේ, මගේ හදවත සන්සුන් කරන්න උවමනා කරන්නේ කව්ද? මට උවමනා කරන්නේ කැතිරිනා. මට අසවල් දෙය උවමනා ය කියා මා දන්නව ද? කරමසෝ පවුලේ අය ගේ නිතුවක්කාර නපුරු ගතිගුණ අත්හරින්න බැහැ. නැහැ, මා දුක් විඳින්න තරම් සුදුසු පුද්ගලයෙක් නො වෙයි. මං නක්කඩියෙක්. එපමණයි කියන්න පුළුවන්."

"මේ ඉන්නේ කැතිරිනා"යි අලෝෂා හිටිහැටියේ ම කී ය.

ඒ මොහොතේ දී කැතිරිනා හිටිහැටියේ ම දොර ළඟට පැමිණියා ය. තරුණිය මොහොතක් පමණ වේලා තෝන්තු වූවකු මෙන් මිතියා දෙස බලා සිටියා ය. මිතියා එක් වර ම දෙපයින් නැඟී සිටියේ ය. ඔහු තැති ගත්තාක් මෙන් පෙනිණි.

ඔහු ගේ මුහුණ සුදුමැලි විය. එහෙත් ඔහු ගේ දෙකොල් මත බයාදු කමින් යුත් බැගෑපත් සිනාවක් ඇති විය. හදිසියෙන් ම නොකල්පනාවෙන් ම වාගේ ඔහු ගේ දෑත කැතිරිනා දෙසට දික් විය. ඈ වහා තරුණයා ළඟට ගොස් ඔහු ගේ දෑත ඇගේ දෑතින් ගෙන බලයෙන් ම වාගේ ඈද උඩ හිඳගැනීමට සැලැස්වූවා ය. අනතුරු ව ඔහු ළඟින් හිඳගත් කැතිරිනා ඔහු ගේ දෑත තදින් මිරිකා ගත්තා ය. කීප වරක් ම ඔවුහු එකිනෙකා සමඟ කතා කිරීමට සැරසුණහ. එහෙත් එකිනෙකා වෙතින් නෙත් ඉවත ගත නො හැකි වූවාක් මෙන් නතර වූ හ. අද්භූත සිනාවකින් මුව සරසා ගත් ඔවුහු එකිනෙකා දෙස නිහඬ ව බලා සිටියහ. මෙසේ මිනිත්තු දෙකක් පමණ ගත විය.

"කැතිරිනා මට සමා වෙනව ද?"යි අත්තිමේ දී මීතියා සෙමෙන් ඇසුවේ ය. ඒ සමඟ හෙතෙම ප්‍රීතියෙන් ආලෝක වූ මුහුණින් අලෝෂා දෙස බලා "මා කැතිරිනාගෙන් අහන දෙය මල්ලිට ඇහුණා ද?"යි විමසුවේ ය.

"මීතියා, ඔබ බොහෝ ම ත්‍යාගශීලී කෙනකු නිසා මම ඔබට ආලය කළා"යි කැතිරිනා හදිසියෙන් ම කීවා ය. "මගෙන් සමාවක් ඔබට අවශ්‍ය නැහැ. මට යි ඔබෙන් සමාව අවශ්‍ය වී තියෙන්නේ. මට සමාව දුන්නත් නුදුන්නත් සදහට ම ඔබ මගේ හදවතට විශාල වේදනාවක් ගෙන දෙන තුවාලයකට සමාන වෙනවා. මා ද ඔබේ හදවතට මහත් වේදනාවක් ගෙන දෙන තුවාලයකට සමානයි. එය එසේ ම විය යුතු යි.........." කැතිරිනා හුස්ම ගැනීම පිණිස නතර වූවා ය. අනතුරු ව ආයේත් ඈ වහවහා කතා කළා ය. "මම ආවේ මොනවට ද? ඔබේ දෙපා වැලඳ ගන්න. මේ විදියට ඔබේ අත මිරිකන්න. රිදෙන තෙක් මිරිකන්න. මොස්කව් නුවර සිටින විට මම ඔබේ අත මිරිකුවා ඔබට මතකයි නේ ද? මගේ දෙවියා ඔබයි, මගේ එක ම සැපත ඔබයි. මම ඔබට පිස්සියක වගේ ආලය කරන බව කියන්න ඔබේ අත මිරිකන සැටි මතකයි නේ ද?" මෙසේ කියා වේදනාවෙන් කෙඳිරි ගෑ තරුණිය අනතුරු ව ඉතා ආශාවෙන් මීතියා ගේ අත ගෙන කොල් මත තද කර ගත්තා ය.

ඇගේ දෑසින් කඳුළු ගලන්නට විය. කලබල වූ අලෝෂාට කතා කරගත නො හැකි විය. මෙ වැනි දෙයක් දැකීමට ඔහු සිහිනෙන් වත් බලාපොරොත්තු නො වී ය.

"මිතියා දූත් මගේ ආලය අවසානයි" කැතිරිනා ආයේත් කීවා ය. "අවසන් වූ දෙය මම බොහො ම අගය කොට සලකනවා. ඒක හැම දා ම එහෙම පවතින බව කරුණා කරල මතක තියා ගන්න. වෙන්න තිබුණු දෙයක් සවල්ප වේලාවකට පමණ ඇත්ත වශයෙන් ම සිදු වෙච්ච බව විශ්වාස කරන්න"යි ඈ මිතියාගේ නෙත් දෙස ප්‍රීතියෙන් බලා, මුහුණට ආරූඪ කරගත් සිනාවකින් යුතු ව කීවා ය. "ඔබ වෙන ගැහැනියකට ආලය කරන අතර, මම වෙන මිනිහකුට ආලය කරනවා. ඒ වුණත් මම ඔබට සදහට ම ආලය කරන අතර, ඔබ ද මට සදහට ම ආලය කළ යුතු සි. ඒ බව දන්නව ද? මා කියන දෙය ඇහෙනව ද? මට ආලය කරන්න, මැරෙන තෙක් මට ආලය කරන්න." ඇගේ කට හඬේ තර්ජනාත්මක සවරූපයක් විය.

"කැතිරිනා, මම ඔබට ආලය කරන්නම්........ දන්නව ද, දවස් පහකට කලින්, එදා සවස ක්ලාන්ත වූ ඔබ උස්සා ගෙන යද්දී මට ඔබ ගැන ලොකු ආදරයක් ඇතිවුණා.... ...."යි මිතියා හැම වචනයක් පාසා ම හුස්ම ගනිමින් කීවේ ය. "කැතිරිනා මම සදහට ම ඔබට ආලය කරන්නම්, එය එසේ ම වේ වා."

මෙසේ ඔවුහු දෙදෙනා එකිනෙකාට කිසි ම තේරුමක් නැති උමතු වචන කියමින් කොඳුරන්නට වූ හ.

සමහරවිට ඒ වචනවල කිසි ම සත්‍යයක් නො තිබෙන්නට ඇත. එහෙත් ඒ මොහොතේ දී ඒ සියල්ල ම සත්‍ය විය. ඔවුහු, එකිනෙකාට කියා ගත් වචන සම්පූර්ණයෙන් ම විශ්වාස කළහ.

"කැතිරිනා මම තාත්තා මැරුවා ය කියා විශ්වාස කරනව ද?"යි මිතියා හදිසියෙන් ම ඇසුවේ ය. "දැන් විශ්වාස නො කරන බව මම දන්නවා. නමුත් එදා සාක්ෂි දෙන කොට......... සත්තකින් ම කැතිරිනා මම තාත්තා මැරුව බව විශ්වාස කරන්නේ නැහැ නේද?"

"මම ඔබට විරුද්ධ ව සාක්ෂි දෙන කොට පවා ඔබ තාත්තා මැරුව බව විශ්වාස කළේ නැහැ. මම කවදා වත් විශ්වාස කළේ නැහැ. නමුත් මම ඔබ එක්ක බොහො ම තරහෙන් හිටියේ, ඒ කෝපය නිසා ඒ මොහොතේ දී ඔබට විරුද්ධ ව සාක්ෂි දීමට මා පෙලඹුණා. සාක්ෂි දෙන අතරේ, ඔබ තාත්තා මැරුව බව විශ්වාස කරන ලෙස මම මට ම

බලකර සිටියා. නමුත් සාක්ෂි දීලා අවසන් වූ හැටියේ ම ඒ විශ්වාසය නැති වුණා. මීතියා, ඔබ මේ හැම දෙයක් ම දැන ගත යුතුයි. මා මෙ තැනට පැමිණියේ මට ම දඬුවම් කර ගැනීමට බව මට අමතක වුණා.'' ඈ මෙසේ කීවේ අමුතු සවරයකිනි. මොහොතකට කලින් ඇගේ කට හඬේ පැවැති ආලයේ රසය වෙනස් විය.

''ගැහැනුන්ට දුක් විඳින්න අමාරුයි'' සි මීතියා නොකල්පනා-වෙන් කී ය.

''දැන් මට යන්න දෙන්න''යි කැතිරිනා සෙමෙන් කීවේ රහසක් කියන්නාක් මෙනි. ''මීතියා, මම ඔබ බලන්න ආයේත් පාරක් එන්නම්; දැන් මට මීට වඩා වද විඳින්න බැහැ.''

ඈ හිඳ සිටි තැනින් නැගිට්ටා ය. එහෙත් නැගිටින අතරේ ආයේත් කෑ ගා හිඳගත්තා ය. ඒ මොහොතේ දී ගෘසෙන්කා හදිසියෙන් ම නිහඬ ව කාමරයට ඇතුළු වූවා ය. කිසිවෙක් ඇගේ පැමිණීම බලාපොරොත්තු නො වී ය. කැතිරිනා වහා දොර ළඟට ගියා ය. එහෙත් ගෘසෙන්කා මුණ ගැසුණු වහා ම නතර වූවා ය. ඇගේ මුහුණ පිරිවටයක් මෙන් සුදු විය. ඈ ඉතා සෙමෙන් කෙඳිරි ගා මෙසේ කීවා ය.

''මට සමා වෙන්න.''

කැතිරිනා දෙස රවා බැලූ ගෘසෙන්කා මොහොතකට පමණ නතර වී, ද්වේෂයෙන් පිරි විසකුරු සවරයෙන් කතා කලා ය.

''ළමයා, අපි කවුරුත් බොහො ම නපුරුයි. නුඹයි මායි දෙන්නම නපුරුයි. ඉතින් අපි කොහොම ද එකිනෙකාට සමාව දෙන්නේ? මීතියා බේරාගන්න. මම මැරෙන තෙක් නුඹට වඳින්නම්.''

''ගෘසෙන්කා කැතිරිනාට සමා වෙන්නේ නැද්ද?''යි මීතියා උමතු කෝපයකින් යුතු ව ගෘසෙන්කා ගෙන් කෑගා ඇසුවේ ය.

''හිත තරක් කරගන්න එපා. මම ඔබට මීතියා බේරා දෙන්නම්''යයි රහසක් කියන්නාක් මෙන් සෙමෙන් පැවැසූ කැතිරිනා කාමරයෙන් පිටතට දිව්වා ය.

''මට සමාවෙන්න' යයි කැතිරිනා කිව්වාට පස්සේ කොහොම ද ඇයට සමාව නො දී ඉන්නේ?''යි මීතියා ආයෙත් ගෘසෙන්කා ගෙන් කිපී ඇසුවේ ය.

"අයියා, ගෲසෙන්කාට දෙස් කියන්න එපා. ඇයට දෙස් කීමට අයියාට කිසි ම අයිතියක් නැහැ"යි අලෝෂා කිපී කී ය.

"කැතිරිනා කතා කළේ ඇගේ අහංකාර කමින් මිස අවංක සිතින් නො වෙයි" ගෲසෙන්කා පිළිකුලින් කීවා ය. "ඈ මිතියා බේරා ගත්තොත් ඇය කළ හැම වරදකට ම මම ඇයට සමාව දෙනවා."

අනතුරු ව ගෲසෙන්කා නිහඬ වූයේ සිතේ නළියන කිසියම් දෙයක් මැඬ ගැනීමට වෑයම් කරන්නාක් මෙනි. තවමත් ඈ ප්‍රකෘති සවභාවයට පැමිණ නැත. ගෲසෙන්කා පැමිණියේ කැතිරිනා පැමිණ සිටින බව නො දැන ය. ඒ බව පසු ව හෙළි විය.

"මල්ලී, ඉක්මනට ගිහින් කැතිරිනාට කතා කරන්න...... ඇයට මොනව කියන්න ද මා දන්නේ නැහැ..... නමුත් ඇයට අමනාපයෙන් යන්න දෙන්න එපා........."යි මිතියා අලෝෂාට කෑගා කීවේ ය.

"මම හවස් වෙන්න ඉස්සෙල්ලා එන්නම්"යයි කෑගා පැවසූ අලෝෂා වහා කැතිරිනා පිටු පසින් දිව ගියේ ය.

රෝහල් භූමියෙන් පිටත දී අලෝෂාට කැතිරිනා අල්ලා ගත හැකි විය. වහවහා යමින් සිටි කැතිරිනා, ළඟට පැමිණි අලෝෂාට මෙසේ කීවා ය.

"අර ගෑනි ඉදිරිපිට දී මට ම දඬුවම් කරගන්න මට පුළුවන් කමක් නැහැ. 'මට සමාවෙන්න' කියා මා ඇයට කිව්වේ අවසානය දක්වා මට ම දඬුවම් කර ගැනීම පිණිසයි. ඈ මට සමාව දෙන්නේ නැහැ......සමාව නුදුන් නිසා මම ඇයට බොහො ම කැමැතියි" කැතිරිනා අස්වාභාවික කට හඬින් කීවා ය. ඇගේ දෑස දුෂ්ට අමනාපයකින් දිලිසිණි.

"ඒ වෙලාවේ ගෲසෙන්කා පැමිණෙන බවක් අයියා දැන ගෙන හිටියේ නැහැ. ගෲසෙන්කා නොඑන බව අයියා ස්ථිර ව ම දැන ගෙන හිටියා"යි අලෝෂා කීවේ ය.

"අපි ඒ ගැන කතා නො කර සිටිමු"යි කැතිරිනා වහා කීවා ය. "මට අලෝෂා එක්ක මළ ගෙදර යන්න බැහැ. මම මළ ගෙදරට මල් යැව්වා. මා හිතනවා ඔවුන් ළඟ තවමත් මුදල් ඇති. කරුණා කරලා ගිහින් කියන්න මා කවදාවත් ඔවුන් අත් නොහරින බව.........දැන් කරුණා කරලා මට යන්න ඉඩ දෙන්න. මළ ගෙදර යන්න අලෝෂාට පමා වුණා. අන්න පූජාවට සීනුව ගහනවා......කරුණා කරලා මට යන්න දෙන්න!"

තුන් වන පරිච්ඡේදය

ඉලූෂා ගේ මළගම හා ගලේ කෙටූ කතාව

සැබැවින් ම අලෝෂා මළගමට යෑමට පමා විය. මෙතෙක් වේලා අලෝෂා පැමිණෙන තෙක් මඟ බලා සිටි ඔවුහු අන්තිමේ දී අලෝෂා නැති ව; මලින් සරසන ලද කුඩා මිනී පෙට්ටිය පල්ලියට ගෙනයාමට සූදානම් වූ හ. එය අසරණ කුඩා ඉලූෂා ගෙ මිනී පෙට්ටියයි. මීතියා මිනීමැරුමට වරදකරු වී දෙ දිනකට පස්සේ ඉලූෂා මළේ ය. ඉලූෂා ගේ පාසල් මිත්‍රයෝ ගේට්ටුව ලඟ දී කෑගා අලෝෂා පිළිගත්හ. මෙතෙක් වේලා අලෝෂා පැමිණෙන තෙක් මඟ බලා සිටි ඔවුහු අන්තිමේ දී අලෝෂා පැමිණීම ගැන ප්‍රීති වූ හ. පාසල් පොත් සහිත කුඩා 'බෑග්' කරින් එල්ලා ගත් ශිෂ්‍යයෝ දොළොස් දෙනෙක් පමණ ඉලූෂා ගේ අවමංගල්‍යයට සහභාගි වූ හ. 'මා මළාට පස්සේ තාත්තා අඬන්න පුළුවනි. ඒ නිසා තාත්තා තනි කර දමා නො ගොස් තාත්තා එක්ක ඉන්න''යි ඉලූෂා අන්තිම මොහොතේ දී මිත්‍රයන්ට කීවේ ය. කුඩා ශිෂ්‍යයන්ට ඉලූෂා ගේ ඉල්ලීම හොඳට මතක තිබිණි. කොල්යා කරොස්කින් ඔවුන් ගේ නායකයා විය.

''අලෝෂා ගේ පැමිණීම ගැන අපි බොහො ම සන්තෝෂයි'' කොල්යා අලෝෂාට අත පිරිනමමින් කී ය. ''මෙ තැන සිදුවන දෙය බලා ඉන්න බැහැ. බොහො ම කනගාටුදායකයි. ඉලූෂා ගේ තාත්තා අද බීල නැහැ. අද එයාට බොන්න දෙයක් නැති බව අපි හොඳට දන්නවා. නමුත් බේබද්දකු වගෙයි කටයුතු කරන්නේ. මගේ හිත බොහො ම තදයි. ඒ වුණත් මෙ තැන සිදුවන දෙය නම් මට ඉවසන්න බැහැ. පමා වෙන්නෙ නැති නම් ගෙය ඇතුලට යන්න ඉස්සෙල්ලා ප්‍රශ්නයක් ඇසුවට වරදක් නැද්ද?''

''මොකක් ද ප්‍රශ්නය?''

''ඔබේ ලොකු අයියා වැරදිකාරයෙක් ද නැද්ද? තාත්තා මැරුවේ ගෙදර වැඩකාරයා ද? නැති නම් අයියා ද? ඔබ කියන දෙය මා පිළිගන්නවා. පසු ගිය දවස් හතරේ ම මේ ගැන කල්පනා කළ නිසා මට නිදාගන්න බැරිවුණා.''

"තාත්තා මැරුවේ වැඩකාරයාසි. අයියා නිර්දෝෂයි." අලෝෂා පිළිතුරු දුන්නේ ය.

"ඒක තමයි මාත් කිව්වේ"යි සමූරෝ හදිසියෙන් ම කීවේ ය.

"එහෙනම් මිතියා කරමසෝ විනාශ වෙනවා. අහිංසකයෙක් නීතිය වෙනුවෙන් බිලි දෙනවා"යි කොල්යා කී ය. "ඒ වුණත් මිතියා සන්තෝෂයෙන් ඉන්නවා ඇති. සමහර විට මට එයා ගැන ඊර්ෂ්‍යාවක් ඇති වෙනවා."

"කොහොම ද ඊර්ෂ්‍යාවක් ඇති වෙන්නේ?"යි අලෝෂා පුදුමයෙන් ඇසුවේ ය.

"මටත් කවදා හරි සත්‍යය වෙනුවෙන් ආත්ම පූජාවක් කරන්න පුළුවන් නම් මම බොහො ම කැමැතියි" කොල්යා උනන්දුවෙන් කීවේ ය.

"නමුත් මෙ වැනි හේතුවක් නිසා, මෙ තරම් නින්දා අපහාස විඳගෙන, මෙ තරම් භයානක ලෙස ආත්ම පරිත්‍යාගයක් කිරීම වටින්නේ නැහැ"යි අලෝෂා පැවසුවේ ය.

"මම කැමැතියි මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් ආත්ම පරිත්‍යාගයක් කරන්න. නින්දා අපහාස මම ගණන් ගන්නේ නැහැ. අපේ නම් ගම් අමතක වෙන්න පුළුවනි. මම මිතියා කරමසෝට බොහො ම ගෞරව කරනවා."

"මාත් එහෙම තමයි." ට්‍රෝයි නුවර ඉදි කළ තැනැත්තා පිළිබඳ තොරතුරු දන්නා බව පැවැසූ ශිෂ්‍යයා කිසි ම බලාපොරොත්තුවක් නැති ව හදිස්සියෙන් ම කී ය. එදා ට්‍රෝයි නුවර ගැන තොරතුරු පැවැසූ වේලාවේ දී රතු වූවාක් මෙන් මෙ වරද ඔහු ගේ මූහුණ ලැජ්ජාවෙන් රතු විය.

අලෝෂා කාමරය තුළට ගියේ ය. වටේ සුදු සිහින් රෙද්දෙන් රැලි දමා සරසන ලද නිල්පාට මිනීපෙට්ටියක ඉලූෂා ගේ මිනිය තැන්පත් කර තිබිණි. නෙත් වසාගෙන සිටි ඉලූෂා ගේ දෑත ළය මත එක් කොට තිබිණි. ඔහු ගේ මුහුණ සිහින් වුවත් ස්වරූපය සත්තම් වත් වෙනස් නො වී ය. පුදුමයකට මෙන් මළමිනිය නරක් වූ බව හඟවන දුගඳක් නො වී ය. පපුව උඩ තබා ගෙන සිටි දෑත කිරිගරුඬ ගලින් නෙළුවාක් මෙන් විශේෂ ලක්ෂණයකින් පෙනිණි. ඉලූෂා ගේ අතේ මල් මිටියක් තිබුණු අතර මිනී පෙට්ටිය ඇතුලත හා පිටත ද මලින් සරසා තිබුණේ ය.

මේ මල් එවන ලද්දේ හොලාකෝව් මැතිනිය ගේ දියණිය වන ලීසා විසිනි. කැතිරිනා විසින් ද මල් එවන ලදි. අලෝෂා දොර ඇර ගෙන කාමරයට ඇතුළු වන විට කපිතන් මිය ගිය දරුවා ගේ මෘතශරීරය මත මල් තබමින් සිටියේ ය. කාමරයට පැමිණි අලෝෂා දෙස යන්තම් හිස ඔසවා බැලූ කපිතන් වෙන කිසිවකු දෙස බැලීමට කැමැති නො වී ය. පුතා ගේ මළ මිනිය බැලීමේ ආසාවෙන් යුතු ව කොර වූ දෙපයින් නැගී සිටීමට වෑයම් කරන උමතු බිරිය දෙසවත් බැලීමට ඔහු කැමැති නො වී ය. පුටුවේ හිඳ සිටි නීනා ශිෂ්‍යයන් විසින් මලණුවන් ගේ මිනී පෙට්ටිය ළඟට ගෙනෙන ලදි. පෙට්ටිය මත හිස තබා ගත් නීනා සෙමෙන් ඇඬුවා ය. ඉලූෂා ගේ පියා ගේ මුහුණේ, සිත අවුල් කරවන, නපුරු, ප්‍රාණවත් ස්වභාවයක් දකින්නට තිබිණි. ඔහු ගේ ඉරියව්වල හා කතාවේ ද උමතු ගතියක් විය. "අනේ මගේ දරුවා, මගේ දරුවා"යි ඔහු හැම මිනිත්තුවක් පාසා ම කීවේ ය.

"මටත් මලක් දෙන්න. අර පුතා ගේ අතේ තියෙන සුදු මල අරන් දෙන්න"යි ඉලූෂා ගේ උමතු මව සැමියාට කීවා ය.

ඈ පුතා ගේ අතේ තිබුණු සුදු රෝස මලට ආසාවක් දක්වන්නට ඇත. නැති නම් පුතා සිහිවීම පිණිස පුතා ගේ අතේ තිබෙන මලක් ගෙන තබා ගැනීමට අදහස් කරන්නට ඇත. ඈ මල ගැනීම පිණිස දෑත දික් කරමින් දඟලන්නට වූවා ය.

"මම පුතා ගේ මල් කාටවත් දෙන්නෙ නැහැ. කාටවත් දෙන්නෙ නැහැ"යි කපිතන් තදින් කී ය. "මේ මල් මගේ පුතාට අයිතියි. අම්මට අයිති නැහැ. ඔක්කොම අයිති මගේ පුතාටයි. අම්මට කිසි ම දෙයක් අයිති නැහැ."

"තාත්තේ, අම්මට මලක් දෙන්න"යි නීනා කඳුළින් තෙමුණු මුහුණ උස්සා බලා කීවා ය.

"මම කිසි ම කෙනකුට කිසි ම දෙයක් දෙන්නෙ නැහැ. කාට දුන්නත් අම්මට දෙන්නෙ නැහැ. අම්මා මගේ පුතාට ආදරය කළේ නැහැ. ඈ ඉලූෂා ගේ පොඩි කාලතුවක්කුවත් ගත්තා." මෙසේ කී කපිතන් ඉලූෂා අම්මාට කුඩා කාලතුවක්කුව දුන් හැටි සිහිකොට ඉකිගසමින් අඬන්නට විය.

ඒ අසරණ උමතු ඉතිරිය ද දෑතින් මුහුණ වසා ගෙන අඬන්නට වූවා ය. ඉලූෂා ගේ පියා මිනීපෙට්ටිය ලඟින් ඈත්

නොවන බව දුටු ශිෂ්‍යයෝ, මිනිය ගෙනයාමට නියම වේලාව පැමිණ ඇති හෙයින් හදිසියෙන් ම මිනී පෙට්ටිය වට කොට උස්සා ගත්හ.

"මගේ පුතා පල්ලිය වත්තේ වළලන්න එපා"යි ඉලූෂා ගේ පියා හදිසියෙන් ම කීවේ ය. "මම පුතා ගල ළඟ වළලනවා. ඉලූෂා කිව්වා ගල ළඟින් වළලන්න ය කියා. මම දෙන්නෙ නැහැ පුතා පල්ලිය වත්තට ගෙනියන්න."

ඉලූෂා ගල ළඟින් වළලන බව පසු ගිය තෙ දින තුළ ම කපිතන් නිතර කීවේ ය. එහෙත්, අලෝෂා, කොල්යා, ගෙවල් අයිතිකාරිය, ඇගේ නැඟනිය හා ශිෂ්‍යයෝ එම අදහසට විරුද්ධ වූ හ.

"හරියට එල්ලිලා මැරිච්ච එකෙක් වගේ මේ දරුවා අපිරිසුදු ගලක් ළඟ වළලන්නේ මොනවට ද?"යි මහලු ගෙවල් අයිති කාරිය සැරවෙමින් කීවා ය. "පල්ලිය වත්ත ශුද්ධ වූ ස්ථානයක්. එ තැන කුරුස සිටවා තියෙනවා. එ තැන දී කවුරුත් මේ දරුවා වෙනුවෙන් යාච්ඤා කරාවි. එ තැනට පල්ලියේ ගීතිකා කියනවා ඇහෙනවා. පාදිලි උන්නාන්සේ නො තරම් හොඳට බයිබලය කියවනවා ද කියතොත් වල උඩ සිට කියවනවා වගේ ඉලූෂාට ඇසේවි."

"කැමැති තැනකට අරන් පලයල්ලා"යි අන්තිමේ දී ඉලූෂා ගේ පියා අත වනා කියා අදහසට කැමැති විය. ශිෂ්‍යයෝ මිනීපෙට්ටිය උස්සා ගත්හ. එහෙත් ඉලූෂා ගේ අම්මා ළඟින් යන විට මදක් නතර වී මිනීපෙට්ටිය පහත් කළේ අන්තිම වතාවට දරුවාගෙන් සමු ගැනීමට ඇයට හැකි වන ලෙසට ය.

පසු ගිය තෙදින තුළ ඈත සිට දුටු පෙම්බර දරුවා ගේ මුහුණ හදිසියෙන් ම ළඟින් දුටු හැටියේ ම මව ගේ සර්වාංගය ම වෙවුලන්නට පටන් ගත්තේ ය. අනතුරු ව ඇ උමතු වූවක මෙන් මිනීපෙට්ටිය උඩින් හිස වනන්නට වූවා ය.

"අම්මේ, මල්ලිගේ මිනිය උඩින් කුරුසියේ ලකුණ ඇඳ ආශීර්වාද කොට සිඹින්න"යයි නීනා කෑගා කීවා ය.

එහෙත් අම්මා වචනයක් වත් නො කියා සවශක්තියෙන් ම ක්‍රියා කරන යන්ත්‍රයක් මෙන් නො නවත්වා හිස වනන්නට වූවා ය. දුක් ශෝකය නිසා මුහුණ විරූප විය. හදිසියෙන් ම ඈ මිට මොලවා පපුවට ගසා ගත්තා ය. ශිෂ්‍යයෝ වහා මිනී පෙට්ටිය උස්සාගෙන ඇත් වූ හ. නීනා අන්තිම වරට, මිය ගිය

මලණුවන් ගේ තොල් මත තොල් තබා සිඹ සමුගත්තා ය. අලෝෂා ගෙදරින් පිටවන අතරේ ගෙවල් අයිති කාරියට කතා කොට, රෝගාතුර වී සිටින මවත් දියණියත් බලාගන්නා ලෙස ඉල්ලා සිටියේ ය. එහෙත් අලෝෂා කියන තෙක් බලා නොසිටි ඉතිරිය "මම ගෙදර නතර වී ඔවුන් බලාගන්නම්. අපිත් ක්‍රිස්තියානි කාරයෝ"යි කීවා ය. මෙසේ කියන අතරේ ඈ ඉකිගසමින් ඇඬුවා ය.

මිනිය උස්සා ගෙන යාමට වැඩි දුරක් නැත. දේවස්ථානයට ඇති දුර බඹ තුන්සියකට වඩා නැත. එය පැහැමත් දිනයකි. වඩා හිම වැටී නැත. දේවස්ථානයේ සාණ්ඨාව තවමත් නාද වෙයි. ග්‍රීෂ්මයට අඳින කොට පරණ කබායක් ඇඳ, පරණ හිස් වැස්මක් අතින් ගෙන, එහෙත් මුඩු හිස, හිස් වැස්මෙන් නො වසාගත් ඉලූෂා ගේ පියා වල්මත් වූවකු සේ මහත් කල-බලයෙන් මිනීපෙට්ටිය පිටුපසින් දුවන්නට විය. ඔහු සිහි කල්පනාවෙන් සිටින බවක් නො පෙනේ. වරක් ඔහු මිනී පෙට්ටියේ හිස පැත්තට අත ගැසීමට ගොස් පෙට්ටිය උස්සා ගෙන යන අයට මහත් අවහිරයක් කෙළේ ය. අනෙක් මොහොතේ පැත්තෙන් ගොස් පෙට්ටියට අත ගැසීමට වෑයම් කෙළේ ය. පෙට්ටිය උඩ තිබුණු මලක් බිම වැටුණු විට, එම මලේ වැටීම මත ලොවේ හැම දෙයක් ම රැඳී පවතින්නාක් මෙන් වහා මල ඇහිඳ ගැනීමට දිව්වේ ය.

"පාන් ගෙඩිය ගේන්න අමතක වුණා"යි ඔහු හදිසියෙන් ම පසුතැවෙමින් කී ය. පාන් ගෙඩිය ඔහු ගෙනා බවත්, එය ඔහු ගේ සාක්කුවේ තිබෙන බවත්, ශිෂ්‍යයෝ ඔහුට මතක් කර දුන්හ. ඔහු වහා සාක්කුවට අත දමා පාන් ගෙඩිය ගෙන බලා සිත සනසා ගත්තේ ය.

"ඉලූෂා මට මේ පාන් ගෙඩිය ගැන නිතර ම මතක් කළා"යි ඔහු අලෝෂාට විස්තර කරමින් කී ය. "දවසක් රෑ මම පුතා ළඟ ඉඳගෙන ඉන්න කොට පුතා මට කතා කරල 'තාත්තේ මා වැළලුවාට පස්සේ වල උඩ පාන් කෑලි ටිකක් දමන්න. එතකොට පාන් කෑලි ඇහිඳ ගැනීමට ගේකුරුල්ලන් එවි. මට උන්ගේ කෑගෑම අහන්න පුළුවනි. එතකොට මා තනියෙන් නොසිටින බව දැනගෙන මට සතුටු වෙන්න පුළුවනි'යි කිව්වා."

"ඒ අදහස බොහො ම හොඳයි. අපි නිතර ම ඉලූෂා ගේ වල උඩ පාන් කෑලි දමමු"යි අලෝෂා කී ය.

“හැම දා ම දමන්න පුළුවනි, හැම දා ම දමන්න පුළුවනි.” යි කපිතන් කීවේ අලෝෂා ගේ අදහස ගැන සතුටු වෙමිනි.

අන්තිමේ දී දේවස්ථානයට පැමිණි ඔවුහු මිනීපෙට්ටිය දේවස්ථානය මැද තැබූ හ. පෙට්ටිය වට කරගත් ශිෂ්‍යයෝ භක්තියෙන් හිස නමාගෙන පූජාව අවසන් වන තෙක් සිටියහ. එය දිළිඳු පෙනුමෙන් යුත් පැරණි දේවස්ථානයකි. සුරුවම් වැඩි හරියක් තබා තිබුණේ කිසි ම සැරසිල්ලක් ඇති ව නො වේ. නිවිහැන්නේ යාච්ඤා කිරීමට මෙය කදිම ස්ථානයකි. පූජාව පැවැති කාලයේ දී මඳක් නිහඬ ව සිටි ඉලූෂා ගේ පියා ඇතැම් විට නොකල්පනාවෙන් ම වාගේ කෑගා ඇඬුවේ ය. එය සිතේ වේදනාවෙන් හටගත් ආකූල වූ කෑගැමක් වැන්න. මිනීපෙට්ටිය වසා තිබුණු වැස්ම හෝ මල් වඩමක් හෝ සකස් කිරීමට ඔහු වරින් වර මිනීපෙට්ටිය ළඟට ගියේ ය. පහන් රුකකින් ඉටිපන්දමක් ගැලවී වැටුණු විට වහා එය සවිකිරීමට යන හෙතෙම පින වේලාවක් ගත වන තුරු ඉටිපන්දම සවි කර ගත නො හැකි ව දඟලයි. අනතුරු ව සන්සුන් වන හෙතෙම ආකූල වූ නො සන්සුන් හිස් බැල්මෙන් මිනීපෙට්ටියේ හිස ළඟ බලා සිටියි. සන්දේශය කියවා නිම කළ වහා ම ඔහු, ළඟ සිටි අලෝෂාට කතාකොට සන්දේශය හරිහැටි නොකී බව කී ය. එහෙත් ඒ ගැන විස්තරයක් නො කෙළේ ය. ‘කුඩා සුර දූතයා’ නමැති ගීයට සහභාගි වූ හෙතෙම බිම දණගසා නළල ගල් මත රඳවා ගෙන බොහෝ වේලා බලා සිටියේ ය.

අන්තිමේ දී අවමංගල පූජාව ආරම්භ විය. රැස් ව සිටි පිරිසට ඉටිපන්දම බැගින් දෙන ලදී. ඉලූෂා ගේ පියා ආයේත් නො සන්සුන් විය. එහෙත් සිත කිතිකවා අනුකම්පාව ඇති කරවන අවමංගල ගීතිකා ඔහු ගේ හැඟීම් සතපවා ආත්මය අවදි කෙළේ ය. හදිසියෙන් ම මැලවුණාක් මෙන් පෙනුණ හෙතෙම වරින් වර ඉතා සෙමෙන් ඉකිගසමින් අඬන්නට විය. මුල දී ඇඬීම මැඩ ගැනීමට වෑයම් කළ හෙතෙම පසු ව මහ හඬින් අඬා වැලපුණේ ය. මිනියට කතා කොට පෙට්ටිය වැසීමට සැරසෙන විට, පුතා වැසීමට ඉඩ නොදෙන බව හඟවන්නාක් මෙන් දෑත වැනූ හෙතෙම අනතුරු ව මහත් ආශාවෙන් නො නවත්වා ම පුතා ගේ මුහුණ සිඹින්නට විය. දරුවා සිඹීම නවත්වා මිනිය ළඟින් ඉවත් වීමට අන්තිමේ දී ශිෂ්‍යයෝ කපිතන් කැමැති කරවා ගත්හ. එහෙත් පඩි පෙළ බැස ගිය හෙතෙම හදිසියෙන් ම ආපසු හැරී අත දික් කොට මිනීපෙට්ටිය උඩ තිබුණු මල්වලින් සවල්පයක් කඩා ගත්තේ ය.

ඒ මල් දෙස බැලූ ඔහු තුල හදිසියෙන් ම අලුත් අදහසක් ඇති වූ බව පෙනිණි. එ හෙයින් ඔහුට මිනිත්තුවකට පමණ දරු මල ශෝකය අමතක විය. අවට සිදුවන දෙය අමතක විය. විකිත් විත කල්පනාකාරී වූ හෙතෙම, මිනී පෙට්ටිය උස්සා වල ළඟට ගෙන යන විට ඊට බාධා නො කෙළේ ය. දේවස්ථානයට නුදුරින් කපන ලද එම වළට විශාල වියදමක් දරා තිබිණි. වළට මුදල් ගෙවන ලද්දේ කැතිරිනා විසිනි. මිනී වල කැපූ මිනිස්සු, ව්‍යවහාරික ආගමික චාරිත්‍රවලින් පසුව මිනී පෙට්ටිය වළට බැවෝ ය. අතින් මල් ගෙන සිටි ඉලූෂා ගේ පියා කො තරම් පහත් වී වළට එබී බැලුවේ ද කියතොත්, ශිෂ්‍යයෝ ඔහු ගේ කබායෙන් අල්ලා ඇද්දෝ ය. එහි සිදුවන දෙය ගැන ඔහුට පැහැදිලි අවබෝධයක් නො වී ය. වල වසන විට හෙතෙම මහත් උනන්දුවක් දක්වා අත දික් කොට වළට වැටෙන පස් පෙන්නා මොනවා දෝ කීවේ ය. එහෙත් ඔහු කී දෙය කිසිවකුට නො තේරිණි. ආයේත් වරක් ඔහු නිහඬ විය. අනතුරු ව පාන්ගෙඩිය කඩා දැමිය යුතු බව මතක් කල විට ඔහු, කො තරම් කලබල වූයේ ද කියතොත්, වහා සාක්කුවට අත දමා පාන් ගෙඩිය ගෙන කෑලි කඩමින් වල උඩ දමන්නට විය. "දූක් ඉතින් කුඩා ගේකුරුල්ලනි, ඇවිදින් පාන් කෑලි කාපල්ලා"යි ඔහු උනන්දුවෙන් කී ය. අනේ මල් තබා ගෙන පාන්ගෙඩිය කෑලිවලට කැඩිය නො හැකි බැවින් මල් මිටිය තවෙකකුට දිය යුතු යයි ශිෂ්‍යයෙක් කී ය. එහෙත් කපිතන් ඊට කැමැති නො වී ය යම් කිසිවෙක් තමා ගේ මල් සොරා ගනී යයි සිතා ඔහු හදිසියෙන් ම තැති ගත්තේ ය. අනතුරු ව, අන්තිම වරට වල දෙස බලා, වල වසා ඒ මත පාන්කෑලි දමා හැම දෙයක් ම අවසන් කොට ඇති බව දැන ගත් හෙතෙම කිසි ම බලාපොරොත්තුවක් නැති ව හදිසියෙන් ම ආපසු හැරී කලබලයක් නො දක්වා ගෙදර ගියේ ය ඔහු ගේ ගමන වේගවත් විය. වැඩි වේලා යන්නට පෙර ඔහු දුවන්නට විය. අලෝෂා හා ශිෂ්‍යයෝ ද කපිතන් පසු පසින් දිව ගියෝ ය.

"මේ මල් ගෙනියන්නේ අම්මට දෙන්නයි. අපි අම්මට නපුරු කම් කළා. අපි ඇගේ හිත නරක් කළා"යි ඔහු හදිසියෙන් ම කී ය.

එ වේලේ දැඩි සීතලයක් පැවැති හෙයින් හිස්වැස්ම දමා ගන්නා ලෙස කවුදෝ කෑගා කී ය. ඉන් කෝප වූ බව හැඟවූ කපිතන් හිස්වැස් ම විසිකොට "මට තොප්පිය උවමනා නැහැ, මට තොප්පිය උවමනා නැහැ"යි කියා කෑගෑවේ ය. සමුරෝ

හිස්වැස්ම ඇඟිද ගෙන කපිතන් පසු පසින් ගියේ ය. ශිෂ්‍යයෝ අඬන්නට වූ හ. කොල්යා හා ට්‍රෝසි නගරය ගැන තොරතුරු දැන සිටි ශිෂ්‍යයා අනෙක් ශිෂ්‍යයන්ට වඩා ඇඬුවේ ය. කපිතන් ගේ හිස්වැස්ම අතින් ගෙන සිටි සමුරෝ ද අඬන්නට විය. එහෙත් ඔහු දිව ගොස් බිම හිම මත තිබුණු රතු ගඩොළු කැටයක් ගෙන පියාසර කරමින් සිටි ගේ කුරුල්ලන් රැලකට දමා ගැසුවේ ය. ගල් පහර කුරුල්ලන්ට වැදුණේ නැත. ඔහු අංශේක් අඬමින් ගමන් කෙළේ ය. ගෙදරට අඩක් පමණ දුර තිබිය දී හදිසියෙන් ම මඟ නතර වූ කපිතන් යම් කිසිවක් සිහි කිරීමට මෙන් මිනිත්තු භාගයක් පමණ බලා සිට, අනතුරු ව ආයේත් ආපසු හැරී මිනීවල දෙසට දුවන්නට විය. එහෙත් ශිෂ්‍යයෝ වහා ඔහු පසු පසින් දිවගොස් අල්ලා නතර කළහ. පහර කෑ එකකු මෙන් බිම වැටුණු කපිතන්, හිම මත දඟලමින් විලාප නඟන්නට විය. "ඉලූෂා, මගේ පුතා, මගේ පුතා" කියමින් ඉහ් කෑගැවේ ය. අලෝෂා හා කොල්යා කපිතන් නැඟිටවා ගෙදර යාමට ඉතා අමාරුවෙන් කැමැති කරවා ගත්හ.

"තිර්ගීත මිනිහා එඩිතර විය යුතුයි" කොල්යා කීවේ ය.

"තාත්තා ඔය මල් පොඩි කරනවා. මතකයි නේද මල් ගෙනෙන තෙක් අම්මා බලා ඉන්න බව? ඉලූෂා ගේ මල් තුදුන්න නිසා අම්මා පුටුවේ ඉඳගෙන අඬනවා. ඉලූෂා ගේ ඇඳත් තව ම තියෙනවා........." යි අලෝෂා කීවේ ය.

"ඔව් ඔව්, අපි අම්මා ළඟට යමු" යි කපිතන් හදිසියෙන් ම බිරිය මතක් කරමින් කී ය. "ඒ ගොල්ලෝ පුතා ගේ පොඩි ඇඳ ලෑස්ති කරාවි" යි ඔහු කීවේ සිතේ හටගත් නියම භීතියෙනි. ඔහු වහා නැඟිට ආපසු ගෙදර දිව්වේ ය. ඔවුන් සිටි තැන සිට ගෙදරට වැඩි දුරක් නැති හෙයින් හැම දෙනා ම එක විට ම වාගේ ගෙදරට පැමිණියහ. වහා දොර හැරිය කපිතන් මීට ස්වල්ප වේලාවකට පෙර කලහ කරගත් බිරියට කතා කෙළේ ය.

"අම්මේ, අනේ මගේ සොර වෙච්ච අම්මේ, අම්මාට දෙන්න ය කියා ඉලූෂා මේ මල් එව්වා" යි පැවැසූ කපිතන්, හිම වැටී දඟලන විට නැළුණු මල් මිටිය බිරියට දුන්නේ ය.

එහෙත් ඒ මොහොතේ දී හෙතෙම ඇඳ ළඟ මූල්ලේ තබන ලද ඉලූෂා ගේ පරණ පාවහන් සුවල දුටුවේ ය. ඒ පාවහන් එ තැන තබන ලද්දේ ගෙවල් අයිතිකාරිය විසිනි. පාවහන් දුටු කපිතන් දැන උස්සා ඇඳ මූල්ලට දිව ගොස් බිම දණගසා

ඉන් පාවහනක් ගෙන ආදරයෙන් සිඹින්නට පටන් ගත්තේ ය. "අනේ මගේ පුතා, මගේ පුතා, කෝ පුතා ගේ පොඩි කකුල් දෙක?"යි කියමින් ඇඬුවේ ය.

"කෝ මගේ පුතා? උඹලා කොහෙ ද මගේ පුතා ගෙනිච්චේ?"යි කියමින් උමතු මව හද කම්පා කරමින් කෑගෑවා ය.

නීනා ද අඬන්නට පටන් ගත්තා ය. කොල්යා කාමරයෙන් එළියට පැන්නේ ය. අනෙක් ශිෂ්‍යයෝ ද ඔහු අනුගමනය කළහ. අන්තිමේ දී අලෝෂා ද කාමරයෙන් එළියට ආවේ ය.

"ඒ ඇත්තෝ හොඳට ඇඬුව දෙන්. මේ වෙලාවේ ඒ ඇත්තන් ගේ සිත් හැදීමට වෑයම් කිරීමෙන් වැඩක් වෙන්නේ නැහැ. අපි ටික වෙලාවක් එළියෙ ඉඳලා කාමරයට යමු"යි අලෝෂා කීවේ ය.

"ඔව්, ඒක ඇත්තයි. අපට ඒ ඇත්තන් ගේ සිත් හදන්න බැහැ"යි කොල්යා, අලෝෂා ගේ අදහසට එකඟ වෙමින් කී ය. "මට නම් බොහො ම කනගාටුයි. ආයේත් වරක් ඉලූෂා ජීවත් කරවන්න පුළුවන් නම් මම ඕනෑ ම දෙයක් දෙන්න කැමැතියි" අනතුරු ව කොල්යා හදිසියෙන් ම කිසිවකුට නො ඇසෙන්නට ඉතා සෙමෙන් කීවේ ය.

"මාත් බොහො ම කැමැතියි" අලෝෂා ද කී ය.

"මොකද කල්පනා ව, අද රෑට අපි මෙහාට එමු ද? ඉලූෂා ගේ තාත්තා අද රෑට බොන්න පුළුවනි."

"සමහර විට බොන්න පුළුවනි. අපි දෙන්නා විතරක් රෑට එමු. අපි පැයක් විතර නතර වෙලා, අම්මාටත් නීනාටත් කතා කරලා යමු. අපි සේරම ආවොත් ඒ ගොල්ලන්ට ආයේත් ඉලූෂා ගැන මතක් වෙන්න පුළුවනි"යි අලෝෂා යෝජනා කෙළේ ය.

"ගෙවල් අයිතිකාරිය කෑම ලෑස්ති කරලා දානයක් දෙනවා. පූජකතුමාත් එනවා. අපි ආපසු යමු ද?"

"යමු"යි අලෝෂා කැමැති වෙමින් කී ය.

"මේක මහ පුදුම දෙයක්. මෙ පමණ වේලා ශෝකයෙන් අඬාලා හිටි හැටියේ ම පැන්කේක් කනවා. අපේ ආගමේ හැටියට බොහො ම අස්වාභාවිකයි."

"ඒ ගොල්ලෝ මාළුත් කනවා"යි ට්‍රෝයි සගරය ගැන තොරතුරු සොයාගත් ශිෂ්‍යයා හඬ නගා කීවේ ය.

"කටූෂා කරුණා කරලා උඹේ මෝඩ කතාවෙන් අපට බාධා නො කර හිටපන්. විශේෂයෙන් ම උඹට කතා නො කරන විට, උඹ ඉන්නවද නැද්ද කියා දැනගැනීමට තරම් වත් සැලැකිල්ලක් නො දක්වන විට, අපේ කතාවට බාධා නො කර හිටපන්"යයි කොල්යා කෝපයෙන් කීවේ ය. කටූෂා ගේ මූහුණ විළියෙන් රතු විය. ඔහු කතා කිරීමට නැති ගත්තේ ය. ඒ අතරේ ඔවුහු අඩි පාර දිගේ ගමන් කරමින් සිටියෝ ය. හදිසියෙන් ම සමූරෝ ගලක් පෙන්නමින් "අන්න තියෙනවා ඉලූෂා ගේ ගල, ඒ ගල ළඟ තමයි ඉලූෂා වළලන්න කිව්වේ"යි කීවේ ය.

ඔවුහු ගල ළඟ නතර වී නිහඬ ව ගල දෙස බලා සිටියෝ ය. ඉලූෂා තාත්තා බදාගෙන, 'අනේ තාත්තේ, අර මිනිහා තාත්තාට ගහපු හැටි' යි කියමින් ඇඬූ සැටි ගැන ඉලූෂා ගේ තාත්තා එදා තමාට කළ සම්පූර්ණ විස්තරය අලෝෂාට චිත්‍රයක් මෙන් හදිසියෙන් ම පෙනෙන්නට විය. ඔහු ගේ ආත්මය ගිටි හැටියේ ම වේගවත් විය. ඉලූෂා ගේ මිත්‍රයන් ගේ පැහැමත් ප්‍රසන්න මූහුණු දෙස කල්පනාවෙන් හා සැලැකිල්ලෙන් ද බැලූ අලෝෂා හදිසියෙන් ම මෙසේ කීවේ ය.

'මේ ස්ථානයේ දී මම මේ ළමයින්ට වචනයක් කියන්න කැමැතියි."

අලෝෂා වට කර ගත් ළමයි සැලැකිල්ලෙන් හා බලාපොරොත්තුවෙන් ද පිරි නෙතින් අලෝෂා දෙස බලා සිටියෝ ය.

"ළමයිනේ, වැඩි කල් යන්නට පෙර අපි එකිනෙකාගෙන් වෙන් විය යුතුයි. මම දැන් මෙහි නතර වී සිටින්නේ මගේ අයියලා දෙන්නා නිසයි. ලොකු අයියා සයිබීරියාවට යනවා, පොඩි අයියාට බොහො ම අමාරුයි. මම මේ නගරය අත්හැර දමා, යන්න බලාපොරොත්තු වන නිසා බොහෝ කාලයක් යන තුරු අපට ආයේත් හමු වෙන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා පළමු ව, ඉලූෂා අමතක නො කිරීමටත්, දෙවනු ව අප එකිනෙකා අමතක නො කිරීමටත්, අපි ඉලූෂා ගේ ගල ළඟ දී එකඟ වෙමු! අනාගතයේ දී අපට කුමක් වුවත්, තව අවුරුදු විස්සක් ගත වනතුරු අපට එකිනෙකා හමුවීමට නො ලැබුණත්, අපි වරක් ගල් ගැසූ ඉලූෂා වළලපු සැටි මතක තබා ගනිමු! පාලම ළඟ දී ඉලූෂාට ගල් ගැසූ සැටි මතකයි නේ ද? නමුත් පස්සේ අපි ඉලූෂාට බොහො ම ආදරය කළ සැටි මතක තබා ගනිමු! ඉලූෂා බොහො ම හොඳ ළමයෙක්, නිර්භීත ළමයෙක්. තාත්තාට බොහො ම ගෞරව කළ ඉලූෂා තාත්තාට අපහාස

කල විට ඊට විරුද්ධ ව එඩිතර ව සටන් කලා. ඒ නිසා පලමු ව අපි ජීවත් ව සිටින තෙක් ඉලූෂා සිහි කරමු! සමහර විට අපි උසස් තනතුරුවලට පත් වී ඉතා වැදගත් කටයුතුවල යෙදෙන්නට පුළුවනි; ගරු බුහුමන් ලබන්නට පුළුවනි; නැති නම් අපට අයහපත් කල දසාවක් ලබන්නට පුළුවනි. අපට මොනවා වුවත්, කවදා වත් ඉලූෂා අමතක කරන්න එපා. සමහර විට අපට වඩා හොඳ ගතිගුණ අසරණ ඉලූෂා තුළ තියෙන්න ඇති. අසරණ ඉලූෂාට ආදරය කිරීම පිණිස අප කවුරුත් යහපත් කරුණාවන්ත හැඟීමෙන් සමගි වී සිටින විට, අපි බොහො ම සන්තෝෂයෙන් මෙ තැන සිටිය බව කවදා වත් අමතක කරන්න එපා! මගේ කුඩා පරෙවියනි, මේ ළමයි හරියට පරෙවියන් වගෙයි. මේ ළමයින්ට මම 'පරෙවියන්' කියා කතා කරන්නම්. මේ මොහොතේ දී මේ ළමයින් ගේ මූහුණු දෙස බලන විට අර නිල්පාට ලස්සන පරෙවියන් මතක් වෙනවා. සමහර විට ළමයින්ට මා දැන් කියන දෙය නො තේරෙන්න පුළුවනි. මා නිතර ම වාගේ කතා කරන්නේ නො තේරෙන විදියටයි. තේරුණත් නො තේරුණත් මේ ළමයි මගේ අදහස්වලට එකඟ වෙන්න පුළුවනි. අපේ ළමා කාලය හා අප වාසය කල අපේ නිවෙස ගැන මතක තියෙන දේවල් තරම් අනාගතයේ දී අපේ ජීවිතය හැඩගැස්සිය හැකි උතුම්, ශක්තිමත්, පිරිසුදු දේවල් නැති බව අපි දැනගත යුතු යි. මිනිසුන් බොහෝ විට අපේ අධ්‍යාපනය ගැන නොයෙක් දේවල් කියනවා. නමුත් ළමා කාලයේ සිට මතක තියෙන, හොඳ, පිරිසුදු දේවල් අප ලබන හොඳ ම අධ්‍යාපනය විය හැකියි. යම්කිසි කෙනකුට එ වැනි යහපත් දේවල් මතක තියෙනවා නම් ජීවිතය අවසන් වන තෙක් ඒ දේවල් නිසා ඔහු ආරක්ෂා වෙනවා. එක ම හොඳ දෙයක් හරි අපට මතක තිබුණොත් සමහර විට, යම්කිසි දවසක ඒ මතකය අපේ හැලවිල්ලට උපකාර වෙන්න පුළුවනි. සමහර විට අනාගතයේ දී අපි නරක නපුරු මිනිසුන් වෙන්න පුළුවනි. නරක වැඩවලින් වැලකී සිටින්නට නො හැකි වෙන්න පුළුවනි. දැන් කොල්යා මතක් කලා වගේ 'මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් මම දුක් විඳිමි' කියන අයට අපි සිනාසෙන්න පුළුවනි. නපුරු අදහසින් යුතු ව අපහාස කරන්න පුළුවනි. අපි කො තරම් නරක අය වුවත් (දෙයියන්ගේ පිහිටෙන් අප කවදා වත් නරක අය නො විය යුතුයි) අපි ඉලූෂා වලලාපු හැටි, අන්තිම දවස්වල දී අපි ඉලූෂාට ආදරය කල හැටි, අපි මේ ගල ලඟ එකතු වී යහළුවන් වගේ කතා කල හැටි, සිහි කරන විට, අප කො තරම් නපුරු

සිත් ඇති අය වුවත්, මේ මොහොතේ දී ඉතා යහපත් කරුණාවන්ත අය ලෙස ක්‍රියා කළ සැටි සිහිකොට යටි සිතින් වත් සිනාසෙන්න හොඳ නැහැ. සමහර විට මේ මතකය නිසා අපට නපුරු දේවල්වලින් වැළකී සිටින්නට පුළුවන් වේවි. 'ඔව්, එදා මම බොහො ම අවංක ව නිර්භීත ව ක්‍රියා කළා' කියා මතක් කොට නපුරු අදහස්වලින් වැළකී සිටින්නට පුළුවන් වේවි. තමා ගැන ම සිතා සිනාසෙන්න පුළුවනි. එහෙම සිනාසුණාට වරදක් නැහැ. බොහෝ විට මිනිස්සු යහපත් කාරුණික දේවල් ගැන සිනාසෙනවා. එහෙම සිනා-සෙන්නේ හොඳ කල්පනාවෙන් නො වෙයි. නමුත් එහෙම සිනාසුණත් 'සිනාසීමෙත් මා කළේ වරදක්, මෙ වැනි දේවල් ගැන සිනාසෙන්න හොඳ නැහැ'යි ඔහු එක් වර ම යටි සිතින් කියන බව මට සහතික කරලා කියන්න පුළුවනි."

"අලෝෂා කියන දෙය අපට තේරුම් ගන්න පුළුවනි. එය එසේ ම විය යුතුයි!" කොල්යා කීවේ ය. ඔහු ගේ දෑසින් කාන්තිය විහිදිණි.

අලෝෂා ගේ කතාවෙන් උනන්දු වූ අනෙක් ශිෂ්‍යයන්ට ද යම් කිසිවක් කීමට අවශ්‍ය විය. එහෙත් ඒ ආශාව මැඩගත් ඔවුහු සිතේ අවදි වූ හැඟීම්වලින් යුතු ව අලෝෂා දෙස සැල-කිල්ලෙන් බලා සිටියහ.

"මා මේ කාරණාව කියන්නේ අපි නරක අය වුණොත්; නමුත් අපි නරක අය වීමට හේතුවක් නැහැ; එහෙම නේ ද?"යි අලෝෂා ශිෂ්‍යයන් ගෙන් විමසුවේ ය. "පළමු ව අපි බොහො ම කරුණාවන්ත අය විය යුතුයි. අවංක විය යුතුයි. දෙවනුව අපි කවදාවත් එකිනෙකා අමතක නොකළ යුතුයි. මම ඒක නව පාරක් කියනවා. මම කවදා වත් මේ ළමයින් ගෙන් කිසි ම කෙනෙක් අමතක නො කරන බවට පොරොන්දු වෙනවා. දැන් මා දිහා බලා සිටින හැම මුහුණක් ම මම හැම දා ම මතක තියා ගන්නවා. අවුරුදු තිහකට පසු ව වුවත් මතක තියා ගන්නවා. කටූෂා මෙ තැන සිටියත් නො සිටියත් ගණන් නොගන්නා බව දැන් ටිකකට කලින් කොල්යා කිව්වා. කටූෂා මෙ තැන සිටින බවත්, ට්‍රෝයි නගරය ඉදි කළ නැනැත්තා සොයා ගත්ත වෙලාවේ මුහුණ රතු වුණාක් මෙන් දැන් මුහුණ රතු නොවූ බවත්, දැන් කටූෂා එයා ගේ කරුණාවෙන් පිරි කුඩා ඇස්වලින් මා දිහා බලා සිටින බවත්, මට කවදා වත් අමතක වෙන්නේ නැහැ. ළමයිනේ, අපි ජේරම් ඉලූෂා වගේ නාහංගවන්න වෙමු! එඩිතර වෙමු!

කොල්යා වගේ දක්ෂ වෙමු! කොල්යා ලොකු මිනිහෙක් වුණාට පස්සේ මීට වඩා දක්ෂ වේවි. අපි කටූෂා වගේ නිහතමානී වෙමු! දක්ෂ වෙමු! කාරුණාවන්ත වෙමු! මා ළමයින් දෙන්නෙක් ගැන පමණයි කතා කළේ. අද සිට මම මේ ළමයින් සේරට ම ආදරය කරනවා. මම මේ ළමයින් කවදා වත් අමතක කරන්නේ නැහැ. කවදා වත් මාව අමතක කරන්න එපා ය කියා මම මේ ළමයින් ගෙන් බොහො ම කාරුණාවෙන් ඉල්ලා සිටිනවා. ජීවත් වනතුරු කවදා වත් එකිනෙකා අමතක නො කිරීමට පොරොන්දු වූ අප එකමුතු කළ කාරුණික හැඟීම්, අප තුළ ඇති වුණේ කවුරු නිසා ද? ඉලූෂා නිසයි. අපි සදහට ම ඉතා උතුම් කොට සලකන ඒ යහපත් දරුවා මිස වෙන කවුරු නිසා ද? අපි කවදා වත් ඉලූෂා අමතක නො කරමු. මේ මොහොතේ සිට ඉලූෂා පිළිබඳ මතකය සදහට ම අපේ හදවත් තුළ වාසය කෙරේ වා!''

''ඔව්, ඔව්, ඉලූෂා පිළිබඳ මතකය සදහට ම අපේ හදවත් තුළ වාසය කෙරේ වා!''යි ශිෂ්‍යයෝ අවදි වූ හැඟීම්වලින් හා පුබුදු වූ මුහුණින් ද යුතු ව රැව්දෙන කට හඬින් කීවෝ ය.

''අපි ඉලූෂා ගේ මුහුණුවර, ඉලූෂා ගේ ඇඳුම්, කුඩා පරණ පාවහන්, ඔහු වැළලූ කුඩා මිනීපෙට්ටිය, ඔහු ගේ අවාසනාවන්ත තාත්තා, මතක තබා ගනිමු! තාත්තා ගේ ගරුත්වය ආරක්ෂා කර ගැනීම පිණිස ඉලූෂා මුළු පාසලට විරුද්ධ ව තනියෙන් එඩිතර ව සටන් කළ සැටි මතක තබා ගනිමු!''

''ඉලූෂා බොහො ම නිර්භීතයි. බොහො ම හොඳයි. අපි හැම දා ම ඉලූෂා මතක තබා ගනිමු!''

''මම ඉලූෂාට බොහො ම ආදරය කළා''යි කොල්යා කී ය.

''ළමයිනේ, කවදාවත් ජීවිතයට භය වෙන්න එපා. කාට හරි යහපත් ධර්මිෂ්ඨ දෙයක් කළා ම ජීවිතය බොහො ම අගනා දෙයක් හැටියට පෙනෙනවා.''

''ඔව්, ඒක ඇත්ත''යි ශිෂ්‍යයෝ එකග වෙමින් කී හ.

''අපි අලෝෂා කරමසෝව්ට බොහොම ආදරෙයි'' ශිෂ්‍යයෙක් කී ය. සමහර විට එසේ කියන්නට ඇත්තේ කටූෂා විය හැකි ය.

''අපි අලෝෂාට ආදරෙයි, අපි අලෝෂාට ආදරෙයි.'' අනෙක් ශිෂ්‍යයෝ ද එක් හඬින් කී හ.

ශිෂ්‍යයන් බොහෝ දෙනකු ගේ දෑසින් කඳුළු ගලන්නට විය.

"අලෝෂා සැරදේ වා!"යි කියමින් කොල්යා මහත් උද්‍යෝගයෙන් ප්‍රීතිඝෝෂා කෙළේ ය.

"ඉලූෂා අපට සදහට ම අමතක නො වේ වා!"යි අලෝෂා අවදි වූ හැඟීමෙන් යුතු ව කීවේ ය.

"අපේ ආගමේ උගන්වන හැටියට අපි සියලු දෙනාට ම මළවුන් ගෙන් නැගිට, ජීවත් වී, එකිනෙකා දකින්නට ලැබෙනවා ය කියන්නේ ඇත්ත ද? අපට ඉලූෂාත් දකින්නට ලැබේවි ද?"යි කොල්යා අලෝෂා ගෙන් විමසුවේ ය.

"ඔව්, අපි සියලු දෙනා ම මළවුන් ගෙන් නැගිට, එකිනෙකා හමු වී, ප්‍රීතියෙන් යුතු ව, සිදු වූ හැම දෙයක් ම එකිනෙකාට කියන බව ඇත්තයි" අලෝෂා අඩක් සිනා සෙමින් ද අඩක් උද්‍යෝගයෙන් ද කීවේ ය.

"එහෙනම් කො තරම් හොඳ ද!"යි කොල්යා සතුට පළ කෙළේ ය.

"දැන් ඉතින් අපි කතාව නවත්වා ඉලූෂා ගේ දානයට සහභාගි වීමට යමු. පෑන් කේක් ගැන කරදර වෙන්න එපා. පෑන්කේක් කෑම බොහො ම පැරණි සිරිතක්. හොඳ අදහසක් ඇතිවයි ඒ සිරිත පටන් ගෙන තියෙන්නේ"යි අලෝෂා සිනාසෙමින් කී ය. "දැන් ඉතින් අපි එකිනෙකා ගේ අතින් අත අල්ලා ගෙන යමු!"

"හැම දා ම, මුළු ජීවිතයට ම, අපි එකිනෙකා ගේ අතින් අත අල්ලා ගෙන යමු! අලෝෂා සැරදේ වා!"යි කොල්යා ආයේත් වරක් මහත් ප්‍රීතියෙන් කෑගා කීවේ ය. අනෙක් ශිෂ්‍යයෝ ද ප්‍රීති ඝෝෂා නැගූ හ

"අලෝෂා සැරදේ වා!"

කළුබෝවිල, රත්නාවලී පාරේ, සිරි නිවෙසේ වැසි, සිරිල් සී. පෙරේරා විසින් කරන ලද, රුසියන් ජාතික පියෝඩර් මිකේල්ලොවිච් ඩොස්ටොයෙව්ස්කි ගේ, 'භ්‍රාතෘ කරමසෝ' නමැති නවකතාවේ සම්පූර්ණ සිංහල අනුවාදය මෙතෙකින් නිමි.









ප්යෝදර් දොස්තොයෙව්ස්කි

කරමසෝ සහෝදරයෝ

2 වන වෙළුම

පිටකවරය - කුමාර ගල්හේන

3500/-

ISBN 978-955-30-4249-1

සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
රාජ්‍ය සම්මාන ලත් පොත් ප්‍රකාශකයෝ
661, 665, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.
දුරකථන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187
www.godage.com godageem@slt.lk